අට්ඨකථාචාර්ය්‍ය භදන්ත බුද්ධඝොෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# විසුද්ධිමාර්ගය

## (සිංහල පරිවර්තනය)

### දෙවෙනි කොටස

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අවසරය පිට
දෙවැනිවරට මුද්‍රණය කරන ලදී.

පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 10

ටීකාචාර්ය භදන්ත බුද්ධඝොෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# විසුද්ධිමාර්ගය

## (සිංහල පරිවර්තනය)

**දෙවෙනි කොටස**

සිංහල පරිවර්තනය

**ආචාර්ය හේමචන්ද්‍ර දිසානායක**

සමීක්ෂණය

**මහාචාර්ය කපිල අභයවංස**

## ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ
## අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කොමිටිය

මහාචාර්ය එම්. බී. ආරියපාල

මහාචාර්ය එන්. ඒ. ජයවික්‍රම

ආචාර්ය එස්. ජී. සමරසිංහ (සභාපති)

මහාචාර්ය කපිල අභයවංස (ලේකම්)

මහාචාර්ය කේ. ඩී. පරණවිතාන (භාණ්ඩාගාරික)

ආචාර්ය ඒ. අධිකාරී

මහාචාර්ය රත්න විජේතුංග

# පෙරවදන (පළමු මුද්‍රණය)

පාලි භාෂා මාධ්‍යයෙන් පැවති අට්ඨකථා ග්‍රන්ථ සිංහලභාෂාවට පරිවර්තනය කොට සිංහල පාඨකයන් ගේ ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කිරීම අරමුණු කොට ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය මගින් පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ඇරඹිණි. මෙම ඓතිහාසික සත්කාර්යය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බුද්ධ ශාසන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ බුද්ධ ශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ පූර්ණ අනුග්‍රහය ලබා ගැනීමට හැකි වූ බව මෙහි ලා සඳහන් කරනුයේ එම ආයතනයන් කෙරෙහි දැක්වෙන අතිශය කෘතඥතාවෙනි.

අට්ඨකථා ග්‍රන්ථ කොටස් දහයක් සිංහලට පරිවර්තනය කොට මුද්‍රණයෙන් පළකිරීම සඳහා ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අට්ඨකථා පරිවර්තන ව්‍යාපෘතියට බුද්ධශාසන අමාත්‍යාංශයෙන් පැවරුණු වගකීම භදන්ත බුද්ධඝොෂාචාර්යපාදයන් විසින් විරචිත විසුද්ධිමග්ගයේ දෙවැනි කොටසේ සිංහල පරිවර්තනය මුද්‍රණයෙන් එළිදැක්වීමෙන් පරිසමාප්තියට පත් වෙයි.

භදන්ත බුද්ධඝොෂාචාර්ය පාදයන් විසින් රචිත විසුද්ධිමග්ගය සමස්ත බුද්ධ ධර්මයට කරන ලද අතිශය මහාර්ඝ වූ අත්ථකථාවෙකි. මුළු මහත් බුද්ධ ධර්මය පිඬුකොට විවරණය කොට දැක්වීමට බුද්ධඝොෂාචාර්යපාදයන් විසින් විසුද්ධිමග්ගයෙන් ප්‍රශස්ත ව්‍යායාමයක් දරා ඇත. ථෙරවාද සම්ප්‍රදායයේ පිළිගැනීම් අනුව බුද්ධ ධර්මයේ සෑම පැති කඩක්ම ආවරණය වන සේ රචිත එකම පරිපූර්ණ ග්‍රන්ථය ලෙසද විසුද්ධිමග්ගයට අද්විතීය ස්ථානයක් හිමි වෙයි.

විසුද්ධිමග්ගයේ ප්‍රථම භාගයේ මෙන්ම මෙම අවසාන භාගයේද සිංහල පරිවර්තන කාර්යය බෙහෙවින් සාර්ථකව ඉටු කරන ලද්දේ හේමචන්ද්‍ර දිසානායක සූරීන් විසිනි. පාලි හා සිංහල භාෂා විෂයෙහි විශාරද විද්වතකු වන එතුමන් වයෝ වෘද්ධත්වයේ

සිටිමින් වුවද ඉතා සැලකිල්ලෙන් හා උනන්දුවෙන් කරන ලද මෙම විශිෂ්ට කර්තව්‍යය අප මෙහිදී සිහිපත් කරන්නේ අතිශය කෘතඥතාවෙනි.

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ අට්ඨකථා පරිවර්තන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුව මගිනි. මෙම මාහැඟි ජාතික හා ආගමික කර්තව්‍යය උදෙසා එම කමිටුවේ සාමාජික විද්වතුන් ස්වකීය සහභාගිත්වය දක්වන ලද්දේ නිශ්ශරනාධ්‍යාශයෙනි. විසුද්ධිමාර්ගයේ දෙවන භාගය මුද්‍රණය කරවීමෙන් එම කමිටුවේ කාර්යභාරය පරිසමාප්තියට පත් කෙරෙන මෙම අවස්ථාවෙහි එම කමිටු සාමාජික විද්වතුන්ගෙන් ඉටු වූ උදාර මෙහෙය මෙහිදී සිහිපත් කිරීම අපගේ පරම යුතුකමෙකි.

ආරම්භයේ සිටම කමිටුවේ සාමාජිකත්වයෙන් පමණක් නොව ක්‍රියාකාරී සහභාගිත්වයෙන් මෙම සත්කාර්යයට සම්මාදන් වෙමින් සිට අභාවප්‍රාප්තවූ මහාචාර්ය එම්. බී. ආරියපාල, ආචාර්ය **කේ. ටී. ඩබ්. සුමනසූරිය**, ආචාර්ය **සෝමපාල ජයවර්ධන**, ආචාර්ය **ඇස්. ජී. සමරසිංහ** හා ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත **ජී. එස්. බී. සේනානායක** යන විද්වත්හු මෙහිදී අපගේ විශේෂ ගෞරවෝපහාරයට බඳුන් වෙති.

මෙහි මුද්‍රණ කටයුතු ඉතා මැනවින් කමනීය ලෙස නිමකර දුන් දෙහිවල ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් හි අධිපති **මහේන්ද්‍ර සේනානායක** මැතිතුමාට හා එහි කාර්ය මණ්ඩලයට ද අපගේ කෘතඥතාව හිමි වෙයි.

**මහාචාර්ය කපිල අභයවංස**
**ලේකම්**
**අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුව**

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය
96, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 07

# පටුන


| | |
|---|---|
| ඉද්ධිවිධ නිද්දේසය | 1-34 |
| අභිඤ්ඤා නිද්දේසය | 35-61 |
|     දිබ්බසොත ඤාණය | 35-36 |
|     චෙතොපරිය ඤාණය | 36-38 |
|     පුබ්බෙනිවාසානුස්සති ඤාණය | 38-49 |
|     චුතූපපාත ඤාණය | 49-55 |
| ඛන්ධ නිද්දේසය | 62-113 |
|     රූපස්කන්ධය | 69-80 |
|     විඥානස්කන්ධය | 80-89 |
|     වෙදනාස්කන්ධය | 89-91 |
|     සංඥාස්කන්ධය | 91-109 |
| ආයතනධාතු නිද්දේසය | 114-124 |
| ඉන්ද්‍රියසච්ච නිද්දේසය | 125-156 |
| පඤ්ඤාභූමි නිද්දේසය | 157-241 |
| දිට්ඨිවිසුද්ධි නිද්දේසය | 241-253 |
| කඞ්ඛාවිතරණ විසුද්ධි නිද්දේසය | 254-262 |
| මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිද්දේසය | 263-299 |
| පටිපදාඤාණදස්සන විසුද්ධි නිද්දේසය | 300-335 |
|     භඞ්ගානුපස්සනා ඤාණය | 300-306 |
|     ආදීනවානුපස්සනා ඤාණය | 306-312 |

| | |
|---|---|
| නිබ්බදානුපස්සනා ඤාණය | 313 |
| පටිසංඛානුපස්සනා ඤාණය | 313-315 |
| සංඛාරුපෙක්ඛා ඤාණය | 315-333 |
| අනුලොම ඤාණය | 333-334 |
| ඤාණදස්සන විසුද්ධි නිද්දෙසය | 336-366 |
| පඤ්ඤාභාවනානිසංස නිද්දෙසය | 367-382 |
| නිගමනය | 382-384 |

# විසුද්ධි මාර්ගය

## දෙවන භාගය

## ඉද්ධිවිධ නිද්දේසය

ඉක්බිති යම් ලෞකික අභිඥාවන් පිළිබඳව 'මේ සමාධිභාවනාව ආභිඥාවන් ආනිශංස කොට ඇත්තේය'යි කියන ලද්දේද, එම අභිඥාවන් නිපදවීම පිණිස පඨවීකසිණ ආදියෙහිදී, ලබාගන්නාලද චතුර්ත්‍ථධ්‍යානයෙන් යුක්තවූ යෝගාවචරයා විසින් භාවනානුයෝගය කළයුතු වන්නේය. තවද මෙසේ ඒ යෝගාවචරයාගේ එම සමාධිභාවනාව ලබාගන්නාලද ආනිශංස ඇත්තේ පමණක් නොව ඉතා තිරතරද වන්නේය, ලබාගන්නාලද ආනිශංස ඇති ඉතා තහවුරුවූ සමාධිභාවනාවෙන් සමන්විතවූ ඒ යෝගාවචර තෙමේ පහසුවෙන්ම පඤ්ඤාභාවනාව (විදර්ශනා භාවනාව) සම්පාදනය කරන්නේය, එහෙයින් පළමුකොට අභිඥාවන් පිළිබඳ විස්තර කථාව ආරම්භ කරන්නෙමු. භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි ලබාගන්නාලද චතුර්ත්‍ථධ්‍යාන සමාධි ඇති කුලපුත්‍රයනට සමාධි භාවනාවෙහි අනුසස් දක්වනු පිණිසද, මතුමත්තෙහි වඩ වඩා ප්‍රණීතවූ ධර්මයන් දේශනා කරනු පිණිසද, ''මෙසේ සිත සමාධිගතව (සමාහිතෙ) පිරිසුදුව (පරිසුද්ධෙ) නිර්මලව (පරියොදාතෙ) කෙලෙස් රහිතව (අනඞ්ගණෙ) උපක්ලේශයන්ගෙන් තොරව (විගතූපක්කිලෙසෙ) මෘදුව (මුදුභූතෙ) කර්මයෝග්‍යව (කම්මනියෙ) සිටි කල්හි, අකම්ප්‍ය භාවයට පත්වූ කල්හි (ආනෙඤ්ජප්පත්තෙ) ඒ යෝගාවචර තෙමේ ඉද්ධිවිධඥාණය පිණිස සිත මෙහෙයවයි, නැඹුරු කරවයි. හේ තෙමේ අනේකවිධවූ ඍද්ධිවිශේෂයන් අනුභව කරයි, එක් පුද්ගලයෙක්වම බොහෝ පුද්ගලයන් සෙයින් දිස්වෙයි''[a] (එකොපි හුත්වා බහුධා හොති)'' යන ආදී වශයෙන් ඍද්ධිමය ක්‍රියාවන් කරනු කැමැති ආධුනික යෝගාවචරයා විසින් පළමු කොට ඕදාතකසිණය තෙක් වූ කසිණ අටෙහි සමවත් අටක් අටක් නිපදවීමෙන් කසිණානුලෝම වශයෙන්ද, එසේම

a. පාරාජිකපාළි, වේරඤ්ජ කාණ්ඩ - cf.D.i 77

කසිණපටිලෝම වශයෙන්ද, කසිණානුලොමපටිලෝම වශයෙන්ද, ඣානානුලෝම වශයෙන්ද, ඣානපටිලෝම වශයෙන්ද, ඣානුලෝමපටිලෝම වශයෙන්ද, ඣානුක්කන්තික වශයෙන්ද, කසිණුක්කන්තික වශයෙන්ද, ඣානකසිණුක්කන්තික වශයෙන්ද, අඞ්ගසංකන්ති වශයෙන්ද, ආරම්මණසංකන්ති වශයෙන්ද, අඞ්ගාරම්මණසංකන්ති වශයෙන්ද, අඞ්ගවවත්ථාපන වශයෙන්ද, ආරම්මණවවත්ථාපන වශයෙන්දැයි යන මේ තුදුස් ආකාරයෙන් සිත මැනවින් දමනය කළයුතුය. මෙහි **කසිණානුලොම** යනු කිමෙක්ද? -පෙ- ආරම්මණවවත්ථාපන යනු කිමෙක්ද යත්:- මෙහි භික්ෂු තෙමේ පඨවිකසිණයෙහි ධ්‍යානයට සමවදියි, ඉක්බිති ආපෝකසිණයෙහිදැයි මෙසේ පිළිවෙළින් මුල් කසිණ අටෙහි සියක් වර දහසක් වර සමවදියි. මේ කසිණානුලෝම නම්. එසේම ඕදාතකසිණයෙහි පටන් ප්‍රතිලෝම වශයෙන් (අග සිට මුලට) සමවැදීම **කසිණපටිලොම** නම්. පඨවිකසිණයෙහි පටන් (මුල සිට අගට) ඕදාතකසිණය තෙක්ද, ඕදාතකසිණයෙහි පටන් (අග සිට මුලට) පඨවිකසිණය තෙක්දැයි මෙසේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් නැවත නැවතත් සමවැදීම 'කසිණානුලොම-පටිලොම' නම්. ප්‍රථමධ්‍යානයෙහි පටන් පිළිවෙළින් නේවසඤ්ඤානාසඤ්ඤායතනය තෙක් නැවත නැවතත් සමවැදීම ඣානානුලෝම නම්. නේවසඤ්ඤානාසඤ්ඤා- යතනයෙහි පටන් ප්‍රථම ධ්‍යානය තෙක් නැවත නැවතත් සමවැදීම ඣානපටිලෝම නම්. ප්‍රථමධ්‍යානයෙහි පටන් නේවසඤ්ඤානාසඤ්ඤා- යතනය තෙක්ද නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පටන් ප්‍රථමධ්‍යානය තෙක්දැයි මෙසේ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් නැවත නැවතත් සමවැදීම ඣානානුලොමපටිලොම නම්. පඨවිකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද එම කසිණයෙහිම තෘතීයධ්‍යානයට සමවදියි, ඉක්බිති එම ධ්‍යානය උගුළුවා ආකාසානඤ්චායතනයටද, ඉක්බිති ආකිඤ්චඤ්ඤායතනයටදැයි මෙසේ කසිණය නොඉක්මවා ධ්‍යානයම ඒකාන්තරික වශයෙන් (එකක් හැර එකක්) පැන යාම ඣානුක්කන්තික නම්. මේ ආකාරයෙන්ම ආපෝකසිණාදිය මුල් කොටද, යෝජනා කටයුතුය. පඨවිකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද නැවත එම ධ්‍යානයටම තේජෝකසිණයෙහිද, ඉක්බිති නීලකසිණයෙහිද, ඉක්බිති ලෝහිතකසිණයෙහිදැයි යන මේ නයින් ධ්‍යානය නො-ඉක්මවා කසිණයම ඒකාන්තරික වශයෙන් පැන යාම කසිණුක්කන්තික නම්. පඨවිකසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද ඉක්බිති තේජෝකසිණයෙහි තෘතීයධ්‍යානයටද නීලකසිණය උගුළුවා ආකාසානඤ්චායතනයටද, ලෝහිතකසිණයෙන් ආකිඤ්චඤ්ඤා-යතනයටදැයි යන මේ නයින් ධ්‍යානයද කසිණයද උලැඟීම 'ඣාන-කසිණුක්කන්තික' නම්. පඨවීකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද එම කසිණයෙහිම සෙසු ධ්‍යානයටද සමවැදීම 'අංගසංකන්තික' නම්.

පඨවිකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද එයටම ආපෝකසිණයෙහිද - පෙ- ඕදාත කසිණයෙහිදැයි මෙසේ සියලු කසිණයන්හි එක්ම ධ්‍යානයට සමවැදීම 'ආරම්මණසංකන්තික' නම්. පඨවිකසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද, ආපෝකසිණයෙහි ද්විතීයධ්‍යානයටද තේජෝකසිණයෙහි තෘතීය ධ්‍යානයටද, වායෝකසිණයෙහි චතුර්ථධ්‍යානයටද, නීලකසිණය උගුළුවා ආකාසානඤ්චායතනයටද, පීතකසිණයෙහි විඤ්ඤානඤ්ඤා- යතනයටද, ලෝහිතකසිණයෙහි ආකිඤ්චඤ්ඤායතනටද, ඕදාතකසිණයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනයටදැ'යි මෙසේ ඒකාන්තරික වශයෙන් අංගයෙන් ආරම්මණයට සංක්‍රමණය වීම අංගාරම්මණසංකන්තික නම්. ප්‍රථමධ්‍යානය වනාහි පංචඞ්ගික (අංග පසක් ඇත්තේ)යයි ව්‍යවස්ථාපනය කොට, ද්විතීයධ්‍යානය තිවඞ්ගික (අංග තුනක් ඇත්තේ)ය, තෘතීයධ්‍යානය දුවඞ්ගික (අංග දෙකක් ඇත්තේ)ය, චතුර්ථධ්‍යානයද, ආකාසානඤ්චායතනයද - පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතනයද එසේම (ද්ව්‍යංගික)යයි මේ ආකාරයෙන් ධ්‍යානාංග මාත්‍රයම ව්‍යවස්ථාපනය කිරීම අංගවවත්ථාපන නම්. එසේම මේ පඨවිකසිණයයි ව්‍යවස්ථාපනය කොට, මේ ආපෝකසිණය, -පෙ- මේ ඕදාතකසිණයයි මෙසේ ආරම්මණමාත්‍රයම ව්‍යවස්ථාපනය කිරීම ආරම්මණවවත්ථාපන නම්. ඇතැමෙක් අංගාරම්මණවවත්ථාපනයද කැමැති වෙති, අටුවාහි නො-ආ හෙයින් ඒකාන්තයෙන් එය භාවනාමුඛයක් නොවේමය.

මෙකී තුදුස් ආකාරයෙන් සිත දමනය කොට භාවනා නොවැඩූවිරූ ආධුනික යෝගාවචරයකු සෘද්ධික්‍රියාවන් නිපදවති'යි යනු විද්‍යමාන නොවේ. (සිදු විය නොහැකිය). ආධුනිකයකුහට වනාහි කසිණභාවිතය පවා දුෂ්කරය, සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් සමත් වෙති. කසිණපරිකර්මයන් පුරුදු කළ අයකුහට පවා නිමිති ඉපැදවීම දුෂ්කරය, සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් සමත් වෙති. අර්පණා ඉපැදවූ අයකුහට පවා තුදුස් ආකාරයෙන් සිත දමනය කිරීම දුෂ්කරය. සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් සමත් වෙති. තුදුස් ආකාරයෙන් සිත දමනය කළ අයකුහට පවා සෘද්ධික්‍රියා නිපදවීම දුෂ්කරය, සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් සමත් වෙති. සෘද්ධික්‍රියා ඉපැදවූ අයකුහට පවා යුහුව ධ්‍යානයට සමවැදීම දුෂ්කරය, සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් සමත් වෙති.

ථේරම්බථල ලෙණෙහි මහා රෝහණගුත්ත තෙරුන්හට ගිලන් උවටැන් පිණිස පැමිණි තිස්දහසක් පමණ සෘද්ධිමතුන් අතුරෙන් අටවස් උපසම්පදා ඇතිව සිටි රක්ඛිත නම් තෙරුන් සේය. ඔවුන්ගේ ආනුභාවය යට පඨවිකසිණ නිද්දේසයෙහි කියනලද්දේමය. ඔවුන්ගේ එම ආනුභාව බලය දැක තෙරණුවෝ, 'ඇවැත්නි, රක්ඛිත තෙරුන් මෙහි නොසිටිනුවට

නාරජු රැක ගැන්මට නොසමත්වූහ'යි අපි සියල්ලෝම ගැරහීමට ලක් වන්නමෝය, එහෙයින් තමා විසින් ගෙන පරිහරණය කළයුතු ආයුධය මල සෝදා හැරම පරිහරණය කරනු වටනේය'යි කීහ. එම තිස්දහසක් භික්‍ෂූහු තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා ඛිප්පනිසන්ති (යුහුව ධ්‍යානයට සමවදිනු සමත්) බවට පත්වූහ. ඛිප්පනිසන්තිභාවය ඇති කල්හි පවා පරහට පිහිටවිය හැකිබව ලැබීම දුෂ්කරය, සියක් දෙනකු දහසක් දෙනකු අතුරෙන් එක්ම කෙනෙක් පොහොසත් වෙති. ගිරිභණ්ඩවාහන පූජෝත්සවයෙහිදී මාරයා විසින් අඟුරුවැසි වස්වනවිට අහස්හි පොළොවක් මවා අඟුරුවැස්සෙන් රැකවරණ සැලසූ තෙරුන් සේය. පෙර පුරුදු කරනලද බලවත් භාවනායෝග ඇති බුදු පසේබුදු අගසවු ආදීන්හට වනාහි යට කියන ලද ප්‍රකාර සහිත භාවනාක්‍රමයෙන් තොරව පවා අර්හත්‍ව ප්‍රතිලාභ වශයෙන්ම මෙම ඍද්ධික්‍රියාමහිමයද පටිසම්භිදාදී භේද ඇති සෙසු ගුණ විශේෂයෝද සමෘද්ධ වෙති. එහෙයින්, යම්සේ පළඳනා වෙසෙසක් කරනු කැමැති රන්කරුවෙක් ගිනිපිඹීම් ආදී ක්‍රියාවෙන් රන් මෙලෙක් කොට, වැඩට හුරු කොටම එම පළඳනාව තනාද, තවද යම්සේ බඳුන් වෙසෙසක් තනනු කැමැති කුඹල්කරුවෙක් මනා කොට මැටි අඹරා මෙලෙක් කොටම එම බඳුන තනාද, එසේම ආධුනික යෝගාවචරයා විසින් තුදුස් ආකාරයෙන් සිත මනාසේ දමනයකොට, ඡන්‍දය, චිත්තය, විරියය, වීමංසය යන ඍද්ධිපාදයන් පෙරටුකොට සමවැදීම් වශයෙන්ද, ආවර්ජනාදී වශීභාව වශයෙන්ද මුදුකොට කර්මණ්‍ය කොට ඍද්ධිවිධය පිණිස භාවනානුයෝග කටයුතුය. පූර්වහේතු ඇත්තහු විසින් වනාහි කසිණවිෂයෙහි (යටත් පිරිසෙයින්) චතුර්ත්‍ථධ්‍යානය පමණවූ චිණ්ණවසීභාවය ඇතිව එසේ කරනු වටනේය. මෙහිලා යම් ආකාරයෙකින් භාවනානුයෝගය කළයුතු වන්නේද, එම ආකාරය දක්වමින් භාග්‍යවතුන් වහන්සේ "සො එවං සමාහිතෙ චිත්තෙ" (මෙසේ සිත සමාධිගත වූ කල්හි ඒ යෝගාවචරයා) යන ආදිය වදාළහ.

එහිලා පෙළෙහි ආ නයින්ම විනිශ්චය කථාව මෙසේයඃ- එහි **සො** යනු, චතුර්ත්‍ථධ්‍යානලාභී යෝගාවචර තෙමේ, **එවං** යනු, චතුර්ත්‍ථධ්‍යානයට පැමිණීමේ ක්‍රමය දැක්වීමයි, ප්‍රථමධ්‍යානාදියට පැමිණීම ආදි මේ අනුක්‍රමයෙන් චතුර්ත්‍ථධ්‍යාන සමාධියෙන් සමාධිගත වූ කල්හි, **චිත්තෙ** යනු, රූපාවචර සිත, **පරිසුද්ධෙ** යන ආදියෙහි වනාහි, උපෙක්ඛාසතිපාරිසුද්ධියෙන් පිරිසිදුවූ කල්හි, පිරිසිදුවූ හෙයින්ම, **පරියොදාතෙ** යනු නිර්මලවූ කල්හි, ප්‍රභාස්වරවූ කල්හියයි කී නියායි. සුඛාදීවූ ප්‍රත්‍යයන් නැසීමෙන් රාගාදී අංගණයන් නසනලද හෙයින් **අනඞ්ගණෙ**, අනංගණවූ කල්හි, අනංගණවූ හෙයින්ම, **විගතූපක්කිලෙසෙ**, පහකරනලද උපක්ලේශයන් ඇති කල්හිඃ අංගණ හෙවත් ක්ලේශයන් හේතුකොටගෙන සිත කිලුටුබවට යෙයි. මනාකොට වඩනාලද හෙයින්

මුදුභූතෙ, මුදුබවට පත්වූ කල්හි, වශීභාවයට පත්වූ කල්හියයි කී නියායි-වසඟයෙහි පවත්නා සිත මෘදුයයි කියනු ලැබේ. මුදු බැවින්ම කම්මනීයෙ, කර්මණ්‍යවූ කල්හි, කර්මයෝග්‍යවූ කල්හියයි කී නියායි. මුදු බවට පත්වූ සිත මනාකොට ගිනි පිඹීමෙන් මෙලෙක් වූ ස්වර්ණයක් සෙයින් කර්මණ්‍ය වේ, මෘදු වීම හා කර්මණ්‍ය වීම යන දෙකම මනාකොට වඩනාලද හෙයින්ම වේ. කියන ලදමැයි:-

'මහණෙනි, වඩනා ලද පුරුදු පුහුණු කරන ලද මේ සිත තරම් මෘදු වූද කර්මණ්‍ය වූද අන් කිසිදෙයක් මම නොදකිමි''[a] යනුවෙනි. මෙකී පිරිසුදු බව ආදී ගුණයෙහි පිහිටි හෙයින් ඨිතෙ. තිරව සිටි කල්හි, තිරව සිටි හෙයින්ම ආනෙඤ්ජප්පත්තෙ, නිසලවූ කල්හි, කම්පා නැතිවූ කල්හියයි කී නියායි. මෘදුතා කර්මණ්‍යතා හේතුවෙන් තමා වසඟයෙහි සිටි හෙයින් හෝ මොනවට පිහිටි කල්හි, ශ්‍රද්ධාදී ගුණයෙන් පරිගෘහීත වූ හෙයින් අකම්ප්‍යතාවට පත්වූ කල්හි ශ්‍රද්ධාවෙන් රැකවරණලද සිත ශ්‍රද්ධාහීනතාවෙන් සසල නොවේ, වීර්යයෙන් රැකවරණ ලද සිත කුසීත බවින් සසල නොවේ, සතියෙන් රැකවරණ ලද සිත ප්‍රමාද බවින් සසල නොවේ, සමාධියෙන් රැකවරණ ලද සිත අවිද්‍යාවෙන් සසල නොවේ, මෙකී ශ්‍රද්ධාදී ෂඩ්ධර්මයෙන් රැකවරණලද සිත අකම්ප්‍යතාවට ගියේ වේ. මෙසේ (චතුර්ථධ්‍යානයෙන් සමාධිගත වීම් ආදී) අට අඟෙකින් සමන්විතවූ සිත අභිඥාවෙන් සාක්‍ෂාත් කළයුතු ධර්මයන් අභිඥාවෙන් සාක්‍ෂාත් කරනු පිණිස යොමු කිරීමට යෝග්‍ය වේ. තවද ක්‍රමයෙකිː-චතුර්ථධ්‍යාන සමාධියෙන් සමාහිතවූ කල්හිය, නීවරණයන් දුරුවීමෙන් (පරිසුද්ධෙ) පිරිසුදුවූ කල්හිය, විතර්කාදිය ඉක්මවීමෙන් (පරියෝදාතෙ) නිර්මලවූ කල්හිය, ධ්‍යානප්‍රතිලාභයට ප්‍රතිපක්‍ෂවූ ලාමක සිතුවිලි නොමැති වීමෙන් (අනඞ්ගණෙ) නිකෙලෙස්වූ කල්හිය, අභිධ්‍යාදී උපක්ලේශයන් පහවීමෙන් (විගතූපක්කිලෙසෙ) උපක්ලේශ රහිතවූ කල්හිය, මෙම ක්‍රම දෙකම අනඞ්ගණසුත්ත, වත්ථසුත්ත අනුසාරයෙන් දතයුතුය. වශීභාවයට පැමිණීමෙන් (මුදුභූතෙ) මුදු බවට පත්වූ කල්හිය, ඍද්ධිපාද බවට පැමිණීමෙන් (කම්මනියෙ) කර්මයෝග්‍යවූ කල්හිය, භාවනා සම්පූර්ණවීමෙන් ප්‍රණීතබවට පත්වීමෙන් (ඨිතෙ) මොනවට පිහිටි කල්හිය, (ආනෙඤ්ජප්පත්තෙ) අකම්ප්‍ය භාවයට පත්වූ කල්හිය, අකම්ප්‍ය භාවයට පැමිණෙන සේ මොනවට සිටි කල්හිය යන අර්ථයි. මේ ආකාරයෙන්ද අටඟෙකින් සමන්විතවූ සිත අභිඥා නයින් සාක්‍ෂාත් කළයුතු ධර්මයන් අභිඥානයින් සාක්‍ෂාත් කරනු පිණිස පාදක වූයේද ප්‍රතිෂ්ඨා වූයේද වේ.

ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති යනු, මෙහි සමෘද්ධ වෙතැ'යි යන අර්ථයෙන් ඉද්ධි නම්, 'කාර්යනිෂ්පත්ති' යන අර්ථයෙන්

a. අංගුත්තර නිකාය. එකක නිපාත - A. i. 9

හෝ 'ප්‍රතිලාභ' යන අර්ථයෙන් හෝ එනම් වෙතැ'යි කී නියායි. යමක් සාධනය කරගනු ලැබේද, අයත් කරගනු ලැබේද, එය සමෘද්ධ වෙති'යි කියනු ලැබේ. යම්සේ කියන ලදද, - 'කාමං කාමයමානස්ස තස්ස චෙතං සමිජ්ඣති''[a] කාමය කැමැති වන ඔහුට එය සමෘද්ධ වේ නම්. මේ ආකාරයෙන්ම නෛෂ්ක්‍රම්‍යය (කැමැති වන්නහුට) සමෘද්ධ වෙති'යි ඉද්ධි නම්. මුල් රූපය හැර වෙනත් රූප ගනිති'යි 'පාටිහාරිය' නම්, අර්හත් මාර්ගය සඵල වෙති'යි ඉද්ධි නම්. මුල් රූපය හැර වෙනත් වෙනත් රූප ගනිති'යි පාටිහාරිය නම්.

තවද ක්‍රමයෙකි:- සමෘද්ධ වෙති'යි යන අර්ථයෙන් 'ඉද්ධි' නම්, උපාය සම්පත්තියට මෙය අධිවචනයෙකි. උපාය සම්පත්තිය වනාහි අභිප්‍රේත ඵලය උපදවන හෙයිනි. යම්සේ කියන ලදමැයි:- 'මේ චිත්ත ගෘහපති තෙමේ සිල්වත්ය, යහපත් ගුණධර්ම ඇත්තේය, ඉදින් ප්‍රාර්ථනා කෙරේනම් මතු අනාගතයෙහි සක්විති රජ වන්නේය, සිල්වත් වූ ඔහුට වනාහි ප්‍රාර්ථනා චිත්තයෙහි පිරිසුදුබව හේතුකොටගෙන මෙය සමෘද්ධ වන්නේය''[b]

තවද ක්‍රමයෙකි:- මෙය හේතුකොටගෙන සත්වයෝ සමෘද්ධ වෙති'යි 'ඉද්ධි' නම්, සමෘද්ධ වෙති'යි යනු සමෘද්ධභාවයට යෙති'යි වෘද්ධියට පත් වෙති'යි උසස්බවට යෙති'යි කී නියායි. එම ඍද්ධිය දශ ආකාර වේ, කියන ලදමැයි:- 'ඉද්ධියො' යනු දශ ඍද්ධියයි, යලිදු කියන ලදමැයි:- දශඍද්ධි නම් කවරේද? අධිෂ්ඨාන ඍද්ධිය, විකුර්වන ඍද්ධිය, මනෝමය ඍද්ධිය, ඥානවිෂ්ඵාර ඍද්ධිය, සමාධිවිෂ්ඵාර ඍද්ධිය, ආර්ය ඍද්ධිය, කර්මවිපාකජ ඍද්ධිය, පුණ්‍යවන්තයන්ගේ ඍද්ධිය, විද්‍යාමය ඍද්ධිය, ඒ ඒ තන්හි මනාකොට යෙදීමේ හේතුවෙන් සමෘද්ධ වීමේ ඍද්ධිය යන මේය. එහි ස්වභාව වශයෙන් එක්ම පුද්ගලයෙක් වූයේ බොහෝ දෙනෙකු ලෙසින්, සියක් දෙනකු, දහසක් දෙනකු, සුවහසක් දෙනකු සෙයින් ආවර්ජනය කරයි, එසේ ආවර්ජනය කොට ''බොහෝ දෙනකු බවට පත් වෙමි''යි ඥානයෙන් අධිෂ්ඨාන කරයි, මෙසේ විග්‍රහ කොට දක්වනලද ඍද්ධිය අධිෂ්ඨාන වශයෙන් නිපන් හෙයින් අධිට්ඨානඉද්ධි නම් වේ. ''හේ තෙමේ ප්‍රකෘති වේශය හැර කුමාර වේශය දක්වයි. නාග වේශය හෝ -පෙ- විවිධවූ සේනා ව්‍යූහය දක්වයි''[c] යන ආදී වශයෙන් මෙසේ ඍද්ධිය ප්‍රකෘති වේශය හැර අන්‍යවේශයන් ගැනීම් වශයෙන් පවත්වන ලද හෙයින් විකුර්වන ඍද්ධි නම් වේ. ''මේ ශාසනයෙහි භික්ෂු තෙමේ මේ කය කෙරෙන් මනෝමය රූප ඇති අන් කයක් නිර්මාණය කරයි.''[a] යන ආදී වශයෙන් ආ ඍද්ධිය ශරීරාභ්‍යන්තරයෙහි මනෝමයවූ අනෙක්

a. සු. නි. කාමසුත්ත - Sn.766
b. සං. නි. චිත්ත සංයුත්ත - S. iv. 303
c. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - Paṭ. ii. 210

ශරීරයක් නිපදවීම් වශයෙන් පවත්වනලද හෙයින් මනොමයඉද්ධි නම් වේ. විදර්ශනාඥානයට පෙර හෝ පසුව හෝ එක් කෙණෙහි හෝ මාර්ගඥානානුභාවය හේතුකොටගෙන උපන් ඍද්ධි විශේෂය ඤාණ විප්ඵාර ඉද්ධි නම් වේ. කියන ලද මැයි:- ''අනිත්‍යය මෙනෙහි කිරීමෙන් නිත්‍ය සංඥාව ප්‍රහීණ කිරීමේ කාර්යය සිද්ධ වෙති'යි ඤාණවිප්ඵාර ඉද්ධි නම්, -පෙ- අර්හත් මාර්ගයෙන් සකල ක්ලේශයන් ප්‍රහීණ කිරීමේ කාර්යය සිද්ධ වෙති'යි ඤාණවිප්ඵාර ඉද්ධි නම්.''[b] ආයුෂ්මත් බක්කුල තෙරුන්හට ඤාණවිප්ඵාර නම් ඍද්ධිය විය, ආයුෂ්මත් සංකිච්ච තෙරුන්හට ඤාණවිප්ඵාර නම් ඍද්ධිය විය. ආයුෂ්මත් භූතපාල තෙරුන්හටද ඤාණවිප්ඵාර නම් ඍද්ධිය විය.

එහි ආයුෂ්මත් බක්කුල තෙරණුවෝ පෙර ළදරු කල්හිම නාමකරණ මඟුල් දිනයෙහි ගඟෙහි නහවනු ලබද්දී කිරිමවගේ ප්‍රමාදයෙන් සැඩ පහරට වැටුණාහුය, එක්තරා මත්ස්‍යයෙක් ළදරුවා ගිල බරණැස් තොටුපලට පැමිණියේය. එහිදී එක්තරා ධීවරයෙක් එම මත්ස්‍යයා අල්වාගෙන එක්තරා සිටු බිරියක්හට විකිණීය. ඕ තොමෝ මත්ස්‍යයා කෙරෙහි ඇලුම් උපදවා 'මම්ම මත්ස්‍යයා පිසන්නෙමි'යි ගෙන කපන විට මත්ස්‍යයාගේ කුසතුළ සිටි රන්රුවක් වන් දරුවා දැක, 'මට පුතකු ලැබුණාහ'යි සොම්නස් වූහ. මෙසේ මත්ස්‍යයාගේ කුසෙහිදී උපද්‍රවයක් නොවීම අන්තිම ආත්මභාවයෙහි සිටි බක්කුල ආයුෂ්මතුන්හට එම ආත්මභාවයෙහි ලැබෙන්නට තිබුණ අර්හත් මාර්ගඥානයෙහි ආනුභාව බලයෙන් සිදුවූ හෙයින් ඤාණවිප්ඵාර ඉද්ධි නම් වේ, මෙම කථා වස්තුව විස්තර වශයෙන් කියනු වටී.

සංකිච්ච තෙරුන්ගේ වනාහි මව් තොමෝ ඔවුන් කුසතුළ සිටියදීම කලුරිය කළාය. ඇය චිතකයට නංවා හුලින් ඇන දවනු ලබන කල්හි හුල කෙළවර ඇස් කොන්හි වැදී හඬ නැඟූහ. ඉක්බිති 'ළදරුවාට පණ ඇතැ'යි මළ සිරුර බිමට ගෙන කුස පලා ළදරුවා ගෙන මිත්තණියට දුන්හ. ඔහු තුමූ ඇය විසින් හදා වඩා ගන්නා ලදුව වැඩිවියට පැමිණ පැවිදිව සිවුපිළිසිඹියා සහිත රහත් බවට පත්වූහ. මෙසේ කී ලෙසින්ම සංකිච්ච ආයුෂ්මතුන්හට දරසෑ මත උපද්‍රවයක් නොවීම ඤාණවිප්ඵාර ඉද්ධි නම් වේ.

භූතපාල නම් දරුවාගේ පියා රජගහ නුවර සිටි දිළිඳු මිනිසෙකි. හේ තෙමේ ගැලක් ගෙන දර පිණිස වනයට ගොස් දර පටවාගෙන සවස්කල නුවර දොරටුව අසලට පැමිණියේය. එහිදී ඔහුගේ ගොන්නු වියෙන් මිදී නුවරට පිවිසියාහුය. හේ තෙමේ ගැල සමීපයෙහි පුතු සිටුවා ගොනුන් පසුපස යන්නේ නුවරටම පිවිසියේය. ඔහු පෙරළා

---

a. පටිසම්භිදා, ඉද්ධිකථා - Paṭ. ii. 211

නික්මෙන්නට පෙරම නුවර දොරටුව වසන ලද්දේය. ව්‍යාල මෘගයන් යක්‍ෂාදීන්ගෙන් ගහන පිටුසරෙහි තුන්යම් රැය සිටි දරුවාට උවදුරක් නොවීම කී නයින්ම ඤාණවිප්ඵාර ඉද්ධි නම් වේ. මෙම කථා වස්තුවද විස්තර කරනු වටී.

සමාධියට පෙර හෝ පසුව හෝ එක් කෙණෙහි හෝ එම සමාධියෙහි ආනුභාවයෙන් නිපන් ඍද්ධිවිශේෂය සමාධිවිප්ඵාර ඉද්ධි නම් වේ. කියන ලදමැයි:- ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ප්‍රහාණකාර්යය සිද්ධ වෙති'යි සමාධිවිප්ඵාර ඉද්ධි නම්, -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවෙහි ප්‍රහාණකාර්යය සිද්ධ වෙති'යි සමාධිවිප්ඵාර නම් ඍද්ධිය විය. ආයුෂ්මත් සංජීව තෙරුන්හටද, ආයුෂ්මත් ඛාණුකොණ්ඩඤ්ඤ තෙරුන්හටද, උත්තරා නම් උපාසිකාවටද, සාමාවතී නම් උපාසිකාවටද සමාධිවිප්ඵාර නම් ඍද්ධිය විය.[a]

එහි, එක් කලෙක කපෝතකන්‍දරාවෙහි, මුගලන් තෙරුන් සමග වෙසෙන සැරියුත් තෙරුන් සඳ පහන් ඇති රාත්‍රියෙක්හි අලුත බූගෑ හිසින් අභ්‍යවකාශයෙක්හි හුන් විට, එක්තරා දුෂ්ට යක්‍ෂයෙක් සහායක යක්‍ෂයා විසින් වලකනු ලබනුයේම, හිසට පහරක් දුන්නේය. අකුණු හඬක් වැනි හඬක් විය. තෙරණුවෝ ඔහු පහර දෙනුවා හාම සමවතට සමවන්හ, එහෙයින් තෙරුන්හට එයින් කිසි වෙහෙසක් නොවීය. මේ ඔවුන්ගේ සමාධිවිප්ඵාර නම් ඍද්ධියයි. මේ කථාවස්තුව උදානයෙහි ආයේය. [b]

සංජීව තෙරුන් වනාහි නිරෝධ සමාපත්තියට සමවැද සිටි විටෙක ගොපලු ආදීහු ඔවුන් කලුරිය කළහ'යි සිතා තණපරඬල් දර ගොමරිටි ආදිය රැස්කොට ගිනි දැල්වූහ. තෙරුන්ගේ සිවුරු පවා අංශුමාත්‍රයෙකුදු නොදැවිණි. මේ ඔවුන්ගේ සමවත් පිළිවෙළින් පවත්වලද සමාධියෙහි ආනුභාවයෙන් නිපන් හෙයින් සමාධිවිප්ඵාර නම් ඍද්ධියයි. මේ කථාවස්තුව සූත්‍ර පිටකයෙහි ආයේය.[c]

ඛාණුකොණ්ඩඤ්ඤ තෙරණුවෝ වනාහි ස්වභාවයෙන්ම සමවත්බහුල වූවාහු එක්තරා අරණ්‍යයෙක්හි රාත්‍රිකාලයෙහි සමවතට සමවැද හුන්හ. සොරු පන්සියයක් දෙනා බඩු සොරකම් කොට ගෙනයන්නාහු දැන් අප පසුපස එන කෙනකු නැතැ'යි විඩා හැර ගනු කැමැතිව බඩු බිම තබන්නාහු කණුවෙකැ'යි සිතා සියලු බඩු තෙරුන් මතම තැබූහ. විඩා හැර යන කල ඒ සොරුන් පළමුවෙන්ම තබනලද බඩු ගන්නා හාම කාලපරිච්ඡේද වශයෙන් තෙරණුවෝ සමවතින්

a. පටිසම්භිදා එම - Paṭ. ii. 211f
b. උදානපාළි - Ud 39f
c. ම.නි. මාරතජ්ජනිය සූ. - M i 333

නැගිටියහ. ඔවුහු තෙරුන් සෙලවෙනු දැක බිය පත්ව බිරුසන් දුන්හ. තෙරණුවෝ 'උපාසකවරුනි, බිය නොවවු, මම භික්ෂු කෙනෙක්මි'යි කීහ, ඔවුහු අවුත් වැඳ තෙරුන් කෙරෙහි පැහැදී පැවිදිව පිළිසිඹියා සහිතව රහත්බවට පැමිණියාහුය. මෙහිදී බඩු පන්සියයක් සිය සිරුර මත ගොඩ ගැසීමෙන් පවා තෙරුන්හට කිසි ආයාසයක් නොවීම සමාධිවිප්ඵාර නම් සෘද්ධියයි.

උත්තරා නම් උපාසිකා තොමෝ වනාහි පුණ්ණක නම් සිටුවරයාගේ දියණියෝය, සිරිමා නම් ගණිකා තොමෝ ඇය කෙරෙහි ඊර්ෂ්‍යා කොට හුණුතෙල් කළයක් හිසමත වැගිරවීය. උත්තරා උපාසිකා තොමෝ එකෙණෙහිම මෙත් සමවතට සමවනි. හුනු තෙල් නෙළුම් පතෙකින් දියබිඳු රූරා වැටෙන්නා සේ පෙරළී ගලා ගියේය. මේ මැයගේ සමාධිවිප්ඵාර නම් සෘද්ධියයි. මේ කථාප්‍රවෘත්තියද සවිස්තරව දක්වනු වටී.

සාමාවතී තොමෝ නම් උදයන රජුගේ අගමෙහෙසියයි. මාගන්දිය නම් බමුණා සිය දියණියන්හට අගබිසෝ තනතුර පතමින් ඇයගේ වීණාව තුළ සර්පයකු ලවා, ''මහරජ සාමාවතිය ඔබ නසනු කැමැතිව වීණාව තුළ සර්පයකු ලවාගෙන හැසිරෙතැ'යි රජුට කීය. රජ තෙමේ එය දැක කිපී, 'සාමාවතිය මරමි'යි දුන්න ගෙන විස පෙවූ හීයක් නැඟීය. සාමාවතී තොමෝ පිරිවර හා සමග රජු කෙරෙහි මෙත් පැතිරවීය. රජ තෙමේ සැරය විදින්නට හෝ තබන්නට හෝ නොහැකිව වෙවුලා සිටියේය. ඉක්බිති දේවී තොමෝ, ''කිමෙක්ද මහරජ, වෙහෙස වනුදැ?''යි කීය. රජ තෙමේ 'එසේය, වෙහෙසට පත් වීමි''යි කීය. ''එසේ නම් දුන්න බහා තබනුය''යි කීය, හීය රජුගේ පාමුල වැටිණි. ඉක්බිති දේවී තොමෝ, ''මහරජ, නිදොසුන්හට ද්‍රෝහ නොකරනුයැ''යි අවවාද කළාය. මෙසේ රජුහට ශරය විදිනු නොහැකිවීම සාමාවතියගේ සමාධිවිප්ඵාර නම් සෘද්ධියයි.

පිළිකුල් සහගත දෙය කෙරෙහි පිළිකුල් නොකොට විසීම් ආදිය **අරියාඉද්ධි** නම්. කියන ලදමැයි:- ''ආර්ය සෘද්ධි නම් කිම? මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ඉදින් පිළිකුල් සහගත දෙය කෙරෙහි නොපිළිකුල් හැඟීම් ඇතිව වෙසෙම්වා'යි කැමැති වන්නේද, නොපිළිකුල් හැඟීමෙන් එහි වෙසේද, -පෙ-උපේක්ෂා සහිතව, සිහි ඇතිව, මැනවින් දැනගෙන එහි වෙසෙයි''[a] මෙම සෘද්ධිය චේතෝවශීභාවයට පත් (සිත මැනවින් දමනය කළ) ආර්යයන්හටම වනහෙයින් ආර්ය සෘද්ධියයි කියනු ලැබේ. මෙම සෘද්ධියෙන් සමන්විතවූ ආර්ය ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ පිළිකුල් කටයුතු අනිෂ්ට වස්තූන් කෙරෙහි මෙත් පැතිරවීම හෝ ධාතුමනසිකාරය හෝ

---

a. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii 212

කරමින් නොපිළිකුල් හැඟීමෙන් විහරණය කරයි, පිළිකුල් නොවූ ඉෂ්ට වස්තූන් කෙරෙහි අසුභභාවනා හෝ අනිච්ච මනසිකාරය හෝ කරමින් පිළිකුල් හැඟීමෙන් යුතුව විහරණය කරයි, එසේම පිළිකුල් වූද නොපිළිකුල් වූද වස්තූන් කෙරෙහි එම මෙත් පැතිරවීම හෝ ධාතුමනසිකාරය හෝ කරමින් නොපිළිකුල් හැඟීමෙන් විහරණය කරයි, නොපිළිකුල් වූද පිළිකුල් වූද, වස්තූන් කෙරෙහි අශුභ සංඥා හෝ අනිත්‍ය සංඥා හෝ වඩමින් පිළිකුල් හැඟීමෙන් විහරණය කරයි. ඇසින් රූපයක් දැක සොම්නස් නොවේ[a] යන ආදී වශයෙන් කියනලද ෂඩංගෝපේක්ෂාව පවත්වමින්, පිළිකුල් හැඟීමද, නොපිළිකුල් හැඟීමද යන දෙකම දුරුකොට උපේක්ෂා සහිතව, සිහි ඇතිව, මැනවින් දැන විහරණය කරයි. පටිසම්භිදාවෙහි වනාහි, ''පිළිකුල් සහගත වස්තූන් කෙරෙහි නොපිළිකුල් හැඟීමෙන් වෙසෙනුයේ කෙසේද? අනිෂ්ට වස්තූන් කෙරෙහි මෙත්සිත් හෝ පතුරුවයි, ධාතු වශයෙන් හෝ මෙනෙහි කරයි''[b] යන ආදී නයින් මෙම අර්ථයම විග්‍රහකොට දක්වනලදී. මෙම ඍද්ධිය චේතෝවශීභාවයට පත් ආර්යයන්හටම වනහෙයින් ආර්ය ඍද්ධියයි කියනු ලැබේ.

පක්ෂි ආදීන්ගේ අහස් ගමන් ආදිය 'කම්මවිපාකජඉද්ධි නම්. කියන ලදමැයි:- ''කර්මවිපාකජඍද්ධි නම් කිම? සියලු පක්ෂීන්හටද, සියලු දෙවියන්හටද, ඇතැම් මිනිසුන්හටද, ඇතැම් විනිපාතිකයන් (කුශලකර්මයෙකින් ඉපිද කිසියම් අකුශල කර්මයෙක විපාක විඳිනවුන්) හටද කර්ම විපාකජ ඍද්ධිය වේ.''[c] මෙහි වනාහි ධ්‍යානයෙකින් හෝ විදර්ශනාවෙකින් තොරව සියලු පක්ෂීන්ගේ අහස්ගමන, එසේම සියලු දෙවියන්ගේ හා ඇතැම් ආදිකල්පක මනුෂ්‍යයන්ගේද, එසේම පියංකරමාතාය, උත්තරමාතාය, ඵුස්සමිත්තාය, ධම්මගුත්තාය යන මේ ආදී ඇතැම් විනිපාතිකයන්ගේද අහස් ගමන කර්මවිපාකජඍද්ධියයි. චක්‍රවර්ති ආදීන්ගේ අහසින් යාම ආදිය 'පුඤ්ඤවතෝ ඉද්ධි' (පින්වතුන්ගේ ඍද්ධිය) නම්. කියන ලදමැයි:- ''පින්වතුන්ගේ ඍද්ධිය යනු කිම? චක්‍රවර්ති රජ තෙමේ සිවුරඟ සෙනඟ ගෙන, අසුන් බඳින ගොනුන් බඳින පුරුෂයන් පවා ගෙන අහසින් යයි, ජෝතිය සිටුවරයාහටද, ජටිල සිටුවරයාහටද, මෙණ්ඩක සිටුවරයාහටද, මහපින්වතුන් පස් දෙනාහටද, 'පුඤ්ඤවතො ඉද්ධි' (පින්වතුන්ගේ ඍද්ධිය) විය.[d] සංක්ෂේපයෙන් වනාහි පුණ්‍යසම්භාරය මුහුකුරා ගිය කල්හි ඇතිවන ඍද්ධිවිශේෂය 'පුඤ්ඤවතො ඉද්ධි' (පින්වතුන්ගේ ඍද්ධිය) නම්. මෙහි ජෝතිය සිටුවරයාහට පොළොව විවර කරගෙන මිණිපහයක් පැන නැංගේය, එසේම කප්රුක් සූසැටක්ද පහළ

---

a. එම - part ii 213
b. පටිසම්භිදා, ඉද්ධිකථා - part. ii. 212
c. එම
d. එම.

විය. මේ ඔහුගේ පුණ්‍යමය ඍද්ධියයි. ජටිල සිටුවරයාහට අසූරියන් රන්පව්වෙක් පහළ විය. ඝෝසිත සිටුවරයාහට තමා මැරවීම පිණිස සත් වරක් උපක්‍රම කළ කල්හි පවා යහතින් සිටිනු හැකිවීම ඔහුගේ පුණ්‍යමය ඍද්ධියයි. මෙණ්ඩක සිටුවරයාහට එක් කිරියක් පමණ පෙදෙස්හි රන්මුවා බැටළුවන් සත්දෙනකු පහළවීම ඔහුගේ පුණ්‍යමය ඍද්ධියයි. මහපින්වත්හු පස්දෙනා නම් මෙණ්ඩක සිටුවරයාය, ඔහුගේ බිරිය වූ චන්‍ද්‍රපද්මසිරිය, පුත් ධනඤ්ජය සිටුවරයාය, ලෙහෙලී වූ සුමනාදේවිය, දාස වූ පුණ්ණාය යන මොහුය. ඔවුනතුරෙන් මෙණ්ඩක සිටුවරයා පැන් සනහා අහස දෙස බැලූ විට දොළොස්දහස් පන්සියයක් කොටු අහසින් ආ රත්හැල්වලින් පිරීයයි. භාර්යාව නැලියක පමණ බත් ගෙන මුළු දඹදිව්තල වැසියන් වළඳවත්මුත් බත් අඩු නොවේ. පුත්‍රයා දහසින් බැඳි පියල්ලක් ගෙන මුළු දඹදිව්තල වැසියන්හට දෙත්මුත් කහවණු අඩු නොවේ. ලෙහෙළිය වී ලහසක් ගෙන මුළු දඹදිව්තල වැසියන්හට බෙදත් මුත් ධාන්‍ය ක්‍ෂය නොවේ. දාසයා නඟුල ගෙන සී සාන කල ඒ අතින් සතක්ද, මේ අතින් සතක්දැයි හී මං තුදුසෙක් සෑදෙයි. මේ ඔවුන්ගේ පුණ්‍යමය ඍද්ධියයි. විද්‍යාධරාදීන්ගේ අහස් ගමන් ආදිය විද්‍යාමය ඍද්ධියයි. කියන ලදමැයි:- "විද්‍යාමය ඍද්ධි නම් කවරේද? විද්‍යාධරයෝ විද්‍යාව ජපකොට අහසින් යෙති, අහස්හි ඇතුන් දක්වති, -පෙ-නොයෙක් සෙනාව්‍යුහයන්ද දක්වති"[a] ඒ ඒ සම්‍යක් ප්‍රයෝගයන්ගෙන් ඒ ඒ කාර්යයන්ගේ සාඵල්‍යය, ඒ ඒ තන්හි සම්‍යක් ප්‍රයෝගය (මනාකොට යෙදීම) හේතුකොටගෙන සඵලවීමේ අර්ථයෙන් ඍද්ධි නම් වේ. කියන ලදමැයි:- "නෛෂ්ක්‍රම්‍යය හේතුකොටගෙන කාමච්ඡන්‍දය ප්‍රහීණ කිරීමේ කාර්යය ඉටු වෙති'යි ඒ ඒ තැන සම්‍යක් ප්‍රයෝගය හේතුකොට ගෙන සඵලවීමේ අර්ථයෙන් ඍද්ධි නම්වේ, -පෙ- අර්හත් මාර්ගයෙන් සියලු ක්ලේශයන් ප්‍රහීණ කිරීමේ කාර්යය ඉටු වෙති'යි ඒ ඒ තැන සම්‍යක්ප්‍රයෝගය හේතුකොටගෙන සඵලවීමේ අර්ථයෙන් ඍද්ධි නම් වේ."[b] මෙහි වනාහි ප්‍රතිපත්ති සංඛ්‍යාත වූම සම්‍යක්ප්‍රයෝගය දැක්වීම් වශයෙන් පළමු දැක්වූ පෙළ හා සමානවූම පෙළ ආයේය. අට්ඨකථාවෙහි වනාහි, ගැල් කොටස් එක්කොට ගැලපීම ආදී වශයෙන් යම්කිසි ශිල්පයක්, යම්කිසි වෙදකමක්, වේදත්‍රය අධ්‍යයනයක්, යටත් පිරිසෙයින් සීසෑම් වැපිරීම් ආදියෙහි පටන් ඒ කාර්යය කොට උපන් ඵල විශේෂය ඒ ඒ කාර්යවිෂයෙහි සම්‍යක්ප්‍රයෝගය හේතුකොටගෙන ඉටුවීමේ අර්ථයෙන් ඍද්ධි නම් වෙතැ'යි ආයේය. මෙසේ මේ දශවිධ ඍද්ධීන් අතුරෙන් අධිෂ්ඨාන ඍද්ධියම 'ඉද්ධිවිධාය' යන පදයෙන් අදහස් කරන ලද්දේය, මෙම අර්ථයෙහි වනාහි විකුබ්බන මනෝමය ඍද්ධීන්ද, අභිමත විය යුතුය.

---

a. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part. ii. 213f
b. එම.

ඉද්ධිවිධාය යනු, ඍද්ධි කොට්ඨාසය පිණිස, නොහොත් ඍද්ධි විකල්ප පිණිස, චිත්තං අභිනීහරති අභිනින්නාමෙති යනු, ඒ භික්ෂු තෙමේ කියනලද ප්‍රකාරයෙන් අභිඥාපාදකවූ ඒ සමාධිගත චිත්තය උපන් කල්හි ඍද්ධිවිධඥානය පිණිස එම පරිකර්ම චිත්තය මෙහෙයවයි. කසිණ අරමුණෙන් බැහැරකොට ඉද්ධිවිධඥානය වෙත යොමු කරවයි, 'අභිනින්නාමෙති' යනු ලබාගත යුතු ඍද්ධිය වෙතට යොමු කරවයි, නැඹුරු කරවයි. සො යනු, කරනලද චිත්තාභිනීහාර (සිත් පුහුණු කිරීම්) ඇති භික්ෂු තෙමේයි. අනෙකවිහිතං යනු, නොයෙක් ආකාර ඇති, නොයෙක් ප්‍රකාර සහිත, ඉද්ධිවිධං යනු, ඍද්ධිකොට්ඨාසයි, පච්චනුභොති යනු අත්විඳියි, අත්දකියි, නාමකාය වශයෙන් ස්පර්ශ කරයි, සාක්ෂාත් කරයි, පැමිණෙයි යන අර්ථයි. දැන් මේ ඍද්ධිවිධඥානය අනේකප්‍රකාර සහිතබව දක්වන්නාහු 'එකොපි හුත්වා' යන ආදිය කීහු.

එහි, එකොපි හුත්වා යනු ඍද්ධික්‍රියාවෙන් පෙර, ප්‍රකෘතියෙන් එක් පුද්ගලයකු වශයෙන් සිට, බහුධා හොති යනු, බොහෝ දෙනා ඉදිරියෙහි සක්මන් කරනු කැමැතිව හෝ, පිරිවහනු කැමැතිව හෝ, පැන විමසනු කැමැතිව හෝ සියක් දෙනකු, දහසක් දෙනකු ලෙස දිස් වෙයි. මෙය කෙසේ මේ ආකාරයෙන් සිදුවේද යත්, ඍද්ධිය පිළිබඳ භූමි සතරද, පාද සතරද, පියවර අටද, මුල් සොළොසද සම්පාදනය කොට ඥානයෙන් අදිටන් කිරීමෙනි. එහි, ඍද්ධි සතර නම් ධ්‍යාන සතරයයි දතයුතුය. ධර්මසේනාපතීන් (සැරියුත් තෙරුන්) විසින් මෙසේ කියන ලදිඃ- ''ඍද්ධිය පිළිබඳ භූමි සතර කවරේද? විවේකජ භූමිවන ප්‍රථමධ්‍යානය, ප්‍රීතිසුඛභූමි වන ද්විතීයධ්‍යානය, උපේක්ෂාසුඛභූමි වන තෘතීය ධ්‍යානය, අදුඃඛමසුඛ භූමිවන චතුර්ත්‍ථධ්‍යානය යන මේයි. මේ සතර භූමීහු ඍද්ධිලාභය පිණිස, ඍද්ධිප්‍රතිලාභය පිණිස, ඍද්ධික්‍රියා කරනු පිණිස, ඍද්ධිමහිමය දැක්වීම පිණිස, ඍද්ධිවිෂයෙහි හුරුපුරුදු බව පිණිස, ඍද්ධිවිෂයෙහි බුහුටිබව පිණිස, පවත්නාහුය. මෙහි පළමු ධ්‍යානත්‍රයය ප්‍රීතිය පැතිරවීමෙන්ද, සුඛය පැතිරවීමෙන්ද, සුඛසංඥාවට හා ලඝුසංඥාවට එළඹ ලඝුවූද, මෘදුවූද කර්මණ්‍යවූද කය ඇතිව ඍද්ධිය ට පැමිණෙන හෙයින්, මේ ආකාරයෙන් ඍද්ධිලාභය පිණිස පවත්නා හෙයින් 'සම්භාරභූමි' යයි දතයුතුය. චතුර්ත්‍ථධ්‍යානය වනාහි ඍද්ධිලාභය පිළිබඳ 'ප්‍රකෘතිභූමි' වේ.

පාද සතර යනු, සතර ඍද්ධිපාදයයි දතයුතුය, කියන ලදමැයිඃ- ''ඍද්ධිය පිළිබඳ පාද සතර කවරේද? මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ඡන්දසමාධිය ප්‍රධාන සංස්කාරය කොටඇති ඍද්ධිපාදය වඩයි, විරිය -පෙ- චිත්ත-පෙ-වීමංස සමාධිය ප්‍රධාන සංස්කාරය කොටඇති ඍද්ධිපාදය වඩයි, ඍද්ධිය පිළිබඳ මේ පාද සතර ඍද්ධිලාභය පිණිස-පෙ-ඍද්ධි වෛශාරද්‍යය පිණිස පවත්නේය''[a] මෙහි වනාහි (කත්තුකම්‍යතා) ඡන්දය හේතුකොට ඇති,

a. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii. 205

නොහොත් ඡන්දය අධිකකොට ඇති සමාධිය ඡන්දසමාධි නම්. කත්තුකම්‍යතා ඡන්දය (කරනු කැමැතිබව) අධිපති කොට ලබන සමාධියට මේ අධිවචනයි. ප්‍රධාන ස්වරූප ඇති සංස්කාරයෝ පධානසංඛාර නම් වෙති, කෘත්‍ය සතර සිද්ධකරන සම්‍යක්ප්‍රධාන වීර්යයට මේ අධිවචනයි. සමන්නාගතං යනු, ඡන්දසමාධියෙන්ද, ප්‍රධාන සංස්කාරයන්ගෙන්ද යුක්තවූයි. ඉද්ධිපාදං යනු, නිෂ්පත්ති පර්යාය වශයෙන් හෝ සඵල වීම් අරුතින්, මෙය කරණකොටගෙන සත්වයෝ සමෘද්ධ වෙති, මෙය කරණකොටගෙන සත්වයෝ සමෘද්ධියට, වෘද්ධියට, උසස්බවට යෙති'යි යන මේ අරුතින් හෝ 'ඍද්ධි'ය යන ව්‍යවහාරයට පැමිණි අභිඥා චිත්තයෙන් සමන්විතවූ ඡන්දසමාධිය ප්‍රධානකොට ඇති. සංස්කාරයන්හට අධිෂ්ඨානාර්ථයෙන් පාදකවූ සෙසු චිත්ත චෛතසික සමූහය'යි යන අර්ථයි. කියන ලද මැයි:- ''ඉද්ධිපාද යනු, ඒ ආකාරයෙන් (ඡන්දාදී ධර්මයන් ලැබ) සිටියහුගේ වේදනාස්කන්ධයයි, -පෙ-විඤ්ඤාණස්කන්ධයයි''[a] නොහොත්, මෙයින් පදවනු ලැබෙති'යි පාද නම්. පමුණුවනු ලැබෙති'යි යන අර්ථයි. ඍද්ධිය පිළිබඳ පාදය 'ඉද්ධිපාද' නම්. ඡන්දාදියට මේ අධිවචනයි. යම්සේ කියනලදද:- ''මහණෙනි, ඉදින් භික්ෂු තෙමේ ඡන්දය නිසා සමාධියක්, චිත්තෛකාග්‍රතාවක් ලබා නම්, එම ඡන්දසමාධියය කියනු ලැබේ. ඒ භික්ෂු තෙමේ නූපන් පාපයන් -පෙ- වීර්ය කෙරේ නම් මේ පධානසංඛාරයයි කියනු ලැබේ. මෙසේ මේ ඡන්දයද, මේ සමාධියද, මේ පධානසංඛාරයෝද (යන සියල්ලම) ඡන්දසමාධිපධාන සංඛාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදයයි කියනුවෙති.''[b] සෙසු ඍද්ධිපාදයන්ගේද අර්ථය මේ ආකාරයෙන්ම දතයුතුය. අට්ඨපදානි යනු ඡන්දාදී අටයයි දතයුතුය. කියන ලදමැයි:- ''ඍද්ධිය පිළිබඳ පද අට කවරේද? ඉදින් භික්ෂු තෙමේ ඡන්දය නිසා සමාධියක් ලබා නම්, චිත්තෛකාග්‍රතාවක් ලබා නම්, එම ඡන්දය සමාධි නොවේ, සමාධිය ඡන්ද, නොවේ. ඡන්දය එකෙකි, සමාධිය අනෙකෙකි, ඉදින් භික්ෂු තෙමේ වීර්යය නිසා -පෙ- ඉදින් භික්ෂු තෙමේ චිත්තය -පෙ-ඉදින් භික්ෂු තෙමේ වීමංසය නිසා සමාධියක් ලබා නම්, චිත්තෛකාග්‍රතාවක් ලබා නම්, එම වීමංසය සමාධි නොවේ. එම සමාධිය විමංස නොවේ, වීමංසය එකෙකි, සමාධිය අනෙකෙකි, ඍද්ධිය පිළිබඳවූ මේ පද අට ඍද්ධිලාභය පිණිස, -පෙ-ඍද්ධිවෛශාරද්‍යය පිණිස පවත්නේය[c]. මෙහි වනාහි ඍද්ධිය ඉපැදවීම පිණිස වූ ඡන්දය (කැමැතිබව) සමාධිය හා සමග එක්ව යෙදුණේම ඍද්ධිලාභය පිණිස පවතී, විරියාදියද එසේය, එහෙයින් මේ පද අට කියන ලදැ'යි දතයුතුය.

සොළසමූලානි යනු සොළොස් ආකාරයෙකින් සිතෙහි ඇතිවන ආනෙඤ්ජතාව (නොසැලෙන බව) යයි දතයුතුය, කියන ලදමැයි:- ''ඍද්ධියෙහි මුල් කෙතෙක්ද? මුල් සොළොසෙකි, අනවනත (පහළට

---

a. ඉද්ධිපාදවිභඞ්ග, සුත්තන්තභාජනීය - Vbh 217

b. සං. නි. මහාවග්ග - Sv 268

c. පටිසම්භිදා, ඉද්ධිකථා - part ii 205f

නොනැමුණු) චිත්තය කුසීත බවින් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, අනුන්නත (ඉහළට නොනැමුණු) චිත්තය නොසන්සුන් බවින් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, අනභිනත (නොඇලුණු) චිත්තය රාගයෙන් සසල නොවෙතිය'යි ආනෙඤ්ජ නම්, අනපනත (නොරුස්නා බවින් මිදුණු) චිත්තය ව්‍යාපාදයෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, අනිස්සිත (තමා වෙතට නොනැඹුරු) චිත්තය ආත්මදෘෂ්ටියෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, අප්පටිබද්ධ (පිළිබඳ නොවූ) චිත්තය ඡන්දරාගයෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, විප්පමුත්ත (කෙලෙසුන්ගෙන් මිදුණු) චිත්තය කාමරාගයෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, විසංයුත්ත (කෙලෙසුන් හා නොබැඳුණු) චිත්තය කෙලෙසුන්ගෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, විමරියාදීකත (කෙලෙස් ඉම්වලින් බැහැරවූ) චිත්තය කෙලෙස් සීමාවන්ගෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජනම්, ඒකත්තගත (එකඟබවට ගිය) චිත්තය නානත්ව ක්ලේශයන්ගෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්. සද්ධා පරිග්ගහිත (සැදැහැයෙන් බැඳුණු) චිත්තය නොසැදැහැයෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, පඤ්ඤාපරිග්ගහිත (ප්‍රඥාවෙන් සැදි) චිත්තය අවිද්‍යාවෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්, ඕභාසගත (ආලෝකවත්) චිත්තය අවිද්‍යාන්ධකාරයෙන් සසල නොවෙති'යි ආනෙඤ්ජ නම්. ඍද්ධිය පිළිබඳවූ මේ මුල් සොළොස ඍද්ධිලාභය පිණිස -පෙ-ඍද්ධිවිෂයෙහි බුහුටි බව පිණිස පවතී.[a]

ඒකාන්තයෙන්ම මෙම අර්ථය 'එවං සමාහිතෙ චිත්තෙ' යන ආදියෙන්ද ප්‍රකාශිත වූයේමය. ප්‍රථමධ්‍යානාදිය පිළිබඳවූ ඍද්ධියට භූමි-පාද-පද-මූලයන් වන බව දක්වනුවස් නැවත කියන ලදි. මෙහි පළමුව දක්වන ලදුයේ සූත්‍රධර්මයෙහි ආ නයයි. මේ (දෙවනුව දක්වන ලදුයේ) පටිසම්භිදාවෙහි ආ නයයි, දෙතන්හි මුළා නොවනු පිණිසද මෙසේ යලිදු කියනලදි.

ඤාණෙන අධිට්ඨහනෙතා යනු, ඒ මේ යෝගාවචර තෙමේ ඍද්ධිය භූමි-පාද-පද-මූලවූ මේ ධර්මයන් සම්පාදනය කොටගෙන අභිඥාපාදක ධ්‍යානයට සමවැද ඉන් නැඟී, ඉදින් සියක් දෙනකු බවට පත්වනු කැමැත්තේ නම්, 'සතං හොමි, සතං හොමි'යි පිරියම් කොට, යළි අභිඥාපාදකධ්‍යානයට සමවැද ඉන් නැඟී අධිෂ්ඨාන කරයි. එම අධිෂ්ඨාන චිත්තය හා සමගම සියක් දෙනකු බවට පත්වේ. දහසක් දෙනකු ආදි තන්හිදු මෙම නයයි. ඉදින් මෙසේ සිද්ධ නොවේනම්, යලිදු පිරියම් කොට දෙවනුවත් සමවැද ඉන් නැඟී අධිෂ්ඨාන කළයුතුය. සංයුත්තනිකායට්ඨකථාවෙහි[a] එක් වරක් දෙවරක් සමවදිනු වටීයයි කියනලදි.

a. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii 206

එහි පාදකධ්‍යානචිත්තය නිමිත්ත අරමුණුකොට වන්නේය, පරිකර්මචිත්තය සියක් දෙනකු දහසක් දෙනකු අරමුණු කොට වන්නේය. තවද එම පරිකර්මචිත්තය වනාහි තමා විසින් පරිකල්පිත රූපවශයෙන් මිස සත්‍වප්‍රඥප්ති වශයෙන් නොවන්නේය. අධිෂ්ඨාන චිත්තයද, එසේම සියක් දෙනකු හෝ දහසක් දෙනකු හෝ අරමුණුකොට වන්නේය. එය යටකී අර්පණා චිත්තය මෙන් ගෝත්‍රභූ චිත්තයට අනතුරුව එක්ම රූපාවචර චතුර්ත්‍ථධ්‍යානික චිත්තයක් වශයෙන් උපදනේය. පටිසම්භිදාවෙහි එය මෙසේ කියන ලදි:- ''ප්‍රකෘතියෙන් එක් පුද්ගලයෙක් වූයේ බොහෝ පුද්ගලයන් වශයෙන්, සියය් දෙනකු, දහසක් දෙනකු හෝ සුවහසක් දෙනකු වශයෙන් ආවර්ජනය කරයි, ආවර්ජනය කොට 'බොහෝ දෙනෙක් වෙමි'යි ඥානයෙන් අධිෂ්ඨාන කරයි. බොහෝ දෙනෙකු බවට පත් වෙයි. ආයුෂ්මත් චූල්ලපන්‍ථක තෙරුන් මෙනි.''[b]

එහි, ආවජ්ජෙති යනු, පරිකර්ම වශයෙන්ම කියන ලදි. 'ආවජ්ජිත්‍වා ඤාණෙන අධිට්ඨාති' යනු අභිඥා ඥානවශයෙන් කියනලදි. එහෙයින් බොහෝ දෙනකු වශයෙන් ආවර්ජනය කරයි, ඉක්බිති එම පරිකර්ම චිත්තයනට අනතුරුවද සමවදියි, සමවැදීමෙන් නැඟී යළිත් 'බොහෝ දෙනෙක් වෙමි'යි ආවර්ජනයකොට, ඉන් අනතුරුව පවත්වනලද පූර්වභාග චිත්තයන් තුනකට හෝ සතරකට පසුව උපන්, සනිටුහන් කිරීමේ හේතුවෙන් 'අධිට්ඨාන'යයි නම්ලද එක්ම අභිඥාඥානයෙන් අධිෂ්ඨාන කෙරේය'යි මෙසේ මෙහි අර්ත්‍ථය දතයුතුය. 'යථා ආයස්මා චූලපන්‍ථකො'යි යමක් කියන ලද්දේද එය බහුවිධභාවයට කායසාක්ෂි දක්වනු පිණිස කියනලදි. එය වනාහි කථා වස්තුවෙන් පැහැදිලි කළ යුතුයඃ- එම දෙබෑයෝ වනාහි මඟදී උපන් හෙයින් 'පන්‍ථක' යන නම ලැබූහ. දෙටු බෑයෝ මහාපන්‍ථක නම් වූහ. ඔහු පැවිදිව පිළිසිඹියා සහිත රහත් බවට පත්වූහ. රහත්ව චූලපන්‍ථකයන් පැවිදි කරවා,

''පදුමං යථා කොකනදං සුගන්‍ධං
පාතො සියා ඵුල්ලමවීතගන්‍ධං
අඞ්ගීරසං පස්ස විරොචමානං
තපන්‍තමාදිච්චමිවන්‍තලික්ඛෙ''[c]

'යම්සේ සුවඳහමන රත්පියුමක් උදෑසන සුපිපියේ පහනොවූ සුවඳ ඇත්තේ වේද, එසේම ගුණසුවඳ වහනය කරමින් අහස් මැද දිලෙන හිරු සෙයින් බබලන අංගීරසයන් වහන්සේ දෙස බලව.' යන මේ ගාථාව වාචෝද්ගත කරනු පිණිස දුන්හ.

---

a. හෙලටුවා
b. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii 207
c. අං. නි., පඤ්චක නිපාත - A iii 239

චූලපන්ථකයෝ එය සිවුමසෙකිනුදු ප්‍රගුණ කර ගැනීමට නොසමත් වූහ. ඉක්බිති තෙරණුවෝ, 'ඔබ ශාසනයට යෝග්‍ය නොවෙති'යි විහාරයෙන් නෙරපූහ. එවකට තෙරණුවෝ භත්තුද්දේසක (දානය පිළිබඳ කටයුතු මෙහෙයවීමේ) තනතුර දැරූහ. ජීවකයෝ තෙරුන් වෙත එළඹ, ''ස්වාමීනි, හෙට භාග්‍යවතුන් වහන්සේ සමග භික්ෂූන් පන්සිය නමක් රැගෙන අපගේ ගෙහි භික්ෂාව පිළිගනු මැනවැ''යි ඇරයුම් කළහ. තෙරණුවෝ 'චූලපන්ථකයන් හැර සෙසු භික්ෂූන් වෙනුවෙන් පිළිගනිමු'යි ඇරියුම පිළිගත්හ. චූලපන්ථකයෝ දොරටුව අසල හඬමින් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ එපවත් දිවැසින් දැක ඔවුන් වෙත එළඹ, 'කවර හෙයින් හඬවුදැ'යි විමසූහ. ඔහු එම පුවත සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ, 'වනපොත් කිරීමට නොසමත්හු මාගේ ශාසනයෙහි අභව්‍යයෝ (නොසුදුස්සෝ) නම් නොවෙති, ශෝක නොකරවු'යි ඔවුන් අත් ගෙන විහාරයට ඇතුල් කොට, ඍද්ධිබලයෙන් රෙදිකඩක් මවාදී 'මහණ මෙහි බලනුය, මේ රෙදිකඩ පිරිමදිමින් ''රජොහරණං, රජොහරණං'' යනුවෙන් නැවත නැවතත් පිරිවහනුය'යි කීසේක. ඔවුන් එසේ කරන කල එය දුර්වර්ණ විය. ඔහු 'වස්ත්‍රය පිරිසුදුය, මෙහි දෙසෙක් නැත, මේ සිරුරෙහිම දොසැ'යි යන හැඟීම ලැබ පංචස්කන්ධ විෂයෙහි ඥානය මෙහෙයවා විදර්ශනා වඩා පිළිවෙළින් එම ඥානය ගෝත්‍රභූ චිත්තය සමීපයට පැමිණවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ ඕභාස (මඟ හෙළි කරන) ගාථාවන් වදාළ සේක:-

රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජො'ති
එතං රජං විප්පජහිත්‍වා පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ

රාගය රජසෙකි හෙවත් කිලුටෙකි, (ආර්යවිනයෙහි) දූවිලි රජස්යයි නොකියනු ලැබේ. 'රජස්' යන මෙය එහි රාගයට අධිවචනයෙකි. පණ්ඩිතයෝ මේ රාග නමැති රජස දුර හැර පහකළ රජස් ඇති බුදුන්ගේ ශාසනයෙහි විහරණය කෙරෙති.

දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජො'ති
එතං රජං විප්පජහිත්‍වා පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ

ද්වෙෂය රජසෙකි හෙවත් කිලුටෙකි, දූවිලි රජස්යයි නොකියනු ලැබේ, (ආර්යවිනයෙහි) 'රජස්' යන මෙය ද්වේෂයට අධිවචනයෙකි. පණ්ඩිතයෝ මේ ද්වේෂ නමැති රජස දුර හැර බුදුන්ගේ ශාසනයෙහි විහරණය කෙරෙති.

මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජො'ති
එතං රජං විප්පජහිත්ව පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ[a]

මෝහය රජසෙකි හෙවත් කිලුටෙකි, දූවිලි 'රජස්' යයි නොකියනු ලැබේ, (ආර්යවිනයෙහි) 'රජස්' යන මෙය මෝහයට අධිවචනයෙකි. පණ්ඩිතයෝ මේ මෝහ නමැති රජස දුර හැර බුදුන්ගේ ශාසනයෙහි විහරණය කෙරෙති.

ගාථාවසානයෙහි ඔවුන්හට චතුපටිසම්භිදා හා ෂඩ් අභිඥා පිරිවර කොට ඇති නවලෝකෝත්තර ධර්මයෝ අත් පත් වූහ. ශාස්තෲන් වහන්සේ භික්ෂුසංඝයා හා සමග ජීවකයන්ගේ ගෙට වැඩිසේක, එහිදී පැන් පිළිගැන්වීමෙන් අනතුරුව කැඳ පිළිගන්වනවිට පාත්‍රය වැසූසේක. ජීවකයෝ 'කිමෙක්ද ස්වාමීනි?'යි විමසූහ. 'විහාරයෙහි එක් භික්ෂු කෙනකු ඇතැ'යි කීසේක. ජීවකයෝ 'ආර්යයන්වහන්සේ කැඳවාගෙන වහා එව'යි පුරුෂයකු යැවූහ. භාග්‍යවතුන්වහන්සේ විහාරයෙන් නික්ම වැඩි කල්හිː-

සහස්සක්ඛත්තුං අත්තානං නිම්මිනිත්වාන පන්ථකො
නිසීදම්බවනෙ රම්මෙ යාවකාලප්පවෙදනා[b]

පන්ථක තෙරණුවෝ තමන් දහස් ගුණකොට මවාගෙන කාලය දන්වන තුරු මනරම් අඹ වෙනෙහි හුන්හ.

ඉක්බිති ඒ පුරුෂයා ගොස් කසාවතින් ඒකාලෝකවූ ආරාමය දැක පෙරළා අවුත්, ''ස්වාමීනි, ආරාමය භික්ෂූන්ගෙන් පිරීගියේය, ඒ ආර්යයන් වහන්සේ කවුරුදැ'යි මම නොදනිමි'යි කීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ, ''යව, යම් කෙනකු පළමුකොට දක්නෙහිද, ඔවුන්ගේ සිවුරුකොණ ගෙන, 'ශාස්තෲන් වහන්සේ ඔබ කැඳවන සේකැ'යි කියා ගෙනෙව'යි ඔහුට කීසේක. හේ තෙමේ ගොස් තෙරුන්ගේම සිවුරුකොණ අල්ලා ගති. එ කෙණෙහිම මවනලද සියල්ලෝම අතුරුදන් වූහ. තෙරණුවෝ, ''ඔබ යනුයැ'යි ඔහු පිටත් කොට මුවදෙවීම් ආදී සිරුරුකිස නිමවා ඔහුට පෙරාතුව ගොස් ඉතිරිව තුබූ අස්නෙහි හුන්නාහ. ආයුෂ්මත් චූලපන්ථකයන්වහන්සේ මෙනි'යි කියනලදුයේ මේ පුවත සඳහාය. එහි, යම් බොහෝ දෙනෙක් මවන ලද්දාහුද, ඔවුන් අනියමයෙන් මවනලද හෙයින් ඍද්ධිමතුන් හා සමානම වෙති. සිටීම් හිඳීම් ආදිය වේවා, බිණීම් නොබිණීම් ආදිය හෝ වේවා, ඍද්ධිමත්හු යම් යම් දෙයක් කෙරෙත්ද, ඒ ඒ දෙයම කෙරෙති. ඉදින්

a. මහානිද්දෙස - Nd i 505
b. ථෙරගාථා - Thl 563

නොයෙක් ආකාර ඇත්තන් මවනු කැමැති වෙත්ද, පළමු වියෙහි වූවන්, මැදිවියෙහි වූවන්, මහලු වියෙහි වූවන්, එසේම දික්කෙස් ඇත්තන්, තරමක් මුඩු වූවන්, මුඬු වූවන්, කළු සුදු මුසු කෙස් ඇත්තන්, තරමක් රත්පැහැ සිවුරු ඇත්තන්, කසාවන් සිවුරු ඇත්තන්, පදබිණීම්, දම් දෙසීම්, මිහිරි කොට දෙසීම්, පැන පිළිවිසීම්, පැන විසඳීම්, පඬුපෙවීම්, පඬු තැම්බීම්, සිවුරුමැසීම්, සේදීම් ආදිය කරන්නන්, තවද නානා ආකාර ඇත්තන් මවනු කැමැති වෙත්ද, ඔවුන් විසින් පාදකධ්‍යානයෙන් නැඟී, 'මෙපමණ භික්‍ෂූහු පළමු වියෙහි වෙත්වා, ආදී වශයෙන් පිරියම්කොට යළි සමවැද, ඉන් නැඟී අධිෂ්ඨාන කළ යුතුය. අධිෂ්ඨාන චිත්තය හා සමග කැමැති කැමැති ආකාර ඇත්තෝ වෙති. බහුධාපි හුත්වා එකො හොති' (බහුවිධ වූයේද, එක් පුද්ගලයෙක් වේ) යන ආදියෙහිද මෙම නයයි.

මේ විශේෂයි:- මේ භික්‍ෂුව විසින් මේ ආකාරයෙන් බොහෝබවක් මවාගෙන නැවත, 'එක් පුද්ගලයෙක්වම සක්මන් කරමි, පිරිවැහීම් කරමි, ප්‍රශ්න විචාරමි'යි සිතා හෝ, 'මේ විහාරය භික්‍ෂූන් ස්වල්ප දෙනෙකු ඇත්තෙකි, ඉදින් කිසිවකු ආවහොත්, 'එක සමානවූ මෙපමණ භික්‍ෂූහු කොයින්ද? ඒකාන්තයෙන් මේ තෙරුන්ගේ ආනුභාවයයි දැනගනිති'යි අල්පේච්ඡතාව නිසා හෝ අතරතුරදීම 'එක් පුද්ගලයෙක් වෙමි'යි කැමැතිව පාදකධ්‍යානයට සමවැද, එයින් නැඟී, 'එක් පුද්ගලයෙක් වෙමි'යි අධිෂ්ඨාන කළයුතුය, අධිෂ්ඨාන චිත්තය හා සමගම එක් පුද්ගලයකු බවට පත් වේ. මෙසේ නොකොට සිටියද, පිරිසිඳි කාලය අනුව (එම කාලසීමාව ඉකුත් වන්නා හාම) එක් පුද්ගලයකු බවට පත්වේ.

ආවීභාවං තිරොභාවං යනු, පහළ වීමය, මුවහ වීමය යන මේ අර්ථයි. මෙයම සඳහා පටිසම්භිදාවෙහි, 'ආවීභාවං' යනු කිසිවෙකින් මුවහ නොවූයේ, නොවැසුණේ, විවෘත වූයේ ප්‍රකට වූයේයි, තිරොභාවං' යනු, කිසිවෙකින් මුවහ වූයේ, වැසුණේ, සැඟවුණේ අප්‍රකට වූයේය'යි කියනලදී.[a] එහි, මේ සෘද්ධිමත් යෝගාවචර තෙමේ පහළවනු කැමැති වූවිට අන්ධකාරය ආලෝකයක් කරයි, කෙසේද යත්:- මේ යෝගාවචර තෙමේ මුවහවූයේ හෝ දුර සිටියේ හෝ යම්සේ දිස්වේද, තමා හෝ වේවා අනිකකු හෝ වේවා, එසේ කරනු කැමැතිවූවිට පාදකධ්‍යානයෙන් නැඟී 'මේ අන්ධකාරස්ථානය ආලෝකවත් වේවා'යි හෝ 'මේ වැසී ඇති දෙය විවෘත වේවා'යි හෝ, මේ ඇස් හමු නොවූ දෙය ඇස් හමු වේවා'යි ආවර්ජනයකොට පිරියම්කොට කියනලද නයින්ම අධිෂ්ඨාන කරයි, එම අධිෂ්ඨානය හා සමගම අධිෂ්ඨිත ආකාරයෙන්ම සිදුවෙයි. අන්‍යයෝ දුර සිටියාහුද දකිති, තෙමේද දකිනු කැමැත්තේ නම් දකියි. මෙම ප්‍රාතිහාර්යය කවුරුන් විසින් කරන ලද්දේද? භාග්‍යවතුන් වහන්සේ විසිනි.

a. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii 207

භාග්‍යවතුන් වහන්සේ වනාහි චූලසුභද්‍රාවන් විසින් ඇරියුම් කරන ලදසේක් විස්කම් දෙව්පුතු විසින් මවනලද කූටාගාර පන්සියයෙකින් සැවැත් නුවර සිට සත් යොදුනක් ඇතුළත සාකේත නුවරට වඩින සේක්, යම්සේ සාකේත නුවර වැසියෝ සැවැත් නුවර වැසියන් දකිත්ද, සැවැත් නුවර වැසියෝද සාකේත නුවර වැසියන් දකිත්ද, එසේ අධිෂ්ඨාන කළසේක, තවද නගරමධ්‍යයෙහි බැස පොළොව දෙබෑකොට අවීචිය දක්වාද, අහස දෙබෑකොට බඹලොව දක්වාද පෙන්වූ සේක.

තවද, දේවාවරෝහණයෙන් (දෙවියන් හා සමඟ පොළොවට බැසීමෙන්)ද මේ කරුණ විස්තර කළයුතුවේ:- භාග්‍යවතුන් වහන්සේ වනාහි යමාමහ පෙළහර කොට, අසූහාර දහසක් සංසාර බන්ධනයෙන් මුදවා, ''අතීතබුදුවරයෝ යමාමහපෙළහර අවසන්හි කොහි ගියාහුදැ''යි ආවර්ජනයකොට 'තව්තිසාබවනට ගියහ'යි දුටුසේක. ඉක්බිති එක් පයෙකින් පොළෝමත සිට දෙවන පය යුගඳුරුපවුමත තබා යළි පළමු පය ඔසවා මහමෙරමත තබා එහි පඬුපුල් සලතෙලෙහි සිට වස් එළඹ, රැස්වූ දසදහසක් සක්වළ දෙවියනට මුල පටන් බිජම් දෙසුම් ඇරඹිසේක. පිඬු පිණිස හැසිරෙන වේලාවෙහිදී බුදුරුවක් මැවූසේක, එම (නිර්මිත) බුදුවරයා දහම් දෙසද්දී, භාග්‍යවතුන් වහන්සේ නාලිය දැහැටි සපා අනෝතත් විලෙහි මුව දොවා උතුරුකුරු දිවයිනෙන් පිණ්ඩපාතය ලැබ අනෝතත්විල්තෙර හිඳ වළඳනසේක, සැරියුත් තෙරණුවෝ එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ වඳිත්, භාග්‍යවතුන් වහන්සේ, ''අද මෙතෙක් දහම් දෙසීමි'යි තෙරුන්හට දේශනානය පැහැදිලි කරනසේක. මේ ආකාරයෙන් තෙමසක් මුළුල්ලෙහි නොකඩවා අභිධර්මය දේශනාකළසේක, එය ඇසූ අසූ කෙළක් දෙවියනට ධර්මාභිසමය විය. යමාමහපෙළහරෙහිදී රැස්ව දොළොස් යොදුන් තැන් පැතිර සිටි ජනයාද, 'භාග්‍යවතුන් වහන්සේ දැක ගෙනම පෙරළා යන්නමු'යි කඳවුරු බැඳ සිටගත්හ. එම පිරිසට චුල්ල අනාථපිණ්ඩික (අනාථපිණ්ඩික සිටුවරයාගේ මලණු) සිටුවරයාම සියලු ප්‍රත්‍යයෙන් සංග්‍රහ කළහ. ජනයා භාග්‍යවතුන් වහන්සේ කොහිදැ'යි දැන ගනු පිණිස අනුරුද්ධ තෙරුන්හට ඇවිටිලි කළහ. තෙරණුවෝ ආලෝක කසිණය වඩා එහි වස් එළඹ සිටි භාග්‍යවතුන් වහන්සේ වඳිනු කැමතිව මහමුගලන් තෙරුන්හට ආයාචනා කළහ. තෙරණුවෝ පිරිස් මැද්දෙහිම මහපොළොව කිමිද මේරු පර්වතය විනිවිද ගොස් තථාගතයන් වහන්සේගේ පාමුල සිරිපා වැඳගෙනම මතුවී භාග්‍යවතුන් වහන්සේට, 'ස්වාමීනි, දඹදිව්වැස්සෝ භාග්‍යවතුන් වහන්සේ දැක සිරිපා වැඳගෙනම යන්නමු'යි කියති'යි මෙපවත් පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ, 'මොග්ගල්ලානය, ඔබ දෙටුබෑ දම්සෙනෙවි (සාරිපුත්ත)යන් කොහිදැ'යි විචාළසේක. 'ස්වාමීනි, සංකස්ස නුවරය'යි කීහ. 'මොග්ගල්ලානය, මා දක්නා කැමැත්තෝ හෙට සංකස්ස නුවරට එත්වා, හෙට මහාපවාරණ පුන්පොහෝදින මම සංකස්ස නුවරට බසින්නෙමි'යි පැවසූසේක.

තෙරණුවෝ, 'යහපති ස්වාමීනි'යි භාග්‍යවතුන් වහන්සේ වැඳ ගියමගින්ම පෙරළා අවුත් මහජනයා වෙතට පැමිණියාහ. යන එන දෙකල්හිම ජනයාට පෙනෙනසේ අධිෂ්ඨාන කළහ. මෙහිදී වනාහි මුගලන් තෙරණුවෝ මේ ආවිභාවප්‍රාතිහාර්යය කළහ. මෙසේ පෙරළා පැමිණි තෙරණුවෝ එපවත් සැලකොට, 'දුරෙකැ'යි' යන හැඟීම නැතිව උදෑසන ආහාර ගෙනම නික්මෙවු'යයි පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ 'හෙට මිනිස් ලොවට යමි'යි සක්දෙව් රජුහට සැල කළසේක.

දෙව්රජ තෙමේ විස්කම් දෙව්පුතු කැඳවා, 'දරුව. භාග්‍යවතුන් වහන්සේ හෙට මිනිස් ලොවට යනු කැමැතිසේක, රන්මුවා එකක්ද, රිදීමුවා එකක්ද, මිණිමුවා එකක්දැ'යි හිණිපෙළ තුනක් මවනුය'යි අණ කළේය. හේ තෙමේ එසේ කළේය. භාග්‍යවතුන් වහන්සේ පසු දින මේරුමස්තකයෙහි සිට පෙරදිග ලෝකධාතුන් බැලූසේක, නොයෙක් දහස් ගණන් සක්වළ විවෘතව එක්ම අංගණයක් සෙයින් ප්‍රකටවිය. පෙරදිග දුටු නියායෙන්ම අපර දිගද, උතුරුදිගද, දකුණුදිගද සියල්ල විවෘතව දුටුසේක, යටිදිශාවෙන් අවීචිය දක්වාද, උඩුදිශාවෙන් අකනිෂ්ට භවනය දක්වාද දුටුසේක.

එදවස්හි ලෝකවිවරණය (ලෝකය විවෘතවීම) සිදුවූයේමය, මනුෂ්‍යයෝ දෙවියන් දකිති, දෙවියෝද මනුෂ්‍යයන් දකිති, එහිදී මනුෂ්‍යයෝ උඩ නොබලති, දෙවියෝද මනුෂ්‍යයන් දකිති, එහිදී මනුෂ්‍යයෝ උඩ නොබලති, දෙවියෝද බිම නොබලති, සියල්ලෝම ඔවුනොවුන් කෙලින්ම මුහුණට (සම්මුඛා) මුහුණ දකිති. භාග්‍යවතුන් වහන්සේ මැද මිණිමුවා හිණිපෙළින් බසිනසේක, කාමාවචර සදෙව්ලෝ වැසි දෙවියෝ වම්පස රන්මුවා හිණිපෙළින්ද මහබඹු ඇතුළු සුද්ධාවාස වැස්සෝ දකුණුපස රිදීමුවා හිණිපෙළින්ද බසිති. සක්දෙව්රජ පාසිවුරු ගති, මහබඹු තුන්යොදුන් සේසතක්ද සුයාම දෙව්රජ වල්විදුනාවක්ද, පන්සිළු තුන්ගවුපමණවූ බේලුවපණ්ඩු වීණාවද ගෙන තථාගතයන් වහන්සේට පූජා පවත්වමින් බසිති. එදින භාග්‍යවතුන් වහන්සේ දැක බුදුබව පිණිස රිසි නූපදවා සිටි සත්වයෙක් නම් නැත. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ මෙම ආවිභාව ප්‍රාතිහාර්යය පැවැත්වූසේක.

තවද, තම්බපණ්ණි දිවයිනෙහි තලගුරුපවුවැසි ධම්මදින්න තෙරණුවෝද තිස්ස මහාවිහාරයෙහි සෑමළුවෙහි හිඳ, 'තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකං පටිපදං පටිපන්නො හොති'[a] (මහණෙනි, කරුණු තුනෙකින් සමන්විත වූ මහණ තෙමේ නිරවද්‍ය ප්‍රතිපදාවට පිළිපන්නේ වේ) යනුවෙන් අපණ්ණක සූත්‍රය දේශනා කරමින් විජිනිපත යටිකුරුව දිගුකළහ, අවීචිය දක්වා එක් යායක් සේ දිස්විය,

---

a. අං. නි., තිකනිපාත - A i 113

ඉක්බිති උඩුකුරුව දිගුකළහ, බඹලොව දක්වා එක් යායක් සේ දිස්විය. තෙරණුවෝ නිරයභයින් තැතිගන්වා. සග සැපතින් පොළඹවා දම් දෙසූහ. කිසිවෙක් සෝවාන්වූහ, කිසිවෙක් සකෘදාගාමීවූහ. කිසිවෙක් අනාගාමීවූහ. කිසිවෙක් රහත්වූහ. තිරෝභාව ප්‍රාතිහාර්යය කරනු කැමැත්තේ වනාහි ආලෝකය අන්ධකාරය බවට පත්කරයි. නොවැසුණ දෙය වැසුණක් බවට පත් කරයි, ඇස්හමු දෙය නොහමුවක් බවට පත් කරයි, කෙසේද? මේ තෙමේ වනාහි නොවැසුණේ නමුදු, ළඟ සිටියේ නමුදු නොපෙනෙයි. තමා හෝ අනෙකකු හෝ මේ ආකාරයෙන් නොදිස්වෙනසේ සලස්වනු කැමැත්තේ පාදකධ්‍යානයෙන් නැඟී, 'මේ ආලෝකස්ථානය අඳුරු බවට පත් වේවා'යි හෝ, 'මේ නොවැසුණ දෙය වැසුණු බවට පත් වේවා'යි හෝ, 'මේ ඇස්හමු දෙය නොහමු බවට පත් වේවා'යි ආවර්ජනය කොට පිරියම්කොට, යටකී නයින්ම අධිෂ්ඨාන කරයි, අධිෂ්ඨාන චිත්තය හා සමගම එලෙසින්ම සිදුවේ. ළඟසිටියද අන්‍යයෝ නොදකිති, තෙමේද නොදකිනු කැමැත්තේ නම් නොදකියි.

මෙම ප්‍රාතිහාර්යය කවුරුන් විසින් කරණලදවිරුද? භාග්‍යවතුන් වහන්සේ විසිනි. භාග්‍යවතුන් වහන්සේ වනාහි යස කුල පුත්‍ර අසල හිඳිද්දීම ඔහුගේ පියාට නොපෙනෙන ලෙස සැලැස්වූ සේක. එසේම මහාකප්පිණ රජුහට දෙදහස් යොදුන් මඟ පෙරගමන් කොට ඔහු අනාගාමී පෙලෙහිද ඔහුගේ ඇමතියන් දහසක් දෙනා සෝවාන් පෙලෙහිද පිහිටුවා, ඔහු ආ මඟ අනුව ආ දහසක් පිරිවර සහිත අනෝජා දේවියට ළඟ හුන්නාවූද පිරිස් සහිත රජු නොපෙනෙන්නට සලස්වා, 'ස්වාමීනි, රජු දුටු සේක්දැ'යි කී කල්හි, 'කිමෙක්ද, ඔබට වඩා උතුම් වනුයේ රජු සෙවීමද, නැතහොත් තමාම සෙවීමදැ'යි අසා, 'ස්වාමීනි, තමාම සෙවීමය'යි කියා හුන් ඇය දහසක් පිරිවර කතුන් හා සමග සෝවාන් පෙලෙහිද, ඇමතියන් දහසක් පිරිවර කතුන් හා සමග සෝවාන් පෙලෙහිද, ඇමතියන් දහසක් දෙනා අනාගාමී පෙලෙහිද, රජු රහත් පෙලෙහිද පිහිටන සේ දහම් දෙසූසේක. තවද තම්බපණ්ණි දිවයිනට පැමිණි දින තමා හා සමග ආ සෙස්සන් රජුට නොපෙනෙන්නට සලස්වමින් මහින්ද තෙරණුවන් විසින්ද මෙය කරන ලද්දේමය.

තවද ප්‍රකටවනසේ කරන සියලු ප්‍රාතිහාර්ය 'ආවිභාව' නම්ද, අප්‍රකට වනසේ කරන ප්‍රාතිහාර්ය 'තිරෝභාව' නම්ද වේ. එහි, ප්‍රකටප්‍රාතිහාර්යයෙහිදී සෘද්ධිය මෙන්ම සෘද්ධිමත් පුද්ගලයාද පෙනේ, ඒ බව යමක ප්‍රාතිහාර්යය මඟින් පැහැදිලි කළ යුතුයි. 'එහිදී වනාහි තථාගතයන් වහන්සේ ශ්‍රාවකයනට පොදු නොවූ යමකප්‍රාතිහාර්යය කරනසේක්, උඩුකයින් ගිනිකඳක්ද, යටිකයින් ජලධාරාවක්ද පවත්වන සේක.''[a] මෙසේ (සෘද්ධියද, එය පවත්වන්නාදැයි යන) දෙකම දිස් විය.

a. පටිසම්භිදාමග්ග, ඤාණකථා - Paṭ i 125

අප්‍රකට ප්‍රාතිහාර්යයෙහිදී ඍද්ධියම මිස ඍද්ධිමත් පුද්ගලයා නොදිස්වේ. ඒබව මහක සූත්‍රයෙන්ද, බ්‍රහ්මනිමන්තණික සූත්‍රයෙන්ද පැහැදිලි කළයුතුය. එහිදී ආයුෂ්මත් මහක තෙරුන්ගේද භාග්‍යවතුන් වහන්සේගේද ඍද්ධික්‍රියාවම මිස ඍද්ධිමත් පුද්ගලයෙක් නොදිස්වේ. එහෙයින් කීහ:- ''එකත්පසෙක හුන් චිත්ත නම් ගෘහපති තෙමේ ආයුෂ්මත් මහක තෙරුන්හට මෙසේ කීය: 'ස්වාමීනි, ආර්යයන් වහන්සේ මාහට අධිමානුෂවූ ඍද්ධි ප්‍රාතිහාර්යයක් දක්වන සේක්වා' 'එසේ නම් ගෘහපතිය, ආළින්දයෙහි උතුරුසළුව අතුරා ඊමත්තෙහි පිදුරු මිටියක් විසුරුවනුය'යි කීහ. චිත්ත ගෘහපති තෙමේ, 'එසේය ස්වාමීනි'යි ආයුෂ්මත් මහක තෙරුන්හට පිළිවදන් දී ආළින්දයෙහි උතුරුසළුව අතුරා පිදුරු මිටියක් විසුරුවාලීය. ඉක්බිති ආයුෂ්මත් මහක තෙරණුවෝ විහාරයට පිවිස දොරගුලුලා, යම්සේ යතුරු කඩුලුවෙන්ද අගුලු අතරින්ද ගිනිදැල් නිකුත්වී උතුරුසළුව නොදැවී පිදුරුම පමණක් දැවී ගියේද, එසේවූ ඍද්ධිප්‍රාතිහාර්යයක් දැක්වූහ.[a] තවද කීහ:

> ''මහණෙනි, ඉක්බිති මෙතැන් පටන් යම්සේ මහබඹුද, බඹපිරිසද, බඹපිරිවරද මාගේ ශබ්දය අසන්නාහුමුත් මා නොදක්නාහු වෙත්ද, එසේවූ ප්‍රාතිහාර්යයක් දැක්වීමි, නොපෙනී සිටිමින්ම මේ ගාථාව කීමි.''[b]

> ''භවෙචාහං භයං දිස්වා භවඤ්ච විභවෙසිනං
> භවං නාභිවදං කිඤ්චි නන්දිඤ්ච න උපාදියිං''[c]

> භවයෙහි බිය හෙවත් ආදීනවද, විභවය සොයන භවයද දැක, මම කිසිසේත් භවය නොපැසසීමි, භවයෙහි තොස් දනවන නන්දිරාගයද ග්‍රහණය නොකෙළෙමි

'බිත්ති අතරින්, පවුරු අතරින්, පර්වත අතරින් අහසෙහි මෙන් නොපැකිල යයි' යන මෙහි තිරොකුඩ්ඩ යනු, බිත්ති අතරින්, බිත්තියෙන් එපිටයයි කී නියායි. සෙසු තන්හිද මෙම නයයි. 'කුඩ්ඩ' යන මෙය ගෙබිත්තියට පර්යාය වචනයි. 'පාකාර' යනු, ගෘහ, විහාර, ග්‍රාමාදිය වටා ඉදි කළ පවුරුයි. 'පබ්බත' යනු, පස්කඳු හෝ ගල් පර්වතයි. 'අසජ්ජමානො' යනු, නොපැකිලයි, 'සෙය්‍යථා'පි ආකාසෙ, යනු අහසෙහි මෙනි. මෙසේ යනු කැමැත්තහු විසින් ආකාස කසිණයට සමවැද නැඟී, බිත්තිය හෝ පවුර හෝ, මහමෙර සක්වළගල ආදී පර්වතයක් හෝ ආවර්ජනය කොට, පිරියම් කොට, 'ආකාසො හොතු' අහස බවට පත්වේවායි අධිෂ්ඨාන කළයුතුය, අහසබවටම පත්වේ. යටි අතට බසිනු කැමැත්තහුට, උඩු අතට

---

a. සං. නි. චිත්තසංයුත්ත - S iv 290
b. ම. නි., බ්‍රහ්මනිමන්තණිකසුත්ත - M i 330
c. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා

නඟිනු කැමැත්තහුට විවරවෙයි. විනිවිද යනු කැමැත්තහුට සිදුරුවෙයි. ඒ යෝගාවචර තෙමේ එහි නොපැකිල යයි. මෙහිලා ත්‍රිපිටකධර චූලාභය තෙරණුවෝ, ''ඇවැත්නි, ආකාසකසිණ සමාපත්තිය කිනම් ප්‍රයෝජනයක් සඳහාද? කිම, ඇත් අස් ආදීන් මවනු කැමැත්තෙන් 'හත්ථි' 'අස්ස' ආදී කසිණයකට සමවදීද? කවර හෝ කසිණයෙක්හි පිරියම්කොට ලබාගත් අෂ්ට සමාපත්ති විෂයෙහි වශීභාවයම ප්‍රමාණ නොවේද?යම් යම් දෙයක් කැමැති වේනම් ඒ ඒ දෙයම සිද්ධ නොවේදැ?''යි කීහ. භික්‍ෂූහු, ''ස්වාමීනි, ආකාසකසිණයම පෙළෙහි ආයේය, මෙය අවශ්‍යයයි කිවයුතුය''යි කීහ. එහි පෙළ මෙසේයඃ-

ප්‍රකෘති වශයෙන් ආකාසකසිණසමාපත්තිලාභියෙක් වේ, බිත්ති අතරින්, පවුරු අතරින්, පර්වත අතරින් ආවර්ජන කරයි, ආවර්ජනය කොට ඥානයෙන් 'අහස බවට පත් වේවා'යි අධිෂ්ඨාන කරයි, අහස බවට පත් වෙයි, බිත්ති අතරින්, පවුරු අතරින් පර්වත අතරින් නොපැකිල යයි, යම්සේ ප්‍රකෘතියෙන් ඍද්ධිමත් නොවූ මනුෂ්‍යයෝ කිසිවෙකින් නොඇවුරුණු නොවැසුණු තැනෙක නොගැටෙමින් යෙත්ද, එසේම ඒ ඍද්ධිමත් යෝගාවචර තෙමේ චිත්තවශීභාවයට පත්වූයේ බිත්ති අතරින්, පවුරු අතරින්, පර්වත අතරින් අහසෙහි මෙන් නොගැටී යෙයි.[a] ඉදින් එසේ අධිෂ්ඨානකොට යනවිට ඒ භික්‍ෂූහට අතරතුර පර්වතයක් හෝ රුකක් හෝ පැනනැංගහොත් යලි සමවැද අධිෂ්ඨාන කළයුතු වන්නේද දොසෙක් නැත, යලි සමවැද අධිෂ්ඨාන කිරීම උපාධ්‍යායයන් සමීපයෙහි නිස ගැනීම හා සමාන වේ. (මුල සිට යාමක් වන එය අනවශ්‍යය). මේ භික්‍ෂුව විසින් 'අහස බවට පත් වේවා'යි අධිෂ්ඨාන කළ හෙයින් අහස බවට පත්වේමය. පළමු අධිෂ්ඨාන බලය හේතුකොටගෙනම අතරතුර ඔහුට ඍතුමයවූ අනෙක් පර්වතයක් හෝ රුකක් හෝ පැනනඟිතැ'යි යන මෙය සිදුවනු නොහැක්කේමය. වෙනත් ඍද්ධිමතකු විසින් මවන ලද්දක් නම්, පළමු මැවීම බලවත් වේ. අනෙකකු විසින් එයට උඩින් හෝ යටින් හෝ යායුතුය.

පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං යන මෙහි, 'උම්මුජ්ජං' යනු මතුවීමයයිද 'නිමුජ්ජං' යනු කිමිදීමයයිද කියනු ලැබේ, උම්මුජ්ජයද නිමුජ්ජයදැයි යන ද්වන්දය උම්මුජ්ජනිමුජ්ජයි. මෙසේ (මතුවීම හා කිමිදීම) කරනු කැමැත්තහු විසින් ආපෝකසිණයට සමවැද එයින් නැඟී 'මෙතෙක් තැන් පොළොව ජලය බවට පත් වේවා'යි පිරිසිඳ, පිරියම් කොට, යටකී නයින්ම අධිෂ්ඨාන කළයුතුය, අධිෂ්ඨානය හා සමගම පිරිසිඳි තැන් දක්වා පොළොව ජලය බවට පත්වේ. හේ තෙමේ එහි මතුවීම හා කිමිදීම කරයි. එහි පෙළ මෙසේයිඃ- 'ප්‍රකෘතියෙන් ආපෝකසිණ-සමාපත්ති-ලාභියෙක් වේ. පෘථිවිය ආවර්ජනය කරයි, එවිට ජලය බවට පත්වෙයි, හේ තෙමේ පොළොවෙහි මතුවීම හා

a. පටිසම්භිදාමග්ග ඉද්ධිකථා - part ii 208

කිමිදීම කරයි, ප්‍රකෘතියෙන් සෘද්ධිමත් නොවූ මනුෂ්‍යයෝ ජලයෙහි මතුවීම හා කිමිදීම කරන විලාශයෙනි. මේ ආකාරයෙන්ම ඒ සෘද්ධිමත් පුද්ගල තෙමේ චිත්ත වශීභාවයට පැමිණියේ දියෙහි සෙයින් ගොඩතන්හි මතුවීම හා කිමිදීම කරයි.[a]''

හුදෙක් මතු වීම් කිමිදීම් පමණක් නොවේ, නෑම්, බීම්, මුව දෙවීම්, බඩු සේදීම් ආදිය අතුරෙන් යමක් යමක් කැමැති වේද, ඒ ඒ දෙය කරයි, හුදෙක් ජලයම නොවේ, ගී, තෙල්, මී පැණි ආදී ද්‍රාවයන් අතුරෙන් යමක් යමක් කැමැති වේද, ඒ ඒ දෙය 'මේ මේ දෙය මෙතෙක් මෙතෙක් වේවා'යි ආවර්ජනය කොට පිරියම්ද කොට අධිෂ්ඨාන කළ විට අධිෂ්ඨානය සෙයින්ම සිද්ධ වේ. වෙන් කොට බඳුනකට ගත් කල (කැමැතිවූයේ) ගී නම් ගීම වෙයි, තෙල් ආදියම වෙයි, ජලය නම් ජලයම වෙයි. හේ තෙමේ එහි තෙමෙනු කැමැති නම් තෙමෙයි, නොතෙමෙනු කැමැති නම් නොතෙමෙයි. ඔහුට පමණක් එම ගොඩතැන් ජලය වෙයි, සෙසු ජනයාහට ගොඩතැන්ම වෙයි, එහි ජනයා පාගමනින්ද යෙති, යාන ආදියෙන්ද යෙති, ගොවිතැන් ආදියද කෙරෙත්මය. ඉදින් ඔවුනටද ජලය වේවා'යි රිසි වේනම් එසේම වෙයි. පිරිසිඳි කාලසීමාව ඉකුත්වූ විට, යමක් ප්‍රකෘතියෙන් කළ, විල් ආදී දිය තැන් වෙතොත්, ඒ තැන් හැර සෙසු පිරිසිඳි තැන් ගොඩතැන් බවටම පත් වෙයි.

උදකෙපි අභිජ්ජමානෙ යන මෙහි, යම් ජලයකට බටවිට ගිලේද එය 'භිජ්ජමාන' (බිඳෙන) යයි කියනු ලැබේ, එසේ නොවනුයේ 'අභිජ්ජමාන'යි. මේ ආකාරයෙන් (නොගිලී) දියෙහි යනු කැමැත්තහු විසින් පඨවිකසිණයට සමවැද එයින් නැඟී ''මෙතෙක් තැන් ජලය ගොඩ බවට පත්වේවා''යි පිරිසිඳ, පිරියම් කොට, කී නයින්ම අධිෂ්ඨාන කළයුතුය, අධිෂ්ඨානය හා සමගම පිරිසිඳි තන්හි ජලය ගොඩ බවට පත්වෙයි. හේ තෙමේ එහි ගමන් කරයි.

එහි පෙළ මෙසේයි:- 'ප්‍රකෘතියෙන් පඨවීකසිණ-සමාපත්තිලාභියෙක් වෙයි, හේ තෙමේ ජලය ආවර්ජනය කරයි. ආවර්ජනයකොට ''ගොඩ බවට පත් වේවා''යි අධිෂ්ඨාන කරයි. ගොඩ බවට පත් වෙයි, හේ තෙමේ නොගැලී ජලය මත ගමන් කරයි. ප්‍රකෘතියෙන් සෘද්ධිමත් නොවූ මනුෂ්‍යයෝ යම්සේ ගොඩ තන්හි නොගිලී ගමන් කරත්ද, එසේම සෘද්ධිමත් තෙමේ චිත්තවශීතාවට පැමිණියේ ජලය මත ගොඩ තන්හි මෙන් නොගැලී ගමන් කරයි''[b] හුදෙක් ගමන් කරනු පමණක් නොවේ, යම් යම් ඉරියව්වක් කැමැති වේද, ඒ ඒ ඉරියව්ව පවත්වයි. හුදෙක් ගොඩබවටම පත් කරනුයේ නොවේ. මැණික්, රන්, පර්වත,

a. පටිසම්භිදාමග්ග ඉද්ධිකථා - part ii 208
b. පටිසම්භිදාමග්ග ඉද්ධිකථා - part ii 208

වෘක්ෂාදීන් අතුරෙන් යමක් යමක් කැමැති වේනම්, ඒ ඒ දෙය යටකී නයින්ම ආවර්ජනයකොට අධිෂ්ඨාන කරයි, අධිෂ්ඨානකළ ලෙසින්ම සිද්ධ වේ. ඔහුටම පමණක් එම ජලය ගොඩතැන් වෙයි, සෙසු ජනයාහට ජලයම වෙයි. මස්, කැසුබ්, දියකා ආදීහුද එහි සිත් සේ හැසිරෙති. ඉදින් මේ තෙමේ සෙසු ජනයාහටද එම ජලය ගොඩබවට පත්කරනු රිසියේ නම්, එසේ කෙරේමය. පිරිසිඳි කාලසීමාව ඉකුත්වූවිට ජලයම වෙයි. **පල්ලඞ්කෙන කමති** යනු, පර්යංකයෙන් හිඳගෙන ගමන් කරයි. **පක්ඛී සකුණො** යනු, පියාපත් ඇති පක්ෂියකු මෙනි. මෙසේ කරනු කැමැත්තහු විසින් පඨවිකසිණයට සමවැද එයින් නැඟී, ඉදින් හිඳගෙන ගමන් කරනු කැමැත්තේ නම් පර්යංකප්‍රමාණවූ තැන් පිරිසිඳ, පිරියම් කොට යටකී නයින්ම අධිෂ්ඨාන කළයුතුය. ඉදින් වැතිරීගත් ලෙසින් යන කැමැත්තේ නම් ඇඳක් පමණ තැන්ද, පාගමනින් යනු කැමැත්තේ නම් අඩිපාරක් පමණ තැන්දැයි මෙසේ නිසි පමණ තැන් පිරිසිඳ යටකී නයින්ම 'ගොඩ වේවා'යි අධිෂ්ඨාන කළයුතුය, අධිෂ්ඨානය හා සමගම ගොඩතැන් බවට පත්වේ. එහි පෙළ මෙසේය:- 'ආකාශයෙහිද පියාපත් ඇති පක්ෂියකු සෙයින් පර්යංකයෙන් හිඳ ගමන්කරයි' (ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛි සකුණො)[a] ප්‍රකෘතියෙන් පඨවිකසිණ සමාපත්ති-ලාභී වේ, ආකාශය ආවර්ජන කොට, ගොඩ තැන් වේවායි ඥානයෙන් අධිෂ්ඨාන කරයි, ගොඩ තැන් වෙයි. හේ තෙමේ අන්තරීක්ෂ ආකාශයෙහි සක්මන් කරයි, ගොඩ තැන් වෙයි. හේ තෙමේ අන්තරීක්ෂ ආකාශයෙහි සක්මන් කරයි, සිටියි, හිඳියි, සයනයද කරයි. ප්‍රකෘතියෙන් සෘද්ධිමත් නොවූ මනුෂ්‍යයෝ යම්සේ පොළෝමත සක්මන් කරත්ද, -පෙ- සයනය කරත්ද, එසේම ඒ සෘද්ධිමත් තෙමේ චිත්තවශීතාවට පැමිණියේ අන්තරීක්ෂ ආකාශයෙහි සක්මන් කරයි -පෙ- සයනයද කරයි.

අහසින් යනු කැමැති භික්ෂුව දිවැස් ලද්දකුද වියයුතුය. කවර හෙයින්ද? අතරමග ඍතුවිපර්යාසයෙන් උපන් පර්වත වෘක්ෂාදිය වේ, නාග සුපර්ණාදීහු හෝ ඊර්ෂ්‍යාසහගත සිතින් එබඳු දෑ මවති, ඒවා දකිනු පිණිසයි. ඒවා දැක කුමක් කළයුතුද? පාදකධ්‍යානයට සමවැද එයින් නැඟී 'අහස බවට පත් වේවා'යි පිරියම් කොට අධිෂ්ඨාන කළයුතුය. ත්‍රිපිටකචූලාභය තෙරණුවෝ වනාහි, 'ඇවැත්නි, සමාපත්තියට සමවැදීම කවර අර්ථයක් සඳහාද? මේ යෝගියාගේ සිත සමාහිත වූයේම නොවේද? එහෙයින් යම් යම් තැනක් ආකාශය බවට යේවා!යි අධිෂ්ඨාන කළහොත් ඒ ඒ තැන ආකාශය බවටම පත්වේ' යයි කීහ. යලි මෙසේද කීහ. 'ඉක්බිති තිරෝකුඩ්ඩ ප්‍රාතිහාර්යයෙහි කී නයින්ම පිළිපැදියයුතුය. තවද නිසි අවකාශයෙහි බැසීම සඳහාද දිවැස් ලද්දකු වියයුතුය, ඉදින් නහනතොට හෝ ගම්දොර වැනි නොනිසි තැනෙක්හි බටහොත් මහජනයාහට ප්‍රකට

a. පටිසම්භිදාමග්ග ඉද්ධිකථා - part ii 208

වේ. එහෙයින් දිවැසින් බලා නොනිසි තැන් හැර නිසි තන්හි බස්නේය'යි කීහ.

මෙවන් මහා සෘද්ධි ඇති මහානුභාව ඇති මේ චන්‍ද්‍ර සූර්යයන් පවා අතින් අල්ලයි, පිරිමදියි (ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති)[a] යන මෙහි, චන්ද්‍රසූර්ය දෙදෙනා දෙසාළිස්දහසක් යොදුන් මත්තෙහි හැසිරෙන හෙයින් මහර්ද්ධිකතාවද, මහාද්වීපත්‍රයයෙක්හි එකවිට ආලෝකය පතුරුවන හෙයින් මහානුභාවතාවද දතයුතුය. නොහොත් මේ ආකාරයෙන් ඉහළ ආකාශයෙහි හැසිරීම හා ආලෝකය පැතිරවීම හේතුකොට මහර්ධි ඇති, එහෙයින්ම මහානුභාව ඇති චන්ද්‍රසූර්යයන් 'පරාමසති' යනු මුළුමනින් ග්‍රහණය කරයි, එක් කොටසක් හෝ ස්පර්ශ කරයි. 'පරිමජ්ජති' යනු, කැටපත් මුහුණතක් සෙයින් මුළුමනින් පිරිමදියි. මොහුගේ මේ සෘද්ධිය අභිඥාපාදකධ්‍යාන වශයෙන්ම සිද්ධ වේ. මෙහි කසිණසමාපත්ති නියමයෙක් නැති. පටිසම්භිදාවෙහි මෙසේ කියන ලද්දේමයඃ- 'ඉමෙ චන්දිමසුරියෙ-පෙ-පරිමජ්ජති යන මෙහි, ඒ සෘද්ධිමත් යෝගී තෙමේ චිත්තවශීතාවට පැමිණියේ චන්ද්‍රසූර්යයන් ආවර්ජනය කරයි, එවිට 'අත්ලෙහි සිටීවා'යි ඥානයෙන් අධිෂ්ඨාන කරයි, එවිට අත්ලෙහි පිහිටයි, හේ තෙමේ හුන්නේ හෝ වේවා, හොත්තේ හෝ වේවා, චන්ද්‍රසූර්යයන් අතින් අල්ලයි, ගනියි, පිරිමදියි, යම් සේ ප්‍රකෘතියෙන් සෘද්ධිමත් නොවූ මනුෂ්‍යයෝ කිසියම් රූපගත වස්තුවක් අත්ලෙන් අල්ලත්ද, ගනිත්ද, පිරිමදිත්ද, එසේම ඒ සෘද්ධිමත් පුද්ගල තෙමේ -පෙ-පිරිමදියි.'[b]

ඉදින් ළඟට ගොස් අල්ලනු කැමැත්තේ නම් ළඟට ගොස් අල්ලයි. ඉදින් හුන්වනම හෝ හොත් වනම අල්ලනු කැමැත්තේ නම්, අත්ලෙහි සිටීවා'යි අධිෂ්ඨාන කරයි. එම අධිෂ්ඨාන බලයෙන් නටුවෙන් ගිලිහුණු තල්ගෙඩියක් සෙයින් අවුත් අත්ලෙහි පිහිටි කල හෝ අල්ලයි. අතෙහි ප්‍රමාණය වැඩිකොට හෝ අල්ලයි. එසේ වැඩි කරනවිට උපාදින්නකය (හෙවත් ස්ව-ශරීරවශයෙන් ගන්නාලද භෞතික කොටස්) වැඩි කෙරේද? නැතහොත් අනුපාදින්නකය (හෙවත් ගන්නාලද දෙයින් බැහැරිවූ කොටස්) වැඩි කෙරේද? ගන්නා ලද දෙය මඟින් නොගන්නාලද දෙය වැඩි කෙරේ.

මෙහිලා ත්‍රිපිටකධර චූලනාග තෙරණුවෝ මෙසේ කීහඃ- ඇවැත්නි, ගන්නා ලද දෙය කුඩා හෝ මහත් හෝ විය නොහැකිද? යම් කලෙක භික්ෂු තෙමේ යතුරුසිදුරු ආදියෙන් නික්මේනම් එකල උපාදින්නකය (ග්‍රහණය කළ දෙය) කුඩා නොවේද? යම් කලෙක මහත්වූ ආත්මභාවයක් මවා ගනී නම්, එකල උපාදින්නකය මහත් නොවේද? මහමුගලන් තෙරුන් මෙනි.

---

a. දීඝ නි. සාමඤ්ඤඵල සු. - D i 78

b. පටිසම්භිදාමග්ග, ඉද්ධිකථා - part ii 208f.

එක් සමයෙක්හි අනේපිඬු සිටු තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසා, 'ස්වාමීනි, හෙට පන්සියයක් භික්‍ෂූන් හා සමග අපගේ ගෙහි භික්‍ෂාව පිළිගනු මැනවැ'යි ඇරියුම් කොට ගියේය. භාග්‍යවතුන් වහන්සේ ඇරියුම ඉවසා, එදවසින් ඉතිරි කාලයත් රාත්‍රි කාලයත් ඉක්මවා අළුයම් කාලයෙහි දසදහසක් ලෝකධාතුව බැලූ සේක, එවිට නන්දෝපනන්‍ද නම් නාරජු ඥානපථයට ආයේය. භාග්‍යවතුන් වහන්සේ, 'මේ නාරජු මාගේ ඥානපථය හමුවට එයි, මොහුට උපනිශ්‍රය සම්පත් ඇත්දෝහෝ'යි ආවර්ජන කරන සේක්, 'මේ තෙමේ මිසදිටුවෙකි, රත්නත්‍රය කෙරෙහි නොපහන්ය'යි දැක, 'කවරෙක් නම් මොහු මිසදිටු බවින් මුදවාදැ'යි ආවර්ජන කරනසේක් මහමුගලන් තෙරුන් දුටුසේක. ඉක්බිති රැය පහන්වූ කල්හි සිරුරු පිළිදැගුම් නිමවා ආයුෂ්මත් ආනන්‍ද තෙරුන් ඇමතුසේක, 'ආනන්‍දය, තථාගතයන් වහන්සේ දෙව්ලොව චාරිකාවෙහි යෙති, පන්සියයක් භික්‍ෂූන්හට සැල කරව''යි කීසේක. එදින නන්දෝපනන්‍ද නා රජුගේ ආපානභූමිය සරසන ලදි. හේ තෙමේ දිව්‍යමය සේසත් දරා ත්‍රිවිධ නාටක ජනයා විසින්ද නාපිරිස් විසින්ද පිරිවරනලද්දේ දිව්‍යමය භාජනයන්හි එළවනු ලබන ආහාරපාන විශේෂයන් නරඹමින් දිව්‍යමය රත්නපර්යංකයෙක්හි හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නාරජුහට පෙනෙනසේ ඔහුගේ විමානය මත්තෙන් පන්සියයක් භික්‍ෂූන් ගෙන තව්තිසා දෙව්ලොව බලා වැඩිසේක.

එසමයෙහි නන්දෝපනන්‍ද නාරජුහට මෙවන් පවිටු සිතක් පහළ විණි. 'මේ මුඬුමහණෝ අපගේ භවනය මත්තෙන් දෙවියන්ගේ තව්තිසා භවනයට යන්නාහුද එතැනින් නික්මෙන්නාහුද වෙති, දැන් මෙයින් මතු මොවුන්හට අපගේ හිස්මත පාදූවිලි හෙලමින් යන්නට නොදෙමි'යි මෙසේ සිතා නැඟිට මේරු පර්වතමූලයට ගොස් තමාගේ ආත්මභාවය හැර මේරු පර්වතය සත් වරක් දරණ වැලින් වසා මුදුනෙහි පෙණය තබාගෙන යටිකුරුව තමාගත් පෙණයෙන් තව්තිසා භවනය මුවහකොට නොපෙනෙන්නට සැලැස්වීය.

ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. 'ස්වාමීනි, පෙර මේ පියසෙහි සිට මේරු පර්වතය අවට දක්නෙමි, තව්තිසා බවන දක්නෙමි, වෛජයන්ත ප්‍රාසාදය දක්නෙමි, වෛජයන්ත ප්‍රාසාද මස්තකයෙහි ධ්වජය දක්නෙමි, ස්වාමීනි, අද මේරු පර්වතය හෝ -පෙ- වෛජයන්ත ප්‍රාසාද - මස්තකයෙහි ධ්වජය හෝ නොපෙනීමට හේතු කිම?' 'රට්ඨපාලය, මේ නන්දෝපනන්‍දනාරජ තෙමේ ඔබ වෙත කිපී මේරු පර්වතය සත්වරක් දරණින් වෙළාගෙන මුදුන පෙණයෙන් වසාගෙන අඳුරුකොට සිටියේය'යි කී සේක. ස්වාමීනි. ඔහු දමනය කරමි'යි කීවිට භාග්‍යවතුන් වහන්සේ එය නො-අනුදත්සේක. ඉක්බිති ආයුෂ්මත් භද්දිය තෙරණුවෝද, ආයුෂ්මත් රාහුල තෙරණුවෝදැයි

සියලු භික්ෂූහු පිළිවෙළින් ඉදිරිපත් වූහ, භාගයවතුන් වහන්සේ නො- අනුදත්සේක.

අවසන්හි මහමුගලන් තෙරණුවෝ, 'ස්වාමීනි, මම ඔහු දමනය කෙරෙමි'යි කීහ, 'මොග්ගල්ලානය, දමනය කරනුයැ'යි අනුදත්සේක. තෙරණුවෝ ආත්මභාවය හැර මහනාරජ වෙසක් මවාගෙන නන්දෝපනන්ද නාරජු තුදුස් වරක් දරණින් වෙළාගෙන ඔහුගේ පෙණය මත්තෙහි තමාගේ පෙණය තබාගෙන මේරු පර්වතයට තද කළහ. නාරජ තෙමේ දුමන්නට විය, තෙරණුවෝද, 'දුම් ඇත්තේ තොපගේ සිරුරෙහි මතුනොවේ, අපගේ සිරුරෙහිද ඇත්තේය'යි දුමන්නට වූහ. නාරජුගේ දුම් තෙරුන් නොපෙළයි, තෙරුන්ගේ දුම් නාරජු පෙළයි. ඉක්බිති නාරජ තෙමේ දැල්වෙන්නට විය. තෙරණුවෝද, 'ගිනි ඇත්තේ තොපගේ සිරුරෙහි මතු නොවේ, අපගේ සිරුරෙහිද ඇතැ'යි දැල්වෙන්නට වූහ. නාරජුගේ තේජස තෙරුන් නොපෙළයි, තෙරුන්ගේ තේජස නාරජු පෙළයි. නාරජ, 'මේ තෙමේ මා මේරු පර්වතයට තබා තදකොට දුමන්නේද, දැල්වෙන්නේද වේ'යි සිතා. 'පින්වත, ඔබ කවුරුදැ?'යි පිළිවිසීය. 'නන්දය, මම මොග්ගල්ලාන වෙමි'යි කීහ. 'ස්වාමීනි, ඔබගේ භික්ෂුවේශයෙන් සිටිනු මැනවැ'යි කීය. තෙරණුවෝ එම වේශය හැර ඔහුගේ දකුණු කණින් නික්මුණාහ, දකුණු නාසාපුටයෙන් පිවිස වම් නාසාපුටයෙන්ද වම් නාසාපුටයෙන් පිවිස දකුණු නාසාපුටයෙන්ද නික්මුණාහ. එවිට නාරජ මුව විවර කළේය. තෙරණුවෝ මුවින් පිවිස කුස තුළ නැගෙනහිර දෙසටද, බටහිර දෙසටද, සක්මන් කරති.

භාග්‍යවතුන් වහන්සේ 'මොග්ගල්ලානය, මෙනෙහි කරනුය, මේ නාරජ මහත් ඍද්ධි ඇත්තෙකි'යි කීසේක. තෙරණුවෝ 'ස්වාමීනි. මවිසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලද්දාහුය, පුරුදු පුහුණු කරන ලද්දාහුය, ප්‍රගුණ කරන ලද්දාහුය, පදම් කරන ලද්දාහුය, ප්‍රතිෂ්ඨාබවට පත් කරන ලද්දාහුය, අභ්‍යාස කරන ලද්දාහුය, මොනවට අරඹන ලද්දාහුය. ස්වාමීනි, මම නන්දොපනන්දයා මතුනොව නන්දෝපනන්දයා වැනි නාරජුන් සියයක් නමුදු දහසක් නමුදු දමනය කරනු හැකි වෙමි'යි කීහ. නාරජ තෙමේ. 'මවිසින් පිවිසෙනු නොදක්නා ලදි. දැන් නික්මෙනවිට දළ අතර සිර කොටගෙන කා දමමි'යි සිතා 'ස්වාමීනි, නික්මෙනු මැනවි, කුස තුළ ඔබමොබ සක්මන් කරමින් මා නොපෙළනු මැනවි'යි කීය. තෙරණුවෝ නික්ම පිටත සිටියහ. නාරජ තෙමේ දැක 'මේ ඔහුය'යි හැඳින නාසාවාතය නිකුත් කළේය, තෙරණුවෝ චතුර්ත්ථධ්‍යානයට සමවන්හ. එම වාතය ඔවුන්ගේ ලොම් ගසක් හෝ සොල්වනු සමත් නොවීය. සෙසු භික්ෂූහු වනාහි මූල පටන් දක්වනලද සියලු ප්‍රාතිහාර්යයන් කරනු සමත් වෙති, මෙබඳු අවස්ථාවකට පැමිණ මෙසේ ක්‍ෂණිකව සමවදිනු සමත් නොවෙති'යි දැන භාග්‍යවතුන් වහන්සේ ඔවුන්හට නාගරාජදමනය නො- අනුදත් සේක.

නාරජ තෙමේ, 'මම නාසාවාතයෙන් මේ ශ්‍රමණයාගේ රෝමකූපයක් හෝ සොල්වනු සමත් නොවීමි, මේ ශ්‍රමණයා මහර්ධි ඇත්තෙකි'යි සිතීය. තෙරණුවෝ එම වේශය හැර ගුරුළු වෙසක් මවාගෙන ගුරුළු පියා සැලුම් සහිතව නාරජු ලුහුබැන්දාහ. නාරජ තෙමේ එම ආත්මභාවය හැර මානවක වේශයක් මවාගෙන, 'ස්වාමීනි, ඔබ සරණ යෙමි'යි කියමින් තෙරුන්ගේ පා වැඳ සිටියේය. තෙරණුවෝ 'නන්‍දය, ශාස්තෘන් වහන්සේ පැමිණිසේක, එව, එහි යමු'යි නාරජු දමනය කොට නිර්විෂ කොට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණවූහ.

නාරජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ නැමඳ 'ස්වාමීනි, ඔබ වහන්සේ සරණ යෙමි'යි කීය. භාග්‍යවතුන් වහන්සේ, 'සුවපත් වනුය නාරජැ'යි පවසා භික්‍ෂු සංඝයා පිරිවරාගෙන අනේපිඬු සිටුහුගේ නිවසට වැඩිසේක. අනේපිඬු සිටු තෙමේ, 'ස්වාමීනි, කවර හෙයින් ඉතා දහවල්ව වැඩිසේක්දැ?යි කීය. මොග්ගල්ලාන, නන්දෝපනන්‍ද යන දෙදෙනාගේ සංග්‍රාමයෙක් වීය'යි කීසේක. 'ස්වාමීනි, ජය කාහටද පරාජය කාහටදැ'යි කීය. 'මොග්ගල්ලානයනට ජයද නන්දෝපනන්‍දයනට පරාජයද වීය'යි කීසේක. අනේපිඬු සිටු තෙමේ, 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මාගේ නිවසෙහි පිළිවෙළින් නොකඩවා සත්දිනක් භික්‍ෂාව ඉවසනසේක්වා, තෙරුන්හට සත්දිනක් උපහාර කරන්නෙමි'යි කියා බුදුපාමොක් පන්සියයක් භික්‍ෂූන්හට මහත් සත්කාර කළේය. මෙසේ මෙම නන්දොපනන්‍ද දමනයෙහි කරනලද මහත්වූ ආත්මභාවය සඳහා 'යදා මහනතං අතතභාවං කරොති තදා මහනතං හොති මහාමොගගලලානතථෙරසස විය' (යම් කලෙක මහත්වූ ඇත්මභාවයක් මවාගනීද, එකල මහත් වේ)යි යන මෙය කියනලදී. මෙසේ කී කල්හිද භික්‍ෂූහු උපාදිනනකං නිසසාය අනුපාදිනනකමෙව වඩ්ඪති (ග්‍රහණය කරන ලද දෙය නිසා ග්‍රහණය නොකළ දෙය වැඩේ)යි කීහ. මෙහිලා මෙයම යුතුවේ.

හේ (යෝගී) තෙමේ මෙසේ කොට හුදෙක් චන්‍ද්‍ර සූර්යයන් අල්ලනුද මතු නොවේ. ඉදින් කැමැත්තේ නම්, පාපුටුවක් බවට හරවා පා තබයි, පුටුවක් බවට හරවා හිඳගනියි, ඇඳක් බවට හරවා වැතිරෙයි, ඇඳි පුවරුවක් බවට හරවා හොවියි. එක් කෙනකු මෙසේ කරනවිටම අන් කෙනෙක්ද මෙසේ කරති, නොයෙක් සුවහස් ගණන් භික්‍ෂූන් මෙසේ කරනවිට පවා ඔවුන් එක් එක් කෙනකුහට එකසේම (ප්‍රතිහාර්යය) සිද්ධ වේ. චන්‍ද්‍රසූර්යයන්ගේ ගමනයද ආලෝකකරණයද ඒ ආකාරයෙන්ම වේ. යම්සේ දිය පිරූ දහස් ගණන් තළි අතුරෙන් සෑම තළියකම චන්‍ද්‍රමණ්ඩලය දිස්වේද, චන්‍ද්‍රයාගේ ගමනය හා ආලෝකකරණය සිදුවේද, මේ ප්‍රාතිහාර්යයද එය හා සමාන වේ.

යාවබ්‍රහ්මලොකාපි යනු බ්‍රහ්මලෝකය දක්වාද, කායෙන වසං වත්තති යනු, බ්‍රහ්මලෝකයෙහිද කයින් තමා වසඟයෙහි පවත්වයි. එහි අර්ථය පෙළ අනුව ගොස් දත යුතුය. මෙහි පෙළ මෙසේයිඃ- 'යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති' (බ්‍රහ්මලෝකය දක්වාද කයින් තමා වසඟයෙහි පවත්වයි) යනුයි. ඉදින් ඒ සෘද්ධිමත් තෙමේ චිත්තවශීතාවට පැමිණියේ බ්‍රහ්ම ලෝකයට යනු කැමැතිව දූරෙහි වුවද සමීපයෙහි වේවා'යි අධිෂ්ඨාන කෙරේද, එවිට සමීපයෙහි වෙයි, සමීපයෙහි වුවද දූරෙහි වේවා'යි අධිෂ්ඨාන කෙරේද, එවිට දූරෙහි වෙයි. බොහෝ වුවද මඳ වේවා'යි අධිෂ්ඨාන කෙරේද, එවිට මඳ වෙයි. මඳ වුවද බොහෝ වේවා'යි අධිෂ්ඨාන කෙරේද, එවිට බොහෝ වෙයි. දිවැසින් බ්‍රහ්මයාගේ රූපය දකියි. දිව කණින් බ්‍රහ්මයාගේ ශබ්දය අසයි, චේතෝපරියඤාණයෙන් බ්‍රහ්මයාගේ සිත දනියි. ඉදින් චිත්තවශීතාවට පත් ඒ සෘද්ධිමත් තෙමේ දෘශ්‍යමාන වූ කයින් යුක්තව බ්‍රහ්මලෝකයට යනු කැමැති වේද, එවිට කයට අනුව සිත වඩවයි, කයට අනුව සිත හැරෙන සේ අධිෂ්ඨාන කරයි, කයට අනුව සිත වඩවා කයට අනුව සිත හැරෙනසේ අධිෂ්ඨාන කොට සුඛසංඥාවටද ලඝුසංඥාවටද බැස දෘශ්‍යමාන කයින් යුතුව බ්‍රහ්මලෝකයට යයි. ඉදින් චිත්තවශීතාවට පත් ඒ සෘද්ධිමත් තෙමේ අදෘශ්‍යමානවූ කයින් යුතුව බ්‍රහ්මලෝකයට යනු කැමැති වේද, එවිට සිතට අනුව කය වඩවයි, සිතට අනුව කය හැරෙනසේ අධිෂ්ඨාන කරයි. සිතට අනුව කය වඩවා, සිතට අනුව හැරෙනසේ අධිෂ්ඨානකොට සුඛසංඥාවටද ලඝුසංඥාවටද, බැස අදෘශ්‍යමාන ශරීරයෙන් යුක්තව යයි. හේ තෙමේ ඒ බ්‍රහ්මයා අභිමුඛයෙහි සියලු අඟපසඟ සහිත නො-අඩු ඉඳුරන් සහිත මනෝමය රූපයක් මවාගනියි, ඉදින් ඒ සෘද්ධිමත් තෙමේ සක්මන් කෙරේද, මවනලද රූපයද එහි සක්මන් කරයි, ඉදින් ඒ සෘද්ධිමත් තෙමේ සිටීද-පෙ-හිඳීද-සයනය කෙරේද-පෙ- මවනලද රූපයද -පෙ- සයනය කරයි. ඉදින් ඒ සෘද්ධිමත් තෙමේ දුමන්නේද, දැල්වෙන්නේද, දහම් දෙසන්නේද, ප්‍රශ්න විචාරන්නේද, ප්‍රශ්න විචාරන ලද්දුව විසඳන්නේද, මවනලද රූපයද එහිදී -පෙ- ප්‍රශ්න විචාරනලදුව විසඳයි. ඉදින් ඒ සෘද්ධිමත් තෙමේ ඔහු සමඟ හමුව සිටීද, සල්ලාපයෙහි යෙදේද, සාකච්ඡා කෙරේද, මවනලද රූපයද එහිදී ඒ බ්‍රහ්මයා සමඟ හමුව සිටියි. සල්ලාපයෙහි යෙදෙයි, සාකච්ඡා කරයි. ඒ සෘද්ධිමත් තෙමේ යම් යම් දෙයක් කෙරේද, මවනලද රූපයද ඒ ඒ දෙයම කරයි.[a] එහි, 'දූරෙපි සන්තිකෙ අධිට්ඨාති' (දූරෙහි සිටි දෙයද ළඟ සිටින සේ අධිෂ්ඨාන කරයි) යනු, පාදකධ්‍යානයෙන් නැඟී දුර සිටි දෙව්ලොව හෝ බඹලොව හෝ ළඟ සිටීවායි ආවර්ජනකොට, පිරියම් කොට, නැවත සමවැද ළඟ සිටීවායි ඥානයෙන් අධිෂ්ඨාන කරයි, එවිට ළඟ සිටියි. සෙසු පදවලද මේ නයම වේ. එහිලා කවුරු නම් දුර සිටි දෙය ගෙන

a. පටිසම්භිදාමග්ග ඉද්ධිකථා - part ii 209f.

ළඟ සිටිනසේ කළාහුද? භාග්‍යවතුන් වහන්සේය. භාග්‍යවතුන් වහන්සේ වනාහි යමාමහ පෙළහර අවසන්හි දෙව්ලොවට යනසේක් යුගන්ධර පර්වතයද මේරු පර්වතයද ළඟ සිටිනසේ කොට පොළෝ තෙලෙහි සිට එක් පියවරක් යුගන්ධර පර්වතයෙහි තබා දෙවන පියවර මේරුපර්වත මස්තකයෙහි තැබූ සේක. අන් කවරෙක් එසේ කළාහුද? මහමුගලන් තෙරණුවෝය. තෙරණුවෝ වනාහි සැවැත් නුවරදී බත්කිස නිමවා නික්මුණු දොළොස් යොදුන් පමණවූ පිරිස සංකස්ස නුවරට යන තිස් යොදුන් මඟ හකුලුවා එකෙණෙහිම එහි පැමිණවූහ.

තවද තම්බපණ්ණි දිවයිනෙහි චූළසමුද්ද තෙරණුවෝද එසේ කළාහුය. දුර්භික්ෂ සමයෙක්හි දී උදෑසනම සත්සියයක් භික්ෂූහු තෙරුන් වෙතට ආවාහුය. තෙරණුවෝ, 'මහා භික්ෂු සමූහයෙකි, කොතැනක පිඬුපිණිස හැසිරීම වන්නේදැ'යි සිතන්නාහු මුළු තම්බපණ්ණි දිවයිනෙහි කිසි තැනක් නොදැක, පරතෙර පැළැලුප් නුවරදී වන්නේය'යි දැක, 'ඇවැත්නි, එනු, පිඬු පිණිස යම්හ'යි පාසිවුරු ගන්වා පොළොව හකුලුවා පැළලුප් නුවරට ගියාහුය. භික්ෂූහු, 'ස්වාමීනි, පැළලුප් නුවර නම් දුර පිහිටියේය,' 'ඇවැත්නි, මහලු තෙරවරු දුර සිටි දෙයද ගෙන ළඟ සිටිනසේ කරති,' 'ස්වාමීනි, මහාසමුද්‍රය කොහිද?' 'ඇවැත්නි, අතරමඟ එක්තරා නිල්වන් ඇලක් පසුකොට ආවහු නොවවුද?' 'ස්වාමීනි, එසේය, මහාසමුද්‍රය නම් මහත්ය,' 'ඇවැත්නි, මහලු තෙරවරු මහත් දෙයද කුඩා කෙරෙති'යි කීහ. මේ තෙරුන් මෙන්ම චිත්තගුත්ත නම් තෙරණුවෝද සවස් වේලෙහි නහා තනිපට සිවුර පොරවාගෙන මහාබෝධිය වඳින්නෙමි'යි සිතක් උපන් කල ළඟ සිටින සේ සැලැස්වූහ. ළඟ සිටි දෙයක් දුර සිටිනසේ කළෝ කවරහුද? භාග්‍යවතුන්වහන්සේයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි තමන් ළඟ සිටි අංගුලිමාලයන් දුරින් සිටිනසේ සැලැස්වූහ. බොහෝවූ දෙයක් නොබොහෝ කළෝ කවරහුද? මහාකාශ්‍යප තෙරණුවෝය.

රජගහ නුවර නකත් දිනයෙක්හි පන්සියයක් කුමරියෝ චන්‍දපූව නම් කැවිලි වෙසෙසක් ගෙන නකත් කෙළි පිණිස යන්නාහු භාග්‍යවතුන් වහන්සේ දැක කිසිවක් නොදුන්හ, නැවත පසුව එන තෙරුන් දැක, 'අපගේ තෙරණුවෝ එන්නාහ, කැවිලි දෙම්හ'යි සියලුම කැවිලි ගෙන තෙරුන් වෙත එළඹියාහුය. තෙරණුවෝ පාත්‍රය ඇර කැවිලි සියල්ලම එක් පාත්‍රයක් පිරෙන තරම් කළහ. භාග්‍යවතුන් වහන්සේ තෙරුන් එන තෙක් ඉදිරියෙන් වැඩහුන් සේක, තෙරණුවෝ ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ.

ඉල්ලීස නම් සිටුවරයාගේ කථාපුවතෙහි වනාහි මහමුගලන් තෙරණුවෝ නොබොහෝවූ දෙය බොහෝ කළාහුය. කාකවලිය කථාවස්තුවෙහි භාග්‍යවතුන් වහන්සේද එසේ කළසේක. මහාකාශ්‍යප

තෙරණුවෝ සමවත් සුවයෙන් සත්දිනක් ඉක්මවා දිළිත්දනට සංග්‍රහ කරන්නාහු කාකවලිය නම් දුප්පත් මනුෂ්‍යයකුගේ දොරකඩ සිටියාහුය. ඔහුගේ භාර්යා තොමෝ තෙරණුවන් දැක ස්වාමියා සඳහා පිසනලද ලුණු ඇඹුල් නැති කැඳක් පාත්‍රයෙහි වත්කළාය. තෙරණුවෝ එය පිළිගෙන භාග්‍යවතුන් වහන්සේගේ අත තැබූහ. භාග්‍යවතුන් වහන්සේ එය මුළු මහත් භික්ෂුසංඝයාට පොහොනාසේ අධිෂ්ඨාන කළසේක. එක් පාත්‍රයෙකින් ගෙනා කැඳ සියල්ලනටම පොහොනේ විය. කාකවලිය තෙමේද සත්වන දිනයෙහි සිටු තනතුරු ලද්දේය.

හුදෙක් මඳවූ දෙයක් බොහෝ කරනු මතු නොවේ, මිහිරි දෙයක් නොමිහිරි කිරීමය, නොමිහිරි දෙයක් මිහිරි කිරීමය යන ආදියෙහිද යමක් යමක් රිසි වේද, ඍද්ධිමත් පුද්ගලයාට සියල්ල සිද්ධවේ. ඒ එසේමැයි, මහාඅනුල නම් තෙරණුවෝ බොහෝ භික්ෂූන් පිඬු පිණිස හැසිර වියලිබත් පමණක් ලැබ ගංතෙරෙක්හි හිඳ වළඳනු දැක ගඟදිය ගීරස බවට යේවා'යි අධිෂ්ඨානකොට සාමණේරුවරුන්හට ඇඟවූහ. ඔවුහු තලිවලින් ගෙනවුත් සංඝයාහට දුන්හ. සියල්ලෝම මිහිරි ගීරස සමඟ වැළඳූහ.

**දිබ්බෙන චක්ඛුනා** යනු, මෙහිම සිට ආලෝකකසිණය වඩා ඒ බ්‍රහ්මයාගේ රූපය දකියි, මෙහිම සිට බ්‍රහ්මයා කථාකරන කටහඬ අසයි, බ්‍රහ්මයාගේ සිත දනියි. **කායවසෙන චිත්තං පරිණාමෙති** යනු, කරජ කායයට (භෞතික ශරීරයට) අනුව සිත වඩවයි, පාදකධ්‍යානචිත්තය ගෙන කයෙහි ආරෝපණය කරයි, කයට අනුව ලැසි ගමන් ඇතිසේ කරයි, කය වනාහි (සිත මෙන් නොව) ලැසිගමන් ඇත්තේ වේ. **සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමති** යනු, පාදකධ්‍යානය අරමුණු කොටඇති ඍද්ධිචිත්තය හා සමඟ උපන් සුඛසංඥාවටද, ලහුසංඥාවටද බසියි. පිවිසෙයි, ස්පර්ශ කරයි, පැමිණෙයි. සුඛසංඥා නම් උපේක්ෂා සහගත හැඟීමයි, උපේක්ෂාව වූකලී ශාන්තවූ සුඛයෙකැයි කියනලදි. එම සංඥාවම නීවරණයන්ගෙන්ද, විතර්කාදී ප්‍රතිපක්ෂයන්ගෙන්ද මිදුණු හෙයින් ලහුසංඥායයිද දතයුතුය, එයට පිවිසෙන ඍද්ධිමත්හුගේ කරජකායද පුළුන් රොදක් මෙන් සැහැල්ලු වේ. හේ තෙමේ මෙසේ සුළඟින් ඔසවනලද පුළුන් රළක් සෙයින් සැහැල්ලුවූ දෘශ්‍යමානවූ කයින් බ්‍රහ්මලෝකයට යයි, මෙසේ යන්නේම, ඉදින් කැමැත්තේ නම්, පඨවිකසිණ වශයෙන් අහසෙහි මාර්ගයක් මවා පාගමනින් යයි, ඉදින් කැමැත්තේ නම්, වායෝකසිණ වශයෙන් සුළඟ ලෙසින් අධිෂ්ඨානකොට පුළුන් රොදක් සෙයින් සුළඟෙහි පාවී යයි. තවද යනු-කැමැතිබවම මෙහිලා ප්‍රමාණවේ. යනු කැමැතිබව පවත්නා කල්හි, මේ ආකාරයෙන් අධිෂ්ඨාන කළවිට එම අධිෂ්ඨාන වේගයෙන් මෙහෙයවනලද ඒ ඍද්ධිමත් තෙමේ දුන්නෙන් නැඟි ඊයක් සෙයින් දෘශ්‍යමානවම යයි. **චිත්තවසෙන කායං පරිණාමෙති** යනු, කය ගෙන සිත්හි පිහිටුවයි, ශීඝ්‍රවූ ගමන් ඇති සිතට අනුව යනසේ සලස්වයි,

සිතෙහි ගමන ශීඝ්‍රවේ. "සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමති' යනු රූපීවූ කය අරමුණුකොටඇති ඍද්ධිචිත්තය හා සමඟ උපන් සුඛසංඥාවටද, ලඝුසංඥාවටද පිවිසෙයි. සෙස්ස කියනලද නයින්ම දතයුතුයි. මේ වනාහි සිතෙහි ගමනම වේ, මේ ආකාරයෙන් අදෘශ්‍යමානවූ කයින් යුතුව යන මේ තෙමේ එම අධිෂ්ඨානචිත්තයාගේ උත්පාදක්ෂණයෙහි යන්නේද, නැතහොත් ස්ථිතික්ෂණයෙහි හෝ භංගක්ෂණයෙහි යන්නේදැ?යි විමසූ කල එම ක්ෂණත්‍රයයෙහිම යන්නේයයි තෙරණුවෝ පැවසූහ. තෙමේම යන්නේද? නැතහොත් නිර්මිත රූපය යවන්නේද? රිසි ලෙසක් කරයි, මෙහි වනාහි තමාගේම ගමන විස්තර කරන ලද්දේය.

මනොමයං යනු අධිෂ්ඨාන චිත්තයෙන් මවනලද හෙයින් මනෝමය වේ, අහීනින්‍ද්‍රියං යනු, චක්ඛුසෝතාදීන්ගේ හැඩරුව වශයෙනියි කියනලදී, නිර්මිතරූපයෙහි පසාදරූප ඇත්තේ නොවේ. 'ඉදින් ඍද්ධිමත් තෙමේ සක්මන් කෙරේද, නිර්මිතරූපයද එහි සක්මන් කරයි' යන ආදි සියල්ල ශ්‍රාවකනිර්මිතයන් උදෙසා කියනලදී. බුද්ධනිර්මිතය වනාහි භාග්‍යවතුන් වහන්සේ යමක් යමක් කරනසේක්ද, ඒ ඒ දෙයද කරයි, භාග්‍යවතුන් වහන්සේගේ රුචියට අනුව අන් දෙයක්ද කරයි. මෙහිලා ඒ ඍද්ධිමත් තෙමේ මෙහිම සිට දිව ඇසින් යම් රූපයක් දකීද, දිව කණින් යම් ශබ්දයක් අසාද, පරසිත් දන්නා නුවණින් යම් සිතක් දනීද, මෙපමණෙකින් කයින් වසඟයෙහි පවත්වනුයේ නොවේ, මෙහිම සිට ඒ තෙමේ ඒ බ්‍රහ්මයා සමග සිටීද, කථා කරයිද, සාකච්ඡා කරයිද, මෙපමණෙකින්ද කයින් වසඟයෙහි පවත්වනුයේ නම් නොවේ, දුර සිටම ළඟ සිටිනසේ අධිෂ්ඨාන කරයි යන ආදි වශයෙන් ඔහුගේ යම් අධිෂ්ඨානයක් වේද, මෙපමණෙකින්ද කයින් වසඟයෙහි පවත්වනුයේ නම් නොවේ, ඒ තෙමේ දෘශ්‍යමානවූ හෝ අදෘශ්‍යමානවූ කයින් යුතුව බ්‍රහ්මලෝකයට යන්නේද, මෙපමණකින්ද කයින් වසඟයෙහි පවත්වනුයේ නම් නොවේ. යම්සේ 'හේ තෙමේ ඒ බ්‍රහ්මයාගේ අබිමුවෙහි රූපයක් මවයි' යන ආදී නයින් කියනලද විධානය පැමිණේද, මෙපමණෙකින් කයින් වසඟයෙහි පවත්වනුයේ නම්වේ. සෙස්ස වනාහි මෙහි කයින් වසඟයෙහි පැවැත්වීමට පෙර අවස්ථාවන් දක්වනු පිණිස කියනලදි. මේ වනාහි අධිෂ්ඨාන ඍද්ධියයි.

විකුබ්බන ඍද්ධිය හා මනෝමය ඍද්ධිය අතර ඇති වෙනස මෙසේයි: විකුබ්බනය කරන්නහු විසින් වනාහි හේ තෙමේ ප්‍රකෘති වේශය හැර කුමාරවේශයක් හෝ දක්වයි, නාගවේශයක් හෝ දක්වයි. ගුරුළු වේශයක් හෝ දක්වයි, අසුර වේශයක් හෝ දක්වයි, ශක්‍ර වේශයක් හෝ දක්වයි, දේව වේශයක් හෝ දක්වයි, බ්‍රහ්ම වේශයක් හෝ දක්වයි, මුහුදු වේශයක් හෝ දක්වයි, පර්වත වේශයක් හෝ දක්වයි, සිංහ වේශයක් හෝ දක්වයි, ව්‍යාඝ්‍ර වේශයක් හෝ දක්වයි, ද්වීපි වේශයක් හෝ දක්වයි, ඇතකු වුවද දක්වයි, අසකු වුවද දක්වයි, රියක් වුවද, දක්වයි, පාබල

සෙනඟ වුවද දක්වයි, විවිධවූ බලමුළු වුවද දක්වයි'' යනුවෙන් මෙසේ කියන ලද කුමාර වේශාදිය අතුරෙන් යම් යම් වේශයක් රිසි වේද, ඒ ඒ වේශය අධිෂ්ඨාන කළයුතුය.

එසේ අධිෂ්ඨාන කරන විට පඨවිකසිණ ආදිය අතුරෙන් එක්තරා අරමුණක් සහිත අභිඥාපාදකධ්‍යානයෙන් නැඟී තමාගේ කුමාර වේශය ආවර්ජන කළ යුතුය, ආවර්ජනයකොට පිරියම් අවසන්හි යළිදු සමවැද එයින් නැඟී, 'මේ ආකාර ඇති කුමාරයෙක් වෙමි'යි අධිෂ්ඨාන කළයුතුය. එම අධිෂ්ඨාන චිත්තය හා සමගම කුමාරයකු බවට පත්වේ, දෙව්දත් තෙරුන් මෙනි. සියලු තන්හි මෙම නයයි. හත්ථිම්පි දසෙසති (ඇතකු වුවද දක්වයි) යන ආදිය මෙහි, බාහිරවූ ඇත් ආදීන් වුවද දැක්වීම් වශයෙන් කියනලදි. එහිදී 'ඇතෙක් වෙමි'යි අධිෂ්ඨාන නොකොට 'ඇතෙක් වේවා'යි අධිෂ්ඨාන කළයුතුය. අසකු ආදී තන්හිද මෙම නයයි. මේ විකුබ්බන ඍද්ධියයි.

මනෝමය ඍද්ධිය කරනු කැමැත්තේ වනාහි පාදකධ්‍යානයෙන් නැගී පළමුකොට කය ආවර්ජනකොට කියනලද නයින්ම එම කය 'රික්තයක් වේවා'යි අධිෂ්ඨාන කරයි, එවිට රික්තයක් වෙයි. ඉක්බිති තමාගේ සිරුර ඇතුළත අන් කයක් ආවර්ජනකොට පිරියම්දකොට තමාගේ කය ඇතුළත අන් කයක් වේවා'යි අධිෂ්ඨාන කරයි, හේ තෙමේ මුදුතණ පඳුරෙකින් ගොබයක් සෙයින්ද කොපුවෙන් කඩුවක් සෙයින්ද, පැසෙකින් සර්පයකු සෙයින්ද එම කය පිටතට නික්මවයි. එහෙයින් කියන ලදිඃ- ''මේ ශාසනයෙහි භික්ෂු තෙමේ මෙම කයින් රූප සහිතවූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති, නොඅඩු ඉඳුරන් සහිතවූ අන් කයක් මවයි, පුරුෂයකු මුදුතණ පඳුරෙකින් ගොබයක් නික්මවන සෙයිනි. ඔහුට මෙවන් අදහසෙක් වන්නේය. 'මේ මුදුතණ පඳුරයි, මේ ගොබයයි, මුදුතණ පඳුර එකෙකි, ගොබය අනිකෙකි. මුදුතණ පඳුරෙන්ම ගොබය නික්මවන ලදි.[a] මෙහිදී, යම් සේ තරුණ ගොබ ආදිය මුදුතණ ආදිය හා සමාන වේද, එසේම මනෝමය රූපය ඍද්ධිමත් පුද්ගලයා හා සමාන වෙතැයි දක්වනු පිණිස මේ උපමාවෝ කියන ලද්දාහුය. මේ මනෝමය ඍද්ධියයි.

සාධුජන ප්‍රමෝදය පිණිස කරන ලද විශුද්ධිමාර්ගයෙහි
සමාධිභාවනාධිකාරයෙහි ඉද්ධිවිධ නිද්දේස නම් වූ
දොළොස්වන පරිච්ඡේදය සමාප්තයි.

—//—

a. පටිසම්භිදා, ඉද්ධිකථා

# අභිඥා නිද්දේසය

## දිබ්බසොත ඥාණය

ඉක්බිත්තෙන් දිව්‍යංශ්‍රෝත්‍රධාතුව පිළිබඳ නිර්දේශක්‍රමය අනුපිළිවෙළින් පැමිණියේ වේ. එහිද පසුව එන අභිඥාත්‍රයයෙහිද, **සො එවං සමාහිතෙ චිත්තෙ** යන ආදියෙහි අර්ථය යට කීනයින්ම දතයුතුය. ඒ සියලු තන්හි විශේෂාර්ථයන් පමණක් විස්තර කරම්හ. එහි **දිබ්බාය සොතධාතුයා** යන මෙහි, දිව්‍ය සදෘශවූ හෙයින් දිබ්බ වේ. දෙවියන්හට වනාහි සුචරිත කර්ම හේතුකොට උපන් පිත්, සෙම්, ලෙහෙ ආදියෙන් පළිබෝධනොවූ, උපක්ලේශයන්ගෙන් මිදුණු හෙයින් දුරදී පවා අරමුණු ගැනීමේ හැකියාව ඇති, දිව්‍ය වූ පසාදරූප සෝතධාතු ඇත්තේය. මේ භික්ෂුහටද වීර්යභාවනා බලයෙන් උපන් ප්‍රසාදරූප ශ්‍රෝත්‍රධාතුව එබඳුම වෙතැ'යි, දිව්‍යසදෘශවූ හෙයින් 'දිබ්බ' නම්වේ. තවද, දිව්‍යවිහාරවශයෙන් ලබාගන්නා ලද හෙයින්ද තමා විසින් දිව්‍යවිහාරයන් ඇසුරු කරන ලද හෙයින්ද, 'දිබ්බ' නම්වේ. ශ්‍රවණාර්ථයෙන්ද, නිර්ජීවාර්ථයෙන්ද 'සොතධාතු' නම්වේ. ශ්‍රෝත්‍රධාතුකෘත්‍යයන් කරන හෙයින්ද, ශ්‍රෝත්‍රධාතු සමාන වෙතැ'යිද සෝතධාතු නම්වේ, එම දිව්‍ය වූ ශ්‍රෝත්‍රධාතු පිණිසයි. **විසුද්ධාය** යනු, පිරිසුදු වූ, උපක්ලේශ රහිත වූ ශ්‍රෝත්‍රධාතුව පිණිසයි. **අතික්කන්තමානුසිකාය** යනු, මනුෂ්‍ය විෂය ඉක්මවා ශබ්දයන් ශ්‍රවණය කිරීමෙන් මානුෂික මාංශමය ශ්‍රෝත්‍රධාතුව ඉක්මවූ, එයින් ඔබ්බට ගොස් සිටි ශ්‍රෝත්‍රධාතු, පිණිසයි. **උභො සද්දෙ සුණාති** යනු, ශබ්දද්වය ශ්‍රවණය කරයි. කවර ශබ්දද්වයක්ද? දිව්‍ය වූ හා මානුෂ වූ ශබ්දද්වයයි. දෙවියන්ගේද, මනුෂ්‍යයන්ගේද, ශබ්දයනැයි කී නියායි. මෙයින් ප්‍රදේශ වශයෙන් ගැනීම දතයුතුය. **යෙ දූරෙ සන්තිකෙ වා** යනු, යම් ශබ්දයක් පරසක්වළ තරම් දුර වූයේද, යම් ශබ්දයක් යටත් පිරිසෙයින් සිය සිරුර ඇසුරු කොට සිටි ප්‍රාණීන්ගේ ශබ්දයන් මෙන් ළං වූයේද, ඒ සියල්ල ශ්‍රවණය කරති'යි කී නියායි. මෙයින් ප්‍රදේශ භේදයෙන් තොරව සමස්ත වශයෙන් ගැනීම දතයුතුය. මේ දිව්‍යශ්‍රෝත්‍රධාතුව ඉපැදවිය හැක්කේ කෙසේද? ඒ භික්ෂුව විසින් අභිඥාපාදකධ්‍යානයට සමවැද, එයින් නැඟී, පරිකර්ම, සමාධි, චිත්තයෙන් පළමුකොට ප්‍රකෘති වශයෙන් ඇසෙන තෙක් මානයෙහි වූ වනයෙහි සිංහාදීන්ගේ ඖළාරික ශබ්දය ආවර්ජන කළයුතුය. විහාර භූමියෙහි ඝණ්ඨා ශබ්දය, බෙර ශබ්දය, ශංඛ ශබ්දය, මුළු ශක්තියෙන් සජ්ඣායන කරන සාමණේරයන්ගේ හා තරුණ භික්ෂූන්ගේ සජ්ඣායන ශබ්දය, 'කිමෙක්ද ස්වාමීනි,' 'කිමෙක්ද ඇවැත්නි'යි ආදී වශයෙන් සාමාන්‍ය කතාබස්හි යෙදුණවුන්ගේ ශබ්දය, පක්ෂීන්ගේ ශබ්දය, වාතශබ්දය, පියවර තබන ශබ්දය, පැසෙන දියෙහි 'චිටිචිටි' යන අනුකරණ ශබ්දය, අව්වෙහි වියලෙන තල්කොළවල ශබ්දය, කුරු කුහුඹුවන්ගේ ශබ්දයයි. මේ ආකාරයෙන් සියලු

ඕළාරික ශබ්දයෙහි පටන් අනුපිළිවෙළින් සියුම් වූ ශබ්දයන් ආවර්ජන කළ යුතුය. ඔහු විසින් නැගෙනහිර දිශාවෙහි වූ ශබ්දයන්ගේ නිමිති මෙනෙහි කළයුතුය, බටහිර දිශාවෙහි-උතුරු දිශාවෙහි-දකුණු දිශාවෙහි-යටි දිශාවෙහි - උඩු දිශාවෙහි - පූර්ව අනුදිශාවෙහි - අපර අනු දිශාවෙහි - උතුරු අනු දිශාවෙහි - දකුණු අනුදිශාවෙහි වූ ශබ්දයන්ගේ නිමිති මෙනෙහි කළයුතුය. ඕළාරික වූද සියුම්වූද ශබ්දයන්ගේ නිමිති මෙනෙහි කළයුතුය. එම ශබ්දයෝ ඔහුගේ ප්‍රකෘතිචිත්තයටද, ප්‍රකට වෙති, පරිකර්ම සමාධිචිත්තයට වනාහි අතිශයින් ප්‍රකට වෙති. මේ ආකාරයෙන් ශබ්දයන්ගේ නිමිති මෙනෙහි කරන ඔහුට, 'දැන් දිව්‍ය ශ්‍රෝත්‍රධාතුව උපදින්නේය'යි ඒ ශබ්දයන් අතුරෙන් එක්තරා ශබ්දයක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය පහළ වෙයි, එම මනෝද්වාරාවර්ජනය ඉකුත්වත්ම ජවන් සිත් සතරක් හෝ පසක් දිවෙයි, එම ජවන් අතුරෙන් පළමු තුන් හෝ සතර පරිකර්මය, උපචාරය, අනුලෝමය, ගොත්‍රභූය යන නම් ඇති කාමාවචර චිත්තයෝය, සිවුවන හෝ පස්වන අර්පණා චිත්තය චතුර්ථ ධ්‍යානික රූපාවචර චිත්තය වේ. එහිදී එම අර්පණා චිත්තය හා සමඟ උපන් යම් ඥානයක් වේද, එය දිව්‍යශ්‍රෝත්‍ර ධාතුවයයි දතයුතුය. එතැන් පටන් එම ශ්‍රෝත්‍රධාතු-විෂයෙහි අත්දුටුවකු බවට පත්වේ.

එම ශ්‍රෝත්‍රධාතුව තර කරමින් එක් අඟලක් පමණ තැන් ගෙන, 'මෙය ඇතුළත වූ ශබ්දයන් අසමි'යි පිරිසිඳ වැඩිය. යුතුය, ඉක්බිති දෑඟුලක්, සතරඟුලක්, අටඟුලක්, වියතක්, රියනක්, පමණ තැන්, ඇතුල් ගැබ, ආලින්දය, ප්‍රාසාදය, පිරිවෙණ, සංඝාරාමය, ගොදුරුගම, ජනපදය, ආදී වශයෙන් සක්වළ පමණ තෙක්, එයටත් වැඩි තරම් තැන් ගෙන පිරිසිඳ වැඩියයුතුය. මෙසේ ලබාගත් අභිඥා ඇති මේ තෙමේ පාදකධ්‍යානාරම්මණයෙන් අල්වාගත් අවකාශය ඇතුළත වූ ශබ්දයන් නැවත පාදකධ්‍යානයට නොසමවැදම එම අභිඥා ඥානයෙන්ම අසන්නේමය. මෙසේ අසනුයේම බඹලොව තෙක් සක්හඬ, බෙරහඬ, පණාබෙරහඬ ආදියෙන් එක් කොළහල වූයේ නමුදු, එකක් එකක් වෙන් වෙන් වශයෙන් ගෙන හඳුනා ගැනීමේ කැමැත්ත ඇති විට, 'මේ සක්හඬය, මේ බෙරහඬය'යි වෙන් කොට හඳුනාගනු සමත් වේමය.

දිබ්බසෝතධාතු කථාව නිමියේය.

—//—

## චෙතොපරිය ඤාණය

චේතෝපරිය ඤාණ කථාවෙහි, චෙතොපරියඤාණය යනු, මෙහි, විනිවිද යෙති'යි 'පරිය' නම්, පිරිසිඳියි යන අර්ථයි. සිත පිරිසිඳීම 'චේතෝපරිය' නම්, 'චේතොපරිය'ම ඤාණ වෙති'යි 'චේතොපරියඤාණ'

නම්වේ. එම ඥානය ලබනු පිණිසැයි කී නියායි. පරසත්තානං යනු, තමා හැර සෙසු පුද්ගලයන්ගේයි, පරපුග්ගලානං යන මෙයද එයට සමාන අර්ථ ඇත්තේය. වෙනේය - නය වශයෙන්ද, දේශනානය වශයෙන්ද ව්‍යඤ්ජන නානත්වය (එකිනෙකට ව්‍යඤ්ජන වශයෙන් වෙනස් අර්ථ වශයෙන් සමාන වචන දෙකක් යෙදීම) කරනලදී; චෙතසා චෙතො යනු, තමාගේ සිතින් ඒ පරපුද්ගලයන්ගේ සිතයි; පරිච්ච යනු පිරිසිඳැ'යි. පජානාති යනු, සරාගී ආදී වශයෙන් විවිධාකාරයෙන් දනියි. මේ ඥානය ඉපැදවියයුතු වනුයේ කෙසේද? මෙය වනාහි දිබ්බචක්ඛු ඤාණ වශයෙන් සිද්ධවේ. එම ඥානය මෙයට පිරියම් වන්නේය; එහෙයින් එම භික්ෂුව විසින් ආලෝක කසිණය වඩා දිවැසින් අන්පුද්ගලයකුගේ හෘදයරූපය ඇසුරු කොට පවත්නා ලෝහිතයෙහි වර්ණය බලමින් සිත සෙවියයුතුය; යම් විටෙක සොම්නස් සිතක් පවත්නේද, එවිට ඉදුණු නුග පලයෙක වර්ණය මෙන් රක්ත-වර්ණ වේ; යම් විටෙක දොම්නස් සිතක් පවත්නේද, එවිට ඉදුණු දඹපලයෙක වර්ණය මෙන් කාලවර්ණ වේ; යම්විටෙක උපේක්ෂා සිතක් පවත්නේද, එවිට තලතෙල් මෙන් පැදුණු වර්ණ ඇත්තේ වේ; එහෙයින් මේ භික්ෂුව විසින් 'මේ හෘදයරූපය සොම්නස් සහිත ඉන්‍ද්‍රියයෙන් හටගත්තේය, මේ හෘදයරූපය දොම්නස් සහිත ඉන්‍ද්‍රියයෙන් හටගත්තේය, මේ හෘදයරූපය උපේක්ෂාසහිත ඉන්‍ද්‍රියයෙන් හටගත්තේය'යි අන්‍යයන්ගේ හෘදය-ලෝහිත-වර්ණය බලමින්, සොයමින් චේතෝපරියඥාණය තර කළයුතුය. මේ ආකාරයෙන් චේතෝපරියඥාණය තර කරගත් කල අනුපිළිවෙළින් කාමාවචර වූද, රූපාවචර- අරූපාවචර වූද සියලු සිත් දැනගනියි. තමාගේ සිත අනිකාගේ සිතතුළ හසුරුවමින් හෘදයරූපය දැකීමෙන් තොරවද දැනගනියි. අටුවාවෙහි කියන ලද්දේමයඃ- "අරූපධ්‍යාන විෂයෙහිදී අන්‍යයාගේ සිත දන්නා කැමැත්තේ කවරකුගේ හෘදයරූපය දක්නේද? කවරකුගේ ඉන්‍ද්‍රියවිකාරය බලන්නේද? කිසිවකුගේ හෝ නොදකියි, නොබලයි, යම්කිසි භූමියෙක සිතක් ආවර්ජනය කරමින් සොළොස් ආකාර සිත දනී නම්, මේ ඍද්ධිවිෂයයි. නොකරන ලද අභිනිවේශ (භාවිත) ඇත්තහුගේ වශයෙන් මෙසේ (හෘදයරූප වශයෙන්) කියනලදී" යනුවෙනි. සරාගං වා චිත්තං යන ආදියෙහි වනාහි අටවැදෑරුම් ලෝභ සහගත සිත් සරාගසිත් යයි දතයුතුයි. කුශල වූද, අව්‍යාකෘත (කුසල් හෝ අකුසල් නොවූ) වූද සෙසු සියලු චතුර්භූමක සිත් රාගරහිත සිත්ය. ද්වේශසහගත සිත් දෙකද, විචිකිච්ඡා හා උද්ධච්ච සිත් දෙකදැයි යන මේ සිත් සතර මෙම ද්විකයෙහි ඇතුළත් නොවේ. ඇතැම් තෙරවරු එම සිත්ද, (රාග රහිත සිත් ලෙස) ගනිති. දෙවැදෑරුම් දොම්නස් සිත් ද්වේශ සහිත සිත් නම් වේ. කුශලවූද අව්‍යාකෘත වූද සෙසු සියලු චතුර්භූමක වූ සිත් ද්වේශරහිත වේ, ඉතිරි අකුසල් සිත් දසය මෙම ද්විකයෙහි ඇතුළත් නොවේ, ඇතැම් තෙරවරු එම සිත්ද ගනිති. සමෝහං වීතමෝහං යන මෙහි වෙන් වෙන් වශයෙන් විචිකිච්ඡා හා උද්ධච්ච යන සිත් දෙකම සමෝහ වේ, මෝහය වනාහි සියලු අකුශලයන්හි උපදින හෙයින් දොළොස් වැදෑරුම්

වූම අකුසල් සිත් සමෝහ සිත්යයි දතයුතුය, සෙසු සිත් මෝහ රහිත වේ. ථීනමිද්ධය අනුව ගිය සිත සංඛිත්ත නම් වේ, උද්ධච්චය අනුව ගිය සිත වික්ඛිත්ත නම් වේ. රූපාවචර අරූපාවචර සිත් මහග්ගත නම් වේ. සෙසු සිත් අමහග්ගත නම්වේ. සියලු ත්‍රෛභූමක සිත් ස-උත්තර නම්වේ. ලොකෝත්තර සිත් අනුත්තර නම්වේ. උපචාරයට පැමිණියාවූද, අර්පණාවට පැමිණියා වූද, සිත් සමාහිත නම් වේ. ඒ දෙකින් එකකට හෝ නොපැමිණි සිත් අසමාහිත නම් වේ. තදඞ්ග-වික්ඛම්භන-සමුච්ඡේද -පටිප්පස්සද්ධි-නිස්සරණ වශයෙන් විමුක්තියට පැමිණිසිත් විමුක්ත නම්වේ. මෙකී පස් ආකාරයෙන් එක් ආකාරයෙකින් හෝ විමුක්තියට නොපැමිණි සිත් අවිමුත්ත නමැ'යි දතයුතුය. මේ ආකාරයෙන් චේතෝපරියඤාණය ලබාගත් භික්‍ෂුතෙමේ සරාගවූ හෝ සිත-පෙ-අවිමුත්ත වූ හෝ සිත අවිමුත්ත සිතයයි දැනගනියි.

චේතෝපරියඤාණකථාව නිමියේය

—//—

## පුබ්බෙනිවාසානුස්සති ඤාණය

පුබ්බේනිවාසානුස්සති ඤාණකථාවෙහි:- පුබ්බෙනිවාසානුස්සති ඤාණය යනු පෙර වුසූ කඳ පිළිවෙළ සිහි කිරීමේ යම් ඥානයක් වේද, එය සඳහායි. පුබ්බෙනිවාසො යනු, පෙර අතීත ජන්මයන්හි වුසූ ස්කන්ධයෝයි. 'නිවුත්ථා' යනු, වාසය කළ, අත්දුටු, තමාගේ සන්තානයෙහි ඉපිද පහවීගිය, නිවුත්ථක්ඛන්ධයෝයි. 'නිවුත්ථා' යනු, ගෝචර නිවාස වශයෙන් වාසය කළ (ස්වකීය විෂය පථයට අයත්ව පැවති) ස්කන්ධයෝය, තමාගේ විඤ්ඤාණයෙන් දන්නා ලද, පිරිසිඳින ලද ස්කන්ධයෝය. නැතහොත්, ඡින්නවටුමකා* (හෙවත් සසරවට සුන්කළ) බුදුවරයන්ගේ අනුස්මරණාදියෙහිදී මෙන් අනුන්ගේ විඤ්ඤාණයෙන් දන්නා ලද, ස්කන්ධයෝය, මෙකී ස්කන්ධයෝ හුදෙක් බුදුවරයන්හටම විෂය වෙති. 'පුබ්බෙනිවාසානුස්සති' යනු, යම් ස්මෘතියෙකින් පෙර වුසූ කඳ පිළිවෙළ අනුස්මරණය කරනු ලැබේද, එය පුබ්බේනිවාසානුස්සති නම්වේ; 'ඤාණං' යනු, එම ස්මෘතියෙන් යුක්තවූ ඥානයයි. මෙසේ මෙම පුබ්බේනිවාසානුස්සති ඤාණය පිණිසයි. පුබ්බේනිවාසානුස්සති ඤාණය සඳහායි. මෙම ඥානය අවබෝධ කර ගනු, පැමිණෙනු පිණිසැයි කී නියායි. අනෙකවිහිතං යනු, අනේකවිධ වූ, අනේකප්‍රකාරයෙන්

---

* 'ඡින්නවටුමක' යනු පෙර බුදුවරයන් හැඳින්වීම පිණිස යෙදුණ අභිධානයෙකැයි පැවසේ. Ven. Nānamoli Bhikkhu: Visuddhimagga translation; on p. 451 මජ්ඣිම නිකාය III. 118 වැනි පිටුව.

පවත්වනලද, මොනවට විස්තර කරන ලදැ'යි (.න අර්ථයි. පුබ්බෙනිවාසං යනු, ආසන්නවූ පූර්වභවයෙහි පටන් ඒ ඒ තන්හි වුසූ සන්තානයයි. අනුස්සරති යනු, කඳ පිළිවෙළ වශයෙන් හෝ චුති පටිසන්ධි වශයෙන් හෝ අනුව එමින් සිහිකරයි. මෙම පුබ්බෙනිවාසය සිහිකරන්නාහු සදෙනෙක් වෙතිඃ- අන්‍ය ශාස්තෘවරයෝය. සාමාන්‍ය ශ්‍රාවකයෝය, මහාශ්‍රාවකයෝය, අග්‍රශ්‍රාවකයෝය, පසේබුදුවරයෝය, සම්මා සම්බුදුවරයෝය යන මොහුය. එහි, අන්‍ය ශාස්තෘවරයෝ කප් සතළිසක් සිහි කෙරෙති, එයින් එපිට සිහි නොකෙරෙති, කවර හෙයින්දයත්, දුර්වල ප්‍රඥා ඇති හෙයිනි, නාමරූප-පරිච්ඡේද විරහිත වූ හෙයින් ඔවුන්ගේ ප්‍රඥාව දුර්වලවේ. සාමාන්‍ය ශ්‍රාවකයෝ කප් සියයක්ද, කප් දහසක්ද, වුව සිහි කෙරෙත්මය, බලවත් වූ ප්‍රඥා ඇති හෙයිනි. අසූ මහාශ්‍රාවකයෝ සුවහසක් කප් සිහි කෙරෙති, අග්‍රශ්‍රාවකයෝ - ඒකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද, පසේ බුදුවරයෝ ද්ව්‍යසංඛ්‍ය කල්ප ලක්‍ෂයක්ද සිහි කෙරෙති, ඔවුන්ගේ අභිනීහාරය එපමණෙකි. බුදුවරයන්ගේ අභිනීහාරයෙහි වනාහි ඉමක් කොණක් නැත. තීර්ථකයෝ හුදෙක් කඳ පිළිවෙළම සිහි කෙරෙති, කඳ පිළිවෙළ හැර චුතිපටිසන්ධි වශයෙන් සමරනු නොසමත් වෙති. අන්ධයනට මෙන් ඔවුනටද කැමැති කැමැති පෙදෙසකට යා නොහැකිය. යම්සේ අන්ධයෝ යෂ්ටිය නොහැරම යෙත්ද, එසේම තීර්ථකයෝ කඳපිළිවෙළ නොහැරම සමරති. සාමාන්‍ය ශ්‍රාවකයෝ කඳපිළිවෙළ වශයෙන්ද සමරති, චුතිපටිසන්ධි වශයෙන්ද සමරති. අසූ මහාශ්‍රාවකයෝද එසේය. අග්‍රශ්‍රාවකයන් දෙදෙනාහට වනාහි කඳපිළිවෙළ සැමරීමේ කාර්යයක් නැත, එක් ආත්මභාවයෙක චුතිය දැක පටිසන්ධිය දනිති, මෙසේ චුතිපටිසන්ධි වශයෙන් සංක්‍රමණය කෙරෙමින් යෙති. පසේ බුදුවරයෝද එසේය. බුදුවරයන්හට වනාහි කඳපිළිවෙළ අනුව හැසිරීමේ කාර්යයක් හෝ චුතිපටිසන්ධි වශයෙන් යාමේ කාර්යයක් හෝ නොමැත. ඔවුනට වනාහි නොයෙක් කප් කෙළ ගණනෙකින් යට හෝ මතු හෝ යම් යම් තැනක් රිසි වේද, ඒ ඒ තැන ප්‍රකට වේමය. එහෙයින් කප් කෙළ ගණනක් වුවද පෙය්‍යාල පෙළක් මෙන් සංක්ෂේප කොට යම් යම් තැනක් කැමැති වෙත්ද, ඒ ඒ තැනට යමින් සිංහාවක්‍රාන්ත (සිංහයාගේ පැනීම) වශයෙන් යෙති. මෙසේ ගමන් කරන ඔවුන්ගේ ඥානය, යම්සේ අස්ලොම් විදීමෙහි පලපුරුදු ඇති සරභංගයන් වැනි දුනුවායකු විසින් විදින ලද හීසරයක් අතරතුර ගස්වැල් ආදියෙහි නොපැටලී ඉලක්කයටම වදීද, නොපැටලේද, නොපැකිලේද, එසේම අතරතුර ආත්මභාවයන්හි නොපැටලේ, නොපැකිලේ, නොපැටලී නොපැකිලී කැමැති කැමැති තැනම අල්වා ගනියි. පූර්වේනිවාසස්මරණය කරන මෙම සත්වයන් අතුරෙන් තීර්ථකයන්ගේ පූර්වේනිවාසදර්ශනය කණමැදිරි එළියක් හා සමානව වැටහෙයි; සාමාන්‍ය ශ්‍රාවකයන්ගේ දැකීම පහන් එළියක් හා සමානවද, මහාශ්‍රාවකයන්ගේ දැකීම හුළු එළියක් හා සමානවද, අග්‍රශ්‍රාවකයන්ගේ

දැකීම 'ඕසධී තාරකාවෙහි එළිය යා සමානවද, පසේබුදුවරයන්ගේ දැකීම සඳඑළිය හා සමානවද, සම්බුදුවරයන්ගේ දැකීම දහසක් රැසින් ප්‍රතිමණ්ඩිත සරත් සූර්යමණ්ඩලය හා සමානවද වැටහේ. තීර්ත්‍ථකයන්ගේ පූර්වේනිවාසානුස්මරණය අන්‍ධයන් සැරයටි කෙළවර ගෙන යන ගමන වැනි වේ; සාමාන්‍ය ශ්‍රාවකයන්ගේ අනුස්මරණය හේ-දණ්ඩෙක යන ගමන මෙන්ද, මහාශ්‍රාවකයන්ගේ අනුස්මරණය පාගමනින් යාහැකි පාලමෙක යන ගමන මෙන්ද, අග්‍රශ්‍රාවකයන්ගේ අනුස්මරණය පාගමනින් යාහැකි පාලමෙක යන ගමන මෙන්ද, අග්‍රශ්‍රාවකයන්ගේ අනුස්මරණය ගැල් පාලමෙක යන ගමන මෙන්ද, පසේබුදුවරයන්ගේ අනුස්මරණය අඩිපාරෙක යන ගමන මෙන්ද, සම්බුදුවරයන්ගේ අනුස්මරණය මහගැල් මඟෙක යන ගමන මෙන්ද වේ. මේ වර්ණනයෙහි ලා (අගසවු දෙනම හැර සෙසු) ශ්‍රාවකයන්ගේ පූර්වේනිවාසානුස්මරණය අභිප්‍රේතයි. එහෙයින් ''අනුසරති යනු, කඳ පිළිවෙළ අනුව හෝ චුතිපටිසන්‍ධි වශයෙන් හෝ යමින් හැසිරෙති''යි කියන ලදි. එසේ හෙයින් මේ ආකාරයෙන් සමරනු කැමැති ආධුනික භික්‍ෂුව විසින් පිඬු පිණිස ගොස් වළඳා ඉක්බිති, හුදෙකලාව විවේකීව පිළිවෙළින් සතර ධ්‍යානයට සමවැද අභිඥා පාදක චතුර්ත්‍ථධ්‍යානයෙන් නැඟී අවසන් වරට කළ හිඳීම ආවර්ජන කළ යුතුය, එතැන් සිට අසුන් පැනවීමද, සෙනසුනට පිවිසීමද, පාසිවුරු පිළියෙල කොට තැබීමද, භෝජනකාලයද, ගමින් ආ කාලයද, ගමෙහි පිඬු පිණිස හැසිරුණ කාලයද, විහාරයෙන් නික්මුණු කාලයද, සෑ-මලුවෙහි, බෝ-මලුවෙහි වන්‍දනා කළ කාලයද, පාත්‍රය සේදූ කාලයද, පාත්‍රය පිළිගත් කාලයද, පාත්‍රය පිළිගැනීමේ පටන් මුව දෙවීම දක්වා කළ කාර්යයන්ද, අළුයම් කාලයෙහි කළ කාර්යයන්ද, මැදියම් කාලයෙහි කළ කාර්යයන්ද, පෙරයම් කාලයෙහි කළ කාර්යයන්දැයි මෙසේ ප්‍රතිලෝම ක්‍රමයෙන් දිවාරෑ කළ සියලු කාර්යයන් ආවර්ජන කළ යුතුය. මෙපමණක් ප්‍රකෘතිචිත්තයටද, ප්‍රකටවේ, පරිකර්ම සමාධි චිත්තයට ඉතා ප්‍රකට වේමය. ඉදින් මෙහිලා යම් කිසිවක් ප්‍රකට නොවේනම්, යළිත් පාදකධ්‍යානයට සමවැද එයින් නැඟී ආවර්ජන කළයුතුය; මෙතෙකින් පහනක් දැල්වූ කල මෙන් ප්‍රකටවේ. මේ ආකාරයෙන් ප්‍රතිලෝම ක්‍රමයෙන්ම දෙවන දවස්හිද, තුන්වන, සතරවන, පස්වන දවස්හිද, දසදිනක්, අඩමසක්, මසක්, වසරක් දක්වාද, කරන ලද කාර්යයන් ආවර්ජන කළයුතුය; මෙනයින්ම දසවසක්, විසිවසක්දැ'යි යම්තාක් තමාගේ මේ භවයෙහි ප්‍රතිසන්‍ධිය වීද, ඒතාක් ආවර්ජන කරමින් පූර්වභවයෙහි ච්‍යුතික්‍ෂණයෙහි පැවැති නාමරූපයන් ආවර්ජන කළයුතුය. නුවණැති භික්‍ෂු තෙමේ පළමු වරම ප්‍රතිසන්‍ධිය උගුළුවා (ඉක්මවා) ච්‍යුතික්‍ෂණයෙහි වූ නාමරූපයන් අරමුණු කර ගැනීමට සමත් වන්නේමය. යම් හෙයකින් පූර්වභවයට අයත් නාමරූපයන් අශේෂ වශයෙන් නිරුද්ධවී (මේ භවයෙහි) අනෙකක් උපන්නේ නම් එම ස්ථානය දුර්වල ප්‍රඥා ඇත්තකුට අන්‍ධකාරයෙන් වැසී ගිය බාධක ස්ථානයක් සෙයින්

පහසුවෙන් දැක යත නොහැකි වනු ඇත. එසේ වතුදු, 'ප්‍රතිසන්ධිය ඉක්මවා ච්‍යුතික්ෂණයෙහි පැවති නාමරූපයන් අරමුණු කොට ගැනීමට මම නොසමත් වෙමි'යි අපේක්ෂිත කාර්යය හැර දැමීම නොකළ යුතුය; එම පාදකධ්‍යානයට යලි යලිදු සමවැදිය යුතුය, එයින් නැඟී එම ස්ථානය ආවර්ජන කළ යුතුය, මෙසේ කරනුයේ වනාහි, යම්සේ ශක්තිමත් පුරුෂයෙක් කූටාගාරයකට කැණිමඩලක් සඳහා මහරුකක් කපනුයේ අතුරිකිලි සිඳලූ පමණින්ම පොරෝතලය මොට වී ගිය කල මහරුක කපා හෙලන්නට නොහැකි වනුයේ නමුදු, අපේක්ෂිත කාර්යය හැරදැමීම නොකොට කම්හලට ගොස් පොරොව මුවහත් තබවා ගෙන පෙරළා අවුත්, කපනුයේද, නැවත මොට වුවහොත් නැවත එසේ කරවා ගෙන කපනුයේද, මෙසේ කැපීමේදී කැපූ කැපූ දෙය නැවත කැපියයුතු නොවන හෙයින් නොකැපූ දෙයම කපමින් නොබෝ කලෙකින්ම මහරුක කපා හෙලනුයේද, එසේම පාදකධ්‍යානයෙන් නැඟී මුලින් ආවර්ජන කළ දෙය යලි ආවර්ජන නොකොට ප්‍රතිසන්ධියම ආවර්ජන කරනුයේ නොබෝ කලෙකින්ම ප්‍රතිසන්ධිය ඉක්මවා ච්‍යුතික්ෂණයෙහි පැවැති නාමරූපයන් අරමුණු කොටගන්නේය. කට්ඨපාලක (දර පළන්නා), කේසෝහාරක (හිසකේ කපන්නා) ආදී උපමාවන්ගෙන්ද, මෙම අර්ථය පැහැදිලි කළයුතුය. මෙහි අවසන්වරට හිඳ ගැනීමේ පටන් ප්‍රතිසන්ධිය දක්වා අරමුණු කොට පැවැති ඥානය පුබ්බේ නිවාසඤාණ නම් නොවේ, එය පරිකම්මසමාධි-ඤාණ නම්වේ, ඇතැමෙක් 'අතීතංසඤාණ'යයිද කියති; රූපාවචර ඥාණය සඳහා එය නොයෙදේ. යම් කලෙක වනාහි මෙම භික්ෂූහට ප්‍රතිසන්ධිය ඉක්මවා ච්‍යුතික්ෂණයෙහි පැවැති නාමරූපයන් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය උපදීද, එයද ඉකුත්ව එයම අරමුනුකොට ජවන් සිත් සතරක් හෝ පසක් දිවෙයි, සෙස්ස පෙර කී නයින්ම වේ; පරිකර්මකාදි නම්වූ පළමු ජවන් සිත් කාමාවචර වේ. චතුර්ථධ්‍යානික අර්පණා චිත්තය වූ අවසන් ජවනය රූපාවචර වේ. එකල ඒ ජවන් සිත හා සමඟ යම් ඥානයක් උපදීද, මෙය 'පුබ්බේනිවාසානුස්සතිඤාණ' නම්වේ. එම ඥානයෙන් යුක්තවූ සතියෙන් අනේක ප්‍රකාරවූ පුබ්බේ-නිවාසයන් ආකාර සහිතව විස්තර සහිතව සිහි කරයි.

එහි 'එක් ජාතියකද (එකම්පි ජාතිං) යනු, ප්‍රතිසන්ධියෙහි පටන් ච්‍යුතිය අවසන් කොට ඇති එක් භවයකට අයත් එක් කඳපිළිවෙළකි. **ද්වෙපි ජාතියො** යන ආදියෙහිද, මෙම නයයි. **අනෙකෙපි සංවට්ටකප්පෙ** යන ආදියෙහි වනාහි පිරිහෙමින් පවත්නා කල්පය සංවට්ටකප්ප යයිද, වැඩෙමින් පවත්නා කල්පය විවට්ට කප්පයයිද දතයුතුය. එහි 'සංවට්ට' යනුවෙන් සංවට්ටට්ඨායී (පිරිහෙමින් සිටි) කල්පය ගන්නා ලදි, විනාශය මුල් කොට ඇති හෙයිනි, 'විවට්ට' යනුවෙන් විවට්ටට්ඨායී (වැඩෙමින් සිටි) කල්පය ගන්නාලදි. මෙසේ ඇති කල්හි, ''මහණෙනි, කල්පයකට අසංඛෙය්‍ය සතරෙකි, ඒ කවරේද, සංවට්ටය, සංවට්ටට්ඨායීය, විවට්ටය,

විවට්ටට්ඨායීය යන මේයි''[a] යනුවෙන් යම් කල්පයක් කියන ලද්දේද, එය ගන්නා ලදි. එහි සංවට්ට කල්ප තුනෙකි. ආපෝ සංවට්ටය, තේජෝ සංවට්ටය, වායෝ සංවට්ටය යනුවෙනි. සංවට්ට සීමාද තුනෙකි, ආභස්සර සීමාය, සුභකිණ්හ සීමාය, වේහප්ඵල සීමාය යනුවෙනි. යම් කලෙක කල්පය ගින්නෙන් වැනසේද, එකල ආභස්සර බඹලොවින් යට ගින්නෙන් දැවීයයි. යම් කලෙක ජලයෙන් වැනසේද, එකල සුභකිණ්හ බඹලොවින් යට ජලයෙන් දියවී යයි, යම් කලෙක වාතයෙන් නැසේද, එකල වේහප්ඵල බඹලොවින් යට සුළඟින් විදැහී යයි. විතරින් වනාහි සැමකල්හිම එක් බුද්ධකෙෂ්ත්‍රයක් වැනසේ, බුද්ධක්ෂේත්‍රයද ත්‍රිවිධ වේ: ජාතික්ෂේත්‍රය, ආඥාක්ෂේත්‍රය, විෂයක්ෂේත්‍රය යනුවෙනි. එහි ජාතික්ෂේත්‍රය දසදහසක් සක්වළ සීමා කොට ඇත්තේය; මෙය තථාගතයන් වහන්සේගේ ප්‍රතිසන්ධිග්‍රහණාදිය සිද්‍ධ වන විට කම්පා වේ; ආඥාක්ෂේත්‍රය සුවහසක් සක්වළ සීමා කොට ඇත්තේය, එහි රතනසූත්‍රය, ඛන්ධ පරිත්තය, ධජග්ග පරිත්තය. ආටානාටිය පරිත්තය. මෝරපරිත්තය යන මේ පරිත්තයන්ගේ ආනුභාවය පවත්නේය; විෂයක්ෂේත්‍රය අනන්තාපරිමාණ වේ, නොහොත් එය අභිමත වනුයේ යම්තාක්ද, ඒතාක්යයි කියනලදි. එහි තථාගතයන් වහන්සේ යම් යම් දෙයක් කැමැති වන සේක්ද, ඒ ඒ දෙය දක්නා සේක. මෙසේ මේ ත්‍රිවිධ බුද්ධක්ෂේත්‍රයන් අතුරෙන් එක් ආඥාක්ෂේත්‍රයක් වැනසේ. එය නැසුණ කල ජාතික්ෂේත්‍රයද නැසුණේ වේ. නැසෙන කලද. එක්වම නැසේ, හටගන්නා කලද එක්වම හටගනියි. මෙසේ එහි විනාශයද, නැවත හටගැනීමද, දතයුතුය. යම් කලෙක කල්පය ගින්නෙන් නැසේද, එකල පළමු කොට කල්පවිනාශක මහාමේඝයක් නැඟී කෙළ සුවහසක් සක්වළ, එක පැහැර මහවැස්සක් වසියි; මනුෂ්‍යයෝ තුටුපහටුව සියලු බිජුවට ගෙන වපුරත්, ශස්‍යය ගවයින් කනතරම් වැඩුණු තැන්පටන් කොටළු හඬ වැනි ගිගුරුම් හඬ නඟනු මිස එක් බිඳක් හෝ නොවසියි, එදා නැවතුණු වැසි නැවතුණේම වේ. මේ බව පවසනු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින්, ''මහණෙනි, බොහෝ වස් ගණනක්, බොහෝ සියවස් ගණනක් බොහෝ දහස්වස් ගණනක් බොහෝ සුවහස්වස් ගණනක් වැසි නොවසීද, එවන් කලෙක් වන්නේය''[b]යි කියන ලදි. වැසි නිසා ජීවත් වන සත්ත්වයෝද, මල්පල නිසා ජීවත්වන දේවතාවෝද, කලුරිය කොට බඹලොව උපදනාහුය; මෙසේ දිගුකලක් ඉකුත්ව ගිය කල තන්හි තන්හි ඇති ජලය ක්ෂය වීයයි, එවිට පිළිවෙළින් මස් කසුබ් ආදීහුද, නිරයගත සත්ත්වයෝද කලුරිය කොට බඹලොව උපදනාහුය. එහි නිරයගත සත්ත්වයෝ සත්වන සූර්යයා පහළ වන්නාහාම වැනසෙති'යි ඇතැමෙක් කියති; ධ්‍යානයෙන් තොරව බඹලොව උපතෙක් නැත, මොවුනතුරෙන්ද කිසිවෙක් දුර්භික්ෂයෙන් පෙළුණාහු වෙති, කිසිවෙක් ධ්‍යානාධිගමය පිණිස අභව්‍යයෝ

a. අං. නි. චතුක්ක නිපාත

b. අ. නි. සත්තක නිපාතය

(නොසුදුස්සෝ)ය, ඔහු කෙසේ උපදින්නාහුද? දෙව්ලොවදී ලබාගත් ධ්‍යාන වශයෙනි. එකල සුවහස් වස් ඉකුත්වීමෙන් කල්ප විනාශය වන්නේයයි ලෝකව්‍යුහ (ලෝකාරක්‍ෂක) නම් කාමාවචර දෙවියෝ වොටුණු රහිත හිසින් විසුරුණු කෙස් ඇතිව හඬමින් වැලපෙමින් දෙ-අතින් කඳුලු පිසිමින් රතු ඇඳුම් ඇඳගෙන ඉතා විරූපවූ වෙස් දරමින් මිනිස් ලොව සැරිසරන්නාහු මෙසේ සැල කරන්නාහුයः- "සබඳිනි, සබඳිනි, මෙයින් සුවහස් වස්ගිය තැන කල්පාවසානය වන්නේය, මේ ලෝකය විනාශ වන්නේය, මහාසමුද්‍රය වියලී යන්නේය, මේ මහපොළොවද මහාමේරු පර්වතයද දැවී යන්නේය, විනාශවන්නේය, සබඳිනි, මෙත් වඩවු, කරුණා, මුදිතා, උපේක්‍ෂා වඩවු, මවුනට උපස්ථාන කරවු, පියනට උපස්ථාන කරවු, කුලදෙටුවන් පුදවු" යනුවෙනි. ඔවුන් බස් අසා මනුෂ්‍යයෝද, භූමාටු දෙවියෝද, බෙහෙවින් සංවේගයට පත්වූවාහු ඔවුනොවුන් කෙරෙහි මුදුසිත් ඇතිව මෙත් වැඩීම් ආදී පින්කම් කොට දෙව්ලොව උපදනාහුය. එහි දිව්‍යවූ සුධා භෝජනය වළඳා වායෝ කසිණයෙහි පිරියම් කොට ධ්‍යාන ලබති; අන්‍යයෝ අපරාපරිය කර්ම වශයෙන් දෙව්ලොව උපදනාහුය, අපරාපරියවේදනීය කර්ම රහිතවූ සසර සැරිසරන සත්‍වයෙක් නම් නැත. ඔහුද එහිදී එසේම ධ්‍යාන ලබති. මෙසේ දෙව්ලොවදී ලබාගත් ධ්‍යාන වශයෙන් සියලුම සත්‍වයෝ බඹලොව උපදනාහුය. වැසි නැතිව ගොස් දීර්ඝකාලයක් ඉකුත්වීමෙන් දෙවන හිරක් පායන්නේය. කියනලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:- "මහණෙනි, මෙවන් කාලයක් උදා වන්නේය"[a] යන ආදී වශයෙන් සප්තසූර්යයන් විස්තර කළයුතුය. එය (දෙවනහිර) පෑවූ කල රෑදාවල් වෙනසක් නොපෙනේ, එක් හිරක් උදාවෙයි, අනෙක බැස යයි, ලෝකය නොසිඳී පවත්නා සූර්යසන්තාප ඇත්තේ වෙයි; ප්‍රකෘති සූර්යයා කෙරෙහි සෙයින් කල්පවිනාශයක සූර්යයා කෙරෙහි සූර්ය දේවපුත්‍රයෙක් නැත. ප්‍රකෘති සූර්යයා පවත්නා විට අහසෙහි වළාකුළුද, දුම්සිළුද, හැසිරෙයි. කල්පවිනාශක සූර්යයා පවත්නා විට, දුම්වළා කුල් නැතිව ගොස් අහස කැටපත් තලයක් සෙයින් පැහැදිලි වෙයි. පංචමහා-ගංගාවන් හැර සෙසු කුඩා ගං හෝ ඇළ දොල ආදියෙහි ජලය වියලී යයි. එතැන් සිට තවද, දීර්ඝ කාලයක් ඉකුත්ව ගිය කල තෙවන හිර පායයි, එය පෑවූ කල මහාගංගාවෝද, වියලී යති. එයිනිදු දීර්ඝකාලයක් ඉකුත්ව ගිය කල සිවුවන හිර පායයි, එය පෑවූ කල මහානදීනට ප්‍රභවස්ථානවූ හිමාලය පර්වතයෙහි පිහිටි සීහපපාතය, හංසපපාතය, කණ්ණමුණ්ඩකය, රථකාරදහය, අනෝතත්තදහය, ඡද්දන්තදහය, කුණාලදහය යන සත්මහවිල් වියලී යයි. එයිනුදු දීර්ඝකාලයක් ඉකුත්ව ගිය කල පස්වන හිරු පායයි, එය පෑවූ කල මහාසමුද්‍රය ක්‍රමයෙන් සිඳී ගොස් ඇඟිලි පුරුකක් තෙමෙන තරම් හෝ ජලය නොරැඳෙයි. එයිනුදු දීර්ඝකාලයක් ඉකුත්ව ගිය කල සවන හිරු

a. අ. නි. සත්තක නිපාතය

පහළ වෙයි, එය පහළවූ කල එකම වාෂ්පයක් බවට පත්වෙයි. වාෂ්පය විසින් ඇඳගන්නා ලද තෙතමන ඇත්තේ වෙයි, මේ සක්වළ මෙන්ම කෙළසුවහසක් සක්වළද එසේම වෙයි. එයිනුදු දීර්ඝකාලයක් ඉකුත්වී ගියකල සත්වන හිරු පහළ වෙයි, එය පහල වූ කල කෙළසුවසක් සක්වළ හා සමග මේ සියලු සක්වළ එකම අග්නිජ්වාලයක් බවට පත්වෙයි, සියක් යොදුන් ආදී ප්‍රභේද ඇති මේරුපර්වතකූටයෝ පවා වාෂ්පවී ගොස් අහස්හිම අතුරුදන් වෙති. එම අග්නිජ්වාලය නැඟී චාතුර්මහාරාජිකය ගනියි, එහි රන්විමන් රුවන් විමන් මැණික්විමන් දවා තාවතිංසභවනය ගනියි, මෙනයින්ම ප්‍රථමධ්‍යානභූමිය තෙක් හසුකොට ගනියි. එහි බඹලෝ තුනක්ම දවා ආභස්සර බඹලොව දක්වා ගොස් නවතියි. එම අග්නිස්කන්ධය අණුවක් තරම්වූද, සංස්කාරයක් තිබෙන තාක් නොනිවෙයි, සියලු සංස්කාරගත වස්තූන් ක්‍ෂය වීමෙන් ගිතෙල් දවන සිළුවක් සෙයින් අළු හෝ ඉතිරි නොවී නිවී යයි. යට ආකාශය හා උඩ ආකාශය එක් වී මහාන්ධකාරයක් බවට පත් වෙයි. ඉක්බිති දීර්ඝකාලයක් ගෙවී ගිය කල මහා මේඝයක් නැඟී පළමුකොට සිහින් පොද වැසි වසියි, එය ක්‍රමයෙන් වැඩිවෙමින් කුමුදු නැටිදඬු, මොහොල්, තල්කඳ තරම් දහරින් යුතුව වසිමින් කෙළ සුවසක් සක්වළ දැවීගිය තැන් පුරවා අතුරුදන් වෙයි. ඉක්බිති යටින් හා අවටින් නැඟි වාතය එම ජලය කැටිකොට නෙළුම් පතෙහි දියබිඳුවක් සෙයින් මට මට බවට හරවයි. ඒ සා මහත් ජලකඳක් කැටි කරනුයේ කෙසේද? විවර සෑදීමෙනි, එම ජලකඳ තන්හි තන්හි විවර සෑදීමෙන් වාතයට ඉඩ දෙයි. මෙසේ එය වාතයෙන් පිඬුකැරෙමින්, ඝන කැරෙමින්, අඩුවෙමින් යටට බසියි. ජලය යටට බසින බසින කල බඹලෝ තුබූතන්හි බඹලෝද, ඉහල කාමාවචර දෙව්ලෝ සතර තුබූ තන්හි දෙව්ලෝද පහළ වෙයි. පළමු පොළෝතලය තුබූතැනට (ජලය) බට කල්හි බලවත් වාතයෝ හටගනිති. ඒ වාතයෝ බිහිදොර වැසූ මහසැලෙක රැඳි දිය සෙයින් එම ජලකඳ නිසල කොට රඳවති. මිහිරි ජලය සිඳෙමින් පෘථිවි සාරය මතුපිටට නංවයි, එම පෘථිවිසාරය දිය නුමුසු කිරි බතෙක මතුපිට යොදය මෙන් වර්ණසම්පන්නද, ගන්ධරස සම්පන්නද වේ. එකල්හි ආභස්සර බඹලොව පළමුවෙන් උපන් සත්ත්වයෝ ආයුක්‍ෂය වශයෙන් හෝ පුණ්‍යක්‍ෂය වශයෙන් හෝ එතැනින් සැව මෙහි උපදිති; ඔවුහු ශරීරප්‍රභාවෙන් යුක්ත වූවාහු අහස්හි හැසිරෙන්නාහුද වෙති. ඔවුහු අග්ගඤ්ඤසූත්‍රයෙහි කියනලද නයින් ඒ පෘථිවි සාරයෙහි රස විඳින්නාහු තෘෂ්ණාවෙන් මඩනා ලදුව රැස් කොට පරිභෝග කරනු පිණිස උපක්‍රම කෙරෙති; එවිට ඔවුන්ගේ ශරීරප්‍රභාව අතුරුදන් වෙයි, අන්ධකාර වෙයි. ඔවුහු අන්ධකාරයට බිය වෙති, ඉක්බිති ඔවුන්ගේ බිය දුරු කොට සූර-භාවය දනවමින් පිරිපුන් පණස්යොදුන් පමණවූ හිරුමඬල පහළ වෙයි. ඔවුහු එය දැක 'ආලෝකය ලදුම්හ'යි තුටු පහටුව, 'අපගේ බිය නිසා සූරභාවය දනවමින් උදාවූ හෙයින් 'සූර්ය' නම් වේවා'යි එය 'සූර්ය'

යනුවෙන්ම නම් කෙරෙති. ඉක්බිති දහවල ආලෝක කොට හිරු බැස ගිය කල්හි, 'ලැබුණු ආලෝකයද නැතිවී ගිය වනැ'යි යලි බියට පත් වෙති, ඔවුනට 'වෙනත් ආලෝකයක් ලදහොත් මැනවැ'යි යන අදහස පහළ වෙයි. ඔවුන් සිතටි දැන මෙන් එකුන් පණස්යොදුන් පමණවූ සඳමඬල පහළ වෙයි, ඔවුහු එය දැක බෙහෙවින් තුටුපහටුව 'අපගේ ඡන්දය (කැමැත්ත) දැන මෙන් උදාවූ හෙයින් 'චන්ද' නම් වේවා'යි එය 'චන්ද' යනුවෙන්ම නම් කෙරෙති. මෙසේ හිරුසඳු දෙදෙන පහළ වූ ඉක්බිති නකත් තරු පහල වෙයි, එතැන් පටන් රෑදාවල් ප්‍රකට වෙයි, පිළිවෙළින් මාස, පක්‍ෂ, ඍතු, හවුරුදු ප්‍රකට වෙයි. සඳුහිරු පහළවූ දවස්හිම මහාමේරු, චක්‍රවාට, හිමාලය යන පර්වතයෝද, පහළ වෙති, ඒ සියල්ලම පෙර පසු නොව මැදින් පුන් පෝදාකම පහළ වෙයි. කෙසේද යත්ඃ යම්සේ තණ සහල් බතක් පැසෙන විට එක්වරම බුබුලු පැන නගියිද, ඇතැම් තැන් ගොඩ ගොඩ වෙයිද, ඇතැම් තැන් වළ වළ වෙයිද, ඇතැම් තැන් සම සම වෙයිද, එසේම ගොඩ ගොඩ තන්හි කඳුද, වළවළ තන්හි මුහුදුද, සම සම තන්හි දිවයින්ද වෙයි. ඉක්බිති පෘථිවීසාරය අනුභව කරන ඒ සත්‍වයන් අතුරෙන් කෙනෙක් වර්ණසම්පන්න වෙති, කෙනෙක් දුර්වර්ණ වෙති, එහි වර්ණ සම්පන්න වූවාහු දුර්වර්ණයනට වඩා තමන් උසස් යයි සිතති. (හෙළා දකිති). ඔවුන්ගේ මේ අතිමානය හේතුකොට ගෙන එම පෘථිවීරසයද අතුරුදන් වෙයි; භූමිපප්පටක නම් පැළෑටි වෙසෙසක් පහළ වෙයි, එනයින්ම ඔවුනට එයද නැති වෙයි, බදාලතා නම් වැල් වෙසෙසක් පහළ වෙයි, එනයින්ම එයද, නැති වෙයි, කුඩු (නිවුඩු) නැති දහයියා නැති ස්වයංජාත පිරිසුදු සුවඳ, ඇල් සහල් පහළ වෙයි. ඉක්බිති ඔවුනට බඳුන් පහළ වෙයි, ඔවුහු බඳුන් තුළ එම ඇල් සහල් බහා ගල් මත තබති, ගිනිදැල් පැන නැඟී එය පැසේ. එවිට එය දෑසමන් කැකුළු හා සමාන බත් වෙයි, එයට සූප හෝ ව්‍යංජන නැත, යම් යම් රසයක් බුදිනු කැමැති වේද, ඒ ඒ රසයම වෙයි. ඔවුන් එම ඖදාරික අහර වැළඳීමට පටන් ගත් තැන් සිට මළමූ හටගනියි, ඉක්බිති එම මළමූ පහවනු පිණිස අපවහන මාර්ග සෑදේ. පුරුෂයනට පුරුෂාවයවද, ස්ත්‍රීන්හට ස්ත්‍රී අවයවද, පහළ වෙයි. එහිදී ස්ත්‍රීහු පුරුෂයන් ගැනද, පුරුෂයෝ ස්ත්‍රීන් ගැනද බොහෝ වේලා සිත් යොමු කරති. මෙසේ ඔවුන් බොහෝ වේලා සිත් යෙදවීම හේතු කොට ගෙන කාමරාගය උපදී. එවිට මෛථුන සංසර්ගයෙහි යෙදෙති. මෙවුන්දම් සෙවීම හේතු කොට ගෙන නුවණැත්තවුන් විසින් ගරහනු ලබන්නාහු මෙවුන්දම් වසන් කරනු පිණිස ගේදොර සාදති. ගෙවල වාසය කරන්නාහු අනුක්‍රමයෙන් කිසියම් අලස ස්වභාව ඇති සත්වයකුගේ අදහස් අනුව යමින් (ධාන්‍ය) රැස් කෙරෙති, එතැන් පටන් (කුඩු) නිවුඩු ද දහය්යාද සහල් වසා සිටියි, නෙලාගත් තැන්හි නැවත ස්වයංජාතව නොවැවෙයි. ඔවුහු රැස් වී මෙසේ වැලපෙතිඃ- ''භවත්නි, ඒකාන්තයෙන් සත්‍වයන් තුළ පාපධර්මයෝ පහළ

වූවාහුය, අපි වනාහි පෙර මනෝමය ස්වභාව ඇත්තෝ වූම්හ'' යනුවෙන් අග්ගඤ්ඤ සූත්‍රයෙහි කියනලද නයින්ම විස්තර කළ යුතුය. ඉක්බිති කිසියම් සත්ත්ව කෙනෙක් අන් කෙනකුගේ කොටස නොදුන් වනම පැහැර ගනිති, එවිට වරක් දෙවරක් බැණ වැදී තුන්වන වර අතින්ද, කැට කැබිලිතිවලින්ද, දඬු-මුගුරුවලින්ද පහර දෙති, මේ ආකාරවූ නොදුන් දෙය ගැනීම්, ගැරහීම්, මුසාබස් දෙසීම්, දඬුමුගුරු ගැනීම් හටගත් කල ඔවුහු එක් රැස්වී මෙසේ අදහස් පළ කෙරෙති:- ''අප අතර යම් පුද්ගලයෙක් දමනය කළ යුත්තන් දමනය කළ හැකි වේද, ගැරහිය යුත්තන් ගැරහිය හැකිවේද, නෙරපිය යුත්තන් නෙරපා දැමිය හැකිවේද, එවන් පුද්ගලයකු තෝරා පත්කර ගන්නමෝ නම් යෙහෙකි, අපි ඔහුට අස්වනුවලින් කොටසක් දෙන්නමෝ නම් යෙහෙකි යනුවෙන් මෙසේ මේ කල්පයෙහි මුලදී සනිටුහන් කළ එම සත්ත්වයන් අතර, වඩාත් රූපසම්පන්නද, වඩාත් දැකුම්කළුද, වඩාත් මහේශාඛ්‍යද, බුද්ධි සම්පන්නද නිග්‍රහප්‍රග්‍රහ කිරීමෙහි සමර්ත්‍ථද වූවාහු එකල බෝධිසත්ත්වවූ මේ භාග්‍යවතුන් වහන්සේමය, ඔවුහු එම බෝධිසත්ත්වයන් වෙත එළඹ යාඥා කොට පත්කර ගත්හ. ඔහු ඒ මහජනයා විසින් පත්කර ගන්නා ලදහයි මහාසම්මතයයිද, කෙත්වලට අධිපතියහයි ඛත්තියයිද, දැහැමෙන් සෙමෙන් අනුන් රංජනය කෙරෙති'යි (පිනවතියි) රාජායයිද යන නම් තුනෙන් පළටවූහ. ලෝකයෙහි යම් ආශ්චර්ය කාරණයක් වේනම්, එහි ආදිපුරුෂ වූවාහු බෝධිසත්ත්වයෝමය. මෙසේ බෝධිසත්ත්වයන් ආදිමකොට ක්‍ෂත්‍රිය මණ්ඩලය පිහිටි පසු අනුක්‍රමයෙන් බ්‍රාහ්මණාදී වර්ණයෝද පිහිටියාහුය. එහි කල්පවිනාශක මහාමේඝය පටන් ගිනි ජාලා නිවීයාම තෙක්වූ මෙම අසංඛ්‍ය කාලපරිච්ඡේදය 'සංවට්ට' යයි කියනුලැබේ. කල්පාන්ත වග්නිජ්වාලාවන් නිවී යාම පටන් කෙළ සුවහසක් සක්වළ පුරාවට සම්පත්තිමහාමේඝය තෙක්වූ මෙම දෙවැනි අසංඛ්‍ය කාල පරිච්ඡේදය 'සංවට්ටට්ඨායී' යයි කියනුලැබේ. සම්පත්ති මහාමේඝය පටන් සඳහිරු පහළවීම තෙක්වූ මෙම තෙවැනි අසංඛ්‍ය කාල පරිච්ඡේදය 'විවට්ට' යයි කියනු ලැබේ. සඳහිරු පහළවීම පටන් නැවත කල්පාන්ත මහාමේඝය තෙක් වූ මෙම සිවුවැනි අසංඛ්‍ය කාලපරිච්ඡේදය 'විවට්ටට්ඨායී' යයි කියනුලැබේ. මෙම සාරාසංඛ්‍ය කාල පරිමාණය එක් මහාකල්පයක් වේ. මෙසේ ගින්නෙන් සිදුවන කල්පවිනාශයද නැවත වැඩීයාමද දතයුතුය.

යම් කලෙක කල්පවිනාශය ජලයෙන් සිදුවේනම්, කප්පවිනාසක මහා මෙඝො උට්ඨහිත්වා (කල්ප විනාශක මහාමේඝය නැඟී) යනුවෙන් මුලදී කියනලද නයින්ම විස්තර කළයුතුය. විශේෂ වනුයේ මෙයයි:- එහි කියනලද දෙවන හිරුවෙනුවට මෙහි කල්පවිනාශක, ක්‍ෂාරෝදක මහා මේඝයක් (කරදිය වැස්සක්) නැඟේ, පළමුකොට එය සියුම් සේද වශයෙන් වසිමින් අනුක්‍රමයෙන් මහාධාරා වශයෙන් කෙළ සුවහසක් සක්වළ පුරා වසියි, කරදිය තැවරුණ තැවරුණ පෘථිවී පර්වතාදිය වියකී (දියවී) යයි.

වාතයෙන් ඵලය හාත්පස පැතිරී යයි. පොළෝ තෙලෙහි පටන් ද්විතීය ධ්‍යානභූමිය (අප්පමාණසුභ නම් බඹලොව) තෙක් ජලයෙන් යට වෙයි. එහිදී එම ජලකඳ (ආභස්සරය, පරිත්තසුභය, අප්පමාණසුභය යන) බඹ ලෝ තුනම දියකර සුභකිණ්හ නම් බඹලොව දක්වා පැතිර සිටියි. එය අණුමාත්‍රවූද, සංස්කාරයක් ඉතිරිව තිබෙන තුරු නොසන්සිඳෙයි. ජලය අනුව සියලු සංස්කාරයන් මැඩලීමෙන් පසු එක්වරම සන්සිඳී අතුරුදහන්වී යයි, යට ආකාශය හා උඩ ආකාශය එක්වී මහාන්ධකාරයක් බවට පත් වෙයි යනුවෙන් සියල්ල යට කියන ලද අයුරුම වෙයි. මෙහි දී වනාහි භූදෙක් ආභස්සර බඹලොව පටන් කොට ලෝකය පහළ වෙයි. සුභකිණ්හ බඹලොවින් චුතව සත්‍වයෝ ආභස්සර බඹලොව ආදිය තුබූ තන්හි උපදිති. එහි කල්පවිනාශක මහාමේඝයෙහි පටන් කල්පවිනාශක ක්ෂාරෝදකය සිඳීයාම තෙක්වූ කාලපරිච්ඡේදය එක් අසංඛ්‍යයෙක් වේ, ක්ෂාරෝදකය සිඳීයාම පටන් සම්පත්තිමහාමේඝය තෙක් වූ කාල පරිච්ඡේදය දෙවැනි අසංඛ්‍යය වේ, සම්පත්තිමහාමේඝය පටන් -පෙ- මේ සාරාසංඛ්‍යය එක් මහා කල්පයෙක් වේ. මෙසේ ජලයෙන් විනාශ වීමද නැවත වැඩීයාමද දත යුතුය.

යම් කලෙක කල්පවිනාශය වාතයෙන් සිදුවේ නම්, 'කප්පවිනාසක මහාමෙඝො උට්ඨහිත්‍වා'යි යට පළමුවෙන්ම කියනලද නයින්ම විස්තර කළ යුතුය. විශේෂ වනුයේ මෙයයිඃ- එහි දෙවන හිරු වෙනුවට මෙහි කල්පවිනාශක වාතයෙක් නැඟේ, එය පළමු කොට බොල් දූවිලි නංවයි, ඉක්බිති (අනුක්‍රමයෙන්) සියුම් දූවිලිද, සියුම් වැලිද, දලවැලිද, බොරලු ගල්ආදියද, කූටාගාර ප්‍රමාණ මහගල්ද, නොසම තන්හි පිහිටි මහාවෘක්ෂයන්ද නංවයි. පොළොවෙන් අහසට නැඟුණු මේ කිසිවක් යලි පොළොවට නොවැටෙයි. අහස්හිදීම සුණු විසුණුවී නැතිවී යයි, ඉක්බිති අනුක්‍රමයෙන් මහපොළොවෙන් යට වාතය නැඟී පොළොව පෙරලා යටිපිට උඩුකුරු කොට අහසට දමාගසයි, සියක් යොදුන් පමණ ඇති පොළෝ කැබැලිද, දෙසිය යොදුන්, තුන්සිය යොදුන්, සාරසිය යොදුන්, පන්සිය යොදුන් පමණ ඇති කැබැලිද කැඩී වාතවේගයෙන් නැඟී අහස්හිදීම සුණු විසුණුවී නැතිවී යයි, වාතය නැඟී චක්‍රවාට පර්වතයද, මේරුපර්වතයද, ඔසවා අහසට දමයි. එම පර්වතයෝ එකිනෙක හැපී සුණුවිසුණු වී විනාශ වියති. මේ ආකාරයෙන්ම භූම්‍යස්ථ විමානයන්ද ආකාශස්ථ විමානයන්ද වනසමින් කාමාවචර සදෙව් ලොව වනසා කෙළ සුවහසක් සක්වළ වනසාලයි, එහිදී චක්‍රවාට පර්වතයෝ චක්‍රවාට පර්වතයන් සමගද හිමවත් පර්වතයෝ හිමවත් පර්වතයන් සමගද, මේරුපර්වතයෝ මේරුපර්වතයන් සමගද එකිනෙක ගැටෙමින් සුණුවිසුණු වී වැනසෙති. වාතය පොළොවෙහි පටන් තෘතීය ධ්‍යාන භූමිය (සුභ කිණ්හ) බ්‍රහ්මලෝකය තෙක් ග්‍රහණය කරයි. එහිදී (පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්හ යන) බඹලෝ තුනම වනසා වේහප්ඵලය දක්වා

පැතිර සිටියි. මේ ආකාරයෙන් සියලු සංස්කාරයන් වනසෑ තෙමේද වැනසී යයි. යට ආකාසය හා සමග උඩ ආකාශය එක්වී මහාන්ධකාර වෙයි යන මේ සියල්ල යට කියනලද ආකාරම වේ. මෙහිදී වනාහි සුභකිණ්හ බ්‍රහ්මලෝකය පටන් ලෝකය (නැවත) පහළ වෙයි. වේහප්ඵල ලෝකයෙන් චුතව සුභකිණ්හ ලෝක ආදිය සිටි තන්හි සත්‍වයෝ උපදිති. එහි කල්පවිනාශක මහාමේඝයෙහි පටන් කල්පවිනාශක වාතය නැවතීම තෙක්වූ මෙම කාලපරිච්ඡේදය එක් අසංඛ්‍යයෙකි, වාතය නැවතීම පටන් සම්පත්ති මහාමේඝය තෙක්වූ මෙම කාලපරිච්ඡේදය දෙවැනි අසංඛ්‍යයයි, -පෙ- මෙම සාරා සංඛ්‍යය එක් මහා කල්පයක් වේ. මෙසේ වාතයෙන් විනාශවීම හා නැවත වැඩීම දතයුතුය.

කවර හෙයින් ලෝකය මෙසේ විනාශ වේද? අකුසල් මුල් හේතුවෙනි. අකුසල් මුල් උත්සන්න වූ කල මෙසේ ලෝකය විනාශවේ. එයද රාගය වඩාත් උත්සන්න වූ කල ගින්නෙන් වැනසෙයි. ද්වේශය වඩාත් උත්සන්නවූ කල ජලයෙන් වැනසෙයි. ද්වේශය වඩා උත්සන්නවූ කල ගින්නෙන්ද රාගය වඩා උත්සන්නවූ කළ ජලයෙන්ද වැනසෙති'යි කිසිවෙක් කියති. මෝහය වඩාත් උත්සන්නවූ කල වාතයෙන් වැනසෙයි. මෙසේ වැනසෙන්නේද නොකඩවා සත්වරක් ගින්නෙන් වැනසී අටවැනි වර ජලයෙන් වැනසේ. යලිත් සත්වරක් ගින්නෙන් වැනසී අටවැනි වර ජලයෙන් දැයි මෙසේ අටවැනි වර ජලයෙන් සත්වරක් වැනසී නැවත සත්වරක් ගින්නෙන් වැනසෙයි, මෙතෙකින් තෙසැටක් කප් ඉකුත්ව ගියේ වේ. මේඅතර ජලයෙන් නැසෙන වාරය පැමිණියේ නමුදු එය වැලකී ලද අවසරයෙන් වාතය සූසැට කල්පයක් ආයුෂ ඇති සුභකිණ්හය විදහමින් ලෝකය විනාශ කරයි. පූර්වේනිවාසානුස්මරණය කරන භික්ෂු තෙමේ කල්පගණන් සිහි කරමින් මේ කල්පයන් තුළ වූ නොයෙක් සංවට්ට කල්පයන්ද, නොයෙක් විවට්ට කල්පයන්ද, නොයෙක් සංවට්ට විවට්ට කල්පයන්ද සිහිකරයි. කෙසේද, (අමුත්‍රාසිං ආදීනයෙන) අසවල් තැන වීමි යන ආදී නයෙනි. එහි අමුත්‍රාසිං යනු, අසවල් සංවට්ට කල්පයෙහි මම අසවල් භවයෙහි හෝ ජාතියෙහි හෝ ගතියෙහි හෝ විඥානාවස්ථාවෙහි හෝ සත්‍වාවාසයෙහි හෝ සත්‍වනිකායෙහි හෝ සිටියෙමි. එවංනාමො යනු, තිස්සයයි හෝ ඵුස්සයයි හෝ මෙනම් ඇත්තේ වීමි. එවං ගොත්තො යනු, කච්චාන හෝ කස්සප හෝ ගොත් ඇත්තේ වීමි. ඔහු විසින් අතීත භවයෙහි තමාගේ නම්ගොත් සිහිකිරීම් වශයෙන් කියන ලදී. ඉදින් එකල තමාගේ කටුක හෝ සුව පහසු ජීවිත ඇති බව වේවා, සම්පත්තිය වේවා, සැප හෝ දුක බහුල බව වේවා, කෙටි හෝ දික් ආයු ඇතිබව වේවා, සිහිකරනු කැමැත්තේ වේනම් එයද සිහි කෙරේමය. එහෙයින් එවං වණ්ණො (මෙවන් වර්ණ ඇත්තෙක්) -පෙ- එවමායුපරියන්තො (මෙවන් ආයු සීමා ඇත්තෙක්) යයි කීහ. 'එහි එවංවණ්ණො යනු, තෙළලු පැහැ ඇත්තෙක් වීමි. නැතහොත් කළු පැහැ

ඇත්තෙත් වීමි, එවටාහාරො යනු, රසමසවුල් සහිත ඇල් සාල්බත් බොජුන් කොට ඇත්තෙක් වීමි. නැතහොත් ගසෙත් වැටුණ පල බොජුන් කොට ඇත්තෙක් වීමි, එවං සුඛදුක්ඛපටිසංවේදී යනු, මේ ආකාරයෙන් කායික චෛතසික නැතහොත් ආමිස නිරාමිස ආදී ප්‍රභේද සහිත, සුවදුක් විඳින්නෙක් වීමි, එවමායුපරියන්තො යනු, සියවස් පමණ වූ මෙවන් ආයු කෙළවර කොට ඇත්තෙක් නැත හොත්, සුවාසූ කප් සුවහස් පමණ වූ ආයු කෙළවර කොට ඇත්තෙක් වීමි, සො තතො චුතො අමුත්‍ර උපපාදිං යනු, ඒ මම එම භවයෙන් හො ජාතියෙන් හෝ ගතියෙන් හෝ විඥානාවස්ථාවෙන් හෝ සත්ත්වාවාසයෙන් හෝ සත්ත්වනිකායයෙන් හෝ චුතව අසවල් නම් භවයෙහි, ජාතියෙහි, ගතියෙහි, විඥානාවස්ථාවෙහි සත්ත්වාවාසයෙහි, සත්ත්වනිකායයෙහි උපන්නෙමි, තත්‍රාපාසිං යනු, ඉක්බිති එම භවයෙහි හෝ ජාතියෙහි හෝ ගතියෙහි හෝ විඥානාවස්ථාවෙහි හෝ සත්ත්වාවාසයෙහි හෝ සත්ත්වනිකායෙහි යලිදු උපන්නෙමි, එවං නාමො ආදිය යට කී නයින්ම වේ. තවද, යම් හෙයකින් ආමුත්‍රාසිං යන මෙය අනුක්‍රමයෙන් එපිටට යමින් කැමැතිතාක් සිහි කිරීම වේද, සො තතො චුතො යනු පෙරළා එයින් මෙනෙහි කිරීමයිද, එහෙයින් ඉධූපපන්නො යයි කී එම ජන්මයට අනතුරුව ඔහු උපන් ස්ථානය සඳහා අමුත්‍රඋපපාදිං යන මෙය කියනලදැයි දතයුතුය. තත්‍රාපාසිං යන මේ ආදිය මෙම උපතට අනතුරුව ඔහු උපන් ස්ථානයෙහි නම්ගොත් ආදිය සිහිකිරීම දක්වනු පිණිස කියනලදි. සො තතො චුතො ඉධූපපන්නො යනු, ඒ මම අනතුරුව උපන් එතැනින් චුතව මෙහි අසුවල් නම් ඇති ක්ෂත්‍රියකුලයෙහි නොහොත් බ්‍රාහ්මණ කුලයෙහි උපන්නෙමි. ඉති යනු, මෙසේ, සාකාරං ස-උද්දෙසං යනු, නම්ගොත් වශයෙන් උද්දේස සහිතවයි. වර්ණාදිවශයෙන් ආකාර සහිතවයි. නම් ගොත් වශයෙන් වනාහි සත්ත්වයා තිස්සය, කාශ්‍යපයයි වහරනු ලැබේ, වර්ණාදී වශයෙන් කළුය, තළෙලුයයි වෙන්කොට හඳුන්වනු ලැබේ. එහෙයින් නම්ගොත් දෙක උද්දේස නම්. සෙසු විශේෂණ ආකාර නම්. 'අනෙක විහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති' (ආනේක විධවූ පූර්ව චරිතයන් සිහිකරයි) යන මෙය පැහැදිලි අරුත් ඇත්තේම වේ.

පුබ්බේනිවාසානුස්සති ඤාණ කථාව නිමියේය

—//—

## චුතූපපාත ඤාණය

සත්වයන් පිළිබඳ චුති ප්‍රතිසන්ධි ඥාන කථා විෂයයෙහි, චුතූපපාත ඤාණය යනු චුතිය හා ප්‍රතිසන්ධිය පිළිබඳ ඥානය පිණිසයි, යම් ඥානයකින් සත්වයන්ගේ චුතියද ප්‍රතිසන්ධියද දනීද එම ඥානය පිණිසයි. දිබ්බචක්ඛු ඥානය පිණිසයයි කී නියායි. චිත්තං අභිනීහරති අභිනින්නාමෙති යනු,

පිරියම් සිත යොමු කරයි, නැඹුරු කරයි, සො යනු, කරන ලද චිත්තප්‍රණිධි ඇති ඒ භික්ෂු තෙමේ, දිබ්බෙන යන ආදියෙහි වනාහි, දිව්‍ය සදෘශ වූ හෙයින් දිව්‍ය නම්, දේවතාවනට වනාහි සුචරිත කර්මයෙන් උපන්, පිත් සෙම් ලේ ආදියෙන් පළිබෝධ නොවූ, උපක්ලේශයන්ගෙන් මිදුණබව හේතුකොට ගෙන දුරසිටි අරමුණු පවා පිළිගනු සමත්වූ දිව්‍යවූ පසාදචක්ඛු ඇත්තේය, වීර්යයෙන් වඩන ලද භාවනා බලයෙන් උපන් මේ ඥාන චක්ෂුසද එබඳුම වෙතැයි දිව්‍යසදෘශ වූ හෙයින් දිව්‍ය නම්. දිව්‍ය විහරණ වශයෙන් ලබනලද හෙයින්ද, තමා විසින්ද දිව්‍ය විහරණ ඇසුරු කරන ලද හෙයින්ද, දිව්‍ය නම්. ආලෝක කසිණය ගැනීමෙන් මහත් දීප්ති ඇති හෙයින්ද දිව්‍ය නම්, බිත්ති ආදියෙන් මුවහ වූ තත්හි සිටි රූපයන් දැකීමෙන් මහත් ගති ඇති හෙයින්ද දිව්‍ය නම්, ඒ සියල්ල ශබ්දශාස්ත්‍රානුසාරයෙන්ම දතයුතුය. දැකීමේ අරුතින් චක්ඛු නම්, ඇසින් කැරෙන කාර්යය කරන හෙයින් ඇස වැනියහයි ද, චක්ඛු නම්, චුති ප්‍රතිසන්ධීන් දැකීමෙන් දෘෂ්ටිවිශුද්ධියට හේතුවන හෙයින් විසුද්ධ නම්, යමෙක් වනාහි චුතිය පමණක් දක්නේ ප්‍රතිසන්ධිය නොදක්නේද හේ තෙමේ උච්ඡේද දෘෂ්ටිය ගන්නේය, යමෙක් උපපාතය (ප්‍රතිසන්ධිය) පමණක් දක්නේ චුතිය නොදක්නේද නවක සත්වයකු පහළ වූහයි යන දෘෂ්ටිය ගන්නේය, යමෙක් වනාහි එම චුති-උපපාත යන දෙකම දක්නේද, ඔහුගේ දැකීම එම ද්විවිධ වූම දෘෂ්ටීන් ඉක්මවන හෙයින් දෘෂ්ටිවිශුද්ධියට හේතු වන්නේය, බුද්ධ පුත්‍රයෝ මේ (චුති-උපපාත යන) දෙකම දක්නාහුය. එහෙයින් චුතුපපාතදස්සනෙන දිට්ඨිවිසුද්ධිහෙතුත්තා විසුද්ධං (චුති-උපපාතයන් දැකීමෙන් දෘෂ්ටිවිශුද්ධියට හේතු වන හෙයින් විසුද්ධ නමැයි) කියන ලදි. මනුෂ්‍ය විෂය ඉක්මවා රූපයන් දකින හෙයින් අතික්කන්තමානුසක නම්, නොහොත් මානුෂිකවූ මාංසචක්ෂුස ඉක්මවූ හෙයින් අතික්කන්තමානුසක නමැයි දතයුතුය. එම විශුද්ධවූද මනුෂ්‍ය විෂය ඉක්මවූද දිව්‍ය චක්ෂුසෙනි. **සත්තෙ පස්සති** යනු, මනුෂ්‍යයන් මාංසචක්ෂුසින් (පියවි ඇසින්) බලන ආකාරයෙන් සත්වයන් බලයි. **චවමානෙ උපපජ්ජමානෙ ච** යනු, මෙහි චුතික්ෂණයෙහි හෝ උත්පත්තික්ෂණයෙහි හෝ දිව්‍යචක්ෂුසින් දකිනු නොහැකිය, යම් සත්ව කෙනෙක් වනාහි ආසන්නවූ චුති ඇත්තාහු මේ මොහොතෙහි චුත වන්නාහුද, ඔහු චවමාන යයිද යම් සත්ව කෙනෙක් ලබාගත් ප්‍රතිසන්ධි ඇතිව මේ මොහොතෙහි උපන්නාහුද, ඔහු උපපජ්ජමානයයිද අභිප්‍රේතයහ. මෙසේ චුත වන්නාවූද, උපදින්නාවූද, ඒ සත්වයෝ 'පස්සති' යනු දකියි. **හීනෙ** යනු, මෝහ විපාකයෙන් යුක්ත වීමේ හේතුවෙන් ජාති කුල භෝගාදී වශයෙන් හීනයයි පහත්යයි සම්මත වූවන්, හෙලා දැකීමට අවඥාවට පාත්‍රවූවන්ය, **පණීතෙ** යනු, අමෝහ විපාකයෙන් යුක්ත වීමේ හේතුවෙන් එම තත්වයට විපරීත (වෙනස්) වූවන්ය, **සුවණ්ණෙ** යනු, අද්වේශ විපාකයෙන් යුක්තනොවීමේ හේතුවෙන් පියකුරු වූ මනරම්වූ වර්ණ ඇත්තවුන්ය, **දුබ්බණ්ණෙ** යනු,

ද්වේශ විපාකයෙන් යුක්තවීමේ හේතුවෙන් නොමනාවූ අප්‍රියවූ නොමනරම්වූ වර්ණ ඇත්තවුන්, නොමනා රූ ඇත්තවුන්ය, විරූපවූවන්ය යන අර්ථයි. සුගතෙ යනු, සුගතියට පත් වූවන්, නොහොත් අලෝභවිපාකයෙන් යුක්තවීමේ හේතුවෙන් ඉසුරුමත්වූ මහදනවතුන්ය, **දුග්ගතෙ** යනු, දුප්පතුන් නොහොත් ලෝභවිපාකයෙන් යුක්ත වීමේ හේතුවෙන් දිළිඳු වූවන්, කෑම් බීම් හිඟ වූවන්ය, යථාකම්මූපගෙ යනු, යම් යම් කර්මයක් රැස් කරන ලද්දේද, ඒ ඒ කර්මයෙන් යුක්ත වූවන්ය, එහි 'චවමානෙ' යන ආදී පළමු පදවලින් දිබ්බචක්ඛු ඤාණයට අයත් කාර්යය කියනලදි. මේ (යථාකම්මූපගෙ යන) පදයෙන් වනාහි යථාකම්මූපග ඤාණයට අයත් කාර්යය කියනලදි. එම ඥානය උපදින ආකාරය මෙසේයි.:- මේ ශාසනයෙහි භික්ෂු තෙමේ යට නිරය දෙසට ආලෝකය වඩා දැඩි දුක් විඳින නිරයවැසි සත්‍වයන් දකියි. එම දැකීම දිබ්බචක්ඛුඤාණයට අයත් කාර්යයම වේ. ඒ භික්ෂු තෙමේ 'කවර නම් කර්මයක් කොට මේ සත්‍වයෝ මෙවන් දුක් අනුභව කරත්දැ'යි මෙසේ මෙනෙහි කරයි. එවිට ඔහුට 'මේනම් කර්මයක් කොටැ'යි එම කර්මය අරමුණු කොට ගත් ඥානය උපදියි. එසේම ඉහළ දෙව්ලොවට අභිමුඛ කොට ආලෝකය වඩා නන්දනවන මිස්සකවන ඵාරුසක වනාදියෙහි මහා සැපත් වළඳන සත්‍වයන් දකියි, එම දැකීමද දිබ්බචක්ඛු කෘත්‍යයම වේ. හේ තෙමේ, කවර නම් කර්මයක් කොට මේ සත්‍වයෝ මෙවන් සැපත් අනුභව කෙරෙත්දැ'යි මෙසේ මෙසේ මෙනෙහි කරයි, එවිට ඔහුට 'මෙනම් කර්මයක් කොටැ'යි එම කර්මය අරමුණු කොට ගත් ඥානය උපදියි. මෙය යථාකම්මූපග ඤාණ නම්වේ, මෙයට විශේෂ වශයෙන් කළයුතු පරිකර්මයෙක් නැත, මෙයට මෙන්ම අනාගතංස ඤාණයටද විශේෂ පරිකර්මයෙක් නැත. දිබ්බචක්ඛුඤාණයම පාදක කොට මේ ඥානයෝ එම දිබ්බචක්ඛු ඤාණය හා සමගම සිද්ධ වෙති. කායදුච්චරිතෙන යන ආදියෙහි, අයහපත් හැසිරීම නොහොත් දූෂිත චරිතය ක්ලේශයන්ගෙන් කිලිටි වූ හෙයින් දුශ්චරිත නම්. (වචී දුච්චරිතාදී) සෙසු දෙකන්හිද මෙසේමැයි. සමන්නාගතා යනු, සමන්විතවූවාහුයි. අරියානං උපවාදකා යනු, බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රාවකාදී ආර්යයන්හට, යටත් පිරිසෙයින් සෝවාන් වූ ගිහියනට පවා අවැඩ කැමැතිව අන්තිම වස්තුවෙන් හෝ ගුණපරිධංසන වශයෙන් (ඇතිගුණ විපරීත කොට දැක්වීමෙන්) හෝ චෝදනා කරන්නාහු ගරහන්නාහු යයි කී නිසායි. එහි, 'මොවුනට ශ්‍රමණධර්මයක් (මහනකමක්) නැත, මොවුහු ශ්‍රමණයෝ නොවෙති'යි කියනුයේ අන්තිම වස්තුවෙන් චෝදනා කෙරෙයි, 'මොවුනට ධ්‍යානයක් හෝ විමුක්තියක් හෝ මාර්ගයක් හෝ ඵලයක් නැතැ'යි යන ආදිය කියනුයේ ගුණපරිධංසන වශයෙන් චෝදනා කෙරේයයි දතයුතුය. හේ තෙමේ දැන හෝ වේවයි නොදැන හෝ වේවයි මේ කවරාකාරයෙන් වුවද, මෙසේ චෝදනා කරන්නේ නම් එය අරියූපවාදයම වන්නේය.

මෙය වනාහි ආනන්තරිය කර්මයක් තරම්ම ස්වර්ගයටද මාර්ගයටද, බාධාකර බැරෑරුම් කර්මයෙකි, එහෙත් (ආනන්තරිය කර්මය මෙන් නොව) පිළියම් කළහැක්කේ වේ. එය පැහැදිලි කරනු පිණිස මේ කතා පුවත දතයුතුය.:- එක්තරා ගමෙක තෙරණු කෙනෙක්ද තරුණ භික්ෂු කෙනෙක්ද පිඬු සිඟා වැඩියහ, ඔවුන්හට පළමු ගෙයින්ම (උණු කැඳ) සැන්දක් බැගින් ලැබිණි. තෙරුන්හට කුක්ෂිවාතය (බඩසයින් හටගන්නා වාත වේදනාව) පීඩා කරයි. ඔහු 'මට සප්පායවූ මේ කැඳ සිහිල් වීමට පෙර බොමි'යි සිතා එළිපතක් සඳහා මිනිසුන් විසින් ගෙනැවිත් තබන ලද දඬුකඬක් මත හිඳ එය පානය කළහ. අනෙක් භික්ෂු තෙමේ එය නොරුස්නේ මේ මහල්ලා බඩසයින් පෙළී, අපට ලජ්ජාවියයුත්තක් කළේය'යි කීය. තෙරණුවෝ ගම්හි හැසිර විහාරයට ගොස්, 'ඇවැත්නි, ඔබට මේ සස්නෙහි කිසියම් ප්‍රතිෂ්ඨාවෙක් ඇත්දැ'යි තරුණ භික්ෂුව පිළිවුසූහ. 'එසේය ස්වාමීනි, මම සෝතාපන්නයෙක්මි'යි කීය. 'එසේ නම් ඇවැත්නි, උසස් මාර්ග සඳහා නොවෙහෙසෙනුය, ඔබ විසින් ක්ෂීණාශ්‍රව කෙනෙකුට චෝදනා කරන ලදැ'යි කීහ. හේ (තරුණ භික්ෂු) තෙමේ ඔවුන් (තෙරුන්) කමා කරවා ගති. එයින් ඔහුගේ එම කර්මය අහෝසි විය. එහෙයින් සෙසු යම් කෙනෙකු වුවද තමා විසින් ආර්ය කෙනෙකුට උපවාද කරන ලද්දේ නම්, ඔහු විසින් ගොස් තමා වැඩිහිටියකු නම්, උක්කුටිකව (දණ නමා) හිඳ 'මම ආයුෂ්මතුන්හට මේ මේ දෙය කීමි, එයට මට කමා කරනු මැනවැ'යි කමා කරවා ගත යුතුය. තමා නවකයකු නම්, වැඳ උක්කුටිකව හිඳ ඇඳිලි බැඳ 'ස්වාමීනි, මම ඔබවහන්සේට මේ මේ දෙය කීමි, එයට මට කමා කරනු මැනවැ'යි කමා කරවාගතයුතුය. ඉදින් චාරිකාවෙහි ගොස් ඇත්නම්, තමාම ගොස්, නැතහොත් සද්ධිවිහාරිකයන් (තමා යටතෙහි පුහුණුවන්නන්) හෝ යවා කමා කරවාගතයුතුය. ඉදින් තමාටම යන්නට හෝ අනිකකු යවන්නට හෝ නොහොකි නම්, ඒ විහාරයෙහි වසන භික්ෂූන් වෙතට ගොස් ඔවුහු තමාට වඩා නවකයෝ වෙත් නම්, උක්කුටිකව හිඳ, වැඩිහිටියෝ වෙත් නම් යට කී ලෙස වැඩිහිටියන් කෙරෙහි පිළිපදින ආකාරයෙන් පිළිපැද ස්වාමීනි, මම අසුවල් ආයුෂ්මතුන්හට මේ මේ දෙය කීමි, ඒ ආයුෂ්මත්හු මට කමා කෙරත්වා කියා කමා කරවාගතයුතුය. හමුවූ භික්ෂූහු කමා නොකෙරෙත් නම් මෙසේම කළ යුතුය. ඉදින් ඒකචාරික භික්ෂු කෙනෙකු නම්, වසන තැනක් හෝ ගිය තැනක් සොයා ගත නොහැකි නම්, කවර හෝ නුවණැති භික්ෂුවක් වෙත ගොස්, ''ස්වාමීනි, මම අසුවල් නම් ඇති ආයුෂ්මතුන්හට මේ මේ දෙය කීමි, එය සිහි කරන මාහට විපිළිසර (පසුතැවිලි) ඇති වේ, කුමක් කරම්දැ'යි කිව යුතුය. ඒ භික්ෂු තෙමේ, ඔබ නහමක් සිතුව (පසුතැවිලි නොවනු) මැනව, තෙරණුවෝ ඔබට කමා කරන්නාහුය, සිත සනසාගනු මැනවැ'යි කියන්නේය. ඔහු විසින්ද, එම ආර්යයන් ගිය දෙසට හැරී ඇඳිලි බැඳගෙන 'කමා කෙරෙත්වා'යි කිවයුතුය. ඉදින් එම ආර්යයන් පිරිනිවන් පා ඇත්

නම්, පිරිනිවන් මංචකය වෙත ගොස්, ආදාහන මලුව වෙත හෝ ගොස් කමා කරවා ගත යුතුය. මෙසේ කළ විට ස්වර්ගය ඇවිරීමක් හෝ මාර්ගය ඇවිරීමක් හෝ නොවන්නේය, ප්‍රකෘති තත්වයම වන්නේය. මිච්ඡාදිට්ඨිකා යනු වැරදි දැකුම් ඇත්තාහුයි, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා යනු, මිථ්‍යාදෘෂ්ටි වශයෙන් ගන්නා ලද නොයෙක් ආකාර ඇති කර්ම ඇත්තාහුයි, තවද මිථ්‍යාදෘෂ්ටිය මුල්කොට ගත් කායකර්මාදියෙහි අන්‍යයන්ද, යෙදවූවාහුයි. මෙහි වචීදුච්චරිතයැයි ගැනීමෙන් ආර්යෝපවාදයද මනොදුච්චරිතයැයි ගැනීමෙන් මිථ්‍යාදෘෂ්ටියද ඇතුළත් වන නමුදු මේ (අරියූපවාද, මිච්ඡාදිට්ඨි) යන දෙක නැවත කීම මහාසාවද්‍යභාවය දැක්වීම පිණිසයැයි දතයුතුය. ආර්යෝපවාදය ආනන්තරිය කර්මය හා සමාන වන හෙයින් මහාසාවද්‍ය වන්නේමය. මෙසේද කියනලදි: ''යම්සේ සාරිපුත්තය, සීලසම්පන්නවූ සමාධිසම්පන්නවූ පඤ්ඤාසම්පන්නවූ භික්ෂු තෙමේ ඉහාත්ම භාවයෙහිදීම අන්‍යයන් පහදවන්නේ වේද, එසේම සාරිපුත්තය, මේ කාරණය පවසමි, එම වචනය අත් නොහළහොත්, එම චිත්තය අත් නොහළහොත්, එම දෘෂ්ටිය ඉවත් කර නොගතහොත් ගෙන ආ දෙයක් බිම තබන්නට වනසේම (නියතවශයෙන්ම) නිරයෙහි වැටෙන්නේය''[a] තවද මිථ්‍යාදෘෂ්ටියට වඩා මහාසාවද්‍යවූ අනෙකක් නම් නැත්තේය. යම්සේ කියනලදද:- ''මහණෙනි, මේ මිථ්‍යාදෘෂ්ටියයයි යමක් වේද, එයට වඩා මහා සාවද්‍ය වූ අන් කිසිවක් මම නොදකිමි, මහණෙනි, වැරදි අතුරෙන් මහම වැරැද්ද මිථ්‍යා දෘෂ්ටියයි'[b] කායසසභෙදා යනු, ගන්නා ලද ස්කන්ධයන් බිඳීයාමෙනි. පරම්මරණා යනු, ස්කන්ධයන් බිඳීයාමෙන් අනතුරුව නැවත ඉපදීමේදී ස්කන්ධයන් ගන්නා කෙණෙහි, නොහොත් කායසසභේදා යනු, ජීවිතෙන්ද්‍රිය සිඳීයාමෙනි. පරම්මරණා යනු, චුතිචිත්තයෙන් මත්තෙහිය. අපායං යන මේ ආදි සියල්ල 'නිරය' යන්නටම පර්යායවචනයි. නිරය වනාහි 'අය'යයි කියනලද සගමොක් දෙකට හේතුවූ පුණ්‍ය සම්මතවූ දෙයින් පහවූ හෙයින්, නැතහොත් සැපතට මුල් නොවන හෙයින් 'අපාය' නම්, දුකට හසරයයි නිවෙස්යයි දුග්ගති නම්, නොහොත් දෝෂබහුල වූ හෙයින් හෝ දූෂිත කර්මයෙන් උපන් හෙයින් 'දුග්ගති' නම්, නොදැමුණු පාපකාරීන් එහි වැටෙති'යි 'විනිපාත' නම්, බිඳෙන අඟපසඟ ඇතිව වැනසෙන්නවුන් මෙහි වැටෙති'යි හෝ 'විනිපාත' නම්. ආස්වාද, වශයෙන් ගතහැකි කිසිවක් මෙහි නොවෙති'යි 'නිරය' නම්, නැතහොත්, 'අපාය'යි ගැනීමෙන් තිරිසන් යෝනිය දක්වයි, තිරිසන් යෝනිය වනාහි සුගතියෙන් තොරවූ හෙයින් 'අපාය' නම්වේ. මහේශාඛ්‍ය නාගරාජාදීන් උපදින හෙයින් 'දුග්ගති' නම් නොවේ, 'දුග්ගති' යයි ගැනීමෙන් ප්‍රේතාත්මභාවය දක්වයි, 'අපාය' නම්ද, සුගතියෙන් තොරවූ හෙයින් හා දුකට නිවෙස්වූ හෙයින් 'දුග්ගති' නම්ද වේ, එහෙත් 'විනිපාත'

a. ම. නි. මහාසීහනාද සුත්ත
b. අං. නි. ඒකක නිපාත

නම් නොවේ, අසුරනිකාය මෙන් විනිපාත නොවන හෙයිනි, 'විනිපාත'යයි ගැනීමෙන් අසුරනිකාය දක්වයි, එය වනාහි යට කියනලද අරුතින් 'අපාය'යයිද, 'දුග්ගති'යයිද, සියලු සැපතින් ගිලිහුණ හෙයින් 'විනිපාත' යයිද කියනුලැබේ. 'නිරය' ගැනීමෙන් අවීචි ආදී අනේක ප්‍රකාර නකරයන්ම දක්වයි. උප්පන්නා යනු පැමිණියාහුය, එහි උපන්නාහුය යනු අභිප්‍රායයි. මෙහි ශුක්ල (ශුභ) පක්‍ෂය මෙකී දෙයට විරුද්ධාර්ත්‍ථ වශයෙන් දතයුතුය. මේ විශේෂයි:- එහි 'සුගති' යයි ගැනීමෙන් මනුෂ්‍යාත්මභාවයද ගැනේ. 'සග්ග' යයි ගැනීමෙන් දිව්‍යාත්මභාවයම ගැනේ, එහි සොඳුරු වූ ආත්මභාවය 'සුගති' නම්වේ, රූපාදී විෂයයන්ගෙන් මනා සේ අගතැන්පත් වූහයි 'සග්ග' නම්වේ. ඒ සියල්ලම නැසෙති'යි වැනසෙති'යි යනු 'ලෝක' යන මෙහි වචනාර්ත්‍ථයි. මෙසේ 'දිබ්බෙන චක්ඛුනා' (දිව ඇසින්) යන ආදී සියල්ල නිගමන වචනයි. මේ ආකාරයෙන් දිව ඇසින් -පෙ- බලති'යි යනු මෙහි සංක්ෂේපාර්ත්‍ථයි. මේ ආකාරයෙන් බලනු කැමැති ආධුනික කුලපුත්‍රයා විසින් කසිණය අරමුණු කොට ඇති පාදක ධ්‍යානය සියලු ආකාරයෙන් හුරුපුරුදු කොට තෙජො කසිණ, ඕදාත කසිණ, ආලෝක කසිණ යන තුනෙන් එක් කසිණයක් සමීප කොට වැඩිය යුතුය, උපචාර ධ්‍යානයට ගෝචර කොට වඩා තැබිය යුතුය, එහිදී අර්පණාධ්‍යානය නොඉපැදවියයුතුය යන අභිප්‍රායයි. ඉදින් අර්පණාධ්‍යානය ඉපැදවුවහොත් එය පාදකධ්‍යානයට නිශ්‍රයවනු මිස පරිකර්මයට නිශ්‍රය නොවේ. මේ කසිණ තුනෙන් ආලෝක කසිණයම ශ්‍රේෂ්ඨතර වේ, එහෙයින් එම කසිණය, නැතහොත් ඉතිරි දෙකින් එකක් යට කසිණ නිර්දේශයෙහි කී නයින් උපදවා උපචාරභූමියෙහිම සිට වැඩියයුතුය, එය වඩන ක්‍රමයද එහි කියන ලද නයින්ම දතයුතුය. වැඩූ වැඩූ ස්ථානය තුළම ඇති රූපය බැලිය යුතුය, රූපයන් බලන ඔහුට පරිකර්මවාරය ඉකුත්වෙයි, එවිට ආලෝකය අතුරුදන් වෙයි, එය අතුරුදන් වූ විට රූපයද නොපෙනී යයි. එවිට ඔහු විසින් යලි යලිත් පාදකධ්‍යානයටම පිවිස එයින් නැඟී ආලෝකය පැතිරවියයුතුය. මේ ආකාරයෙන් ආලෝකය ක්‍රමයෙන් සවිමත් වන්නේය. මෙහිදී ආලෝකය වේවා'යි යම්තාක් පිරිසිඳියි නම් ඒ තාක්ම ආලෝකය සිටියි. දවසක්ම වුවද හිඳගෙන බලන්නහුට රූපදර්ශනය වන්නේය. මෙහිලා රාත්‍රිකාලයෙහි තණසුළක් ගෙන මඟට පිළිපන් පුරුෂයා උපමා කොට ගන්නේය:- එක්තරා පුරුෂයෙක් රාත්‍රිකාලයේදී තණසුළක් ගෙන මඟට පිළිපන්නේය. ඔහුගේ ඒ තණසුළ (අඟුරුමතුවී) දැල්ලනිවී ගියේය. එවිට ඔහුට සම නොසම තැන් නොපෙනිණි, හේ තෙමේ තණසුළ බිම ගසා නැවත දැල්වීය, ඒ තණසුළ දැල්වී පෙර පැවැති ආලෝකයට වඩා වැඩි ආලොකයක් ඇතිකළේය. මේ ආකාරයෙන් නැවත නැවතත් දැවුණු දැවුණු තණසුළ දල්වමින් යනවිට ක්‍රමයෙන් ඉරු උදාවිය. ඉරු උදාවූ කල තණසුළෙන් වැඩක් නැතැ'යි එය හැර දමා දහවලද ගියේය. පිරියම් කරන කල කසිණාලෝකය එහි

තණසුළෙහි ආලෝකය වැනිය, රූපයක් බලන්නහුට පරිකර්ම වාරය ඉක්මවීමෙන් ආලෝකය අතුරුදන් වී රූපයන් නොපෙනී යාම තණසුළ දැවී ගියකල සම විසම තැන් නොපෙනී යාම වැනිය, නැවත නැවතත් පාදකධ්‍යානයට පිවිසීම තණසුළ නැවත නැවතත් ගැසීම වැනිය, නැවත පිරියම් කරන විට වඩා බලවත් ආලෝකයක් පැතිරීම තණසුළ පෙර පැවැති ආලෝකයට වඩා වැඩි ආලෝකයක් ඇති කිරීම වැනිය, බලවත් වූ ආලෝකය පිරිසිඳි ආකාරයෙන්ම සිටීම හිරු උදාවීම වැනිය. මඳවූ ආලෝකය හැර බලවත් ආලෝකයෙන් දහවලද රූපයන් දැකීම තණසුළ හැරදමා දහවලද යාම වැනිය. එහි යම් කලෙක ඒ භික්ෂුහුගේ මාංශ චක්‍ෂුසට (පියවි ඇසට) විෂය නොවූ කුසතුළ සිටියාවූද, හෘදයවස්තුව ඇසුරු කොට සිටියාවූද, පොළෝ තෙලෙන් යට පිහිටියාවූද බිත්ති, පර්වත ප්‍රාකාරයන්ගෙන් එපිට සිටියාවූද, පරසක්වල සිටියාවූද මේ රූපයන් ඥානචක්‍ෂුසෙහි (දර්ශන) පථයට ඒද, මසැසට දෘශ්‍යමානවූ ආකාරයෙන්ම වේද, එකල දිවඇස උපන්නේ යයි දතයුතුය. මෙහි රූපයන් දැකීමට සමත් වනුයේ එයම මිස පූර්වභාග චිත්තය නොවේ. එය වනාහි පෘථග්ජනයාහට අන්තරායකර වන්නේය. කවර හෙයින්දයත්, (යම් හෙයකින්) ඒ භික්ෂු තෙමේ ආලෝකය වේවා'යි අධිෂ්ඨාන කරනවිට, ඒ ඒ දෙය පෘථිවි සමුද්‍ර පර්වතයන් පවා විනිවිද ඒකාලෝක වේද, එවිට ඔහුට එම ආලෝකය තුළ බියජනක යක් රකුස් ආදී රූපයන් දක්නා විට බිය උපදී, එම බිය හේතු කොටගෙන චිත්තවික්ෂේපයට පත්ව ධ්‍යානයතුළ භ්‍රාන්තියට පත් (මංමුළාබවට) වේද, එහෙයින් රූපයන් දැකීමේදී අප්‍රමාද (පරෙස්සම්) වියයුතුය. මේ දිබ්බචක්ඛු ඤාණය පිළිබඳ උත්පත්තික්‍රමයයි. කියනලද ප්‍රකාර ඇති මෙම ඥානය රූපයක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ඉපිද නිරුද්ධවූ කල එම රූපයම අරමුණුකොට ජවන්සිත් සතරක් හෝ පසක් උපදිති'යි යන මේ සියල්ල පෙර කී පරිදිම යයි දතයුතුය. මෙහිද විතක්ක-විචාර සහිතවූ පූර්වභාග චිත්තයෝ කාමාවචර වෙති, අවසන්හි අපේක්ෂිතාර්ථය සිද්ධ කරන චතුර්ථධ්‍යානික චිත්තය රූපාවචර වේ, එම චිත්තය හා සමග උපන් ඥානය සත්වයන් පිළිබඳ චුතූපපාත ඤාණයයිද දිබ්බචක්ඛු ඤාණයයිද කියනු ලැබේ.

චුතූපපාතඤාණකථා නිමියේයි.

—//—

ඉති පංචක්ඛන්ධවිදූ පඤ්ච අභිඤ්ඤා අවොච යා නාථො
තා ඤත්වා තාසු අයං පකිණ්ණක කථා'පි විඤ්ඤෙය්‍යා

පංචස්කන්ධයන් අවබෝධ කළ නාථයන් වහන්සේ යම් අභිඥාවන් පසක් මෙසේ ප්‍රකාශ කළ සේක්ද, ඒ අභිඥාවන් දැන, එම අභිඥාවන් පිළිබඳ මේ ප්‍රකීර්ණකකථාවන්ද දතයුතුය

මේ අභිඥාවන් අතුරෙන් චුතූපපාතඥාණයයි කියනලද යම් මේ දිබ්බචක්ඛු ඥාණයක් වේද, එයට අනාගතංස ඥාණය, යථාකම්මූපග ඥාණය යන මේ දෙකද පරිවාර ඥාණයෝ වෙති. මෙසේ මේ දෙකද ඉද්ධිවිධාදීවූ පසදැයි අභිඥාවන් සතක් මෙහි ආයේය, දැන් ඒ අභිඥාවන් පිළිබඳ අරමුණු විස්තර කිරීමේදී නිරවුල්බව පිණිසː-

ආරම්මණත්තිකා වුත්තා යෙ චත්තාරො මහෙසිනා
සත්තන්නම්පි ඥාණානං පවත්තිං තෙසු දීපයෙ

අරමුණු පිළිබඳ වූ යම් ත්‍රිකයන් සතරක් මහර්ෂීන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දේද, එම ත්‍රික සතරෙහි දී සප්ත අභිඥාවන් පවත්නා ආකාරය විස්තර කරන්නෙමි.

එහි විස්තරය මෙසේයː- අරමුණු පිළිබඳ වූ ත්‍රිකයන් සතරක් (අරමුණු දොළසක්) මහර්ෂීන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේය, ඒ සතර කවරේද? පරිත්තාරම්මණත්තිකය, මහග්ගතාරම්මණත්තිකය, අතීතාරම්මණත්තිකය, අජ්ඣත්තාරම්මණත්තිකය යන මේයි. ඉද්ධිවිධ ඥාණය-පරිත්ත-මහග්ගත-අතීත-අනාගත-පච්චුප්පන්න-අජ්ඣත්ත-බහිද්ධා වශයෙන් අරමුණු සතෙක්හි පවතී. කෙසේද යත්, යම් කලෙක රූපකායය සිත ඇසුරෙහි සිටින සේ ගෙන අදිසි කයින් යුතුව (නොපෙනී) යනු කැමැත්තේ සිතට අනුව කය හසුරුවයිද, මහද්ගත වූ සිත තුළ කය පිහිටුවයිද, රුවයිද එකල උපභෝග (ද්විතීයා විභක්ති) වශයෙන් ලද දෙය අරමුණ වෙති'යි ගෙන, රූපකායය අරමුණුවූ හෙයින් එය පරිත්තාරම්මණ වේ.* යම් කලෙක සිත කය ඇසුරෙහි සිටින සේ ගෙන දෘශ්‍යමානවූ කයින් යුතුව යනු කැමැත්තේ කයට අනුව සිත හසුරුවයිද, පාදකධ්‍යාන චිත්තය රූපකායය තුළ පිහිටුවයිද, රුවයිද, එකල උපයෝග වචන වශයෙන් ලදදෙය අරමුණු වෙති'යි ගෙන, මහද්ගත වූ සිත අරමුණුවූ හෙයින් එය මහග්ගතාරම්මණවේ. යම් හෙයකින් ඉකුත්ව නිරුද්ධව ගිය එම සිත අරමුණු කොට ගනීද, එහෙයින් එය අතීතාරම්මණ වේ. මහාධාතුනිධානයෙහිදී මහාකාශ්‍යප ස්ථවිරාදීනට සෙයින් අනාගතයෙහි වේවා'යි අධිෂ්ඨාන කරන විට අනාගතාරම්මණ වේ. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ වනාහි මහාධාතුනිධානය කරන සේක්, "අනාගතයෙහි දෙන අටළොස් වසක් මේ ගඳදෑ නොවියකේවා, මේ මල් නොමැලවේවා, මේ පහන් නොනිමේවායයි අධිෂ්ඨාන කළහ, සියල්ල එසේම සිදුවිය. අස්සගුත්ත ස්ථවිරයන් වහන්සේ වත්තනිය නම් සෙනසුනෙහි භික්ෂු සංඝයා වියලිබත් වළඳනු දැක, 'දිය හෙබ දිනපතා

* හේවාවිතාරණ මුද්‍රණයෙහි සවන පෙළෙහි 'කත්වා' යන්නට පසුව හා සත්වන පෙළෙහි 'රූපකායාරම්මණතො' යන්නට පෙරවූව 'මහගගතචිතතාරමමණතො මහගගතාරමමණං හොති, යස්මාපන තදෙවචිත්තං' යනුවෙන් ඇතුළත්ව තිබීම භ්‍රමයක් බව පෙනේ.

උදයවරුවෙහි දීරස වේවා'යි අධිෂ්ඨාන කළහ, උදය වරුවෙහි ගත් විට දීරස වේ, සවස්වරුවෙහි සැබෑදියම වේ. කය සිත ඇසුරෙහි තබා අදිසිකයින් යුතුව යන කල පච්චුප්පන්නාරම්මණ වේ, කයට අනුව සිත හෝ සිතට අනුව කය හසුරුවන කල තමාගේ දාරක වේශාදිය මවනවිට තමාගේම කය හෝ සිත අරමුණු කොට ගනු ලබන හෙයින් අජ්ඣත්තාරම්මණවේ. බාහිර වූ ඇත් අස් ආදීන් දක්වන විට එය බහිද්ධාරම්මණ වේ. මෙසේ පළමුකොට ඉද්ධිවිධ ඥාණය අරමුණු සතෙක්හි පවත්නාබව දතයුතුය. දිබ්බසොතධාතු ඥාණය පරිත්ත-පච්චුප්පන්න-අජ්ඣත්ත-බහිද්ධාරම්මණ වශයෙන් අරමුණු සතරෙක්හි පවතියි. කෙසේදයත්, යම්හෙයකින් ශබ්ද අරමුණු කොටගනීද, ශබ්දය සීමිත දෙයක් වේද, එහෙයින් පරිත්තාරම්මණවේ, විද්‍යමානවූම ශබ්දය අරමුණුකොට පවත්නා හෙයින් පච්චුප්පන්නාරම්මණ වේ, එය තමාගේම කුසෙහි ශබ්දය අසනකල අජ්ඣත්තාරම්මණ වේ, අන්‍යයන්ගේ ශබ්දය අසනකල බහිද්ධාරම්මණ වේ. මෙසේ දිබ්බසෝතධාතු ඥාණය සිවු අරමුණෙක්හි පවත්නා බව දතයුතුය. චේතෝපරිය ඥාණය පරිත්ත-මහග්ගත-අප්පමාණ-මග්ග-අතීත-අනාගත-පච්චුප්පන්න බහිද්ධාරම්මණ වශයෙන් අට අරමුණෙක්හි පවතී. කෙසේද යත්, අනුන්ගේ කාමාවචර සිත් දන්නා කල එය පරිත්තාරම්මණ වේ, රූපාවචර අරූපාවචර සිත් දන්නා කල එය මහග්ගතාරම්මණ වේ, මාර්ග-ඵල දන්නා කල අප්පමාණාරම්මණ වේ, මෙහි වනාහි පෘථග්ජන තෙමේ සෝතාපන්නයාගේ සිත නොදනී. සෝතාපන්න තෙමේ සකෘදාගාමී වූවහුගේ සිත නොදනී, මේ පිළිවෙළින් රහත්හු දක්වා යොදා ගතයුතුය. රහත්හු සියල්ලන්ගේම සිත දනිති. ඉහළින් ඉහළින් සිටි අන්‍යයෝද, පහළින් පහළින් සිටියවුන්ගේ සිත දනිතියි යන මේ විශේෂය දතයුතුයි. මාර්ග චිත්තය අරමුණු කොට ඇති කල්හි මග්ගාරම්මණය වේ. යම් කලෙක වනාහි ඉකුත්ව ගිය සත්දිනක් ඇතුළතද, මතුවට එන සත්දිනක් ඇතුළතද අනුන් සිත් දනීද, එකල අතීතාරම්මණයද අනාගතාරම්මණයද වේ, පච්චුපන්නාරම්මණය කෙසේ සිද්ධ වන්නේද යත්:- පච්චුපන්නය වනාහි ඛන පච්චුප්පන්නය, සන්තතිපච්චුප්පන්නය, අද්ධාපච්චුප්පන්නයයි ත්‍රිවිධ වේ. එහි, උත්පාද - ස්ථිති - භංගයන්ට පැමිණියේ ඛණපච්චුපන්න නම්, සන්තති (පැවතුම්) වාර එකක් හෝ දෙකක් පැවතියේ සන්තති පච්චුප්පන්න නම්. එහි, අඳුරෙහි හිඳ ආලෝකය ඇති තැනකට ගියහුට අරමුණ ප්‍රකට නොවී යාමත්, යලි එය ප්‍රකට වීමත් යන මෙදෑතුර සන්තතිවාර එකක් හෝ දෙකෙක්යයි දතයුතුය. ආලෝකය ඇති තැනෙක හැසිර ඇතුල් ගැබට පිවිසි කෙනකුට එක් වරම රූපයක් ප්‍රකට නොවීමත්, යලි එය ප්‍රකට වීමත් යන මෙදෑතුරද සන්තතිවාර එකක් හෝ දෙකක්යයි දතයුතුය. දුර සිට බලන්නකුට රජකයන්ගේ හස්තවිකාර (රෙදි අපුලන විට කැරෙන අත් ඉහළ පහළ යාම), සංඛා (ගෙඩි) හා භේරි (බෙර)

ගැසීමේදී වන හස්ත විකාර ද දැක පවා එම ශබ්දය පළමුව නොඇසීමත් පසුව යලි ඇසීමත් යන මෙදෑතුරද සන්තතිවාර එකක් හෝ දෙකක්යයි දතයුතුය. මේ පළමු ක්‍රමය මජ්ඣිමභාණකයෝ දක්වති. සංයුත්ත භාණකයෝ වනාහි රූප සන්තති, අරූපසන්තති යනුවෙන් සන්තති දෙකක් දක්වා ජලය පාගාගෙන එතෙර සිටිවිට පාගා නැගු ජල රේඛාව යම්තාක් නොපෑදේද දුරක් ගෙවා ආවහුට කයෙහි ගිමන් බව යම්තාක් නොසන්සිඳේද අවුවෙහි අවුත් ඇතුල් ගබට පිවිසියහුට අඳුරු බව යම්තාක් නොහැරේද ඇතුල් ගබෙහි කමටහන් මෙනෙහි කොට දහවල කවුළුව හැර බලන්නහුට යම්තාක් ඇස්වල සසල බව නොසන්සිඳේද ඒතාක් රූපසන්තති නම්වේ. ජවනවාර දෙකක් හෝ තුනක් අරූපසන්තති නම් වෙතැ'යි පවසා දෙකම සන්තති පච්චුප්පන්න නමැ'යි කියත්. එක් ආත්මභාවයෙකින් පිරිසිඳියේ අද්ධා පච්චුපන්න නම්, මෙය ගැන භද්දේකරත්ත සූත්‍රයෙහි, "ඇවැත්නි, යම් මනසක් වේද, යම් මානසික ස්වභාවයක් වෙත්ද, මේ දෙකම පච්චුප්පන්න යි, එම පච්චුප්පන්නයෙහි ඡන්දරාගය පිළිබඳ විඥ්ඥාණය වේ, විඥ්ඥාණය ඡන්දරාගය පිළිබඳ වූ හෙයින් එහි තොස් වඩයි, එහි තොස් වඩනුයේ පච්චුප්පන්න ධර්මයන් කෙරෙහි ඇද වැටෙයි"[a] යනුවෙන් කියනලදි. මෙහි සනතති පච්චුප්පන්නය අට්ඨකථාවන්හිද අද්ධාපච්චුප්පන්නය සූත්‍ර පිටකයෙහිද, ආයේය. එහි ඛණ පච්චුප්පන්න චිත්තය චේතෝපරියඥාණයට අරමුණු වෙති'යි ඇතැමෙක් කියත්. කවර හෙයින්ද යත්, ඍද්ධිමත්හුගේද (ඍද්ධිමත් නොවන) අනිකකුගේද සිත් එක් කෙණෙක්හි උපදින හෙයිනි. මෙය එයට උපමාවෙකි: යම් සේ මල් මිටක් ගෙන අහසට දැමූ කල අවශ්‍යයෙන්ම එක් මලක් අනෙක් මලක් හා සමග නටුවෙන් නටුව එකිනෙක ගෙතෙයි ද, එසේම පර සිතක් දැනගන්නෙම්'යි සමූහ වශයෙන් මහජනයාගේ සිත් ආවර්ජනය කළ විට අවශ්‍යයෙන්ම එක් සිතක් අනෙක් සිතක් හා සමග උප්පාදක්ෂණයෙහි හෝ ස්ථිතික්ෂණයෙහි හෝ භංගක්ෂණයෙහි හෝ එකිනෙක ගෙතෙයි. එය වනාහි සියක් හවුරුදු දහසක් හවුරුදු ආවර්ජනය කරතත් ආවර්ජන චිත්තය හා ජවන චිත්තය එක්තැන් නොවීමේ හේතුවෙන්ද ආවර්ජන ජවනයන් අභිප්‍රේත නොවන තන්හි නොයෙක් අරමුණු බවට පත්වීමේ දෝෂයෙන්ද, නොසුදුසු යයි අටුවාහි ප්‍රතික්ෂේප කරන ලදි. සන්තති පච්චුප්පන්නයද අද්ධා පච්චුප්පන්නයද අරමුණු වෙති'යි දතයුතුය. එහි, ජවන වීථියෙහි පටන් අතීත අනාගත වශයෙන් ජවනවීථි දෙකක් හෝ තුනක් පමණවූ කාලයෙහි පවත්නා යම් පර චිත්තයක් වේද, ඒ සියල්ල සන්තති පච්චුප්පන්න නම්. අද්ධා පච්චුප්පන්නය වනාහි ජවනවාර වශයෙන් විස්තර කළයුතුයයි සංයුත්සඟි අටුවායෙහි කියනලදි, එය මනාකොටම කියන ලදි. එහි විස්තරය මෙසේය: ඍද්ධිමත් පුද්ගල තෙමේ පරසිතක් දැනගනු කැමැතිව

---

a. ම. නි. මහාකච්චාන භද්දෙකරත්ත - තතිය සු.

ආවර්ජන කරයි, ආවර්ජනය ඛණපච්චුප්පන්නය අරමුණු කොට එය හා සමගම නිරුද්ධ වේ. එතැන් පටන් ජවන් සතරක් හෝ පසක් වේද, එහි අවසන් ජවනය ඍද්ධි චිත්තය වේ, සෙසු ජවන් කාමාවචර වේ. ඒ ජවන් සිත් සියල්ලටම එම නිරුද්ධ වූ සිත අරමුණු වේ. ඒ ජවන් සිත් නානාරම්මණ නොවේ, අද්ධා වශයෙන් පච්චුප්පන්නාරම්මණ වන හෙයිනි. ඒකාරම්මණ බව ඇති කල පවා ඍද්ධි චිත්තයම මිස අනෙක් චිත්තයක් පරසිත් නොදනියි. චක්ඛුද්වාර විෂයෙහි චක්ඛුවිඤ්ඤාණයම මිස (සෝතාදී) සෙසු විඤ්ඤාණයන් රූපයන් නොදකින සෙයිනි. මෙසේ මේ පච්චුප්පන්නාරම්මණය සන්තති පච්චුප්පන්න වශයෙන් ද අද්ධාපච්චුප්පන්න වශයෙන්ද සිද්ධ වේ. යම් හෙයකින් සන්තති පච්චුපන්නයද අද්ධා පච්චුප්පන්නය තුළම වැටේද, එහෙයින් අද්ධාපච්චුප්පන්න වශයෙන්ම සිත පච්චුප්පන්නාරම්මණ වෙතා'යි පර සිත් අරමුණු කොට ඇති හෙයින්ම බහිද්ධාරම්මණද වෙති'යි මෙසේ චේතෝපරියඤාණය අට අරමුණෙක්හි පවත්නා බව දතයුතුය.

පුබ්බේනිවාසඤාණය පරිත්ත-මහග්ගත, අප්පමාණ මග්ග අතීත අජ්ඣත්ත, බහිද්ධා, නවත්තබ්බාරම්මණ වශයෙන් අට අරමුණෙක්හි පවතියි. කෙසේද යත්, කාමාවචර ස්කන්ධයන් සිහි කරන කල්හි පරිත්තාරම්මණ වේ, රූපාවචර හා අරූපාවචර ස්කන්ධයන් සිහි කරන කල්හි මහග්ගතාරම්මණ වේ. අතීතයෙහි තමා විසින් හෝ අන් කෙනෙකුන් විසින් වඩනා ලද ආර්යමාර්ගයද, සාක්ෂාත්කළ ඵලයද සිහිකරන විට අප්පමාණාරම්මණ වේ. වඩනා ලද මාර්ගය පමණක් සිහි කරන විට මග්ගාරම්මණ වේ. මෙය නියත වශයෙන්ම මේ අතීතාරම්මණ වේ. එහි චේතොපරියඤාණය හා යථාකම්මූපගඤාණයද අතීතාරම්මණවේ, එනමුදු ඒ දෙක අතුරෙන් චේතෝපරිය ඤාණයට සත්දිනක් ඇතුළත වූ අතීත චිත්තයම ආරම්මණ වේ. එය සෙසු ස්කන්ධයක් හෝ ස්කන්ධයක් හා බැඳුණු යමක් හෝ නොදනියි. එතෙකුදු වුවත් (ආර්ය) මාර්ග සම්ප්‍රයුක්ත චිත්තය අරමුණු කොට ඇති හෙයින් පර්යාය වශයෙන් මග්ගාරම්මණයයි කියන ලදි. යථාකම්මූපගඤාණයටද අතීත වූ චේතනා මාත්‍රයම ආරම්මණ වේ. පුබ්බේ නිවාස ඤාණයට වනාහි අතීත වූ ස්කන්ධයන් මේවයි ස්කන්ධයන් හා බැඳුණු කිසිවක් හෝ වේවයි අරමුණු නොවන්නක් නම් නැත. එය වනාහි අතීත වූ ස්කන්ධයන් කෙරෙහිද ස්කන්ධයන් හා බැඳුණු ධර්මයන් කෙරෙහිද සර්වඥතාඥානයෙහි ස්වභාවය ඇත්තේය යන මේ විශේෂය දතයුතුය. මේ මෙහි අටුවා නයයි. යම් හෙයකින් වනාහි කුශලස්කන්ධයන් ඉද්ධිවිධ ඤාණයටද, චේතෝපරියඤාණයටද, පුබ්බේනිවාසානුස්සති ඤාණයටද, යථාකම්මූපග ඤාණයටද, අනාගතංස ඤාණයටද ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති'යි පට්ඨාන ප්‍රකරණයෙහි කියන ලද්දේද, එහෙයින් නාමස්කන්ධචතුෂ්කයම චේතෝපරියඤාණයට හා යථාකම්මූපග ඤාණයට අරමුණු වේ, තවද,

එහි යථාකම්මූපග ඤාණයට කුශල අකුශල දෙකම අරමුණු වේ. තමා පිළිබඳ ස්කන්ධයන් සිහි කරන විට මෙය (පුබ්බේ නිවාස ඤාණය) අජ්ඣත්තාරම්මණ වේ. අන්‍යයන්ගේ ස්කන්ධයන් සිහි කරණ විට බහිද්ධාරම්මණවේ. අතීතයෙහි විපස්සී නම් භාග්‍යවත් කෙණෙක් වූහ, ඔවුන්ගේ මෑණියෝ බන්ධුමතී නම්වූහ. පියාණෝ බන්ධුම නම්වූහ. ආදී වශයෙන් නාම ගෝත්‍ර පෘථිවි නිමිත්තාදිය සිහි කරන විට නවත්තබ්බ (වචනයෙන් විස්තර කළ නොහැකි) ආරම්මණ වේ. නාම ගෝත්‍ර යනු මෙහි ස්කන්ධයන් හා බැඳුණු, සම්මුති වශයෙන් සිද්ධ වූ වචනාර්ථය මිස, වචනය නොවේයයි දතයුතුය, වචනය වනාහි ශබ්දායතනයෙන් සංගෘහීතවූ හෙයින් පරිත්තාරම්මණ වේ. එහෙයින් කියනලදිඃ- ''නිරුත්ති පටිසම්භිදාව පරිත්තාරම්මණ වේ'' යනුයි. මේ මෙහි (දක්වන ලදුයේ) අපගේ මතයයි. මේ ආකාරයෙන් පුබ්බේනිවාසඤාණය අට අරමුණෙක්හි පවත්නා බව දතයුතුය.

දිබ්බචක්ඛුඤාණය පරිත්ත-පච්චුප්පන්න-අජ්ඣත්ත-බහිද්ධා රම්මණ වශයෙන් සිවු අරමුණෙක්හි පවතී. කෙසේද යත්, යම් හෙයකින් එය රූපය අරමුණු කෙරේද, තවද රූපය පරිත්තාරම්මණ වේද, එහෙයින් පරිත්තාරම්මණ වේ. විද්‍යමාන වූ රූපයෙහිම පවත්වනු ලබන හෙයින් පච්චුප්පන්නා රම්මණ වේ. තමාගේ කුසතුළ පවත්නා රූපාදිය දක්නා විට බහිද්ධාරම්මණ වේ යයි මේ ආකාරයෙන් දිබ්බචක්ඛුඤාණය සිවු අරමුණෙක්හි පවත්නා බව දතයුතුය.

අනාගතංසඤාණය පරිත්ත-මහග්ගත-අප්පමාණ-මග්ගඅනාගත-අජ්ඣත්ත-බහිද්ධා-නවත්තබ්බාරම්මණ වශයෙන් අට අරමුණක්හි පවත්නේය. කෙසේද යත්, 'මේ තෙමේ අනාගතයෙහි කාමාවචර භූමියෙහි උපදින්නේයයි දැනගන්නා විට පරිත්තාරම්මණ වේ. රූපාවචර හෝ අරූපාවචර භූමියෙහි උපදින්නේයයි දැනගන්නා විට මහග්ගතාරම්මණ වේ. මාර්ග වඩන්නේය. ඵලය අවබෝධ කරන්නේයයි දැන ගන්නා විට අප්පමාණාරම්මණ වේ. මාර්ගය වඩන්නේය යනු පමණක් දැනගන්නාවිට මග්ගාරම්මණ වේ. නිත්‍ය වශයෙන්ම එය අනාගතාරම්මණ වේ. එහි චේතෝපරියඤාණයද අනාගතාරම්මණ වන නමුදු එයට සත් දිනක් ඇතුළත අනාගත චිත්තයම අරමුණු වේ, එය අන්‍යවූ ස්කන්ධයක් හෝ ස්කන්ධයන් පිළිබඳ සෙසු යමක් හෝ නොදනී. අනාගතංස ඤාණයට පුබ්බේ නිවාස ඤාණය පිළිබඳව කී නයින් අනාගතයෙහි අරමුණු නොවන දෙයක් නම් නැත. මම අසුවල් තැන උපදින්නෙමි'යි දැනගන්නා විට අජ්ඣත්තාරම්මණ වේ. අසුවල් පුද්ගලයා අසුවල් තැන උපදින්නේයයි දැනගන්නා විට බහිද්ධාරම්මණ වේ. අනාගතයෙහි මෙත්තෙය්‍ය නම් භාග්‍යවත්හු උපදින්නාහ, ඔවුනට සුබ්‍රහ්ම නම් බ්‍රාහ්මණ තෙමේ පිය වන්නේය, බ්‍රහ්මවතී නම් බ්‍රාහ්මණී තෙමෝ මව් වන්නීය, යන ආදී නයින්

නම් ගොත් දැනගන්නා විට පුබ්බේ නිවාසඤාණය පිළිබඳව කී නයින් නවත්තබ්බාරම්මණ වේ. මෙසේ අනාගතංසඤාණය අට අරමුණෙක්හි පවත්නා බව දතයුතුය.

යථාකම්මූපගඤාණය පරිත්ත-මහග්ගත-අතීත අජ්ඣත්ත-බහිද්ධාරම්මණ වශයෙන් පස් අරමුණෙක්හි පවත්නේය. කෙසේද යත්, එය කාමාවචර කර්මයන් දැන ගන්නා විට පරිත්තාරම්මණ වේ, රූපාවචර අරූපාවචර කර්මයන් දැන ගන්නා විට මහග්ගතාරම්මණ වේ, අතීතයම පමණක් දනිතියි අතීතාරම්මණ වේ. තමාගේ කර්මයන් දැන ගන්නා විට අජ්ඣත්තාරම්මණ වේ, අනුන්ගේ කර්මයන් දැනගන්නා විට බහිද්ධාරම්මණ වේ. මෙසේ යථාකම්මූපගඤාණය පස් අරමුණෙක්හි පවත්නා බව දත යුතුය. මෙහි යම් ඤාණයක් අජඣත්තාරම්මණද බහිද්ධාරම්මණද, වෙතැ'යි කියන ලද්දේද, එය විටෙක අජ්ඣත්ත ස්කන්ධයන්ද විටෙක බහිද්ධා ස්කන්ධයන්ද දන්නා හෙයින් අජ්ඣත්ත බහිද්ධාරම්මණ නම්ද වේමයි.

මෙතෙකින් සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි
අභිඤ්ඤා නිද්දේසය නම් වූ
තෙළෙස්වන පරිච්ඡේදය සමාප්තයි.

—//—

# ඛන්ධ නිද්දේසය

ඉක්බිති යම් හෙයකින් අභිඥා වශයෙන් මෙසේ ලද ආනිශංස ඇති, වඩා තිර බවට පත් සමාධිභාවනායෙන් සමන්විත භික්ෂුව විසින්,

''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං'' යන මෙහි චිත්ත ශීර්ෂයෙන් දක්වන ලද සමාධිය සියලු ආකාරයෙන් වඩනා ලද්දේ වේද, ඉන් අනතුරුව පඤ්ඤා භාවනාවද වැඩියයුතු වේ. එම පඤ්ඤාභාවනාව ඉතා සංක්ෂේපයෙන් දේශනා කරන ලද හෙයින් වැඩීමට තබා වටහාගැනීමට පවා අපහසු වේ. එහෙයින් එය පිළිබඳ විස්තරය හා භාවනාක්‍රමය දක්වනු වස් මේ ප්‍රශ්න-විචාරණය කරනු ලැබේ:- පඤ්ඤා යනු කුමක්ද? කවර අර්ථයෙන් පඤ්ඤා නම්වේද? එහි ලක්ඛණ (ලක්ෂණය), රස (කෘත්‍යය), පච්චුපට්ඨාන (වැටහෙන ආකාරය), පදට්ඨාන (ආසන්න කාරණය හෙවත් පදනම) කවරේද? පඤ්ඤාව කෙතෙක් ආකාර ඇත්තේද? කෙසේ වැඩිය යුතුද? පඤ්ඤාභාවනායෙහි ආනිශංස කවරේද? යනුවෙනි.

එහි විසඳීම මෙසේයි:- පඤ්ඤා යනු කුමක්ද යත්: පඤ්ඤාව බහුවිධ වේ, නොයෙක් ආකාර ඇත්තේ වේ. ඒ සියල්ල විස්තර කිරීම ඇරඹුව හොත් විසඳීම මෙන්ම අභිප්‍රේතාර්ත්ථයද සිද්ධ නොවිය හැකිය, තවද එය වික්ෂේපයට (කලකිරීමට) හේතු විය හැකිය. එහෙයින් මෙහි අභිප්‍රේතඅර්ත්ථයම සලකා කුශල චිත්තය හා සමග යෙදුණු විදර්ශනා ඥානය පඤ්ඤායයි සිතමු.

කවර අර්ත්ථයෙන් පඤ්ඤා නම් වේද යත්: පජානන (හෙවත් විශේෂ කොට දැන ගැනීමේ) අර්ත්ථයෙන් 'පඤ්ඤා' නම් වේ; මේ පජානනය නම් කුමක්ද? හඳුනාගැනීමය, මනාසේ දැන ගැනීමය යන දෙ-ආකාරයටම වඩා විශිෂ්ට වූ නානාප්‍රකාර වශයෙන් දැනගැනීම පජානනයයි. සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා යන මේ තුනෙහිම ජානනභාවය ඇත්තේ නමුදු, 'සඤ්ඤා' යනු, හුදෙක් නිල්වන්ය, කසාවන්යයි අරමුණක් හඳුනාගැනීම පමණෙකි. එය 'අනිත්‍යය, දුඃඛය ආනාත්මය'යි ලක්ෂණ ප්‍රතිවේධයට පැමිණවීමට නොසමත් වේ. විඤ්ඤාණය නිල්වන්ය, කසාවන්යයි අරමුණුද දනියි, ලක්ෂණ ප්‍රතිවේධයටද පමුණුවයි, එහෙත් උත්සාහවත් කොට (නොහොත් ඉදිරියට මෙහෙයවා) මාර්ගාවබෝධයට පමුණුවනු නොහැක්කේ වේ. පඤ්ඤාව වූකලී කීනයින් අරමුණුද දනියි, ලක්ෂණ ප්‍රතිවේධයටද පමුණුවයි. උත්සාහවත් කොට මාර්ගාවබෝධයටද පමුණුවයි.

යම්සේ වනාහි රන් පුවරුවක තබන ලද කහවණු රැසක් නූපන් බුද්ධි ඇති ළදරුවෙක, ගැමි පුරුෂයෙක, රන්කරුවෙකැ'යි යන තිදෙන විසින් දක්නා ලද කල්හි, ඔවුන'තුරෙන් බුද්ධිය නොපැසුණු ළදරුවා එම

කහවණුවල ඇති හැඩහුරුකම, විසිතුරුබව, දික්බව, සිවුරැස් බව, වටකුරුබව ආදිය පමණක් දනියි; 'මෙය මිනිසුන්ගේ උපභෝග-පරිභෝගයට සුදුසු රත්න ජාතියෙකැ'යි නොදනියි. ගැමි තෙමේ එහි ඇති හැඩහුරුකම විසිතුරුබව ආදියද දනියි, 'මෙය මිනිසුන්ගේ උපභෝග-පරිභෝගයට යෝග්‍ය වූ රත්න ජාතියෙකැ'යි ද දනියි. 'මෙය සැබෑ රන්ය, මෙය බොරු රන්ය, මෙය මාත්තු රන්ය' යන මේ විභාගය නොදනියි. රන්කරු තෙමේ එකී සියලුම ප්‍රකාරයන් දනියි, දැන ගනුයේද කහවණු බැලීමෙන්ද දැනගනියි, ගැටෙන විට හඬ ඇසීමෙන්ද දැනගනියි, ගඳ දැනීමෙන්ද, (දිවග තබා) රසබැලීමෙන්ද. අතින් ඔසවා බර බැලීමෙන්ද, 'අසුවල් නම් ගමෙහි, නියම් ගමෙහි හෝ නගරයෙහි, පර්වතයෙහි හෝ ගංතෙරෙහි කරන ලදැ'යිද, 'අසුවල් ආචාර්යයා විසින් කරන ලදැ'යිද දැනගනියි. මෙසේ මේ කාරණය දතයුතුය.

සඤ්ඤාව වූකලී නොහටගත් බුද්ධියෙන් යුත් ළදරුවාගේ කහවණු දැකීම වැනි වේ, නීලාදී වශයෙන් අරමුණට එළඹීමේදී ඡායාමාත්‍රය ගන්නා හෙයිනි. විඤ්ඤාණය ගැමියාගේ කහවණු දැකීම වැනි වේ, නීලාදී වශයෙන් අරමුණුවල ආකාරය ගන්නා හෙයින් හා ඉන් මතු ද ලක්‍ෂණ අවබෝධයට පමුණුවන හෙයිනි. පඤ්ඤාව රන්කරුවාගේ කහවණු දැකීම බඳු වේ, නීලාදී වශයෙන් අරමුණුවල ආකාරය ගෙන ලක්‍ෂණ අවබෝධයටද පමුණුවා එයින් මතුද මාර්ගාවබෝධය වෙත පමණුවන හෙයිනි. එහෙයින් හඳුනාගැනීමට හා දැනගැනීමටද වඩා විශිෂ්ට වූ යම් මේ අනේකාකාරයෙන් අවබෝධ කිරීමෙක් වේද, එය 'පජානන' නමැ'යි දතයුතුය. මෙය සඳහා 'පජානනට්ඨෙන පඤ්ඤා' (වෙසෙසා දැනගැනීමේ අර්ථයෙන් 'පඤ්ඤා' නමැ'යි)යි කියනලදි.

ඒ මේ පඤ්ඤාව වූකලී සඤ්ඤා-විඤ්ඤාණ යන දෙක පවත්නා තැන ඒකාන්ත වශයෙන් පවත්නේ නොවේ. යම් විටෙක පවත්නේ නම්, එවිට එය එම ස්වභාවයන්ගෙන් වෙන් කොට ගතහැක්කේද නොවේ, 'මේ සඤ්ඤාය, මේ විඤ්ඤාණය, මේ පඤ්ඤා යයි වෙන් කොට නොහැකි නානත්වය සියුම්ද, දුරවබෝධද වේ. එහෙයින් කීහ ආයුෂ්මත් නාගසේන තෙරණුවෝ:- ''මහරජ, භාග්‍යවතුන් වහන්සේ විසින් දුෂ්කර කාර්යයක් කරන ලද්දේය''. ''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, කවර නම් දුෂ්කර කාර්යයක් භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද්දේද?'' ''මහරජ, අරූපී වූ, එක් අරමුණෙක්හි පවත්නා වූ, චිත්ත-චෛතසික ධර්මයන් අතුරෙන්, 'මේ ඵස්සය', 'මේ වේදනාය', 'මේ සඤ්ඤාය', 'මේ චේතනාය', 'මේ චිත්තය'යි මෙසේ නිශ්චය කොට දැක්වීම භාග්‍යවතුන් වහන්සේ විසින් කරන ලද දුෂ්කර කාර්යයි''.

---

a. මිලින්දපඤ්හා, අරූප ධම්ම වවත්ථාන වග්ග

එහි ලක්ෂණ, රස (හෙවත් කෘත්‍යය), පච්චුපට්ඨාන (හෙවත් වැටහෙන ආකාරය) පදට්ඨාන (පදනම හෙවත් ආසන්න කාරණය) යනු කවරේදැයි යන මෙහි, පඤ්ඤාව ධර්මයන් පිළිබඳ යථාස්වභාවය විනිවිද දැකීම ලක්ෂණ කොට ඇත්තේ වේ, ධර්මයන් පිළිබඳ යථාස්වභාවය වසා සිටින මෝහාන්ධකාරය නසාලීම කෘත්‍යය කොට ඇත්තේ වේ, නුමුළාබව වැටහෙන ආකාරය වේ.(b) සමාහිතො යථාභූතං පජානාති, පස්සති (සමාධියට පැමිණියේ ඇති තතු දනියි, දකියි)යි කී හෙයින් සමාධිය එහි පදනම හෙවත් ආසන්න කාරණය වේ.

පඤ්ඤාව කී වැදෑරුම් වේද යත්, ධර්මයන් පිළිබඳ යථාස්වභාව ප්‍රතිවේධ වශයෙන් එක් වැදෑරුම් වේ, ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙ-වැදෑරුම්වේ, එසේම සාශ්‍රව අනාශ්‍රවාදී වශයෙන්ද, නාම-රූප නිර්ණය වශයෙන්ද, සෝමනස්ස සහගත-උපේක්ෂා සහගත වශයෙන්ද, දස්සන භූමි, භාවනා භූමි වශයෙන්ද දෙවැදෑරුම් වේ. චින්තාමය, සුතමය, භාවනාමය වශයෙන් තෙවැදෑරුම් වේ, එසේම පරිත්තාරම්මණ මහග්ගතාරම්මණ, අප්පමාණාරම්මණ වශයෙන්ද, ආය (අභිවෘද්ධි), අපාය (අනභිවෘද්ධි), උපාය (ඒ ඒ ධර්මයන් පිළිබඳ නිෂ්පත්ති කාරණ) විෂයයෙහි කුශලතා වශයෙන්ද, අජ්ඣත්තාභිනිවේස, බහිද්ධාභිනිවේස, අජ්ඣත්තබහිද්ධාභිනිවේස වශයෙන්ද තෙවැදෑරුම් වේ. චතුඃසත්‍යයන් විෂයයෙහි වූ ඥාන වශයෙන්ද, චතුපටිසම්භිදා වශයෙන්ද සිවුවැදෑරුම් වේ. එහි එක් වැදෑරුම් කොටසෙහි අර්ථය පැහැදිලි වේ. දෙවැදෑරුම් කොටසෙහිඃ ලෞකික මාර්ගය හා බැඳුණු ප්‍රඥාව ලෞකිකයයිද, ලෝකෝත්තර මාර්ගය හා බැඳුණු ප්‍රඥාව ලෝකෝත්තරයයිද මෙසේ ලෞකික-ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් වේ.

දෙවන ද්විකයෙහිඃ ආශ්‍රවයනට අරමුණු වූ ප්‍රඥාව සාශ්‍රවයයිද, ආශ්‍රවයනට අරමුණු නොවූයේ අනාශ්‍රවයයිද යනුවෙන් දෙවැදෑරුම් වේ. අර්ථවශයෙන් වනාහි මෙය ලෞකික-ලෝකෝත්තර ප්‍රඥාවම වේ. ආශ්‍රව සම්ප්‍රයුක්ත වූයේ සාශ්‍රව නම්ද, විප්‍රයුක්ත වූයේ අනාශ්‍රව නම්ද වේ යන මේ ආදියෙහිද මෙම නයයි. මෙසේ සාශ්‍රව-අනාශ්‍රව වශයෙන් දෙවැදෑරුම් වේ. තුන්වන ද්විකයෙහිඃ විදර්ශනා අරඹනු කැමැත්තහුගේ අරූපස්කන්ධ සතර පිළිබඳ ව්‍යවස්ථාපන වශයෙන් යම් ප්‍රඥාවක් වේද, මෙය නාම ව්‍යවස්ථාපන ප්‍රඥාවයි, රූපස්කන්ධය පිළිබඳ ව්‍යවස්ථාපන විෂයයෙහි යම් ප්‍රඥාවක් වේද, මෙය රූප ව්‍යවස්ථාපන ප්‍රඥාවයි. මෙසේ නාම-රූප ව්‍යවස්ථාපන වශයෙන් දෙවැදෑරුම් වේ. සිවුවන ද්විකයෙහිඃ කාමාවචර කුසල් සිත් දෙකෙක්හිද, පඤ්චක නයයෙහි පළමු ධ්‍යාන සතර හා සමග යෙදුණු මාර්ග සිත් සොළොසෙහිද වූ ප්‍රඥාව සෝමනස්ස සහගත වේ. කාමාවචර කුසල් සිත් දෙකෙක්හිද පංචමධ්‍යානික මාර්ග සිත් සතරෙහිද

a. සංයුත්තනිකාය, නකුල පිතුවග්ග

වූ ප්‍රඥාව උපේක්ෂා සහගත වේ. මෙසේ සෞමනස්ස සහගත-උපේක්ෂා සහගත වශයෙන් දෙවැදෑරුම් වේ. පස්වන ද්විකයෙහි ප්‍රථම මාර්ග ප්‍රඥාව දස්සන භූමි නමැයිද, සෙසු මාර්ග තුනෙහි වූ ප්‍රඥාව භාවනා භූමි නමැ'යිදැයි මෙසේ දස්සන භූමි - භාවනා භූමි වශයෙන් දෙවැදෑරුම් වේ.

ත්‍රිකයන් අතුරෙන් පළමුවන ත්‍රිකයෙහිඃ අනුන් වෙතින් නො-අසා ලද ප්‍රඥාව තමාගේම චින්තා වශයෙන් නිපන් හෙයින් 'චින්තාමය' නම්ද අනුන්ගෙන් අසා ලබා ගත් ප්‍රඥාව ශ්‍රැත වශයෙන් නිපන් හෙයින් 'සුතමය' නම්ද වේ; කවර ආකරයෙන් හෝ අර්පණාවට පත් ප්‍රඥාව භාවනා වශයෙන් නිපන් හෙයින් භාවනාමය නම්වේ. කියන ලදමැයිඃ- එහි 'චින්තාමය පඤ්ඤා' යනු කවරේද යත්ඃ අභ්‍යාස කළ කර්මාන්තයන්හිදී හෝ අභ්‍යාස කළ ශිල්පායතනයන්හිදී හෝ අභ්‍යාස කළ විද්‍යාස්ථානයන්හිදී හෝ පලපුරුද්දෙන් ලත් යම් ඇත්දැකීමක් වේවයි, සත්‍යයට (යථා තත්‍වයට) අනුලෝමික වන සේ රූපය අනිත්‍යය, වේදනාව- පෙ- අනිත්‍යය-පෙ- සංඥාව-පෙ- සංඛාරය -පෙ- විඥානය අනිත්‍යය, යන මේ ආකාර වූ යම් නැඹුරු බවක්, දැක්මක්, රිසි බවක්, මතයක්, අපේක්ෂාවක්, ස්වභාවය සිහිකරනු රිසිබවක් වේවයි, අනුන් වෙතින් නො-අසා ලබනුයේද, මෙය චින්තාමය ප්‍රඥාවයයි කියනු ලැබේ. අභ්‍යාසයෙහි යෙදුණු -පෙ- අනුන්ගෙන් අසා ලබනුයේද මෙය සුතමය ප්‍රඥාවයයි කියනුලැබේ. සමවතට සමවන්නහුගේ සියලුම ප්‍රඥාව 'භාවනාමය පඤ්ඤා' නම් වේ.[a] මෙසේ චින්තාමය, සුතමය, භාවනාමය වශයෙන් තෙවැදෑරුම් වේ. දෙවන ත්‍රිකයෙහිඃ කාමාවචර ධර්මයන් අරමුණු කොට පැවැති ප්‍රඥාව පරිත්තාරම්මණ වේ, රූපාවචර-අරූපාවචර ධර්මයන් අරමුණු කොට පැවැති ප්‍රඥාව මහද්ගතාරම්මණ වේ, මේ ලෞකික විදර්ශනාවයි.

නිර්වාණය අරමුණු කොට ඇති ප්‍රඥාව අප්පමානාරම්මණ වේ, එය ලෝකෝත්තර විදර්ශනාවයි; මෙසේ පරිත්ත-මහග්ගත-අප්පමානාරම්මණ වශයෙන් තෙවැදෑරුම් වේ.

තුන්වන ත්‍රිකයෙහිඃ 'ආය' නම් වෘද්ධියයි, එය අනර්ථනාශ වශයෙන්ද අර්ථජනන වශයෙන්දැයි දෙ-ආකාරයෙකින් සිද්ධ වේ. එහි කුශලතාව 'ආයකෝසල්ල' නම් වේ. කියන ලද මැයිඃ- 'එහි ආයකොසල්ල යනු කවරේද? මේ ධර්මයන් මෙනෙහි කරන්නහුට නො-උපන් අකුසල් නො-උපදීද, උපන් අකුසල් ප්‍රහීණ වේද, තවද මේ ධර්මයන් මෙනෙහි කරන්නහුට නො-උපන් කුසල් උපදීද උපන් කුසල් බොහෝවීම, විපුල බව, වැඩීයාම. පිරිපුන් බව සිදුවේද, එම ධර්මයන් කෙරෙහි වූ යම්

a. විභඞ්ගපාලි, ඤාණවිභඞ්ග

ප්‍රඥාවක්, දැනුවත් බවක් -පෙ- නොමුළා බවක්, දහම් සෙවීමක්, මැනවින් දැක්මක් වේද, මෙය 'ආය කෝසල්ල' යයි කියනු ලැබේ.''[a]

'අපාය' යනු, අවෘද්ධියයි, එයද අර්ථනාශ වශයෙන්ද, අනර්ථජනන වශයෙන්දැයි දෙ-ආකාරයෙකින් සිදුවේ, එහි කුශලතාව 'අපායකෝසල්ල' නම්වේ; කියනලද මැයිඃ- ''එහි අපාය කෝසල්ල යනු කවරේද? මේ ධර්මයන් මෙනෙහි කරන්නහුට නො-උපන් කුසල් නො-උපදීද,''[b] යන ආදියයි. සියලු තන්හි ඒ ඒ ධර්මයන් පිළිබඳ උපාය වූ නිෂ්පත්ති කාරණ විෂයයෙහි එකෙණෙහි පවත්නා, එසේම ඒ ඒ කාරණයෙන් උපන් කුශලතාව 'උපාය කෝසල්ල' නම්වේ. කියන ලදමැයිඃ- ''ඒ ඒ කාරණා විෂයයෙහි උපන් සකලවිධවූම උපායරූපී ප්‍රඥාව 'උපායකෝසල්ල' නම් වේ''[c] මෙසේ ආයකෝසල්ල-අපාය කෝසල්ල-උපාය කෝසල්ල වශයෙන් තෙවැදෑරුම් වේ.

සිවුවන ත්‍රිකයෙහිඃ තමා පිළිබඳ ස්කන්ධයන් අරමුණු කොටගෙන ඇරඹි විදර්ශනා ප්‍රඥාව 'අජ්ඣත්තාභිනිවේස නම්, අනුන් පිළිබඳ ස්කන්ධයන් හෝ බාහිර වූ අනීන්ද්‍රියබද්ධ රූපයන් අරමුණු කොටගෙන ඇරඹි විදර්ශනාප්‍රඥාව 'බහිද්ධාභිනිවේස' නම්, (අජ්ඣත්ත-බහිද්ධා යන) දෙකම අරමුණු කොට ගෙන ඇරඹි විදර්ශනා ප්‍රඥාව 'අජ්ඣත්ත-බහිද්ධාභිනිවේස' නමැයි මෙසේ අජ්ඣත්තාභිනිවේස ආදී වශයෙන් තෙවැදෑරුම් වේ.

චතුෂ්කයන් අතුරෙන් ප්‍රථම චතුෂ්කයෙහි, දුඃඛ සත්‍යය අරබයා පැවති ඥානය 'දුක්ඛෙඤාණ' නම්වේ, දුඃඛ සමුදය සත්‍යය අරබයා පැවති ඥානය 'දුක්ඛ සමුදයෙඤාණ' නම්වේ, දුක්ඛ නිරෝධය අරබයා පැවති ඥානය දුක්ඛ නිරොධෙ ඤාණ' නම්වේ, දුඃඛ නිරෝධය කරා පමුණුවන ප්‍රතිපත්තිය අරබයා පැවති ඥානය 'දුක්ඛනිරොධගාමිනී පටිපදාය ඤාණ' නමැයි මෙසේ චතුඃසත්‍යය පිළිබඳ ඥානය වශයෙන් සිවුවැදෑරුම් වේ.

දෙවන චතුෂ්කයෙහි චතුපටිසම්භිදා යනු, අත්‍ථ ආදි විෂයෙහි ප්‍රභේදයට පත් ඥාන සතරයි. කියනලදමැයිඃ-''අත්‍ථ විෂයයෙහි වූ ඥානය අත්‍ථපටිසම්දායි, ධම්ම විෂයයෙහි වූ ඥානය ධම්මපටිසම්භිදායි, අත්‍ථ-ධම්ම දෙකෙහි නිරුක්තිය අනුව භාෂා ව්‍යවහාරයෙහි ඥානය නිරුත්ති පටිසම්භිදායි. ඤාණ විෂයයෙහි වූ ඥානය පටිභාණ පටිසම්භිදායි''[d]

එහි 'අත්‍ථ' යනු සංක්ෂේපයෙන් හේතු-ඵලයට අධිවචනයෙකි, යම් හෙයකින් හේතු අනුසාරයෙන් හේතුඵලය එළඹේද, වැටහේද, පමුණුවනු

a. විනයපාළි, ඤාණවිභඞ්ග
b. විනයපාළි, ඤාණවිභඞ්ග
c. විනයපාළි, පටිසම්භිදා විභඞ්ග, සුත්තන්ත භාජනීය
d. විනයපාළි, පටිසම්භිදා විභඞ්ග, සුත්තන්ත භාජනීය

ලැබේද, එහෙයින් 'අත්ථ' යැයි කියනුලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි හේතුවෙන් හටගත් ඵලය, නිර්වාණය, වචනාර්ත්ථය, කර්ම විපාකය, ක්‍රියාවය යන මේ පස 'අත්ථ' යයි දතයුතුය. එම 'අර්ත්ථය' මෙනෙහි කරන්නහුට එම අර්ථවිෂයයෙහි ප්‍රභේද ගත වූ ඥානය 'අත්ථ පටිසම්භිදා' නම්. 'ධම්ම' යන මෙය සංක්ෂේපයෙන් ප්‍රත්‍යයට අධිවචනයෙකි, ප්‍රත්‍යය වනාහි යම්හෙයකින් ඒ ඒ අර්ත්ථය දනවාද, පවත්වාද, පැමිණෙන්නට සලස්වාද, එහෙයින් ධම්මයයි කියනු ලැබේ. ප්‍රභේද වශයෙන් වනාහි යම් කිසි ඵලයක් නිපදවන හේතුවක් වේනම් එයද, ආර්යමාර්ගයද, භාෂිතයද, කුශලයද, අකුශලයදැයි යන මේ පස 'ධම්ම' යයි දතයුතුය. එම ධර්මය මෙනෙහි කරන්නහුට එම ධර්ම විෂයයෙහි ප්‍රභේද ගතවූ ඥානයක් වේනම් එය 'ධම්ම පටිසම්භිදා' නම්, මෙම අරුතම අභිධර්මයෙහි:- ''දුඃඛ විෂයයෙහි ඥානය අත්ථපටිසම්භිදායි, දුඃඛ සමුදය විෂයයෙහි ඥානය ධම්මපටිසම්භිදායි, හේතුඵල විෂයයෙහි ඥානය අත්ථපටිසම්භිදායි, යම් ධර්ම කෙනෙක් උපන්නාහුද, හටගත්තාහුද, ජනිත වූවාහුද, නිපන්නාහුද, වෙසෙසින් නිපන්නාහුද, පහළ වූවාහුද, මෙම ධර්මයන් විෂයයෙහි වූ ඥානය අත්ථපටිසම්භිදායි. එම ධර්මයෝ යම් ධර්ම කෙනෙකුන් වෙතින් උපන්නාහුද, හටගත්තාහුද, ජනිතවූවාහුද, නිපන්නාහුද, මෙසෙසින් නිපන්නාහුද, පහළ වූවාහුද, එම ධර්මයන් පිළිබඳ වූ ඥානය ධම්මපටිසම්භිදායි. ජරා-මරණ විෂයයෙහි වූ ඥානය අත්ථපටිසම්භිදායි, ජරා මරණ සමුදය විෂයයෙහි ඥානය ධම්මපටිසම්භිදායි -පෙ- සංඛාර නිරෝධ විෂයයෙහිවූ ඥානය අත්ථ පටිසම්භිදායි. සංඛාර නිරෝධගාමිනී පටිපදා විෂයයෙහිවූ ඥානය ධම්ම පටිසම්භිදායි. මේ ශාසනයෙහි භික්ෂු තෙමේ ධර්මය දනියිද, සුත්ත, ගෙය්‍ය, -පෙ- වේදල්ලය යන නවඞ්ග සත්ථුසාසනය දනීද මෙය 'ධම්ම පටිසම්භිදා'යි කියනුලැබේ. හේ තෙමේ 'මේ භාෂිතයෙහි අර්ත්ථය මෙසේය, මේ භාෂිතයෙහි අර්ත්ථය මෙසේය'යි ඒ ඒ දහම් කොටස්වල අර්ත්ථය දනීද, මේ අත්ථ පටිසම්භිදායි. කවර නම් ධර්මයක් කුශල වේද? යම් කලෙක කාමාවචර කුසල් සිතක් උපන්නේ වේද, -පෙ- මේ ධර්මය කුසලයි, මේ ධර්මයන් විෂයයෙහි වූ ඥානය ධම්මපටිසම්භිදායි, එම කුශලධර්මයන්ගේ විපාක විෂයයෙහි වූ ඥානය අත්ථ පටිසම්භිදායි'' යන ආදී නයින් විග්‍රහ කොට දක්වන ලද්දේය.

'අත්ථ-ධම්ම-නිරුත්තාභිලාපෙ ඤාණං' යනු, එකී අර්ත්ථවිෂයයෙහිද, ධර්ම විෂයයෙහිද ස්වභාව නිරුක්ති සංඛ්‍යාත වූ යම් අව්‍යභිචාරී (නිවැරදි) ව්‍යවහාරයක් වේද, එම ව්‍යවහාරයෙහි, එම ව්‍යවහාරය පිළිබඳ භාෂණයෙහි හා උච්චාරණයෙහිද මෙම භාෂණය. වචනය, උච්චාරණය ඇසූ මතින්ම මේ ස්වභාව නිරුක්තියයි, 'මේ ස්වභාව නිරුක්ති නොවෙයි' යනුවෙන් මෙසේ ධම්ම නිරුක්තියයි හැඳින්වෙන සියලු සත්වයන්ගේ මූලභාෂාව වූ මාගධික ස්වභාව නිරුක්ති විෂයයෙහි ප්‍රභේදගත ඥානය නිරුක්ති

පටිසම්භිදායි නිරුත්ති පටිසම්භිදාවට පත්වූයේ වනාහි 'ඵස්සො' වෙදනා, යන මේ ආදී වදන් ඇසූ මතින්ම 'මේ ස්වභාව නිරුක්තිය'යි දනියි, 'ඵස්සා' 'වෙදනො' යන මේ ආදිය අසා 'මේ ස්වභාව නිරුක්ති නොවේයයිද දනියි.

'ඤාණෙසු ඤාණං' යනු; සියලු තන්හි ඥානය අරමුණු කොට මෙනෙහි කරන්නහුගේ ඤාණාරම්මණයයි, නැතහොත් මෙකී (අර්ථාදී) ත්‍රිවිධ ඥාන විෂයයෙහි සගෝචර කෘත්‍ය ආදී වශයෙන් විස්තර සහිත වූ ඥානය පටිභාන පටිසම්භිදායයි යන අර්ථයි.

මේ පටිසම්භිදා සතරම ශෛක්‍ෂ්‍ය භූමි හා අශෛක්‍ෂ්‍ය භූමියයි යන දෙතන්හි ප්‍රභේදයට යයි. එහිඃ අගසවු - මහසවු ආදීන්ගේ පටිසම්භිදාව අශෛක්‍ෂ්‍ය භූමියෙහිද, ආනන්ද ස්ථවිර, චිත්ත ගහපති, ධම්මික උපාසක, උපාලි ගහපති, ඛුජ්ජුත්තරා උපාසිකාදීන්ගේ පටිසම්භිදාව ශෛක්‍ෂ්‍ය භූමියෙහිද ප්‍රභේද ගත වූයේය. මෙසේ භූමිද්වයෙහි ප්‍රභේදයට යන්නාවූද මේ පටිසම්භිදාවෝ අධිගමයෙන්ද, පර්යාප්ති වශයෙන්ද, ශ්‍රවණයෙන්ද, පරිපුච්ඡාවෙන්ද, පුබ්බයෝගයෙන්දැයි යන මේ පස් ආකාරයෙන් විශද භාවයට පත් වෙති. එහි අධිගමය නම් රහත් බවට පත්වීමයි, පර්යාප්ති නම් බුද්ධවචනය හැදෑරීමයි, ශ්‍රවණය නම් මනා කොට සැදී පැහැදී සදහම් ඇසීමයි, පරිපුච්ඡා නම් පාළි-අට්ඨකථා ආදියෙහි ගැටපද-අරුත්-පද විනිස කථා විචාරීමයි. පුබ්බයෝග නම් පෙර බුදුවරයන්ගේ ශාසනයන්හි ආ-ගිය (ඇසුරු කළ) බැවින්, යම්තාක් අනුලෝම ගෝත්‍රභූ චිත්තය සමීප වේද, ඒතාක් විදර්ශනා භාවනාවෙහි යෙදී හුරුපුරුදු ඇතිබවයි. අන්‍යාචාර්යවරයෝ මෙසේ කීහුඃ-

"පුබ්බයොගො බාහුසච්චං දෙසභාසා ච ආගමො
පරිපුච්ඡා අධිගමො ගරු සන්නිස්සයො තථා
මිත්ත සම්පත්තිචෙවාති පටිසම්භිද පච්චයා"ති

"පරපුරුදු ඇති බවය, බහුශ්‍රැත බවය, දේශභාෂා ඥානයය, පර්යාප්ති ධර්මය දන්නා බවය, අටුවා ගැටපද ආදී නයින් අරුත් විමසීමය, මාර්ග-ඵලාවබෝධයය, බහුශ්‍රැත ගුරුන් සේවනය කිරීමය, කල්‍යාණ මිත්‍ර සම්පත්තියය යන මේ කරුණු ප්‍රතිසම්භිදා ප්‍රත්‍යයයෝ වෙති" යනුයි.

මෙහි, 'පුබ්බයොගො' යනු කියනලද නයමයි, බාහුසච්චං යනු, ඒ ඒ ශාස්ත්‍ර විෂයෙහිද, ශිල්පායතනයන්හිද, කුශලතාවයි, දේසභාසා යනු, එක්සියයක් භාෂාවිෂයයෙහි ව්‍යවහාර කුශලතාවයි, විශේෂයෙන් මාගධී භාෂා විෂයයෙහි බුහුටි බවයි, ආගමො යනු, යටත් පිරිසෙයින් (ම.නි. මූල පණ්ණාසකයෙහි) ඕපම්ම වග්ගය පමණ තෙක් හෝ බුද්ධවචනය හැදෑරීමයි. පරිපුච්ඡා නම්, එක් ගාථාවෙක්හි හෝ අර්ථ-විනිශ්චය විමසීමයි. අධිගමො යනු, සෝවාන් බව -පෙ- හෝ රහත්බවයි, ගරු සන්නිස්සයො

යනු, ඇසූ පිරූ තැන් ඇති ප්‍රතිභාන සම්පන්න ගුරුන් වෙත විසීමයි, මිත්ත සම්පත්ති යනු, එවැනිම වූ කලණ මිතුරන් ලැබීමයි.

එහි, බුදුවරයෝද, පසේ බුදුවරයෝද පෙර පුරුදු ඇති බව හා මාර්ගඵලාවබෝධය හේතුකොට පිළිසිඹියාවනට පත් වෙති, බුද්ධශ්‍රාවකයෝ මේ සියලු කරුණු හේතු කොට පිළිසිඹියාවනට පැමිණෙති. පිළිසිඹියාවනට පත් වීමෙහිද එකක් එකක් බැගින් කර්මස්ථාන භාවනාවෙහි යෙදීමෙක් නැත. ශෛක්‍ෂ්‍යයනට වනාහි ශෛක්‍ෂ්‍ය ඵල විමෝක්‍ෂය අන්ත කොටද, අශෛක්‍ෂ්‍යයනට අශෛක්‍ෂ්‍යඵල විමෝක්‍ෂය අන්ත කොටද පටිසම්භිදාප්‍රාප්තිය සිද්ධ වේ, තථාගතයනට දශබලයන් සිද්ධ වන්නාසේ ආර්යශ්‍රාවකයනට ආර්යඵලයෙන්ම පිළිසිඹියාවන් සමෘද්ධ වෙතැ'යි මේ පිළිසිඹියාවන් සඳහා කියනලදි. සිවුපිළිසිඹියා වශයෙන් සිවුවැදෑරුම්ද වේ.

(පඤ්ඤා භාවනාව) කෙසේ වැඩිය යුත්තේද යත්ඃ මෙහි වනාහි යම් හෙයකින් ඛන්‍ධ-ආයතන-ධාතු-ඉන්‍ද්‍රිය-සච්ච-පටිච්චසමුප්පාද ආදී ප්‍රභේද ඇති ධර්මයෝ මේ ප්‍රඥාවට භූමි වෙත්ද, ශීල විසුද්ධි, චිත්ත විසුද්ධි යන දෙක එහි මූලය වේද, දිට්ඨි විසුද්ධි, කඞ්ඛාවිතරණ විසුද්ධි, මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි, පටිපදාඤාණදස්සන විසුද්ධි, ඤාණදස්සන විසුද්ධි. යන මේ පංච විශුද්ධිය එහි ශරීරය වේද, එහෙයින් මේ භූමිභූත ධර්ම විෂයයෙහි ඉගෙනීම්, පිළිවිසීම් වශයෙන් දැනීම හුරුපුරුදු කොට, එම මූලභූත විශුද්ධි දෙක සම්පාදනය කොට, ශරීරභූත විශුද්ධි පංචකය සම්පාදනය කෙරෙමින් වැඩිය යුතු වේ. මේ මෙහි සංක්‍ෂෙපයයි.

විස්තරය මෙසේයඃ- ඛන්‍ධ-ආයතන-ධාතු-ඉන්‍ද්‍රිය-සච්ච-පටිච්ච සමුප්පාද ආදී ප්‍රභේද ඇති ධර්මයන් මේ ප්‍රඥාවට භූමි වෙතැ'යි පළමුකොට යමක් කියන ලද්දේද, මෙහි ඛන්‍ධ යනු, රූපස්කන්‍ධ, වේදනාස්කන්‍ධ, සංඥාස්කන්‍ධ, සංස්කාරස්කන්‍ධ, විඤ්ඤාණස්කන්‍ධ යන මේ පංච ස්කන්‍ධයයි.

## රූපස්කන්ධය

එහි, ශීතාදිය හේතුකොට විකෘතීනට භාජන වන සුළු යම් ධර්ම සමූහයක් ඇත්ද, ඒ සියල්ල එක්ව ගෙන රූපස්කන්‍ධයයි දතයුතුය. එම රූපස්කන්‍ධය රුප්පන (විකෘතීනට භාජනවීමේ) ලක්‍ෂණය අතින් ඒකවිධ වනුයේ නමුදු භූත උපාදාය ප්‍රභේද වශයෙන් ද්විවිධ වේ. එහි භූත රූපය පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායො ධාතුයයි චතුර්විධ වේ. එහි ලක්‍ෂණ රස හෙවත් කෘත්‍යය පච්චුපට්ඨාන හෙවත් වැටහෙන නොහොත් එළඹ සිටින ආකාරය යන මේ කරුණු ඉහත චතුධාතු වවත්ථානයෙහිදී විස්තර කරන ලදි. පදට්ඨාන හෙවත් පදනම නැතහොත්

ආසන්න කාරණ වශයෙන් ඒ මහාභූත සියල්ලම එකක්, එකක් අනෙක් තුන පදනම් කොට ඇත්තේය.

උපාදාය රූප සූවිසි වැදෑරුම් වේ: චක්ඛු-සෝත-ඝාන-ජිව්හා-කාය-රූප-සද්ද-ගන්ධ-රස-ඉත්ථින්ද්‍රිය-පුරිසින්ද්‍රිය-ජීවිතින්ද්‍රිය-හදයවත්ථු-කායවිඤ්ඤත්ති-වචීවිඤ්ඤත්ති-ආකාසධාතු-රූපස්සලහුතා-රූපස්ස මුදුතා-රූපස්ස කම්මඤ්ඤතා-රූපස්ස උපචය-රූපස්ස සන්තති - රූපස්සජරතා-රූපස්ස අනිච්චතා-කබලිඞ්කාරාහාර යනුවෙනි.

එහි, චක්ඛුපාදායය රූපාලම්බනයක් හා සමග ගැටීමට යෝග්‍යවූ මහාභූතය (හෙවත් ධාතුව) විඳ ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය; නොහොත්, දකිනු රිසිබව මුල් කොටගත් (තෘෂ්ණාසහිත) කර්මයෙන් ජනිත මහාභූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය; රූපයන් වෙත විඤ්ඤාණය ඇද ගැනීම රස හෙවත් කෘත්‍යය කොට ඇත්තේය, චක්ඛු විඤ්ඤාණය දරා සිටින බව වැටහීම් ආකාර කොට ඇත්තේය, දකිනු රිසි බව මුල් කොට ගත් කර්මයෙන් ජනිත මහාභූතය පදට්ඨාන (පදනම) කොට ඇත්තේය.

සෝත උපාදායය ශබ්දාලම්බනයක් හා සමග ගැටීමට යෝග්‍යවූ මහාභූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය, නොහොත් අසනුරිසි බව මුල් කොට ගත් කර්මයෙන් හටගත් මහාභූතය විඳ ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය, ශබ්දාලම්බනය වෙත විඤ්ඤාණය ඇද ගැනීම කෘත්‍යය කොට ඇත්තේය, සෝත විඤ්ඤාණය දරා සිටින බව වැටහීම් ආකාර කොට ඇත්තේය, අසනු රිසිබව මුල් කොට ගත් කර්මයෙන් උපන් මහාභූතය පදනම් කොට ඇත්තේය.

ඝාන උපාදායය ගන්ධාලම්බනයක් හා සමග ගැටීමට යෝග්‍ය වූ මහා භූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය, නොහොත් ආඝ්‍රාණය කරනු රිසි බව මුල් කොට ගත් කර්මයෙන් හටගත් මහාභූතය විඳ ගැනීම ලක්‍ෂණකොට ඇත්තේය, ගන්ධාලම්බනය වෙත විඤ්ඤාණය ඇද ගැනීම කෘත්‍යය කොට ඇත්තේය, 'ඝාන විඤ්ඤාණය දරා සිටින බව වැටහීම් ආකාර කොට ඇත්තේය, ආඝ්‍රාණය කරනු රිසිබව මුල් කොටගත් කර්මයෙන් හටගත් මහා භූතය පදනම් කොට ඇත්තේය.

ජිව්හා උපාදායය රසාලම්බනයක් හා ගැටීමට යෝග්‍ය වූ මහාභූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. නොහොත් සායනය (රසවිඳිනු) රිසි බව මුල් කොට ගත් කර්මයෙන් හටගත් මහාභූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය; රසාලම්බනය වෙත විඤ්ඤාණය ඇදගැනීම කෘත්‍යය කොට ඇත්තේය, ජිව්හා විඤ්ඤාණය දරා සිටින බව වැටහීම් ආකාර කොට ඇත්තේය, රස විඳිනු රිසි බව මුල්කොටගත් කර්මයෙන් හටගත් භූතය පදට්ඨාන කොට ඇත්තේය.

කාය උපාදායය ස්පර්ශාලම්බනයක් හා සමග ගැටීමට යෝග්‍ය වූ මහා භූතය විඳ ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය, නොහොත් ස්පර්ශ කරනු රිසි බව මුල් කොටගත් කර්මයෙන් හටගත් මහාභූතය විඳගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය; ස්පර්ශාලම්බනය වෙතට විඥ්ඤාණය ඇදගැනීම කෘත්‍යය කොට ඇත්තේය, කාය විඥ්ඤාණය දරා සිටින බව වැටහීම් ආකාර කොට ඇත්තේය, ස්පර්ශ කරනු රිසි බව මුල් කොටගත් කර්මයෙන් හටගත් මහාභූතය පදට්ඨාන කෙට ඇත්තේය.

ඇතැමෙක් වනාහි (මහා සඞ්ඝිකයන් අතුරෙන් කෙනෙක්) තේජෝ ධාතුව අධික කොට ඇති භූතය විඳ ගන්නේ චක්‍ෂු (උපාදාය) යයිද, වායෝ, පඨවි, ආපෝ ධාතූන් අධික කොට ඇති භූතයන් විඳගන්නාහු (පිළිවෙළින්) ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා යන උපාදායයෝ යයිද සියල්ල සමවූ මූලධාතූන් විඳගන්නේ කායඋපාදායයිද කියති. තවද කෙනෙක් (අභයගිරි වාසීහු) තේජෝ ගුණය අධික මූලධාතූන් විඳගන්නේ චක්ඛූපාදාය යයිද, විවර (ආකාශ) වායො, ආපෝ, පඨවි ගුණ අධික මූල ධාතූන් විඳගන්නාහු (පිළිවෙළින්) ශ්‍රෝත්‍ර, ඝ්‍රාණ, ජිහ්වා, කාය යන උපාදායයෝයයිද කියති. ඔවුනට, 'සූත්‍ර දේශනාවක් ගෙනහැර දක්වනුයැ'යි කිවයුතුය. ඒකාන්තයෙන් සූත්‍රපාඨයක් දක්වනු නොහැකි වන්නාහුමය; මෙහිදී ඇතැමෙක්, තේජෝ ගුණ සහිත රූපාදිය විසින් චක්ඛුප්පසාද ආදිය අනුග්‍රහ කරනු ලැබීම් වශයෙනි'යි හේතු යුක්ති දක්වති; ඔවුනට මෙසේ කිවයුතුයඃ 'කවරකු එසේ රූපාදිය තේජෝ ආදීන්ගේ ගුණය'යි කියා ඇත්ද? එකිනෙකින් වෙන් නොකට හැකි පැවතුම් ඇති මහාභූතයන් අතර 'මේ අසුවල් භූතගුණයයි, මේ අසුවල් භූතගුණය'යි කිවහැකි නොවේ' යනුවෙනි.

එවිට ඔවුන් තව දුරටත් මෙසේ කියනු ඇත. 'යම්සේ ඒ ඒ ද්‍රව්‍යයන්හි ඒ ඒ මූලධාතුව ඇතිවීමේ හේතුවෙන් පඨවි ආදීන්ගේ දැරීම් ආදී කෘත්‍යයන් කැමැති වන්නහුද (පිළිගන්නහුද) එසේ තේජෝ ගුණ බහුල ද්‍රව්‍යයන් කෙරෙහි රූප ආදිය අධික වශයෙන් දිස්වන හෙයින් එම රූප ආදිය තේජෝ ආදීන්ගේ ගුණයයි කැමැති විය (පිළිගත) යුතුය,' යනුයි. එවිට ඔවුනට මෙසේ කිවයුතුය; ''ඉදින් ආපෝ ගුණ බහුල ආසවයෙහි ගන්ධයට වඩා පඨවිගුණ බහුල කපු පුලුනෙහි බහන ලද ආසවයෙහි ගන්ධය අධිකතර වෙත්හොත්, තේජෝ ගුණ බහුල උණු දියෙහි වර්ණයට වඩා (තේජෝ ගුණයෙන් අඩු ඇල්දියෙහි වර්ණය හීන වෙත් හොත් අපි පිළිගන්නෙමු; මෙකී කරුණු දෙකම එසේ නොවන හෙයින් ආශ්‍රිත භූතයන් (ධාතූන්) පිළිබඳ වූ මේ විශේෂ කල්පනය අත්හරිනුය' යනුවෙනි. යම්සේ එක් කලාපයකට අයත් භූතයන් (මූලධාතූන්) ගේ අවිශේෂ(සාමාන්‍ය) බවක් ඇති විය හැකි නමුදු, රූපරසාදිය එකිනෙකට අසමාන වන්නේද, එසේම චක්ඛුප්පසාදාදිය අන් විශේෂ කරුණක් නොමැතිව පවා එකිනෙකට අසමාන වෙතැ'යි යන මෙය පිළිගත යුතුය'' යනුයි.

එකිනෙකට පොදු නොවන යමක් ඇතොත් ඒ කුමක්ද? චක්ඛුප්පසාදාදිය පිළිබඳ විශේෂ කාරණය නම් කර්මයමැයි, එහෙයින් එම චක්ඛුප්පසාදාදිය පිළිබඳ විශේෂය සිදුවනුයේ කර්ම විශේෂය හේතු කොට ගෙන මිස භූතවිශේෂය හේතුකොට ගෙන නොවේ. ''භූත විශේෂය ඇති කල්හි පසාදය (විඳ ගැනීම) නො-උපදියි, පසාදය සිදුවනුයේ සමානයන් පිළිබඳව මිස අසමානයන් පිළිබඳව නොවේ''යයි පුරාණාචාර්යයෝ කීහ.

මෙසේ කර්ම විශේෂය හේතුකොට එකිනෙකට වෙනස්වන මේ පසාදයන් අතුරෙන් චක්ඛු, සෝත යන දෙක තමන් වෙත නොපැමිණි විෂයයන් ග්‍රහණය කරන්නේ වේ. තමනට නිශ්‍රයවූ මහාභූතයන් නො-ඇලුණු නිශ්‍රය ඇති (රූප-ශබ්ද යන) දෙක විෂයෙහිම විඤ්ඤාණය ඉපැදවීමට හේතුවන හෙයිනි. ඝාන-ජිව්හා-කාය යන තුන තමන් වෙත පැමිණි විෂයයන්ම ග්‍රහණය කරන්නේ වේ; නිශ්‍රය වශයෙන් මෙන්ම තමන්ද තමනටම නිශ්‍රය වූ මහාභූතයන් ඇලුණු නිශ්‍රය ඇති (ගන්ධ-රස-ඵොට්ඨබ්බ යන) විෂයයෙහි විඤ්ඤාණය ඉපැදවීමට හේතු වන බැවිනි.

මෙහි චක්ඛු (ඇස)ද, ලෝකයෙහි, නිල්වන් ඇසිපියෙන් ගැවසුණු, කළු සුදු ඉංගිරියාවලින් විසිතුරු වූ, නිලුපුල් පෙති හා සමවූ යමක් 'චක්ඛු' යයි වහරනු ලැබේද, එය අවයව සහිත ඇස තුළ සුදු ඉංගිරියාවෙන් වටකරන ලද කළු ඉංගිරියාව මැද, ඉදිරියෙහි සිටියවුන්ගේ සිරුරු සටහන් උපදින (පිළිබිඹු වන) තන්හි, පුළුන් පටල සතක් තුළ තෙල් ගැල් වූ පුළුන් පටලයක් මෙන් අක්ෂිපටල සතක් තුළ පැතිර සිටියි, තවද එය කිරිමවුන් සිවු දෙනකු විසින් දරා (වඩාගෙන) සිටීම, නැහැවීම, සැරැසවීම, පවන්සැලීම යන කාර්යයන් කරමින් උපස්ථාන කරනු ලබන ක්ෂත්‍රිය කුමාරයකු මෙන් ධාතු සතර විසින් දැරීම, බැඳීම, බිහිකිරීම, සැලීම යන කාර්යයන් කරමින් ඍතු-චිත්ත-ආහාර යන මෙයින් උපකාර කරනු ලබමින්, ආයුෂය විසින් කළමනා කරනු ලබමින්, වර්ණ-ගන්ධ-රසාදිය විසින් පිරිවරන ලදුව, ප්‍රමාණයෙන් උකුණුහිසක් තරම් ඇතිව, චක්ඛු විඤ්ඤාණාදියට සුදුසු පරිදි වස්තුභාවයද ද්වාරභාවයද සලස්වමින් සිටියි. කියනලද මැයි ධම්මසේනාපතීන් (සැරියුත් තෙරණුවන්) විසින්:-

''යෙන චක්ඛුප්පසාදෙන රූපානිමනුපස්සති
පරිත්තං සුඛුමං එතං ඌකාසිරසමූපම[a]න්ති''

යම් චක්ඛුප්පසාදයක් කරණ කොට රූපයන් දක්නේද, ඉතා කුඩාවූ, සියුම්වූ එය උකුණු හිසක් සමාන වේ.

අවයව සහිත (ද්‍රව්‍යමය) කන් සිදුර තුළ, සිහින් තඹවන් ලොම්වලින් ගැවසුණු මුදුවක් වැනි හැඩය ඇති පෙදෙසෙක්හි (පසාද රූපී) සෝතය

a. මහා නිද්දෙස

යටකී ආකාර ඇති ධාතූන් විසින් උපකාර කරනු ලබමින් ඍතු-චිත්ත ආහාරයන් විසින් උපස්ථාන කරනු ලබමින්, ආයුෂය විසින් කළමනාකරනු ලබමින් වර්ණාදිය විසින් පිරිවරන ලදුව සෝත විඤ්ඤාණාදියට සුදුසු වන සේ වස්තුභාවයද ද්වාරභාවයද සලස්වමින් සිටියි.

අවයව සහිත නාසා සිදුරු තුළ එළුකුරයක් බඳු හැඩය ඇති තැන, ඝානය යටකී ප්‍රකාර ඇති උපකාර-උපස්ථාන-අනුපාලන-පරිවාර යන්ගෙන් යුක්තව ඝාන විඤ්ඤාණාදියට සුදුසු වනසේ වස්තුභාවයද, ද්වාරභාවයද සලස්වමින් සිටියි. අවයව සහිත ජිව්හා මධ්‍යයෙහි මහනෙල් පත් අගක් බඳු හැඩය ඇති තැන පිහිටා ඇති ජිව්හාව යටකී ප්‍රකාර ඇති උපකාර-උපස්ථම්භ-අනුපාලන-පරිවාරයන්ගෙන් යුක්තව ජිව්හා විඤ්ඤාණාදියට සුදුසුවන සේ වස්තුභාවයද, ද්වාරභාවයද සලස්වමින් සිටියි.

යම් පමණ මේ කයතුළ උපාදින්න (ගන්නාලද) රූපයක් ඇත්තේද, ඒ සියලු තන්හි පැතිර ඇති (පසාදරූපී) කාය කපු පුළුන් පටලයෙක්හි තෙලක් මෙන් යටකී ප්‍රකාර ඇති උපකාර-උපස්ථම්භ-අනුපාලන-පරිවාරයන්ගෙන් යුක්තව කායවිඤ්ඤාණ ආදියට වස්තුභාවයද, ද්වාරභාවයද සලස්වමින් සිටියි. යම්සේ සප්, කිඹුල්, ලිහිණි, බලු, කැනහිල් යන මොවුන් (පිළිවෙළින්) තුඹස්, දිය, අහස්, ගම්, සොහොන් යන තම තමන්ගේ ගොදුරුබිම් වෙත නැඹුරු වන්නාහුද, එසේම මේ චක්ඛු ආදියද රූපාදීවූ තම තමන්ගේ ගොදුරුබිම් වෙත නැඹුරුව පවතිතැ'යි දතයුතුය.

එම පසාද රූපයන්ගෙන් මතු, (උපාදාය) රූපාදිය අතුරෙන්, රූපය ඇස හා සමග ගැටීම ලක්‍ෂණ කොට ඇත්තේය, චක්ඛුවිඤ්ඤාණයට විෂය වීම කෘත්‍යය කොට ඇත්තේය, එයටම ගොදුරුවීම වැටහීම් කොට ඇත්තේය, සතර මහාභූතයන් පදනම් කොට ඇත්තේය. මේ චක්ඛු උපාදායය යම්සේද, සියලු උපාදාය රූප එසේය, යම් තැනෙක විශේෂයක් ඇතොත් එය එතැනදී කියමු. එම උපාදාය රූපද නීල, පීතාදී වශයෙන් නොයෙක් ආකාර වේ.

(උපාදාය රූපී) ශබ්දය සෝතය හා සමග ගැටීම ලක්‍ෂණ කොට ඇත්තේය, සෝත විඤ්ඤාණයට විෂය වීම කෘත්‍යය කොට ඇත්තේය, එයටම ගොදුරුවන බව වැටහීම් කොට ඇත්තේය, භේරි ශබ්ද - මෘදඞ්ග ශබ්දාදී වශයෙන් නොයෙක් ආකාර ඇත්තේ වේ, (උපාදාය රූපී) ගන්ධය ඝ්‍රාණය හා සමග ගැටීම ලක්‍ෂණ කොට ඇත්තේය, ඝාන විඤ්ඤාණයට විෂයවීම කෘත්‍යය කොට ඇත්තේය, එයටම ගොදුරුවීම වැටහීම කොට ඇත්තේය, මුල්වල ගන්ධයය, අරටුවෙහි ගන්ධයය ආදී වශයෙන් නොයෙක් ආකාර ඇත්තේය. (උපාදාය රූපී) රසය දිව හා සමග ගැටීම ලක්‍ෂණ කොට ඇත්තේය, ජිව්හා විඤ්ඤාණයට විෂය වීම කෘත්‍යය කොට ඇත්තේය, එයටම ගොදුරුවීම වැටහීම් කොට ඇත්තේය.

මුල්වල රසය, අරටුවෙහි රසය ආදී නයින් නොයෙක් ආකාර ඇත්තේ වේ.

ඉත්ථින්ද්‍රියය ස්ත්‍රී ස්වභාවය ලක්ෂණ කොට ඇත්තේය, ස්ත්‍රියකැ'යි හැඟවීම කෘත්‍යය කොට ඇත්තේය, ස්ත්‍රීලිඞ්ගය, නිමිත්තය, කාර්යය, ආකල්පය යන මොවුනට හේතුවන බව වැටහීම් කොට ඇත්තේය, පුරිසින්ද්‍රියය පුරුෂ ස්වභාවය ලක්ෂණ කොට ඇත්තේය, පුරුෂයෙකැ'යි හැඟවීම කෘත්‍යය කොට ඇත්තේය, පුරුෂ ලිඞ්ගය, නිමිත්තය, කාර්යය, ආකල්පය යන මොවුනට හේතුවන බව වැටහීම් කොට ඇත්තේය, මේ (ඉත්ථිලිඞ්ග. පුරුෂලිඞ්ග) යන දෙකම කායප්පසාදය සෙයින්ම මුළු සිරුර පුරා පැතිර සිටිනුයේම වේ. එහෙත් කායප්පසාදය සිටි තන්හි සිටිති'යි හෝ නොසිටි තන්හි සිටිති'යි හෝ කිවයුතු බවට නොපැමිණේ, රූප, රස ආදිය මෙන් එකිනෙක සංකර (මිශ්‍ර) වීමෙක් නැත.

ජීවිතින්ද්‍රියය තමා හා එක්ව උපන් රූපයන් පිළිබඳ අනුපාලනය (කළමනාකරණය) ලක්ෂණ කොට ඇත්තේය, එම සහජරූපයන් පවත්වා ගැනීම කෘත්‍යය කොට ඇත්තේය, සහජාත රූපයන් තබාගැනීම වැටහීම් කොට ඇත්තේය, තමා විසින් යැපිය යුතු භූතරූපයන් (මූල ධාතුන්) පදනම් කොට ඇත්තේය. අනුපාලන ලක්ෂණාදී එම විධානය එසේ පවත්නා කල්හිදු එම ජීවිතේන්ද්‍රියය එම සහජරූපයන් විද්‍යමාන වන කල්හිම අනුපාලනය කරයි, ජලය විද්‍යමානවූම උපුල් ආදිය අනුපාලනය කරන්නා සේය. තමා සතු සහජරූපයන් මෙන්ම ප්‍රත්‍යයෙන් උපන් ධර්මයන්ද අනුපාලනය කරයි, කිරිමවක් කුමරුවකු පාලනය කරන්නා සේය. තමා විසින්ම පවත්වන ලද ධර්ම සම්බන්ධයෙන්ම පවතියි, නියාමකයකු සේය. බිඳීයාමෙන් මතු නොපවත්වයි, (බිඳීගිය පසු) තමා මෙන්ම තමා විසින් පැවැත්විය යුතු ධර්මයන්ද නැති හෙයිනි. භංගක්ෂණයෙහි (සහජාත රූපයන්) තබා ගැනීමෙක් නැත, තමාද බිඳී යන හෙයිනි. ක්ෂයවී යන පහන්වැටි තෙල පහන් දැල්ල නොතබන්නා සේය. (එම ජීවිතේන්ද්‍රිය මෙකී) අනුපාලන-පවත්තන-ඨාපන බලයෙන් තොර වන්නේ නොවේ. කියනලද පරිදි ඒ ඒ කෙණෙහිදී ඒ ඒ කාර්යයන් සිද්ධ කරන හෙයිනි'යි දතයුතුය.

උපාදාය රූපී හදයවත්ථුව මනෝධාතු, මනෝ විඤ්ඤාණ ධාතුන්හට නිශ්‍රය වීම ලක්ෂණ කොට ඇත්තේය, එම ධාතුන්හටම ආධාර වීම කෘත්‍යය කොට ඇත්තේය. එම ධාතුන්ම උසුලා සිටීම වැටහීම් ආකාර කොට ඇත්තේය. යට කායගතාසති කර්මස්ථාන විස්තර කථාවෙහි කියනලද පරිදි හෘදයවස්තු අභ්‍යන්තරයෙහි පවත්නා ලෝහිතය ඇසුරුකොට සිටිමින්, සන්ධාරණාදී කෘත්‍යයන් සිදු කරන මූල ධාතුන් විසින් උපකාර කරනු ලබමින්, ඍතු-චිත්ත-ආහාරයන්ගේ පිහිට ලබමින්, ආයුෂය විසින් අනුපාලනය කරනු ලබමින් මනෝධාතු- මනෝවිඤ්ඤාණධාතු යන

දෙකට හා සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයනටද වස්තු (වාසස්ථාන) භාවය සපයමින් සිටියි.

ඉදිරියට යාම් ආදී ක්‍රියාවන් පැවැත්වීමේ සිතින් හටගත්, වායෝ ධාතුවෙන් සහජාත රූපකායයත් දැඩිවීමට, දැරීමට හා සැලීමට හේතුවන ආකාර විකාර ලක්‍ෂණය කාය විඤ්ඤත්තියයි, එය අභිප්‍රාය ප්‍රකාශනය කෘත්‍යය කොට ඇත්තේය, කය සෙලවීමට හේතුවන බව වැටහීම් කොට ඇත්තේය. සිතින් හටගත් වායෝධාතුව පදට්ඨාන කොට ඇත්තේය. එම කායවිඤ්ඤත්තිය වනාහි කය සැලීම අභිප්‍රාය හැඟවීමට හේතුවන හෙයින්ද, තමාද එම කායවිප්ඵන්‍දන සංඛ්‍යාත කයින්ම දතයුතු වන හෙයින්ද 'කායවිඤ්ඤත්තිය'යි කියුනු ලැබේ. එම කායවිඤ්ඤත්තියෙන් සැලුණ චිත්තජරූපයන් හා සමග බැඳුණ ඍතු ගුණයන්ගේද සැලීමෙන් අභික්‍රම පටික්කම (ඉදිරියට පස්සට යාම්) ආදිය සිදු වෙති'යි දතයුතුය.

වාග්භේදය (එකිනෙකට වෙනස් වචන භාවිතය) පවත්වන සිතින් හටගත්, පඨවි ධාතුව විසින් අල්ලා ගන්නාලද දෙය හා සමග ගැටීමට හේතු වන ආකාර විකාර ලක්‍ෂණය වචී විඤ්ඤත්තියයි, එය අභිප්‍රාය ප්‍රකාශනය කෘත්‍යය කොට ඇත්තේය, වාක්ශබ්දයට හේතුවන බව වැටහීම් කොට ඇත්තේය, චිත්තයෙන් හටගන්නා පඨවිධාතුව පදට්ඨාන කොට ඇත්තේය. එම වචීවිඤ්ඤත්තිය වාක්ශබ්දයෙන් අභිප්‍රාය හැඟවීමට හේතුවන හෙයින්ද, තමාද එම වාක්ශබ්ද සංඛ්‍යාත වචනයෙන් දතයුතු වන හෙයින්ද 'වචී විඤ්ඤත්ති' යයි කියතුලැබේ. යම්සේ ජලය ඇති බව හඟවනු පිණිස වනයෙහි ඔසවා බඳනා ලද සඳුන් රිකිලි ආදිය දැක 'මෙහි ජලය ඇතැ'යි දැනගැනීම වන්නේද, එසේම කායවිප්ඵන්‍දනය (කය සැලීම) ද වාක් ශබ්දය ද ගෙන (පිළිවෙළින්) 'කාය විඤ්ඤත්ති'- 'වචී විඤ්ඤත්ති' යන දෙක දන්නා ලැබේ.

(උපාදාය රූපී) ආකාසධාතුව රූපයන් පිරිසිඳීම ලක්‍ෂණ කොට ඇත්තේය, රූප කෙළවර සීමාව ප්‍රකාශ කිරීම කෘත්‍යය කොට ඇත්තේය, රූප සීමාව වැටහීම් ආකාර කොට ඇත්තේය, නැතහොත් ස්පර්ශ නොකරන ලදබව, විවර බව, සිදුරු සහිත බව ආදිය වැටහීම් ආකාර කොට ඇත්තේය. පිරිසිඳින ලද රූපයන් පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය. එම ආකාසධාතුවෙන් රූපයන් පිරිසිඳි කල්හි, 'මෙය මෙයට උඩිනි, යටිනි, සරසිනි'යි යන හැඟීම වේ. (උපාදායරූපී) රූපස්ස ලහුතාව සැහැල්ලුබව ලක්‍ෂණ කොට ඇත්තේය, රූපයන්ගේ ගුරුබව (බරබව) දුරු කිරීම කෘත්‍යය කොට ඇත්තේය, යුහුව ක්‍රියාකාරීවීම වැටහීම් කොට ඇත්තේය, සැහැල්ලු රූපයන් පදනම් කොට ඇත්තේය.

රූපස්ස මුදුතාව (එනම් උපාදාය) තද නොවන බව ලක්‍ෂණ කොට ඇත්තේය. රූපයන්ගේ දැඩිබව දුරු කිරීම කෘත්‍යය කොට ඇත්තේය, සියලු ක්‍රියා විෂයයෙහි මුදු බව වැටහීම් කොට ඇත්තේය, මෘදු රූපයන්

පදනම් කොට ඇත්තේය. 'රූපස්ස කම්මඤ්ඤතා' උපාදායය ශරීර ක්‍රියාවනට අනුකූලව කර්මණ්‍යකෘත්‍යය කොට ඇත්තේය, දුබල නොවන බව වැටහීම් කොට ඇත්තේය, කර්මණ්‍යරූපයන් පදනම් කොට ඇත්තේය.

මෙකී (රූපස්ස ලහුතා, රූපස්ස මුදුතා, රූපස්ස කම්මඤ්ඤතා යන) තුන එකිනෙක නොහරියි, මෙසේ වුවද - රෝග නැත්තකුගේ මෙන් රූපයන් පිළිබඳ යම් ලුහුබවක්, මොට නොවන බවක්, යුහුව ක්‍රියාකාරී වන ආකාරයක්, රූපයන් පිළිබඳ මොට බව ඇති කරන ධාතූන්ගේ කැළඹීමට ප්‍රතිපක්ෂ හේතූන්ගේ නැඟීමෙක් වේද, එම රූප විකාරය 'රූපස්ස ලහුතා'යි මැනවින් පදම් කරන ලද සමෙක මෙන් රූපයන් පිළිබඳ යම් මුදු බවක්, සියලු ක්‍රියා විශේෂයන් වශයෙහි පවත්වන (හුරුබුහුටි) බවක්, මටසිළුටු ආකාරයක්, රූපයන්ගේ දැඩිබව ඇතිකරන ධාතූන්ගේ කැළඹීමට ප්‍රතිපක්ෂ හේතූන්ගේ නැඟීමෙක් වේද, එම රූපවිකාරය 'රූපස්ස මුදුතායි මැනවින් පිරිසුදු කරන ලද ස්වර්ණයෙහි මෙන් රූපයන් පිළිබඳ යම් කර්මයෝග්‍යතාවක්, ශරීර ක්‍රියාවනට අනුකූල වීමේ ප්‍රකාරයක්, ශරීර ක්‍රියාවන්ගේ අනනුකූල බව ඇති කරන ධාතූන්ගේ කැළඹීමට ප්‍රතිපක්ෂ හේතූන්ගේ නැඟීමෙක් වේද, එම රූපවිකාරය 'රූපස්ස කම්මඤ්ඤතා'යි මෙසේ මේ 'රූපස්සලහුතා' ආදීන් පිළිබඳ විශේෂය දතයුතුය.

'රූපස්ස උපචය' උපාදායය එක්රැස් වීම ලක්ෂණ කොට ඇත්තේය, ප්‍රථමයෙන් රූපයන් මතුකරවීම (ප්‍රකට කරවීම) කෘත්‍යය කොට ඇත්තේය. ඉදිරියට එළඹවීම වැටහීම් කොට ඇත්තේය, නොහොත් පිරිපුන් බවට යාම වැටහීම් කෙට ඇත්තේය, වැඩීගිය එම රූපයම පදනම් කොට ඇත්තේය.

'රූපස්ස සන්තති' උපාදායය පැවතීම ලක්ෂණ කොට ඇත්තේය. අනු පිළිවෙළින් ගැලපීම කෘත්‍යය කොට ඇත්තේය, නොසිඳී පවතින බව වැටහීම් කොට ඇත්තේය. අනුපිළිවෙළින් එකිනෙක ගලපන රූපයන්ම පදනම් කොට ඇත්තේය.

මෙම ('රූපස්ස උපචය', 'රූපස්ස සන්තති' යන) දෙකම ජාති (උපදනා) රූපයටම අධිවචනයි, ආකාර නානත්ව හේතුවෙන්ද, වෛනේය විශේෂත්ව වශයෙන්ද 'උපචය' 'සන්තති' යනුවෙන් දෙකක් ලෙස උද්දේස (ඉගෙනීම පිණිස මාතෘකා) කොට සංක්ෂේප දේශනා කරනලදි. මෙහි අර්ථ වශයෙන් නානත්වයක් නැති හෙයින්ම මේ පද දෙක නිද්දේස (සවිස්තර) කොට දැක්වීමෙහිදී, ''යො ආයතනානං ආචයො, සො රූපසස උපචයො, යො රූපසස උපචයො සො 'රූපසස සන්තති' (ආයතනයන්ගේ යම් එක්රැස් වීමෙක් වේද එය රූපස්ස උපචය' නම්, රූපයන්ගේ යම් වැඩීයාමක් වේද එය 'රූපස්ස සන්තති' මැයි) කියන ලදි. අටුවායෙහිද 'ආචය' නම් ඉපැදීමයි, 'උපචය' නම් වැඩීයාමයි, සන්තති නම්

පැවැත්මය'යි කියා, ''ආචය'' යනු ගංතෙරෙක කනින ලද ලිඳෙක පළමුවෙන්ම ජලය උනන කාලය වැනිය, 'උපචය' යනු, ලිද පිරීගිය කාලය වැනිය. 'සන්තති' යනු, එහි ජලය උතුරා යන කාලය වැනිය'යි උපමා කරන ලදි. උපමා කොට අවසන්හි, ''මෙසේ කුමක් කියන ලද්දේද? 'ආයතන' යනුවෙන් (රූපයන්ගේ) 'ආචය' හෙවත් ඉපැදීම කියනලදි, 'ආචය' යනුවෙන් ආයතනය කියන ලදැ'යි පවසන ලදි. එහෙයින් රූපයන්ගේ යම් පළමු හට ගැනීමෙක් වේද එය 'ආචය'යිද, ඉන් ඉක්බිති උපදින රූපයන්ගේ යම් හටගැනීමෙක් වේද එය වැඩී යාමක් ලෙසින් එළඹෙන හෙයින් 'උපචය'යිද, ඉනුදු ඉක්බිති යලි යලිත් උපදින අනෙක් අනෙක් රූපයන්ගේ යම් හටගැන්මෙක් වේද, එය එකිනෙක අනුපිළිවෙළින් එළඹෙන හෙයින් 'සන්තති' යයිද කියනු ලැබෙති'යි දතයුතුය.

රූපස්ස ජරතා උපාදායය රූපයන්ගේ මුහුකළ බව ලක්‍ෂණ කොට ඇත්තේය. රූපයන් පරිහාණිය කරා ගෙනයාම කෘත්‍යය කොට ඇත්තේය, (ආවේණික) ස්වභාවය නො-ඉකුත්ව තිබියදීම වී පරණ වන්නාසේ නවතාව ඉකුත්ව යාම වැටහීම් කොට ඇත්තේය, පරිපාකයට පමුණුවනු ලබන රූපධර්මයමන්ම පදනම් කොට ඇත්තේය; දත්වල කඩතොලු බව ඇතිවීමෙන් විකාර දර්ශන ඇතිවීම් වශයෙනි, මෙය ප්‍රකට ජරාව සඳහා කියන ලදි. අරූප ධර්මයන් පිළිබඳව වනාහි 'පටිච්ඡන්න' නම් ජරාව වේ; එම අරූපධර්මයන් පිළිබඳ ජරාවෙහි මේ ආකාර වූ විකාරයෙක් නැත; පෘථිවි, ජල, පර්වත, චන්‍ද්‍ර, සූර්ය ආදියෙහි ඇති වන යම් ජරාවක් වේද එය 'අවිචි(නිරන්තර)ජරා' නම්වේ.

රූපස්ස අනිච්චතා උපාදායය රූපධර්මයන්ගේ බිඳී යාම ලක්‍ෂණ කොට ඇත්තේය, එම රූපධර්මයන්ගේ සම්පූර්ණ විනාශය කෘත්‍යය කොට ඇත්තේය, ක්‍ෂය-ව්‍යය (ගෙවීයාම හා වැයවීම) යන දෙක වැටහීම් කොට ඇත්තේය, බිඳී යාමට ලක්වන රූපයම පදනම්කොට ඇත්තේය.

කබලිඞ්කාරාහාර උපාදාය ඕජස ලක්‍ෂණ කොට ඇත්තේය. ද්‍රව්‍යමය රූපය පවත්වාගෙන යාම කෘත්‍යය කොට ඇත්තේය. ශක්තිය සැපයීම වැටහීම්කොට ඇත්තේය, කැබලිකොට ආහාරයට ගතයුතු වස්තූන් පදනම්කොට ඇත්තේය. යම් ඕජාවෙකින් (ද්‍රව්‍යමය රසයෙකින්) සත්වයෝ යැපෙත්ද, එයට මේ අධිවචනයි. මේ වනාහි පෙළෙහි ආ රූපයෝය. අටුවායෙහි වනාහි බලරූපය, සම්භවරූපය, ජාතිරූපය, රෝගරූපය හා ඇතැමකුගේ (අභයගිරිකයන්) මතයට අනුව මිද්ධරූපයයි අන්‍යවූද රූපයක් ගෙනහැර දක්වා,

''අද්ධා මුනී'සි සම්බුද්ධො නත්‍ථිනීවරණා තව''[a] (ඒකාන්තයෙන් සම්බුද්ධ මුනිවන්නාහුය, ඔබ වෙත නීවරණයෝ නැත්තාහ) යන ආදිය

a. මහාඅට්ඨකථා

පච්චයා 'මිද්ධ' නම් උපාදාරූපයක් නැත්තේමැයි පළමුකොටම ප්‍රතික්ෂේප කරනලදි. මෙකී අනෙක් රූපයන් අතුරෙන් රෝග රූපය 'රූපස්ස ජරතා, රූපස්ස අනිච්චතා' යනුවෙන් ගන්නා ලද්දේමය; තවද ජාතිරූපය 'උපචය, සන්තති' යනුවෙන්ද, සම්භව රූපය ආපෝ ධාතුවශයෙන්ද, බලරූපය වායෝධාතු වශයෙන්ද, ගන්නා ලද්දේම වේ. එහෙයින් එකී රූපයන් අතුරෙන් විශේෂ කොට ගතහැකි එකකුදු නැතැ'යි අවධාරණය කරනලදි. මෙසේ සූවිස්සක් වූ මේ උපාදාරූපද, පෙරාතුව කියන ලද සිවුවැදෑරුම් භූත රූපදැ'යි යනුවෙන් රූපස්කන්ධය අඩුවැඩි නැතිව අටවිසි වැදෑරුම් වේ.

ඒ සියලු (අටවිසිවැදෑරුම්) රූපස්කන්ධය **සහෙතුය** (තමා ලෝභාදී මූල හේතු නොවීම), **අහෙතුකය** (තමාටද හේතුවන දෙයක් නොමැති බව), **හෙතුවිප්පයුත්තය** (හේතුවෙකින් තොර වීම), **සප්පච්චයය** (ප්‍රත්‍යයන් හා සමග පැවතීම), **ලොකියය** (ලෞකික බව. සාසවය (ආශ්‍රවයනට අරමුණු වන බව) ආදී වශයෙන් එක් වැදෑරුම් වේ.

අභ්‍යන්තර-බාහිර වශයෙන්ද. ඖදාරික-සූක්ෂ්ම වශයෙන්ද, දූර-සන්තික වශයෙන්ද, නිෂ්පන්න - අනිෂ්පන්න වශයෙන්ද, පසාදරූප - නප්පසාදරූප වශයෙන්ද, ඉන්ද්‍රිය - අනින්ද්‍රිය වශයෙන්ද, උපාදින්න - අනුපාදින්න වශයෙන්ද, යන ආදී වශයෙන් දෙවැදෑරුම් වේ.

එහි චක්ඛු ආදී පංචකය ආත්මභාවය උදෙසා පවත්නා හෙයින් අජ්ඣත්තික නම්වේ. සෙසු තෙවිසි වැදැරුම් රූපය ආත්මභාවයෙන් බැහැරවූ හෙයින් බාහිර නම්වේ. චක්ඛු ආදී (රසය අවසන් කොට ඇති) නවයද, ආපෝධාතුව හැර ඉතිරි ධාතු තුනදැ'යි යන දොළොස (විෂය-විෂයී) ගැටීම් වශයෙන් ගතයුතු වන හෙයින් 'ඕළාරික' නම්වේ. ඉතිරි සොළොස එසේ නොවන හෙයින් 'සුඛුම' නම් වේ, යමක් සුඛුම (සියුම්) වේද, එය දුරවබෝධය ස්වභාව ඇති හෙයින් 'දූර' නම්වේ, ඉතිරි දොළොස සුබෝධ්‍ය ස්වභාව ඇති හෙයින් 'සන්තික' නම්වේ.

ධාතු සතරද, චක්ඛු ආදීවූ (හදය වත්‍ථුරූපය තෙක්) තෙළසද කබලිංකාරාහාරයදැ'යි යන අටළොස් වැදෑරුම් රූපය පිරිසිඳීම්, වෙනස්වීම් ලක්‍ෂණ කොට ඇති බව ඉක්මවා ස්වභාව වශයෙන්ම ගතයුතු වන හෙයින් 'නිෂ්පන්න' නම් වේ, ඉතිරි දසය එයට වෙනස්වන හෙයින් 'අනිෂ්පන්න' නම්වේ. චක්ඛු ආදි පස රූපාදිය ගැනීමට ප්‍රත්‍යය වීමෙන් කැටපත් තලයක් මෙන් පැහැදිලි වන හෙයින් පසාද රූපනම්වේ. ඉතිරි තෙවිස්ස එයට විපරීත වන හෙයින් නප්පසාදරූප නම්වේ. එම පසාදරූප පස අධිපති අර්ථයෙන් ඉත්‍ථීන්ද්‍රිය ආදී තුනද සමග 'ඉන්ද්‍රිය' නම් වේ. ඉතිරි විස්ස එයට විපරීත වන හෙයින් 'අනින්ද්‍රිය' නම්වේ.

යම් රූපයක් 'කම්මජ' යයි මෙහි මතු පවසන්නමෝද එය කර්මය විසින් ගන්නා ලද හෙයින් 'උපාදින්න' නම්වේ. ඉතිරිය එයට විපරීත වන හෙයින් 'අනුපාදින්න' නම්වේ. තවද සකල විධවූම රූපය 'සනිදස්සන' යනුවෙන්ද, 'කම්මජ' යනුවෙන්ද ඇරඹෙන ත්‍රිකයන්ගේ අනුසාරයෙන් ත්‍රිවිධ වේ: එහි ඕළාරික රූපයන් අතුරෙන් රූප(උපාදා)ය 'සනිදස්සනසප්පටිඝ (දැකිය හැකි, ගැටීම් සහිත) වේ. සෙසු ඕළාරික රූප එකොළොස අනිදස්සන-සප්පටිඝ (නොදැකිය හැකි, ගැටීම් සහිත) වේ. සියලු සුඛුම රූප සොළස අනිදස්සන - අප්පටිඝයි. මෙසේ සනිදස්සනාදී වශයෙන් ත්‍රිවිධවේ. කම්මජාදී ත්‍රික වශයෙන් වනාහි, කර්මයෙන් උපන් රූපය (ඉන්ද්‍රිය රූප අට හා හදය වත්‍ථු රූපය) 'කම්මජ' වේ. කර්මය හැර (ඍතු ආදී) අනෙකක් ප්‍රත්‍යය කොට නිපන් රූපය 'අකම්මජවේ, කිසිවෙකින් නූපන් රූපය 'නේව කම්මජ - නාකම්මජ' වේ.

සිතින් උපන් රූපය 'චිත්තජ'යි, සිත හැර අනෙකක් ප්‍රත්‍යය කොට උපන් රූපය 'අචිත්තජ'යි, කිසිවෙකින් නූපන් රූපය 'නෙවචිත්තජනාචිත්තජයි, ආහාරයෙන් උපන් රූපය 'ආහාරජ'යි, ආහාරය හැර අනෙකක් ප්‍රත්‍යය කොට උපන් රූපය 'අනාහාරජ'යි, කිසිවෙකින් නූපන් රූපය 'නේව ආහරජ-න අනාහාරජ'යි ඍතු හේතුවෙන් උපන් රූපය 'උතුජ'යි, අනෙකක් ප්‍රත්‍යය කොට උපන් රූපය 'අනුතුජ'යි. කිසිවෙකින් නූපන් රූපය 'නෙව උතුජ-න අනුතුජයි; මෙසේ කම්මජාදී ත්‍රික වශයෙන් ත්‍රිවිධ වේ.

තවද 'දිට්ඨ' යනුවෙන්ද, 'රූපරූප' යනුවෙන්ද, 'වත්‍ථු' යනුවෙන්ද ඇරඹෙන ඒ ඒ චතුෂ්කයන්ගේ වශයෙන් චතුර්විධ වේ. එහි රූපායතනය දර්ශනයට විෂය වන හෙයින් දිට්ඨ නම්. සද්දායතනය ශ්‍රවණයට විෂය වන හෙයින් සුත නම්. ගන්‍ධ, රස, ඵොට්ඨබ්බ යන ආයතන තුන තමා වෙත පැමිණි දෙයක් ග්‍රහණය කරන ඉන්ද්‍රියයනට විෂය වන හෙයින් මුත නම්. සෙසු රූප විඤ්ඤාණයටම විෂය වන හෙයින් විඤ්ඤාත නම්; මෙසේ දිට්ඨාදී චතුෂ්ක වශයෙන් සිවුවැදෑරුම්වේ.

(ඉහත සඳහන්) නිෂ්පන්න රූපය මෙහි රූපරූප නම්, ආකාසධාතුව පරිච්ඡේද රූප නම්. කායවිඤ්ඤත්තියෙහි පටන් 'රූපස්ස කම්මඤ්ඤතාව' අවසන් කොට ඇති රූප විකාරරූප නම්, ජාති-ජරා-භංග යන තුන ලක්ඛණරූප නම්, මෙසේ රූපරූපාදි චතුෂ්ක වශයෙන් සිවුවැදෑරුම් වේ.

මෙහි වනාහි 'හදයරූප' යයි යම් උපාදාරූපයෙක් ඇත්ද. එය වත්‍ථු (හෙවත් යමක් රඳවා ගෙන සිටින දෙයක්) නම්, එය ද්වාරයෙක් නොවේ; විඤ්ඤත්ති දෙක ද්වාර යි, වත්‍ථු නොවේ, පසාදරූප වස්තු මෙන්ම ද්වාරද වන හෙයින් වත්‍ථුද්වාර යි, සෙසුරූප වස්තුද ද්වාරද

නොවන හෙයින් අවත්ථුඅද්වාරයි. මෙසේ වත්ථාදි චතුක්ක වශයෙන් සිවුවැදෑරුම් වේ.

යලි (කර්ම, චිත්ත, ඍතු, ආහාර යන මෙයින් එකක්, දෙකක්, තුනක් හෝ සතරම මුල් කොට ගෙන ඉපැදීම් වශයෙන්) ඒකජ, ද්විජ, තිජ, චතුජ යයිද; (මෙකී කිසිවක් මුල් කොට නො-ඉපැදීම් වශයෙන්) නකුතෝචිජාත යයිද පස් වැදෑරුම් වේ. එහි හුදෙක් කර්මයෙන්ම හෝ චිත්තයෙන්ම හෝ උපන් රූපය ඒකජ යි, එම රූපයන් අතුරෙන් හෘදය වස්තුව හා ඉන්ද්‍රියරූප අට හුදෙක් කර්මයෙන්ම උපන්නේ වේ; විඤ්ඤත්ති රූප දෙක හුදෙක් චිත්තයෙන්ම උපන්නේ වේ. යම් රූපයෙක් චිත්තයෙන් හා ඍතු හේතුවෙන් උපන්නේද, එය ද්විජ නම්. ඒ සද්දායතනයමැයි. යම් රූපයෙක් ඍතු, චිත්ත, ආහාර යන තුනෙන් උපන්නේද, එය තිජ නම්. ඒ රූපස්ස ලහුතා ආදී තුනමැයි. යම් රූපයෙක් කර්මාදී සතරින්ම උපන්නේද, එය චතුජ නම් වේ. ඒ ලක්ඛණ රූප හැර සෙසු රූපයි. ලක්ඛන රූපය වනාහි නකුතෝචිජාත (කිසිවෙකින් හෝ හටගත්තේ නොවේ, කවර හෙයින්ද යත්, උත්පාදය (ඉපැදීම) පිළිබඳ උත්පාදයෙක් (නැවත ඉපැදීමෙක්) ඇත්තේ නැත. හටගත් රූපයට ඇත්තේ පරිපාක (මිහිකිරීම) හා භේද (බිඳීයාම) යන අනෙක් ලක්ෂණ දෙක පමණි. "රූපායතන, සද්දායතන, ගන්ධායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, ආකාසධාතු, ආපෝධාතු, රූපස්සලහුතා, රූපස්ස මුදුතා, රූපස්ස කම්මඤ්ඤතා, රූපස්ස උපචය, රූපස්ස සන්තති, කබලිංකාර ආහාර යන මේ ධර්මයෝ සිතින් හටගත්තාහුය" යන ආදී තන්හි ඉපැදීම කිසිවෙකින් හටගත් බවක් අනුදන්නා ලද්දේද, එය වනාහි රූප ජනක ප්‍රත්‍යයන්ගේ කෘත්‍ය සිද්ධිය ප්‍රකටවූ කෙනෙහි දක්නාලද හෙයිනි'යි දතයුතුය.

මේ රූපස්කන්ධය පිළිබඳ විස්තර කථා මාර්ගයයි.

—//—

## විඥානස්කන්ධය

සෙසු ස්කන්ධයන් අතුරෙන් වේදයිත ලක්ෂණ ඇති හෙවත් වින්දනය ලක්ෂණ කොට ඇති යමක් වේද, ඒ සියල්ල එක්කොට ගෙන වේදනා ක්ඛන්ධයයිද, හඳුනාගැනීම ලක්ෂණ කොට ඇති යමක් වේද, ඒ සියල්ල එක් කොට ගෙන සඤ්ඤා ක්ඛන්ධයයිද, සකස් කිරීම හෝ උත්සහකිරීම ලක්ෂණ කොට ඇති යමක්වේද, ඒ සියල්ල එක්කොට ගෙන සංඛාරක්ඛන්ධයයිද, දැනගැනීම ලක්ෂණ කොට යමක් වේද, ඒ සියල්ල එක්කොට ගෙන විඤ්ඤාණක්ඛන්ධ යයිද දතයුතුය. එහි යම් හෙයකින්

විඤ්ඤාණස්කන්ධය දතහොත් සෙසු ස්කන්ධත්‍රයය දැනගැනීම පහසුවේද, එහෙයින් විඤ්ඤාණස්කන්ධය පළමුකොට විස්තර කරන්නෙමු.

''විජානනය (මැනවින් දැන ගැනීම) ලක්‍ෂණ කොට ඇති යම් කිසිවක් ඇත්තේද, ඒ සියල්ල එක් කොට විඤ්ඤාණස්කන්ධය දතයුතුය''යි කියනලදි. විජානනය ලක්‍ෂණ කොට ඇති විඤ්ඤාණය යනු කවරේද යත් කියන ලදමැයිඃ- ඇවැත්නි, ''විජානාති, විජානාති''[a]යි වහරනු ලැබේ. එහෙයින් 'විඤ්ඤාණ'යයි කියනු ලැබේ'' යනුයි. 'විඤ්ඤාණ', 'චිත්ත', 'මනෝ' යන වචන තුන අර්ථ වශයෙන් සමානය, ඒ මේ විඤ්ඤාණය දැනගැනීම් ලක්‍ෂණයෙන් ස්වභාව වශයෙන් ඒකවිධ වූයේ නමුදු ජාති වශයෙන් කුසලය, අකුසලය, අව්‍යාකතයයි ත්‍රිවිධ වේ. එහි කුසල චිත්තය භූමිභේද වශයෙන් කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තරයයි චතුර්විධ වේ. කාමාවචර චිත්තය සෝමනස්ස-උපෙක්ඛා ඤාණ, සංඛාර භේද වශයෙන් අෂ්ටවිධ වේ. ඒ මෙසේයිඃ සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත - අසංඛාරික හා සසංඛාරික(2), එසේම ඤාණවිප්පයුත්ත(2); උපෙක්ඛාසහගත-ඤාණසම්පයුත්ත අසංඛාරික හා සසංඛාරික(2), එම ඤාණවිප්පයුත්ත(2) යනුවෙනි.

යම්කලෙක වනාහි, දියයුතු දානවස්තු, ප්‍රතිග්‍රාහක, ආදීන් නිසි ලෙස ලැබීමෙන් හෝ සොම්නසට හේතුවන අන්කිසි දෙයක් ලැබීමෙන් හෝ තුටුපහටුව, දුන් දෙයෙහි පල ඇතැ'යි යන ආදී නයින් පැවැති නිවැරදි දැකීම පෙරදැරි කොට, පැකිලීමෙකින් තොරව, අන් කෙනෙකුගේ මෙහෙයවීමක් නැතිව, යමෙක් දානාදී පින් කෙරෙත්ද, එකල සෝමනස්ස සහගත, ඤාණසම්පයුත්ත අසංඛාරික චිත්තය වේ. යම් කලෙක, කියනලද නයින් තුටුපහටුව, නිවැරදිදැකීම පෙරදැරිකොට අමුත්තචාගතාදී වශයෙන් පසුබටවෙමින් හෝ අනෙකෙකු විසින් උත්සාහවත් කරන ලදුව යමෙක් එවන් පින්කම් කෙරෙත්ද එකල එම (සෝමනස්ස සහගත ඤාණ සම්පයුත්ත) චිත්තයම සසංඛාරික වේ. 'සංඛාර' යන මේ වචනය මේ අර්ථයට අනුව තමාගේම හෝ මෙරමාගේ වශයෙන් පැවැති පූර්වප්‍රයෝගයට (මෙහයවීමට) අධිවචනයෙකි.

යම් කලෙක වනාහි වැඩිහිටි ඥාතිජනයාගේ පිළිවෙත් දැකීමෙන් උපන් පලපුරුදු ඇති බාලදරුවෝ භික්‍ෂූන් දැක සොම්නස්ව වහා අතපත් යම් කිසිවක් දෙන්නාහුද, නැතහොත් වඳින්නාහුද එකල තුන්වැනි (සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසංඛාරික) සිත උපදියි. යම් කලෙක දෙවු, වඳිවු යනුවෙන් වැඩිහිටි ඥාතීන් විසින් උත්සාහවත් කරන ලදුව මෙසේ පිළිපන්නාහු නම්, එකල සිවුවැනි (සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත සසංඛාරික) සිත උපදියි. යම් කලෙක දියයුතු දානවස්තු

a. මජ්ඣිම නිකාය, මහාවේදල්ල සුත්ත

ප්‍රතිග්‍රාහකාදීන් නොලැබීමෙන් හෝ සොම්නසට හේතුවූ අන් දෙයක් නොලැබීමෙන් මෙකී විකල්ප සතරෙහිම සෝමනස්ස රහිත බව වන්නේද, එකල ඉතිරි උපේක්ෂා සහගත සිත් සතර උපදිති'යි මෙසේ සෝමනස්ස-උපෙක්ඛා ඤාණ, සංඛාර ප්‍රභේද වශයෙන් අෂ්ටවිධවූ කාමාවචර කුශලචිත්තය දතයුතුය.

රූපාවචර චිත්තය වනාහි ධ්‍යානාංග යෝගභේද වශයෙන් පස් වැදෑරුම්වේ. ඒ මෙසේයිඃ විතක්ක, විචාර, පීති, සුඛ, සමාධි යන අංග පසම හා යෙදුණේ පළමුවැන්නයි. ඉක්බිති විතක්කය ඉක්මවූයේ දෙවැන්නයි. ඉක්බිති විචාරයද ඉක්මවූයේ තෙවැන්නයි. ඉනික්බිති පීතියද ඉක්මවූයේ සිවුවැන්නයි. ඉනිදු ඉක්බිති සුඛයද ඉකුත්ව උපේක්ෂා සමාධියෙන් යුක්ත වූයේ පස්වැන්නයි.

අරූපාවචර චිත්තයද ආරුප්ප සමාධි සතර හා යෙදීමෙන් සිවුවැදෑරුම් වේ; කියන ලද ක්‍රමයෙන් ආකාසානඤ්චායතන සමාධිය හා සමග යෙදුණේ පළමුවැන්නයි. විඤ්ඤාණඤ්චායතනාදිය හා සමග යෙදුණේ (පිළිවෙලින්) දෙවන, තුන්වන, සිවුවන අරූපාවචර කුසල් සිත් වන්නේය.

ලෝකෝත්තර චිත්තය සතර මඟ හා යෙදීමෙන් සිවුවැදෑරුම් වෙතැ'යි මෙසේ පළමුකොට කුසල චිත්තයම එක්විසි වැදෑරුම් වන්නේය.

අකුසල විඤ්ඤාණය වනාහි භූමි වශයෙන් එක්වැදෑරුම් කාමාවචර භූමි වන්නේය; මූල වශයෙන් ලෝභමූලය, දෝසමූලය. මෝහ මූලයයි තෙවැදෑරුම් වන්නේය; සෝමනස්ස-උපෙක්ඛා, දිට්ඨිගත, සංඛාර ප්‍රභේද වශයෙන් අටවැදෑරුම් වේ. ඒ මෙසේයිඃ සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික හා සසංඛාරික සිත් දෙකද, එසේම දිට්ඨිගත විප්පයුත්ත වශයෙන් වන දෙකද, උපෙක්ඛා සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංඛාරික හා සසංඛාරික සිත් දෙකද, එසේම දිට්ඨිගත විප්පයුත්ත වශයෙන් වන දෙකදැ'යි මෙසේ අටවැදෑරුම් වේ.

යම් කලෙක වනාහි 'කාමයන්හි ආදීනවයක් නැතැ'යි ආදී නයින් මිථ්‍යාදෘෂ්ටිය පෙරටුකොට, තුටුපහටුව, උත්සාහවත් නොකරන ලද ස්වභාවයෙන්ම තියුණුවූ මනසින් යුක්තව කාමයන් පරිභෝග කෙරේද, දිට්ඨමංගලාදිය සාරවශයෙන් ගනීද, එකල පළමුවන අකුශල චිත්තය උපදියි. යම් කලෙක (මෙරමා විසින්) උත්සාහවත් කරන ලද ස්වභාවයෙන් මොටවූ සිතින් එසේම අකුසල කර්මයන් කෙරේද, එකල දෙවන අකුශල චිත්තය උපදියි. යම් කලෙක මිථ්‍යාදෘෂ්ටිය පෙරටුකොට නොගෙන, හුදෙක් තුටුපහටු සිතින්, උත්සාහවත් නොකරන ලද ස්වභාවයෙන් තියුණු වූ මනසින් මෛථුන සේවනය හෝ කෙරේද, අන්සතු සම්පතෙහි දැඩිලෝභ හෝ කෙරේද, අන්සතු වස්තුව හෝ පැහැර ගනීද, එකල තුන්වන අකුසල

චිත්තය උපදියි. යම් කලෙක උත්සාහවත් කරන ලද ස්වභාව වශයෙන් මොටවූ සිතින් යුක්තව එම අකුශල කර්මයන් කෙරේද, එකල සිවුවන අකුශල චිත්තය උපදියි.

යම් කලෙක වනාහි කාම සම්පත්තියක් නොලැබ හෝ සෙසු සොම්නස් හේතුවක් නොමැතිව හෝ මෙකී විකල්ප සතරෙහි සොම්නස් රහිතව සිදු වේද, එකල උපේක්ෂා සහගතවූ සෙසු අකුසල් සිත් සතර සිදු වෙති'යි මෙසේ සෝමනස්ස, උපෙක්ඛා, දිට්ඨිගත, සංඛාර භේද වශයෙන් අටවැදෑරුම් ලෝභමූල චිත්තය දතයුතුය.

දෝසමූල චිත්තය වනාහි, දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත අසංඛාර සසංඛාර යනුවෙන් දෙවැදෑරුම්ම වේ. පාණාතිපාතාදියෙහි තියුණුව, නැතහොත් මොටව පවත්නා එම (දෙවැදෑරුම්) දෝසමූල චිත්තය (පිළිවෙළින් අසංඛාරිකව නැතහොත්, සසංඛාරිකව) උපදිති'යි දතයුතුය.

මෝහමූල චිත්තය උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුත්තයද, එම උද්ධච්ච සම්පයුත්තයදැයි දෙවැදෑරුම් වේ. එහි පැවැත්ම (පිළිවෙළින්) සැක මුසු බව හෝ වික්ෂේප හෙවත් මානසික නොසන්සුන් බව ඇති විට සිදුවෙති'යි දතයුතුය. මේ ආකාරයෙන් අකුසල විඤ්ඤාණය දොළොස් වැදෑරුම් වේ.

අව්‍යාකත චිත්තය විපාකය, කිරියයයි ජාති වශයෙන් දෙවැදෑරුම් වේ. එහි විපාක චිත්තය භූමි වශයෙන් කාමාවචරය, රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තරයයි සිවුවැදෑරුම් වේ, එහිදු කාමාවචර චිත්තය කුශල විපාක, අකුශල විපාක වශයෙන් දෙවැදෑරුම් වේ. කුශල විපාකයද අහේතුකය, සහේතුකයයි දෙවැදෑරුම් වේ.

අහේතුක චිත්තය චක්ඛු විඤ්ඤාණය, සෝතවිඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය. ජිව්හාවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය යන පසද, සම්පටිච්ඡන (අරමුණු පිළිගැනීම්) කෘත්‍යය සිදු කරන මනෝධාතුවද, සන්තීරණාදී කෘත්‍යයන් ඉටු කරන මනෝ විඤ්ඤාණධාතු දෙකදැයි යනුවෙන් අටවැදෑරුම් වේ.

එහි චක්ඛු විඤ්ඤාණය ඇසට විෂය වන රූපය දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේය, රූපය නිමිති කොට අරමුණු ගැනීම කෘත්‍යය කොට ඇත්තේය. රූපයට අභිමුඛ වීමේ ස්වභාවය වැටහීම් කොට ඇත්තේය. රූපාරම්මණය පිළිබඳ කිරිය මනෝධාතුවෙහි අපගමනය (ඉකුත්වීම) පදනම් කොට ඇත්තේය. සෝත, ඝාන, ජිව්හා, කාය යන විඤ්ඤාණ (සතර පිළිවෙළින් සෝත ආදියට විෂය වන ශබ්ද ආදිය විජානනය ලක්ෂණ කොට ඇත්තේය. ශබ්ද ආදිය නිමිති කොට අරමුණු ගැනීම කෘත්‍ය කොට ඇත්තේය, ශබ්ද ආදියට අභිමුඛ වීම වැටහීම් කොට

ඇත්තේය. ශබ්ද ආදී අරමුණු පිළිබඳ කිරිය මනෝධාතූන්ගේ අපගමය (ඉකුත්වීම) පදට්ඨාන කොට ඇත්තේය.

චක්ඛු විඤ්ඤාණාදියට අනතුරුව රූපාදිය දැනගැනීම ලක්ෂණ කොට ඇති මනෝධාතුව වේ, එය රූප ආදිය පිළිගැනීම කෘත්‍ය කොට ඇත්තේය. එම ස්වභාවය (එසේ වීම) වැටහීම් කොට ඇත්තේය, චක්ඛු විඤ්ඤාණ ආදීන්ගේ අපගමය පදනම් කොට ඇත්තේය. සාළාරම්මණ විජානනය (අරමුණු සය දැනගැනීම) ලක්ෂණ කොට ඇති දෙවැදෑරුම්ම වූ අහේතුක විපාක සහිත මනෝවිඤ්ඤාණ ධාතුව සන්තීරණ ආදිය කෘත්‍ය කොට ඇත්තේය, සන්තීරණ ආදියම එයට අයත් කෘත්‍යයයි. එම ස්වභාවය (එසේවීම) වැටහීම් කොට ඇත්තේය, හෘදය වස්තුව පදට්ඨාන කොට ඇත්තේය.

සෝමනස්ස, උපෙක්ඛා යන දෙක හා සමග යෙදීමෙන්ද, ස්ථාන දෙකය, ස්ථාන පසය යන භේදයෙන්ද එය (මනෝ විඤ්ඤාණ ධාතුව) පිළිබඳ බහුවිධ භාවය වේ. මේ දෙක අතුරෙන් එකක් ඒකාන්ත වශයෙන් ඉෂ්ට වූ අරමුණෙහි පැවැත්ම ස්වභාව කොට ඇති හෙයින් සෝමනස්ස සම්පයුත්තව සන්තීරණ තදාරම්මණ වශයෙන් පඤ්චද්වාරයන්හිද ජවන සිත් අවසන්හිද පවත්නා හෙයින් 'ද්විට්ඨාන' නම් වේ; අනෙක ඉෂ්ටවූද. මධ්‍යස්ථවූද අරමුණෙහි පැවැත්ම ස්වභාව කොට ඇති හෙයින් උපේක්ෂා සම්ප්‍රයුක්ත වීමෙන් සන්තීරණ, තදාරම්මණ, පටිසන්ධි, භවඞ්ග, චුති වශයෙන් පවත්නා හෙයින් 'පඤ්චට්ඨාන' නම්වේ.

අටවැදෑරුම්වූම මේ අහේතුක විපාක විඤ්ඤාණය නියතවූද අනියත වූද අරමුණු ඇති හෙයින් ද්විවිධ වේ. උපෙක්ඛා, සුඛ, සෝමනස්ස භේදයෙන් තෙවැදෑරුම් වේ. මෙහි (චක්ඛු ආදී) විඤ්ඤාණ පඤ්චකය පිළිවෙළින් රූපාදී අරමුණු කෙරෙහිම පවත්නා හෙයින් නියත අරමුණු ඇත්තේ වේ. ඉතිරි තුන අනියත අරමුණු සහිත වේ.

එහි මනෝධාතුව රූපාදී පඤ්චකය කෙරෙහිම පවත්නා අතර මනෝවිඤ්ඤාණ ධාතුද්වයය අරමුණු සය කෙරෙහිම පවත්නේ වේ. මෙහි කායවිඤ්ඤාණය සුඛයුක්ත වේ. ද්වි-ස්ථානික මනෝවිඤ්ඤාණ ධාතුව සෝමනස්ස යුක්තවේ. සෙස්ස උපේක්ෂාසහගත වේ. මෙසේ අටවැදෑරුම්වූ කුසල විපාක අහේතුක විඤ්ඤාණය දතයුතුය.

සහේතුක කුසල විඤ්ඤාණය අලෝභාදී විපාකහේතු සහිත වේ. එය කාමාවචර කුසල විඤ්ඤාණය සෙයින්ම සෝමනස්සාදී භේද වශයෙන් අටවැදෑරුම්වේ. යම් සේ වනාහි කුසල විඤ්ඤාණය දානාදී වශයෙන් අරමුණු සයෙහි පවත්නේද, මෙය එසේ නොවේ. මෙය (විපාකය) වනාහි පටිසන්ධි, භවංග, චුති, තදාරම්මණ වශයෙන් පරිත්ත (කාමාවචර) ධර්මයන්හි ඇතුළත් අරමුණු සයෙහි පමණක් පවත්නේ වේ. මෙහි

සසඞ්ඛාරික අසඞ්ඛාරික භාවය ආගමනාදී ප්‍රත්‍යය වශයෙන් දතයුතුය, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ විශේෂයක් නැති නමුදු විපාක චිත්තය කැටපත් තල ආදියෙහි පිළිබිඹු වන මුඛ නිමිත්ත මෙන් නිරුත්සාහික වෙතැ'යිද, කුශල චිත්තය මුඛය මෙන් සොත්සාහික වෙතැ'යිද දතයුතුය. අකුසල විපාක චිත්තය හුදෙක් අහේතුකම වේ, එය චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝානවිඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කායවිඤ්ඤාණය, සම්පටිච්ඡන කෘත්‍යය සහිත මනෝධාතුවය, සන්තීරණ කෘත්‍යය සහිත මනෝවිඤ්ඤාණ ධාතුවයයි සප්තවිධ වේ. එය ලක්ෂණාදී වශයෙන් කුසල අහේතුක විපාකයෙහි කී නයින්ම දතයුතුය.

හුදෙක් කුසල විපාක සිත්ම ඉෂ්ටාරම්මණ සහිතද ඉෂ්ටමධ්‍යස්ථාරම්මණ සහිතද වේ. මේ (අකුසල විපාක) සිත් අනිෂ්ට ආරම්මණ සහිතද අනිෂ්ට මධ්‍යස්ථ ආරම්මණ සහිතද වේ. තවද (කුසල විපාක සිත් උපෙක්ඛා, සුඛ, සෝමනස්ස වශයෙන් ත්‍රිවිධ වේ. මෙහි (අකුසල විපාක විෂයයෙහි) වනාහි කායවිඤ්ඤාණය දුක්ඛ සහගතම වේ, (චක්ඛු ආදී) සෙසු විඤ්ඤාණ උපෙක්ඛා සහගතවේ. එකී සෙසු විඤ්ඤාණයන් කෙරෙහිවූ ඒ උපේක්ෂාවද (අකුසල විපාක වන හෙයින්) හීන වන නමුදු, (කාය විඤ්ඤාණය කෙරෙහි වූ) දුඃඛ විෂයයෙහි මෙන් ඉතා කටුක නොවේ. සෙසු (කුසල) විපාකයන් කෙරෙහි වූ උපේක්ෂාව ප්‍රණීත වන නමුදු සුඛ විපාකයෙහි තරම් ඉතා තියුණු නොවේ. මෙසේ මේ අකුසල විපාක සතක් වශයෙන්ද, පළමු කී කුසළ විපාක සොළොසක් වශයෙන්ද කාමාවචර විපාක විඤ්ඤාණය තෙවිසි වැදෑරුම් වේ.

රූපාවචර (විපාක) විඤ්ඤාණය වනාහි එම කුසල විඤ්ඤාණය මෙන් පස්වැදෑරුම් වේ. කුසල විඤ්ඤාණය සමාපත්ති වශයෙන් ජවන වීථියෙහි පවතී, මේ කුසල විපාක විඤ්ඤාණය උත්පත්තියෙහිදී පටිසන්ධි, භවංග හා චුති වශයෙන් පවතී. රූපාවචර විපාක විඤ්ඤාණය රූපාවචර කුසලය මෙන් පස් වැදෑරුම් වන සෙයින්ම අරූපාවචර විපාක විඤ්ඤාණයද අරූපාවචර කුසලය මෙන් සිවු වැදෑරුම් වේ. පැවැත්ම පිළිබඳ විශේෂයද රූපාවචර විෂයයෙහි කී නයින්ම වේ.

ලෝකෝත්තර විපාකයද සතර මග හා යෙදුණු සිත්ම පල ද වන හෙයින් සිවුවැදෑරුම් වේ. එය මග්ගවීථි වශයෙන්ද ඵල සමාපත්ති වශයෙන්දැ'යි දෙපරිද්දෙකින් පවත්නේය, මේ ආකාරයෙන් භූමි සතර තුළ ඇති සියලු විපාක විඤ්ඤාණය සතිස් වැදෑරුම් වේ.

කිරියචිත්තය වනාහි භූමිභේද වශයෙන් කාමාවචරය, රූපාවචරය, අරූපාවචරයයි තෙවැදෑරුම් වේ. එහි කාමාවචර චිත්තය අහේතුකය, සහේතුකයයි දෙවැදෑරුම් වේ. එහි අලෝභාදී වූ කිරිය හේතු රහිත වූයේ අහේතුකයි. එයද මනෝධාතුය, මනෝවිඤ්ඤාණ ධාතුයයි දෙවැදෑරුම් වේ.

එහි මනෝධාතුව චක්ඛු විඤ්ඤාණාදියට පෙරටුව ඇති රූපාදිය දැන ගැනීම් ලක්ෂණ කොට ඇත්තේය, ආවර්ජනය කෘත්‍ය කොට ඇත්තේය. රූපාදිය අභිමුඛ වීම වැටහීම් කොට ඇත්තේය. භවඞ්ග විච්ඡේදය (භවංගය සිඳී යාම) පදට්ඨාන කොට ඇත්තේය; උපේක්ෂාවෙන් යුක්ත වූයේම වේ.

මනෝවිඤ්ඤාණ ධාතුව වනාහි සාධාරණය, අසාධාරණය'යි දෙවැදෑරුම් වේ. එහි සාධාරණ මනෝවිඤ්ඤාණ ධාතුව වූ උපේක්ෂා සහගත අහේතුක කිරිය චිත්තය ස-අරමුණු දැන ගැනීම ලක්ෂණ කොට ඇත්තේය. කෘත්‍ය වශයෙන් පඤ්චද්වාරයන් හා මනෝද්වාරයෙහි (පිළිවෙලින්) වොත්‍ථපන (පිහිටුවීම) හා ආවර්ජනය කෘත්‍ය කොට ඇත්තේය, එම ස්වභාවයම වැටහීම් කොට ඇත්තේය, (පඤ්චද්වාර විෂයයෙහි) අහේතුක-විපාක-මනෝවිඤ්ඤාණ ධාතුව හෝ (මනෝද්වාර විෂයයෙහි) භවංගය පහවීම පදට්ඨාන කොට ඇත්තේය.

අසාධාරණ මනෝවිඤ්ඤාණ ධාතුව වූ සෝමනස්ස සහගත අහේතුක කිරිය චිත්තය ස-අරමුණු දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේය. කෘත්‍ය වශයෙන් උදාර නොවන වස්තු විෂයයෙහි රහතුන්ගේ හසිතුප්පාදය (සිනහ ඉපැදීම) කෘත්‍ය කොට ඇත්තේය. එම ස්වභාවයම වැටහීම් කොට ඇත්තේය, ඒකාන්තයෙන් හෘදය වස්තුව පදට්ඨාන කොට ඇත්තේය.

මෙසේ අහේතුක කාමාවචර කිරිය චිත්තය තෙවැදෑරම්වේ. සහේතුක කිරිය චිත්තය වනාහි කුසල චිත්තය මෙන්ම සෝමනස්සාදී භේද වශයෙන් අටවැදෑරුම්වේ. කුසල චිත්තය වනාහි හුදෙක් ශෛක්ෂ්‍යවූ පෘථග්ජනයන්හටම උපදියි. මෙය (සහේතුක කිරිය චිත්තය) රහතුන්හටම උපදියි; මේ මෙහි විශේෂයයි. මෙසේ කාමාවචර (කිරිය) චිත්තය එකොළොස් වැදෑරුම් වේ. රූපාවචර හා අරූපාවචර (කිරිය) චිත්තයන් පිළිවෙළින් එම කුසලචිත්තයන් මෙන්ම පස් වැදෑරුම්ද, සිවුවැදෑරුම්ද වේ; මෙහිලා කුසලචිත්තයෙන් වෙනස් වනුයේ හුදෙක් රහතුන්හටම ඉපැදීම් වශයෙනි'යි දතයුතුය. මෙසේ භූමිත්‍රයයට අයත් සියලු කිරිය චිත්තය විසි වැදෑරුම් වේ.

මෙසේ කුසල විඤ්ඤාණ විසිඑකක්ද, අකුසල විඤ්ඤාණ දොළොසක්ද, විපාක විඤ්ඤාණ සතිසක්ද, කිරිය විඤ්ඤාණ විස්සක්දැයි සියලු විඤ්ඤාණයෝ අසූනවයක් වෙති; මේ විඤ්ඤාණයෝ පටිසන්ධි, භවංග, ආවජ්ජන, දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන, සම්පටිච්ඡන, සන්තීරණ, වොත්‍ථපන, ජවන, තදාරම්මණ, චුති යනුවෙන් තුදුස් ආකාරයෙකින් පවත්නාහුය. කෙසේද යත්:-

යම් කලෙක වනාහි කාමාවචර කුසල් අටෙහි බලයෙන් දෙව් මිනිස් දෙලොවෙහි සත්‍වයෝ උපදිත්ද, එකල ඔවුන්ගේ (පූර්ව භවයෙහි)

මරණාවස්ථායෙහිදී එළඹ සිටි කර්ම, කර්ම නිමිත්ත, ගති නිමිත්ත යන මෙයින් එකක් අරමුණු කොට ගෙන සහේතුක කාමාවචර විපාක සිත් අටද, මිනිස් ලොවෙහි නපුංසකාදී තත්‍වයනට පැමිණෙන්නවුන්ගේ උපේක්‍ෂා සහගත, දුබල, ද්විහේතුක කුසල විපාක සහිතවූ අහේතුක විපාක මනෝවිඤ්ඤාණ ධාතුවදැයි යන විපාක සිත් නවය පටිසන්ධි වශයෙන් පවතී. යම් කලෙක රූපාවචර, අරූපාවචර කුශලානුභාවයෙන් රූප, අරූප, භවයන්හි උපදිත්ද, එකල මරණාවස්ථායෙහිදී එළඹ සිටි කර්ම, කර්ම නිමිත්ත යන දෙකින් එකක් අරමුණු කොට ගෙන රූපාවචර-අරූපාවචර විපාක සිත් නවය පටිසන්ධි වශයෙන් පවතියි. යම් කලෙක අකුශල බලයෙන් අපායෙහි උපදිත්ද, එකල මරණාවස්ථායෙහිදී එළඹ සිටි කර්ම, කර්මනිමිත්ත, ගතිනිමිත්ත යන මෙයින් එකක් අරමුණු කොට ගෙන එක්ම අකුශල විපාක අහේතුක මනෝවිඤ්ඤාණධාතුව පටිසන්ධි වශයෙන් පවත්නේයයි මෙසේ මෙහි පළමුකොට එකුන් විසි විපාක විඤ්ඤාණයන් පටිසන්ධි වශයෙන් පවත්නා ආකාරය දතයුතුය.

පටිසන්ධි විඤ්ඤාණය නිරුද්ධවූ කල්හි ඒ ඒ පටිසන්ධි විඤ්ඤාණය අනුව යමින් ඒ ඒ කර්මයට විපාකවූ එබඳුම වූ භවඞ්ග නම්වූ විඤ්ඤාණය පවත්නේය. යළියළිදු එබඳුම වූ භවංගයන් ඉපැදීම වේ, මෙසේ මෙම භවංග සන්තතිය සිදී යාමට හේතුවන අන් චිත්තෝත්පාදයක් නැතොත් - සිහින නොපෙනෙන නින්දට පිවිසි අවස්ථා ආදියෙහිදීද - නදී ප්‍රවාහයක් මෙන් භවංගයන් අප්‍රමාණ සංඛ්‍යාවක් පවතිතැ'යි මෙසේ භවාංග වශයෙන්ද එම විඤ්ඤාණයන්ගේ පැවැත්ම දතයුතුය. මේ ආකාරයෙන් භවංග සන්තතිය පවත්නා විට යම් කලෙක සත්‍වයින්ගේ ඉන්ද්‍රියයෝ අරමුණු ගැනීමට සමත් වෙත්ද, එකල රූපයක් චක්‍ෂුඃ පථයට පැමිණිය හොත් එම රූපය නිසා චක්ඛුප්පසාදයෙහි ගැටීම සිදුවේ. ඉක්බිති එම ගැටීමේ බලයෙන් භවංග චලනය වේ. ඉක්බිති භවංගය නිරුද්ධවූ කල්හි එම රූපයම අරමුණු කොට භවංගය සිඳගෙන මෙන් ආවර්ජන කෘත්‍යය සිද්ධ කරන කිරිය මනෝධාතුව (පඤ්චද්වාරාවජ්ජන චිත්තය) උපදියි. ශ්‍රෝතද්වාරාදියෙහිද මෙම නයයි. මනෝද්වාරයෙහි වනාහි සවැදෑරුම්ම වූ අරමුණු ඉන්ද්‍රිය පථයට පැමිණි කල්හි භවංගචලනයට අනතුරුව භවංගය සිඳගෙන මෙන් ආවර්ජන කෘත්‍යය සිද්ද කරන උපේක්‍ෂාසහගත අහේතුක කිරිය මනෝවිඤ්ඤාණ ධාතුව (මනෝද්වාරාවජ්ජන චිත්තය) උපදියි. මෙසේ ආවර්ජන වශයෙන් කිරියවිඤ්ඤාණ දෙකෙහි පැවැත්ම දතයුතුය.

ආවර්ජනයට අනතුරුව චක්ඛු ද්වාරයෙහි දර්ශන කෘත්‍යය සිදු කෙරෙමින් චක්ඛුප්පසාද-වත්‍ථුක චක්ඛු විඤ්ඤාණයද, සෝත ද්වාරාදියෙහි ශ්‍රවණාදී කෘත්‍යයන් සිදු කෙරෙමින් සෝත, ඝාන, ජිව්හා, කාය විඤ්ඤාණයෝද පවත්නාහුය. ඒ විඤ්ඤාණයෝ ඉට්ඨය, ඉට්ඨමජ්ඣත්‍ථය යන විෂයයන්හි වෙතොත් කුසල විපාකයන්ද, අනිට්ඨය,

අනිට්ඨමජ්ඣත්තය යන විෂයයන්හි වෙතොත් අකුසල විපාකයන්ද වෙති'යි මෙසේ දස්සන, සවණ, ඝායන, සායන, ඵුසන වශයෙන් දස විපාක විඤ්ඤාණයන්ගේ පැවැත්ම දතයුතුය.

''චක්ඛුවිඤ්ඤාණධාතුව ඉපිද නිරුද්ධ වීමෙන් අනතුරුව චිත්තය, මනස, මනෝභාවය, එයින් උපන් මනෝ ධාතුව උපදියි'', යනු කී හෙයින් චක්ඛු විඤ්ඤාණාදියට අනතුරුව එම විඤ්ඤාණයනට අයත් ඒ ඒ විෂයයන් පිළිගනිමින් කුසල විපාකයනට අනතුරුව කුසල විපාක සහිතවූද, අකුසල විපාකයනට අනතුරුව අකුසල විපාක සහිත වූද මනෝධාතුව උපදිති'යි මෙසේ සම්පටිච්ඡන (පිළිගැනීම) වශයෙන් (කුසල, අකුසල) විපාක දෙකෙහි පැවැත්ම දතයුතුය.

'මනෝධාතුවද ඉපිද නිරුද්ධ වීමෙන් පසුව චිත්තය, මනස, මනෝභාවය, එයින් උපන් මනෝ විඤ්ඤාණධාතුව උපදියි' යනු කී හෙයින් එකී මනෝධාතුව විසින් පිළිගැනුණ විෂයයම තීරණය කෙරෙමින් අකුසල විපාක මනෝධාතුවට අනතුරුව අකුසල විපාක සහිතවූද, කුසල විපාක මනෝධාතුවට අනතුරුව ඉෂ්ටාරම්මණයෙහි සෝමනස්ස සහගතවූ හා ඉට්ඨමජ්ඣත්තාරම්මණයෙහි උපෙක්ඛා සහගතවූ විපාක-අහේතුක-මනෝවිඤ්ඤාණ ධාතුව උපදිති'යි, මෙසේ සන්තීරණ වශයෙන් විපාක විඤ්ඤාණ තුනෙහි පැවැත්ම දතයුතුය. සන්තීරණයට අනතුරුව එම විෂයයම ව්‍යවස්ථාපනය (තහවුරු) කෙරෙමින් උපෙක්ඛා සහගත කිරිය-අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව උපදිති'යි, මෙසේ වොත්ථපන වශයෙන් එක්ම කිරිය විඤ්ඤාණයෙහි පැවැත්ම දතයුතුය.

වොත්ථපනයට අනතුරුව, ඉදින් රූපාදී වූ ආරම්මණය 'මහන්ත' යයි සම්මත (චිත්තක්ෂණ තුදුසක් දිවෙන) වූවක් වෙතොත්, එවිට එසේ ව්‍යවස්ථාපිත විෂයයෙහි, කාමාවචර කුසල් අටෙහි හෝ, අකුසල් දොළොසෙහි හෝ, සෙසු කාමාවචර කිරිය සිත් නවයෙහි හෝ එකක් එකක් වශයෙන් ජවන්සිත් සයක් හෝ සතක් බැගින් දිවෙතැ'යි මේ පඤ්චද්වාර විෂයයෙහි නයයි.

මනොද්වාර විෂයයෙහි වනාහි මනෝද්වාරාවජ්ජනයට අනතුරුව එම ජවනයෝම වෙති, (කාමාවචරය ඉක්මවූ) ගෝත්‍රභූ චිත්තයෙන් මතු රූපාවචර වශයෙන් කුසල්සිත් පස හා එම කිරිය සිත් පසද, අරූපාවචර වශයෙන් කුසල් සිත් සතර හා එම කිරිය සිත් සතරද, ලෝකෝත්තර වශයෙන් මාර්ග සිත් සතර හා ඵල සිත් සතරද යන මේ සිත් අතුරෙන් යම් යම් සිතක් ප්‍රත්‍යය වශයෙන් ලද්දුයේ නම් ඒ ඒ සිත (ජවන වශයෙන්) දිවෙතැ'යි මෙසේ පස් පණස් කුසල-අකුසල-කිරිය-විපාක විඤ්ඤාණයන්ගේ ජවන වශයෙන් පැවැත්ම දතයුතුය.

ජවනාවසානයෙහි වනාහි ඉදින් පඤ්චද්වාර විෂයෙහි අති මහත්වූද, මනෝද්වාර විෂයයෙහි විභූත (ඉතා ප්‍රකට)වූද අරමුණු වෙතොත්, එවිට කාමාවචර සත්වයන්ගේ කාමාවචර ජවන අවසන්හිදී ඉෂ්ටාරම්මණ ආදීන්ගේ හා පූර්වකර්ම ජවන චිත්ත ආදීන්ගේ වශයෙන් යම් යම් ප්‍රත්‍යයක් ලදුයේ වේද, ඒ ඒ ප්‍රත්‍යය වශයෙන් සහේතුක-කාමාවචර-විපාක සිත් අට හා විපාක අහේතුක මනෝ විඤ්ඤාණ ධාතු තුනද (යන සිත් එකොළස) අතුරින් එකක්, උඩුගං බලා යන නැවක් පසුපස මඳදුරක් දිවෙන දිය දහරක් සෙයින්, භවඞ්ගාරම්මණයෙන් බැහැර අන් අරමුණෙක්හි දිවෙන ජවනයක් අනුව දිවෙමින්, දෙවරක් -හෝ එක්වරක් විපාක විඤ්ඤාණය උපදියි. ඒ මේ විපාක විඤ්ඤාණය ජවනාවසානයෙහි භවඞ්ගයාගේ අරමුණෙහි පැවැත්මට සුදුසු වූයේම එම ජවනයාගේ අරමුණු අරමුණු කොට පැවැති හෙයින් 'තදාරම්මණ' යයි කියනු ලැබේ. මෙසේ විපාක විඤ්ඤාණ එකොළසෙහි තදාරම්මණ වශයෙන් පැවැත්ම දතයුතුය.

තදාරම්මණ අවසානයෙහිදී යලි භවංගයම පවතී, භවංගය සිඳී ගිය විට යලි ආවජ්ජනාදිය වේ. මෙසේ ප්‍රත්‍යය ලද චිත්ත සන්තානය භවංගයට අනතුරුව ආවර්ජනයද, ආවර්ජනයට අනතුරුව දර්ශනාදියදැයි චිත්තනියම වශයෙන්ම එක් භවයෙක භවංගයාගේ සිඳීයාම තෙක් යලියලිත් සිදුවෙමින් පවතියි. එක් භවයෙක සියල්ලටම පසුව එන යම් භවංග චිත්තයක් වේද, එය (තතො චවනත්තා) එම භවාංගයෙන් චුතිය සිදුවන හෙයින් 'චුති' යයි කියනුලැබේ. එහෙයින් එයද එකුන්විසි වැදෑරුම්ම වේ; මෙසේ එකුන් විසි විපාක විඤ්ඤාණයන්ගේ චුති වශයෙන් පැවැත්ම දතයුතුය.

චුති චිත්තයෙන් අනතුරුව නැවත පටිසන්ධිචිත්තයද, පටිසන්ධිචිත්තයෙන් අනතුරුව යලි භවංගයද වෙති'යි මෙසේ ත්‍රිභවයෙහි, පංචගතියෙහි, සප්ත-විඥානස්ථිතියෙහි හා නව සත්වාවාසයෙහි සැරිසරන සත්වයන්ගේ චිත්ත-සන්තානය නොසිඳී පවත්නේම වේ, යමෙක් මේ ලෝකයෙහි රහත්බවට පැමිණෙත්ද, ඔවුන්ගේ චුතිචිත්තය නිරුද්ධ වූ කල නිරුද්ධ වූයේම වේ.

මේ විඤ්ඤාණක්ඛන්ධයෙහි විස්තර කථා මාර්ගයයි.

—//—

## වේදනා ස්කන්ධය

ඉක්බිති, "යම් කිසිවක් වින්දනය (ආලම්බන රසාස්වාදය) ලක්ෂණ කොට ඇත්තේ වේද, ඒ සියල්ල එක් කොට වේදනා ස්කන්ධය දතයුතුය"යි (ඉහත නාමස්කන්ධ ආරම්භයෙහි) යමක් කියන ලද්දේද, (එය විස්තර

කරනු ලැබේ). මෙහි විඳනය (ආලම්බන රසාස්වාදය) ලක්ෂණ කොට ඇති නාමස්කන්ධය වේදනාවම වේ; යම්සේ කියන ලදද, ''ඇවැත්නි, විඳිනු ලැබෙති, විඳිනු ලැබෙති'යි වේදනායයි කියනු ලැබේ.[a]

එම වේදනාව වූකලී විඳිනු ලැබීමේ ලක්ෂණය හේතුකොට ගෙන ස්වභාව වශයෙන් ඒකවිධ වන නමුදු ජාති වශයෙන් කුසලය, අකුසලය, අව්‍යාකතයයි ත්‍රිවිධ වේ. එහි කාමාවචර කුසලය සෝමනස්ස-උපෙක්ඛා-ඤාණ-සංඛාර භේද වශයෙන් අටවැදෑරුම් වෙති'යි ආදී නයින් කියනලද කුසල විඤ්ඤාණයෙන් යුක්තවූයේ කුසල වේදනායි. අකුසල විඤ්ඤාණයෙන් යුක්ත වූයේ අකුසල වේදනායි, අබ්‍යාකත විඤ්ඤාණයෙන් යුක්ත වූයේ අබ්‍යාකත වේදනායයි දත යුතුය.

ස්වභාව භේද වශයෙන් සුඛය, දුක්ඛය, සෝමනස්සය, දෝමනස්සය, උපෙක්ඛායයි පස්වැදෑරුම් වේ. එහි කුසල විපාක සහිත කාය විඤ්ඤාණයෙන් යුක්තවූයේ සුඛ වේදනායි, අකුසල විපාක කාය විඤ්ඤාණයෙන් යුක්ත වූයේ දුක්ඛ වේදනායි. කාමාවචර වශයෙන් කුසල් සිත් සතරෙකින්ද සහේතුක විපාකසිත් සතරෙකින්ද, අහෙතුක විපාක සිත් එකකින්ද සහේතුක කිරිය සිත් සතරෙකින්ද, අහේතුක කිරිය සිත් එකෙකින්ද, අකුසල් සිත් සතරෙකින්ද, රූපාවචර වශයෙන් - පංචමධ්‍යාන විඤ්ඤාණය හැර-කුසල් සිත් සතරින්ද, විපාක සිත් සතරින්ද කිරිය සිත් සතරින්ද, - ධ්‍යාන නොවන ලෝකෝත්තර සිතක් නැති හෙයින් ලෝකෝත්තර සිත් අට ධ්‍යාන පසක් වශයෙන් සතළිසක් වේ. ඔවුනතුරෙන් පංචමධ්‍යානික සිත් අට හැර ඉතිරි ලෝකෝත්තර කුසලවිපාක සිත් දෙතිසෙකින්දැ'යි මෙසේ දෙසැට විඤ්ඤාණයෙකින් සම්ප්‍රයුක්ත වූයේ සෝමනස්ස වේදනායි, අකුසල් සිත් දෙකෙකින් සම්ප්‍රයුක්ත වූයේ දෝමනස්ස වේදනායි, සෙසු පස් පණස් විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත වූයේ උපේක්ෂා වේදනායි.

එහි, සුඛවේදනාව ඉෂ්ට(රිසි)වූ ස්පර්ශයන් අනුභව කිරීම ලක්ෂණ කොට ඇත්තේය, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වැඩීයාම කෘත්‍ය කොට ඇත්තේය. කායික ආස්වාදය පච්චුපට්ඨාන (වැටහෙන ආකාරය) කොට ඇත්තේය, කායින්ද්‍රියය පදට්ඨාන කොට ඇත්තේය.

දුක්ඛ වේදනාව අනිෂ්ට-ස්පර්ශ-අනුභවය ලක්ෂණ කොට ඇත්තේය, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ මැලවීයාම (දුබලවීම) කෘත්‍ය කොට ඇත්තේය, කායික ආබාධ වැටහීම් කොට ඇත්තේය, කායින්ද්‍රියය පදට්ඨාන (පදනම) කොට ඇත්තේය.

සෝමනස්ස වේදනාව ඉෂ්ටාරම්මණයන්ගේ අනුභවය ලක්ෂණ කොට ඇත්තේය, කවර ආකාරවූ හෝ ඉෂ්ටාකාර සම්භෝගය කෘත්‍ය

a. ම. නි. මහා වෙදල්ලසුත්ත

කොට ඇත්තේය, චෛතසික ආස්වාදය වැටහීම් කොට ඇත්තේය, පස්සද්ධිය (මානසික විවේකය) පදනම් කොට ඇත්තේය.

දෝමනස්ස වේදනාව අනිෂ්ට-ආරම්මණ-අනුභවය ලක්‍ෂණකොට ඇත්තේය, කවර ආකාරවූ හෝ අනිෂ්ටාකාර සම්භෝගය කෘත්‍ය කොට ඇත්තේය, චෛතසික ආබාධ වැටහීම් කොට ඇත්තේය, ඒකාන්තයෙන්ම හෘදය වස්තුව පදනම්කොට ඇත්තේය.

උපේක්‍ෂා වේදනාව මැදහත් බවින් යුත් වින්‍දනය ලක්‍ෂණ කොට ඇත්තේය, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ බොහෝ නොවන වැඩීම හෝ මැඩීම කෘත්‍ය කොට ඇත්තේය, ශාන්තභාව වැටහීම් කොට ඇත්තේය, නිෂ්ප්‍රීතික (ප්‍රීති රහිත) චිත්තය පදනම් කොට ඇත්තේය.

මේ වේදනා ස්කන්‍ධයෙහි විස්තර කථා මාර්ගයයි.

—//—

## සංඥා ස්කන්‍ධය

ඉක්බිති, 'හඳුනාගැනීම ලක්‍ෂණකොට ඇති යම් කිසිවක් ඇත්නම් ඒ සියල්ල එක්කොට සංඥාස්කන්‍ධයයි දතයුතුය' යනුවෙන් ඉහත යමක් කියන ලදද, එහිද හඳුනාගැනීම ලක්‍ෂණ කොට ඇති නාමස්කන්‍ධය නම් සංඥායි. ඒ මේ සංඥා ස්කන්‍ධය වූකලී සංජානන ලක්‍ෂණයෙන් ස්වභාව වශයෙන් ඒකවිධ වනුයේ නමුදු ජාති වශයෙන් කුසලය, අකුසලය, අබ්‍යාකතය'යි ත්‍රිවිධ වේ. එහි කුසල විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත වූයේ කුසල සංඥායි, අකුසල විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත වූයේ අකුසල සංඥායි, අව්‍යාකෘත සම්ප්‍රයුක්ත වූයේ අව්‍යාකෘත සංඥායි. සඤ්ඤායෙන් යුක්ත නොවූ විඤ්ඤාණයෙක් නැත, එහෙයින් විඤ්ඤාණයෙහි ප්‍රභේද යම් පමණ ඇත්ද, සංඥායෙහිද එපමණම ඇත.

ඒ මේ සංඥාව වූකලී විඤ්ඤාණය හා සමානවූ ප්‍රභේද ඇත්තේ නමුදු ලක්‍ෂණ වශයෙන් මුළු සංඥාස්කන්‍ධයම හුදෙක් හඳුනාගැනීමම ලක්‍ෂණ කොට ඇත්තේය, මේ (පෙර හඳුනාගත්) එයමය'යි නැවත හඳුනාගැනීමට හේතුවන නිමිති ඇති කිරීම කෘත්‍ය කොට ඇත්තේය, දැව ආදී විෂයයන්හි නිමිති ඇති කරන වඩු ආදීන් මෙනි; ගන්නාලද නිමිති අනුව සිතතුළට පිවිසීම වැටහීම් කොට ඇත්තේය, ඇතා හඳුනා ගන්නා අන්ධයන් මෙනි; එළඹසිටි ආකාරවූ විෂයයන් පදනම්කොට ඇත්තේය, තණයෙන් කළ පඹයන් කෙරෙහි මුවපොව්වන් තුළ ඇති වන 'මිනිස්සු'ය යන හැඟීම මෙනි.

මේ සංඥා ස්කන්‍ධයෙහි විස්තර කථා මාර්ගයයි.

—//—

# සංස්කාර ස්කන්ධය

'අභිසංඛරණය (කුශලාකුශල කර්මයන් සාධනය කිරීම) ලක්‍ෂණ කොට ඇති යමක් ඇත්තේද, ඒ සියල්ල එක් කොට සංස්කාර ස්කන්ධයයි දතයුතුය' යනුවෙන් ඉහත යමක් කියන ලද්දේද, එහි අභිසංඛරණ ලක්ඛණ නම් රැස්කිරීමේ ලක්‍ෂණයයි; ඒ කිමෙක්ද? සංස්කාරයෝමැයි; යම්සේ කියන ලදද, ''මහණෙනි, සංඛතධර්මයන් සාධනය කෙරෙති'යි (රැස් කෙරෙති'යි හෝ) 'සංඛාර' යයි කියනු ලැබේ[a] එම සංඛාරයෝ අභිසංඛරණය ලක්‍ෂණ කොට ඇත්තාහ, ආයූහනය (එක්රැස් කොට ගැනීම) කෘත්‍ය කොට ඇත්තාහ. පැතිරීම වැටහීම ආකාර කොට ඇත්තාහ, සෙසු (නාම) ස්කන්ධ තුන පදනම් කොට ඇත්තාහ.

මෙසේ ලක්‍ෂණාදියෙන් ඒකවිධ වන නමුදු ජාති වශයෙන් කුසලය, අකුසලය, අබ්‍යාකතයයි ත්‍රිවිධ වේ. එහි කුසල විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත වූයේ කුසලයි. අකුසල විඤ්ඤාණයෙන් සම්ප්‍රයුක්ත වූයේ අකුසලයි. අබ්‍යාකත විඤ්ඤාණයෙන් යුක්ත වූයේ අබ්‍යාකත සංඛාරයි.

එහි පළමුකොට කාමාවචර ප්‍රථම කුසල විඤ්ඤාණයෙන් යුක්තවූ, ඒකාන්ත වශයෙන් කියන ලද ස්වරූපයෙන් (පෙළෙහි) ආ (ඵස්ස ආදී) සංඛාරයන් සත්විස්සක්ද, 'යේවාපනක' යන නමින් (නියත වශයෙන් හෝ අනියත වශයෙන් නො-ආ) හැඳින්වෙන සතරක්ද, අනියත වශයෙන් ආ පසක්දැයි සංඛාරයෝ සතිසක් වෙති.

එහි **ඵස්සය, චේතනාය, විතක්කය, විචාරය, පීතිය, විරියය, ජීවිතය, සමාධිය, සද්ධාය, සතිය, හිරිය, ඔත්තප්පය, අලෝභය, අදෝසය, අමෝහය, කාය පස්සද්ධිය, චිත්ත පස්සද්ධිය, කාය ලහුතාය, චිත්ත ලහුතාය, කාය මුදුතාය, චිත්තමුදුතාය, කාය කම්මඤ්ඤතාය, චිත්ත කම්මඤ්ඤතාය, කායපාගුඤ්ඤතාය, චිත්තපාගුඤ්ඤතාය. කායුජ්ජුකතාය, චිත්තුජ්ජුකතාය,** යන මොහු නියත ස්වරූපයෙන් (පෙළෙහි) ආ සත්විස්සයි, ඡන්දය. අධිමොක්ඛය, මනසිකාරය, තත්‍රමජ්ඣත්තතාය යන සතර යේවාපනකයි, කරුණාය, මුදිතාය, කායදුච්චරිතවිරතිය, වචීදුච්චරිත විරතිය, මිච්ඡාජීව විරතිය යන මොහු අනියත පසයි. මේ අනියත සංඛාර පස ඇතැම් විටෙක උපදියි, එහෙත් (එක්ම චිත්තයෙහි) එකවිට නො-උපදියි.

එහි, **ඵස්ස** යනු, (ඵුසතී'ති ඵස්සො) ස්පර්ශ කෙරෙති'යි ඵස්ස නම්, එය ස්පර්ශ කිරීම ලක්‍ෂණ කොට ඇත්තේය, අරමුණ හා ගැටීම කෘත්‍ය කොට ඇත්තේය, (වස්තු, ආරම්මණ, විඤ්ඤාණ යන තුනෙහි) එක්රැස්වීම වැටහීම් කොට ඇත්තේය, ආපාථයට (හමුවට) පැමිණි විෂයය පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය. මේ ස්පර්ශය අරූපධර්මයක් වුයේම,

a. සං. නි. ඛජ්ජනිය වග්ග

අරමුණෙහි වැදගන්නා ආකාරයෙන්ම (ගැටෙන්නා සේ) පවතී. ඒකදේශයෙකින් හෝ ගැටීමක් නොවෙතත්, ඇස හා රූපය මෙන්ද, කණ හා ශබ්දය මෙන්ද, සිත හා අරමුණ එකිනෙක ගැටෙයි, (වස්තු ආලම්බන. විඤ්ඤාණ යන) තුනෙහි එක්වීම එස්සයට හේතු වශයෙන් දක්වන ලද හෙයින්, එම හේතු තුනෙහි එක්රැස්වීම පච්චුපට්ඨාන (වැටහීම්) කොට ඇත්තේය; එයට අනුරූපවූ ආවර්ජන චිත්තයෙන් හා ඉන්ද්‍රියයෙන් සකස් කතරලද විෂයයෙහි බාධාරහිතව උපදනා හෙයින් (ආපාථගත විසයපදට්ඨාන) හමුවට පත් අරමුණු පදට්ඨාන (පදනම්) කොට ඇත්තේයයි කියනුලැබේ. වේදනාවට ආධාරවන බැවින් සම ගසනලද ගවදෙනක වැනියයි දතයුතුය.

චේතනා - සිතනු ලැබෙති'යි චේතනානම් වේ. ''සම්ප්‍රයුක්ත ධර්මයන් මෙහෙයවති''යි යන අර්ථයි. එම චේතනා ස්වභාවය ලක්‍ෂණ කොට ඇත්තේය, එක්රැස්වීම කෘත්‍ය කොට ඇත්තේය, සංවිධානය වැටහීම් ආකාර කොට ඇත්තේය. තමා සතු කාර්යය කරමින්ම අන්‍යයන්ද ඔවුන් සතු කාර්යයෙහි යොදවන දෙටුසිසු, ඇදුරු වඩු ආදීන් සෙයිනි. අත්‍යවශ්‍ය කාර්යයන් සිහිගැන්වීම් ආදියෙහිද මෙය (චේතනාව) සම්ප්‍රයුක්ත ධර්මයන් උත්සාහවත් කරන ස්වභාවයෙන් පවතිමින් ප්‍රකට වෙයි.

විතක්ක-විචාර-පීති යන මෙහි කිවයුතු යමක් ඇත්ද, ඒ සියල්ල පඨවිකසිණ නිද්දේසයෙහි ප්‍රථමධ්‍යාන විස්තරයෙහිදී කියනලද්දේමය.

විරිය - නම් වීරභාවය (වීර්යය)යි. එය උත්සාහවත් කිරීම ලක්‍ෂණ කොට ඇත්තේය, සහජාත ධර්මයනට උපස්තම්භ වීම කෘත්‍ය කොට ඇත්තේය, අනලස් බව වැටහීම් කාරණ කොට ඇත්තේය. 'සංවේගයට පත් වූයේ නුවණින් පධන් (වීර්ය) වඩයි' යන වදන් අනුව සංවේගය පදට්ඨාන (පදනම්) කොට ඇත්තේය, වීර්යාරම්භක වස්තුව හෝ පදට්ඨාන කොට ඇත්තේය; මනාකොට අරඹන ලද්දේ සියලු සැපතට මුල් වෙති'යි දතයුතුය.

ජීවිත - මෙය කරණ කොට ජීවත් වෙති'යි, තමාම ජීවත් වෙති'යි හෝ හුදෙක් ජීවත්වීමම හෝ ජීවිතයි. මෙහි ලක්‍ෂණ ආදිය රූපස්කන්ධ විභාගයෙහිදී ජීවිතින්ද්‍රියය පිළිබඳව කීනයින්ම දතයුතුය, එය රූප ධර්මයන් පිළිබඳ ජීවිතයයි, මෙය වූ කලි අරූපධර්මයන් පිළිබඳ ජීවිතයයි. මේ දෙකෙහි වෙනස එයමයි.

සමාධි - සිත සමසේ පිහිටුවනු ලැබෙති'යි, මනාකොට පිහිටුවනු ලැබෙති'යි හෝ හුදෙක් මැනවින් දැරීමම හෝ සමාධියයි. එය නොවිසිර සිටීම, නිරවුල්ව පැවතීම හෝ ලක්‍ෂණ කොට ඇත්තේය, සහජාත ධර්මයන් පිඬු කොට තබා ගැනීම කෘත්‍ය කොට ඇත්තේය නහන විට ඇඟ ගල්වන සුණු ජලය මුසුවූ කල එක්ව බැඳී සිටින්නා සේය. (ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගේ)

උපශාන්ත භාවය වැටහීම් කොට ඇත්තේය. සුඛ වේදනාව පදනම් කොට ඇත්තේය. සුළං මුවාවෙක්හි පහන් සිළුවෙක මෙන් සිතෙහි නිසලබවය'යි දතයුතුය.

සද්ධා - මෙය කරණ කොට අදහති'යි, ඇදහීම සිදුවෙති'යි හෝ හුදෙක් ඇදහීමම හෝ සද්ධායි. එය ඇදහීම ලක්‍ෂණ කොට ඇත්තේය, අරමුණට පිවිසීම හෝ ලක්‍ෂණ කොට ඇත්තේය, පැහැදවීම කෘත්‍ය කොට ඇත්තේය, ජලය පහදවන මැණිකක් සෙයිනි; සැඩ පහරෙක වේගයෙන් එතෙර වීම මෙන් අරමුණට වැදගැනීම හෝ කෘත්‍ය කොට ඇත්තේය, නිර්මලභාවය වැටහීම් කොට ඇත්තේය. අධිෂ්ඨානය හෝ වැටහීම් කොට ඇත්තේය. ඇදහීමට සුදුසු වස්තූන් පදනම් කොට ඇත්තේය. සද්ධර්මශ්‍රවණාදී වූ ශ්‍රෝතාපත්ති අංගයන් හෝ පදනම් කොට ඇත්තේය. අතපත් වස්තු බීජයන් සෙයින් දැක්ක යුතුය.

සති - එය කරණ කොට සමරති'යි සැමරීම වෙති'යි හෝ හුදෙක් සැමරීමම හෝ සති නම්, එය අරමුණෙහි නො-ඉල්පෙන බව ලක්‍ෂණකොට ඇත්තේය, මුළා නොවීම කෘත්‍ය කොට ඇත්තේය, රැක වරණ සහිත බව වැටහීම් කොට ඇත්තේය. අරමුණට යොමු බව හෝ වැටහීම් කොට ඇත්තේය. ස්ථිර සංඥාව පදට්ඨාන කොට ඇත්තේය. කායාදී සතිපට්ඨාන විෂයයන් හෝ පදට්ඨාන කොට ඇත්තේය. අරමුණෙහි දැඩිව පිහිටි හෙයින් ඒසිකා ස්තම්භයක් (ඉන්‍ද්‍රඛීලයක්) සෙයින් චක්‍ෂුරාදිය රක්නා හෙයින් දොරටුපල්ලකු සේ දැක්ක යුතුය.

හිරිඔත්තප්ප - කායදුශ්චරිතාදියෙන් හැකිලෙති'යි (පිළිකුල් කෙරෙති'ය) හිරි නම්. මෙය ලජ්ජාව හඟවන වචනයෙකි. එම කායදුශ්චරිතාදියෙන් තැති ගනිති'යි ඔත්තප්ප නම්. පවින් තැතිගැනීම හඟවන වදනෙකි. හිරි යනු ලජ්ජාකාරයෙන් පවින් වැලකීමයි. තැතිගැනීම ආකාරයෙන් පවින් වැලකීම ඔත්තප්පයි. එහි පව් පිළිකුල් කිරීම ලක්‍ෂණ කොට ඇත්තේ හිරියි, පවින් තැති ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේ ඔත්තප්පයි. ලජ්ජාකාරයෙන් පව් නොකිරීම කෘත්‍ය කොට ඇත්තේ හිරියි. තැතිගැනීම් ආකාරයෙන් පව් නොකිරීම කෘත්‍ය කොට ඇත්තේ ඔත්තප්පයි. මේ හිරිඔතප් දෙක කියන ලද ප්‍රකාරයෙන්ම පවින් වැළකීම වැටහීම් කොට ඇත්තේය. (පිළිවෙළින්) ආත්ම ගෞරවය හා පරගෞරවය පදනම් කොට ඇත්තේය. තමා කෙරෙහි ගෞරවයෙන් කුලකාන්තාවක සේ ලජ්ජාව හේතුකොට පව් හැර දමයි; මෙරමා කෙරෙහි ගෞරවයෙන් වෙසඟනක සේ ඔතප්පහේතුකොට පවින් වලකියි. තවද මේ හිරිඔතප් දෙක ලෝකපාලක ධර්මයයිද දතයුතුය.

අලෝභ අදෝස අමෝහ - එය හේතුකොට ලෝභ නොකෙරෙති'යි, තෙමේම ලෝභ නොකෙරෙති'යි හෝ හුදෙක් ලෝභ නොකිරීමම අලෝභ

නමි. අදෝස, අමෝහ යන තන්හිද මෙම නයයි; ඔවුනතුරෙන් අලෝභය අරමුණෙහි සිත ගිජු නොවීම ලක්‍ෂණ කොට ඇත්තේය. පියුම් පතෙහි දිය බිඳු සෙයින් නොලැගීම ලක්‍ෂණ කොට ඇත්තේය, කෙලෙසුන් කෙරෙන් මිදුණු භික්‍ෂුවක් සෙයින් අපරිග්‍රහය (නො-ඇලීම) කෘත්‍ය කොට ඇත්තේය. අසූචියෙහි වැටුණු පුරුෂයකු මෙන් නො-ඇලෙන බව වැටහීම් කොට ඇත්තේය, අදෝසය නොසැඬ බව ලක්‍ෂණකොට ඇත්තේය, අනුකූල (සමාන පැවතුම් ඇති) මිතුරකු සෙයින් නො-පටහැනි බව හෝ ලක්‍ෂණ කොට ඇත්තේය, ව්‍යාපාද පීඩා දුරුකිරීම කෘත්‍ය කොට ඇත්තේය. සඳුනක් සෙයින් (වෛර) පරිදාහ දුරුකිරීම හෝ කෘත්‍ය කොට ඇත්තේය. පුන්සඳෙහි සෙයින් සෞම්‍ය ගුණය වැටහීම් කොට ඇත්තේය. අමෝහය ඇති තතු වැටහීම ලක්‍ෂණ කොට ඇත්තේය. හුරුපුරුදු දුනුවායකු විදි හී සරයක් සෙයින් නොපැකිල වහා අවබෝධ වීම හෝ ලක්‍ෂණ කොට ඇත්තේය; පහනක් සෙයින් අරමුණ හෙළිපෙහෙළි කිරීම කෘත්‍ය කොට ඇත්තේය, වනයෙහිදී යහපත් නියමුවකු මෙන් මුළා නොකිරීම වැටහීම් කොට ඇත්තේය; මේ (අලෝභ, අද්වේෂ, අමෝහ යන) තුන සියලු කුසලයට මුල් වෙති'යි දතයුතුය.

කායපස්සද්ධි, චිත්තපස්සද්ධි - කායපස්සද්ධි යනු, කය පිළිබඳව ඇතිවන ක්ලේශ පරිදාහදුරලීමයි, චිත්තපස්සද්ධි යනු, සිත පිළිබඳ පරිදාහය දුරලීමයි, මෙහි 'කාය' යනුවෙන් වේදනාව ආදි කොට ඇති ස්කන්ධත්‍රයය ගැනේ, මේ කාය පස්සද්ධිය හා චිත්ත පස්සද්ධිය යන දෙකම එක් කොට (කියතොත්) කාය-චිත්ත පරිදාහයන් සන්සිඳුවීම ලක්‍ෂණ කොට ඇත්තේය. කාය-චිත්ත පරිදාහයන් මැඩීම කෘත්‍ය කොට ඇත්තේය. කය-සිත දෙකෙහි නිසසලබව, සිහිල්බව වැටහීම් කොට ඇත්තේය, කය-සිත දෙක පදනම් කොට ඇත්තේය. කය-සිත දෙකෙහි නොසන්සුන් බව ඇති කරන උද්ධච්ච ආදී කෙලෙසුනට ප්‍රතිපක්‍ෂයහ'යි දතයුතුය.

කායලහුතා, චිත්තලහුතා - කායලහුතා යනු කය පිළිබඳ සැහැල්ලු බවයි. චිත්තලහුතා යනු, සිතෙහි සැහැල්ලු බවයි. ඒ දෙක (පිළිවෙලින්) කය-සිත යන දෙකෙහි බර මුදා හැරීම ලක්‍ෂණ කොට ඇත්තේය, කය-සිත යන දෙකෙහි බර බව මැඩීම කෘත්‍ය කොට ඇත්තේය, කය-සිත යන දෙකෙහි නොලැසිබව වැටහීම් කොට ඇත්තේය, කය-සිත දෙක පදනම් කොට ඇත්තේය. කය-සිත දෙක්හි බරබව ඇති කරන ථීනමිද්ධ ආදී කෙලෙසුනට ප්‍රතිපක්‍ෂයහයි දතයුතුය.

කායමුදුතා, චිත්තමුදුතා - කායමුදුතා යනු කය පිළිබඳ මුදුබවයි, චිත්ත මුදුතා යනු සිත පිළිබඳ මුදු බවයි. ඒ දෙක (පිළිවෙළින්) කය සිත දෙකෙහි දැඩිබව ශමනය කිරීම ලක්‍ෂණ කොට ඇත්තේය. කය-සිත යන දෙකෙහි තදබව මැඩීම කෘත්‍යකොට ඇත්තේය, (අරමුණෙහි) නොගැටීම වැටහීම් කොට ඇත්තේය. කය-සිත යන දෙක පදට්ඨාන කොට ඇත්තේය.

කය-සිත යන දෙකෙහි දරදඬු බව ඇති කරන දිට්ඨි, මාන ආදී කෙලෙසුනට ප්‍රතිපක්ෂයහ'යි දතයුතුය.

කායකම්මඤ්ඤතා, චිත්ත කම්මඤ්ඤතා - කාය කම්මඤ්ඤතා යනු, කය පිළිබඳ කර්මණ්‍යතාව (හුරුබුහුටි බව)යි, චිත්ත කම්මඤ්ඤතා යනු සිත පිළිබඳ කර්මණ්‍යතාවයි, ඒ දෙක (පිළිවෙළින්) කය-සිත යන දෙකෙහි අකර්මණ්‍ය භාවය මැඩීම කෘත්‍ය කොට ඇත්තේය, කය-සිත දෙක පිළිබඳ අරමුණු ගැනීමේ සපල බව වැටහීම් කොට ඇත්තේය. කය-සිත යන දෙක පදනම් කොට ඇත්තේය. කය-සිත යන දෙක අකර්මණ්‍ය භාවයට පත් කරන සෙසු (කාමච්ඡන්ද ආදී) නීවරණාදියට ප්‍රතිපක්ෂය'යි දතයුතුය. තවද ප්‍රසාදනීය වස්තූන් කෙරෙහි ප්‍රසාදය එළවති'යිද ස්වර්ණ විශුද්ධිය මෙන් හිත වැඩෙහි යෙදීමට සමත් බව එළවති'යිද, දතයුතුය.

කාය පාගුඤ්ඤතා-චිත්ත පාගුඤ්ඤතා - කායපාගුඤ්ඤතා යනු කය පිළිබඳ ප්‍රාගුණ්‍යය (හුරුපුරුදු බව)යි, චිත්ත පාගුඤ්ඤතා නම් සිත පිළිබඳ ප්‍රාගුණ්‍යයයි. ඒ දෙක (පිළිවෙළින්) කය හා සිත පිළිබඳ නො-ගිලන් බව ලක්ෂණ කොට ඇත්තේය, කය-සිත පිළිබඳ ගිලන් බව මැඩීම කෘත්‍ය කොට ඇත්තේය. ආදීනව රහිත බව වැටහීම් කොට ඇත්තේය. කය-සිත දෙක පදනම් කොට ඇත්තේය. කය-සිත යන දෙක ගිලන් බවට පත් කරන සැදැහැ නැතිබව ආදියට ප්‍රතිපක්ෂයහ'යි දතයුතුය.

කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා - කායුජ්ජුකතා යනු කය පිළිබඳ ඍජුභාවයයි. චිත්තුජ්ජුකතා යනු සිත පිළිබඳ ඍජුභාවයයි. ඒ දෙක කය සිත යන දෙකෙහි ඍජුභාවය ලක්ෂණ කොට ඇත්තේය. කය සිත යන දෙකෙහි කුටිල බව මැඩීම කෘත්‍ය කොට ඇත්තේය. අවංක බව වැටහීම් කොට ඇත්තේය. (පිළිවෙළින්) කය සිත යන දෙක පදනම් කොට ඇත්තේය. කය සිත දෙකෙහි වංක භාවය ඇති කරන මායාකාර බව කපටිබව ආදියට ප්‍රතිපක්ෂයහයි දතයුතුය.

ඡන්ද - යන මෙය කත්තුකාමතාවට (අරමුණෙහි සිත යොදනු කැමැති බවට) අධිවචනයෙකි. එහෙයින් එය කත්තුකාමතාව ලක්ෂණ කොට ඇත්තේය. ඡන්දය අරමුණු සෙවීම කෘත්‍ය කොට ඇත්තේය. අරමුණු කැමැතිබව වැටහීම් කොට ඇත්තේය. එයම පදනම් කොට ඇත්තේය. මෙය අරමුණු ගැනීමෙහිදී සිතට අත දිගු කිරීමක් බඳුයයි දත යුතුය.

අධිමොක්ඛ - යනු, නිශ්චය කිරීමයි, එය සනිටුහන් කිරීම ලක්ෂණකොට ඇත්තේය, අසංසප්පනය (ඒ මේ අත නොවැනීම) කෘත්‍ය කොට ඇත්තේය. නිශ්චය සහිත බව වැටහීම් කොට ඇත්තේය. සනිටුහන් කළයුතු ධර්මය පදනම්කොට ඇත්තේය. අරමුණෙහි නිශ්චලව පිහිටීම හේතුකොට ගෙන ඉන්ද්‍රඛීලයක් මෙනැයි දතයුතුය.

මනසිකාර - 'කාර' යනු ක්‍රියායි, මනසෙහි ක්‍රියාව මනසිකාරයි. පළමු මනසට වෙනස්වූ මනසක් ඇති කෙරෙති'යිද මනසිකාර නම්. ඒ මේ මනසිකාරය ආරම්මණ ප්‍රතිපාදකය, වීථිප්‍රතිපාදකය, ජවන ප්‍රතිපාදකයයි තුන් ආකාර වේ. ආරම්මණ ප්‍රතිපාදක වූ මනසෙහි ක්‍රියාව මෙහිලා මනසිකාර නම්. එය අරමුණට අභිමුඛව හැසිරවීම ලක්‍ෂණ කොට ඇත්තේය. සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි යෙදවීම කෘත්‍ය කොට ඇත්තේය. අරමුණට අභිමුඛ වීම වැටහීම් කොට ඇත්තේය, අරමුණ පදනම් කොට ඇත්තේ සංස්කාර ස්කන්ධය බවට පත් මනසිකාරය අරමුණ ප්‍රතිපාදනය කිරීමෙන් සම්ප්‍රයුක්ත ධර්මයනට නියමුවකු බඳුයයි දතයුතුය.

(මෙහි සඳහන්) වීථි ප්‍රතිපාදක මනසිකාර යන මෙය පංචද්වාරාවජ්ජන චිත්තයට අධිවචනයෙකි, ජවනප්‍රතිපාදක මනසිකාර යනු මනෝද්වාරාවජ්ජන චිත්තයට අධිවචනයෙකි, මෙහිලා ඒ දෙක අභිප්‍රේත නොවේ.

**තත්‍ර මජ්ඣත්තතා** යනු චිත්ත චෛතසික ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථ භාවයයි, එය චිත්ත චෛතසික ධර්මයන් සමව පැවැත්වීම ලක්‍ෂණ කොට ඇත්තේය. ඌනාධික භාවය (අඩු වැඩිබව) වැලැක්වීම කෘත්‍ය කොට ඇත්තේය, පක්‍ෂපාත බව නැති කිරීම හෝ කෘත්‍ය කොට ඇත්තේය. මධ්‍යස්ථතාව වැටහීම් කොට ඇත්තේය. චිත්ත චෛතසික ධර්මයන් කෙරෙහි අධි-උපේක්‍ෂා සහිත බැවින් ආජානේය සෛන්ධවයන් සමව හැසිරවීමෙහි අධි-උපේක්‍ෂා සහිත සාරථී කෙනකු බඳුයයි දතයුතුය.

**කරුණා, මුදිතා** යන මේ දෙක යට බ්‍රහ්මවිහාර නිද්දේසයෙහි කී නයින්ම දතයුතුය. එහි කරුණා, මුදිතා යන දෙක හුදෙක් අර්පණා බවට පත් රූපාවචර ධර්මයන් වන අතර, මෙහි ඒ දෙක කාමාවචර වෙති'යි යනුම විශේෂයි. ඇතැම් ආචාර්ය කෙනෙක් මෙත්තා, උපෙක්ඛා යන දෙකද අනියත ධර්මයන් කෙරෙහි ලා ගනු කැමැති වෙති, එහෙත් එසේ නොගත යුතුය. අර්ථ වශයෙන් වනාහි 'මෙත්තා' යනු (ඉහත සඳහන්) අදෝසය මැයි, 'උපෙක්ඛා' යනු, තත්‍ර මජ්ඣත්තතාවමැයි.

**කායදුච්චරිත විරති** යනු කාය දුශ්චරිතයෙන් වැලකීමයි.

**(වචීදුච්චරිත විරති, මිච්ඡාජීවවිරති)** යන සෙසු දෙතැන්හිදු මෙම නයයි. ලක්‍ෂණාදියෙන් වනාහි මේ (කායදුච්චරිත විරති, වචීදුච්චරිත විරති, මිච්ඡාජීව විරති යන) තුනම කායදුශ්චරිතාදී එකිනෙකට අයත් වස්තූන් උල්ලංඝනය නොකිරීම ලක්‍ෂණ කොට ඇත්තේය. නොපෙළෙන බව ලක්‍ෂණ කොට ඇත්තේය යන අර්ථයි. කායදුශ්චරිතාදී වස්තූන් කෙරෙන් ඉවත්වීම කෘත්‍ය කොට ඇත්තේය. එම දුශ්චරිතයන්හි නොයෙදෙන බව වැටහීම් කොට ඇත්තේය. සද්ධා, හිරි, ඔත්තප්ප, අප්පිච්ඡතාදී ගුණ

පදනම් කොට ඇත්තේය. පාපක්‍රියාවන් කෙරෙන් සිත වැලැක්වීමයයි දතයුතුය.

මෙසේ මේ සතිස් සංස්කාරයන් ප්‍රථම කාමාවචර කුශල විඤ්ඤාණය හා සමග සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතුය. පළමුවන කාමාවචර කුසල විඤ්ඤාණය හා සමග යම්සේද දෙවැන්න (කාමාවචර කුසල විඤ්ඤාණය) හා සමගද එසේය; එහි ඇති විශේෂය (පළමුවැන්න අසංඛාරික වන අතර මෙය) සසංඛාරික වීම පමණෙකි. තුන්වන (කාමාවචර කුසල විඤ්ඤාණය හා සමග අමෝහය හැර සෙසු සංස්කාරයන් (සම්ප්‍රයෝගයට යෙති'යි) දතයුතුය. සිවුවැන්න හා සමගද එසේය. සසංඛාරික බව පමණක් එහි ඇති විශේෂයයි.

ප්‍රථම (කාමාවචර කුසල) විඤ්ඤාණයෙහි කියනලද සංස්කාරයන් අතුරෙන් පීතිය හැර සෙසු සංස්කාරයෝ පස්වන (කාමාවචර කුසල) විඤ්ඤාණය හා සමග සංයෝගයට යෙති; පස්වැන්න හා සමග යම්සේද, සවැන්න හා සමගද එසේය, එහි ඇති විශේෂය වනුයේ සසංඛාරික බව පමණෙකි. සත්වැන්න හා සමග අමෝහය හැර සෙසු සංස්කාරයන් සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතුය; අටවැන්න හා සමගද එසේමය. විශේෂය වනුයේ සසංඛාරික බව පමණි.

පළමුවන (කාමාවචර කුසල) විඤ්ඤාණයෙහි කියනලද සංස්කාරයන් අතුරෙන් විරති තුන හැර සෙසු සංස්කාරයෝ රූපාවචර කුශලයන් අතුරෙන් පළමුවැන්න හා සමගද සම්ප්‍රයෝගයට යෙති. එයිනුදු විතක්කය හැර සෙසු සංස්කාරයෝ (රූපාවචර) දෙවැන්න හා සමගද, එයිනුදු විචාරය හැර සෙසු සංස්කාරයෝ එම තෙවැන්න හා සමගද, එයිනුදු පීතිය හැර සෙසු සංස්කාරයෝ එම සිවුවැන්න හා සමගද, එයිනුදු කරුණා, මුදිතා යන අනියත දෙක හැර සෙසු සංස්කාරයෝ එම පස්වැන්න හා සමගද සම්ප්‍රයෝගයට යෙති. එම (අටවිසි) සංස්කාරයෝම අරූපාවචර කුසල විඤ්ඤාණ සතරෙහිද සම්ප්‍රයෝගයට යෙති, මෙහි විශේෂය වනුයේ අරූපාවචර බව පමණි.

ලෝකෝත්තර විඤ්ඤාණයන් අතුරෙන් පළමුකොට ප්‍රථමධ්‍යානික මග්ග විඤ්ඤාණයෙහි ප්‍රථම රූපාවචර කුසල විඤ්ඤාණයෙහි කියනලද නයින්ද, ද්විතීය ධ්‍යානික ආදී භේද ඇති මග්ග විඤ්ඤාණයෙහි (පිළිවෙළින්) ද්විතීය රූපාවචර විඤ්ඤාණ ආදියෙහි කියනලද නයින්ද දතයුතුය. කරුණා, මුදිතා යන දෙක (සත්වාලම්බන හෙයින්) නොවීමද, ඒකාන්ත විරති බව හා ලෝකෝත්තර බවද මෙහි විශේෂයි. මෙසේ කුශල සංස්කාරයන් මෙතෙකින් දතයුතුය.

අකුසල විඤ්ඤාණයන් අතුරෙන් පළමුකොට ලෝභමූලික ප්‍රථම අකුශලය හා සම්ප්‍රයුක්ත වූ නියත ස්වරූපයෙන් ආ තෙළෙසද,

යේවාපනකවශයෙන් ආ සතරදැයි සංස්කාරයෝ සතළොසෙක් වෙති. එහි, ඵස්සය, චේතනාය, විතක්කය, විචාරය. පීතිය, විරියය, ජීවිතය, සමාධිය, අහිරිකය, අනොත්තප්පය, ලෝභය, මෝහය, මිච්ඡාදිට්ඨිය යන තෙළෙස ස්වරූප වශයෙන් ආයේය. ඡන්දය, අධිමෝක්ඛය, උද්ධච්චය, මනසිකාරය යන මේ සතර සේවාපනක නම් වේ.

එහි, ලජ්ජා නොවෙති'යි අහිරික නම්. අහිරික භාවය අහිරික නම්වේ. බිය නොවෙති'යි අනොත්තප්ප නම්; මේ දෙක අතුරෙන් අහිරිකය කායදුශ්චරිතාදිය පිළිකුල් නොකිරීම නොහොත් එයට ලජ්ජා නොවීම ලක්‍ෂණ කොට ඇත්තේය. අනොත්තප්පය එම කායදුශ්චරිතාදියෙහි පසුබට නොවීම නොහොත් තැතිගැනීම් රහිත බව ලක්‍ෂණ කොට ඇත්තේය; මේ මෙහි සංක්‍ෂේපයයි, විස්තර හිරිඔත්තප්ප දෙක පිළිබඳව කියන ලද දෙයට ප්‍රතිපක්‍ෂ වශයෙන් දතයුතුය.

එය හේතුකොට ගෙන ලෝභ කෙරෙති'යි, තෙමේම ලෝභ කෙරෙති'යි නොහොත් ලෝභ කිරීම් මාත්‍රයම හෝ ලෝභ නම්. එය හේතු කොටගෙන මුළා වෙති'යි තෙමේම මුළා වෙති'යි නොහොත් මුළාවීම් මාත්‍රයම හෝ මෝහ නම්. ඒ දෙක අතුරෙන් ලෝභය අරමුණු ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. වඳුරන් හසු කරගන්නා ලහටුවක් මෙනි, ඇලීම කෘත්‍ය කොට ඇත්තේය, රත්වූ කබලෙක ලූ මස්පිඩක් මෙනි. අත් නොහැරීම වැටහීම් කොට ඇත්තේය. තෙලංජනරාගයක් (තෙල්සායමක්) මෙනි. ඇලීමට යෝග්‍ය වස්තූන් කෙරෙහි ආස්වාද දර්ශනය පදනම් කොට ඇත්තේය. තෘෂ්ණානදී භාවයෙන් වැඩෙමින් සීඝ්‍රප්‍රවාහ සහිත නදියක් මහමුහුද කරා යන ලෙස අපාය වෙතම ගෙනයති'යි දතයුතුය.

මෝහය සිතෙහි අඳබව නොහොත් නොදැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. මනාසේ කරුණු අවබෝධ නොකිරීම නොහොත් අරමුණෙහි යථා ස්වභාවය වසන් කිරීම කෘත්‍ය කොට ඇත්තේය. නොමනා පිළිවෙත් නොහොත් මෝහාන්ධකාරය වැටහීම් කොට ඇත්තේය. අයෝනිසෝ මනසිකාරය පදට්ඨාන කොට ඇත්තේය. සියලු අකුසලයනට මූලය'යි දතයුතුය.

එය හේතුකොට වරදවා දකිති'යි, වැරදි දැකීම වෙති'යි, නැතහොත් හුදෙක් වැරදිලෙස දැකීම් මාත්‍රයම මිච්ඡාදිට්ඨි නම්. එය නුනුවණින් පිවිසීම ලක්‍ෂණ කොට ඇත්තේය. වැරදි ලෙස ගැනීම කෘත්‍ය කොට ඇත්තේය. වැරදි පිවිසීමම වැටහීම් කොට ඇත්තේය. ආර්යයන් නොදකිනු රිසි බව ආදිය පදනම් කොට ඇත්තේය. මහත්ම වරදයයි දතයුතුය.

උද්ධච්ච යනු සිතෙහි කැළඹුණු බවයි. එය නොසන්සුන් බව ලක්‍ෂණ කොට ඇත්තේය. සුළං පහරින් සසල ජලය මෙනි. නිසලව නොපැවතීම කෘත්‍ය කොට ඇත්තේය. සුළං පහරින් සසල ධජපතාකා

මෙනි. ඇලලී ගිය ස්වභාවය වැටහීම් කොට ඇත්තේය. කැට පහරින් කැළඹී නැඟුණු අළු මෙනි. නොසන්සුන් සිතින් නුනුවණින් මෙනෙහි කිරීම පදනම් කොට ඇත්තේය. සිතෙහි අසහනයයි දතයුතුය.

සෙසු (යේවාපනක) සංස්කාරයන් කුසල සංස්කාරයන් පිළිබඳව කී නයින්ම දතයුතුය, අකුසල බවද, අකුසල වන බැවින් ලාමක බවද මෙහි ඇති විශේෂයි. මෙසේ සතළොස් සංස්කාරයන් ප්‍රථම අකුසල විඤ්ඤාණය හා සමඟ සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතුය. ප්‍රථම අකුසල විඤ්ඤාණය හා සමග යම් සේද, ද්විතීය අකුසල විඤ්ඤාණය හා සමගද එසේමය. මෙහිලා සසඞ්ඛාරික බවද, ථීනමිද්ධය පිළිබඳ අනියත බවද විශේෂයි. එහි 'ථීන' යනු කුසීත බවයි, 'මිද්ධ' යනු, කළකිරුණු ස්වභාවයයි. (පිළිවෙළින්) උත්සාහ හීන බව හා උද්යෝග රහිත බවය යන අර්ථයි. ථීනය, මිද්ධය යන දෙක සමාස වීමෙන් 'ථීන මිද්ධ'යි සිද්ධවේ. එහි ථීනය මන්දොත්සාහය ලක්‍ෂණ කොට ඇත්තේය. වීර්යය දුරු කිරීම කෘත්‍යකොට ඇත්තේය. උදාසීන බව වැටහීම් කාරණ කොට ඇත්තේය. මිද්ධය අකර්මණ්‍ය බව ලක්‍ෂණ කොට ඇත්තේය. (සම්ප්‍රයුක්ත ධර්මයන්) වසා සිටීම කෘත්‍ය කොට ඇත්තේය. (අරමුණෙහි) හැකිලෙන ස්වභාවය වැටහීම් කාරණකොට ඇත්තේය. නොහොත් පචලායික නිද්දාව (හෙවත් ඇලිමැලිබව) වැටහීම් කොට ඇත්තේය. (ථීන, මිද්ධ යන) දෙකම (කුසල් කෙරෙහි) අනභිරතිය, උදාසීන බව ආදියෙහි අයෝනිසෝමනසිකාරය පදනම්කොට ඇත්තේය.

තෘතීය අකුසල විඤ්ඤාණය හා සමග, ප්‍රථම අකුසල විඤ්ඤාණයෙහි කී සංස්කාරයන් අතුරෙන් මිච්ඡාදිට්ඨිය හැර සෙසු සංස්කාරයන් වෙති'යි දතයුතුය. මෙහි වනාහි මානය අනියත වේ. මෙය විශේෂයි: ඒ මානය ඉහළට නැඟුරු බව (සෙය්‍යමානය) ලක්‍ෂණ කොට ඇත්තේය. දැඩිව ගැනීම කෘත්‍ය කොට ඇත්තේය. කේතුකම්‍යතාව (හෙවත් කොඩියක්මෙන් ඉහළින් පෙනී සිටිනු රිසිබව) වැටහීම් කොට ඇත්තේය. දිට්ඨි විප්පයුත්ත (මිථ්‍යාදෘෂ්ටියෙන් තොර) ලෝභය පදනම්කොට ඇත්තේය. උමතුබව වැනියයි දතයුතුයි.

සිවුවන අකුසල විඤ්ඤාණය හා සමග, දෙවන අකුසල විඤ්ඤාණයෙහි කී සංස්කාරයන් අතුරෙන් මිච්ඡාදිට්ඨිය හැර සෙසු සංස්කාරයන් වෙති'යි දතයුතුය; මෙහිද මානය අනියතයන් අතර වේමය.

පළමුවන අකුසල විඤ්ඤාණය පිළිබඳවකී සංස්කාරයන් අතුරෙන් පීතිය හැර සෙසු සංස්කාරයෝ පස්වන අකුසල චිත්තය හා සමගද සම්ප්‍රයෝගයට යෙති. පස්වැන්න හා සමග මෙන්ම සවැන්න හා සමගද එසේමය; මෙහිදී වනාහි සසංඛාරික බව මෙන්ම ථීනමිද්ධය පිළිබඳ අනියත බවද විශේෂයි. සත්වන අකුසල චිත්තය හා සමග, පස්වැන්න පිළිබඳව

කී සංස්කාරයන් අතුරෙන් දිට්ඨිය හැර සෙසු සංස්කාරයන් සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතුය; මෙහිදී වනාහි මානය අනියත වේ. අටවන අකුසල විඤ්ඤාණය හා සමග, සවැන්නෙහි කී සංස්කාරයන් අතුරෙන් දිට්ඨිය හැර සෙසු සංස්කාරයන් වෙති'යි දතයුතුය. මෙහිදීද, මානය අනියතයන් අතර වේමය.

දෝසමූලික සිත් දෙකෙහි වනාහි පළමුකොට, නියත ස්වරූපයෙන් ආ ප්‍රථම සම්ප්‍රයුක්තයන් එකොළොසද, යේවාපනකයන් සතරද, අනියතයන් තුනක්දැ'යි සංස්කාරයෝ අටළොසෙක් වෙති. එහි, ඵස්ස, චේතනා, විතක්ක, විචාර, විරිය, ජීවිත, සමාධි, අහිරික, අනොත්තප්ප, දෝස, මෝහ, යන මේ ස්වරූපයෙන් ආ එකොළොසයි. ඡන්දය, අධිමොක්ඛය, උද්ධච්චය, මනසිකාරය යන මේ යේවාපනක සතරයි, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන මේ අනියත තුනයි.

එහි, එය විසින් දූෂ්‍ය කරනු ලැබෙති'යි, තමාම දූෂ්‍ය වෙති'යි හෝ හුදෙක් දූෂණ මාත්‍රයම හෝ 'දෝෂ' නම්. එය සැඩ බව ලක්ෂණ කොට ඇත්තේය. පහර ලත් සර්පයකු වැනිය, සිරුර පුරා පැතිර යාම කෘත්‍ය කොට ඇත්තේය. විස පැහැරීම මෙනි; තමාට නිශ්‍රයවූ (හෘදය වස්තුව) පවා දවන සුලුය. ලැව්ගිනි මෙනි; කෙලෙසීම වැටහීම් කාරණා කොට ඇත්තේය, අවසර ලත් සතුරකු මෙනි; ද්වේෂයට හේතු වූ වස්තුව පදනම් කොට ඇත්තේය; විෂමිශ්‍ර පල්වූ මූත්‍රයක් මෙන් දැකියයුතු වේ.

ඉස්සා යනු ඊර්ෂ්‍යා කිරීමයි, අනුන්ගේ සැපත නො-ඉවසන බව ලක්ෂණ කොට ඇත්තේය. එයම නොරුස්නා බව කෘත්‍ය කොට ඇත්තේය. එහිම දොම්නස් බව වැටහීම් කොට ඇත්තේය. මෙරමා සම්පත් පදනම් කොට ඇත්තේය. සංයෝජනයක් සෙයින් දැක්කයුතුය.

මච්ඡරිය යනු මසුරුබවයි. එය තමාට අයත්වූ හෝ ලැබෙන්නට ඇති සැප සම්පත් සැඟවීම ලක්ෂණ කොට ඇත්තේය. එම සම්පත් පරහට පොදුවීම නො-ඉවසන සුලුබව කෘත්‍ය කොට ඇත්තේය. (මෙරමාගෙන්) හැකිලෙන බව (ඇසුරු කරනු නොකැමතිබව) වැටහීම් කාරණා කොට ඇත්තේය. කටුකාකාර පැවැත්ම හෝ වැටහීම් කොට ඇත්තේය. තමා සතු සම්පත් පදනම් කොට ඇත්තේය. සිතෙහි විකෘත භාවයෙකි'යි දැකියයුතුවේ.

පිළිකුල් කටයුතු ක්‍රියාව 'කුකත' නම්, එහි ස්වභාවය කුක්කුච්ච නම්වේ. එය පසුතැවිලිවීම ලක්ෂණ කොට ඇත්තේය. කළ නොකළ දෙය පිළිබඳව තැවීම කෘත්‍ය කොට ඇත්තේය. විපිළිසරබව වැටහීම් කාරණා කොට ඇත්තේය. කළ නොපනත් කම් හෝ නොකළ යහපත් ක්‍රියා පදනම් කොට ඇත්තේය. කළ නොපනත් කම් හෝ නොකළ යහපත් ක්‍රියා පදනම් කොට ඇත්තේය. දාසත්වය සේ දැකිය යුතුය.

සෙසු සංස්කාරයන් යට කියනලද පරිද්දෙන්ම වෙතැ'යි දතයුතුය. මෙසේ මේ අට ළොස් සංස්කාරයන් ප්‍රථම දෝසමූලික අකුසල විඤ්ඤාණය හා සමග සම්ප්‍රයෝගයට යෙති'යි දතයුතුය. ප්‍රථමය හා සමග යම්සේද ද්විතීය (දෝසමූලික) විඤ්ඤාණය හා සමගද එසේමය. සසංඛාර බවද අනියතයන් අතුරෙන් ථීන මිද්ධ සම්භවයද විශේෂයි.

මෝහමූලික අකුසල විඤ්ඤාණ දෙක අතුරින් පළමුකොට විචිකිච්ඡා සම්ප්‍රයුක්තය හා සමග ඵස්සය, චේතනාය, විතක්කය, විචාරය, විරියය, ජීවිතය, චිත්තට්ඨිතිය, අහිරිකය, අනොත්තප්පය, මෝහය, විචිකිච්ඡාය යන ස්වරූප වශයෙන් ආ එකොළසද, උද්ධච්චය, මනසිකාරය යන යේවාපනක දෙකදැයි යන මේ තෙළස යෙදේ. එහි චිත්තට්ඨිති යනු ප්‍රවෘත්තිමාත්‍රවූ දුර්වල සමාධියයි.

පිළියම් කරනු කැමැති බවින් තොරවූහයි විචිකිච්ඡා නම්. එය සැකය ලක්ෂණ කොට ඇත්තේය. සසල බව කෘත්‍ය කොට ඇත්තේය. නිශ්චය රහිත බව වැටහීම් කොට ඇත්තේය. නොයෙක් අතට වැනෙනසුලු බව හෝ වැටහීම් කොට ඇත්තේය. මේ විචිකිච්ඡාව අයෝනිසෝමනසිකාරය පදනම් කොට ඇත්තේය. සම්‍යක් ප්‍රතිපත්තියට අන්තරායකරවෙති'යි දතයුතුය. සෙසු සංස්කාරයෝ කියනලද පරිදිම වෙති.

උද්ධච්ච සම්ප්‍රයුක්ත (මෝහ මූලික චිත්ත)ය හා සමග විචිකිච්ඡා සම්පයුත්තයෙහි කියනලද සංස්කාරයන් අතුරෙන් එම විචිකිච්ඡාව හැර සෙසු දොළස යෙදේ. මෙහිදී වනාහි විචිකිච්ඡාව නොවීමෙන් අධිමොක්ඛය උපදියි. එය හා සමග තෙළසක්ම වේ. අධිමොක්ඛ සහිත බැවින් බලවත් සමාධිය වේ. මෙහි යම් උද්ධච්චයක් වේනම් එය ස්වරූප වශයෙන්ම ආයේය. අධිමොක්ඛය, මනසිකාරය යන දෙක යේවාපනක වශයෙන් ආයේය. මෙසේ අකුසල සංස්ඛාරයන් දතයුතුයි.

අබ්‍යාකත සංස්කාරයන් අතුරෙන් පළමුකොට විපාක අබ්‍යාකතයෝ අහේතුක සහේතුක භේදයන් ද්විවිධ වෙති. ඔවුනතුරෙන් අහේතුක විපාක විඤ්ඤාණයෙන් යුක්තවූවාහු අහේතුකයෝය. එහි පළමුකොට කුසල-අකුසල-විපාක-චක්ඛු විඤ්ඤාණයෙන් යුක්ත-වූවාහු ඵස්සය, චේතනාය, ජීවිතය, චිත්තට්ඨිතිය යන ස්වරූප වශයෙන් ආ සතරද, යේවාපනක වශයන් ආ මනසිකාරයදැ'යි පසෙක් වෙති. සෝත-ඝාණ-ජිව්හා-කාය-විඤ්ඤාණයන්ගෙන් යුක්තවූවාහුද මොහුය.

විපාක මනෝධාතු (සම්පටිච්ඡන) සිත් දෙකෙහි මෙකී පසද, විතක්කය, විචාරය, අධිමොක්ඛය යන තුනදැ'යි සංස්කාරයෝ අටෙක් වෙති. ත්‍රිවිධ වූම අහේතුක මනෝවිඤ්ඤාණධාතු (සන්තීරණ) විෂයයෙහිද එසේය. මෙහි වනාහි සෝමනස්ස සහගතවූ යම් අහේතුක

මනෝවිඤ්ඤාණ ධාතුවක් වේද, එය හා සමග පීතිය අධික වෙති'යි දතයුතුය. සහේතුක විපාක විඤ්ඤාණයන් යුක්තවූවාහු සහේතුකයෝය. ඔවුනතුරෙන් පළමුකොට, අෂ්ටකාමාවචර විපාක සහිත වූවාහු අෂ්ට කාමාවචර කුසල විඤ්ඤාණයන් හා සමග යෙදුණු සංස්කාරයන් හා සදෘශ වෙත්මය. අනියතයන් අතුරෙන් වනාහි යම් කරුණාය, මුදිතාය යන දෙකක් ඇත්ද, ඒ දෙක සත්‍වයන් අරමුණුකොට ඇති හෙයින් විපාක සිත් අතර නොවෙති. කාමාවචර විපාකයෝ වූකලී ඒකාන්ත වශයෙන් පරිත්තාරම්මණ සහිතයෝය. කරුණා-මුදිතා යන දෙක පමණක් නොව විරතීහුද විපාකයන් අතර නොවෙති. පංච ශික්‍ෂාපදයන් කුසලම වෙති'යි කියනලදී.

රූපාවචර-අරූපාවචර-ලෝකෝත්තර විපාක විඤ්ඤාණයෙන් යුක්ත සංස්කාරයෝ, පිළිවෙළින් එම (රූපාවචර, අරූපාවචර හා ලෝකෝත්තර) කුසල විඤ්ඤාණයන් හා සමග යෙදුණු සංස්කාරයන් හා සදෘශ වෙති.

කිරිය අබ්‍යාකත සංස්කාරයෝද අහේතුක-සහේතුක භේද වශයෙන් ද්විවිධ වෙති. ඔවුන'තුරෙන් අහේතුක කිරිය විඤ්ඤාණයෙන් යුක්ත වූවාහු අහේතුකයෝය. තවදු ඔවුහු කුසල විපාක මනෝධාතුය. අහේතුක මනෝවිඤ්ඤාණධාතුද්වයය යන මොවුන් හා සමග යෙදුණු සංස්කාරයන් හා සමාන වෙති. මනෝවිඤ්ඤාණධාතුද්වයයෙහි වනාහි වීර්යය අධික වේ. තවද වීර්යය පවත්නා හෙයින් බලවත්වූ සමාධියද වේ. මේ මෙහි විශේෂයි.

සහේතුක කිරිය විඤ්ඤාණයෙන් යුක්තවූවාහු සහේතුකයෝය. ඔවුන'තුරෙන් පළමුකොට අෂ්ට කාමාවචර කිරිය චිත්තයන් හා සමග යෙදුණු සංස්කාරයෝ, විරති තුන හැර, අෂ්ට කාමාවචර කුසල චිත්තයන් හා සමග යෙදුණු සංස්කාරයන් හා සමාන වෙති. රූපාවචර-අරූපාවචර කිරිය චිත්තයන් හා සමග යෙදුණු සංස්කාරයෝ වනාහි සකලාකාරයෙන්ම එම (රූපාවචර-අරූපාවචර) කුසල චිත්තයන් හා සමග යෙදුණු සංස්කාරයන් හා සදෘශ වෙත්මය. මෙසේ අව්‍යාකත සංස්කාරයන්ද දතයුතුය.

මේ සංස්කාර ස්කන්ධයෙහි විස්තර කථා මාර්ගයයි.

——//——

මේ වනාහි අභිධර්මයෙහි පදභාජනීයක්‍රමයට අනුව ස්කන්ධයන් පිළිබඳ විස්තර කථාමුඛයයි:- භාග්‍යවතුන් වහන්සේ විසින්, ''අභ්‍යන්තර හෝ බාහිරවූ, ඖළාරික හෝ සියුම්වූ, ලාමක හෝ ප්‍රණීතවූ, දූරස්ථ හෝ

සමීපස්ථවූ, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න යන කාලත්‍රයයට අයත් යම් කිසි රූප කොටසක් වේද, ඒ සියල්ල එක්කොට, පිඬු කොට, මේ 'රූපස්කන්ධය'යිද, යම්කිසි වේදනා කොටසක්වේද-පෙ-යම්කිසි සඤ්ඤා කොටසක් වේද-පෙ- යම්කිසි සංස්කාර කොටසක් වේද -පෙ- යම් කිසි විඤ්ඤාණ කොටසක් වේද, ඒ සියල්ල එක්කොට, පිඬු කොට, 'මේ විඤ්ඤාණ ස්කන්ධයයිද කියනු ලැබෙති''යි යනුවෙන් මෙසේ සකන්ධයෝ විස්තර කරන ලද්දාහුය. (යංකිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා, ඔළාරිකං වා සුඛුමං වා, හීනං වා පණීතං වා, යං දූරෙ සන්තිකෙ වා තදෙකජ්ඣං අභිසංයුහිත්වා, අභිසඞ්ඛිපිත්වා 'අයං වුච්චති රූපක්ඛන්ධො', යාකාචි වේදනා-පෙ- යාකාචි සඤ්ඤා -පෙ-යෙ කෙචි සංඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගත පච්චුප්පන්නං -පෙ- අභිසඞ්ඛිපිත්වා 'අයං වුච්චති විඤ්ඤාණක්ඛන්ධො'ති)[a]

එහි 'යං කිඤ්චි' යනුවෙන් නිරවශේෂ ග්‍රහණය (කිසිවක් නොහැර මුළුමනින් ගැනීම) වේ; 'රූපං' යනුවෙන් අතිප්පසංග නියමනය (සෙසු පදාර්ථයන්ගෙන් වෙන්කොට අභිප්‍රේත පදාර්ථය නියම කිරීම)වේ. මෙසේ මේ (යඞකිඤ්චි රූපං යන) පද දෙකින් නමුදු රූප පදාර්ථයෙහි අතීතාදී විනිශ්චයය අරඹයි. එය වනාහි අතීතයෙහි වූ කිසිවක්, අනාගතයෙහි වන්නාවූ කිසිවක් යන ආදී විශේෂයයි; වේදනා ආදී තන්හිද මෙම නයයි.

එහි, පළමුකොට රූපය අද්ධාය, සන්තතිය, සමයය, ඛණය යනුවෙන් සිවු ආකාරයෙකින් අතීත නම්වේ. අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයද එසේය. එහි පළමු කොට අධ්ව වශයෙන් ගතහොත්, එක් පුද්ගලයකුගේ එක් භවයෙක්හි ප්‍රතිසන්ධියෙන් පෙරවූයේ අතීතයි, ච්‍යුතියෙන් මත්තෙහි වනුයේ අනාගතයි, ප්‍රතිසන්ධි-ච්‍යුති යන දෙකට අතර වනුයේ ප්‍රත්‍යුත්පන්නයි.

සන්තති වශයෙන්, සමානවූ හෝ එක්මවූ ඍතුගුණයෙන් හටගත්තාවූද, එක්මවූ ආහාරයෙන් හටගත්තාවූද රූපය, පෙර පසු වශයෙන් පවත්නේ නමුදු ප්‍රත්‍යුත්පන්න වේ; ඉන් පෙර අසමාන වූ ඍතු ගුණයෙන් හා ආහාරයෙන් හටගත් රූපය අතීතවේ; පසුව වනුයේ අනාගත වේ. චිත්තජ රූපය ගතහොත්, එක් චිත්ත වීථියෙක්හි, එක් ජවනයෙක්හි, එක් සමවතෙක්හි හටගත්තේ ප්‍රත්‍යුත්පන්නයි. ඉන් පෙර වූයේ අතීතයි, ඉන් පසුව වනුයේ අනාගතයි. කර්මජ රූපයට සන්තති වශයෙන් එකක් එකක් පාසා අතීතාදි භේදයක් නැත. ඍතු-ආහාර-චිත්ත යන මෙයින් හටගන්නා එම රූපයන්හට උපස්ථම්භක වශයෙන් එම කම්මසමුට්ඨානික රූපය පිළිබඳ අතීත බව ආදිය දත යුතුය.

---

a. විභඞ්ග පාළි - ඛන්ධ විභඞ්ග සුත්තන්ත භාජනීය

සමය වශයෙන්,එක් මොහොතක්ය. පෙරවරුය, පස්වරුය, රැයය, දහවලය යන ආදී කාලනියමයෙහි නිරන්තර වශයෙන් පවත්නා කාලය ප්‍රත්‍යුත්පන්න වේ. ඉන් පෙර කාලය අතීතයි, පසුව එන කාලය අනාගතයි.

ඛණ වශයෙන් උත්පාද ආදී ක්‍ෂණත්‍රයයට අයත්රූපය ප්‍රත්‍යුත්පන්නයි. ඉන්පෙර එය අතීතයි. පසුව අනාගතයි. තවද ඉකුත්වූ හේතුකෘත්‍ය-ප්‍රත්‍යය කෘත්‍ය සහිත වූයේ අතීතයි. නිමි හේතු කෘත්‍යය හා නොනිමි ප්‍රත්‍යය කෘත්‍යය ඇති රූපය ප්‍රත්‍යත්පන්නයි. උභය කෘත්‍යයන්ම නොසැපයුණ රූපය අනාගතයි; නොහොත් ස්වකෘත්‍යය කැරෙමින් පවත්නා කෙණෙහි ප්‍රත්‍යුත්පන්නයි. එයින් පෙර එය අතීතයි. පසුව අනාගතයි.

මෙහි 'ඛණ' යනුවෙන් ඇරඹෙන කථාමාර්ගයම නිෂ්පර්යාය හෙවත් ඒකාන්ත අර්ථ සහිත වේ. සෙසු (අද්ධා, සන්තති, සමය යන) තුන සපර්යාය හෙවත් සාපේක්‍ෂාර්ථ සහිත වේ.

අජ්ඣත්ත - බහිද්ධා භේදය යට කී නයම වේ. තවද මෙහි අජ්ඣත්ත යනු තමා පිළිබඳ (රූපාදී) අජ්ඣත්තයයිද, බහිද්ධා යනු මෙරමා පිළිබඳ රූපාදියයිද දතයුතුය. ඕළාරික-සුඛුම (දැඩි, සියුම්) භේදයද යටකී නයම වේ.

හීන-ප්‍රණීත භේදය සප්පරියාය (සාපේක්‍ෂක) වශයෙන් හා නිප්පරියාය (ඓකාන්තික) වශයෙන් ද්විවිධ වේ. එහි අකනිට්ඨා වැස්සන්ගේ රූපයට වඩා සුදස්සී වැස්සන්ගේ රූපය හීන වේ. එයම සුදස්ස වැස්සන්ගේ රූපයට වඩා ප්‍රණීත වේ. මේ ආකාරයෙන් නිරය වාසීන්ගේ රූපය දක්වා සාපේක්‍ෂ වශයෙන් හීන-ප්‍රණීතතාව වෙතැ'යි දතයුතුය. නිප්පරියාය (ඓකාන්තික) වශයෙන් වනාහි, යම් තැනෙක්හි අකුසල විපාකය සිදුවේද එය හීන වේ. යම් තැනෙක්හි කුසල විපාකය වේද එය ප්‍රණීත වේ.

දූරෙ සන්තිකෙ යන මෙයද යටකී නයම වේ. තවද අවකාශ වශයෙන්ද ගෙන මෙහිදී දූර-සන්තිකතාව දතයුතුය.

තදෙකජ්ඣං අභිසංයූහිත්වා අභිසඞ්ඛරිත්වා යනු, අතීතාදී පදවලින් වෙන් වෙන් වශයෙන් දක්වනලද සකලාකාර වූම රූපය රුප්පන ලක්‍ෂණ සංඛ්‍යාත වූ ඒකවිධ භාවයෙන් ප්‍රඥාවෙන් එක් රැස්කොට රූපස්කන්ධයයි කියනු ලැබේ' යනු මෙහි අර්ථයයි. මෙයින් සකල විධවූම රූපය විනාශවීමේ ලක්‍ෂණය රාශීභූත බවට යාමෙන් රූපස්කන්ධයයි දක්වන ලද්දේවේ. එම රූපය හැරඅනෙක් රූපස්කන්ධයෙක් නම් නැත්තේය.

රූපය මෙන්ම වේදනාදියද වේදයිත ලක්‍ෂණාදිය තුළ රාශීභූත වීමෙන් වේ. වේදනාදියෙන් බැහැරවූ වේදනාස්කන්ධ ආදියෙක් නැත. මෙහි අතීතාදීවූ විභාගයෙහිදී වනාහි සන්තති වශයෙන් හා ඛණාදී වශයෙන්ද වේදනාව පිළිබඳ අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න භාවය දතයුතුය.

එහි සන්තති වශයෙන් එක් චිත්ත වීථියකට, එක් ජවනයකට, එක් සමවතකට පත්වූද, එක සමාන විෂය සංයෝගයකට පැමිණියාවූද වේදනාව ප්‍රත්‍යුත්පන්න වේ. ඉන් පෙර වූයේ අතීතද පසුව වනුයේ අනාගත වේ.

ක්‍ෂණාදී වශයෙන් (උත්පාද, ස්ථිති-භංග යන) ක්‍ෂණත්‍රයයට පත්වූද, පූර්වාන්තයට, අපරාන්තයට හා මධ්‍යයට පැමිණියාවූද, ස්වකෘත්‍යය කරන්නාවූද, වේදනාව ප්‍රත්‍යුත්පන්න වේ. එයින් පෙර වූයේ අතීතද පසුව වනුයේ අනාගතද වේ.

අජ්ඣත්ත-බහිද්ධා භේදය, තමා පිළිබඳ අධ්‍යාත්ම වශයෙන් දතයුතුය. ඕළාරික-සුඛුම භේදය 'අකුශල වේදනාව ඕළාරික වේ. කුශල වේදනාව හා අව්‍යාකෘත වේදනාව සුඛුම වේ' ආදී නයින් විභඞ්ගයෙහි කියන ලද ජාති, ස්වභාව, පුද්ගල, ලෞකික හා ලෝකෝත්තර වශයෙන් දතයුතුය. පළමුකොට ජාතිවශයෙන් ගතහොත්, අකුසල වේදනාව සාවද්‍ය ක්‍රියා හේතුවෙන්ද, ක්ලේශ සන්තාප භාවයෙන්ද, අශාන්ත වෘත්ති ඇත්තේයයිද කුශල වේදනාවට වඩා ඕළාරික වේ. ව්‍යාපාර සහිත බැවින්ද, උත්සාහ සහිත බැවින්ද, විපාක සහිත බැවින්ද ක්ලේශ පරිදාහ සහිත බැවින්ද, සාවද්‍ය-බැවින්ද විපාක අව්‍යාකෘත-වේදනාවට වඩා ඔළාරික වේ. විපාක සහිත බැවින්ද, ක්ලේශ පරිදාහ සහිත බැවින්ද, සාවද්‍ය බැවින්ද පීඩා සහිත බැවින්ද, සාවද්‍ය බැවින්ද කිරිය අව්‍යකෘතයට වඩා ඕළාරිකවේ.

කුසල වේදනාව හා අව්‍යාකෘත වේදනාව කියනලද අකුසල වේදනාව විපරීත හෙයින් අකුසල වේදනාවට වඩා සුඛුම වේ. කුසල වේදනා හා අකුසල වේදනා යන දෙකම ව්‍යාපාර සහිත බැවින්ද, උත්සාහ සහිත බැවින්ද, විපාක සහිත බැවින්ද (විපාක-කිරියය යන) ද්විප්‍රකාරවූම අව්‍යාකෘත වේදනාවට වඩා ඕළාරික වේ. කියනලද (කුසල-අකුසල) වේදනාවනට විපරීත වශයෙන් ද්විප්‍රකාර වූම අව්‍යාකෘත වේදනාව (එම කුසල-අකුසල වේදනාවනට වඩා) සූක්‍ෂම වේ. මෙසේ ජාති වශයෙන් ඕළාරික හා සුඛුම බව දතයුතුය.

ස්වභාව වශයෙන් වනාහි දුක්ඛ වේදනාව ආස්වාද රහිත බැවින්ද, පැතිරීම් සහිත බැවින්ද, කැළඹීම් ඇති කරන හෙයින්ද, උද්වේග ඇති කරන හෙයින්ද, මැඩලන හෙයින්ද (සුඛ, උපේක්‍ෂා යන) වේදනා දෙකට වඩා ඕළාරික වේ. අන්‍යවූ (සුඛ, උපේක්‍ෂා යන) වේදනා දෙක මිහිරි බැවින්ද. සන්හුන් බැවින්ද, ප්‍රණීත බැවින්ද, මැදහත් බැවින්ද, දුඃඛ වේදනාවට වඩා යෝග්‍ය ප්‍රමාණයෙන් සූක්‍ෂම වේ. සුඛවේදනා, දුඃඛ වේදනා යන දෙක වනාහි පැතිරීම් සහිත බැවින්ද, කැළඹීම් ඇති කරන

බැවින්ද, ප්‍රකට බැවින්ද උපේක්‍ෂා වේදනාවට වඩා ඕළාරික වේ. ඒ උපේක්‍ෂා වේදනාව මෙකී (සුඛ, දුඃඛ යන) දෙකට විපරීත වන ආකාරයෙන් වඩා සූක්‍ෂ්ම වේ. මෙසේ ස්වභාව වශයෙන් ඕළාරික බව හා සූක්‍ෂ්ම බව දතයුතුය.

පුද්ගල වශයෙන් වනාහි (සමවතට) නොසමවන්නහුගේ වේදනාව නොයෙක් නොයෙක් අරමුණු කෙරෙහි විසුරුණු බැවින් සමවන්නහුගේ වේදනාවට වඩා ඕළාරික වේ. එයට විපරීත වන හෙයින් අනෙක (සමවන්නහුගේ වේදනාව) සූක්‍ෂ්ම වේ. මෙසේ පුද්ගල වශයෙන් ඕළාරික-සූක්‍ෂ්ම භේදය දතයුතුය.

ලෞකික ලෝකෝත්තර වශයෙන් වනාහි ආශ්‍රව සහිත වේදනාව ලෞකික වේ. එය ආශ්‍රවයන් ඉපැදීමට හේතුවන බැවින්ද, (කාම, භව,) දිට්ඨි, අවිජ්ජා යන) චතුරෝඝනයට හසු වියහැකි බැවින්ද, බැඳීම්වලට හසුවියහැකි වන බැවින්ද, කෙලෙස් ගැටවල පැටලිය හැකි වන හෙයින්ද, නීවරණයනට ගොදුරු වියහැකි බැවින්ද, උපාදානයට හසුවියහැකි බැවින්ද, සංක්ලේශ සහිත බැවින්ද, පෘථග්ජනසාධාරණ බැවින්ද ආශ්‍රවරහිත වේදනාවට වඩා ඕළාරික වේ. ඒ (ආශ්‍රව රහිත) වේදනාව විපරීත වශයෙන් ආශ්‍රව සහිත වේදනාවට වඩා සූක්‍ෂ්ම වේ. මෙසේ ලෞකික-ලෝකෝත්තර වශයෙන් ඕළාරිකසූක්‍ෂ්ම භේදය දතයුතුය.

එහි ජාති ආදී වශයෙන් (ඕළාරික බව හා සූක්‍ෂ්ම බව පිළිබඳව) ඇතිවිය හැකි අවුල වැලැක්විය යුතුය. අකුසල විපාක කායවිඤ්ඤාණ සම්ප්‍රයුක්ත වේදනාව වනාහි ජාති වශයෙන් අව්‍යාකෘත වන හෙයින් සූක්‍ෂ්ම වතුදු ස්වභාවාදී වශයෙන් ගත්කල ඕළාරික වේ. කියනලදමැයි:- ''අව්‍යාකෘත වේදනාව සූක්‍ෂ්ම වේ. දුඃඛ වේදනාව ඕළාරිකවේ. සමවන්නහුගේ වේදනාව සූක්‍ෂ්ම වේ. අසමාපන්නයාගේ වේදනාව ඕළාරික වේ. අනාශ්‍රව වේදනාව සූක්‍ෂ්ම වේ. සාශ්‍රව වේදනාව ඕළාරිකවේ. (අව්‍යාකතා වෙදනා, සුඛුමා, දුක්ඛා වෙදනා ඕළාරිකා, සමාපන්නස්ස වෙදනා සුඛුමා, අසමාපන්නස්ස වේදනා ඔළාරිකා, අනාසවා වේදනා සුඛුමා, සාසවා වෙදනා ඔළාරිකා'')[a] දුඃඛ වේදනාව මෙන්ම සුඛ වේදනාදියද ජාතිවශයෙන් ඕළාරික වේ. ස්වභාවාදී වශයෙන් සූක්‍ෂ්ම වේ. එහෙයින් යම්සේ ජාති ආදී වශයෙන් අවුලක් නොවේද, එසේ වේදනාවන්ගේ ඕළාරික බව හා සූක්‍ෂ්ම බව දතයුතුය. ඒ මෙසේයි:-

ජාතිවශයෙන් ගත්කල, කුසල වූද අකුසලවූද වේදනාවට වඩා අව්‍යාකත වේදනාව සියුම් වේ යන මේ කරුණෙහිලා, කවර නම් අව්‍යාකත වේදනාවද? සුඛ වේදනාවද? දුඃඛ වේදනාවදැ'යි (ස්වභාව වශයෙන්) හෝ සමාපන්නයාගේ වේදනාවද? අසමාපන්නයාගේ වේදනාවදැ'යි

---

a. විභඞ්ගපාළි, ඛන්ධ විභඞ්ග සුත්තන්ත භාජනීය

(පුද්ගල වශයෙන්) හෝ, සාසව වේදනාවද? අනාසව වේදනාවදැ'යි (ලෞකික-ලෝකෝත්තර වශයෙන්) හෝ ඕළාරික-සුඛුම භේදය නොසැලකියයුතුය. සියලු තන්හිම මෙම නයයි.

තවදː- ''ඒ ඒ වේදනාව ඒ ඒ ආකාරයෙන් (වෙන් වෙන්ව) ගෙන ඕළාරික හෝ සූක්ෂ්ම වෙති'යි දතයුතුය''[a]යි (තං තං වා පන වේදනං උපාදායුපාදාය වෙදනා ඔළාරික සුඛුමා දට්ඨබ්බා) යයි කී හෙයින් අකුසල වේදනාදිය අතුරෙන්ද ද්වේෂ සහගත වේදනාව ගිනි මෙන් තමා ඇසුරෙහි වූ දෙය (හෘදය පවා) දවන හෙයින් ලෝභසහගත වේනාවට වඩා ඕළාරික වේ; ලෝභසහගත වේදනාව (ද්වේෂ සහගත වේදනාවට වඩා) සුඛුම වේ.

ද්වේෂ සහගත වේදනාවන් අතුරෙනුදු නියත වේදනාව ඕළාරිකද අනියත වේදනාව සුඛුමද වේ; නියතයන් අතුරෙනුදු කල්පයක් විපාක දෙන (ද්වේෂ සහගත) වේදනාව ඕළාරික ද, අනෙක සුඛුමද වේ.

ලෝභ සහගත වේදනා විෂයෙහිද, දිට්ඨිසම්පයුත්ත වේදනාව ඕළාරිකද අනෙක (දිට්ඨිගත විප්පයුත්ත) සුඛුමද වේ. එයද නියත වූයේ, කප්පට්ඨිතික වූයේ, අසංඛාරික වූයේ, ඕළාරිකද එසේ නොවූයේ සුඛුමද වේ. අවිශේෂයෙන් ගත හොත්, බොහෝ විපාක සහිත අකුසල වේදනාව ඕළාරිකද, මදවිපාක සහිත වේදනාව සුඛුමද වේ. කුසල වේදනාව වනාහි මඳවිපාක සහිත වූයේ ඕළාරිකද, බොහෝ විපාක සහිත වූයේ සුඛුමද වේ.

තවද, කාමාවචර කුසල වේදනාව (රූපාවචරයට) වඩා ඕළාරිකද, රූපාවචර වේදනාව (කාමාවචරයට වඩා) සියුම්ද වේ, එයට වඩා අරූපාවචර වේදනාවද, එයටද වඩා ලෝකෝත්තර වේදනාවද සියුම් වේ. කාමාවචර කුසල වේදනාවන් අතුරෙන් දානමය වූයේ (ශීලමය වේදනාවට වඩා) ඕළාරික වේ. ශීලමය වූයේ එයට වඩා සියුම් වේ; භාවනාමය වූයේ එයටද වඩා සියුම්වේ. භාවනාමය කුසල වේදනාවන් අතුරෙන්ද ද්විහේතුක වූයේ ත්‍රිහේතුකයට වඩා ඕළාරිකද ත්‍රිහේතුක වූයේ වඩා සියුම්ද වේ. ත්‍රිහේතුක කුසල වේදනාවන් අතුරෙන්ද (අසංඛාරිකයට වඩා) සසංඛාරිකය ඕළාරිකද, (සසංඛාරිකයට වඩා) අසංඛාරිකය සියුම්වේ. රූපාවචර කුසල වේදනාවන් අතුරෙන්ද, ප්‍රථමධ්‍යානිකය (ද්විතීයධ්‍යානිකයට වඩා) ඕළාරිකද-පෙ-පඤ්චමධ්‍යානිකය සියුම්ද වේ. අරූපාවචර කුසල වේදනාවන්ගෙනුදු ආකාසානඤ්චායතන සම්ප්‍රයුක්තය ඕළාරිකද -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන සම්ප්‍රයුක්තය සියුම්ද වේ. ලෝකෝත්තර වේදනාවන් අතුරෙනුදු සෝතාපත්ති සම්ප්‍රයුක්තය -පෙ- ඕළාරිකද -පෙ- අරහත්ත මග්ග සම්ප්‍රයුක්තය සියුම්ද වේ. භූමි, විපාක,

a. විභඞ්ගපාළි, ඛන්ධ විභඞ්ග සුත්තන්ත භාජනීය

කිරිය යන වේදනාවන් විෂයෙහිද, දුඃඛාදී වශයෙන්, අසමාපන්නාදී වශයෙන් හා සාසවාදී වශයෙන් කියන ලද ඒ ඒ වේදනාවන් පිළිබඳ මෙම නයයි.

අවකාශ වශයෙන්ද නිරයෙහි දුඃඛවේදනාව ඕළාරිකද, තිරිසන් යෝනියෙහි (දුඃඛ වේදනාව) එයට වඩා සියුම්ද -පෙ- පරනිර්මිත වශවර්තී ලෝකයෙහි (වේදනාව) සියුම්ද වේ. දුඃඛ වේදනාව මෙන්ම සුඛවේදනාවද සියලු තන්හි සුදුසු පරිදි යොදාගතයුතුය.

රූපාදී වස්තු වශයෙන්ද, යම්කිසි වේදනාවක් හීන වස්තුවක් අරමුණු කොට ඇතිවේනම්, එය ඕළාරිකද, ප්‍රණීත වස්තුවක් අරමුණු කොට ඇති වේනම් එය සුඛුමද වේ. හීන ප්‍රණීත භේදයෙහිලා යම්කිසිවක් ඕළාරික වේනම්, එය හීනයයිද යම්කිසිවක් සියුම් වේනම් එය ප්‍රණීතයයිද දතයුතුය. (ඉහත දක්වන ලද විභඞ්ගපාළි පාඨයෙහි) දූරෙ යන පදය වනාහි අකුසල වේදනාව කුසල-අව්‍යාකත වේදනාවන්ගෙන් දුරෙහි වෙතැ'යිද, සන්තිකෙ යන පදය අකුසල වේදනාව අකුසල වේදනාවෙන් නුදුරෙහි වෙතැයිද යන ආදී නයින් විභඞ්ගයෙහි බෙදා දක්වා ඇත. එහෙයින් අකුසල වේදනාව කුසල-අව්‍යාකත වේදනාවන්ගෙන් විසදෘශ වීම් වශයෙන්ද, නොගැලපීම් වශයෙන්ද, විෂම වීම් වශයෙන්ද දුරෙහි වේ. එසේම කුසල-අව්‍යාකත වේදනා දෙක අකුසල වේදනාවෙන් දුරෙහි වේ; සියලු තන්හි මෙම නයයි. අකුසල වේදනාව අකුසල වේදනාව සදෘශ වීම් වශයෙන්ද, ගැලපීම් වශයෙන්ද, සමවීම් වශයෙන්ද නුදුරෙහි වේ.

මේ වේදනා ස්කන්ධයෙහි අතීතාදී විභාග පිළිබඳ විස්තර කථායි.

—//—

වේදනාව හා සමග යෙදුණ ඒ ඒ විස්තරය සඤ්ඤා ආදි සෙසු ස්කන්ධයන් හා සමගද එසේම වෙතැ'යි දතයුතුය. එසේ දැන, යළිදු,

ඛන්ධෙසු ඤාණභෙදත්ථං කමතො'ථ විසෙසතො
අනූනාධිකතො චෙව උපමාතො තථෙවච
දට්ඨබ්බතො ද්විධා එවං පස්සන්තස්සත්ථ සිද්ධිතො
විනිච්ඡයනයො සම්මා විඤ්ඤාතබ්බො විභාවිනා

ස්කන්ධයන් පිළිබඳ ඥානවිශේෂයන් ලැබීම සඳහා දේශනාක්‍රම වශයෙන්ද, විශේෂ විභාග වශයෙන්ද, අනූනාධික වශයෙන්ද, උපමාවශයෙන්ද, එසේම, දෙපරිද්දෙකින් දැකිය යුතු බව වශයෙන්ද, එසේ දක්නහුගේ අභිමතාර්ථ-සිද්ධි වශයෙන්ද මෙහි විනිශ්චය ක්‍රමය නුවණැත්තහු විසින් මනාකොට දතයුතුය.

එහි කමතො යනු, ක්‍රමය වූකලී උත්පත්ති ක්‍රමය, ප්‍රහාණක්‍රමය, ප්‍රතිපත්ති ක්‍රමය, භූමි ක්‍රමය, දේශනා ක්‍රමය'යි යන ආදී වශයෙන් බොහෝ ඇත්තේ වේ. එහි, ''පඨමං කලලං හොති කලලා හොති අබ්බුදං'' යන ආදිය උත්පත්තික්‍රමයයි; ''දස්සනෙන පහාතබ්බා ධම්මා, භාවනාය පහාතබ්බාධම්මා'' යන ආදිය ප්‍රහාණ ක්‍රමයයි; ''සීලවිසුද්ධි, චිත්ත විසුද්ධි'' යන ආදිය ප්‍රතිපත්ති ක්‍රමයයි; ''කාමාවචරා, රූපාවචරා'' යන මේ ආදිය භූමික්‍රමයයි; ''චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා'' යන මේ ආදිය නැතහොත්, ''දාන කථං, සීල කථං'' යන ආදිය දේශනා ක්‍රමයයි. මේ ක්‍රමයන් අතුරෙන් ප්‍රථමය වූ උත්පත්ති ක්‍රමය මෙහි නොයෙදේ; කලලාදිය මෙන් ස්කන්ධයන් පෙර-පසු නියමයෙන් නො-උපදාන හෙයිනි. ප්‍රහාණ ක්‍රමයද නොයෙදේ. කුසල-අව්‍යාකතයන් ප්‍රහීණ කළයුතු නොවන හෙයිනි. ප්‍රතිපත්ති ක්‍රමයද නොයෙදේ. අකුසලයන් නොපිළිපැදිය යුතුවන හෙයිනි. භූමික්‍රමයද නොයෙදේ. වේදනා ආදිය චතුර්භූමියටම සාමාන්‍ය වන හෙයිනි.

දේශනා ක්‍රමය වනාහි යෙදේමැයි, පංච ස්කන්ධයන් විභාග කොට ගනු නොහැකි වීමෙන් එම ස්කන්ධයන් කෙරෙහි ආත්මග්‍රාහයට වැටුණ කිසියම් වෛනේය ජන කෙනකු වෙතොත්, ඔවුන් කෙරෙහි හිත කැමැතිව, දැඩි ලෙස එක්ව බැඳුණු එම ස්කන්ධ සමූහය විග්‍රහ කොට දැක්වීමෙන් එම ආත්මග්‍රාහයෙන් මුදවා ලනු කැමැති භාග්‍යවතුන් වහන්සේ, ඒ ඒ ජනයාගේ සුඛග්‍රහණය සඳහා චක්ෂුරාදියට පවා විෂය වන ඖළාරික රූපස්කන්ධය පළමුකොට දේශනා කළ සේක. ඉක්බිති ඉෂ්ටානිෂ්ට රූපයන් පිළිබඳ සංවේදන සංඛ්‍යාත වේදනාස්කන්ධයද, ''යමක් විඳිතොත් එය හඳුනාගනිති'යි මෙසේ වේදනාවිෂය පිළිබඳ ආකාරය ගන්නා සඤ්ඤා ස්කන්ධයද, සඤ්ඤා වශයෙන් රැස්කරනු ලබන චෛතසික සංස්කාරයන්ද, එම වේදනාදියට නිශ්‍රයවූ ඔවුනට අධිපතිවූ විඤ්ඤාණ ස්කන්ධයද දේශනා කළ සේක. මෙසේ අනුපිළිවෙළින් ස්කන්ධයන් පිළිබඳ විනිශ්චය ක්‍රමය දතයුතුය. විසෙසතො (විශේෂ වශයෙන්) යනු, ස්කන්ධයන්ගේ හා උපාදානස්කන්ධයන්ගේ විශේෂ වශයෙනි. ඔවුන්ගේ විශේෂය කවරේද? පළමුව ස්කන්ධයෝ අවිශේෂයෙන් කියන ලද්දාහුය. උපාදානස්කන්ධයෝ ආශ්‍රව සහිත බවින් හා උපාදානීය බවින් විශේෂ කොට කියන ලද්දාහුය. කියනලදමැයිඃ- ''මහණෙනි, ඔබට පඤ්චක්ඛන්ධයන්ද පඤ්ච උපාදානක්ඛන්ධයන්ද දේශනා කරමි. එය අසනු. -පෙ-මහණෙනි, පංච ස්කන්ධයෝ කවරහුද? අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ -පෙ- නුදුරෙහි හෝ වූ යම් කිසි රූපයක් වේනම්, මෙය රූපස්කන්ධයයි කියනුලැබේ. යම්කිසි වේදනාවක් -පෙ- යම්කිසි විඤ්ඤාණයක් වේනම්, මහණෙනි, මෙය විඤ්ඤාණස්කන්ධයයි කියනු ලැබේ. මහණෙනි මොහු පංචස්කන්ධයෝයයි කියනු ලැබෙති. මහණෙනි පංච උපාදානස්කන්ධයෝ කවරහුද? මහණෙනි, ආශ්‍රව සහිතවූද, උපාදානීය වූද, යම්කිසි රූපයක් -

පෙ- නුදුරෙහි හෝ වේනම්, මහණෙනි, මෙය රූප උපාදානස්කන්‍ධයයි කියනු ලැබේ. යම්කිසි වේදනාවක් -පෙ- යම්කිසි විඤ්ඤාණයක් නුදුරෙහි හෝ වේනම්, මහණෙනි, මෙය විඤ්ඤාණ උපාදානස්කන්‍ධයයි කියනු ලැබේ. මහණෙනි, මොහු පංච උපාදානස්කන්‍ධයයි කියනු ලැබෙති''[a]

තවද මෙහිලා ආශ්‍රව රහිතවූද වේදනාදිය ඇති නමුදු, රූපය එසේ නොවේ. යම් හෙයකින් වනාහි 'රාශි' යන අර්ත්‍ථයෙන් එයට ස්කන්‍ධභාවය යෙදේද, එහෙයින් එය (රූපය) ස්කන්‍ධ සංඛ්‍යාවෙහිලා කියනලදී. යම් හෙයකින් රාශි-අර්ත්‍ථයෙන්ද, ආශ්‍රව සහිතය යන අර්ත්‍ථයෙන්දැයි (යන උභයාර්ත්‍ථයෙන්) උපාදානස්කන්‍ධ භාවයම යෙදේද, එහෙයින් එය (රූපය) උපාදානස්කන්‍ධ සංඛ්‍යාවෙහි ලා කියනලදි. වේදනාදී (සෙසු ස්කන්‍ධ සතර) වනාහි ආශ්‍රවරහිත වූයේම ස්කන්‍ධ සංඛ්‍යාවෙහිලා කියනලදී; ආශ්‍රව සහිත වූයේ උපාදානස්කන්‍ධ සංඛ්‍යාවෙහිලා කියනලදි. තවද 'උපාදානක්ඛන්‍ධා' යන මෙහි, උපාදානයට ගෝචරවූ ස්කන්‍ධයෝ උපාදානස්කන්‍ධයෝය'යි මෙසේ අර්ත්‍ථය දතයුතුවේ. මෙහි (විසුද්ධි මග්ගයෙහි) වනාහි ඒ (සාසව වූද අනාසව වූද) සියල්ල එක් කොට 'ස්කන්‍ධ'යයි අභිප්‍රේත වේ.

අනූනාධිකතො යනුः- කවර හෙයින් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් අඩුවැඩි නැතිව ස්කන්‍ධයන් පසක්ම ප්‍රකාශ කරන ලද්දේද යත්ः- සියලු සංස්කාර ධර්මයන් එකිනෙකට ඇති පොදු ලක්‍ෂණ අනුව එක් එක් ස්කන්‍ධයට ඇතුළත් කොට සංග්‍රහ කළ හැකි හෙයින් හා 'තමාය, තමාගේය'යි ගත හැකි ඉහළම ප්‍රභේද සංඛ්‍යාව වන හෙයින්ද, ඉන් බැහැර වූ සෙසු වස්තූන්ද එයටම ඇතුළත් වන හෙයිනි. නොයෙක් ප්‍රභේද සහිතවූ සංස්කාරයන් සමාන ලක්‍ෂණ අනුව සංග්‍රහ කරනු ලබන කල්හි රූපය රූපයට අයත් පොදු ලක්‍ෂණ අනුව එක් ස්කන්‍ධයක් වෙයි. වේදනාව වේදනාවට අයත් පොදු ලක්‍ෂණ අනුව අනෙක් ස්කන්‍ධයක් වෙයි. සඤ්ඤා ආදිය පිළිබඳවද මෙම නයයි. එහෙයින් සියලු සංකාර ධර්මයන් එක් එක් සංස්කාරයට අයත් පොදු ලක්‍ෂණ අනුව සංග්‍රහ කිරීම් වශයෙන් ස්කන්‍ධපසක්ම ප්‍රකාශ කරනලදී.

තවද මෙම ඒතපරමය (උපරිම සංඛ්‍යාව) 'තමාය තමාගේය'යි ගනු ලබන රූපාදී වූ පංචකයමැයි. කියනලදමැයිः- ''මහණෙනි, රූපය විද්‍යමාන වන කල්හි, රූපය උපාදාන කොටගෙන (දැඩිව අල්වාගෙන), රූපයට පිවිස, 'මෙය මාගේය, මේ මම්ම වෙමි, මේ මාගේ ආත්මය' යන මෙවන් දෘෂ්ටියක් උපදියි. වේදනාව-පෙ-සඤ්ඤාව-පෙ- සංඛාර-පෙ- විඤ්ඤාණය විද්‍යමාන වන කල්හි, විඤ්ඤාණය උපාදාන කොටගෙන, විඤ්ඤාණය වෙත පිවිස, 'මෙය මාගේ ය, මේ මම්ම වෙමි, මේ මාගේ ආත්මයමයි' යන මෙවන් දෘෂ්ටියක් උපදියි. එහෙයින් තමාය, තමාගේය'යි

a. සං. නි. ආදිත්තවග්ග

ගත හැකි වස්තුව පිළිබඳ ඵකපරමතාව (උපරිම සංඛ්‍යාව) වශයෙන්ද පසෙක්ම කියනලදි. තවද සෙසු ශීලාදීවූ යම් ස්කන්ධ පංචකයක් කියන ලද්දේද, එයද සංස්කාර ස්කන්ධය බවට පත්වන හෙයින් මෙකී ස්කන්ධ පංචකය තුළම අන්තර්ගත බවට යෙයි. එහෙයින් එම සෙසු ස්කන්ධයන්ද මෙහිම ඇතුළත් වීමෙන් පසක්ම වෙති'යි කියනලදැ'යි මෙසේ නොඅඩු-නොවැඩි වශයෙන් විනිශ්චය ක්‍රමය දතයුතුය.

උපමාතො යනුඃ- මෙහි රූපූපාදනක්ඛන්ධය ගිලන්හලක් බඳුවේ. ගිලනකු බඳු විඤ්ඤාණ-උපාදානක්ඛන්ධයට වස්තු-ද්වාර-ආරම්මණ වශයෙන් නිවාසස්ථාන වන හෙයිනි. වේදනා-උපාදානක්ඛන්ධය ගිලන්බව වැනිය. ආබාධ ඇති කරන හෙයිනි. සඤ්ඤා-උපාදානක්ඛන්ධය ගිලන්බව ඇතිකරන රෝග කාරකය බඳුය. කාම සඤ්ඤාදී වශයෙන් රාගාදිය සමග යෙදුණ වේදනාවන් උපදවන හෙයිනි. සඞ්ඛාර-උපාදනක්ඛන්ධය අපථ්‍යසේවනය වැනිය. වේදනා නමැති ගිලන්බවට නිදාන වන හෙයිනි. වේදනාව සඳහා වේදනාව රැස් කෙරෙති'යිද, එසේම අකුසල කර්මයක් කරන ලද හෙයින්-රැස් කරන ලද හෙයින්, කාය විඤ්ඤාණවූ දුඃඛ සහගත විපාකය උපන්හ'යිද කියනලදි. විඤ්ඤාණ-උපාදානක්ඛන්ධය ගිලනකු බඳුවේ. වේදනා නමැති ගිලන් බවින් නොමිදුණ හෙයිනි.

තවද, (රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මේ උපාදාන ස්කන්ධ පඤ්චකය පිළිවෙළින්) චාරක (වධකස්ථානය), ''කාරණට්ඨානතාය චාරකූපමං රූපං-ටීකා), කාරණ (දෙතිස් වධය), අපරාධය, කාරණ-කාරක (වධකයා) අපරාධික (වරදකරු) යනුවෙන්ද, එසේම භාජන (බඳුන), භෝජන (බොජුන), ව්‍යඤ්ජන (වෑන්ජනය), පරිවේසක (බෙදන්නා), භුඤ්ජන (බුදින්නා) යනුවෙන්දැයි උපමා කළ හැකිය. මෙසේ උපමා වශයෙන් විනිශ්චය ක්‍රමය දතයුතුය.

දට්ඨබ්බතො ද්විධා යනුඃ- සංක්ෂේප වශයෙන් හා විස්තර වශයෙන්දැ'යි දෙපරිද්දෙන් මෙහි විනිශ්චය ක්‍රමය දතයුතුය. සංක්ෂේප වශයෙන් වනාහි පඤ්ච-උපාදානක්ඛන්ධය ආසීවිසූපම සූත්‍රයෙහි කීනයින් කඩුවක් ඔසවා ගත් සතුරකු සෙයින්ද, භාරසූත්‍රයෙහි කී නයින් බරක් සෙයින්ද, ඛජ්ජනීය පරියාය සූත්‍ර නයින් කන්නකු සෙයින්ද, යමක සූත්‍ර නයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මයයි කියනලද වධකයන් සෙයින්ද දතයුතුය. විස්තර වශයෙන් වනාහි මෙහි රූපස්කන්ධය පෙණ පිඩක් බඳුයයි දතයුතුය. අත තැබූ කෙණෙහි බිඳෙන සුලු හෙයිනි. වේදනාස්කන්ධය දියබුබුලක් සෙයින් දතයුතුය. මොහොතක් රමණීය වන හෙයිනි. සඤ්ඤා ස්කන්ධය මිරිඟුවක් සෙයින් දතයුතුය, රවටන සුලු හෙයිනි. සංඛාරයන් කෙසෙල් කඳන් සෙයින් දැකිය යුතුය. හරයක් නොමැති හෙයිනි. විඤ්ඤාණ ස්කන්ධය මායාවක් සෙයින් දැකිය යුතුය. වංචාකාරී හෙයිනි.

විශේෂයෙන් ඉතා සොඳුරු වූද අභ්‍යන්තර රූපය අසුබයයි දතයුතුය. වේදනාස්කන්ධය ත්‍රිවිධ දුඃඛස්වභාවයෙන් නොමිඳුණ හෙයින් දුකෙකැ'යිද, සඤ්ඤා සංඛාර යන දෙක තමා වශයෙහි තබාගත නොහැකි වන හෙයින් අනාත්මය'යිද, විඤ්ඤාණය ඇතිව නැතිවන ස්වභාව වූ හෙයින් අනිත්‍යය'යිද දතයුතුය.

එවං පස්සනතස්ස අත්ථසිද්ධිතො යනුඃ- මෙසේ සංක්ෂේප වශයෙන් හා විස්තර වශයෙන් බලන්නහුට යම් අර්ත්ථසිද්ධියක් වන්නේද, ඒ ආකාරයෙන්ද මෙහි විනිශ්චය ක්‍රමය දතයුතුය. කෙසේද යත්ඃ- පළමුකොට සංක්ෂේප වශයෙන් පංච-උපාදානස්කන්ධය පිළිවෙළින් කඩු ඔසවා ගත් සතුරකු ආදී වශයෙන් බලන්නහු ස්කන්ධයන් විසින් රවටනු නොලබයි, විස්තර වශයෙන් වනාහි රූපාදිය පෙණ පිඬු ආදිය හා සමාන කොට දක්නේ අසාරයන් විෂයයෙහි සාරදර්ශී නොවේ. විශේෂයෙන් අභ්‍යන්තර රූපස්කන්ධය අසුබ ලෙස බලන්නේ කබලිංකාර ආහාරය මැනවින් හඳුනාගනියි; අසුබයන් විෂයයෙහි සුබය යන හැඟීම අත්හරියි, කාම නමැති ඕඝය තරණය කරයි. කාමයෝගයෙහි නොයෙදෙයි. කාමාශ්‍රවයෙන් මිදුණේ වෙයි. අභිජ්ඣා කාය ගන්ථය (විෂම ලෝභය) සිඳලයි. කාමය උපාදාන කොට නොගනියි.

සාධුජන ප්‍රමෝදය පිණිස කරනලද විසුද්ධිමාර්ගයෙහි
පඤ්ඤාභාවනාධිකාරයට අයත් ඛන්ධ නිද්දෙස නම් වූ
තුදුස්වන පරිච්ඡේදය මෙතෙකින් නිමියේය.

—//—

# ආයතනධාතු නිද්දේසය

ආයතන යනු, චක්ඛායතනය. රූපායතනය, සෝතායතනය, සද්දායතනය, ඝාණායතනය, ගන්ධායතනය, ජිව්හායතනය, රසායතනය, කායායතනය, ඵොට්ඨබ්බායතනය, මනායතනය, ධම්මායතනය යන දොළොස් ආයතනයි. එහිඃ-

අත්ථලක්ඛණතාවත්ව කම සංඛෙප විත්ථාරා
තථා දට්ඨබ්බතො චෙව විඤ්ඤාතබ්බො විනිච්ඡයො

අර්ත්ථ වශයෙන්ද, ලක්‍ෂණ වශයෙන්ද, තො-අඩු නොවැඩි බැව් වශයෙන්ද, ක්‍රම (අනුපිළිවෙළ) වශයෙන්ද, සංක්‍ෂේප-විස්තාර වශයෙන්ද, එසේම දැකිය යුතු ආකාර වශයෙන්ද (එම දොළොස් ආයතනයන් පිළිබඳ) විනිශ්චයය දතයුතුවේ.

එහි පළමුකොට විශේෂ වශයෙන් දකිති'යි යන අර්ත්ථයෙන් 'චක්ඛු' නම් වේ. රූපය ආස්වාදනය කෙරෙති'යි, ප්‍රකට කෙරෙති'යි යන අර්ත්ථයි. නිරූපණය කෙරෙති'යි යන අර්ත්ථයෙන් 'රූප' නම්වේ. වර්ණ විශේෂයන් ප්‍රකාශ කෙරෙති'යි යන අර්ත්ථයි. අසති'යි යන අර්ත්ථයෙන් 'සෝත' නම්. (කණින් ඇසිය යුතු බවට යෙති'යි යන අර්ත්ථයෙන් 'සද්ද' නම්, ශ්‍රෝත්‍රය වෙතට පමුණුවනු ලැබෙති'යි යන අර්ත්ථයි. ආඝ්‍රාණය කෙරෙති'යි 'ඝාණ' නම්. වහනය වෙති'යි 'ගන්ධ' නම්. තමාගෙන් නිකුත්වන ද්‍රව්‍යය සූචනය කෙරෙති'යි යන අර්ත්ථයි. දිවි පැවැත්මට මුල්වූ රසය තමා වෙත කැඳවති'යි 'ජිව්හා' නම්. ප්‍රාණීන් එය සායනය කෙරෙති'යි 'රස' නම්. ආස්වාද කෙරෙති'යි යන අර්ත්ථයි. පිළිකුල් සහගත වැගිරෙන දෙයට නිජබිම් වෙති'යි 'කාය' නම්. 'ආය' යනු උත්පත්තිස්ථානයයි. පහස දනවති'යි ඵොට්ඨබ්බ' නම්. දනිති'යි 'මනො' නම්. ස්වලක්‍ෂණයන් දරති'යි 'ධම්ම' නම්.

අවිශේෂ වශයෙන් වනාහි, (චිත්ත චෛතසිකයන්ගේ කාර්යසිද්ධිය පිණිස) යත්න කරන හෙයින්, (ආය සංඛ්‍යාත චිත්ත චෛතසිකය පතුරුවන හෙයින්, දික්වූ සංසාර දුඃඛය එළවන හෙයින් හෝ 'ආයතනය'යි දතයුතුය. ද්වාරාරම්මණ චිත්ත චෛතසික ධර්මයන් චක්ඛු රූප ආදීන් අතුරෙන් එකක් එකක් අනුභවනාදීවූ ස්ව-කාර්යයන් මගින් පතුරුවති'යි, එම කාර්යයන් සඳහා නැඟී සිටිති'යි, ගැටෙති'යි, යත්න කෙරෙති'යි කී නියායි. තවද මේ ආයතනයන් 'ආය' සංඛ්‍යාත එම ධර්මයන් පතුරුවති'යි, පුළුල් කෙරෙති'යි කී නියායි. එසේම අග-මුල් නොදතහැකි සංසාරයෙහි පවත්නා ඉතා දික්වූ මේ සංසාර දුඃඛය යම්තාක් නොනවතීද, ඒතාක් ගෙන යති'යි, පවත්වති'යි, කී නියායි. මෙසේ මේ සියලු ධර්මයෝ යත්න කරන හෙයින්ද, ආය සංඛ්‍යාත චිත්ත චෛතසිකයන් පතුරුවන හෙයින්ද,

දීර්ඝවූ සංසාර දුඃඛය එළවන හෙයින්ද, 'ආයතනය, ආයතනය'යි වහරනු ලබති.

තවද, නිවාසස්ථානය යන අරුතින්ද. ආකාරය යන අරුතින්ද, සංචාරස්ථානය යන අරුතින්ද, ජාතභූමිය යන අරුතින්ද, කාරණය යන අරුතින්ද ආයතන නම් වෙති'යි දතයුතුය. ඒ එසේමය. ලොකයෙහි, 'ඉස්සරායතනය', 'වාසුදේවායතනය' යන ආදී තන්හි නිවාසස්ථානයද සුවණ්ණායතනය, රතනායතනය යන ආදී තන්හි ආකරයද, 'ආයතනය'යි වහරනු ලැබේ. ශාසනයෙහි වනාහි, ''මනොරමේ ආයතනෙ සෙවන්ති තං විහඞ්ගමා (මනරම් ආයතනය තුළ ක්ෂීණාශ්‍රව නමැති පක්ෂීහු ඒ සර්වඥ නමැති මහාවෘක්ෂය සේවනය කරති)'' යන තන්හි ගැවසෙන ස්ථානයද, ''දක්ඛිණාපථො ගුන්නං ආයතනං'' (දක්ෂිණාපථය ගවයනට ආයතනය)'' යන ආදී තන්හි උත්පත්ති ස්ථානයද, ''තත්‍ර තත්‍රෙ'ව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ (අභිඥාලාභයට සුදුසු පෙර පුරුදු ඇති කල්හි (ඉද්ධිවිධාදී වූ) ඒ ඒ අභිඥාවිෂයයෙහි සක්ඛිභබ්බතාවට (පහසුවෙන් දක්නට සමත් බවට පැමිණෙයි) යන ආදී තන්හි හේතුවද 'ආයතනය'යි වහරනු ලැබේ. 'චක්ඛු' ආදී තන්හිද ඒ ඒ චිත්ත-චෛතසික ධර්මයන් තම තමනට අයත් වෘත්තිවශයෙන් ඒ ඒ ආයතන තුළ වෙසෙති'යි එම චක්ඛු-ආදියද ඒ ඒ චිත්ත-චෛතසික ධර්මයනට නිවාසස්ථාන වේ. එම චිත්ත-චෛතසික ධර්මයන් චක්ඛු ආදී තන්හි ගැවසෙන හෙයින්ද, ඇසුරු කොට සිටින හෙයින්ද, අරමුණු කොට පවත්නා හෙයින්ද එම චක්ඛු ආදිය ඔවුනට ආකර වේ. තවද එම ''චක්ඛු ආදියද ඒ ඒ තන්හි වත්ථුද්වාරාරම්මණ වශයෙන් ගැවසෙන හෙයින් එම චිත්ත-චෛතසිකයනට සංචාරස්ථානයද වේ; නිස්සයාරම්මණ වශයෙන් එහිම උපදනා හෙයින් එම චක්ෂුරාදිය ඔවුනට උත්පත්ති ස්ථානද වේ; එසේම චක්ෂුරාදිය නොමැති තැන ඔවුන්ද නොමැති හෙයින් චක්ෂුරාදිය ඒ චිත්ත-චෛතසිකයනට කාරණ ද වේ.

මෙසේ නිවාසස්ථානාර්ථය, ආකරාර්ථය, සමොසරණ ස්ථානාර්ථය. උත්පත්ති ස්ථානාර්ථය, කාරණාර්ථය යන මෙකී කරුණු අතින් මේ චක්ෂුරාදී ධර්මයෝ 'ආයතන, ආයතනය'යි වහරනු ලැබෙති. එහෙයින් මෙසේ කියනලද ඒ ඒ අර්ථයෙන්, චක්ඛු වූයේද එම ආයතන වූයේද -පෙ- ධම්ම වූයේද එම ආයතන වූයේද ධම්මායතන නම්වෙති'යි මෙසේ අර්ථ වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

ලක්ඛණ යනු, ලක්ෂණ වශයෙන්ද මෙම චක්ෂුරාදිය පිළිබඳ විනිශ්චයය දතයුතුවේ. එම ලක්ෂණයන් ඛන්ධ නිද්දේසයෙහි කී නයින්ම දතයුතු වේ. තාවත්ව යනු, තාවත්(නොඅඩු නොවැඩි) ස්වභාව වශයෙනි'යි කී නියායි. චක්ෂුරාදියද ධර්මයෝමයි. එසේනම් හුදෙක් 'ධර්මායතන'යයි නොකියා 'ද්වාදශායතන'යයි කුමක් හෙයින් කියන ලද්දේද යත්:-

විඤ්ඤාණ-කාය සයෙහි හටගැනීමට හේතුවන ද්වාරයන් හා ආලම්බනයන් පිරිසිඳ දක්වනු පිණිසයි. මෙහිදී, (චක්ඛු විඤ්ඤාණ ආදී) විඤ්ඤාණ කාය සයට ද්වාර වශයෙන්ද, ආලම්බන වශයෙන්ද වෙන් කොට දැක්වීම සඳහා ආයතනයන් පිළිබඳ මේ භේදය වෙති'යි දොළොසෙක් කියනලදි. චක්ඛු-විඤ්ඤාණ වීථියට ඇතුළත් විඤ්ඤාණකායයට චක්ඛු-ආයතනයම උත්පත්ති-ද්වාර වේ. රූපායතනයට ආරම්මණවේ; එසේම සෙසු විඤ්ඤාණ කායයනට සෙසු ආයතනයෝ (උත්පත්ති-ද්වාරද ආරම්මණ ද වෙති. සවන (මනෝ විඤ්ඤාණවීථියට අයත්) විඤ්ඤාණ කායයට 'භවංග චිත්ත'යයි කියනුලබන මනායතන-ඒක දේශය (කොටස)ම උත්පත්තිද්වාර වේ. (චක්ඛු ආදීනට පොදු නොවූ) ධම්මායතනයම ආරම්මණ වේ. මෙසේ විඤ්ඤාණ කාය සයට උත්පත්ති-ද්වාර හා ආරම්මණ වශයෙන් දොළොසක් කියන ලදි. මෙසේ තාවත්‍ව වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුවේ.

කාම යනුඃ- මෙහිදීද යට (ඛන්ධ නිද්දේසයෙහි) කී උත්පත්ති ක්‍රම ආදිය පිළිබඳ දේශනා ක්‍රමයම යෙදේ. අභ්‍යන්තර ආයතනයන් අතුරෙන් චක්ඛු-ආයතනය දැකීම් හා ගැටීම් සහිත විෂය ඇති බැවින් (සෙසු ආයතනයනට වඩා) ප්‍රකට වෙති'යි එය පළමුකොට දේශනා කරන ලදි. ඉක්බිති දැකීම් රහිත, ගැටීම් සහිත විෂය වූ සෝතායතනාදිය දේශනා කරන ලදි. නොහොත්, දැකීම හා ඇසීම සෙසු ආයතයනට වඩා උසස් වන බැවින් බොහෝ උපකාරී වෙතැ'යි අභ්‍යන්තර ආයතනයන් අතුරෙන් චක්ඛායතන-සෝතායතන යන දෙක ප්‍රථමයෙන්ද, ඝාණාදී ආයතන තුන අනතුරුවද දේශනා කරනලදි. (චක්ඛු ආදී) පසටම ගෝචර විෂය වන හෙයින් මනායතනය අවසන්හි දේශනා කරනලදි. චක්ඛු ආදීනට ගෝචර හෙයින් බාහිර ආයතනයන් අතුරෙන්ද පිළිවෙළින් රූපාදිය එකිනෙකට පසුව දේශනා කරනලදි.

තවද, විඤ්ඤාණුප්පත්තියට හේතු දැක්වීම් වශයෙන්ද, ආයතනයන් පිළිබඳ මෙම ක්‍රමය දතයුතුය; කියනලදමැයි:- ''චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'' -පෙ-මනඤ්ච පටිච්ච ධම්මෙච උප්පජ්ජති මනොවිඤ්ඤාණං'' (ඇසද රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදියි, -පෙ- සිතද චෛතසික ධර්මයන්ද නිසා මනෝවිඤ්ඤාණය උපදියි)[a] යනුවෙති. මෙසේ ක්‍රම වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

සඞ්ඛෙප-විත්‍ථාර යනුඃ- සංක්ෂේප වශයෙන් වනාහි, මනායතනය හා ධම්මායතනයෙන් කොටසක් නාම වශයෙන්ද, ඉතිරි ආයතනයන් රූප වශයෙන්ද සංග්‍රහ කරනලද හෙයින් ආයතන දොළොසම හුදෙක් නාම-රූප පමණෙකි. විස්තර වශයෙන් වනාහි, අභ්‍යන්තර ආයතනයන්

a. සං. යු., යොගක්ඛෙම්මවග්ග

අතුරෙන් පළමුකොට චක්ඛායතනය ජාති(ස්වභාව) වශයෙන් හුදෙක් චක්ඛුප්පසාද මාත්‍රම වේ. ප්‍රත්‍යය, ගති, නිකාය, පුද්ගල භේද වශයෙන් වනාහි අනන්ත භේද ඇත්තේ වේ. සෝතායතනාදී සතරද එසේය. මනායතනය කුසල-අකුසල-විපාක-කිරිය විඤ්ඤාණ භේද වශයෙන් නවාසූවක්ද, නැතහොත් එක්සිය විසිඑකක්ද ප්‍රභේද ඇත්තේය. චක්ඛුරාදී වස්තු ප්‍රභේදයෙන්ද, දුඃඛාදී ප්‍රතිපදාප්‍රභේදයෙන්ද අනන්ත ප්‍රභේද ඇත්තේ වේ. රූප, සද්ද, ගන්ධ, රස යන ආයතන සතර විසභාග ප්‍රත්‍යයාදී භේදයෙන් අනන්ත ප්‍රභේද ඇත්තේය. ඵොට්ඨබ්බායතනය පඨවී, තේජෝ, ආපෝ ධාතු වශයෙන් ප්‍රභේද තුනක්ද, ප්‍රත්‍යයාදී භේදයෙන් අනන්තවූද ප්‍රභේද ඇත්තේය. ධම්මායතනය වේදනා, සඤ්ඤා, සංඛාර යන ස්කන්ධයන්ගේද, සුඛුම රූප, නිබ්බාණ යන මොවුන්ගේද ස්වභාවනානත්වය හේතුකොට ගෙන නොයෙක් ප්‍රභේද ඇත්තේ වේ. මෙසේ සංඛේප-විත්ථාර වශයෙන් විනිශ්චය දතයුතුය.

දට්ඨබ්බතො යනු, සඞ්ඛත සංඛ්‍යාත වූ සියලුම ආයතනයෝ ආ තැනක් හෝ යන තැනක් නැත්තවුන් ලෙස දැකියයුත්තාහුය. ඔහු ඉපැදීමට පෙර කිසි තැනෙක සිට නොඑති, භංගයෙන් මතු කිසි තැනෙකට නොද යති. මෙසේ හටගැනීමට පෙර නොදතහැකි ස්වභාව ඇත්තාහුය, බිඳීයාමෙන් පසු නැසෙන ස්වභාව ඇත්තාහුය, පූර්වාන්ත අපරාන්ත දෙකට අතර ප්‍රත්‍යයනට අයත් පැවතුම් ඇතිව නිදහස්ව පවත්නාහුය. එහෙයින් ආ තැනක් හෝ යන තැනක් නැත්තවුන් වශයෙන් දැකිය යුත්තාහුය. එසේම, උත්සාහ රහිත ලෙසත් ව්‍යාපාර රහිත ලෙසත් දැකිය යුත්තාහුය. චක්ඛුරූප ආදීනට, ''අපගේ එක් වීමෙන්, (චක්ඛු) විඤ්ඤාණාදිය උපදිතොත් මැනවැ'යි යන මෙවන් අදහසෙක් පහළ වනුයේ නොවේ. තවද ඔවුහු එම විඤ්ඤාණය ඉපැදවීම පිණිස ද්වාර වශයෙන් හෝ වස්තු වශයෙන් හෝ ආරම්මණ වශයෙන් හෝ උත්සාහ කරන්නාහුද නොවෙති; කිසි ව්‍යාපාරයකට හෝ නො-එළඹෙති. එහෙත් චක්ඛු-රූප ආදීන්ගේ එක් වීමේදී යම් හෙයකින් චක්ඛු විඤ්ඤාණ ආදීහු හටගනිත්ද, මෙය ස්වභාව වශයෙන් සිදු වන්නකි. එහෙයින් ඔවුහු උත්සාහ රහිත ලෙසත්, ව්‍යාපාර රහිත ලෙසත් දැකිය-යුත්තාහුය.

තවද අභ්‍යන්තර ආයතනයන් පාලු ගමක් ලෙසින් දැකිය යුතුය. නිත්‍ය-ශුභ-සුඛ භාවයෙන් තොරවූ හෙයිනි. බාහිර ආයතනයන් ගම් පහරන සොරුන් සෙයින් දැකිය යුතුය. අභ්‍යන්තර ආයතනයන් වනසන හෙයිනි. කියන ලද මැයි:- ''මහණෙනි, චක්ඛායතනය මනාප වූද අමනාප වූද රූපයන් විසින් වනසනු ලැබේ''[a] යන ආදියෙන් විස්තර වේ. තවද අභ්‍යන්තර ආයතන සය ප්‍රාණීන් ලෙසත් බාහිර ආයතන සය එම

a. සං. නි. ආසීවිසොපම සුත්ත

ප්‍රාණීන්ගේ ගෝචර ස්ථානයන් ලෙසත් දැකිය යුතුය. මෙසේ දැකියයුතු ආකාර වශයෙන් (දට්ඨබ්බතෝ) මෙහි විනිශ්චයය දතයුතුය.

මේ ආයතනයන් පිළිබඳ විස්තර කථා මාර්ගයයි.

——//——

අනතුරුව, 'ධාතුයෝ' යනු, චක්ඛුධාතු, රූපධාතු, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත ධාතු, සද්ද ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ ධාතු, ගන්ධ ධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු, රසධාතු, ජිව්හා විඤ්ඤාණධාතු, කාය ධාතු, ඵොට්ඨබ්බ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනෝධාතු, ධම්මධාතු, මනෝවිඤ්ඤාණ ධාතුය යන අටළොස් ධාතූහුය.

එහි,

අත්ථතො ලක්ඛණාදීහි කම තාවත්ව සඞ්ඛතො
පච්චයා අථ දට්ඨබ්බා වෙදිතබ්බා විනිච්ඡයො

අර්ත්‍ථ වශයෙන්, ලක්‍ෂණාදී වශයෙන්, ක්‍රම වශයෙන්, තාවත්ව වශයෙන්, සංඛ්‍යා වශයෙන්, ප්‍රත්‍යය වශයෙන් හා දට්ඨබ්බ වශයෙන් විනිශ්චයය දතයුතුය.

එහි 'අත්ථතො' යනු, දකිති'යි යන අරුතින් 'චක්ඛු' නම්වේ. රූපණය කෙරෙති'යි ප්‍රකාශ කෙරෙති'යි යන අරුතින් 'රූප' නම්වේ. චක්ඛුහේතුවෙන් ඇතිවන විඤ්ඤාණය චක්ඛු විඤ්ඤාණයි; මේ ආදී නයින් චක්ඛු ආදීන් පිළිබඳ විශේෂාර්ත්‍ථ වශයෙන් විනිශ්චයය දතයුතුය. අවිශේෂ වශයෙන් වනාහි (විදධති) විධාන කෙරෙති'යි (කර්තෘකාරකයෙහි) හෝ, (ධීයති විධානං) විධානය දරනු ලැබෙති'යි (කර්මකාරකයෙහි) හෝ, (විධීයතෙ) විධාන මාත්‍රය'යි (භාව කාරකයෙහි) හෝ, (එතාය චෙත්ථ වා ධීයති) මෙය කරණ කොට නොහොත් මෙහි පිළියෙළ කරනු ලැබෙති'යි (කරණ කාරකයෙහි නොහොත් ආධාර කාරකයෙහි) හෝ ධාතු නම්වේ. රන් රිදී ආදීනට කාරණවූ ධාතූන් රන් රිදී ආදිය උපදවන්නාක් මෙන් ලෞකිකවූ ධාතූහු කාරණ භාවයෙන් පිරිසිඳිනු ලදුව නොයෙක් ප්‍රකාර ඇති සසර දුක් වර්ග කෙරෙති'යි, බර උසුලන්නවුන් ලවා බර මෙන්, සත්‍වයන් ලවා අදවති'යි, උසුලවති'යි යන අර්ත්‍ථයි. වසඟයෙහි නොපවත්නා හෙයින් මේ ධාතූහු හුදෙක් දුඃඛ විධාන මාත්‍ර වෙති. මේ ධාතූන් විසින් කාරණ වශයෙන් සිට සත්‍වයින් ලවා සසර දුක් උසුලවනු ලැබෙති'යි, එසේ කරමින්ම මේ ධාතූන් කෙරෙහිම සසර දුක් විධාන කරනු ලැබෙති'යි, පිහිටුවනු ලැබෙති'යි යන අර්ත්‍ථයි. මෙසේ චක්ඛු ආදීන් අතුරෙන් එක්එක් ධර්මයක් හටගන්නා ආකාරයෙන්ම විධාන කෙරෙති'යි, උසුලවති'යි ආදී අර්ත්‍ථ වශයෙන් 'ධාතු' යයි වහරනු ලැබේ.

තවද, තීර්ථකයන් පවසන ආත්මය නම් සැබවින් විද්‍යමාන වූවක් නොවේ, මේ ධාතුහු එසේ නොව තමන්ගේ ස්වභාවය දරති'යි යන අරුතින්ම 'ධාතු' නම් වෙති. යම්සේ ලෝකයෙහි සිරියල් මනෝසිලා ආදී විසිතුරු ශෛල විශේෂයෝ 'ධාතු' යයි වහරනු ලැබෙත්ද, එසේම මේ ධාතුහුද, එම ධාතුන් සෙයින්ම 'ධාතු' නම් වෙති; නුවණින් දතයුතු විසිතුරු අවයව ඇත්තාහුද වෙති. නොහොත්, යම් සේ ශරීරයයි වහරනු ලබන සමුදාය තුළ අවයව වූ එකිනෙකට විසදෘශ ලක්‍ෂණයෙන් පිරිසුන් රසධාතු, රුධිර ධාතු ආදියට 'ධාතු' යන සංඥාව වේද, එසේම පංචස්කන්‍ධයයි කියනු ලබන ආත්මභාවයට අයත් මේ (චක්ඛු ආදී) අවයවයන් කෙරෙහිද 'ධාතු'ය යන නාමය දතයුතුය. මේ චක්ඛු ආදීහුද එකිනෙකට විසදෘශ ලක්‍ෂණයෙන් පිරිසුන් වූවාහුය.

තවද 'ධාතු' යන මෙය හුදෙක් නිර්ජීව මාත්‍රයකට අධිවචනයි, ඒ එසේමැයි, භාග්‍යවතුන් වහන්සේ, ''මහණ, 'පුරිස' යනු හුදෙක් ධාතු සයෙකින් සැදුණෙකි''[a] (ඡධාතුකො අයං භික්ඛු පුරිසො)යි යන ආදී තන්හි, ජීව (ආත්ම) සංඥාව බැහැර කරනු පිණිස ධාතුදේශනය කළ සේක. එසේ හෙයින් මෙකී අර්ථයෙන්, ''චක්ඛු වූයේද එම ධාතු වූයේද චක්ඛුධාතුයි -පෙ- මනෝවිඤ්ඤාණ වූයේද එම ධාතුවූයේද, මනෝවිඤ්ඤාණධාතුයි' මෙසේ පළමු කොට මෙහි අරුත් වශයෙන් විනිශ්චයය දතයුතුය.

'ලක්ඛණාදිතො' යනු, චක්ඛු ආදීන් පිළිබඳ විනිශ්චයය ලක්‍ෂණාදී වශයෙන්ද දතයුතුය. ඔවුන් පිළිබඳ ලක්‍ෂණාදිය ඛන්‍ධ නිද්දේසයෙහි කී නයින්ම දතයුතුය. 'කමතො' යන මෙහිද පෙර කී උත්පත්ති ක්‍රමාදීන් පිළිබඳ දේශනාක්‍රමයම යෙදේ. එම දේශනා ක්‍රමය මෙහි හේතු හා ඵල අනු පිළිවෙලට තැබීම් වශයෙන් කියනලදි:- චක්ඛු ධාතු, රූපධාතු යන දෙක හේතුයි, චක්ඛු විඤ්ඤාණධාතු යනු, ඵලයයි, අන් සියලු තන්හිද මෙසේය.

තාවතවතො යනුවෙන් අඩුවැඩි නැතිව මෙපමණෙකි'යි යන මෙය පවසන ලදි. ඒ ඒ සූත්‍ර අභිධර්ම පාඨයන්හි, ආභා ධාතුය, සුභාධාතුය, ආකාසානඤ්චායතන ධාතුය, විඤ්ඤාණඤ්චායතන ධාතුය, ආකිඤ්චඤ්ඤායතන ධාතුය, නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධාතුය, සඤ්ඤාවේදයිත නිරෝධ ධාතුය, කාම ධාතුය, ව්‍යාපාද ධාතුය, විහිංසා ධාතුය, නෙක්ඛම්ම ධාතුය, අව්‍යාපාදධාතුය, අවිහිංසා ධාතුය, සුඛධාතුය, දුක්ඛධාතුය, සෝමනස්ස ධාතුය, දෝමනස්ස ධාතුය, උපෙක්ඛා ධාතුය, අවිජ්ජා ධාතුය, ආරම්භ ධාතුය, නික්ඛමධාතුය, පරක්කම ධාතුය, හීන ධාතුය, මජ්ඣිම ධාතුය, පණීතධාතුය, පඨවීධාතුය, ආපෝ ධාතුය, තේජෝ ධාතුය, වායෝ ධාතුය, ආකාස ධාතුය, විඤ්ඤාණ ධාතුය. සඞ්ඛතධාතුය,

---

a. ම. නි. උපරිපණ්ණාසක

අසඞ්ඛතධාතුය, අනේකධාතුය, නානාධාතුක ලෝකයයි යන මේ ආදී අන්‍ය වූද ධාතුහු දක්නා ලැබෙති. මෙසේ වූ කල්හි, සියලු ධාතූන් වශයෙන් පරිච්ඡේද නොකොට, 'අටළොසෙකැ'යි යන මේ පරිච්ඡේදයම කරන ලද්දේ කවර හෙයින්ද යත්: ස්වභාව (පරමාර්ථ) වශයෙන් විද්‍යමාන වූ සියලු ධාතූන් මේ අටළොසටම ඇතුළත් වන හෙයිනි.

'ආභාධාතු' යනු රූපධාතුමැයි, 'සුභාධාතු' යනු- රූපාදිය හා සමගම බැඳී පවතින්නකි. කවර හෙයින්ද යත්: සුභ නිමිති සහිතවූ හෙයිනි, 'සුභාධාතු' යනු සුබය'යි ගනු ලබන නිමිතියි, එය රූපාදියෙන් තොරව විද්‍යමාන නොවේ. නොහොත්, කුසල විපාක අරමුණු කොට ගත් රූපාදියම වේ. 'ආකාසානඤ්චායතන-ධාතු' යන ආදියෙහිවූ චිත්තය මනෝවිඤ්ඤාණධාතුම වේ. සෙසු (ආයතන) ධාතුහු 'ධම්මධාතු'ම වෙති. 'සඤ්ඤාවේදයිත නිරෝධ-ධාතු' වනාහි ස්වභාව (පරමාර්ථ) වශයෙන් අවිද්‍යමාන වේ. එය (මනෝ විඤ්ඤාණ-ධාතුය, ධම්මධාතුය යන) දෙකෙහි නිරෝධමාත්‍රය මැයි. 'කාමධාතු' යනු, හුදෙක් ධම්මධාතුම වේ. කියන ලදමමැයි:- "එහි 'කාම ධාතු' යනු කවරේද? කාමයන් හා සමග බැඳුණු තර්කයයි, විතර්කයයි, මිථ්‍යාසංකල්පයයි"[a] යනුවෙන් අටළොස් ධාතුහුම හෝ එනම් වෙති. "යටින් අවීචිනිරයත් උඩින් පරනිර්මිත වශවර්ති දිව්‍යලෝකයත් යන මෙදෑතුරෙහි ඇතුළත්, මෙයට අයත්, ස්කන්ධ, ධාතු, ආයතන, රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන මේ සියල්ල 'කාමධාතු'යයි කියනු ලැබෙති'යි කී හෙයිනි.

'නෙක්ඛම්මධාතු' යනු ධම්මධාතුම වේ. සියලුම කුසලධර්මයන් නෙක්ඛම්ම ධාතු වෙති'යි කී හෙයින් මනෝවිඤ්ඤාණ ධාතුවද එනම් වේමය. ව්‍යාපාදය, විහිංසාය, අව්‍යාපාදය, අවිහිංසාය, සුඛය, දුක්ඛය, සෝමනස්සය, දෝමනස්සය, උපෙක්ඛාය, අවිජ්ජාය, ආරම්භය, නික්කමය, පරක්කමය, යන මේ ධාතුහු ධම්ම ධාතුව වෙති. හීන-මජ්ඣිම-පණීත ධාතුහු හුදෙක් අටළොස් ධාතුහුම වෙති. හීනවූ චක්ඛු ආදිය හීනධාතුයි, මජ්ඣිම-පණීත චක්ඛු ආදිය මජ්ඣිම - පණීත ධාතුයි. අවිශේෂයෙන් අකුසලවූ ධම්මධාතු හා මනෝ විඤ්ඤාණධාතුහු හීන ධාතුනම් වෙති. ලෞකික වූ කුසල හා අව්‍යාකෘත ධම්මධාතුහුද චක්ඛුධාතු ආදියද මජ්ඣිම ධාතු නම් වෙති. ලෝකෝත්තරවූ ධම්මධාතු හා මනෝවිඤ්ඤාණ ධාතුහු ප්‍රණීතධාතු නම්වෙති.

පඨවී, තේජෝ, වායෝ යන ධාතුත්‍රයය. ඵොට්ඨබ්බ ධාතුමැයි; ආපෝ ධාතු, ආකාස ධාතු යන දෙක ධම්මධාතුමැයි; විඤ්ඤාණ ධාතු යනු චක්ඛු ආදී විඤ්ඤාණ ධාතු සතෙහි සංක්ෂේපයමැයි. සතළොස් ධාතු හා ධම්මධාතු ඒකදේශයක් (කොටසක්)ද සංඛත ධාතුයි, අසංඛත

a. විභඞ්ග පාළි, ධාතු විභඞ්ග

ධාතුනම් ධම්මධාතුවෙන් ඉතිරි කොටසමැයි. අනේකධාතු-නානා ධාතු ලෝකයනම් අටළොස් ධාතුන් පිළිබඳ වූම ප්‍රභේද මාත්‍රයෙකි. මෙසේ ස්වභාව වශයෙන් විද්‍යමාන වූ සියලු ධාතුන්ම ඇතුළත් වන හෙයින් (අඩු වැඩි නැතිව) අටළොසෙක්ම කියනලදි.

තවද, විජානනය (වෙසෙසින් දැන ගැනීම) ස්වභාව කොට ඇති විඤ්ඤාණය තුළ ජීවයක් (හෙවත් ආත්මයක්) ඇතැ'යි අදහන්නවුන්ගේ එම හැඟීම නැති කරනු පිණිසද අටළොසෙක්ම කියන ලදී. විජානන ස්වභාව ඇති විඤ්ඤාණය තුළ ජීව (ආත්ම)යක් ඇතැ'යි ගන්නා සත්වයෝ වෙති, ඔවුන්හට චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මනෝ යන ධාතුන්ද, මනෝවිඤ්ඤාණධාතු භේදයෙන් එහි නොයෙක් ආකාර ඇති බවද, චක්ඛු, රූප ආදී ප්‍රත්‍යයනට අයත් පැවතුම් ඇති හෙයින් එහි අනිත්‍යතාවද ප්‍රකාශ කොට දීර්ඝ කාලාන්තරයක් මුල් බැස ගත් ආත්මසංඥාව නසාලනු කැමැති භාග්‍යවතුන් වහන්සේ විසින් ධාතුන් අටළොසෙක්ම ප්‍රකාශ කරනලදි. බොහෝ කොට කීමෙන් පල කිම? වෛනේය ජනයාගේ අධ්‍යාශය වශයෙන්ද එසේ කියනලදි. යම් වෛනේය ජන කෙනෙක් ඉතා සංක්ෂිප්තද ඉතා විස්තරාත්මකද නොවූ මේ දේශනා ක්‍රමයෙන් පහසුවෙන් අවබෝධ කෙරෙත්ද. ඔවුන්ගේ අධ්‍යාශය වශයෙන්ද අටළොසෙක්ම ප්‍රකාශ කරන ලදි.

සංඛෙපවිත්ථාර නයෙන තථා තථාපි
ධම්මං පකාසයති එස යථායථාස්ස
සද්ධම්මතෙජවිහතං විලයං ඛණෙන
වෙනෙය්‍යසත්ත හදයෙසු තමො පයාති

යම් යම් පරිද්දෙකින් දේශනා කළ විට වෛනෙය ජනයාගේ සිත්තුළ ඇති අවිද්‍යාන්ධකාරය සද්ධර්ම තේජසින් නැසී අභාවයට යේද, ඒ ඒ පරිද්දෙන් මේ භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේප වශයෙන්ද විස්තර වශයෙන්ද ධර්මය දේශනා කරන සේක.

මෙසේ තාවත්ව (අඩුවැඩි නොවීම්) වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය. සඞ්ඛතො (සංඛ්‍යා වශයෙන්) යනු, පළමු කොට චක්ඛු ධාතුව ජාති වශයෙන් 'චක්ඛුප්පසාද' යන එක්ම ස්වභාව වෙතැයි ගැණේ. සෝත, ඝාණ, ජිව්හා, කාය, රූප, සද්ද, ගන්ධ, රස යන ධාතුහුද සෝතප්පසාදාදී වශයෙන් එසේම වෙති. ඵොට්ඨබ්බ ධාතුව වනාහි පඨවී, තේජෝ, වායෝ වශයෙන් ත්‍රිවිධ ස්වභාව ඇත්තේයයි ගැණේ. චක්ඛු විඤ්ඤාණ ධාතුව කුශල අකුශල විපාක වශයෙන් ද්වි-ස්වභාව ඇත්තේයයි ගැණේ. සෝත, ඝාණ, ජිව්හා, කාය යන විඤ්ඤාණ ධාතුහුද එසේම වෙති. මනෝධාතුව වනාහි පඤ්චද්වාරාවජ්ජනය, කුසල හා අකුසල විපාක සම්පටිච්ඡනය යනුවෙන් ත්‍රි-ස්වභාව ඇත්තේයයි ගැණේ. ධම්මධාතුව (වේදනා, සඤ්ඤා,

සංඛාර යන) ත්‍රිවිධ අරූපස්කන්ධ වශයෙන්ද, අටළොස් සූක්ෂ්ම රූප වශයෙන්ද, අසඞ්ඛත (නිර්වාණ) ධාතු වශයෙන්ද විංශත්-ස්වභාව ඇත්තේයයි ගැණේ. මනෝ විඤ්ඤාණ ධාතුව සෙසු කුසල, අකුසල, අව්‍යාකෘත විඤ්ඤාණයන්ගේ වශයෙන් ස-සැත්තෑ ආකාර වෙතැයි ගැණේ. මෙසේ සංඛ්‍යා වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

*පච්චයා යනු, ප්‍රත්‍යය වශයෙනි, පළමු කොට චක්ඛු ධාතුව චක්ඛු විඤ්ඤාණ ධාතුවට විප්පයුත්ත පච්චය, පුරේජාත පච්චය, අත්‍ථි පච්චය, අවිගත පච්චය, නිස්සය පච්චය, ඉන්‍ද්‍රිය පච්චය යන මේ ෂඩාකාරයෙන් ප්‍රත්‍යය වේ. රූප ධාතුව (එම චක්ඛු විඤ්ඤාණ ධාතුවට) පුරේජාත පච්චය, අත්‍ථි පච්චය, අවිගත පච්චය, ආරම්මණ පච්චය යන මොවුන්ගේ වශයෙන් සතර අකාරයෙකින් උපකාරී වෙයි. එසේම සෝතධාතු, සද්දධාතු ආදිය සෝත විඤ්ඤාණධාතු ආදියට උපකාරී වෙයි.

එම (චක්ඛු ආදී) පසට ආවජ්ජන මනෝධාතුව අනන්තර, සමනන්තර, නත්‍ථි, විගත, අනන්තර උපනිස්සය වශයෙන් පස් ආකාරයෙකින් ප්‍රත්‍යය වෙයි. එම (චක්ඛුවිඤ්ඤාණ ආදී) පසද සම්පටිච්ඡන මනෝධාතුවට එසේම (එම පස් ආකාරයෙන්) ප්‍රත්‍යය වේ. සම්පටිච්ඡන මනොධාතුව සන්තීරණ මනෝවිඤ්ඤාණ ධාතුවට එසේම ප්‍රත්‍යය වේ. එම (සන්තීරණ මනෝවිඤ්ඤාණ) ධාතුව වොත්‍ථපන මනෝවිඤ්ඤාණ ධාතුවටද, වොත්‍ථපන මනෝවිඤ්ඤාණ ධාතුව ජවන මනෝ විඤ්ඤාණ ධාතුවටද (එම පස් ආකාරයෙන්) ප්‍රත්‍යය වේ. එම ජවන මනෝ විඤ්ඤාණ ධාතුව වනාහි, අනතුරුව එන ජවන මනෝ විඤ්ඤාණ ධාතුවට එම පස් ආකාරයෙන් හා ආසේවන ප්‍රත්‍යය වශයෙන්දැයි යන ෂඩාකාරයෙන් ප්‍රත්‍යය වේ. මේ පළමු කොට දක්වන ලද්දේ පඤ්චද්වාරය පිළිබඳ නයයි. මනෝද්වාර විෂයෙහි වනාහි, භවංග මනෝ විඤ්ඤාණ ධාතුව ආවජ්ජන මනෝ විඤ්ඤාණ ධාතුවටද, ආවජ්ජන මනෝ විඤ්ඤාණ ධාතුව ජවන මනෝ විඤ්ඤාණ ධාතුවටද පෙර කී පස් ආකාරයෙන්ම ප්‍රත්‍යය වේ.

ධම්මධාතුව වනාහි විඤ්ඤාණ ධාතු සතටම සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්‍ථි, අවිගත ආදී ප්‍රත්‍යය වශයෙන් බොහෝ ආකාරයෙන් ප්‍රත්‍යය වේ. චක්ඛුධාතු ආදියද, ඇතැම් ධම්ම ධාතුවක්ද, ඇතැම් මනෝවිඤ්ඤාණ ධාතුවකට ආරම්මණ ප්‍රත්‍යයාදී වශයෙන් උපකාරී වෙයි. චක්ඛු විඤ්ඤාණ ධාතු ආදියට හුදෙක් චක්ඛු, රූප ආදියම ප්‍රත්‍යය වනුයේ නොවේ. ආලෝකාදියද ප්‍රත්‍යය වේ. එහෙයින් කීහු පූර්වාචාර්යයෝ:- ''චක්ඛු - රූප - ආලෝක - මනසිකාරයන් නිසා චක්ඛුවිඤ්ඤාණය උපදියි; සෝත-සද්ද-කර්ණවිවර-මනසිකාරයන් නිසා

* පඤ්ඤාභූමි නිද්දේසයෙහි (පිටු 397-398) චතුවීසති පච්චය බලන්න.

සෝත විඥ්ඥාණය උපදියි; ඝාණ-ගන්ධ-වායු-මනසිකාරයන් නිසා ඝාණ විඥ්ඥාණය උපදියි; ජිව්හා-රස-ආපෝ-මනසිකාරයන් නිසා ජිව්හා විඥ්ඥාණය උපදියි; කාය-ඵොට්ඨබ්බ-පඨවී-මනසිකාරයන් නිසා කායවිඥ්ඥාණය උපදියි; භවඞ්ග-මනෝ-ධම්ම-මනසිකාරයන් නිසා මනෝවිඥ්ඥාණය උපදියි''. මේ මෙහි සංක්ෂේපයයි; විස්තර වශයෙන් වනාහි ප්‍රත්‍යයයන් පිළිබඳ ප්‍රභේදය පටිච්චසමුප්පාද (පඥ්ඥාභූමි) නිද්දේසයෙහි මතු දැක්වේ. මේ ආකාරයෙන් ප්‍රත්‍යය වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

දට්ඨබ්බතො යනු, දැකියයුතු ආකාර වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය යන අර්ථයි. (නිර්වාණ ධාතුව හැර) සියලුම සංඛත ධාතූහු අතීත-අනාගත දෙකෙළවර හිස් වූවන් සෙයින්ද, නිත්‍ය-ශුභ-සුඛ-ආත්ම වශයෙන් ශුන්‍ය වූවන් සෙයින්ද, ප්‍රත්‍යයයනට අයත් පැවතුම් ඇත්තවුන් සෙයින්ද දතයුත්තාහ. මෙහි විශේෂ වශයෙන් චක්ඛුධාතුව බෙර ඇසක් සෙයින්ද, රූපධාතුව කඩිප්පුවක් (බෙරයට ගසන ලී කැබැල්ලක්) සෙයින්ද, චක්ඛු විඥ්ඥාණ ධාතුව බෙරහඬ සෙයින්ද දැකිය යුතුය; තවද චක්ඛු ධාතුව කැටපතක් සෙයින්ද, රූපධාතුව මුහුණක් ලෙසින්ද, චක්ඛුවිඥ්ඥාණ ධාතුව මුහුණු පිළිබිඹුව සෙයින්ද දැක්කයුතුය; නොහොත්, චක්ඛුධාතුව උක්දඬු හෝ තල සෙයින්ද, රූප ධාතුව යන්ත්‍ර රෝදයෙහි මිට සෙයින්ද, චක්ඛු විඥ්ඥාණධාතුව උක්යුස හෝ තෙල් සෙයින්ද දැක්ක යුතුය; තවද චක්ඛුධාතුව ගිනිගානා යන්ත්‍රයෙක උඩු පලුව සෙයින්ද; රූපධාතුව යටිපලුව සෙයින්ද, චක්ඛුවිඥ්ඥාණ ධාතුව (නිපදවනලද) ගිනි සෙයින්ද දැකිය යුතුය. සෝතධාතු ආදියෙහිද මෙම නයයි.

මනෝධාතුව වනාහි, හටගන්නා ආකාරය අනුව, චක්ඛු විඥ්ඥාණ ධාතු ආදීනට පෙරටුව හෝ පසුව හෝ හැසිරෙන්නකු සෙයින් දැකියයුතුය. ධම්මධාතුවට අයත් වේදනාස්කන්ධය (සැත්කම් සඳහා ගනු ලබන) සැතක් හෝ කටුවක් සෙයින් දැකිය යුතුය. සඥ්ඥා-සංඛාර යන ස්කන්ධද්වය වේදනා (නමැති) ශල්‍ය, ශූලාදිය යෙදීමට සුදුසු රෝගීන් සෙයින් දැකිය යුතුය; නොහොත්, පෘථග්ජනයන්ගේ සඥ්ඥා-ඛන්ධය ආශා නමැති දුක් දනවන සෙයින් හිස් මිටක් සෙයින්ද, නිවැරදි නොවන අරමුණු ගන්නා හෙයින් වනමෘගයකු සෙයින්ද, දැකියයුතුය. සංඛාරක්ඛන්ධය ප්‍රතිසන්ධියට ඇද හෙලන හෙයින් අඟුරු වළකට හෙලන්නවුන් සෙයින්ද, ජාති නමැති දුක විසින් ලුහුබඳිනු ලබන හෙයින් රාජපුරුෂයන් විසින් ලුහුබඳිනු ලබන සොරුන් සෙයින්ද, සකලවිධ අනර්ථයන් එළවන ස්කන්ධ පරම්පරාවට හේතුවන හෙයින් විෂවෘක්ෂ-බීජයන් සෙයින්ද දැකියයුතුය. රූපස්කන්ධය නානාවිධ උපද්‍රවයනට නිමිති වන හෙයින් උරචක්‍රමාලාවක් සෙයින් දැකිය යුතුය.

අසඞ්ඛත ධාතුව (නිර්වාණය) වනාහි අමෘතයක් සෙයින්ද, ශාන්තියක් සෙයින්ද, ක්‍ෂේමභූමියක් සෙයින්ද, දැකිය යුතුය. කවර හෙයින්දයත්: සියලු අනර්ථායතනට ප්‍රතිපක්‍ෂවූ හෙයිනි. මනෝවිඤ්ඤාණ ධාතුව අරමුණු කෙරෙහි ඒකාන්ත නියමයක් නැති හෙයින් වනවඳුරකු සෙයින්ද, දමනය කළ නොහැකි හෙයින් කුළු අසකු සෙයින්ද වැටෙන තැනක් නියත වශයෙන් නොදත හැකි හෙයින් අහසට දමා ගැසූ දඬු කඩක් සෙයින්ද, ලෝභ, ද්වේශ ආදී නානාවිධ ක්ලේශ වේශයන්හි යෙදෙන හෙයින් රඟුම් නළුවකු සෙයින්ද දැකිය යුතුය.

මේ ධාතුන් පිළිබඳ විස්තර කථා මාර්ගයයි

සාධුජන ප්‍රමෝදය පිණිස කරන ලද විශුද්ධිමාර්ගයෙහි
පඤ්ඤාභාවනාධිකාරයට අයත් ආයතන-ධාතු නිද්දේස නම් වූ
පසළොස්වන පරිච්ඡේදය මෙතකින් නිමියේය.

—//—

# ඉන්ද්‍රියසච්ච නිද්දේසය

ධාතුනට අනතුරුව ඉන්ද්‍රියයන් දක්වන ලදැ'යි, ඔහු දෙවිස්සෙක් වෙති:- චක්ඛුන්ද්‍රිය, සෝතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, මනින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්සින්ද්‍රිය, දෝමනස්සන්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤාස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤතාවින්ද්‍රිය යනුවෙනි. එහි:-

අත්ථතො ලක්ඛණාදීහි කමතො ච විජානියා
භෙදාභෙදා තථා කිච්චා භූමිතො ච විනිච්ඡයො

අර්ථ වශයෙන්ද, ලක්‍ෂණාදී වශයෙන්ද, ක්‍රම වශයෙන්ද, භේදා භේද වශයෙන්ද, එසේම කෘත්‍ය වශයෙන්ද, භූමි වශයෙන්ද විනිශ්චයය දතයුතුය.

එහි, චක්ඛු ආදිය පිළිබඳව, පළමුකොට, අරමුණු ආස්වාද කෙරෙති'යි රස විඳිති'යි යන අරුතින් චක්ඛු නම් වෙති'යි ආදී වශයෙන් අර්ථය (ධාතු-ආයතන නිද්දේශයෙහි) ප්‍රකාශ කරන ලදි. දෙවිසි ඉන්ද්‍රියයන් අතුරෙන් අවසන්හි සඳහන් තුනෙන් පළමුවැන්න පෙර නොදන්නා ලද අමෘතපදය නොහොත් චතුස්සත්‍ය ධර්මය අවබෝධ කරන්නෙමැ'යි මෙසේ පිළිපන්නහුට උපදනා හෙයින්ද, ඉන්ද්‍රියාර්ථය දරන හෙයින්ද 'අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයයි කියන ලදි. දෙවැන්න (සෝවාන් මාර්ගඥානයෙන්) මනාකොට දන්නාලද හෙයින්ද, ඉන්ද්‍රියාර්ථය දරන හෙයින්ද, අඤ්ඤින්ද්‍රියයයි කියනලදි. තුන්වැන්න චතුස්සත්‍ය විෂයයෙහි පරිසමාප්ත ඥාන කෘත්‍යයන් ඇති ක්ෂීණාශ්‍රවයාහට උපදනා හෙයින්ද ඉන්ද්‍රියාර්ථය දරන හෙයින්ද අඤ්ඤාතාවින්ද්‍රියයයි කියනලදි.

මෙකී චක්ඛු, සෝත ආදීන්ගේ ඉන්ද්‍රියාර්ථය (ඉන්ද්‍රියට්ඨ) යනු කවරේද යත්:- ඉන්ද්‍ර නම් අසහාය පාලකයාගේ ස්වභාව සංකේතවත් කෙරෙති'යි යන අර්ථය ඉන්ද්‍රියාර්ථයයි, 'ඉන්ද්‍ර'යයි හැඳින්විය හැකි ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්සේ විසින් දේශනා කරන ලදැ'යි යන අර්ථය ඉන්ද්‍රියාර්ථයයි, මුනීන්ද්‍රයන් වහන්සේ විසින් දක්නා ලදැ'යි යන අර්ථය ඉන්ද්‍රියාර්ථයයි, ඉන්ද්‍ර ස්වභාවය දරන කර්මය විසින් නිපදවන ලදැ'යි යන අර්ථය ඉන්ද්‍රියාර්ථයයි. එම කර්මය විසින්ම වෙසෙස් කොට රචිතය'යි යන අර්ථය ඉන්ද්‍රියාර්ථයයි. මෙකී සියලු අරුත් මෙහි යෙදේ.

සම්‍යක් සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ වනාහි පරමේශ්වර භාවය දරන හෙයින් 'ඉන්ද්‍ර' නම් වන සේක. කර්මයන් කෙරෙහිද, කිසිවකුටත් ඊශ්වර භාවයක් නොමැති හෙයින් කුශල වූ හෝ අකුශල වූ කර්මයද 'ඉන්ද්‍ර' නම්වේ. එහෙයින් මෙහිලා කර්මය විසින් නිපදවන ලද

ඉන්ද්‍රියයන් වෙසෙස් කොට (සිට්ය) සංකේතවත් කෙරෙති'යි, එම කර්මය විසින්ම රචිතයහ'යි ඉන්ද්‍ර ලිංගාර්ත්‍ථයෙන්ද ඉන්ද්‍ර සිට්ඨාර්ත්‍ථයෙන්ද ඉන්ද්‍රිය නම් වෙයි.

මේ සියලු ඉන්ද්‍රියයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් තත්වූ පරිද්දෙන් ප්‍රකාශ කරන ලද්දාහ'යි, මනා කොට අවබෝධ කරන ලදහ'යි යන ඉන්ද්‍ර දේශිත අර්ත්‍ථයෙන් හා ඉන්‍ද්‍රදිට්ඨාර්ත්‍ථයෙන් එනම් වෙති. එම භාග්‍යවත් මුනීන්ද්‍රයන් වහන්සේ විසින්ම ඇතැම් ඉන්ද්‍රියයන් ගෝචර හෙවත් අරමුණු ආසේවන වශයෙන්ද, ඇතැම් ඉන්ද්‍රියයන් භාවනා ආසේවන වශයෙන්ද සෙවුනා ලදහ'යි ඉන්‍ද්‍රජුට්ඨාර්ත්‍ථයෙන්ද එනම් වෙති. තවද ආධිපත්‍ය සංඛ්‍යාත ඓශ්වරාර්ත්‍ථයෙන්ද මොවුහු ඉන්ද්‍රිය නම් වෙති. චක්ඛු විඤ්ඤාණාදිය පිළිබඳ පැවැත්මෙහිදී චක්ඛු ආදීන්ගේ ආධිපත්‍යය සිද්ධ වේ. චක්ඛු ආදීන් තියුණුවූ කල්හි චක්වූ විඤ්ඤාණාදීන්ද තියුණු වන හෙයින් හා මොට වූ කල්හි මොට වන හෙයිනි. මේ මෙහි අර්ත්‍ථ වශයෙන් විනිශ්චයයයි.

'ලක්ඛණාදීහි' යනු, ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන වශයෙනුදු චක්ඛු ආදීන්ගේ විනිශ්චයය දතයුතුය යන අර්ත්‍ථයි. ඔවුන් පිළිබඳ එම ලක්ඛණාදිය ඛන්‍ධ නිද්දේසයෙහි කියන ලදුයේමය. පඤ්ඤින්ද්‍රිය ආදී (අවසන්) ඉන්ද්‍රිය සතර අර්ත්‍ථවශයෙන් අමෝහයම වේ. සෙසු ඉන්ද්‍රියයෝ ස්වරූපයෙන්ම එහි ආවාහුය. (සඳහන්වෙත්).

'කමතො' යනු, දේශනා ක්‍රමයමැයි, එහි, 'අභ්‍යන්තර ධර්මයන් මනාව අවබෝධ කිරීමෙන් ආර්යභූමි ප්‍රතිලාභය සිද්ධ වෙති'යි කී හෙයින් ආත්මභාවයට අයත් චක්ඛුන්ද්‍රිය ආදිය පළමු කොට දේශනා කරන ලදි. එම ආත්මභාවය යම් ස්වභාවයක් හේතුකොට ස්ත්‍රියකැයි හෝ පුරුෂයෙකැයි ව්‍යවහාරයට යේද, මේ එම ස්වභාවයැයි දක්වනු පිණිස ඉන් අනතුරුව ඉත්‍ථීන්ද්‍රිය පුරිසින්ද්‍රිය යන දෙක දේශනා කරනලදි. එම ද්විවිධ වූම ස්වභාවය ජීවිතින්ද්‍රියය හා සමග බැඳුණු පැවතුම් ඇතැයි හඟවනු පිණිස ඉන් අනතුරුව ජීවිතින්ද්‍රිය දේශනා කරනලදි. යම්තාක් එම ජීවිතන්ද්‍රිය පවතීද, ඒතාක් වේදයිත ධර්මයන්ගේ නැවැත්ම නොවෙති'යයිද, යම්කිසිවක් වේදයිත වේනම් ඒ සියල්ල දුකෙකියි හඟවනු පිණිස ඉන් අනතුරුව සුඛින්ද්‍රිය ආදිය දේශනා කරන ලදි, එම සුඛදුඃඛාදිය නිවාරණය පිණිස මේ ධර්මයන් වැඩිය යුතුය'යි පිළිපැදීම දක්වනු පිණිස ඉන් ඉක්බිති සද්ධින්ද්‍රිය ආදිය දේශනා කරන ලදි; මේ පිළිපැදීම හේතුකොට මේ ධර්මය පළමුකොට තමා තුළ පහළ වෙති'යි පිළිපැදීමෙහි නොසිස්බව දක්වනු පිණිස අනතුරුව අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය දේශනා කරන ලදි; එම ඉන්ද්‍රියයෙහිම ඵලය වන හෙයින්ද, ඉන්පසු වැඩියයුතු හෙයින්ද, ඉනුදු අනතුරුව අඤ්ඤින්ද්‍රියය දේශනා කරන ලදි. ඉතික්බිතිව එම ඉන්ද්‍රියය වැඩීමෙන් මේ ඉන්ද්‍රියයෙහි අධිගමය වන්නේය'යිද, මෙය අවබෝධ කළ

කල්හි තවදුරටත් කළයුතු කිසිවක් නැත්තේය'යිද හඟවනු පිණිස අවසන්හි පරමාස්වාද වූ අඤ්ඤාතාවීන්‍ද්‍රියය දේශනා කරන ලදැ'යි යනු මෙය පිළිබඳ ක්‍රමයවේ.

'භේදාභේදා' යනු, මෙහි භේදයක් පවත්නේ ජීවිතින්ද්‍රියය පිළිබඳවම පමණෙකි. එය රූප ජීවිතින්ද්‍රියය, අරූප ජීවිතින්ද්‍රියයයි ද්විවිධ වේ; සෙසු ඉන්ද්‍රියයන්ගේ භේදයක් නැතැ'යි මෙසේ භේදාභේද වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

'කිච්චා' යනුඃ ඉන්ද්‍රියයන්ගේ කෘත්‍යය කවරේද යත්ඃ- පළමු කොට, චක්ඛුන්ද්‍රියය පිළිබඳ වූ චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවටද, එය හා සමග බැඳුණු (රූපාදී) ධර්මයනටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වන්නේය'යි කී හෙයින් ඉන්ද්‍රියප්‍රත්‍යය භාවයෙන් තමාගේ තියුණු බව හෝ ලැසි බව හේතුකොට සාධනය කළයුතු චක්ඛු විඤ්ඤාණාදී ධර්මයන්ගේ තියුණු බව හෝ ලැසි බවය'යි කියනලද තමාගේ ආකාරය අනුව පැවැත්වීමෙක් වේද, මෙය කෘත්‍යය වේ. සෝත, ඝාණ, ජිව්හා, කාය යන ඉන්ද්‍රියයන් පිළිබඳවද මෙසේමය. මනින්ද්‍රියය පිළිබඳ ඉන්ද්‍රිය කෘත්‍යය වනුයේ සහජාත ධර්මයන් තමා වශයෙහි පැවැත්වීමයි. ජීවිතින්ද්‍රිය පිළිබඳ කෘත්‍යය වනුයේ සහජාත ධර්මයන් පාලනය කිරීමයි. ඉත්ථින්ද්‍රිය-පුරිසින්ද්‍රියයන් පිළිබඳ කෘත්‍යය වනුයේ ස්ත්‍රී පුරුෂයන්ගේ ලිංග, නිමිත්ත, කෘත්‍ය, ආකල්ප හා ආකාරයනට අනුව විධාන කිරීමයි; සුඛ, දුක්ඛ, සෝමනස්ස දෝමනස්ස යන ඉන්ද්‍රියයන්ගේ කෘත්‍යය වනුයේ සහජාත ධර්මයන් අභිබවා ඒ ඒ ඉන්ද්‍රියයනට අයත් ඖළාරික ආකාරයනට පැමිණවීමයි. උපෙක්ඛින්ද්‍රියය පිළිබඳ කෘත්‍යය වනුයේ ශාන්තවූ ප්‍රණීත වූ මධ්‍යස්ථාකාරයට පැමිණවීමයි, සද්ධින්ද්‍රියාදීන් පිළිබඳ කෘත්‍යය වනුයේ ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩලීම හා සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රසන්නාකාරාදී ස්වභාවයට පැමිණවීමයිඃ අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය පිළිබඳ කෘත්‍යය වනුයේ පළමු සංයෝජන තුන ප්‍රහීණ කිරීම හා සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රහාණය වෙත යොමු කරවීමයි; අඤ්ඤින්ද්‍රියය පිළිබඳ කෘත්‍යය වනුයේ කාමරාග, ව්‍යාපාද, යන සංයෝජනයන් දුර්වල කිරීම හා ප්‍රහීණ කිරීමද, සහජාත ධර්මයන් තමා වශයෙහි පැවැත්වීමද යන මේයි. අඤ්ඤාතාවීන්ද්‍රියය පිළිබඳ කෘත්‍යය වනුයේ සියලු කෘත්‍යයන් විෂයයෙහි උත්සුක භාවය ප්‍රහීණ කිරීම හා සම්ප්‍රයුක්ත ධර්මයන් නිවන කරා යොමු කරවනු පිණිස ප්‍රත්‍යය වීමයි. මෙසේ මෙහි කෘත්‍ය වශයෙන් විනිශ්චයය දතයුතුය.

'භූමිතො' යනුඃ- චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, ඉත්ථි, පුරිස, සුඛ, දුක්ඛ, දෝමනස්ස යන ඉන්ද්‍රියයෝ කාමාවචරම වෙති; මනින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යන මොහුද, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන මොහුද භූමි සතරටම අයත් වෙති;

සෝමනස්සින්ද්‍රියය කාමාවචර, රූපාවචර, ලෝකුත්තර යන භූමි තුනට අයත් වෙති. අවසන් ඉන්ද්‍රිය තුන ලෝකුත්තරම වේ. මෙසේ භූමි වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය. මෙසේ දැනඃ-

සංවෙග බහුලො භික්ඛු ඨිතො ඉන්ද්‍රියසංවරෙ
ඉන්ද්‍රියානි පරිඤ්ඤාය දුක්ඛස්සන්තං කරිස්සතීති

සංවේග බහුල කොට ඇති භික්ෂු තෙමේ ඉන්ද්‍රිය සංවරයෙහි පිහිටියේ ඉන්ද්‍රියයන් මනාකොට දැන දුක් කෙළවර කරන්නේය.

මේ ඉන්ද්‍රියයන් පිළිබඳ විස්තර කථාමුඛයයි

—//—

ඉන්ද්‍රියයනට අනතුරුව සත්‍යයෝය'යි, දුඃඛ ආර්ය සත්‍යය, දුඃඛ සමුදය ආර්ය සත්‍යය, දුඃඛ නිරෝධ ආර්ය සත්‍යය, දුඃඛ නිරෝධ-ගාමිනී පටිපදා ආර්ය සත්‍යය යන මේ චතුරාර්ය සත්‍යය දක්වනු ලැබේ. එහිඃ

විභාගතො නිබ්බචන - ලක්ඛණාදිප්පභෙදතො
අත්ථත්ථුද්ධාරතො චෙව අනූනාධිකතො තථා

කමතො ජාති ආදීනං නිච්ඡයා ඤාණ කිච්චතො
අන්තොගධානං පභේදා උපමාතො චතුක්කතො

සුඤ්ඤතෙක විධාදීහි සභාග විසභාගතො
විනිච්ඡයො වෙදිතබ්බො විඤ්ඤූනා සාසනක්කමෙ

විභාග වශයෙන්ද, නිර්වචන වශයෙන් හා ලක්ෂණාදී ප්‍රභේද වශයෙන්ද, අර්ථ වශයෙන් හා අර්ථය මතුකොට දැක්වීම් වශයෙන්ද, එසේම, නො-අඩු නොවැඩි බැව් වශයෙන්ද,

ක්‍රම වශයෙන්ද, ජාති ආදිය පිළිබඳ නිශ්චය වශයෙන්ද, ඥානකෘත්‍ය වශයෙන්ද, අන්තර්ගත ධර්මයන් පිළිබඳ ප්‍රභේද වශයෙන්ද, උපමා වශයෙන්ද, චතුෂ්ක වශයෙන්ද,

ශූන්‍ය වශයෙන් හා ඒකවිධාදී වශයෙන්ද, සභාග විසභාග වශයෙන්ද, (යන මේ සොළොස් ආකාරයෙන්) ශාසනක්‍රමයෙහි නිපුණ වූවහු විසින් මෙහි විනිශ්චයය දතයුතුය.

එහි, 'විභාගතො' යනු, දුඃඛාදී වූ එක් එක් සත්‍යයක් පිළිබඳව සතරක් සතරක් බැගින් තථ (තත්)වූ, අවිතථ (නොතතු නො) වූ, අනඤ්ඤථ (අන්අයුරු නො) වූ අර්ථයෝ බෙදා දක්වන ලද්දාහුය. එම දුඃඛාදිය විනිවිද දකිනු කැමැත්තවුන් විසින් එම අරුත් දතයුතුයඃ කියන ලදමැයිඃ- දුඃඛය පිළිබඳ පීඩනාර්ථය, සංඛතාර්ථය, සන්තාපාර්ථය,

විපරිණාමාර්ථය යන මේ සතර දුඃඛය පිළිබඳ තථ වූ, අවිතථවූ, අනඤ්ඤථ වූ දුඃඛාර්ථයි. සමුදයය පිළිබඳ ආයූහනාර්ථය, නිදානාර්ථය, සංයෝගාර්ථය -පෙ-, නිරෝධය පිළිබඳ නිශ්ශරණාර්ථය, විවික්තාර්ථය, අසංඛතාර්ථය, අමෘතාර්ථය-පෙ-, මාර්ගය පිළිබඳ නිර්ගමනාර්ථය, හේත්වර්ථය, දර්ශනාර්ථය, ආධිපත්‍යාර්ථය යන මේ සතර මාර්ගය පිළිබඳ තථවූ, අවිතථවූ, අනඤ්ඤථවූ මාර්ගාර්ථයි. එසේම දුක පිළිබඳ පීඩනාර්ථය, සංඛතාර්ථය, සන්තාපාර්ථය, හා විපරිණාමාර්ථය අවබෝධ කරගත යුතු අර්ථයි, යන මේ ආදියයි. මේ ආකාරයෙන් සතරක් සතරක් බැගින් බෙදා දක්වන ලද අර්ථයන් අනුව දුඃඛ ආදිය දතයුතුය. මේ මෙහි විභාග වශයෙන් වූ විනිශ්චයයි.

'නිබ්බචන ලක්ඛණාදිප්පභේදතො' යන මෙහි, පළමුකොට නිර්වචන වශයෙන් යනු, 'දු' යන මේ ශබ්දය කුත්සිතාර්ථය දක්නා ලැබේ. කුත්සිත වූ (නින්‍දා කටයුතු) පුත්‍රයා 'දුප්පුත්ත' යයි කියනු ලැබේ. ඛ-ශබ්දය රික්තාර්ථයෙහි වේ. හිස් වූ ආකාශය 'ඛ' යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ පළමුවන (දුඃඛ) සත්‍යය නොයෙක් උවදුරුවලට උත්පත්ති ස්ථාන වූ හෙයින් කුත්සිත වේ. අඥාන ජනයා විසින් ඇතැ'යි සලකනු ලබන නිත්‍ය-ශුභ,-සුඛ-ආත්ම ස්වභාවයෙන් තොරවූ හෙයින් තුච්ඡ (හිස්) ද වේ. එහෙයින් නින්දිත වූ බැවින්ද තුච්ඡ වූ බැවින්ද 'දුක්ඛ' යයි කියනු ලැබේ.

'සං' යන මේ ශබ්දය 'සමාගම', 'සමේත' ආදි තන්හි සංයෝගාර්ථය දක්වයි; 'උ' යන මේ ශබ්දය 'උප්පන්න', 'උදිත' ආදී තන්හි උත්පත්ති අර්ථයද, 'අය' ශබ්දය කාරණාර්ථයද පවසයි. මේ දෙවන (සමුදය) සත්‍යයද සෙසු ප්‍රත්‍යයන්ගේ සංයෝගය ඇති කල්හි දුක ඉපැදීමට හේතු වේ; මෙසේ දුකෙහි උපතට හේතුවූ හෙයින්, දුක් හා සමග යෙදීමෙන් 'දුක්ඛ සමුදය'යි කියනු ලැබේ.

තුන්වන සත්‍යය, යම් හෙයකින් 'නි' ශබ්දය අභාවාර්ථයද, 'රෝධ' ශබ්දය චාරක (සිර ගෙය යන) අර්ථයද දක්වන හෙයින් මෙහි සංසාරචාරකයයි කියනු ලබන දුඃඛ නමැති සිරගෙය අභාවයට පත්වේ. සියලු සංසාරගති ශූන්‍ය වූ හෙයිනි. නොහොත්, එය අවබෝධ කළ විට 'සංසාරචාරක'යයි කියනු ලබන දුඃඛ නමැති චාරකයෙහි අභාවය සිදුවේ. එම සංසාර නමැති සිරගෙයට ප්‍රතිපක්ෂවූ හෙයින්ද 'දුක්ඛ නිරෝධ' යයි කියනු ලැබේ. දුඃඛය පිළිබඳ අනුත්පාද නිරෝධයට ප්‍රත්‍යය වන හෙයින් හෝ 'දුක්ඛ නිරෝධ'යයි කියනු ලැබේ.

සිවුවන සත්‍යය වනාහි, යම් හෙයකින් දුඃඛ නිරෝධයට අරමුණු වශයෙන් අභිමුඛ වන හෙයින් එම දුක්ඛනිරෝධය කරා යෙයිද, තවද එම දුක්ඛ නිරෝධය කරා පැමිණීමේ ප්‍රතිපදාව වෙයිද, එහෙයින් දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදායයි කියනු ලැබේ.

යම් හෙයකින් වනාහි මේ සත්‍යයන් බුද්ධාදී ආර්යයන් විසින් අවබෝධ කරනු ලබත්ද, එහෙයින් ආර්යසත්‍යයයි කියනු ලැබෙති. කියනලදමැයි:- "මහණෙනි, මේ ආර්යසත්‍යයෝ සතරෙක් වෙති. කවර නම් සතරෙක්ද? -පෙ- මහණෙනි මේ සතර ආර්ය සත්‍යයෝය, ආර්යයෝ මේ සත්‍යයන් අවබෝධ කෙරෙති. එහෙයින් ආර්යසත්‍යයයි කියනු ලැබෙති"[a]. තවද ආර්ය වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට අයත් සත්‍යයෝයි යන අර්ථයෙන්ද ආර්ය සත්‍ය නම් වෙති. කියනලදමැයි:- "මහණෙනි, දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- තථාගතයන් වහන්සේ උතුම් (ආර්ය නම්) වෙති, එහෙයින් ආර්යසත්‍යයයි කියනු ලැබෙති"[a] නොහොත්, මේ චතුස්සත්‍යයන් මනාකොට අවබෝධ කිරීමෙන් ආර්යභාවය සිද්ධවූ හෙයින්ද ආර්යසත්‍ය නම් වෙති. කියනලදමැයි:- "මහණෙනි, මේ චතුස්සත්‍යයන් තත්වූ පරිද්දෙන් අවබෝධ කළ හෙයින් තථාගත වූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ 'ආර්ය' යනුවෙන් වහරනු ලැබෙති"[a]. තවද 'උතුම් වූ සත්‍ය' යන අරුතින්ද ආර්යසත්‍ය නම් වෙති. 'ආර්ය' යනු තත්වූ, නොතතුනොවූ, අව්‍යාජවූ යන අර්ථයි කියනලදමැයි:- "මහණෙනි, මේ චතුස්සත්‍යයෝ ඇති තතුම වෙති. නොතතු නොවෙති. අන්තතුද නොවෙති. එහෙයින් ආර්යසත්‍යයයි කියන ලැබෙති[a]. මෙසේ නිර්වචන වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

ලක්ඛණාදිප්පභේදතො යනුः ලක්‍ෂණාදී ප්‍රභේද වශයෙන් කෙසේද යත්:- මෙහි වනාහි දුඃඛ සත්‍යය පෙළීම ලක්‍ෂණ කොට ඇත්තේය. සන්තාපය කෘත්‍යය කොට ඇත්තේය, (සසරවට) පැවැත්ම වැටහීම් කොට ඇත්තේය; සමුදය සත්‍යය ප්‍රභවය ලක්‍ෂණ කොට ඇත්තේය, නොකඩවා පැවැත්වීම කෘත්‍යය කොට ඇත්තේය. (සසරින් නික්මීම) වැළැක්වීම, අවහිර කිරීම වැටහීම් කොට ඇත්තේය; නිරෝධ සත්‍යය ශාන්තිය (සමනය) ලක්‍ෂණ කොට ඇත්තේය, නිර්වාණය කෘත්‍යය කොට ඇත්තේය. (පංචස්කන්ධ විෂයයෙහි) නිමිති රහිත බව වැටහීම් කොට ඇත්තේය; මාර්ගසත්‍යය නිර්යාණය (හෙවත් ප්‍රගතිය) ලක්‍ෂණ කොට ඇත්තේය. කෙලෙස් පහකිරීම කෘත්‍යය කොට ඇත්තේය. (උපාදානයන්ගෙන්) නැඟී සිටීම වැටහීම් කොට ඇත්තේය. තවද (සත්‍ය සතර) පිළිවෙළින් පැවැත්ම, පැවැත්වීම, නැවැත්ම, නැවැත්වීම ලක්‍ෂණ කොට ඇත්තේය. එසේම (පිළිවෙළින්) සංස්කාර භාවය, තෘෂ්ණාව, අසංස්කාර භාවය, සම්‍යග්දර්ශනය ලක්‍ෂණ කොට ඇත්තේය. මෙසේ ලක්‍ෂණාදී ප්‍රභේද වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

අත්ථතුද්ධාරතො යන මෙහි, පළමුකොට අර්ථ වශයෙන් සත්‍යයන් පිළිබඳ අර්ථය කවරේද යත්:- යම් සත්‍යාර්ථයක් ප්‍රඥා නමැති ඇසින් පිරික්සන්නවුනට මායාවක් සෙයින් විපරීතව, මිරිඟුවක් සෙයින් රවටන

---

a. සං. යු. කෝටිගාමවග්ග

සුලුව, තීර්ථකයන්ගේ ආත්ම සංකල්පය සෙයින් නොලැබිය හැකි ස්වභාව ඇත්තක්ව නොවැටහේද, එහෙත් (පිළිවෙළින්) බාධන, ප්‍රභව, ශාන්ති හා නිර්යාන (ප්‍රගති) ලක්‍ෂණයෙන් තථ්‍යවූද, අවිපරීත වූද ස්වභාවයෙන් ආර්යඥානයට ගෝචර වේද, මේ සත්‍යාර්ථය ගින්නෙහි ලක්‍ෂණය බඳු, ලෝකස්වභාවය බඳු, තථ්‍ය වූ, අවිපරීතවූ ස්වභාවයයි දතයුතුය. කියනලදමැයි:- ''මහණෙනි, 'මේ ස්වභාවය දුකය' යන මේ නිගමනය ඇති තතුවේ. නොතතු නොවේ. අන්තතුද නොවේ''[a] යනුවෙන් විස්තර වේ. තවද:

නාබාධකං යතො දුක්ඛං දුක්ඛා අඤ්ඤං නබාධකං
බාධකත්තනියාමෙන තතො සච්චමිදං මතං

යං විනා නාඤ්ඤතො දුක්ඛං නහොති නච තං තතො
දුක්ඛහෙතුනියාමෙන ඉති සච්චං විසත්තිකා

නාඤ්ඤා නිබ්බාණතො සන්ති සන්තං න ච න තං යතො
සන්තභාව නියාමෙන තතො සච්චමිදං මතං

මග්ගා අඤ්ඤං න නිය්‍යානං අනිය්‍යානො න චාපි සො
තච්ඡ නිය්‍යානභාවත්තා ඉති සො සච්ච සම්මතො

ඉති තච්ඡා විපල්ලාස භූත භාවං චතූසවපි
දුක්ඛාදි සවිසෙසෙන සච්චට්ඨං ආහු පණ්ඩිතා'ති

යම් හෙයකින් අබාධක වූ දුකෙක් නැත්ද, දුකින් තොර වූ බාධකයෙක් නැත්ද, එහෙයින් බාධකත්ව නියාමයෙන් මෙය (දුඃඛ) සත්‍යයයි දන්නා ලදී.

එම තෘෂ්ණාව හැර අනෙකෙකින් දුකෙක් නොවේ. එයින් දුක හැර අනෙකෙක්ද නොවේ. එහෙයින් මෙසේ දුකට හේතු වීමේ නියාමයෙන් තෘෂ්ණාව සත්‍ය වේ.

නිර්වාණය හැර අන් ශාන්තියක් නැත. ශාන්ත නොවූ නිර්වාණයක්ද නැත. එහෙයින් ශාන්තභාව නියාමයෙන් මෙය සත්‍යයයි දන්නා ලදී.

ආර්ය මාර්ගය හැර අන් නිර්යාණයක් (ප්‍රගතියක්) නැත. ප්‍රගති නොවන මාර්ගයෙක්ද නැත. තථ්‍ය වූ ප්‍රගතිභාවයෙන් එය සත්‍යයයි සම්මතය.

මෙසේ පණ්ඩිතයෝ දුඃඛාදීවූ සතරෙහිම තථ්‍ය-අවිපරීත භාවය වූ සත්‍යාර්ථය අවිශේෂයෙන් කීහු.

---

a. සං. නි. ධම්මචක්කප්පවත්තන වග්ග

මෙසේ අර්ථ වශයෙන් විනිශ්චයය දතයුතුය.

අත්ථුද්ධාරතො යනු, අර්ථය මතුකොට දැක්වීම් වශයෙන් කෙසේද යත්:- මේ 'සච්ච' - ශබ්දය මෙහි නොයෙක් අර්ථයන්හි දක්නා ලැබේ. ඒ මෙසේයි:- 'සච්චං භණෙ නකුජ්ඣෙය්‍ය''[a] (සත්‍යය කථා කළ යුතුය, නොකිපිය යුතුය) යන ආදි තන්හි සත්‍ය වචනය යන අර්ථයෙහිය. ''සච්චෙ ඨිතා සමණබ්‍රාහ්මණාච'' (සත්‍යයෙහි පිහිටි ශ්‍රමණ බ්‍රාහ්මණයෝද) යන ආදී තන්හි විරති සත්‍යය හෙවත් අසත්‍යයෙන් වැලකීම යන අර්ථයෙහිය, ''කස්මා නු සච්චානි වදන්ති නානා පවාදියාසෙ කුසලාවදානා''[b](කීමෙහි බිණීමෙහි බුහුටි මතවාදීහු කවර හෙයින් එකිනෙකට වෙනස් සත්‍යයන් ප්‍රකාශ කෙරෙත්ද?) යන ආදී තන්හි දෘෂ්ටි සත්‍යය (අදහනු ලබන දෘෂ්ටිය) යන අර්ථයෙහිය. ''එකං හි සච්චං නදුතියමත්ථි''[c] (සත්‍යය එකක්ම වේ. දෙවැන්නක් නොමැත) යන ආදී තන්හි පරමාර්ථසත්‍යය, නිර්වාණය, මාර්ගය යන අර්ථවිෂයෙහිය; ''චතුන්නං සච්චානං කති කුසලා''[d] (චතුස්සත්‍යයන් අතුරින් කෙතෙක් කුශල වේද?) යන ආදී තන්හි ආර්යසත්‍ය විෂයෙහිය. මෙහිද එය ආර්ය සත්‍යය යන අර්ථයෙහිය. මෙසේ අත්ථුද්ධාර වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

අනූනාධිකතො යනු, කවර හෙයින් අඩු වැඩි නැතිව ආර්යසත්‍යයන් සතරක්ම දේශනා කරන ලද්දේද යත්:- මේ සතරට වඩා වැඩි අන් සත්‍යයක් හෝ මේ සතරින් බැහැර කළයුතු එකක් හෝ නැත්මය කියන ලද මැයි:- ''මහණෙනි, මේ ලෝකයෙහි ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ, 'මේ දුඃඛ ආර්ය සත්‍යය නොවෙයි. දුඃඛාර්ය සත්‍යය අනෙකෙකි. මේ දුඃඛාර්ය සත්‍යය බැහැරකොට මම් අනෙක් ආර්යසත්‍යයක් පණවමි'යි ඉදිරිපත් වෙති'යි යන මේ කාරණය සිදුවිය නොහැකිය''[e] යන ආදියයි. මෙසේද කියන ලදමැයි:- ''මහණෙනි, යම් කිසි ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ, 'ශ්‍රමණ ගෞතමයන් විසින් දේශනා කරන ලද්දේ පළමුවන දුඃඛාර්ය සත්‍යය නොවේ. මම් මේ දුඃඛාර්ය සත්‍යය ප්‍රතික්ෂේප කොට අන් දුඃඛාර්ය සත්‍යයක් පණවමි'යි කියතැ'යි යන මේ කාරණය සිදු විය නොහැකිය''[f] යන ආදියයි. තවද, භාග්‍යවතුන් වහන්සේ පැවැත්ම ප්‍රකාශ කරමින් එයට හේතුවද නැවැත්ම ප්‍රකාශ කරමින් එයට උපායද ප්‍රකාශ කළහ. මෙසේ පැවැත්මද, නැවැත්මද, ඒ දෙකට හේතුන්දැයි ඒත පරම (උපරිම) වශයෙන් සතරක්ම කියන ලදි. එසේම මනාකොට දතයුතු දෙය, ප්‍රහීණ කළයුතු දෙය අවබෝධ කළයුතු දෙය හා වැඩිය යුතු දෙය

a. ධ. ප. කෝධ වග්ග
b. සු. නි. චූලවියූහ සුත්ත
c. විභඞ්ග, සච්චවිභඞ්ග
d. සං. යු. ධම්මචක්කප්පවත්තන වග්ග
e. විභඞ්ග, සච්චවිභඞ්ග
f. සං. නි. ධම්මචක්කප්පවත්තන වග්ග

යනුවෙන්ද, තෘෂ්ණාව පදනම් කොට ඇති දෙය (දුක), එම තෘෂ්ණාව, තෘෂ්ණාව වැලැක්වීම, හා තෘෂ්ණාව වැලැක්වීමේ මාර්ගය යනුවෙන්ද, (තෘෂ්ණාවට) අරමුණය, අරමුණෙහි ඇලෙන බවය. අරමුණ වැලැක්වීමය. අරමුණ වැලැක්වීමේ උපායය යනුවෙන්ද සතරක්ම ප්‍රකාශ කරන ලදැ'යි මෙසේ අනූනාධික වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

කමතො යන මෙයද දේශනා ක්‍රමයම වේ. මෙහි වනාහි ඖළාරික වූ හෙයින්ද, සියලු සත්ත්වයනට පොදුවූ හෙයින්ද, පහසුවෙන් තේරුම් ගතහැකි වෙති'යි දුඃඛ සත්‍යය ප්‍රථමයෙන් කියනලදි. එම දුඃඛ සත්‍යයටම හේතු දක්වනු පිණිස එයට අනතුරුව සමුදය සත්‍යයද, හේතුව වැලැක්වීමෙන් ඵලයද වැලකෙති'යි දක්වනු පිණිස එයට අනතුරුව නිරෝධ සත්‍යයද, එය අවබෝධ කිරීමේ උපාය දක්වනු පිණිස අවසන්හි මාර්ග සත්‍යයද කියන ලදි. නොහොත්, භවසුඛාස්වාදයෙහි බැඳුණු සත්ත්වයන්හට සංවේග දනවනු පිණිස ප්‍රථමයෙන් දුඃඛසත්‍යය කියන ලදි. එම දුඃඛයද නොකරන ලදුව (ආකස්මිකව) නොඑති'යි ඊශ්වර නිර්මාණාදියෙන් නොවෙති'යි මෙම හේතුවෙන් වෙති'යි දන්වනු පිණිස එයට අනතුරුව සමුදය සත්‍යය කියනලදි. සහේතුක වූ දුකින් පීඩිත වීමෙන් සංවේගයට පත් සිත් ඇතිව විමුක්තිය සොයන්නන්හට එම විමුක්තිය දැක්වීමෙන් සහනය දනවනු පිණිස නිරෝධ සත්‍යය කියන ලදි. එම නිරෝධය අවබෝධ කරවනු පිණිස එයට පමුණුවන මාර්ග සත්‍යය කියනලදි. මෙසේ මෙහි අනුක්‍රම වශයෙන් විනිශ්චයය දතයුතුය.

ජාති ආදීනං නිච්ඡයා යනු, යම් ඒ ආර්ය සත්‍යයන් දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ විසින් 'ජාතිපි දුක්ඛා' ආදී වශයෙන් ''ඉපදීම දුකෙකි, ජරාවද දුකෙකි, මරණයද දුකෙකි, ශෝක පරිදේව (වැලපීම්) ශාරීරික පීඩා, මානසික පීඩා, ආයාස (වෙහෙස) යන මේවාද දුක්ය. අප්‍රියයන් හා සමග එක්වීමද දුකෙකි. ප්‍රියයන්ගෙන් වියෝවීමද දුකෙකි. කැමැති දෙය නොලැබීමද දුකෙකි. සංක්ෂේපයෙන් (කියතොත්) උපාදානස්කන්ධ පංචකයම දුකෙකි''[a]යි දුක්ඛ නිද්දේසයෙහි දුඃඛස්වභාවයන් දොළොසක්ද, ''පුනර්භවය ඇති කරන, නන්දිරාගයෙන් යුක්තවූ, ඒ ඒ තන්හි සතුට දනවන, කාම තණ්හා. භව තණ්හා, විභව තණ්හා යන යම් මේ තෘෂ්ණාවක් වේදැ''[a]යි සමුදය නිද්දේසයෙහි ත්‍රිවිධ තෘෂ්ණාවක්ද, එම තෘෂ්ණාවම පිළිබඳ යම් නිරවශේෂ ප්‍රහාණයක්, අත්හැරීමක්, බැහැර කිරීමක්, මිදීමක්, නො-ඇලීමක් වේදැ''[a] යි මෙසේ නිරෝධ නිද්දේසයෙහි අර්ථ වශයෙන් එකම නිර්වාණයද, ''දුක් වැලැක්වීමේ මාර්ගය වූ ආර්ය සත්‍යය කවරේද? සම්මාදිට්ඨි, සම්මා වාචා -පෙ- සම්මා සමාධි යන මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමය''යි[a] මෙසේ මාර්ග නිර්දේශයෙහි ධර්මයන් අටක්ද කියන ලදි. මේ ආකාරයෙන් චතුස්සත්‍ය නිද්දේසයෙහි ජාති ආදී ධර්මයෝ

a. විභඞ්ග, සච්චවිභඞ්ග

කියන ලදහ. එම ජාති ආදී ධර්මයන් පිළිබඳ නිශ්චය ක්‍රමයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය, කෙසේද යත්:-

මේ ජාති-ශබ්දය වූකලී නොයෙක් අරුත් ඇත්තෙකි. ඒ එසේමැයි, ''එකම්පි ජාතිං ද්වේ'පි ජාතියො''[(a)] (එක් ආත්මභාවයක්ද ආත්මභාව දෙකක්දැ'යි) යන මෙහි මෙය භව-අර්ථයෙහි වේ; ''අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාති''[(b)] (විශාඛාවෙනි. නිගණ්ඨ නම්වූ ශ්‍රමණ නිකායක් ඇත) යන මෙහි නිකායාර්ථයෙහි වේ; ''ජාති ද්වීහි ඛන්ධෙහි සඞ්ගහිතා (හටගැනීම ස්කන්ධ දෙකෙකින් සංගෘහීත වේ) යන මෙහි සංස්කාර ලක්ෂණයෙහි වේ. ''යං මාතු කුච්ඡිස්මිං පඨමං චිත්තං උප්පන්නං, පඨමං විඤ්ඤාණං පාතුභූතං, තදුපාදාය සාවස්ස ජාති'' (මව්කුස තුළ පළමුවෙන් සිත උපදනේද, පළමුවරට (ප්‍රතිසන්ධි) විඥ්ඥාණය පහළ වේද එතැන් සිට එයම ඔහුගේ උපත වේ) යන මෙහි පිළිසිඳීම් අරුත්හි වේ; ''සම්පති ජාතො ආනන්ද බෝධිසත්තො[(c)] (ආනන්දය, උපන් වනම බෝධිසත්ව තෙමේ) යන මෙහි බිහිවීම් අරුත්හි වේ; ''අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන''[(d)] (කුලවාදය නිසා බැහැර කරන ලද්දේ, හෙලා දකින ලද්දේ නොවේ) යන මෙහි කුලය යන අරුත්හි වේ; ''යතො'හං භගිනි, අරියාය ජාතියා ජාතො[(e)] (නැඟණිය, මා ආර්යජාතියෙහි උපන් තැන් පටන්) යන මෙහි 'උතුම් ශීලය' යන අර්ථයෙහි වේ. මෙහි වනාහි ජාති-ශබ්දය මව්කුස හෝනවුන්ගේ (ජලාබුජ සත්වයන්ගේ) පිළිසිඳීමේ පටන් මව්කුසින් බිහිවීම දක්වා පැවති ස්කන්ධයන් කෙරෙහි වේ. (අණ්ඩජ ආදී) සෙසු සත්වයන්ගේ ප්‍රතිසන්ධියෙහිදී පහළ වන ස්කන්ධයන් පමණක් හැඟවෙතැ'යි දතයුතුය. මේ වනාහි පර්යාය (සම්මුති) කථායි, නිෂ්පර්යාය (පරමාර්ථ) වශයෙන් වනාහි ඒ ඒ තැන උපදනා සත්වයන්ගේ යම් යම් ස්කන්ධයෝ පහළ වෙත්ද, ඒ ඒ ස්කන්ධයන් අතුරෙන් ප්‍රථම පහළ වීම ජාති නම් වේ. එම ජාතිය ඒ ඒ භවයෙහි ප්‍රථමයෙන්ම ඉපැදීම ලක්ෂණ කොට ඇත්තේය. දුක් කරා මෙහෙයවීම කෘත්‍යය කොට ඇත්තේය. ඉකුත් භවයෙන් මේ භවයට මතුවීම වැටහීම් කොට ඇත්තේය. දුඃඛ විචිත්‍රතාව (දුක් නොයෙක් ආකාර වන බව) හෝ වැටහීම් කොට ඇත්තේ වේ.

කවර හෙයින් මෙය (ඉපදීම) දුක් නම් වන්නේද? අනේක ප්‍රකාර වූ දුක්වලට වස්තුවන හෙයිනි. දුක් වනාහි නොයෙක් ආකාර ඇත්තේ වේ; ඒ මෙසේයි:- දුක්ඛ දුක්ඛය, විපරිනාම දුක්ඛය, සංඛාර දුක්ඛය,

---

a. විභඞ්ග ඤාණ විභඞ්ග
b. අං. නි. විසාඛුපොසථ සුත්ත
c. දි. නි. මහාපදාන සුත්ත
d. අං. නි. තිකණ්ණ සුත්ත
e. ම. නි. අඞ්ගුලිමාල සුත්ත

පටිච්ඡන්න දුක්ඛය, අපටිච්ඡන්න දුක්ඛය, පරියාය දුක්ඛය, නිප්පරියාය දුක්ඛයයි යනුවෙනි. එහි, කායික චෛතසික දුක්ඛවේදනා ස්වභාව වශයෙන්ද, නාම වශයෙන්ද දුක් වන හෙයින් දුක්ඛ දුක්ඛයයි කියනු ලැබේ; සුඛවේදනා විපරිණාමයෙන් දුක් ඉපැදීමට හේතුවන හෙයින් විපරිණාම දුක්ඛයයිද, උපෙක්ඛා වේදනා හා භවත්‍රයයට අයත් සංස්කාරයන් ඇතිව නැතිවන සුලු හෙයින් සංඛාර දුක්ඛ යයිද කියනු ලැබේ; කන් කැක්කුම්, දත් කැක්කුම්, රාගයෙන් උපන් පරිදාහ, ද්වේෂයෙන් උපන් පරිදාහ ආදී කායික, මානසික ආබාධයන් විමසා දතයුතු හෙයින්ද, උපක්‍රම අප්‍රකට හෙයින්ද, පටිච්ඡන්න දුක්ඛ නම්වේ; අපාකට දුක්ඛයයිද කියනු ලැබේ. දෙතිස් වධ බන්ධනාදියෙන් උපන් පීඩා නොවිමසාම දත හැකි වන හෙයින්ද, උපක්‍රමයන් ප්‍රකට වන හෙයින්ද අප්පටිච්ඡන්න දුක්ඛ නම්වේ. පාකටදුක්ඛ යයිද කියනු ලැබේ. දුක්ඛදුක්ඛය හැර සෙසු දුඃඛයන් දුක්ඛ සච්ච විභඞ්ගයෙහි ආයේය. ජාති ආදීවූ සියල්ලම, ඒ ඒ දුඃඛයනට වස්තුවන හෙයින් පර්යාය (අනියත) දුඃඛ යයිද, දුක්ඛ දුක්ඛය වනාහි නිප්පරියාය (නියත) දුක්ඛයයිද කියනු ලැබේ.

එහි, මේ ජාති හෙවත් ඉපදීම බාල පණ්ඩිත සුත්ත ආදියෙහි භාග්‍යවතුන් වහන්සේ විසින්ද උපමා වශයෙන් ප්‍රකාශ කරන ලද යම් අපාදුකක් වේද, එසේම සුගති සංඛ්‍යාත මිනිස් ලොවෙහි මව්කුස පිවිසීම ආදිය මුල් කොට යම් දුකක් උපදීද, එයට වස්තු වන හෙයින් දුඃඛ නම්වේ. එහි, ගබ්භොක්කන්ති මූලක (මව්කුස පිවිසීම් ආදිය මුල් කොට ඇති වන) ආදී හේතු සහිත දුඃඛය මෙසේයිඃ- මේ සත්ව තෙමේ මව්කුස උපදනේ උපුල්, රත්පියුම්, හෙළ පියුම් ආදිය තුළ මෙන් (සුවසේ) උපදනේ නොවේඃ තවද ආමාශයට යටින් පක්වාශයට උඩින් උදර පටලයටත් පිටකටුවටත් මැදිව, ඉතා ගැහැට සහිත, සතාන්ධකාර සහිත, නොයෙක් කුණු ගඳ වැකුණු ඉතා දුගඳවත් වාතයට විවර වූ ඉතාමත් පිළිකුල් දනවන කුස් පෙදෙසෙක්හි, කුණුමසකු තුළ, පිළුනු කොමුපිඬුවක් තුළ, අසූචිවළක් තුළ උපදනා පණුවකු මෙන් උපදනේය; එසේ උපන් ඒ සත්ව තෙමේ දසමසක් මව්කුස හටගත් උණුසුමින් උනෙහි පැසෙන පිට්ටුවක් සෙයින් වේදුමින් පැසෙමින්, අත් පා හැකිලීම් දිග හැරීම් ආදියට පවා අස්වැසුමක් නැතිව, ඉතා දැඩි දුකක් විඳියි; මේ වනාහි ගබ්භොක්කන්ති මූලක දුක්ඛයයි.

මව, තදින් පැකිලෙන විට, ගමන් කරන විට, හිඳින සිටින විට, පෙරළෙන විට සුරා සොඬකු අතට පත් එළුවකු සෙයින්ද, අහිගුණ්ඨිකයකු අතපත් සප් පැටියකු සෙයින්ද පෙරට ඇදීම් පස්සට ඇදීම්, උඩු අතට යටි අතට සෙලවීම් ආදී ක්‍රියාවලින් ඒ සත්ව තෙමේ යම් දුකක් විඳීද, තවද මව් සිහිල් දිය පානය කරන විට සීත නරකයෙහි උපන්නකු සෙයින්ද, උණු කැඳ බත් ආදිය අනුභව කරන විට අඟුරු වැස්සෙකින් වසනු

ලබන්නකු සෙයින්ද, ලුණු ඇඹුල් පරිභෝග කරන විට බාරාපතච්ඡික (සිරුර කේදිලා කාඩිගැල්වීම) වැනි වධ දෙනු ලබන්නකු සෙයින්ද, යම් කටුක දුකක් විඳීද, මේ ගබ්භපරිහරණ මූලක දුක්ඛයයි.

මව මූඪගර්භ (ගබ්සා) ඇත්තියක් වුවහොත් යහළුවන්, මිතුරන්, හිතවතුන්ට පවා බලා සිටිය නොහැකි තරම් දුක් ඉපදීමට හේතුවූ කැපුම් කෙටුම් ආදියෙන් මේ සත්වයාහට යම් දුකෙක් උපදීද, මේ ගබ්භ-විපත්ති-මූලක දුක්ඛයයි.

ප්‍රසූත කරනුලබන විට මවගේ කර්මජවාතයෙන් පෙරලී නරක ප්‍රපාතයක් බඳු, ඉතා බිය දනවන යෝනි මාර්ගයට පිවිසවනු ලබන සත්වයාහට, ඉතා ගැහැට සහිත යෝනිමාර්ගයෙන් පිටතට තෙරපවනු ලබන විට යතුරු සිදුරෙකින් තෙරපවනු ලබන මහ ඇතකුට මෙන්ද, සඞ්ඝාත නරකයෙහි පර්වතයන්ගෙන් සුණු කරනු ලබන තිරිසතකුට මෙන්ද යම් දුකෙක් උපදීද, මේ විජායනමූලක දුක්ඛයයි.

උපන් කෙණෙහි අලුත් වණයක් බඳු සියුමැලි සිරුරු ඇති සත්වයාහට අතිනතට ගැනීම, නැහැවීම, සේදීම, රෙදිකඩින් පිස දැමීම ආදිය කරන විට හිදිතුඩු, කරකැති (දැළිපිහි) ආදියෙන් විදුම් පැළුම් ආදිය කරන විට මෙන් යම් දුකෙක් උපදීද, මේ මාතුකුච්ඡිතො-බහි-නික්ඛමන-මූලක දුක්ඛයයි.

ඉක්බිති ජිවත් වීමේදී තමා විසින්ම තමාට වධදී ගැනීමෙන් අචේළක (නිගණ්ඨ) ව්‍රත ආදී වශයෙන් ඇතුළතින් පිටතින් තවා-ගැනීමෙහි යෙදෙන විටද, ක්‍රෝධ වශයෙන් (තරහවී) අහර නොගෙන සිටින විටද, (කොකුවලින්) එල්බ සිටින විටද යම් දුකෙක් උපදීද, මේ අත්තූපක්කම-මූලක-දුක්ඛයයි.

අනුන්ගේ වධබන්ධනාදිය විඳින විට යම් දුකෙක් උපදීද, මේ පරූපක්කම-මූලක දුක්ඛයයි. මෙසේ මේ සියලු දුකට මේ ජාති හෙවත් ඉපැදීම වස්තු වේමය. එහෙයින් කියනු ලැබේ:-

''ජායෙථ නො චෙ නරකෙසු සත්තො තත්‍ථග්ගිදාහාදිකමප්පසය්හං
ලභෙථ දුක්ඛන්නු කුහිං පතිට්ඨං ඉච්චාහ දුක්ඛාති මුනීධ ජාති

ඉදින් සත්ව තෙමේ නරකයෙහි නො-උපදින්නේ නම්, එහි ගිනිගෙන දැවීම් ආදී නො-ඉවසිය හැකි දුක් කොතැනෙක ප්‍රතිෂ්ඨාවක් ලබන්නේද? එහෙයින් මුනීන්ද්‍රයන් වහන්සේ ජාතිය (ඉපදීම) දුකෙකියි පැවසූ සේක.

''දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද දණ්ඩාභිඝාතාදිභවං අනෙකං
යං තං කථං තත්‍ථ භවෙය්‍ය ජාතිං විනා තහිං ජාති තතො'පි දුක්ඛා

තිරිසන් ජාතියෙහිදී කස, කෙවිටි, මුගුරු පහර ආදියෙන් සිදුවන අනේකවිධ වූ යම් දුකෙක් ඇද්ද, එම තිරිසන් ජාතියෙහි ඉපදීමෙන් තොරව එය එය කෙසේ සිදුවන්නේද? එහෙයින්ද ඉපැදීම දුකෙකි.

''පෙතෙසු දුක්ඛං පන ඛුප්පිපාසා වාතාතපාදිප්පභවං විචිත්තං
යස්මා අජාතස්ස න තත්‍ථ අත්‍ථි තස්මාපි දුක්ඛං මුනිජාතිමාහ

ප්‍රේත ලෝකයෙහි සා පිපාසා, අව්, සුළං ආදියෙන් සිදුවන අනේකවිධ වූ දුක් එහි නො-උපන්නකුට සිදු නොවන්නේද, එහෙයින්ද ඉපදීම දුකෙකි'යි මුනීන්‍ද්‍රයන් වහන්සේ පැවසූ සේක.

තිබ්බන්‍ධකාරෙච අසය්හසීතෙ ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං
න තං භවෙ තත්‍ථ නචස්ස ජාති යතො අයං ජාති තතොපි දුක්ඛා''

ඝනාන්‍ධකාර සහිතවූ නො-ඉවසියහැකි ශීතයෙන් යුත්, ලෝකාන්තරික නරකයෙහි අසුරනිකායෙහි යම්දුකෙක් ඇත්ද, යම් ලෙසකින් එහි ඉපදීමක් නැතොත් එම දුක සිදු නොවන්නේය, එහෙයින්ද මේ ඉපදීම දුකෙකි.

''යඤ්චාපි ගූථනරකෙ විය මාතුගබ්භෙ
සත්තො වසං චිරමථො බහි නික්ඛමඤ්ච
පප්පොති දුක්ඛමතිඝොර මිදම්පි නත්‍ථි
ජාතිං විනා ඉතිපි ජාතිරයං හි දුක්ඛා

තවද ගූථනරකය වැනි මාතෘගර්භය තුළ සත්වයා දිගු කලක් වැස ඉන්පසු පිටතට නික්මෙමින් යම් ඝොරතර දුකකට පත්වේද, ඉපැදීමක් නැතහොත් එම දුකද නැත; එහෙයින්ද මේ ඉපැදීම දුකෙකි.

''කිං භාසිතෙන බහුනා නනු යං කුහිඤ්චි
අත්‍ථීධ කිඤ්චිදපි දුක්ඛමිදං කදාචි
නෙවත්‍ථි ජාති විරහෙ යදතො මහෙසී
දුක්ඛාති සබ්බපඨමං ඉමමාහ ජාති'න්ති

බොහෝ කොට කියනු කිම? මේ ලෝකයෙහි කවර කලෙකවත්, කවර තැනෙක වත්, යම් මේ කවර හෝ දුකක් ඇතොත්, ඒ කිසිවක් ඉපැදීමක් නැතොත් සිදු නොවන්නේ නොවේද? එහෙයින් මහාමුනීන්‍ද්‍රයන් වහන්සේ සියල්ලට ප්‍රථම මේ ඉපැදීම දුකෙකි'යි ප්‍රකාශ කළ සේක.

මේ පළමුකොට ජාති (ඉපැදීම පිළිබඳ) විනිශ්චයයි.

——//——

'ජරාපිදුක්ඛා' යන මෙහි, ජරාව (දිරාපත්වීම) ද්විවිධ වේ: සඞ්ඛත ලක්ඛණ සඞ්ඛ්‍යාත අප්‍රකට ජරාව හා 'ඛණ්ඩිච්ච' (දත්වැටීම-කෙස් හැලීම)

යයි සම්මතවූ, සංසාර පැවැත්ම තුළ එක් භවයකට අයත් ස්කන්ධයන්ගේ දිරාපත් වීමයි. මෙහි අභිප්‍රේත වනුයේ පසුව කී ආකාරයයි. ඒ මේ ජරා තොමෝ ස්කන්ධයන්ගේ පැසීයාම ලක්‍ෂණ කොට ඇත්තීය, මරණය වෙත ළං වීම කෘත්‍යය කොට ඇත්තීය. යොවුන්බව නැසීම වැටහීම් කොට ඇත්තීය. සංසාර දුඃඛ භාවයෙන්ද, දුකට වස්තු වූ හෙයින්ද දුක්වේ. අඟපසඟ ලිහිල්වීම, ඉන්ද්‍රියයන් විකෘත වීම, විරූපීබව, යොවුන්බව නැතිවීම, වීර්යය හීන වීම, සිහිනුවණ පිරිහීයාම, අනුන්ගේ නිගරුවට පාත්‍ර වීම ආදී නොයෙක් හේතුනිසා උපදින කායික වූද මානසික වූද යම් දුකක් වේනම් එයට වස්තු වනුයේ ජරාවයි. එහෙයින් කියන ලැබේ:

''අඞ්ගානං සිථිලීභාවා ඉන්ද්‍රියානං විකාරතො
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතතො

අඟපසඟ දුබල වීමෙන්ද ඉන්ද්‍රියයන් විකෘත වීමෙන්ද, යොවුන් බව නැසීයාමෙන්ද, ශරීර ශක්තිය හීන වීමෙන්ද,

''විප්පවාසා සතාදීනං පුත්තදාරෙහි අත්තනො
අපසාදනීයතොචෙව භීයෝ‍ය බාලත්තපත්තියා

ස්මෘති ආදිය ඉවත්ව යාමෙන්ද, සිය අඹුදරුවනට පවා අප්‍රිය විය හැකි හෙයින්ද, ළදරුවකුගේ ස්වභාවයට පත්වීමෙන්ද

''පප්පොති දුක්ඛං යං මච්චො කායිකං මානසං තථා
සබ්බමෙතං ජරාහෙතු යස්මා තස්මා ජරා දුඛා''ති

මනුෂ්‍යයා කායික වූද, මානසික වූද යම් දුකකට පත් වේ නම්, මේ සියල්ල ජරාව හේතුකොට ගෙන සිදු වන හෙයින් ජරාව දුකෙකි.

මේ ජරාව පිළිබඳ විනිශ්චයයි.

—//—

''මරණම්පි දුක්ඛං'' යන මෙහිද, මරණය දෙආකාර වේ. ''ජරාමරණං ද්විහිඛන්ධෙහි සංගහිතං'' (ජරාමරණ යන දෙක ස්කන්ධ දෙකෙකින් සංගෘහීත වේ) යනුවෙන් කියනලද සංඛත ලක්‍ෂණය හා ''නිච්චං මරණතො භයං''[a] (මරණයට ඇති නිරන්තරභය) යනුවෙන් කියනලද එක් භවයකට අයත් ජීවිතේන්ද්‍රිය සම්බන්ධය බිඳීයාමයි. මෙහි අභිප්‍රේත වනුයේ පසුව කී ජාති පච්චය (ඉපැදීම් හේතුවෙන් ඇතිවන මරණයයි. ජාතිපච්චය මරණයටම උපක්කම මරණ (උපක්‍රම හේතුවෙන් සිදුවන මරණය) යනුද, සරස මරණ (ස්වාභාවික මරණය) යනුද, ආයුක්ඛය මරණ (ආයුෂ ක්‍ෂය වීමෙන් සිදුවන මරණය) යනුද, පුඤ්ඤක්ඛය මරණ (පින් ගෙවීයාමෙන් ඇතිවන මරණය) යනුද නම් වේ. මෙය චුතිය ලක්‍ෂණ කොට ඇත්තේය.

a. සු. නි., සල්ල සුත්ත

වියෝගය කෘත්‍ය කොට ඇත්තේය. මේ භවය හැර අන්භවයට පැමිණීම වැටහීම් කොට අත්තේය. දුකට වස්තු වන හෙයින් දුඃඛ වශයෙන් දතයුතුය. එහෙයින් කියනු ලැබේ:-

"පාපස්ස පාපකම්මාදි නිමිත්තමනුපස්සතො
භද්දස්සාපසහන්තස්ස වියොගං පියවත්ථුකං
මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො
සබ්බෙසඤ්චාපි යං සන්ධි බන්ධනච්ඡෙදනාදිකං
විතුජ්ජමානමම්මානං හොති දුක්ඛං සරීරංජ
අසය්හමප්පතීකාරං දුක්ඛස්සෙතස්සිදං යතො
මරණං වත්ථු තෙනෙතං දුක්ඛමිච්චෙව භාසිතං"ති

මරණාසන්න අවස්ථාවෙහිදී පාපකාරී පුද්ගලයාහට කර්මනිමිති, ගතිනිමිති පෙනෙන විටද, පින්කළ පුද්ගලයාහට වුවද, ප්‍රියවස්තූන් කෙරෙන් වන වියෝගය දක්නා විටද අවිශේෂයෙන් යම් මානසික දුකක් ඇතිවේද,

සියල්ලන්හටම සන්ධිබන්ධන ඡේදනාදීවූ (අත්පා ආදී අඟ පසඟ සිඳීම් ආදී) මර්මස්ථානයනට හානි කරන වධ වේදනාවනට භාජන වන විට පමණ කළ නොහැකි, නො-ඉවසිය හැකි. ප්‍රතීකාරයක් නැති යම් ශාරීරික දුකක් ඇතිවේද, මේ සියලු දුකට මේ මරණය යම් හෙයකින් වස්තු වේද, එහෙයින් මෙය දුක්මයයි කියනලදී.

මේ මරණය පිළිබඳ විනිශ්චයයි.

—//—

සොකාදිය අතුරෙන් 'සොක' යනු, ඥාතිව්‍යසනාදියෙන් සිදුවන චිත්ත සන්තාපයයි. එය අර්ථ වශයෙන් (මතු පැවසෙන) දෝමනස්සයම වන නමුදු, ඇතුළතින් දැවීම ලක්ෂණකොට ඇත්තේය, ළ-තැවීම කෘත්‍ය කොට ඇත්තේය. නැවත නැවත ශෝකයට පත්වීම වැටහීම් කොට ඇත්තේය. (ඉහතකී) දුක්ඛ-දුක්ඛයම වන හෙයින්ද, දුකට වස්තු වන හෙයින්ද දුක්ම වේ. එහෙයින් කියනු ලැබේ:-

"සත්තානං හදයං සොකො විසසල්ලංව තුජ්ජති
අග්ගි තත්තොව නාරාචො භුසං ච දහතෙ පුන

ශෝකය විෂ සහිත සැතක් සෙයින් සත්‍වයන්ගේ හෘදය පෙළයි, ගින්නෙන් රත්වූ යවුලක් සෙයින් නැවත නැවතත් බොහෝ සෙයින් දවයි.

"සමාවහති ච බ්‍යාධි ජරා මරණ භේදනං
දුක්ඛම්පි විවිධං යස්මා තස්මා දුක්ඛො'ති වුච්චති"

ජරා, ව්‍යාධි, මරණ යන භේද සහිත විවිධ දුක් ගෙන දෙන හෙයින් දුක්ඛ යයි කියනු ලැබේ.

මේ සෝකය පිළිබඳ විනිශ්චයයි

——//——

පරිදෙව යනු ඥාතිව්‍යසනාදියෙන් පහව පුද්ගලයාග් වැලපීමයි. එය දොඩමලු වීම ලක්‍ෂණ කොට ඇත්තේය. ගුණදොස් පැවසීම කෘත්‍ය කොට ඇත්තේය. (සෙසු වැළපෙන්නන් හා සමග) එක්වීම වැටහීම් කොට ඇත්තේය. (ඉහත කී) 'සංසාර දුක්ඛ' වන හෙයින්ද, දුකට වස්තුවන හෙයින්ද දුක් වේ. එහෙයින් කියනු ලැබේ:-

''යං සොකසල්ල විහතො පරිදෙවමානො
කණ්ඨොට්ඨ තාලුතල සොසජමප්පසය්හං
භීයොධිමත්තමධිගච්ඡතියෙව දුක්ඛං
දුක්ඛො'ති තෙන භගවා පරිදෙව මාහ

ශෝක නමැති හුලෙන් පහර ලැබ වැළපෙන පුද්ගලයා බොහෝ සෙයින් උගුර, තොල්, තලු වියලීමෙන් හටගන්නා නො-ඉවසියහැකි ඉතා මහත් දුකකට පත් වේද, එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වැළපීම දුකෙකැයි පැවසූහ.

මේ පරිදේවය පිළිබඳ විනිශ්චයයි

——//——

දුක්ඛං යනු කායික දුඃඛයයි. එය කය පෙළීම ලක්‍ෂණ කොට ඇත්තේය. නැණහීනයන් දොම්නස් කරවීම කෘත්‍ය කොට ඇත්තේය. කායික ආබාධ වැටහීම් කොට ඇත්තේය. දුක්ඛ දුක්ඛ වන හෙයින්ද, මානසික දුක් පවා ගෙන දෙන හෙයින්ද දුක්ඛ නම් වේ. එහෙයින් කියනු ලැබේ:-

''පීළෙති කායික මිදං දුක්ඛඤ්ච මානසං භීයො
ජනයති යස්මා තස්මා දුක්ඛන්ති විසෙසතො වුත්තන්ති

යම් හෙයකින් මේ කායික දුඃඛය මානසික දුඃඛයද දනවමින් බොහෝ සෙයින් සත්වයා පෙළාද, එහෙයින් විශේෂයෙන් දුක්ඛයයි කියනු ලැබේ.

මේ දුඃඛය පිළිබඳ විනිශ්චයයි

——//——

දොමනස්සං යනු මානසික දුඃඛයයි. එය සිත පෙළීම ලක්ෂණ කොට ඇත්තේය. සිත විකල කිරීම කෘත්‍ය කොට ඇත්තේය. මානසික ආබාධ වැටහීම් කොට ඇත්තේය. දුක්ඛ-දුක්ඛ වන හෙයින්ද කායික දුක් පවා ගෙන දෙන හෙයින්ද දුක්ඛ නම් වේ. මානසික දුඃඛයෙන් පීඩිතවූවාහු හිස කෙස් විසුරුවා ගෙන හඬති. ළෙහි අත් ගසති. පෙරළෙති. ඒ මේ අත පෙරළෙති. පාළුඩුකුරු කොට වැටෙති. සැතින් ඇන ගනිති. වසවිස කති. ගෙළ වැලලා ගනිති. ගිනි වදිති. මෙසේ අනේකප්‍රකාරවූ දුක් අනුභව කෙරෙති. එහෙයින් කියනු ලැබේ:-

"පීළෙති යතො චිත්තං කායස්සච පිළනං සමාවහති
දුක්ඛන්ති දොමනස්සං විදොමනස්සා තතො ආහු"ති.

යම් හෙයකින් සිත පීඩාවට පත් කරාද, කායික පීඩා පවා ගෙන දෙයිද. එහෙයින් දෝමනස්ස දුරු කළාහු එම දෝමනස්සය දුකෙකි'යි පැවසූහ:

මේ දෝමනස්සය පිළිබඳ විනිශ්චයයි

—//—

උපායාස නම් ඥාතිව්‍යසනාදිය හේතු කොටගෙන ඇතිවූ අතිමාත්‍ර මානසික දුඃඛයෙන් බලවත්වූ ද්වේෂය මැයි. ඇතැමෙක් සංස්කාර ස්කන්ධයට අයත් එක්තරා ස්වභාවයෙකැ'යි කියති. එය චිත්ත සන්තාප ලක්ෂණ කොට ඇත්තේය. තැතනීම කෘත්‍ය කොට ඇත්තේය. විශාදය (අසහනය) වැටහීම් කොට ඇත්තේය. සංඛාරදුක්ඛ වන හෙයින්ද, සිත දවන හෙයින්ද, කය අසහනයට පත් කරන හෙයින්ද දුඃඛ වේ. එහෙයින් කියනු ලැබේ:-

"චිත්තස්ස පරිදහනා කායස්ස විසාදනා ච අධිමත්තං
යං දුක්ඛං උපායාසො ජනෙති දුක්ඛො තතො වුත්තො ති"

සිත දැවීමෙන් ද කය අසහනයට පත් කරවීමෙන්ද අතිමාත්‍ර වූ යම් දුකක් උපදවාද, එහෙයින් උපායාසය දුකෙකැ'යි කියන ලදී.

මේ උපායාසය පිළිබඳ විනිශ්චයයි

—//—

මෙහි වනාහි, ශෝකය මඳ ගින්නේ භාජනය ඇතුළත පැසීම වැනියයිද, පරිදේවය තද ගින්නෙන් පැසෙන විට භාජනයෙන් පිටතට උතුරා යාම වැනියයිද, උපායාසය පිටතට උතුරා යාමෙන් අනතුරුව ඉතිරිය බඳුන තුළම සිඳී යන තෙක් පැසීම වැනියයිද දතයුතුය.

අප්පිය සම්පයෝගය නම් මනාප නොවූ සත්ත්ව-සංස්කාරයන් හා සමග එක්වීමයි. එය නොකැමැත්තෙන් එක්වීම ලක්ෂණ කොට ඇත්තේය. සිතට වදදීම කෘත්‍ය කොට ඇත්තේය, අහිතකර බව වැටහීම් කොට ඇත්තේය. දුකට වස්තු වන හෙයින් දුක්ඛ නම්වේ. එහෙයින් කියනුලැබේ:-

''දිස්වාව අප්පියෙ දුක්ඛං පඨමං හොති චෙතසි
තදුපක්කම සම්භූතමථ කායෙ යතො ඉධ
තතො දුක්ඛද්වයස්සාපි වත්ථුතො සො මහෙසිනා
දුක්ඛො වුත්තො'ති විඤ්ඤෙය්‍යො අප්පියෙහි සමාගමො''ති

යම් හෙයකින් පළමුකොට අප්‍රියයන් දැකීමෙත්ම සිතු තුළද, අනතුරුව ඔවුන් හා සම ඇසුරෙන් කයතුළද, දුක් හටගැනීමෙන්, මෙසේ (කායික මානසික යන) දෙ-ආකාරවූ දුකට වස්තුවන හෙයින් අප්‍රිය සමාගමය මහර්ෂීන් වහන්සේ විසින් දුකෙකි'යි පවසන ලද බව දතයුතුය.

මේ අප්‍රියසංයෝගය පිළිබඳ විනිශ්චයයි

—//—

පිය විප්පයෝගය නම්, මනාපවූ සත්ත්ව-සංස්කාරයන් කෙරෙන් වියෝවීමයි. එය කැමැති වස්තූන්ගෙන් වෙන් කරනු ලැබීම ලක්ෂණ කොට ඇත්තේය. ශෝකය දැනවීම කෘත්‍ය කොට ඇත්තේය. ව්‍යසනයට පත්වීම වැටහීම් කොට ඇත්තේය. සෝ-දුකට වස්තුවන හෙයින් දුඃඛ නම් වේ. එහෙයින් කියනුලැබේ:-

''ඤාතිධනාදි වියෝගා සොකසර සමප්පිතා විතුජ්ජන්ති
බාලා යතො තතො'යං දුක්ඛො'ති මතො පියවිප්පයොගො''ති

යම් හෙයකින් අඥාන ජනයා ඥාති ධනාදීන් කෙරෙන් වියෝවීම හේතුකොට සෝ-හී පහරින් මඩිනු ලැබෙත්ද, එහෙයින් ප්‍රියවිප්‍රයෝගය දුකෙකි'යි දන්නා ලදි.

මේ ප්‍රියවිප්‍රයෝගය පිළිබඳ විනිශ්චයයි

—//—

යම්පිච්ඡං න ලභති යන මෙහි ''අහො වත මයං න ජාතිධම්මා අස්සාම''[a] (අහෝ අපි ඉපැදීම ස්වභාව කොට ඇත්තෝ නො වන්නමෝ නම් මැනවි) යන ආදී නොලදහැකි වස්තූන් හෝ ස්වභාවයන් කෙරෙහි ආශා කිරීමම ''යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං'' (කැමති වන දෙය නොලැබේ නම් එයද දුකෙකි)යි කියන ලදි. එය නොලදහැකි වස්තූන්

a. විභඞ්ග, සච්චවිභඞ්ග

කැමැතිවීම ලක්‍ෂණ කොට ඇත්තේය. එය සෙවීම කෘත්‍ය කොට ඇත්තේය. එම වස්තුන් නොලැබීම වැටහීම් කොට ඇත්තේය. දුකට වස්තුවන හෙයින් දුක්ඛ නම් වේ. එහෙයින් කියනුලැබේ:-

''යං යං පත්ථයමානානං තස්ස තස්ස අලාභතො
යං විඝාතමයං දුක්ඛං සත්තානං ඉධ ජායති
අලබ්භනෙය්‍ය වත්ථූනං පත්ථනා තස්ස කාරණං
යස්මා තස්මා ජිනො දුක්ඛං ඉච්ඡිතාලාභමබ්‍රවී''ති

යමක් යමක් ප්‍රාර්ථනා කරන්නවුනට ඒ ඒ දෙය නොලැබීමෙන් යම් ඉච්ඡාවිඝාතමය (කැමැති දෙය නොලැබීමෙන් උපන්) දුකෙක් වේද, යම් හෙයකින් එම දුකට හේතුව නොලදහැකි දෙය පැතීම වේද, එහෙයින් ජිනයන් වහන්සේ එය ඉච්ඡිතාලාභ දුක්ඛ (කැමති වන දෙය නොලැබීමෙන් ඇතිවන දුක)යයි පැවසූ සේක.

මේ ඉච්ඡිතාලාභය පිළිබඳ විනිශ්චයයි.

—//—

සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා යන මෙහි:-

ජාතිප්පභුතිකං දුක්ඛං යං වුත්තමිධ තාදිනා
අවුත්තං යඤ්ච තං සබ්බං විනා එතෙන විජ්ජති
යස්මා තස්මා උපාදානක්ඛන්ධා සංඛෙපතො ඉමෙ
දුක්ඛාති වුත්තා දුක්ඛන්ත දෙසකෙන මහෙසිනා

තත්වදර්ශී (තතුදත්) වූ, දුඃඛාන්ත-දේශක (නිර්වාණය දේශනා කළා) වූ මහර්ෂීන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද ජාති ආදී වූ යම් දුඃඛසත්‍යයක් වේද, යම් හෙයකින් එයින් බැහැරවූ (විශේෂ කොට) ප්‍රකාශ නොකරන ලද යමක් ඇත්නම් ඒ සියල්ල ගෙන, ''සංක්‍ෂේපයෙන් මේ උපාදානස්කන්ධයෝ දුඃඛයහ''යි ප්‍රකාශ කරන ලදි.

ඒ එසේමැයි, ගින්න දර සෙයින්ද, ආයුධ ඉලක්කය සෙයින්ද, මැසිමදුරු ආදීන් ගවසිරුරක් සෙයින්ද, ගොයම් කපන්නන් කෙතක් සෙයින්ද, ගම්පහරන්නන් ගමක් සෙයින්ද, ජාති ආදීහු උපාදානස්කන්ධ පඤ්චකයම නන් අයුරින් පෙළමින්, භූමියෙහි තෘණලතාදිය මෙන්ද, ගස්වල මල්පලු පල මෙන්ද, උපාදානස්කන්ධයන් තුළම උපදිති.

උපාදානස්කන්ධයන්ගේද ආරම්භයෙහි වූ දුක ඉපැදීමයි. මධ්‍යයෙහි වූ දුක ජරාවයි. අවසන්හි වූ දුක මරණයයි. මරණය දුක් පීඩා මගින් දවන දුක ශෝකයයි. එම ශෝකය ඉවසනු නොහැකිව මෙන් දොඩමලු කරවන දුක පරිදේවය (වැලපීම)යි, ඉක්බිතිව ධාතූන්ගේ කැළඹීම යයි කියනු

ලබන අහිතකර ස්පර්ශයන්ගේ එක්වීමේ හේතුවෙන් කය රෝගීබවට පත් කරවන දුක 'දුක්ඛ' යයි, එය හේතු කොට ගෙන පෘථග්ජනයන් තුළ ද්වේෂය ඉපැදීමෙන් සිත රෝගී කරවන දුක දෝමනස්සයයි. ශෝකාදිය දැනීමෙන් උපන් කලකිරීම (වැලපීම් මගින්) ප්‍රකට නොවන දුක උපායාසයයි. බලාපොරොත්තු කඩවූවන් තුළ අපේක්ෂාභංගත්වය නිසා ඇතිවන දුක ඉච්ඡිතාලාභය (පතන දෙය නොලැබීම)යි. මෙසේ නන් අයුරින් පිරික්සනු ලබන විට පංච උපාදානස්කන්ධයෝම දුක්ඛ නම් වෙති. යම් හෙයකින් මේ දුඃඛස්වභාවය එකක් එකක් ගෙන හැර දක්වමින් කියනු ලබතොත්, කල්පගණනාවෙකින් වුවද කියා නිමකළ නොහැකි වේද, එහෙයින් එම සියලු දුක් එක් දිය බිඳුවෙක මුළු මහත් මුහුදු දියෙහි (ලුණු) රසය මෙන් පංච උපාදානස්කන්ධයන් තුළ පිඩු කොට දක්වනු පිණිස භාග්‍යවතුන් වහන්සේ ''සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා''යි පැවසූ සේක.

මේ උපාදානස්කන්ධයන් පිළිබඳ විනිශ්චයයි

—//—

දුක්ඛ නිද්දේසනය මෙසේ පළමු කොට දක්වන ලදි.

—//—

සමුදය නිද්දෙසයෙහි වනාහි, යායං තණ්හා යනු, යම් මේ තෘෂ්ණාවක් වේද. එයයි. පොනොභවිකා යනු, නැවත නැවත ඉපැදීම කරවනුයේ පුනබ්භවයි. පුනබ්භවය ස්වභාව කොට ඇත්තේ පොනොභවිකයි. නන්දිරාගයෙන් යුක්ත වූයේ නන්දිරාගසහගතායි. අරුත් වශයෙන් නන්දි (සතොස් බවින් සිත ඉපිලෙන ස්වභාව සහිත) රාගය හා සමග සමාන බවට ගියේයයි කී නියායි. තත්‍රතත්‍රාභිනන්දිනී යනු, යම් යම් තැනෙක ආත්මභාවය උපදිද ඒ ඒ තැන සොම්නසින් බැඳීමයි. සෙය්‍යථීදං යනු, නිපාතයි. ඒ කවරක්දැයි යනු එහි අර්ථයි. කාමතණ්හා, භවතණ්හා විභවතණ්හා යන මෙය පටිච්චසමුප්පාද නිද්දේසයෙහි මතු විස්තර වේ; මෙහි වනාහි, ත්‍රිවිධ වූම තෘෂ්ණාව දුඃඛ සත්‍යය උපදවති'යි යන අර්ථයෙන් එකක් කොට ගෙන දුක්ඛ-සමුදය- අරියසච්චයයි කියනලද බව දතයුතුය.

දුක්ඛ නිරෝධ නිද්දේසයෙහි ''යො තස්සායෙව තණ්හාය'' යන ආදී වශයෙන් සමුදය නිරෝධය කියන ලදි. ඒ කවර හෙයින්ද යත්, සමුදය නිරෝධයෙන් දුක්ඛ නිරෝධය වේ. සමුදය නිරෝධයෙන්ම දුක නැතිවේ. සමුදය නිරෝධයෙන් මිස අන් ලෙසකින් දුක නිරුද්ධ නොවේ. එහෙයින් කීහුඃ-

"යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති
එවං හි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං"ති[a]

යම් සේ මුල නිරුපද්‍රැතව දැඩිව තිබියදී ගසක් කපන ලද්දේ නමුදු එය නැවතත් වැඩේද, එසේම මුල් බැසගත් තෘෂ්ණාව නොනසන ලද තාක් මේ දුක යලියලිත් හටගනියි.

මෙසේ, යම් හෙයකින් සමුදය නිරෝධයෙන්ම දුක් නිරුද්ධ වේද, එහෙයින් භාග්‍යවතුන්වහන්සේ දුක්ඛ නිරෝධය දේශනා කරන සේක් සමුදය නිරෝධය මගින්ම දේශනා කළ සේක.

තථාගතවරයෝ වනාහි, සිංහයනට සමාන පැවතුම් ඇත්තාහුය. ඔවුහු දුක වලකන්නාහුද, දුක්ඛ නිරෝධය දෙසන්නාහුද (දුකට) හේතුව මිස ඵලය වෙත යොමු නොවෙති; තීර්ථකයෝ වනාහි, ශුනකයනට බඳු පැවතුම් ඇත්තාහුය. ඔවුහු දුක් වලක්වන්නහුද, දුඃඛනිරොධය දෙසන්නාහුද අත්තකිලමථානු යෝගාදිය දෙසීමෙන් ඵලය (එනම්, දුක) වෙතම මිස හේතුව වෙත යොමු නොවෙති. දුඃඛ නිරෝධය සමුදය නිරෝධය වශයෙන් දේශනා කිරීමේ ප්‍රයෝජනය මේ නයින් දතයුතුය.

මේ අර්ථයයිඃ තස්සායෙව තණ්හාය යනු, පොනෝභවිකයයි පවසා කාමතණ්හාදී වශයෙන් විග්‍රහ කොට දක්වන ලද තණ්හාවෙහිය; විරාග යනුවෙන් පැවසෙනුයේ මාර්ගයයි. විරාගය හේතුකොට විමුක්තිය වෙතැ'යි කියනලදි; විරාග හේතුවෙන් නිරුද්ධවීම විරාග නිරෝධයයි; ප්‍රකෘතිසිද්ධ කාමරාගාදී ක්ලේශයන්ගේ සමූලඝාත වශයෙන් කිසිවක් ඉතිරි නොවූ විරාග නිරෝධය අසේසවිරාග නිරෝධයයි.

නොහොත්:- විරාග යනු ප්‍රහාණයයි කියනු ලැබේ. එහෙයින් අශේෂ වශයෙන් ප්‍රහාණය අසේස විරාගයයිද අසේස නිරෝධයයිද යෙදෙතැ'යි දතයුතුය. අරුත් වශයෙන් වනාහි මෙකී සියල්ලම නිර්වාණයෙහිම පර්යාය වචනයි. පරමාර්ථ වශයෙන් නිර්වාණය දුඃඛ නිරෝධ අරිය සච්ච යනුවෙන් වහරනු ලැබේ; යම් හෙයකින් වනාහි එයට පැමිණ තෘෂ්ණාව දුරු-වේද, නිරුද්ධ වේද, එහෙයින් විරාගයයිද, නිරෝධයයිද කියනු ලැබේ. තවද යම් හෙයකින් එයට පැමිණීමෙන් එම තෘෂ්ණාව හැර දැමීම ආදිය වේද, කාම ගුණයන් කෙරෙහි ඇති ඇලීම් අතුරෙන් එකද ඇලීමෙක් නොමැත්තේද එහෙයින් චාග (හැර දැමීම), පටිනිස්සග්ග (ඉවතලීම), මුත්ති (මිදීම) හා අනාලය (නො-ඇලීම) යනුවෙන්ද වහරනු ලැබේ.

ඒ මේ නිර්වාණය වූකලී ශාන්ති (හෙවත් සමනය) ලක්‍ෂණ කොට ඇත්තේය. චුතනොවීම කෘත්‍ය කොට ඇත්තේය. ආස්වාස කරණය

---

a. ධම්මපද, තණ්හාවග්ග

(අස්වැසීම) හෝ කෘත්‍ය කොට ඇත්තේය. නිමිතිරහිත බව වැටහීම් කොට ඇත්තේය. නොවිසුරුණු බව හෝ වැටහීම් කොට ඇත්තේය.

සා අඟක් ලෙසින් අනුපලබ්භනීය (නොලද හැකි) වන හෙයින් නිර්වාණයයි කිසිවක් නොමැත්තේ නොවේද? නො-එසේය, නිසි උපාය මගින් උපලබ්භනීය (ලදහැකි) වන හෙයිනි. එයට අනුරූපවූ ප්‍රතිපත්ති සංඛ්‍යාත උපාය මගින් එය ලදහැකියේ වේමැයි. (ඇතැම් ආර්යයන්) චේතෝපරිය ඥාණයෙන් අනුන්ගේ ලෝකෝත්තර චිත්තයන් දැනගන්නාසේයි. එහෙයින් (තමනට) විෂය නොවූ පමණින් (ලොවුතුරු සිතක් වන) නිර්වාණය නැතැ'යි නොකිවයුතුය. අඥාන වූ පෘථග්ජනයාට යමක් අත්දකිනු නොහැකිවූ පමණින් එය නැතැ'යි කීම නොයෙදේමය.

(තවද කරුණෙකින්) නිර්වාණයෙක් නැතැයි කීම සුදුසු නොවේ:- කවර හෙයින්ද යත්, එසේ වෙතොත් ප්‍රතිපදා මාර්ගය නිෂ්ඵල බවට පත්වන හෙයිනි. නිර්වාණයක් නැතොත් සම්‍යග්දෘෂ්ටිය පෙරටු කොට ඇති ශීලාදී ශික්ෂාත්‍රයයෙන් සමන්විතවූ මුළු සම්‍යක් ප්‍රතිපදා මාර්ගයම වඳ බවට පත්වේ. එහෙත්, මේ ප්‍රතිපත්ති මාර්ගය වඳවූවක් නොවේ. නිර්වාණයට පමුණුවන හෙයිනි.

නොපවත්නා (නිවනක්) වෙතට පමුණුවන හෙයින් ප්‍රතිපදාව නිෂ්ඵල බවට පත් නොවේද? එසේ නොවේ, අතීත අනාගත (ස්කන්ධයන්) නැති කල්හි පවා නිවණට පැමිණීම නොවන හෙයිනි.

එසේ නම් 'නිර්වාණය' යනු වර්තමාන ස්කන්ධයන්ගේද අභාවයද? නො-එසේය, ඔවුන්ගේ අභාවයක් සිද්ධ නොවියහැකි හෙයිනි. (අභාවයක් ඇති තැන වර්තමානද විය හැකි නොවේ). අභාවය සිද්ධවන විටම අවර්තමාන භාවයට පත්වන හෙයිනි. තවද වර්තමාන ස්කන්ධයන් ඇසුරුකොට ඇති මාර්ගක්ෂණයෙහිදීම සෝපාදිසේස-නිබ්බාණ-ධාතුවට පත් නොවීමේ දෝෂය සිද්ධවන හෙයිනි.

එකල ක්ලේශයන් නොපවත්නා හෙයින් දෝෂයක් නොවේද? නොවේ. ආර්ය මාර්ගය නිරර්ථක බවට පැමිණෙන හෙයිනි. එසේ වෙතොත් ආර්යමාර්ග ක්ෂණයට පෙරද ක්ලේශයන්ගේ අභාවය වෙතැ'යි ආර්ය මාර්ගය නිරර්ථක බවට පත් වේ. එහෙයින් මේ තර්කය යුක්තියුක්ත නොවේ.

''යො ඛො ආවුසො රාගක්ඛයො''[a] ආදි වචනයෙන් රාග, ද්වේෂ, මෝහ යන මොවුන්ගේ ක්ෂය වීම් මාත්‍රය නිර්වාණය වේද? නොවේ. අර්හත්ත්වයද ක්ෂය මාත්‍ර බවට පත්වන හෙයිනි. එයද 'යො ඛො ආවුසො රාගක්ඛයො' ආදී නයින් දක්වන ලද්දේ වේ.

---

a. සං. නි. ජම්බුඛාදක සංයුත්ත

තවද, 'නිර්වාණය තාවකාලික වේ' යන ආදී සාවද්‍ය නිගමනයනට පමුණුවන හෙයිනි, එසේ වුවහොත්, තාවකාලික වූ නිර්වාණය සංඛත ලක්‍ෂණ ඇති බවටද, සම්‍යග් ව්‍යායාම විෂයයෙහි අපේක්‍ෂාවෙන් තොරව අවබෝධ කළ හැකි බවටද පත් වන්නේය; සංඛත ලක්‍ෂණ ඇති හෙයින්ම සංස්කාරධර්මයනට අයත් වන්නේය. සංස්කාරයනට අයත් වන හෙයින්ම රාගාදී ගින්නෙන් ඇවිල ගියේය. එසේ ඇවිල ගිය හෙයින්ම දුඃඛයයි යන ආදි සාවද්‍ය නිගමනයනට එළඹෙන්නේය.

ක්‍ෂයවීමෙන් පසු යම් හෙයකින් නැවත පැවැත්මක් නැතොත් එය නිර්වාණයයි ගැනීමෙහි දෝෂයක් නැත්ද? නොඑසේය, එවන් ක්‍ෂය වීමක් නැති හෙයිනි, ඇත්තේ වුවද, කියනලද ප්‍රකාර ඇති සාවද්‍ය නිගමනයන් නො-ඉක්මවිය හැකි හෙයින් හා ආර්ය මාර්ගය යනුද නිර්වාණයමැ'යි යන සාවද්‍ය නිගමනයට පමුණුවන හෙයිනි.

ආර්ය මාර්ගය ඒකාන්තයෙන් දෝෂයන් සිඳලන්නේය. එහෙයින් 'ඛය'යි කියනුලැබේ. එතැන් පටන් දෝෂයන්ගේ පැවැත්මක්ද නැත; 'අනුත්පත්ති නිරෝධ' යයි කියන ලද 'ඛය' නෙවත් නොපැවැත්මට පර්යාය වශයෙන් උපනිශ්‍රය වන හෙයින්, යමකට උපනිශ්‍රය වේද එය උපචාර වශයෙන් 'ඛය' යයි කියනලදි. කවර හෙයින් එය (උපචාර වශයෙන් මිස) ස්වරූප වශයෙන්ම නොකියන ලද්දේද? ඉතා සියුම් හෙයිනි. එය ඉතා සියුම්බව භාග්‍යවතුන් වහන්සේට පවා මන්දෝත්සාහී බව ඇති වීමෙන්ද, ආර්ය චක්‍ෂුසින්ම එය දැකගතයුතු වන හෙයින්ද සිද්ධයි.

ඒ මේ නිර්වාණය ආර්යමාර්ගයෙන් යුක්තවූවහු විසින්ම ලැබියහැකි වන හෙයින් 'අසාධාරණ' (අසාමාන්‍ය) වේ. මුල් කෙළවරක් නැති හෙයින් 'අප්පභව' වේ. ආර්යමාර්ගය ඇති විටම එය (නිර්වාණය)ද ඇති හෙයින් 'අප්පභව' නොවන්නේ නොවේද? එසේ නොවේ. මාර්ගයෙන් එය නො-ඉපදවිය හැකි වන හෙයිනි. මෙය (නිර්වාණය) වනාහි ආර්යමාර්ගයෙන් පැමිණිය හැකිවන නමුදු ඉපිදවිය හැකි නොවේ. එහෙයින් එය 'අප්පභව' වන්නේමය, 'අප්පභව' වන හෙයින් 'අජරාමරද' වන්නේය. ප්‍රභව-ජරා-මරණයන්ගෙන් තොරවූ හෙයින් 'නිත්‍ය' වන්නේය.

නිර්වාණය මෙන්ම පරමාණු ආදියෙහිද නිත්‍ය භාවය ගම්‍ය වන්නේ නොවේද? එසේ නොවේ. (එසේ වන්නට) හේතුවක් නැති හෙයිනි. නිර්වාණය නිත්‍යවන හෙයින් ඒ පරමාණු ආදියද නිත්‍ය වන්නේ නොවේද? එසේ නොවේ. හේතු ලක්‍ෂණයක් ඇසුරු කොට නොපවත්නා හෙයිනි.

ඉපැදීම් ආදියක් නොමැති හෙයින් නිර්වාණය මෙන්ම පරමාණු ආදියද නිත්‍ය වන්නේ නොවේද? එසේ නොවේ, පරමාණු ආදියට ඉපැදීම් ආදිය නොමැති බව මෙහි සාධනය නොවන හෙයිනි. (නොහොත්, අකෘත්‍රිම වූ පමණින් පරමාණු ආදිය නිත්‍ය වන බවක් සාධනය නොවන හෙයිනි).

මෙහි කියනලද හේතු යුක්තීන්ගේ සද්භාවය අනුව හුදෙක් මේ (නිර්වාණය)ම නිත්‍ය වේ; රූපස්වභාවය ඉක්මවන හෙයින් අරූප වේ; දෘඪ වීර්ය බලයෙන් සාධනය කළයුතු ඥාන විශේෂයෙන්ම අවබෝධ කළහැකි හෙයින්ද, සර්වඥයන් වහන්සේගේම වචන හෙයින්ද පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන නොවේ. කියන ලදමැයි:- "මහණෙනි, අජාත (නොඋපන්) වූ, අභූත (නොවූ)වූ, අකෘත (නොකළා)වූ, අසංඛත (අකෘත්‍රිම)වූ දෙයක් ඇත."[a]

මේ දුක්ඛ-නිරෝධ නිද්දේසයෙහි විනිශ්චය කථාමාර්ගයයි.

—//—

දුක්ඛ-නිරෝධ-ගාමිණී-පටිපදා-නිද්දේසයෙහි කියන ලද කරුණු අට වනාහි ඛන්ධ නිද්දේසයෙහිද අර්ථ වශයෙන් ඒකාන්තයෙන් ප්‍රකාශකරන ලද්දේමය. මෙහි වනාහි එම කරුණු අට එක් ක්‍ෂණයෙක්හි (මාර්ගක්‍ෂණයෙහි) පවත්නා විට ඇති විශේෂය අවබෝධ කිරීම සඳහා යලි පවසමු:- සංක්ෂේපයෙන් වනාහි චතුඃසත්‍ය ප්‍රතිවේධය පිණිස පිළිපන් යෝගියාහට නිවණ පිළිබඳව ඇති වන අවිද්‍යානුශයය මුළුමනින් බිඳ දමන සුලු ප්‍රඥාව සම්මාදිට්ඨි නම්වේ. එය මනා දැකීම ලක්‍ෂණ කොට ඇත්තේය. ධාතූන් පිළිබඳ ඇති තතු ප්‍රකට කිරීම කෘත්‍ය කොට ඇත්තේය. අවිද්‍යාන්ධකාර විධ්වංශනය වැටහීම් කාරණා කොට ඇත්තේය.

එබඳු දෘෂ්ටියෙන් යුක්ත වූවහුගේ මිථ්‍යා සංකල්පයන් නසනසුලු, චිත්තය නිර්වාණාභිමුඛව පිහිටුවීම සම්මා සඞ්කප්පයයි. එය මනා කොට සිත පිහිටුවීම ලක්‍ෂණ කොට ඇත්තේය, අර්පණාව (හෙවත් නිර්වාණයට අභිමුඛව) සිත මෙහෙය වීම කෘත්‍ය කොට ඇත්තේය.

මිථ්‍යා සංකල්පයන් ප්‍රහාණය කිරීම වැටහීම් කාරණා කොට ඇත්තේය.

එබඳු දෘෂ්ටි හා සංකල්පයන් ඇත්තහු කෙරෙහි වාග්-දුශ්චරිත නාශය ඇතිකරන, මිථ්‍යා වචන විරතිය සම්මා වාචා නම්වේ. එය සම්ප්‍රයුක්ත ධර්මයන් මනාකොට ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය: (සදොස් වචනයෙන්) වැලකීම කෘත්‍ය කොට ඇත්තේය. මිථ්‍යා වචනයෙන් දුරුවීම වැටහීම් කාරණාකොට ඇත්තේය.

සදොස් වචනයෙන් වැලකී නිදොස් වචනයෙන් යුක්ත වූවහු කෙරෙහි සදොස් ක්‍රියාවන් උපුටා දැමීම, ප්‍රාණඝාතාදියෙන් වැලකීම සම්මා කම්මන්ත නම්. එය (සම්‍යක් කර්මාන්ත සහිත පුද්ගලයා) උසස් බවට නඟා සිටුවීම ලක්‍ෂණ කොට ඇත්තේය; (සදොස් ක්‍රියාවෙන්) වැලැක්වීම කෘත්‍යයකොට ඇත්තේය; සදොස් ක්‍රියාවෙන් දුරුවීම වැටහීම් කාරණා කොට ඇත්තේය.

---

a. ඉතිවුත්තක, දුක නිපාත, අජාතසුත්ත

එම සම්මාවාචා. සම්මා කම්මන්තයන්හි පිහිටා ශීල විශුද්ධියෙහි පිහිටියහු කෙරෙහි කුහනා, ලපනාදී සදොස් ක්‍රියාවන් වලකන යම් මිථ්‍යා ආජීව විරතියක් වේද එය සම්මා ආජීවයයි. එය පිවිතුරු බව ලක්‍ෂණ කොට ඇත්තේය; න්‍යායානුකූල ජීවිකාවෘත්තිය කෘත්‍ය කොට ඇත්තේය; සදොස් ජීවිකාවෙන් වැලකීම වැටහීම් කොට ඇත්තේය.

අනතුරුව සම්මා කම්මන්ත-සම්මා ආජීව සංඛ්‍යාත ශීලභූමියෙහි පිහිටියහු කෙරෙහි එම ශීලයට අනුරූපව කුහනා-ලපනාදිය නසන සුලු යම් වීර්යාරම්භයක් වේද, එය සම්මා වායාම නම්. එය උත්සාහය ලක්‍ෂණ කොට ඇත්තේය, නූපන් අකුසල් නො-ඉපැදවීම් ආදිය කෘත්‍ය කොට ඇත්තේය. මිථ්‍යා ව්‍යායාමය ප්‍රහීණ කිරීම් වැටහීම් කාරණා කොට ඇත්තේය.

මෙසේ වීර්ය කරන්නහුට ඇතිවන එම වීර්යයෙන්ම යුක්තවූ, මිච්ඡාසතිය පලවා හරින සුලු යම් නුමුළා බවක් වේද. එය සම්මා සතියයි. එය එළඹ සිටීම ලක්‍ෂණ කොට ඇත්තේය; මුළා නොවීම කෘත්‍ය කොට ඇත්තේය; මිච්ඡාසතිය හැරලීම වැටහීම් කාරණකොට ඇත්තේය.

මෙසේ අනුත්තරවූ සතියෙන් රක්නා ලබන සිත් ඇත්තහු කෙරෙහි ඇති වන එම සම්මා සතියෙන්ම යුක්තවූ, මිච්ඡාසමාධිය නසන සුලු යම් චිත්තෛකාග්‍රතාවක් වේද එය සම්මාසමාධියයි. එය නොවිසුරුණු බව ලක්‍ෂණ කොට ඇත්තේය, එකලස් කිරීම කෘත්‍යය කොට ඇත්තේය; මිච්ඡාසමාධිය බැහැරලීම වැටහීම් කාරණා කොට ඇත්තේය.

මේ දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා නිද්දේස නයයි.
මෙසේ මෙහි ජාති ආදීන් පිළිබඳ විනිශ්චය දතයුතුය.

—//—

ඤාණකිච්චතො යනු, (ඉන්‍ද්‍රිය සච්ච නිද්දේසයෙහි, ඉන්‍ද්‍රියයන් පිළිබඳ විස්තර කථාවට අනතුරුව, සත්‍යයයන් පිළිබඳ විස්තර කථාව අරඹමින් දක්වන ලද 'විභාගතො නිබ්බචනා'දී ගාථාවන්හි) සත්‍යයයන් පිළිබඳ ඥානකෘත්‍ය වශයෙන්ද විනිශ්චය දතයුතුය. සත්‍යඥානය වූකලී අනුබෝධ ඤාණය, පටිවේධ ඤාණයයි ද්විවිධ වේ. එහි අනුබෝධ ඤාණය ලෞකික වේ; එය නිරෝධ හා මාර්ගයන් දෙක පිළිබඳව අනුස්සව (හෙවත් අසා ලබාගත් දැනුම) ආදී වශයෙන් පවතියි. පටිවේධ ඤාණය ලෝකෝත්තර වේ; එය නිරෝධය අරමුණු කොට, කෘත්‍ය වශයෙන් චතුස්සත්‍යය අවබෝධ කරවයි. කියනලදමැයි:- "මහණෙනි, යමෙක් දුඃඛ සත්‍යය දකීද, හේ සමුදය සත්‍යයද දකියි; දුඃඛ නිරෝධය දකියි; දුඃඛ-නිරෝධ-ගාමිනී ප්‍රතිපදාවද දකියි"[a] යන ආදී සියල්ල කිව යුතුය. එය

a. සං. නි.. කෝටිගාම වග්ග

පිළිබඳ කෘත්‍යය මතු ඤාණදස්සන විසුද්ධි නිද්දේසයෙහි පැවසේ. ලෞකිකවූ යම් අනුබෝධ ඤාණයක් වේද, එහි දුඃඛය පිළිබඳ ඥානය නැඟ එන සක්කාය දිට්ඨිය මැඩලීම් වශයෙන් පවතිමින් එය නවත්වයි; සමුදය ඥානය උච්ඡේද දෘෂ්ටිය වලක්වයි; නිරෝධ ඥානය ශාස්වත දෘෂ්ටිය වලක්වයි. මාර්ග ඥානය අකිරිය දෘෂ්ටිය වලක්වයි.

නොහොත්, දුඃඛ ඥානය නිත්‍ය, ශුභ, සුඛ, ආත්මභාව යන මේ ස්වභාවයන්ගෙන් තොරවූ ස්කන්ධයන් කෙරෙහි එකී නිත්‍ය ආදී ස්වභාවයන් ඇතැ'යි යන එලය පිළිබඳ වැරදි පිළිවෙත වලකාලයි; (මේ සත්කාර්යවාදය'යි කියනු ලබන සාංඛ්‍යවාදය ප්‍රමුඛ දර්ශනයන් හැඳින්වූ පරිදියි). සමුදය ඥානය ඊශ්වර ප්‍රමුඛ බ්‍රහ්ම පදාර්ථ, කාල, ස්වභාව ධර්ම යන හේතූන්ගෙන් ලෝකය පවතිතැ'යි යනුවෙන් හේතුව පිළිබඳව, අකාරණ විෂයයෙහි කාරණයයි යන වැරදි වැටහීම වලකාලයි; ('ඉස්සර පධාන' යනුවෙන් සත්කාරණ වාදයයි කියනු ලබන වේදාන්ත, අද්වෛත වේදාන්ත, විශිෂ්ටාද්වෛත වේදාන්ත යන දර්ශනවාදයන්ද, 'කාල-සභාව' යනුවෙන් පිළිවෙළින් කාලය නිත්‍ය පදාර්ථයක් ලෙස පිළිගන්නා න්‍යාය, වෛශේෂික දර්ශනයන් හා ස්වභාව ධර්මය මිස අන් කිසිවක් නැතැ'යි පවසන චර්වාකාදී භෞතික වාදයන්ද ගත් සේ පෙනේ). නිරෝධඥානය අරූප ලෝක, ලෝක ථූපිකා නොහොත් ලෝක ථූපිකා යනුවෙන් හඳුන්වනු ලබන අකනිටා බඹලොව ආදිය නිර්වාණයයි නිරෝධය පිළිබඳ වරදවා ගැනීම වලකාලයි; මාර්ගඥානය කාමසුඛල්ලිකානු යෝගය, අත්තකිලමථානු යෝගයන යන ප්‍රභේද ඇති අවිශුද්ධි මාර්ගයන් විශුද්ධිමාර්ගයයි උපාය පිළිබඳ වරදවා ගැනීම වලකා ලයි. එහෙයින් කියනු ලැබේ:-

ලොකෙ ලොකප්පභවෙ ලොකත්ථගමෙ සිවෙ ච තදුපායෙ
සම්මුය්හති තාව නරො නවිජානාති යාව සච්චානී'ති

ලෝකය, ලෝකයට මුල්වූ හේතුව, (ලෝකාවසානයවූ) නිර්වාණය, (එම නිර්වාණයට පැමිණෙන) උපාය මාර්ගය.

යම්තාක් මනුෂ්‍යයා චතුස්සත්‍යයන් නොදනීද ඒතාක් ලෝකය, ලෝකයට මුල්වූ හේතුව, ලෝකාවසානය වූ නිර්වාණය එම නිර්වාණයට පැමිණෙන උපාය මාර්ගය යන මෙහි මුළාවට පත්වේ.

මෙසේ ඥානකෘත්‍ය වශයෙන්ද මෙහි විනිශ්චය දතයුතුයි.

—//—

අන්තොගධානං පභෙදා (අන්තර්ගත කරුණු පිළිබඳ ප්‍රභේද වශයෙන්) යනු, දුඃඛ සත්‍යය තුළ තෘෂ්ණාවද ආශ්‍රව නොවන ධර්මයන් හැර සෙසු සියලු ධර්මයෝද, සමුදය සත්‍යය තුළ සතිස් තෘෂ්ණා

විශේෂයෝද ඇතුළත් වෙති. නිරෝධ සත්‍යය අසම්මිශ්‍රව පවතී. මාර්ග සත්‍යය තුළ, සම්මාදිට්ඨි යනුවෙන් වීමංසිද්ධිපාද, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබල, ධම්මවිචය සම්බොජ්ඣඞ්ග යන මේ ධර්මයෝ ඇතුළත් වෙති. සම්මා සඞ්කප්ප වශයෙන් නෙක්ඛම්ම විතක්ක ආදී ත්‍රිවිධ විතර්කයෝද, සම්මා වාචා යනුවෙන් චතුර්විධ වාක් සුචරිතයෝද, සම්මාආජීව යනුවෙන් අල්පේච්ඡතා, සන්තුෂ්ටිතා යන මොහුද ඇතුළත් වෙති.

නොහොත්, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මේ සියල්ලම එක්ව 'අරියකන්ත සීලය' වන හෙයින්ද, ශීලයද ශ්‍රද්ධා නමැති හස්තයෙන් ගතයුතු වන හෙයින්ද, එම සම්මා වාචා ආදිය තුළ ඇති හෙයින් සද්ධින්ද්‍රිය, සද්ධා බල, ඡන්දිද්ධිපාද යන මොහු ඇතුළත් වෙති.

සම්මාවායාම යනුවෙන් චතුර්විධ සම්‍යක් ප්‍රධානයෝද, විරියින්ද්‍රිය, විරියබල, විරිය සම්බොජ්ඣඞ්ග යන මොහුද ඇතුළත් වෙති. සම්මාසති යනුවෙන් චතුර්විධ සතිපට්ඨාන, සතින්ද්‍රිය, සතිබල, සති සම්බොජ්ඣඞ්ග යන මොහු ඇතුළත් වෙති. සම්මාසමාධි යනුවෙන් සවිතක්ක, සවිචාරාදී ත්‍රිවිධ සමාධීහුද. චිත්ත සමාධි, සමාධින්ද්‍රිය, සමාධිබල යන මොහුද, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොජ්ඣඞ්ගයෝද ඇතුළත් වෙති.

මෙසේ අන්තර්ගත ධර්මයන්ගේ ප්‍රභේද වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

——//——

උපමාතො (උපමා වශයෙන්) යනු, දුඃඛ සත්‍යය බරක් සෙයින්ද, සමුදය සත්‍යය බර ගැනීම සෙයින්ද, නිරෝධ සත්‍යය බර හැරීම සෙයින්ද, මාර්ගසත්‍යය බරහැරීමේ උපාය සෙයින්ද දතයුතුය. යළි දුඃඛසත්‍යය රෝගයක් සෙයින්ද, සමුදය සත්‍යය රෝගනිදානය සෙයින්ද, නිරෝධ සත්‍යය රෝග ව්‍යුපශමනය සෙයින්ද, මාර්ග සත්‍යය බෙහෙතක් සෙයින්ද දතයුතුය. නොහොත්, දුඃඛ සත්‍යය දුර්භික්ෂයක් සෙයින්ද, සමුදය සත්‍යය නියඟක් සෙයින්ද, නිරෝධ සත්‍යය සුභික්ෂයක් සෙයින්ද, මාර්ග සත්‍යය වැසි සුලබ බවක් මෙන්ද දැකිය යුතුය.

තවද (පිළිවෙළින්) වෛර ඇත්තකු, වෛරයට මුල, වෛරය, වෛරය උපුටා දැමීම, වෛරය උපුටා දැමීමේ උපාය මාර්ගය යන මේවා සමගද, විෂවෘක්ෂ, වෘක්ෂමූල, මූලච්ඡේදන, මූලච්ඡේදනෝපාය යන මේවා සමගද, භය, භයහේතු, අභයලාභ, අභයලාභෝපාය යන මේවා සමගද, එසේම මෙතෙර, මහඹොය, පරතෙර, පරතෙර යාමේ උත්සාහය යන මේවා සමගද උපමා වශයෙන් යොදා දතයුතුය.

මෙසේ උපමා වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

——//——

චතුක්කතො (චතුෂ්ක වශයෙන්) යනු, මේ දුඃඛයන් අතරඃ-

i. දුඃඛ වූ ආර්ය සත්‍ය නොවූ ධර්මයෙක් ඇත.
ii. ආර්යසත්‍ය වූ දුඃඛ නොවූ ධර්මයෙක්ද ඇත.
iii. දුඃඛ වූ ආර්ය සත්‍යද වූ ධර්මයෙක්ද ඇත.
iv. දුඃඛද නොවූ ආර්යසත්‍යද නොවූ ධර්මයෙක්ද ඇත.

සමුදය ආදියෙහිද මෙම නයයි. එහි මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයෝද, ශ්‍රමණභාවයෙහි ඵලයෝද, ''යදනිච්චං තං දුඃඛං'' (යමක් අනිත්‍ය වේද. එය දුකෙකි) යන වචනය අනුව සංස්කාර දුඃඛ වන හෙයින් දුඃඛ නම් වන මුත් දුඃඛ ආර්යසත්‍ය නොවේ. නිරෝධය ආර්යසත්‍ය වන නමුදු දුඃඛ නොවේ. ඉතිරි ආර්යසත්‍ය දෙක (සමුදය, මාර්ග) වනාහි අනිත්‍ය වන හෙයින් දුඃඛ වනුමිස තථ්‍යාර්ත්‍ථයෙන් එසේ නොවේ. එම ධර්මයන් විනිවිද දැකීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචර්ය වාසය කරනු ලබන හෙයිනි.

සියලු ආකාරයෙන් වනාහි තෘෂ්ණාව හැර උපාදානස්කන්‍ධ පංචකය දුඃඛද ආර්යසත්‍යද වේ. මාර්ග සම්ප්‍රයුක්ත ධර්මයෝද ශ්‍රමණ භාවඵලයෝද තථ්‍යර්ත්‍ථයෙන් දුඃඛද ආර්ය සත්‍යද නොවේ. එම ධර්මයන් පිරිසිඳ දැනගැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචර්යවාසය කරනු ලබන හෙයිනි. සමුදය ආදියෙහිද මේ ආකාරයෙන් සුදුසු පරිදි යොදා චතුෂ්ක වශයෙනුදු මෙහි විනිශ්චයය දතයුතුය.

සුඤ්ඤතෙකවිධාදීහි යන මෙහි පළමුකොට සුඤ්ඤතො (ශුන්‍ය වශයෙන්) යනු, පරමාර්ත්‍ථ වශයෙන් වනාහි සියලුම ආර්යසත්‍යයන් (පිළිවෙළින්), වේදක (විඳින්නකු), කාරක (කරවන්නකු) නිබ්බුත (නිවුනකු) ගමක (යන්නකු) නොමැති හෙයින් ශුන්‍ය යයි දතයුතුය. එහෙයින් කියනුලැබේඃ-

දුක්ඛමෙවහි න කොචි දුක්ඛිතො කාරකො න කිරියාව විජ්ජති,
අත්‍ථි නිබ්බුති න නිබ්බුතො පුමා මග්ගමත්‍ථි ගමකො න විජ්ජති

දුකම විනා දුක් විඳින කිසිවෙක් නැත; ක්‍රියාවම විනා කරවන්නෙක් නැත; නිවණ ඇතිමුත් නිවුණ කෙනෙක් නැත; මාර්ගය ඇති මුත් යන කෙනෙක් නැත.

නොහොත්ඃ-

ධුව සුභ සුඛත්ත සුඤ්ඤං පුරිමද්වය මත්ත සුඤ්ඤමමතපදං
ධුව සුඛ අත්ත විරහිතො මග්ගො ඉති සුඤ්ඤතා තෙසු

පළමු සත්‍ය දෙක නිත්‍ය-ශුභ-සුඛ-ආත්ම ස්වභාවයන්ගෙන් ශුන්‍ය(තොර) වේ; අමෘතපදය (නිරෝධය) ආත්ම ස්වභාවයෙන් ශුන්‍ය වේ; මාර්ගය නිත්‍ය-සුඛ-ආත්ම ස්වභාවයන්ගෙන් ශුන්‍යවේ; මෙසේ සත්‍යයන් පිළිබඳ ශුන්‍යතාව වේ.

නොහොත්, දුක්ඛ, සමුදය, මාර්ග යන සත්‍යත්‍රයය නිරෝධයෙන් ශුන්‍යය; නොහොත්, මෙහි හේතුව ඵලයෙන් ශුන්‍ය වේ; සමුදය සත්‍යය කෙරෙහි දුක්ඛය නොමැති හෙයින් හා මාර්ග සත්‍යය කෙරෙහි නිරෝධය ද නොමැති හෙයිනි. ප්‍රකෘතිවාදීන්ගේ* ප්‍රකෘතිය මෙන් හේතුව ඵලය ගැබ් කොට ඇත්තේ නොවේ. ඵලය හේතුවෙන් ශුන්‍ය වේ. දුක්ඛය, සමුදයය යන දෙක හෝ නිරෝධය, මාර්ගය යන දෙක හෝ සමවාය නොවන හෙයිනි (එකිනෙක බැඳී නොපවත්නා හෙයිනි). මෙම හේතු-ඵල ද්වයය සමවාය වාදීන්ගේ† ද්වි අණුක ආදිය මෙන් හේතු-ඵල සමාවායයෙන් සිද්ධවූයේ නොවේ.

එහෙයින් කියනු ලැබේ:-

තයමිධ නිරෝධ සුඤ්ඤං තයෙන තෙනාපි නිබ්බුති සුඤ්ඤා
සුඤ්ඤො ඵලෙන හෙතු ඵලම්පි තං හෙතුනා සුඤ්ඤන්ති

මෙහි, දුක්ඛ-සමුදය-මග්ග යන සත්‍ය-ත්‍රයය නිරෝධයෙන් ශුන්‍යවේ; නිරෝධයද එකී තුනෙන් ශුන්‍ය වේ; හේතුව ඵලයෙන් ශුන්‍ය වේ; ඵලයද හේතුවෙන් ශුන්‍ය වේ.

මෙසේ ශුන්‍යතා වශයෙන්ද මෙහි විනිශ්චය දතයුතුයි.

—//—

එකවිධාදීහි යනු, මෙහි සකලවිධ දුක්ඛය පවත්නා ස්වභාවය අනුව ඒකවිධ වේ; නාම-රූප වශයෙන් ද්විවිධ වේ; කාම-රූප-අරූප යන උත්පත්ති ස්වභාව වශයෙන් ත්‍රිවිධ වේ. ආහාර භේද වශයෙන් චතුර්විධ වේ; පංච-උපාදාන-ස්කන්ධ භේදවශයෙන් පංචවිධ වේ.

සමුදයයද ප්‍රවර්තක ස්වභාව වශයෙන් ඒකවිධ වේ; දිට්ඨිසම්පයුත්ත, අසම්පයුත්ත වශයෙන් ද්විවිධ වේ; කාම-භව-විභව-තෘෂ්ණා භේද වශයෙන් ත්‍රිවිධ වේ; සතර මගින් පහකළයුතු හෙයින් චතුර්විධ වේ; රූපාදී ආලම්බන භේද වශයෙන් පංචවිධ වේ; ෂට්තෘෂ්ණා-කාය භේද වශයෙන් ෂඞ්විධ වේ.

නිරෝධයද අසංඛත ධාතු වන හෙයින් ඒකවිධ වේ; සම්මුති වශයෙන් සෝපාදිශේෂ, නිරුපාදිශේෂ භේදයෙන් ද්විවිධ වේ; භවත්‍රයය

---

* ප්‍රකෘති (ඵල)ය, පුරුෂ(හේතු) යයි මූල පදාර්ථ දෙකක් දක්වන සංඛ්‍යවාදය ප්‍රකෘති-පුරුෂ යන දෙකින් ප්‍රකෘතිය ප්‍රමුඛ පදාර්ථය ලෙස හඳුන්වයි. එහෙයින් එය ප්‍රකෘතිවාදය සත්කාර්යවාදය යනුවෙන්ද හැඳින්වේ.

† හේතු-ඵල දෙක අණුකද්වය (පරමාණු දෙකක්) සෙයින් එකිනෙක බැඳී ඇතැ'යි වෛශේෂික වාදය පවසයි. එහෙයින් එය සමවාය වාදය, ද්වි-අණුක වාදය යන නම් වලින්ද වහරනු ලැබේ.

සංසිඳුවන හෙයින් ත්‍රිවිධ වේ; සිවුමගින් අවබෝධ කළයුතු හෙයින් චතුර්විධ වේ; පංච අභිනන්‍දනයන් සංසිඳුවීම් වශයෙන් පංචවිධ වේ; ෂට් තෘෂ්ණාකායක්‍ෂය භේද වශයෙන් ෂඩ්විධ වේ.

මාර්ගයද වැඩියයුතු වීම් වශයෙන් ඒකවිධ වේ; සමථ විපස්සනා භේදයෙන්, දර්ශන-භාවනා භේදයෙන් හෝ ද්විවිධ වේ; (ශීල, සමාධි. ප්‍රඥා යන) ස්කන්‍ධත්‍රය භේද වශයෙන් ත්‍රිවිධ වේ; මේ මාර්ගය වූකලී සප්පදේස (නිශ්චිත සීමාවක් ඇති) හෙයින් රටෙකින් නගරයක් සෙයින් නිප්පදේසවූ (නිශ්චිත සීමාවක් නැති) ස්කන්‍ධ තුනෙකින් පිඩු කොට ගන්නා ලද්දේය. යම්සේ කියන ලද්දේදః- ''ආයුෂ්මත් විශාඛයෙනි, ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් ස්කන්‍ධත්‍රයය සංගෘහීත වූයේ නොවේ; ආයුෂ්මත් විශාඛයෙනි, ස්කන්‍ධත්‍රයයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය සංගෘහීත වූයේ වේ; ආයුෂ්මත් විශාඛයෙනි, යම් සම්‍යග් වචනයක් වේද, යම් සම්‍යක් කර්මාන්තයක් වේද. යම් සම්‍යග් ආජීවයක් වේද, මේ ධර්මයෝ ශීලස්කන්‍ධය තුළ සංගෘහීත වෙති; යම් සම්‍යග් ව්‍යායාමයක් වේද, යම් සම්‍යක් ස්මෘතියක් වේද, යම් සම්‍යක් සමාධියක් වේද, මෙකී ධර්මයෝ සමාධිස්කන්‍ධය තුළ සංගෘහීත වෙති; යම් සම්‍යග් දෘෂ්ටියක් වේද, යම් සම්‍යක් සංකල්පයක් වේද, මෙකී ධර්මයෝ ප්‍රඥා ස්කන්‍ධය තුළ සංගෘහීත වෙති'[a]

මෙහි වනාහි සම්‍යග් වචනාදී වූ තුන ශීලයමැයි, එහෙයින් ඒ තුන ස්වජාතීය වන හෙයින් ශීලස්කන්‍ධයෙන් සංගෘහීත වේ. එතෙකුදු වූවත් පාළියෙහි ''සීලක්ඛන්‍ධෙ'' යනුවෙන් ආධාර විභක්තියෙන් මෙන් දක්වන ලදි. අර්ථය වනාහි කරණ වශයෙන්ම දතයුතුය.

සම්මාවායාම ආදී තුන් තන්හි (අවසන්හි ඇති) සම්මා සමාධිය ස්වකීය ස්වභාවය අනුව ඒකාග්‍රතාවෙන් අරමුණෙහි පවතිනු නොහැකි වේ.

වීර්යය ප්‍රග්‍රහ (ප්‍රයත්න) කෘත්‍යයද, ස්මෘතිය පාවී යනු නොදීමේ (අරමුණින් ඉවත යනු නොදීමේ) කෘත්‍යයද ඉටු කරන කල එම උපකාරයෙන් හැකිවේ. එහිලා මේ උපමායිః-

නකත් කෙළිම්හයි උයනට පිවිසි යහළුවන් තිදෙනකු අතුරෙන් එකෙක් සුපිපි සපු රුකක් දැක අත ඔසවාද මල නෙලාගනු නොහැකි වේ; එවිට දෙවැන්නා නැමී පිට දෙයි, ඔහුගේ පිට නැඟී පවා ඒ මේ අත ඇල වෙමින් මල් ගැනීමට නොහැකි වේ. එවිට තුන්වැන්නා තම දසරුව (කර) ළං කරයි. හේ තෙමේ එකකු පිට නැඟ අනෙකාගේ දසරුවෙහි එල්බ ගෙන සිත්සේ මල් නෙලා පැළඳගෙන නකත් කෙළියි. මේ කරුණ මෙසේ දතයුතුය. සම්මා වායාම ආදී සහජාත ධර්ම තුන එක්ව උයනට පිවිසි තුන් යහළුවන් වැනිය. අරමුණ සුපිපි සපුරුක වැනිය. තමාගේම

a. ම. නි., මහා වෙදල්ල සුත්‍ත

ස්වභාවය අනුව අරමුණෙහි ඒකාග්‍රතාවෙහි පිහිටන්නට නොහැකි සමාධිය අත ඔසවාද මල් නෙලාගත නොහැකිවූ පළමුවන යහළුවා වැනිය. සම්මා වායාමය නැමී පිට දුන් දෙවැනි යහළුවා වැනිය. සම්මා සතිය, තම දසරුව එළවමින් සිටි යහළුවා වැනිය. යම්සේ ඔවුනතුරෙන් පළමුවැන්නා එකකු පිට නැඟී අනිකාගේ දසරුවෙහි එල්බගෙන රිසිසේ මල් නෙලා ගැනීමට සමත්වේද, එසේම සම්මා වායාමය (වීර්යය) අරමුණෙහි පිහිටීමේ ප්‍රග්‍රහ කෘත්‍යයද, සම්මා සතිය අරමුණෙන් ඉවතට පාවී යාම වලක්වන අපිලාපන කෘත්‍යයද ඉටු කරන විට එයින් උපකාර ලැබ සමාධිය අරමුණෙහි ඒකාග්‍රභාවයෙන් පිහිටනු සමත් වේ. එහෙයින් මෙහිදී සම්මා සමාධියම ස්වජාතීය (තම ස්වභාව) වශයෙන් සමාධිස්කන්ධයෙන් සංගෘහීතයි. ව්‍යායාම, සති යන දෙක වනාහි ක්‍රියා වශයෙන් සංගෘහීත වේ.

සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප යන දෙක පිළිබඳවද, ප්‍රඥාව තමාගේ ස්වභාවයෙන්ම අනිත්‍යය. දුඃඛය, අනාත්මයයි අරමුණ නිශ්චය කරගැනීමට නොසමත්වේ; විතර්ක අරමුණ අවුස අවුසා දෙන විටම සමත් වේ; කෙසේද යත්:- යම් සේ රන්කරුවෙක් කහවණුවක් අත්ලෙහි තබා සියලු පැති බලනු රිසි වනුයේ නමුදු එය ඒ මේ අත පෙරළීමේ කාර්යය ඇසින්ම කළ නොහැක්කේ වේද, ඇඟිලි තුඩුවලින්ම එම (ඒ මේ අත පෙරළීමේ) කාර්යය කළ හැක්කේ වේද, එසේම ප්‍රඥාව තම ස්වභාවයෙන්ම අනිත්‍යාදී වශයෙන් අරමුණ නිශ්චය කරනු නොසමත්වේ; නැවත නැවත පිහිටුවීම ලක්‍ෂණ කොට ඇති, ඒ මේ අත ඇවිසීම කෘත්‍ය කොට ඇති විතර්කය විසින් අවුසමින් පෙරළමින් මෙන් ගෙන දෙන ලද්දක්ම නිශ්චය කරනු සමත්වේ. එහෙයින් මෙහිදීද සම්මාදිට්ඨියම ස්වජාතීය වශයෙන් ප්‍රඥාස්කන්ධය තුළ සංගෘහීතයි; සම්මා සංකප්පය වනාහි ක්‍රියා වශයෙන් සංගෘහීත වේ.

මෙසේ මාර්ග සත්‍යය මේ ස්කන්ධ ත්‍රයයෙන් සංග්‍රහයට යෙයි. එහෙයින් ස්කන්ධත්‍රය භේදයෙන් ත්‍රිවිධයයි කියනලදි. සෝතාපත්ති මග්ග ආදී වශයෙන් චතුර්විධ වේ.

තවද සියලුම සත්‍යයෝ, අවිතථ (නො-එසේ නොවන) හෙයින්, අභිඤ්ඤෙය්‍ය (මනාකොට දතයුතු) වන හෙයින් හෝ, ඒකවිධ වෙති. ලෞකික ලෝකෝත්තර වශයෙන්, සංඛත අසංඛත (කෘත්‍රිම-අකෘත්‍රිම) වශයෙන් ද්විවිධ වෙති. දස්සන පහාතබ්බය, භාවනා පහාතබ්බය, අප්පහාතබ්බය යනුවෙන් ත්‍රිවිධ වෙති. පරිඤ්ඤෙය්‍ය (මනා කොට දත යුතු) ආදී භේද වශයෙන් චතුර්විධ වෙති. මෙසේ මෙහි ඒකවිධාදී භේද වශයෙන්ද විනිශ්චයය දතයුතුය.

සභාග විසභාගතො (සමාන අසමාන ස්වභාව වශයෙන්) යනු, සියලුම සත්‍යයෝ, අවිතථ ස්වභාවයෙන්ද, ආත්මරහිත වන හෙයින්ද, දුෂ්කර අවබෝධ ඇති හෙයින්ද එකිනෙක සමාන වෙති. යම් සේ කියන

ලදද:- ''ආනන්දය, යම් පුරුෂයෙක් තෙමේ දුර සිට සියුම් යතුරු සිදුරක් අතරින් හීයක් විදින්නේද, නැවත නැවතත් නොවරදවා විදිනේද, තවද, යම් පුරුෂයෙක් තෙමේ සියක් කඩක් කොට පළන ලද අස් ලොමෙක් (එක් එක් කැබැල්ලෙක) කෙළවරින් කෙළවර (මේ වේය'යි) දත හැකි වනුයේද, (මෙදෙකින්) කුමක් වඩා දුෂ්කර වෙති'යි, දුස්සාධ්‍ය වෙති'යි සිතන්නෙහිද?'' ''ස්වාමීනි, යම් පුරුෂයෙක් තෙමේ සියක් කඩ කොට පළන ලද අස් ලොමෙක (එක් එක් පලුවෙක) කොණින් කොණ දත හැකි වන්නේදැයි යන මෙයම වඩාත් දුෂ්කරය. වඩාත් දුස්සාධ්‍යය''. ''එසේ නම් ආනන්දය, යම් කෙනෙක් 'මේ දුකයයි' තත්වූ පරිදි අවබෝධ කෙරෙත්ද, -පෙ- 'දුක් නැති කිරීමේ මාර්ගය'යි තත්වූ පරිදි අවබෝධ කෙරෙත්ද ඔහු තුමූ එයටත් වඩා දුෂ්කර දෙයක් දුස්සාධ්‍ය දෙයක් සාධනය කෙරෙති.''[a]

ස්වලක්‍ෂණ ව්‍යවස්ථාන (එකිනෙකට අයත් ලක්‍ෂණ අනුව) වශයෙන් එකිනෙකට අසමාන වෙති. පළමුවන දෙක දුරවබෝධ බැවින්ද, ගැඹුරු බැවින්ද, ලෞකික බැවින්ද, ආශ්‍රව සහිත බැවින්ද එකිනෙකට සමාන වේ, ඵල-හේතු භේදයෙන්ද, දතයුතු බවින් හා හළයුතු බවින්ද එකිනෙක අසමාන වේ. අවසන් දෙකද දුරවබෝධ බැවින්ද. ලෝකෝත්තර බැවින්ද, ආශ්‍රවරහිත බවින්ද එකිනෙක සමාන වේ; විෂය-විෂයී භේදයෙන්ද, සාක්‍ෂාත් කළයුතු බවින් හා වැඩියයුතු බවින්ද එකිනෙකට අසමාන වේ. පළමුවන-තුන්වන දෙක 'ඵල' වන හෙයින් සමාන වේ. සංඛත-අසංඛත භේදයෙන් අසමාන වේ. දෙවන-සිවුවන දෙක 'හේතු' වන හෙයින් සමාන වේ. (පිළිවෙළින්) ඒකාන්ත කුශල හා ඒකාන්ත අකුසල වන හෙයින් අසමාන වේ. පළමුවන-සිවුවන දෙකද සංඛත වන හෙයින් සමාන වේ. (පිළිවෙළින්) ලෞකික හා ලෝකෝත්තර වන හෙයින් අසමාන වේ. දෙවන-තුන්වන දෙකද ශෛක්‍ෂ්‍ය හෝ අශෛක්‍ෂ්‍ය හෝ නොවන හෙයින් සමාන වේ; සාරම්මණ (අරමුණු සහිත) - අනාරම්මණ (අරමුණු රහිත) වශයෙන් අසමාන වේ.

ඉති එවං පකාරෙහි නයෙහි ච විචක්ඛණො
විජඤ්ඤා අරියසච්චානං සභාග විසභාගතං

මෙසේ මෙකී ප්‍රකාර හා ක්‍රම අනුව නුවණැත්තේ ආර්යසත්‍යයන් පිළිබඳ සමාන-අසමාන බව දන්නේයි.

සාධුජන ප්‍රමෝදය පිණිස කරන ලද විශුද්ධිමාර්ගයෙහි
පඤ්ඤාභාවනාධිකාරයෙහි ඉන්ද්‍රිය සච්ච නිද්දේස නම් වූ
සොළොස්වන පරිච්ඡේදය මෙතකින් නිමියේය.

—//—

a. සං. නි., පපාත වග්ග

# පඤ්ඤාභූමි නිද්දේසය

ඉක්බිති, ඛන්ධ-ආයතන-ධාතු-ඉන්ද්‍රියසච්ච-පටිච්චසමුප්පාද ආදී භේද සහිත ධර්මයන් මේ ප්‍රඥාවට භූමි වෙති'යි මෙසේ කියන ලද මේ ධර්මයන් අතුරෙන්, යම් හෙයකින් පටිච්ච සමුප්පාදයද ආදි ශබ්දයෙන් සංගෘහීත පටිච්ච සමුප්පන්න ධර්මයෝද ශේෂව ඇත්තාහුද, එහෙයින් මේ ධර්මයන් පිළිබඳ වර්ණනා ක්‍රමය පිළිවෙළින් එළඹියේය.

එහි පළමුකොට අවිජ්ජා ආදී ධර්මයෝ 'පටිච්ච සමුප්පාද'යයි දතයුත්තාහුය. කියනලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:- 'මහණෙනි, 'පටිච්චසමුප්පාද' යනු කවරේද? මහණෙනි, අවිජ්ජාව ප්‍රත්‍යය කොට සඞ්ඛාරයෝද, සඞ්ඛාරයන් ප්‍රත්‍යය කොට විඤ්ඤාණයද, විඤ්ඤාණය ප්‍රත්‍යය කොට නාම-රූප දෙකද, නාම-රූපයන් ප්‍රත්‍යය කොට සළායතනයෝද, සළායතනයන් ප්‍රත්‍යය කොට ඵස්සයද, ඵස්සය ප්‍රත්‍යය කොට වේදනාවද, වේදනාව ප්‍රත්‍යය කොට තණ්හාවද, තණ්හාව ප්‍රත්‍යයකොට උපාදානයද, උපාදානය ප්‍රත්‍යය කොට භවයද, භවය ප්‍රත්‍යය කොට ජාතියද, ජාතිය ප්‍රත්‍යය කොට ජරා-මරණ-සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්ස-උපායාසයෝද හටගන්නාහුය; මෙසේ මේ සියලු දුඃඛස්කන්ධයෙහි හටගැනීම සිදුවන්නේය; මහණෙනි, මෙය පටිච්චසමුප්පාද'යයි කියනු ලැබේ''[a]

ජරා-මරණ ආදීහු පටිච්ච සමුප්පන්න ධර්මයෝයයි දතයුත්තාහුය. කියන ලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:- ''මහණෙනි, 'පටිච්ච සමුප්පන්න' ධර්මයෝ කවරහුද? මහණෙනි, ජරා-මරණ දෙක අනිත්‍යය, සංඛතය, හේතුවෙකින් උපන්නේය, ක්‍ෂය වීම ස්වභාව කොට ඇත්තේය; වැය වීම ස්වභාව කොට ඇත්තේය; විරාගය (නො-ඇලීම) ස්වභාව කොට ඇත්තේය, නිරෝධය (නිවීයාම) ස්වභාව කොට ඇත්තේය. ජාති (ඉපදීම-පෙ-භව- උපාදාන-තණ්හා-වේදනා-ඵස්ස-සළායතන-නාම-රූප-විඤ්ඤාණ-සංඛාර-අවිජ්ජා යන මොහු අනිත්‍යයහ. සංඛතයහ. පටිච්ච සමුප්පන්නයහ. ක්‍ෂයවීම ස්වභාව කොට ඇත්තාහ. වැය වීම ස්වභාව කොට ඇත්තාහ. විරාගය ස්වභාව කොට ඇත්තාහ. නිරෝධය (සංසිඳීම) ස්වභාව කොට ඇත්තාහ. මහණෙනි. මොහු පටිච්ච සමුප්පන්න ධර්මයෝය'යි කියනු ලබති[b].

මේ මෙහි සංක්‍ෂේපයයි. 'පටිච්ච සමුප්පාද' යනුවෙන් ප්‍රත්‍යය (හේතු) වන ධර්මයන්ද, 'පටිච්ච සමුප්පන්න ධම්ම' යනුවෙන් ඒ ඒ හේතුවෙන් නිපන් ධර්මයන්ද දතයුතුය. මෙය කෙසේ දතයුත්තේද? භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙනි; භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි,

a. සං. නි. බුද්ධ වග්ග
b. සං. නි., ආහාර වග්ග

පටිච්චසමුප්පාද-පටිච්ච සමුප්පන්න සූත්‍රයෙහි, ''මහණෙනි. 'පටිච්ච සමුප්පාද යනු කවරේද? මහණෙනි, ජාතිය (ඉපැදීම) හේතුකොට ජරාමරණ දෙක වන්නේය; තථාගතයන්ගේ උත්පාද කාලයෙහි වුවද, අනුත්පාද කාලයෙහි වුවද එම මූලධර්මය, ස්වභාවික ස්ථිතිය, ස්වාභාවික නියාමය, ඉදප්පච්චයතාව (මේ හේතුවෙන් මේ ඵලය සිදු වේ' යන නියමය) තිරව සිටියේම වේ. තථාගතවරයෝ එය මනාකොට වටහා ගනිති. අවබෝධ කොට ගනිති. ප්‍රකාශ කෙරෙති. දේශනා කෙරෙති. පණවති. පිහිටුවති. විවරණය කෙරෙති. විග්‍රහ කෙරෙති. ප්‍රකට කෙරෙති. බලවු යයි පෙන්වා දෙති. මහණෙනි, ජාති (ඉපැදීම) හේතුකොට ජරා-මරණ දෙක වන්නේය. මහණෙනි, භවය හේතු කොට ජාතිය වන්නේය. -පෙ- අවිජ්ජාව ප්‍රත්‍යය කොට සංඛාරයෝ වන්නාහුය. තථාගතයන්ගේ උත්පාද කාලයෙහි වේවා. අනුත්පාද කාලයෙහි වේවා. -පෙ- ප්‍රකට කෙරෙති. බලවුයයි පෙන්වති; මහණෙනි, 'අවිජ්ජාව හේතුකොට සංඛාරයෝ වන්නාහුය.' යන මෙහි යම් තථතාවක් (සැබෑ බවක්), අවිතථතාවක් (නොසැබෑ නොවන බවක්). අනඤ්ඤථතාවක් (නො-එසේ නොවන බවක්), ඉදප්පච්චයතාවක් (මේ හේතුවෙන් මේ ඵලය වෙතැ'යි යන බවක්) වන්නේද, මහණෙනි, මෙය 'පටිච්චසමුප්පාද'යයි කියනු ලැබේ.''[a]

මෙසේ පටිච්චසමුප්පාදය දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ විසින් තථතා ආදී වූ විවරණයන්ගෙන් ප්‍රත්‍යය වූ ධර්මයෝම පටිච්චසමුප්පාදයයි ප්‍රකාශ කරන ලද්දාහුය. එහෙයින් ජරාමරණාදී ධර්මයන්ගේ ප්‍රත්‍යය ලක්ෂණයම පටිච්චසමුප්පාද නම් වේ; එය දුක් ලුහුබැඳීම කෘත්‍යය කොට ඇත්තේය; අසන්මාර්ගය වැටහීම් කාරණා කොට ඇත්තේයයි දතයුතුය.

එම පටිච්චසමුප්පාදය වනාහි අඩු-වැඩි නොවන සේ ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ස්වභාවයන් හටගන්නා හෙයින් 'තථතා'යි කියන ලදි. ප්‍රත්‍යයන් එක්රැස් බවට පත්වූ විට, එයින් නිපන් ස්වභාවයන් මොහොතකුදු නොනැවත නොසිටින හෙයින් 'අවිතථතා' යයි කියන ලදි. අනෙක් අනෙක් ස්වභාව ඇති ප්‍රත්‍යයන්ගෙන් අනෙක් අනෙක් ස්වභාවයන් පහළ නොවන හෙයින් 'අනඤ්ඤථතා'යි කියනලදි. මෙසේ කියන ලද මේ ජරා-මරණාදීනට ප්‍රත්‍යය වන හෙයින් හෝ ප්‍රත්‍යයන් එක්රැස් වන හෙයින් හෝ 'ඉදප්පච්චයතා'යි කියන ලදි. මේ එහි වචනාර්ථයයි. ඉමෙසං පච්චයා (මොවුනට ප්‍රත්‍යය වූවාහු) ඉදප්පච්චයා (ඉදප්පච්චය නම් වෙති), ඉදප්පච්චයා එව ඉදප්පච්චයතා (ඉදප්පච්චය' යනුම ස්වාර්ථයෙන් ඉදප්පච්චයතා නම්). ඉදප්පච්චයානං සමූහො වා ඉදප්පච්චයතා (ඉදප්පච්චයයන්ගේ සමූහය හෝ 'ඉදප්පච්චයතා' නම්). මෙහි ලක්ෂණය ශබ්දශාස්ත්‍රානුසාරයෙන් පිරික්සිය යුතුවේ.

---

a. සං. නි. ආහාර වග්ග

ඇතැමෙක් වනාහි, යම් කිසිවක් හේතුකොට (පටිච්ච), මනාකොට (සම්මා), තීර්ත්‍ථකයන් විසින් පරිකල්පිත ප්‍රකෘති-පුරුෂ ආදී (සාංඛ්‍යවාදයෙහි මෙන්) මූල පදාර්ත්‍ථයන් පිළිබඳ අපේක්ෂා රහිතව (එවන් මතයන් නොතකා) සිදුවන උත්පාද (ඉපැදීම්) මාත්‍රය 'පටිච්චසමුප්පාදය'යි මෙසේ හුදු ඉපැදීම පටිච්ච සමුප්පාදයයි කියති. එය යුතු නොවේ. කවර හෙයින්ද? එවන් සූත්‍රධර්මයක් නොමැති හෙයිනි, සූත්‍ර දේශනාවනට පටහැණි වන හෙයිනි. ගැඹුරු දේශනා ක්‍රමයක් නොවන හෙයිනි. එසේම ශබ්ද ශාස්ත්‍රයට නොගැලපෙන හෙයිනි.

උත්පාද මාත්‍රය පටිච්ච සමුප්පාදයයි පැවසෙන සූත්‍රදේශනාවක් නැත. එය (උත්පාද මාත්‍රය) පටිච්චසමුප්පාදයයි පවසන්නහුට පදෙස-විහාර සූත්‍ර විරෝධය සිදුවේ. කෙසේද යත්:- ''ඉක්බිති භගවත්හු රාත්‍රි ප්‍රථම යාමයෙහි පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළහ''[a] යන ආදී භාග්‍යවතුන් වහන්සේගේම වචනයෙනි. පටිච්චසමුප්පාදය මෙනෙහි කිරීම බුද්ධත්‍වයට පැමිණි භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම විහරණය වේ. පදේස විහාර යනු එම ප්‍රථම විහරණයටම අයත් ඒක දේශයෙකි. යම්සේ කියන ලදදෑ:- ''මහණෙනි, බුද්ධත්‍වයට පැමිණි ඒ මම යම් ප්‍රථම විහරණයෙකින් කල් යැවීම්ද. එම විහරණයෙහිද ඒකදේශ විහරණයෙකින් කල් යැවීමි[b] එහිද ප්‍රත්‍යයාකාර දර්ශනයෙන් මිස හුදෙක් උත්පාද මාත්‍ර දර්ශනයෙන් නොවේ. යම්සේ කියන ලද්දේදෑ:- ''ඒ (මම) මෙසේ දනිමි, මිථ්‍යාදෘෂ්ටි ප්‍රත්‍යය හේතුකොට ගෙනද වේදයිතය (විඳිය යුතුඵලය) ඇතිවේ; සම්‍යග්දෘෂ්ටි ප්‍රත්‍යය හේතුකොට ගෙනද වේදයිතය ඇතිවේ; මිථ්‍යා සංකල්පය ප්‍රත්‍යය කොට ගෙනද වේදයිතය ඇතිවේ.'' යන ආදිය සියල්ල විස්තර කළයුතුය. මෙසේ උත්පාද මාත්‍රය ''පටිච්චසමුප්පාදය'යි කියන්නහුට පදේස-විහාර-සුත්ත විරෝධය සිදුවේ.

එසේම කච්චාන සුත්ත විරෝධයද වේ. කච්චාන සූත්‍රයෙහි වනාහි, ''කච්චානය, ලෝකසමුදයය (ලෝකයට හේතු වූ අවිද්‍යාදිය) සම්‍යක් ප්‍රඥාවෙන් ඇතිතතු බලන්නහුට ලෝකය පිළිබඳව යම් නාස්තිකතාවක් (උච්ඡේද දෘෂ්ටියක්) වේනම් එය එසේ නොවන බව වැටහේ''[c] අනුලෝම පටිච්චසමුප්පාදය ලෝකයට හේතු වශයෙන් ලෝක සමුදය වෙති'යි උච්ඡේද දෘෂ්ටිය නැසීම උදෙසා දේශනා කරන ලදි. හුදෙක් උත්පාද මාත්‍රය පටිච්චසමුප්පාද නොවේ. උත්පාද මාත්‍රය දැක්වීමෙන් උච්ඡේද දෘෂ්ටිය නැසීමක් සිදුනොවේමය; ප්‍රත්‍යයන්ගේ අනුපිළිවෙළ දැකීමෙන්ම එය සිදුවේ. ප්‍රත්‍යයන්ගේ අනුපිළිවෙළින් ඵලයන්ගේ අනුපිළිවෙළ සිදුවන

a. මහාවග්ග, බෝධිකථා
b. ස. නි. විහාරවග්ග
c. සං. නි. ආහාරවග්ග

හෙයිනි. මෙසේ උත්පාදමාත්‍රය පටිච්චසමුප්පාදයයි කියන්නහුට කච්චාන සුත්ත විරෝධයද සිදුවේ.

ගම්භීරනයාසම්භවතො (ගැඹුරු දේශනානයක් නොවන හෙයිනි) යනු, කියනලදමැයි භාග්‍යවතුන් වහන්සේ විසින්:- ''ආනන්දය, මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය, ගැඹුරුබව පෙනෙන්නටද ඇත''[a] ගැඹුරු බව වනාහි සිවුවැදෑරුම් වේ; එය පසුව විස්තර කරන්නමු. එය උත්පාදමාත්‍රයෙහි නොමැත. මේ පටිච්චසමුප්පාදය සිවුවැදෑරුම් නයින් යුක්තයයි විස්තර කෙරෙති. ඒ සිවුවැදෑරුම් නය උත්පාද මාත්‍රයෙහි නොමැති හෙයින් ගැඹුරුබවක් නොමැති වීමෙන්ද පටිච්චසමුප්පාදය යනු හුදු උත්පාද මාත්‍රය නොවේ.

සද්දභෙදතො (ශබ්දශාස්ත්‍ර භේදයෙන්ද) යනු, මේ 'පටිච්ච' යන පදය වනාහි සමාන කර්තෘක පූර්වක්‍රියාවක් ලෙස යොදනු ලබන විට අර්ථය සිද්ධ කරයි. ''චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං[b] (ඇස හා රූපයන් ඇසුරුකොට චක්ඛු විඤ්ඤාණය උපදියි)'' යන තන්හි මෙනි. මෙහිදී වනාහි භාවකාරක 'උප්පාද ශබ්දය හා සමග යොදනු ලබනුයේ සමාන කර්තෘක නොවන හෙයින් ශබ්ද ශාස්ත්‍ර (ව්‍යාකරණ) විරෝධයට පැමිණේ. කිසි අර්ථයක් හෝ සාධනය නොකෙරේ; මෙසේ ව්‍යාකරණ විරෝධ වන හෙයින්ද 'පටිච්චසමුප්පාද' යනු උත්පාද මාත්‍රය නොවේ.

එහි 'හොති' යන ක්‍රියාපදය හා සමග 'පටිච්චසමුප්පාදො හොති'යි යොදන්නෙමු'යි තර්කයෙක් වේනම්, එයද යුතු නොවේ; කවර හෙයින්දයත්, එවන් යෙදීමක් (කොතැනකවත්) නොමැති හෙයිනි. තවද (එසේ යෙදුව හොත්) උත්පාදයාගේද උත්පාදයක් පිළිබඳ වැරදි හැඟීමක් ඇති විය හැකි හෙයිනි. 'පටිච්ච සමුප්පාදං වො භික්ඛවෙ දෙසිස්සාමි, කතමො ච භික්ඛවෙ පටිච්ච සමුප්පාදො -පෙ- අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදො''[c] යන ආදී තන්හි එකද පදයක් හා සමග 'හොති' යන ක්‍රියා පදය යෝගයට නොපැමිණේ (නොයෙදේ). 'උප්පාදො හොති'යි යන්නක් සිදු නොවේ. ඉදින් එසේ වෙතොත්, උත්පාදයාගේද උත්පාදයක් පිළිබඳ වැරදි වැටහීමක් වන්නේය.

යමෙක් වනාහි, ''ඉදප්පච්චයයන් (මේ මේ ඵලයන් ඇති කරන මේ මේ හේතුන්) ගේ භාවය 'ඉදප්පච්චයතා'යි කියනු ලැබේ, 'භාව' නම් සංඛාරාදීන්ගේ පහළ වීමෙහිලා හේතුවන අවිජ්ජාදීන්ගේ යම් ආකාරයක් වේනම්, එම ආකාරයයි. එය එම අවිජ්ජාදිය සංඛාරාදිය බවට පත්වීමෙහිලා

a. සං. නි., දුක්ඛවග්ග
b. සං. නි., ගහපතිවග්ග
c. සං. නි., බුද්ධවග්ග

හේතුවේ. එය එම සංඛාරවිකාර විෂයයෙහි පටිච්ච සමුප්පාද සඞ්ඛ්‍යාව වෙති''යි හඟිත් නම්, ඔවුන්ගේ එම හැඟීමද යුතු නොවේ. කවර හෙයින්ද? අවිජ්ජා ආදිය 'හේතු' යයි කියන ලද හෙයිනි. භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි, ''තස්මාතිහ ආනන්ද එසොව හෙතු, එතං නිදානං, එස සමුදයො, එස පච්චයො ජරාමරණස්ස යදිදං ජාති-පෙ- සංඛාරානං යදිදං අවිජ්ජා''[a] යනුවෙන් මෙසේ අවිජ්ජාදිය 'හේතු' යයි කියන ලද මුත් එම අවිජ්ජාදිය පිළිබඳ විකාරයක් නොකියන ලදි. එහෙයින් 'පටිච්ච සමුප්පාද' යනුවෙන් ප්‍රත්‍යය (හේතු) වන ධර්මයන් දතයුතුයයි යමක් කියන ලදුයේද එය මැනවින් (නිවැරදිව) කියන ලදැ'යි දතයුතුය.

මෙහි 'පටිච්චසමුප්පාද' යන ශබ්දච්ඡායාව ගැනීමෙන් එයින් පැවසෙනුයේ උත්පාදයමය''යි යන හැඟීමක් වෙතොත් 'පටිච්චසමුප්පාද' යන මේ පදයෙහි පහත දැක්වෙන අර්ථය ගෙන එම හැඟීම බැහැර කළ යුතුය. භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහිඃ-

ද්වෙධා තතො පවත්තෙ ධම්මසමූහෙ යතො ඉදං වචනං
තප්පච්චයො තතො'යං ඵලෝපචාරෙන ඉති වුත්තො

එහෙයින්, (හේතු-ඵල වශයෙන්) දෙපරිදිව පවත්නා ධර්මසමූහයෙහි, යම් හෙයකින් මේ (පටිච්ච සමුප්පාද යන) වචනය වේද, එහෙයින්, එය (ඵල ධර්මයන්ගේ) හේතුධර්මයයි; ඵලධර්මයන් පිළිබඳ උපචාරයෙන් (විශේෂය නොසලකා) මෙසේ කියන ලද්දේය.

ප්‍රත්‍යය වශයෙන් පවත්නා යම් මේ ධර්ම සමූහයක් වේද, එම ධර්ම සමූහයෙහි 'පටිච්ච සමුප්පාද' යන මේ වචනය පිළිබඳව දෙපරිද්දෙකින් (අර්ථය) කැමැති වෙති. එම ධර්ම සමූහය වනාහි 'පටිච්චසමුප්පාද' වශයෙන් (ප්‍රකෘති-පුරුෂාදී වශයෙන් නොව) වටහාගනු ලබනුයේම හිත සුව පිණිස පවත්නේය. එහෙයින් 'පණ්ඩිතයන් මෙය අවබෝධ කරගැනීමට සුදුසු වෙති'යි යන අරුතින් 'පටිච්ච' නම් වේ. උපදිනුයේද 'එක්ව, මැනවින් උපදියි, වෙන් වෙන්ව හෝ හේතු රහිතව හෝ නො-උපදියි', එහෙයින් 'සමුප්පාද' නම් වේ. මෙසේ පටිච්චවූයේද එම සමුප්පාද වූයේදැ'යි පටිච්චසමුප්පාද නම් වේ.

තවද, එක්ව උපදිති'යි සමුප්පාද නමි. ප්‍රත්‍යයසාමග්‍රියට පැමිණීමෙන් (හේතුව හා සමග එක්වීමෙන්)ද, හේතුන් පිළිබඳව නිරපේක්ෂ නොවීමෙන්දැ'යි යන මේ දෙ-අරුතින්ද පටිච්චසමුප්පාද නම් වේ. එහිද 'මේ හේතු සමූහය ප්‍රත්‍යය වෙති'යි ප්‍රත්‍යය වශයෙන් ගැනීමෙන් මෙයද ඵලව්‍යවහාරයෙන් 'පටිච්චසමුප්පාද'යයි කියනලදැ'යි දතයුතුය. යම්සේ ලෝකයෙහි සෙමට හේතු වන සකුරුද (අභේදෝපචාරයෙන්) අවිශේෂයෙන් 'සෙම' යනුවෙන්ම වහරනු ලැබේද; තවද ශාසනය සැපතට

a. දී. නි., මහානිදාන සුත්ත

හේතුවන බුදුවරයන්ගේ ඉපදීම (බුද්ධශාසනය බුද්ධ යනුවෙන්ම අභේදෝපචාරයෙන්) ගෙන 'සුඛො බුද්ධානං උප්පාදො'යි කියනු ලැබේද, එසේය.

නොහොත්:-

පටිමුඛමිතො'තිවුත්තො හෙතුසමූහො අයං පටිච්චොති
සහිතො උප්පාදෙති ච ඉති වුත්තො සො සමුප්පාදො

මේ හේතු සමූහය (සභාග ඵල ධර්මයන්ගේ) ප්‍රතිමුඛයට (නොපැනෙන බවට) ගියහ'යි (ඉත= ඉ+ත) 'පටිච්ච'යයි කියනු ලදි; සභාග ඵල ධර්මයන් (සහිත=සහ+ඉත) උපදවති'යි 'සමුප්පාද'යයිද කියන ලදි.

සංස්කාරයන්ගේ පහළ වීමට අවිද්‍යාදීවූ එක් එක් ශීර්ෂ වශයෙන් දක්වන ලද යම් මේ හේතු සමූහයක් ඇත්ද, එය පොදු වූ ඵලයන් නිෂ්පාදනය කෙරෙති'යි යන අරුතින්ද, විකල (අඩු) නොවෙති'යි යන අරුතින්ද, සමග උපදනා (චෛතසික ආදී) අංගයන් එකිනෙක හා සමග ප්‍රතිමුඛයට (නොපැනෙන බවට) යෙති'යි යන අරුතින්ද ගෙන 'පටිච්ච'යයි කියනු ලැබේ. ඒ මේ හේතු සමූහය ඔවුනොවුන් නොහැර පවත්නා ස්වභාව ඇති ඵලධර්මයන්ම උපදවති'යි 'සමුප්පාද'යයි කියනු ලැබේ. ඒ මේ හේතු සමූහය ඔවුනොවුන් නොහැර පවත්නා ස්වභාව ඇති ඵලධර්මයන්ම උපදවති'යි 'සමුප්පාද'යයි කියනු ලැබේ. මෙසේද පටිච්ච වූයේද එම සමුප්පාද වූයේදැයි 'පටිච්චසමුප්පාද' නම් වේ.

තවද නයකි:-

පච්චයතා අඤ්ඤමඤ්ඤං පටිච්ච යස්මා සමං සහච ධම්මෙ
අයමුප්පාදෙති තතොපි එවමිධ භාසිතා මුනිනා

යම් හෙයකින් මේ අවිද්‍යාදී වූ ප්‍රත්‍යයසමූහය ඔවුනොවුන් නිසා, ඔවුනොවුන් හා සමග සම ක්‍රියාකාරිත්වයෙන් ඵලධර්මයන් උපදවාද, එහෙයින් මුනීන්ද්‍රයන් වහන්සේ විසින් මෙසේ මෙය (පටිච්ච සමුප්පාදයයි) කියන ලද්දේය.

අවිද්‍යා ආදී ශීර්ෂ වශයෙන් දක්වන ලද ප්‍රත්‍යයන් අතුරෙන් යම් ප්‍රත්‍යය ධර්ම කෙනෙක් තුමූ යම් සංස්කාර ආදී ඵල ධර්මයක් උපදවත්ද, ඔහු තුමූ ඔවුනොවුන් කෙරෙහි නිරපේක්‍ෂව, ඔවුනොවුන් විකලබවක් (අඩුවක්) ඇති විට ඉපැදවීමට නොසමත් වෙති; එහෙයින් ඔවුනොවුන් පිළිබඳ අපේක්‍ෂා සහිතව, පෙර-පසු නොව, ඔවුනොවුන් හා සමග, වෙන් වෙන් වශයෙන් නොව මේ ප්‍රත්‍යය සමූහය ඵල ධර්මයන් උපදවති'යි අර්ථානුසාර ව්‍යාවහාරයෙහි කුශල වූ මුනීන්ද්‍රයන් වහන්සේ විසින් මෙහිලා මෙසේ කියන ලදුයේ 'පටිච්චසමුප්පාද' යනුවෙන්ම කියන ලද්දේය යන අර්ථයි. මෙසේ කියමින්ම උන්වහන්සේ විසින්:-

පුරිමෙන සස්සතාදීනමභාවො පච්ඡිමෙන ච පදෙන,
උච්ඡෙදාදි විඝාතො ද්වයෙන පරිදීපිතො ඤායො

('පටිච්ච' යන) පෙර පදයෙන් ශාස්වතාදී දෘෂ්ටීන්ගේ අභාවයද, ('සමුප්පාද' යන) පසු පදයෙන් උච්ඡේද ආදී දෘෂ්ටීන්ගේ විඝාතයදැ (නැසීමද)යි යන මේ අන්තද්වයයෙන් දක්වන ලද න්‍යායය ('පටිච්චසමුප්පාද' නමැ'යි දන්නා ලද්දෝයි.

'පුරිමෙන' යනු, ප්‍රත්‍යයන් හා සමග පවත්නා බව හඟවන 'පටිච්ච' යන පදයෙන්, පවත්නා ධර්මයන්ගේ ප්‍රත්‍යය සාමග්‍රිය ඇති කල්හි එයට අයත් පැවතුම් ඇති හෙයින්, ශාස්වත හේතු, විෂම හේතු, වසවත්ති වාද ආදී ප්‍රභේද ඇති ශාස්වතවාදයන්ගේ අභාවය දක්වන ලද්දේය. අහේතුවාද ආදී වශයෙන් පවත්නා ශාස්වතාදී වාදයනට ප්‍රත්‍යය සාමග්‍රියෙන් කවර ප්‍රයෝජනයෙක්ද?

'පච්ඡිමෙන' යනු, ඵලධර්මයන්ගේ හටගැනීම දක්වන 'සමුප්පාද' යන පදයෙන්, ප්‍රත්‍යය සාමග්‍රිය ඇතිවිට ඵලධර්මයන්ගේ උපත සිදුවන හෙයින් උච්ඡේද. නාස්තික, අකිරිය ආදී වාදයන්ගේ අභාවය දක්වන ලද්දේ වේ. පළමු පළමු හේතු වශයෙන් නැවත නැවතත් ඵලධර්මයන් උපදනා කල උච්ඡේදයක් කොයින්ද? නාස්තික හෝ අකිරිය හෝ වාදයෝ කොයින්ද?.

'ද්වයෙන' යනු, 'පටිච්චසමුප්පාද' යන සම්පූර්ණ පදයෙනි. ඒ ඒ ධර්මයන්ගේ ප්‍රත්‍යය සාමග්‍රිය (හේතුන් සමග පවත්නා බව) නිසා පිළිවෙළ නොසිඳී ඒ ඒ ධර්මයන්ගේ සම්භවය සිදුවන හෙයින්, මෙසේ (ශාස්වත හෝ උච්ඡේද හෝ නොවන) මධ්‍යම ප්‍රතිපදාව වේ. "හේ කරයි, තෙමේම (පල) විඳියි; එකෙක් කරයි. අනෙකෙක් විඳියි" යනුවෙන් පළට (ශාස්වත-උච්ඡේද) වාදයන්ගේ ප්‍රහාණය වේ; ජනපද (සාමාන්‍ය) ව්‍යවහාරය පරමාර්ථ වශයෙන් නොගැනීමද, හුදෙක් සම්මුති නාම වශයෙන් ගැනීමෙන් අනතිධාවනයද සිදුවේ. මේ ආකාරයෙන් මේ පටිච්ච සමුප්පාද න්‍යායය දක්වන ලද්දේ වේ. මේ වනාහි 'පටිච්ච සමුප්පාද' යන වචනමාත්‍රයෙහි අර්ථය වේ.

පටිච්චසමුප්පාදය දේශනා කරන භාග්‍යවතුන් වහන්සේ විසින් "අවිජ්ජාපච්චයා සඞ්ඛාරා" ආදි නයින් පෙළ පිහිටුවන ලද්දේ වේ; එම පෙළෙහි අර්ථසංවර්ණනාය කරන්නහු විසින් විභජ්ජවාදී මණ්ඩලයට (සම්ප්‍රදායයට) බැස, පූර්වාචාර්යයන් නො-අබිබවා, ස්ව-සමය නො-ඉක්මවා, පරවාදයන් වැළඳ නොගෙන. සූත්‍රධර්මය පිළිකෙව් නොකොට, විනයට අනුකූලව, සතර මහාපදේසයන් සලකා බලමින්, ධර්මය විවරණය කෙරෙමින්, අර්ථය සංග්‍රහ කෙරෙමින්, එම අර්ථය සමාලෝචනය කෙරෙමින්, අන් අයුරින්ද පැහැදිලි කරමින්, අර්ථ-සංවර්ණය කළයුතු

වේද, පටිච්චසමුප්පාදය පිළිබඳ ඒ ආකාරවූ අර්ථ කථනයක් කිරීම ස්වභාව වශයෙන්ම දුෂ්කර වන්නේය.

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

සච්චං සත්තො පටිසන්ධි පච්චයාකාරමෙවච
දුද්දසා චතුරො ධම්මා දෙසෙතුඤ්ච සුදුක්කරා'ති

චතුඃසත්‍යය, සත්වයාය, ප්‍රතිසන්ධිය, 'ප්‍රත්‍යයාකාරය යන මේ ධර්ම සතර දැකීම දුෂ්කර වේ. දෙසුමද අතිදුෂ්කර වේ.

එහෙයින් ආගම (පර්යාප්ති) අධිගම (ප්‍රතිවේධ) ලාභීන් හැර සෙස්සනට පටිච්ච සමුප්පාදය පිළිබඳ අර්ථසංවර්ණනය සුකර නොවේ. මේ බව මැනවින් සලකා බලා:-

වත්තුකාමො අහං අජ්ජ පච්චයාකාර වණ්ණනං
පතිට්ඨං නාධි ගච්ඡාමි අජ්ඣොගාළ්හොව සාගරං
සාසනං පනිදං නානා දේසනානය මණ්ඩිතං
පුබ්බාචරියමග්ගොච අබ්බොච්ඡින්නො පවත්තති
යස්මා තස්මා තදුභයං සන්නිස්සායත්ථවණ්ණනං
ආරභිස්සාමි එතස්ස තං සුණාථ සමාහිතා'ති.

ප්‍රත්‍යයන් පිළිබඳ ආකාරය කියනු කැමැතිවූ මම අද මහා සාගරයට බට තැනැත්තකු සෙයින් පිහිටක් නොලබමි.

(එතෙකුදු වූවත්) මේ ශාසනය වනාහි අනේකාකාර දේශනා ක්‍රමයෙන් විසිතුරු වේ; පූර්වාචාර්ය සම්ප්‍රදායයද නොසිඳී පවත්නේ වේ.

එසේ හෙයින් (දේශනා නය, ආචාර්ය සම්ප්‍රදාය යන) මේ දෙක ඇසුරු කරමින් මේ අර්ථ සංවර්ණනය අරඹමි; එය සාවධානව ශ්‍රවණය කරවු.

කියන ලදමැයි පූර්වාචාර්යයන් විසින්:-

යො කොචිමං අට්ඨිකත්වා සුණෙය්‍ය ලභෙථ පුබ්බාපරියං විසේසා
ලද්ධාන පුබ්බාපරියං විසේසං අදස්සනං මච්චුරාජස්ස ගච්ඡති

යම් කිසිවෙක් වනාහි ආදර සහිතව මේ පටිච්ච සමුප්පාද ධර්මය අසන්නේද, හේ තෙමේ පෙර-පසු දෙතන්හිම විශිෂ්ටත්වයට පත් වන්නේය; දෙතන්හිම විශිෂ්ටත්වයට පත්ව මාරයාගේ දර්ශන පථයෙන් ඔබ්බට යන්නේය.

'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' ආදියෙහි වනාහි මුල පටන්ම:

දෙසනා භෙදතො අත්ථලක්ඛණෙකවිධාදිතො
අඞ්ගානඤ්ච වවත්ථානා විඤ්ඤාතබ්බො විනිච්ඡයො

දේශනා නය භේද වශයෙන්ද. අර්ථවශයෙන්ද, ලක්ෂණ වශයෙන්ද, 'ඒකවිධාදී වශයෙන්ද, අංග නිර්වචන වශයෙන්ද මෙහි විනිශ්චය දතයුතුය.

එහි, 'දේසනා භේදතො'යනු, වැල් කපන පුරුෂයන් සිවු දෙනකුගේ වැල් රැස් කරන ආකාරය සෙයින් භාග්‍යවතුන් වහන්සේගේ පටිච්චසමුප්පාද දේශනාවද සිවු ආකාර වේ: එනම්, මුල හෝ මැද පටන් අග දක්වාද? අග හෝ මැද පටන් මුල දක්වාදැ'යි යනුවෙනි.

යම් සේ වනාහි වැල් කපන පුරුෂයන් සිවු දෙනාගෙන් එක් පුරුෂයෙක් වැලෙක මුල පළමු කොට දකියිද, හේ තෙමේ එය මුලින් කපා සියල්ල ඇද ගෙන කර්මාන්තයෙහි යොදයිද, එපරිද්දෙන්ම භාග්‍යවතුන්වහන්සේ, ''මහණෙනි. අවිද්‍යාහේතුවෙන් සංස්කාරයෝ හටගනිති -පෙ- ඉපැදීම හේතුකොට ජරා-මරණාදිය සිදුවේ[a] යනුවෙන් මුල සිට අග දක්වා පටිච්චසමුප්පාදය දේශනා කරති.

යම්සේ වනාහි ඔවුන් සිවු දෙනාගෙන් තවත් පුරුෂයෙක් වැලෙහි මැද පමණක් පළමුව දකීද, හේතෙමේ එය මැදින් කපා ඉහළ කොටස පමණක් ඇදගෙන කර්මාන්තයෙහි යොදයිද, එසේම භාග්‍යවතුන් වහන්සේද, ''එම වේදනාව ආස්වාදය කරන, එය පසසන, එහි ඇලී ගැලී සිටින ඕහට නන්දි තෘෂ්ණාව උපදියි. වේදනාවන් කෙරෙහි යම් නන්දි තෘෂ්ණාවක් වේද. එය උපාදානයයි ඕහට එම උපාදානය හේතු කොට භවයද, භවය හේතු කොට ජාතිය (ඉපැදීම)ද සිදුවේ''[b] යනුවෙන් මැද පටන් අග දක්වා පටිච්චසමුප්පාදය දේශනා කරති.

යම්සේ ඔවුනතුරෙන් තවත් පුරුෂයෙක් වැලෙහි අග පළමුව දකීද, හේ තෙමේ එය අගින් සිඳ අග සිට මුල දක්වා ඇදගෙන කර්මාන්තයෙහි යොදයි, එසේම භාග්‍යවතුන් වහන්සේද ''ජාතිය හේතුකොට ජරා-මරණයන් වෙති'යි මෙය මෙසේ කියනලදී, මහණෙනි, ජාතිය හේතුකොට ජරාමරණයෝ වෙත්ද? නොවෙත්ද? ඔබට මෙය කෙසේ වැටහේද?'' ''ස්වාමීනි, ජාතිය හේතුකොට ජරාමරණයෝ වෙති, අපට මෙය මෙසේ වැටහෙයි, ස්වාමීනි, ජාතිය හේතුකොට ජරාමරණයෝ වෙති,' භවය හේතු කොට -පෙ- අවිද්‍යාව හේතුකොට සංස්කාරයන් වෙති'යි මෙය මෙසේ කියන ලදි. 'මහණෙනි, අවිද්‍යාව හේතු කොට සංස්කාරයෝ වෙත්ද? නොවෙත්ද? ඔබට මෙය කෙසේ වැටහේද?' 'ස්වාමීනි, අවිද්‍යාව හේතුකොට සංස්කාරයෝ වෙති. මෙය අපට මෙසේ වැටහෙයි. අවිද්‍යාව හේතුකොට සංස්කාරයෝ වෙති''[c]යි යනුවෙන් අග පටන් මුල දක්වාද පටිච්චසමුප්පාදය දේශනා කරති.

---

a. ම. නි., මහාතණ්හා සඞ්ඛය සුත්ත
b. සං. නි., ආහාරවග්ග
c. සං. නි., ආහාරවග්ග

යම්සේ වනාහි පුරුෂයන් සිවු දෙනාගෙන් එක් පුරුෂයෙක් පළමුකොට වැලෙහි මැද පමණක් දකීද, හේ තෙමේ වැලෙහි මැදින් සිඳ පහළට යමින් මුල දක්වා ගෙන කර්මාන්තයෙහි යොදයි. මෙසේ භාග්‍යවතුන් වහන්සේද, "මහණෙනි, මේ සිවු ආහාරයෝ කුමක් නිදාන කොට ඇත්තාහුද? කුමක් ප්‍රභව කොට ඇත්තාහුද? මේ සිවු ආහාරයෝ තෘෂ්ණාව නිදාන කොට ඇත්තාහුය. තෘෂ්ණාව හේතුකොට ඇත්තාහුය. තෘෂ්ණාව ජාතිකොට ඇත්තාහුය. තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තාහුය. තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත්තාහුද? -පෙ- වේදනාව-පෙ- ස්පර්ශය -පෙ- ෂඩායතනය-පෙ- නාමරූපය-පෙ- විඤ්ඤාණය, -පෙ- සංස්කාර කුමක් නිදාන කොට ඇත්තාහුද? -පෙ- කුමක් නිදාන කොට ඇත්තාහුද? -පෙ- අවිද්‍යාව නිදාන කොට ඇත්තාහුය -පෙ- අවිද්‍යාව ප්‍රභව කොට ඇත්තාහුය"[a] යි මැද පටන් මුල දක්වා පටිච්චසමුප්පාදය දේශනා කරති.

කවර හෙයින් මෙසේ දේශනා කෙරෙත්ද යත්, පටිච්චසමුප්පාදය සර්වතෝභද්‍ර (සැම අතින් යහපත්) වන හෙයින් හා තමන් වහන්සේද (එවන් අසිරිමත්) දේශනා විලාශයන් ලබා සිටි හෙයිනි. පටිච්චසමුප්පාදය සර්වතෝභද්‍ර වූයේම ඒ ඒ දේශනා ක්‍රමයන්ගෙන් න්‍යාය ප්‍රතිවේධය පිණිස පවත්නේ වේ. භාග්‍යවතුන් වහන්සේද සතර ආකාර විශාරද බවින් හා සතර ආකාර පටිසම්භිදා ඥාණයෙන් යුක්තවූ හෙයින්ද, සිවු ආකාරයෙකින් ගැඹුරු බවටපත්වූ හෙයින්ද (අපූර්ව) දේශනා විලාශයක් ලබා සිටි සේක. එහෙයින් උන්වහන්සේ නානා ක්‍රමයෙන් ධර්මය දේශනා කරන සේක.

විශේෂයෙන් මේ පටිච්චසමුප්පාදය පිළිබඳව ආදියෙහි පටන්වූ යම් අනුලෝම දේශනා ක්‍රමයක් වේද, එය (සංස්කාර ආදීන්ගේ) පැවැත්මට හේතුවූ (අවිද්‍යාදිය) වටහා ගත නොහැකිව මුළා බවට පත් වෙන්නේය. ජනයන් දැක ඒ ඒ ඵලයට හේතුවූ කරුණු මගින්ම පැවැත්ම සිදුවන බව දක්වනු පිණිසද, උත්පත්ති ක්‍රමය දකුවනු පිණිසද පවත්වන ලදයි දතයුතුය. අවසානයෙහි පටන් යම් ප්‍රතිලෝම දේශනාවක් වේද, එය "මේ ලෝකසත්‍වයා ඒකාන්තයෙන් දුකට පත්ව උපදනේද, දිරාපත්වන්නේද, මැරෙන්නේද වේ" යන ආදී වශයෙන් දුකට පත් ලෝක සත්‍වයා අනුව බලමින් පූර්වභාග ප්‍රතිවේධක්‍රමයට අනුව ජරාමරණාදීවූ ඒ ඒ දුඃඛය පිළිබඳව තමන් වහන්සේ විසින් අවබෝධ කරගන්නා ලද හේතු දක්වනු පිණිස පවත්වනලදැ'යි දතයුතුය. මැද පටන් මුල දක්වා යම් දේශනා ක්‍රමයක් පවත්වන ලද්දේද, එය ආහාර-පිළිබඳ නිදාන පැනවීම් අනුසාරයෙන් අතීත අද්ධානය ඈර දක්වා නැවත අතීත අද්ධානයෙහි පටන් හේතුඵල පරම්පරාව දක්වනු පිණිසද, යම් දේශනා ක්‍රමයක් මැද පටන් අග දක්වා පවත්වන ලද්දේද, එය වර්තමාන අද්ධානයෙහි අනාගත

අද්ධානයට හේතු හටගැනීමෙහි පටන් අනාගත අද්ධානය ඇර දක්වනු පිණිසද පවත්වන ලදැ'යි දතයුතුය.

ඒ (සිවු ආකාර) දේශනාක්‍රමයන් අතුරෙන් යම් අනුලෝම දේශනාක්‍රමයක් පැවැත්මේ හේතුන් පිළිබඳව මුළාවූ වෛනෙයජනයාට ඒ ඒ ඵලයට අයත් හේතුන්ගෙන් පැවැත්ම සිදුවන ආකාරයද, උපත සිදුවන ආකාරයද දක්වනු පිණිස ආදියෙහි පටන් කියන ලද්දේද, එය මෙහි (විශුද්ධිමාර්ගයෙහි) යොදා ගන්නා ලදැ'යි දතයුතුය.

කවර හෙයකින් මෙහි අවිද්‍යාව පළමු කොට කියන ලද්දේද? කිම, ප්‍රකෘති (සාංඛ්‍ය) වාදීන්ගේ ප්‍රකෘති පදාර්ථය මෙන් අවිද්‍යාවද ලෝකය පිළිබඳ අකාරණ වූ (හේතුවක් නැති) මූලකාරණය (මුල්හේතුව)ද? අවිද්‍යාව 'අකාරණ' නොවේ; ආශ්‍රවයන් හටගැනීමෙන් අවිද්‍යාව හටගනිති'යි අවිද්‍යාවට හේතුව කියන ලදි. එහෙත් එය මූලකාරණය වශයෙන් ගතහැකි පර්යායක්‍රමයක්ද ඇත. ඒ කවරේද? (සංසාර) වෘත්ත කථාවට ශීර්ෂ වශයෙන් ගෙන ඇති බවයි. භාග්‍යවතුන් වහන්සේ වනාහි වෘත්ත කථාව කියන විට කරුණු දෙකක් ශීර්ෂ කොට ගනිති. අවිද්‍යාව ශීර්ෂ කොට, ''මහණෙනි, 'මෙතැනින් පෙර අවිද්‍යාව නොතිබිණි, මෙතැනින් පසු එය ඇති වීය''යි මෙසේ අවිද්‍යාවෙහි පූර්ව කෙළවරක් නොපැනෙයි, මහණෙනි, මෙය මෙසේ කියනු ලැබේ. එතෙකුදු වුවත්, අවිද්‍යාව ඉදප්පච්චය (මෙයට හේතුව මෙයයි යනුවෙන් ගතහැකි) වන බව ප්‍රකටව පැනේ'' යනුවෙන් මෙසේ කියන සේක; භවතණ්හාව හෝ ශීර්ෂකොට, ''මහණෙනි, මෙතැනින් පෙර භවතෘෂ්ණාව නොතිබිණ, මෙතනින් පසු භවතෘෂ්ණාව ඇතිවිය'යි භවතෘෂ්ණාවේ පූර්ව කෙළවරක් නොපැනේයයි මෙසේ කියනුලැබේ; එතෙකුදුවුවත්, භවතෘෂ්ණාව ඉදප්පච්චය වන බව ප්‍රකටව පැනේ'' යනුවෙන් මෙසේ දේශනා කරති.

කවර හෙයින් භාග්‍යවතුන් වහන්සේ සංසාර වෘත්තය කියන විට මේ කරුණු දෙක ශීර්ෂ කොට කියත්ද? සුගතිගාමීවූ හෝ දුර්ගතිගාමී වූ හෝ කර්මයට විශේෂයෙන් හේතුවන හෙයිනි.

දුර්ගතිකාමී කර්මයට විශේෂයෙන් හේතු වනුයේ අවිද්‍යාවයි. කවර හෙයින්ද? අවිද්‍යාවෙන් මඩනාලද පෘථග්ජන තෙමේ, යම් සේ ඝාතනයට නියමිත ගව දෙනෙක් (ඝාතනය කරනුලබන) ගින්නෙන් තැවීම්, මුගුරෙන් තැළීම් ආදී පීඩාවෙන් මඩනා ලදුව, එම පීඩාවෙන් ආතුර බවට පත්වීමෙන්, තමාට සැනසීමක් නැති, අනර්ථයක්ම ගෙන දෙන උණු දිය පවා පානය කරන්නීද, එසේම, කෙලෙස් ගින්නෙන් තවනා ලදුව තමාට ආස්වාදයක් නොලැබෙන අනර්ථයක්ම ගෙනදෙන ප්‍රාණඝාතාදී අනේකප්‍රකාර වූ දුගතිගාමී කර්මයන් අරඹන්නේය.

සුගතිගාමී කර්මයනට විශේෂයෙන් හේතු වනුයේ භවතෘෂ්ණාවයි. කවර හෙයින්ද? භවතෘෂ්ණාවෙන් මඩනා ලද පෘථග්ජන තෙමේ යම් සේ *උක්තප්‍රකාර ඇති ගව දෙනක විසින් තමාගේ සිහිල් දියට ඇති ආශාව සංසිඳුවන, පීඩාවන්ද දුරලන සිහිල් දිය පානය කිරීම වේද, එසේම ක්ලේශ සන්තාපයන් දුරුවීමෙන් සැනසීම ගෙන දෙන, සුගතියට පැමිණවීමෙන් තමාගේ දුගති දුක් පීඩා දුරලන ප්‍රාණඝාතයෙන් වෙන්වීම් ආදී අනේකප්‍රකාර වූ සුගතිගාමී කර්මයන් අරඹන්නේය. භාග්‍යවතුන් වහන්සේ (සංසාර) වෘත්ත කථාවට ශීර්ෂ වූ මේ ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් මුල් කොට ගෙන කිසි තැනෙක්හි දේශනා කරන සේක; ඒ මෙසේයි:- ''මහණෙනි, මෙසේ අවිද්‍යාව හේතුකොට සංස්කාරයෝ වෙති; සංස්කාරයන් හේතුකොට විඤ්ඤාණය වේ[a] යන ආදියයි. එසේම ''මහණෙනි, උපාදානයට අරමුණු විය හැකි ධර්මයන් විෂයෙහි ආස්වාදයට අනුව බලමින් වාසය කරන්නාහට තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාව හේතුකොට උපාදාන වැඩේ''[b] යන ආදියයි. කිසි තැනෙක්හි මේ ශීර්ෂ දෙකම මුල්කොට ගෙන දේශනා කරන සේක; ඒ මෙසේයි:- ''මහණෙනි, අවිද්‍යාවෙන් වැසීගිය, එසේම තෘෂ්ණාවෙන් යුක්ත බාලයාහට මෙසේ මේ කය හටගැනණි. මෙසේ මේ කයද බාහිර වූ නාම-රූප දෙකද උපදියි. (කයද නාමරූපද යන) දෙක ඇසුරුකොට ස්පර්ශයද ෂඩායතනයෝද උපදිති. මේ ධර්මයන් විසින් ස්පර්ශ කරන ලද බාලයා සැප-දුක් විඳියි'' යන මෙය අවිද්‍යාවශයෙන් එක් ධර්මයක් මුල්කොටගෙන කරනලද දේශනායයි දතයුතුය. මෙසේ මෙහි පළමු කොට දේශනාභේද වශයෙන් විනිශ්චයය දතයුතුය.

'අත්ථතො' යනු, 'අවිජ්ජා' ආදීවූ පදවල අර්ථයයි; ඒ මෙසේයි: 'පිරියයුතු නොවේ' යන අරුතින් කායදුශ්චරිත ආදිය 'අවින්දිය' නම් වේ, 'නොලද යුතුය' යන අර්ථයි. එම අවින්දියය විඳිති'යි 'අවිජ්ජා' නම්, එයට විපරීත වන හෙයින් කායසුචරිතාදිය 'වින්දිය' නම්වේ; එය වින්දියය නොවිඳිති'යි 'අවිජ්ජා' නම්වේ. ස්කන්ධයන්ගේ රාශ්‍යර්ථය, ආයතනයන්ගේ ආයතනාර්ථය, ධාතූන්ගේ ශූන්‍යතාර්ථය, ඉන්ද්‍රියයන්ගේ අධිපති අර්ථය, සත්‍යයන්ගේ තථ්‍යාර්ථය අවබෝධ කිරීම වලකති'යි 'අවිජ්ජා' නම්. දුඃඛ ආදීන්ගේ පීඩනාදී වශයෙන් කියනලද චතුර්විධ අර්ථය දැනගැනීම වලකති'යි ද 'අවිජ්ජා' නම්වේ. අන්තයක් නැති සංසාරයෙහි වූ සියලු යෝනි, ගති, භව, විඤ්ඤාණ, ස්ථිති සත්වාවාසයන්හි සත්වයන් දුවවති'යි 'අවිජ්ජා' නම්. පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූ ස්ත්‍රීභාව, පුරුෂභාව ආදියෙහි දුවති'යිද, (පරමාර්ථ වශයෙන්) විද්‍යමාන වූ ස්කන්ධාදීන් වෙත නොදුවති'යිද 'අවිජ්ජා' නම්වේ. තවද චක්ඛුවිඤ්ඤාණාදීන්ද, චක්ඛුප්පසාද

* උක්ත ප්‍රකාර ඇති ගව දෙනක විසින්

a. සං. නි. ආහාරවග්ග

b. සං. නි. දුක්ඛවග්ග

ආදී) වස්තූන් ද, (රූපාදී වූ) ආරම්මණයන්ද, පටිච්චසමුප්පාද හා පටිච්ච සමුප්පන්න ධර්මයන්ද වලහන හෙයින්ද 'අවිජ්ජා' නම්වේ.

යමක් හේතුකොට ඵලයක් වේද, එය 'පටිච්ච' වේ; 'පටිච්ච' යනු 'නොවෙන්ව', 'නොහැර' යන අර්ථයි. 'එති' (එයි) යනු 'උපදියි' යන අර්ථයි, 'එසේම පවතියි' යනුද අර්ථයි. තවද, උපකාර් වෙති'යි යන අර්ථයද, හේතු වෙති'යි යන අර්ථයද වේ. අවිජ්ජා වූයේද, එම පච්චය වූයේද, 'අවිජ්ජාපච්චය'යි, ඒ අවිජ්ජාපච්චයයෙනි. සඞ්ඛතය (සංස්කාරය) සකස් කෙරෙති'යි 'සඞ්ඛාර' නම් වේ; තවද, අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇති සඞ්ඛාරය, 'සඞ්ඛාර' ශබ්දයෙන් ආ සඞ්ඛාරයයි සඞ්ඛාරයෝ ද්විවිධ වෙති.

එහි, පුඤ්ඤාභිසංඛාරය, අපුඤ්ඤාභිසංඛාරය, අනෙඤ්ජාභි සංඛාරය යන තුනද, කායසංඛාරය, වචී සංඛාරය, චිත්ත සංඛාරය යන තුනදැ'යි යන මේ සය අවිද්‍යාව හේතු කොට ඇති වන සංඛාරයෝ වෙති. ඒ සියලු සංඛාරයෝ හුදෙක් ලෞකික වූ කුශල, අකුශල චේතනාවෝ වෙති. සඞ්ඛත සඞ්ඛාරය, අභිසඞ්ඛත සඞ්ඛාරය, අභිසඞ්ඛරණක සඞ්ඛාරය පයොගාභිසඞ්ඛාර යන මේ සතර 'සඞ්ඛාර'-ශබ්දය හා සමග ආ සඞ්ඛාරයෝය.

එහි, 'අනිච්චා වත සඞ්ඛාරා''[a] යන ආදී තන්හි කියන ලද සියලුම ප්‍රත්‍යය සහිත ධර්මයෝ 'සඞ්ඛත සඞ්ඛාර' නම් වෙති; කර්මයෙන් නිපන් ත්‍රෛභූමක වූ රූපාරූප ධර්මයෝ 'අභිසඞ්ඛත සඞ්ඛාරයහ'යි අටුවාහි කියනලදි. ඔහුද ''අනිච්චා වත සඞ්ඛාරා''[b] යන මෙහිම ඇතුළත් වෙති, ඔවුන් වෙන්කොට දැක්වෙන තැනක් දක්නට නොලැබේ. ත්‍රෛභූමක කුශල අකුශල චේතනාවෝ වනාහි 'අභිසඞ්ඛරණක සඞ්ඛාර' යයි කියනුලැබේ. එය, ''මහණෙනි, අවිද්‍යාවට පත් පුද්ගලයා පුණ්‍යවූ සඞ්ඛාරයන්ද රැස්කරයි.[c] යන ආදියෙහි ආ තැන් පැනේ. කායිකවූද, චෛතසිකවූද වීර්යය 'පයෝගාභිසඞ්ඛාර'යි කියනු ලැබේ; එය, ''කායප්‍රයෝග වේගයෙහි ගමන යම් තාක්වේද, ඒතාක් ගොස් අකෙහි සිටියාක් මෙන් නැවතිණි''.[d] ආදී තන්හි ආයේය.

'සඞ්ඛාර' යනු සඳහන් තැන් මෙපමණෙක් නොවේ. තවද තැන් ඇත; ''ඇවැත්නි, විශාඛයෙනි, සඤ්ඤා වේදයිත නිරෝධයට සමවදින භික්ෂුවගේ පළමුව වචීසංඛාරයද, ඉක්බිති කාය සංඛාරයද, ඉනිදු ඉක්බිති චිත්ත සංඛාරයද නිරුද්ධ වේ''[e] යන ආදී නයින් සංඛාරශබ්දයෙන් ආ

---

a. සං. නි. බ්‍රහ්මසංයුත්ත
b. එම
c. සං. නි. රුක්ඛවග්ග
d. අං. නි. රථකාරවග්ග

නොයෙක් සංඛාර විශේෂයෝ වෙති. එම සංඛාරයන් අතර සංඛත සංඛාරය තුළ සංග්‍රහ නොවන (ඇතුළත් නොවන) සංඛාරයෙක් නැත.

මින්මතු, 'සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං'' යන ආදි තන්හිද මෙතෙක් කියන ලද දෙය එලෙසින්ම දතයුතුය. නොකියනලද තන්හි වනාහිː- (අරමුණු) දැනගනිති'යි 'විඤ්ඤාණ' නම්, (අරමුණු වෙතට) නැමෙති'යි 'නාම' නම්. විනාශයට ගොදුරු වෙති'යි 'රූප' නම්. ආයයන් (හෙවත් ලැබෙන අරමුණු) රුචි කෙරෙති'යි 'තණ්හා' නම්. එල්බ ගනිති'යි 'උපාදාන' නම් වෙති', වවති'යි හෝ 'භව' නම්, ඉපදීම 'ජාති' නම්. දිරාපත්වීම 'ජරා' නම්. මැරෙති'යි 'මරණ' නම්. ශෝක කිරීම 'සෝක' නම්. වැලපීම 'පරිදේව' නම්. (ශරීරය) පෙළති'යි. ඉපැදීම්-පැවතීම් වශයෙන් දෙ-අයුරෙකින් කණිති'යි හෝ 'දුක්ඛ) නම්. දොම්නස් වීම 'දෝමනස්ස' නම්. දැඩි චිත්ත පීඩාව 'උපායාස' නම්.

'සම්භවන්ති' යනු, 'හටගනියි' යන අර්ථයි; 'සම්භවන්ති' යන පදය හුදෙක් 'සොක' යන ආදිය සමග පමණක් නොව, (ඉහතකී සඞ්ඛාරාදී) සියලු පද හා සමග යෙදීම කළයුතුය, නො-එසේ නම් ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා''යි කී කල්හි, කුමක් කෙරෙත්දැ'යි නොවැටහෙන්නේය. 'සම්භවන්ති' යනු සමග යෙදූවිට, 'අවිජ්ජා' වූයේද එම 'පච්චය' වූයේද, 'අවිජ්ජා පච්චය'යි සිද්ධවේ. 'එම අවිද්‍යාව හේතුකොට සංස්කාරයෝ හටගනිති'' යනුවෙන් ප්‍රත්‍යයන් හා ප්‍රත්‍යය-සමුත්පන්න ධර්මයන්ගේ ව්‍යවස්ථානය (සම්මුතිය) කරන ලද්දේවේ. සියලු තන්හි මෙම නයයි.

'එවං' යනු, දක්වන ලද ක්‍රමය ගැන යලි සඳහන් කිරීමයි; එයින් අවිද්‍යාදිය හේතුකොටම විනා ඊශ්වර නිර්මාණාදී නයින් එසේ නොවන බව (අවධාරණයෙන්) දක්වයි. 'එතස්ස' යනු, ඉහත කී යන අර්ථයි, 'කෙවලස්ස' යනු, අසම්මිශ්‍ර (නිරවුල්)වූ හෝ සියලු යන අර්ථයි. 'දුක්ඛක්ඛන්ධස්ස' යනු, දුක් සමූහයෙහියි යන අර්ථයි. සත්වයාගේ (හටගැනීම) නොවේ. සුඛ (සැපත) සුභ (යහපත) ආදියෙහි (හටගැනීම)ද නොවේ. 'සමුදයො' යනු, ඉපැදීමයි. 'හොති' යනු වෙයි. හටගනියි යන අර්ථයි. මෙහි අර්ථ වශයෙන් විනිශ්චයය මෙනයින් දතයුතුය.

'ලක්ඛණාදිතො' යනු, අවිද්‍යාදීන් පිළිබඳ ලක්ෂණාදී වශයෙනි; ඒ මෙසේ යිː- අවිද්‍යාව නොදැනීම ලක්ෂණ කොට ඇත්තේය. මුළා බවට පත් කිරීම කෘත්‍යය කොට ඇත්තේය. වැලහීම වැටහීම් ආකාර කොට ඇත්තේය. ආශ්‍රවයන් පදනම් කොට ඇත්තේය. 'සංඛාරයෝ අභිසංඛරණය (සකස් කිරීම) ලක්ෂණ කොට ඇත්තේය. එක්රැස් කිරීම කෘත්‍යය කොට ඇත්තේය. චේතනාව වැටහීම් ආකාර කොට ඇත්තේය. අවිද්‍යාව පදනම් කොට ඇත්තේය. 'විඤ්ඤාණය' (අරමුණු) දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේය. (නාමරූපයනට) පළමුව පැමිණීම කෘත්‍යය කොට ඇත්තේය.

ප්‍රතිසන්ධිය වැටහීම් ආකාර කොට ඇත්තේය. සංඛාරයන් නැතහොත් වස්තු ආරම්මණයන් (වස්තූන් අරමුණු කොට ගැනීම) පදනම් කොට ඇත්තේය. 'නාමය' අරමුණු වෙතට නැඹුරු වීම ලක්‍ෂණ කොට ඇත්තේය. සිත හා සමග සම්ප්‍රයෝගය (එක්වීම) කෘත්‍යය කොට ඇත්තේය. වෙන් වෙන්ව නොපැවතීම වැටහීම් ආකාර කොට ඇත්තේය. විඤ්ඤාණය පදනම්කොට ඇත්තේය. 'රූපය' පීඩාවනට ලක්වීම ලක්‍ෂණ කොට ඇත්තේය. විසිරයාම කෘත්‍යය කොට ඇත්තේය. නොපැහැදිලි බව වැටහීම් ආකාර කොට ඇත්තේය. විඤ්ඤාණය පදනම් කොට ඇත්තේය. 'සළායතනය' පැතිරීම ලක්‍ෂණ කොට ඇත්තේය. දැකීම් ආදිය කෘත්‍යය කොට ඇත්තේය. වස්තු-ද්වාර භාවය (අරමුණුවලට දොරටුවීම) වැටහීම් ආකාර කොට ඇත්තේය. නාමරූප දෙක පදනම් කොට ඇත්තේය. 'ඵස්සය' ස්පර්ශවීම ලක්‍ෂණ කොට ඇත්තේය. අරමුණු හා සමග ගැටීම කෘත්‍යය කොට ඇත්තේය. (වස්තු, ආලම්බන, විඤ්ඤාණ යන තුන එක් කිරීම වැටහීම් ආකාර කොට ඇත්තේය. ෂඩායතනය පදනම් කොට ඇත්තේය. 'වේදනාව' අනුභවය ලක්‍ෂණ කොට ඇත්තේය. විෂය-රස-විඳීනය කෘත්‍යය කොට ඇත්තේය. සුඛ දුඃඛ යන දෙක වැටහීම් ආකාර කොට ඇත්තේය. ස්පර්ශය පදනම් කොට ඇත්තේය. 'තණ්හාව' (සසර දුකට) හේතු වීම ලක්‍ෂණ කොට ඇත්තේය. (අරමුණු කෙරෙහි) ඇලීම කෘත්‍යය කොට ඇත්තේය. තෘප්තියට පත් නොවීම වැටහීම් ආකාර කොට ඇත්තේය. වේදනාව පදනම් කොට ඇත්තේය. 'උපාදානය' දැඩිව ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය. නොහරනා බව කෘත්‍යය කොට ඇත්තේය. තෘෂ්ණා දෘඪත්වය (දැඩිතෘෂ්ණාව) හා මිථ්‍යාදෘෂ්ටිය වැටහීම් ආකාර කොට ඇත්තේය. තෘෂ්ණාව පදනම් කොට ඇත්තේය. 'භව'ය කර්ම හා කර්මඵල ලක්‍ෂණ කොට ඇත්තේය. හටගැනීම හා හට ගැන්වීම කෘත්‍යය කොට ඇත්තේය; කුශල, අකුශල, හා අව්‍යාකෘත කර්මයන් වැටහීම් ආකාර කොට ඇත්තේය. උපාදානය පදනම් කොට ඇත්තේය.

'ජාති' ආදිය පිළිබඳ ලක්‍ෂණාදිය (ඉහත) සච්ච නිද්දේසයෙහි කී නයින්ම දතයුතුය. මෙසේ මෙහි ලක්‍ෂණාදිය පිළිබඳ විනිශ්චයය දතයුතුය.

එකවිධාදිතො යන මෙහි 'අවිද්‍යාව' නොදැනීම, නොදැකීම. මුළා වීම ආදි වශයෙන් එක් වැදෑරුම් වේ. අප්‍රතිපත්ති, මිථ්‍යාප්‍රතිපත්ති වශයෙන් දෙවැදෑරුම් වේ. සසංඛාරික, අසංඛාරික වශයෙන්ද එසේය; ත්‍රිවිධ වේදනාවන් හා යෙදීමෙන් තෙවැදෑරුම් වේ. චතුඃ සත්‍යයන් අවබෝධ නොකිරීම් වශයෙන් සිවුවැදෑරුම් වේ. ගතිපංචකය මුවහ කිරීම් වශයෙන් පස්වැදෑරුම් වේ. ද්වාරාරම්මණ වශයෙන් සියලුම අරූපධර්මයන් විෂයයෙහි සවැදෑරුම් බව දතයුතුය.

'සංඛාරයෝ' සාසව ධර්ම විපාකධර්මයන් ස්වභාව කොට ඇති බව ආදි වශයෙන් එක් වැදෑරුම් වෙති. කුශල අකුශල වශයෙන්

දෙවැදෑරුම් වෙති. පරිත්ත-මහග්ගත යනුවෙන්ද, හීන-මධ්‍යම වශයෙන්ද, මිථ්‍යාභාව-සම්‍යග්භාව වශයෙන්ද, නියත-අනියත වශයෙන්ද, එසේම (දෙවැදෑරුම්) වෙති, පුඤ්ඤාභිසංඛාර ආදි වශයෙන් තෙවැදෑරුම් වෙති. චතුර්යෝනීන් ඇතුළත පවත්වන හෙයින් සිවු වැදෑරුම් වෙති. පංචගතියට පමුණුවන හෙයින් පස්වැදෑරුම් වෙති.

'විඤ්ඤාණය' ලෞකික විපාක ඇතිබව ආදි වශයෙන් එක් වැදෑරුම් වේ. සහේතුක-අහේතුක ආදී වශයෙන් දෙවැදෑරුම් වේ. භවත්‍රයයෙහි ඇතුළත් වන හෙයින්ද, වේදනාත්‍රයය හා සමග යෙදෙන හෙයින්ද, අහේතුක-ද්විහේතුක-ත්‍රිහේතුක වශයෙන්ද තෙවැදෑරුම් වේ. චතුර්යෝනි වශයෙන් හා පඤ්චගති වශයෙන් (පිළිවෙළින්) සිවු වැදෑරුම්ද, පස් වැදෑරුම්ද වේ.

'නාම-රූප දෙක' විඤ්ඤාණය නිශ්‍රය කොට පවත්නා හෙයින්ද, කර්මය ප්‍රත්‍යය කොට ඇති හෙයින්ද එක් වැදෑරුම් වේ.

අරමුණු සහිත බව හා අරමුණු රහිත බවයයි දෙවැදෑරුම් වේ. අතීත-ප්‍රත්‍යුත්පන්න-අනාගත වශයෙන් තෙවැදෑරුම් වේ. යෝනි වශයෙන් හා ගති වශයෙන් (පිළිවෙළින්) සිවුවැදෑරුම් හා පස් වැදෑරුම් වේ.

'සළායතනයෝ' (විඤ්ඤාණයද විඤ්ඤාණය හා සමග යෙදුණු ධර්මයන්ද) උපදින හා හමුවන ස්ථාන වශයෙන් එක් වැදෑරුම් වෙති. භූතයන් පිළිබඳ වූ පසාදය විඤ්ඤාණය ආදී වශයෙන් දෙවැදෑරුම් වෙති. සම්පත්ත (එක්ව බැඳුණු), ගෝචරය, අසම්පත්ත ගෝචරය උභය ගෝචරයයි තෙවැදෑරුම් වෙති. චතුර්යෝනියෙහි හා පංචගතියෙහි ඇතුළත් වන හෙයින් (පිළිවෙළින්) සිවුවැදෑරුම්ද පස්වැදෑරුම්ද වෙති.

මෙම නයින් ඵස්ස ආදිය පිළිබඳවද ඒකවිධාදී ස්වභාවය දතයුතුය.මේ ආකාරයෙන් මෙහි ඒකවිධාදි වශයෙන් විනිශ්චයය දතයුතුය.

අඞ්ගානඤ්ච වවත්ථානා යනු, මෙහි 'සෝක' ආදියද භවචක්‍රයෙහි නොසිඳී පැවැත්ම දක්වනු පිණිස කියනලදි, ජරා-මරණ දෙකින් මඩනා ලද අඥානයාහට ඒ ශෝකාදිය හටගනී, කියන ලදමැයි:- ''මහණෙනි, (ආගම ධර්මය) නොදත් පෘථග්ජන තෙමේ කායික වූ දුක් වේදනාවෙන් පහරන ලදුයේ සොවියි, පෙළෙයි. වැලපෙයි. උරෙහි අත් ගසමින් හඬයි, මුළාවට පත්වෙයි'' යනුවෙනි. ඒ ශෝකාදියෙහි පැවැත්ම යම් තාක් වේද, ඒතාක් අවිද්‍යාවද පවත්නේයයි ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා''යි අවිද්‍යාව හේතුකොට සංඛාරයන් වෙතැයි යන මේ සම්බන්ධයම වන භවචක්‍රය පවතී; එහෙයින් ඒ ශෝකාදිය ජරා මරණයන් තුළම ඇතුළත් කොට පටිච්ච සමුප්පාද අංගයන් දොළසක්ම වෙති'යි දතයුතුයි. මෙසේ මෙහි අංග ව්‍යවස්ථාන වශයෙන්ද විනිශ්චයය දතයුතුය.

මේ පළමු කොට දක්වන ලදුයේ මෙහි සංක්ෂේප කථායි; සවිස්තර කථා ක්‍රමය මෙසේයිඃ-

'අවිජ්ජා' යනු, සෞත්‍රාන්තික ක්‍රමයට අනුව දුක්ඛ ආදීවූ සිවු තන්හි නොදැනීම වේ. අභිධර්ම ක්‍රමයට අනුව පුබ්බන්ත ආදිය ගෙන අට තැනෙක්හි නොදැනීමයි කියනලද මැයිඃ- ''එහි අවිජ්ජා යනු කුමක්ද? දුඃඛ විෂයෙහි නොදැනීමයි. -පෙ- දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා විෂයයෙහි නොදැනීමයි. පුබ්බන්ත විෂයයෙහි නොදැනීමයි. අපරන්ත විෂයයෙහි නොදැනීමයි. පුබ්බන්ත-අපරන්ත යන දෙකෙහිම නොදැනීමයි. 'ඉදප්පච්චයතා'යයි කියනු ලබන පටිච්චසමුප්පාද හා පටිච්චසමුප්පන්න ධර්ම විෂයයෙහි නොදැනීමයි.[a]

එසේ වතුදු එහි (නිරෝධය, මාර්ගය යන) ලෝකෝත්තර සත්‍යද්වයය හැර, සෙසු තන්හි අරමුණු වශයෙන්ද අවිද්‍යාව උපදියි; එසේ පවත්නා කල්හිදු මෙහිදී (ආලම්බන ස්වභාවය) මුවහ කිරීම් වශයෙන්ම අවිද්‍යාව අභිප්‍රේත වේ. එසේ උපන් කල (අවිද්‍යාව) දුඃඛ සත්‍යය වසාගෙන සිටියි. දුඃඛයාගේ නියමිත කාර්යය හා එහි ස්වභාවය අවබෝධ කිරීමට ඉඩ නොදෙයි. එසේම සමුදයය, නිරෝධය, මාර්ගය යන සත්‍යයන්ද, 'පුබ්බන්ත'යයි කියනු ලබන අතීත ස්කන්ධපංචකයද, 'අපරන්ත'යයි කියනු ලබන අනාගත ස්කන්ධ පංචකයද, 'පුබ්බන්තාපරන්ත'යයි කියනු ලබන එකී දෙකමද 'ඉදප්පච්චයතා පටිච්චසමුප්පන්නධර්ම'යයි කියනු ලබන ඉද්දප්පච්චයතා හෙවත් පටිච්චසමුප්පාදයද, පටිච්චසමුප්පන්න ධර්මයන්ද වසාගෙන සිටියි. ''මේ අවිද්‍යාවය, මොහු සංස්කාරයෝය''යි මේ ආකාරයෙන් දුක පිළිබඳ යථාස්වභාව ලක්ෂණයන් අවබෝධ කිරීමට ඉඩ නොදෙයි; එහෙයින් ''දුක පිළිබඳ නොදැනීම -පෙ- පටිච්ච සමුප්පාදය, පටිච්ච සමුප්පන්න ධර්මයන් විෂයයෙහි නොදැනීම''යයි කියනුලැබේ.

'සංඛාරා' යනු, පුඤ්ඤාභිසඞ්ඛාරාදි තුනද, කායසංඛාරාදි තුනදැයි මෙසේ ඉහත සැකෙවින් සඳහන් කළ සයයි; මෙහි, විස්තර වශයෙන් කියතොත්, 'පුඤ්ඤාභිසංඛාර' යනු, දාන ශීලාදිවශයෙන් පැවැති කාමාවචර කුසල් සිත් අටද භාවනා වශයෙන් පැවති රූපාවචර කුසල් සිත් පසදැයි යන මේ සිත් තෙළෙසයි; 'අපුඤ්ඤාභිසංඛාර' යනු, 'පාණාතිපාත' ආදි වශයෙන් පැවැති අකුසල් සිත් දොළොසයි, 'අනෙඤ්ජාභිසංඛාර' යනු, භාවනා වශයෙන්ම පැවැති අරූපාවචර කුසල් සිත් සතර'යි, මෙසේ (පුඤ්ඤාභිසංඛාරා) ආදි තුන සිත් වශයෙන් එකුන්තිසක් වේ.

ඉතිරි සංඛාර තුන අතුරෙන්, කය පිළිබඳ චේතනා කායසංඛාරයි. වචනය පිළිබඳ චේතනා වචීසංඛාරයි. සිත පිළිබඳ සඤ්චේතනා චිත්ත

a. විභඞ්ගපාළි, බුද්දකවත්ථු විභඞ්ග

සංඛාරයි. මෙකී ත්‍රිකය කර්මය රැස් කරන අවස්ථාවෙහිදී පුඤ්ඤාභිසංඛාරාදියට ද්වාර වශයෙන් පවත්නා බව දක්වනු පිණිස කියන ලදි. කාය විඤ්ඤත්තිය උපදවා කායද්වාරයෙන් පවත්වන ලද කාමාවචර කුසල චේතනා අටද, අකුසල චේතනා දොළොසද'යි යන සමවිසි චේතනා 'කාය සංඛාර'නම් වේ; එම සමවිසි චේතනාම වචීවිඤ්ඤත්තිය උපදවා වචීද්වාරයෙන් පවත්වන ලද කල්හි 'වචී සංඛාර' නම්වේ. මෙහිදී වනාහි අභිඤ්ඤා චේතනාව මතු (පටිසන්ධි) විඤ්ඤාණයට ප්‍රත්‍යය නොවෙතැයි (අටුවාචාරීන් විසින්) බැහැර කරන ලදි. අභිඤ්ඤා චේතනාව මෙන්ම උද්ධච්ච චේතනාවද විපාක විඤ්ඤාණයට ප්‍රත්‍යය නොවන එහෙයින් එයද ප්‍රත්‍යයභාවයෙන් ඉවත් කළ යුතුය. මේ සියලු චේතනාවෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙනම සිදුවෙති. (කාය-වචී) විඥප්ති නො-උපදවා මනෝද්වාරයෙහි උපන් සියලු එකුන් තිස් චේතනාවෝ චිත්ත සංඛාර නම් වෙති. මෙසේ මෙකී ත්‍රිකය පළමු කී ත්‍රිකයටම ඇතුළත් වෙති'යි යන අරුතින් පුඤ්ඤාභිසංඛාර ආදී වශයෙන්ම අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇති වන බව දතයුතුය.

මෙහිලා මෙවන් ප්‍රශ්නයක් නැඟිය හැකියඃ- මේ සංඛාරයන් අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙන උපදිති'යි යන මෙය දතහැකි වනුයේ කෙසේද? අවිද්‍යාව ඇති තැන (සංස්කාරයනුදු) ඇති හෙයිනි. යමකුට වනාහි දුඃඛාදි විෂයයෙහි අවිද්‍යාසංඛ්‍යාත නොදැනීම ප්‍රහීණ නොවූයේද, හේ තෙමේ දුඃඛ විෂයයෙහි පළමුකොට පුබ්බන්තාදියෙහිද නොදැනීමෙන් සසර දුක් සැපෙකැ'යි ගෙන එයටම හේතුවූ ත්‍රිවිධවූම සංස්කාරයන් උපදවයි. සමුදය විෂයයෙහි නොදැනීමෙන් දුකට හේතුවූ තෘෂ්ණාවට පිරිවරවූ සංස්කාරයන් සැපතට හේතු වෙති'යි හඟිමින් -පෙ- ත්‍රිවිධ වූම සංස්කාරයන් උපදවයි. නිරෝධ හා මාර්ග විෂයයෙහි නොදැනීම හේතුකොටගෙන, දුක්ඛනිරෝධ නොවන බඹලොව ආදි ගති විශේෂයෙහි දුඃඛනිරෝධයයි හඟිමින්ද, නිරෝධ මාර්ග නොවන යාග-හෝම හා (අමරණීයත්වය පතා කරනු ලබන) අමරතප ආදි ව්‍රතයන් නිරෝධමාර්ගයයි හඟිමින්ද දුක්ඛ නිරෝධය පතමින් එම යාගහෝම ව්‍රත තපස් ආදීවශයෙන් ත්‍රිවිධ වූම සංස්කාරයන් අරඹයි.

තවද, හේ තෙමේ චතුඃසත්‍ය විෂයයෙහි අවිද්‍යාව දුරු නොවීමේ හේතුවෙන්, විශේෂයෙන් ජාති, ජරා, රෝග, මරණාදී නොයෙක් ආදීනවයෙන් ගහන වූ නමුදු පුණ්‍යඵල (හෙවත් සැප) යයි කියනු ලබන දුක දුක් වශයෙන් හඳුනා නොගෙන, එම පුණ්‍යඵලයන් ලැබීම පිණිස කාය-වචී-චිත්ත සංඛාරභේද සහිත පුඤ්ඤාභිසංඛාරයන් අරඹයි. දිව්‍යප්සරාවන් කැමැතිව පර්වත ප්‍රපාතයකට පතිත ලෙසිනි. සුඛසම්මතවූ නමුදු එම පුණ්‍යඵලය අවසන්හිදී බලවත් පීඩා සන්තාප උපදවන විපරිණාම දුඃඛ ස්වභාවය හා හීන ආස්වාද සහිත බව නොදන්නේ අවිද්‍යාව

ප්‍රත්‍යය කොට ඇති, කියන ලද ප්‍රකාර ඇති එම පුඤ්ඤාභිසංඛාරයන් අරඹයි; පලඟැටියකු පහන් සිළුවට වදින ලෙසිනි. මීබිඳුවට ගිජුව මීවැකුණු පිහිතලයක් ලොවින ලෙසිනි. (අනිෂ්ට) විපාක සහිත කාමසේවනාදිය පිළිබඳ ආදීනවයන් නොදක, සැපය'යි යන හැඟීමෙන් හා ක්ලේශයන් විසින් මඩනාලද හෙයින් තුන් දොරින්ම පවත්වනු ලබන අපුඤ්ඤාභිසංඛාරයන් අරබයි; ළදරුවකු අසූචියෙහි කෙළනා ලෙසිනි. මියනු කැමැතිව වස කන ලෙසිනි. අරූපධ්‍යාන විපාක විෂයයෙහිද, සංඛාරයන් පිළිබඳ විපරිණාම දුඃඛ ස්වභාවය නොහඳුනනුයේ ශාස්වතාදී විපර්යාස වශයෙන් ගෙන චිත්ත සංඛාරමය අනෙඤ්ජාභි සංඛාරය අරඹයි; මංමුළාවූවකු පිශාචනගරයකට යන මඟෙක ගමන් අරඹන ලෙසිනි.

මෙසේ යම් හෙයකින් අවිද්‍යාව ඇති තැනම සංඛාරයන්ගේ ඇතිවීම සිදුවේද, නැති තැන එසේ නොවේද, එහෙයින් මේ සංඛාරයන් අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙනම වෙති'යි යන මේ ධර්මතාව දතයුතුය. කියන ලදමැයිඃ- ''මහණෙනි, අඥාන තෙමේ අවිද්‍යාව හේතුකොට පුඤ්ඤාභිසංඛාරයන් රැස්කරයි, අපුඤ්ඤාභිසංඛාරයන් රැස්කරයි. අනෙඤ්ඤාභි සංඛාරයන්ද රැස් කරයි; මහණෙනි, යම්හෙයකින් වනාහි භික්‍ෂුවක්හුගේ අවිද්‍යාව ප්‍රහීණ වේද, විද්‍යාව උදාවේද, ඒ භික්‍ෂු තෙමේ අවිද්‍යාව දුරු වීමෙන්ද විද්‍යාව උදාවීමෙන්ද පුඤ්ඤාභි සංඛාරයද-පෙ- රැස් නොකෙරේ''[a]

මෙහිලා මෙසේ කිව හැකියඃ- ''අවිද්‍යාව සංඛාරයනට ප්‍රත්‍යය වෙති'යි යන මෙය පළමුකොට පිළිගනිමු. එහෙත් කවර නම් සංඛාරයනට කෙසේ ප්‍රත්‍යය වේද'යි යන මෙය කිවයුතුය. එහිලා මෙසේ කියනුලැබේඃ- භාග්‍යවතුන්වහන්සේ විසින් වනාහි, 'හේතු පච්චය, ආරම්මණ පච්චය, අධිපති පච්චය, අනන්තර පච්චය, සමනන්තර පච්චය, සහජාත පච්චය, අඤ්ඤමඤ්ඤ පච්චය, නිස්සය පච්චය, උපනිස්සය පච්චය, පුරේජාත පච්චය, පච්ඡාජාත පච්චය, ආසේවන පච්චය, කම්මපච්චය, විපාක පච්චය, ආහාර පච්චය, ඉන්ද්‍රියපච්චය, ඣාන පච්චය, මග්ග පච්චය, සම්පයුත්ත පච්චය, විප්පයුත්ත පච්චය, අත්‍ථි පච්චය, නත්‍ථි පච්චය, විගත පච්චය, අවිගත පච්චය,' යනුවෙන් ප්‍රත්‍යයයන් සූවිස්සක්[b] දේශනා කොට ඇත.

එහි හේතු වූයේද එම ප්‍රත්‍යය වූයේදැ'යි පච්චයයි, හේතු වශයෙන් ප්‍රත්‍යය වීමයි. හේතුභාවයෙන් ප්‍රත්‍යයවීමයයි කීසේයි. ආරම්මණ පච්චය ආදියෙහිද මෙම නයයි. එහි 'හේතු' යනු, වචනාවයවය, කාරණය, මූලය යන මොවුනට අධිවචනයෙකි. 'පටිඤ්ඤාහේතු' ආදී තන්හි ලෝකයෙහි

a. සං. නි., රුක්ඛ වග්ග
b. පට්ඨාන පච්චයුද්දෙස

(න්‍යාය වාදයෙහි) සාධනාවයවය 'හේතු' යයි කියනුලැබේ. ශාසනයෙහි වනාහි 'යෙ ධම්මා හෙතුප්පභවා' යන ආදියෙහි කාරණාර්ථයෙහි වේ; තයො කුසලහේතු, තයො අකුසල හේතු' යන ආදියෙහි මූලය 'හේතු'යයි කියනු ලැබේ; මෙම අර්ථය මෙහිදී අභිප්‍රේතයි 'පච්චය' යන මෙහි වචනාර්ථය මෙසේයි- 'පටිච්ච එතස්මා එති' (මෙය අරබයා, මෙයින් හටගනිති'යි හෝ පච්චය නම්; එය ප්‍රතික්ෂිප්ත (බැහැර) නොවී පවතී' යන අර්ථයි. යම් ධර්මයක් තවත් ධර්මයක් බැහැර නොකොට සිටිති'යි, හටගනිති'යි හෝ මෙසේ එම (පළමු කී) ධර්මය පසුව කී ධර්මයට ප්‍රත්‍යය වෙති'යි කී නියායි. ලක්ෂණ වශයෙන් වනාහි ප්‍රත්‍යයය උපකාරක ලක්ෂණ ඇත්තේය. යම් ධර්මයක් වනාහි තවත් ධර්මයෙක පැවැත්මට හෝ හටගැනීමට උපකාරී වේද, එම (පළමුකී) ධර්මය (පසුව කී) ධර්මයට ප්‍රත්‍යයයයි කියනු ලැබේ.

ප්‍රත්‍යයය, හේතුය, කාරණය, නිදානය, සම්භවය, ප්‍රභවය යන ආදිය ව්‍යංජන (අක්ෂර) වශයෙන් විසදෘශ වන මුත් අරුත් වශයෙන් සමාන වේ.

මෙසේ මූලාර්ථයෙන් හේතුවූ, උපකාරක අර්ථයෙන් ප්‍රත්‍යයවූ, සැකෙවින් කිවහොත් මූලාර්ථයෙන් උපකාරකවූ ධර්මස්වභාවය 'හේතුපච්චය' නම්. එය ශාලි ආදී ධාන්‍ය විශේෂයනට ශාලිබීජාදිය සෙයින්ද, මණිප්‍රභාදීනට මණිවර්ණාදිය සෙයින්ද, කුශලාදීන්ගේ කුශලාදී ස්වභාවය සිද්ධ කරන්නේය යනු (රේවත නම්) ආචාර්යයන්ගේ අභිප්‍රායයි. එසේ ඇති කල්හි වනාහි කුශල හා අකුශල හේතුවෙන් හටගත් රූපයන්ගේ හේතුප්‍රත්‍යය භාවය සිද්ධ නොවේ; එම හේතු ප්‍රත්‍යය එකී රූපයන්ගේ කුශලාකුශල භාවය සාධනය නොකරයි. එහෙත් එම රූපයනට ප්‍රත්‍යය නොවන්නේ නොවේ. කියන ලදමැයිඃ- "(ලෝභ, අලෝභ, ආදී) හේතුව හේතු සම්ප්‍රයුක්ත ධර්මයනටද, එයින් හටගත් රූපයනටද හේතු ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ"[a] අහේතුක චිත්තයන්ගේද මෙයින් (හේතුප්‍රත්‍යය භාවයෙන්) තොරවූ අව්‍යාකෘත භාවය සිද්ධයි; සහේතුක චිත්තයන්ගේද කුසල-අකුසලභාවය යොනිසෝමනසිකාරාදිය හා සමග බැඳුණේ වේ. සම්ප්‍රයුක්ත හේතුව හා සමග බැඳුණේ නොවේ. ඉදින් සම්ප්‍රයුක්ත හේතූන්ගේ කුසලාදි භාවය ස්වභාව සිද්ධ වේනම්, සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ කුසලාදී භාවයද හේතුව හා සමග බැඳුණේ නම්, ආලෝභය කුසල හෝ අව්‍යාකෘත හෝ වන්නේය. යම් හෙයකින් වනාහි උභයාකාරයෙන්ම වෙතොත්, සම්ප්‍රයුක්ත හේතූන් කෙරෙහිද මෙසේ කුසලාදිභාවය සෙවිය (විමසිය) යුතු වන්නේය.

කුසලාදි-භාව-සාධන වශයෙන් හේතූන්ගේ මූලාර්ථය නොගෙන, (අරමුණෙහි) සුප්‍රතිෂ්ඨිත-භාව-සාධන වශයෙන් ගනුලබන කල්හි කිසි

---

a. පට්ඨාන පච්චයුද්දෙස

විරෝධයෙක් නොවේ; ලබන ලද හේතුප්‍රත්‍යය ඇති ධර්මයෝ මනාව මුල්බැසගත් වෘක්ෂයන් මෙන් මනාකොට තිරව පිහිටන්නාහුය. අහේතුකයෝ වනාහි තිලබීජක නම් සෙවෙල් වෙසෙස මෙන් තිරව නොපිහිටන්නාහුය; මෙසේ ''මූලට්ඨේන උපකාරකො'' යනු, සුප්‍රතිෂ්ඨිත -භාව-සාධන වශයෙන් උපකාරක වූ ධර්මය හේතුප්‍රත්‍යයයි දතයුතුය.

අනතුරුව දක්වන ලද ප්‍රත්‍යයන් අතුරෙන්; ආලම්බන වශයෙන් උපකාරක වූ ධර්මය ආලම්බන ප්‍රත්‍යයයි. එය ''රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා'' (රූපායතනය චක්ෂුර් විඥානධාතුවට-අරමුණු වේ) යනුවෙන් ආරම්භ කොටද, ''යම් යම් ධර්මයක් ඇරබ යම් යම් චිත්ත චෛතසික ධර්ම කෙනෙක් උපදිත්ද, ඒ ඒ ධර්මයෝ ඒ ඒ (චිත්තචෛතසික) ධර්මයනට ආලම්බන ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති'' යනුවෙන් අවසන් කළ හෙයින් ආලම්බන ප්‍රත්‍යය නොවන කිසි ධර්මයෙක් නැත්තේය. යම්සේ දුර්වල පුරුෂයෙක් දඬුවක් ගෙන හෝ කඹයක එල්බ හෝ නැගිටියිද, සිටියිද, එසේම චිත්ත චෛතසික ධර්මයෝ රූපාදීවූ අරමුණක් ඇරබම උපදිති, සිටිති. එහෙයින් සියලුම චිත්ත චෛතසික ධර්මයනට අරමුණු වන ධර්මයන් ආරම්මණ ප්‍රත්‍යය වෙති'යි දතයුතුය.

ප්‍රමුඛත්වයෙන් උපකාරක වූ ස්වභාවය අධිපති ප්‍රත්‍යයයි; එය සහජාතය, ආරම්මණයයි දෙ-වැදෑරුම් වේ. එහි ''ඡන්දාධිපති ප්‍රත්‍යය ඡන්දය (එනම් ඉද්ධිපාදය) හා සමග යෙදුණු ධර්මයනටද, එයින් හටගත් රූපයනටද, අධිපති ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ''[a] යන ආදී වචනයෙන් ඡන්ද-විරිය-චිත්ත-වීමංස යන ධර්ම සතර අධිපතිප්‍රත්‍යයයි දතයුතුය; එහෙත් එක්වම එක්වර නොවේ; යම් විටෙක ඡන්දය ප්‍රධාන කොට, ඡන්දය ප්‍රමුඛ කොට සිත පවත්නේද, එවිට ඡන්දයම අධිපති වනු මිස අනෙක් තුන නොවේ. අනෙක් (ඉද්ධිපාද) තුන පිළිබඳවද මෙම නයයි. යම් ධර්මයක් ගරු කොට අරූප (චිත්ත-චෛතසික) ධර්මයෝ පවත්නාහුද, එය එම (අරූප) ධර්මයනට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. එහෙයින් කියන ලදිඃ- ''යම් යම් ධර්මයක් ගරු කොට යම් යම් (චිත්ත-චෛතසික) ධර්ම කෙනෙක් උපදනාහුද, ඒ ඒ ධර්මයෝ ඒ ඒ ධර්මයනට අධිපති ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති[b].

අනන්තර භාවයෙන් (අතරක් නැති වීමෙන්) උපකාරක වූ ධර්මය අනන්තර ප්‍රත්‍යයයි; එකකට එකක් යාව සිදු වීමෙන් මෙකී ප්‍රත්‍යය දෙක පිළිබඳව බොහෝ සෙයින් කථා කරනු ලැබේ. (සාකච්ඡාවට බඳුන් වූවෙකි.) මෙහි සාරාර්ථය මෙසේයඃ- චක්ඛු විඤ්ඤාණයට අනතුරුව මනොධාතුවද, මනෝධාතුවට අනතුරුව මනෝ විඤ්ඤාණ ධාතුවද වෙති'යි යන ආදී යම් මේ චිත්ත නියමයක් වේද, යම් හෙයකින් එය

a. පට්ඨාන, පච්චයුද්දෙස
b. පට්ඨාන, පච්චයුද්දෙස

පෙර-පසු අනුපිළිවෙළින්ම සිදුවනු මිස අන් ලෙසකින් නොවේද, එහෙයින් තම තමාට පසුව එන අනුරූපවූ චිත්තුප්පාදය ඉපැදවීමට සමත්වූ ධර්මය අනන්තර ප්‍රත්‍යයයි. එහෙයින්ම කීහු:- "අනන්තර ප්‍රත්‍යය යනු, චක්ඛු විඤ්ඤාණ ධාතුවද, එය හා බැඳුණු ධර්මයෝද, මනෝ ධාතුවටද එය හා බැඳුණු ධර්මයනටද අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති"[a] යන ආදියයි.

යමක් අනන්තර ප්‍රත්‍යය වේ නම් එයම සමනන්තර-ප්‍රත්‍යයද වේ. මෙහි වෙනස් වනුයේ හුදෙක් ව්‍යංජන මාත්‍රයමය, උපචයසන්තති යන පදයුගලයෙහි මෙන්ද, අධිවචන-නිරුත්ති යන පදයුගලයෙහි මෙන්ද, මෙහිද අර්ථ වශයෙන් නානත්වයෙක් නැත.

එල වශයෙන් අතරක් නැති බව අනන්තර ප්‍රත්‍යය යයිද, කාල වශයෙන් අතරක් නැතිබව සමනන්තර ප්‍රත්‍යයයිද යනුවෙන් (රේවතනම්) ආචාර්යවරයාගේ යම් මතයක් වේද, එය නිරෝධ සමාපත්තියෙන් නැගිටින්නහුට නේවසඤ්ඤා-නාසඤ්ඤායතන කුසල චිත්තය අනාගාමී-අර්හත් එල සමාපත්තීනට සමනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති'යි යන ආදිය සමග විරෝධ වේ (නොගැලපේ).

තවද එහිලා 'ධර්මයන්ගේ හටගැනීමේ හැකියාව නොපිරිහේ, භාවනා බලයෙන් වලක්වන ලද හෙයින් සමනන්තර ධර්මයෝ නූපදිති' යනුවෙන් යමක් කියන ලද්දේද, එයද කාලානන්තරතාවක් නොමැති බවම සාධනය කරයි; එහි භාවනා බලයෙන් සිදුවන කාලානන්තරතාවක් නැතැ'යි යන මෙයම අපිදු කියමු; යම් හෙයකින් කාලානන්තරතාවක් නොමැත්තේද, එහෙයින්ම සමනන්තරප්‍රත්‍යයතාවක්ද නොයෙදේ. කාලානන්තරතාවෙන්ම සමනන්තරප්‍රත්‍යය ප්‍රත්‍යය වෙති'යි යනු ඔවුන්ගේ ලබ්ධියයි. එහෙයින් එම ලබ්ධියට දැඩිව පිවිසීම නොකොට මෙහි ඇති වෙනස ව්‍යංජන මාත්‍ර වශයෙන්ම මිස අර්ථ වශයෙන් නොවන බව පිළිගත යුතුය. කෙසේද යත්:- මොවුන්ගේ අතරක් නැත්නුයි අනන්තර වේ. සටහනක් හෝ නැති හෙයින් වඩාත් අනන්තර වෙති'යි සමනන්තර වේ.

උත්පාදාවස්ථාවෙහිදීම සමග ඉපැදීමෙන් උපකාරකවූ ධර්මය සහජාත ප්‍රත්‍යය වේ; ආලෝකයට පහන සෙයිනි. එය අරූපස්කන්ධාදී වශයෙන් සවැදෑරුම් වේ. යම්සේ කීහුද:- (වේදනා ආදී) සතර අරූපස්කන්ධයෝ ඔවුනොවුනට සහජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති. සතර මහාභූතයෝ ඔවුනොවුනට -පෙ-, ප්‍රතිසන්ධික්ෂණයෙහි නාමරූපයෝ ඔවුනොවුනට -පෙ- චිත්ත-චෛතසික ධර්මයෝ චිත්තජ රූපයනටද, මහාභූතයෝ උපාදා රූපයනටද, රූපී ධර්මයෝ අරූපී ධර්මයනටද, කිසි

a. පට්ඨාන පච්චයුද්දෙස

විටෙක සහජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති, තවත් විටෙක සහජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය නොවෙති''[a] මෙය (මෙහි අවසනට 'රූපී ධම්මා' යනුවෙන් කී කරුණ) හදයවත්‍ථු රූපය සඳහාම කියනලදි.

ඔවුනොවුන්ගේ උපතට උපස්ථම්භන වශයෙන් උපකාරක වූ ධර්මය අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය වේ. එකිනෙකට රුකුල් ලෙසින් සිටි දඬු තුනෙකින් සැදී ත්‍රිදණ්ඩක නම් උපකරණය මෙනි. එය අරූප ස්කන්‍ධාදි වශයෙන් තෙ-වැදෑරුම් වේ. යම්සේ කීහුදෘ- ''සතර අරූපී ස්කන්‍ධයෝ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති. සතර මහාභූතයෝ -පෙ-, ප්‍රතිසන්‍ධි ක්‍ෂණයෙහිදී නාමරූපයෝ ඔවුනොවුනට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති.''[b]

පාදකයක් ලෙසින්ද ආධාරකයක් ලෙසින්ද උපකාරක වූ ධර්මය නිස්සය ප්‍රත්‍යයයි. වෘක්‍ෂ, චිත්‍රකර්ම ආදියට (පිළිවෙළින්) පෘථුවි, වස්ත්‍ර ආදිය සෙයිනි. එය ''සතර අරූපී ස්කන්‍ධයෝ ඔවුනොවුනට නිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[c] යනුවෙන් මෙසේ සහජාත ප්‍රත්‍යයෙහි කී නයින්ම දතයුතුය. මෙහි සවන කොටස ('රූපිනො ධම්මා' යන ආදී කොටස) ''චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණධාතුවටද -පෙ- සෝත-පෙ-ඝාන-පෙ-ජිව්හා-පෙ-කායායතනය කායවිඤ්ඤාණ ධාතුවටද, එය හා සමග යෙදුණු ධර්මයනටද නිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. යම් රූපයක් නිසා මනෝධාතුවද, මනෝ විඤ්ඤාණ ධාතුවද පවතී නම්, එම රූපය මනෝධාතුවටද, මනෝවිඤ්ඤාණධාතුවටද එය හා සමග යෙදුණු ධර්මයනටද නිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ''[d] යනුවෙන් එය බෙදා දක්වන ලදි.

'උපනිස්සය පච්චයෝ' යන මෙහි වනාහි, පළමු කොට වචනාර්ත්‍ථය මෙසේයි:- එයට අයත් වෘත්ති ඇති හෙයින් තමාගේ ඵලය විසින් ආශ්‍රිතවූයේනුයි, පිළිකෙව් නොකරන ලද්දේනුයි 'නිස්සය'වේ. යම්සේ වනාහි අධික ආයාසය 'උපායාස' නම් වේද, එසේම අධික නිස්සයය 'උපනිස්සය' නම් වේ. මේ බලවත් කාරණයට අධිවචනයි. බලවත් කාරණ වශයෙන් උපකාරකවූ ධර්මය උපනිස්සය ප්‍රත්‍යයයි දතයුතුය. එය ආලම්බන උපනිස්සය, අනන්තර උපනිස්සය, ප්‍රකෘති උපනිස්සය'යි තෙ-වැදෑරුම්වේ; එහි දන්දී, සිල් සමාදන්ව, පෙහෙවස් වැස, එය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා කරයිද, පෙර තමා විසින් බොහෝ කලක් පුරුදු කරන ලද ගුණධර්මයන් ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා කරයිද, ශෛක්‍ෂ්‍යයෝ (සෝතාපන්න ආදීහු) ගෝත්‍රභූ චිත්තය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා කරත්ද, (චිත්ත) පාරිශුද්ධිය ගරු කොට ප්‍රත්‍යවේක්‍ෂා කරත්ද, ශෛක්‍ෂ්‍යයෝ මාර්ගයෙන් නැගී සිට මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්‍ෂා

---

a. පට්ඨානපච්චය
b. පට්ඨානපච්චය
c. පට්ඨානපච්චය
d. එම

කරත්ද'යි මේ ආදි නයින් ආලම්බන උපනිස්සයය ආලම්බනාධිපති ප්‍රත්‍ය හා සමග නානත්‍වයක් නොකොට බෙදා දක්වන ලදී. එහි යම් අරමුණක් ගරු කොට චිත්ත-චෛතසිකයෝ උපදිත්ද, එම අරමුණ නියම වශයෙන් එම චිත්ත-චෛතසිකයනට අරමුණු අතුරෙන් බලවත් අරමුණ වේ. මෙසේ ගරුකළ යුතුය යන අර්ත්‍ථයෙන් ආලම්බනාධිපති ප්‍රත්‍යයද, බලවත් හේතුවය යන අර්ත්‍ථයෙන් ආලම්බන උපනිස්සයප්‍රත්‍යයද වෙති'යි මෙසේ මේ ආලම්බනාධිපති, ආලම්බන උපනිස්සය යන) දෙකෙහි නානාත්‍වය දතයුතුය.

අනන්තර උපනිස්සය ප්‍රත්‍යයද, ''පළමු පළමු කුශල ස්කන්‍ධයෝ පසු පසු එන කුශලස්කන්‍ධයනට උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[a] යන ආදී නයින් අනන්තර ප්‍රත්‍යය හා සමග නානත්‍වයක් නොකොටම බෙදා දක්වන ලදි. මාතිකා නික්ඛේපයෙහි වනාහි, චක්ඛු විඤ්ඤාණධාතුවද, එය හා යෙදුණු චිත්ත චෛතසික ධර්මයෝද, මනෝ ධාතුවටද එය හා සමග බැඳුණු ධර්මයනටද අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති[b] යනුවෙන් අනන්තර ප්‍රත්‍යයද, ''පළමු පළමු කුසල ධර්මයෝ පසු පසුව එන කුශල ධර්මයනටද උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති[c] යන ආදී නයින් උපනිස්සය ප්‍රත්‍යයද ආ හෙයින් 'නික්ඛේපයෙහිදී ඒ දෙකෙහි නානත්‍වය ඇත; එයද අර්ත්‍ථ වශයෙන්, ඒකී භාවයටම පැමිණේ.

එතෙකුදු වුවත් තම තමාට අනතුරුව අනුරූපවූ චිත්තෝත්පාදයන් පැවැත්වීමට සමත්වන හෙයින් අනන්තර ප්‍රත්‍යය වන හෙයින් අනන්තර උපනිස්සය ප්‍රත්‍යය වන බවද, දතයුතුය. ඒ එසේයː- හේතු ප්‍රත්‍යයාදිය අතුරෙන් කිසියම් ප්‍රත්‍යයක් නොමැතිවද සිත් උපදනේ නමුදු, අනතුරු (අනන්තර) සිතෙකින් තොරව එසේ සිතෙක ඉපැදීමෙක් නම් නැත. එහෙයින් එය බලවත් ප්‍රත්‍යයයි මෙසේ තම තමාට අනතුරුව අනුරූප චිත්තෝත්පාදන වශයෙන් අනන්තර ප්‍රත්‍යයද, බලවත් හේතු වශයෙන් අනන්තර උපනිශ්‍රය ප්‍රත්‍යයද වෙති'යි මේ දෙකෙහි නානත්‍වය දතයුතුය.

පකතූපනිස්සයය වනාහිː- පකතො උපනිස්සයෝ පකතූපනිස්සයෝ (ප්‍රකෘත වූ උපනිශ්‍රයය ප්‍රකෘතෝපනිශ්‍රයයි) මෙහි ප්‍රකෘත (පකත) යනු, ස්වසන්තානයෙහි නිපදවන ලද ශ්‍රද්ධා ශීල ආදියයි, නොහොත් සෙවුනා ලද ඍතු-භෝජන ආදියයි. නැතහොත්ː- ප්‍රකෘතියෙන්ම උපනිශ්‍රය වූයේ පකතූපනිස්සයයි. ආලම්බන-අනන්තර ප්‍රත්‍යයන් හා සමග මිශ්‍ර නොවූයේ යන අර්ත්‍ථයි. ''ප්‍රකෘති උපනිශ්‍රය යනු, ශ්‍රද්ධාව උපනිශ්‍රය කොට ගෙන දන් දෙයි, සිල් සමාදන් වෙයි. පෙහෙවස් වෙසෙයි. ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි. මාර්ගයන් උපදවයි.

a. පට්ඨාන පච්චය
b. පට්ඨාන පච්චය නිද්දෙස
c. පට්ඨාන පච්චය නිද්දෙස

අභිඥාවන් උපදවයි. සමවත් උපදවයි. ශීලය-ශ්‍රැතය-ත්‍යාගය, ප්‍රඥාව-උපනිශ්‍රය කොට ගෙන දන්දෙයි -පෙ- සමවත් උපදවයි; ශ්‍රද්ධාව-ශීලය-ශ්‍රැතය-ත්‍යාගය-ප්‍රඥාව යන මොහු ශ්‍රද්ධාවට-ශීලයට-ශ්‍රැතයට-ත්‍යාගයට-ප්‍රඥාවට උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[a] යන ආදි නයින් අනේක ප්‍රකාරයෙන් එහි ප්‍රභේදය දතයුතුය. මෙසේ මේ ශ්‍රද්ධාදිය 'ප්‍රකෘත' වෙති'යි, බලවත් කාරණය යන අරුතින් උපනිශ්‍රයද වෙති'යි ප්‍රකෘතෝපනිශ්‍රය නම්වේ.

පළමුව ඉපිද පවත්නා බැවින් උපකාරකවූ ධර්මය පුරේජාත ප්‍රත්‍යයයි; එය පංචද්වාර විෂයයෙහි (පංච) වස්තුය, (පංච) ආලම්බනය, හෘදයවස්තුයයි එකොළොස් වැදෑරුම් වේ. යම්සේ කීහුදෑ:- ''චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවටද එය හා සමග යෙදුණු (චිත්ත-චෛතසික) ධර්මයනටද පුරේජාත-ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ., සෝතායතය-පෙ-ඝාන-ජිව්හා-කායායතනය-පෙ- රූපායතන-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බායතනය-පෙ- කායවිඤ්ඤාණ ධාතුවටද, එය හා සමග යෙදුණු (චිත්ත-චෛතසික) ධර්මයනටද පුරේජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. රූප-සද්ද-ගන්ධ-රස-පෙ-ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද, යම් රූපයක් නිසා මනෝධාතුවද, මනෝ විඤ්ඤාණ ධාතුවද පවතී නම් එම රූපය මනෝ ධාතුවටද එය හා සමග යෙදුණ (චිත්ත-චෛතසික) ධර්මයනටද පුරේජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ; මනෝවිඤ්ඤාණ ධාතුවටද එය හා සමග යෙදුණු ධර්මයනටද කිසි විටෙක පුරේජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. ඇතැම් විටෙක පුරේජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය නොවේ.''

පුරේජාත (පළමුව උපන්) රූපධර්මයනට උපස්තම්භක වශයෙන් උපකාරක වූ අරූප ධර්මය පච්ඡාජාත ප්‍රත්‍යයයි. ගිජුලිහිණි පොව්වන්ගේ ශරීර තුළ (පසුව) ඇතිවන ආහාර තෘෂ්ණා චේතනාව මෙනි, එහෙයින් කියන ලදි, ''පසුව උපන් චිත්ත චෛතසික ධර්මයෝ පළමුව උපන් මේ කයට පච්ඡාජාත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[b] ආසේවන (අභ්‍යාස) අර්ථයෙන් අනන්තර ප්‍රත්‍යයන්ගේ ප්‍රාගුණ්‍යය බලවත් බවින් උපකාරක වූ ධර්මය ආසේවන ප්‍රත්‍යය වේ. ග්‍රන්ථ ආදිය (හැදෑරීමේදී) පළමු පළමු අභ්‍යාසයන් මෙනි. එය කුශල ජවනය අකුශලජවනය කිරිය ජවනයයි ත්‍රිවිධ වේ. යම්සේ කීහුදෑ:- ''පළමු පළමු (උපන්) කුශල ධර්මයෝ පසු පසුව එන කුශල ධර්මයනට ආසේවන ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති; පළමු පළමු අකුශල ධර්මයෝ -පෙ- කිරිය, අබ්‍යාකත ධර්මයෝ පසු-පසුව එන කිරිය අබ්‍යාකත ධර්මයනට ආසේවන ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[c]

---

a. පට්ඨාන පඤ්හාවාර

b. පට්ඨාන, පච්චයනිද්දෙස

c. පට්ඨාන, පච්චයනිද්දෙස

චිත්ත ප්‍රයෝග සංඛ්‍යාත (සිත මෙහෙයවීමයයි කියනු ලබන) ක්‍රියාභාවයෙන් උපකාරක වූ ධර්මය කම්ම ප්‍රත්‍යය වේ. එය නානාක්ෂණික වූ කුශලාකුශල චේතනාවටද, සහජාත වූ සියලුම චේතනාවටද'යි දෙවැදෑරුම් වේ; යම්සේ කීහුදෑ:- ''කුශලාකුශල කර්මය විපාකස්කන්ධයනටද, එයින් හටගත් රූපයනටද කර්ම ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ; චේතනාව තමා හා සමග යෙදුණු ධර්මයනටද, එයින් හටගත් රූපයනටද කර්ම ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ''[a] නිරුත්සාහික භාවයෙන් හා ශාන්ත භාවයෙන් නිරුත්සාහික භාවය හා ශාන්ත භාවය පිණිස උපකාරකවූ විපාක ධර්මය විපාකප්‍රත්‍යය වේ. ඒ විපාක ප්‍රත්‍යය පවත්නා කාලයෙහි විපාක සිත්වලින් හටගන්නා රූපයනටද, ප්‍රතිසන්ධි අවස්ථාවෙහි කර්මජ රූපයෙන් හටගන්නා රූපයනටද, සියලු අවස්ථාවන්හිදී (ප්‍රවෘත්ත හා ප්‍රතිසන්ධි යන අවස්ථා දෙකෙහිදීම) තමා හා සමග යෙදුණු ධර්මයනටද ප්‍රත්‍යය වේ. යම්සේ කීහුදෑ:- ''විපාක අව්‍යාකත වූ එක් (නාම) ස්කන්ධයෙක් සෙසු (නාම) ස්කන්ධ තුනටද (විපාක) චිත්තයෙන් හටගත් රූපයනටද විපාක ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. -පෙ- ප්‍රතිසන්ධි ක්ෂණයෙහිදී විපාකඅබ්‍යාකතවූ එක් (නාම) ස්කන්ධයෙක් සෙසු (නාම) ස්කන්ධ තුනටද, එයින් හටගත් රූපයනටද, (නාම) ස්කන්ධ තුනක් එක් (නාම) ස්කන්ධයකටද, ස්කන්ධ දෙකක් අනික් ස්කන්ධ දෙකටද, එයින් හටගත් රූපයනටද විපාක ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. (නාම) ස්කන්ධයෝ (හෘදය) වස්තුවට විපාක ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[b]

රූප-අරූප ස්කන්ධයනට උපස්තම්භකාර්ථයෙන් උපකාරක වූ සතර ආහාරයෝ ආහාර ප්‍රත්‍යය වෙති. යම්සේ කීහුදෑ:- ''කබලිංකාරාහාරය මේ කයට ආහාරප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. අරූපී වූ (ඵස්ස, මනෝසංචේතනා, විඤ්ඤාණ යන) ආහාරත්‍රයය එය හා යෙදුණු (චිත්ත චෛතසික) ධර්මයනටද, එයින් හටගත් (චිත්තජ) රූපයනටද ආහාර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ''[c] පඤ්හාවාරයෙහි වනාහි, ''ප්‍රතිසන්ධික්ෂණයෙහිදී විපාක අබ්‍යාකත (අරූපී) ආහාරයෝ තමන් හා සමග යෙදුණු ස්කන්ධයනටද එයින් හටගත් (කර්මජ) රූපයනටද ආහාර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''යිද කියනලදී.

අධිපති අර්ථයෙන් උපකාරකවූ (ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය යන දෙක හැර සෙසු) ඉන්ද්‍රිය විස්ස ඉන්ද්‍රිය ප්‍රත්‍යයයි. එහි චක්ඛුන්ද්‍රිය ආදීහු හුදෙක් අරූප ධර්මයනටමද, සෙසු ඉන්ද්‍රියයෝ රූප-අරූප (යන උභය) ධර්මයනටමද ප්‍රත්‍යය වෙති. යම්සේ කීහුදෑ:- ''චක්ඛුන්ද්‍රියය චක්ඛු විඤ්ඤාණ ධාතුවට -පෙ-සෝත-පෙ-ඝාන-පෙ-ජිව්හා-පෙ-කායින්ද්‍රියය කාය

a. පට්ඨාන, පච්චයනිද්දෙස
b. පට්ඨාන පඤ්හවාර
c. පට්ඨාන පඤ්හවාර

විඤ්ඤාණ ධාතුවට හා එය හා සමග යෙදුණු ධර්මයනටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ, රූපී ජීවිතින්ද්‍රියය එයින් හටගත් (කර්මජ) රූපයනට ඉන්ද්‍රියප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. අරූපී ඉන්ද්‍රියයෝ සම්ප්‍රයුක්ත ධර්මයනටද, එයින් හටගත් රූපයනටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති.''[a] පඤ්හවාරයෙහි වනාහි, ''ප්‍රතිසන්ධික්ෂණයෙහිදී විපාක-අබ්‍යාකත ඉන්ද්‍රියයෝ තමන් හා සමග යෙදුණු ස්කන්ධයනටද තමන්ගෙන් හටගත් රූපයනටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති'' යනුවෙන්ද කියන ලදී.

උපනිජ්ඣායන (අරමුණු ගැනීම්) අර්ථයෙන් උපකාරක වූ, ද්විපංච විඤ්ඤාණයෙහි සුඛ දුඃඛ වේදනා දෙක හැර, කුශලාදී භේද ඇති සියලු සප්ත ධ්‍යානාංගයෝ ධ්‍යානප්‍රත්‍යය වෙති. යම්සේ කීහුදඃ- ''ධ්‍යානාංගයෝ ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්මයනටද, එයින් හටගත් රූපයනටද ධ්‍යානප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[b] පඤ්හවාරයෙහි වනාහි, ''ප්‍රතිසන්ධික්ෂණයෙහිදී විපාක අබ්‍යාකත වූ ධ්‍යානාංගයෝ තත් සම්ප්‍රයුක්ත ස්කන්ධයනටද, කර්මජ රූපයනටද ධ්‍යානප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති'' යනුවෙන්ද කියනලදී.

යම් හෝ ආකාරයෙකින් (යතො තතො වා) (කුශල පක්ෂයට හෝ අකුශල පක්ෂයට) යොමු කිරීම් අර්ථයෙන් උපකාරක වූ කුශලාදී භේද ඇති මාර්ගාංග දොළස මාර්ග ප්‍රත්‍යය වේ. යම් සේ කීහුදඃ- ''මාර්ගාංගයෝ මාර්ගසම්ප්‍රයුක්තවූ ධර්මයනටද, එයින් හටගත් රූපයනටද මාර්ග ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[c] පඤ්හාවාරයෙහි වනාහි, 'ප්‍රතිසන්ධික්ෂණයෙහිදී විපාක අබ්‍යාකත මාර්ගාංගයෝ තත්සම්ප්‍රයුක්ත ස්කන්ධයටද, කර්මජ රූපයනටද මාර්ග ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති' යනුවෙන්ද, කියන ලදී. මේ ධ්‍යාන ප්‍රත්‍යය මාර්ගප්‍රත්‍යය යන දෙකම ද්විපඤ්ච විඤ්ඤාණ හා අහේතුක සිත්වල නොලැබෙති'යි දතයුතුය.

ඒක වත්ථුක-ඒකාරම්මණ- ඒකුප්පාද-ඒකනිරෝධ සංඛ්‍යාතවූ සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරකවූ අරූප ධර්මයෝ සම්පයුත්ත ප්‍රත්‍යය වෙති. යම්සේ කීහුදඃ- ''අරූපී වූ (නාම) ස්කන්ධ සතර එකිනෙකට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ.[d] (මෙකී) ඒකවත්ථුක භාවාදියට නොපැමිණීමෙන් උපකාරී වූ රූපී ධර්මයෝ අරූපී ධර්මයනටද, අරූපී ධර්මයෝ රූපී ධර්මයනටද විප්‍රයුක්තප්‍රත්‍යය වෙති. එය සහජාතය, පච්ඡජාතය, පුරේජාතය යනුවෙන් ත්‍රිවිධ වේ. කියන ලදමැයිඃ- ''සහජාත වූ කුශලස්කන්ධයෝ චිත්ත සමුට්ඨාන (සිතින් හටගත්) රූපයනට විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති, පච්ඡාජාතවූ (පසුව උපන්) කුශල

---

a. පට්ඨාන, පච්චය නිද්දෙස
b. පට්ඨාන, පච්චය නිද්දෙස
c. පට්ඨාන, පච්චය නිද්දෙස
d. පට්ඨාන, පච්චය නිද්දෙස

ස්කන්ධයෝ පුරේජාත වූ (පළමුඋපන්) මේ කයට විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[a] අබ්‍යාකතපදය පිළිබඳව වනාහි සහජාත විභංගයෙහි, විපාක අබ්‍යාකත ස්කන්ධයෝ කර්මජ රූපයනට විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති; ස්කන්ධයෝ වස්තුවටද, වස්තුව ස්කන්ධයනටද විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති' යනුවෙන්ද කියනලදි. පුරේජාත (විප්‍රයුක්ත)ය වනාහි චක්ඛුන්‍ද්‍රියාදිය හා වස්තු වශයෙන්ම දතයුතුය. යම්සේ කීහුදඃ- ''පුරෙජාත වූ චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණයට -පෙ- කායායතනය කාය විඤ්ඤාණයට විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයන් ප්‍රත්‍යය වේ.'' (හෘදය) වස්තුව විපාක අව්‍යාකත ස්කන්ධයනට කිරිය අබ්‍යාකත ස්කන්ධයනටද -පෙ- වස්තුව කුශලස්කන්ධයයනට -පෙ- වස්තුව අකුශල ස්කන්ධයනට විප්‍රයුක්ත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ.''

ප්‍රත්‍යුත්පන්න ලක්ෂණ ඇති අත්ථිභාවයෙන් (පවත්නා ස්වභාවයෙන්) එබඳුම වූ ධර්මයනට උපස්තම්භක භාවයෙන් උපකාරීවූ ධර්මය අස්ති ප්‍රත්‍යයයි. එයට අරූපස්කන්ධය, මහාභූතය, නාමරූපය, චිත්ත චෛතසිකය, මහාභූතය, ආයතනය, වස්තුයයි යනුවෙන් සත් ආකාරයෙකින් මාතෘකා තබන ලදි. යම්සේ කීහුදඃ- ''අරූපීවූ ස්කන්ධ සතර එකිනෙකට අස්තිප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. මහාභූත සතර -පෙ- ප්‍රතිසන්ධික්ෂණයෙහිදී නාමරූප දෙක එකිනෙකට -පෙ- චිත්ත චෛතසික ධර්ම චිත්තයෙන් හටගත් රූපයනට -පෙ- මහාභූත උපාදාරූපයනට -පෙ- චක්ඛායතනය චක්ඛු විඤ්ඤාණ ධාතුවට -පෙ- රූපායතනය -පෙ- ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණ ධාතුවට හා තත්සම්ප්‍රයුක්ත ධර්මයනටද අස්තිප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. රූපායතනය -පෙ- ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද තත්සම්ප්‍රයුක්ත ධර්මයනටද, යම්රූපයක් නිසා මනෝධාතුව හා මනෝවිඤ්ඤාණ ධාතුවද පවතීනම් එම රූපය මනෝධාතුවට හා මනෝ විඤ්ඤාණ ධාතුවටද තත්සම්ප්‍රයුක්ත ධර්මයනටද අස්තිප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ.''[b]

පඤ්හවාරයෙහි වනාහි, ''සහජාතය, පුරේජාතය, පච්ඡාජාතය, ආහාරය, ඉන්ද්‍රියය'' යනුවෙන් මාතෘකා තබා, පළමුකොට සහජාත විෂයයෙහි, ''එක් ස්කන්ධයක් සෙසු ස්කන්ධ තුනට හා තත්සමුත්ථාන රූපයනටද අස්තිප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ''[c] ආදි නයින් නිර්දේශ කරන ලදි. පුරේජාත විෂයයෙහි, පළමුව උපන් චක්ඛු ආදීන්ගේ වශයෙන් නිර්දේශ කරන ලදි. පච්ඡාජාත විෂයයෙහි, පළමුව උපන් මේ කය පසුව උපන් චිත්ත චෛතසිකයනට ප්‍රත්‍යය වශයෙන් නිර්දේශ කරනලදි; ආහාර හා ඉන්ද්‍රිය විෂයයෙහි, කබලිංකාර ආහාරය මේ කයට අස්ති ප්‍රත්‍යය

a. පට්ඨාන පඤ්හවාර
b. පට්ඨාන පච්චයනිද්දෙස
c. පට්ඨාන පඤ්හවාර

වශයෙන් ප්‍රත්‍යය වේ. රූපජීවිතින්ද්‍රියය කර්මජ රූපයනට අස්තිප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ'' යනුවෙන් මෙසේ නිර්දේශ කරනලදි.

තමනට අනතුරුව උපදනා අරූපධර්මයන්ගේ පැවැත්මට අවකාශ දීමෙන් උපකාරකව ඉන් අනතුරුව නිරුද්ධ වන අරූප ධර්මයෝ නාස්තිප්‍රත්‍යය නම් වෙති. යම්සේ කීහුදඃ- ''සමනන්තරව නිරුද්ධවූ චිත්ත චෛතසික ධර්මයෝ පවත්නා චිත්ත චෛතසික ධර්මයනට නාස්ති ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති''[a]

එම චිත්ත චෛතසික ධර්මයෝ විගත භාවයෙන් (ඉවත්ව යාමෙන්) උපකාරක වන හෙයින් විගත ප්‍රත්‍යය වෙති. යම්සේ කීහුදඃ- සමනන්තරව ඉවත්වූ චිත්ත චෛතසික ධර්මයෝ පවත්නා චිත්ත චෛතසික ධර්මයනට විගත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙති.''[b]

අස්ති ප්‍රත්‍යය වන (චිත්ත චෛතසික) ධර්මයෝම පහව නොයන ස්වභාවයෙන් උපකාරක වන හෙයින් අවිගත ප්‍රත්‍යය වෙති යනුද දතයුතුය. දේශනා විලාශ වශයෙන්. එසේම, හික්මවිය යුතු වෛනේය ජනයාගේ නානත්වය ගැන සැලකීමෙන් හෝ මෙසේ (අවිගත-විගත යන) මේ ද්විකය කියනලදි. (ධම්මසංගනී මාතිකාවන් අතර) අහේතුක ද්විකය දක්වා ඉක්බිති හේතුවිප්පයුත්ත ද්විකයද දක්වීම වැනිය. මෙසේ මේ චතුර්විංශත් (සූවිසි) ප්‍රත්‍යයන් අතුරෙන් මේ අවිද්‍යාව,

පච්චයො හොති පුඤ්ඤානං දුවිධානෙකධා පන
පරෙසං පච්චයානං සා එකධා පච්චයො මතා

ඒ (අවිද්‍යාව) පුණ්‍යාභිසංඛාරයනට දෙපරිද්දෙකින්ද අන්‍යවූ (අපුණ්‍ය) අභිසංඛාරයනට නොයෙක් පරිද්දෙන්ද, පසුව සඳහන් (ආනෙඤ්ජ) අභිසංඛාරයනට එක් පරිද්දෙකින්ද ප්‍රත්‍යය වෙතැ'යි දන්නා ලදි.

එහි 'පුඤ්ඤානං දුවිධා' යනු, (පුණ්‍යාභිසංඛාරයනට) ආලම්බන ප්‍රත්‍යය වශයෙන්ද, උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්දැයි දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වේ. ඒ අවිද්‍යාව වනාහි ක්‍ෂය වශයෙන්ද, ව්‍යය වශයෙන්ද සම්මර්ශනය කරන කල කාමාවචර පුණ්‍යාභිසංඛාරයනට ආලම්බන ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. අභිඥා චිත්තයෙන් සමෝහ සිත් හඳුනාගන්නා කල රූපාවචර පුණ්‍යාභිසංඛාරයනටද (ආලම්බන ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ). අවිද්‍යාව ඉක්මවීම පිණිස දානාදී වූ කාමාවචර පුණ්‍යක්‍රියා වස්තූන් පුරන්නහුටද, රූපාවචර ධ්‍යානයන් උපදවන්නහුටදැයි යන මේ දෙදෙනාහටද උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ; එසේම අවිද්‍යාවෙන්

---

a. පට්ඨාන පච්චයනිද්දෙස

b. පට්ඨාන පච්චයනිද්දෙස

මුළා බවට පත්වූ හෙයින් කාමභව, රූපභව සම්පත් ප්‍රාර්ථනා කරමින් එම පුණ්‍යක්‍රියාවන් කරන්නහුටද උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ.

''අනෙකධා පන පරෙසං'' යනු, අපුඤ්ඤාභිසංඛාරයනට නොයෙක් ආකාරයෙන් ප්‍රත්‍යය වේ, කෙසේද යත්: මේ අවිද්‍යා තොමෝ වනාහි අවිද්‍යාව නිසා රාගාදීන් උපදනා කල ආලම්බන ප්‍රත්‍යය වශයෙන්ද, ගරුකොට සලකා ආස්වාදනය කරන කල ආලම්බන-අධිපති-ආලම්බන-උපනිශ්‍රය ප්‍රත්‍යයන් වශයෙන්ද, අවිද්‍යාවෙන් මුළා බවට පත්ව ආදීනවයන් නොදක ප්‍රාණඝාතාදිය කරන්නහුට උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද, ද්විතීය ජවන ආදීන්හට අනන්තරය, සමනන්තරය අනන්තරෝපනිශ්‍රය. ආසේවනය. නාස්තිය, විගතය යන ප්‍රත්‍යයන් වශයෙන්ද ප්‍රත්‍යය වේ. යම්කිසි අකුශලයක් කරන්නහුට හේතුය, සහජාතය, අඤ්ඤමඤ්ඤය, නිශ්‍රයය, සම්ප්‍රයුක්තය, අස්තිය, අවිගතය යන ප්‍රත්‍යයන් වශයෙන්දැයි මෙසේ නොයෙක් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

''පවත්මානං සා එකධා පච්චයො මතා'' යනු ආනෙඤ්ජාභිසංඛාරයනට එක්ම ආකාර ඇති උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙතැ'යි දන්නා ලදි. අවිද්‍යාව පිළිබඳ එම උපනිශ්‍රය භාවය පුඤ්ඤාභිසංඛාර විෂයයෙහි කියන ලද නයින්ම දතයුතුය.

මෙහිලා කීහු:- ''කිම, හුදෙක් මේ අවිද්‍යාවම සංස්කාරයනට එක්ම ප්‍රත්‍යය වේද? නැතහොත් අනෙකුදු ප්‍රත්‍යයෝ වෙත්ද? කිම, ඉදින් මෙහි එය (අවිද්‍යාව) එක්ම ප්‍රත්‍යය වෙතොත්, ඒකකාරණ වාදයක් බවට පත්වේ. එහෙයින් අනෙකුදු ප්‍රත්‍යයන් වෙතොත්, 'අවිජ්ජා පච්චයා සංඛාරා' යනු ඒකකාරණ නිර්දේශයක් නොවේද? නොවන්නේ නොවේ, කවර හෙයින්ද යත්:-

එකං න එකතො ඉධ නානෙකමනෙකතො'පි නො එකං
ඵලමත්ථි අත්ථි පන එක හේතුඵල දීපනෙ අත්ථො

මෙහි එක් හේතුවෙකින් එක් ඵලයක් නොවේ. අනේක ඵලද නොවේ, අනේක හේතුවෙන්ද එක් ඵලයක් නොවේ. එහෙත්, එක්ම හේතුවෙකින් එක් ඵලයක් දැක්වීමේ අර්ථයෙක් ඇත.

මෙහි, එක්ම කාරණයෙකින් කිසිදු එක්ම ඵලයෙක් නොවේ. අනේකවූ ඵලයෙක්ද නැත, අනේක වූ හේතුවෙකින් එක්ම ඵලයෙක්ද නැත. අනේකවූ හේතුවෙන් අනේකවූ ඵලයෙක්ම වේ. ඒ එසේමැයි, ඍතුය. පෘථිවිය, බීජය, ජලය යන බහුවිධ හේතූන්ගෙන් අනේක වූම රූප, ගන්ධ රස සහිත අංකුර සංඛ්‍යාතවූ ඵලයන් උපදිනු දක්නා ලැබේ. යම් මේ 'අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං'' යනුවෙන්

ඒක හේතුඵල පරිදීපනයක් කරන ලද්දේද, එහි අර්ථයෙක් ඇත. ප්‍රයෝජනයෙක් ඇත.

භාග්‍යවතුන් වහන්සේ වනාහි, කිසි තැනෙක ප්‍රධානත්‍වය නිසාද, කිසි තැනෙක ප්‍රකටත්‍වය නිසාද, කිසිතැනෙක අසාධාරණත්‍වය (පොදු නොවන බව) නිසාද, දේශනා විලාසය සඳහාද, වෛනෙය ජනයාගේ චරිතස්වභාවයට අනුරූප වන ආකාරයෙන්ද, එක්ම හේතුවක් හෝ ඵලයක් හෝ දක්වති.

'ඵස්ස පච්චයා වෙදනා'' එන මෙහි ප්‍රධානත්‍වය නිසා එක්ම හේතුවක් හා ඵලයක් දෙසූහ. ඵස්සය වනාහි වේදනාවට ප්‍රධාන හේතුවයි. ඵස්සයට අනුව වේදනාවෙහි ස්වභාවය තීරණය වන හෙයිනි; වේදනාවද ඵස්සයෙහි ප්‍රධාන ඵලයයි. වේදනාවට අනුව ස්පර්ශයෙහි ස්වභාවය තීරණය වන හෙයිනි. 'සෙම්හ සමුට්ඨානා ආබාධා'' යන මෙහි ප්‍රකට බැවින් එක් හේතුවක් පැවසූ සේක. මෙහි ප්‍රකට වනුයේ කර්මාදිය නොව සෙමයි. 'යෙ කෙචි භික්ඛවෙ අකුසලා ධම්මා, සබ්බෙ තෙ අයෝනිසො මනසිකාර මූලකා'' යන මෙහි අසාධාරණ (පොදු නොවන) බැවින් එක්ම හේතුවක් දැක්වූ සේක. අකුශලයනට අසාධාරණ (අවශ්‍යයෙන්ම තිබියයුතු හේතුව වනුයේ අයෝනිසෝ මනසිකාරය (නුනුවණින් මෙනෙහි කිරීම) යි, වස්තු ආලම්බන ආදිය හේතු වනුයේ සාධාරණ (පොදු) වශයෙනි.

එහෙයින් මෙහිලා වස්තු, ආලම්බන, සහජාත ධර්ම ආදීවූ තවද සංඛාර හේතූන් විද්‍යමාන වතුදු, මේ අවිද්‍යාව ''අස්සාදානුපස්සිනො තණ්හා පවඩ්ඪති'' (ආස්වාදය අනුව බලන්නහුගේ තෘෂ්ණාව වැඩේ) යනුද, ''අවිජ්ජා සමුදයා ආසව සමුදයො'' (අවිද්‍යාව හේතුකොට ගෙන ආශ්‍රවයන්ගේ පහළ වීම සිදුවේ'') යනුද කියන ලද හෙයින් අන්‍යවූද තෘෂ්ණාදී වූ සංඛාර හේතූනට ප්‍රධාන බැවින් හේතුවේ; ''මහණෙනි, අඥාන තෙමේ අවිද්‍යාවට පත්ව පුණ්‍යාභිසඞ්ඛාරයද රැස් කෙරේ'' යනු ප්‍රකට හේතු වශයෙන්ද, අසාධාරණ හේතු වශයෙන්ද සංඛාරයනට හේතු භාවයෙන් මේ හේතුඵල දැක්වීම පිළිබඳ පරිහාර (විසඳීම්) වචනයෙන් සියලු තන්හි එක් එක් හේතුඵල දීපනයෙහි ප්‍රයෝජනය දතයුතුය.

මෙහිලා (ඇතැමෙක් මෙසේ) කියති:- එසේ වතුදු, ඒකාන්තයෙන්ම අනිෂ්ට ඵලදායක වූ, සාවද්‍ය වූ, අවිද්‍යාව පුණ්‍යාභිසංඛාර අනෙඤ්ජාභි සංඛාරයනට ප්‍රත්‍යය ලෙසින් දැක්වීම කෙසේ නම් යෙදේද? යනු කොසොඹ බීජයෙකින් උක් නො-උපදනේම නොවේද'' යනුවෙනි. (පරිහාරය): ''කෙසේ නොයෙදෙන්නේද? ලෝකයෙහි වනාහි,

විරුද්ධො චාවිරුද්ධො ච සදිසාසදිසො තථා,
ධම්මානං පච්චයො සිද්ධො විපාකා එව තෙ ච න.

ප්‍රත්‍යයසමුත්පන්න ධර්මයනට විරුද්ධ මෙන්ම අවිරුද්ධ වූද, එසේම සදෘශ මෙන්ම අසදෘශවූද ප්‍රත්‍යය සිද්ධ වේ. ඔහු (ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ) විපාකයෝම නොවෙති. එහෙයින් නොයෙදෙන්නේ නොවේ.

ධර්මයන් පිළිබඳ ස්ථාන, ස්වභාව කෘත්‍යාදි වශයෙන් විරුද්ධවූද අවිරුද්ධ වූද ප්‍රත්‍යය ලෝකයෙහි සිද්ධ (විද්‍යමාන) වේ. පූර්ව චිත්තය පශ්චිම චිත්තයට ස්ථාන වශයෙන් විරුද්ධ වූ ප්‍රත්‍යයයි. පළමුව පුහුණු කරන ලද ශිල්පාදිය පසුව පවත්නා ශිල්ප ආදී ක්‍රියාවනටද ස්ථාන වශයෙන් විරුද්ධ ප්‍රත්‍යය වේ; කර්මය (අරූප වූ හෙයින්) රූපයනට ස්වභාව වශයෙන් විරුද්ධ වූ ප්‍රත්‍යයයි. දී ආදියට කිරිද එසේය. චක්ඛු විඤ්ඤාණයට ආලෝකය කෘත්‍ය වශයෙන් විරුද්ධ ප්‍රත්‍යය වේ; ආසව ආදියට සකුරු ආදියද එසේය. චක්ඛු විඤ්ඤාණාදියට චක්ඛු, රූප ආදිය ස්ථාන වශයෙන් අවිරුද්ධ ප්‍රත්‍යයෝ වෙති, පශ්චිම ජවන ආදියට පූර්ව ජවන ආදිය ස්වභාව වශයෙන්ද කෘත්‍ය වශයෙන්ද අවිරුද්ධ ප්‍රත්‍යයෝ වෙති. විරුද්ධ හා අවිරුද්ධ ප්‍රත්‍යයන් සිදුවන ආකාරයෙන්ම සදෘශ හා අසදෘශ ප්‍රත්‍යයෝද සිද්ධ වෙති; සෘතු, ආහාර සංඛ්‍යාත සදෘශ වූම රූපය රූපයට ප්‍රත්‍යය වේ. හැල් බිජුවට ආදිය හැල් අස්වනු ආදියටද එසේය. අසදෘශ වූ රූපය අරූපයට (නාමයට)ද, අරූපය (නාමය) රූපයටද, ප්‍රත්‍යය වේ; ගව-ලොම් හා බැටළු ලොම්ද, ගව අං හා බැටළු අං ද, දී තල පිටි ආදියද (පිළිවෙළින්) කුස තණ, හීතණ, බට, හුණ ආදියටද එසේම අසදෘශප්‍රත්‍යය වේ. යම් ධර්මයනට එකී පූර්වචිත්ත ආදිය විරුද්ධ-අවිරුද්ධ, සදෘශ-අසදෘශ, වශයෙන් ප්‍රත්‍යය වේද, එම ධර්මයෝ එකී (පූර්වචිත්ත ආදී) ධර්මයන්ගේ විපාකයෝම නොවෙති.

මෙසේ මේ අවිද්‍යාව විපාක වශයෙන් ඒකාන්ත අනිෂ්ට ඵල ඇත්තේම, ස්වභාව වශයෙන් සාවද්‍ය වූයේම, මේ සියලු පුඤ්ඤාභිසංඛාරාදීනට අනුරූප වූ පරිදි ස්ථාන කෘත්‍යය, ස්වභාව යන මෙයින් විරුද්ධ හා අවිරුද්ධ ප්‍රත්‍යය වශයෙන්ද, සදෘශ හා අසදෘශ ප්‍රත්‍යය වශයෙන්ද ප්‍රත්‍යය වෙති'යි දතයුතුය. 'යමකුගේ වනාහි දුඃඛාදිය විෂයයෙහි. අවිද්‍යා සංඛ්‍යාත අඥානය (නොදැනීම) ප්‍රහීණ නොවූයේද, හේ තෙමේ පළමු කොට දුඃඛය පිළිබඳවද, පූර්වාන්තාදිය පිළිබඳවද නොදැනීම හේතුකොට ගෙන සංසාර දුඃඛය සුඛසංඥාවෙන් ගෙන, එයට (සංසාර දුඃඛයට) හේතුවූ ත්‍රිවිධවූම සංඛාරයන් අරඹයි'' යන ආදී නයින් අවිද්‍යාව පිළිබඳ ඒ ප්‍රත්‍යය භාවය කියන ලද්දේම වේ. තවද මේ අන් ක්‍රමයෙක්ද වේ:-

චුතූපපාතෙ සංසාරෙ සංඛාරානඤ්ච ලක්ඛණෙ
යො පටිච්චසමුප්පන්න ධම්මෙසු ච විමුය්හති
අභිසඞ්ඛරොති සො එතෙ සංඛාරෙ තිවිධෙ යතො
අවිජ්ජා පච්චයො තෙසං තිවිධානං අයං තතො

චුති උප්පත්ති යන දෙක්හිද, සංසාර විෂයයෙහිද, සංඛාරයන් පිළිබඳ ලක්‍ෂණ විෂයයෙහිද, පටිච්ච සමුප්පන්න ධර්මයන් විෂයයෙහිද, යමෙක් මුළා වේද,

හේ තෙමේ යම් හෙයකින් මේ ත්‍රිවිධවූම සංඛාරයන් රැස් කෙරේද එහෙයින් ඒ ත්‍රිවිධ වූම සංඛාරයනට මේ අවිද්‍යාව ප්‍රත්‍යය වේ.

මෙකී කරුණු විෂයයෙහි මුළාවන තැනැත්තේ කෙසේ නම් මේ ත්‍රිවිධ වූම සංඛාරයන් රැස් කෙරේද යත්:- පළමුව චුති විෂයයෙහි මුළා වූයේ, 'මරණය නම් සියලු තන්හි ස්කන්‍ධයන්ගේ බිඳී යාමයි' යනුවෙන් චුතිය (තත්‍ත්වාකාරයෙන්) නොගෙන, ''සත්‍ත්වයා මැරෙයි, සත්‍ත්වයාගේ දේශාන්තර ගමනය'' යන ආදී වශයෙන් විකල්පනය කරයි.

උත්පත්ති විෂයයෙහි මුළා වූයේ, 'සියලු තන්හි ස්කන්‍ධයන්ගේ පහළවීම ඉපැදීමයි' යනුවෙන් උපපාතය (තත්‍ත්වාකාරයෙන්) නොගෙන, ''සත්‍ත්වයා උපදියි, සත්‍ත්වයාගේ නව සිරුරක් හටගැනීමයි'' යන ආදී වශයෙන් විකල්පනය කරයි.

සංසාර විෂයයෙහි මුළා වූයේ,

ඛන්‍ධානඤ්ච පටිපාටි ධාතු ආයතනානි ච
අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරො'ති පවුච්චති.

ස්කන්‍ධයන්ගේද, ධාතුන්ගේ හා ආයතනයන්ගේද නොසිඳී පැවැත්ම සංසාරයයි කියතු ලැබේ යනුවෙන් මෙසේ විස්තර කරන ලද සංසාරය එසේ නොගෙන, ''මේ සත්‍ත්වයා මෙලොවින් පරලොවට යයි, පරලොවින් මෙලොවට එයි''. යන ආදිය විකල්පනය කරයි.

සංස්කාර ලක්‍ෂණ විෂයයෙහි මුළා වූයේ, සංස්ඛාරයන්ගේ ස්වභාව ලක්‍ෂණයද සාමාන්‍ය ලක්‍ෂණයද (තත්වාකාරයෙන්) නොගෙන, සංස්කාරයන් ආත්ම වශයෙන්ද, ආත්ම ප්‍රතිබද්ධ වශයෙන්ද, ස්ථිර වශයෙන්ද, ශුභවශයෙන්ද, සුඛ වශයෙන්ද විකල්පනය කරයි.

පටිච්ච සමුප්පන්න ධර්ම විෂයයෙහි මුළාවූයේ, අවිජ්ජා ආදීන්ගෙන් සංඛාර ආදීන්ගේ පැවැත්ම නොපිළිගෙන, ආත්ම තෙමේ දනියි. නොහොත් නොදනියි. ආත්ම තෙමේ මෙසේ කරයි. නොහොත් කරවයි. ඒ (ආත්මයම) ප්‍රතිසන්‍ධියෙහිදී උපදියි. එම ආත්මය පිළිබඳ වූ පරමාණු ඊශ්වර ආදීහු කලලාදී වශයෙන් සිරුර සැලසුම් කරමින් ඉන්‍ද්‍රියයන් සම්පාදනය කරති, ඒ ආත්ම තෙමේ ඉන්‍ද්‍රිය සම්පන්න වූයේ ස්පර්ශ කරයි. විඳිනය කරයි. ඇලුම් කරයි. දුඩිව ගනියි, ගැටෙයි. නොහොත් එම ආත්මය යලිත් භවාන්තරයට යෙයි'' යනුවෙන් විකල්පනය කරයි. නැතහොත්, ''සියලු සත්‍ත්වයෝ නියති. සංගතිභාවයෙන් (පෙර පසු නියමය

අනුව හෝ දිව්‍ය, මනුෂ්‍ය ආදි ගති අනුව) පරිණතියට ගියාහුය'' යනුවෙන් විකල්පනය කරයි.

හේ තෙමේ අවිද්‍යාව විසින් අන්ධභාවයට පත්කරන ලද්දුයේ මෙසේ විකල්පනය කරනුයේ, යම්සේ වනාහි අන්ධයෙක් පෙළොව මත හැසිරෙනුයේ, මගටද නොමගටද, ගොඩටද, වලටද, තැන්නටද හෙලටද එළඹේද, එසේම පුඤ්ඤ, අපුඤ්ඤ, ආනෙඤ්ජ යන ත්‍රිවිධ සංඛාරයන් රැස් කරයි. එහෙයින් කියනු ලැබේ.

යථාපි නාම ජච්චන්ධො නරො අපරිනායකො
එකදා යාති මග්ගෙන උම්මග්ගෙනාපි එකදා

සංසාරෙ සංසරං බාලො තථා අපරිනායකො
කරොති එකදා පුඤ්ඤං අපුඤ්ඤම්පි ච එකදා

යදා ච ඤත්වා සො ධම්මං සච්චානි අභිසමෙස්සති
තදා අවිජ්ජූපසමා උපසන්තො චරිස්සතී'ති

යම්සේ උපතින්ම අන්ධ වූ මිනිසෙක් නියමුවකු නැතිව, විටෙක මගද විටෙක නොමගද යන්නේ වේද,

එසේම සසර සැරිසරන බාල තෙමේ නියමුවකු නොමැතිව, විටෙක පින්ද විටෙක පව්ද රැස් කෙරේ.

යම් කලෙක හේ තෙමේ ධර්මය දැන සත්‍යයන් මැනවින් අවබෝධ කෙරේද, එකල අවිද්‍යාව සමනය වීමෙන් උපශාන්ත බවට පත්ව හැසිරෙන්නේය.

මේ ''අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'' යන පදයෙහි විස්තර කථායි.

—//—

''සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං'' යන පදයෙහි:- ''විඤ්ඤාණං'' යනු, සවැදෑරුම් චක්ඛු විඤ්ඤාණ ආදියයි, එහි චක්ඛු විඤ්ඤාණය කුසල විපාකය, අකුසල විපාකයයි දෙවැදෑරුම් වේ. සෝත, ඝාණ, ජිව්හා, කාය විඤ්ඤාණයෝද එසේය. මනෝවිඤ්ඤාණයः කුසල හා අකුසල විපාක වූ මනෝ විඤ්ඤාණ දෙකද, අහේතුක වූ මනෝවිඤ්ඤාණධාතු තුනද, සහේතුක වූ කාමාවචර විපාක සිත් අටද, රූපාවචර සිත් පසද, අරූපාවචර සිත් සතරද්‍ද'යි දෙවිසි වැදෑරුම් වේ. මෙසේ මේ ෂඩ්විඥානයෙන් දෙතිසක්වූ ලෞකික විපාක විඤ්ඤාණ සියල්ලම සංග්‍රහකරන ලදි. එහෙත් ලෝකෝත්තර විපාක විඤ්ඤාණයන් (සංසාර) වට්ටය පිළිබඳ කථාව හා නොසැසඳෙන හෙයින් ඔහු නොගන්නා ලදහ.

මෙහිලා:- මෙකී ප්‍රකාර ඇති විඥ්ඥාණයන් සංකාර ප්‍රත්‍යයයෙන් වෙති'යි කෙසේ දතහැකිද යන චෝදනාව (ප්‍රශ්නය) නැඟිය හැකිය. උපචිත (රැස්කරන ලද) කර්මයක් නැති හෙයින් විපාකයක් නැති හෙයිනි යනු පරිහාරය (විසඳුම)යි. මෙකී (දෙතිස්) විඥ්ඥාණය විපාකයි. විපාකය වනාහි රැස් කළ කර්මයක් නැතිව නොඋපදියි. ඉදින් එසේ උපදිතොත්, සියලුම විඥ්ඥාණයනට සියලුම විපාකයන් ඉපැදිය යුතුය. එසේ නො-උපදනා හෙයින් සංඛාරයන් ප්‍රත්‍යය කොට ගෙන වේ. විඥ්ඥාණය උපදිති'යි යන මේ කාරණය දතයුතුය. කවර නම් සංඛාරයක් ප්‍රත්‍යය වීමෙන් කවර නම් විඥ්ඥාණයක් වන්නේද යත්, පළමු කොට, කාමාවචර පුඤ්ඤාභිසංඛාරයන් ප්‍රත්‍යය වීමෙන් කුසල විපාකවූ චක්ඛු විඥ්ඥාණාදී පසද, මනෝ විඥ්ඥාණයෙහි එක් මනෝධාතුවක්ද මනෝ විඥ්ඥාණ ධාතු දෙකද කාමාවචර මහාවිපාක අටදැයි කුශවිපාකයෝ සොළොසක් වෙති. එහෙයින් කීහු:- ''කාමාවචර වූ කුශල කර්මයක් කරන ලද හෙයින්, රැස් කරන ලද හෙයින්, (එහි) විපාක වූ චක්ඛු විඥ්ඥාණය උපන්නේ වේ. -පෙ- සෝත- ඝාණ, ජිව්හා, කාය විඥ්ඥාණය -පෙ- විපාකවූ මනෝධාතුව උපන්නේ වේ. සෝමනස්ස සහගත මනෝ විඥ්ඥාණ ධාතුව උපන්නේ වේ. උපෙක්ඛා සහගත මනෝවිඥ්ඥාණධාතුව උපන්නේ වේ; සෝමනස්ස සහගත ඥාණසම්පයුත්තය හා සසංඛාර වශයෙන් උපන් සෝමනස්ස සහගත ඥාණ සම්පයුත්තයද, සෝමනස්ස සහගත ඥාණවිප්පයුත්තය හා සසංඛාරික වූ සෝමනස්ස සහගත ඥාණ විප්පයුත්තයද, උපෙක්ඛා සහගත ඥාණ සම්පයුත්තය හා සසංඛාරික වූ උපෙක්ඛා සහගත ඥාණ සම්පයුත්තයද, උපෙක්ඛා සහගත ඥාණ විප්පයුත්තය හා සසංඛාරිකවූ උපෙක්ඛා සහගත ඥාණ විප්පයුත්තයද වේ''.

රූපාවචර පුඤ්ඤාභිසංඛාරයන් ප්‍රත්‍යය වීමෙන් රූපාවචර විපාක පස සිද්ධවේ. යම්සේ කීහුද:- ''එම රූපාවචර කුසලවූ කර්මය කරන ලද හෙයින්, රැස් කරන ලද හෙයින්, කාමයන් කෙරෙන් දුරුව-පෙ- ප්‍රථමධ්‍යානයට -පෙ- පංචමධ්‍යානයට සමවැද විහරණය කෙරේ'' යනු විපාකයි. මෙසේ පුඤ්ඤාභිසංඛාරයන් ප්‍රත්‍යය කොට විසිඑක් වැදෑරුම් විඥ්ඥාණය සිද්ධ වේ.[a]

අපුඤ්ඤාභිසංඛාරයන් ප්‍රත්‍යය කොටගෙන චක්ඛු විඥ්ඥාණාදී වූ අකුසල විපාක පසද, එක් මනෝධාතුවක්ද, එක් මනෝවිඥ්ඥාණ ධාතුවක්ද'යි මෙසේ අකුසල විපාක වූ සත්වැදෑරුම් විඥ්ඥාණය වේ. යම්සේ කීහුද:- ''අකුසලවූ කර්මයක් කරන ලද හෙයින්, රැස්කරන ලද හෙයින්, විපාකවූ චක්ඛු විඥ්ඥාණය උපන්නේ වේ. -පෙ-සෝත-ඝාණ-

a. විභඞ්ගපාළි, පටිච්චසමුප්පාද විභඞ්ග අභිධම්මභාජනීය

ජිව්හා-කාය විඤ්ඤාණය උපන්නේ වේ. විපාකවූ මනෝ ධාතුවද, විපාක වූ මනෝ විඤ්ඤාණ ධාතුවද උපන්නේ වේ.

ආනෙඤ්ජාභිසඞ්ඛාරයන් ප්‍රත්‍යය කොටගෙන අරූප විපාක සතරක් වෙති'යි මෙසේ චතුර්විධවූ විඤ්ඤාණය වේ. යම්සේ කියනලදදා:- ''එම අරූපාවචර කුසල කර්මය කරන ලද හෙයින් රැස් කරන ලද හෙයින්. එහි විපාකය සියලු ආකාරයෙන් රූප සඤ්ඤාවන් ඉක්මවා සිටි හෙයින් -පෙ- ආකාසානඤ්චායතන සඤ්ඤාවෙන් යුත් -පෙ- විඤ්ඤාණඤ්චායතන -පෙ- ආකිඤ්චඤ්ඤායතන -පෙ- නේවසඤ්ඤා නාසඤ්ඤායතන සඤ්ඤා සහගතවූ, සුඛදුඃඛ යන දෙකින් තොර වූ හෙයින්, චතුර්ථ ධ්‍යානයට සමවැද විහරණය කරයි.

මෙසේ සංඛාරයන් ප්‍රත්‍යය කොට ගෙන යම් විඤ්ඤාණයක් වේ නම්, එය දැන, ඉක්බිති එහි පැවැත්ම මෙසේ දත යුතුයි:- මේ සියල්ලම ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි වශයෙන් දෙපරිද්දෙකින් පවතී; එහි, පංච විඤ්ඤාණ දෙකද, මනෝධාතු දෙකද, සෝමනස්ස සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුවදැයි යන මේ තෙළෙස පංච වෝකාර (පංචස්කන්ධ සහිත) භවයෙහි පැවැත්මෙහි පමණක් පවතියි. ඉතිරි එකුන් විස්ස තුන් භවයෙහිම සුදුසු පරිදි ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි දෙක්හිම පවතී. කෙසේද යත්:-

පළමුකොට කුශල විපාක වූ චක්ඛු ආදි විඤ්ඤාණ පස. කුශල හෝ අකුශල විපාකයෙන් ඉපිද අනුක්‍රමයෙන් මුහුකුරා ගිය ඉන්ද්‍රිය ඇත්තහුගේ චක්ඛු ආදී හමුවට පැමිණි ඉෂ්ට වූ හෝ ඉෂ්ට මධ්‍යස්ථවූ රූපාදී අරමුණු ඇරඹූ චක්ඛු ආදී පසාදයන් නිසා (පිළිවෙළින්) දර්ශන-ශ්‍රවණ-ආඝ්‍රාණ-ආස්වාදන-ස්පර්ශන කෘත්‍යයන් සිදු කෙරෙමින් පවතියි; අකුශල විපාක පසද එසේය; හුදෙක් එම අකුශල විපාකයනට අනිෂ්ට වූ හෝ අනිෂ්ට-මධ්‍යස්ථ වූ අරමුණු වන බවම විශේෂයි. මෙකී (කුශල අකුශල විපාක විඤ්ඤාණ) දශයම නියත වූ ද්වාර-ආරම්මණ-වත්‍ථු-ඨානයන් ඇත්තේ නියතවූ කෘත්‍යයන් ඇත්තේම වේ.

ඉක්බිති කුශල විපාකවූ චක්ඛු විඤ්ඤාණ ආදියට අනතුරුව කුශල විපාක සහිත මනෝධාතුව එම (කුශල විපාක සහිත චක්ඛු විඤ්ඤාණ ආදීන්ගේම) අරමුණු ඇරඹ, හෘදය වස්තුව ඇසුරුකොට සම්පටිච්ඡන කෘත්‍යය සිදු කරමින් පවතියි. අකුශල විපාකයනට අනතුරුව අකුශල විපාක මනෝධාතුවද එසේමය. මෙකී (කුශල හා අකුශල මනෝධාතු) දෙක වනාහි අනියත වූ ද්වාර-ආරම්මණ ඇත්තේ, නියතවූ වස්තුස්ථාන ඇත්තේ, නියතවූ කෘත්‍ය ඇත්තේද වේ. සෝමනස්ස සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව වනාහි, කුශල විපාක මනෝධාතුවට අනතුරුව, එම අරමුණම අරබයා, හෘදයවස්තුව ඇසුරු කරමින් සන්තීරණ කෘත්‍යය සිද්ධ කෙරෙමින්ද, ෂඩ්ද්වාරයෙහි බලවත් අරමුණෙහි කාමාවචර

සත්‍වයනට බොහෝ සෙයින් ලෝභ සම්ප්‍රයුක්ත ජවන අවසන්හි භවාංග වීථිය සිඳගෙන ජවනය විසින් ගන්නා ලද අරමුණෙහි තදාලම්බන වශයෙන්ද එක්වරක් හෝ දෙවරක් පවතී යයි මැදුම් සඟි අටුවායෙහි කියනලදී.

අභිධර්ම අටුවායෙහි වනාහි, තදාලම්බනයෙහි චිත්තවාර දෙකක් වෙති'යි සඳහන්ව ඇත. මේ චිත්තය වනාහි 'තදාරම්මණ'ය , 'පිට්ඨිභවඞ්ගය'යි නම් දෙකක් ලබයි; අනියතවූ ද්වාරාලම්බන ඇත්තේ, නියතවූ වස්තු ඇත්තේ, අනියතවූ ස්ථාන හා කෘත්‍ය ඇත්තේද වේ. මෙසේ පළමු තෙළෙස පඤ්චවෝකාර භවය තුළ ප්‍රවෘත්ති (පැවැතුම්) වශයෙන්ම පවත්නේයයි දතයුතුය.

ඉතිරි වූ එකත් විසි විඤ්ඤාණයන් අතුරෙන් කිසිවෙක් තමනට අනුරූපවූ ප්‍රතිසන්‍ධියක් ඇති කල්හි නො-පවත්නේ නොවේ. (පවත්නේ මැයි) පැවැත්මෙහි දී වනාහි පළමුව කුශල-අකුශල විපාක ඇති අහේතුක මනෝ විඤ්ඤාණ ධාතු දෙක පංචද්වාර විෂයයෙහි කුශල-අකුශල විපාක සහිත මනෝධාතුනට අනතුරුව සන්තීරණ කෘත්‍යයද, ෂඩ්ද්වාර විෂයයෙහි පෙර කී නයින්ම තදාරම්මණ කෘත්‍යයද තමන් විසින් දෙන ලද ප්‍රතිසන්‍ධියෙන් මතු, භවාංගය සිඳින චිත්තෝත්පාදයක් නැති කල භවාංග කෘත්‍යයද, අවසන්හි චුති කෘත්‍යයදැයි යන සතර කෘත්‍යයන් සිද්ධ කෙරෙමින් නියත වස්තු ඇතිව, අනියතද්වාර-ආලම්බන-ස්ථාන කෘත්‍ය ඇතිව පවත්නේය.

කාමාවචර සහේතුක සිත් අට කියන ලද නයින්ම ෂඩ්ද්වාරයෙහි තදාලම්බන කෘත්‍යයද, තමන් විසින් දෙන ලද ප්‍රතිසන්‍ධියෙන් මතු භවාංගෝපච්ඡේදක චිත්තෝත්පාදයක් නැති කල්හි භවාංගකෘත්‍යයද, අවසන්හි ච්‍යුති චිත්තයදැ' යන තුන් කිස සිදු කෙරෙමින් නියත වස්තුකව, අනියත ද්වාර-ආලම්බන-ස්ථාන-කෘත්‍ය සහිතව පවතියි.

රූපාවචර සිත් පසද, අරූපාවචර සතරද තමන් විසින් දෙන ලද ප්‍රතිසන්‍ධියෙන් මතු භවාංගෝපච්ඡේදක චිත්තොත්පාදයක් නැති කල්හි භවාංගකෘත්‍යයද, අන්තයෙහි ච්‍යුති කෘත්‍යයද'යි යන දෙකිස ඉටු කෙරෙමින් පවතියි. ඔවුනතුරෙන් රූපාවචර සිත් පස නියත වූ වස්තු හා ආලම්බනද, අනියත වූ ස්ථාන හා කෘත්‍යද ඇත්තේය.

ඉතිරි (අරූපාවචර සතර) නියත අවස්තුකව, නියත ආලම්බන අනියත ස්ථාන-කෘත්‍ය සහිතව පවතියි' යනුවෙන් මෙසේ පළමු කොට දෙතිස්-වැදෑරුම් වූම විඤ්ඤාණය පැවැත්මෙහිදී සංඛාරයන් ප්‍රත්‍යය කොට පවතියි.

එහිදී මේ විඤ්ඤාණයට ඒ ඒ සංඛාරයෝ කර්ම ප්‍රත්‍යය වශයෙන්ද උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද ප්‍රත්‍යය වෙති. ''ඉතිරි එකුන් විසි-

විඤ්ඤාණයන් අතුරෙන් කිසිවෙක් තමනට සුදුසු ප්‍රතිසන්ධියෙකින් නොපවත්තේ නොවේ'' යනුවෙන් යමක් යට කියන ලද්දේද, එය ඉතා සංක්ෂිප්ත වූ හෙයින් පහසුවෙන් නොදතහැකිය. එහෙයින් එහි සවිස්තර නය දක්වනු පිණිස මේ මාතෘකා-ප්‍රශ්න කියනු ලැබේ:- ප්‍රතිසන්ධි කොතෙක්ද? ප්‍රතිසන්ධි සිත් කෙතෙක්ද? කවර නම් සිතෙකින් කොතැනෙක ප්‍රතිසන්ධි වේද? ප්‍රතිසන්ධියට අරමුණ වනුයේ කිමෙක්ද?

අසඤ්ඤසත්ත ප්‍රතිසන්ධියත් සමග ප්‍රතිසන්ධි විස්සෙකි. යටකී පරිදිම ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සෙකි. එහි අකුශල විපාක සහිත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුවෙන් අපායයන්හි ප්‍රතිසන්ධිය වේ. කුශල විපාකසහිත (අහේතුක මනෝ විඤ්ඤාණ ධාතුවෙන්) මිනිස් ලොව, ජාත්‍යන්ධ, ජාතිබධිර, ජාති උම්මත්තක, ජාති එළමුග (උපතින්ම ගොලු). නපුංසක ආදීන්ගේ ප්‍රතිසන්ධිය වේ; සහේතුක කාමාවචර විපාක සිත් අටෙන් දෙවියන් අතරද මනුෂ්‍යයන් අතර පිනැතියන්ගේද ප්‍රතිසන්ධිය වේ. රූපාවචර විපාකසිත් පසින් රූපී බ්‍රහ්මලෝකයෙහිද, ඇරූපාවචර විපාක සිත් සතරින් අරූපී ලෝකයෙහිද ප්‍රතිසන්ධිය වේ. යම් විපාකයෙකින් යම් තැනෙක ප්‍රතිසන්ධි වේද, එයම එයට 'අනුරූප පටිසන්ධි' නම්වේ.

සංක්ෂේපයෙන් වනාහි ප්‍රතිසන්ධියකට අතීතය, ප්‍රත්‍යුත්පන්න (වර්තමාන)ය, නවත්තබ්බ (නොකිව හැකි)යයි අරමුණු තුනෙක් වේ. අසඤ්ඤ ප්‍රතිසන්ධියට අරමුණෙක් නැත. එහි විඤ්ඤාණඤ්චායතන - නේවසඤ්ඤා නාසඤ්ඤායතන ප්‍රතිසන්ධීනට අතීත වූම අරමුණු වේ. කාමාවචර ප්‍රතිසන්ධි දසයට අතීත හෝ ප්‍රත්‍යුත්පන්න අරමුණු වේ. සෙසු (රූපාවචර හා ප්‍රථම, තෘතීය අරූපාවචර) ප්‍රතිසන්ධීනට නවත්තබ්බ අරමුණුම වේ. මෙසේ තුන් අරමුණෙහි පවත්නා ප්‍රතිසන්ධිය යම් හෙයකින් අතීතාරම්මණ හෝ නවත්තබ්බාරම්මණ සහිත චුති චිත්තයට අනතුරුවම පවත්නේ වේද - පච්චුප්පන්න ආරම්මණ සහිත චුතිචිත්තයක් නම් නැත- එහෙයින් (අතීත, නවත්ඛ්බ යන) අරමුණු දෙක අතුරෙන් එකක් අරමුණු කොටගත් චුතියෙන් අනතුරුව තුන් අරමුණින් එක්තරා අරමුණක් සහිත ප්‍රතිසන්ධියෙක්හි සුගති දුර්ගති වශයෙන් පවත්නා ආකාරය දතයුතුය.

කෙසේද යත්:- පළමු කොට කාමාවචර සුගතියෙහි සිටි පාපකාරී පුද්ගලයාහට මරණ මංචකයෙහි හොත් කල, ''තානිස්ස තස්මිං සමයෙ ඔලම්බන්ති'' (ඔහුගේ ඒ (පාපක්‍රියා) එසමයෙහි එල්බගනියි) යනු කී හෙයින් තමා රැස්කර ගත් පාපකර්මයන් හෝ කම් නිමිති හෝ මනෝද්වාරය හමුවට එයි. එය අරබයා උපන් එම අරමුණින් අවසන් වන ජවන වීථියට අනතුරු ඇති භවාංග විෂයය අරමුණු කොට චුතිචිත්තය උපදියි. එය නිරුද්ධවූ විට (මනෝද්වාරය) හමුවට පත් එම කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ඇරබ නොසිඳුණු කෙලෙස් බලයෙන් නැමුණු දුගතිගාමී

ප්‍රතිසන්ධිචිත්තය උපදියි. මේ අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව අතීතාරම්මණ ඇති ප්‍රතිසන්ධියයි.

අනෙකකුහට මරණාවස්ථායෙහිදී කියන ලද ප්‍රකාර ඇති (පාප) කර්මයට අනුව නරකාදියෙහි ගිනිදැල් පැහැය ආදී දුගති නිමිති මනෝද්වාරය හමුවට එයි. එයින් අනතුරුව භවාංගය දෙවරක් ඉපිද පහව ගිය කල එම අරමුණ ඇරබ එක් ආවර්ජන සිතක්ද, මරණයට ආසන්න බැවින් මඳවී ගිය වේග ඇති හෙයින් ජවන් පසක්ද, තදාරම්මණ දෙකක්ද'යි මෙසේ වීථිචිත්ත තුනක් උපදියි. ඉක්බිති භවාංග විෂයය අරමුණු කොට එක් චුතිචිත්තයක් උපදියි; මෙතෙකින් චිත්තක්ෂණ එකොළොසෙක් ඉකුත් වූයේ වේ. ඉක්බිති ඔහුට චිත්තක්ෂණ පසක් වූ ආයුකාලයක් ඉතිරිව තිබියදී එම අරමුණෙහිම ප්‍රතිසන්ධිචිත්තය උපදියි. මේ අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව පච්චුප්පන්නා රම්මණසහිත ප්‍රතිසන්ධියයි.

අනෙකකුහට මරණාවස්ථාවෙහිදී පංචද්වාරයන් අතුරෙන් එක්තරා ද්වාරයෙක්හි රාගාදියට හේතුවූ අරමුණක් (මනෝද්වාරය) හමුවට එයි. ඔහුට අනුපිළිවෙළින් උපන් වොත්ථපන (චිත්තක්ෂණ)ය අවසන්හි, මරණයට ආසන්නවූ බැවින් මඳවූ වේග ඇති හෙයින්, ජවන් පසක්ද තදාරම්මණ දෙකක්ද උපදියි. ඉක්බිති භවාංග විෂයය අරමුණු කොට එක් චුති චිත්තයක්ද'යි මෙතෙකින් භවාංග සිත් දෙකය. ආවර්ජනය, දර්ශන (චක්ඛු විඤ්ඤාණ)ය, සම්පටිච්ඡනය, සන්තීරණය, වොත්ථපනය, ජවන් සිත් පසය, තදාරම්මණ දෙකය, චුති චිත්තයයි යන චිත්තක්ෂණ පසළොසක් ඉකුත් වූයේ වේ. ඉක්බිති එක් චිත්තක්ක්ෂණයක් ආයුෂ ඉතිරීව තිබියදී එම අරමුණෙහිම ප්‍රතිසන්ධි චිත්තය උපදියි. මෙයද අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව පච්චුප්පන්න ආරම්මණ ඇති ප්‍රතිසන්ධියයි.

මේ පළමු කොට, අතීතාරම්මණ ඇති සුගති චුතියට අනතුරුව අතීත-පච්චුප්පන්න ආරම්මණ සහිත දුගති ප්‍රතිසන්ධිය පවත්නා ආකාරයයි.

සුගතියෙහි සිටි, නිරවද්‍ය කර්මයන් රැස් කළහුහට, ''තානිස්ස තස්මිං සමයෙ ඔලම්බන්ති'' (ඕහට එකල්හි කුශල කර්මයෝ එලබෙති) යන ආදී කී හෙයින් මරණ මංචකයෙහි වැද හොත්තහු ඉදිරිපිට තමා රැස් කරගත් කුශල කර්මය හෝ එම කර්මය පිළිබඳ නිමිති හෝ මනෝද්වාරය හමුවට එයි. එය එසේ වනුයේ කාමාවචර කුශල කර්මයන් රැස් කරගත්තහුටමය. මහද්ගත කර්මයන් රැස් කරගත්හුට වනාහි කර්ම නිමිත්තම (මනෝද්වාර) හමුවට පැමිණෙයි. එම (කර්මනිමිත්තම) අරබයා උපන් තදාරම්මණ අවසානයෙහි වූ හෝ ශුද්ධවූ ජවන වීථියට අනතුරුව භවාංග විෂය අරමුණු කොට චුති චිත්තය උපදියි. එය පහව ගිය කල ආපාථගත වූ එම කර්මයම හෝ කර්මනිමිත්ත හෝ අරබයා, නොසිඳී පවත්නා කෙලෙස් බලයෙන් නැමුණු සුගතිගාමී වූ ප්‍රතිසන්ධි චිත්තය උපදියි.

මේ අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව අතීතාරම්මණ හෝ නවත්තබ්බාරම්මණ සහිත ප්‍රතිසන්ධියයි.

අනෙකකුහට මරණාවස්ථායෙහිදී කාමාවචර නිරවද්‍ය කර්මවශයෙන් මනුෂ්‍යලෝකය පිළිබඳවූ මාතෘකුක්ෂි වර්ණ සංඛ්‍යාතවූ හෝ දිව්‍ය ලෝකයට අයත් උද්‍යාන, විමාන, කල්පවෘක්ෂ ආදී වර්ණ සංඛ්‍යාතවූ හෝ සුගති නිමිති මනෝද්වාරය හමුවට එයි. ඕහට, දුගති නිමිති පිළිබඳව (ඉහත) දක්වන ලද පිළිවෙළින්ම චුති චිත්තයට අනතුරුව ප්‍රතිසන්ධි චිත්තය උපදියි.

මේ අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව පච්චුප්පන්නාරම්මණ සහිත ප්‍රතිසන්ධියයි.

අනෙකකුහට මරණාවස්ථාවෙහිදී, ඥාතීහු (පැමිණ) ''දරුව. ඔබ වෙනුවෙන් මේ බුද්ධපූජාව කරනු ලැබේ. සිත පහදවා ගනු යැ''යි කියා මල්දම් පතාක ආදී වශයෙන් රූපාරම්මණයන් හෝ ධර්මශ්‍රවණ, තූර්යපූජාදී වශයෙන් සද්දාරම්මණයන් හෝ, සුවඳ දුම් සුවඳ පැන් ආදී වශයෙන් ගන්ධාරම්මණයන් හෝ දරුව, මෙය රස විඳිනු පිණිසය. මේ ඔබ වෙනුවෙන් දෙනු ලබන දාන වස්තුය''යි කියා මී පැණි ආදී රසාරම්මණයන් හෝ ''දරුව, මේ පහස විඳිනු පිණිසය, ඔබ වෙනුවෙන් පුදනු ලබන දෙය්‍යධර්මය''යි පවසා චීන පට, සෝමාර පට ආදිවූ ඵොට්ඨබ්බාරම්මණයන් හෝ මෙසේ පංචද්වාරයන් වෙත එළවත්ද, එවිට ඔහුට ඒ රූපාදී අරමුණු ආපාථගත වීමෙන් අනුපිළිවෙළින් උපන් වොත්ථපන චිත්තය අවසන්හි මරණය ආසන්නව සිටීමෙන් මඳ වී ගිය වේග ඇති හෙයින් ජවන් සිත් පසක්ද, තදාරම්මණ සිත් දෙකක්ද උපදියි, ඉක්බිති භවාංග විෂය අරමුණු කොට එක් චුති චිත්තයක්ද, එය අවසන්හි එම චිත්තක්ෂණයෙහි සිටි එම අරමුණෙහිම ප්‍රතිසන්ධි චිත්තය උපදියි.

මෙයද අතීතාරම්මණ සහිත චුතියට අනතුරුව පච්චුප්පන්නාරම්මණ සහිත ප්‍රතිසන්ධියයි.

අනෙකෙකුහට වනාහි පඨවි කසිණ ධ්‍යාන ආදී වශයෙන් මහද්ගත කුශල සහිත සුගතියෙහි සිටීමෙන් මරණාවස්ථාවෙහිදී, කාමාවචර කුශල කර්ම, එම කර්ම නිමිති, එම ගති නිමිති යන මෙයින් එකක් හෝ, පඨවි කසිණාදියෙන් එක් නිමිත්තක් හෝ මහද්ගත චිත්තයක් හෝ මනෝද්වාරය හමුවට එයි. නැතහොත්, චක්ඛු-සෝත ආදියෙන් එකක් තුළ කුසල් ඉපදීමට හේතුවූ ප්‍රණීත අරමුණක් ආපාථගත වෙයි. ඔහුට අනුපිළිවෙළින් උපන් වොත්ථපන චිත්තය අවසන්හි මරණය ආසන්නව සිටීමෙන් මඳ වීගිය වේග ඇති හෙයින් ජවන් සිත් පසෙක් උපදියි. මහග්ගත ගතිකයනට වනාහි තදාරම්මණයෙක් නැති. එහෙයින් ජවනයනට අනතුරුවම භවංග විෂයය අරමුණු කොට එක් චුතිචිත්තයෙක් උපදියි. එය අවසන්හි

කාමාවචර, මහද්ගත යන සුගතීන් අතුරෙන් එකක් වෙතට නැඹුරුව එළඹ සිටි අරමුණු අතුරෙන් එක්තරා අරමුණක් සහිත ප්‍රතිසන්‍ධි චිත්තය උපදියි.

මේ නවත්තබ්බාරම්මණ ඇති සුගතිචුතියට අනතුරුව අතීත, පච්චුප්පන්න, නවත්තබ්බ යන ආරම්මණයන් අතුරෙන් එකක් අරමුණු කොට ගත් ප්‍රතිසන්‍ධියයි.

මේ අනුසාරයෙන්ම අරූප චුතියට අනතුරුව සිදු වන ප්‍රතිසන්‍ධියද දතයුතුය. මේ අතීත හා නවත්තබ්බ ආරම්මණ සහිත සුගති චුතියට අනතුරුව අතීත, නවත්තබ්බ හා පච්චුප්පන්න ආරම්මණ සහිත ප්‍රතිසන්‍ධිය පවත්නා ආකාරයයි.

දුගතයෙහි සිටි, පාපකාරී පුද්ගලයාහට වනාහි, මෙකී නයින්ම ඔහුගේ ඒ පාපක්‍රියාවක් හෝ කර්ම නිමිති, ගති නිමිති ආදී කිසිවක් හෝ මනෝද්වාරයෙහි අපාථගත වේද, නැතහොත් පංචද්වාරයෙහි අකුසල් හට ගැනීමට හේතුවූ අරමුණක් ආපාථගත වේද, එවිට ඔහුට අනුපිළිවෙළින් ආ චුතිචිත්තය අවසන්හි එම අරමුණු අතුරෙන් දුගතියට පමුණුවන එක් අරමුණක් සහිත ප්‍රතිසන්‍ධි චිත්තය උපදියි.

මේ අතීතාරම්මණ සහිත දුගතිචුතිය පවත්නා ආකාරයයි.

මෙතෙකින් එකුන්විසි ආකාර ඇති විඤ්ඤාණය ප්‍රතිසන්‍ධි වශයෙන් පවත්නා ආකාරය ප්‍රකාශ කරන ලද්දේ වේ. ඒ සියල්ල මෙසේයි:-

පවත්තමානං සන්‍ධිම්හි ද්වෙධා කම්මෙන වත්තති,
මිස්සාදීහිච භෙදෙහි භෙදො'ස්ස දුවිධාදිකො

ප්‍රතිසන්‍ධියෙහි පවත්නා (විපාක විඤ්ඤාණය) කර්මවශයෙන් දෙපරිද්දෙකින් පවත්නේය. තවද මිශ්‍ර වීම ආදී භේද වශයෙන් මෙහි ද්විවිධාදී වූ භේදයද වේ.

මේ එකුන්විසි වැදෑරුම් විපාක විඤ්ඤාණය ප්‍රතිසන්‍ධියෙහි පවත්නා විට කර්ම වශයෙන් දෙපරිද්දෙකින් පවතියි. (කෙනකු විසින්) කරන ලද කර්මයට අනුරූපව විපාක උපදවන කර්මය නානාක්‍ෂණික කර්ම ප්‍රත්‍යය වශයෙන්ද, උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්ද ප්‍රත්‍යය වේ. කියන ලද මැයි:- ''කුසලාකුසලං කම්මං විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො''ති (කුසල අකුශල කර්මය විපාකයට උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ) යනුයි. මෙසේ පවත්නා මේ විපාක විඤ්ඤාණය රූපය හා සමග මිශ්‍ර වීම් ආදී භේදයෙන් ද්විවිධාදීවූ භේදයද දතයුතුය. ඒ මෙසේයි:- ''මේ විපාක විඤ්ඤාණය ප්‍රතිසන්‍ධි වශයෙන් ඒකවිධව පවත්නේ නමුදු රූපය සමග මිශ්‍ර හෝ අමිශ්‍ර වීමේ භේදයෙන් ද්විවිධ වේ. කාම, රූප, හා අරූප භේද වශයෙන් ත්‍රිවිධ වේ. අණ්ඩජය, ජලාබුජය, සංසේදජය,

ඕපපාතිකය යන යෝනි වශයෙන් චතුර්විධ වේ. ගති වශයෙන් පංචවිධ වේ. විඤ්ඤාණට්ඨිති වශයෙන් සප්තවිධ වේ. සත්ත්වාවාස වශයෙන් අෂ්ටවිධ වේ. එහි:-

මිස්සං ද්විධා භාවභෙදා සභාවා තත්ථ ච ද්විධා
ද්වෙ වා තයො වා දසකා ඔමතො ආදිනා සහ

රූප මිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණය භාව භේදයෙන් (ස්ත්‍රි හෝ පුරුෂ භාවය ඇතිව හෝ නැතිව)ද්විවිධ වේ. මුලින් සඳහන් (රූප මිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණය) සමග යටත් පිරිසෙයින් දශක දෙකක් හෝ තුනක් වේ.

''මිස්සං ද්විධා භාවභේදා'' යනු, මෙහි, අරූප භවයෙහි යම් මේ රූපමිශ්‍ර ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් උපදීද, එය රූපභවයෙහිදී ස්ත්‍රීන්ද්‍රිය - පුරුෂේන්ද්‍රිය භාවයෙන් තොරව උපදනා හෙයින්ද, කාමභවයෙහිදී ජාතිනපුංසක ප්‍රතිසන්ධිය හැර (ස්ත්‍රි-පුරුෂ) භාවය ඇතිවම උපදනා හෙයින්ද, සභාව (භාව සහිත)ය, අභාව (භාව රහිතය)යයි ද්විවිධ වේ. ''සභාවං තත්ථ ද්විධා'' යනු, එහිද, 'සභා' නම් යමක් වේද, එයද ස්ත්‍රී-පුරුෂ භාවයන් අතුරෙන් එක් භාවයක් සහිතව උපදනා හෙයින් එයද නැවත ද්විවිධ වේ. ''ද්වෙ වා තයො වා දසකා ඔමතො ආදිනා සහ'' යනු, මෙහි යම් මේ මිශ්‍රය, අමිශ්‍රය යන දෙකින් මුලින් සඳහන් රූපමිශ්‍ර වූ ප්‍රතිසන්ධි විඤ්ඤාණයක් වේද, එය හා සමග යටත් පිරිසෙයින් වස්තු-කාය වශයෙන් දශක හෝ, වස්තු-කාය-භාව දශක වශයෙන් තුනක් හෝ උපදියි. මෙයට අධික රූපපරිහාණියෙක් නැති (අඩුවීමෙක් නැත).

මෙසේ ඒ අවම රූපපරිමාණය අණ්ඩජය, ජලාබුජය යන දෙ-යෝනියෙහි උපදනා විට, එදා උපන් (එළු පොච්චකුගේ) එක් රෝමයෙක කොණෙකින් නඟාගත හැකි ගිතෙල් පොදක් තරම් ඇතිව, 'කලලය'යි යන නමක් ලබා උපදියි. එහි යෝනීන්ගේ සම්භව භේදය ගති වශයෙන් දතයුතුය; මේ යෝනීන් කෙරෙහි:-

නිරයෙ භුම්මවජ්ජෙසු දෙවෙසු ච න යොනියො
තිස්සො පුරිමකා හොන්ති චතස්සො'පි ගතිත්තයෙ

නිරයෙහිද, භූම්‍යස්ත දෙවියන් හැර සෙසු දෙවියන් කෙරෙහිද පළමු යෝනි තුන නොවේ; (ඕපපාතික යෝනියමවේ) සෙසු තුන් ගතියෙහි යෝනි සතරම වේ.

එහි ''දෙවෙසු ච''යි යන මෙහි ච-ශබ්දයෙන්, නිරයෙහි හා බූමාටු දෙවියන් හැර සෙසු දෙවියන් කෙරෙහි මෙන්ම, නිජ්ඣාමතණ්හික නම් ප්‍රේත නිකායෙහිද පළමු යෝනි තුන නොවෙති'යි දතයුතුය. සෙසු තිර්යක්, ප්‍රේත, මනුෂ්‍ය යන තුන්ගතියෙහිද පළමු නිෂේධ කළ බූමාටු දෙවියන් කෙරෙහිද යෝනි සතරම වේ. එහි:-

තිංස නව චෙව රූපීසු සත්තති උක්කංසතො'ථ රූපානි,
සංසේදූපපාත යොනිසු අථවා අවකංසතො තිංස

රූපීන් කෙරෙහි තිසකුත් නවයක්ද, උපරිම වශයෙන් සැත්තෑවක්ද රූප වේ. නොහොත් සංසේදජය, ඕපපාතිකය යන යෝනි දෙක්හි අවම වශයෙන් තිසක් වේ.

පළමු කොට ඕපපාතික යෝනි ඇති රූපී බ්‍රහ්මයන් කෙරෙහි චක්ඛු, සෝත, වත්‍ථු දසකයන්ගේ හා ජීවිත නවක (ජීවිතය නවවැන්න කොට ඇති) රූපකලාපයන්ගේදැයි යන මේ චතුෂ්කලාපයන්ගේ වශයෙන් (තිසකුත් නවයක්දැයි) රූප තිස් නවයක් ප්‍රතිසන්‍ධි විඤ්ඤාණය හා සමග උපදියි. රූපී බ්‍රහ්මයන් හැර අන්‍යවූ සංසේදජ, ඕපපාතික යෝනීන් කෙරෙහි උඩත් පිරිසෙයින් චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, වත්‍ථු, භාව යන දශකයන්ගේ වශයෙන් සැත්තෑවක් උපදියි. එම සැත්තෑව දෙවියන් කෙරෙහි නිත්‍යයෙන් වේ. එහි වණ්ණ. ගන්‍ධ, රස, ඕජා යන සතරද, ධාතූන් සතරද, චක්ඛුප්පසාදයද, ජීවිතයදැයි යන මේ දශයෙන් පරිමිත රූප සමූහය චක්ඛු දසක නම්. සෙසු දසකද මෙනයින් දතයුතුයි.

ජාත්‍යන්‍ධය, ජාතිබධිරය අඝාණකය, නපුංසකය යන මොවුන් කෙරෙහි අවම වශයෙන් ජිව්හා, කාය, වත්‍ථු දසකයන් වශයෙන් රූප තිසක් උපදියි. උපරිම හා අවම රූපීන් අතර විකල්පය අනුරූප වූ පරිදි දතයුතුය. මෙසේ දැන යලිදු:-

ඛන්‍ධාරම්මණ ගති හෙතු වෙදනා පීති විතක්ක විචාරෙහි
භෙදාභෙද විසෙසො චුතිසන්‍ධීනං පරිඤ්ඤෙය්‍යො

ඛන්‍ධ-ආරම්මණ-ගති-හේතු-වේදනා-පීති-විතක්ක-විචාර යන මොවුන්ගේ වශයෙන් චුති-පටිසන්‍ධීන් පිළිබඳ (මිශ්‍ර, අමිශ්‍ර) භේදාභේද විශේෂය දතයුතුය.

යම් මේ මිශ්‍ර-අමිශ්‍ර වශයෙන් ද්විවිධ වූ ප්‍රතිසන්‍ධියක් වේද, එසේම එයට අතීතානන්තරවූ (පෙරාතුව සිදුවූ) චුතියක් වේද, යන මේ දෙකෙහි භේද අභේද විශේෂය මේ ස්කන්‍ධාදිය අනුව දතයුතුය යන අර්ථයි. කෙසේද යත්:-

ඇතැම් විටෙක (රූපස්කන්‍ධය හැර) ස්කන්‍ධ සතරින් යුත් අරූප චුතියට අනතුරුව අරමුණු වශයෙන්ද නොවෙනස් ස්කන්‍ධ සතරින්ම යුත්, ප්‍රතිසන්‍ධිය වේ; ඇතැම් විටෙක, මහද්ගත නොවූ බාහිර අරමුණු සහිත චුතියෙන් අනතුරුව, මහද්ගතවූ අභ්‍යන්තර අරමුණු සහිත ප්‍රතිසන්‍ධිය වේ; මේ වනාහි පළමු කොට අරූප ලෝකවලම සිදුවන ක්‍රමයයි.

ඇතැම් විටෙක වනාහි ස්කන්ධසතරින් යුත් අරූපච්‍යුතියට අනතුරුව ස්කන්ධ පසම ඇති කාමාවචර ප්‍රතිසන්ධිය වේ. ඇතැම් විටෙක ස්කන්ධ පසින් යුත් කාමාවචර චුතියට හෝ රූපාවචර චුතියට අනතුරුව ස්කන්ධ සතරින් යුත් අරූපාවචර ප්‍රතිසන්ධිය වේ.

මෙසේ අතීත ආලම්බන සහිත චුතියට අනතුරුව අතීත-නවත්තබ්බ-පච්චුප්පන්න ආලම්බන සහිත ප්‍රතිසන්ධිය වේ; ඒකාන්ත සුගති චුතියට අනතුරුව ඒකාන්ත දුර්ගති ප්‍රතිසන්ධියද, අහේතුක චුතියට අනතුරුව සහේතුක ප්‍රතිසන්ධියද, ද්විහේතුක චුතියට අනතුරුව ත්‍රිහේතුක ප්‍රතිසන්ධියද. උපේක්ෂා සහගත චුතියට අනතුරුව සෝමනස්ස සහගත ප්‍රතිසන්ධියද, අප්‍රීතික චුතියට අතුරුව සප්‍රීතික ප්‍රතිසන්ධියද, අවිතර්ක චුතියට අනතුරුව සෝමනස්ස සහගත ප්‍රතිසන්ධියද, අප්‍රීතික චුතියට අනතුරුව සප්‍රීතික ප්‍රතිසන්ධියද, අවිතර්ක චුතියට අනතුරුව සවිතර්ක ප්‍රතිසන්ධියද, අවිචාර චුතියට අනතුරුව සවිචාර ප්‍රතිසන්ධියද, අවිතර්ක අවිචාර චුතියට අනතුරුව සවිතර්ක සවිචාර ප්‍රතිසන්ධියදැයි මෙසේ එකිනෙකට විපරීත වශයෙන්ද යෝග්‍ය වන පරිදි යෙදිය යුතුය.

ලද්ධපච්චයමිති ධම්මමත්තමෙතං භවන්තරමුපෙති,
නාස්ස තතො සඞ්කන්ති න තතො හෙතුං විනා හොති

මෙසේ ලද ප්‍රත්‍යය ඇති මේ ධර්මමාත්‍රය භවාන්තරයට යෙයි, එහි (එම ධර්මමාත්‍රයෙහි) ඔබින් සංක්‍රමණයක් නොවේ. හේතුවෙකින් තොරව එසේ නොවේ.

මෙසේ අතීත භවයෙන් ප්‍රත්‍යය ලැබ උපදින රූපාරූප ධර්මමාත්‍රය භවාන්තරයට යෙති'යි කියනු ලැබේ; සත්වයෙක් හෝ ජීවියෙක් (භවාන්තරගත) නොවේ. එම ධර්මමාත්‍රයෙහිද අතීත භවයෙන් මේ භවයට සංක්‍රමණයෙක් නොවේ; හේතුවක් නොමැතිව මෙහි පහළ වීමෙක්ද නැත.

මේ කරුණ (වඩාත්) ප්‍රකට වූ මනුෂ්‍ය චුති ප්‍රතිසන්ධි ක්‍රමයෙන් ප්‍රකාශ කරන්නෙමු:- අතීත භවයෙහි දී ස්වාභාවිකව හෝ උපක්‍රම හේතුවෙන් මරණාසන්නව සිටියකුගේ සියලු අංගප්‍රත්‍යංග සන්ධි බන්ධනයන් සිඳලන සුලු මාරාන්තික වේදනා නමැති ශාස්ත්‍රයන්ගේ එක්තැන් වීම නො-ඉවසිය හැකි වූවකුගේ ශරීරය, අව්වෙහි ලූ හරිතවර්ණ වූ තල්පතක් සෙයින් ක්‍රමයෙන් වියළී යන කල්හි, චක්ඛු ආදී ඉන්ද්‍රියයන් නිරුද්ධව ගිය පසු, කායින්ද්‍රිය, මනින්ද්‍රිය, ජීවිතින්ද්‍රියයන් හෘදය වස්තු මාත්‍රයෙහි පිහිටි කල්හි, එකෙණෙහි හෘදය වස්තුව ඇසුරුකොට ශේෂවූ විඤ්ඤාණය, (ආනන්තරිය ආදී) ගරුකම්ම, සමාසේවිත (ආචිණ්ණ) කම්ම, ආසන්න කම්ම, පුරාකෘත (අපරාපරිය වේදනීය) කම්ම යන මොවුනතුරෙන්, ලබන ලද (අවිද්‍යා ආදී) අවශේෂ ප්‍රත්‍යය ඇති, සංඛාර සංඛ්‍යාත වූ එක්තරා

කර්මයක් හෝ, එම කර්මය විසින් එළවන ලද කම්මනිමිත්ත, ගති නිමිත්ත සංඛ්‍යාත විෂයයක් හෝ ඇරබ පවතියි. මෙසේ පවත්නා එම (ප්‍රතිසන්ධි) විඤ්ඤාණය, ප්‍රහීණ නොකළ තෘෂ්ණා අවිද්‍යාදිය ඇති හෙයින්, අවිද්‍යාවෙන් වැසුණු ආදීනව සහිත එම විෂයය වෙතට තෘෂ්ණාව විසින් නැඹුරු කරවනු ලබයි. සහජාත සංඛාරයන් විසින් එහි හෙලනු ලබයි. එම ප්‍රතිසන්ධි විඤ්ඤාණය තෘෂ්ණාව විසින් සන්තති වශයෙන් නමනු ලබමින්, සංඛාරයන් විසින් හෙලනු ලබමින් මෙතෙර ගසෙක බැඳි කඹයෙක එල්බ ඇළෙකින් එතෙර වන්නකු සෙයින් පූර්ව භවය හා සමග බැඳුණු නිශ්‍රය වස්තූන් හැර දමයි, කර්මය විසින් පිහිටුවන ලද පශ්චිම භවය පිළිබඳ නිශ්‍රය වස්තූන් ආස්වාදකෙරෙමින් හෝ නොකෙරෙමින් හෝ ආලම්බනාදී වූ ප්‍රත්‍යයන් හා සමගම පවතියි; මෙහි පූර්ව චිත්තය ගිලිහෙන (චවනතො) හෙයින් 'චුති' නම්වේ. පශ්චිමය භවාන්තරාදිය හා සමග ගලපන (පටිසන්ධානතො) හෙයින් 'පටිසන්ධි' යයි කියනු ලැබේ. එම ප්‍රති-සන්ධිය පූර්වභවයෙන් මෙහි ආයේ නොවේ. කර්ම සංස්කාරයන් ගේ නැමීම් වශයෙන් පැවති විෂය ආදී හේතුවෙකින් තොරව එම භවයෙන් මෙහි පහළ වූයේද නොවෙති'යි දතයුතුය.

> සියුං නිදස්සනානෙත්ථ පටිඝොසාදිකා අථ,
> සන්තාන බද්ධතො නත්ථි එකතා නාපි නානතා

මෙහිලා පටිඝොස (ප්‍රතිරාව) ආදී නිදසුන් ඇත. සන්තති (චිත්ත පරම්පරා) වශයෙන් බැඳී ඇති හෙයින් මෙහි ඒකත්වයක් හෝ නානත්වයක් නැත.

තවද මෙම විඤ්ඤාණය පූර්ව භවයෙන් මෙහි නොඑන බවටද, අතීත භවය කරා දිවෙන හේතූන්ගෙන් එහි උපත වන බවටද ප්‍රතිරාව, ප්‍රදීප, මුද්‍රා, ප්‍රතිබිම්බ ආදිය නිදසුන් වේ. යම්සේ වනාහි ප්‍රතිරාව, ප්‍රදීප, මුද්‍රා ඡායාආදිය ශබ්දආදිය හේතු කොට සිදුවේද, අන් තැනෙක නොගොසින්ම (තුබූ තැනම තිබියදීම), සිදු වේද, මේ සිතද එසේමය.

තවද මෙහි සන්තාන බද්ධතාහේතුවෙන් එකත්වයෙක් නැත. නානත්වයෙක්ද නැත. ඉදින් සන්තාන බද්ධතාව ඇතිකල ඒකාන්ත ඒකත්වයක් වෙතොත්, කිරෙන් දී හටගැනීමෙක් නොවන්නේය, තවද? ඒකාන්ත නානත්වයක් වෙතොත් කිරට දී පිළිබඳ සබඳතාවක් නොවන්නේය. හේතු සමුත්පන්න වූ සියලු වස්තූන් පිළිබඳව මෙම නයයි. එසේ වූ කල්හි සියලු ලෝක ව්‍යවහාරය ලොප් වන්නේය; එයද අනිෂ්ටය. එහෙයින් මෙහිලා ඒකාන්ත ඒකත්වයට හෝ ඒකාන්ත නානත්වයට නො-එළඹිය යුතුය.

මෙහිලා මෙවන් චෝදනාවක් (ප්‍රශ්නයක්) නැඟියහැකියः- ''මෙසේ සංක්‍රමණයෙන් තොර පහළ වීමක් ඇතොත් මේ මනුෂ්‍යාත්මභාවයෙහිදී පැවැති ස්කන්ධයන් නිරුද්ධ වන හෙයින් ඵලයට හේතුවූ ප්‍රත්‍යය වූ කර්මයද එහි නොයන හෙයින් එම ඵලය එකකුගෙන් අනෙකකුට යාහැකිය; අනුභව කරන්නකු නැති කල කවරකු වෙත එම ඵලය යන්නේද? එහෙයින් මේ විධානය යෝග්‍ය නොවන්නේ නොවේද?'' යනුවෙනි. එහිලා මේ පරිහාරය (විසඳීම) කියනු ලැබේः-

> සන්තානෙ යං ඵලං එතං නාඤ්ඤස්ස න ච අඤ්ඤතො
> බීජානං අභිසංඛාරො එතස්සත්ථස්ස සාධකො

(ප්‍රතිසන්ධි විඤ්ඤාණාදීවූ) සන්තතියෙහි යම් (කර්ම) ඵලයක් වෙතොත්, එය එකකුගෙන් අනෙකකුට නොවන්නේය. බීජයන් පිළිබඳ සංස්කාරය (සැකසීම) මෙම කාරණයට සාධක (නිදසුන්) වේ. එක් සන්තතියෙක්හි උපදනා ඵලය පිළිබඳව ඒකාන්ත ඒකත්වය මෙන්ම ඒකාන්ත නානත්වයද ප්‍රතිෂේධ කළ හෙයින් එය අනෙකෙකුහට හෝ අනෙකෙකුගෙන් හෝ වෙතැ'යි යන මෙය සිද්ධ නොවේ; මේ කරුණට බීජසංස්කාරය සාධක වේ. අඹ ඇට ආදිය මැනවින් (පොහොර යෙදීම් ආදියෙන් සකස් කොට) රෝපණය කළ කල්හි එම බිජුවට පරපුරෙන් ලද ප්‍රත්‍යයෙන් කාලාන්තරයෙන් උපදනා ඵලවිශේෂය අනෙක් බීජයකට කළ අනෙක් අභිසංස්කාරයක් නිසා උපදනේ නොවේ. එම අභිසංස්කාරය හේතු කොට එම බීජයෙන්ම පල බවට පත්වන්නේද නොවේ. මේ ආකාරයෙන් මෙම කරුණ දතයුතුය. ළදරු ශරීරය වෙත යොදන ලද විද්‍යා, ශිල්ප, ඖෂධ ආදියද කල් යාම්දී වැඩීගිය ශරීරය තුළ පල දෙති'යි මෙසේ මේ කාරණය දතයුතුය.

අනුභව කරන්නකු නැති කල එම ඵලය කවරකුහට වන්නේදැ'යි යමක් කියන ලද්දේද, එහිः-

> ඵලස්සුප්පත්තියා එව සිද්ධා භුඤ්ජක සම්මුති,
> ඵලුප්පාදෙන රුක්ඛස්ස යථා 'ඵලති' සම්මුති.

ඵලය ඉපැදීමෙන්ම භොජක (බුදින්නකු) යකු ඇතැ'යි යන සම්මුතිය සිද්ධයි. ගසක් පල දැරීමෙන් 'ඵලති' (පලදෙති'යි) යන සම්මුතිය වන්නා මෙනි.

යම්සේ වනාහි 'වෘක්ෂ'යයි සම්මත ධර්මයන්ගේ එක් කොටසක් වන පල හටගැනීමත් සමගම ගස පල දරති'යි නොහොත් පීදෙති'යි කියනු ලැබේද, එසේම 'දෙවියෝ'ය, 'මනුෂ්‍යයෝ'යයි කියනු ලබන, ස්කන්ධයන්ගේ ඒකදේශයක්වූ උපභෝග සංඛ්‍යාත 'සුඛ-දුඃඛ ඵලයාගේ ඉපැදීමෙන්ම දෙවියෙක් නොහොත් මිනිසෙක් (සැප) අනුභව කෙරේයි'යි,

නැතහොත් සැපතට හෝ දුකට පත් වූයේය'යි කියනු ලැබේද; එසේ හෙයින් මෙහිලා අන්කිසි උපභුඤ්ජකයකු (වළඳන්නකු)ගෙන් ප්‍රයෝජනයෙක් නැත.

යමකු වනාහි, ''එසේ වතොත්, මේ සංඛාරයෝ විද්‍යමානව ඵලයට ප්‍රත්‍යය වන්නාහුද? නැතහොත් අවිද්‍යමානව එසේ වන්නාහුද? ඉදින් විද්‍යමානව එසේ වතොත් ප්‍රවෘත්තික්‍ෂණයෙහි පවත්නා කෙණෙහිම සංඛාරයන්ගේ විපාක පහළ විය යුතුය. අවිද්‍යමානව එසේ වතොත්, පැවැත්මට පෙරාතුවද, පසුවද නිරතුරුවම විපාක ගෙන දිය යුතුය''යි කියතහොත්, ඔහුට මෙසේ කිවයුතුයඃ-

කතත්තා පච්චයා එතෙ නච නිච්චං ඵලාවහා
පාටිභොගාදිකං තත්‍ථ වෙදිතබ්බං නිදස්සනං

මේ සංඛාරයෝ කරන ලද හෙයින්ම ඵලයනට ප්‍රත්‍යය වෙති. එසේ වතුදු නිරතුරුවම විපාක ගෙනදෙන්නාහු නොවෙති. එහිලා පාටිභෝග (ඇපවීම්) ආදිය නිදසුන් ලෙස දතයුතුය.

කරන ලද හෙයින්ම වනාහි සංඛාරයෝ, ස්වකීය ඵලයට ප්‍රත්‍යය වෙති. විද්‍යමාන හෝ අවිද්‍යමාන වන හෙයින් එසේ නොවෙති. යම්සේ කීහුද; - ''කාමාවචර කුශල කර්මයක් කරනලද හෙයින්, රැස් කරන ලද හෙයින්, එහි විපාක වශයෙන් චක්ඛු විඤ්ඤාණය උපන්නේ වේ.''[a] යන ආදියයි. සුදුසු පරිදි තම ඵලයට ප්‍රත්‍යය වීමෙන් පසු නැවත ඵල දෙන්නෝ නොවෙති. දෙන ලද විපාක ඇති හෙයිනි. මේ අර්ත්‍ථය පැහැදිලි කිරීමේදී මෙකී පාටිභෝග (ඇපවීම්) ආදි නිදසුන් දතයුතුය. යම්සේ වනාහි, ලෝකයෙහි, යමෙක් යම්කිසි අවශ්‍යතාවක් පිරිමසා ගැනීම සඳහා ඇප වේද, භාණ්ඩයක් හෝ මිලදී ගනියිද, ණයක් හෝ ලබා ගනියිද, එම අර්ත්‍ථය ඉටුකරගැනීම පිණිස ප්‍රත්‍යය වනුයේ එම ක්‍රියාවෙහි විද්‍යමාන හෝ අවිද්‍යමාන බව නොව හුදෙක් ඔහු විසින් එම ක්‍රියාව කරනු ලැබීමයි. එම අර්ත්‍ථය ඉටුකර දීමෙන් පසුවද හෝ ඇපය දරන්නෙක් නොවේ; මෙසේම සංඛාරයෝද කරන ලද හෙයින්ම ස්වකීය පලයට ප්‍රත්‍යය වෙති. යෝග්‍ය පරිදි දීමෙන් පසුවද විපාක දෙන්නාහු නොවෙති.

මෙතෙකින් මිශ්‍රාමිශ්‍ර වශයෙන් ද්විප්‍රකාරව පවත්නා ප්‍රතිසන්‍ධි විඤ්ඤාණයට සංඛාරයන් ප්‍රත්‍යයව පවත්නා බව පැහැදිලි කරන ලද්දේ වේ.

ඉක්බිති ඒ සියලුම දෙතිස් විපාක විඤ්ඤාණයන් කෙරෙහිවූ සම්මෝහ විඝාතය (මුළාබව නැසීම) පිණිස කියනලදීඃ-

---

a. විභඞ්ගපාලි, පටිච්චසමුප්පාද විභඞ්ග, අභිධම්ම භාජනීය

පටිසන්ධිපවත්තීනං වසෙනෙතෙ භවාදිසු
විජානිතබ්බා සංඛාරා යථා යෙසඤ්ච පච්චයා

භවාදී විෂයයෙහි ප්‍රතිසන්ධි හා ප්‍රවෘත්තීන් ගේ වශයෙන් මේ සංඛාරයෝද, ඔවුන් විපාක විඤ්ඤාණයනට ප්‍රත්‍යය වන සැටිද දත යුත්තාහ.

එහි, භව තුනද, යෝනි සතරද, ගති පසද, විඤ්ඤාණට්ඨිති සතද, සත්වාවාස නවයදැයි යනු භවාදිය වේ; මේ භව ආදී විෂයයෙහි ප්‍රතිසන්ධියෙහි හා ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි)ද යම් විපාක විඤ්ඤාණයකට ප්‍රත්‍යයවන යම් සංඛාර කෙනෙක් වෙත්ද, එම සංඛාරයෝද, ඔවුන් විපාක විඤ්ඤාණයනට ප්‍රත්‍යය වන ආකාරයද දතයුත්තාහුය යන අර්ථයි.

එහි පළමු කොට, පුඤ්ඤාභිසංඛාර විෂයයෙහිඃ කාමාවචර අෂ්ටචේතනා සහිත පුඤ්ඤාභිසංඛාරය අවිශේෂයෙන් සුගති කාමභවයෙහි ප්‍රතිසන්ධි කාලයෙහි විපාක විඤ්ඤාණ නවයට නානාක්‍ෂණික කර්ම ප්‍රත්‍යය වශයෙන්ද, උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන්දැයි දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වේ. රූපාවචර පංච කුසල චේතනා භේද සහිත පුඤ්ඤාභිසංඛාරය රූප භවයෙහි ප්‍රතිසන්ධිය හා සමගම විපාක විඤ්ඤාණ පසට (ඒ දෙපරිද්දෙන්ම) ප්‍රත්‍යය වේ.

කියන ලද ප්‍රභේද සහිත කාමාවචර-පුඤ්ඤාභිසංඛාර)ය වනාහි සුගති කාම භවයෙහි, උපේක්‍ෂා සහගත අහේතුක මනෝවිඤ්ඤාණ ධාතුව හැර ඉතිරි පරිත්ත-විපාක-විඤ්ඤාණ සතට ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) දී ඉහත කී ලෙසින්ම ප්‍රත්‍යය වේ. එහෙත් ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ. එම පුඤ්ඤාභිසංඛාරයම රූපභව විෂයයෙහිදී විපාක විඤ්ඤාණ පසට ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි)දී එපරිද්දෙන්ම ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ. දුගති-කාමභවයෙහි වනාහි පරිත්ත-විපාක-විඤ්ඤාණ අටටම, පැවැත්මෙහිදී එපරිද්දෙන්ම ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ. එහි (දුගති කාමභවයෙහි) නිරයෙහි මහමුගලන් තෙරුන්ගේ නරක චාරිකා ආදියෙහිදී ඉෂ්ටාලම්බන යෝගයෙහිදී එය ප්‍රත්‍යය වේ. තිරශ්චීනයන් හා මහර්ධිමත් ප්‍රේතයන් කෙරෙහිද ඉෂ්ටාලම්බනය ලැබේමය.

එම පුඤ්ඤාභිසංඛාරයම කාමභව සුගතියෙහිදී කුසල විපාක විඤ්ඤාණ සොළොසටම එසේම ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි දෙක්හිම ප්‍රත්‍යය වේ. අවිශේෂයෙන් පුඤ්ඤාභිසංඛාරය රූප භවයෙහි විපාක විඤ්ඤාණ දශයට එසේම ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි දෙක්හිම (ප්‍රත්‍යය වේ.)

අකුසල චේතනාභේද දොළොසක් ඇති අපුඤ්ඤාභිසංඛාරය දුගති කාමභවයෙහි එක් විඤ්ඤාණයකට එසේම ප්‍රතිසන්ධියෙහිදී ප්‍රත්‍යය වේ.

ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) දී එසේ නොවේ. (විඤ්ඤාණ) සයකට ප්‍රවෘත්තියෙහිදී ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ; අකුසල විපාක විඤ්ඤාණ සතටම ප්‍රවෘත්ති-ප්‍රතිසන්ධි දෙක්හිම ප්‍රත්‍යය වේ; සුගති කාමභවයෙහි වනාහි එම (විපාක විඤ්ඤාණ) සතටම එසේම ප්‍රවෘත්තියෙහිදී ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ. රූපභවයෙහි විපාක විඤ්ඤාණ සතරට එසේම ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) දී ප්‍රත්‍යය වන අතර ප්‍රතිසන්ධියෙහිදී එසේ නොවේ. එය වනාහි කාමාවචර භූමියෙහි අනිෂ්ට වූ රූප දර්ශන, ශබ්ද ශ්‍රවණ වශයෙන් වේ. බ්‍රහ්ම ලෝකයෙහි වනාහි අනිෂ්ට රූපාදිය නොමැත. කාමාවචර දේවලෝකයෙහිද එසේය.

අනෙඤ්ජාභිසංඛාරය අරූප භවයෙහි විපාක විඤ්ඤාණ සතරටම එසේම පැවැත්මෙහිදී මෙන්ම ප්‍රතිසන්ධියෙහිදීද ප්‍රත්‍යවේ.

මෙසේ (කාමාදී භවයන්හි ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති වශයෙන් මේ සංඛාරයෝ (විපාක විඤ්ඤාණාදීවූ) යමකට යම් ලෙසකින් ප්‍රත්‍යය වෙත්ද, එලෙසින් දතයුතුය. යෝනි ආදී විෂයයෙහිද මේ නයින්ම දතයුතුය.

එහිලා මෙහි දක්වෙනුයේ මුල පටන් මුඛ පාඨමාත්‍රවූ ප්‍රකාශනයෙකිː- මේ සංඛාරයන් අතුරෙන් පළමුකොට පුඤ්ඤාභිසංඛාරය කාම-රූප යන භව දෙක්හි ප්‍රතිසන්ධිය ඇති කොට තම විපාක සියල්ල දනවාද, එසේම අණ්ඩජාදී සිවු යෝනියෙහිද, දිව්‍ය මනුෂ්‍ය යන දෙගතියෙහිද, නානත්තකාය-නානත්තසඤ්ඤීය, නානත්තකාය ඒකත්ත සඤ්ඤීය, ඒකත්ත කාය නානත්ත සඤ්ඤීය, ඒකත්තකාය ඒකත්ත සඤ්ඤීය යන විඤ්ඤාණට්ඨිති සතරෙහිද අසඤ්ඤ සත්තාවාසයෙහි වනාහි මෙය (පුඤ්ඤාභිසංඛාරය) රූපමාත්‍රයක්ම අභිසංඛරණය කරන හෙයින්-සත්තාවාස සතරෙක්හිද ප්‍රතිසන්ධිය දී තම විපාක සියල්ලම දනවයි. එහෙයින් මෙය (පුඤ්ඤාභිසංඛාරය) මෙකී බව දෙක්හිද, යෝනි සතරෙහිද, ගති දෙකෙහිද, විඤ්ඤාණට්ඨිති සතරෙක්හිදූයි මෙසේ එක්විසි විපාක විඤ්ඤාණයනට ඉහත කී නයින්ම ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති දෙක්හි සුදුසු පරිදි ප්‍රත්‍යය වේ.

අපුඤ්ඤාභිසංඛාරය වනාහි, යම් හෙයකින් එක්ම කාමභවයෙහිද, යෝනි සතර තුළද, ඉතිරි (නිරය, තිර්යක්, ප්‍රේත යන) ගති තුනෙහිද, 'නානත්තකාය ඒකත්තසඤ්ඤී' යනුවෙන් හැඳින්වෙන එක්ම විඤ්ඤාණට්ඨිතියෙහිද, එබඳුවූම එක් සත්වාවාසයෙක්හිද ප්‍රතිසන්ධි වශයෙන් විපාක දේද, එහෙයින් මෙය එක්ව (කාම) භවය තුළ, යෝනි සතරෙහි, ගති තුනෙක්හි, එක් විඤ්ඤාණට්ඨිතියෙක්හි එක් සත්තාවාසයෙක්හි විපාක විඤ්ඤාණ සතකට, කී නයින්ම ප්‍රතිසන්ධියෙහිදී මෙන්ම ප්‍රවෘත්තියෙහිදීද ප්‍රත්‍යය වේ.

ආනෙඤ්ජාභිසංඛාරය වනාහි, යම් හෙයකින්, එකම අරූප භවයෙහි, එක්ම ඕපපාතික යෝනියෙහි, එක්ම දේවගතිය තුළ, ආකාසානඤ්චායතන ආදී විඤ්ඤාණට්ඨිති තුනෙක්හි, ආකාසානඤ්චායතන ආදිවූ සත්තාවාස සතරෙක්හි ප්‍රතිසන්ධි වශයෙන් විපාක දේද, එහෙයින් මෙය එක්ම භවයෙක්හි, එක්ම යෝනියෙක, එක්ම ගතියෙක, විඤ්ඤාණට්ඨිති තුනෙක, සත්තාවාස සතරෙක, විඤ්ඤාණ සතරකට, කී නයින්ම ප්‍රතිසන්ධියෙහිදී මෙන්ම ප්‍රවෘත්තියෙහිදීද ප්‍රත්‍යය වේ. මෙසේ:-

පටිසන්ධිප්පවත්තීනං වසෙනෙතෙ භවාදිසු,
විජානිතබ්බා සංඛාරා යථා යෙසඤ්ච පච්චයා'ති

ප්‍රතිසන්ධි-ප්‍රවෘත්තීන්ගේ වශයෙන් මේ සංඛාරයෝ යම් සේ යම් විඤ්ඤාණයකට ප්‍රත්‍යය වෙත්ද, එසේ දතයුත්තාහුය.

මේ 'සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං'' යන පදයෙහි විස්තර කථායි.

——//——

'විඤ්ඤාණ පච්චයා නාමරූපං'' යන පදයෙහි:-

විභාග නාමරූපානං භවාදිසු පවත්තිතො,
සඞ්ගහා පච්චයනයා විඤ්ඤාතබ්බො විනිච්ඡයො

නාමරූපයන්ගේ විභාග වශයෙන්ද, භව ආදියෙහි ප්‍රවෘත්ති වශයෙන්ද, සංග්‍රහ වශයෙන්ද, ප්‍රත්‍යය නය වශයෙන්ද විනිශ්චය දතයුත්තේය.

'විභාගා නාමරූපානං'' යන මෙහි වනාහි, 'නාමං' යනු, අරමුණට අභිමුඛව නැමෙන හෙයින් වේදනා ආදීවූ ස්කන්ධත්‍රයයි; 'රූපං' යනු, සතර මහාභූත හා සතර මහාභූතයන් හා බැඳුණු උපාදාය රූපයි; ඔවුන්ගේ විභාගය ඛන්ධ නිද්දේසයෙහි කියනලද්දේමය. මෙසේ මෙහි පළමුකොට නාමරූපයන් පිළිබඳ විභාග වශයෙන් විනිශ්චය දතයුතුය.

'භවාදිසු පවත්තිතො' යන මෙහිද, නාමය එක් සත්තාවාසයක් (අසඤ්ඤසත්තය) හැර සියලු භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිතීන් හා සෙසු සත්තාවාසයන්හි පවතී; රූපය (අරූපභවය හැර ඉතිරි) භව දෙකෙහිද, යෝනි සතරෙහිද, ගති පසෙහිද, ප්‍රථම විඤ්ඤාණට්ඨිති සතරෙහිද, සත්තාවාස පසෙක්හිද පවතී.

මෙසේ පවත්නාවූද මේ නාමරූප විෂයයෙහි, යම් හෙයකින් අභාවක (භාවරූප රහිත) ගබ්භ සෙය්‍යකයන් (මව්කුස හොත්තවුන්) හටද, අණ්ඩජයන්හටද, ප්‍රතිසන්ධික්ෂණයෙහි, වස්තු-කාය දශක වශයෙන්, රූපයන්

අතුරෙන් සන්තති කලාප දෙකක්ද, අරූපී (නාම) ස්කන්ධ තුනක් පහළ වේද, එහෙයින් ඔවුනට විස්තර වශයෙන් රූප රූපයන් ගෙන් (නාමරූප) ධර්ම විස්සක්ද අරූප(නාම) ස්කන්ධ තුනක්දයි යන මේ තෙවිස්ස විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් ඇතිවන නාමරූපයයි දතයුතුය. අ+ගහිත ගහණ (න+ගහිත ගහණ, වරක් ගන්නා ලද දෙය නැවත නොගැනීම්) වශයෙන් වනාහි එක් රූප කලාපයෙකින් රූප ධර්ම නවයක් හැර තුදුසෙකි. (ස්ත්‍රී-පුරුෂ) භාවරූප සහිත ගබ්භ-සෙය්‍යකයනට භාවදශකයද ගෙන තෙතිසෙකි. එහිද අ-ගහිත ගහණ වශයෙන්, සන්තති කලාප දෙකෙන් අටළොසක් හළ විට පසළොසෙකි.

යම් හෙයකින් ඕපපාතික සත්ත්වයන් අතුරින් බ්‍රහ්මකායිකාදීන්ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි, චක්ඛු-සෝත වත්‍ථුදසකයන්ගේද, ජීවිතින්ද්‍රිය නවක (ජීවිතින්ද්‍රියය නවවැන්න කොට ඇති) රූපයන්ගේද වශයෙන් රූපයන්ගෙන් සන්තති ශීර්ෂ සතරක්ද, අරූප ස්කන්ධ තුනක්ද පහළ වේද, එහෙයින් ඔවුන්හට විස්තර වශයෙන් රූපරූපයන්ගෙන් එකුන්සාළිස් ධර්මයක් හා සමග අරූප ස්කන්ධ තුනක්දයි යන මේ දෙසාළිස් ධර්මයන් විඤ්ඤාණය ප්‍රත්‍යය කොට ඇති නාමරූපයයි දතයුතුය. අ-ගහිත ගහණයෙන් වනාහි සන්තතිශීර්ෂ තුනෙන් (තිසෙන්) සත්විසි ධර්මයන් හැර ඉතිරිය පසළොසෙකි.

කාම භවයෙහි වනාහි, යම් හෙයකින්, (ස්ත්‍රී-පුරුෂ) භාවසහිත පරිපූර්ණ ආයතන ඇති සෙසු ඕපපාතිකයන්ගේ හෝ සංසෙදජයන්ගේ ප්‍රතිසන්ධියෙහි රූප වශයෙන් සන්තති ශීර්ෂ සතක්ද අරූප ස්කන්ධ තුනක්ද පහළ වේද, එහෙයින් ඔවුනට විස්තර වශයෙන් රූපරූප ධර්මයන්ගෙන් සැත්තෑවක්ද, අරූපස්කන්ධ තුනක්දයි යන මේ තෙසැත්තෑවක් ධර්මයන් විඤ්ඤාණය ප්‍රත්‍යය කොට ඇති නාම-රූපයයි දතයුතුය. අගහිතගහණයෙන් වනාහි, රූප සන්තති ශීර්ෂ සයෙකින් සුපණසක් ධර්මයන් හැර එකුන් විස්සෙකි. මේ උපරිමයයි. අවම වශයෙන් වනාහි, රූපසන්තති ශීර්ෂ විකල වූවන් අතුරෙන් එකිනෙක අඩු කරමින් මෙසේ සංක්ෂේප වශයෙන්ද, විස්තර වශයෙන්ද, ප්‍රතිසන්ධි ක්ෂණයෙහිදී විඤ්ඤාණය ප්‍රත්‍යය කොට වන නාමරූප සංඛ්‍යාව දතයුතුය.

අරූපීන්හට වනාහි, අරූප ස්කන්ධ තුන පමණක් වේ; අසඤ්ඤීන්හට රූපයන්ගෙන් ජීවිතින්ද්‍රිය නවකය (ජීවිතින්ද්‍රියෙන් අවසන්වන භවය) පමණක් වේ. මේ ප්‍රතිසන්ධි විෂයයෙහි වූ නයයි.

ප්‍රවෘත්ති (ප්‍රතිසන්ධියෙහි පටන් චුතිය තෙක් වූ) කාලයෙහි රූපයන් පවත්නා සියලු තන්හි. ප්‍රතිසන්ධිචිත්තය පිහිටි කෙණෙහිම, එම ප්‍රතිසන්ධි චිත්තය සමග පැවැති ඍතු (හෙවත් තේජෝ ධාතු)

වෙත් 'උතුසමුට්ඨාන' ශුද්ධාෂ්ටකය පහළ වේ; ප්‍රතිසන්ධිචිත්තය වනාහි රූපයන් උපදවන්නේ නොවේ. එය වූකලී ප්‍රපාතයෙක්හි වැටුණු මිනිසකු අනෙකකුහට පිහිට වන්නට නොහැකි වන්නා සේ. වස්තු දුර්වලතායෙන් දුර්වල වූ හෙයින් රූපයන් හටගැන්වීමට නොසමත් වේ; ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු ප්‍රථම භවාංගයෙහි පටන් චිත්තසමුට්ඨාන (සිතින් හටගන්නා) ශුද්ධාෂ්ටකයද, ශබ්දය පහළවූ කල ප්‍රතිසන්ධික්ෂණයෙන් මතු පැවැති ඍතු (තේජෝධාතු) වෙත් හා චිත්තයෙන් සද්ද නවකයද උපදියි.

කබලිංකාරාහාරයෙන් ජීවත්වන ගබ්භසෙය්‍යක (මව්කුස හෝනා) යම් සත්ව කෙණෙක් වෙත්ද, ඔවුන් හටඃ-

''යඤ්චස්ස භුඤ්ජති මාතා අන්නං පානඤ්ච භොජනං
තෙන සො තත්ථ යාපෙති මාතුකුච්ඡිගතො නරො'ති

''මව්කුස හොත් ඒ සත්ව තෙමේ, තමාගේ මව යම් ආහාරයක්, පානයක්, භෝජනයක් අනුභව කරයිද, එයින් යැපේ'' යයි කී හෙයින්, මව විසින් අනුභව කළ ආහාරය අනුව වැඬෙන ශරීරය තුළද, ඖපාතිකයනට, පළමුවෙන්ම තමාගේ මුවතුළ කෙළ ඉනූ කෙණෙහිද ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටකය පහළ වේ. මෙසේ ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටකයද, ඍතු-චිත්ත සමුට්ඨාන නවක දෙකදැ'යි යනුවෙන් මෙය උපරිම වශයෙන් සවිසිවැදෑරුම් වේ; ඉහත එක් එක් චිත්තක්ෂණයෙක්හි තුන් වරක් උපදිතැයි කියන ලද සැත්තෑ වැදෑරුම් කර්ම සමුට්ඨානයන්ද සමග සයානූ වැදෑරුම් රූපයද, අරූප ස්කන්ධ තුනදැ'යි මෙසේ සමස්ත වශයෙන් නවානූවක් නාමරූප ධර්මයෝ වෙති.

යම් හෙයකින් ශබ්දය අනියත වේද, ඇතැම් විටෙක පමණක් එහෙයින් දෙවැදෑරුම් වන එය හැර සත් අනූවක් වන මේ ධර්මයෝ යෙදෙන යෙදෙන පරිද්දෙන් සියලු සත්වයනට 'විඤ්ඤාණප්‍රත්‍යය කොට ඇති නාමරූප' යයි දතයුතුය. නිදන්නාවූද, පමා වන්නාවූද, කන්නාවූද, බොන්නාවූද සත්වයනට දිවාරෑ දෙක්හිම මේ නාම-රූප ධර්මයෝ විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් පවත්නාහ. ඔවුන්ගේ එම විඤ්ඤාණප්‍රත්‍යය භාවය පසුව විස්තර කරන්නමු.

මෙහි, යම් මේ කර්මජ රූපයක් වේද, එය භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති-සත්වාවාසයෙන්හි සියලු රූපයනට පළමු පිහිටනුයේ නමුදු, තිසමුට්ඨානික රූපයෙන් උපස්තම්භ නොලද හොත් පවතිනු නොහැකිවේ; තිසමුට්ඨානික රූපයද එම කර්මජ රූපයෙන් උපස්තම්භ නොලැබ පවතිනු නොහැකිවේ. තවද, වාත වේගයෙන් පහරන ලද්දේ නමුදු, (අග එක් තැන් වන සේ) සිවු දිගට හරවා තබන ලද බට දඬු මිටි සතරක් සෙයින්ද, මහමුහුදෙහි රළ වේගයෙන් පහරන ලද්දේ නමුදු කිසි තැනෙක්හි හිර වීමෙන් රැඳී සිටි බුන් නැවක් සෙයින්ද, එකිනෙක පිහිට

ලැබ නොවැටී සිටිනුයේ එක් වසරක්, දෙවසරක්, -පෙ-සියයක් වසරක් වුවද, නොහොත් එම සත්‍වයන්ගේ ආයුක්ඛයය හෝ පුඤ්ඤක්ඛයය සිදුවන තෙක්ම පවත්නේය. මෙසේ (භවාදිසු පවත්තිතො) භවාදියෙහි පැවතීම් වශයෙන් මෙහි විනිශ්චයය දතයුතුය.

සංගහා (සංග්‍රහ වශයෙන්) යන මෙහිද, අරූපභවයෙහි ප්‍රවෘත්තිප්‍රතිසන්ධි යන දෙක්හිමද, පංච වෝකාර භවයෙහි ප්‍රවෘත්තියෙහිද, යමක් වේද, එය විඤ්ඤාණය ප්‍රත්‍යය කොට වන නාමයමයි. අසඤ්ඤතලයන්හි සියලු තන්හිද, පංචවෝකාර භවයෙහි ප්‍රවෘත්ති (පැවැත්මෙහි) යෙහිද යමක් වේද, එය විඤ්ඤාණය ප්‍රත්‍යය කොට ඇති නාමරූපයයි. එකී නාමය, රූපය, නාමරූපය යන සියල්ලම ඒකදේස-සරූපේක සේස නයින් (එක් කොටසෙක පමණක් සමානත්‍වය ගෙන) 'නාමරූප'යයි සංග්‍රහ කොට විඤ්ඤාණය ප්‍රත්‍යය කොට ඇති (විඤ්ඤාණ පච්චයා) නාමරූපයයි දතයුතුය.

අසඤ්ඤ තලයන්හි විඤ්ඤාණය නොපවත්නා හෙයින් මෙය අයෝග්‍ය නොවන්නේද? අයෝග්‍ය නොවේ: මෙය වනාහි:-

නාමරූපස්ස යං හේතු විඤ්ඤාණං තං ද්විධා මතං
විපාකමවිපාකඤ්ච යුත්තමෙව යතො ඉදං

නාමරූපයට හේතුවූ යම් විඤ්ඤාණයෙක් වේද, එය විපාකය, අවිපාකයයි දෙපරිදි වෙතැ'යි දක්නා ලද්දේය; එහෙයින් මෙය යුතුම වේ.

නාමරූපයට හේතු වූ යම් විඤ්ඤාණයෙක් වේද, එය විපාක-අවිපාක භේදයෙන් දෙපරිදි කොට දන්නා ලද්දේය. මෙයද අසඤ්ඤසත්තයන්හි කර්මයෙන් හටගන්නා හෙයින්, පංචවෝකාර භවයෙහි පැවැත්මෙහිදී අභිසංඛාර විඤ්ඤාණය හේතුකොට ගෙන රූපය වේ. එසේම පංචවෝකාර භවයෙහි පැවැත්මෙහිදී කුශලාදී චිත්තක්ෂණයන්හිද එය කර්ම සමුත්ථාන වෙතැ'යි යනු යුතුම වේ. මෙසේ සංග්‍රහ වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය. 'පච්චය නයා' යන මෙහි වනාහි:-

නාමස්ස පාක විඤ්ඤාණං නවධා හොති පච්චයො
වත්ථුරූපස්ස නවධා සෙසරූපස්ස අට්ඨධා
අභිසඞ්ඛාර විඤ්ඤාණං හොති රූපස්ස එකධා
තදඤ්ඤම්පන විඤ්ඤාණං තස්ස තස්ස යථාරහං

විපාක විඤ්ඤාණය නාමයට නව ආකාරයෙකින්ද, වස්තුරූපයට නව ආකාරයෙකින්ද සෙසු රූපයට අට ආකාරයෙකින්ද ප්‍රත්‍යය වේ.

අභිසංඛාර විඤ්ඤාණය (කර්මජ) රූපයට එක් ආකාරයෙකින්ද, (භවාංග ආදී) සෙසු විඤ්ඤාණය ඒ ඒ රූපයට සුදුසු පරිදි ප්‍රත්‍යය වේ.

ප්‍රතිසන්ධියෙහි හෝ වේවා, ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) හෝ වේවා, යම් මේ විපාක සංඛ්‍යාත වූ නාමයෙක් වේද, රූපයෙන් මිශ්‍රවූ හෝ අමිශ්‍ර වූ හෝ එයට, ප්‍රතිසන්ධික වූ හෝ අන්‍ය වූ විපාක-විඤ්ඤාණය සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත විපාක, ආහාර, ඉන්ද්‍රිය, අත්ථි හා අවිගත යන ප්‍රත්‍යය වශයෙන් නව ආකාරයෙකින් ප්‍රත්‍යය වේ; වස්තු රූපයට ප්‍රතිසන්ධියෙහිදී සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි හා අවිගත ප්‍රත්‍යය වශයෙන් නව ආකාරයෙකින් ප්‍රත්‍යය වේ; වස්තුරූපය හැර සෙසු රූපයට මේ නව ප්‍රත්‍යයන් අතුරෙන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය හැර ඉතිරි අට ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

අභිසංඛාර විඤ්ඤාණය වනාහි අසඤ්ඤ සත්ත රූපයට හෝ පඤ්ච වෝකාර භවයෙහි කර්මජ රූපයට හෝ, සුත්තන්තික පර්යායයට අනුව උපනිස්සය වශයෙන් එක්ම ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

සෙසු සියලු විඤ්ඤාණය ප්‍රථම භවාංගයෙහි පටන් සුදුසු පරිදි ඒ ඒ නාමරූපයට ප්‍රත්‍යය වෙති'යි දතයුතුය. විස්තර වශයෙන් වනාහි එම ප්‍රත්‍යය ක්‍රමය දක්වත් හොත් මුළු මහත් පට්ඨාන කථාව ගෙනහැර දැක්විය යුතුවේ. එහෙයින් එය නො-අරඹමු. එහිදී, 'කෙසේ නම් වනාහි මේ ප්‍රතිසන්ධි නාමරූපය විඤ්ඤාණප්‍රත්‍යයෙන් වෙති'යි යන මෙය දතහැකි වන්නේද'යි යන පැනය මතු වන්නේයඃ සූත්‍ර නයින් මෙන්ම යුක්ති වශයෙන්ද (එය දත හැකිවේ). සූත්‍ර පිටකයෙහි වනාහි, 'චිත්තානුපරිවත්තිනො ධම්මා'' (ධර්මයෝ සිතට අනුවට පරිවර්තනය වෙති) ආදී නයින් බොහෝ ආකාරයෙන් වේදනාදීනට විඤ්ඤාණය ප්‍රත්‍යය වන බව සිද්ධයි; යුක්ති වශයෙන් වනාහිඃ-

චිත්තජෙන හි රූපෙන ඉධ දිට්ඨෙන සිජ්ඣති,
අදිට්ඨස්සාපි රූපස්ස විඤ්ඤාණං පච්චයො ඉති.

මෙහිලා දක්නා ලද චිත්තජ රූපය මගින් නොදක්නා ලද රූපයටද විඤ්ඤාණය ප්‍රත්‍යය වෙති'යි යනු සිද්ධයි.

සිත පහන් කල්හි හෝ වේවා, නොපහන් කල්හි හෝ වේවා. එයට අනුරූපව රූපයන් උපදිනු දක්නා ලැබේ; දුටු දෙයින් නොදුටු දෙය අනුමානයෙන් දැකීම වෙති'යි යනු න්‍යාය හෙයින්, මෙහි දක්නා ලද චිත්තජ රූපය මගින් නොදක්නා ලද ප්‍රතිසන්ධිරූපයට විඤ්ඤාණය ප්‍රත්‍යය වෙති'යි යන මෙය දතයුතුය. මෙසේ චිත්ත සමුට්ඨාන වූ රූපයට මෙන්ම

කම්මසමුට්ඨානයටද විඤ්ඤාණය ප්‍රත්‍යය වන බව පට්ඨානයෙහි දැක්වේ. මෙසේ ප්‍රත්‍යයනය වශයෙන්ද මෙහි විනිශ්චයය දතයුතුය.

මේ ''විඤ්ඤාණ පච්චයා නාමරූපං'' යන පදයෙහි විස්තර කථායි

—//—

''නාමරූප පච්චයා සළායතනං'' යන පදයෙහිඃ-

නාමං ඛන්ධත්තයං රූපං භූතවත්ථාදිකං මතං
කතෙකසෙසං තං තස්ස තාදිසස්සෙව පච්චයො

'නාමං' යනු (වේදනා ආදී) ස්කන්ධත්‍රයයිද, 'රූපං' යනු, මහාභූත හා වස්තු ආදියයිද දන්නා ලදි. ඒකශේෂ කරන ලද යම් (නාමයක් හෝ රූපයක්) වේද, එය එවැනිම වූ ආයතනයට ප්‍රත්‍යය වේ.

සළායතනයට ප්‍රත්‍යයවූ යම් මේ නාමරූපයක් වේද, එහි, 'නාම' යනු වේදනා ආදීවූ ස්කන්ධත්‍රයයයි. 'රූප' නම් ස්ව-සන්තතියෙහි ඇතුළත් සතර මහාභූතය, ෂඩ්-වස්තුය, ජීවිතේන්ද්‍රියය යන මේ භූත වස්තු ආදිය වශයෙන් දන්නාලද්දයි දතයුතුය. එය වනාහි නාමය, රූපය, නාම-රූපයයි මෙසේ ඒකශේෂ කරන ලද ෂෂ්ඨායතනයද ෂඩායතනයටම ප්‍රත්‍යය වෙති'යි දතයුතුය. කවර හෙයින්ද යත්, අරූපභවයෙහි හුදෙක් නාමයම ප්‍රත්‍යය වන හෙයින් හා එසේ ප්‍රත්‍යය වනුයේද ෂෂ්ඨායතනයටම මිස අනෙකකට නොවන හෙයිනි. 'නාම පච්චයා ඡට්ඨායතනං'' (නාමය ප්‍රත්‍යය කොට ගෙන සවැනි ආයතනය වෙති'යි') විභඞ්ගයෙහි කියන ලදමැයි.

එහිලා මෙවන් පැනයක් නැඟිය හැකියඃ- නාමරූපය ෂඩායතනයට ප්‍රත්‍යය වෙති'යි යන මෙය කෙසේ දතහැකිද? යනුවෙනි. නාමරූපයන් ඇති කල්හිම (සළායතනයන්) වන හෙයිනි. ඒ ඒ නාමයද රූපයද ඇති කල්හි මිස අන් ලෙසකින් ඒ ඒ ආයතනය, නොවන හෙයිනි. (ෂඩායතනයන් පිළිබඳවූ) එම තද්භාව භාවිතාව (නාමරූපයන් ඇතිවිටම ආයතනයන් පහළ වීම පිළිබඳ විනිශ්චයය) මතු පච්චයනයයෙහිම පළට වන්නේය. එහෙයින්ඃ-

පටිසන්ධියං පවත්තෙවා හොති යං යස්ස පච්චයො
යථා ච පච්චයො හොති තථා නෙය්‍යං විභාවිනා

ප්‍රතිසන්ධියෙහි හෝ වේවා, පැවැත්මෙහි හෝ වේවා, යමක් යමකට ප්‍රත්‍යය වීමද, එසේ ප්‍රත්‍යය වන ආකාරයද නුවණැත්තහු විසින් විමසා දතයුතුය.

එහි අර්ථ ප්‍රකාශනය මෙසේයිඃ-

නාමමෙවහි ආරුප්පෙ පටිසන්ධි පවත්තිසු
පච්චයො සත්තධා ඡධා හොති තං අවකංසතො

අරූප භවයෙහි වනාහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති යන දෙක්හිම හුදු නාමයම සත් ආකාරයෙකින් හෝ අවම වශයෙන් ස-ආකාරයෙකින් හෝ (ආයතනයනට) ප්‍රත්‍යය වේ.

කෙසේද? යත්:- පළමුකොට, ප්‍රතිසන්ධියෙහිදී අවම වශයෙන් සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, විපාක, අත්‍ථි හා අවිගත වශයෙන් සත් ආකාරයෙකින් නාමය සවන (මන) ආයතනයට ප්‍රත්‍යය වේ. මෙම නාමයන් අතුරෙන් කිසිවක් හේතු ප්‍රත්‍යය වශයෙන්ද, කිසිවක් ආහාර ප්‍රත්‍යය වශයෙන්ද'යි මෙසේ අන් ආකාරයෙකින්ද ප්‍රත්‍යය වේ. ඒ අනුසාරයෙන් උත්කර්ෂාවකර්ශය (උපරිම-අවමය) දතයුතුය.

අඤ්ඤස්මිම්පි භවෙ නාමං තථෙව පටිසන්ධියං
ඡට්ඨස්ස ඉතරෙසං තං ඡහාකාරෙහි පච්චයො

අන්‍යවූ පංච වෝකාර භවයෙහිද, ප්‍රතිසන්ධියෙහිදී එම විපාක නාමය එසේම (සත් ආකාරයෙකින්) සවැන්නටද, ෂඩාකාරයෙකින් සෙසු ආයතන පසටද ප්‍රත්‍යය වේ.

අරූපභවය හැර සෙසු පංච වෝකාර භවයෙහි එම විපාක නාමය හදය වත්‍ථු රූපයට සහායවීමෙන්, අරූප භව විෂයයෙහි සවන (මන) ආයතනය පිළිබඳව කී නයින්ම අවම වශයෙන් සත් ආකාරයෙකින් ප්‍රත්‍යය වේ. චක්ඛු ආදී වූ සෙසු (ආයතන) පස විෂයයෙහි සතර මහාභූතයනට සහායව සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත අත්‍ථි හා අවිගත වශයෙන් ෂඩාකාරයෙකින් ප්‍රත්‍යය වේ; එම නාමයන් අතුරෙන් කිසිවක් හේතු ප්‍රත්‍යය වශයෙන්ද, කිසිවක් ආහාර ප්‍රත්‍යය වශයෙන්ද'යි මෙසේ අන් අයුරකින්ද ප්‍රත්‍යය වේ. ඒ අනුසාරයෙන් උපරිම-අවමය දතයුතුය.

පවත්තෙපි තථා හොති පාකං පාකස්ස පච්චයො,
අපාකමවිපාකස්ස ඡධා ඡට්ඨස්ස පච්චයො

ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි)ද එම ආකාරයෙන්ම විපාක නාමය විපාක වූ (මන) ආයතනයට ප්‍රත්‍යය වේ; අවිපාක නාමය අවිපාක වූ සවන (මන) ආයතනයට සය ආකරයෙකින් ප්‍රත්‍යය වේ.

ප්‍රවෘත්තියෙහිදී- වනාහි, පංච වෝකාර භවයෙහි ප්‍රතිසන්ධියෙහිදී යම් සේද, එසේම විපාක නාමය විපාක වූ සවන ආයතනයට අවම වශයෙන් සත් ආකාරයෙකින් ප්‍රත්‍යය වේ; අවිපාක නාමය වනාහි අවිපාක වූ සවන ආයතනයට එයින් (එකී සත් ආකාරයෙන්) විපාක ප්‍රත්‍යය හැර, අවම වශයෙන් ස-ආකාරයෙකින් ප්‍රත්‍යය වේ. මෙහි උපරිම-අවම ආකාරය කියන ලද නයින්ම දතයුතුය.

තථෙව සෙසපඤ්චන්නං විපාකං පච්චයො භවෙ
චතුධා අවිපාකම්පි එවමෙව පකාසිතං

එහි (පැවැත්මෙහි) දීම, සෙසු චක්ෂුරායතනාදී පසට විපාක නාමය සිවු අයුරෙකින් ප්‍රත්‍යය වේ; අවිපාක නාමයද එසේම (ප්‍රත්‍යය) වෙති'යි ප්‍රකාශිතයි.

එම පැවැත්මෙහිදීම ඉතිරි චක්ෂුරායතනාදී පංචකයට චක්ඛුප්පසාදාදිය වස්තුකොට ඇති අන්‍යවූ විපාක නාමයද පච්ඡාජාත, විප්පයුත්ත, අත්ථි හා අවිගත ප්‍රත්‍යය වශයෙන් සිවු අයුරෙකින් ප්‍රත්‍යය වේ. විපාක නාමය යම්සේද, අවිපාක නාමයද එසේම වෙති'යි ප්‍රකාශිතයි. එහෙයින් කුශලාදී භේද ඇති එම නාමයද පංචායතනයනට සිවු අයුරෙකින් ප්‍රත්‍යය වෙති'යි දතයුතුය.

මෙසේ පළමුකොට (හුදු) නාමයම ප්‍රතිසන්ධියෙහි හෝ වේවා, ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) හෝ වේවා, යම් යම් ආයතනයකට ප්‍රත්‍යය වේද, (එසේම) යම් යම් ආකාරයෙකින් ප්‍රත්‍යය වේද, ඒ ඒ ආකාරයෙන් දතයුතුය.

රූපං පනෙත්ථ ආරුප්පෙ භවෙ භවති පච්චයො
න එකායතනස්සාපි පඤ්චක්ඛන්ධභවෙ පන
රූපතො සන්ධියං වත්ථු ඡධා ඡට්ඨස්ස පච්චයො
භූතානි චතුධා හොන්ති පඤ්චන්නං අවිසෙසතො

මෙහි, අරූප භවයෙහිදී වනාහි රූපය එකදු ආයතනයකට ප්‍රත්‍යය නොවේ. පංචස්කන්ධ භවයෙහිදී වනාහි,

රූපයන් අතුරෙන් වස්තුරූපය ප්‍රතිසන්ධියෙහිදී සවන ආයතනයට ස-අයුරෙකින් ප්‍රත්‍යය වේ; භූතරූප සතර අවිශේෂයෙන් ආයතන පසට සිවු අයුරෙකින් ප්‍රත්‍යය වේ.

රූපයන් අතුරෙන් වස්තු රූපය ප්‍රතිසන්ධියෙහිදී සවන ආයතනයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විප්පයුත්ත, අත්ථි, හා අවිගත වශයෙන් ස-අයුරෙකින් ප්‍රත්‍යය වේ. මහා භූතරූප සතර වනාහි, අවිශේෂයෙන් ප්‍රතිසන්ධියෙහි මෙන්ම ප්‍රවෘත්තියෙහිද, යම් යම් ආයතනයක් උපදීද, ඒ ඒ ආයතනයට යෝග්‍ය වන සේ චක්ෂුරාදීවූ ආයතන පසටම සහජාත, නිස්සය, අත්ථි හා අවිගත වශයෙන් සිවු අයුරෙකින් ප්‍රත්‍යය වේ.

තිධා ජීවිත මෙතෙසං ආහාරො ච පවත්තියං
තානෙව ඡධා ඡට්ඨස්ස වත්ථු තස්සෙව පඤ්චධා

මේ ආයතන පසට ජීවිතේන්ද්‍රියය මෙන්ම ආහාර රූපයද තුන් අයුරෙකින් ප්‍රත්‍යය වේ. සවන ආයතනයට ඒ දෙකම ස-අයුරෙකින් ප්‍රත්‍යය වේ. වස්තුරූපය එයටම පස් අයුරෙකින් ප්‍රත්‍යය වේ.

මේ චක්‍ෂුරාදීවූ මේ ආයතන පසට, ප්‍රතිසන්ධියෙහිදී මෙන්ම ප්‍රවෘත්තියෙහිදීද ජීවිතින්ද්‍රිය රූපය අත්‍ථි, අවිගත හා ඉන්ද්‍රිය වශයෙන් තුන් අයුරෙකින් ප්‍රත්‍යය වේ. ආහාර රූපයද අත්‍ථි, අවිගත, ආහාර වශයෙන් තුන් අයුරෙකින් ප්‍රත්‍යය වේ; එම ආහාර රූපයද, ආහාරයෙන් ජීවත් වන යම් සත්ව කෙනෙක් වෙත්ද, ඔවුන්ගේ කය ආහාරයට අනුව හැඩ ගැසුණු කල්හි ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි) දීම ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී ප්‍රත්‍යය නොවේ. චක්‍ෂුරාදී වූ ඒ ආයතන පස චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා- කායවිඤ්ඤාණ සංඛ්‍යාත සවන මනායතනයට නිස්සය, පුරේජාත, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි හා අවිගත වශයෙන් ස-අයුරෙකින් පැවැත්මෙහිදී ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී ප්‍රත්‍යය නොවේ. මෙකී (චක්ඛු විඤ්ඤාණ ආදී) විඤ්ඤාණ පස හැර ශේෂ වූ එම මන-ආයතනයටම, වස්තුරූපය නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්‍ථි හා අවිගත වශයෙන් පස් අයුරෙකින් පැවැත්මෙහිදීම පමණක් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධියෙහිදී ප්‍රත්‍යය නොවේ.

මෙසේ රූපයම පමණක්, ප්‍රතිසන්ධියෙහිදී හෝ වේවා, ප්‍රවෘත්තියෙහි (පැවැත්මෙහි)දී හෝ වේවා, යම් යම් ආයතනයකට යම් යම් ආකාරයෙකින් ප්‍රත්‍යය වේද, එසේ දතයුතුය.

නාමරූපං පනුභයං හොති යං යස්ස පච්චයො
යථා ච තම්පි සබ්බත්‍ථ විඤ්ඤාතබ්බං විභාවිනා.

> නාමරූප යන දෙක්හිම, යමක් යමකට ප්‍රත්‍යය වේනම් එයද, යම් ආකාරයෙකින් ප්‍රත්‍යය වේනම් එයදැයි යනුවෙන් සියලු තන්හි නුවණැත්තහු විසින් විමසා දතයුතුය.

ඒ මෙසේයි:- පළමුකොට ප්‍රතිසන්ධියෙහිදී, පංචවෝකාර භවයෙහි, (නාම) ස්කන්ධතුනද වස්තුරූපයයි, කියනලද මේ නාමරූපය සවන ආයතනයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත ආදී වශයෙන් ප්‍රත්‍යය වේ; මේ මෙහිලා සංක්ෂේප මාත්‍රයෙකි. කියනලද නයින් සියල්ල යොදා ගතහැකි හෙයින් මෙහි විස්තර නොදක්වන ලදි.

මේ "නාමරූප පච්චයා සළායතනං" යන පදයෙහි විස්තරකථායි.

—//—

''සළායතන පච්චයා ඵස්සො'' (ෂඩ් ආයතනයන් ප්‍රත්‍යය කොට ගෙන ස්පර්ශය වේ) යන පදයෙහි:-

සළෙව ඵස්සා සඞ්ඛෙපා චක්ඛු සම්ඵස්ස ආදයො
විඤ්ඤාණමිව බත්තිංස විත්ථාරෙන භවන්ති තෙ

සංක්‍ෂේප වශයෙන් වනාහි චක්ඛු සම්ඵස්ස ආදී ස්පර්ශයෝ සයක්ම වෙති; විස්තර වශයෙන් ඔහු විඤ්ඤාණය මෙන්ම දෙතිසක් වෙති.

සංක්‍ෂේප වශයෙන් වනාහි ''සළායතන පච්චයා ඵස්සො'' යනුවෙන්, චක්ඛුසම්ඵස්සය, සෝත සම්ඵස්සය, ඝාණ සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය, කාය සම්ඵස්සය, මනෝසම්ඵස්සය යනුවෙන් මෙකී චක්ඛු සම්ඵස්ස ආදී වූ ස්පර්ශයෝ සයක්ම වෙති; විස්තර වශයෙන් වනාහි චක්ඛු සම්ඵස්ස ආදිය කුශල විපාක පසෙක, අකුශල විපාක පසෙකැ'යි යනුවෙන් දසයක්ද, ලෞකික විඤ්ඤාණ දෙවිස්ස හා යෙදුණු ඉතිරි ස්පර්ශ දෙවිස්සක්දැ'යි මෙසේ මේ සියල්ලම, සංඛාර ප්‍රත්‍යය කොට ඇතැ'යි කියන ලද විඤ්ඤාණය මෙන්ම දෙතිසක් වෙති. මෙකී දෙතිස් වැදෑරුම්වූද, ඵස්සයට ප්‍රත්‍යය වූ යම් ආයතන සයක් වේද, එහි:-

ඡට්ඨෙන සහ අජ්ඣත්තං චක්ඛාදිං බාහිරෙහිපි
සළායතන මිච්ඡන්ති ඡහි සද්ධිං විචක්ඛණා

නුවණැත්තෝ සවන (මන) ආයතනය හා සමග චක්ඛු ආදී අභ්‍යන්තර ආයතන පස ෂඩායතන-වශයෙන් රිසිවෙති. (මහාවිහාරයතුළම වූ අභ්‍යන්තර ආචාර්යවාදයකට අනුව) කෙනෙක් රූප ආදී බාහිර ආයතන සයද සමග ගෙන සළායතන වශයෙන් රිසි වෙති.

එහි පළමුකොට, යම් ආචාර්ය කෙනෙක්, 'මේ උපාදින්නක පවත්ති කථා (කර්ම ඵල වශයෙන් ලත් ජීවිත ප්‍රවෘත්ති කථා) යයි ගෙන ප්‍රත්‍යයද ප්‍රත්‍යයෝත්පන්නයද ස්වසන්තතියට ඇතුළත් කොට දක්වත්ද, ඔවුහු 'ඡට්ඨායතන පච්චයා ඵස්සො' (සවන (මන) ආයතනය ප්‍රත්‍යය කොට ගෙන ඵස්සය වේ) යන (අභිධම්ම භාජනීය) පාළි අනුසාරයෙන්, අරූප භවයෙහිදී සවන ආයතනයද, සෙසු තන්හිදී සියල්ල සංග්‍රහ කොට ගත් ෂඩායතනයද ඵස්සයට ප්‍රත්‍යය වෙති'යි ඒක දේශයෙකින් ස්වරූප ඒකශේෂ කොට සවන ආයතනය හා සමග චක්ඛු ආදී අභ්‍යන්තර ආයතන (පස) සළායතන වශයෙන් රිසි වෙති. එසේ ගන්නා ලද සවන ආයතනයද, ෂඩ් ආයතනයෝද සළායතන සංඛ්‍යාවටම යෙති.

යම් ආචාර්ය කෙනෙක් වනාහි, හුදෙක් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ම ඒකසන්තති (එකම සන්තියකට අයත්වූවන්) වශයෙන්ද, ප්‍රත්‍යය ධර්මයන් භින්න සන්තති (වෙනත් සන්තතියකට අයත් වූවන්) වශයෙන්ද දීපනය කෙරෙත්ද, ඔවුහු යම් යම් ආයතනයක් ඵස්සයට ප්‍රත්‍යය වේනම්,

ඒ සියල්ලම දක්වමින්, බාහිර ආයතන සවන (මන) ආයතනය සමගද, (චක්ඛු ආදී) අභ්‍යන්තර ආයතන (රූපාදී) බාහිර ආයතන සමගද ගෙන සළායතන වශයෙන් රිසි වෙති. මෙසේ එකී සවන (මන) ආයතනයද, ෂඩ් ආයතනයද, යන දෙක ඒකශේෂ කළ කල්හි සළායතන සංඛ්‍යාවටම යෙයි.

මෙහිලා චෝදනාවක් (පැනයක්) නඟති, එනම්ඃ සියලු ආයතනයන්ගෙන් එක්ම ඵස්සයක් හෝ එක් ආයතනයෙකින් ඵස්සයන් සියල්ලම හෝ නොහටගනී; එහෙත් මේ පදය 'සළායතන පච්චයා ඵස්සො'යි එකක්ම කියයි. ඒ කවර හෙයින්ද? යනුවෙනි.

මේ එහි පරිහාරය (විසඳීම)යිඃ- මෙය සැබැවි, සියල්ලෙන්ම එකක් හෝ එකෙකින් සියල්ලම හෝ නොහට ·ගනියි; නොයෙක් ආයතනයන්ගෙන් එක් ඵස්සයක් හටගනීමැයි, යම්සේ චක්ඛු සම්ඵස්සය චක්ඛායතන රූපායතන, චක්ඛු විඤ්ඤාණ සංඛ්‍යාත මනායතන, අවශේෂ සම්පයුත්ත ධම්මායතන යන මේ අනේක ආයතනයන්ගෙන් හටගනීද, එසේය, සියලු තන්හි මෙසේ සුදුසු පරිද්දෙන් යෙදිය යුතුය. එහෙයින්මඃ

එකො පනායතනප්පභවො ඉති දීපිතො
ඵස්සායං එකවචන නිද්දෙසෙනිධ තාදිනා

මෙහිලා ඒකවචන කොට දක්වීමෙන් මෙකී ඵස්සය එකක්වද අනේකායතනයන්ගෙන් වියහැකි බව තාදීවූ තතු දත් බුදුරදුන් විසින් දක්වන ලදි.

'ඒකවචන නිද්දේසෙන' යනු, 'සළායතන පච්චයා ඵස්සො' යන මෙහි 'ඵස්සො' යයි ඒකවචනයෙන් දැක්වීමෙන් අනේක ආයතනයන්ගෙන් එක් ඵස්සයක් වුවද වෙතැ'යි තතුදත් බුදුරදුන් විසින් දක්වන ලදැ'යි යන අර්ථයි.

ආයතනයන් අතුරෙන් වනාහිඃ-

ඡධා පඤ්ච තතො එකං නවධා බාහිරානි ඡ
යථා සම්භවමෙතස්ස පච්චයත්තෙ විභාවයෙ.

(චක්ඛායතනාදී) පස ස-අයුරෙකින්ද, ඉක්බිති එක්ම (විපාක මනායතනය) නව අයුරෙකින්ද, බාහිර (රූපාදී) ආයතන සය සුදුසු පරිදිද මේ (ඵස්සයට) ප්‍රත්‍යය භාවයෙහිලා විවරණ කරන්නේයි.

මේ එහි විවරණයයිඃ පළමුකොට චක්ඛු ආදී වූ ආයතන පස චක්ඛු සම්ඵස්ස ආදී භේද වශයෙන් පංචවිධ වූ ඵස්සයම නිස්සය, පුරේජාත, ඉන්‍ද්‍රිය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය වශයෙන් ස-අයුරෙකින් ප්‍රත්‍යය වේ; එයින් අන්‍ය වූ එක්ම විපාක මනායතනය

නොයෙක් ප්‍රභේද ඇති විපාක මනෝ සම්ඵස්සයට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය වශයෙන් නව අයුරෙකින් ප්‍රත්‍යය වේ. බාහිර ආයතනයන් අතුරෙන් රූපායතනය චක්ඛු සම්ඵස්සයට ආරම්මණ, පුරේජාත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය වශයෙන් සිව් අයුරෙකින් ප්‍රත්‍යය වේ; සද්දායතන ආදියද සෝත සම්ඵස්ස ආදියට එසේය. මනෝසම්ඵස්සයට වනාහි ඒ රූපායතනාදිය හා ධම්මාරම්මණයද හුදෙක් ආරම්මණ ප්‍රත්‍යය වශයෙන්ම ප්‍රත්‍යය වේ. මෙසේ බාහිර ආයතන සය ප්‍රත්‍යය භාවයෙහිදී සුදුසු පරිදි විවරණ කළයුතු වේ.

මේ 'සළායතන පච්චයා ඵස්සො' යන පදයෙහි විස්තර කථායි. 'ඵස්ස පච්චයා වෙදනා' (ස්පර්ශය ප්‍රත්‍යය කොට ගෙන වේදනාව වේ) යන පදයෙහි:-

ද්වාරතො වෙදනා වුත්තා චක්ඛුසම්ඵස්සජාදිකා
සළෙව සා පභෙදෙන එකූන නවුතී මතා

ද්වාර වශයෙන් චක්ඛු ආදීන්ගේ සම්ඵස්සයෙන් උපන් වේදනා සයක්ම කියන ලදි: ප්‍රභේද වශයෙන් එම වේදනා නවාසූවක් වෙති'යි දන්නා ලදි.

'ඵස්ස පච්චයා වෙදනා' යන මේ පදයට විභඞ්ගයෙහි 'චක්ඛුසම්ඵස්සජා වෙදනා, සොත-ඝාණ-ජිව්හා-කාය-මනො-සම්ඵස්සජා වෙදනා' (චක්ඛු සම්ඵස්සයෙන් උපන් වේදනා, සෝත ඝාණ-ජිව්හා-කාය-මනෝ සම්ඵස්සයෙන් උපන් වේදනා'[a] යි මෙසේ ද්වාර වශයෙන් සයක්ම කියන ලදි. ප්‍රභේද වශයෙන්, එම වේදනා නවාසූවක් සිත් සමග සම්ප්‍රයුක්ත වූ හෙයින් නවාසූවක්ම වෙති'යි දන්නා ලදි.

වෙදනාසු පනෙතාසු ඉධ බත්තිංස වෙදනා
විපාක සම්පයුත්තාව අධිප්පෙතාති භාසිතා
අට්ඨධා තත්‍ථ පඤ්චන්නං පඤ්චද්වාරම්හි පච්චයො
සෙසානං එකධා ඵස්සො මනොද්වාරෙපි සො තථා

මෙහි වනාහි මේ (නවාසූවක්) වේදනාවන් අතුරෙන් දෙතිසක් වේදනාවන් විපාක සම්ප්‍රයුක්තයහ'යි අභිප්‍රේත වන බව කියන ලදි.

එහි පංචද්වාරයෙහි වූ පංච වේදනාවනට ඵස්සය අට අයුරෙකින් ප්‍රත්‍යය වේ; සෙසු (කාමාවචර විපාක) වේදනාවනට එක් අයුරෙකින් ප්‍රත්‍යය වේ; මනෝද්වාර විෂයයෙහිද එසේය. (අට අයුරෙකින්ද එක් අයුරෙකින්ද ප්‍රත්‍යය වේ).

---

a. විභඞ්ගපාළි, පටිච්ච සමුප්පාද, සුත්තන්තභාජනීය

එහි වනාහි පංචද්වාරයෙහි චක්ඛුප්පසාදාදිය වස්තු කොට ඇති වේදනා පසට චක්ඛු සම්ඵස්ස ආදී වූ ඵස්සය සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, සම්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය වශයෙන් අට අයුරෙකින් ප්‍රත්‍යය වේ. එක් එක් ද්වාරයෙහි සම්පටිච්ඡන, සන්තීරණ, තදාරම්මණ වශයෙන් පවත්නා සෙසු කාමාවචර විපාක වේදනාවනට චක්ඛුසම්ඵස්ස ආදීවූ ඵස්සයට උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් එක්ම අයුරෙකින් ප්‍රත්‍යය වේ.

'මනෝද්වාරෙපි සො තථා' යනු, මනෝද්වාර විෂයයෙහිද තදාරම්මණ වශයෙන් පවත්නා කාමාවචර විපාක වේදනාවනට එම 'සහජාත මනෝසම්ඵස්සය'යි කියනු ලබන ඵස්සය එසේම අට අයුරෙකින් ප්‍රත්‍යය වේ. පටිසන්‍ධි, භවංග, චුති වශයෙන් පවත්නා ඒ ත්‍රෛභූමක විපාක වේදනාවනටද, මනෝද්වාරයෙහි තදාරම්මණ වශයෙන් පවත්නා යම් ඒ කාමාවචර වේදනාවක් ඇතොත් එයටද මනෝද්වාරාවජ්ජන සම්පයුත්ත වූ මනෝ සම්ඵස්සය උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් එක්ම අයුරෙකින් ප්‍රත්‍යය වේ.

මේ 'පසස පච්චයා වෙදනා' යන පදයෙහි විස්තර කථායි.

—//—

වෙදනා පච්චයා තණ්හා' යන පදයෙහිඃ

රූපතණ්හාදි භෙදෙන ඡ තණ්හා ඉධ දීපිතා<br>
එකෙකා තිවිධා තත්‍ථ පවත්තාකාරතො මතා

මෙහිලා රූපතණ්හා ආදි ප්‍රභේද වශයෙන් තණ්හා සයක් දක්වන ලදි; පවත්නා ආකාරයෙන් එහි එක් එක් තණ්හාවක් තුන් තුන් ආකාර වේ.

(වෙදනා පච්චයා තණ්හා' යන) මේ පදයෙහි වනාහි, 'සිටු පුත්‍රයාය, බ්‍රාහ්මණ පුත්‍රයාය', යනුවෙන් පියාගේ නමින් පුතා හඳුන්වනු ලබන සෙයින් රූපතණ්හා, සද්ද-ගන්‍ධ-රස-ඵොට්ඨබ්බ-ධම්මතණ්හා යනුවෙන් විභංගයෙහි අරමුණු අනුව නම් වශයෙන් තණ්හා සයක් දක්වන ලදි. ඒ තණ්හාවන් අතුරෙන් එක් එක් තණ්හාවක් පවත්නා ආකාරයෙන් කාමතණ්හා, භවතණ්හා, විභව තණ්හා යනුවෙන් තුන් වැදෑරුම් වෙති'යි දන්නා ලදි.

හුදෙක් රූපතණ්හාවම යම් කලෙක චක්ඛු-පථයට පැමිණි රූපාරම්මණයක් කාමාස්වාද වශයෙන් ආස්වාද කැරෙමින් පවතීද, එකල 'කාමතණ්හා නම් වේ; යම් කලෙක එම රූපාරම්මණයම නිත්‍යය, ශාස්වතයැයි පවත්නා ශාස්වත දෘෂ්ටිය හා සමග පවතීද, එකල 'භව තණ්හා' නම් වේ; ශාස්වත දෘෂ්ටි සහගතවූ රාගය 'භවතණ්හා' යයි

කියනු ලැබේ. යම් කලෙක වනාහි එම අරමුණම සිඳිනු ලබති'යි, විනාශයට යෙති'යි පවත්නා උච්ඡේද දෘෂ්ටිය හා සමග පවත්නේද, එකල 'විභව තණ්හා' නම් වේ; උච්ඡේදදෘෂ්ටි සහගත වූ රාගය 'විභව තණ්හායයි කියනුලැබේ. මේ නයින්ම සද්ද තණ්හා ආදියද වෙති'යි මේ තණ්හාව අටළොස් වැදෑරුම් වේ.

එම තණ්හාවම අභ්‍යන්තර රූපාදියෙහි අටළොසෙක, බාහිර රූපාදියෙහි අටළොසෙකැ'යි සතිසෙක් වේ; මේ ආකාරයෙන් අතීත කාලයෙහි සතිසෙක, අනාගත කාලයෙහි සතිසෙක, ප්‍රත්‍යුත්පන්නයෙහි සතිසෙකැ'යි තණ්හාව එක්සිය අට වැදෑරුම් වේ. එම තණ්හාවම නැවත පිඬු කරනු ලබන විට රූපාදී වූ අරමුණු වශයෙන් සයෙක, කාමතණ්හා ආදී වශයෙන් තුනෙකැ'යි දතයුතුය.

යම් හෙයකින් මේ සත්ත්ව කෙනෙක් පුතු කෙරෙහි ඇලුමින් පුතු කෙරෙහි මමත්වයෙන් කිරිමවට සංග්‍රහ කෙරෙත්ද, රූපාදී අරමුණු වශයෙන් උපදනා වේදනාව ආස්වාද කොට වේදනාව කෙරෙහි මමත්වයෙන් රූපාදීවූ අරමුණු සපයන සිත්තරුන්, ගඳඹුන්, සුවඳ විලවුන් නිපදවන්නන්, අරක්කැමියන්, පෙහෙරුන්, රසායන බෙහෙත් සාදන වෙදුන් යන ආදීන්හට මහත් සත්කාර කෙරෙත්ද එහෙයින්ම වේදනාව ප්‍රත්‍යය කොට ඇති මේ සකලවිධ වූම තණ්හාව හටගනිති'යි දතයුතුය.

යස්මා චෙත්ථ අධිප්පෙතා විපාකසුඛ වෙදනා,
එකාව එකධා චෙසා තස්මා තණ්හාය පච්චයො.

මෙහිලා යම් හෙයින් විපාක සුඛ වේදනාවම අභිප්‍රේත වූයේද, එහෙයින් මේ එකම වේදනාව එක් අයුරෙකින්ම ප්‍රත්‍යය වේ.

'එකධා' යනු, උපනිස්සය ප්‍රත්‍යය වශයෙන්ම නැතහොත්, යම් හෙයකින්:

දුක්ඛී සුඛං පත්ථයති සුඛී භීයොපි ඉච්ඡති
උපෙක්ඛා පන සන්තත්තා සුඛමිච්චෙව භාසිතා
තණ්හාය පච්චයා තස්මා හොන්ති තිස්සොපි වෙදනා
වෙදනා පච්චයා තණ්හා ඉති වුත්තා මහෙසිනා
වේදනා පච්චයා චාපි යස්මා නානුසයං විනා
හොති තස්මා න සා හොති බ්‍රාහ්මණස්ස වුසිමතො

දුක්පත් වූයේ සුව පතයි, සුවපත් වූයේ වැඩියෙන් සුව පතයි. උපේක්ෂාව වනාහි ශාන්ත වූ හෙයින් සැපම යයි කියනු ලැබේ.

එහෙයින් වේදනා තුනම තණ්හාවට ප්‍රත්‍යය වේ. මෙසේ වෙදනා පච්චයා තණ්හා'යි මහර්ෂීන් විසින් පවසනලදි.

වේදනාව ප්‍රත්‍යය කොට උපන වුවද, යම් හෙයකින් අනුසයෙන් තොරව තණ්හාව නොවේද, එහෙයින් බඹසර වැස නිමකළ රහතුනට එම තණ්හාව නොවේ.

මේ 'වේදනා පච්චයා තණ්හා යන පදයෙහි විස්තර කථායි.

——//——

'තණ්හා පච්චයා උපාදානං' යන පදයෙහිඃ-

උපාදානානි චත්තාරි තානි අත්ථවිභාගතො,
ධම්මසඞ්ඛෙප විත්ථාරා කමතො ච විභාවයෙ

උපාදාන සතරෙකි, එම සතර අර්ථ විභාග වශයෙන්ද, උපාදාන ධර්මයන් පිළිබඳව සංක්ෂේප වශයෙන් හා විස්තර වශයෙන්ද, ක්‍රමවශයෙන්ද විස්තර කරන්නේයි.

මේ එහි විස්තරාර්ථකථනයයිඃ- කාමූපාදානය, දිට්ඨූපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදූපාදානයයි මෙහි පළමු කොට උපාදාන සතරෙක් වේ. මේ එය පිළිබඳ අර්ථ විභාගයයිඃ (රූපාදි) වස්තු සංඛ්‍යාත වූ කාමය දැඩි සේ ග්‍රහණය කෙරෙති'යි 'කාමූපාදාන' නම්. කාම වූයේද එම උපාදාන වූයේදූයි හෝ කාමූපාදාන නම්. 'උපාදාන' යනු, දැඩිව ගැනීමයි. මෙහි 'උප' ශබ්දය දෘඪාර්ථයෙහි වේ; උපායාස, උපකුට්ඨ යන ආදියෙහි මෙනි.

එසේම දිට්ඨි වූයේද එම උපාදාන වූයේදූ'යි දිට්ඨූපාදාන නම්; දෘෂ්ටිය දැඩිව ගනිති'යි හෝ දිට්ඨූපාදාන නම්. ආත්මයද ලෝකයද ශාස්වත වෙති'යි යන ආදියෙහි (ලෝකය ශාස්වත වෙති'යි) පසුව කී දෘෂ්ටිය (ආත්මය ශාස්වත වෙති'යි) පළමුව කී දෘෂ්ටිය දැඩිව ගනී.

එපරිදිම සීලබ්බතය දැඩිව ගණිති'යි සීලබ්බතුපාදාන නම්, සීලබ්බත වූයේද එම උපාදාන වූයේදූ'යි හෝ සීලබ්බතුපාදාන නම්. මෙසේ ගෝ-සීල, ගෝ-වුත ආදියෙන් පිරිසුදු වෙති'යි සිය කැමැත්තෙන්ම ඇතුළත් වීමෙන් එම සීලව්‍රතාදිය උපාදාන නම් වේ.

එසේම මෙය කරණ කොට කියති'යි (වාද කෙරෙති'යි) වාද නම්. මෙය කරණ කොට දැඩිව ගනිති'යි උපාදාන නම්. කුමක් කියත්ද? කුමක් දැඩිව ගනිත්ද? ආත්මයයි. නොහොත්, ආත්මය දැඩි කොට ගැනීම 'අත්තවාදූපාදාන' නම්. හුදෙක් ආත්මවාද මාත්‍රයම හෝ මෙය කරණ කොට ආත්මයයි දැඩිව ගනිති'යි හෝ 'අත්තවාදූපාදාන' නම්. මේ වනාහි එම (සිවු) උපාදානයන් පිළිබඳ අර්ථ විභාගයයි.

(උපාදාන) ධර්මයන් පිළිබඳව සංක්ෂේප වශයෙන් හෝ විස්තර වශයෙන් දැක්වීමේදී වනාහිඃ පළමු කොට කාමූපාදානය නම්ඃ- එහි

කාමූපාදානය යනු කවරේද යත්, පංචකාම විෂයයෙහි යම් ඇලීමක්, රැඳීමක්, පිනායාමක්, තෘෂ්ණාවක්, සෙනෙහසක්, දාහයක්, මුසපත් වීමක්, ගැලීමක් වෙතොත් මෙය 'කාමූපාදාන'යයි කියනු ලැබේ[a] යනුවෙන් (විභඞ්ගයෙහි) ආ හෙයින් සංක්ෂේපයෙන් 'තෘෂ්ණා දෘඪත්වය'යි කියනු ලැබේ, තෘෂ්ණාදෘඪත්වය නම්, පළමු තෘෂ්ණාවම උපනිශ්‍රය ප්‍රත්‍යය වශයෙන් දැඩි බවට පත්වීමෙන් පසුව ඇතිවන (බලවත්) තෘෂ්ණාවයි.

කිසිවෙක් මෙසේ යෙති:- ''අත් පත් නොවූ කාම විෂයයක් පැතීම තණ්හාවයි, අඳුරෙහි සොරාගේ අත දිගු කිරීම වැනිය, අතට හසු වුණ විෂයය අල්වා ගැනීම උපාදානයයි, අත ගැසුණ බඩු අල්වා ගැනීම වැනිය,'' යනුවෙනි. තණ්හා. උපාදාන යන මේ ස්වභාවයෝ අප්පිච්ඡතා, සන්තුට්ඨිතා යන ගුණධර්මයනට ප්‍රතිපක්ෂ වූවාහුමය; එසේම පරියේසන දුක්ඛ (සෙවීමේ දුක), ආරක්ඛ දුක්ඛ (රැකීමේ දුක) යන මොවුනට මුල් වූවාහුය.

සෙසු උපාදානත්‍රයය වනාහි සංක්ෂේප වශයෙන් දෘෂ්ටිමාත්‍රයම වේ.

විස්තර වශයෙන් වනාහි, රූපාදී විෂයයෙහි ඉහත කී එක්සිය අටක් ප්‍රභේද ඇති තණ්හාවෙහි දැඩිබව කාමූපාදානයයි; දශවස්තුක මිථ්‍යාදෘෂ්ටිය දිට්ඨූපාදානයයි; එහෙයින් කීහු:- ''එහි දිට්ඨූපාදාන යනු කවරේදයත්:- ''දුන් දෙයෙහි විපාක නැත, පරිත්‍යාගයෙහි විපාක නැත, -පෙ- ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන මෙසේ කියති'යි යන මෙබඳු වූ දෘෂ්ටියක් වෙතොත්, -පෙ- විපරීත ග්‍රහණයක් වෙතොත්, මෙය දිට්ඨූපාදානයයි කියනු ලැබේ'' යනුවෙනි.

ශීල ව්‍රතයන්ගෙන් පාරිශුද්ධිය සිදු වෙති'යි යන පරාමර්ෂණය වනාහි සීලබ්බතුපාදානයයි; එහෙයින් කීහු:- ''එහි සීලබ්බතුපාදානය යනු කවරේද යත්, (මිථ්‍යා) ශීලයෙන් ශුද්ධිය වෙති'යි, ව්‍රතයෙන් ශුද්ධිය වෙති'යි. ශීලව්‍රතයෙන් ශුද්ධිය වෙති'යි යන මෙබඳු වූ දෘෂ්ටියක් -පෙ- විපරීත ග්‍රහණයක් වෙතොත් මෙය සීලබ්බතුපාදානය'යි කියනු ලැබේ'' යනුයි.

විසි වැදෑරුම් සක්කාය දිට්ඨිය අත්තවාදූපාදානයයි[b]; එහෙයින් කීහු:- ''එහි අත්තවාදූපාදාන යනු කවරේද යත්, මේ ලෝකයෙහි තත්‍වාවබෝධයෙන් තොර වූ පෘථග්ජන තෙමේ -පෙ- සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණේ රූපය ආත්මවශයෙන් ගනී. -පෙ- විපරීතග්‍රහණයෙන් ගනියිද, මෙය අත්තවාදූපාදානයයි කියනු ලැබේ.''[c] යනුයි.

මේ මෙහි ධම්ම සංඛේප-විත්ථාර කථා යි.

---

a. විභඞ්ගපාළි, බුද්දකවත්‍ථු විභඞ්ග

b. විභඞ්ගපාළි, බුද්දකවත්‍ථු විභඞ්ග

c. විභඞ්ග, බුද්දකවත්‍ථු විභඞ්ග

'කමතො' යන මෙහි, උත්පත්ති ක්‍රමය, ප්‍රහාණ ක්‍රමය, දේශනා ක්‍රමයයි ක්‍රමය ත්‍රිවිධ වේ. ඉමක් කොනක් නැති සංසාරයෙහි 'මේ මොහුගේ පළමු උපතැ'යි නොකිවහැකි වන හෙයින් ඒකාන්ත වශයෙන් ක්ලේශයන්ගේ උත්පත්ති ක්‍රමයක් නොකියනු ලැබේ; සාපේක්ෂ වශයෙන් වනාහි බොහෝ සෙයින් එක් භවයක් තුළ ආත්මදෘෂ්ටිය පෙරටු කොට ගත් ශාස්වත උච්ඡේද දෘෂ්ටි වශයෙන් අභිනිවේසය (පිවිසීම) වේ; අනතුරුව මේ ආත්මය ශාස්වතයයි ගත්තහුට ආත්ම විශුද්ධිය පිණිස සීලබ්බත-උපාදානයද, ආත්මය මෙතැතින් අවසන් වෙති'යි ගත්තහුට, එහෙයින්ම පරලෝකාපේක්ෂා නැත්තහුට, කාමූපාදානයද වෙති'යි මෙසේ පළමුව අත්තවාදූපාදානයද, අනතුරුව දිට්ඨි, සීලබ්බත, කාම යන උපාදාන තුනද'යි යනුවෙන් මෙසේ එක් ආත්මභාවයක් තුළ වූ උත්පත්ති ක්‍රමය වේ.

මෙහි දිට්ඨි-උපාදානාදී තුන සෝතාපත්ති මාර්ගයෙන් ක්ෂය වන හෙයින් පළමුව ප්‍රහීණ වේ; කාමූපාදානය අර්හත් මාර්ගයෙන් ක්ෂය කළයුතු හෙයින් පසුව ප්‍රහීණ වේ. මේ මොවුන්ගේ ප්‍රහාණ ක්‍රමයයි.

මේ උපාදානයන් අතුරෙන් කාමූපාදානය මහාවිෂයයක් වන හෙයින්ද, ප්‍රකට වූ හෙයින්ද, පළමුව දේශනා කරන ලදි. එය (ලෝභ) සිත් අට හා සම්ප්‍රයුක්ත වන හෙයින් 'මහාවිෂය' නම්. (ද්වේෂ, මෝහ) සිත් සතර හා සම්ප්‍රයුක්ත වන ඉතිරි උපාදාන තුන 'අල්පවිෂය' නම්වේ; කාමූපාදානය බොහෝ සෙයින් ජනයා පංචකාමයෙහි ඇලෙන සුලු හෙයින් ප්‍රකට වේ. සෙසු උපාදාන තුන එසේ නොවේ.

කාමූපාදානසහිත පුද්ගල තෙමේ කාමයන් ලබාගැනීම සඳහා (දිට්ඨි, සුත ආදී) කෞතුහල මංගල බහුල කොට ඇත්තෙක් වේ; 'අනතුරුව ඔහුට දිට්ඨි (උපාදාන)ය වෙති'යි දිට්ඨූපාදානය දක්වන ලදි. එය ප්‍රභේද වනුයේ සීලබ්බත උපාදාන, අත්තවාද උපාදාන යනුවෙන් ද්විවිධ වේ, ඒ දෙක අතුරෙන්ද, ගවයන්ගේ ක්‍රියා හෝ සුනඛයන්ගේ ක්‍රියා දැකීමෙන්ද දතහැකි වන හෙයින් ඖළාරිකයයි ගෙන සීලබ්බතුපාදනය පළමුකොට දක්වන ලදි. අත්තවාදූපාදානය සූක්ෂ්ම වන හෙයින් අවසන්හි දේශනා කරන ලදි. මේ උපාදානයන් පිළිබඳ දේශනා ක්‍රමයයි.

තණ්හාව පුරිමසෙස්සා එකධා හොති පච්චයො,
සත්තධා අට්ඨධා චාපි හොති සෙසත්තයස්ස සා.

මෙහි තණ්හාවම ප්‍රථම කාමූපාදනයට එක් අයුරෙකින්ද සෙසු උපාදාන තුනට සත් අයුරෙකින් හෝ අට අයුරෙකින්ද ප්‍රත්‍යය වේ.

තවද මෙහි මෙසේ දේශනා කරන ලද උපාදාන සතරෙන් ප්‍රථම කාමූපාදානයට කාම තණ්හාව උපනිශ්‍රය වශයෙන් එක් අයුරෙකින් ප්‍රත්‍යය වේ; තණ්හාවෙන් පිනවන ලද විෂයයන්හි උපදින හෙයිනි. සෙසු උපාදාන තුනට වනාහි, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත,

හේතු යන මේ ප්‍රත්‍යය වශයෙන් සත් අයුරෙකින් හෝ උපනිස්සය වශයෙන්ද ගෙන අට අයුරෙකින් හෝ ප්‍රත්‍යය වේ. යම් කලෙක එය උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වන්නේද, එකල සහජාත ප්‍රත්‍යය නොවන්නේමය.

මේ 'තණ්හා පච්චයා උපාදානං' යන පදයෙහි විස්තර කථා යි.

—//—

'උපාදානපච්චයා භවො' යන පදයෙහි

අත්ථතො ධම්මතො චෙව සාත්ථතො භෙදසඞ්ගහා,
යං යස්ස පච්චයො චෙව විඤ්ඤාතබ්බො විනිච්ඡයො

අර්ථ වශයෙන් ද, ධර්ම වශයෙන්ද, සාර්ථක වශයෙන්ද, භේද වශයෙන් හා සංග්‍රහ වශයෙන්ද, යම් උපාදානයක් යම් භවයකට ප්‍රත්‍යය වේනම් එහි ආකාර වශයෙන්ද විනිශ්චය දතයුතුය.

එහි 'වෙති' යි යන අරුතින් 'භව' නම් වේ, එය කර්ම භවය, උත්පත්ති භවයයි ද්විවිධ වේ. එහෙයින් කීහුඃ- 'භවය' දෙපරිද්දෙකින් වේ. කර්මභවයෙක් ඇත. උත්පත්ති භවයෙක්ද ඇත.' යනුවෙනි. එහි කර්මයම භව වූයේ කර්මභවයි, එසේම උත්පත්තියම භව වූයේ උත්පත්ති භවයි. මෙහිද උත්පත්තිය වෙති'යි යන අරුතින් 'භව' නම් වේ; කර්මය වනාහි, යම්සේ (බුදුන්ගේ උපත) සැපයට හේතු වන සෙයින් 'සුඛො බුද්ධානං උප්පාදො'යි කියන ලද්දේද, එසේම භවයට හේතු වන හෙයින් ඵලව්‍යවහාරයෙන් 'භව' නම් වෙති'යි දතයුතුය. මෙසේ පළමු කොට මෙහි අර්ථවශයෙන් විනිශ්චයය දතයුතුය.

ධර්ම වශයෙන් වනාහි, පළමුකොට, 'කම්මභව' යනු සංක්ෂේපයෙන් චේතනාවද, චේතනාව හා සමග යෙදුණ අභිධ්‍යාදී වූ කර්ම සංඛ්‍යාත ධර්මයෝයි. එහෙයින් කීහුඃ ''එහි 'කම්ම භව' යනු කවරේද යත්, පරිත්තභූමක (කාමාවචර) හෝ වේවා, මහාභූමක (රූපාවචර හා අරූපාවචර) හෝ වේවා, යම් මේ පුඤ්ඤාභිසංඛාරයක් අපුඤ්ඤාභිසංඛාරය හෝ ආනෙඤ්ජාභිසංඛාරයක් වේද, මෙය 'කම්මභව' යයි කියනු ලැබේ. භවගාමීවූ සියලුම කර්මයෝ 'කම්මභව' නම් වෙති.

මෙහි වනාහි පුඤ්ඤාභිසංඛාර යනු, (කාමාවචර හා රූපාවචර) කුශල චේතනා තෙළෙසයි, අපුඤ්ඤාභිසංඛාර යනු අකුශල චේතනා දොළොසයි; ආනෙඤ්ජාභිසංඛාර යනු, (අරූපාවචර) කුශල චේතනා සතරයි. මෙසේ 'පරිත්ත භූමකො වා මහාභූමකො වා' යන මෙයින් එම (පුඤ්ඤාභිසංඛාරාදි) චේතනාවන් පිළිබඳ වූම මඳ වූ හෝ බොහෝ වූ විපාක ස්වභාවය කියන ලදි. ''සබ්බම්පි භවගාමී කම්මං'' යන මෙයින් චේතනා සම්ප්‍රයුක්ත වූ අභිධ්‍යා ආදියම කියන ලදි.

උත්පත්ති භවය වනාහි, සංක්ෂේපයෙන් කර්මයෙන් හටගත් ස්කන්ධයි, ප්‍රභේද වශයෙන් එය නවවිධ වේ. එහෙයින් කීහු. ''එහි 'උප්පත්ති භව' යනු කවරේද යත්ඃ කාමභවය, රූපභවය, අරූප භවය, සඤ්ඤාභවය, අසඤ්ඤාභවය, නෙවසඤ්ඤානාසඤ්ඤා භවය ඒකස්කන්ධ භවය, චතුඃස්කන්ධභවය, පංචස්කන්ධභවයයි යන මේ නවය 'උප්පත්තිභව' යයි කියනු ලැබේ.

එහි කාම සංඛ්‍යාත වූ භවය කාමභවයයි, රූප-අරූපභව විෂයයෙහිද මෙම නයයි. (සඤ්ඤාවතං) සඤ්ඤා ඇත්තවුන්ගේ භවය, නොහොත්, සඤ්ඤාව මේ භවයෙහි ඇත්තේය'යි හෝ සඤ්ඤාභව නම්. මෙයට විපර්යය වශයෙන් අසඤ්ඤා භවය වේ. ඕළාරික වූ සඤ්ඤාව නැති හෙයින් හා සූක්ෂ්ම වූ සඤ්ඤාව ඇති හෙයින් හෝ, මේ භවයෙහි සඤ්ඤාව ඇත්තේද නැත. නැත්තේද නැතැ'යි 'නේවසඤ්ඤා නාසඤ්ඤාභව' නම් වේ. එක්ම රූපස්කන්ධයෙන් යුත් භවය ඒක වෝකාර (ස්කන්ධ) භව නම් වේ. මේ භවයෙහි එක්ම ස්කන්ධයක් ඇතැ'යි හෝ 'ඒක වෝකාර භව' නම්. චතුවෝකාර, පංච වෝකාර භවයන් පිළිබඳවද මෙම නයයි.

එහි කාමභවය උපාදාන වශයෙන් ගන්නා ලද ස්කන්ධ පසක් ඇත්තේ වේ; රූප භවයද එසේ ය; අරූපභවය (ස්කන්ධ) සතරක් ඇත්තේ වේ; සඤ්ඤාභවය (ස්කන්ධ) පසක් ඇත්තේ වේ; අසඤ්ඤ භවය උපාදාන වශයෙන් ගන්නා ලද එක්ම ස්කන්ධයක් ඇත්තේ වේ, නේවසඤ්ඤානාසඤ්ඤා භවය (ස්කන්ධ) සතරක් ඇත්තේ වේ. ඒක වෝකාර භව ආදිය (පිළිවෙළින්) ඒක ස්කන්ධ චතුඃස්කන්ධ, පංචස්කන්ධ ඇතිව උපාදාන වශයෙන් ගන්නා ලද ස්ඩයන්ගෙන් යුක්ත වූයේයයි මෙසේ මෙහි ධර්ම වශයෙන්ද විනිශ්චයය දතයුතුය.

සාත්‍ථතො (අපේක්ෂිත අර්ථ සහිත වීම් වශයෙන්) යනු, යම් සේ මෙම භව නිර්දේශයෙහි පුඤ්ඤාභිසංඛාරාදිය කියන ලද්දේද, එසේම ඉහත සංඛාර නිර්දේශයෙහිද කියන ලද්දේය; එහෙත් පෙර කී පුඤ්ඤාභිසංඛාර ආදිය, මේ භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූ අතීත කර්ම වශයෙන් කියන ලදි; මෙකී පුඤ්ඤාභිසංඛාර ආදිය අනාගත ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූ වර්තමාන කර්මයයි කී හෙයින් චේතනා සම්ප්‍රයුක්තඅභිධ්‍යා ආදියද අපේක්ෂිතය, ඉහත විඤ්ඤාණයට ප්‍රත්‍යය වූ කර්මය 'සංඛාර'යයි කියන ලදි, මෙහි අසඤ්ඤභවයෙහි උත්පත්තිය ඇති කරන කර්මයද 'භව' යයි කියන ලදි.

බොහෝ කොට (නැවත නැවතත්) කීම කුමක් සඳහාද යත්, ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යන මෙහි, පුඤ්ඤාභිසංඛාරාදී වශයෙන් කුශල-අකුශල යන දෙ-ආකාර වූ කර්මයන් කියන ලදි; මෙහි ''උපාදාන පච්චයා භවො'' යනුවෙන් උත්පත්ති භවයද ඇතුළත් කරන ලද හෙයින්, කුශල-අකුශල

අබ්‍යාකත යන තුන් ආකාර වූම කර්මය කියන ලදි. එහෙයින් මේ නැවත කීම සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේමය; මෙසේ මෙහි සාර්ථකතා වශයෙන්ද විනිශ්චයය දත යුතුය.

'භෙදසඞ්ගහා' යනු, උපාදාන ප්‍රත්‍යයෙන් වන භවයෙහි භේද වශයෙන්ද සංග්‍රහ වශයෙන්ද'යි යන අර්ථයි. කාමඋපාදාන ප්‍රත්‍යයෙන් කාමභවයෙහි උත්පත්තිය ඇති කරන යම් කර්මයක් කරනු ලැබේද, එය 'කම්මභව' නම්; එයින්ම උපදවන ලද ස්කන්ධ 'උප්පත්ති භව' නම්. රූප-අරූප භව විෂයයෙහිද මෙම නයයි. මෙසේ කාම-උපාදානයන් ප්‍රත්‍යය කොට (කර්ම හා උත්පත්ති වශයෙන්) කාම භව දෙක හා එම කාම භවයෙහිම ඇතුළත් සඤ්ඤාභව, පංච වෝකාර භවයන්ද, (එනයින්ම කර්ම හා උත්පත්ති වශයෙන්) රූපභව දෙකද හා එම රූපභවයෙහිම ඇතුළත් සඤ්ඤාභව, අසඤ්ඤාභව, ඒක වෝකාර භව, පංච වෝකාර භවයන්ද, (එනයින්ම) අරූප භව (කර්ම හා උත්පත්ති වශයෙන්) දෙක හා එහිම ඇතුළත් සඤ්ඤා භව, නේවසඤ්ඤා නාසඤ්ඤා භව, චතුර්වෝකාර භව යන මේ අන්තර්ගත භවයන් හා සමග මෙසේ භව සයක් වේ. යම්සේ කාමූපාදාන ප්‍රත්‍යයෙන් අන්තර්ගතයන් හා සමග භව සයක් වේද, එසේම සෙසු (දිට්ඨි, සීලබ්බත හා අත්තවාද යන) උපාදානයන් ප්‍රත්‍යය කොට ගෙනද සයක් සයක් වේ; මෙසේ උපාදානප්‍රත්‍යයෙන් අන්තර්ගත භවයන් හා සමග භව සූවිස්සක් වේ.

සංග්‍රහ වශයෙන් වනාහි, කාමූපාදානප්‍රත්‍යයෙන්, කර්මභව - උත්පත්ති භව යන දෙක එක් කොට අන්තර්ගත භවයන්ද සමග ගැනීමෙන් එක් කාම භවයක් වේ; රූප-අරූප භවයන්ද එසේම වෙති'යි භවත්‍රයයක් වේ, සෙසු (දිට්ඨි ආදී) උපාදාන තුන ප්‍රත්‍යය කොට ගෙනද ඒ ආකාරයෙන්ම අන්තර්ගත භවයන් හා සමග තුනක් තුනක් වශයෙන් වෙති'යි මෙසේ සංග්‍රහ වශයෙන් දොළොස් භවයෙක් වේ.

තවද, අවිශේෂයෙන් (සියලු) උපාදානයන් ප්‍රත්‍යය කොට ගෙන කාමභවයට පමුණුවන කර්මය 'කම්මභව' නම්; එම උපාදානයන්ගෙන්ම උපන් ස්කන්ධ 'උප්පත්ති භව' නම්; රූප-අරූප භව විෂයයෙහිද මේනයම වේ. මෙසේ අන්තර්ගතයන් හා සමග ගෙන, කාමභව දෙකෙක, රූපභව දෙකෙක, 'අරූපභව දෙකෙකැ'යි වෙනත් ක්‍රමයෙකින් සංග්‍රහ කිරීමෙන් භව සයෙක් වේ; කම්ම භව-උප්පත්ති භව භේදය නොසලකා, අන්තර්ගතයන් හා සමග ගෙන කාමභවාදී වශයෙන් භවත්‍රයයෙකි; කාමභවාදී භේදයටද - නොගොස්, කම්මභව උප්පත්ති භවයන් පමණක් ගැනීමෙන් භව දෙකක් වේ; කර්ම උත්පත්ති භේදයටද නොගොස්, උපාදානය ප්‍රත්‍යය කොට ගෙන භවය වෙති'යි භව වශයෙන් එක්ම භවය වේ. මෙසේ මෙහි උපාදාන ප්‍රත්‍යයෙන් වන භවය පිළිබඳ වූ භේද-සංග්‍රහ විනිශ්චයය දතයුතුය.

'යං යස්ස පච්චයො චෙව' (කවර උපාදානයක් කවර භවයකට ප්‍රත්‍යය වේද) යන මෙහි, යම් උපාදානයක් යම් භවයකට ප්‍රත්‍යය වේද, ඒ අනුවද විනිශ්චය දතයුතුය යන අර්ථයි. මෙහි, කවර නම් උපාදානයක් කවර නම් භවයකට ප්‍රත්‍යය වේද යත්; කිසියම් උපාදානයක් කිසි යම් භවයකට ප්‍රත්‍යය වන්නේමය. පෘථග්ජන තෙමේ වනාහි උම්මත්තකයකු වැනිය; හේ තෙමේ මේ යුතුය. මේ අයුතුය'යි නොවිමසා යම් කිසි උපදානයක් වශයෙන් යම්කිසි භවයක් පතා යම්කිසි කර්මයක් කෙරේමය; එහෙයින් සීලබ්බතුපාදානයෙන් රූපාරූප භවයන් නොවෙති'යි කිසිවෙක් කියත්ද, එය නොපිළිගත යුතුය. සියලු උපාදානයන්ගෙන් සියලු භවයන් වෙති'යි ගතයුතුය.

කෙසේද යත්ඃ මේ ලෝකයෙහි කිසිවෙක් අනුස්සව (ශ්‍රැති) වශයෙන් හෝ, දුටු දෙය අනුව හෝ, ''මේ කාමයෝ නම් මිනිස් ලොව ක්‍ෂත්‍රිය මහාසාරකුල ආදියෙහිද, කාමාවචර දේව ලෝක තුළද සමෘද්ධ වෙති'යි මෙසේ සිතා එම කාමසම්පත් ලබා ගැනීම පිණිස, අසද් ධර්ම ශ්‍රවණාදීයෙන් රවටන ලදුව, ''මේ මේ කර්මයෙන් කාමයෝ සැපයෙති'යි මෙසේ හඟිමින් කාමූපාදාන වශයෙන් කායදුශ්චරිතාදියද කෙරේ; හේ තෙමේ දුශ්චරිතයන් පිරීමෙන් අපායෙහි උපදියි; නැතහොත්, සාන්දෘෂ්ටික (මෙලොවදී ලැබිය යුතු) කාම සම්පත් පතමින් ලබා ඇති සම්පත් රකිමින් හෝ කාමූපාදාන වශයෙන් කායදුශ්චරිතාදියද කෙරේ; හේ තෙමේ කායදුශ්චරිතාදිය පිරීමෙන් අපායෙහි උපදියි. එහිදී ඔහුගේ උත්පත්තියට හේතු වූ කර්මය කර්මභවයයි; කර්මයෙන් නිපන් ස්කන්ධ උත්පත්ති භවයයි, සඤ්ඤාභව, පංචවෝකාර භව ආදිය එහිම අන්තර්ගත වේ.

අනෙකෙක් වනාහි, සද්ධර්ම ශ්‍රවණාදියෙන් වර්ධනය කරගන්නා ලද ඤාණයෙන් යුතුව මෙවන් කර්මයෙකින් කාම සම්පත් සැපයෙති'යි හඟිමින් කාමූපාදාන වශයෙන් කාය සුචරිතාදිය කෙරෙයි; හේ සුසිරිත් දහම් පිරීමෙන් දෙව්ලොව හෝ මිනිස් ලොව උපදියි; එහිදී ඔහුගේ උත්පත්තියට හේතු වූ කර්මය 'කම්මභව' නම්; කර්මයට අනුව නිපන් ස්කන්ධ උත්පත්ති භව' නම්. සඤ්ඤාභව, පංචවෝකාරභව යන මොහු එහි අන්තර්ගතයෝයි. මෙසේ කාමූපාදානය ප්‍රභේද සහිත වූද, අන්තර්ගත භව සහිත වූද කාමභවයට ප්‍රත්‍යය වේ.

තවද අනෙකෙක් තෙමේ, රූප-අරූප භවයන්හි කාම සම්පත් කාම භවයට වඩා සමෘද්ධ යයි අසා හෝ සලකා කාමූපාදාන වශයෙන්ම රූප-අරූප සමාපත්ති උපදවා සමාපත්ති බලයෙන් රූප-අරූප බ්‍රහ්ම-ලෝකයන්හි උපදියි; එහිදී ඔහුගේ උත්පත්තියට හේතුවූ කර්මය 'කම්මභව' නම්; කර්මභවයට අනුව උපන් ස්කන්ධ 'උප්පත්ති භව' නම්. සඤ්ඤාභව, අසඤ්ඤාභව, නේවසඤ්ඤා නාසඤ්ඤා භව, ඒක-චතු-පංච වෝකාර භව යන මේ සියල්ල එහි අන්තර්ගත වේ; මෙසේ කාමූපාදානය ප්‍රභේද සහිත වූ ද, අන්තර්ගත භව සහිත වූද රූප-අරූප භවයනටද ප්‍රත්‍යය වේ.

තවද අනෙංකෙක් තෙමේ, ''මේ ආත්මය තෙමේ කාමාවචර සම්පත් ඇති භවයෙහිදී හෝ රූප-අරූප භවයන් අතුරින් කිසියම් භවයෙක්හිදී හෝ සිඳී ගිය විට, මනා සේ සිඳී ගියේ වන්නේය'යි උච්ඡේද දෘෂ්ටි ගෙන, එයට පමුණුවන කර්මයන් කෙරේ; ඔහුගේ එම කර්මය 'කම්ම භව' නමි; කර්මයෙන් නිපන් ස්කන්ධ 'උප්පත්ති භව' නමි. සඤ්ඤා භවාදිය වනාහි එහිම අන්තර්ගත වේ. මෙසේ දිට්ඨූපාදානය ප්‍රභේද සහිතවූද, අන්තර්ගතයන් සහිතවූද කාම, රූප, අරූප යන භවත්‍රයයටම ප්‍රත්‍යය වේ.

යලිදු අනෙකෙක් තෙමේ, 'මේ ආත්මය කාමාවචර සම්පත් ඇති භවයෙහිදී හෝ රූප-අරූප භවයන් අතුරෙන් එක්තරා භවයෙක්හිදී හෝ, ක්ලේශ පරිදාහයන් පහවී ගොස් සුඛිත වන්නේය'යි අත්තවාදූපාදානයෙන්, එයට පමුණුවන කර්මයන් රැස් කෙරේ; ඔහුගේ එම කර්මය 'කම්ම භව' නමි; එයින් නිපන් ස්කන්ධ 'උප්පත්ති භව' නමි. සඤ්ඤා භව ආදිය වනාහි එහිම අන්තර්ගත වේ; මෙසේ අත්තවාදූපාදානය ප්‍රභේද සහිත වූද, අන්තර්ගතයන් සහිත වූද භවත්‍රයයටම ප්‍රත්‍යය වේ.

තවද අනෙකෙක් තෙමේ ''මේ සීලබ්බතය නම් කාමාවචර සම්පත් ඇති භවයෙහිදී හෝ රූපාරූප භවයන් අතුරෙන් එක්තරා භවයෙක්හිදී හෝ පුරන්නහුට සුවසේ පිරිපුන් බවට යෙති'යි සීලබ්බතූපාදාන වශයෙන් එය කරා පමුණුවන කර්මය කෙරේ; ඔහුගේ එම කර්මය කම්මභව' නමි; එයින් නිපන් ස්කන්ධ 'උප්පත්තිභව' නමි. සඤ්ඤාභව ආදිය එහිම අන්තර්ගත වේ. මෙසේ සීලබ්බතූපාදානයද, ප්‍රභේද සහිතවූද, අන්තර්ගතයන් සහිත වූද භවත්‍රයටම ප්‍රත්‍යය වේ. මෙසේ මෙහි යම් උපාදානයක් යම් භවයකට ප්‍රත්‍යය වේද, ඒ අනුවද මෙහි විනිශ්චයය දතයුතුය.

මෙහි කවර උපාදානයක් කවර භවයකට කවර ආකාරයෙන් ප්‍රත්‍යය වේද යත්:

රූපා රූපභවානං උපනිස්සය පච්චයො උපාදානං
සහජාතාදීහිපිතං කාමභවස්සාති විඤ්ඤෙය්‍යං

රූපාරූපභවයනට උපාදානය උපනිස්සය වශයෙන් ප්‍රත්‍යය වේ; කාමභවයට එය සහජාත ආදී වශයෙන්ද ප්‍රත්‍යය වෙතැ'යි දතයුතුය.

රූපාරූප භවයනටද, කාමභවයෙහි කම්මභවයට අයත් කුශල කර්මයටද, (කාම භවයෙහිම වූ) උප්පත්ති භවයටද, මේ සිවු වැදෑරුම් වූම උපාදානය උපනිස්සය ප්‍රත්‍යය වශයෙන් එක්ම අයුරෙකින් ප්‍රත්‍යය වේ; කාමභවයෙහි, (එම උපාදානය) තමා සමග සම්ප්‍රයුක්ත අකුසල කම්මභවයට, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්‍ථි, අවිගත,

හේතු යන මේ ප්‍රත්‍යය ප්‍රභේද සහිත සහජාත ආදි ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ; විප්‍රයුක්තයට වනාහි උපනිස්සය වශයෙන්ම ප්‍රත්‍යය වේ.

මේ 'උපාදාන පච්චයා භවො' යන පදයෙහි විස්තර කථායි.

—//—

'භව පච්චයා ජාති' යන ආදියෙහි ජාති ආදිය පිළිබඳ විනිශ්චයය (ඉහත) සච්ච නිද්දේසයෙහි කීනයින්ම දතයුතුය. 'භවො' යන මෙහි වනාහි (හුදෙක්) කම්මභවයම අභිප්‍රේතයි; ජාතියට ප්‍රත්‍යය වනුයේ එයම මිස උප්පත්ති භවය නොවේ. එම කම්මභවය වනාහි කම්ම පච්චය, උපනිස්සය පච්චය වශයෙන් දෙ-අයුරෙකින් (ජාතියට) ප්‍රත්‍යය වේ.

මෙහිදී මෙවන් චෝදනාවක් (පැනයක්) නැඟිය හැකියඃ 'භවය ජාතියට ප්‍රත්‍යය වෙති'යි යන මෙය කෙසේ දතහැකිද?' යනුවෙනි. බාහිර හේතුන් සමත්‍වයෙන් පවත්නා කල්හි පවා හීන-ප්‍රණීතතාදී විශේෂයන් දක්නට ලැබෙන හෙයිනි යනු පරිහාරයිඃ- ඒ එසේමැයි, පිතෘ, මාතෘ, ශුක්‍ර ශ්‍රෝණිත, ආහාර ආදී බාහිර ප්‍රත්‍යයන් සමව පවත්නා කල්හි පවා සත්‍වයන්ගේ- නිවුන් දරුවන් ගේ පවා- හීන, ප්‍රණීතතාදී විශේෂය දක්නා ලැබේ; එම විශේෂයද අහේතුක නොවේ; සියලු කල්හි සියල්ලනටම (අනිවාර්යයෙන්) නොවන හෙයිනි. කර්මභවය හැර අන් හේතුවක් නිසා සිදු වන්නේද නොවේ; එම කර්මභවයෙන් උපන් සත්‍වයන්ගේ අධ්‍යාත්ම සන්තානයෙහි අන් හේතුවක් නැති හෙයින් කර්මභවයම හේතු කොට ඇත්තේය; කර්මයම වනාහි සත්‍වයන්ගේ හීන ප්‍රණීතතා ආදී විශේෂයට හේතු වේ; එහෙයින් වදාළහ. භාග්‍යවතුන් වහන්සේඃ "කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය"[a] (කර්මය හීන ප්‍රණීතා වශයෙන් සත්‍වයන් බෙදයි) යනුවෙනි. එහෙයින් භවය ජාතියට (ඉපදීමට) ප්‍රත්‍යය වෙති'යි යන මෙය දතයුත්තේය.

තවද යම් හෙයකින් ජාතියක් නැති කල්හි ජරා-මරණ හෝ ශෝකාදී ස්වභාවය හෝ නොවේද, ජාතියක් ඇති කල්හිම ජරාමරණ වේද, ජරාමරණ සංඛ්‍යාත දුඃඛස්වභාවයන් ගෙන් පහර ලත් අඥාන ජනයාට එම ජරාමරණ හා සමග සම්බන්ධවූ හෝ, ඒ ඒ දුඃඛ ස්වභාවයෙන් පහර ලද්දහුට ජරා මරණ හා සම්බන්ධ නොවූ හෝ ශෝකාදී ස්වභාවය වේද, එහෙයින් මේ ජාතිය ජරාමරණයනට මෙන්ම ශෝකාදියටද ප්‍රත්‍යය වෙති'යි දතයුත්තේය. එම ජාතිය උපනිස්සමය වශයෙන් එක්ම අයුරෙකින් ප්‍රත්‍යය වේ.

මේ 'භව පච්චයා ජාති' යන ආදියෙහි විස්තර කථායි.

—//—

a. ම. නි., චූලකම්මවිභඞ්ග සුත්ත

යම් හෙයකින් වනාහි මෙහි ශෝක ආදිය අවසන්හි කියන ලද්දේද, එහෙයින් යම් ඒ අවිද්‍යාවක් වේද, එය 'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යනුවෙන් මේ භවචක්‍රයෙහි මුලින්ම කියන ලදි. එයඃ-

සොකාදීහි අවිජ්ජා - සිද්ධා, භවචක්කමවිදිතාදිමිදං
කාරක වෙදක රහිතං - ද්වාදසවිධ සුඤ්ඤතා සුඤ්ඤං

ශෝකාදිය හේතු කොට ගෙන අවිද්‍යාව සිද්ධ වේ; ආරම්භයක් දත නොහෙන, කරන්නකු හෝ විඳින්නකු නැති, ද්වාදශවිධ ශූන්‍යතායෙන් ශූන්‍ය වූ මේ භවචක්‍රය,

නිරන්තරයෙන් අඛණ්ඩව පවත්නේයයි දතයුතුය. මෙහි කෙසේනම් ශෝකාදියෙන් අවිද්‍යාව සිද්ධ වේද? කෙසේ නම් මේ භවචක්‍රයෙහි ආරම්භය නොදතහැකි වේද? කරන්නකු හෝ විඳින්නකු නැති වනුයේ කෙසේද? ද්වාදශවිධ ශූන්‍යතායෙන් ශූන්‍ය වනුයේ කෙසේද?

මෙහි වනාහි, ශෝක, දෞර්මනස්‍ය, උපායාස යන මොහු අවිද්‍යාවෙන් තොරව පැවතිය නොහැකිය; පරිදේවය (වැලපීම)ද මුළාවූවහුටම වේ; ඒ ශෝකාදිය පළමුව සිද්ධ වූ පසු අවිද්‍යාවද සිද්ධ වේ; තවද, 'ආසව සමුදයා අවිජ්ජා සමුදයො' (ආශ්‍රවයන් හට ගැනීමෙන් අවිද්‍යාව හටගනී)යි කියන ලදි. මේ ශෝකාදිය ආශ්‍රවයන්ගෙන්ම හටගනියි. කෙසේද යත්ඃ-

පළමු කොට වස්තුකාම වියෝගයෙහිදී ඇති වන ශෝකය කාමශ්‍රවයෙන් හටගනියි. එහෙයින් කීහුඃ-

තස්ස චෙ කාමයමානස්ස ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ල විද්ධො'ව රුප්පති.[a]

(වස්තු) කාමයෙහි ඇලුණු සිත් ඇති, (ක්ලේශ) කාම වශයෙන් හටගත් ආශා ඇති සත්වයාගේ එම කාමයන් පිරිහෙත් හොත් ශල්‍යයෙකින් (හීයෙකින්) විදින ලද්දකු සෙයින් පීඩාවට පත්වේ.

මෙසේද කීහුඃ- 'කාමතො ජායතී සොකො' (කාමය හේතු කොට ගෙන ශෝකය උපදියි) යනුයි. මේ සියල්ලම දිට්ඨාසව හේතුවෙන් හටගනියි. එහෙයින් කීහුඃ- ''මම රූපය වෙමි, මේ මාගේ රූපයයි'' යනුවෙන් උදම් වන ඕහට එම රූපය විපරිණාම හේතුවෙන් වෙනස් වන විට සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්ස-උපායාසයෝ උපදිත්'' යනුයි.

දිට්ඨාසවයන් සෙයින්ම භවාසවයෝද හට ගනිති. එහෙයින් කීහුඃ- ''දීර්ඝායුෂ්ක වූ, වර්ණසම්පන්න වූ, සුඛ බහුල වූ යම් මේ දෙවි කෙනෙක් උත්තුංග විමානයන්හි ඉතා දිගුකලක් ජීවත් වෙත්ද, ඔහු පවා තථාගතයන්

a. මහානිද්දෙස, කාමසුත්ත

වහන්සේගේ ධර්ම දේශනාව අසා භයට, සන්ත්‍රාසයට, සංවේගයට පත් වෙති'' යනුවෙන් පස් පෙර නිමිති දැක භයින් තැතිගත් දෙවියන් සෙයිනි.

භවාසවයන් හටගැනීම යම් සේද අවිජ්ජාසවයන් හටගැනීමද එසේම වේ. එහෙයින් කීහු:- ''මහණෙනි ඒ අන්‍ධබාල තෙමේ ඉහාත්ම භාවයෙහිදීම තුන්වැදෑරුම්* දුක් දොම්නස් විඳින්නේ වේ'' යනුයි.

මෙසේ යම් හෙයකින් මේ (ශෝකාදී) ස්වභාවයෝ ආශ්‍රවයනට හේතු වෙත්ද, එහෙයින් ඔහු සිදු වන්නාහු, අවිද්‍යාවට හේතු භූත වූ ආශ්‍රවයන්ද උපදවති. ආශ්‍රවයන් සිද්ධ වූ කල්හි ප්‍රත්‍යය භාවය සිද්ධ වන හෙයින් අවිද්‍යාවද සිද්ධ වූයේම වේ. මෙසේ පළමුකොට මෙහි ශෝකාදිය හේතුකොට ගෙන අවිද්‍යාව සිද්ධ වෙති'යි දතයුතුය.

යම් හෙයකින් වනාහි, මෙසේ ප්‍රත්‍යයභාවය ඇති වීමෙන් අවිද්‍යාව සිද්ධ වූ කල්හි, නැවත ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං'' යනුවෙන් මෙසේ හේතුඵල- පරම්පරාවෙහි කෙළවරක් නැත. එහෙයින් හේතුඵල සම්බන්ධ වශයෙන් පවත්නා දොළොස් අංගයෙකින් යුත් ඒ භවචක්‍රය 'අවිතාදි' (ආරම්භයක් දත නොහැකි) නම් වෙතැයි යනු සිද්ධය.

එසේ වෙතොත්, 'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යනුවෙන් මෙසේ ආදිමාත්‍ර කථනය (ආරම්භය පමණක් කීම) විරෝධ නොවේද යත්: මේ ආදිමාත්‍රකථනයක් නොවේ; මේ ප්‍රධාන සාධකය දැක්වීම යි. (කර්ම, ක්ලේශ, විපාක) යන ත්‍රිවිධ** වට්ටයටම අවිද්‍යාව ප්‍රධාන වේ; අවිද්‍යාව ගැනීමෙන් සෙසු කෙලෙස්වටයද, කර්මාදියද අඥානයා පෙළයි; සර්පයකුගේ හිස අල්වාගත් විට ඉතිරි සර්පශරීරය බාහුව වෙළාගන්නා සේය. අවිද්‍යාව සිඳලූ කල්හි වනාහි, ඒ කෙලෙස්වට ආදියෙන් විමෝක්ෂය (මිදීම) සිදුවේ. සර්පයාගේ හිස සිඳලූ කල්හි (සර්ප ශරීරයෙන්) වෙළා ගන්නා ලද බාහුව මිදෙන සේය. එහෙයින් කීහු: ''අවිජ්ජායත්වේව අසෙස විරාග නිරොධා සඞ්ඛාර නිරොධො' (අවිද්‍යාව නිරවශේෂයෙන් නිරුද්ධ වීමෙන් සංඛාර නිරෝධය වේ) යන ආදිය යි. මෙසේ යම් (ධර්මයක්) ගන්නාහට බන්ධනයද මුදාහරින්නාහට මෝක්ෂයද වේ නම්, එම ප්‍රධානධර්මය ගැන කීමෙකි; ආදිමාත්‍රකථනයක් නොවේ. මෙසේ මේ භවචක්‍රය දත නොහැකි ආරම්භය ඇත්තෙකැ'යි දතයුතුය.

ඒ මේ භවචක්‍රය වූකලී අවිද්‍යාදී හේතූන්ගෙන් ඇති වන සංඛාරාදී ඵලයන්ගේ පැවැත්මයි; එහෙයින් ඉන් බැහැර වූ බ්‍රහ්ම, මහාබ්‍රහ්ම, ශ්‍රේෂ්ඨ, සංජිත යන ආදි වශයෙන් මෙසේ පරිකල්පනය කරනු ලබන

* මාතර ශ්‍රී ධර්මවංශ හිමිපාණෝ: සිංහල විශුද්ධි මාර්ගය, 446 වැනි පිටුව, ත්‍රිවිධ දුඃඛ - දෞර්මනස්සයන් දක්වා ඇත.

** එම.

සංසාර කාරකයකු හෝ 'මේ වනාහි මාගේ ආත්මයයිද, එය කථා කරන්නෙකැයිද, විඳින්නෙකැයිද පරිකල්පිත, සුවදුක් විඳින ආත්මයක් හෝ නැත. මෙසේ කරන්නකු හෝ විඳින්නකු නොමැති (කාරක වේදක රහිතං) යයි දතයුතුය.

මෙහි වනාහි. යම් හෙයකින් අවිද්‍යාව ඇතිව නැතිවී යන ස්වභාවයෙන් යුක්ත වූ හෙයින් නිත්‍ය භාවයෙන්ද, කිලටිවූද කෙලසන සුලුවූද ස්වභාව ඇති හෙයින් ශුභභාවයෙන්ද, උදයව්‍යය යන දෙකින් පෙළන හෙයින් සුඛභාවයෙන්ද, ප්‍රත්‍යයනට අයත් පැවතුම් ඇති හෙයින් තමා වශයෙහි පවත්වා ගත හැකි ආත්මභාවයෙන්ද ශූන්‍ය (තොර) වේද, සංඛාරාදී වූ අංගයෝද එසේ වෙති. යම් හෙයකින් අවිද්‍යාව ආත්මය නොවේද, ආත්මයට අයත් වූවක් හෝ නොවේද, ආත්මය තුළ වූවක් හෝ නොවේද, ආත්මසහිත වූවක් හෝ නොවේද සංඛාරාදීවූ අංගයෝද එසේම වෙති. එහෙයින් මේ භවචක්‍රය දොළොස් වැදෑරුම් ශූන්‍යතායෙන් ශූන්‍ය වූවෙකි'යි දතයුතුය. මෙසේද දැන යලිදූ:-

තස්සාවිජ්ජා තණ්හා මූල මතීතාදයො තයො කාලා
ද්වෙ අට්ඨ ද්වෙ එවච සරූපතො තෙසු අඞගානි

ඒ භවචක්‍රයෙහි, අවිද්‍යා, තෘෂ්ණා යන දෙක මූලයයි; එහි අතීතාදි කාල තුනක් වේ; එහි ස්වරූප වශයෙන් (පිළිවෙළින්) දෙකක්, අටක් හා නැවත දෙකක් වශයෙන් අංග ඇත්තේය.

ඒ භවචක්‍රයෙහි වනාහි අවිද්‍යා තෘෂ්ණා යන දෙක මූලයයි දතයුතුය. එයින් මේ වේදනාවෙන් අවසන් වන අවිද්‍යා මූලය පූර්වාන්තයෙහි සිට ගෙන එන හෙයින්ද, ජරාමරණයන්ගෙන් අවසන් වන තෘෂ්ණා මූලය අපරාන්තය හා සමග සම්බන්ධ කරන හෙයින්දයි දෙ-ආකාර වේ.

එයින් පළමුවැන්න දෘෂ්ටිචරිත වශයෙන්ද, දෙවැන්න තෘෂ්ණාචරිත වශයෙන්ද කියන ලදි; දෘෂ්ටිචරිතයනට අවිද්‍යාවද, තෘෂ්ණා චරිතයනට තෘෂ්ණාවද සංසාරය කරා මෙහෙයවයි. පළමුවැන්න උච්ඡේද දෘෂ්ටිය උපුටා දැමීම සඳහා දේශනා කරන ලදී. (සංඛාර, විඤ්ඤාණ ආදී) ඵලයන් ඉපැදවීමට හේතු වූ අවිද්‍යාදිය නොසිඳ පවත්නා බව ප්‍රකාශ වන හෙයිනි. දෙවැන්න ශාස්වත දෘෂ්ටිය උපුටා දැමීම සඳහා හෝ දේශනා කරන ලදි; උපන්නවුන්ගේ ජරාමරණයන් ප්‍රකාශ වන හෙයිනි. නොහොත් පළමු වැන්න (අවිද්‍යාමූලය) ගබ්භසෙය්‍යක (හෙවත් ජලාබුජ) සත්වයන් සඳහා කියන ලදි; (හේතුඵල) පිළිවෙළ නොසිඳී පවත්නා බව ප්‍රකාශවන හෙයිනි; දෙවැන්න (තෘෂ්ණාමූලය) ඕපපාතික සත්වයන් සඳහා දේශනා කරන ලදි; (උත්පත්තිය හා ස්කන්ධයන්) එකවිට ඉපැදීම ප්‍රකාශ වන හෙයිනි.

ඒ භවචක්‍රයෙහි අතීතය, ප්‍රත්‍යුත්පන්නය, අනාගතයයි කාලත්‍රයයක් වේ; ඔවුනතුරෙන් පෙළෙහි ස්වරූපයට අනුව ආ පරිදි, අවිජ්ජා, සංඛාර

යන අංග දෙක අතීත කාලයයිද, විඤ්ඤාණයෙන් පටන් ගෙන භවයෙන් අවසන් වන අංග අට ප්‍රත්‍යුත්පන්න කාලයයිද, ජාති හා ජරාමරණ යන අංග දෙක අනාගත කාලයයිද දතයුතුය. තවද:

හේතුඵල හේතුපුබ්බක - තිසන්ධි චතුභේද සංගහඤ්චෙව,
වීසති ආකාරාරං - තිවට්ටමනවට්ඨිතං භවති ඉතිපි වෙදිතබ්බං

හේතු ඵල - හේතු පූර්වක වශයෙන් සන්ධි තුනක් ඇති, භේද-සංග්‍රහ සතරක් ඇති, විසි ආකාර අර සහිත, වට තුනක් ඇති, මේ භවචක්‍රය නැවැත්මක් නැතිව භ්‍රමණය වෙති'යිද දතයුතුය.

එහි, සංඛාරයන් හා ප්‍රතිසන්ධිවිඤ්ඤාණය අතර 'හේතුඵල සන්ධි' නම් එක් සන්ධියෙකි; වේදනා හා තණ්හා යන දෙක අතර 'ඵලහේතු සන්ධි' නම් එක් සන්ධියෙකි, භව-ජාති යන දෙක අතර නැවත 'හේතු-ඵල සන්ධි' නම් එකෙකැ'යි මෙසේ මේ හේතු-ඵල-හේතු පූර්වක සන්ධි තුන දතයුතුය.

සන්ධීන් පිළිබඳ මුල-අග නියම කිරීම් වශයෙන් මෙහි සංග්‍රහ (පිඬු කිරීම්) සතරෙක් වේ. ඒ මෙසේයි:- අවිජ්ජා-සංඛාර යන දෙක එක් සංග්‍රහයෙකි; විඤ්ඤාණ - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා යන පස දෙවැන්නයි; තණ්හා - උපාදාන - භව යන තුන තෙවැන්නයි; ජාති - ජරා - මරණ සංග්‍රහය සිවුවැන්නයි. මෙසේ මේ මෙහි චතුභේද - සංග්‍රහයයි දතයුතුය.

අතීතෙ හෙතවො පඤ්ච ඉදානි ඵලපඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච ආයතිං ඵල පඤ්චකන්ති.

අතීත හේතු පසෙකි; වර්තමාන ඵල පසෙකි; වර්තමාන හේතු පසෙකි; අනාගත ඵල පසෙකි, මේ විංශද් ආකාර සංඛ්‍යාත අරයන් හේතුකොට ගෙන (භව චක්‍රය) වීසති ආකාර - අර නම් වෙති'යි දතයුතුය.

එහි 'අතීතෙ හේතවො පඤ්ච' යනු, පළමුකොට, අවිජ්ජා - සංඛාර යන දෙක කියන ලද්දේමය. යම් හෙයකින් වනාහි, අඥාන තෙමේ තෘෂ්ණාවෙන් මඩිනු ලබයිද, එසේ මඩනා ලද්දේ, (තෘෂ්ණාවෙන්) දැඩිව අල්වා ගනියිද, ඔහුට එම උපාදානය හේතු කොට ගෙන භවය වේ; එහෙයින් තණ්හා, උපාදාන, භව යන තුනද ගන්නා ලද්දේ වේ. එහෙයින් කීහු - "පුරිම කම්ම - භවස්මිං මොහො අවිජ්ජා - ආයූහනා සඞ්ඛාරා - නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවොති ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා" (පූර්ව කර්මභවයෙහි, මෝහ හෙවත් අවිද්‍යාවය, ආයූහන (රැස් කිරීම) හෙවත් සංඛාරය, ඇලීම් සංඛ්‍යාත තෘෂ්ණාවය, දැඩිව අල්වා ගැනීම වන උපාදානය, චේතනා හෙවත් භවයයි යන ධර්ම පංචකය මෙම භවයෙහි ප්‍රතිසන්ධිය පිණිස ප්‍රත්‍යය වේ).

එහි, 'පුරිමකම්මභවස්මිං' යනු, පූර්වකර්මභවයෙහි, පෙර ජාතියෙහි කර්මයන් රැස් කරන කල්හිය යන අර්ථයි 'මොහො අවිජ්ජා' යනු, එකල දුක්ඛ ආදී විෂයයෙහි යම් මූළාවෙක් වීද, යම් හෙයකින් මූළාවට පත්ව කර්මයන් රැස් කෙරේද, එය අවිද්‍යාවයි. 'ආයූහනා සඞ්ඛාරා' යනු, ඒ කර්මය කරන්නහුට යම් පූර්ව චේතනාවක් වේද, ඒ මෙසේයි:- 'දානයක් දෙමි'යි යන සිත උපදවා ගෙන මාසයක් හෝ අවුරුද්දක් හෝ දානෝපකරණ සම්පාදනය කරන්නකුට උපදිනුයේ පූර්ව චේතනායි; ප්‍රතිග්‍රාහකයන් අත දානය තබන්නකුට ඇතිවන චේතනා 'භව' යයි කියනු ලැබේ. නොහොත්, එක් ආවර්ජනයක් තුළ වූ ජවන් සිත් සයෙක්හි රැස්වන චේතනා 'සංඛාර' නම්වේ; සත්වැන්න 'භව' නම් වේ. යම් හෝ චේතනාවක් 'භව' වේද, එය හා සම්ප්‍රයුක්ත ආයූහනය (රැස් කිරීම) 'සංඛාර' නම්වේ. 'නිකන්ති තණ්හා' යනු, කර්මයක් කරන්නහුට එහි ඵලය වූ උත්පත්ති භවය කෙරෙහි යම් කැමැත්තක්, පැතීමක් වේනම්, එය තණ්හා නම්; 'උපගමනං උපාදානං' යනු කර්මභවයට ප්‍රත්‍යය වූ යම් මේ කර්මයක් කොට, අසුවල් තැන (ඉපිද) කාමයන් සේවනය කරන්නෙමියි, නැතහොත්, සිඳලන්නෙමි'යි යන ආදි නයින් පැවති යම් එල්බ ගැනීමක්, ග්‍රහණයක්, පරාමර්ශනයක් වෙතොත්, මෙය 'උපාදාන' නම් වේ; 'චේතනා භවො' යනු, ආයුහනය අවසන්හි කියන ලද චේතනා භවයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය.

ඉක්බිති, ඵලපඤ්චකං' යනු, විඤ්ඤාණය පටන් වේදනාව තෙක් පෙළෙහි ආ ඵල පඤ්චකයයි; එහෙයින් කීහුඃ 'ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා ඉති ඉමෙ පඤ්චධම්මා ඉධූපපත්ති භවස්මිං පුරෙ කතස්ස කම්මස්ස පච්චයා'' (මේ භවයෙහි, විඤ්ඤාණං යනු, ප්‍රතිසන්ධියයි; 'නාමරූපං' යනු, (මව්කුස) වැද ගැනීමයි; 'ආයතනා' යනු, චක්ඛු ආදී වූ පසාද පංචකයයි, 'ඵස්ස' යනු, අරමුණු සමග ගැටීමයි; 'වෙදනා' යනු, විඳිනු ලැබීමයි;) මෙසේ මේ උත්පත්ති භවයට අයත් ධර්ම පංචකය පූර්වභවයෙහි කළ කර්මය ප්‍රත්‍යය කොට ගෙන සිදුවේ) යනුයි.

එහි 'පටිසන්ධි විඤ්ඤාණං' යනු, යමක් භවාන්තර ප්‍රතිසන්ධි වශයෙන් උපන් හෙයින් ප්‍රතිසන්ධි යයි කියනු ලැබේද, එම විඤ්ඤාණයයි; 'ඔක්කන්ති නාම රූපං' යනු, රූපා-රූප ධර්මයන් (මව්කුසට) වැදගැනීම, අවුත් පිවිසීම වැනි යමක් සිදුවේද, එය නාමරූපයි; 'පසාදො ආයතනං' යනු, මෙය චක්ෂුරාදී පංචායතන වශයෙන් කියනලදි; 'ඵුට්ඨො ඵස්සො' යනු, යමක් අරමුණ හා ගැටුණේද, ගැටෙමින් උපන්නේද, එය ඵස්සයයි; 'වෙදයිතං වෙදනා' යනු, ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග හෝ ෂඩායතන ප්‍රත්‍යය කොට ගෙන හෝ ඵස්සය සමග උපන්නේද, යම් විපාක විඳුනයක් වේද, එය වේදනාවයි; යනුවෙන් මෙසේ අර්ථය දතයුතුය.

'ඉදානි හෙතවො පඤ්ච' යනු, තණ්හාව ආදි කොට පෙළෙහි ආ තණ්හා, උපාදාන, භව යන මොහුද, - භවය ගත් කල එයට පෙරටු වූ, නැතහොත්, එය හා සම්ප්‍රයුක්ත වූ සංඛාරයෝ ගන්නා ලද්දාහුමය; තණ්හා, උපාදාන යන දෙක ගැනීමෙන් ඔවුන් හා සම්ප්‍රයුක්ත ධර්මයෝද ගැනෙති, යමක් හේතු කොට ගෙන මුළාවට පත්ව කර්මයන් රැස් කෙරේද, ඒ අවිද්‍යාව ගන්නා ලද්දේම වේ යනුවෙන් මෙසේ වර්තමාන හේතු පංචකය ගැනේ. එහෙයින් කීහු:- 'ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා, ආයූහනා සඞ්ඛාරා, නිකන්ති තණ්හා, උපගමනං උපාදානං, චෙතනා භවො, ඉති ඉමෙ පඤ්ච ධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා'' (මේ භවයෙහිදී ආයතනයන් මුහුකුරා ගිය හෙයින්, මෝහ (මුළාව) සංඛ්‍යාත අවිද්‍යාවය, ආයූහන (රැස් කිරීම) සංඛ්‍යාත සංඛාරය, නිකන්ති (කැමැත්ත)යයි කියනු ලබන තණ්හාවය, උපගමන (ඉතා ළං වීම) සංඛ්‍යාත උපාදානය; චේතනා සංඛ්‍යාත භවය යන මේ කර්මභවයට අයත් පංච ධර්මයෝ අනාගත ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති යනුයි.

'ඉධ පරිපක්කත්තා ආයතනානං'' යනු, මූකළ ආයතන සහිතව කර්මයන් රැස් කරන කාලයෙහි වූ මුළාව දක්වන ලදි; සෙස්ස පැහැදිලි අරුත් ඇත්තේමය.

'ආයතිං ඵල පඤ්චකං' යනු, විඤ්ඤාණය ආදිකොට ඇති (මතු භවයෙහි) ඵලපඤ්චකයයි; ඒවා 'ජාති' ශබ්දග්‍රහණයෙන්ම කියන ලද්දේය. 'ජරාමරණං' යනු, (මතු භවයෙහි වන) එම ඵලපඤ්චකය පිළිබඳ ජරා-මරණයි. එහෙයින් කීහු:- ''ආයතිං පටිසන්ධි - විඤ්ඤාණං, ඔක්කන්ති නාම රූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා' (මතු භවය පිළිබඳ) 'විඤ්ඤාණ' යනු, ප්‍රතිසන්ධියයි; නාමරූපං' යනු, (මව්කුස) වැදගැනීමයි; 'ආයතනං' යනු, චක්ඛු ආදී පසාද පංචකයයි; 'ඵස්සො' යනු, අරමුණු සමග ගැටීමයි; 'වෙදනා' යනු, විඳිනු ලැබීමයි.) මෙසේ මේ පංචධර්මයෝ අනාගත උත්පත්ති භවයට මේ භවයෙහිදී කරන ලද කර්මයෙන් ප්‍රත්‍යය වෙති'යි මේ විසිආකාර අර ඇති (භවචක්‍රය) සිදුවේ.

''තිවට්ටමනවට්ඨිතං භවති' යනු, මෙහි වනාහි 'සංඛාරභව යන දෙක 'කම්මවට්ට' නම්; අවිජ්ජා, තණ්හා. උපාදාන යන තුන 'කිලේසවට්ට' නම්; විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන පස 'විපාක වට්ට' නම්. මෙසේ මෙම වට තුන හේතු කොට ගෙන 'තිවට්ට' නම් වූ මේ භවචක්‍රය, යම්තාක් කිලේසවට්ටය නොසිඳී පවත්නේද, ඒතාක් නොසිඳෙන ප්‍රත්‍යය ඇති හෙයින් නොනැවතී යලියලිදු කැරකෙමින් භ්‍රමණය වන්නේයයි දතයුතුය.

මෙසේ භ්‍රමණය වන ඒ මේ භවචක්‍රය වූකලී:

සච්චප්පභවතො කිච්චා වාරණා උපමාහිච
ගම්භීරනය භේදා ච විඤ්ඤාතබ්බං යථාරහං

සත්‍යප්‍රභව වශයෙන්ද, කෘත්‍ය වශයෙන්ද, වාරණ වශයෙන්ද, උපමාමගින්ද, ගම්භීරතා වශයෙන්ද, නයභේද වශයෙන්ද, සුදුසු පරිද්දෙන් දත යුත්තෙකි.

එහි, යම් හෙයින් කුසල-අකුසල කර්මය අවිශේෂයෙන් සමුදය සත්‍යය වෙති'යි සච්චවිභඞ්ගයෙහි කියන ලද්දේද, එහෙයින් 'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යනුවෙන් අවිද්‍යා ප්‍රත්‍යයෙන් ඇති වන සංඛාරය ද්විතීය (සමුදය) සත්‍යය ප්‍රභව කොට ඇති ද්විතීය සත්‍යයයි; සංඛාර ප්‍රත්‍යයෙන් ඇති වන විඤ්ඤාණය ද්විතීය සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම (දුඃඛ) සත්‍යයයි; විඤ්ඤාණාදියෙන් ඇති වන, විපාක වේදනාව අවසාන කොට ඇති නාමරූපාදිය ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම සත්‍යයයි; වේදනාවෙන් ඇති වන තණ්හාව ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති ද්විතීය සත්‍යයයි; තණ්හාවෙන් ඇතිවන උපාදානය ද්විතීය සත්‍යය ප්‍රභව කොට ඇති ද්විතීය සත්‍යයයි; උපාදානයෙන් ඇති වන භවය ද්විතීය සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම හා ද්විතීය සත්‍යද්වයයයි; භවයෙන් ඇති වන ජාතිය ද්විතීය සත්‍යය ප්‍රභව කොට ඇති ප්‍රථම සත්‍යයයි; ජාතියෙන් ඇති වන ජරාමරණය ප්‍රථම සත්‍යය ප්‍රභව කොට ඇති වන ප්‍රථම සත්‍යයයි. මෙසේ පළමුකොට මෙය සත්‍යප්‍රභව වශයෙන් සුදුසු පරිදි දතයුතුය.

යම් හෙයකින් මේ භවචක්‍රයෙහි අවිද්‍යාව වස්තූන් විෂයයෙහි සත්වයන් මුළා කෙරේද, සංඛාරයන් පහළ වීම පිණිසද ප්‍රත්‍යය වේද, එසේම සංඛාරයෝ සහජාත සංඛාරයන් රැස් කෙරෙත්ද, විඤ්ඤාණයටද ප්‍රත්‍යය වෙත්ද, විඤ්ඤාණය වස්තූන් හඳුනා ගනීද, නාමරූපයනටද ප්‍රත්‍යය වේද, නාමරූපයෝද එකිනෙකට උපස්තම්භ වෙත්ද, සළායතනයනටද ප්‍රත්‍යය වෙත්ද, සළායතනයෝද ස්වවිෂයෙහි පවතිත්ද. ඵස්සයටද ප්‍රත්‍යය වෙත්ද, ඵස්සයද අරමුණු ස්පර්ශ කෙරේද, වේදනාවටද ප්‍රත්‍යය වේද, වේදනාවද අරමුණු රස විඳීද, තණ්හාවටද ප්‍රත්‍යය වේද, තණ්හාවද ඇලීමට සුදුසු වස්තූන් කෙරෙහි ඇලේද, උපාදානයටද ප්‍රත්‍යය වේද, උපාදානයද එල්බ ගත හැකි ධර්මයන් කෙරෙහි එල්බේද, භවයටද ප්‍රත්‍යය වේද, භවයද නානාගතීන් තුළ විසිරෙයිද, ජාතියටද ප්‍රත්‍යය වේද, ජාතියද ස්කන්ධයන් ඉපැදවීමේ ස්වභාව ඇති හෙයින් එම ස්කන්ධයන් දනවයිද, ජරාමරණයනටද ප්‍රත්‍යය වේද, ජරාමරණයෝද ස්කන්ධයන්ගේ බිහිකිරීම හා බිඳියාම තීරණය කෙරෙත්ද, ශෝකාදිය තීරණය කිරීම් වශයෙන්, භවාන්තරයෙහි පහළ වීමටද ප්‍රත්‍යය වෙත්ද, එහෙයින් සියලු පදයන්හි දෙපරිද්දෙකින් පැවතීම වෙති'යි කෘත්‍ය වශයෙන්ද මෙය සුදුසු පරිදි දතයුතුය.

තවද, මෙහි. යම්හෙයකින්, 'අවිජ්ජා පච්චයා සංඛාරා' යන මෙය (ඊශ්වරාදී) කාරකයකු (හෙවත් නිර්මාපකයකු) පිළිබඳ දෘෂ්ටිය වලකයිද, 'සඞ්ඛාර පච්චයා' යන මෙය ආත්ම සංක්‍රාන්ති (ආත්මය භවයෙන් භවයට සංක්‍රමණය වෙති'යි යන) දෘෂ්ටිය වලකයිද, 'විඤ්ඤාණපච්චයා නාමරූපං' යන මෙය ආත්මයයි පරිකල්පිත වස්තූන් නාමරූප වශයෙන් විග්‍රහ කොට දක්වීමෙන් ආත්මය පිළිබඳව පවත්නා ඝනසංඥාව නිවාරණය කරයිද, 'නාමරූප පච්චයා සළායතනං' යන ආදිය ''ආත්මය තෙමේ දකියි -පෙ- ස්පර්ශ කරයි, විඳියි, ඇලුම් කරයි, එල්බගනියි, වෙයි, උපදියි, දිරයි, මැරෙයි' යන මේ ආදී දෘෂ්ටීන් වාරණය කරයිද, එහෙයින් මෙකී මිථ්‍යාදෘෂ්ටීන් වැලකීම් වශයෙන්ද මේ භව චක්‍රය සුදුසු පරිදි දතයුතුය.

යම් හෙයකින් වනාහි මෙහි (මේ භවචක්‍ර විෂයයෙහි), ස්වලක්ෂණ, සාමාන්‍ය ලක්ෂණ වශයෙන් වස්තුස්වභාවයන් නොදැකීමෙන් අවිද්‍යාව අන්ධයකු වැනි වේද, 'අවිජ්ජා පච්චයා සඞ්ඛාරා' යනු අන්ධයාගේ පැකිලීම වැනි වේද, 'සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං' යනු, පැකිලීම නිසා වැටීම වැනි වේද, 'විඤ්ඤාණපච්චයා නාමරූපං' යනු, වැටුණාහුගේ සිරුරෙහි ගඩක් හටගැනීම වැනි වේද, 'නාමරූප පච්චයා සළායතනං' යනු, ගඩ බිඳීමෙන් නැඟුණ වනයක් වැනි වේද, 'සළායතන පච්චයා ඵස්සො' යනු, ගඩින් හටගත් වනය යමක ගැටීම වැනි වේද, 'ඵස්ස පච්චයා වෙදනා' යනු, ගැටීමෙන් ඇති වන දුඃඛ වේදනාව වැනි වේද, 'වෙදනාපච්චයා තණ්හා' යනු, දුකට ප්‍රතිකාර ලබාගැනීමේ කැමැත්ත වැනි වේද, 'තණ්හා පච්චයා උපාදානං' යනු, ප්‍රතිකාරාභිලාෂයෙන් අසත්ප්‍රාය ප්‍රතිකාර ලැබීම වැනි වේද, 'උපාදාන පච්චයා භවො' යනු, ලබාගත් අසත්ප්‍රාය බෙහෙත් ගැල්වීම වැනි වේද, 'භවපච්චයා ජාති' යනු, අසත්ප්‍රාය ලේපනයෙන් ගඩෙහි අසාධ්‍ය ලක්ෂණ පහළ වීම වැනි වේද, 'ජාති පච්චයා ජරාමරණං' යනු, ගඩ උත්සන්න වී පැලීයාම වැනි වේද,

නොහොත්, යම් හෙයකින් මෙහි අවිද්‍යාව දුෂ්ප්‍රතිපත්ති, මිථ්‍යා ප්‍රතිපත්ති වශයෙන්, පටලයක් ඇස් මැඩ ලන්නා සේ සත්වයන් මැඩලයිද, එම අවිද්‍යාව විසින් මැඩලන ලද අඥාන තෙමේ පුනර්භවය ඇති කරන සංඛාරයන්ගෙන්, කෝෂකාර කෘමියා (පටපණුවා) කෝෂය සෑදෙන හුයෙන් තමාම වෙළා ගන්නා සේ, වෙළා ගනීද, සංඛාරයන්ගෙන් පෝෂණය ලද විඤ්ඤාණය, පරිණායික (ආරක්ෂක) ඇමැතියාගේ උපකාරයෙන් රජකුමරකු රාජ්‍යයෙහි පිහිටන්නා සේ, (පංචවිධ) ගතිය තුළ පිහිටීම ලබයිද, උත්පත්ති නිමිති පරිකල්පනය කිරීම් වශයෙන් විඤ්ඤාණය, ඉන්ද්‍රජාලිකයකු ඉන්ද්‍රජාලයන් නිපදවන්නා සේ, ප්‍රතිසන්ධිවිෂයයෙහි අනේකප්‍රකාර නාමරූපයන් නිපදවයිද, නාමරූප විෂයයෙහි පිහිටි සළායතනය, සරු බිමෙක පිහිටි වන ලැහැබක් සේ, වෘද්ධියට, සවිමත් බවට, මහත් බවට පැමිණේද, ආයතනයන්ගේ ගැටීමෙන්, ගිනි ගානා

දඬු එකට ගැටීමෙන් ගිනි උපදින්නා සේ, ස්පර්ශය උපදීද, ස්පර්ශයන්ගේ පහස ලද්දහුට, ගිනිරැස් පහස ලද්දහුට දැවිල්ල හටගන්නා සේ, වේදනාව පහළ වේද, (වේදනා) විඳීම ලබන්නහුට, ලුණු දිය බොන්නහුට පිපාසය වැඩෙන්නා සේ, තෘෂ්ණාව වැඩෙයිද, තෘෂ්ණා සහිත වූයේ, පිපාසිතයකු ජලයට අභිලාෂ කරන්නා සේ, භවයන් කෙරෙහි අභිලාෂ කෙරේද, ඉක්බිති ඔහුට උපාදානය ඇති වේද, උපාදානයෙන් භවය, අහර ලොබින් මසකු බිලිය ඩැහැගන්නා සේ, දැඩිලෙස ගැනීම ඇති කරයිද, බීජයක් ඇතිකල අංකුරය හට ගන්නා සේ භවය ඇති කල ජාතිය ඇති වේද, හටගත් ගසෙහි වැටීම සිදු වන්නා සේ උපන්නහුට නියත වශයෙන්ම ජරා-මරණ සිදු වේද,

එහෙයින් උපමා වශයෙන්ද මේ භවචක්‍රය සුදුසු පරිදි දත යුතුය.

තවද යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් අර්ථ වශයෙන්ද, ධර්මවශයෙන්ද, දේශනා වශයෙන්ද, ප්‍රතිවේධ වශයෙන්ද ගැඹුරු බවින් යුක්ත වූ හෙයින්, ''ගම්භීරොචායං ආනන්ද පටිච්චසමුප්පාදො, ගම්භීරාවභාසොච'' (ආනන්දය, මේ පටිච්චසමුප්පාදය ගැඹුරුය, ගැඹුරු ලෙසින්ම වැටහේ) යයි වදාරණ ලද්දේද, එහෙයින් මේ භවචක්‍රය ගම්භීර භේදාදි වශයෙන්ද සුදුසු-පරිදි දතයුතුය.

එහි, යම් හෙයකින් ඉපදීම හේතු කොටගෙන ජරාමරණ නොවනුයේ නොවේද, ඉපදීමෙන් විනා අනෙකෙකින් (ජරාමරණ) නොවනුයේ වේද. තවද මෙසේ ඉපැදීමෙන්ම හටගනිති'යි යනුවෙන් ජාතිප්‍රත්‍යයෙන් හටගනිති'යි යන අර්ථය දුරවබෝධ වන හෙයින් ජරාමරණයන් ජාතිය ප්‍රත්‍යය කොට ගෙන හට ගනිති'යි, එය සමගම එති'යි යන අර්ථය ගැඹුරු වූයේද, එසේම ඉපදීම (ජාතිය) භවය ප්‍රත්‍යය කොට ගෙන -පෙ- සංඛාරයන් අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙන හටගනිති'යි, එය හා සමගම එති'යි යන අර්ථය ගැඹුරු වූයේද, එහෙයින් මේ භවචක්‍රය අර්ථ වශයෙන් ගැඹුරු වෙති'යි පළමු කොට මෙහි අර්ථ ගම්භීරතාව වේ: හේතුවකින් ලැබෙන ඵලය අර්ථය'යි කියනු ලැබේ; එහෙයින් හේතු-ඵල විෂයයෙහි වූ ඥානය 'අත්‍ථ පටිසම්භිදාය'යි කියන ලදි.

යම් හෙයකින් වනාහි, අවිද්‍යාව යම් අවස්ථාවෙක යම් ආකාරයෙකින් සංඛාරයනට ප්‍රත්‍යය වේද, එය දුරවබෝධ වන හෙයින් සංඛාරයනට අවිද්‍යාව ප්‍රත්‍යය වෙතැ'යි යන අර්ථය ගැඹුරු වූයේද, එසේම (අවිද්‍යාව) සංඛාරයනට -පෙ- ඉපැදීම ජරාමරණයනට ප්‍රත්‍යය වෙතැ'යි යන අර්ථය ගැඹුරු වූයේද, එහෙයින් මේ භවචක්‍රය ධර්ම වශයෙන් ගැඹුරු වෙතැ'යි යන මේ අර්ථය ධර්ම ගම්භීරතාව වේ: 'ධම්ම' යනු හේතුවට නමෙකි, එහෙයින් හේතුව පිළිබඳ දැනීම 'ධම්ම පටිසම්භිදා' යයි කියනලදි.

තවද යම් හෙයකින් (මේ භවචක්‍රය) පිළිබඳව, ඒ ඒ කාරණයෙන්, ඒ ඒ ආකාරයෙන් පැවැත්විය යුතු වන හෙයින් දේශනාවද ගැඹුරු වූයේද, එහිදී සර්වඥතාඥානය මිස අන් ඥානයක් ප්‍රතිෂ්ඨා නොලබාද, - ඒ එසේමැයි, කිසියම් සූත්‍රයෙක්හි අනුලෝම වශයෙන් (මුල පටන් අග දක්වා)ද, කිසියම් තැනෙක්හි ප්‍රතිලෝම වශයෙන් අග පටන් මුල දක්වා) ද, කිසියම් තැනෙක්හි අනුලෝම-ප්‍රතිලෝම වශයෙන්ද කිසියම් සූත්‍රයෙක්හි මධ්‍යභාගයෙහි සිට අනුලෝම හෝ ප්‍රතිලෝම වශයෙන්ද, කිසියම් සූත්‍රයෙක්හි සන්ධි තුනෙකින් යුත් කොටස් සතරෙක සංක්ෂේපයක් වශයෙන්ද, කිසියම් සූත්‍රයෙක්හි සන්ධි දෙකකින් යුත් කොටස් තුනෙක සංක්ෂේපයක් වශයෙන්ද, කිසියම් සූත්‍රයෙක්හි එක් සන්ධියෙකින් යුත් කොටස් දෙකෙක සංක්ෂේපයක් වශයෙන්ද, දේශනා කරන ලද්දේද - එහෙයින් මේ භවචක්‍රය දේශනා වශයෙන්ද ගැඹුරු වෙතැ'යි යනු දේසනා ගම්භීරතා'යි .

තවද යම් හෙයකින් මේ භවචක්‍ර විෂයයෙහි අවිද්‍යාදීන්ගේ යම් ඒ (අවිපරීත) ස්වභාවයෙක් වේද, එම ස්වභාවය ප්‍රතිවේධ කළහු විසින් අවිද්‍යාදිය ස්වලක්‍ෂණ වශයෙන් මනා කොට ප්‍රතිවේධ කරන ලද්දේ වේද, එය (කෙනකුට) අවබෝධ කළ නොහැකි තරම් ගැඹුරු වේද, එහෙයින් මේ භවචක්‍රය ප්‍රතිවේධ වශයෙන් ගැඹුරු වේ. ඒ එසේමැයිඃ මෙහි අවිද්‍යාව පිළිබඳ අඥානාර්ථය. අදර්ශනාර්ථය හා සත්‍යයන් කෙරෙහි අනවබෝධාර්ථය ගැඹුරුය; සංඛාරයන් පිළිබඳ අභිසංඛරණ (කර්මයන් සකස් කිරීමේ) අර්ථය, ආයූහන (රැස් කිරීමේ) අර්ථය හා (අපුඤ්ඤාභිසංඛාර වශයෙන්) සරාගාර්ථයද (පුඤ්ඤාභිසංඛාර වශයෙන්) විරාගාර්ථයද ගැඹුරුය; විඤ්ඤාණය පිළිබඳ (ආත්ම වශයෙන්) ශූන්‍යාර්ථය, අව්‍යාපාරාර්ථය, අසංක්‍රමණාර්ථය හා ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රාදුර්භාව (පහළ වීමේ) අර්ථය ගැඹුරුය; නාමරූපයන් පිළිබඳ ඒකෝත්පාද (එක්ව ඉපදීමේ) අර්ථය, විනිර්භෝග (නාමරූප යන දෙක අමිශ්‍රව පැවතීමේ) හා අවිනිර්භෝග (නාමයන් නාමයන් හා සමග මිශ්‍රව පැවතීමේ) අර්ථයද, නමනා (නාමයන් පිළිබඳ අරමුණු වෙත යොමු වීමේ) අර්ථයද රුප්පන (රූපයන් පිළිබඳ විනාශ වීමේ) අර්ථයද ගැඹුරුය, සළායතනයන් පිළිබඳ (දර්ශනාදී විෂයයෙහි) අධිපති බවය, ලෝක බවය, ද්වාර බවය, ක්ෂේත්‍ර බවය, විෂයී බවය යන මේ අර්ථ ගැඹුරුය; ඵස්සය පිළිබඳ ස්පර්ශන (ස්පර්ශ වීමේ) අර්ථය, සංඝට්ටන (ගැටීමේ) අර්ථය, සංගමන (එක්වීමේ) අර්ථය හා සන්නිපාත (රැස්වීමේ) අර්ථය ගැඹුරුය; වේදනාව පිළිබඳ ආලම්බන රසානුභවන (අරමුණු රස විඳීමේ) අර්ථය, සුඛ-දුඃඛමධ්‍යස්ථභාව (සුවදුක් දෙකෙහි මැදහත් බව) අර්ථය, නිජ්ජීව (සත්වයකු නොවීමේ) අර්ථය හා වේදන (විඳීමේ) අර්ථය ගැඹුරුය; තණ්හාව පිළිබඳ අභිනන්දිත (අරමුණෙහි පිනවතු ලබන බව) අර්ථය, අජ්ඣෝසාන (එල්බගන්නාබව) අර්ථය, සරිතා-ලතා-නදී තණ්හා

(තෘෂ්ණාව හොයක්, ලතාවක්, මහනදියක් වැනිය යන) අර්ථය හා සමුද්ද දුප්පූර (මුහුද මෙන් පිරිවිය නොහැකිය යන) අර්ථය ගැඹුරුය, උපාදානය පිළිබඳ ආදානගග්ගහණ (දැඩි ලෙස ගැනීමේ) අර්ථය, අභිනිවේස (එල්බ ගැනීමේ) අර්ථය, පරාමාස (අරමුණ සමග වෙළී සිටීමේ) අර්ථය හා දුරතික්කම (ඉක්මවා ලිය නොහැකිය යන) අර්ථය ගැඹුරුය, භවය පිළිබඳ ආයූහන (කර්මයන් රැස් කිරීමේ) අර්ථය, අභිසංඛරණ (සකස් කිරීමේ) අර්ථය, යෝනි-ගති-ස්ථිති- සත්ත්වාවාසයන්හි ඛිපන (බහාලීමේ) අර්ථය ගැඹුරුය; ජාතිය පිළිබඳ සංජාති (ඉපැදීමේ) අර්ථය, ඔක්කන්ති ආයතනයන්ගේ පහළවීමේ) අර්ථය, නිබ්බත්ති (මව්කුස වැද ගැනීමේ) අර්ථය හා පාතුභව (ස්කන්ධයන්ගේ ප්‍රකට වීමේ) අර්ථය ගැඹුරුය; ජරාමරණයන් පිළිබඳ ඛය (ක්‍ෂය වීමේ) අර්ථය, වය (වැය වීමේ) අර්ථය භේද (බිඳීයාමේ) අර්ථය හා විපරිණාම (වෙනස් බවට පත්වීමේ) අර්ථය ගැඹුරුය යන මෙය පටිවේධ ගම්භීරතායි.

යම් හෙයකින් වනාහි මෙහි (සමාන භාවය වූ) ඒකත්වනයය, (අසමාන භාවය වූ) නානත්වනයය, (නිරුත්සාහ භාවය වූ) අව්‍යාපාරනයය, (ධර්මයන්ගේ යථා ස්වභාවය වූ) ඒවං ධම්මතානයයයි අර්ථය පිළිබඳ නය සතරෙක් වේද, එහෙයින් නය භේද වශයෙන්ද මේ භවචක්‍රය සුදුසු පරිදි දතයුතුය.

එහි ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං'' යනුවෙන් මෙසේ බීජය අංකුරයක් වී රුකක් බවට පත්වීම මෙන් පිළිවෙළ නොසිඳ පැවතීම ඒකත්වනය නම්වේ.එම ඒකත්වනයය මනා කොට දක්නේ හේතුඵල සම්බන්ධයන් පිළිබඳ නොසිඳ පැවැත්ම අවබෝධ කිරීමෙන් උච්ඡේද දෘෂ්ටිය ප්‍රහීණ කරයි. එයම විපරීත කොට (වැරදි ලෙස) දක්නේ හේතු-ඵල සම්බන්ධය මත පවත්නා පිළිවෙළ නොසිඳ පැවැත්ම ඒකත්වයයි ගැනීමෙන් ශාස්වත දෘෂ්ටිය දැඩි කොට ගනියි.

අවිද්‍යාදීන්ගේ ස්ව-ලක්‍ෂණයන් තත්වූ පරිදි විනිශ්චය කොට ගැනීම 'නානත්වනය' නම් වේ. එය මනාකොට දක්නේ නව නව ධර්මයන්ගේ ඉපදීම දැකීමෙන් ශාස්වත දෘෂ්ටිය හරියි. එය විපරීත කොට දක්නේ එක්ම සන්තානයෙක්හි හේතු-ඵල සමූහය භින්න සන්තානයකට අයත් සේ නානත්වයෙන් ගැනීමෙන් උච්ඡේද දෘෂ්ටිය දැඩි කොට ගනියි.

'මා විසින් සංඛාරයන් ඉපැදවිය යුතුය'යි අවිද්‍යාවට හෝ, අප විසින් විඤ්ඤාණය ඉපැදවිය යුතුයයි සංඛාරයනට හෝ මෙසේ මේ ආදී ව්‍යාපාරයක් නැතැ'යි යනු අව්‍යාපාරනය නම් වේ. එය මනා කොට දක්නේ කාරකයකු නැති බව අවබෝධ කිරීමෙන් ආත්මදෘෂ්ටිය හරියි. විපරීත කොට දක්නේ උත්සාහයක් නැති කල්හිදූ අවිද්‍යාදිය පිළිබඳ ස්වභාව සිද්ධ වූ යම් හේතුභාවයෙක් වේද, එය නොපිළිගැනීමෙන් අකිරිය දෘෂ්ටියෙහි එල්බ ගනියි.

කිරි ආදියෙන් දී ආදිය සෙයින්ම, අවිද්‍යාදී හේතුන්ගෙන් සංඛාරාදීන්ගේ හටගැනීම සිදු වනමුත් අන් දෙයක් හටගැනීම නොවෙති'යි යන මෙය 'ඒවං ධම්මතානය' නම්වේ. එය මනා කොට දක්නේ ප්‍රත්‍යයට අනුකූල වන සේ ඵලය අවබෝධ කිරීමෙන් අහේතුක දෘෂ්ටියද අකිරිය දෘෂ්ටියද හරියි. එයම විපරීත ලෙසින් දක්නේ ප්‍රත්‍යයට අනුරූප වන ලෙස ඵලයෙහි පැවැත්ම වටහා නොගෙන, කවර හෝ දෙයකින් කවර හේ දෙයක් හටගැනීම නොවෙති'යි වටහා නොගැනීමෙන් අහේතුක දෘෂ්ටියද, නියත වාදයද දැඩි ලෙස ගනියි. මෙසේ මේ භවචක්‍රයः-

සච්චප්පභවතො කිච්චා වාරණා උපමාහි ච
ගම්භීරනය භෙදා ච විඤ්ඤාතබ්බං යථාරහං

සත්‍ය ප්‍රභව වශයෙන්ද, කෘත්‍ය වශයෙන්ද, වාරණ වශයෙන්ද, උපමා මගින්ද, ගම්භිරතා - නය - ප්‍රභේද වශයෙන්ද, සුදුසු පරිදි දත යුතුය.

මෙය වනාහිः

ගම්භීරතො අගාධං නානානය ගහණතො දුරතියානං
ඤාණාසිනා සමාධිප්පවරසිලායං සුනිසිතෙන
භවචක්කමපදාලෙත්වා අසනි විචක්කමිව නිච්ච නිම්මථනං
සංසාරභයමතීතො න කොචි සුපිනන්තරෙප්‍යත්ථි

පතුලක් නැති තරම් ගැඹුරුය, අනේකාකාර නය සහිත වූ හෙයින් ඉක්මවීම දුෂ්කරය, උතුම් සමාධිනමැති හණ ගලෙහි මනා සේ මුවහත් තබන ලද ඥාන නමැති කඩුවෙන්, අසනි චක්‍රයක් (හෙණ වටක්) මෙන් නිරන්තරයෙන් වනසන සුලු මේ භවචක්‍රය නොපළා සිහිනෙන් හෝ සසර බිය ඉක්මවූ කිසිවෙක් ඇත්තේ නැත.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දේශනා කරන ලදමැයිः- ''ගම්භීරො චායං ආනන්ද, පටිච්චසමුප්පාදො ගම්භීරාවභාසොච, එතස්සචානන්ද ධම්මස්ස අඤ්ඤාණා අනනුබෝධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුළාගුණ්ඨික ජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තති''ති[a] (ආනන්දය, මේ පටිච්චසමුප්පාද ධර්මය වනාහි ගැඹුරුය, එහි වැටහීමද ගැඹුරුය, ආනන්දය, මේ ධර්මය නොදැනීමෙන්, අවබෝධ නොකිරීමෙන්, විනිවිද නොදකීමෙන්, මෙසේ මේ සත්වයා අවුල් වූ හූ-වටක් මෙන්, පැටලුණ නූල් රොදක් මෙන්, මුදුතණ-බබුස් තණ පඳුරක් මෙන් වෙළී පැටලී අපායවූ. දුර්ගති වූ විනිපාත වූ සංසාරය නො-ඉක්මවයි) එහෙයින් තමාගේ හෝ වේවා, මෙරමාගේ හෝ වේවා, හිත සුව පිණිස පිළිපන්නේ සෙසු කටයුතු පසෙක තබා,

a. සං. නි. දුකඛවග්ග

ගම්භීරෙ පච්චයාකාරප්පභෙදෙ ඉධ පණ්ඩිතො,
යථා ගාධං ලභෙථෙවමනුයුඤ්ජෙ සදා සතො

පණ්ඩිත තෙමේ සදා සිහි ඇතිව ගැඹුරු වූ ප්‍රත්‍යයාකාර ප්‍රභේද සහිත මෙම පටිච්චසමුප්පාද ධර්ම විෂයයෙහි පිහිටීමක් ලද හැකි වන සේ නියැලෙන්නේය.

සාධුජන ප්‍රමෝදය සඳහා කළ විශුද්ධි මාර්ගයෙහි,
පඤ්ඤාභාවනාධිකාරයෙහි, පඤ්ඤාභූමි නිද්දේස නම්
සතළොස්වන පරිච්ඡේදය මෙතෙකින් නිමියේයි.

—//—

# දිට්ඨි විසුද්ධි නිද්දේසය

ඉක්බිති ''(විදර්ශනාවට) භූමිභූත මෙම ධර්මයන් පිළිබඳව උග්ගහ (වන පොත් කිරීම) හා පරිපුච්ඡා (අර්ථවිචාරීම්) වශයෙන් දැනුම හා පුහුණුව ලැබීමෙන් ශීල විශුද්ධි. චිත්ත විශුද්ධි යන මූලික විශුද්ධි දෙක සම්පාදනය කළ යුතුය'යි යමක් කියන ලද්දේද, එහි ශීලවිශුද්ධි නම් වූ සුපිරිසුදුව රක්නාලද ප්‍රාතිමෝක්ෂ සංවරාදී චතුර්විධ ශීලයයි; එය ශීලනිර්දේශයෙහි විස්තර කරන ලද්දේමය. චිත්ත විශුද්ධි යනු උපචාර සහිත සමාපත්ති අටයි; එයද චිත්ත ශීර්ෂය යටතෙහි කියන ලද සමාධි නිර්දේශයෙහි සියලු ආකාරයෙන්ම විස්තර කරන ලද්දේමය. එහෙයින් ඒ දෙක එහි විස්තර කරන ලද නයින්ම දතයුතුය.

''දිට්ඨි විසුද්ධි, කඞ්ඛාවිතරණ විසුද්ධි. මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි, පටිපදා ඤාණදස්සන විසුද්ධි, ඤාණදස්සන විසුද්ධි යන මේ විශුද්ධි පස ශරීරයයි'' යනුවෙන් යමක් කියන ලද්දේද, එහි නාම-රූපයන් තත් වූ පරිද්දෙන් දැකීම දිට්ඨි විසුද්ධි නම්වේ. එය සම්පාදනය කරනු කැමැති සමථයානික යෝගාවචරයා විසින් පළමුකොට නේවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තිය හැර සෙසු රූපාරූපාවචර ධ්‍යානයෙකින් නැඟී විතර්කාදී ධ්‍යානාංගයන්ද, සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන්ද ලක්ෂණ - රසාදී වශයෙන් පිරිසිඳ ගත යුතුය. එසේ පිරිසිඳගෙන නම් සියල්ල අරමුණ වෙතට නැඹුරු වන හෙයින් නැඹුරුවීම් අර්ථයෙන් 'නාම' යයි ව්‍යවස්ථාපනය කළයුතුය.

ඉක්බිති යමසේ වනාහි පුරුෂයෙක් තෙමේ ගෙය-තුළ සර්පයකු දැක පසුපස යනුයේ සර්පයා වසන තැන දකීද. එසේම මේ යෝගාවචරයාද එම 'නාමය' නුවණින් පරීක්ෂා කරනුයේ 'මේ නාමය කුමක් නිසා පවත්නේද'යි සොයනුයේ නාමය ඇසුරු කොට පවත්නා හෘදයරූපය දකියි, අනතුරුව හෘදයරූපයට නිශ්‍රය වූ මහාභූතයන්ද, මහාභූතයන් ඇසුරු කොට පවත්නා උපාදාය රූපයන්ද'යි යනුවෙන් මෙසේ රූපය හඳුනා ගනියි. හේ තෙමේ මේ සියල්ල විනාශ වන සුලු හෙයින් 'රූප' යයි ව්‍යවස්ථාපනය කරයි. ඉක්බිති අරමුණු වෙත නැමෙන ලක්ෂණ ඇත්තේ නාමයයිද, වෙනස් වන ලක්ෂණ ඇත්තේ රූපයයිද සැකෙවින් නාමරූප දෙක විනිශ්චය කරයි.

ශුද්ධ විදර්ශනායානිකයා හෝ වේවා, මෙකී සමථයානිකයාම හෝ වේවා, (ඉහත) චතුධාතු වවත්ථානයෙහි කියන ලද ධාතූන් හඳුනාගැනීමේ ශීර්ෂයන් අතුරෙන්, එක්තරා ශීර්ෂයෙකින් සංක්ෂේප වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ සතර ධාතූන් හඳුනාගනියි. ඉක්බිති ඔහුට කෘත්‍ය හා ලක්ෂණ වශයෙන් ධාතූන් නිසි පරිදි ප්‍රකට වූ කල්හි, පළමු කොට කම්ම සමුට්ඨානික (කර්මයෙන් හටගත්) කේශ විෂයයෙහි සතර ධාතූන්ද, වණ්ණ,

ගන්ධ, රස, ඕජා, ජීවිත, කායප්පසාදයන්ද'යි මෙසේ කායදශක වශයෙන් රූප දශයෙකි; එම කේශ විෂයයෙහි භාවරූපයද ඇති හෙයින් භාවදශක වශයෙන් තවද රූප දශයෙකි; එහිම ආහාරසමුට්ඨාන, උතු සමුට්ඨාන, චිත්ත සමුට්ඨාන (ආහාර, ඍතු, චිත්ත යන මේ තුනෙන් හටගත්) ඕජට්ඨමක ('ඕජා' යන්නෙන් අවසන් වන, එනම් ජීවිත, කායප්පසාද යන දෙක හැර ඉතිරි අට) වශයෙන්දැයි තවද සූවිස්සෙකි. මෙසේ චතුසමුට්ඨානික (කම්ම, චිත්ත, උතු, ආහාර යන සතරින් හටගත්) (කේශ ආදී) සූවිසි කොට්ඨාසයෙහි එක් එක් කොට්ඨාසයෙහි සූසාළිසක් බැගින් රූපයෝ වෙති. ඍතු, චිත්ත යන දෙකින් හටගන්නා සේද, අස්සු, ඛේළ, සිඞ්ඝානිකා යන මේ සිවු කොටසෙහි ඕජට්ඨමක දෙකක් වශයෙන් සොළොසක් බැගින් රූපයෝ වෙති. උදරිය, කරීස, පුබ්බ, මුත්ත යන උතුසමුට්ඨානික (ඍතුවෙන් හටගන්නා) සතරෙහි උතුසමුට්ඨානික ඕජට්ඨමක වශයෙන් අටක් බැගින් රූපයෝ ප්‍රකට වෙති. මේ ද්වත්තිංසාකාර ක්‍රමයයි.

මේ ද්වත්තිංසාකාරය ප්‍රකට වූ කල්හි, තවද යම් දශ ආකාරයක් ප්‍රකට වේද, එහි පළමු කොට අසිත (කෑම. බිදීම ආදී) ආහාර පැසවන කර්මජවූ තෙජෝධාතු කොට්ඨාසයෙහි ඕජට්ඨමකය හා ජීවිතරූපයදැයි යනුවෙන් රූප නවයෙක් වේ. එසේම චිත්තජ වූ ආශ්වාස-ප්‍රශ්වාස කොටසෙහිද ඕජට්ඨමක හා ශබ්දයද'යි රූප නවයෙක් වේ. සෙසු චතුසමුට්ඨාන රූප අටෙහි ජීවිත නවක ('ජීවිත' යන්නෙන් අවසන්වන) කලාපයද ඕජට්ඨමක තුනද'යි මෙසේ තෙතිසක් බැගින් රූපයෝ ප්‍රකට වෙති. මෙසේ ඔහුට විස්තර වශයෙන් දෙසාළිස් ආකාරයෙකින් මේ භූත-උපාදාය රූපයන් ප්‍රකට වූ කල්හි වස්තු හා ද්වාර වශයෙන් චක්ඛු ආදී පඤ්චදසකය හා හදයවත්‍ථු දසකයද'යි තවද රූපයෝ සැටක් ප්‍රකට වෙති.

හේ තෙමේ එකී සියල්ලම රුප්පන (විනාශවන) ලක්‍ෂණ වශයෙන් සංග්‍රහකොට 'මේ රූපය' යි දකියි. මෙසේ රූපය හඳුනාගත් පසු ඔහුට ද්වාර වශයෙන් අරූප ධර්මයෝ ප්‍රකට වෙති. ඒ මෙසේය: පඤ්ච විඤ්ඤාණ දෙකද, මනෝධාතු තුනද, මනෝ විඤ්ඤාණ ධාතු සැට අටද'යි යන මේ එක් අසූවක් ලෞකික සිත් හා අවිශේෂයෙන් එම සිත් හා සමග උපන් ඵස්සය, වේදනාය, සඤ්ඤාය, චේතනාය, ජීවිතින්ද්‍රියය, චිත්තට්ඨිතිය, මනසිකාරයයි යන මේ චෛතසික සතද ප්‍රකට වේ.

ලෝකෝත්තර සිත් වනාහි ශුද්ධ විදර්ශනා යානිකයාගේ හෝ සමථයානිකයාගේ හෝ විෂය පථයට නොපැමිණෙයි; එය අවබෝධ නොකළ හෙයිනි. ඒ යෝගාවචර තෙමේ එම සියලු අරූපධර්මයන් නැමීම් ලක්‍ෂණයෙන් සංග්‍රහ කොට 'මේ නාමය' යි දකියි. මෙසේ එක් යෝගාවචර

කෙනෙක් චතු ධාතු වවත්ථාන නයින් විස්තර වශයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කරයි.

අන් කෙනෙක් අටළොස් ධාතු වශයෙන් ගනිති. කෙසේද යත්:- මේ ශාසනයෙහි එක් භික්ෂු කෙනෙක් මේ ආත්මභාවයෙහි චක්ඛුධාතුය. පෙ- මනෝ විඤ්ඤාණ ධාතුය යන අටළොස් ධාතුන් ඇතැ'යි ආවර්ජනය කොට, ලෝවැස්සෝ සුදු හා කළු මඩුලුවලින් විසිතුරු වූ (නිශ්චිත) දිග-පළල සහිතවූ ඇස් කුහරය තුළ ස්නායු-තන්තුවෙන් බැඳුණු මාංස පිණ්ඩය 'ඇස' යයි හඳුනා ගනිත්ද, එය එසේ නොගෙන, ඛන්ධ නිද්දේසයෙහි, උපාදාය රූප විෂයයෙහි කියන ලද ස්වරූප සහිත චක්ඛුප්පසාදය චක්ඛුධාතුය'යි ව්‍යවස්ථාපනය කරයි. එයට නිශ්‍රය වූ පඨවි ආදී ධාතු සතරද, පිරිවරවූ වර්ණ, ගන්ධ, රස, ඕජා රූපයන්ද අනුපාලක වූ ජීවිතින්ද්‍රියද'යි යන මේ සහජාත රූප නවයද, එහිම කායදසක-භාවදසක වශයෙන් සිටි කර්මජ රූප විස්සද, ආහාර සමුට්ඨානාදිය හා සමග බැඳුණ ඕජට්ඨමක තුන වශයෙන් වූ සූවිසි අනුපාදින්න (අකර්මජ) රූපද'යි මෙසේ සෙසු යම් තෙපණසක් රූපයෝ වෙත්ද, ඒ කිසිවක් චක්ඛුධාතු වශයෙන් ව්‍යවස්ථාපනය නොකරයි. සෝතධාතු ආදියෙහිද මෙම නයයි.

කාය ධාතු විෂයයෙහි වනාහි අවශේෂ රූපයෝ තෙසාළිසක් වෙති: ඇතැම් ආචාර්ය කෙනෙක් උතු-චිත්ත සමුට්ඨානයන් ශබ්දය සමග නවයක් නවයක් කොට පන්සාළිසෙකැ'යි යෙති. මෙසේ මේ පසාද පංචකයද එයට විෂය වූ රූප, සද්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන රූප දශකය දසධාතු නම්වේ. සෙසු රූපයෝ ධම්මධාතු නම් වෙති. චක්ඛුප්පසාදය නිසා රූපය අරබයා පවත්නා සිත චක්ඛු විඤ්ඤාණධාතු නමැ'යි මේ අයුරින් ගෙන පංච විඤ්ඤාණ දෙක පංච විඤ්ඤාණධාතු නම් වේ.

මනෝධාතු සිත් තුන එක්ම මනෝධාතුයි, අටසැටක් වූ මනෝ විඤ්ඤාණධාතු සිත් මනෝවිඤ්ඤාණ ධාතුයි, මෙසේ සියලුම ලෞකික සිත් අසූ එක සත්ත විඤ්ඤාණ ධාතුයි, එය හා සම්ප්‍රයුක්ත වූ ඵස්සාදිය ධම්මධාතුයි; මෙසේ මෙහි අඩ එකොළොසක් (දහයමාරක්) ධාතුන් රූපයයිද, අඩ අටක් (හතහමාරක්) ධාතුන් නාමයයිද යනුවෙන් අන් කෙනෙක් අටළොස් ධාතු වශයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කෙරෙති.

තවද යෝගාවචර කෙනෙක් තුමූ දොළොස් ආයතන වශයෙන් ගනිති; කෙසේද යත්: චක්ඛුධාතු විෂයයෙහි කියන ලද පරිදිම තෙපණස් රූපයන් හැර චක්ඛුප්පසාදය පමණක් ගෙන චක්ඛායතනයයි ව්‍යවස්ථාපනය කෙරෙති; එහි කියනලද සෙයින්ම සෝත-ඝාණ, ජිව්හා, කාය යන ධාතුන් (පිළිවෙළින්) සෝත-ඝාණ-ජිව්හා-කාය ආයතනයයි ව්‍යවස්ථාපනය කෙරෙති. (චක්ඛු ධාතුව ඇතුළු) එම ධාතුනට විෂය වූ ධර්මපංචකය රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ආයතනයයිද

ව්‍යවස්ථාපනය කෙරෙති; ලෞකික වූ සත්ත විඤ්ඤාණ ධාතූන් මනායතනයයිද, එය හා සම්ප්‍රයුක්ත ඵස්ස ආදී සෙසු රූපයන් ධම්මායතනයයිද විනිශ්චය කෙරෙති. මෙසේ මෙහි අඩඑකොළොසක් (දහයමාරක්) ආයතනයන් රූපයයි එකහමාරක් ආයතනයන් නාමයයිද ගෙන දොළොස් ආයතන වශයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කෙරෙති.

තවද අන් යෝගාවචර කෙනෙක් එයටද වඩා සංක්ෂිප්ත කොට ඛන්ධ වශයෙන් ගෙන (නාම-රූපයන්) විනිශ්චය කෙරෙති, කෙසේද යත්: මේ ශාසනයෙහි භික්ෂු තෙමේ මේ ශරීරයෙහි වූ චතුසමුට්ඨාන (කර්‍ම, ආහාර, උතු, චිත්ත යන සතරින් හටගත්) ධාතු සතරද, එය හා නිශ්‍රිත වණ්ණ, ගන්ධ, රස, ඕජා යන සතරද චක්ඛුප්පසාදාදී වූ පඤ්චප්පසාදයන්ද, වත්‍ථුරූපය, භාව රූපය, ජීවිතින්‍ද්‍රියය, ද්විසමුට්ඨානික වූ සද්දයයි යන මේ සතළොස් රූපයන් සම්මර්ශනයට සුදුසු වන සේ නිපන් හෙයින් 'රූපරූප' නම් වෙතියිද, කාය විඤ්ඤත්තිය, වචී විඤ්ඤත්තිය, ආකාසධාතුය, රූපස්ස ලහුතාය, රූපස්ස මුදුතාය, රූපස්ස කම්මඤ්ඤතාය, රූපස්ස උපචයය, රූපස්ස සන්තතිය, රූපස්ස ජරතාය, රූපස්ස අනිච්චතාය යන මේ (උපාදාය) රූප දසය සම්මර්ශනයට යෝග්‍ය නොවෙතැ'යිද, (රූපයන් පිළිබඳ) ආකාර-විකාරයන්ගේ අන්තරය පිරිසිඳීම පමණක් වූ එම රූපයන් නිෂ්පන්න හෝ 'රූප-රූප' හෝ නොවෙති'යිද එකෙකුදු වුවත්, හුදෙක් රූපයන් පිළිබඳ ආකාර-විකාර යන දෙක්හි අන්තරය පිරිසිඳීම වූ හෙයින් රූප සංඛ්‍යාවට ගියහ'යිද යනුවෙන් මෙසේ මේ සියලුම සත්විසි රූපයන් රූපස්කන්ධ යයිද, ලෞකික සිත් අසූඑක සමග උපන් වේදනාවන් වේදනා ස්කන්ධයයිද, එය හා සමග යෙදුණ සංඥාවන් සංඥාස්කන්ධයයිද, සංඛාරයන් සංස්කාරස්කන්ධයයිද, විඤ්ඤාණය විඤ්ඤාණස්කන්ධයයිද යනුවෙන් මෙසේ ව්‍යවස්ථාපනය කෙරෙයි. රූපස්කන්ධය රූප වශයෙන්ද, අරූපී වූ සතර ස්කන්ධයන් නාම වශයෙන්ද ගෙන මෙසේ ඇතැම් යෝගාවචර කෙනෙක් පංචස්කන්ධ වශයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කෙරෙති.

තවද අන් යෝගාවචර කෙනෙක්, ''රූපයයි යම් කිසිවක් වෙතොත් ඒ සියල්ල මහාභූත සතර හා එම සතර මහා භූතයනට අයත් උපාදාය රූපය'යි ගෙන මෙසේ සංක්ෂිප්ත වශයෙන් මේ ආත්මභාවයෙහි (තමාගේ ශරීරයෙහි) රූපය විනිශ්චය කොට, එසේම මනායතනය හා ධම්මායතනයෙන් කොටසක් 'නාම' යයි ගෙන, ''මේ නාමයයි, මේ රූපයයි, මේ දෙක 'නාමරූපය' කියනු ලැබේ. යනුවෙන් සංක්ෂේපයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කෙරෙති.

ඉදින් ඒ ඒ ශීර්ෂ වශයෙන් ගෙන රූපය විනිශ්චය කොට ඉක්බිති අරූපය (නාමය) විනිශ්චය කරන විට සියුම් බැවින් ඔහුට එය නොවැටහේ

නම් ඔහු විසින් ධුරනික්ෂේපය (වීර්යය අත් හැරීම) නොකළයුතුය, රූපයම යලියලිත් සම්මර්ශනය කළයුතුය. මෙනෙහි කළයුතුය. විග්‍රහ කළයුතුය. විනිශ්චය කළයුතුය. යම් යම් ආකාරයෙකින් ඔහුට රූපය පැහැදිලිව, නිරවුල්ව, සුපිරිසුදුව වැටහේද, ඒ ඒ ආකාරයෙන් එයට අරමුණු වන අරූපධර්මයෝ තුමූම ප්‍රකට වෙති.

යම්සේ වනාහි අපිරිසුදු කැඩපතෙකින් මුහුණ බලන ඇස් ඇති පුරුෂයකුහට එයතුළ ඡායාව නොපෙනෙතොත්, හේ තෙමේ මුහුණ නොපෙනෙති'යි කැඩපත ඉවත නොදමයිද, එය නැවත නැවතත් පිරිමැදීමෙන් පිරිසුදුවූ කැඩපත තුළ මුඛච්ඡායාව තෙමේම ප්‍රකට වේද, තවද යම් සේ තෙල් ලබාගනු කැමැති පුරුෂයෙක් තෙමේ (කොටන ලද) තල මැඩි ඔරුවෙක (බඳුනෙක) දමා ජලයෙන් තෙමා එක්වරක් දෙවරක් මැඩීම් කළ පමණින් තෙල් නොලැබෙතොත් තලමැඩි ඉවත නොදමයිද, එය නැවත නැවතත් උණුදියෙන් තෙමමින් මැඩ මිරිකන විට සුපිරිසුදු තලතෙල් නික්මේද, තවද යම්සේ ජලය පිරිසුදු කරනු කැමැත්තෙක් ඉඟිනි ඇටයක් ගෙන කළයතුළ අත බහා එක්වරක් දෙවරක් ඉලූ පමණින් දිය නොපැදෙතොත්, ඉඟිනි ඇටය ඉවත නොදමාද, එය නැවත නැවතත් ගාන විට බොරමඩ පතුළට බැස දිය සුපිරිසුදු ලෙස පැදේද, එසේම එම භික්ෂුව විසින් ධුරනික්ෂේපය (වීර්යය අත්හැරීම) නොකොට රූපයම නැවත නැවතත් සම්මර්ශනය කළ යුතුය, මෙනෙහි කළයුතුය, විග්‍රහ කළයුතුය, ව්‍යවස්ථාපනය කළයුතුය.

යම්සේ වනාහි ඔහුට රූපය පැහැදිලි වේද, නිරවුල් වේද, නිර්මලව වැටහේද, එසේම තත්ප්‍රතිපක්ෂ ක්ලේශයෝ යටපත් වෙති, (පතුලෙහි තැන්පත්) මඩට උඩින් ඇති ජලය මෙන් සිත පැදෙයි, එම රූපය අරමුණු කොට ඇති අරූප ධර්මයෝ තුමූම ප්‍රකට වෙති. මේ ආකාරයෙන්ම ඉක්ෂු (උක්) - චෝර - ගෝණ - දධි(දී)-මත්ස්‍ය ආදී උපමා මගින්ද, මෙම අර්ථය ප්‍රකාශ කළ හැකිය.

මෙසේ සුපිරිසුදු රූපය මෙනෙහි කරන ඒ යෝගාවචරයාහට අරූපධර්මයෝ තුන් ආකාරයෙකින් වැටහෙති; ඵස්ස වශයෙන් හෝ වේදනා වශයෙන් හෝ විඤ්ඤාණ වශයෙනි. කෙසේද යත්ඃ ඇතැම් යෝගී කෙනකුහට පළමුකොට, ''රළු බව ලක්ෂණ කොට ඇත්තේ පඨවී ධාතුවයි'' ආදී නයින් ධාතූන් විග්‍රහ කරන විට ප්‍රථමයෙන් ඵස්සය අරමුණට වැටෙයි; එය, එය හා සම්ප්‍රයුක්ත වූ වේදනාව වේදනාස්කන්ධයයිද, සඤ්ඤාව සඤ්ඤාක්ඛන්ධයයිද, ඵස්සය හා සමග යෙදෙන චේතනාව සංඛාරක්ඛන්ධයයිද, සිත විඤ්ඤාණක්ඛන්ධයයිද වැටහෙයි.

එසේම ''කේශයෙහි කැකුළු(රළු) බව ලක්ෂණ කොට ඇත්තේ පඨවී ධාතුවයි -පෙ- ආශ්වාස ප්‍රශ්වාසයෙහිදී දැඩි බව ලක්ෂණ කොට ඇත්තේ පඨවී ධාතුවයි'' යනුවෙන් පළමුවෙන් ඵස්සය අරමුණට වැටෙයි;

එය හා යෙදුණ වේදනාව වේදනාක්ඛන්ධයයිද -පෙ- චිත්තය විඤ්ඤාණක්ඛන්ධයයිද වැටහේ; මෙසේ අරූපධර්මයෝ ඵස්සය අනුව වැටහෙති.

ඇතැම් යෝගී කෙනකුහට, කැකුළු (රළු) බව ලක්ෂණකොට ඇත්තේ පඨවි ධාතුවයි, එය අරමුණු කොට රස අනුභව කරන (අත්දැකීම් ලබන) වේදනාව වේදනාක්ඛන්ධයයිද, එය හා සමග යෙදුණ සඤ්ඤාව සඤ්ඤාක්ඛන්ධයයිද, එය හා සමග යෙදුණ ඵස්සය හා චේතනාව සංඛාරක්ඛන්ධයයිද, එය හා සමග යෙදුණ චිත්තය විඤ්ඤාණක්ඛන්ධයයිද වැටහේ.

එසේම කේශයෙහි රළුබව ලක්ෂණ කොට ඇත්තේ පඨවිධාතුවයි, -පෙ- ආශ්වාස ප්‍රශ්වාසයෙහි රළුබව ලක්ෂණ කොට ඇත්තේ පඨවි ධාතුවයි. එය අරමුණු කොට අනුභූතිය (අත් දැකීම්) ලබන වේදනාව වේදනාක්ඛන්ධයයිද, -පෙ- එය හා සමග යෙදුණ සිත විඤ්ඤාණක්ඛන්ධයයිද, වැටහේ. අරූපධර්මයෝ වේදනා වශයෙන් වැටහෙති.

අන් යෝගාවචර කෙනකුහට, කැකුළු බව ලක්ෂණකොට ඇත්තේ පඨවිධාතුවයිද අරමුණු දැන ගන්නා විඤ්ඤාණය විඤ්ඤාණක්ඛන්ධයයිද, එය හා සමග යෙදුණ වේදනාව වේදනාක්ඛන්ධයයිද, සඤ්ඤාව සඤ්ඤාක්ඛන්ධයයිද, ඵස්සය හා චේතනාව සංඛාරක්ඛන්ධයයිද වැටහේ.

එසේම කේශයෙහි රළුබව ලක්ෂණ කොට ඇත්තේ පඨවි ධාතුවයිද, -පෙ- ආශ්වාස ප්‍රශ්වාසයෙහි රළුබව ලක්ෂණ කොට ඇත්තේ පඨවිධාතුවයිද, අරමුණු දැන ගන්නා විඤ්ඤාණය විඤ්ඤාණක්ඛන්ධයයිද, එය හා සමග යෙදුණු වේදනාව වේදනාක්ඛන්ධයයිද, සඤ්ඤාව සඤ්ඤාක්ඛන්ධයයිද, ඵස්සය හා චේතනාව සංඛාරක්ඛන්ධයයිද වැටහේ. මෙසේ විඤ්ඤාණ වශයෙන් අරූප ධර්මයෝ වැටහෙති.

මේ අනුසාරයෙන්ම කර්මයෙන් හටගත් කේශයෙහි දැඩිබව ලක්ෂණ කොට ඇත්තේ පඨවිධාතුවයි' ආදී නයින් දෙසාළිසක් වූ ධාතු කොට්ඨාසයන්හි, මූල ධාතු සතරක් සතරක් වශයෙන්ද, චක්ඛුධාතු ආදී සෙසු රූපයන් පිළිබඳ පරිග්‍රහ විෂයයෙහි සියලු නයප්‍රභේදයන් අනුව යමින් අර්ථයෝජනා කළයුතුය.

යම් හෙයකින් මෙසේ සුවිශුද්ධ රූප පරිග්‍රහ ඇති ඒ යෝගාවචරයාහට අරූපධර්මයෝ (ඵස්සය, වේදනාය, විඤ්ඤාණය යන) තුන් ආකාරයෙන් ප්‍රකට වෙත්ද, එහෙයින් සුවිශුද්ධ රූප පරිග්‍රහ ඇත්තහු විසින්ම අරූප පරිග්‍රහය පිණිස යෝග කටයුතුය. අනෙකකු (රූප පරිග්‍රහ නැත්තකු) විසින් නොකටයුතුය. ඉදින් එක් රූපධර්මයක් හෝ දෙකක් වැටහුණ කල රූප පරිග්‍රහය හැර අරූපපරිග්‍රහය අරඹත්හොත්

කර්මස්ථානයෙන් පිරිහෙයි; (ඉහත) පඨවිකසිණ භාවනා විෂයයෙහි කියන ලද ප්‍රකාර ඇති (මග තොට නුපුරුදු) පර්වත වාසී (ගව) දෙන මෙනි. සුවිශුද්ධ රූප පරිග්‍රහ ඇතිව අරූප පරිග්‍රහය පිණිස යෝග වඩන්නහුගේ කර්මස්ථානය වෘද්ධියට, පරිපූර්ණ බවට, මහත් බවට පැමිණෙයි.

ඒ යෝගාවචර තෙමේ මෙසේ 'ඵස්ස' ආදී වශයෙන් වැටහුණු අරූපී ස්කන්ධ චතුෂ්කය 'නාම' යයිද, එම අරූපයනට අරමුණු වූ සතර මහාභූතයන් හා එම සතර මහාභූතයනට අයත් උපාදාය රූපයන් 'රූප' යයිද ව්‍යවස්ථාපනය කරයි. මේ ආකාරයෙන් අටළොස් ධාතූන්ද, දොළොස් ආයතනයන්ද, පංච ස්කන්ධයන්ද යන සියලු ත්‍රෛභූමක ධර්මයන් කඩුවෙකින් කරඬුවක් විවර කරනු සෙයින්ද, දෙබිඩිතල් කඳක් පළනු සෙයින්ද 'නාම' යයිද 'රූප' යයිද යනුවෙන් දෙපරිද්දෙන් ව්‍යවස්ථාපනය කරයි. නාමරූප මාත්‍රයට වැඩි යම් සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ දෙවියෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැතැ'යි නිගමනයට පැමිණෙයි.

මෙසේ ඒ යෝගාවචර තෙමේ තත් වූ පරිදි නාමරූපයන් විනිශ්චය කොට 'සත්ත්වයෙක, පුද්ගලයෙකැ'යි යන මේ ලෝකව්‍යවහාරය වඩාත් මැනවින් ප්‍රහීණ කරනු පිණිස, සත්ත්වයෙකැ'යි යන මුළාව ඉක්මවනු පිණිස අසම්මෝහ භූමියෙහි (නුමුළා බවෙහි) සිත පිහිටුවීම පිණිස බොහෝ සූත්‍රාන්තයන්ගේ අනුසාරයෙන්, 'නාම-රූප මාත්‍රයෙකි, සත්ත්වයෙක්, පුද්ගලයෙක් හෝ නොවේ' යන මේ අර්ථය සංසන්දනය කොට ව්‍යවස්ථාපනය කරයි. කියන ලදමැයි:-

> යථාපි අඞ්ග සම්භාරා හොති සද්දො රථො ඉති
> එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති

යම්සේ ඒ ඒ කොටස් එක්කොට ගැලපීමෙන් 'රථ'ය යන ශබ්ද ව්‍යවහාරය ඇති වේද, එසේම ස්කන්ධයන් පවත්නා කල 'සත්ත්ව' යන සම්මුතිය වේ.

තවද, ''ඇවැත්නි, දඬු නිසාද, වැල් නිසාද, මැටි නිසාද, (බට ආදී) තෘණ වර්ග නිසාද ආවරණය කරන ලද ආකාශය 'ගෙය' යනුවෙන්ම ව්‍යවහාරයට යෙයි, ඇවැත්නි, එසේම ඇට නිසාද, නහර නිසාද, මස් නිසාද, සම නිසාද ආවරණය කරන ලද ආකාශය 'රූප'ය යන ව්‍යවහාරයට යෙයි''[a] යනුද කියන ලදී.

තවද:-

> දුක්ඛමෙවහි සම්භොති දුක්ඛං තිට්ඨති වෙතිච
> නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤං දුක්ඛා නිරුජ්ඣති.

---

a. ම.නි. මහා හත්ථිපදොපමසුත්ත

දුකම උපදියි, දුකම පවතියි, දුකම ඉවත්වී යයි; දුක මිස අන් කිසිවක් නූපදියි, දුක මිස අන් කිසිවක් ඉවත නොයයි.

මෙසේ නොයෙක් සියගණන් සූත්‍රාන්තයන් මගින් නාමරූපයම දක්වන ලදි. එහෙයින් යම්සේ අක්‍ෂ (රිය අකුරු), චක්‍ර, පඤ්ජර (මැදිරි), රථශීර්ෂ (රියහිස්) ආදී අවයව රාශිය කිසියම් ආකාරයෙකින් සවිකොට තැබූ කල 'රථ' ය යන ව්‍යවහාර මාත්‍රය වේද, එක් එක් අවයවය වෙන වෙනම ගෙන පිරික්සන විට පරමාර්ථ වශයෙන් 'රථය' නම් වූ කිසිවක් නොමැත්තේද, තවද දැවදඬු ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය කිසියම් ආකාරයෙකින් අහස ආවරණය කොට පිහිටුවන ලද කල 'ගෙය'ය යන ව්‍යවහාර මාත්‍රය වේද, පරමාර්ථ වශයෙන් 'ගෙය' නම් වූ කිසිවක් නොමැත්තේද, තවද, ඇඟිලි මහපටැඟිලි ආදිය කිසියම් ආකාරයෙකින් පිහිටුවන ලද කල 'මිට'ය යන ව්‍යවහාර මාත්‍රය වේද, -පෙ-, තවද (එක්තරා පිළිවෙළකට එක් කොට තැබූ කල) ද්‍රෝණි (බඳ), තන්ත්‍රී (තත්) ආදිය 'වීණා' යයිද, ඇත්, අස් ආදීහු 'සේනා' යයිද, ප්‍රාකාර, ගෘහ, ගෝපුර (අට්ටාල සහිත දොරටු) ආදිය 'නගර' යයිද, කඳ, අතු, කොළ මඬුලු ආදිය 'රුක' යයිද ව්‍යවහාර මාත්‍රයට යෙත්ද පරමාර්ථ වශයෙන් එක් එක් අවයවය වෙන වෙනම ගෙන පිරික්සන කල 'මිට' යයි හෝ 'වීණා' යයි හෝ, 'සේනා' යයි හෝ, 'නගර' යයි හෝ 'රුක' යයි හෝ කිසිවක් නැත්තේ වේද, මෙසේම උපාදානස්කන්ධ පංචකය පවත්නා කල 'සත්ත්වයෙක, පුද්ගලයෙක' යන ව්‍යවහාර මාත්‍රය පවතියි, පරමාර්ථ වශයෙන් එක් එක් ස්කන්ධයක් ගෙන පිරික්සනු ලබන විට 'වෙමි'යි හෝ 'මම' යයි ගැනීමට වස්තු වන සත්ත්වයෙක් නම් නැත්තේය; පරමාර්ථ වශයෙන් වනාහි හුදෙක් නාම-රූප මාත්‍රයම වෙති'යි මෙසේ දක්නාහුගේ දර්ශනයම 'යථාභූත දස්සන' (ඇති තතු දැකීම) නම් වේ.

යමෙක් වනාහි මේ යථාභූතදස්සනය හැර පියා සත්ත්වයෙක් ඇතැ'යි ගන්නේද, හේ ඒ සත්ත්වයාගේ නැවැත්ම, නැතහොත්, පැවැත්ම අනුදන්නේ වේ; පැවැත්ම අනුදන්නේ ශාස්වත දෘෂ්ටියට වැටේ; නැවැත්ම අනුදන්නේ උච්ඡේද දෘෂ්ටියට වැටේ. කවර හෙයින්ද යත්; කිරිම (ක්‍රමයෙන්) විකාර බවට යාමෙන් (මිදී) සැදෙන දී මෙන් (ආත්මය) වෙනස් බවට පත් වීමෙන් සැදෙන අන් කිසිවක් නොමැති හෙයිනි. සත්ත්වයා ශාස්වත (සදාකාලික) යයි ගන්නා හේ තෙමේ භවය තුළ අවලීන වෙයි (කිඳා බසියි, ඇලී-ගැලී සිටියි). (භවය මරණයෙන්) සිඳී යෙති'යි ගන්නේ අතිධාවනය කරන්නේ නම්වේ.

එහෙයින් දෙසූහ, භාග්‍යවතුන් වහන්සේ:- ''මහණෙනි, දෘෂ්ටි ද්වයයෙකින් මඩනාලද ඇතැම් දෙව්-මිනිස් කෙනෙක් භවයෙහි අවලීන වෙති. ඇලී ගැලී සිටිති, ඇතැම් දෙව්-මිනිස් කෙනෙක් අතිධාවනය කෙරෙති, ඇස් ඇත්තෝම (ඇති තතු නුවණින්) දකිති, මහණෙනි, ඇතැමකු

අවලීන වනුයෙ කෙසේද? මහණෙනි, මේ දෙව්මිනිස්සු වනාහි භවයෙහි ඇලෙන සුලු වෙති, භවය කෙරෙහි ඇළුණාහු වෙති, භවය වෙත බැඳුණාහු වෙති, භවයෙහි සතුටු වන්නාහු වෙති, භව නිරෝධය පිණිස දහම් දෙසනු ලබන විට එයට සිත නො-ඇදයි, නොපහදියි, නොපිහිටයි, අධිමුක්තියට (නිශ්චයයට) නොපැමිණෙයි, මහණෙනි, ඇතැමෙක් මේ ආකාරයෙන් අවලීන (ඇලීගැලී සිටිති) වෙති, මහණෙනි, ඇතැමෙකු අතිධාවනය කරනුයේ කෙසේද? මහණෙනි, ඇතැමෙක් තුමූ භව හේතුවෙන්ම පීඩාවට පත් වූවාහු, ලජ්ජාවට පත් වූවාහු, පිළිකුලට පත් වූවාහු විභවය කැමැති වෙති, යම් හෙයකින් වනාහි මේ ආත්මය කය බිඳ වැටීමෙන් කෙළවර වේද, විනාශ වේද, මරණින් මතු නොපවතීද, එහෙයින් මේ (විභවය) ශාන්තය, ප්‍රණීතය, යථා ස්වභාවය'යි යනුවෙන් මෙසේ අතිධාවනය කෙරෙති. කෙසේ නම්, මහණෙනි, ඇස් ඇත්තෝම දකිත්ද? මහණෙනි මේ ශාසනයෙහි භික්ෂු තෙමේ (යථා) භූතය (ඇති තතු) භූත වශයෙන්ම දකියි. භූතය භූත වශයෙන් දැක, එහි කලකිරීම පිණිස, නො-ඇලීම පිණිස, අවසන් කිරීම පිණිස, පිළිපන්නේ වේ; මහණෙනි, ඇස් ඇත්තෝ මේ ආකාරයෙන් දකිති'' යනුයි.

එහෙයින්, යම්සේ දාරු (දැව මුවා) යන්ත්‍රයක් (ආත්මයෙන්) ශූන්‍ය වූයේ, නිර්ජීව වූයේ, නිරුත්සාහික වූයේ නමුදු, දැව හා රැහැන් එක් කොට යෙදීමෙන්, යන්නේද, සිටින්නේද, උත්සාහ සහිත වූවක්, ව්‍යාපාර සහිත වූවක් සෙයින් වැටහෙන්නේ වේද, එසේම මේ නාම-රූප දෙකද ශූන්‍ය වූයේ, නිර්ජීව වූයේ, නිරුත්සාහික වූයේ නමුදු, එකිනෙක එක්ව සංයෝග වීමෙන් යන්නේද, සිටින්නේද, සොත්සාහික වූවක්, සව්‍යාපාර වූවක් සෙයින් වැටහෙති'යි දතයුතුයි. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

නාමඤ්ච රූපඤ්ච ඉධත්ථි සච්චතො
නහෙත්ථ සත්තො මනුජො ච විජ්ජති
සුඤ්ඤං ඉදං යන්තමිවාභිසංඛතං
දුක්ඛස්ස පුඤ්ජො තිණකට්ඨ සාදිසො

සත්‍ය වශයෙන් ඇත්තේ නාම-රූප දෙක පමණයි. මෙහි සත්වයෙක් හෝ මිනිසෙක් විද්‍යමාන නොවේ; මෙය සකස් කළ යන්ත්‍රයක් මෙන් (ආත්ම වශයෙන්) ශූන්‍යය, පිදුරු හා දැව මෙන් නිසරුය, දුක් පිඬෙකි.

මෙය හුදෙක් දාරු යන්ත්‍රෝපමා වශයෙන් පමණක් නොව බටමිටි ආදී අන් උපමා මගින්ද විස්තර කළ හැකිය. යම්සේ බට මිටි දෙකක් එකිනෙක පටලවා තැබූ විට, එකක් අනෙකට ආධාරකයක් වේද, එකක් වැටෙන විට අනෙකද වැටේද, එසේම මේ පඤ්චස්කන්ධ භවයෙහි නාම-රූප දෙක එකිනෙක නිසා පවතී, එකක් අනෙකට උපස්ථම්භක වේ; මරණ වශයෙන් එකක් වැටෙන කල අනෙකද වැටේ. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

යමකං නාමරූපඤ්ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා
එකස්මිං භිජ්ජමානස්මිං උභො භිජ්ජන්ති පච්චයා

නාම-රූප යමක (නිවුන්)යෙකි. දෙක එකිනෙක ඇසුරු කොට පවතී, එකක් බිඳෙන කල එකිනෙකට ප්‍රත්‍යය වූ දෙකම බිඳේ.

තවද, (යම්සේ) දඬුවෙකින් පහරන ලද බෙරය නිසා ශබ්දය පවත්නා විට, බෙරය එකෙකි, ශබ්දය අනෙකෙකි; බෙරය ශබ්දය සමග අසම්මිශ්‍රය, බෙරය ශබ්දයෙන් ශූන්‍යය, ශබ්දය බෙරයෙන් ශූන්‍යය, එසේම වස්තු, ද්වාර, ආරම්මණයයි කියනු ලබන රූපය නිසා නාමය පවත්නා කල රූපය එකෙකි, නාමය අනෙකෙකි, නාමය රූපය සමග මිශ්‍ර වූයේ නොවේ; නාමය රූපයෙන් ශූන්‍යය, රූපය නාමයෙන් ශූන්‍යය; එහෙත් බෙරය නිසා ශබ්දය මෙන් රූපය නිසා නාමය පවතී. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

න චක්ඛුතො ජායරෙ ඵස්ස පඤ්චමා
න රූපතො නොච උභින්නමන්තරා
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථා හි සද්දො පහටාය භෙරියා
න සොතසො - පෙ න සද්දතො - පෙ.
න ඝානතො - පෙ - න ගන්ධතො -පෙ-
න ජිව්හතො - පෙ - න රසතො - පෙ-
න කායතො - පෙ - න ඵස්සතො - පෙ-
න වත්ථුරූපා පභවන්ති සඞ්ඛතා
න චාපි ධම්මායතනෙහි නිග්ගතා
හෙතුං පටිච්ච පභවන්ති සඞ්ඛතා
යථාහි සද්දො පහටාය භෙරියා'ති

ස්පර්ශය අවසන් කොට ඇති (රූපාදි) පංචකය ඇසින් උපදිනුයේ නොවේ; රූපයෙන් හෝ (චක්ඛු-රූප යන) දෙක අතරින් හෝ උපදිනුයේද නොවේ; සංඛාරයෝ හේතුවක් නිසා හටගනිත්, බෙරයකට ගැසූ කල ශබ්දය උපදින්නා සේය.

කණින් -පෙ- ශබ්දයෙන් හෝ - පෙ,
නහයෙන් -පෙ- ගඳින් හෝ -පෙ-,
දිවෙන් -පෙ- රසයෙන් හෝ -පෙ-,
කයින් -පෙ- පහසින් හෝ -පෙ, ගසන ලද බෙරයෙන් ශබ්දය නිකුත් වන්නා සේ සංඛාරයෝ හේතුවක් නිසාම උපදිත්.

තවද මෙහි නාම ස්කන්ධය ප්‍රභාවරහිත වේ, ස්වකීය ප්‍රභාවයෙන් පවතිනු නොහැකි වේ, නො බුදියි, නො බොයි, නො බෙණෙයි, ඉරියවු නො පවත්වයි; රූපස්කන්ධයද ප්‍රභාව රහිත වේ. ස්වකීය ප්‍රභවයෙන්

පවතිනු නොහැකි වේ. එයටද කනු කැමැති බවත්, බොනු කැමැති බවක් හෝ ඉරියවු පවත්වනු කැමැති බවක් නැත. එහෙත්, නාමය නිසා රූපය පවතියි, රූපය නිසා නාමය පවතියි, නාමයට කනුකැමැති බව, බොනුකැමැති බව, බෙණෙනු කැමැති බව ඉරියවු පවත්වනු කැමති බව ඇති විට, රූපය කයි, බොයි, බෙණෙයි, ඉරියවු පවත්වයි.

මේ අර්ථය පැහැදිලි කරනු පිණිස (ආචාර්යවරයෝ) මෙවන් උපමාවක් ගෙන හැර දක්වති:- ජාත්‍යන්ධයෙක් හා පිළෙක් දිසා සංචාරය කරනු කැමැත්තෝ වූහ; ජාත්‍යන්ධ තෙමේ පිළාට මෙසේ කීය. "සබඳ, මම පයින් ඇවිද යාහැකියේ වෙමි, එහෙත් මග තොට වළ ගොඩලි දැකියහැකි ඇස් නැත්තේ වෙමි" පිළා ද ජාත්‍යන්ධයාට මෙසේ කීය, "සබඳ මම ඇසින් දැක බලා ගැනීමට හැකියේ වෙමි, එහෙත් යාම් ඊම් කළ හැකි පා නොමැත්තේ වෙමි". තුටු පහටු වූ ඒ ජාත්‍යන්ධ තෙමේ පිළා තම කර පිට තබා ගති, පිළා ජාත්‍යන්ධයාගේ කර පිට හිඳ, "වම් (පය) තබනු, දකුණු (පය) ගනු"යයි කීය.

මෙහි අන්ධයා ද ප්‍රභාව රහිත වේ, දුබල වේ, ස්වශක්තියෙන් යා නොහැක්කේ වේ, පිළාද ප්‍රභාවරහිත වේ, දුබල වේ, ස්වශක්තියෙන් යා නොහැක්කේ වේ; එහෙත් එකිනෙකා නිසා ඔවුන්ගේ ගමන නොපවත්නේ නොවේ. මෙසේම නාමයද බලරහිත වේ, ස්වශක්තියෙන් නො-උපදනේය, ස්වශක්තියෙන් ඒ ඒ කාර්යයෙහි නොයෙදෙනුයේය; රූපයද බල රහිතය, ස්වශක්තියෙන් නො-උපදනේය, ඒ ඒ කාර්යයෙහි නොයෙදෙනුයේය, එහෙත් එකිනෙක නිසා ඒ දෙකෙහිම උපත නොවන්නේ නොවේ.

එහෙයින් කියනු ලැබේ:-

> න සකෙන බලෙන ජායරෙ නාපි සකෙන බලෙන තිට්ඨරෙ,
> පර ධම්මවසානුවත්තිනො ජායරෙ සඞ්ඛතා අත්තදුබ්බලා
> පරපච්චයතො ච ජායරෙ පරආරම්මණතො සමුට්ඨිතා,
> ආරම්මණ පච්චයෙහි ච පරධම්මෙහි චිමෙ පභාවිතා
>
> යථාපි නාවං නිස්සාය මනුස්සා යන්ති අණ්ණවෙ,
> එවමෙව රූපං නිස්සාය නාමකායො පවත්තතෙ
> යථාච මනුස්සෙ නිස්සාය නාවා ගච්ඡති අණ්ණවෙ,
> එවමෙව නාමං නිස්සාය රූපකායො පවත්තති.
> උභො නිස්සාය ගච්ඡන්ති මනුස්සා නාවා ච අණ්ණවෙ,
> එවං නාමඤ්ච රූපඤ්ච උභො අඤ්ඤොඤ්ඤනිස්සිතා

සංඛාරයෝ, තුමූ දුර්වල වූවාහු ස්වබලයෙන් නො-උපදනාහුය, නොද පවත්නාහුය, පරා අයත් ධර්මයන් අනුව පවත්නාහු උපදනාහුද වෙති.

මොහු පරා අයත් ස්වභාව ඇති ආලම්බනප්‍රත්‍යයන්ගෙන් බලය ලැබ පරා අයත් ප්‍රත්‍යයෙන්ම උපදිත්, පරා අයත් අරමුණුවලින්ම හටගනිත්,

යම් සේ නැව නිසා මිනිස්සු මුහුදෙහි යෙත්ද, එසේම රූපස්කන්‍ධය නිසා නාමස්කන්‍ධ සමූහය පවතී.

තවද යම්සේ මනුෂ්‍යයන් නිසා නැව සමුද්‍රරෙහි යේද, එසේම නාමස්කන්‍ධය නිසා රූපස්කන්‍ධය පවතී.

මිනිස්සුද නැවද එකිනෙකා නිසා සමුද්‍රරෙහි යෙත් ද, එසේම නාම-රූප දෙකද එකිනෙක නිසා පවතී.

මෙසේ නොයෙක් ක්‍රමයෙන් නාම-රූපයන් ව්‍යවස්ථාපනය කරන්නහුට සත්‍වසංඥාව අබිබවා නාම-රූපයන් පිළිබඳව ඇතිවන නුමුළාබව්හි පිහිටි ඇතිතතු දැකීම 'දිට්ඨි විශුද්ධි'යයි දතයුතුය. 'නාමරූප වවත්‍ථාන'යයිද, සඞ්ඛාර පරිච්ඡේද' යයිද මෙයටම අධිවචන (පර්යාය) වේ.

සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි,
පඤ්ඤාභාවනාධිකාරයෙහි, "දිට්ඨිවිසුද්ධි නිද්දේස" නම්වූ
අටළොස්වන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.

—//—

# කඞ්ඛා විතරණ විසුද්ධි නිද්දේසය

මෙම නාම-රූපයන්ගේම ප්‍රත්‍යයන් පිරිසිඳ දැක්මෙන් තුන් කල්හි සැකය දුරු කොට සිටි ඥානය 'කංඛාවිතරණ විසුද්ධි' නම්වේ. එය සම්පාදනය කරනු කැමැති භික්ෂු තෙමේ, යම්සේ දක්‍ෂ වෛද්‍යවරයෙක් රෝගයක් දැක එහි නිදානය සොයන්නේද, නැත හොත්, යම්සේ අනුකම්පා ඇති පුරුෂයෙක් වීදියෙක උඩුකුරුව වැතිර සිටින ළාබාල අතදරුවකු දැක, 'මේ' කවරකුගේ දරුවෙක්දෝ'යි මාපියන් සොයා බලනුයේද, එසේම ඒ නාමරූපයන් පිළිබඳ හේතුප්‍රත්‍යයයන් සොයා බැලීමෙහි යෙදෙයි. ඒ (භික්ෂු) තෙමේ මුල පටන්ම මෙසේ සලකා බලයිඃ- ''පළමු කොටම මේ නාමරූපය අහේතුක නොවේ, සියලු තන්හි, සියලු කල්හි ඒකාකාරව නොපැමිණෙන හෙයිනි. ඊශ්වරාදී හේතුවෙකින් හටගන්නේද නොවේ, නාමරූපයට ඉහළින් සිටි ඊශ්වරාදී කිසිවකු නොමැති හෙයිනි. යමෙක් නාම-රූප මාත්‍රය ඊශ්වර ආදීන් ලෙස වහරත්ද, ඔවුන් විසින් ඊශ්වරාදීන් ලෙස වහරනු ලබන නාමරූපය අහේතුක බවට පත් වන හෙයිනි. (අහේතුක යයි පිළිගත යුතුවන හෙයිනි). එහෙයින් මෙයට හේතු ප්‍රත්‍යයන් තිබිය යුතුය; ඒ හේතු ප්‍රත්‍යයයෝ කවරහුද?'' යනුවෙනි.

ඒ (භික්ෂු) තෙමේ මෙසේ නාමරූපයන් පිළිබඳ හේතුප්‍රත්‍යයන් ආවර්ජනය කොට, ඉක්බිති පළමුව මේ රූපකාය පිළිබඳ හේතු ප්‍රත්‍යයන් විග්‍රහ කරයිඃ- ''මේ කය උපදින විට උපුල්, රත්පියුම්, හෙළ පියුම්, හෙල්මැලි ආදිය තුළ හෝ මිණි මුතු ආකරාදිය තුළ හෝ උපදනේ නොවේ; වැලිදු, ආමාශ පක්වාශ යන දෙක අතර උදරපටලය පිටුපසින්ද, පිටකටුව (කොඳු ඇට පෙළ) ඉදිරිපසින්ද සිටින සේ, අතුණු හා අතුණු බහන්වලින් පිරිවරන ලදුව, තෙමේද දුගඳව, ජුගුප්සිතව, පිළිකුල්ව, එසේම දුගඳ, ජුගුප්සිත, පිළිකුල් වන, බොහෝ ගැහැට ඇති, අවකාශයෙක්හි, කුණු මසුන්, කුණු මළසිරුරු, පිළුණු කොමු (පිට්ටු), වැසිකිලිවළ, ගම්දොර කුණුවල ආදිය තුළ පණුවකු සෙයින් උපදියි. මෙසේ උපදින කයට අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම යන මේ සතර උත්පත්තිකර්තෘක (ඉපැදීම සිදුකරන) හේතුව වේ. ආහාරය උපස්තම්භකර්තෘක ප්‍රත්‍යය වේ. මෙසේ මේ ධර්ම පංචකය හේතු-ප්‍රත්‍යය වේ. එම පංචකය අතුරෙන්ද, අවිද්‍යා ආදී (පළමු) තුන දරුවකුට මවක සෙයින් මේ කයට උපනිශ්‍රය වේ; කර්මය දරුවකුට පියකු මෙන් ජනක (උපදවන්නා) වේ; ආහාරය දරුවකුට කිරිමවක සෙයින් සන්ධාරක (දරන්නා) වේ.'' යනුවෙන් මෙසේ රූපකාය පිළිබඳ ප්‍රත්‍යයන් විනිශ්චය කොට, නැවතත්, ''චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං''[a] (ඇසද රූපයන්ද නිසා චක්ඛු විඤ්ඤාණය උපදී) යන

---

a. ම. නි. මධුපිණ්ඩික සූත්‍රය

ආදී නයින් නාමකාය පිළිබඳ ප්‍රත්‍යයයන් විනිශ්චය කරයි. මෙසේ ඒ යෝගාවචර තෙමේ ප්‍රත්‍යය වශයෙන් නාමරූප යන දෙක්හි පවත් දැක, ''මේ නාම-රූප දෙක දැන් මෙන්ම අතීත කාලයෙහිද ප්‍රත්‍යය නිසා පැවැත්තේය, අනාගතයෙහිද ප්‍රත්‍යය නිසා පවත්නේය'යි දකී.

මෙසේ දක්නා ඔහුට පූර්වාන්තය අරබයා, ''අතීත කාලයෙහි මම් වීම්ද? නොවීම්ද? අතීත කාලයෙහි මම් කවරෙක් වීම්ද? අතීතකාලයෙහි මම් කෙබන්දෙක් වීම්ද? අතීත කාලයෙහි මම් කවරෙක්ව සිට (අනතුරුව) කවරෙක් වීම්දැ''[b]යි යනුවෙන් පංචවිධ විචිකිච්ඡාවක් වෙති'යි කියන ලද්දේද, තවද අපරාන්තය අරබයාද, ''අනාගත කාලයෙහි මම් වන්නෙම්ද? නොවන්නෙම්ද?, අනාගත කාලයෙහි මම් කවරෙක් වන්නෙම්ද? අනාගත කාලයෙහි මම් කෙබන්දෙක් වන්නෙම්ද? අනාගත කාලයෙහි මම් කවරෙක්ව සිට (අනතුරුව) කවරෙක් වන්නෙම්දැ[b]යි යනුවෙන් පංචවිධ විචිකිච්ඡාවක් වෙති'යි කියන ලද්දේද තවද වර්තමානය අරබයාද දැන් මේ ප්‍රත්‍යුත්පන්න කාලයෙහි තොරතුරු විමසමින්, ''මම් වෙම්ද? නොවෙම්ද? කවරෙක් වෙම්ද? කෙබන්දෙක් වෙම්ද? මේ සත්‍වයා කොයින් ආයේද? හෙතෙම කොහි යන්නේදැ'යි යනුවෙන් ෂඩ්විධ විචිකිච්ඡාවක් වෙති'යි කියන ලද්දේද, ඒ සකලවිධ විචිකිච්ඡාවම ප්‍රහීණ වේ.

අන් යෝගාවචරයෙක් තෙමේ නාමය පිළිබඳ වූ සාධාරණ අසාධාරණ යනුවෙන් දෙ-ආකාර ප්‍රත්‍යයද, රූපය පිළිබඳවූ කර්ම ආදී සිවු ආකාර ප්‍රත්‍යයද බලයි.

නාමයට සාධාරණ අසාධාරණ වශයෙන් ප්‍රත්‍යය දෙ-ආකාර වේ. එහි චක්ඛු ආදී ද්වාර සය හා රූප ආදී අරමුණු සය නාමය පිළිබඳ සාධාරණ ප්‍රත්‍යය වේ. කුසලාදී භේද ඇති සකලාකාර වූම නාමය එයින් (ද්වාර හා ආලම්බනයන් වෙතින්) පවත්නා හෙයිනි. මනසිකාර ආදිය අසාධාරණ ප්‍රත්‍යයයි; යෝනිසෝමනසිකාර, ධර්මශ්‍රවණ ආදිය කුශලයටම ප්‍රත්‍යය වන අතර විපරීතය අකුශලයටම ප්‍රත්‍යය වේ. කර්මාදිය විපාක චිත්තයටද, භවාංගාදිය කිරිය චිත්තයටද ප්‍රත්‍යය වේ.

රූපයට වනාහි කර්ම, චිත්ත, ඍතු, ආහාර යන මේ සතර ප්‍රත්‍යය වේ. එහි කර්මය අතීත වූයේම කර්ම සමුත්ථාන රූපයට ප්‍රත්‍යය වේ. චිත්තය උපදනේම චිත්ත සමුත්ථාන රූපයටද, ඍතු; ආහාර යන දෙක ස්ථිතික්ෂණයෙහි ඍතු ආහාර සමුත්ථාන රූපයටද ප්‍රත්‍යය වේ. මෙසේ එක් යෝගාවචරයෙක් තෙමේ නාමරූපයන් පිළිබඳ ප්‍රත්‍යය විග්‍රහය කෙරේ.

හේ තෙමේ මෙසේ ප්‍රත්‍යය වශයෙන් නාම රූපයෙන් පිළිබඳ පවත් දැක, ''මෙය දැන් මෙසේ නම්, අතීත අද්ධායෙහිද මෙසේම ප්‍රත්‍යය වශයෙන් පැවතුනා විය යුතුය, අනාගතයෙහිද ප්‍රත්‍යය වශයෙන් පැවතීම

b. ම. නි. සබ්බාසව සුත්ත

වියයුතුයයි දකියි. මෙසේ දක්නා ඔහුට කී නයින්ම කාලත්‍රයයෙහිම වූ විචිකිඡාව පහ වෙයි.

අන් යෝගාවචරයෙක් තෙමේ එම නාමරූප සංඛ්‍යාත සංඛාරයන්ගේ ජරාප්‍රාප්තිය (ජරාවට පත්වීම)ද, ජරාවට පත්ව බිඳීයාමද දැක, ''මේ සංඛාරයන්ගේ ජරා-මරණ යන දෙක ජාතිය (ඉපැදීම) ඇති තාක් පවතී, ජාතිය කර්මභවය ඇති තාක් පවතී, භවය උපාදානය ඇති තාක්ද, උපාදානය තෘෂ්ණාව ඇති තාක්ද, තෘෂ්ණාව වේදනාව ඇති තාක්ද, වේදනාව ඵස්සය ඇති තාක්ද, ඵස්සය සළායතනය ඇති තාක්ද, සළායතනය නාම-රූපය ඇති තාක්ද, නාමරූපය විඤ්ඤාණය ඇති තාක්ද, විඤ්ඤාණය සංඛාරයන් ඇති තාක්ද, සංඛාරයෝ අවිද්‍යාව ඇතිතාක්ද පවතිති'' යනුවෙන් මෙසේ ප්‍රතිලෝම (අග සිට මුලට) පටිච්ච සමුප්පාද වශයෙන් නාමරූපයන් ගේ ප්‍රත්‍යය පරිග්‍රහය කෙරේ. එවිට කී නයින්ම ඔහුගේ විචිකිච්ඡාව දුරුවේ.

අන් යෝගාවචරයෙක් තෙමේ ''ඉති ඛෝ අවිජ්ජා පච්චයා සංඛාරා (මෙසේ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙන සංඛාරයෝ වෙති) යනුවෙන් පළමුව (පඤ්ඤාභූමි නිද්දේසයෙහි) විස්තර කොට දක්වන ලද අනුලෝම පටිච්ච සමුප්පාද වශයෙන් නාමරූපයන් පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහය කරයි. එවිට කී නයින්ම ඔහුගේ සැක දුරුවෙයි.

අන් යෝගාවචරයෙක් තෙමේ, ''පූර්ව කර්මභවයෙහි මෝහය අවිද්‍යාවයි, කර්මයන් රැස්කිරීම සංඛාරයි, ආශාව තෘෂ්ණාවයි, දැඩිව ගැනීම උපාදානයයි, චේතනාව භවයයි, යනුවෙන් මේ පංච ධර්මයෝ පූර්වකර්මභවයෙන් මේ භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වූහ, මේ භවයෙහි ප්‍රතිසන්ධිය විඤ්ඤාණයයි, මව්කුස වැදගැනීම නාමරූපයයි, (චක්ඛු ආදී) පසාද ෂට්කය ආයතනයි. අරමුණු සමග ගැටීම ඵස්සයයි, විඳිනය වේදනායි, යනුවෙන් මේ පංච ධර්මයෝ මෙම උත්පත්ති භවය තුළ පූර්වයෙහි කරනලද කර්මය ප්‍රත්‍යය කොට සිද්ධ වෙති. ආයතනයන්ගේ පරිපාකය මේ භවය තුළ වන හෙයින් මෝහය අවිද්‍යාය, -පෙ- චේතනාව භවයයි. යනුවෙන් මේ පංචධර්මයෝ මේ භවය තුළ මතු ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වෙති''යි මෙසේ කම්මවට්ට, විපාක වට්ට වශයෙන් නාම-රූපයන් පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහය කරයි.

එහි කර්මය දිට්ඨ ධම්ම වේදනීය, උපපජ්ජ වේදනීයය, අපරාපරිය වේදනීයය, අහෝසි කර්මයයි චතුර්විධ වේ. ඒ අතුරෙන් දිට්ඨ ධම්ම වේදනීය කර්මය නම්, එක් ජවන වීථියෙක්හි ජවන් සිත් සතින් - කුශල හෝ වේවා, අකුශල හෝ වේවා, පළමුවන ජවන් සිතයි. එය මෙම ආත්මභාවයෙහිදීම විපාක දේ. එසේ විපාක දීමට නොහැකි වුවහොත් ''අහොසි කම්මං, නාහොසි කම්මවිපාකො, නභවිස්සති කම්මවිපාකො,

නත්ථි කම්මවිපාකෝ (අහෝසි කම්ම යනු, කර්ම විපාකයක් නොවීය. මතුද කර්ම විපාකයක් නොවන්නේය, දැනුදු කර්ම විපාකයක් නැත'' යනුවෙන් ත්‍රිකයක් වශයෙන් දක්වන ලද 'අහෝසි කම්ම'[a] නම් වේ. (කුශලාකුශල විපාක වශයෙන්) අර්ථ සාධනය කරන (පල දෙවන) සත්වන ජවන චේතනාව වනාහි 'උපපජ්ජ වේදනීය කම්ම' නම්; එය අනතුරු අත්බව්හිදී විපාක දෙයි; එසේ නොහැකි වුවහොත් කී නයින්ම අහෝසිකම්ම නම් වේ. (පළමුවන, සත්වන ජවනයන්) අතර වූ ජවන චේතනා පස 'අපරාපරිය වේදනීය කම්ම' නම්; එය අනාගතයෙහි කවරදාක හෝ අවසර ලබාද එවිට විපාක දෙයි; සංසාර ප්‍රවෘත්තිය යම් තාක් පවතීද ඒ තාක් මෙය අහෝසිකම්ම නම් නොවේ.

යග්ගරුකය, යබ්බහුලය, යදාසන්නය, කටත්තාවාපනයයි අනෙකුදු සිවු වැදෑරුම් කර්මයෙක් වේ. එහි කුශල හෝ වේවා, අකුශල හෝ වේවා, ගරුකාගරුක කර්මයන් අතුරෙන් ගරුක වූ මාතෘඝාතාදී අකුශල කර්මයක් හෝ, (ප්‍රථමධ්‍යානාදී) මහද්ගත කුශල කර්මයක් හෝ වෙතොත්, එයම පළමුව විපාක දෙයි. එසේම බහුලාබහුල කර්මයන් අතුරෙන් බහුල වශයෙන් කරන ලද සුශීලතා හෝ දුඃශීලතාදී කර්මයක් වෙතොත්, එයම ප්‍රථමයෙන් විපාක දෙයි. යදාසන්න නම්, මරණාසන්න කාලයෙහිදී සිහි කළ කර්මයයි; මරණාසන්නයෙහි සිටියකු යම් කර්මයක් සිහි කිරීමට හැකි වෙතොත්, හේ තෙමේ එම කර්මයෙන්ම උපත ලබයි. මේ තුන හැර නැවත නැවත පුරුදු කළ කර්මයක් වෙතොත්, එය 'කටත්තාවාපන කම්ම' නම්වේ; පළමු කී ත්‍රිවිධ කර්මය නැති කල්හි, එය ප්‍රතිසන්ධිය තමා වෙත ඇදගනියි.

ජනකය, උපත්ථම්භකය, උපපීළකය, උපඝාතකයයි තවද සිවුවැදෑරුම් කර්මයෙක් වේ. එහි, ජනක කර්මය කුශල මෙන්ම අකුශලද වේ, එය ප්‍රතිසන්ධි, ප්‍රවෘත්ති (පිළිසිඳීම, හා පැවැත්ම) යන දෙකෙහිදීම රූප-අරූප විපාක සමූහය උපදවයි. උපත්ථම්භක කර්මය වනාහි තෙමේ විපාක ඉපදවීමට නොසමත් වේ; අනෙක් කර්මයක් විසින් දෙන ලද ප්‍රතිසන්ධියෙක්හිදී (කුශල, අකුශල) විපාකයන් විඳුවන කල එසේ උපදින සුව-දුක්වලට උපස්ථම්භ වේ; එසේම දිගුකලක් පවත්වයි. උපපීළක කර්මය අනෙක් කර්මයක් විසින් දෙන ලද ප්‍රතිසන්ධියෙක්හිදී (කුශලාකුශල කර්මයන්) විපාක දෙන කල එසේ උපදනා සුවදුක් අඩු කරයි, බාධා කරයි, දිගු පැවැත්මට ඉඩ නොදෙයි. උපඝාතක කර්මය වනාහි තෙමේ කුශල හෝ අකුශල වූයේ (අකුශල හෝ කුශල වූ) අනෙක් දුර්වල කර්මයක් නසා එහි විපාක වලක්වා තමාගේ විපාකය සඳහා ඉඩ ලබාගනී; මෙසේ ඉඩ ලබාගත් කල එම උපඝාතක කර්මයෙහි විපාක උපදනේ නම් වේ.

---

a. පටිසම්භිදා පාළි, කම්ම කථා

මෙසේ මේ දොළොස් ආකාර කර්මයන් පිළිබඳ කර්මාන්තරය හා විපාකාන්තරය (කර්ම - විපාක භේදය) බුදුවරයන්ගේම කර්ම-විපාක ඥානයට යථාතත්‍ත්වයෙන් ප්‍රකට වේ; (එම ඥානය) ශ්‍රාවකයනට සාධාරණ (පොදු) නොවේ. විදර්ශනා වඩන්නහු විසින් වනාහි කර්මාන්තර විපාකාන්තරයන් ඒකදේශ වශයෙන් දැනගත යුතුය. එහෙයින් කර්මය පිළිබඳ මේ ප්‍රභේදය මුඛ (මාතෘකා) මාත්‍ර දැක්වීමක් වශයෙන් ප්‍රකාශ කරන ලදී.

මෙසේ මේ දොළොස් ආකාර වූ කර්මය, කර්ම වෘත්තයෙහි බහා එක් විදර්ශකයෙක් තෙමේ කර්ම වෘත්ත විපාක වෘත්ත වශයෙන් නාම-රූප දෙක පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහය කෙරේ; හේ තෙමේ මෙසේ කර්ම වෘත්ත විපාක වෘත්ත වශයෙන් ප්‍රත්‍යය වීමෙන් නාම-රූපයන්ගේ පැවැත්ම දැක, ''මෙය දැන් මෙසේ නම්, අතීත කාලයෙහිද කර්ම වෘත්ත විපාක වෘත්ත වශයෙන් (නාම-රූප දෙක) පැවැතියේය, අනාගතයෙහිද කර්ම වෘත්ත, විපාක වෘත්ත වශයෙන් ප්‍රත්‍යය වීමෙන් එය පවතිනු ඇත'' යනුවෙන් මෙසේ කර්මය මෙන්ම කර්ම විපාකයද, කර්ම වෘත්තය මෙන්ම විපාක වෘත්තයද, කර්ම ප්‍රවෘත්තය මෙන්ම විපාක ප්‍රවෘත්තයද කර්ම පරම්පරාව මෙන්ම විපාක පරම්පරාවද, ක්‍රියාව මෙන්ම ක්‍රියා ඵලයද,

කම්මා විපාකා වත්තන්ති විපාකො කම්මසම්භවො
තස්මා පුනබ්භවො හොති, එවං ලොකො පවත්තති

කර්මය කෙරෙන් විපාකයෝ පවත්නාහුය, විපාකය කර්මය සම්භව කොට ඇත්තේය, එහෙයින් පුනර්භවය සිදුවේ. මෙසේ මේ සත්ත්වලොකය පවතී'' යනුවෙන් මනා සේ දකියි.

මෙසේ දක්නා ඔහුට පූර්වාන්තාදිය අරබයා ''අහොසිං නුඛො අහං'' (මම් පෙර වීම් දෝ) යනාදී නයින් යම් සොළොස් ආකාර වූ විචිකිච්ඡාවක් කියන ලද්දේද, ඒ සියල්ල ප්‍රහීණ වේ. සියලු භව - යෝනි - ගති - ස්ථිති - සත්ත්වාවාසයන්හි හේතු-ඵල වශයෙන් පවත්නා නාම-රූප මාත්‍රයම වැටහේ. හේ තෙමේ, කාරණයට (හේතුවට) ඉහළින් කාරකයකු (කරවන්නකු) හෝ විපාක ප්‍රවෘත්තියට ඉහළින් විපාක විඳින්නකු හෝ නොදකී; කාරණය (හේතුව) ඇති කල කාරකයෙකැ'යිද, විපාක ප්‍රවෘත්තිය ඇති කල විඳින්නෙකැ'යිද යනුවෙන් හුදෙක් (පරමාර්ථ වශයෙන් නොව) නාම මාත්‍ර වශයෙන් පණ්ඩිතයන් ව්‍යවහාර කෙරෙති'යි මෙසේ ඔහු විසින් සම්‍යක් ප්‍රඥාවෙන් මනාකොට දක්නා ලද්දේ වේ.

එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

කම්මස්ස කාරකො නත්ථි විපාකස්ස ච වෙදකො,
සුද්ධ ධම්මා පවත්තන්ති එවෙතං සම්මදස්සනං
එවං කම්මෙ විපාකෙ ච වත්තමානෙ සහෙතුකෙ,

බීජ රුක්ඛාදිකානංව පුබ්බා කොටි න ඤායතෙ
අනාගතෙපි සංසාරෙ අප්පවත්තං නදිස්සති,
එතමත්ථමනඤ්ඤාය තිත්ථියා අසයංවසී,
සත්තසඤ්ඤං ගහෙත්වාන සස්සතුච්ඡෙද දස්සිනො,
ද්වාසට්ඨි දිට්ඨිං ගණ්හන්ති අඤ්ඤමඤ්ඤං විරොධිතා,
දිට්ඨිබන්ධනබද්ධා තෙ තණ්හාසොතෙන වුය්හරෙ,
තණ්හා සොතෙන වුය්හන්තා - න තෙ දුක්ඛා පමුච්චරෙ
එවමෙතං අභිඤ්ඤාය භික්ඛු බුද්ධස්ස සාවකො
ගම්භීරං නිපුණං සුඤ්ඤං පච්චයං පටිවිජ්ඣති
කම්මං නත්ථි විපාකම්හි පාකො කම්මෙ න විජ්ජති
අඤ්ඤමඤ්ඤං උභො සුඤ්ඤා නච කම්මං විනා ඵලං
යථා න සූරියෙ අග්ගි න මණිම්හි න ගොමයෙ,
න තෙසං බහි තෙ අත්ථි සම්භාරෙහි ච ජායති.
තථා න අන්තො කම්මස්ස විපාකො උපලබ්භති
බහිද්ධාපි න කම්මස්ස න කම්මං තත්ථ විජ්ජති
ඵලෙන සුඤ්ඤකං කම්මං ඵලං කම්මෙ න විජ්ජති
කම්මඤ්ච ඛො උපාදාය තතො නිබ්බත්තතී ඵලං
න හෙත්ථ දෙවො න බ්‍රහ්මා සංසාරස්සත්ථි කාරකො.
සුද්ධ-ධම්මා පවත්තන්ති හෙතුසංසාර පච්චයා'ති

කර්මය කරන්නෙක් නැත, විපාකය විඳින්නෙක් ද නැත. ධර්මයෝ හුදකලාව පවත්නාහුය; සම්‍යග්දර්ශනය මේ මැයි හේතු සහිත වූ කර්මය මෙන්ම විපාකයද මෙසේ පවත්නා කල්හි, බීජ-වෘක්ෂ ආදියෙහි මෙන් මුල් ඉමක් (ආරම්භයක්) නොපැනේ.

මතු සංසාරයෙහිද නොපැවැත්මක් (අවසානයක්) ද නොපැනේ; ආත්මදමනයෙන් තොර අන්තොටුවෝ මේ කරුණ නොදන, 'සත්වයෙක' යන සංඥාව ගෙන, ශාස්වත - උච්ඡේදදෘෂ්ටි ඇත්තාහු, එකිනෙකට විරෝධ වූ දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන් ගනිති.

දෘෂ්ටි බන්ධනයෙන් බැඳුණු ඔවුහු තෘෂ්ණා නමැති සැඩපහරින් පැහැර ගෙනයනු ලබති. තෘෂ්ණා ශ්‍රෝතසින් පැහැර ගෙනයනු ලබන්නාහු (සසර) දුකින් නොමිදෙති.

මේ කරුණ මෙසේ මනා කොට දැන, බුද්ධ ශ්‍රාවක වූ භික්ෂු තෙමේ ගැඹුරු වූ, නියත වූ ශූන්‍ය වූ ප්‍රත්‍යය (හේතුව) විනිවිද දකියි.

විපාකයෙහි කර්මයෙක් නැත, කර්මය තුළද විපාකයෙක් නැත; මේ දෙක එකිනෙකින් ශූන්‍ය (හුදකලා) වේ, එහෙත් කර්මයෙන් තොර ඵලයෙක් (විපාකයෙක්) ද නැත.

යම්සේ හිරු, මැණික් හෝ (දර පිණිස ගනු ලබන) ගොමරිටි තුළ හෝ මතුපිට හෝ ගිනි නොමැත්තේද, එහෙත් අවශ්‍ය ද්‍රව්‍යයන් එක් වීමෙන් ගිනි හටගන්නේ වේද, එසේම කර්මය ඇතුළත හෝ පිටත, විපාකයෙක් නොලැබේ. එහි (විපාකය) තුළ කර්මයෙක් ද විද්‍යමාන නොවේ.

කර්මය ඵලයෙන් ශුන්‍යවේ. කර්මය තුළ ඵලය (විපාකය) ද විද්‍යමාන නොවේ. එතෙකුදු වූවත්, කර්මය හේතු කොට ගෙන ඵලය (විපාකය) උපදනේය.

මෙහිලා සංසාරය ඇති කරවන දෙවියෙක් හෝ බඹෙක් නැත්තේය, එකිනෙකින් අමිශ්‍ර වූ ස්වභාවයෝ හේතු සමූහයන් ප්‍රත්‍යය කොට ගෙන පවත්නාහුය.

මේ ආකාරයෙන් කම්මවට්ට-විපාක වට්ට වශයෙන් නාම රූපයන් පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහය කොට කාලත්‍රයයෙහි විචිකිච්ඡාව දුරු කළ ඒ යෝගාවචරයා විසින් සියලුම අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්න ධර්මයෝ ච්‍යුති - ප්‍රතිසන්ධි වශයෙන් දන්නා ලද්දාහු වෙති. ඔහුගේ එම ඥානය 'ඤාත පරිඤ්ඤා' නම් වේ.

හේ තෙමේ මේ ආකාරයෙන් මනා කොට අවබෝධ කරයිඃ- අතීත භවයෙහි කර්මප්‍රත්‍යයෙන් උපන් යම් ස්කන්ධයෙක් වීනම්, ඒ සියල්ල එහිදීම නිරුද්ධ විය. අතීත කර්මප්‍රත්‍යයෙන් මේ භවයෙහි උපන් ස්කන්ධය එයින් අන්‍යතර වේ. අතීත භවයෙන් මේ භවයට ආ කිසිදු ධර්මයක් (ස්කන්ධයක්) නැත. කර්ම ප්‍රත්‍යයෙන් මේ භවයෙහි උපන් ස්කන්ධයෝද (මෙහිදීම) නිරුද්ධ වෙති. පුනර්භවයෙහිදී පහළ වන ස්කන්ධයෝ අන්‍යතරයෝය. මේ භවයෙන් පුනර්භවයට කිසිදු ධර්මයක් (ස්කන්ධයක්) නොයන්නේය, එතෙකුදුවූවත්, යම්සේ ආචාර්යවරයාගේ මුඛයෙන් හදාරවන ලද දෙය ශිෂ්‍යයාගේ මුඛයට නොපිවිසෙතත්, ඒ හේතුවෙන් ඔහුගේ (ශිෂ්‍යයාගේ) මුඛයෙහි (එසේ) හදාරවන ලද දෙය නොපවත්නේ නොවේද, (පවත්නේමැයි) තවද, යම්සේ දූතයා විසින් බොන ලද මන්ත්‍රෝදකය රෝගියාගේ උදරයට නොපිවිසෙතත්, ඒ හේතුවෙන් ඔහුගේ රෝගය නොසන්සිඳෙනුයේ නොවේද, (සන්සිඳේමැයි), තවද යම්සේ මුහුණෙහි කරන ලද අලංකරණය කැඩපත් ආදියතුළ වූ මුඛච්ඡාවට නොපිවිසෙතත්, ඒ හේතුවෙන් කැඩපත් ආදිය තුළ අලංකරණය නොදිස්වනුයේ නොවේද, (දිස් වේමැයි), තවද, යම්සේ එක් පහන් වැටියෙක ඇති පහන්සිළුව අන් පහන් වැටියකට සංක්‍රමණය නොවෙතත්, එම හේතුවෙන් එහි (අනෙක් වැටියෙහි) සිළුවක් නො-උපදිනුයේ නොවේද (උපදීමයි), එසේම අතීත භවයෙන් මේ භවයට හෝ මේ භවයෙන් පුනර්භවයට හෝ කිසිඳු (නාමරූප) ධර්මයක් සංක්‍රමණය නොවෙතත්, අතීත භවයෙහි වූ ඛන්ධ-ආයතනධාතූන් ප්‍රත්‍යය වීමෙන් මේ භවයෙහි

හෝ මේ භවයට අයත් ඛන්‍ධ - ආයතන - ධාතූන් ප්‍රත්‍යය වීමෙන් පුනර්භවයෙහි හෝ ඛන්‍ධ - ආයතන - ධාතූහු නො-උපදනාහු නොවෙති.

යථෙව චක්ඛු විඤ්ඤාණං මනොධාතු අනන්තරං
නචෙව ආගතං නාපි න නිබ්බත්තං අනන්තරං
තථෙව පටිසන්‍ධිම්හි වත්තතෙ චිත්තසන්තති
පුරිමං භිජ්ජති චිත්තං පච්ඡිමං ජායතී තතො
තෙසං අන්තරිකා නත්‍ථි වීචි තෙන නවිජ්ජති
න චිතො ගච්ඡති කිඤ්චි පටිසන්‍ධි ච ජායතී'ති

යම්සේ මනෝධාතුවට අනතුරුව එන චක්ඛු විඤ්ඤාණය එම මනෝධාතුවෙන් හෝ එයට අනතුරුව හෝ නො-උපදනේ නොවේද,

එසේම ප්‍රතිසන්‍ධියෙහිදී චිත්ත පරම්පරාව පවතී, ප්‍රථම (ච්‍යුති) චිත්තය බිඳෙයි. ඉක්බිති පශ්චිම (ප්‍රතිසන්‍ධි) චිත්තය උපදියි.

එම ච්‍යුති හා ප්‍රතිසන්‍ධි චිත්තයන්ගේ අතරක් නැත, එහෙයින් (ඒ දෙකෙහි) කඩවීමෙක් විද්‍යමාන නොවේ; මෙතැනින් කිසිවක් නොයතත් එහි ප්‍රතිසන්‍ධිය සිදු වේ.

මෙසේ ච්‍යුති-ප්‍රතිසන්‍ධි වශයෙන් සියලු (නාම-රූප) ස්වභාවයන් දැනගත් ඔහුට සියලු ආකාරයෙන්ම එම නාම-රූපයන් පිළිබඳ ප්‍රත්‍යයන් විනිශ්චය කිරීමේ ඥානය තිර බවට පත්වේ; සොළොස් ආකාර වූ සැකය වඩාත් පහසුවෙන් ප්‍රහීණ කළ හැකි වේ. එමතුදු නොවේ, 'සත්‍ථරි කඞ්ඛති'' (ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක උපදවයි) ආදී නයින් පවත්නා අට වැදෑරුම් සැකයද ප්‍රහීණ වේමය. දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීහු ක්‍ෂය වී යති.

මෙසේ නොයෙක් ආකාරයෙන් නාම-රූපයන් පිළිබඳ ප්‍රත්‍යය පරිග්‍රහය හේතුකොට ගෙන කාලත්‍රය විෂයයෙහි සැකය දුරු කොට සිටි ඥානය 'කඞ්ඛාවිතරණ විසුද්ධි'යයි දතයුතුය, 'ධම්මට්ඨිති ඤාණ'යයිද, 'යථාභූත ඤාණ'යයිද 'සම්මා දස්සන'යයිද මෙයටම අධිවචන (පර්යාය) වේ. කියන ලදමැයිඃ ''අවිජ්ජා පච්චයා සඞ්ඛාරා පච්චයසමුප්පන්නා; උභොපෙතෙ ධම්මා පච්චය සමුප්පන්නා''[a] (අවිද්‍යාව ප්‍රත්‍යය කොට උපන් සංඛාරයෝ ප්‍රත්‍යය සමුත්පන්න (ප්‍රත්‍යයයෙන් හටගත්තාහු) වෙති, මෙකී අවිජ්ජා-සඞ්ඛාර යන දෙ-ආකාරවූම ධර්මයෝ ප්‍රත්‍යයසමුත්පන්න වෙති'යි යනුවෙන් ප්‍රත්‍යය-පරිග්‍රහ විෂයයෙහි ප්‍රඥාව 'ධම්මට්ඨිති ඤාණ' නම්.

අනිත්‍යවශයෙන් මෙනෙහි කරනුයේ කවර ධර්මයන් තත්වාකාරයෙන් දනීද? දකීද? සම්‍යග්දර්ශනය කෙසේ සිද්ධවේද? එම පිළිවෙළින් සියලු සංඛාරයෝ අනිත්‍ය වශයෙන් කෙසේ මනාකොට දක්නාලද්දාහු වෙත්ද? කොතැනෙක්හි ඔහුගේ සැකය දුරු වේද? දුඃඛ

a. පට්ඨාන පාළි, ඤාණකථා

වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ කවර ධර්මයන් තත්වාකාරයෙන් දනීද? දකීද? -පෙ- කොතැනෙක්හි සැකය දුරුවේද?

අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනුයේ (නාම-රූප) නිමිත්ත තතු ලෙසින් දනියි. දකියි, එහෙයින් එය 'සම්මාදස්සන' යයි කියනු ලැබේ. මෙසේ මෙම පිළිවෙළින් සියලු සංඛාරයෝ අනිත්‍ය වශයෙන් මනාකොට දන්නා ලද්දාහු වෙති; ඔහුගේ සැකය දුරුවේ; දුඃඛ වශයෙන් මෙනෙහි කරනුයේ (ස්කන්ධයන්ගේ) පැවැත්ම තතු ලෙස -පෙ- අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ නිමිත්ත, පවත්ත (නිමිත්ත හා පැවැත්ම) යන දෙකම තතුලෙසින් දනියි, දකියි. එහෙයින් (ඔහුගේ එම දර්ශනය) 'සම්මා දස්සන' යයි කියනු ලැබේ. මෙසේ මෙම පිළිවෙළින් සියලු ධර්මයෝ අනාත්ම වශයෙන් මනා කොට දක්නා ලද්දාහු වෙති; මෙහි සැකය ප්‍රහීණ වේ.

'යථාභූතඤාණ', 'සම්මාදස්සන', 'කංඛාවිතරණ' යනුවෙන් වහරනු ලබන මේ ධර්මයෝ එකිනෙකට අසමාන අර්ථ සහිතව විවිධාක්ෂර සහිත වූවාහුද? නැතහොත්, සමානාර්ථ සහිතව හුදෙක් අක්ෂරයෙන්ම විවිධාකාර වූවාහුද? 'යථාභූත ඤාණ', 'සම්මා දස්සන', 'කංඛා විතරණ' යන මේ ධර්මයෝ හුදෙක් අක්ෂරයෙන්ම විවිධාකාර වෙති, එහෙත් අර්ථයෙන් සමාන වෙති.

මෙම ඤාණයෙන් සමන්විත විදර්ශක වූ යෝගාවචර තෙමේ බුද්ධශාසනයෙහි ආස්වාදය ලත්, ප්‍රතිෂ්ඨාව (පිහිට) ලත්, නියත ගති සහිතවූ "චූල්ලසෝතාපන්න" නම්වේ.

තස්මා භික්ඛු සදාසතො නාමරූපස්ස සබ්බසො
පච්චයෙ පරිගණ්හෙය්‍ය කඞ්ඛාවිතරණත්ථිකො, ති.

එහෙයින්, භික්ෂු තෙමේ නිරන්තරයෙන් සිහි ඇතිව, සැකය දුරුකිරීම පිණිස නාමරූප දෙකෙහි ප්‍රත්‍යයයන් සකලාකාරයෙන් පරිග්‍රහ (විනිශ්චය) කරන්නේය.

සාධුජන ප්‍රමෝදය පිණිස කරන ලද විශුද්ධි මාර්ගයෙහි,
පඤ්ඤා භාවනාධිකාරයෙහි කඞ්ඛාවිතරණ විසුද්ධි නිද්දේස නම්වූ
එකුන්විසිවන පරිච්ඡේදය නිමියේයි.

# මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධි නිද්දේසය

'මේ (ආර්ය) මාර්ගයයි, මේ (ආර්ය) මාර්ගය නොවේ' යනුවෙන් මෙසේ මග- නොමග දැන සිටි ඥානය මග්ගා-මග්ග ඤාණදස්සන නම් වේ. එය සම්පාදනය කරනු කැමැති යෝගාවචරයා විසින් පළමුකොට කලාප සම්මර්ශනයයි කියනු ලබන නය විදර්ශනාව වැඩීම පිණිස යෝග කටයුතුය; කවර හෙයින්ද යත්, විදර්ශනා ආරම්භ කළ යෝගාවචරයාහට 'ඕභාස' ආදිය පහළ වූ කල මග්ගාමග්ග ඤාණය පහළ වන හෙයිනි. විදර්ශනා ආරම්භ කළ යෝගාවචරයාහට වනාහි ඕභාස ආදිය පහළවූ කල මග්ගාමග්ග ඤාණය සිද්ධ වේ. විදර්ශනාවටද වනාහි කලාප සන්මර්ශනය මුල්වේ; එහෙයින් මෙය කඞ්ඛාවිතරණයට අනතුරුව දක්වන ලදි. තවද, යම් හෙයිකින් තීරණපරිඤ්ඤාව පවත්නා කල මග්ගාමග්ග ඤාණය උපදීද, තීරණ පරිඤ්ඤාවද ඤාත පරිඤ්ඤාවට අනතුරුව උපදීද, එහෙයින් එම මග්ගාමග්ගඤාණවිසුද්ධිය සම්පාදනය කරනු කැමැත්තහු විසින් පළමු කොට කලාප සන්මර්ශනය පිණිස යෝග කටයුතුය.

මේ එය පිළිබඳ විනිශ්චයයි:- ඤාත පරිඤ්ඤාය, තීරණපරිඤ්ඤාය, පහානපරිඤ්ඤායයි ලෞකික පරිඤ්ඤා තුනෙකි. එය සඳහා කියන ලදි: "අභිඤ්ඤා පඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං, පරිඤ්ඤාපඤ්ඤා තීරණට්ඨෙ ඤාණං, පහානපඤ්ඤා පරිච්චාගට්ඨෙඤාණං[a] (අභිඤ්ඤාපඤ්ඤා යනු, (ස්කන්ධ, ධාතු, ආයතනාදිය ස්වලක්‍ෂණ වශයෙන්) හැඳිනගැනීමේ ඥානයයි; පරිඤ්ඤා පඤ්ඤා යනු, රූපාදිය පිළිබඳව අනිත්‍යාදී ස්වලක්‍ෂණයන් තීරණය කිරීමේ ඤාණයයි; පහාන පඤ්ඤා යනු, එම ස්කන්ධ ධාතු ආයතනයන් පිළිබඳ (නිත්‍ය සංඥා) ආදිය අත්හැරීමේ ඥානයයි).

එහි විනාශ වීම ලක්‍ෂණ කොට ඇත්තේ රූපයයි, විඳනය ලක්‍ෂණ කොට ඇත්තේ වේදනාවයි යනුවෙන් මෙසේ ඒ ඒ ධර්මයන් පිළිබඳ ඒ ඒ විශෙෂ ලක්‍ෂණයන් සැලකීම් වශයෙන් පවත්නා ප්‍රඥාව 'ඤාතපරිඤ්ඤා' නම් වේ;

'රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යයය', යන ආදී වශයෙන් එම ධර්මයන් පිළිබඳ සාමාන්‍ය ලක්‍ෂණයන් අරබයා පවත්නා ලක්‍ෂණාරම්මණික වූ විදර්ශනා ප්‍රඥාව තීරණ පරිඤ්ඤා' නම් වේ; එම ධර්මයන්ම කෙරෙහි නිත්‍ය සංඥාදීය අත් හැරීම් වශයෙන් පවත්නා ලක්ඛණාරම්මණික වූ විදර්ශනා ප්‍රඥාව 'පහානපරිඤ්ඤා' නම් වේ.

එහි සංඛාරයන් පිරිසිඳීමෙහි පටන් ප්‍රත්‍යය පරිග්‍රහය තෙක් ඤාත පරිඤ්ඤාවට අයත් භූමියයි; මෙදෑතුරෙහි (නාමරූප) ධර්මයන් පිළිබඳ

---

a. පට්ඨාන පාළි, මාතිකා

තමතමාට අයත් (අසාමාන්‍ය) ලක්‍ෂණ ප්‍රතිවේධයෙහි ආධිපත්‍යය වේ. (චක්ඛු දසකාදී) කලාප සම්මර්ශනයෙහි පටන් උදයව්‍යය අනුසාරයෙන් දැකීම තෙක් තීරණපරිඥ්ඤාවට අයත් භූමියයි; මෙදැතුරෙහි සාමාන්‍ය ලක්‍ෂණ ප්‍රතිවේධයෙහි ආධිපත්‍යය වේ. භංගානුපස්සනාවෙහි පටන් කොට පහාන පරිඥ්ඤාවට අයත් භූමියයි. එතැන් පටන්, අනිත්‍ය වශයෙන් බලනුයේ නිත්‍යසංඥාව (නිත්‍යය ශාස්වතය යන හැඟීම) හරියි; දුඃඛ වශයෙන් බලනුයේ සුඛ සංඥාව -පෙ- අනාත්ම වශයෙන් බලනුයේ ආත්ම සංඥාව -පෙ- (සංස්කාරයන් කෙරෙහි) කළකිරුණේ නන්දිරාගය (සප්‍රීතිකරාගය) -පෙ- නො-ඇලෙනුයේ රාගය -පෙ- නිරෝධය අනුව බලනුයේ (සමුදය හෙවත්) තෘෂ්ණාව -පෙ- (සංස්කාරයන්) බැහැර කරනුයේ නැවත ගැනීම (ප්‍රතිසන්ධිය) හරියි; යනුවෙන් මෙසේ නිත්‍යසංඥා ආදිය ප්‍රහීණ කරවන අනුපස්සනා සතෙහි ආධිපත්‍යය වේ.

මෙසේ මේ යෝගියා විසින් සංඛාරයන් පිරිසිඳීම මෙන්ම ප්‍රත්‍යයන් විනිශ්චය කිරීමද සාධනය කරන ලද හෙයින් මේ පරිඥ්ඤා තුන අතුරෙන් ඤාත පරිඥ්ඤාවම අවබෝධ කරන ලද්දේ වේ. ඉතිරි දෙකද අවබෝධ කළයුතු වේ. එහෙයින් කියන ලදිඃ- ''යම් හෙයකින් තීරණ පරිඥ්ඤාව පවත්නා කල්හි මග්ගාමග්ග ඤාණය උපදනේද, එම තීරණ පරිඥ්ඤාවද ඤාතපරිඥ්ඤාවට අනතුරුව උපදනේද, එහෙයින්ද ඒ මග්ගාමග්ග ඤාණවිසුද්ධිය සම්පාදනය කරනු කැමැත්තහු විසින් පළමු කොට කලාප සම්මර්ශනයෙහි යෝග කටයුතු වේ''[a] කෙසේද යත්ඃ-

එම කලාප සම්මර්ශනය පිළිබඳ පෙළ මෙසේයිඃ- ''අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න (නාමරූප) ධර්මයන් සංක්‍ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන-ඥානයයි, අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ යම්කිසි රූපයක් වේද, අභ්‍යන්තර හෝ වේවා, -පෙ- දූරෙහි හෝ සමීපයෙහි හෝ වේවා, ඒ සියලු රූපය අනිත්‍ය වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, මේ එක් සම්මර්ශනයෙකි; දුඃඛ වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, මේ එක් සම්මර්ශනයෙකි; අනාත්ම වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, මේ තවද එක් සම්මර්ශනයෙකි; යම්කිසි වේදනාවක් -පෙ-, යම්කිසි -පෙ- විඥ්ඤාණයක් -පෙ- අනාත්ම වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, මෙද එක් සම්මර්ශනයෙකි; අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ යම්කිසි චක්ඛුවක් -පෙ- ජරාමරණයක් අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කරයි, මේ එක් සම්මර්ශනයෙකි; දුඃඛ වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් ව්‍යවස්ථාපනය කරයි මෙද එක් සම්මර්ශනයෙකි.

''අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ යම් රූපයක් වේද, එය ක්‍ෂය වීමේ අර්ථයෙන් අනිත්‍ය වේ. භය වීමේ අර්ථයෙන් දුඃඛ වේ, අසාර

a. පටිසම්භිදා පාළි, ඤාණ කථා

වීමේ අර්ථයෙන් අනාත්ම වේ යනුවෙන් මෙසේ සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශනඥානයයි. (අතීත අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ) වේදනාවක් -පෙ- විඤ්ඤාණයක් වේද, චක්ඛුවක් පෙ- ජරාමරණයක් වේද, එය ක්ෂය වීමේ -පෙ- අසාර වීමේ අර්ථයෙන් අනාත්ම වේ යනුවෙන් -පෙ- ව්‍යවස්ථාපන කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි.

"අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ යම් රූපයක් වේද, එය අනිත්‍යය, සංඛත (ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දේ)ය. පටිච්චසමුප්පන (හේතුවක් නිසා හටගන්නේ)ය, ක්ෂය වන සුලුය, ව්‍යය වන සුලුය, නැති වන සුලුය, නවතින සුලුයයි මෙසේ සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශනඥානයයි. වේදනාවක් -පෙ- විඤ්ඤාණයක් වේද, -පෙ- චක්ඛුවක් -පෙ- ජරාමරණයක් වේද, එය අනිත්‍යය -පෙ- නවතින සුලුයයි මෙසේ ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි.

"ජාතිය (ඉපැදීම) හේතුකොට ගෙන ජරාමරණ වේ, ජාතිය නැති කල ජරාමරණද නැතැ'යි සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශනඥානයයි; අතීත කාලයෙහිද, අනාගත කාලයෙහිද ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ. ජාතිය නැති කල ජරාමරණද නැතැ'යි ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි. භවප්‍රත්‍යයෙන් ජාතිය වේ. භවය නැති කල -පෙ- අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර හටගනියි, අවිද්‍යාව නැති කල සංස්කාරද නැතැ'යි සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි. අතීත කාලයෙහිද අනාගත කාලයෙහිද අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාර හටගනියි, අවිද්‍යාව නැතිකල සංස්කාරද නැතැ'යි සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි. එය (සම්මර්ශන ඥානය) දන්නා ලදැ'යි යන අර්ථයෙන් 'ඤාණ' නම්, වෙසෙසින් දනිති'යි යන අර්ථයෙන් 'පඤ්ඤා' නම්; එහෙයින් කියනු ලැබේ, 'අතීත අනාගත ප්‍රත්‍යුත්පන්න වූ ධර්මයන් සංක්ෂිප්ත කොට ව්‍යවස්ථාපනය කිරීමේ ප්‍රඥාව සම්මර්ශන ඥානයයි'.

"මෙහිදී 'චක්ඛුං -පෙ- ජරාමරණං' යන ආදී මේ පෙය්‍යාලයෙන් (සංක්ෂේපනයෙන්) ද්වාරාරම්මණයන් හා සමග සංදොරින් පවත්නා ධර්මයෝ, එනම්:- පඤ්චස්කන්ධය, ෂඩ්ද්වාරය, ෂඩ්ආලම්බනය, ෂඩ්විඤ්ඤාණය, ෂඩ් ස්පර්ශය, ෂඩ් වේදනාය, ෂඩ් සංඥාය, ෂඩ් චේතනාය, ෂඩ් තෘෂ්ණාය, ෂඩ් විතර්කය. ෂඩ් විචාරය. ෂඩ් ධාතුය. දශ කසිණය, ද්වාත්‍රිංශත් කොට්ඨාසය, ද්වාදශායතනය, අෂ්ටාදශ ධාතුය, ද්වාවිංශද් ඉන්ද්‍රියය, ධාතුත්‍රයය, භවත්‍රයය, අනෙක් භවත්‍රයය, තවද අනෙක් භවත්‍රයය, චතුර්ධ්‍යානය, අප්පමඤ්ඤා සතරය, ආරුප්ප සමාපත්ති සතරය, පටිච්චසමුප්පාද අංග දොළොසය යන මේ ධර්මරාශිය සංක්ෂිප්ත කරන ලදැයි දතයුතුය.

''කියනලදමැයි අභිඤ්ඤෙය්‍ය නිද්දේසයෙහි, ''මහණෙනි, සියල්ල මනාසේ දතයුතුය, මහණෙනි, මනාසේ දතයුතු සියල්ල යනු කවරේද? මහණෙනි, චක්ඛුප්පසාදය දතයුතුය, -පෙ- රූපා- ලම්බනය - චක්ඛු විඤ්ඤාණය - චක්ඛු සම්ඵස්සය, චක්ඛු සම්ඵස්සය ප්‍රත්‍යය කොට ගෙන උපදනා සුඛ, දුක්ඛ හෝ අදුක්ඛමසුඛ වූ යම් වේදනාවක් ඇතොත්, ඒ සියල්ල දතයුතුය; සොතප්පසාදය -පෙ- ධම්ම සඤ්ඤාය - පෙ- මනො සම්ඵස්සය, එම මනො සම්ඵස්සය ප්‍රත්‍යය කොටගෙන උපදනා සුඛ, දුක්ඛ හෝ අදුක්ඛමසුඛ වූ යම් වේදනාවක් ඇතොත් ඒ සියල්ල දතයුතුය.

''රූපය -පෙ- විඤ්ඤාණය, චක්ඛුය - පෙ- මනොය, රූපය, -පෙ- ධම්මය, චක්ඛු විඤ්ඤාණය, -පෙ- මනො විඤ්ඤාණය, චක්ඛුය -පෙ- මනොය, -පෙ- රූපය, -පෙ- ධම්මය, චක්ඛු විඤ්ඤාණය, -පෙ- මනෝ විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය -පෙ- මනෝ සම්ඵස්සය, චක්ඛු සම්ඵස්ස වේදනාය, -පෙ- මනෝ සම්ඵස්සවේදනාය, රූපසඤ්ඤාය, -පෙ- ධම්මසඤ්ඤාය, රූපසඤ්චේතනාය, -පෙ- ධම්ම සඤ්චේතනාය, රූපතණ්හාය, -පෙ- ධම්මතණ්හාය, රූප විතක්කය, -පෙ- ධම්ම විතක්කය, රූප විචාරය. -පෙ- ධම්මවිචාරය, පඨවීධාතුය, -පෙ- විඤ්ඤාණ ධාතුය, පඨවිකසිණය, -පෙ- විඤ්ඤාණකසිණය, කේසය, -පෙ- මත්ථලුඞ්ගය, චක්ඛායතනය, -පෙ- ධම්මායතනය, චක්ඛුධාතුය, පෙ- මනෝ විඤ්ඤාණ ධාතුය, චක්ඛුන්ද්‍රියය, -පෙ- අඤ්ඤතාවී ඉන්ද්‍රියය, කාමධාතුය, රූප ධාතුය, අරූප ධාතුය, කාමභවය, රූපභවය, අරූප භවය, සඤ්ඤාභවය, අසඤ්ඤාභවය, නෙවසඤ්ඤානාසඤ්ඤා භවය, ඒකවෝකාර භවය, පඤ්චවෝකාරභවය, ප්‍රථමධ්‍යානය, -පෙ- චතුර්ථධ්‍යානය, මෙත්තා චේතනා විමුක්තිය, -පෙ- උපෙක්ඛා චේතනා විමුක්තිය, ආකාසානඤ්චායතන සමාපත්තිය, -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය, අවිජ්ජාය, -පෙ- ජරාමරණය යන මේ සියල්ල දතයුතුය''[a] යනුවෙනි.

ඒ සියල්ල එහි (අභිඤ්ඤා නිද්දේසයෙහි) සවිස්තරව කියන ලද හෙයින් මෙහි පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත කොට දක්වන ලදී. මෙසේ සංක්ෂිප්ත කරන ලද මෙහි ආ යම් ලෝකෝත්තර වූ ධර්ම කොට්ඨාසයක් වෙතොත් එය සම්මර්ශනයට නො-එළඹෙන හෙයින් මේ අධිකාරයෙහිලා නොගතයුතුය. යම් ධර්මයක් සම්මර්ශනයට එළඹේද පහසුවෙන් වැටහේද ඔහු (යෝගාවචරයා) විසින් එම ධර්මය කෙරෙහි සම්මර්ශනය ආරම්භ කළයුතුය.

එහිලා ඛන්ධවශයෙන් වූ ආරම්භක විධාන යෝජනා මෙසේයි:-

''යම්කිසි රූපයක් -පෙ- ඒ සියලු රූපය අනිත්‍ය වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, ඒ එක් සම්මර්ශනයෙකි; දුඃඛ වශයෙන් -පෙ-

a. පටිසම්භිදාමග්ගපාළි, ඤාණකථා

අනාත්ම වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, දුඃඛ වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, එද එක් සම්මර්ශනයෙකි''[a] මෙහි වනාහි ''අයම්පි භික්ඛු යං කිඤ්චි රූපං'' යනුවෙන් මෙසේ අනියම් වශයෙන් දක්වන ලද සියලු රූපස්කන්ධය අතීත ආදි ත්‍රිකය අනුව හා අජ්ඣත්ත ආදී (අජ්ඣත්ත - බහිද්ධා, ඕළාරික - සුඛුම. හීන - පණීත, දූරෙ-සන්තිකේ) ද්වික සතර අනුවද යන මේ එකොළොස් අවකාශ වශයෙන් පිරිසිඳ සියලු රූපය අනිත්‍ය වශයෙන් ව්‍යවස්ථාපනය කරයි, අනිත්‍යයයි සම්මර්ශනය කරයි.

කෙසේද යත්, මතු කියනු ලබන ආකාරයෙහි; කියන ලද මැයිඃ- ''රූපං අතීතානාගත පච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන'' (අතීත වූද අනාගත වූද, ප්‍රත්‍යුත්පන්නවූද රූපය 'ක්‍ෂය වීමේ අර්ත්‍ථයෙන් අනිත්‍ය වේ) යනුවෙනි. එහෙයින් යම් මේ අතීත රූපයක් වීද, එය යම් හෙයකින් අතීත භවයෙහිදීම ක්‍ෂය වීය, මේ භවයට නොපැමිණියේද, එහෙයින් එය ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍ය වේ; යම් අනාගත රූපයක් මතු භවයෙහි උපදනේද, එයද එහිදීම ක්‍ෂය වන්නේය, එයින් මතු එපිට භවයකට නොයන්නේය, එහෙයින් ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍ය වේ; යම් ප්‍රත්‍යුත්පන්න රූපයක් වේද, එයද මෙහිදීම ක්‍ෂය වෙයි, මෙයින් මතු භවයට නොයන්නේය, එහෙයින් ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍ය වේ; යම් අභ්‍යන්තර රූපයක් වේද, එය ඇතුළතදීම ක්‍ෂය වෙයි, පිටතට නොඑන්නේය, එහෙයින් ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍ය වේ; බාහිර වූ යම් රූපයක් වේද -පෙ- ඕළාරික වූ -පෙ- සමීපයෙහි වූ යම් රූපයක් වේද, එය එහිදීම ක්‍ෂය වෙයි, අන් තැනකට නොයන්නේය, එහෙයින් ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍යවේ යනුවෙන් සම්මර්ශනය කරයි. ''අනිච්චං ඛයට්ඨෙන'' (ක්‍ෂයාර්ත්‍ථයෙන් අනිත්‍යයි) යනුවෙන් කියන ලද මේ සියල්ල එක් සම්මර්ශනයෙකි. භේද වශයෙන් වනාහි එකොළොස් ආකාර වේ. තවද ඒ සියලුම රූපස්කන්ධය භයාර්ත්‍ථයෙන් දුඃඛ වේ, භයාර්ත්‍ථයෙහි'යි යනු භය සහිතවූ හෙයිනි, යමක් අනිත්‍ය වේද, එය භය එළවන්නේ වේ, සීහෝපම සූත්‍රයෙහි දෙවියනට මෙනි. මෙසේ මෙයද 'භයාර්ත්‍ථයෙන් දුඃඛ වේ' යනුවෙන් එක් සම්මර්ශනයෙකි, භේද වශයෙන් වනාහි එකොළොස් ආකාර වේ.

යම්සේ දුඃඛ වේද, එසේම ඒ සියල්ලම අසාරාර්ත්‍ථයෙන් අනාත්ම වේ, අසාරාර්ත්‍ථයෙනි'යි යනු, ආත්මය (තමාතුළ) වෙසෙන්නෙකැයිද, කාරකයෙකැ'යි (කරවන්නෙකැ'යි)ද, වේදකයෙකැ'යි (විඳින්නෙකැයි)ද, සංයංවසී (තමා වසඟ කොට ගත්තෙකැයි) ද යනුවෙන් මෙසේ පරිකල්පිත ආත්මසාරයක් නොමැති හෙයින්. 'යමක් අනිත්‍ය වේද, එය දුකෙකි, (ආත්මය තෙමේ) තම පිළිබඳවූම අනිත්‍යතාව හෝ උදය-ව්‍යය පීඩණය

---

a. සං. නි., උපය වග්ග

(ඉපැදීම් වැයවීම් දෙකෙහි පීඩණය) වලක්වනු නොහැකියේ වේ; එය සතු කාරකභාවාදියක් කොයින්ද? එහෙයින් කීහුः-

''රූපං ච හිදං භික්ඛවේ අත්තා අභවිස්ස. නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය''[a] (මහණෙනි, මේ රූපස්කන්ධය ආත්මය වේනම්, මෙය ආබාධ පිණිස නොපවතිනු ඇත) යන ආදියයි. මෙසේ මේ රූපය අසාරාර්ථයෙන් අනාත්මයයි යන මේ ආකාරයෙන් එක් සම්මර්ශනයෙක් වේ; භේද වශයෙන් වනාහි එයද එකොළොස් ආකාර වේ. වේදනා ආදිය විෂයයෙහිද මෙම නයයි.

යමක් වනාහි අනිත්‍ය වේද, යම් හෙයකින් එය නියත වශයෙන්ම සංඛත (සංස්කාර) ආදී භේද (ස්වභාව) ඇත්තේ වේද, එහෙයින් එය පිළිබඳ පර්යාය දක්වනු පිණිස, නැතහොත්, විවිධාකාරයෙන් එහි මනසිකාර (මෙනෙහි කිරීමේ) ක්‍රමය දක්වනු පිණිස ''රූපං අතීත අනාගත පච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පච්චුප්පන්නං පටිච්ච සමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං'' (අතීත, අනාගත, ප්‍රත්‍යුත්පන්න වූ රූපස්කන්ධය අනිත්‍යය, සංඛතය, හේතුවක් නිසා හටගත්තෙකි, ක්‍ෂය වන සුලුය, වැය වන සුලුය, නිරුද්ධ වන සුලුය, විරාගය (සන්සිඳීම) ස්වභාව කොට ඇත්තෙකි) යනුවෙන් නැවතත් පෙළ දක්වන ලදි. ''එස නයො වෙදනාදීසු (වේදනා ආදියෙහිද මෙම නයයි) යනුः-

ඒ යෝගී තෙමේ එම පංචස්කන්ධ විෂයයෙහි අනිත්‍ය-දුඃඛ-අනාත්ම සම්මර්ශනය තිර බවට පත්කර ගනු පිණිස සතළිස් ආකාරයෙකින් පංචස්කන්ධයන් දකිමින් අනුලෝමික ඛන්තිය' ලබයි. භාග්‍යවතුන් වහන්සේ විසින්. ''කවර නම් සතළිස් ආකාරයෙකින් අනුලෝමික ඛන්තිය (ආර්ය මාර්ගානුකූල ක්‍ෂාන්තිය) ලබාද? කවර නම් සතළිස් ආකාරයෙකින් ''සම්මත්ත නියාමයට' (නිවැරදි ආර්ය මාර්ගයට) බසීද'යි යන මෙය විභඞ්ගයෙහි මෙසේ දක්වන ලදිः-

''පංචස්කන්ධයන් අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩ වශයෙන් (ගඩක් වශයෙන්) සල්ල (ශල්‍ය) වශයෙන්, අඝ (විපත්ති) වශයෙන්, ආබාධ වශයෙන්, පර (තමාසතු නොවූ) වශයෙන්, පලෝක (බිඳෙන සුලු) වශයෙන්, අන්තරාය වශයෙන්, උපද්‍රව වශයෙන් භය වශයෙන්, උපසග්ග (වසංගත රෝග) වශයෙන්, චල (සැලෙන සුලු) වශයෙන්, පභංගුර (බිඳෙන සුලු) වශයෙන්, අද්ධුව (අස්ථිර) වශයෙන්, අතාණ (අරක්ෂිත) වශයෙන්, අලේණ (රැකවරණ නැති) වශයෙන්, අසරණ (පිහිටක් නැති) වශයෙන්, රික්ත (හිස්) වශයෙන්, තුච්ඡ (හිස්) වශයෙන්, ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්, ආදීනව වශයෙන්, විපරිණාම ධර්ම වශයෙන්, අසාර වශයෙන්, ව්‍යසනමූල වශයෙන්, වධක වශයෙන්, විභව

---

a. සං. නි. උපයවග්ග

(වැනසෙන සුලු) වශයෙන්, සාශ්‍රව වශයෙන්, සඞ්ඛත (සංස්කාර) වශයෙන්, මාරාමිස (මාරයාට අයත්) වශයෙන්, ජාතිධර්ම වශයෙන්, ජරාධර්ම වශයෙන්. ව්‍යාධිධර්ම වශයෙන්, මරණ ධර්ම වශයෙන්, ශෝක ධර්ම වශයෙන්, පරිදේව ධර්ම වශයෙන්, උපායාස ධර්ම වශයෙන්, සඞ්කිලේසික (කෙලෙසන සුලු) ධර්ම වශයෙන්ද'යි යන සතළිස් ආකාරයෙන් පංචස්කන්ධයන් දකිනුයේ අනුලෝමික ක්‍ෂාන්තිය ලබයි, පංචස්කන්ධයන්ගේ නැවැත්ම නිත්‍යවූ නිර්වාණයයි දකිනුයේ සම්මත නියාමයට (ආර්ය මාර්ගයට) බසියි.'' යන ආදී නයින් අනුලෝමඥානය විග්‍රහ කෙරෙමින් ප්‍රභේද වශයෙන් අනිත්‍යාදී සම්මර්ශනය කියන ලද්දේද, ඒ අනුවද මේ පංචස්කන්ධයන් සම්මර්ශනය කරයි.

කෙසේද යත්:- ඒ (යෝගාවචර) තෙමේ එක් එක් ස්කන්ධයක් අනිත්‍යය අන්තකොට ඇති හෙයින් (අශාස්වත හෙයින්) හා ආදි-අන්ත යන දෙක ඇති හෙයින් අනිත්‍ය වශයෙන්ද, උදය-ව්‍යය යන දෙකින් නිරන්තරයෙන් පෙළෙන හෙයින් හා දුකට වස්තු වූ හෙයින් දුඃඛ වශයෙන්ද. (ආහාර ආදී) ප්‍රත්‍යයයෙන් නිරන්තරයෙන් යැපියයුතු වන හෙයින් හා රෝගයනට මුල් වන හෙයින් රෝග වශයෙන්ද, දුක්ඛතා රුජායෙන් යුක්ත වූ හෙයින් හා කෙලෙස් නමැති අසුචි වැගිරෙන හෙයින්ද, උත්පාද-ජරා-භංග යන මෙයින්ද ඉදිමුම්, පැසවීම් බිඳීම් ස්වභාව ඇති හෙයින් ගණ්ඩ වශයෙන්ද, පීඩා ජනක වන හෙයින්ද, ඇතුළත රිදවන හෙයින් හා දුක සේ බැහැර කළ යුතු වන හෙයින් ශල්‍යයක් වශයෙන්ද, ගැරහිය යුතු වන හෙයින්ද, අවැඩ ගෙන දෙන හෙයින් හා විපතට වස්තු වන හෙයින් අඝ වශයෙන්ද. ස්වෛරී භාවය නැති කරන හෙයින් හා ආබාධයනට වස්තු වන හෙයින් ආබාධ වශයෙන්ද, තමා වශයෙහි නොපැවැත්විය හැකි හෙයින් හා විධානයෙහි හැසිරවිය නොහැකි හෙයින් පර වශයෙන්ද, ව්‍යාධි, ජරා, මරණ යන මෙයින් පලුදුවන හෙයින් පලෝක(බිඳෙන සුලු) වශයෙන්ද, නොයෙක් ව්‍යසනයන් එළවන හෙයින් ඊති (අන්තරාය) වශයෙන්ද, ඇඟවීමක් නැතිවම ඉමහත් අනර්ථයන් ගෙන දෙන හෙයින් හා සියලු උවදුරුවලට වස්තුවන හෙයින් උපද්‍රව වශයෙන්ද, සියලු භයට ආකර වන හෙයින් හා දුක්ඛූපසම (දුක් සමනය කිරීම) යයි කියනු ලබන පරමසුඛයට (නිවණට) ප්‍රතිපක්‍ෂවූ හෙයින් භයවශයෙන්ද, අනේක වූ අනර්ථයන් විසින් ලුහු බඳතාලද හෙයින්ද දෝෂයන්ගෙන් ගැවසීගත් හෙයින් හා පීඩාවක් සෙයින් නො-ඉවසිය හැකි වන හෙයින් උපසග්ග (වසන්ගත රෝග) වශයෙන්ද, ව්‍යාධි, ජරා, මරණ යන මෙයින් හා ලාභ, අලාභ ආදී අෂ්ටලෝක ධර්මයන්ගෙන් සැලෙන හෙයින් චල වශයෙන්ද, උපක්‍රමයෙන් මෙන්ම ස්වභාව සිද්ධ වශයෙන්ද භංගයට යන සුලු හෙයින් පභංගු වශයෙන්ද, කවර අවස්ථාවෙක වුවද ගිලිහී යාහැකි හෙයින් හා ස්ථිර භාවයක් නොමැති හෙයින් අද්ධුව වශයෙන්ද, අනාරක්‍ෂිත භාවයෙන් හා ක්‍ෂේම භාවයක්

නොලද හැකි වන හෙයින් අත්තාණ වශයෙන්ද, සැඟවීගත නොහැකි වන හෙයින් හා සැඟවී සිටිනවුනට පවා රැකවරණ කිසක් නොසැපයෙන හෙයින් අලේණ වශයෙන්ද, ඇසුරු කළවුන්ගේ භය දුරුකළ නොහැකි හෙයින් අසරණ වශයෙන්ද, පෘථග්ජනයන් විසින්) පරිකල්පනය කරන ලද පරිදි ධ්‍රැව-සුභ-සුඛ-අත්තභාවයක් නැති හෙයින් රික්ත වශයෙන්ද, රික්ත (හිස්) භාවය නිසාම, නැතහොත් ලාමක භාවය නිසා තුච්ඡ වශයෙන්ද, ලෝකයෙහි අල්ප (ලාමක) වූ දෙය තුච්ඡ කොට වහරනු ලැබේ, ස්වාමියකු, නිවාසියකු, කාරකයකු (කරවන්නකු), වේදකයකු (විඳින්නකු), අධිට්ඨායකයකු (අධ්‍යක්‍ෂකයකු) නැති හෙයින් ශූන්‍ය වශයෙන්ද, තමාද අස්වාමික භාවාදියෙන් යුක්ත වූ හෙයින් අනාත්ම වශයෙන්ද, පැවැත්ම දුක්සහිත වන හෙයින් හා දුක්ද ආදීනව වන හෙයින් ආදීනව වශයෙන්ද,- නොහොත්, ආදීන (බැගෑ) බව වෙත ළං වෙති'යි. යෙති'යි, පවතිති'යි ආදීනව නම්; මෙය දුගීම්නිසාට අධිවචනයෙකි; ස්කන්ධයෝද කෘපණයෝ(දුගියෝ)ම වෙති'යි - දුගියන් හා සමාන වන හෙයින් ආදීනව වශයෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද යන දෙ-අයුරෙකින් පරිණාමයට යන සුලු හෙයින් විපරිණාම ධර්ම වශයෙන්ද දුබල බැවින් හා හරයක් නැති බැවින් කොටදිඹුලා ශාකය මෙන් පහසුවෙන් කඩා දැමිය හැකි වන හෙයින් අසාර වශයෙන්ද, පවට මුල් වන හෙයින් අසමූලක වශයෙන්ද, මිතුරු වෙසින් සිටින සතුරකු සෙයින් විශ්වාසය කඩ කරන වධකයකු වශයෙන්ද, වැඩීමක් නැති හෙයින් හා විභව (විනාශ)යෙන් හටගත් හෙයින් විභව වශයෙන්ද, ආශ්‍රවයනට පදනම් වන හෙයින් සාශ්‍රව වශයෙන්ද, හේතු ප්‍රත්‍යයෙන් සැකසුණ හෙයින් සංඛත වශයෙන්ද, මෘත්‍යුමාර, ක්ලේශ මාරාදීනට ගොදුරු වන හෙයින් මාරාමිස වශයෙන්ද, ජාති-ජරා-ව්‍යාධි මරණයන් ස්වභාව කොට ඇති හෙයින් ජාති-ජරා-ව්‍යාධි මරණ ස්වභාව වශයෙන්ද, සෝක-පරිදේව-උපායාසයනට හේතුවන හෙයින් සෝක-පරිදේව-උපායාස ස්වභාව වශයෙන්ද, තෘෂ්ණාදෘෂ්ටි- සංක්ලේශයනට විෂයවන ස්වභාව ඇති හෙයින් සංක්ලේශික ස්වභාව වශයෙන්ද'යි මෙසේ ප්‍රභේද වශයෙන් දක්වන ලද අනිත්‍යාදී සම්මර්ශන වශයෙන් සම්මර්ශනය කරයි.

මෙහි අනිත්‍ය වශයෙන්, පලෝක වශයෙන්, චල වශයෙන්, පභඞ්ගු වශයෙන්, අද්ධුව වශයෙන්, විපරිණාමධර්ම වශයෙන්, අසාර වශයෙන්, විභව වශයෙන්, සංඛත වශයෙන්, මරණ ස්වභාව වශයෙන්ද'යි මෙසේ එක් එක් ස්කධයෙක්හි දශයක් දශයක් බැගින් අනිච්චානු පස්සනා පණසක්ද, පරවශයෙන්, රික්ත වශයෙන්, තුච්ඡ වශයෙන්, ශූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන්ද'යි මෙසේ එක් එක් ස්කන්ධයෙක්හි පසක් පසක් බැගින් අනිත්‍යානු පස්සනා විසිපහක්ද, දුඃඛ වශයෙන් රෝග වශයෙන් ආදී වූ ඉතිරි අනුපස්සනා අතුරෙන් එක් එක් ස්කන්ධයෙක්හි පස්විස්සක් පස්විස්සක් බැගින් දුක්ඛානුපස්සනා එක්සිය විසිපහක්ද වේ.

මෙසේ මේ දෙසියක් ආකාරයෙන් අනිත්‍යාදී සම්මර්ශනයෙන් පංචස්කන්ධයන් සම්මර්ශනය කරන මේ යෝගියාහට 'නය විපස්සනා'යයි කියනු ලබන අනිත්‍ය-දුඃඛ-අනාත්ම සම්මර්ශනය තිර බවට යෙයි. මේ වනාහි, පෙළනය අනුව, මෙහි අනිච්චානුපස්සනාදී වශයෙන් සම්මර්ශනාරම්භය පිළිබඳ විධානයයි.

මෙසේ නය විපස්සනා පිණිස යෝග කිරීමෙන් පවා යම් යෝගාවචරයකුහට නයවිපස්සනාව සිද්ධ නොවෙතොත්, ඔහු විසින්:- ''නව ආකාරයෙකින් (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයෝ තියුණු වෙති, උපනූපන් සංස්කාරයන්ගේ ක්ෂයවීම දිකියි, තවද එහිදී මනාසේ ක්‍රියා කරයි, සතතයෙන් ක්‍රියා කරයි, සප්පාය ලෙස ක්‍රියා කරයි, සමාධිය පිළිබඳ නිමිති ගැනීමෙන්ද (ක්‍රියාකරයි), බොජ්ඣංගයන් අනුව පැවැත්මෙන් (ක්‍රියා කරයි), කය හා ජීවිතය පිළිබඳව නිරපේක්ෂතාවට එළඹෙයි, එහිදී නෛෂ්ක්‍රම්‍යයෙන් (කය හා ජීවිතය පිළිබඳ අපේක්ෂාවන්) මැඩලයි, අතරතුර කඩ නොවනසේ (ක්‍රියා කරයි)'' යනුවෙන් මෙසේ කියන ලද නව ආකාරයෙන් ඉන්ද්‍රියයන් තියුණු කොට (ඉහත) පඨවිකසිණ නිද්දේසයෙහි දක්වන ලද නයින් සප්ත-අසත්ප්‍රායයන් දුරු කොට සප්ත සත්ප්‍රායයන් සෙවුමින් වරෙක රූපස්කන්ධයද, වරෙක අරූප ස්කන්ධයන්ද සම්මර්ශනය කළයුතුය.

රූපස්කන්ධය සම්මර්ශනය කෙරෙමින් රූපයෙහි උපත දැකිය යුතුය, ඒ මෙසේයි:- 'මේ රූපස්කන්ධය වනාහි කර්ම ආදී කරුණු සතරෙකින් උපදියි, සියලු සත්වයන්ගේ රූපය උපදින විට, පළමුකොට කර්මයෙන් උපදියි, ප්‍රතිසන්ධි ක්ෂණයෙහිදීම, පළමු කොට ගර්භශායී සත්වයනට, වස්තු, කාය, භාව යන දශක සංඛ්‍යාතවූ සන්තති තුනක් වශයෙන්, රූප තිසක් උපදියි; ඒ රූප තිස ප්‍රතිසන්ධි චිත්තය උපදින කෙණෙහිම උපදියි; උත්පාදක්ෂණයෙහි යම්සේද, ස්ථිති ක්ෂණයෙහි හා භංගක්ෂණයෙහිද එසේය.

එහිදී රූපයෙහි නැවැත්ම ලැසිව සිදුවේ; පරිණාමය මන්දගාමී වේ; චිත්තයෙහි නැවැත්ම වහා සිදු වේ, පරිණාමය යුහුව සිදු වේ. එහෙයින් වදාළහ: ''මහණෙනි, මේ චිත්තය තරම් යුහුව පෙරළෙන අන් කිසිදු ස්වභාවයක් මම නොදක්නෙමි''[a] යනුයි.

රූපය තිබියදීම භවාංග චිත්තය සෙළොස් වරක් ඉපිද නිරුද්ධ වේ. චිත්තයෙහි උත්පාද ක්ෂණයද ස්ථිති ක්ෂණයද, භංගක්ෂණයද එකසමාන (සමප්‍රමාණ) වේ; රූපයෙහි වනාහි උත්පාද ක්ෂණය හා භංගක්ෂණය යුහු වේ, ඒ දෙක පමණක් සමප්‍රමාණ වේ; ස්ථිති ක්ෂණය වනාහි වැඩිතරම් වේ, සිත් සොළොසක් ඉපිද නිරුද්ධ වන තෙක් පවතියි.

a. අං. නි., ඒකක නිපාත

ප්‍රතිසන්ධි චිත්තය උපන් ක්ෂණෙහිම ඉපිද තැන්පත් වූ, එහෙයින් පුරේජාත (පළමුව උපන්) යයි කිවයුතු හෘදය වස්තුව නිසා දෙවන භවාංග චිත්තය උපදියි, ඒ දෙවන භවාංග චිත්තය හා සමග ඉපිද තැන්පත් වූ, පුරේජාත වූ හෘදය වස්තුව නිසා තුන්වන භවාංග චිත්තය උපදියි; මේ නයින් චිත්ත ප්‍රවෘත්තිය (සිතෙහි පැවැත්ම) ආයුෂ ඇති තෙක් වෙතැ'යි දතයුතුය. මරණාසන්න වූවහුට වනාහි තැන්පත් වූ එකම හෘදය වස්තුව නිසා සිත් සොළොසක් උපදියි.

ප්‍රතිසන්ධි චිත්තය උපන් ක්ෂණෙහිම උපන් රූපය ප්‍රතිසන්ධි චිත්තයෙන් මතු සොළොස්වන චිත්තය හා සමග නිරුද්ධ වේ. ස්ථිති ක්ෂණයෙහි උපන්රූපය සතළොස්වන චිත්තයෙහි ඉපැදීම හා සමග නිරුද්ධ වේ. භංගක්ෂණයෙහි උපන් චිත්තය සතළොස්වන චිත්තයෙහි ස්ථිතික්ෂණයට පැමිණ නිරුද්ධ වේ; යම්තාක් පැවැත්ම වේද, ඒතාක් මෙසේම පවතියි. ඕපපාතික සත්‍වයනටද මේ ආකාරයෙන්ම සන්තති සතක් (චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, භාව, වත්‍ථු දශක) වශයෙන් රූප සැත්තෑවක් පවතී.

එහිලා කර්මය, කර්මසමුට්ඨානය, කර්ම ප්‍රත්‍යය, කර්මප්‍රත්‍යය-චිත්ත සමුට්ඨානය, කර්ම ප්‍රත්‍යය ආහාර සමුට්ඨානය කර්ම ප්‍රත්‍යය ඍතු සමුට්ඨානය යන මේ විභාගය දතයුතුය.

එහි කර්ම නම්, කුශලාකුශල චේතනායි; කර්ම සමුට්ඨාන නම්, විපාක වූ වේදනාදී ස්කන්ධ හා චක්ඛු-දශකාදී වූ සමසැත්තෑ රූපයි, කර්ම ප්‍රත්‍යය නම්, එම විපාක ස්කන්ධ හා සමසැත්තෑ රූපමයි. කර්මය වනාහි කර්මසමුට්ඨානයට උපස්ථම්භක ප්‍රත්‍යයද වේ.

කර්මප්‍රත්‍යය-චිත්තසමුට්ඨාන නම් විපාක චිත්තයෙන් හටගත් රූපයයි, කර්මප්‍රත්‍යය-ආහාර සමුට්ඨාන නම්, කර්ම-සමුට්ඨාන රූපයන්හි තැන්පත් ඕජාව තවත් ඕජාෂ්ටමකයක් උපදවයි, එහිද තැන්පත් වූ ඕජාව අනෙකක් (ඕජාෂ්ටමක) දැ'යි මේ ආකාරයෙන් සතරක් හෝ පහක් රූප කලාප උපදවයි; කර්මප්‍රත්‍යය-ඍතුසමුට්ඨාන නම්, කර්මජ තේජොධාතුව තැන්පත්ව උෂ්ණත්‍වයෙන් හටගන්නා ඕජාෂ්ටමකයක් උපදවයි, එහිද උෂ්ණත්‍වය තවත් ඕජාෂ්ටමකයක් උපදවයි, මේ ආකාරයෙන් සතරක් හෝ පහක් (රූප) පැවැතුම් උපදවයි. මෙසේ පළමුකොට කර්මජ රූපයෙහි උපත දැකියයුතුය.

චිත්තජ රූපයන් අතුරෙහිදු චිත්තය, චිත්ත සමුට්ඨානය, චිත්ත ප්‍රත්‍යයය, චිත්ත ප්‍රත්‍යය-ආහාර සමුට්ඨානය, චිත්තප්‍රත්‍යය-ඍතු සමුට්ඨානය යන මේ විභාගය දතයුතුය.

එහි චිත්ත යනු, නවාසූවක් වූ චිත්තයෝයි; ඔවුනතුරෙන්,

ඡත්තිංස චිත්තානි ඡබ්බීස ඌනවීසති සොළස,
රූපිරියාපථ විඤ්ඤත්ති ජනකාජනකා මතා.

චිත්තයන් දෙතිසක්ද, සවිස්සක්ද, එකුන් විස්සක්ද (පිළිවෙළින්) රූප, ඉරියාපථ, විඤ්ඤත්ති යන තුනමද, රූප, ඉරියාපථ යන දෙකද, හුදෙක් රූප මාත්‍රයමද උපදවයි; (චිත්තයන්) සොළොසක් මේ කිසිවක් නො-උපදවයි.

කාමාවචර සිත් වශයෙන්, කුසල් සිත් අට හා අකුසල් සිත් දොළොසද, මනෝධාතු හැර කිරිය සිත් දහයද, කුසල් කිරිය සිත් වශයෙන්, අභිඤ්ඤා සිත් දෙකක් දැයි යන මේ සිත් දෙතිස රූප, ඉරියාපථ, විඤ්ඤත්ති යන තුනම උපදවයි.

විපාකසිත් හැර සෙසු රූපාවචර සිත් දසයද, අරූපාවචර සිත් අටද, ලෝකෝත්තර සිත් අටදැයි යන මේ සිත් සවිස්ස රූපය හා ඉරියවු යන දෙක උපදවයි, විඤ්ඤත්තිය නො-උපදවයි; කාමාවචර භවංග සිත් දසයද, රූපාවචර (විපාක) සිත් පසද, මනෝධාතු තුනද විපාක - අහේතුක - මනෝ විඤ්ඤාණධාතු එකදැයි යන මේ සෝමනස්ස සහගත සිත් එකුන්විස්ස හුදෙක් රූපමාත්‍රයම උපදවයි; ඉරියාපථ හෝ විඤ්ඤත්ති නො-උපදවයි. පංච විඤ්ඤාණ දෙකද, සියලු සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තයද, රහතුන් ගේ චුතිචිත්තයද, අරූප විපාක සිත් සතරද'යි යන මේ සිත් සොළොස රූප හෝ ඉරියාපථ හෝ විඤ්ඤත්ති හෝ (කිසිවක්) නො-උපදවයි.

මෙහි යම් චිත්තයක් රූප උපදවාද එය ස්ථිති - ක්ෂණයෙහි හෝ භංග ක්ෂණයෙහි නො-උපදවයි, එම ක්ෂණයන්හි දී සිත දුර්වල වේ; උත්පාද ක්ෂණයෙහි වනාහි සිත බලවත් වේ, එහෙයින් එම ක්ෂණයෙහිදී, පුරේජාතවූ (පළමුව උපන්) හෘදය වස්තුව නිසා රූපය උපදවයි.

චිත්ත සමුට්ඨාන නම්, අරූපී ස්කන්ධ තුන හා සද්ද නවකය, කාය විඤ්ඤත්තිය, වචී විඤ්ඤත්තිය, ආකාස ධාතුය, (රූප) ලහුතාය, -මුදුතාය-කම්මඤ්ඤතාය - උපචයය - සන්තතිය යන සොළොස් වැදෑරුම් රූපයයි.

චිත්ත පච්චය නම්, ''පච්ඡා ජාතා චිත්ත චෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස'' (පසුව උපන් චිත්ත-චෛතසික ධර්මයෝ පළමුව උපන් මේ කයට.....) යනුවෙන් මෙසේ කියන ලද චතු-සමුට්ඨාන රූපයයි; චිත්ත පච්චය ආහාර සමුට්ඨාන නම්: චිත්තයෙන් හටගත් රූපයන් වෙත තැන්පත් වූ ඕජාව තවත් ඕජාෂ්ටමකයක් උපදවයි, මේ ආකාරයෙන් දෙ-තුන් වරක් (ඕජාෂ්ටමක) ප්‍රවෘත්තීන් (පැවතුම්) හටගන්වයි.

චිත්ත පච්චය උතු සමුට්ඨාන නම්:- සිතින් හටගත් ඍතුව (උෂ්ණත්වය) තැන්පත්ව තවත් ඕජාෂ්ටමකයක් උපදවයි; මේ ආකාරයෙන්ද

දෙ-තුන් වරක් පැවතුම් හටගන්වයි. චිත්තජ රූපයන්ගේ උපත මෙසේ දතයුතුය.

ආහාරජ රූපයන් පිළිබඳවද, ආහාරය, ආහාර සමුට්ඨානය, ආහාර පච්චයය, ආහාර පච්චය-ආහාර සමුට්ඨානය, ආහාරපච්චය - උතුසමුට්ඨානයදැ'යි යන මේ විභාගය දතයුතුය.

එහි ආහාර නම්ඃ කබලිංකාර ආහාරයයි; ආහාර සමුට්ඨාන නම්ඃ උපාදින්නක කර්මජ රූප ප්‍රත්‍යය ලැබ, එහිම පිහිටා තැන්පත් වූ ඕජාවෙන් හටගත් ඕජාෂ්ටකමකය, ආකාශ ධාතුය, ලහුතාය, මුදුතාය, කම්මඤ්ඤතාය, උපචයය, සන්තතිය දැ'යි යන තුදුස් වැදෑරුම් රූපයයි, ආහාර පච්චය නම්; ''කබලිඞ්කාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො''[a] (කබලිංකාර ආහාරය මේ කයට ආහාර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ) යනුවෙන් මෙසේ කියන ලද චතුසමුට්ඨාන රූපයයි.

ආහාර-පච්චය-ආහාර සමුට්ඨාන නම්ඃ ආහාරයෙන් හටගත් රූපයන් වෙත තැන්පත්වූ (ආහාරමය) ඕජාව තවත් ඕජාෂ්ටමකයක් හටගන්වයි. එහිදීද ඕජාව තවද අනෙක් ඕජාෂ්ටමකයක්දැ'යි මෙසේ දස දොළොස් වරක් පමණ පැවැත්ම ගලපයි. එක් දිනකදී වළඳන ලද ආහාරය සතියක් වුවද උපස්තම්භක වේ; දිව්‍ය ඕජාව වනාහි එසේ මාසයක් දෙකක් උපස්තම්භක වේ; මව විසින් අනුභව කළ ආහාරයද දරුවාගේ ශරීරය පුරා පැතිර රූපය හටගන්වයි; සිරුරෙහි ගල්වන ලද ආහාරය පවා රූපය උපදවයි; කර්මයෙන් උපන් ආහාරය උපාදින්න ආහාර නම්වේ. එයද තැන්පත්ව රූප උපදවයි; එහිද ඕජාව තවද ඕජාෂ්ටමකයක් හටගන්වයි, මේ ආකාරයෙන් සතර පස්වරක් (රූප ප්‍රවෘත්තීන්) ඕජාෂ්ටමකරූපයන් ගලපයි.

ආහාර පච්චය-උතු සමුට්ඨාන නම්ඃ ආහාරයෙන් හටගත් තේජෝ ධාතුව තැන්පත්ව ඍතු-සමුත්ථාන ඕජාෂ්ටමකරූපය උපදවයි; එහිදී මේ ආහාරය ආහාර සමුත්ථාන රූපයනට ජනක (උපදවන්නා) වීමෙන් ප්‍රත්‍යය වේ, සෙසු (කම්ම, චිත්ත, උතු-සමුට්ඨාන) රූපයනට නිස්සය, ආහාර, අත්‍ථි, අවිගත-ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. මෙසේ ආහාරජ රූපයෙහි උපත දැකිය යුතුය.

තවද ඍතුජ රූපයන් පිළිබඳවද, උතුය, උතු සමුට්ඨානය, උතුපච්චයය, උතුපච්චය-උතුසමුට්ඨානය, උතුපච්චය-ආහාර-සමුට්ඨානයදැ'යි යන මේ විභාගය දතයුතුය.

එහි උතු නම් චතුසමුට්ඨාන තේජෝ ධාතුවයි; මෙය වනාහි ශීත ඍතුය, උෂ්ණ ඍතුය යනුවෙන් දෙ-ආකාර වේ; උතුසමුට්ඨානික ඍතුව

---

a. පට්ඨාන, පච්චය නිද්දේස

(තේජෝධාතුව) උපාදින්නක (දැඩිව ගැනීම) ප්‍රත්‍යය ලැබ තැන්පත්ව ශරීරයෙහි රූපය හටගන්වයි, එය සද්දනවකය, ආකාසධාතුය, ලහුතාය, මුදුතාය, කම්මඤ්ඤතාය, උපචයය, සන්තතිය යනුවෙන් පසළොස් ආකාර වේ; උතුපච්චය නම් ඍතුව (තේජෝ ධාතුව) චතුසමුට්ඨානික රූපයන්ගේ පැවැත්මටද නැවැත්මටද ප්‍රත්‍යය වේ; උතුපච්චය-උතුසමුට්ඨාන නම් ඍතු හේතුවෙන් හටගත් තේජෝධාතුව තැන්පත්ව තවත් ඕජාෂ්ටමකයක් නිපදවයි, එහිද ඍතුව තවද ඕජාෂ්ටමකයන් නිපදයි; මෙසේ ඍතුව (තේජෝධාතුව) අනුපාදින්න පක්ෂයෙහි සිට පවා බොහෝ කාලයක් ඍතුසමුත්ථානය පවත්වන්නේමය. උතුපච්චය - ආහාර සමුට්ඨාන නම්; ඍතුවෙන් හටගෙන තැන්පත් වූ ඕජාව තවත් ඕජාෂ්ටමකයක් නිපදවයි, එහිද ඕජාව තවද ඕජාෂ්ටමකයන් උපදවයි, මෙසේ දස දොළොස් වාරයක් ප්‍රවෘත්තීන් (පැවතුම්) ගලපයි. එහිදී මේ ඍතුව ඍතු හේතුවෙන් හටගන්නා රූපයනට ජනක (උපදවන්නකු) වශයෙන් ප්‍රත්‍යය වේ; කම්ම-චිත්ත-ආහාර සමුට්ඨානිකවූ සෙසු රූපයනට නිස්සය-අත්‍ථි- අවිගත ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. මෙසේ ඍතුජරූපයෙහි උපත දැකිය යුතුය. මේ ආකාරයෙන් රූපයෙහි උපත දක්නේ සුදුසු කාලයෙහි රූපය සම්මර්ශනය කරනුයේ නම් වේ.

රූපස්කන්‍ධය සම්මර්ශනය කරන්නහු විසින් රූපයෙහි උපත මෙන්ම, අරූපස්කන්‍ධයන් සම්මර්ශනය කරන්නහු විසින්ද අරූප ස්කන්‍ධයෙහි උපත දැකිය යුතුය. එයද එක් අසූවක් ලෞකික චිත්තෝත්පාද වශයෙන්ම වේ. කෙසේද යත්:- මේ අරූපය නම්: පූර්වභවයෙහි රැස්කළ කර්ම වශයෙන් පළමුකොට ප්‍රතිසන්‍ධියෙහි දී එකුන් විස්සක් වූ චිත්තෝත්පාද භේදය උපදියි; මෙය උපදින ආකාරය වනාහි පටිච්ච සමුප්පාද නිද්දේසයෙහි කී නයින්ම දතයුතුය. එම (එකුන්විසි චිත්තෝත්පාදය) ප්‍රතිසන්‍ධි චිත්තයට අනතුරු චිත්තයෙහි පටන් භවාංග වශයෙන්ද, ආයුෂ කෙළවර චුති වශයෙන්ද හටගනී, එහි කාමාවචර වූ යමක් ඇත්ද, එය ෂඩ්ද්වාරයෙහි බලවත් අරමුණු ඇතිව තදාරම්මණ වශයෙන් පවතියි; එවිට චක්ඛුප්පසාදය නොකඩවූ හෙයින්ද, රූපයන් චක්ඛු පථයට එළඹි හෙයින්ද, ආලෝකය හා සමග යෙදුණ, මනස්කාරයට හේතුවන, චක්ඛු විඤ්ඤාණය සම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග උපදියි; චක්ඛුප්පසාදය ස්ථිති ක්ෂණයෙහි වූ කල, ස්ථිතියට පත්වූම රූපය චක්ඛු-ප්පසාදයෙහි ගැටෙයි; එසේ ගැටුණු කල භවාංගය දෙවරක් ඉපිද නිරුද්ධ වේ; ඉක්බිති එම අරමුණෙහිම, ආවර්ජන කෘත්‍යය ඉටු කරමින් කිරිය මනෝ ධාතුව උපදියි; අනතුරුව එම රූපයම දකිමින් කුශල හෝ අකුශල විපාක වූ චක්ඛු විඤ්ඤාණයද, අනතුරුව එම රූපයම පිළිගනිමින් (සම්පටිච්ඡනකෘත්‍යය කරමින්) විපාක මනෝධාතුවද, ඉනික්බිතිව එම රූපයම මනාසේ තීරණය (සන්තීරණ කෘත්‍යය) කරමින් විපාක-අහේතුක-මනෝවිඤ්ඤාණ ධාතුවද, එයට අනතුරුව එම රූපයම ව්‍යවස්ථාපනය

(ව්‍යවස්ථාපන කෘත්‍යය) කරමින් උපේක්ෂා සහගත කිරිය-අහේතුක-මනෝ විඥ්ඥාණ ධාතුවද, තදනන්තරව කාමාවචර, කුශල හෝ අකුශල, කිරිය චිත්තයන් අතුරෙන් එක් උපේක්ෂාසහගත අහේතුක සිතක්, නැතහොත්, ජවන්සිත් පසක් හෝ සතක්ද, ඉනික්බිතිව, කාමාවචර සත්‍වයනට, තදාරම්මණ සිත් එකොළොස අතුරෙන් ජවන් අරමුණට අනුරූප වූ කිසි යම් තදාරම්මණයක්ද උපදියි. සෙසු ද්වාරයන් විෂයයෙහිද මෙම නයයි; මනෝද්වාරයෙහි වනාහි මහද්ගත චිත්තයෝද උපදිති. මේ ආකාරයෙන් ෂඩ්ද්වාරයෙහි අරූප ස්කන්ධයන්ගේ උපත දැකිය යුතුය. මෙසේ අරූපස්කන්ධයන්ගේ උපත දක්නේ සුදුසු කල්හි අරූපයන් සම්මර්ශනය කරන්නේ නම් වේ. මෙසේ කලෙක රූපයද, කලෙක අරූපයද සම්මර්ශන කෙරෙමින්, ත්‍රිලක්ෂණයට ආරෝපණය කෙරෙමින්, අනුක්‍රමයෙන් පිළිපදිමින්, කිසියම් යෝගියෙක් පඤ්ඤා භාවනාව සම්පාදනය කරයි.

තවත් යෝගියෙක් තෙමේ රූපසප්තක-අරූප සප්තක වශයෙන් ත්‍රිලක්ෂණයට ආරෝපණය කෙරෙමින් සංඛාරයන් සම්මර්ශනය කරයි. එහි, ආදාන-නික්ඛේපන වශයෙන්ද, වයෝවුද්ධත්‍ථඞ්ගම වශයෙන්ද, ආහාරමය වශයෙන්ද, ඍතුමය වශයෙන්ද, කම්මජ වශයෙන්ද, චිත්තජ වශයෙන්ද, ධම්මතාරූප වශයෙන්ද'යි යන මේ සත් ආකාරයෙන් ත්‍රිලක්ෂණයට නඟා සම්මර්ශනය කරනුයේ රූප-සප්තක වශයෙන් ආරෝපණය කොට සම්මර්ශනය කරනුයේ නම් වේ. එහෙයින් කීහු පූරාණාචාර්යයෝ:-

ආදාන නික්ඛෙපනතො වයොවුඩ්ඪත්‍ථ ගාමිතො,
ආහාරතො ච උතුතො කම්මතො චාපි චිත්තතො,
ධම්මතාරූපතො සත්ත විත්‍ථාරෙන විපස්සති'ති

ආදාන නික්ඛේපන වශයෙන්ද .....පෙ... ධම්මතාරූප වශයෙන්ද'යි යන සත් වැදෑරුම් විදර්ශනා පුරනුයේ නම් වේ.

එහි, 'ආදාන' යනු, ප්‍රතිසන්ධියයි; 'නික්ඛේපන' යන චුතියයි; මෙසේ යෝගාවචර තෙමේ ආදාන-නික්ඛේපන අනුසාරයෙන් එක් සියවසක් පිරිසිඳ සංඛාරයන් කෙරෙහි ත්‍රිලක්ෂණය ආරෝපණය කරයි; කෙසේද යත්:- මේ ආදාන (ප්‍රතිසන්ධිය) හා නික්ඛේපන (ච්‍යුතිය) යන දෙක අතර ඇති සියලු සංස්කාරයෝ අනිත්‍ය වෙති; කවර හෙයින්ද යත්:- ඉපිද නැසී යන හෙයින්, විපරිණාම වශයෙන් පෙරළෙන සුලු හෙයින්, තාවකාලික වන හෙයින් හා නිත්‍ය ස්වභාවයට ප්‍රතිපක්ෂ වන හෙයිනි. යම් හෙයකින් වනාහි උපන් සංස්කාරයෝ ස්ථිති භාවයට පත් වෙත්ද, ස්ථිතිභාවයට පත්ව, ජරාවෙන් පෙළෙත්ද, ජරාවට පත්ව නියතවශයෙන්ම බිඳී යත්ද, මෙසේ නිරතුරු පෙළීම් ඇති හෙයින්, දුකසේ ඉවසිය යුතු හෙයින්, දුකට ප්‍රතිෂ්ඨා වන හෙයින් හා සැපතට ප්‍රතිපක්ෂ වන හෙයින් දුඃඛ නම් වෙති. තවද යම් හෙයකින්, "උපන් සංස්කාරයෝ ස්ථිතියට

පැමිණෙත්වා, ස්ථිතියට පත්ව නොදිරත්වා, දිරායාමට පත්වීමෙන් බිඳී නොයත්වා'යි යන මේ කරුණු තුන පිළිබඳව කිසිවකුටත් වශවර්ති භාවයක් (තමා රිසි පරිදි පැවැත්විය හැකි බවක්) නොමැත්තේය; එහෙයින් කිසිවකුගේ වශයෙහි නොපැවැත්විය හැකි ආකාර වන හෙයින් ශූන්‍ය (හිස්) වෙති. මෙසේ ශූන්‍ය වන හෙයින්, අස්වාමික වන හෙයින්, කිසිවකුගේ වශයෙහි නො පවත්නා හෙයින් හා ආත්ම ප්‍රතිපක්ෂ වන හෙයින් අනාත්ම වෙති.

මෙසේ ආදාන-නික්ඛේපන වශයෙන් සියවස් පිරිසුන් රූප විෂයයෙහි ත්‍රිලක්ෂණය ආරෝපණය කොට, ඉක්බිති වයෝවුද්ධත්‍ථගම වශයෙන් ආරෝපණය කරයි; එහි 'වයෝවුද්ධත්‍ථගම' යනු, වයසින් මුහුකළ, වැසීගිය රූපය ඉකුත්ව යාමයි. එයට අනුව ත්‍රිලක්ෂණය ආරෝපණය කෙරෙති'යි යන අර්ත්‍ථයි.

කෙසේද යත්:-ඒ යෝගාවචර තෙමේ එම සියවස් කාලය ප්‍රථම වයස, මධ්‍යම වයස, පශ්චිම වයස යන වයස් සීමා තුනක් වශයෙන් පිරිසිඳ ගනියි, එහි මුල පටන් තෙතිස් වසක් ප්‍රථම වයස නම්, එතැන් පටන් තවද සූතිස් වසක් මධ්‍යම වයස නම්, එතැන් පටන් තවද තෙතිස් වසක් පශ්චිම වයස නම්; මෙසේ මේ තුන් වයසින් පිරිසිඳිමින්, ප්‍රථම වයස්හි පැවති රූපය මධ්‍යම වයසට නොපැමිණ එහිදීම නිරුද්ධ වෙයි; එහෙයින් එය අනිත්‍යය, යමක් අනිත්‍ය නම්, එය දුඃඛය, යමක් දුඃඛ නම්, එය අනාත්මය; මධ්‍යම වයස්හි පැවති රූපයද පශ්චිම වයසට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ; එහෙයින් එයද අනිත්‍යය, දුඃඛය. අනාත්මය, පශ්චිම වයස්හි තෙතිස් වසක් පැවති රූපයද මරණයෙන් පසු යාමට නොසමත් වන හෙයින් එයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්ෂණයට නගයි.

මෙසේ ප්‍රථමවයස් ආදී වශයෙන් වයසින් වැඩී ඉකුත් වීම ත්‍රිලක්ෂණයට නඟා, යළිදු මන්දදසකය, ඛිඩ්ඩා දසකය, වණ්ණ දසකය, බලදසකය, පඤ්ඤා දසකය, හානි දසකය, පබ්භාර දසකය, පවඞ්ක දසකය, මෝමූහ දසකය, සයන දසකය යන මේ දශදශකය අනුව වයසින් වැඩී ඉකුත්වීම් වශයෙන් ත්‍රිලක්ෂණයට නගයි.

එම දශකයන් අතුරෙන්, පළමු කොට සියක් අවුරුදු ජීවත්වන පුද්ගලයකුගේ ප්‍රථම දශවර්ෂය මන්‍දදසක නම්, එම වයස් කාලයෙහි හේ තෙමේ ළද බොළඳ දරුවෙකි; අනතුරු දස අවුරුදු කාලය ඛිඩ්ඩාදසක නම්, එකල හෙතෙම කෙළිලොල් බව බහුලව ඇත්තෙකි; ඉක්බිති දස අවුරුදු කාලය වණ්ණ දසක නම්, එකල ඔහුගේ ශරීර වර්ණය වර්ධනයට පත් වේ; අනතුරු දස අවුරුදු කාලය බලදසක නම්, එකල ඔහුගේ කාය බලය, ශරීර ශක්තිය දෘඩ බවට පත්වේ; ඉක්බිති දස හවුරුදු කාලය පඤ්ඤාදසක නම්, එකල ඔහුගේ ප්‍රඥාව මනාසේ මුහුකුරා ගොස් තිර

බවට පත්වේ; ප්‍රකෘතියෙන් මහා බුද්ධිකයකුගේ වුවද, මේ කාලයතුළ මඳවූ හෝ නැණවත් බවක් උපදනේමය; අනතුරුව එළඹෙන දස හවුරුදු කාලය හානි දසක නම්, එම කාලය තුළ ඔහුගේ කෙළිලොල් බව, ශරීර වර්ණය. බලය හා ප්‍රඥාව පිරිහී යයි; ඉක්බිති එළඹෙන දස අවුරුදු කාලය පබ්භාර දසක නම්, එකල්හි වනාහි ඔහුගේ සිරුර ඉදිරියට නැමෙයි, ඉක්බිති දස අවුරුදු කාලය පවඞ්ක දසක නම්, එකල්හි ඔහුගේ සිරුර නඟුල් කෙළවරක් සෙයින් වකුටු වෙයි. ඉක්බිති දශකය මෝමූහ දසක නම්, එකල්හි හේතෙමේ සිහිවිකල බවට පත්වේ, කළ කළ දෙය මතකින් ගිලිහී යයි; අවසන් දශකය සයන දසක නම්, සියවස් වයස් වූයේ වනාහි නිද්‍රා බහුල (නිතර නිදන සුලු) පුද්ගලයෙක්ම වේ.

එහිදී මේ යෝගාවචර් තෙමේ මෙකී දශකයන් වශයෙන් වයෝවුද්ධත්‍ථගමනයෙන් ත්‍රිලක්‍ෂණයට නඟනු පිණිස මෙසේ මෙනෙහි කරයිඃ- ප්‍රථම දශකයෙහි පැවති රූපය දෙවන දශකයට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ, එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය; දෙවන දශකයෙහි පැවැති රූපය -පෙ- නවවන දශකයෙහි පැවති රූපය දසවන දශකයට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ, දසවන දශකයෙහි පැවැති රූපය පුනර්භවයට නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ, එහෙයින් එයද අනිත්‍යය, දුඃඛය, අනාත්මයයි ත්‍රිලක්‍ෂණයට නඟයි.

මෙසේ දශක වශයෙන් වයෝවුද්ධත්‍ථගමනයට අනුව ත්‍රිලක්‍ෂණයට නඟා ඉක්බිති යලිදු එම සියවසම පසක් පසක් බැගින් විසි කොටසක් කොට වයෝවුද්ධත්‍ථගමනයට අනුව ත්‍රිලක්‍ෂණයට නඟයි. කෙසේද යත් - හේ තෙමේ මෙසේ මෙනෙහි කරයිඃ- පළමු පස්වස තුළදී පැවති රූපය දෙවන පස්වසට නොපමිණ එහිදීම නිරුද්ධ වේ, එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය; දෙවන පස්වස තුළ පැවති රූපය -පෙ- එකුන්විසිවන පස්වසතුළ පැවැති රූපය විසිවන පස්වසට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ; විසිවන පස්වස තුළ පැවැති රූපය මරණින් මතු යාමට සමත් නොවේ, එහෙයින් එයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි යනුවෙනි.

මෙසේ විසි කොටසක් වශයෙන් වයෝවුද්ධත්‍ථගමයට අනුව ත්‍රිලක්‍ෂණයට නඟා, ඉක්බිති යලිදු පස්විසි කොටසක් කොට වසර සතරක් සතරක් බැගින් ගෙන ආරෝපණය කරයි. එසේම තෙතිස් කොටසක් කොට වසර තුනක් තුනක් බැගින්ද පණස් කොටසක් කොට වසර දෙකක් දෙකක් බැගින්ද, කොටස් සියයක් කොට එක් එක් වසරක් බැගින්ද, ඉක්බිති එක් අවුරුද්දක් තුන් කොටසක් කොට වස්සාන, හේමන්ත හා ගිම්හාන යන ඍතු තුනෙන් එකක් වශයෙන්ද ගෙන එම වයෝවුද්ධත්‍ථගම රූපයන් ත්‍රිලක්‍ෂණයට නඟයි.

කෙසේද යත්, වස්සානයෙහි සිවුමසක් තුළ පැවැති රූපය හේමන්තයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, හේමන්තයෙහි පැවැති රූපය ගිම්හානයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, ගිම්හානයෙහි පැවැති රූපය නැවත වස්සානයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය; එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මයයි යනුවෙනි.

මෙසේ ආරෝපණය කොට යලිදු එක් වසරක් කොටස් සයක් කොට බෙදා වස්සානයෙහි දෙමසක් පැවැති රූපය සරත් කාලයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය; සරත් කාලයෙහි පැවති රූපය හේමන්තයට -පෙ- හේමන්තයෙහි පැවැති රූපය සිසිරයට -පෙ- සිසිරයෙහි පැවති රූපය වසන්තයට -පෙ- වසන්තයෙහි පැවැති රූපය ගිම්හානයට -පෙ- නොපැමිණ එහිදීම නිරුද්ධ විය; ගිම්හානයෙහි පැවැති රූපය යලි වස්සානයට නොපැමිණ ඒ ඒ ඍතුව තුළදීම නිරුද්ධ විය; එහෙයින් එය අනිත්‍යය. දුඃඛය, අනාත්මය'යි මෙසේ වයෝවුද්ධ්‍යථගම රූපයන් ත්‍රිලක්‍ෂණයට නඟයි.

මෙසේ ආරෝපණය කොට ඉක්බිති කාළ-ශුක්ල පක්‍ෂ වශයෙන් ගෙන, කාළ පක්‍ෂයෙහි පැවැති රූපය ශුක්ල පක්‍ෂයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, ශුක්ලපක්‍ෂයෙහි පැවැති රූපයද කාළපක්‍ෂයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය; එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්‍ෂණයට නඟයි.

ඉක්බිති රෑ-දහවල් වශයෙන් ගෙන රෑයෙහි පැවැති රූපය, දහවලට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, දහවල පැවැති රූපය රෑයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, දහවල පැවැති රූපය රෑයට නොපැමිණ එහිදීම නිරුද්ධ විය; එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්‍ෂණයට නඟයි.

ඉක්බිති එම රෑ-දහවල පූර්වාහ්ණ (පෙරවරු) ආදී වශයෙන් සකොටසක් කොට පෙරවරුවෙහි පැවැති රූපය මද්දහනටද, මද්දහනෙහි පැවැති රූපය පස්වරුවටද පස්වරුවෙහි පැවති රූපය පෙරයමටද, පෙරයමෙහි පැවති රූපය මැදයමටද, මැදයමෙහි පැවැති රූපය අලුයමටද නොපැමිණ එහි එහිදීම නිරුද්ධ විය, අලුයම්හි පැවැති රූපය යලි පෙරවරුවට නොපැමිණ එහිදීම නිරුද්ධ විය, එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්‍ෂණයට නඟයි.

මෙසේ ආරෝපණය කොට යලිදු, එම රූපයතුළම පෙරට, පස්සට යාම, ඉදිරිය බැලීම, ඔබමොබ බැලීම, හැකිලීම් - දිගහැරීම් ආදි වශයෙන් ගෙන, පෙරට යද්දී පැවැති රූපය පෙරළා එන තෙක් නොපැවත එහිදීම නිරුද්ධ විය, පෙරළා එද්දී පැවැති රූපය ඉදිරිය බලන තෙක්ද, ඉදිරිය බලද්දී පැවැති රූපය ඔබමොබ බලන තෙක්ද, ඔබමොබ බලද්දී පැවැති

රූපය, (අත්පා ආදිය) හකුලන තෙක්ද, හැකිලීමේදී පැවැති රූපය දිගහරින තෙක්ද, නොපැවත එහි එහිදීම නිරුද්ධ විය, එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්‍ෂණයට නඟයි.

ඉක්බිති එක්ම පියවරක් ගෙන, උද්ධරණ, අතිහරණ, වීතිහරණ, වොස්සජන, සන්නික්ඛේපන, සන්නිරුම්භන යනුවෙන් කොටස් සයක් කරයි; එහි 'උද්ධරණ' නම්, පය පොළොවෙන් එසවීමයි, 'අතිහරණ' නම්, පය පෙරට යැවීමයි, වීතිහරණ නම්, කණු, කටු, සර්ප ආදී කිසිවක් දැක පය ඔබ මොබ හැසිරවීමයි, 'වොස්සජන' නම්, පය පහළට හෙළීමයි, 'සන්නික්ඛේපන' නම්, පය බිම තැබීමයි, 'සන්නිරුම්භන' නම්, නැවත පය ඔසවන විට එය පොළොව සමග තෙරපීමයි.

එහි, උද්ධරණයෙහිදී පඨවී, ආපෝ යන ධාතු දෙක අවම වී දුබල වේ; සෙසු ධාතු අධික වී බලවත් වේ; අතිහරණ, වීතිහරණ යන දෙකෙහි දීද එසේය; වොස්සජනයෙහිදී තේජෝ, වායෝ යන ධාතු දෙක අවම වී දුබල වේ; සෙසු ධාතු දෙක අධික වී බලවත් වේ; සන්නික්ඛේපන, සන්නිරුම්භන යන දෙකෙහිදීද එසේය. මෙසේ කොටස් සයක් කොට ඒ අනුව වයෝවුද්ධත්‍ථංගම රූපයෙහි ත්‍රිලක්‍ෂණය ආරෝපණය කරයි.

කෙසේද යත්, හෙතෙම මෙසේ මෙනෙහි කරයිඃ- උද්ධරණයෙහිදී පැවැති යම් ධාතුවක් වෙතොත් එයද එයින් උපන් යම් උපාදාරූපයක් ඇතොත් එයදැයි යන මේ සියලු ධර්මයෝ අතිහරණයට නොපැමිණ එහිදීම නිරුද්ධ වෙති, එහෙයින් අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහ, එසේම අතිහරණයෙහි පැවැත්තාහු වීතිහරණයටද, වීතිහරණයෙහි පැවැත්තාහු වොස්සජනයටද, වොස්සජනයෙහි පැවැත්තාහු සන්නික්ඛේපනයටද, සන්නික්ඛේපනයෙහි පැවැත්තාහු සන්නිරුම්භනයටද නොපැමිණ එහි එහිදීම නිරුද්ධ වෙති'යි මෙසේ ඒ ඒ අවස්ථායෙහි උපන්නාහු අනෙක් අනෙක් කොටසට නොපැමිණ එහි එහිදීම බිඳීයති, පුරුකක් පුරුකක්, සන්‍ධියක් සන්‍ධියක්, ඉමක් ඉමක් බවට පත්වෙමින්, රත්වූ කබලෙක්හි ලූ කල 'තට,තට' යන අනුකරණයෙන් පුපුරන්නාසේ සංස්කාරයෝ බිඳී යති; එහෙයින් අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහ'යි යනුවෙනි.

මෙසේ පුරුක් පුරුක් බවට පත් සංස්කාරයන් (විදර්ශනාඥානයෙන්) දක්නා ඒ යෝගාවචරයාගේ රූප සම්මර්ශනය සියුම් වේ; විදර්ශනාවෙහි මේ සියුම්බවට මේ උපමා කථාවෙකිඃ

දරසුල් තණසුල්, (පන්දම්) ආදියෙහි හුරුපුරුදු එහෙත්, පහනක් නොදුටු විරූ පිටූසර වැසියෙක් තෙමේ නගරයට පැමිණ වෙළඳ සලක් තුළ දැල්වෙන පහනක් දැක, එක්තරා පුරුෂයකුගෙන් ''පින්වත මේ සිත්කලු දෙය කිමෙක්දැ''යි විචාළේය. ඒ පුරුෂයා ඔහුට මෙසේ කීය, ''මෙහි ඇති සිත්කලු බව කිමෙක්ද? මේ පහනෙකි, තෙල් හා වැටිය දැවී ගිය පසු

මෙය ගිය මගවත් නොපැනේ'' යනුයි, අනෙකෙක් ඔහුට මෙසේ කීය, ''මෙයද ඖළාරිකය (ප්‍රකටය, පැහැදිලිය), මේ වැටිය ක්‍රමයෙන් දැවී යන විට එහි එක් එක් තුනෙන් කොටසෙහි දැල්ල අනෙක් අනෙක් කොටසට නොපැමිණම නිරුද්ධ වේ'' යනුයි. තවද අනෙකෙක් ඔහුට මෙසේ කීය, ''මෙයද ඖළාරිකය (පැහැදිලිය). මෙහි එක් එක් අඟුලෙහි, එක් එක් අඩඟුලෙහි. එක් එක් හුයෙහි -පෙ- එක් එක් අංශුවෙහි පැවැති දැල්ල අනෙක් අනෙක් අංශුවට නොපැමිණම නිරුද්ධ වේ; අංශුවෙන් තොරව දැල්ල පෙන්වීමට නොහැකිය''යනුයි.

එහි තෙල්ද වැටියද දැවී ගිය පසු පහන්දැල්ල ගිය මගවත් නොපැනේය යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ ආදාන - නික්ඛේපන (ප්‍රතිසන්ධිච්‍යුති) වශයෙන් සියවසෙකින් පිරිසිඳි රූපයෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය වැනිය, වැටියෙහි එක් එක් තුනෙන් කොටසෙහි දැල්ල අනෙක් අනෙක් කොටසට නොපැමිණ නිරුද්ධ වේ යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ සියවසෙක තුනෙන් කොටසින් පිරිසිඳි වයෝවුද්ධත්‍ථගම රූපයෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය වැනිය; එක් එක් අඟුලෙහි දැල්ල අනෙක් අනෙක් අඟුලට නොපැමිණම නිරුද්ධවේ යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ දස වසෙකින් - පස් වසෙකින්, සිවුවසෙකින්, තෙවසෙකින් - දෙවසෙකින් - එක් වසෙකින් පිරිසිඳී රූපයෙහි ත්‍රිලක්‍ෂණා රෝපණය වැනිය; එක් එක් අඩඟුලෙහි දැල්ල අනෙක් අනෙක් අඩඟුලට නොපැමිණම නිරුද්ධ වේ' යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ එක් එක් වර්ෂය ඍතු වශයෙන් තුනකට හෝ සයකට බෙදා සිවු මසක් හෝ දෙමසක් බැගින් පිරිසිඳී රූපයෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය වැනිය; හුයක් හුයක් පාසා ඇති දැල්ල අනෙක් අනෙක් හුයට නොපැමිණම නිරුද්ධ වේ' යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ අව-පුර-පස වශයෙන් රෑ දහවල් වශයෙන් - එක් දිනක් ස-කොටසකට බෙදා උදය ආදී වශයෙන් පිරිසිඳි රූපයෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය වැනිය. අංශුවක් පාසා පැවැති දැල්ල අනෙක් අනෙක් අංශුවට නොපැමිණම නිරුද්ධ වේ' යන පුරුෂයාගේ ඥානය යෝගියාගේ අභික්කමාදී වශයෙන්ද, උද්ධරණාදියෙහි එක් එක් කොටස වශයෙන්ද පිරිසිඳි රූපයන් විෂයයෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය වැනිය.

හෙතෙම මෙසේ විවිධාකාරයෙන් වයෝවුද්ධත්‍ථගම රූපයන් ත්‍රිලක්‍ෂණයට නඟා යලි එම රූපයම විග්‍රහ කෙරෙමින් ආහාරමයාදී වශයෙන් සිවු කොටසක් කොට එක් එක් කොටසෙහි ත්‍රිලක්‍ෂණාරෝපණය කෙරෙයි. එහිදී ඔහුට ආහාරමය රූපය ක්‍ෂුධිත - සන්තෘප්ත වශයෙන් ප්‍රකට වේ; ක්‍ෂුධිත (සාගත) කාලයෙහි හටගත් රූපය මළානිකද, ක්ලාන්තද වේ, දාගිය කොටයක් මෙන්ද. අඟුරු පැසෙක සැඟවුණු කපුටකු සෙයින්ද (පිළිවෙළින්) අඳුරු පැහැ ඇත්තේද, නොපැහැදිලි සටහන් ඇත්තේද

වේ; සුභිත (සුභික්ෂ) කාලයෙහි හටගත් රූපය පුෂ්ටිමත්ද, ඕදවත්ද, මෘදුද, සිනිඳුද සුපහස් ඇත්තේද වේ; හේ තෙමේ එම ආහාරමය රූපය සම්මර්ශනය කෙරෙමින් ක්‍ෂුධිත කාලයෙහි පැවැති රූපය සුභික්‍ෂ කාලයට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ, සුභික්‍ෂ කාලයෙහි පැවැති රූපයද ක්‍ෂුධිත කාලයට නොපැමිණ එහිදීම නිරුද්ධ වේ; එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි මෙසේ ත්‍රිලක්‍ෂණයට නඟයි.

ඍතුමය රූපය ශීත-උෂ්ණ වශයෙන් ප්‍රකට වේ, උෂ්ණ කාලයෙහි හටගත් රූපය මළානිකද ක්ලාන්තද, දුර්වර්ණද වේ, ශීත ගුණයෙන් හටගත් රූපය පුෂ්ටිමත්ය, ඕදවත්ය, මෘදුය, සිනිඳුය, සුපහස් ඇත්තේය, හේ තෙමේ එය සම්මර්ශනය කෙරෙමින් පැවැති රූපය ශීතකාලයට නොපැමිණ මෙහිදීම නිරුද්ධවේ, ශීතකාලයෙහි පැවැති රූපය උෂ්ණ කාලයට නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ; එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි මෙසේ ත්‍රිලක්‍ෂණාරෝපණය කරයි.

කර්මජ රූපය ආයතන - ද්වාර වශයෙන් ප්‍රකට වේ; චක්ඛුද්වාර විෂයයෙහි වනාහි චක්ඛු -කාය- භාව දශක වශයෙන් කර්මජ රූප තිසෙක් වේ; එයට උපස්තම්භක වූ ඍතු - චිත්ත - ආහාර යන තුනෙන් හටගත් (ශුද්ධාෂ්ටමක තුනක්) සූවිස්සක්දැ'යි සූපණසක් රූප වේ. සෝත-ඝාන-ජිව්හා ද්වාර විෂයයෙහිද එසේය; කායද්වාර විෂයයෙහි වනාහි කාය - භාව දශක වශයෙන් හා ඍතු - චිත්ත - ආහාර සමුට්ඨාන වශයෙන් සූසාළිසක් රූපද, මනෝද්වාර විෂයයෙහි, හදය වත්ථු -කාය- භාව දසක වශයෙන්ද ඍතු - චිත්ත - ආහාර සමුට්ඨාන වශයෙන්ද රූප සූපණසෙක්ම වේ. හේ තෙමේ ඒ සියලුම රූපයන් සම්මර්ශනය කෙරෙමින් චක්ඛුද්වාරයෙහි පැවැති රූපය සෝතද්වාරයට නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ, සෝත ද්වාරයෙහි පැවැති රූපය ඝානද්වාරයටද, ඝානද්වාරයෙහි පැවැති රූපය ජිව්හාද්වාරයටද, ජිව්හාද්වාරයෙහි පැවැති රූපය කායද්වාරයටද, කායද්වාරයෙහි පැවැති රූපය මනෝද්වාරයටද නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ; එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි මෙසේ එහි ත්‍රිලක්‍ෂණාරෝපණය කෙරෙයි.

චිත්ත සමුට්ඨාන රූපය සෝමනස්සිත, දෝමනස්සිත වශයෙන් ප්‍රකට වේ. සොම්නසින් යුත් කාලයෙහි උපන් රූපය සිනිඳු මුදු සුපහස් ඇත්තෙකි, දොම්නසින් යුත් කාලයෙහි උපන්නේ මළානික, වැහැරී ගිය දුර්වරණ රූපයෙකි; හේ තෙමේ එය සම්මර්ශනය කෙරෙමින් සෝමනස්සිත කාලයෙහි පැවැති රූපය දෝමනස්සිත කාලයට නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ; දෝමනස්සිත කාලයෙහි පැවැති රූපය සෝමනස්සිත කාලයට නොපැමිණ මෙහිදීම නිරුද්ධ වේ; එහෙයින් එයද අනිත්‍ය මෙන්ම දුඃඛද අනාත්මද වේ යනුවෙන් මෙසේ ත්‍රිලක්‍ෂණාරෝපණය කෙරෙයි. මෙසේ චිත්ත සමුට්ඨාන රූපය පරිග්‍රහණය

කෙරෙමින් ත්‍රිලක්ෂණය ආරෝපණය කරන ඔහුට මේ කරුණ මැනවින් පැහැදිලි වේ:-

ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කේවලා,
ඒකචිත්ත සමායුත්තා ලහුසො වත්තතෙ ඛණො.
චුල්ලාසීති සහස්සානි කප්පං තිට්ඨන්ති යෙ මරූ,
නත්වෙව තෙපි තිට්ඨන්ති ද්වීහි චිත්තෙහි සමොහිතා
යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙව සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධිකා
අනන්තරා ච යෙ භග්ගා යෙ ච භග්ගා අනාගතෙ,
තදන්තරා නිරුද්ධානං වෙසමං නත්ථි ලක්ඛණෙ.
අනිබ්බත්තෙන න ජාතො පච්චුප්පන්නෙන ජීවති,
චිත්තභඞ්ගා මතො ලොකො පඤ්ඤත්ති පරමත්ථියා
අනිධානගතා භග්ගා පුඤ්ජො නත්ථි අනාගතෙ,
නිබ්බත්තා යෙහි තිට්ඨන්ති ආරග්ගෙ සාසපූපමා
නිබ්බත්තානඤ්ච ධම්මානං භඞ්ගො තෙසං පුරක්ඛතො,
පලොකධම්මා තිට්ඨන්ති පුරාණෙහි අමිස්සිතා
අදස්සනාතො ආයන්ති භඞ්ග ගච්ඡන්ත්‍යදස්සනං,
විජ්ජුප්පාදොව ආකාසෙ උප්පජ්ජන්ති වයන්ති ච

ජීවිතයද ආත්මභාවයද යනු, හුදෙක් එක් චිත්තක්ෂණයෙකින් යුත් සුඛ හෝ දුඃඛම වේ; ක්ෂණයද පවතිනුයේ ඉතා කෙටි කාලයෙකි.

යටත් පිරිසෙයින් අසූ දහසක් කප් ජීවත් වන යම් දෙවි කෙනෙක් වෙත්ද, ඔහු පවා චිත්තක්ෂණ දෙකෙකින් යුක්තව ජීවත් නොවෙති.

මියයන්නකුගේ හෝ මෙහි ජීවත් වන්නකුගේ හෝ යම් ස්කන්ධයක් නිරුද්ධ වූයේද, එක හා සමාන වූ ඒ සියල්ල නැවත නො-එන පරිදි ගියේය.

අතීත භවයෙහි බිඳුණාවූද, අනාගතයෙහි බිඳෙන්නා වූද, ඒ දෙක අතර තුර නිරුද්ධ වූද ස්කන්ධයන්ගේ ලක්ෂණයෙහි විසම බවෙක් නැති. (සමාන වේ).

නූපන් චිත්තයෙන් උපන්නෙක් නැත, පවත්නා චිත්තයෙන් ජීවත් වේ; චිත්තය බිඳී යාමෙන් ලෝකය මියෙයි, මේ (ජීවත්වීම හා මියයාම යන දෙක පිළිවෙළින් ප්‍රඥප්තිය (සම්මුතිය) හා පරමාර්ථය වේ.

බිඳී ගිය (ස්කන්ධයෝ) නිදන්ගත වූයේ නැත, අනාගතයෙහි යලි පිඬු වීමෙක්ද නැත, උපන්නාවූ යම් ස්කන්ධයෝ වෙත්ද ඔහු හිඳි තුඩෙහි රැඳි අබැටක් සෙයින් ජීවත් වෙති.

උපන්නාවූද, ඒ සංස්කාර ධර්මයන්ගේ බිඳීයාම පළමුකොට ස්වයං සිද්ධව අනිවාර්යයෙන්ම වියයුත්තෙකි. (පුරක්ඛත). විනාශ වීම ස්වභාව කොට ඇති සංස්කාර ධර්මයෝ පුරාණ සංස්කාර ධර්මයන් හා සමග අමිශ්‍රව පවත්නාහුය.

(ස්කන්ධයෝ තුමූ) නොදුටු විරූ තැනෙකින් එති, බිඳී ගියාහු අදර්ශනයට යෙති, ආකාශයෙහි විදුලිය උපදනා සෙයින් උපදිති, එසේම වැනසෙති.

මෙසේ ආහාරමය රූප විෂයයෙහි ත්‍රිලක්ෂණය ආරෝපණය කොට යලිදු ''ධම්මතා රූප'' විෂයයෙහි ත්‍රිලක්ෂණය ආරෝපණය කෙරෙයි. 'ධම්මතාරූප' නම්, බාහිර වූ, ඉන්ද්‍රියබද්ධ නොවූ, විවට්ට කල්පයෙහි සිට ස්වාභාවිකව හටගන්නා යකඩ, තඹ, සුදුඊයම්, කළු ඊයම්, රන්, රිදී, මුතු, මැණික්, වෛදූර්ය, සක්. කළුගල්, පබළු, රතුකැට, මැසිරිගල්, පලිඟු, පවු, තණ, ගස්, වැල් ආදී ප්‍රභේද ඇති රූපයි.

එය මේ යෝගියාහට අශෝක අංකුරාදී වශයෙන් ප්‍රකට වේ. අශෝක අංකුරය වනාහි මුලදී ලාරතු පැහැ ඇත්තේ වේ, අනතුරුව දෙ-තුන් දවසක් ඉකුත් වත්ම තදරතු පැහැ ඇතිවේ. යලි දෙතුන් දවසක් ගිය පසු මදරත් පැහැ ඇත්තේ වේ. ඉනික්බිති, ලා දළුපැහැ වේ, අනතුරුව මුහුකළ දළු පැහැ ඇත්තේවේ. ඉන් අනතුරුව කොළ පැහැ ගනී, ඉනුදු අනතුරුව නිල්-කොළ පැහැ ගනී; නිල්-කොළ පැහැ ගත් තැන් පටන් සමාන රූප පරම්පරා අනුව පවත්නේ අවුරුද්දෙකින් පමණ පඬුපැහැ ගෙන නටුවෙන් ගිලිහී වැටෙයි.

ඒ යෝගාවචර තෙමේ එය සම්මර්ශනය කරමින්, ලා-රතු කල්හි පැවැති රූපය තද රතු වන තුරු නොපැවත නිරුද්ධ වෙයි, තද රතු කල්හි පැවැති රූපය මඳ රතු වන තෙක් මඳ රතු කල්හි පැවැති රූපය ලාදළු පැහැ වන තෙක්ද මූකළ දළු පැහැ කාලයෙහි පැවැති රූපය කොළ පැහැ වන තෙක්ද, කොළ පැහැති කාලයෙහි පැවැති රූපය නිල්-කොළ පැහැ වන තෙක්ද. නිල්-කොළ පැහැති කාලයෙහි පැවැති රූපය පඬුපැහැ කොළ ඇති වන තෙක්ද, පඬුපැහැ කොළ ඇති කාලයෙහි පැවැති රූපය නටුවෙන් ගිලිහී වැටෙන තෙක්ද නොපැවතම නිරුද්ධ වේ; එහෙයින් එය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්ෂණාරෝපණය කරයි.

මෙසේ මෙහි ත්‍රිලක්ෂණාරෝපණය කොට, මේ නයින් සියලු ධම්මතාරූපයන් සම්මර්ශනය කරයි. මෙසේ පළමු කොට රූප-සප්තක වශයෙන් ත්‍රිලක්ෂණාරෝපණය කරමින් සංඛාරයන් සම්මර්ශනය කරයි.

''අරූප සත්තක වසෙන' යනුවෙන් යමක් කියන ලද්දේද, එහි මාතෘකා මෙසේයි:- කලාපතෝ (කලාප වශයෙන්) යමකතෝ (යුගල

වශයෙන්) ඛණිකතෝ (ක්‍ෂණික වශයෙන්) පටිපාටිතො (පිළිවෙළ වශයෙන්) දිට්ඨිඋග්ඝාටනතෝ (දෘෂ්ටීන් උගුලවා දැමීම) මාන සමුග්ඝාටනතෝ (මානය උපුටා දැමීම) හා නිකන්ති පරියාදානතෝ (නිකන්ති' යනුවෙන් හැඳින්වෙන සියුම් තෘෂ්ණාව අවසන් කිරීම) යන සත් ආකාරයෙනි.

එහි 'කලාපතො' යනු, ඵස්ස පඤ්චමක (ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, චිත්ත) ධර්මයෝයි; කලාපවශයෙන් කෙසේ සම්මර්ශනය කෙරේද යත්, මේ ශාසනයෙහි භික්‍ෂු තෙමේ මෙසේ මෙනෙහි කරයිඃ- ''මේ කෙස්, අනිත්‍යය. දුඃඛය, අනාත්මය'යි සම්මර්ශන කිරීමේදී උපන් ඵස්ස පංචමක ධර්මයෝද, ''මේ ලොම් -පෙ- මේ හිස් මොළ අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කිරීමේදී උපන් ඵස්ස පංචමක ධර්මයෝදැ'යි යන මේ සියල්ල එකක් අනෙකකට නොපැමිණ පුරුක් පුරුක් බවට, අනෙක් අනෙක් කැබලි බවට පත්ව, රත් කළ කබලෙක ලූ තල මෙන් 'තට, තට' යන අනුකරණයෙන් නටුයේය; එහෙයින් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි යනුවෙනි. මේ පළමු කොට විසුද්ධි කථා නයයි.

අරියවංස කථා නයෙහි වනාහි, යට රූප සප්තකයෙහි, සත් තැනෙක්හි (වෙන වෙනම) ''රූපය අනිත්‍යය,. දුඃඛය, අනාත්මය'යි පැවැති චිත්තය, අනෙක් චිත්තයෙකින් (එකට ගෙන) අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කරනුයේ කලාප වශයෙන් සම්මර්ශනය කරයි'' යනුවෙන් කියන ලද්දේය; එය වඩා යෝග්‍ය වේ. එහෙයින් සෙසු 'යමකතො' යන ආදියද එනයින්ම විග්‍රහ කරන්නමු.

'යමකතො' යනු, මෙහිදී භික්‍ෂු තෙමේ (යට කී) ආදාන-නික්ඛේපන රූපය ''අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශන කොට, එම සිතද අනෙක් සිතෙකින් 'අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කරයි. වයෝවුද්ධත්‍ථගම (වයස වැඩී යාමෙන් ඉකුත්ව යන රූපය) -පෙ- ආහාරමය -පෙ-, ඍතුමය -පෙ- කර්මජ -පෙ- චිත්ත සමුට්ඨාන -පෙ- ධම්මතා රූපය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කොට, එම චිත්තයද, අනෙක් චිත්තයෙකින් 'අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කරයි; මෙසේ, (රූප හා අරූප) යුගල වශයෙන් ගෙන සම්මර්ශනය කිරීම නම් වේ.

'ඛණිකතො' යනු, මෙහිදී භික්‍ෂු තෙමේ, ආදානනික්ඛේප රූපය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කොට ඉක්බිති එම ප්‍රථම චිත්තය දෙවන චිත්තයෙකින්ද, දෙවැන්න තෙවැන්නෙකින්ද, තෙවැන්න සිවුවැන්නෙකින්ද, සිවුවැන්න පස්වැන්නෙකින්දැ'යි මෙසේ, ''මෙයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කරයි. වයෝවුද්ධත්‍ථගම රූපයද, ආහාරමය-ඍතුමය-කර්මජ-චිත්ත සමුට්ඨාන, රූපයන්ද, ධම්මතා රූපයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කොට, එම ප්‍රථම

චිත්තය දෙවන චිත්තයෙකින්ද, දෙවන චිත්තය තෙවන චිත්තයෙකින්ද, තෙවන චිත්තය සිවුවැනි චිත්තයෙකින්ද, සිවුවන චිත්තය පස්වැන්නෙකින්දැ'යි මෙසේ, ''මෙයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'ය සම්මර්ශනය කරයි; මෙසේ රූප-පරිග්‍රාහක චිත්තයෙහි පටන් සතරක් සතරක් බැගින් සම්මර්ශනය කරනුයේ ක්‍ෂණික වශයෙන් සම්මර්ශනය කෙරේ නම් වේ.

'පටිපාටිතො' යනු, ආදාන-නික්ඛේප රූපය අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කොට, එම ප්‍රථම චිත්තය, දෙවන චිත්තයෙකින්ද, දෙවැන්න තෙවැන්නෙකින්ද, තෙවැන්න සිවුවැන්නෙකින්ද, -පෙ- දසවැන්න එකොළොස් වැන්නෙකින්දැ'යි මෙසේ ''මෙයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කරයි. වයෝවුද්ධත්‍ථංගම රූපයද, ධම්මතාරූයද, අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි සම්මර්ශනය කොට, ඉක්බිති එම ප්‍රථම චිත්තය දෙවන චිත්තයෙකින්ද, දෙවන චිත්තය තෙවන චිත්තයෙකින්ද, තෙවැන්න -පෙ- දසවැන්න එකොළොස් වැන්නෙකින්දැ'යි මෙසේ මෙයද අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි විදර්ශනා පිළිවෙළින් මුළු දහවලම සම්මර්ශනය කරනු වටී, දසවන චිත්තය තෙක් සම්මර්ශනය කිරීමෙන් රූප-කර්මස්ථානයද, අරූප-කර්මස්ථානයද ප්‍රගුණ වේ; එහෙයින් දසවැන්නෙහිදීම නැවැත්විය යුතුයයි කියන ලදි. මෙසේ සම්මර්ශනය කරනුයේ පටිපාටි (පිළිවෙළ) වශයෙන් සම්මර්ශනය කෙරේ නම් වේ.

'දිට්ඨි උග්ඝාටනතො', මාන උග්ඝාටනතො', 'නිකන්ති පරියාදානතො' යන මේ තුනෙහි වෙන් වෙන් වශයෙන් සම්මර්ශන ක්‍රමයක් නැත; යට පරිග්‍රහණය කරන ලද යම් මේ රූපයක් ඇත්ද එය හා මෙහි (දැන්) පරිග්‍රහණය කරනු ලබන අරූපයද දකිනුයේ එම රූප-අරූප දෙක හැර අන් කිසි සත්‍වකෙනකු නොදකී; සත්‍වයකු නොදක්නා තැන් සත්‍ව සංඥාව උගුළුවා හරින ලද්දේ වේ. සත්‍ව සංඥාව උගුළුවා හළ සිතින් සංස්කාරයන් පරිග්‍රහ කරන්නහුට (සාවද්‍ය දෘෂ්ටිය නො-උපදියි; දෘෂ්ටිය නූපදනා කල දෘෂ්ටිය උගුළුවා හරින ලද්දේ වේ; දෘෂ්ටිය උගුළුවා හළ සිතින් සංස්කාරයන් පරිග්‍රහණය කරන්නහුට මානය නො-උපදියි. මානය නො-උපදනා කල මානය උගුළුවා හරින ලද්දේ නම් වේ; මානය උගුළුවා හළ සිතින් සංස්කාරයන් පරිග්‍රහණය කරන්නහුට තෘෂ්ණාව නො-උපදියි. තෘෂ්ණාව නො-උපදනා කල නිකන්තිය (එනම් සියුම් තෘෂ්ණාව) ක්‍ෂය කරන ලද්දේ වේ. මෙසේ විසුද්ධි කථායෙහි කියන ලදි.

අරියවංස කථායෙහි වනාහි 'දිට්ඨි උග්ඝාටනතො' (දෘෂ්ටිය උගුළුවා ලීම් වශයෙන්), 'මාන සමුග්ඝාටනතො' (මානය උගුළුවාලීම් වශයෙන්), 'නිකන්ති පරියාදානතො' (නිකන්තිය ක්‍ෂය කිරීම් වශයෙන්), යනුවෙන්

මාතෘකා තබා, මෙම ක්‍රමය දක්වන ලදි. ''මම් විදර්ශනා වඩමි', 'මගේ විදර්ශනාව' යනුවෙන් ගන්නහුට දෘෂ්ටිසමුද්ඝාටනයෙක් නම් නොවේ; ''සංස්කාරයෝම සංස්කාරයන් විදර්ශනා කරති, සම්මර්ශනය කරති, ව්‍යවස්ථා කරති, පරිග්‍රහ කරති, පිරිසිඳ දනිති'යි ගන්නහුට වනාහි දෘෂ්ටි සමුද්ඝාටනය වේ. ''මනාකොට විදර්ශනා කරමි'', ''මැනවින් විදර්ශනා කරමි'යි ගන්නහුට මාන සමුද්ඝාටනයෙක් නම් නොවේ, ''සංස්කාරයෝම සංස්කාරයන් විදර්ශනා කරති, විනිශ්චය කරති, ව්‍යවස්ථා කරති, පරිග්‍රහ කරති, පිරිසිඳ දනිති'යි ගන්නහුට මාන සමුද්ඝාටනය වේ. ''විදර්ශනා කරනු හැකි වෙමි''යි විදර්ශනාව ආස්වාද කරන්නහුට නිකන්ති පරියාදානයක් නම් නොවේ; සංස්කාරයෝම සංස්කාරයන් විදර්ශනා කරති, විනිශ්චය කරති. ව්‍යවස්ථා කරති, පරිග්‍රහ කරති, පිරිසිඳ දනිති'යි ගන්නහුට වනාහි නිකන්ති පරියාදානය වේ.

ඉදින්, සංස්කාරයන් ආත්මය වෙතොත්, ආත්මය'යි ගනු වටනේය; (එහෙත්) අනාත්ම වූවක්ම ආත්මයයි ගන්නා ලදි; එහෙයින් ඔවුන් තමා වශයෙහි නොපවත්නා අරුතින් අනාත්ම වෙති'යි, ඇති වී නැතිව යන අරුතින් අනිත්‍ය වෙති'යි, ඉපදීම නැසීයාම යන දෙකින් පෙළනු ලැබීමේ අරුතින් දුඃඛ වෙති'යි දක්නහුට දෘෂ්ටි-උද්ඝාටනය වේ.

ඉදින්, සංස්කාරයන් නිත්‍ය වෙතොත්, නිත්‍යය'යි ගනු වටනේය, (එහෙත්) අනිත්‍ය වූවක්ම නිත්‍යය'යි ගන්නා ලදි; එහෙයින් ඔවුන් ඇතිවී නැතිව යන අරුතින් අනිත්‍ය වෙති'යි, ඉපදීම-නැසීයාම යන දෙකින් පෙළනු ලැබීමේ අරුතින් දුඃඛය'යි, වශයෙහි නොපවත්නා අර්ථයෙන් අනාත්ම වෙති'යි දක්නහුට මාන සමුද්ඝාතය වේ.

ඉදින් සංස්කාරයන් සුඛ (සැප) වෙතොත්, සුඛය'යි ගනු වටනේය, (එහෙත්) දුඃඛ වූවක්ම සුඛය'යි ගන්නා ලදි; එහෙයින් ඉපදීම වැයවීම යන දෙකින් පෙළනු ලබන අරුතින් දුඃඛ වෙති'යි, ඇති වී නැතිව යන අරුතින් අනිත්‍ය වෙති'යි, වශයෙහි නොපවත්නා අරුතින් අනාත්ම වෙති'යි දක්නහුට නිකන්ති පරියාදානය වේ.

මෙසේ සංස්කාරයන් අනාත්ම වශයෙන් දක්නහුට දෘෂ්ටි සමුද්ඝාටනය වේ; අනිත්‍ය වශයෙන් දක්නහුට මාන සමුද්ඝාටනය වේ; දුඃඛ වශයෙන් දක්නහුට නිකන්ති පරියාදානය වේ. මෙසේ මේ විදර්ශනාව තම තමාගේ ස්ථානයෙහිම සිටියි. මේ ආකාරයෙන් අරූප සප්තක වශයෙන්ද ත්‍රිලක්‍ෂණය ආරෝපණය කොට සංස්කාරයන් සම්මර්ශනය කරයි.

මෙතෙකින් මේ යෝගාවචරයාහට රූප කර්මස්ථානයද අරූප කර්මස්ථානයද ප්‍රගුණ වෙයි.

මෙසේ රූප-අරූප කර්මස්ථානයන් ප්‍රගුණ කළ යෝගාවචර තෙමේ මතු භංගානුපස්සනාවෙහි පටන් පහාන පරිඤ්ඤා (ප්‍රහාණාවබෝධ) වශයෙන් සියලු ආකාරයෙන් පැමිණියයුතු යම් මහා විදර්ශනා අටළොසක් ඇත්ද, එයින් ඒක දේශයක් මෙහිදීම ප්‍රතිවේධ කෙරෙමින් එයට ප්‍රතිපක්ෂ ධර්මයන් පහ කෙරෙයි.

අටළොස් මහා විදර්ශනා නම්: අනිච්චානුපස්සනා ආදී කොට ඇති ප්‍රඥාව යි. ඔවුනතුරෙන් අනිච්චානු-පස්සනාව වඩනුයේ නිත්‍ය සංඥාව පහ කරයි, දුඃඛානුපස්සනාව වඩනුයේ සුඛ සංඥාව පහ කරයි. අනත්තානුපස්සනාව වඩනුයේ ආත්ම සංඥාව පහකරයි, නිබ්බිදානුපස්සනාව වඩනුයේ නන්දිරාගය (සප්‍රීතික තෘෂ්ණාව) පහ කරයි. විරාගානුපස්සනාව වඩනුයේ රාගය පහ කරයි, නිරෝධානුපස්සනාව වඩනුයේ සමුදය (තෘෂ්ණාව) පහ කරයි, පටිනිස්සග්ගානුපස්සනාව වඩනුයේ ආදානය (භව තෘෂ්ණාව) පහ කරයි. ඛයානුපස්සනාව වඩනුයේ ඝන (සන්තති ආදී වශයෙන්) සංඥාව පහ කරයි, වයානුපස්සනාව වඩනුයේ ආයූහනය (සංස්කාරයන් රැස් කිරීම) පහ කරයි, විපරිණාමානුපස්සනාව වඩනුයේ ධ්‍රැව සංඥාව (ස්ථිරය යන හැඟීම) පහ කරයි, අනිමිත්තානුපස්සනාව වඩනුයේ නිමිත්ත සංඥාව (වැරදි නිමිති පිළිබඳ හැඟීම) පහ කරයි; අප්පණිහිතානුපස්සනාව වඩනුයේ පණිධිය (ප්‍රාර්ථනය) පහ කරයි; සුඤ්ඤතානුපස්සනාව වඩනුයේ අභිනිවේසය (ආත්මය පිළිබඳ වැරදි විශ්වාසය) පහ කරයි, අධිපඤ්ඤා ධම්ම විපස්සනාව වඩනුයේ සාරාදානාභිනිවේසය (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් දැඩිව ගැනීම) පහ කරයි, යථාභූත ඤාණ දස්සනය වඩනුයේ සම්මෝහාභිනිවේසය (මුළාවෙන් දැඩිව ගැනීම) පහ කරයි, ආදීනවානුපස්සනාව වඩනුයේ ආලයාභිනිවේසය (ඇලීම් වශයෙන් දැඩිව ගැනීම) පහ කරයි, පටිසඞ්ඛානුපස්සනාව වඩනුයේ අප්පටිසඞ්ඛාව (මිථ්‍යා මනස්කාරය) පහ කරයි, විවට්ටානුපස්සනාව වඩනුයේ සංයෝගාභිනිවේසය (කාමයන් වෙත නැඹුරු වීම) පහ කරයි.

යම්හෙයකින් මේ යෝගියා විසින් ඒ අටළොස් අනුපස්සනාවන්හිදී අනිත්‍යාදී ලක්ෂණත්‍රය වශයෙන් සංස්කාරයෝ දක්නා ලද්දාහුද, එහෙයින් අනිත්‍ය-දුක්ඛ-ආත්මානුදර්ශනය ප්‍රතිවේධ කරන ලද්දේ වේ. තවද මෙකී අනිච්චානුපස්සනා අනිමිත්තානුපස්සනා යන දෙක අර්ථයෙන් එක සමාන වන මුත් හුදෙක් අක්ෂර වශයෙන්ම අසමාන වෙතැයිද, එසේම දුඛානුපස්සනා-අප්පණිහිතානුපස්සනා යන දෙක ද අර්ථයෙන් එක සමාන වන මුත් හුදෙක් අක්ෂර වශයෙන්ම අසමාන වෙතැ'යි ද, එසේම අනත්තානු පස්සනා-සුඤ්ඤතානුපස්සනා යන දෙකද අර්ථයෙන් එක සමාන වන මුත් හුදෙක් අක්ෂර වශයෙන් අසමාන වෙතැයිද කියන ලදි; එහෙයින් ඒ (අනිමිත්ත, අප්පණිහිත, සුඤ්ඤතා යන) අනුපස්සනා තුන ද ප්‍රතිවේධ කරන ලද්දේ වේ.

අධිපඤ්ඤා ධම්මවිපස්සනා යනු සියලුම විපස්සනාවෝය; යථාභූත ඤාණ විපස්සනාව කඞ්ඛාවිතරණ විසුද්ධි විෂයයෙහිම සංගෘහීත වේ. මෙසේ මේ විපස්සනා දෙකද ප්‍රතිවේධ කරන ලද්දේම වේ, සෙසු විපස්සනා ඤාණයන් අතුරෙන් කිසිවක් ප්‍රතිවේධ කරන ලද්දේ වේ, කිසිවක් ප්‍රතිවේධ නොකරන ලද්දේද වේ (විය හැකිය). එම විපස්සනාවන් පිළිබඳ විභාගය මතු ප්‍රකාශ කරන්නමු. යමක් ප්‍රතිවේධ කරන ලද්දේද, එය සඳහා මෙසේ කියන ලදිඃ- ''මෙසේ රූපාරූප කර්මස්ථානයන් ප්‍රගුණ කළ යෝගාවචර තෙමේ මතු භඞ්ගානුපස්සනායෙහි පටන් පහාන පරිඤ්ඤා වශයෙන් සියලු ආකාරයෙන් පැමිණිය යුතු මහා විපස්සනා අටළොසක් ඇත්ද, එයින් ඒකදේසයක් (එක් කොටසක්) මෙහිදීම ප්‍රතිවේධ කරමින් එයට ප්‍රතිපක්ෂ ධර්මයන් පහ කරයි.'' යනුවෙනි.

මෙසේ ඒ යෝගාවචර තෙමේ අනිච්චානුපස්සනා ආදියට ප්‍රතිපක්ෂ නිත්‍යසංඥා ආදිය පහ කිරීමෙන් පිරිසුදු වූ ඥාන ඇතිව, සම්මර්ශනඥානයෙහි පරතෙර පත්ව, එම සම්මර්ශනඥානයට අනතුරුව, ''ප්‍රත්‍යුත්පන්න (පවත්නා) ධර්මයන් විපරිණාමයට අනුව දැකීමේ ප්‍රඥාව උදයව්‍යයානුදර්ශනය'යි'' යනුවෙන් යම් ඒ උදයබ්බයානුපස්සනාවක් කියන ලද්දේද, එය ප්‍රතිවේධ කිරීම පිණිස භාවනානුයෝගය අරඹයි.

එසේ අරඹනුයේද, පළමු කොට සංක්ෂේප වශයෙන් අරඹයි; එහි පෙළ මෙසේයි, කෙසේද යත්ඃ- ''ප්‍රත්‍යුත්පන්න ධර්මයන් විපරිණාමයට අනුව දැකීමේ ප්‍රඥාව උදයබ්බයානුපස්සනා ඤාණයයි; හටගත් රූපය ප්‍රත්‍යුත්පන්නයි, එහි හටගැනීමේ ලක්ෂණය 'උදයයි,' විපරිණාමලක්ෂණය 'ව්‍යය'යි, අනුව දැකීම 'ඥාන'යි; හටගත් වේදනාව -පෙ- සඤ්ඤාව -පෙ- සංඛාරය -පෙ- විඤ්ඤාණය -පෙ- හටගත් චක්ඛුව, -පෙ- හටගත් භවය ප්‍රත්‍යුත්පන්නයි, එහි හටගැනීමේ ලක්ෂණය 'උදයයි, විපරිණාම ලක්ෂණය 'ව්‍යය'යි, අනුව දැකීම 'ඥාන'යි,[a] යනුවෙනි.

ඒ යෝගාවචර තෙමේ මේ පෙළනයට අනුව, හටගත් නාමරූපයන් හටගත් ආකාරය, ජාතිය හෙවත් ඉපදීම, අභිනව ස්වභාවය 'උදය'යි, විපරිණාම ලක්ෂණය, ක්ෂය වීමයි, බිඳීයාම ව්‍යය යි යනුවෙන් සම්මර්ශනය කරයි.

හේ තෙමේ මෙසේ අවබෝධ කරයි, ''මේ නාම-රූපය ඉපැදීමට ප්‍රථම, නූපන් නාම-රූපයෙහි රාසි (එක්රැස්) වීමක් හෝ නිචය (පිඬු) වීමක් නැත; උපදනා වූද නාමරූපයෙහි රාශි වශයෙන් හෝ නිචය වශයෙන් ආගමනයක් නැත; නිරුද්ධ වන්නාවූද නාම-රූපයෙහි දිශාවකට හෝ අනුදිශාවකට යාමක් නැත; නිරුද්ධවූද නාම-රූපයෙහි එක් තැනෙක්හි රාශි වශයෙන් හෝ පිණ්ඩ වශයෙන් හෝ නිධාන වශයෙන්

a. පටිසම්භිදා පාළි, ඤාණ කථා

රැඳී සිටීමෙක් නම් නැත; යම් සේ වනාහි වීණාව වාදනය කරන විට උපදනා ශබ්දයෙහි ඉපැදීමට ප්‍රථම පිඬුවීමෙක් නැත්තේද, උපදනා විට හෝ පිඬුවීමෙක් නො-ආයේද, නිරුද්ධ වන විට හෝ දිශානුදිශාවකට යාමක් නොමැත්තේ වේද, නිරුද්ධ වූයේ හෝ කිසි තැනෙක්හි එක් රැස්ව නොසිටීද, එතෙකුදු වූවත් වීණාව හා උපවීණයද (වාදක) පුරුෂයාගේ තදීය (ඒ සඳහාවූ) ව්‍යායාමයද නිසා පෙර නොවූ ශබ්දය හටගනීද, හටගෙන නැතිවීයාද, මෙසේ සියලු නාම-රූප ධර්මයෝද පෙර ඇති වීමක් නැතිව හටගනිති; හටගෙන නැති වී යති'' යනුවෙනි.

මෙසේ සංක්ෂේප වශයෙන් උදය-ව්‍යය මනස්කාරය (ඉපදීම හා නැති වීම මෙනෙහි) කොට යලිදු, මේ උදයව්‍යය ඥානය පිළිබඳවම විභඞ්ගයෙහි,

අවිජ්ජා සමුදයයෙන් රූප සමුදයය වෙති'යි ප්‍රත්‍යය සමුදයාර්ත්‍ථයෙන් රූපස්කන්‍ධයෙහි පහළ වීම දකියි; තණ්හා සමුදයයෙන් -පෙ- කම්ම සමුදයයෙන් -පෙ- ආහාර සමුදයයෙන් රූප සමුදයය වෙති'යි ප්‍රත්‍යය - සමුදයාර්ත්‍ථයෙන් රූපස්කන්‍ධයෙහි පහළ-වීම දකියි; නිබ්බත්ති (උත්පත්ති) ලක්‍ෂණය දකිනුයේද රූපස්කන්‍ධයෙහි පහළ වීම දකියි; රූපස්කන්‍ධයෙහි පහළ වීම දකිනුයේ මේ පංච ලක්‍ෂණයන් දකියි. අවිජ්ජා නිරෝධයෙන් රූප නිරෝධය වෙති'යි ප්‍රත්‍යය-නිරෝධාර්ත්‍ථයෙන් රූපස්කන්‍ධයෙහි නැතිවීම දකියි, තණ්හා නිරෝධයෙන් -පෙ- කම්ම නිරෝධයෙන් -පෙ- ආහාර නිරෝධයෙන් රූප නිරෝධය වෙති'යි ප්‍රත්‍යය-නිරෝධාර්ත්‍ථයෙන් රූපස්කන්‍ධයෙහි අභාවය දකියි; විපරිණාම ලක්‍ෂණය දකිනුයේද රූපස්කන්‍ධයෙහි අභාවය දකියි; රූපස්කන්‍ධයෙහි අභාවය දක්නේද, මේ පංච ලක්‍ෂණයන් දකියි.

එසේම අවිද්‍යා සමුදයයෙන් වේදනා සමුදයය වෙති'යි ප්‍රත්‍යය සමුදයාර්ත්‍ථයෙන් වේදනා ස්කන්‍ධයෙහි උපත දකියි, තණ්හා සමුදයයෙන් කම්ම සමුදයයද, ඵස්ස සමුදයයෙන් වේදනා සමුදයයද වෙති'යි ප්‍රත්‍යයසමුදයාර්ත්‍ථයෙන් වේදනා ස්කන්‍ධයෙහි උපත දකියි; උත්පත්ති ලක්‍ෂණය දක්නේද වේදනා ස්කන්‍ධයෙහි උපත දකියි, වේදනා ස්කන්‍ධයෙහි උපත දක්නේ මේ පංච ලක්‍ෂණයන් දකියි.

අවිජ්ජා නිරෝධයෙන් - තණ්හා නිරෝධයෙන් - කම්ම නිරෝධයෙන් - ඵස්ස නිරෝධයෙන් වේදනා නිරෝධය වෙති'යි ප්‍රත්‍යය නිරෝධාර්ත්‍ථයෙන් වේදනා ස්කන්‍ධයෙහි අභාවය දකියි; විපරිණාම ලක්‍ෂණය දක්නේද වේදනා ස්කන්‍ධයෙහි අභාවය දක්නේ මේ පංච ලක්‍ෂණයන් දකියි.

වේදනා ස්කන්‍ධයෙහි මෙන්ම සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණය යන ස්කන්‍ධත්‍රය විෂයයෙහිද (-පෙ- මේ පංච ලක්‍ෂණයන් දකියි); මේ විශේෂයි:-

විඤ්ඤාණක්ඛන්ධ විෂයයෙහි 'ඵස්ස සමුදයා' යන්න වෙනුවට 'නාමරූප සමුදයා' යනුවෙන්ද යෙදියු යුතුයි.

මෙසේ එක් එක් ස්කන්ධයෙක්හි උදය-ව්‍යය දර්ශනයෙහිදී දශයක් දශයක් වශයෙන් ලක්‍ෂණ පණසක් කියන ලදි.

ඒ අනුසාරයෙන්, 'මෙසේද රූපයෙහි උපත වේ, මෙසේද රූපයෙහි අභාවය වේ, මෙසේද රූපය උපදියි, මෙසේද රූපය වැය වෙයි'' යනුවෙන් ප්‍රත්‍යය වශයෙන්ද, ක්‍ෂණ වශයෙන්ද සවිස්තරව මෙනෙහි කිරීම කරයි; එසේ මෙනෙහි කරන යෝගියාහට, ''මෙසේ මේ ධර්මයෝ (පෙර) වීමක් නොමැතිව හටගනිති, හට ගෙන වැය වෙති'' යන ඥානය වඩාත් පැහැදිලි වේ.

මෙසේ ප්‍රත්‍ය වශයෙන්ද ක්‍ෂණ වශයෙන්දැයි යන දෙ-ආකාරයෙන් උදය-ව්‍යයය දක්නහුට චතුෂ්සත්‍යයන් හා පටිච්ච සමුප්පාද -නය- ලක්ඛණ භේදය ප්‍රකට වේ. යම් සේ ඒ යෝගී තෙමේ අවිද්‍යාදීන්ගේ සමුදයයෙන් ස්කන්ධයන්ගේ සමුදයයද, අවිද්‍යාදීන්ගේ නිරෝධයෙන් ස්කන්ධයන්ගේ නිරෝධයද දක්නේ වේද, මේ ඔහුගේ ප්‍රත්‍යය වශයෙන් උදය ව්‍යයයන් දැකීමයි; යම් සේ උත්පත්තිලක්‍ෂණ-විපරිණාම ලක්‍ෂණයන් දකිමින් ස්කන්ධයන්ගේ උදය-ව්‍යයයන් දක්නේද, මේ ඔහුගේ ක්‍ෂණ වශයෙන් උදය-ව්‍යයයන් දැකීමයි. උත්පත්ති ක්‍ෂණයෙහිදීම නිබ්බත්ති ලක්‍ෂණයද, භංගක්‍ෂණයෙහිදීම විපරිණාම ලක්‍ෂණයද වේ.

මෙසේ ප්‍රත්‍යය වශයෙන්ද, ක්‍ෂණ වශයෙන්දැ'යි යන දෙ-ආකාරයෙන් උදය-ව්‍යයය දක්නා ඒ යෝගාවචරයාහට, ප්‍රත්‍යය වශයෙන් උදය ව්‍යයය දැකීමෙන් සමුදය සත්‍යය ප්‍රකට වේ; (ස්කන්ධාදිය) උපදවන (අවිද්‍යාදිය) අවබෝධ වන හෙයිනි. ක්‍ෂණ වශයෙන් උපත දැකීමෙන් දුඃඛ සත්‍යය ප්‍රකට වේ, ජාති දුක්ඛය අවබෝධ වන හෙයිනි. ප්‍රත්‍යය වශයෙන් ව්‍යයය දැකීමෙන් නිරෝධ සත්‍යය ප්‍රකට වේ; ප්‍රත්‍යයයන්ගේ අනුත්පාදයෙන් (ප්‍රත්‍යයයන් නො-ඉපිදවීමෙන්) ප්‍රත්‍යයවත් (හේතුවෙකින් හටගන්නා) ධර්මයන්ගේ අනුත්පාදය අවබෝධ වන හෙයිනි. ක්‍ෂණ වශයෙන් ව්‍යයය දැකීමෙන් දුක්ඛ සත්‍යයම ප්‍රකට වේ, මරණ දුක අවබෝධ වන හෙයිනි. මෙසේ මේ යෝගියාහට යම් උදය-ව්‍යය-දර්ශනයක් වේද, එවිට ''මේ ලෞකික (ලෝකස්වභාවය) මාර්ගයයි'' යනුවෙන් මාර්ගසත්‍යය ප්‍රකට වේ, එය පිළිබඳ සම්මෝහය (මුළාව) නැති වී යන හෙයිනි.

මේ යෝගියාහට, ප්‍රත්‍යය වශයෙන් උදය (උපත) දැකීමෙන් අනුලෝම පටිච්ච සමුප්පාදය ප්‍රකට වේ; ''මෙය ඇති කල මෙයද ඇති වේ'' යන අවබෝධය වන හෙයිනි. ප්‍රත්‍යය වශයෙන් වැයවීම දැකීමෙන් පටිලෝම පටිච්ච සමුප්පාදය ප්‍රකට වේ; ''මෙය නැතිවීමෙන් මෙයද

නැති වේ'' යන අවබෝධය වන හෙයිනි. ක්‍ෂණ වශයෙන් උදය-ව්‍යයය දකීමෙන් පටිච්ච සමුප්පන්න ධර්මයෝ ප්‍රකට වෙති; සංඛත ලක්ඛණාවබෝධය (සංස්කාර ලක්‍ෂණයන් පිළිබඳ අවබෝධය) වන හෙයිනි. ''සංස්කාර ධර්මයෝ වනාහි උදය-ව්‍යය (ඇතිවීම නැතිවීම) ස්වභාව කොට ඇත්තාහුය, ඔහු පටිච්ච සමුපන්න (හේතුවකින්ම උපදනාහු) ද වෙති'' යනුවෙනි.

තවද ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් ඔහුට ඒකත්ව ක්‍රමය ප්‍රකට වේ; හේතුඵල සම්බන්ධයෙන් සන්තානය, නොසිඳී පවත්නා බව අවබෝධ වන හෙයිනි. එවිට උච්ඡේද දෘෂ්ටිය වඩාත් මැනවින් පහ කරයි. ක්‍ෂණ වශයෙන් උදය දර්ශනයෙන් නානත්ව ක්‍රමය ප්‍රකට වේ; (උත්පාද-ස්ථිති-භංග වශයෙන්) නව නව සංස්කාරයන්ගේ ඉපැදීම අවබෝධ වන හෙයිනි. එවිට ශාස්වත දෘෂ්ටිය වඩාත් මැනවින් පහ කරයි; ප්‍රත්‍යය වශයෙන් උදය ව්‍යය දර්ශනයෙන් අව්‍යාපාර ක්‍රමය ප්‍රකට වේ; නාම-රූප ධර්මයන් තමා වශයෙහි නොපවත්නා බව අවබෝධ වන හෙයිනි. එවිට ආත්මදෘෂ්ටිය වඩාත් මැනවින් පහ කරයි. ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් ඒවං ධම්මතා ක්‍රමය ප්‍රකට වේ; ප්‍රත්‍යයට අනුරූප වූ ඵලය උපදින බව අවබෝධ වන හෙයිනි. එවිට අකිරිය දෘෂ්ටිය වඩාත් මැනවින් පහ කරයි.

ප්‍රත්‍යය වශයෙන් උදය දර්ශනයෙන් මොහුට අනාත්ම ලක්‍ෂණය ප්‍රකට වේ; සංස්කාර ධර්මයන්ගේ නිරුත්සාහික භාවය හා ප්‍රත්‍යය ප්‍රතිබද්ධ වෘත්තිතාව (හේතූන් සමග බැඳුණු පැවතුම් ඇති බව) අවබෝධ වන හෙයිනි. ක්‍ෂණ වශයෙන් උදය ව්‍යය දර්ශනයෙන් අනිත්‍ය ලක්‍ෂණය ප්‍රකට වේ; ඇතිව නැතිවී යාම අවබෝධ වන හෙයිනි, තවද පුබ්බන්ත - අපරන්ත විචාරය අවබෝධ වන හෙයිනි. දුඃඛ ලක්‍ෂණයද ප්‍රකට වේ; උදයව්‍යය යන දෙකින් නැවත නැවතත් පෙළෙන බව අවබෝධ වන හෙයිනි. ස්වභාව ලක්‍ෂණයද ප්‍රකට වේ; උදය ව්‍යය යන දෙකින් පිරිසුන් බව අවබෝධ වන හෙයිනි. ස්වභාව ලක්‍ෂණයෙහි (පඨවී-ඵස්ස ආදියෙහි) සංඛත ලක්‍ෂණය තාවකාලික වන බවද ප්‍රකට වේ; උදය ක්‍ෂණයෙහි ව්‍යයයෙහිද, ව්‍යය ක්‍ෂණයෙහි උදයයෙහිද අභාවය අවබෝධ වන හෙයිනි.

මෙසේ ඔහුට (යෝගියාහට) සත්‍ය හා පටිච්චසමුප්පාදනය ලක්‍ෂණ භේදය අවබෝධ වූ කල්හි, ''මෙසේ වනාහි පෙර නූපන් විරූ මේ ධර්මයෝ උපදිති, උපන්නාහු නිරුද්ධ වෙති'' යනුවෙන් සංස්කාරයෝ නිත්‍ය නව ස්වරූපයෙන් වැටහෙයි; හුදෙක් නිත්‍ය-නව-ස්වරූපයෙන් වැටහෙනු මතු නොවේ, හිර උදාවෙහිදී පිනිබිඳක් සෙයින්, දියබුබුලක් සෙයින්, දියෙහි දඬුවෙකින් ඇඳි ඉරක් සෙයින්, හිදිඅග රැඳි අබැටක් සෙයින්, විදුලියක් සෙයින්, සුලු මොහොතක් පවත්නා සුලුය; මායාවක්, මිරිඟුවක්, සිහිනයක්,

අලාත (ගිනිපෙනෙල්ලක් කැරකෙන විට දිස්වන) චක්‍රයක්, ගන්ධර්ව නගරයක්, පෙන පිඬක්, කෙසෙල් කඳක් සෙයින් අසාරයයිද නිස්සාරයයිද වැටහෙයි.

මෙතෙකින් මේ යෝගාවචරයා විසින්, ''වය ස්වභාවසහිතවම උපදියි, උපන්නේද ව්‍යයයට පත් වෙයි.'' යන මේ ආකාරයෙන් (යට කී) සම පණස් ලක්‍ෂණයන් ප්‍රතිවේධ කොට සිටි 'උදය-ව්‍යයානුපස්සනා' නම් තරුණ විදර්ශනා ඥානය අවබෝධ කරන ලද්දේ වේ; එම ඥානය ලැබීමෙන් ''ආරද්ධ විපස්සක'' (විදර්ශනාව ආරම්භ කළ) සංඛ්‍යාවට යෙයි.

ඉක්බිත්තෙන් මේ තරුණ විදර්ශනායෙන් විදර්ශනාව ආරම්භ කළ යෝගියාහට දශ විදර්ශනෝපක්ලේශයෝ උපදනාහ. විදර්ශනෝපක්ලේශයෝ වනාහි ප්‍රතිවේධයට පත් ආර්ය ශ්‍රාවකයාට මෙන්ම ශීල විපත්ති ආදියෙන් නොමඟට පිළිපන්, කර්මස්ථානයෙන් ගිලිහුණු, කුසීත පුද්ගලයාහටද නො-උපදිති. නිසිමඟට පිළිපන්, සැදී පැහැදී විදර්ශනාව ආරම්භ කළ කුලපුත්‍රයාහටම උපදිති. ඒ දශ උපක්ලේශයෝ කවරහුද යත්:- ඕභාසය, ඥානය, ප්‍රීතිය, පස්සද්ධිය, සුඛය, අධිමොක්ඛය, පග්ගහ (වීර්ය)ය, උපට්ඨාන (ස්මෘති)ය, උපේක්‍ෂාය, නිකන්තිය යන මොහුය.

කියන ලද මැයි:- ''කෙසේ නම් ධර්ම-ඖද්ධත්‍යයෙන් (මාර්ග-ඵලාවබෝධයට ප්‍රථම ඇති වන සිත් කැළඹීමෙන්) ගන්නා ලද මනස ඇති වේද යත්: අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට ඕභාසය උපදී, එම ඕභාසය (මාර්ග) ධර්මය'යි වැරද ගෙන එය (ඕභාසය) ආවර්ජයනය කරයි, එයින් ඇති වන (මානසික) නොසන්සුන් කම 'උද්ධච්ච' නම්, එම උද්ධච්චය විසින් මඩනා ලද මනස් ඇති යෝගාවචර තෙමේ අනිත්‍ය වශයෙන් වැටහීම තතු ලෙස නොදනී, දුඃඛ වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් වැටහීම තතු ලෙස නොදනී; එසේ අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට 'ඥානය' උපදී -පෙ- 'ප්‍රීති'ය -පෙ-, 'පස්සද්ධිය', - පෙ-, 'සුඛය', -පෙ- 'අධිමොක්ඛය' -පෙ- 'පග්ගහ'ය, -පෙ- 'උපට්ඨාන'ය, -පෙ- 'උපේක්‍ෂාව', -පෙ- 'නිකන්ති'ය උපදී, -පෙ- නිකන්තිය ධර්ම මාර්ගය'යි වැරද ගෙන එම 'නිකන්තිය ආවර්ජනය කරයි; එයින් ඇතිවන වික්ඛේපය 'උද්ධච්ච' යයි. එම උද්ධච්චයෙහි මඩනා ලද සිත් ඇත්තේ අනිත්‍ය වශයෙන් වැටහීම තතුලෙස නොදනී, දුඃඛ වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් වැටහීම තතු ලෙස නොදනී''[a] යනුයි.

එහි 'ඕභාස' යනු, විදර්ශනෝභාසයයි, එය උපන් කල යෝගාවචර තෙමේ, ''මින් පෙර මට ඒකාන්තයෙන් මෙවන් අවභාසයක් (ආලෝකයක්)

---

a. පටිසම්භිදා පාළි, යුගනද්ධ කථා

නොවූ වීර්‍යය, ඒකාන්තයෙන් මාර්ගයට පැමිණියේ වෙමි, ඵලයට පැමිණියේ වෙමි''යි මාර්ග නොවන්නක්ම මාර්ගයයි, ඵල නොවන්නක්ම ඵලයයි වරදවා ගනියි; අමාර්ගය මාර්ගයයි, අඵලය ඵලය'යි ගන්නහුට විදර්ශනාවීථිය නොමගට වැටුණා නම් වේ. හේ තෙමේ තමාගේ මුල් කර්මස්ථානය හැර-පියා ඕභාසයම ආස්වාදනය කෙරෙමින් හිඳියිඃ

ඒ මේ ඕභාසය වනාහි ඇතැම් භික්‍ෂු කෙනකුට පර්යංකස්ථානය පමණක් ආලෝකවත් කෙරෙමින් උපදියි, ඇතැමකුට ඇතුළු ගබ පමණද, ඇතැමකුට පිට ගබද, ඇතැමකුට මුළු විහාරයමද, ගව්වක් පමණද, අඩ යොදුනක් පමණද, යොදුනක් පමණද දෙ-තුන් යොදුනක් පමණද, කිසිවකුට පොළෝතෙලෙහි පටන් අකනිටා බඹලොව දක්වාද. ඒකාලෝක කරමින් පහළ වෙයි. භාග්‍යවතුන් වහන්සේට වනාහි දසදහසක් ලෝකධාතුව බබලවමින් පහළ විය.

මෙසේ අවභාස විවිධත්‍වය දක්වනු සඳහා මේ කථා වස්තුවෙකිː- සිතුල්පවු වෙහෙරෙහි, දෙබිති ගෙයක් (ගර්භ භිත්තිය හා ආලින්දය වටා පිහිටි භිත්තිය සහිත කුටියක්) තුළ තෙරුන් දෙනමක් හුන්නාහ. දවසද කළුවර දෙපෝදා දිනයෙක් විය; දිශාවෝ ද වළාපටලයෙන් වැසී ගත්හ, රාත්‍රිභාගයෙහි චතුරංග සමන්නාගත අන්‍ධකාරය පවතියි; එවේලෙහි එක් තෙර නමක්, ''ස්වාමීනි, මට සෑ-මළුවෙහි ඇති සිංහාසනයෙහි (සිංහ රූප සහිත මලසුනෙක්හි) පස් පැහැ ඇති මල් පෙනේය'යි කීය; අනෙක් තෙර නම, ''ඇවැත්නි, එය පුදුමයක් නොවේ, මට දැන් මහ මුහුදෙහි යොදුනක් පමණ තන්හි මස්-කැස්බෝ පෙනෙති'යි කීය.

මේ විදර්ශනෝපක්ලේශය වනාහි බොහෝ සෙයින් සමථ විදර්ශනා ලාභියාහට උපදී; හේ තෙමේ සමවතින් යටපත් වූ ක්ලේශයන්ගේ නොපැළඹීමේ හේතුවෙන් ''මා රහත් වූ වනැ''යි යන සිත උපදවයි. උච්චවාලිකවාසී මහානාග තෙරුන්ද, හංකන වාසී මහාදත්ත තෙරුන්ද, සිතුල් පව්වෙහි නිකපෙනෙක පධානඝරවාසී චූල්ලසුමන තෙරුන්ද මෙනි.

එහිලා මේ එක් කථා වස්තුවක් ගෙන හැර දක්වීමයිː- තලංගර වාසී ධම්මදින්න නම් සිවුපිළිසිඹියා පත් මහ රහත් තෙර කෙනෙක් බොහෝ වූ භික්‍ෂු සංඝයාහට අවවාද දෙමින් වැඩ සිටියහ. එක් දවසක් උන්වහන්සේ ස්වකීය දිවාස්ථානයෙහි හිඳ ''අපගේ ආචාර්ය උච්චවාලික වාසී මහානාග ස්ථවිරයන් වහන්සේගේ මහණකම මුදුන් පත් වූයේ දෝ-හෝ''යි බලන්නාහු, ඔවුන් වහන්සේ තවමත් පෘථග්ජන භාවයෙහි සිටි බව දැක, ''මා එහි නොගියහොත් පෘථග්ජනයකුව සිටියදීම කාලක්‍රියා කරන්නාහුය'යි දැන ඍද්ධි බලයෙන් අහසට නැග දිවාස්ථානයෙහි හුන් තෙරුන් සමීපයෙහි බැස, වැඳ වත්පිළිවෙත් දක්වා, එකත් පසෙක

හුන්නාහුය. ''ඇවැත්නි, ධම්මදින්නයෙනි, කවර හෙයින් අකාලයෙහි ආවහුදැ'යි විචාළ කල්හි, ''ස්වාමීනි, ප්‍රශනයක් ඇසීමට ආවෙමි''යි කීහ. ''ඇවැත්නි, අසනුය, දනිතොත් කියම්හ''යි පැවසූ කල්හි පැන දහස් ගණනක් විචාළහ.

තෙරුන් වහන්සේ ඇසූ ඇසූ ප්‍රශ්න සියල්ල නොපැකිලව විසඳූහ. ඉක්බිති. ''ස්වාමීනි, ඔබ වහන්සේගේ (ධර්ම) ඥානය අතිතීක්ෂණ (ඉතා තියුණු)ය; කවර දාක ඔබවහන්සේ විසින් මේ ධර්මය අවබෝධ කරන ලද්දේදැ'යි විමසූ කල, ''ඇවැත්නි, මෙයින් සැට මසකට පෙරය''යි පැවසූහ. ''ස්වාමීනි, සමාධියටද සමවදනා සේක්දැ''යි කීකල, ''ඇවැත්නි, එය අපට බැරිරුම් දෙයක් නොවේ''යයි පැවසූහ; ''එසේ නම් ස්වාමීනි, ඇතකු මවනු මැනව''යි කීහ; තෙරණුවෝ සුදුවන් සියලු අඟ-පසඟ ඇති ඇතකු මැවූහ; ''ස්වාමීනි, දැන් මේ ඇතු කන් නිසල කොට ගෙන, වලිගය දික් කොට සොඬ මුව තුළ රුවා ගෙන බිහිසුණු ලෙස කුංචනාද කෙරෙමින් ඔබ වහන්සේ වෙත එන සේ කරනු මැනව''යි කීහ; තෙරණුවෝ එසේ කොට වේගයෙන් එන ඇතුගේ බිහිසුණු විලාශය දැක නැඟිට පලායාමට සැරසුණහ. එවිට රහත් තෙර නම අත දිගුකොට උන්වහන්සේගේ සිවුරු කොණ ගෙන, ''ස්වාමීනි, රහතුනට තැති ගැනීමෙක් ඇත්දැ'යි විචාළහ.

එවිට උන්වහන්සේ තමා පෘථග්ජනයකු බව දැන, ''ඇවැත්නි ධම්මදින්නයෙනි, මට පිහිට වනු මැනව''යි පාමුල උත්කුටිකයෙන් හිඳ ගත්හ. ''ස්වාමීනි, ඔබ වහන්සේට පිහිට වන්නෙමි' යන අදහසින්ම මෙහි පැමිණියෙමි, නහමක් සිතනු මැනව'යි කියා කමටහන් කීහ. තෙරණුවෝ කමටහන් ගෙන සක්මන් මලුවට නැඟ තෙවන පියවර තුබූ කෙණෙහි අග්‍රඵලය වූ රහත් බවට පත්වූහ. තෙරණුවෝ ද්වේෂ චරිත ඇති කෙනෙක් වූහ; එවන් භික්ෂූහු ඕභාසයෙහි කම්පා වෙති.

'ඤාණ' යනු විදර්ශනා ඥානයයි; රූපාරූප ධර්මයන් තුලනය කරන, තීරණය කරන යෝගාවචරයාහට මුදාහළ ඉන්‍ද්‍ර වජ්‍රය (සෙණයක්) සෙයින් නොනැසෙන වේග ඇති, තියුණු වූ, ශූර වූ, ඉතා පැහැදිලි වූ ඥානය උපදී.

''පීති'' යනු, විදර්ශනා ප්‍රීතියයි. එකල ඒ යෝගියාහට ඛුද්දකය, ඛණිකය, ඔක්කන්තිකය, උබ්බේගය, ඵරණය යන මේ පස්වණක් ප්‍රීතිය මුළු සිරුර පුරවා ලමින් උපදියි.

''පස්සද්ධි' යනු විදර්ශනා පස්සද්ධිය (කායික මානසික සන්සුන් බව) යි. එසමයෙහි, රාත්‍රිස්ථානයෙහි හෝ දිවාස්ථානයෙහි හුන් යෝගාවචරයාහට, කා-සිත් දෙකෙහි විඩාවක්, බර බවක්, රළුබවක්, මොට බවක්, ගිලන් බවක්, වංක බවක් නොවේද, එවිට ඔහුගේ කාසිත් දෙක

සන්සුන් වූයේ, සැහැල්ලු වූයේ, මොලොක් වූයේ, කර්මණ්‍ය වූයේ, පැහැදිලි වූයේ සරල වූයේම වේ. හේ තෙමේ ප්‍රශ්‍රබ්ධාදියෙන් මෙහෙයුම් ලද කා-සිත ඇත්තේ, එසමයෙහි 'අමානුසී රති' නම් සුවය අනුභව කෙරෙයි. ඒ සඳහා කියනලදිඃ-

සුඤ්ඤාගාරං පවිට්ඨස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
අමානුසී රති හොති සම්මා ධම්මං විපස්සතො.
යතො යතො සම්මසති ඛන්ධානං උදයබ්බයං
ලභති පීති පාමොජ්ජං අමතං තං විජානතං[a]

සුඤ්ඤාගාරයට පිවිසි, සන්සුන් සිත් ඇති, මනාසේ ධර්මය දක්නා භික්ෂුවට අමානුෂ වූ ඇල්මක් ඇති වේ.

යම් යම් ආකාරයෙකින් ස්කන්ධයන්ගේ උදයව්‍යයය සම්මර්ශනය කෙරේද, ඒ ඒ ආකාරයෙන් යම් ප්‍රීති ප්‍රමෝදයක් ලබාද, එය අමෘතයයි දන්නේයි.

මෙසේ ඒ යෝගියාහට මෙකී අමානුෂ රතිය ගෙනදෙමින් ලහුතාදියෙන් සම්ප්‍රයුක්ත වූ පස්සද්ධිය (සන්සුන් බව) ඇතිවේ.

'සුඛ' යනු, විදර්ශනා සුඛයයි; එකල්හි ඒ යෝගියාහට මුළු සිරුරම තෙමමින් මෙන් ඉතා ප්‍රණීත වූ සුවයෙක් උපදියි.

'අධිමොක්ඛ' යනු, ශ්‍රද්ධාවයි, එම යෝගියාගේ විදර්ශනාසම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසිකයන් අතිශය ප්‍රසාදයට පත් කරවන බලවත් ශ්‍රද්ධාව උපදියි.

'පග්ගහ' යනු, වීර්යයි; විදර්ශනා සම්ප්‍රයුක්ත වූම, ඉතා දැඩි නොවූ (එහෙත්) මනා කොට ගන්නා ලද වීර්යය උපදියි.

'උපට්ඨාන' යනු, ඒ යෝගියාහට විදර්ශනා සම්ප්‍රයුක්ත වූම, මැනවින් එළඹ සිටි, මනාසේ පිහිටුවන ලද, මනාසේ හිඳුවන ලද, මහ පව්වක් සෙයින් නිසසල සිහිය උපදියි. හේ තෙමේ යම් යම් තැනක් ආවර්ජනය කෙර්ද, ස්මරණය කෙරේද, මෙනෙහි කෙරේද, ප්‍රත්‍යවේක්‍ෂා කෙරේද, ඒ ඒ තැන මැත් වී, විවර වී, දිවැස් ඇත්තකුට පරලොව සෙයින් සිහියට එළඹේ.

'උපෙක්ඛා' යනු, විදර්ශනා - උපේක්‍ෂාව මෙන්ම ආවර්ජන - උපේක්‍ෂාවයි; එසමයෙහි ඔහුට සියලු සංස්කාර විෂයයෙහි මධ්‍යස්ථව පවත්නා විදර්ශනෝපේක්‍ෂාවද, මනෝද්වාරයෙහි ආවර්ජනෝපේක්ෂාවද බලවත්ව උපදියි; ඒ යෝගියා ඒ ඒ තැන් ආවර්ජනය කරන විට මුදාහළ

---

a. ධම්මපාද, භික්ඛුවග්ග

ඉන්ද්‍රවජ්‍රයක් (සෙන පහරක්) සෙයින්ද, (වියලි) කොළ ගොටුවෙක බහාලූ රත්වූ යහුලක් සෙයින්ද, ශූරව තීක්ෂ්ණව පවතී.

'නිකන්ති' යනු, විදර්ශනා නිකන්ති යයි; ඔහුට ඕභාසාදියෙන් සමන්විත විදර්ශනා විෂයයෙහි ඇලුම් ඇති කරවන, සියුම් වූ, ශාන්ත ආකාර සහිත නිකන්තිය (නැඹුරුව) උපදියි; එම නිකන්තිය ක්ලේශයෙකැ'යි ගැනීමටද - නොහැකි වේ.

මෙසේ ඕභාස පිළිබඳව (යට කියන ලද) පරිදිම සෙසු කිසියම් උපක්ලේශයක් උපන් විටද යෝගාවචර තෙමේ, ''ඒකාන්තයෙන් මට මින් පෙර මෙවන් ඥානයක් නො-උපන් විරූය, -පෙ- මෙවන් ප්‍රීතියක්, -පෙ- පස්සද්ධියක් -පෙ- සුඛයක් -පෙ- අධිමෝක්ෂයක්, -පෙ- ප්‍රග්‍රහයක්, -පෙ- උපට්ඨානයක්, -පෙ- උපේක්ෂාවක් -පෙ- නිකන්තියක් නො-උපන් විරූය; ඒකාන්තයෙන් මාර්ගයට පිවිසියේ වෙමි, ඵලයට පිවිසියේ වෙමි''යි අමාර්ගයම මාර්ගයයිද, අඵලයම ඵලයයිද ගන්නා ඔහුගේ විදර්ශනාවීථිය උක්කන්ත (නොමඟ ගිය) නම් වේ. හේ තෙමේ තමාගේ මුල් කමටහන් හැර පියා මෙම නිකන්තියම ආස්වාදනය කෙරෙමින් හිඳියි.

මෙහි වනාහි ඕභාස ආදිය උපක්ලේශයනට වස්තු වන හෙයින් 'උපක්ලේශ'යයි කියන ලද මුත් අකුසල වශයෙන් ගෙන නොවේ, නිකන්තිය වනාහි උපක්ලේශයක් මෙන්ම, උපක්ලේශයනට වස්තුද වේ.

මේ ඕභාස ආදිය වස්තු වශයෙන්ම දසයෙකි. 'ගාහ' වශයෙන් වනාහි සම තිසෙකි. කෙසේද යත්, ''මට ඕභාසය උපනැ''යි ගන්නහුට දෘෂ්ටිග්‍රාහය (සක්කාය දිට්ඨිය) ඇති වේ; ''මනා වූ ඕභාසයක් උපනැ''යි ගන්නහුට මානගාහය (මාන වශයෙන් ගැනීම) ඇති වේ; ඕභාසය ආස්වාදනය කරන්නහුට තණ්හාගාහය (තෘෂ්ණා ග්‍රාහය)වේ. මෙසේ ඕභාසයෙහි දෘෂ්ටි, මාන, හා තෘෂ්ණා වශයෙන් ග්‍රාහත්‍රයයක් වේ; එසේම සෙසු ප්‍රීති ආදියෙහිද එලෙසින්ම වේ. මෙසේ ග්‍රාහ වශයෙන් උපක්ලේශයෝ සම-තිසෙක් වෙති. ඒ උපක්ලේශයන්ගේ අනුසාරයෙන්, කුශල නොවූ, ව්‍යක්ත නොවූ යෝගාවචර තෙමේ ඕභාසාදියෙහිදී කම්පා වේ, වික්ෂිප්ත වේ. ඕභාසාදියෙහි එකක් එකක් ''මෙය මගේය'', ''මේ මම් වෙමි'', ''මේ මාගේ ආත්මයයි'' යනුවෙන් දකියි. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ

ඔභාසෙ චෙව ඤාණෙ පීතියා ච විකම්පති,
පසසද්ධියා සුඛෙ චෙව යෙහි චිත්තං පවෙධති
අධිමොක්ඛෙච පග්ගාහෙ උපට්ඨානෙ ච කම්පති,
උපෙක්ඛාවජ්ජනායං ච උපෙක්ඛාය නිකන්තියා

යම් උපක්ලේශයක් නිසා සිත සසල වේද, එකී ඕභාසයෙහිද, ඤාණයෙහිද, පීතියෙහිද, පස්සද්ධියෙහිද සුඛයෙහිද කම්පා වෙයි.

අධි මොක්ඛයෙහිද, පග්ගහයෙහිද, උපට්ඨානයෙහිද, උපෙක්ඛා වජ්ජනයෙහිද, උපෙක්ඛායෙහි හා නිකන්තියෙහිද කම්පා වෙයි.

එහෙත් දක්ෂ වූ, පණ්ඩිත වූ, ව්‍යක්ත වූ, බුද්ධිසම්පන්න වූ යෝගාවචර තෙමේ ඕභාස ආදිය උපන් කල, ''මට මේ උපන්නේ ඕභාසයයි, ඒ ඕභාසය වනාහි අනිත්‍යය, සංඛතය, පටිච්චසමුප්පන්නය, ගෙවී යන සුලුය, වැය වන සුලුය, වැනසෙන සුලුය, නිරුද්ධවන සුලුය'යි මෙසේ එය ප්‍රඥාවෙන් පිරිසිඳ බලයි, පිරික්සයි, නැතහොත් ඔහුට මෙවන් අදහසෙක් පහළ වෙයි, ''ඉදින් ඕභාසය ආත්මය වෙතොත්, ආත්මය'යි ගත යුතුය, (එහෙත්) මේ ආත්මය'යි ගන්නා ලද්දේ ආත්ම නොවන්නෙකි. එහෙයින් එය තමා වශයෙහි නොපවත්නේය, එහෙයින් අනාත්මය, ඇතිව නැතිවී යන හෙයින් අනිත්‍යය, උදයව්‍යය වශයෙන් පෙළන හෙයින් දුඃඛය''යි යන මේ සියල්ල යට අරූප සප්තකයෙහි කියනලද නයින් විස්තර කළ යුතුය. ඕභාස විෂයයෙහි යම්සේද සෙසු උපක්ලේශ විෂයයෙහිද එසේමය.

ඒ යෝගාවචර තෙමේ මෙසේ ඕභාසය පරීක්ෂා කොට, ''මෙය මාගේ නොවෙයි,'' ''මේ මම් නොවෙමි'', ''මේ මාගේ ආත්මය නොවෙයි,'' යනුවෙන් මැනවින් දකියි, ඤාණය-පෙ- නිකන්තිය-පෙ- ''මෙය මාගේ නොවෙයි'', මේ මම් නොවෙමි'' මේ මගේ ආත්මය නොවෙයි'' යනුවෙන් මැනවින් දකියි; මෙසේ මැනවින් දක්නේ ඕභාසාදියෙහි නො-ඇලෙයි, නොසැලෙයි. එහෙයින් කීහු පුරාණාචාර්යයෝඃ-

ඉමානි දස ඨානානි පඤ්ඤාය'ස්ස පරිච්චිතා
ධම්මුද්ධච්ච කුසලො හොති නච වික්ඛෙපං ගච්ඡති

මේ ඕභාස ආදී කරුණු දසය පුරුදු කළ ප්‍රඥාව යමකුට වේද, (ඒ යෝගී තෙමේ) ඕභාස ආදිය ධර්ම මාර්ගයයි වරදවා නොගැනීමෙහි දක්ෂ වූයේ වික්ෂේපයට නොපැමිණෙයි.

ඒ යෝගාවචර තෙමේ මෙසේ වික්ෂේපයට නොයනුයේ එම සමතිස් වැදෑරුම් උපක්ලේශ ජටාව (අවුල) නිරවුල් කොට ගෙන, ඕභාසාදීය ධර්ම මාර්ගය නොවෙති'යිද, උපක්ලේශයන්ගෙන් මිදුණ, වීථියට පිළිපන් විදර්ශනාඥානය (නිවැරදි) මාර්ගය වෙතැ'යිද, මග නොමග විනිශ්චය කරයි.

මෙසේ ඔහුගේ, ''මේ මගය, මේ නොමගය''යි මග නොමග දැන සිටි ඥානය 'මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි'යයි දතයුතුය.

මෙතෙකින් වනාහි ඒ යෝගාවචරයා විසින් සත්‍ය-ත්‍රයයක් විනිශ්චය කරන ලද්දේ වේ; කෙසේද යත්:- පළමු කොට දිට්ඨි විසුද්ධිය මගින් නාමරූප ව්‍යවස්ථාපනයෙන් දුඃඛ සත්‍යය පිළිබඳ ව්‍යවස්ථානය කරන ලදි; කංඛාවිතරණ විසුද්ධියෙහි ප්‍රත්‍යය-පරිග්‍රහණයෙන් සමුදය-සත්‍යය පිළිබඳ ව්‍යවස්ථානය කරන ලදි; මෙම මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධියෙහි සම්‍යග් මාර්ගය අවධාරණය කිරීමෙන් මාර්ග සත්‍යය පිළිබඳ ව්‍යවස්ථානය කරන ලදි. මෙසේ පළමු කොට ලෞකික ඥානයෙන්ම මේ ත්‍රිවිධ සත්‍යයන් පිළිබඳ ව්‍යවස්ථානය කරන ලද්දේ වේ.

සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි.
පඤ්ඤාභාවනාධිකාරයෙහි මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිනිද්දේස
නම්වූ විසිවන පරිච්ඡේදය මෙතෙකින් සමාප්තයි.

# පටිපදාඤාණ දස්සන විසුද්ධි නිද්දේසය

අෂ්ටවිධ ඥානයන්ගේ වශයෙන් මුදුන්පත් වූ විදර්ශනාව හා නවවන සච්චානුලෝමිකඤාණයද'යි යන මේ (පිළිවෙළ) 'පටිපදාඤාණ දස්සන විසුද්ධි නම් වේ. මෙහි අෂ්ටවිධ ඥානය නම් උපක්ලේශයන් කෙරෙන් මිදුණ වීථියට (නිසිමගට) පිළිපන්, විදර්ශනා සංඛ්‍යාත වූ, උදයබ්බයානුපස්සනා ඤාණය, භඞ්ගානුපස්සනා ඤාණය, භයතුපට්ඨාන ඤාණය, ආදීනවානුපස්සනා ඤාණය, නිබ්බිදානුපස්සනා ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසඞ්ඛානුපස්සනා ඤාණය, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය'යි යන මේ අටයයි දතයුතුය. නවවැන්න වූ සච්චානුලෝමික ඤාණයදැ'යි යන මෙය අනුලෝමඤාණයට අධිවචනයෙකි. එහෙයින් එය සම්පාදනය කරනු කැමැත්තහු විසින් උපක්ලේශයන් කෙරෙන් මිදුණ උදයව්‍යයඥානය ආදි කොට ඇති මේ ඥානයන් කෙරෙහි යෝග කළයුතුය.

උදය ව්‍යය ඥාන විෂයයෙහි යලිත් යෝග කිරීම කවර අර්ථයක් සඳහාද යත්ඃ තිලකුණු සිහිතබා ගැනීම සඳහාය. උදයව්‍යය ඥානය යටකී දශ උපක්ලේශයන්ගෙන් කිලිටි වීමෙන් නිසි පරිදි තිලකුණු සැලකීමට නොහැකි වේ; උපක්ලේශයන් කෙරෙන් මිදුණේම හැකි වේ. එහෙයින් තිලකුණු සැලකීමේ ප්‍රයෝජනය සඳහා යලිදු මෙහි යෝග කටයුතුය.

කුමක් මෙනෙහි නොකිරීමෙන්, කිමෙකින් වැසීයාමෙන්. තිලකුණු නොවැටහේද යත්, පළමු කොට අනිත්‍ය ලක්‍ෂණය උදයව්‍යය මෙනෙහි නොකිරීමෙන්, සන්තතියෙන් වැසී යාමෙන් නොවැටහෙයි. දුඃඛ ලක්‍ෂණය නිරන්තරයෙන් (සංස්කාරයන්ගෙන් ඇති වන) පීඩනය මෙනෙහි නොකිරීමෙන්, ඉරියවුවලින් වැසීයාමෙන් නොවැටහෙයි. අනාත්ම ලක්‍ෂණය, නොයෙක් ධාතුන් එකිනෙක වෙන් කොට මෙනෙහි නොකිරීමෙන්, ඝහන බවින් වැසීයාමෙන් නොවැටහෙයි.

එහෙත්, උදයව්‍යයය මෙනෙහි කොට සන්තතිය සිඳලූ කල අනිත්‍ය ලක්‍ෂණය යථාතත්වයෙන් වැටහෙයි; නිරන්තර පීඩනය මෙනෙහි කොට ඉරියවු උගුළුවා ලූකල දුඃඛ ලක්‍ෂණය යථාස්වභාවයෙන් වැටහෙයි; නානා ධාතුන් විග්‍රහ කොට එකිනෙක වෙන් කළ විට අනාත්ම ලක්‍ෂණය යථා ස්වභාවයෙන් වැටහෙයි.

තවද, මෙහි, අනිත්‍යය, අනිත්‍ය ලක්‍ෂණය, දුඃඛය, දුඃඛලක්‍ෂණය, අනාත්මය, අනාත්ම ලක්‍ෂණය යන මේ විභාගයද දතයුතුය. එහි අනිත්‍යය නම්, ස්කන්ධ පංචකයයි. කවර හෙයින්ද? ඉපිද වැය වී අන්‍යථාභාවයට (වෙනස්බවට) යන හෙයිනි; නොහොත්, ඇතිව නැතිවී යන හෙයිනි. ඉපිද ජරාවට පත් වී මෙන් අන්‍යථාභාවයට පත්වීම අනිත්‍ය ලක්‍ෂණයයි;

නොහොත් ඇතිව නැති වීමය යයි කියන ලද ආකාර-විකාරය අනිත්‍ය ලක්‍ෂණයයි.

''යදනිච්චං තං දුක්ඛං'' (යමක් අනිත්‍ය වේද, එය දුඃඛවේ)යයි කී හෙයින් එම ස්කන්‍ධ පංචකය දුඃඛද වේ; කවර හෙයින්ද? නිරන්තරයෙන් පීඩා ගෙන දෙන හෙයිනි. නිරන්තරයෙන් පීඩා දනවන ආකාරය දුඃඛ ලක්‍ෂණයයි.

''යං දුක්ඛං තදනත්තා''[a] (යමක් දුක් වේද, එය අනාත්ම වේ) යන වචනයෙන් එම ස්කන්‍ධ පංචකය අනාත්මද වේ; කවර හෙයින්ද? වශයෙහි නොපවත්නා හෙයිනි. වශයෙහි නොපවත්නා ස්වභාවය අනාත්ම ලක්‍ෂණයයි.

ඒ මේ සියල්ල මේ යෝගාවචර තෙමේ උපක්ලේශයන් ගෙන් විනිර්මුක්ත, වීථිපටිපන්න (නිසිමගට පිළිපන්) විදර්ශනාසංඛ්‍යාත උදය ව්‍යයානුදර්ශන ඥානයෙන් තතුසේ දකියි.

මේ ආකාරයෙන් සලකමින්, යලි යලිදු ''අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි රූපාරූප ධර්මයන් තුලනය කරමින්, තීරණය කරන විට, විදර්ශනාඥානය තියුණු වීමෙන් සංස්කාරයෝ යුහුව වැටහෙති. විදර්ශනාඥානය තියුණුව පවත්නා කල, සංස්කාරයන් යුහුව වැටහෙන කල, ඉපදීම හෝ, ස්ථිතිය හෝ, පැවැත්ම හෝ නිමිත්ත හෝ සිහියට නොනැඟෙයි; හුදෙක්, ක්‍ෂය-ව්‍යය භේද සහිත නිරෝධයෙහිම සිහිය පිහිටයි.

''සංස්කාරයන් මෙසේ ඉපිද, මෙසේ නිරුද්ධ වෙති'යි දක්නා ඒ යෝගාවචරයාහට මේ අවස්ථායෙහිදී ''භඞ්ගානුපස්සනා' නම්වූ විදර්ශනාඥානය උපදී. එම ඥානය සඳහා කියනලදි:- ''අරමුණු මෙනෙහි කොට භංගය (බිඳීම) අනුව බැලීමෙන් උපන් ප්‍රඥාව විදර්ශනා ඥානය නම් වනුයේ කෙසේද? රූපය අරමුණු කොට උපන් සිත ඉපිද බිඳීයයි; ඉක්බිති එම අරමුණ (ක්‍ෂය-ව්‍යය වශයෙන්) මෙනෙහි කරමින්, එය බිඳී යාම අනුව බලයි, බලනුයේ කෙසේ බලාද? නිත්‍ය වශයෙන් නොව අනිත්‍ය වශයෙන් බලයි; සුඛ වශයෙන් නොව දුඃඛ වශයෙන් බලයි, ආත්ම වශයෙන් නොව අනාත්ම වශයෙන් බලයි. කලකිරෙනු මිස තුටු නොවෙයි; දුරුවනු මිස නො-ඇලෙයි; නිරුද්ධකරනු මිස නො-උපදවයි; අත්හරිනු මිස නො-ඇදගනියිඃ

අනිත්‍ය වශයෙන් බලනුයේ නිත්‍යසංඥාව හරියි; දුඃඛ වශයෙන් බලනුයේ සුඛ සංඥාව හරියි, අනාත්ම වශයෙන් බලනුයේ ආත්මසංඥාව හරියි; කලකිරෙනුයේ නන්දි (රාග)ය හරියි; නො-ඇලෙනුයේ ආදානය

a. ම. නි. රාහුලෝවාද සුත්ත.

හරියි. වේදනාව අරමුණු කොට උපන් සිත -පෙ-, සඤ්ඤාව අරමුණු කොට උපන් සිත -පෙ-, සංඛාරය අරමුණු කොට උපන් සිත -පෙ-, විඤ්ඤාණය අරමුණු කොට උපන් සිත -පෙ-, ඇස අරමුණු කොට -පෙ- ජරාමරණයන් අරමුණු කොට උපන් සිත ඉපිද බිඳීයයි. -පෙ- නො-ඇලෙනුයේ ආදානය හරියි.''[a]

වත්ථු සඞ්කමනා චෙව පඤ්ඤාය ච විවට්ටනා
ආවජ්ජනා බලඤ්චෙව පටිසඞ්ඛා විපස්සනා
ආරම්මණන්වයෙනාපි උභො එක වවත්ථානා,
නිරොධෙ අධිමුත්තතා වය ලක්ඛණ විපස්සනා
ආරම්මණඤ්ච පටිසඞ්ඛා භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං අධිපඤ්ඤා විපස්සනා
කුසලො තීසු අනුපස්සනාසු චතස්සො ච විපස්සනාසු
තයො උපට්ඨානෙ කුසලතා නානාදිට්ඨීසු න කම්පති

(පූර්ව) වස්තුවෙන් (අපර) වස්තුවට සංක්‍රමණයද, ප්‍රඥාවෙහි විවර්තනයද (පෙරළීමද), ආවර්ජන බලයද'යි යන මේ 'පටිසඞ්ඛාවිපස්සනා'යි.

අරමුණ අනුව යාමෙන් (අතීත-අනාගත) දෙකට අයත් සංස්කාරයන් එක් සමාන වෙති'යි විනිශ්චය කිරීම හා නිරෝධය වෙතට නැඹුරු වීම 'වය ලක්ඛණ විපස්සනා'යි.

අරමුණ මෙනෙහි කොට එම අරමුණුවල භංගය (බිඳීයාම) අනුව දැකීමද සංස්කාරයන් ශූන්‍ය වශයෙන් වැටහීමද 'අධිපඤ්ඤා විපස්සනා'යි.

මෙකී අනුපස්සනාද, (නිබ්බිදාදීවූ) චතුර්විධ විපස්සනා විෂයයෙහිද, ත්‍රිවිධ උපට්ඨාන විෂයයෙහිද කුශලතාව හේතුකොට ගෙන නොයෙක් ආකාර ඇති දෘෂ්ටි විෂයයෙහි සසල නොවේ. (මේ ගාථා සතරෙහි අර්ථය අනතුරුව එළඹෙන ඡේද කීපයෙන් වඩාත් හොඳින් පැහැදිලි කොට ඇත.)

දන්නා ලද්දැ'යි යන අර්ථයෙන් 'ඤාණ' නම්; ප්‍රජානන (මනාකොට දනිති'යි යන) අර්ථයෙන් 'පඤ්ඤා' නම්. එහෙයින් ''ආරම්මණ පටිසඞ්ඛා භඞ්ගානු පස්සනෙ පඤ්ඤා විපස්සනෙ ඤාණං'' (අරමුණු මෙනෙහි කොට භංගයට අනුව බැලීමෙන් ලබාගත් ප්‍රඥාව විදර්ශනාඥානයයි) කියනු ලැබේ.

එහි ආරම්මණ පටිසඞ්ඛා'' යනු, යම් කිසි රූපාදී අරමුණක් මෙනෙහි කොට දැන, ක්ෂය වශයෙන්ද ව්‍යය වශයෙන්ද දැකැ'යි යන අර්ථයි. ''භඞ්ගානුපස්සනෙ පඤ්ඤා'' යනු, ඒ යෝගාවචරයාහට ක්ෂය වශයෙන්ද,

---

a. පටිසම්භිදා පාළි, ඤාණකථා

ව්‍යය වශයෙන්ද අරමුණු මෙනෙහි කොට උපන් ඥානය බිඳී යාම අනුව බැලීමේදී යම් ප්‍රඥාවක් වේද, එය විදර්ශනා ඥානය'යි කියන ලදි. එය කෙසේ වේද'යි යන මෙය කියනු කැමැතිව, මෙසේ පළමු කොට ප්‍රශ්න කිරීමයි. (අරමුණු මෙනෙහි කොට භංගය අනුව බැලීමෙන් උපන් ප්‍රඥාව විදර්ශනාඥානය වනුයේ කෙසේද?'' යනුවෙන් ප්‍රශ්න කිරීමේ අර්ථය එය විස්තර කොට කියනු කැමැත්තයි).

ඉක්බිති එය කෙසේ වේද'යි දක්වනු පිණිස ''රූපාරම්මණතා'' ආදිය කියන ලදි. එහි ''රූපය අරමුණු කොට උපන් සිත ඉපිද බිඳීයයි' යනු රූපය අරමුණු කොට ඇති වූ සිත ඉපිද බිඳී යයි'' යන අර්ථයි. ''තං ආරම්මණං පටිසඞ්ඛා'' (එම අරමුණ මෙනෙහි කොට) යනු, එම රූපාලම්බනය මෙනෙහි කොට දැන, ක්‍ෂය වශයෙන්ද ව්‍යය වශයෙන්ද දැකැ'යි යන අර්ථයි. ''තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති'' (අනතුරුව එම සිතෙහි බිඳී යාමද බලයි) යනු, යම් සිතෙකින් එම රූපාලම්බනය ක්‍ෂය වශයෙන්ද, ව්‍යය වශයෙන්ද දක්නා ලද්දේද, එම සිතද වෙනත් සිතෙකින් බිඳී යාම දකී යන අර්ථයි. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:- ''ඤාතඤ්ච ඤාණඤ්ච උභො විපස්සති'' (ඥාත හෙවත් දන්නා ලද දෙයද, ඥානය හෙවත් දැනීමද යන දෙකම දකියි'' යනුවෙනි.

මෙහි, 'අනුපස්සති' යනු, යලියලිදු බලයි, ත්‍රිලක්‍ෂණ වශයෙන් නැවත නැවතත් නොයෙක් ආකාරයෙන් බලයි' යන අර්ථයි. එහි 'අනුපස්සති'යි කීහු; කෙසේ අනුව බලාද? අනිත්‍ය වශයෙන් යනාදිය වේ.

එහි, යම් හෙයකින් භංගය අනිත්‍යතාවෙහි අන්තිම කෙළවර වේද, එහෙයින් භංගය අනුව බලන යෝගාවචර තෙමේ සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් බලනු විනා නිත්‍ය වශයෙන් නොබලයි.

ඉක්බිති අනිත්‍යය දුඃඛද වන හෙයින් හා දුඃඛය අනාත්මද වන හෙයින්, එයම දුඃඛ වශයෙන් මිස සුඛ වශයෙන් නොබලයි; අනාත්ම වශයෙන් නොව ආත්ම වශයෙන් නොබලයි. යම් හෙයකින් වනාහි යමක් අනිත්‍යද, දුඃඛද, අනාත්මද වෙතොත් එය තොස් විය යුතු දෙයක් නොවේ; යමක් තොස් විය යුතු දෙයක් නොවෙතොත් එය ඇලුම් කළ යුතු දෙයක් නොවේ. එහෙයින් (මේ සංස්කාරයන්) භංගය අනුව බැලීම් වශයෙන් අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි දුටු කල්හි එම සංස්කාරයන් කෙරෙහි කලකිරෙයි, තොස් නොවෙයි, නො-ඇලෙයි, ඇලුම් නොකරයි, හේ තෙමේ මෙසේ නො-ඇලෙනුයේ, පළමු කොට ලෞකික වූ ඥානයෙන්ම රාගය වළක්වයි, නො-උපදවයි, සමුදය (ඉපදවීම) නොකරයි? යන අර්ථයි.

නොහොත්, යමෙක් තෙමේ මෙසේ රාගරහිත වූයේ දක්නාලද සංස්කාරයන් යම් සේද, එසේම නොදක්නා ලද සංස්කාරයන්ද අන්වයඥාන

වශයෙන් වලක්වයි, නො-උපදවයි, නිරෝධ වශයෙන්ම මෙනෙහි කරයි, නිරෝධයම මිස සමුදයය නොබලයි යන අර්ථයි.

මෙසේ පිළිපන් හේ තෙමේ 'බැහැර කරයි, ආදානය (ඇදගැනීම) නොකරයි. කුමක් කියන ලද්දේද යත්, මේ අනිත්‍යාදී අනුපස්සනාව ස්කන්ධඅභිසංස්කාරයන් හා සමග ක්ලේශයන් තදඞ්ග වශයෙන පහ කරන හෙයින් 'පරිච්චා පටිනිස්සග්ග' යයිද, සංස්කාර දෝෂයන් දක්නා හෙයින් හා (එම ස්කන්ධාදියට) විපරීත වූ නිර්වාණය වෙතට නැඹුරු වූ හෙයින් 'පක්ඛන්දන පටිනිස්සග්ග' යයිද කියනු ලැබේ. එහෙයින් එම අනුපස්සනාවෙන් සමන්විත භික්ෂු තෙමේ, මෙකී නයින් ක්ලේශයන්ද පහකරයි, නිවණ කරාද නැඹුරු වෙයි, ඉපැදීම් වශයෙන් ක්ලේශයන් නොඇදගනියි, දොස් නොදැකීම් වශයෙන් සංස්කාර-ආලම්බනයන් නොගනියි. එහෙයින් 'පටිනිස්සජති' (බැහැර කරයි) 'නො ආදියති' (වෙතට නො-ඇදගනියි) යයි කියනුලැබේ.

ඉක්බිති, ඒ යෝගාවචරයාගේ එම (අනිත්‍යානුපස්සනා ආදී) ඥානයන් මගින් ප්‍රහීණ වන ක්ලේශධර්මයන් දක්වනු පිණිස, ''අනිච්චතො අනුපස්සනෙතා නිච්චසඤ්ඤං පජහති (අනිත්‍ය වශයෙන් බලනුයේ නිත්‍යසංඥාව බැහැර කරයි) යන ආදිය කියන ලදි. එහි 'නන්දි' යනු, සප්‍රීතික (ප්‍රීතිසහිත) තෘෂ්ණාවයි. සෙස්ස යට කී නයම වේ.

(යට සඳහන් 'වත්ථුසඞ්කමනා' ආදී) ගාථාවල 'වනාහි වත්ථුසඞ්කමනා' යනු, රූපයෙහි බිඳී යාම දැක, නැවත, යම් සිතෙකින් එම බිඳී යාම දක්නා ලද්දේද, එම සිතෙහිද භංගදර්ශන වශයෙන් පූර්ව වස්තුව කෙරෙන් අපර වස්තුව වෙතට සංක්‍රමණයයි. 'පඤ්ඤාය ච විවට්ටනා' යනු, උදයය (උපත) හැර ව්‍යය විෂයයෙහිම විදර්ශනාප්‍රඥාව මනාව පිහිටීමයි. 'ආවජ්ජනා බලඤ්චෙව' යනු, රූපයෙහි බිඳීයාම දැක, නැවත එම බිඳීයාම අරමුණු කළ සිතෙහිද බිඳී යාම දකිනු පිණිස අනතුරුවද ආවර්ජනය කිරීමේ සමත්බවය. 'පටිසඞ්ඛාවිපස්සනා' යනු, මේ අරමුණු මෙනෙහි කිරීමේ විපස්සනාව භංගානුපස්සනා නම්වේ.

''ආරම්මණාන්වයෙන උභො ඒකවවත්ථානා' යනු, ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා ලද අරමුණු පිළිවෙළ අනුව යාමෙන්, (වර්තමානයෙහි මෙන්ම අතීතයෙහිද සංස්කාරයෝ බිඳී ගියහ, අනාගතයෙහිද බිඳෙන්නාහයි මෙසේ (දුටු-නොදුටු යන) උභය ස්කන්ධයන් එක සමානයයි විනිශ්චය කිරීමය' යන අර්ථයි. කියන ලදමැයි පුරාණාචාර්යයන් විසින්:-

සංවිජ්ජමානම්හි විසුද්ධදස්සනෙ තදන්වයං නෙති අතීතනාගතෙ
සබ්බෙපි සංඛාරගතා පලොකිනො උස්සාව බින්දූ සූරියෙව උග්ගතෙ

(ස්කන්ධයන් පිළිබඳ) භංග දර්ශනය පැහැදිලිව පවත්නා කල්හි, එම පිළිවෙළ අතීත අනාගත යන දෙකටද පමුණුවයි; සියලු සංස්කාර

ධර්මයන් හිරු නැගි කල පිණි බිඳු සෙයින් විනාශ වන සුලු බව දකියි.

'නිරොධෙ අධිමුත්තතා' යනු, මෙසේ (දුටු-නොදුටු) උභය සංස්කාරයන් භංග වශයෙන් එක සමාන වෙති'යි ව්‍යවස්ථාන කොට, එම භංගසංඛ්‍යාත නිරුද්ධ වීම වෙතට හුරු වූ බවය, බර වූ බවය, නැමුණු බවය, යොමු වූ බවය, නැඹුරු වූ බවය යන අර්ථයි. 'වයලක්ඛණ විපස්සනා' යනු, මෙය 'වයලක්ඛණ විපස්සනා' නම් වෙති'යි කී නියායි.

'ආරම්මණඤ්ච පටිසංඛා' යනු රූපාදී වූ පෙර අරමුණු දැන, 'භඞ්ගඤ්ච අනුපස්සති' යනු, එම අරමුණු බිඳී යාමද දැක, එය අරමුණු කළ සිතෙහිද බිඳීයාම දකියි.

'සුඤ්ඤතො ච උපට්ඨානං' යනු, මෙසේ භංගය අනුව බලන ඒ යෝගාවචරයාහට, ''සංස්කාරයෝම බිඳියති, මරණය නම් ඒ සංස්කාරයන්ගේ බිඳී යාමයි. එය හැර (ආත්ම ආදී වූ) අන් කිසිවක් නැතැ'යි ශූන්‍ය වශයෙන් වැටහීම සිදුවේ. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

ඛන්ධා නිරුජ්ඣන්ති න චත්ථි අඤ්ඤො<br>
ඛන්ධාන භෙදො මරණන්ති වුච්චති<br>
තෙසං ඛයං පස්සති අප්පමත්තො<br>
මණිං ච විජ්ඣං වජිරෙන යොනිසො'ති.

හුදෙක් ස්කන්ධයෝ නිරුද්ධ වෙති, එය හැර අන් කිසිත් නැත, ස්කන්ධයන්ගේ බිඳී යාම මරණයයි කියනු ලැබේ; අප්‍රමාද වූයේ වීදුරු කටුවෙකින් මැණිකක් විදින්නා සේ එම ස්කන්ධයන්ගේ ක්‍ෂය වීම නුවණින් දකියි.

'අධිපඤ්ඤා විපස්සනා' යනු, මෙකී ආරම්මණ පටිසංඛා, භංගානු පස්සනා, සුඤ්ඤතො උපට්ඨාන යන තුන 'අධිපඤ්ඤාවිපස්සනා' නම් වෙති'යි කී නියායි.

'කුසලො තීසු අනුපස්සනාසු' යනු, අනිත්‍යය අනුව බැලීම් ආදී ත්‍රිවිධ අනුපස්සනාවෙහි දක්‍ෂ භික්‍ෂු තෙමේ; 'චතසෙසා ච විපස්සනාසු'යනු, නිබ්බිදා (කලකිරීම) ආදී චතුර්විධ විදර්ශනා විෂයයෙහි, ''තයෙ උපට්ඨානෙ කුසතා' යනු, ක්‍ෂයවශයෙන්ද, ව්‍යය වශයෙන්ද, ශූන්‍ය වශයෙන්දැ'යි යන මේ ත්‍රිවිධ උපට්ඨාන (වැටහීම්) විෂයයෙහි කුශල බැවිනි.

'නානාදිට්ඨීසු න කම්පති' යනු, ශාස්වතාදී අනේකප්‍රකාර දෘෂ්ටීන් විෂයයෙහි නොසැලේ; මෙසේ නොසැලෙනුයේ, නිරුද්ධ නොවූවක්ම නිරුද්ධ වෙති'යි, නොබිඳුණක්ම බිඳී යති'යි යනුවෙන් පැවැති මනස්කාර ඇත්තේ, දුබල බඳුනක් බිඳෙන විට මෙන්ද, සියුම් දූවිල්ලක් විසිරෙන

විට මෙන්ද, තල බඳිනු ලබන විට මෙන්ද, සියලු සංස්කාරයන්ගේ උත්පාද-ස්ථිති-ප්‍රවෘත්ති (පැවැත්ම) පිළිබඳ නිමිති දුරහැර භේදය (බිඳීයාම)ම බලයි. හේ තෙමේ, යම්සේ ඇස් ඇති පුරුෂයෙක් පොකුණු තෙරෙක හෝ ගං-තෙරෙක සිටියේ මහත් පොද ඇති වැස්සක් වසින විට දිය මතුපිට මහත් මහත් බුබුලු සැදෙමින් වහ වහා බිඳී යනු දකීද, එසේම සියලු සංස්කාරයන් බිඳි බිඳීයෙති'යි දකියි. මෙවන් යෝගාවචරයා සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ වදාරන ලදි:-

යථා බුබ්බුලකං පස්සෙ යථා පස්සෙ මරීචිකං,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති[a]

දිය බුබුලක් දක්නා සෙයින්, මිරිඟුවක් දක්නා සෙයින් යමෙක් ලෝකය දකීද, එවන් තැනැත්තා මාර තෙමේ නොදකී.

මෙසේ "සියලු සංස්කාරයෝ බිඳී බිඳී යති" යනුවෙන් නිරතුරු දක්නා ඒ යෝගාවචරයාගේ ආනිසංස අටක් පිරිවර කොට ඇති භංගානුපස්සනා-ඤාණය බලවත් වෙයි. එහි ආනිසංස අට නම්:- භව (ශාස්වත) දෘෂ්ටිය ප්‍රහීණ වීම, ජීවිතාශාව පහවීම, සැම කල්හි (භාවනා සඳහා) සැදී පැහැදි සිටින බව, පිරිසුදු ආජීව ඇති බව, (ලෞකික) උත්සුකතාවන් පහ වූ බව, දුරුවූ භය ඇති බව, ඉවසීම හා මුදුගුණය ලද බව උකට ලී බවින් හා කාමයෙහි ඇලීමෙන් තොරවූ බවය යන මේ'ය. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:-

ඉමානි අට්ඨගුණමුත්තමානි දිස්වා තහිං සම්මසතී පුනප්පුනං,
ආදිත්ත චෙල සසිරසූපමො මුනි භඞ්ගානුපස්සී අමතස්ස පත්තියා

මේ උතුම් ගුණ අට දැක, භංගය අනුව බලනසුලු යෝගාවචර තෙමේ, අමෘත නිර්වාණයට පැමිණීම පිණිස (ඇඳි වතෙහි) නරුපට ගිනි ගත් අයකු සෙයින් නැවත නැවතත් (සංස්කාර භංගය) සම්මර්ශනය කරයි.

භඞ්ගානුපස්සනා ඤාණය නිමි

——//——

මේ ආකාරයෙන් සියලු සංස්කාරයන්ගේ ක්ෂය ව්‍යයභේද සහිත නිරෝධය අරමුණු කොට ඇති භඞ්ගානුපස්සනාව පුරුදු කරන, වඩන, ප්‍රගුණ කරන ඒ යෝගාවචරයාහට සියලු භව-යෝනි-ගති-ස්ථිති-සත්වාවාසයන්හි බිඳෙමින් පවත්නා සංස්කාරයෝ, සුවසේ ජීවත්වනු කැමැති බියසුලු පුරුෂයකුහට සිංහ-ව්‍යාඝ්‍ර-දිවි-වලස්-තරස්-යක්-රකුස්-කුළුහරක්-සැඬ බලු- මද කිපුණු ඇත්-ගොරසප් - සෙන මඬුලු - සුසාන

a. ධ. ප., ලෝකවග්ග

භූමි - රණ භූමි - දිලෙන අඟුරු වළ ආදියෙහි දී මෙන් මහත් බිය උපදවන්නන් ලෙසින් වැටහෙති.

''අතීත සංස්කාරයෝ නිරුද්ධ වූහ, වර්තමාන සංස්කාරයෝ නිරුද්ධ වෙති, අනාගතයෙහි උපදනා සංස්කාරයෝද මෙසේම නිරුද්ධ වන්නාහ'යි දක්නා ඔහුට, මේ අවස්ථාවෙහිදී භයතුපට්ඨාන නම් ඤාණය උපදියි.

මේ එයට උපමා කථා යිඃ- එක්තරා ස්ත්‍රියකගේ පුත්හු තිදෙනාම රාජාපරාධ කාරයෝ වූහ; රජ තෙමේ ඔවුන්ගේ හිස ගසාදැමීමට අණ කළේය; ඕ තොමෝ පුතුන් සමග වධකස්ථානයටද ගියාය; ඉක්බිති (වධකයෝ) ඇයගේ දෙටු පුතාගේ හිස ගසා දමා මද්දුමයාගේ හිස සිඳීම ඇරඹූහ; ඕ තොමෝ වැඩිමහල් පුතාගේ හිස සිඳලූ බවද, මද්දුමයාගේ හිස සිඳිනු ලබන බවද දැක කණිටු පුතුහටද මෙසේම වෙති'යි ඔහු කෙරෙහි ආලය හැරලූය. එහි ඒ ස්ත්‍රියගේ දෙටු පුතු හිස සිඳ ලූබව දැකීම යෝගාවචරයා විසින් අතීත සංස්කාරයන් නිරුද්ධ වූ බව දැකීම බඳුය; මද්දුමයාගේ හිස සිඳිනු දැකීම වර්තමාන සංස්කාරයන් නිරුද්ධ වනු දැකීම බඳුය; මොහුද පළමු දෙදෙනා මෙන්ම වෙති'යි කණිටු පුතු කෙරෙහි ආලය හැරලීම, අනාගතයෙහි උපදනා සංස්කාරයන්ද බිඳී යති'යි එම (ආනාගත) සංස්කාරයන්ගේද නිරෝධ දර්ශනය බඳුය. මෙසේ ඔහුට මේ අවස්ථායෙහිදී භයතුපට්ඨාන ඤාණය උපදියි.

තවද උපමාවෙකිඃ- එක්තරා මියන දරුවන් ඇති ස්ත්‍රියක් දරුවන් දස දෙනකු වැදූය. ඔවුන්ගෙන් නව දෙනෙක් මිය ගියහ; එක් දරුවෙක් අතෙහි මැරෙමින් සිටියි, කුස හොත් තවද දරුවෙකි. ඕ තොමෝ දරුවන් නව දෙනකු මිය ගිය බවද, අත හොත් දසවැන්නා ද මියෙමින් සිටින බවද, දැක කුස හොත්තහු කෙරෙහි වූ ආලය ''මොහුටද මෙසේ වෙති''යි සලකා අත් හළාය. එහි, එම ස්ත්‍රිය දරුවන් නව දෙනකුගේ මරණය සිහි කිරීම එම යෝගියා විසින් අතීත සංස්කාරයන්ගේ නිරෝධය දැකීම බඳුය; අත හොත් දරුවා මියෙමින් සිටිනු දැකීම, යෝගියා විසින් වර්තමාන සංස්කාරයන් දැකීම බඳුය, කුසහොත්තහු කෙරෙහි ආලය හැරීම අනාගත සංස්කාරයන් නිරුද්ධ වනු දැකීම බඳුය. මෙසේ දක්නා එම යෝගියාහට මේ අවස්ථායෙහිදී භයතු පට්ඨාන ඤාණය උපදියි.

භයතුපට්ඨාන ඤාණය බිය දනවාද? නොදනවා ද? නොදනවයි එය වනාහි, 'අතීත වූ සංස්කාරයෝ නිරුද්ධ වූහ, වර්තමාන සංස්කාරයෝ නිරුද්ධ වෙති, අනාගත සංස්කාරයෝද නිරුද්ධ වන්නාහ,'' යනුවෙන් හුදෙක් තීරණ මාත්‍රයක්ම වේ. එහෙයින්, යම් සේ වනාහි ඇස් ඇති පුරුෂයෙක් නගරද්වාරයෙහි අඟුරු වළවල් තුනක් දක්නේ, තෙමේ භය නොවේද, එහෙත්, ඔහුට ''යමකු මෙහි වැටුණහොත්, ඔහු සියල්ලෝම අපමණ දුක් අනුභව කරන්නාහ'' යන තීරණ මාත්‍රයක්ම වේද, නැතහොත්,

යම්සේ වනාහි, ඇස් ඇති පුරුෂයෙක් කිහිරිහුලක්ද, යහුලක්ද, රන්හුලක්ද'යි එක පෙළට තබන ලද හුල් තුනක් දක්නේ, තෙමේ භය නොවේද, එහෙත් ඔහුට, ''යම් කෙනකු මේ හුල් මත වැටුණහොත්, ඔහු සියල්ලෝම නොමඳ වූ දුක් අනුභව කරන්නාහ'' යනුවෙන් හුදු තීරණමාත්‍රයක්ම වේද, එසේම භයතුපට්ඨාන ඤාණය බිය නොදනවයි. ඔහුට, අඟුරු වළවල් තුන බඳු වූද, හුල් තුන බඳු වූද භවත්‍රයයෙහි වූ ''අතීත සංස්කාරයෝ නිරුද්ධ වූහ, වර්තමාන සංස්කාරයෝ නිරුද්ධ වෙති, අනාගත සංස්කාරයෝද නිරුද්ධ වන්නාහ'' යනුවෙන් හුදු තීරණ මාත්‍රයක්ම වේ. යම් හෙයකින් වනාහි ඒ යෝගාවචරයාහට සියලු භව-යෝනි-ගති-ස්ථිති-නිවාසයනට පත්වූ සංස්කාරයෝ ව්‍යසනයට පත්වූවන්, භයසහිත වූවන් ලෙසින් භය වශයෙන් වැටහෙති. එහෙයින් 'භයතුපට්ඨාන' යයි වහරනු ලැබේ.

මේ ආකාරයෙන් ඔහුට භය වශයෙන් වැටහීම දක්වෙන පෙළ මෙසේයි:- ''අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට කුමක් භයවශයෙන් වැටහේද?අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට නිමිත්ත භය වශයෙන් වැටහෙයි; දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නහුට පැවැත්ම භය වශයෙන් වැටහෙයි; අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නහුට නිමිත්ත හා පැවැත්ම යන දෙකම භය වශයෙන් වැටහෙයි.

එහි 'නිමිත්ත' යනු, සංඛාර නිමිත්තයි. අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න සංස්කාරයනට මේ (නිමිත්ත යනු) අධිවචන (පර්යාය) වේ. අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනුයේ වනාහි සංස්කාරයන්ගේ මරණයම දකී; එහෙයින් ඔහුට නිමිත්ත භය වශයෙන් වැටහේ; 'පවත්ත' (පැවැත්ම) යනු, රූප-අරූප භවයන්ගේ පැවැත්මයි, දුඃඛ වශයෙන් මෙනෙහි කරනුයේ වනාහි, සුඛ (සැප යයි) සම්මත පැවැත්මෙහි පවා නිරන්තර ප්‍රතිපීඩනභාවය (නිරතුරු පෙළීම ඇති කරන ස්වභාවය)ම දකියි; එහෙයින් ඔහුට පැවැත්ම භය වශයෙන් වැටහේ; අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ වනාහි මේ (නිමිත්ත-පවත්ත යන) දෙකම, පාලු ගමක් සෙයින්ද, මිරිඟු, ගන්ධබ්බනගර ආදිය මෙන්ද, හිස්ව, මුඩුව, ශූන්‍යව, අස්වාමිකව, අපරිණායකව (කළමනා කරුවකු නැතිව) මෙන් පෙනේ, මෙසේ ඔහුට නිමිත්තද, පැවැත්මද යන දෙකම භය වශයෙන් වැටහේ''[a] යනුයි.

භයතුපට්ඨාන ඤාණය නිමි.

—//—

භයතුපට්ඨාන ඤාණය සේවනය කරන, වඩන, ප්‍රගුණ කරන ඒ යෝගාවචරයාහට සියලු භව-යෝනි-ගති-ස්ථිති-සත්වාවාසයන්හි ආරක්ෂාස්ථානයක්, රැකවරණයක්, යන-එන මඟක්, පිළිසරණක්

a. පටිසම්භිදා පාළි, විමොක්ඛ කථා

නොපෙනේ. සියලු භව-යෝනි-ගති-ස්ථිති නිවාසයනට පැමිණි සංස්කාරයන් අතුරෙන් එකදු සංස්කාරයක් කෙරෙහි පැතුමක් හෝ පරාමර්ශයක් (දෘෂ්ටි වශයෙන් ගැනීමක් නොවේ. භවත්‍රයය ගිනිදල් සිඳුණු අඟුරින් පිරි අඟුරු වළවල් සෙයින්ද, සතර මහාභූත විෂඝෝර සර්පයන් සෙයින්ද, පංචස්කන්ධය කඩු ඔසවා ගත් වධකයන් සෙයින්ද, අභ්‍යන්තර ආයතනසය පාලුගමක් සෙයින්ද, බාහිර ආයතන සය ගම්පහරන සොරුන් සෙයින්ද, විඤ්ඤාණට්ඨිති සතද, සත්වාවාස නවයද එකොළොස් ගින්නෙකින් ඇවිල දිලිසෙන ගිනි ඇති තැන් සෙයින්ද සියලු සංස්කාරයෝ ගඬ සෙයින්ද, ලෙඩ සෙයින්ද, හුල් සෙයින්ද, පාපරෝග සෙයින්ද, ආබාධ සෙයින්ද, ආස්වාද රහිතව, නීරසව, මහදොස් රැසක් වශයෙන් වැටහෙති.

කෙසේද යත්:- සුවසේ ජීවත් වනු කැමැති, බියසුලු පුරුෂයකුට, රමණීය ආකාරයෙන් දිස්වන මූත් වල්සතුන් පිරි වනගහනයක් සෙයින්ද, දිවියන් ගැවසෙන ගුහාවක් සෙයින්ද, කිඹුලන්, රකුසන් සහිත ජලාශයක් සෙයින්ද, කඩු ඔසවා ගත් සතුරන් සෙයින්ද, විස සහිත බොජුනක් සෙයින්ද, සොරුන් ගැවසෙන මගක් සෙයින්ද, ගිනිගත් ගෙයක් සෙයින්ද, යුදට සැරසුණු සේනා සහිත රණ බිමක් සෙයින්ද වැටහෙති. යම් සේ ඒ පුරුෂයා එම වල්සතුන් ගැවසී වනගහනාදියට පැමිණ බියපත්ව, සංවේගයට පත්ව, ලොමු දැහැගෙන, සියලු අතින් ආදීනවම දකියි. එසේම මේ යෝගාවචරයාද භඞ්ගානුපස්සනා වශයෙන් සියලු සංස්කාරයන් භයවශයෙන් වැටහුණු කල්හි, හාත්පසින් නීරස, ආස්වාද රහිත, ආදීනවම දකියි. මෙසේ දක්නා ඔහුට ආදීනව ඤාණය උපන්නේ නම් වේ. එම ඥානය සඳහා කියන ලදිඃ-

''භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඥානය වනුයේ කෙසේද? ඉපැදීම භයෙකැ'යි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඤාණය වේ; පැවැත්ම භයෙකැ'යි -පෙ- නිමිත්ත භයෙකැයි -පෙ- ආයූහනය (කර්ම රැස්කිරීම) භයෙකැ'යි -පෙ-ප්‍රතිසන්ධිය භයෙකැ'යි -පෙ- නිබ්බත්තිය භයෙකැ'යි -පෙ- ජාතිය භයෙකැ'යි -පෙ- ජරාව භයෙකැයි -පෙ- ව්‍යාධිය භයෙකැ'යි -පෙ- මරණය භයෙ'කැයි -පෙ- සෝකය භයෙකැයි -පෙ- වැලපීම භයෙකැ'යි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඤාණය වේ.

''නො-ඉපැදීම ක්ෂේම (අභය) යැ'යි ශාන්ති පද සංඛ්‍යාත නිර්වාණ විෂයයෙහි ඥානයයි - නොපැවැත්ම - පෙ- අනුපායාසය ක්ෂේමයයි, ශාන්ති පදයෙහි ඥානයයි; පැවැත්ම -පෙ-, උපායාසය භයෙකැ'යි, අනුපායාසය ක්ෂේමයයි, ශාන්තිපද විෂයයෙහි ඥානයයි; ඉපැදීම දුකෙකැ'යි යනුවෙන් භයතු පට්ඨානයෙහි ප්‍රඥාව ආදීනව විෂයයෙහි ඥානයයි; නො-ඉපැදීම සැපෙකැ'යි යනුවෙන් ශාන්තිපද විෂයයෙහි

ඥානයයි; නොපැවැත්ම -පෙ- අනුපායාසය සැපෙකැ'යි යනුවෙන් ශාන්තිපද විෂයයෙහි ඥානයයි; පැවැත්ම -පෙ- උපායාසය දුකෙකැ'යිද අනුපායාසය සැපෙකැයිද යනුවෙන් ශාන්තිපද විෂයයෙහි ඥානයයි; ඉපැදීම සාමිෂ (ලෞකික)යයි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනව විෂයයෙහි ඥානයයි; පැවැත්ම -පෙ- උපායාසය සාමිෂයයි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනව විෂයයෙහි ඥානයයි; නො-ඉපැදීම නිරාමිෂයයි යනු ශාන්තිපදයෙහි ඤාණයයි; නොපැවැත්ම -පෙ-, අනුපායාසය නිරාමිෂයයි යනු ශාන්තිපද විෂයයෙහි ඥානයයි; ඉපැදීම සාමිෂයයිද, නො-ඉපැදීම නිරාමිෂය'යි යනු ශාන්තිපද විෂයයෙහි ඥානයයි; පැවැත්ම -පෙ- උපායාසය සාමිෂය, -පෙ- අනුපායාසය නිරාමිෂය'යි යනු ශාන්ති පද විෂයයෙහි ඥානයයි. ඉපැදීම සංස්කාරයයි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඤාණයයි; පැවැත්ම -පෙ- උපායාසය සංස්කාරයයි යනුවෙන් භයතුපට්ඨානයෙහි ප්‍රඥාව ආදීනවයෙහි ඥානයයි; නො-ඉපැදීම නිර්වාණයයි යනු ශාන්තිපදයෙහි ඥානයයි. ඉපැදීම සංස්කාරයයි, නො-ඉපැදීම නිර්වාණයයි යනු ශාන්තිපදයෙහි ඥානයයි; පැවැත්ම -පෙ- උපායාසය සංස්කාරයයි අනුපායාසය නිර්වාණයයි යනු ශාන්තිපදයෙහි ඥානයයි.

"උප්පාදඤ්ච පවත්තඤ්ච නිමිත්තං දුක්ඛන්ති පස්සති,
ආයූහනං පටිසන්ධිං ඤාණං ආදීනවෙ ඉදං.
අනුප්පාදං අප්පවත්තං අනිමිත්තං සුඛන්ති ච
අනායූහන අප්පටිසන්ධි ඤාණං සන්තිපදෙ ඉදං
ඉදං ආදීනවෙ ඤාණං පඤ්චට්ඨානෙසු ජායති,
පඤ්චට්ඨානෙ සන්තිපදෙ දස ඤාණෙ පජානාති.
ද්වින්නං ඤාණානං කුසලතා නානාදිට්ඨීසු නකම්පති."(a)

ඉපැදීමද, පැවැත්මද, නිමිත්තද, ආයූහනයද, ප්‍රතිසන්ධියද දුකෙකැ'යි දකියි; මේ ආදීනවයෙහි ඥානයයි.

නො-ඉපැදීමද, නොපැවැත්මද, අනිමිත්තයද, අනායූහනය හා අප්‍රතිසන්ධියද සැපෙකැ'යි දකියි; මේ ශාන්තිපද නිර්වාණ විෂයයෙහි වූ ඥානයයි.

මේ ආදීනව විෂයයෙහි ඥානය (ඉපැදීම, පැවැත්ම, නිමිත්තය, ආයූහනය හා ප්‍රතිසන්ධියැයි යන) පස් තැනෙහි උපදියි; ශාන්තිපද විෂයයෙහි ඥානයද එසේම පස් තැනෙක්හි උපදිති'යි මේ ආකාරයෙන් මේ දශඥානය දනියි; මේ ඥානද්වයයෙහි කුශලතාව නානාවිධ දෘෂ්ටීන් විෂයයෙහි නොසැලේ.

---

a. පටිසම්භිදා පාළි, ඤාණකථා

දන්නා ලද'යි යන අර්ථයෙන් එය 'ඤාණ' නම්; (අනිත්‍යාදී ත්‍රිලක්‍ෂණය) යථා තත්ත්වයෙන්දනී යන අර්ථයෙන් 'පඤ්ඤා' නම්. එහෙයින් භයතුපට්ඨානයෙහි 'පඤ්ඤා' යයිද ආදීනයෙහි ඤාණ යයිද කියනු ලැබේ.

එහි 'උප්පාද' (ඉපැදීම) යනු, පූර්ව කර්ම හේතුවෙන් මේ භවයෙහි ඉපැදීමයි; 'පවත්ත' (පැවැත්ම) යනු, එසේ උපන්නහුගේ පැවැත්මයි, 'නිමිත්ත' යනු, සියලු සංස්කාරයන් පිළිබඳ නිමිතියි; 'ආයූහන' යනු, මතු ප්‍රතිසන්‍ධියට හේතුවන කර්මයන් රැස්කිරීමයි; 'පටිසන්‍ධි' යනු, මතු භවයෙහි ඉපැදීමයි; 'ගති' යනු, (නිරය ආදී) යම් ගතියෙකින් ඒ ප්‍රතිසන්‍ධිය වේනම් එයයි; 'නිබ්බත්ති' යනු, ස්කන්‍ධයන්ගේ හටගැනීමයි, 'උප්පත්ති' යනු, ''සමාපන්නස්‍ස වා උප්පන්නස්‍ස වා'' (සමන්විත වූවහුගේ හෝ ප්‍රතිසන්‍ධියට පැමිණියහුගේ) යයි කියනලද විපාක ප්‍රවෘත්තියයි. 'ජාති' යනු, ජරා ආදියට හේතු වූ, භව-හේතුවෙන් ඇතිවූ ඉපැදීමයි. ජරාමරණ ආදිය ප්‍රකට වූ අර්ථ ඇත්තේම වේ.

එහි 'උප්පාදය' ආදී කොට ඇති පසම ආදීනව ඥානයට වස්තු වශයෙන් කියන ලදි, සෙසු (ගති, නිබ්බත්ති ආදිය) එකී පසටම පර්යාය වශයෙන් කියන ලදි. 'නිබ්බත්ති', 'ජාති' යන දෙක 'උප්පාද' යන්නටද 'පටිසන්‍ධි' යන්නටද පර්යාය වේ, 'ගති', 'උප්පත්ති' යන මෙ දෙක 'පවත්ත' (පැවැත්ම) යන්නටද, 'ජරා' ආදිය 'නිමිත්ත' යන්නටද පර්යාය වේ. එහෙයින් කීහු:-

උප්පාදඤ්ච පවත්තඤ්ච නිමිත්තං දුක්ඛන්ති පස්සති,
ආයූහනං පටිසන්‍ධිං ඤාණං ආදීනවෙ ඉදං තිච
ඉදං ආදීනවෙ ඤාණං පඤ්ච ඨානෙසු ජායතී'තිච

ඉපැදීමය, පැවැත්මය, නිමිත්තය, ආයූහනය, ප්‍රතිසන්‍ධිය'යි යන මේ පස ආදීනවයෙහි ''ඤාණ'' යයිද, මේ ආදීනවයෙහි ඥානය මෙකී පස් තන්හි උපදිති'යි යනුයි.

''අනුප්පාදය (නො-ඉපැදීම) ක්‍ෂේමයයි, ශාන්තිපදයෙහි ඥානයයි'' යන ආදිය වනාහි ආදීනව ඥානයට ප්‍රතිපක්‍ෂ ඥානය දක්වනු සඳහා කියන ලදි. නැතහොත්, භයතුපට්ඨානයෙන් ආදීනව දැක කලකිරුණ සිත් ඇත්තවූනට, 'ආදීනවයන්ගෙන් තොරවූ, ක්‍ෂේම වූ අභය භූමියක්ද ඇතැ'යි ආස්වාද ඉපැදවීම පිණිසද මෙසේ කියන ලදි. යම් හෙයකින් වනාහි ඒ යෝගාවචරයාහට ඉපැදීම් ආදිය භය වශයෙන් මනාසේ වැටහී සිටීද, ඔහුගේ සිත එහි ප්‍රතිපක්‍ෂයට නැඹුරුව සිටීද, එහෙයින් භයතුපට්ඨාන වශයෙන් සිද්ධවූ ආදීනව ඤාණයෙහි ආනිසංස දක්වනු පිණිසද මෙය කියන ලද'යි දතයුතුය.

මෙහි, යමක් 'භය' වේද, එය ස්වභාව වශයෙන්ම 'දුඃඛ' ද වේ. එය වට්ටාමිස-ලෝකාමිස-කිලෙසාමිසයන්ගෙන් නොමිදුණ හෙයින් 'සාමිස'ම

වේ; යමක් සාමිස වේද, එය සංස්කාර මාත්‍රයක්ම වේ; එහෙයින් ''ඉපැදීම දුකෙකැ'යි යන භයතුපට්ඨානපඤ්ඤාව ආදීනවයෙහි 'ඤාණ'යයි'' යන ආදිය කියනලදි. එතෙකුදු වූවත්, භයාකාරයෙන්ද, දුඃඛාකාරයෙන්ද, සාමිෂාකාරයෙන්දැ'යි මෙසේ ආකාර නානත්වයෙන් මෙහි පැවතුම් වශයෙන්ම නානත්වය දතයුතුය.

''දස ඤාණෙ පජානාති'' (ඥාන දසයක් දනිති'යි) යනු, ආදීනවඤාණය දන්නේ උත්පාදාදීවූ වස්තු පසක්ද, අනුත්පාදාදී වූ වස්තු පසක්දැ'යි දශඥානයක් මනා කොට දනියි, ප්‍රතිවේධ කරයි, සාක්‍ෂාත් කරයි. ''ද්වින්නං ඤාණානං කුසලතා'' (ද්විවිධ ඥානවිෂයයෙහි කුශලතා) යනු, ආදීනව ඤාණයද, සන්තිපද ඤාණයදැ'යි යන මේ දෙකෙහිම කුශල වූ හෙයිනි; ''නානාදිට්ඨීසු නකම්පති'' (නානා දෘෂ්ටිවිෂයයෙහි නොසැලේ) යනු, 'පරම දෘෂ්ටධර්ම නිර්වාණ' ආදී වශයෙන් පැවැති දෘෂ්ටීන් කෙරෙහි නොසැලේ. මෙහි සෙසු පද ප්‍රකට වූ අරුත් ඇත්තේම වේ.

ආදීනවානුපස්සනා ඤාණය නිමි.

—//—

මෙසේ ඒ යෝගාවචර තෙමේ සියලු සංස්කාරයන් ආදීනව වශයෙන් දකිනුයේ සියලු භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති සත්වාවාසයනට පත් ප්‍රභේද සහිත එම සංස්කාරයන් කෙරෙහි කලකිරෙයි, උකටලී වෙයි, නො-ඇලෙයි. යම්සේ වනාහි චිත්‍රකූට පර්වත පාදයෙහි ඇලුණු ස්වර්ණ හංස රාජයෙක් තෙමේ සැඩොල් ගම් දොරක පිහිටි කසවළෙක නො-ඇලේද, මහ විල් සත වෙතම ඇලේද, එසේම මේ යෝගී නමැති රාජහංසයාද මනාකොට දුටු ආදීනව සහිත ප්‍රභේද ඇති සංස්කරයන් කෙරෙහි නො-ඇලෙයි; භාවනාවෙහි ඇලුණු හෙයින් භාවනාරතියෙන් සමන්විතව අනුපස්සනා සතෙහිම ඇලෙයි. යම්සේ රන් මැදිරියෙක දමනලද සිංහ රාජයෙක් එහි නො-ඇලේද, තුන්දහස් යොදුන් විතර ඇති හිමවතෙහිම ඇලේද, එසේ මේ යෝගී නමැති සිංහරාජයාද ත්‍රිවිධ වූ සුගති භවයෙහි පවා නො-ඇලෙයි; ත්‍රිවිධ අනුපස්සනාවන්හිම ඇලෙයි. යම්සේ සර්වාංග ධවලවූ සත් තැනෙකින් පොළොව ස්පර්ශ කෙරෙන, සෘද්ධිමත්, ආකාශගාමී ඡද්දන්ත හස්ති රාජයෙක් නගරමධ්‍යයෙක්හි නො-ඇලේද, හිමවත්හි ඡද්දන්ත විල වෙතම ඇලේද, එසේම මේ යෝගී නමැති උතුම් හස්තියාද කිසිම සංස්කාරයක් කෙරෙහි නො-ඇලෙයි. ''අනුප්පාදො ඛෙමං'' (නො-ඉපදීම ක්ෂේමයයි) යනුවෙන් ආදී නයින් දක්වන ලද ශාන්ති පදයෙහිම ඇලෙයි; එම ශාන්තිපදය වෙතම නැඹුරු වූ, එය වෙතම බරවූ, එය වෙතටම නැමුණු සිත් ඇත්තෙක් වේ.

නිබ්බිදානුපස්සනා ඤාණය නිමි

—//—

ඒ නිබ්බිදානුපස්සනා ඥාණය පළමු කී ඥාණ ද්වයය හා සමග අර්ථයෙන් එක සමාන වේ. එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:- ''එක්ම භයතුපට්ඨාන ඥාණය නම් තුනක් ලබයි,'සියලු සංස්කාරයන් භය වශයෙන් දුටහ'යි භයතුපට්ඨාන නම්විය; එම සංස්කාරයන් කෙරෙහිම ආදීනවයන් උපදිති'යි ආදිනවානුපස්සනා නම් විය; එම සංස්කාරයන් කෙරෙහිම කලකිරීම උපන්හ'යි නිබ්බිදානුපස්සනා නම් විය.'' පෙළෙහිද කියන ලදි:- ''භයතුපට්ඨානයෙහි යම් ප්‍රඥාවක් වේද, යම් ආදීනවයෙක්හි ඥාණයක් වේද, යම් නිබ්බිදානුපස්සනා ඥානයක් වේද, මේ ධර්මයෝ සමානාර්ථවත් වෙති, හුදෙක් ව්‍යංජන (අක්‍ෂර) වශයෙන්ම විවිධ වෙති''[a] යනුවෙනි.

මේ නිබ්බිදා ඥාණයෙන් කලකිරෙන, උකටලී වන නො-ඇලෙන මේ කුලපුත්‍රයාගේ සිත සියලු භව-යෝනි-ගති-විඤ්ඤාණට්ඨිති, සත්ත්වාවාසයනට ඇතුළත්, ප්‍රභේද සහිත සංස්කාරයන් අතුරෙන් කිසිදු සංස්කාරයෙක්හි නොරැඳේ, නොලැඟේ, නොබැඳේ, සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැත්තේ, දුරුවනු කැමැත්තේ වෙයි. කුමක් මෙන්ද යත්:- යම්සේ වනාහි දැලක් තුල හසුවූ මසෙක්, සර්පමුඛයට පත් මැඩියෙක්, මැදිරියෙක ලූ වලි කුකුලෙක්, දැඩි මළ පුඩුවක හිර වූ මුවෙක්, අහිගුණ්ඨිකයකු අතට පත් නයෙක්, මහ වගුරෙක වැටුණු ඇතෙක්, ගුරුළු මුවට පත් නාරජෙක්, රාහුමුඛයට පත් සඳ, සතුරන් විසින් වට කරන ලද පුරුෂයෙක්දැ'යි මේ ආදී වූ ඒ ඒ තැනින් මිදෙනු කැමැත්තාහු, ඉවත් වනු කැමැත්තාහු වෙත්ද, එසේම ඒ යෝගියාගේ සිත සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැත්තේ, දුරු වනු කැමැත්තේ වෙයි. ඉක්බිති, මෙසේ සියලු සංස්කාරයන් කෙරෙහි ඇලුම් දුරු කළ, සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැති ඔහුට 'මුඤ්චිතුකම්‍යතා ඥාණය' උපදියි.

මුඤ්චිතුකම්‍යතා ඥාණය නිමි.

—//—

මෙසේ ඒ යෝගාවචර තෙමේ, සියලු භව-යෝනි-ගති-ස්ථිත-නිවාසගතවූ, ප්‍රභේද සහිත වූ සංස්කාරයන් කෙරෙන් මිදෙනු පිණිස, නැවතත් එම සංස්කාරයන්ම, පටිසඞ්ඛානුපස්සනා ඥාණයෙන් ත්‍රිලක්‍ෂණයට නගා විග්‍රහ කෙරෙයි; හේ තෙමේ සියලු සංස්කාරයන් අනිත්‍යාදී ත්‍රික (ත්‍රිලක්‍ෂණ) වශයෙන්, තාවකාලික වශයෙන්, ඉපදීම-නැසීයාම යන දෙකින් පිරිසුන් සෙයින්, විනාශ වන සෙයින්, සසල වන සෙයින්, බිඳෙන සුලු සෙයින්, නොතිර වූ සෙයින්, සඞ්ඛත (කෘත්‍රිම) වූ සෙයින්, මරණ ස්වභාව ඇති සෙයින්දැ'යි යන ආදී කරුණු හෙයින් අනිත්‍යයයි දකියි.

---

a. පට්ඨාන පාළි, විමොක්ඛ කථා

නිරතුරුව පෙළන සුලු හෙයින්ද, ඉවසීම දුෂ්කර වූ හෙයින්ද, දුකට වස්තු වන හෙයින්ද, රෝගයක් සෙයින්ද, ගඬක් සෙයින්ද, හුළක් සෙයින්ද, පාප රෝගයක් සෙයින්ද, ආබාධයක් සෙයින්ද, අන්තරායයක් සෙයින්ද, උපද්‍රවයක් සෙයින්ද, බියක් සෙයින්ද, විපතක් සෙයින්ද, ආරක්ෂාරහිතයක් සෙයින්ද, රැකවරණ රහිතයක් සෙයින්ද, සරණ නොවන්නක් සෙයින්ද, ආදීනවයක් සෙයින්ද, පාපයට මුල්වන්නක් සෙයින්ද, වධකයකු සෙයින්ද, සාශ්‍රවයක් සෙයින්ද, මාරාමිෂයක් (කෙලෙස් බිළියක්) සෙයින්ද, ජාතිස්වභාව සෙයින්ද, ජරාස්වභාව සෙයින්ද, ව්‍යාධි ස්වභාව සෙයින්ද, ශෝක ස්වභාව සෙයින්ද, සංක්ලේශ ස්වභාව සෙයින්දැ'යි යන ආදී කරුණු අනුව දුඃඛ යයි දකියි.

උපද්‍රව හෙයින්, දුර්ගන්ධ හෙයින්, ජුගුප්සා (සඟවනු රිසි) වන හෙයින්, පිළිකුල් වන හෙයින්, අලංකරණයට යෝග්‍ය නොවන හෙයින්, විරූප වන හෙයින් හා බීභත්ස (වලකනු රිසි) වන හෙයින්දැ'යි යන ආදී කරුණු අනුව දුඃඛ ලක්ෂණයට පිරිවර වූ අශුභ වශයෙන් දකියි.

පර (තමා සතු නොවන) හෙයින්, හිස් වූ හෙයින්, තුච්ඡ (අගයක් නැති) හෙයින්, ශූන්‍යවූ හෙයින්, අස්වාමික වූ හෙයින්, ඊශ්වරරහිත වූ හෙයින්, වශයෙහි පැවැත්විය නොහැකි හෙයින්දැ'යි යන ආදී කරුණු අනුව අනාත්ම වශයෙන් දකියි. මෙසේ දක්නා ඔහු විසින් සංස්කාරයෝ ත්‍රිලක්ෂණයට නඟා විග්‍රහකරන ලද්දාහු නම් වෙති.

කවර හෙයින් මේ යෝගියා මෙසේ මේ සංස්කාරයන් විග්‍රහ කෙරේද? මිදෙනු සඳහා උපාය සම්පාදනය පිණිසයි. මේ එයට උපමායි:- එක්තරා පුරුෂයෙක් තෙමේ මසුන් අල්වන්නෙමි'යි කෙමිනක් ගෙන දියෙහි බහාලීය. හේ තෙමේ කෙමිනෙහි කටින් අත දමා ජලය තුළින් සර්පයකු ගෙලෙන් ගෙන, මවිසින් මසෙක් අල්වා ගන්නා ලද්දේ වනැයි සතුටු විය; හේ තෙමේ, 'මට මහ මසෙක් ලැබිණැ'යි ඔසවා බලනුයේ සෝවැති තුන දැක, සර්පයෙකැ'යි හැඳින, බිය පත්ව, ආදීනව දැක, (සපකු) ගැනීමෙහි කලකිරී, මිදෙනු කැමැතිව, මිදෙනු පිණිස උපායයක් යොදනුයේ, නගුට අග පටන් අතෙහි වෙළීම් හරවා, අත ඔසවා දෙතුන් වරක් හිස වට සිසාරවා, සර්පයා දුර්වල කොට 'යව, දුෂ්ට සර්පය'යි විසිකොට වහා වෑ-ඉවුරට නැඟී, 'ඒකාන්තයෙන් මහා සර්පයකු මුවින් මිදුණෙමි'යි ආ මග බලමින් සිටියේය.

එහි, මේ යෝගියා මුලින් ආත්මභාවය ලැබ සතුටු වූ කාලය, ඒ පුරුෂයා මත්ස්‍යයෙකැ'යි සර්පයා ගෙලෙන් ගෙන සතුටු වූ කාලය වැනිය; මේ යෝගාවචරයා ඝනීභූතව පැවැති සංස්කාරයන් විග්‍රහ කොට එහි ත්‍රිලක්ෂණය දැකීම, ඒ පුරුෂයා කෙමින කටින් හිස ඉවතට ගෙන සෝවැති තුන දැකීම වැනිය; මේ යෝගියාගේ භයතුපට්ඨාන ඤාණය ඒ පුරුෂයා

බියපත් වූ කාලය වැනිය; ඉක්බිති ආදීනවානුපස්සනා ඤාණය ඒ පුරුෂයාගේ ආදීනව දැකීම වැනිය; නිබ්බිදානුපස්සනා ඤාණය ඒ පුරුෂයා සර්පයකු ගැනීමෙන් කලකිරීම වැනිය; මුඤ්චිතුකම්‍යතා ඤාණය සර්පයා මුදා හැරීමට කැමැති වීම වැනිය; (යෝගියා විසින්) පටිසංඛානුපස්සනා ඤාණයෙන් සංස්කාරයන් කෙරෙහි ත්‍රිලක්‍ෂණය ආරෝපණය කිරීම සර්පයා මුදාහැරීම පිණිස උපාය යෙදීම වැනිය; යම් සේ වනාහි ඒ පුරුෂයා සර්පයා හිස වට සිසාරවා දුර්වල කොට නැවත, දෂ්ට කළ නොහැකි බවට පමුණුවා මනා සේ මිදේද, එසේම මේ යෝගාවචරයාද ත්‍රිලක්‍ෂණා රෝපණයෙන් සංස්කාරයන් විග්‍රහ කොට, නැවතත් නිත්‍ය-සුඛ-ශුභ-ආත්ම ආකාරයෙන් වැටහෙනු නොහැකි බවට පත් කොට මනා සේ එයින් මිදේ. එහෙයින් ''මිදෙනු පිණිස උපාය යෙදීම සඳහා මෙසේ පරිග්‍රහ කෙරෙයි'' යනුවෙන් කියන ලදී.

මෙතෙකින් ඒ යෝගාවචරයාහට පටිසඞ්ඛා ඤාණය උපන්නේ වේ; එම පටිසඞ්ඛා ඤාණය සඳහා කියනලදීː- අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට කුමක් නුවණින් බැලීමෙන් ඤාණය උපදීද? දුඃඛ වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නහුට කුමක් නුවණින් බැලීමෙන් ඤාණය උපදීද? අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට නිමිත්තය නුවණින් බලන විට ඤාණය උපදියි; දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නහුට පැවැත්ම නුවණින් බැලීමෙන් ඤාණය උපදියි; අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නහුට නිමිත්ත මෙන්ම පැවැත්මද නුවණින් බැලීමෙන් ඤාණය උපදියි.[a]

'තවද මෙහි ''නිමිත්තං පටිසඞ්ඛා (නිමිත්තය නුවණින් බලා) යනු, සංස්කාර නිමිත්තය 'අනිත්‍යය, තාවකාලිකය'යි අනිත්‍යලක්‍ෂණ වශයෙන් දැනැ'යි (යන අර්ථයි). ඒකාන්තයෙන් පළමුකොට දැනගැනීමෙන් අනතුරුවම ඤාණය උපදීද? ව්‍යවහාර වශයෙන් වනාහි 'මනඤ්ච පටිච්ච ධම්මෙච උප්පජ්ජති මනො විඤ්ඤාණං'' (සිතද, ධර්මාලම්බනයන්ද නිසා මනෝ විඥ්ඥාණය උපදියි) යන ආදිය මෙන් මෙසේ කියනු ලැබේ; නොහොත්, පූර්ව පශ්චිම ක්‍රියා දෙකම එක් කොට ඒකත්ව නයින් මෙසේ මෙසේ කියන ලදැයි දතයුතුය. මෙනයින්ම (දුඃඛ, අනාත්ම යන) සෙසු පද දෙකෙහි අර්ථයද දතයුතුය.

පටිසංඛානුපස්සනා ඤාණය නිමි

—//—

ඒ යෝගාවචර තෙමේ, පටිසඞ්ඛානුපස්සනා ඤාණයෙන් සියලු සංස්කාරයන් ශූන්‍යයහ'යි විනිශ්චය කොට, යලිදු ආත්ම වශයෙන් හෝ

a. පට්ඨානපාළි, විමොක්ඛ කථා.

වේවයි, ආත්මික (ආත්මයට අයත් කිසිවක්) වශයෙන් හෝ වේවයි, ශූන්‍යයහ'යි ද්වි කෝටික (කෙළවර දෙකක්) වශයෙන් ගෙන ශූන්‍යතාව විග්‍රහ කරයි. හේ තෙමේ ආත්මයක් හෝ ආත්මයට අයත් සේ ගත හැකි අන් කිසිවක් හෝ නොදක, යලිදු, ''නාහං ක්වචනි, කස්සචි කිඤ්චනතස්මිං, නච මම ක්වචනි, කිස්මිං චි කිඤ්චනතා අත්ථි'' (මම කිසි තැනෙක නෙවෙමි, කිසිවකුගේ කිසිවක් වශයෙන් හෝ නොවෙමි, තවද මාගේ (මාහට අයත්) කිසිවක් තුළ, කිසිවකු සතු කිසිවක් හෝ නැත) යනුවෙන් මෙහි යම් චතුකෝටික (කෙළවර සතරක් ඇති) ශූන්‍යතාවක් කියන ලදද, එය අනුව පරිග්‍රහ කරයි. කෙසේද?:-

මේ යෝගාවචර තෙමේ, ''නාහං ක්වචනි'' (මම කිසිදු තැනෙක නොවෙමියි) යනුවෙන් ආත්මයක් නොදකැ'යි කී නියායි, ''කස්සචි කිඤ්චනතස්මිං'' (කිසිවකුගේ කිසිවක්, ලෙසින් එළවිය හැකි කිසිවක්) නොදකිති'යි කී නියායි. සොහොවුරෙකැ'යි හැඟීමෙන් සොහොවුරකු වශයෙන් හෝ, මිතුරෙකැ'යි හැඟීමෙන් මිතුරකු වශයෙන් හෝ පරිෂ්කාර (පරිභෝගභාණ්ඩ) යෙකැ'යි හැඟීමෙන් එළවිය හැකි කිසිවක් නොදකිති'යි යන අර්ථයි; ''නච මම ක්වචනි'' (මට අයත් කිසිවක් කිසි තැනෙකවත් නැත) යන මෙහි 'මම' යන පදය (මොහොතකට) ඉවත් කොට, ''නච ක්වචනි'' අනිකකුගේ ආත්මයක් හෝ කිසිදු තැනෙක නොදකිති'යි යන අර්ථයි; ඉක්බිති 'මම' යන පදය නැවත පමුණුවා, ''(නච) මම කිස්මිං චි කිඤ්චනතත්ථි'' යනුවෙන් ඔහු අනෙකෙකුගේ ආත්මය තමාගේ කිසිවක් තුළ කිසිවක් වශයෙන් එළවියහැකි කිසිවක් නොදනිති'යි, තමාගේ සොහොවුරෙකැ'යි හැඟීමෙන් සොහොවුරකු වශයෙන් හෝ, මිතුරෙකැ'යි යන හැඟීමෙන් මිතුරකු වශයෙන් හෝ පරිෂ්කාරයෙකැ'යි හැඟීමෙන් පරිෂ්කාරයක් වශයෙන් හෝ මේ කවර ආකාරයෙකින් හෝ අනෙකෙකුගේ ආත්මයක් මෙකී කිඤ්චන භාවයෙන් (කිසිවෙකැයි යන හැඟීමෙන්) එළවිය හැකි දෙයක් නොදනිති'යි යන අර්ථයි. මෙසේ මේ යෝගාවචර තෙමේ, යම් හෙයකින්,

මෙසේ මේ යෝගාවචර තෙමේ, කිසිදු තැනෙක (i) තමාගේ ආත්මයක් නොදකීද, (ii) පරහට අයත් කිසිවක් වශයෙන් දැක්විය හැකි එවන් ආත්මයක් හෝ නොදකීද, (iii) පරහට අයත් ආත්මයක් හෝ කිසිදු තැනෙක නොදකීද, (iv) තමාගේ (සොහොවුරු ආදී) කිසිවෙකැ'යි දැක්විය හැකි පරහට අයත් ආත්මයක් හෝ නොදකීද, එහෙයින් ඔහු විසින් මේ චතුෂ්කෝටික (සිවුකොන්) ශූන්‍යතාව පරිග්‍රහ කරන ලද්දේ වේ.

මේ ආකාරයෙන් චතුෂ්කෝටික ශූන්‍යතාව පරිග්‍රහණය කොට, යලිදු, ස-අයුරෙකින් ශූන්‍යතාව පරිග්‍රහණය කරයි; කෙසේද? චක්ඛු (හෙවත් ඇස) i. ආත්ම වශයෙන්, ii. ආත්මයට අයත් වූවක් වශයෙන්, iii. නිත්‍ය ස්වභාව වශයෙන්, iv. ස්ථිර ස්වභාව වශයෙන්, v. ශාස්වත ස්වභාව

වශයෙන්, vi. විපරිණාම නොවන ස්වභාව වශයෙන් ශුන්‍ය වේ; -පෙ- මනස -පෙ- ශුන්‍ය වේ; රූප -පෙ- ධර්මයෝ -පෙ- ශුන්‍ය වෙති; චක්ඛු විඤ්ඤාණය -පෙ- මනෝ විඤ්ඤාණය, චක්ඛු සම්ඵස්සය ශුන්‍ය වේ; යන මේ පිළිවෙළින් 'ජරාමරණ' පදය තෙක් මේ ක්‍රමය ගෙනයා යුතුය.

මේ ආකාරයෙන් ස-අයුරෙකින් ශුන්‍යතාව පරිග්‍රහණය කොට, යලි අට අයුරෙකින් පරිග්‍රහණය කරයි; කෙසේද යත්:- රූපය, i. නිත්‍ය සාරත්වයෙන්, ii. ස්ථිරසාරත්වයෙන්, iii. සුඛසාරත්වයෙන්, iv. ආත්ම සාරත්වයෙන්, v. නිත්‍ය භාවයෙන්. vi. ස්ථිරභාවයෙන්, vii. ශාස්වත භාවයෙන්, viii. අවිපරිණාමධර්ම ස්වභාවයෙන් අසාර වේ; සාරයක් නැත්තේ වේ, සාරත්වයෙන් තොර වේ, -පෙ- වේදනාව -පෙ- සඤ්ඤාව -පෙ- සංඛාරය -පෙ- විඤ්ඤාණය -පෙ- චක්ඛු හෙවත් ඇස -පෙ- ජරාමරණය අසාර වේ. සාරයක් නැත්තේ වේ, සාරත්වයෙන් තොර වේ. නිත්‍ය සාරත්වයෙන් -පෙ- අවිපරිණාම ධර්ම වශයෙන් (විපරිණාම ධර්මයට අයත්වන හෙයින්) අසාර වේ, සාරයක් නැත්තේ වේ; සාරත්වයෙන් තොර වේ. බටගසක් සෙයින්, අසාර වේ, සාරයක් නැත්තේ වේ, සාරත්වයක් නැත්තේ වේ, සාරත්වයෙන් තොර වේ. එරඬු ගසක් සෙයින් -පෙ-, දිඹුල් ගසක් සෙයින් -පෙ-, හෙළ වරා ගසක් සෙයින් -පෙ-, එරබදු ගසක් සෙයින් -පෙ-. පෙන පිඩක් සෙයින් -පෙ- දියබුබුලක් සෙයින් -පෙ-, මිරිඟුවක් සෙයින් -පෙ-, කෙසෙල් කඳක් සෙයින් -පෙ-, මායාවක් සෙයින් -පෙ-, අසාර වේ, සාරයක් නැත්තේ වේ, සාරත්වයෙන් තොර වේ. එසේම රූපය -පෙ- ජරාමරණය අසාර වේ, සාරයක් නැත්තේ වේ, සාරත්වයෙන් තොර වේ. නිත්‍යසාරත්වයෙන් වේවයි, -පෙ- අවිපරිණාම ධර්ම ස්වභාවයෙන් වේවයි, අසාර වේ -පෙ- සාරත්වයෙන් තොර වේ.

ඒ යෝගාවචර තෙමේ මෙසේ අට අයුරෙකින් ශුන්‍යතාව පරිග්‍රහණය කොට යලිදු දස අයුරෙකින් පරිග්‍රහණය කෙරේ. කෙසේද? රූපය හිස්වූවක් ලෙසින්, නිසරු වූවක් ලෙසින්, ශුන්‍යයක් ලෙසින්, අනාත්ම වූවක් ලෙසින්, අස්වාමිකයක් ලෙසින්, අකාමකාර්යයක් (නොකැමැති වැඩක්) ලෙසින්, නොලද හැක්කක් ලෙසින්, වශයෙහි නොපවත්නක් ලෙසින්, තමා සතු නොවන්නක් ලෙසින්, කිසිවකු සතු නොවන්නක් ලෙසින් යන මේ දස ආකාරයෙන් බලයි; වේදනාව -පෙ- විඤ්ඤාණය හිස් වූවක් -පෙ- කිසිවකු සතු නො-වූවක් ලෙසින්, දිකිති'යි මෙසේ දස ආකාරයෙකින් ශුන්‍යතාව පරිග්‍රහණය කොට,

යලිදු දොළොස් ආකාරයෙකින් පරිග්‍රහණය කෙරේ. කෙසේද? "රූපය සත්වයෙක් නොවේ, ජීවියෙක් නොවේ, මනුෂ්‍යයෙක් නොවේ, මානවයෙක් ද නොවේ, ස්ත්‍රියක් ද නොවේ, පුරුෂයෙක් ද නොවේ, ආත්මය ද නොවේ, ආත්මයට අයත් වූවක් ද නොවේ, මම ද නොවෙමි, මා සතු වූවක් ද නොවේ, අනෙකකු සතු වූවක් ද නොවේ, කිසිවකු සතු

වූවක් හෝ නොවේ. වේදනාව -පෙ- විඤ්ඤාණය -පෙ- සත්‍වයෙක් නොවේ -පෙ- කිසිවකු සතු වූවක් හෝ නොවේ,'' යනුවෙන් මෙසේ දොළොස් ආකාරයෙකින් ශූන්‍යතාව පරිග්‍රහණය කොට,

යලිදු, තීරණ පරිඥා (පූර්ණ අවබෝධයෙන්) වශයෙන් මෙසේ දෙසාළිස් ආකාරයෙකින් ශූන්‍යතාව පරිග්‍රහණය කෙරේ;- රූපය අනිත්‍යවූවක් ලෙසින්, දුඃඛයක්, ලෙඩක්, ගඩක්, හුලක් (පිළිකාවක්) පාපරෝගයක්, ආබාධයක්, තමාසතු නොවන්නක්, විනාශ වන්නක්, අන්තරායයක්, උපද්‍රවයක්, භයක්, විපතක්, සසල වූවක්, බිඳෙන සුලු වූවක්, අස්ථිර වූවක්, ආරක්‍ෂා රහිත වූවක්, රැකවරණ රහිත වූවක්, සරණ නොවූවක්, අසරණ බවට පත්වීමක්, නිසරු වූවක්, හිස් වූවක්, ශූන්‍යයක්, ආත්ම නොවන්නක්, ආස්වාද රහිතයක්, ආදීනවයක්, විපරිණාම ධර්මයක්, අසාර වූවක්, පාපයට මුලක්, වධකයකු, විනාශයක්, ආශ්‍රව සහිතයක්, සංස්කාරයක්, මාරයාගේ ඇමක්, ජාති ස්වභාවයක්, ජරා ස්වභාවයක්, ව්‍යාධි ස්වභාවයක්, මරණ ස්වභාවයක් ලෙසින්, සෝක-පරිදේව-දුක්ඛ-දෝමනස්ස-උපායාස ස්වභාවයක් ලෙසින්, හටගැනීමක්, අවරට යාමක්, විසිර යාමක් ලෙසින්, දකියි. වේදනාව -පෙ- විඤ්ඤාණය -පෙ- අනිත්‍ය වූවක් ලෙසින් -පෙ- දකියි.

මෙසේද කියන ලදිඃ ''රූපං අනිච්චතො -පෙ- නිස්සරණතො පස්සන්තො සුඤ්ඤතො ලොකං අවෙක්ඛති; වෙදනං -පෙ- විඤ්ඤාණං අනිච්චතො -පෙ- නිස්සරණතො පස්සන්තො සුඤ්ඤතො ලොකං අවෙක්ඛති. (රූපය අනිත්‍ය වශයෙන් -පෙ- නිස්සරණ වශයෙන් බලනුයේ ලෝකය ශූන්‍යයක් ලෙසින් බලයි. වේදනාව -පෙ- විඤ්ඤාණය -පෙ- ශූන්‍ය විලසින් බලයි.

සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා,
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සතී'[a]ති

මෝඝරාජය, සැම කල්හි සිහි ඇතිව ලෝකය ශූන්‍යයක් ලෙසින් බලව, මෙසේ ආත්මදෘෂ්ටිය හැර, මාරයා ඉක්මවන්නෙක් වන්නේය. මෙසේ ලෝකය දෙස බලන්නා මෘත්‍යුරාජයා (මාරයා) හට නොපෙනේ.

මෙසේ ශූන්‍ය වශයෙන් දැක, ත්‍රිලක්‍ෂණයට නඟා සංස්කාරයන් පරිග්‍රහණය කරනුයේ බියද, නන්දිරාගයද දුර හැර සංස්කාරයන් කෙරෙහි උදාසීනයකු, මධ්‍යස්ථයකු බවට පත් වෙයි; 'මම' යයි හෝ මාගේ යයි නොගනියි; භාර්යාව අත් හළ පුරුෂයකු සෙයිනි.

---

a. චූල නිද්දේස, මෝඝරාජ මානවක පුච්ඡා

යම්සේ වනාහි පුරුෂයකුහට ඉෂ්ට වූ ප්‍රියමනාප වූ භාර්යාවක් වේද, හේ තෙමේ මොහොතකුදු ඇයගෙන් වෙන් වී සිටිනු නොහැකි වන්නේය; ඇය කෙරෙහි බොහෝ සෙයින් ඇලුම් කරන්නේය; හෙතෙමේ ඒ ස්ත්‍රිය අන් පුරුෂයකු සමග සිටිනු හෝ හිඳිනු හෝ, තෙපලනු හෝ සිනාසෙනු දුටහොත්, කුපිතව නොසතුටට පත්ව ඉතා දොම්නසක් විඳින්නේය; පසු කලෙක ඇයගේ දොසක් දැක වෙන් වනු කැමැතිව ඇය අත් හරින්නේය; ඇය තමාගේ බිරිය ලෙස නොසලකන්නේය; එතැන් පටන් ඇය යම් කිසිවකු සමග කිසිවක් කරනු දුටු විට පවා නොකිපෙන්නේය, දොම්නසට පත් නොවන්නේය, ඒකාන්තයෙන්ම උදාසීන වන්නේය, මධ්‍යස්ථ වන්නේය. එසේම මේ යෝගාවචරයා සියලු සංස්කාරයන් කෙරෙන් මිදෙනු කැමැතිව පටිසංඛානුපස්සනාව මගින් සංස්කාරයන් පරිග්‍රහණය කරනුයේ, 'මම'ය, 'මාගේ' යයි ගතහැකි දෙයක් නොදැක, බියද, නන්දි-රාගයද හැර, සියලු සංස්කාරයන් කෙරෙහි උදාසීන වන්නේය, මධ්‍යස්ථ වන්නේය.

මෙසේ දැන මෙසේ දක්නා ඒ යෝගාවචරයාගේ සිත භවත්‍රයයෙහිද, චතුර්යෝනියෙහිද, පංච ගතියෙහිද, සප්ත විඥානස්ථිතියෙහිද, නව සත්ත්වාවාසයෙහිද හැකිලෙයි, පැතිරෙයි, ආපසු හැරෙයි, නොපැතිරෙයි; උපේක්ෂාව හෝ පිළිකුල් බවම සුපිහිටයි. යම්සේ වනාහි, මඳක් නැඹුරුවූ නෙළුම් කොළයෙක දියබිඳු හැකිලේද, පැකිලේද, ආපසු හැරේද, නොපැතිරේද, එසේම -පෙ-; යම් සේ වනාහි කුකුළු පිහාටුවක් හෝ නහර වැලක් හෝ ගින්නෙහි බහා ලූ කල, හැකිලේද, පැකිලේද, ආපසු හැරේද, නොපැතිරේද, එසේම ඒ යෝගාවචරයාගේ සිත භවත්‍රයයෙහිද -පෙ- උපේක්ෂාව හෝ පිළිකුල් බවම හෝ සුපිහිටයි. මෙසේ ඔහුට සංඛාරුපෙක්ඛා ඥාණය උපන්නේ නම් වේ.

ඉදින් එම සංඛාරුපෙක්ඛා ඥාණය ශාන්තිපද නිර්වාණය ශාන්ත ලෙස දකී නම් සියලු සංසාර වෘත්තය හැර නිර්වාණයටම පිවිසේ; නිර්වාණය ශාන්ත වශයෙන් නොදකිතොත් නැවත නැවතත් සංස්කාරයන් අරමුණු කොට ගෙනම පවතී. සාමුද්‍රික වෙළඳුන්ගේ දිසාකාකයකු මෙනි.

මුහුදෙන් එතර වෙළඳාමෙහි නියුතු වෙළඳජනයා නැව් නගින විට 'දිසාකාක' යයි වහරනු ලබන කපුටකු රැගෙන යති. යම් කලෙක සැඩසුළඟට හසුවී නැව විදේශයට හැරුණ හොත්, වෙරළ නොපෙනී ගියහොත්, එකල දිසාකාකයා මුදා හරිති. දිසාකාකයා කුඹ ගසින් අහසට නැඟ සියලු දිසා අනුදිසාවන් වෙත ඉගිලෙමින් වෙරලක් දුටහොත් ඒ අතට පියාඹයි; නොදුටහොත් නැවත නැවතත් පෙරළා අවුත් කුඹගසෙහිම ලැගෙයි. එසේම, ඉදින් සංඛාරුපෙක්ඛා ඥාණය ශාන්තිපද නිර්වාණය ශාන්ත වශයෙන් දකිතොත් සියලු සසර වට හැර පියා නිර්වාණය වෙතටම

වදියි; එසේ නොදකිතොත් යලියලිත් සංස්කාරයන් අරමුණු කොටගෙනම පවතියි.

ඒ මේ සංඛාරුපෙක්ඛා ඤාණය කුලු-අග පොළනු ලබන පිටි මෙන්ද, ඇට ඉවත් වන සේ නෙළනු ලබන කපු මෙන්ද, සංස්කාරයන් නත් අයුරින් විනිශ්චය කරමින්, බියද, නන්දියද හැරපියා සංස්කාරයන් රැක්කිරීමෙහි මධ්‍යස්ත වූයේ ත්‍රිවිධ අනුපස්සනා වශයෙන් සිටියි. එසේ සිටිමින් (ඒ සංඛාරුපෙක්ඛා ඤාණය) ත්‍රිවිධ වූ විමෝක්ෂ මුඛ භාවයට පත්ව, (මතු දැක්වෙන සද්ධානුසාරී ආදී සප්ත ආර්ය පුද්ගල භාවය) පිණිස ප්‍රත්‍යය වේ.

එහි, මෙම සංඛාරුපෙක්ඛා ඤාණය (අනිත්‍යාදී) ත්‍රිවිධ අනුපස්සනා වශයෙන් පවත්නා හෙයින් (ශ්‍රද්ධාදී) ත්‍රිවිධ ඉන්ද්‍රියයන්ගේ ආධිපත්‍ය වශයෙන් (අනිමිත්තාදී) ත්‍රිවිධ විමෝක්ෂමුඛ භාවයට පැමිණේ නම් වේ; අනුපස්සනා තුන වනාහි 'විමෝක්ෂ මුඛ' යයි කියනු ලැබේ; යම් සේ කීහුදඃ- ''මේ විමෝක්ෂමාර්ග තුන වනාහි ලෝකය (සසරවට) ඉක්මවීම පිණිස පවතී. i. සියලු සංස්කාරයන් (උදය-ව්‍යය දෙකින්) පරිච්ඡින්න වූ ආකාරයෙන් හා සියලු අතින් වට කරන ලද ආකාරයෙන් මැනවින් දක්නා බැවින් හා 'අනිමිත්ත' (සංස්කාරයන් පිළිබඳ නිමිති නැති) ධාතුව වෙතට සිත පිවිසෙන බැවින්ද, ii. සියලු සංස්කාරයන් කෙරෙහි සිත කලඹවන බැවින් 'අප්පණිහිත' (රාගාදී ප්‍රණිධි රහිත) ධාතුව වෙතට සිත පිවිසෙන බැවින්ද, iii. සියලු සංස්කාර ධර්මයන් පර (අනාත්ම) වශයෙන් මැනවින් දක්නා බැවින් හා 'සුඤ්ඤතා (ශූන්‍යතා) ධාතුව වෙතට සිත පිවිසෙන බැවින්ද, මේ විමෝක්ෂ මාර්ග තුන ලෝකයෙන් (සසර වටින්) නික්මෙනු පිණිස පවතී''[a]

එහි, 'පරිච්ඡින්න හා සියලු අතින් වටකරන ලද ආකාරයෙන්' (පරිච්ඡේද පරිවටුමතා) යනු, උදය-ව්‍යය වශයෙන් පිරිසිඳි බැවින් හා සියලු අතින් වැසුණු බවිනි. අනිච්චානු පස්සනාව වනාහි 'උදාවට පෙර සංස්කාරයන් නැතැ'යි පිරිසිඳ, එම සංස්කාරයන්ගේ ගමන සොයමින් 'ව්‍යයයෙන් පසුව නොයති, මෙහිදීම අතුරුදන් වෙති'යි පරිවටුම (සීමා) වශයෙන් මැනවින් දකියි. 'සිත කළඹවන බැවින්' (මනො සමුත්තේජනතාය) යනු, සිත තුළ සංවේගය දනවන බැවිනි. දුඃඛානුපස්සනාවෙන් සංස්කාරයන් කෙරෙහි සිත සංවේගයට පත්වේ. 'පර (අනාත්ම) වශයෙන් මැනවින් බලන බැවින්' (පරතො සමනුපස්සනතාය) යනු, 'මම් නොවෙමි, මාගේ නොවේ' යනුවෙන් මෙසේ අනාත්ම වශයෙන් දක්නා බැවිනි.

a. පටිසම්භිදා පාළි, විමොක්ඛ කථා

මෙසේ මේ පද තුන 'අනිච්චානුපස්සනා' ආදි වශයෙන් කියන ලද්‍ද'යි දතයුතුය. එහෙයින්ම, අනතුරුව පැන විසඳීමේදී, ''අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට සංස්කාරයන් ක්‍ෂය වශයෙන් වැටහෙතැ'යිද, දුඃඛ වශයෙන් මෙනෙහි කරන්නහුට භය වශයෙන් වැටහෙතැ'යිද, අනාත්ම වශයෙන් මෙනෙහි කරන්නහුට ශූන්‍ය වශයෙන් වැටහෙතැ'යිද කියන ලදී.

මේ අනුපස්සනාවන් මුඛ (මාර්ග) කොට ඇති එම (යට කියන ලද) විමෝක්‍ෂයෝ කවරහුද? අනිමිත්තය, අප්‍රණිහිතය, ශූන්‍යතාය යන මේ ත්‍රිවිධ විමෝක්‍ෂයෝය. කියන ලද මැයි:- අධිමෝක්‍ෂය (බලවත් ශ්‍රද්ධාව) බහුල කොට ඇත්තේ අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනුයේ අනිමිත්ත විමෝක්‍ෂය ලබයි; පස්සද්ධි (සත් සිඳුණු බව) බහුල කොට ඇත්තේ දුඃඛ වශයෙන් මෙනෙහි කරනුයේ අප්‍රණිහිත විමෝක්‍ෂය ලබයි; (ආත්ම ශූන්‍යතානු දර්ශන) බහුල වූයේ අනාත්ම වශයෙන් මෙනෙහි කරනුයේ ශූන්‍යතා විමෝක්‍ෂය ලබයි.

මෙහිලා අනිමිත්ත විමෝක්‍ෂ යනු, නිමිති නොවන ආකාරයෙන් නිර්වාණය අරමුණු කොට පැවැති ආර්යමාර්ගයයි. එය වනාහි 'අනිමිත්ත' ධාතුවෙන් උපන් හෙයින් 'අනිමිත්ත' නම්ද, කෙලෙසුන් කෙරෙන් මිදුණු හෙයින් 'විමෝක්‍ෂ' නම්ද වේ. මෙනයින්ම 'අප්පණිහිත' (ප්‍රණිධි රහිත) ආකාරයෙන් නිර්වාණය අරමුණු කොට පැවැතියේ 'අප්පණිහිත' විමෝක්‍ෂයයිද, ශූන්‍යතාකාරයෙන් නිර්වාණය අරමුණු කොට පැවැතියේ 'ශූන්‍යතා' විමෝක්‍ෂයයිද දතයුතුය.

අභිධර්මයෙහි වනාහි, ''යම් කලෙක නෛර්යානික වූ, නිර්වාණගාමී වූ, ලෝකෝත්තර ධ්‍යානය වඩාද, දෘෂ්ටීන් පහ කරනු පිණිස, ප්‍රථම (සෝවාන්) භූමියට පැමිණෙනු පිණිස, කාමයන්ගෙන් වෙන්ව අප්‍රණිහිත වූද -පෙ- සුඤ්ඤත වූද ප්‍රථමධ්‍යානයට පැමිණ මෙසේද්‍ද''[a]යි යනුවෙන් මෙසේ විමෝක්‍ෂද්වයයක්ම පමණක් කියන ලද්දේද, එය නිෂ්පර්යා (අවිශේෂ) වශයෙන් විදර්ශනා ගමනය සඳහා කියන ලදී.

එකෙකුදු වූවත්, පටිසම්භිදාමග්ගයෙහි විදර්ශනාඥානය මෙසේ දක්වා ඇතඃ- ''අනිච්චානුපස්සනා ඤාණය'' නිත්‍යය, යන හැඟීමෙන් මුදවති'[b]යි ශූන්‍යතා විමෝක්‍ෂයි, දුඃඛානුපස්සනා ඤාණය සුඛයයි යන හැඟීමෙන්ද, අනත්තානුපස්සනා ඤාණය ආත්මයයි යන හැඟීමෙන්ද, මුදවති'යි ශූන්‍යතා විමෝක්‍ෂයි, යනුවෙන් මෙසේ අභිනිවෙසමුඤ්චන වශයෙන් ශූන්‍යතා විමෝක්‍ෂයයි. අනිච්චානුපස්සනා ඤාණය නිත්‍යය යන නිමිත්තෙන් මුදවති'යි අනිමිත්ත විමෝක්‍ෂයි; දුක්ඛානුපස්සනා

---

a. පට්ඨාන පාළි, ඣාන විභඞ්ග

b. පට්ඨාන පාළි, විමොක්ඛ කථා

ඤාණය සුඛයයි යන නිමිත්තෙන්ද, අනත්තානුපස්සනා ඤාණය ආත්මයයි යන නිමිත්තෙන්ද මුදවති'යි අනිමිත්ත විමෝක්ෂයයි, යනුවෙන් මෙසේ නිමිත්ත මුඤ්චන වශයෙන් අනිමිත්ත විමෝක්ෂයි; අනිච්චානුපස්සනා ඤාණය නිත්‍යයයි යන (තෘෂ්ණා) ප්‍රණිධියෙන් මුදවති'යි අප්පණිහිත විමෝක්ෂයයි, දුක්ඛානුපස්සනාඤාණය සුඛයයි යන ප්‍රණිධියෙන්ද, අනත්තානුපස්සනා ඤාණය ආත්මයයි යන ප්‍රණිධියෙන්ද මුදවති'යි අප්‍රණිහිත විමෝක්ෂයයි, යනුවෙන් මෙසේ ප්‍රණිධි මුඤ්චන වශයෙන් අප්‍රණිහිත විමෝක්ෂයි; යනුවෙනි.

එසේ වතුදු එය (විදර්ශනා ඥානය) සංඛාර නිමිත්ත නොහරනා හෙයින් නිෂ්පර්යාය (වචනාර්ථ) වශයෙන් 'අනිමිත්ත විමෝක්ෂ වනුයේ නොවේ; නිෂ්පර්යාය වශයෙන් ශූන්‍යතා විමෝක්ෂද අප්පණිහිත විමෝක්ෂද වේ. එම විදර්ශනාඥානයෙහි ආගමන වශයෙන් ආර්යමාර්ගක්ෂණයෙහිදී විමෝක්ෂය වෙන් කොට හඳුනාගත හැකි වේ. එහෙයින් අප්පණිහිතය, සුඤ්ඤතයයි විමෝක්ෂද්වයයක්ම (අභිධර්මයෙහි) කියන ලද්'යි දතයුතුය.

මේ පළමු කොට මෙහි විමෝක්ෂ කථායි

——//——

''සප්ත ආර්යපුද්ගල විභාගය පිණිස ප්‍රත්‍යය වෙති'යි (සත්ත අරියපුග්ගල විභාගාය පච්චයො හොති) යමක් යට කියන ලද්දේද, එහි සද්ධානුසාරීය, සද්ධා විමුත්තය, කාය සක්ඛීය, උභතො භාග විමුත්තය, ධම්මානුසාරීය, දිට්ඨිප්පත්තය, පඤ්ඤා විමුත්තය යන මොහු සප්ත ආර්යපුද්ගලයෝ වෙති; ඔවුන්ගේ විභාගය පිණිස මේ සංඛාරුපෙක්ඛා ඤාණය ප්‍රත්‍යය වේ.

යම් ආර්ය පුද්ගලයෙක් වනාහි අනිත්‍ය වශයෙන් මෙනෙහි කරමින් අධිමෝක්ෂ (ශ්‍රද්ධා) බහුල වූයේ සද්ධින්‍ද්‍රියය ලබාද හේ තෙමේ සෝතාපත්ති මාර්ගක්ෂණයෙහිදී සද්ධානුසාරී (ශ්‍රද්ධාව අනුව හැසිරෙන්නෙක්) නම් වේ; සෙසු (මාර්ග-ඵල) ස්ථාන සතෙහිදී සද්ධා විමුත්ත නම්වේ. යම් ආර්ය පුද්ගලයෙක් වනාහි පස්සද්ධි (අධික වීර්යය මඳක් ලිහිල් කිරීම) බහුල වූයේ දුඃඛ වශයෙන් මෙනෙහි කරමින්, සමාධි-ඉන්ද්‍රියය ලබාද, හේ තෙමේ සියලු තන්හි 'කායසක්ඛි' නම්වේ. අරූප ධ්‍යානයකට පැමිණ අග්‍ර (අර්හත්) ඵලයට පත්වූයේ උභතොභාග විමුත්ත'' නම්වේ. යම් ආර්ය පුද්ගලයෙක් වනාහි වේද (ඥාන) බහුල වූයේ අනාත්ම වශයෙන් මෙනෙහි කරමින් පඤ්ඤින්‍ද්‍රියය ලබාද, හේ තෙමේ සෝතාපත්ති මාර්ග ක්ෂණයෙහිදී ''ධම්මානුසාරී'' නම්වේ; (අනතුරු) ස්ථාන සයෙහිදී දිට්ඨප්පත්ත නම්ද, අග්‍ර (අර්හත්) ඵලයෙහිදී පඤ්ඤාවිමුත්ත නම්ද වේ. කියන ලදමැයි-

''අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට සද්ධින්‍ද්‍රියය බහුල කොට ඇත්තේය, සද්ධින්‍ද්‍රියය බහුල වූ, හෙයින් සෝතාපත්ති මාර්ගය සාක්‍ෂාත් කරයි. එහෙයින් 'සද්ධානුසාරි' යයි කියනු ලැබේ; එසේම අනිත්‍ය වශයෙන් මෙනෙහි කරන්නහුට සද්ධින්‍ද්‍රියය බහුලව ඇත්තේය, සද්ධින්‍ද්‍රියය බහුලවූ හෙයින් සෝතාපත්ති ඵලය සාක්‍ෂාත් කරන ලද්දේ වේ. එහෙයින් සද්ධාවිමුත්ත යයි කියනු ලැබේ,'' යන ආදියයි.

ශ්‍රද්ධාව පුරුදු කරමින් මිදුණහ'යි 'සද්ධා විමුත්ත' නම්; ස්පර්ශ කිරීමෙන් (තමාම අත්දැකීමෙන්) සාක්‍ෂාත් කළහ'යි' කායසක්ඛි' නම්. තමා විසින්ම දක්නා ලද ඵලයට පැමිණියහ'යි 'දිට්ඨප්පත්ත' නම්; ශ්‍රද්ධාව වඩමින් මිදේ (සද්‍දහනෙතා විමුච්චති) යනු, සද්ධාවිමුත්ත ආර්ය පුද්ගලයා පළමු කොට ධ්‍යානයන් ස්පර්ශ කරයි, පසුව නිරෝධ සංඛ්‍යාත නිර්වාණය සාක්‍ෂාත් කරති'යි 'කායසක්ඛි' නම් වේ. සංස්කාරයන් දුඃඛ (දුක්) වෙති'යි, නිරෝධය සුඛ(සැප) වෙති'යි දන්නා ලදහ'යි දක්නා ලදහ'යි සාක්‍ෂාත් කරන ලදහ'යි, ප්‍රඥායෙන් ස්පර්ශ කරන ලදහ'යි 'දිට්ඨප්පත්ත' නම්වේ.

ඉතිරි (ආර්ය පුද්ගලයන්) සිවු දෙනා අතුරෙන් වනාහි, ශ්‍රද්ධාව අනුව හැසිරෙති'යි, ශ්‍රද්ධාවෙන් යුක්තව හැසිරෙති'යි යෙති'යි 'සද්ධානුසාරී' නම්වේ. එසේම ප්‍රඥා සංඛ්‍යාත වූ ධර්මය අනුව හැසිරෙති'යි, ධර්මයෙන් යුක්තව හැසිරෙති'යි හෝ 'ධම්මානුසාරී' නම්වේ. අරූපධ්‍යාන මගින්ද, ආර්ය මාර්ගඥානයෙන්ද'යි (වික්ඛම්භන සමුච්ඡේද වශයෙන්) දෙවරක් මිදුණහ'යි 'උභතෝභාග විමුත්ත' නම් වේ. (අනිත්‍යාදී වශයෙන්) මැනවින් දැන මිදුණහ'යි 'පඤ්ඤා විමුත්ත' නම්වේ. මේ ආකාරයෙන් වචනාර්ථය දතයුතුය.

සඞ්ඛාරුපෙක්ඛා ඤාණයයි.

—//—

ඒ මේ (සංඛාරුපෙක්ඛා) ඤාණය වනාහි පළමු කී (මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසඞ්ඛානුපස්සනා ඤාණය යන) ඤාණ දෙක හා අර්ථ වශයෙන් සමාන වේ; එහෙයින් කීහු පුරාණාචාර්යයෝ:- 'මෙකී එක්ම සඞ්ඛාරුපෙක්ඛා ඤාණය නම් තුනක් ලබයි; යට ''මුඤ්චිතුකම්‍යතා ඤාණ' නම්විය, මැද 'පටිසඞ්ඛානුපස්සනා ඤාණ නම් වේ, අවසන්හි මුදුන් පත් වූයේ සඞ්ඛාරුපෙක්ඛාඤාණ නම්වේ'' යනුවෙනි.

පෙළෙහිද කියන ලදි:- ''මුඤ්චිතුකම්‍යතා, පටිසඞ්ඛා සන්තිට්ඨනා යන තුන විෂයයෙහි ප්‍රඥාව සඞ්ඛාරුපෙක්ඛා විෂයයෙහි ඤාණ වනුයේ කෙසේද? පැවැත්මද, නිමිත්තද -පෙ- උපායාසයද -පෙ-, මුඤ්චිතු කම්‍යතා, පටිසඞ්ඛා, සන්තිට්ඨාන යන තුන විෂයයෙහි වූ ප්‍රඥාව සංඛාරුපෙක්ඛා විෂයයෙහි ඤාණය වේ; උත්පාදය දුකෙකැ'යි -පෙ- භයෙකැ'යි -පෙ-

සාමිෂයැ'යි -පෙ- උත්පාදය සංස්කාරයැ'යි -පෙ- උපායාසය සංස්කාරයැ'යි මුඤ්චිතුකම්‍යතා, පටිසඞ්ඛා, සන්තිට්ඨාන විෂයයෙහි ප්‍රඥාව සඞ්ඛාරුපෙක්ඛා විෂයයෙහි ඤාණය වේ''[a]

එහි, මුඤ්චිතුකම්‍යතාද එම පටිසඞ්ඛාද එම සන්තිට්ඨානද යි 'මුඤ්චිතුකම්‍යතා-පටිසඞ්ඛා-සන්තිට්ඨාන' යි සමාස වේ. මෙසේ මුල් අවස්ථාවෙහිදී නිබ්බිදා ඤාණයෙන් නිර්වේදයට (කලකිරීමට) පත්ව, උත්පාදාදිය දුරුකරනු කැමැති බව 'මුඤ්චිතුකම්‍යතා' නම්, මධ්‍ය අවස්ථාවෙහිදී, මිදීමට උපයා කරගැනීම පිණිස ප්‍රත්‍යවේක්‍ෂා කිරීම 'පටිසඞ්ඛා' නම්, මිදීමෙන් පසු අවසන්හි ඇතිවන තැන්පත් බව 'සන්තිට්ඨානා' නම්. එය (සන්තිට්ඨානා) සඳහා, 'උත්පාදය සංඛාරයි, එම සංඛාරයන් කෙරෙහි මැදහත් වෙති'යි සංඛාරුපෙක්ඛා නම් වෙති'යි ආදිය කියන ලදි. මෙසේ මේ ඥානය එකක්ම වේ. තවද මෙය එකක්ම බව මේ පෙළ අනුවද දතයුතුයඃ- ''යම් මුඤ්චිතුකම්‍යතාවක් වේද, යම් පටිසඞ්ඛානුපස්සනාවක් වේද, යම් සඞ්ඛාරුපෙක්ඛාවක් වේද, මේ ධර්මයෝ ඒකාර්ථවත් වෙති; හුදෙක් අක්‍ෂර වශයෙන්ම නානත්වය වේ''[b]යනුයි.

මෙසේ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය ලැබූ මේ කුලපුත්‍රයාගේ විදර්ශනාව මුදුන්පත්වූයේ සිඛාප්පත්ත නම්ද, නැගීමට යනුයේ 'වුට්ඨාන ගාමිනී' නම්ද වේ. 'සිඛාප්පත්තා විපස්සනා'යි කීවද, 'වුට්ඨානගාමිනී විපස්සනා'යි කිවද, සඞ්ඛාරුපෙක්ඛා ආදීවූ ඥානත්‍රයයටම මේ අධිවචනයි. එය වනාහි සිළුවක් බවට උතුම් බවට පත්වූ හෙයින් 'සිඛාප්පත්ත' නම්ද නැගීමට යන හෙයින් වුට්ඨානගාමිනී නම්ද වේ. බාහිර වශයෙන් (විදර්ශනාවට) නිමිති ලෙසින් අභිනිවේශ(පිවිසීම) කළ (රූපාදී) වස්තූන් කෙරෙන් මෙන්ම අභ්‍යන්තරව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද නැගී සිටින හෙයින් (ආර්ය) මාර්ගය, උසස් බවට යෙති'යි වුට්ඨාන ගාමිනී' නම් වේ; මාර්ගය හා සැබැදෙති'යි යන අර්ථයි.

එහි, අභිනිවේශය (පිවිසීම) හා වුට්ඨානය (නැගීම) ප්‍රකට වීම සඳහා මේ මාතෘකා යිඃ- ඇතුළතින් පිවිස ඇතුළතින් නැගී සිටියි, ඇතුළතින් පිවිස පිටතින් නැගී සිටියි, පිටතින් පිවිස පිටතින් නැගී සිටියි, පිටතින් පිවිස ඇතුළතින් නැගී සිටියි, රූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටියි, රූපයෙහි පිවිස අරූපයෙන් (නාමයෙන්) නැගී සිටියි, අරූපයෙහි පිවිස අරූපයෙන් නැගීසිටියි, අරූපයෙහි පිවිස රූපයෙන් නැගී සිටියි, එක් පහරින් (එක් විටම) පංචස්කන්ධයන් කෙරෙන් නැගී සිටියි, අනිත්‍ය වශයෙන් පිවිස අනිත්‍ය වශයෙන් නැගී සිටියි, අනිත්‍ය වශයෙන් පිවිස දුඃඛ වශයෙන් -පෙ- අනාත්මවශයෙන් නැගී සිටියි, දුඃඛ

a. පටිසම්භිදා පාළි, ඤාණ කථා
b. පටිසම්භිදා පාළි, විමොක්ඛ කථා

වශයෙන් පිවිස දුඃඛ වශයෙන් -පෙ- අනිත්‍ය වශයෙන් -පෙ- අනාත්ම වශයෙන් නැඟී සිටියි, අනාත්ම වශයෙන් පිවිස අනාත්ම වශයෙන් -පෙ- අනිත්‍ය වශයෙන් -පෙ- දුඃඛ වශයෙන් නැඟී සිටියි. කෙසේද යත්:-

මේ ශාසනයෙහි, ඇතැම් යෝගාවචරයෙක් පළමු කොටම අභ්‍යන්තර සංස්කාරයන්හි පිවිසෙයි, පිවිස එම සංස්කාරයන් බලයි, යම් හෙයකින් වනාහි හුදෙක් ඇතුළත දැකීමෙන්ම (ආර්ය) මාර්ගයට නැඟීම සිදු නොවේද, පිටතද දැකිය යුතුම වේද එහෙයින් පරසන්තානගත ස්කන්ධයන් හා අනුපාදින්න (ඉන්ද්‍රියයන් හා සමග නොබැඳුණ) සංස්කාරයන්ද අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් දකියි. හේ තෙමේ විටෙක ඇතුළතද, විටෙක පිටතද සම්මර්ශනය කරයි. මෙසේ සම්මර්ශනයෙහි යෙදෙන්නහුගේ විදර්ශනාව ඇතුළත සම්මර්ශනය කරන විට (ආර්ය) මාර්ගය හා සමග සැබැදෙයි. මේ ඇතුළතට පිවිස ඇතුළතින් නැඟී සිටීම නම්වේ. ඉදින් මොහු පිටත සම්මර්ශනය කරන විට විදර්ශනාව මාර්ගය හා සමග සැබැඳෙතොත්, මේ ඇතුළතින් පිවිස පිටතින් නැඟී සිටීම නම්වේ. පිටතට පිවිස පිටතින්ද, ඇතුළතින්ද නැඟී සිටීමෙහිදීද මෙම නයයි.

අන් යෝගාවචරයෙක් තෙමේ පළමුකොට රූපයෙහි පිවිසෙයි, පිවිස භූතරූපයද උපාදා රූපයද රාශියක් කොට බලයි; යම් හෙයකින් වනාහි හුදෙක් රූපය දැකීමෙන්ම වුට්ඨානය සිදු නොවේද, අරූපයද දැකිය යුතුම වේද, එහෙයින් ඒ රූපය අරමුණු කොට උපන් වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණයන්ද මේ අරූපයයි හැඳින අරූපය සම්මර්ශනය කරයි; හෙතෙම විටෙක රූපයද, විටෙක අරූපය (නාමය) ද සම්මර්ශනය කරයි. මෙසේ සම්මර්ශනය කරන ඔහුගේ විදර්ශනාව රූප සම්මර්ශන කාලයෙහිදී මාර්ගය හා සමග සැබැඳේ; මේ රූපයෙන් පිවිස අරූපයෙන් නැඟී සිටීම නම්වේ. අරූපයෙන් පිවිස අරූපයෙන් හා එසේම රූපයෙන් නැඟීමෙහිදීද මෙම නයයි.

උදාවන සුලු යම් කිසිවක් ඇතොත්, ඒ සියල්ල ඉකුත් වන සුලුයයි මෙසේ පිවිස මෙසේම නැඟී සිටින විට එක් වරම පංචස්කන්ධයන් කෙරෙන් නැඟීම නම් වේ.

කිසි යෝගාවචරයෙක් තෙමේ පළමුකොට සංස්කාරයන් අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කරයි, යම් හෙයකින්, හුදෙක් අනිත්‍ය වශයෙන්ම සම්මර්ශනය කිරීමෙන්ම වුට්ඨානය සිදු නොවේද, දුඃඛ වශයෙන් හා අනාත්ම වශයෙන්ද සම්මර්ශනය කළයුතුම වේද, එහෙයින් දුඃඛ වශයෙන්ද, අනාත්ම වශයෙන්ද සම්මර්ශනය කරයි; මෙසේ පිළිපන් ඔහුට අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කරන විට වුට්ඨානය සිදුවේනම්, මේ අනිත්‍ය වශයෙන් පිවිස අනිත්‍ය වශයෙන් නැඟීම නම්වේ. ඉදින් ඔහු දුඃඛ

වශයෙන්ද, අනාත්ම වශයෙන්ද සම්මර්ශනය කරන විට වුට්ඨානය සිදුවේ නම්, මේ අනිත්‍ය වශයෙන් පිවිස දුඃඛ වශයෙන්ද, අනාත්ම වශයෙන්ද නැඟීම නම් වේ. දුඃඛ වශයෙන්ද අනාත්ම වශයෙන්ද පිවිස සිදුවන සෙසු වුට්ඨානයන්හිදීද මෙම නයයි.

තවද මෙහි, යම් යෝගාවචර කෙනෙක් තුමූ අනිත්‍ය වශයෙන් හෝ දුඃඛ වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ පිවිස වුට්ඨාන කාලයෙහිදී අනිත්‍ය වශයෙන් වුට්ඨානය වේද, මේ තිදෙනාම අධිමෝක්ෂ (ශ්‍රද්ධා) බහුලයෝ වෙති, සද්ධින්ද්‍රියය ලබති; අනිමිත්ත විමෝක්ෂ වශයෙන් මිදෙති; ප්‍රථම මාර්ගක්ෂණයෙහි 'සද්ධානුසාරී' නම් වෙති; ඉතිරි සත් තන්හිදී 'සද්ධා විමුත්ත' නම් වෙති. ඉදින් දුඃඛ වශයෙන් වුට්ඨානය සිදුවේ නම්, තිදෙනාම පස්සද්ධි බහුලයෝ වෙති; සමාධි ඉන්ද්‍රියය ලබති, අප්පණිහිත විමෝක්ෂ වශයෙන් මිදෙති; සියලු තන්හිම 'කායසක්ඛි' නම් වෙති. යමකුට වනාහි, මෙහිදී අරූප ධ්‍යානයක් පාදක වෙතොත්, හේ තෙමේ අග්‍ර (අර්හත්) ඵලයෙහිදී 'උභතෝභාග විමුත්ත' නම් වේ. තවද අනාත්ම වශයෙන් ඔවුන්ගේ වුට්ඨානය වේ නම්, තිදෙනාම වේද (ප්‍රඥා) බහුලයෝ වෙති; පඤ්ඤින්ද්‍රියය ලබති; ශූන්‍යතා විමෝක්ෂ වශයෙන් මිදෙති, ප්‍රථම මාර්ග ක්ෂණයෙහිදී 'ධම්මානුසාරී' නම් වෙති; අනතුරු ස-තැන්හිදී 'දිට්ඨිප්පත්ත' නම්ද අග්‍රඵලයෙහිදී 'පඤ්ඤා විමුත්ත' නම් ද වෙති.

ඉක්බිත්තෙන්, පළමු කී (භයතුපට්ඨාන ආදී) ඥානයන්ද, පසුව කියනු ලබන (ගෝත්‍ර භූ ආදී) ඥානයන්ද සමග මේ වුට්ඨානගාමිනී විදර්ශනාව ප්‍රකට වනු පිණිස මේ උපමා දොළොස දතයුතුය; ඒ පිළිබඳ සංග්‍රාහක උද්දානය (පබැඳුම) මෙසේයිඃ-

වග්ගුලී කණ්හසප්පො ච ඝරං ගො යක්ඛි දාරකො,
ඛුදා පිපාසා සීතුණ්හං අන්ධකාරං විසෙන වා

වවුලාය, කෘෂ්ණ සර්පයාය, ගෘහයය, ගවයාය, යකිණිය, ළදරුවාය, සාය, පිපාසාය, ශීතය, උෂ්ණය හා අන්ධකාරය විෂයත් සමග මෙකී දොළොසයි.

මේ උපමා භයතුපට්ඨාන ඤාණයෙහි පටන් ඇති කිසියම් ඥානයෙක සිට ගෙනහැර දක්වනු සුදුසුය; මෙතැනදී ඇර දක්වනු ලබන කල, භයතුපට්ඨාන ඤාණයෙහි පටන් ඵල ඤාණය දක්වා සියල්ල ප්‍රකට වේ; එහෙයින් මෙහිදීම ඇර දැක්විය යුතුය'යි කියනලදි.

'වග්ගුලි' යනු, එක්තරා වවුලෙක්, ''මෙහි මලක් හෝ පලයක් ලැබෙති''යි ශාඛා පසක් ඇති මී ගසෙක වසා එක් ශාඛාවක් පිරික්සා එහි ගතයුතු මලක් හෝ ගෙඩියක් නොදිටියේය; පළමුවැන්න මෙන්ම දෙවැනි, තුන්වැනි, සිවුවැනි, පස්වැනි ශාඛාවන්ද පිරික්සූ මුත් කිසිවක් නොදිටියේය. ඒ වවුලා, 'එතැනින්ම මේ වඳගසෙකි, මෙහි ගතයුතු කිසිවක් නැතැ'යි

එම ගස කෙරෙහි ආලය හැර, මුදුන් අත්තට නැඟී, අතුපතරින් හිස ඔසවා උඩ බලා අහසට ඉගිලී අන් පල රුකෙක වැසීය.

එහි, යෝගාවචරයා (උපමා කථාවෙහි) වවුලා වැනියයි දතයුතුය; පංච උපාදානස්කන්ධය අතු පසක් ඇති මීගස වැනිය. *යෝගියා විසින් රූපස්කන්ධය පිරික්සා එහි ගත යුතු කිසිවක් නොදැක අනෙක් අනෙක් ස්කන්ධයන් පිරික්සීම, ඒ වවුලා විසින් එක් එක් ශාඛාව පිරික්සා ගතයුතු කිසිවක් නොදැක අනෙක් අනෙක් ශාඛා පිරික්සීම වැනිය. ස්කන්ධ පංචකයෙහි අනිත්‍ය ලක්‍ෂණාදිය දැකීමෙන් කලකිරුණු යෝගියාගේ මුඤ්චිතුකම්‍යතාදී ඥානත්‍රයය, වවුලා විසින් ''මේ පල නැති ගසෙකි''යි එහි ආලය හැරීම වැනිය. යෝගියාගේ අනුලෝම ඤාණය වවුලා මුදුන් අත්තේ ඉහළට නැඟීම වැනිය. යෝගියාගේ ගෝත්‍රභූ ඤාණය වවුලා හිස ඔසවා උඩ බැලීම වැනිය. (යෝගියාගේ) මාර්ගඥානය (වවුලා) අහසට ඉගිලීම වැනිය. (යෝගියාගේ) ඵලඥානය (වවුලා) අන් ඵලරුකෙක වැසීම වැනිය.

කෘෂ්ණසර්පෝපමාව යට පටිසඞ්ඛාඤාණයෙහි කියන ලද්දේමය. මෙහි උපමා සංසන්දනය මෙසේයඃ- ගෝත්‍රභූඤාණය සර්පයා හැර දැමීම වැනිය; මාර්ගඥානය (සර්පයාගෙන්) මිදී අවුත් ආමග බලමින් සිටීම වැනිය; ඵලඥානය මිදීගොස් අභය ස්ථානයෙක්හි රැඳීම වැනිය; මේ විශේෂයි.

'සරං' යනු, ගෙහිමියකු සවස ආහාර අනුභව කොට යහනට නැඟ නින්දට බට විට ගෙට ගිනි ඇවිළිණි. හෙතෙම පිබිද ගින්න දැක බිය පත්ව, 'නොදැවී ඉවත් වෙතොත් මැනව'යි පිටවන මඟක් සොයා දැක නික්ම වහා ක්ෂේමස්ථානයකට ගොස් නැවතිණි. එම උපමාවෙහිඃ අන්ධ බාල පෘථග්ජනයා ස්කන්ධ පංචකය කෙරෙහි. ''මමය, මාගේය'යි ගැනීම, ගෙහිමියා ආහාර අනුභව කොට යහනට නැඟ නින්දට වැටීම වැනිය; සම්‍යක් ප්‍රතිපදාව පිළිපැද ත්‍රිලක්‍ෂණය දැක භයතුපට්ඨාන ඤාණය ලැබීම, (ගෙහිමියා) පිබිද ගින්න දැක බියපත්වූ අවස්ථාව වැනිය. මුඤ්චිතුකම්‍යතා ඤාණය පිටවන මඟ සෙවීම වැනිය; අනුලෝම ඤාණය පිටවන මඟ දැකීම වැනිය; ගෝත්‍රභූ ඤාණය පිටතට නික්මීම වැනිය; මාර්ගඥානය වහා පලායාම වැනිය; ඵලඥානය අභයස්ථානය වැනිය.

'ගො' යනු, රාත්‍රි කාලයෙහි නින්දට බට එක්තරා ගොවියකුගේ ගවගාල බිඳ ගෙන ගොන්නු පලා ගියහ. ගොවියා අලුයම් කාලයෙහි එහිගොස් බලා ගොනුන් පැන ගිය බව දැක පිය සටහන් අනුව ගොස් රජුට අයත් ගොනුන් දුටුයේය; ''මේ මාගේ ගොන්නුය''යි සිතා ගෙන

* ස්කන්ධපංචකය තුළ යෝගියාගේ අභිනිවේශය (පිවිසීම) වවුලා මීගසෙහි වැසීම වැනිය.

එතුයේ පහන් වූ කල, ''මොහු මාගේ ගොනුන් නොව රජුට අයත් ගොන්නුය''යි හැඳින, බියපත්ව, ''රාජපුරුෂයන් මං සොරෙකැ'යි ගෙන හිංසා පීඩාවනට පමුණුවන්නට පෙර පලා යන්නෙමි'යි ගොනුන් හැර දමා වහා පලා ගොස් නිර්භය ස්ථානයෙක සිටියේය. එහි, අන්ධබාල පෘථග්ජනයා විසින් ස්කන්ධයන් ''මමය, මාගේය'යි ගැනීම, (ගොවියා විසින්) රජුට අයත් ගොනුන් ''මාගේ ගොන්නුය''යි ගැනීම වැනිය; යෝගියා විසින්, ''අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ත්‍රිලක්ෂණ වශයෙන් ස්කන්ධයන් හඳුනා ගැනීම, (ගොවියා විසින්) පහන්වූ කල රජුගේ ගොනුන් බව හඳුනා ගැනීම වැනිය. (යෝගියාගේ) භයතුපට්ඨාන ඤාණය (රජුගේ ගොනුන් බව දූන ගොවියා) බියපත් වීම වැනිය; මුඤ්චිතුකම්‍යතා ඤාණය ගොනුන් හැර දමා යනු කැමති වීම වැනිය; ගෝත්‍රභූඤාණය (ගොනුන්) හැර දැමීම වැනිය; ආර්ය මාර්ගය ගැනීම පලා යාම වැනිය; ඵලප්‍රාප්තිය නිර්භය ස්ථානයෙක සිටීම වැනිය.

'යක්ඛී' යනු, එක්තරා පුරුෂයෙක් යකිනියක සමග සහවාස කළේය; ඕ තොමෝ රාත්‍රිකාලයෙහි, ''මොහු නිදති'යි අමු සොහොනට ගොස් මිනීමස් කයි; හේ තෙමේ ''මැය කොහි යෙත්දැ'යි පසු පස ගොස් මිනීමස් කනු දැක, ඇය අමනුෂ්‍යයකු බව දැන, බියපත්ව, ''මා කන්නට පළමු පලා යමි''යි වේගයෙන් පලාගොස් අභයස්ථානයෙක සිටියේය. එහි, ''මමය, මාගේය''යි ස්කන්ධයන් ගැනීම යකිනිය සමග විසීම වැනිය; ත්‍රිලක්ෂණය දැක ස්කන්ධයන්ගේ අනිත්‍යාදිය වැටහීම සොහොනෙහි මිනීමස් කනු දැක, ''මෝ යකිනියකැ'යි හඳුනා ගැනීම වැනිය; භයතුපට්ඨාන ඤාණය බියපත් වූ කාලය වැනිය; මුඤ්චිතුකම්‍යතා ඤාණය පලා යනු කැමැති වීම වැනිය; ගෝත්‍රභූඤාණය සොහොන හැර දැමීම වැනිය; මාර්ගඥානය වේගයෙන් පලායාම වැනිය, ඵලඥානය අභයස්ථානයෙහි සිටීම වැනිය.

'දාරකො' යනු, දරුපෙම් ඇති එක්තරා ස්ත්‍රියක් ප්‍රාසාදයෙහි උඩුමහලෙහි හිඳින විට වීදියෙහි දරුවකු හඬනු අසා. ''මගේ දරුවා කිසිවකු විසින් පෙළනු ලබති'යි වේගයෙන් ගොස් තම පුතුය'යි යන හැඟීමෙන් අනිකකුගේ දරුවකු ගත්තාය; (ඉක්බිති) ඕතොමෝ ''මේ අන් දරුවෙකැ'යි හැඳින, බියපත්ව, ඔබමොබ බලා, ''කිසිවකු මා දරු සෙරකැ'යි නොකිව මැනවැ'යි දරුවා එහිම තබා වේගයෙන් පෙරළා ප්‍රාසාදයට නැඟ හුන්නාය. එහි ''මමය මාගේයයි පංචස්කන්ධයන් ගැනීම තම පුතුයයි හැඟී අන් දරුවකු ගැනීම වැනිය; ත්‍රිලක්ෂණ වශයෙන් දැක ''මමය මාගේය''යි නොගැනීම ''මේ අන්දරුවෙකැ''යි හඳුනාගැනීම වැනිය. භයතුපට්ඨාන ඤාණය බියට පත්වීම වැනිය; මුඤ්චිතුකම්‍යතා ඤාණය ඔබමොබ බැලීම වැනිය; අනුලෝම ඤාණය දරුවා එහිම තැබීම වැනිය; ගෝත්‍රභූ ඤාණය දරුවා බස්වා වීදිය තුළ සිටි කාලය වැනිය; මාර්ගඤාණය (පෙරළා) ප්‍රාසාදතලයට නැඟීම වැනිය; ඵලඥානය ප්‍රාසාද තලයට නැඟ එහි හිඳීම වැනිය.

'බුදා පිපාසා සීතුණ්හං අන්ධකාරං විසෙන වා' යන මේ උපමා සය වුට්ඨාන ගාමිනී විදර්ශනාවෙහි පිහිටි යෝගියා ලෝකෝත්තර ධර්මය වෙතට නැඹුරු වීම, නැමීම. බර වීම දක්වනු පිණිස කියන ලදී.

යම්සේ සාදුකින් පෙළෙන, බුදිනු කැමැති පුරුෂයෙක් මිහිරි, රසවත් බොජුනක් පතාද, එසේම සසරවට නමැති සයින් පෙළෙන යෝගාවචර තෙමේ අමාරස ඇති කායගතාසති නමැති බොජුන පතයි. තවද යම් සේ පිපාසයෙන් මඩනා ලද, උගුරකට වියලී ගිය පුරුෂයෙක් නොයෙක් රසමුසු පානයක් පතාද, එසේම සසර වට නමැති පිපාසයෙන් මඩනා ලද යෝගාවචර තෙමේ ආර්ය අෂ්ටාංගික මාර්ග නමැති පානය පතයි. තවද, යම්සේ වනාහි, ශීතය ඇඟ වැදීමෙන් පෙළෙන පුරුෂයෙක් උෂ්ණය පතාද, එසේම මේ සසරවට තුළ තෘෂ්ණා-ස්නේහ නැමැති සීතයෙන් පෙළෙන යෝගාවචර තෙමේ කෙලෙසුන් තවන සුලු මාර්ගඥාන නමැති උෂ්ණය පතයි. තවද, යම්සේ ග්‍රීෂ්මයෙන් පෙළෙන පුරුෂයෙක් සිසිල පතාද, එසේම සසරවට තුළ එකොළොස් ගින්නෙකින් තැවෙන මේ යෝගාවචර තෙමේ, එකොළොස් ගිනි නිවා ලන නිවන පතයි. යම්සේ වනාහි අන්ධකාරයෙන් පෙළෙන පුරුෂයෙක් ආලෝකය පතාද, එසේම අවිද්‍යාන්ධකාරයෙන් වෙළුණු පැටලුණු යෝගාවචර තෙමේ මාර්ග භාවනා ඥාන නමැති ආලෝකය පතයි. තවද, යම්සේ විසෙකින් පීඩිත වූ පුරුෂයෙක් විස නසන බෙහෙතක් පතාද, එසේම කෙළෙස් නමැති විසෙන් මඩනා ලද යෝගාවචර තෙමේ කෙලෙස් විස නසන අමා ඔසුවක් හා සමාන නිර්වාණය පතයි. එහෙයින් කියන ලදීඃ-

"මෙසේ දන්නා, මෙසේ දක්නා ඒ යෝගාවචරයාගේ සිත භවත්‍රයය කෙරෙහි -පෙ- නව සත්ත්වාවාසය කෙරෙහි, හැකිලෙයි, පැකිලෙයි, පසුබසියි, ආපසු හැරෙයි, නොපැතිරෙයි, උපේක්ෂාව හෝ පිළිකුල් බව තිර වෙයි. යම්සේ වනාහි, මදක් බැවුම් ඇති නෙළුම් කොළයෙක....." යන ආදි වශයෙන් සියල්ල පෙර කී නයින්ම දතයුතුය.

මෙතෙකින් වනාහි මොහු (මේ යෝගාවචරයා) 'පතිලීනචර' (හැකිලුණු සිත් ඇතිව හැසිරෙන) නම් වේ; ඔහු සඳහා කියන ලදීඃ-

> "පතිලීනචරසස භික්ඛුනො භජමානසස විවිතත මානසං,
> සාමග්ගියමාහු තසස තං යො අතතානං භවනෙ න දසසයෙ"[a]

> "යම් භික්‍ෂු කෙනෙක් තුමූ තමන් මේ භවත්‍රයයට අයත් කෙනකුසේ නොදක්වත්ද, හැකිලුණු පැවතුම් ඇතිව හැසිරෙන, (ලෞකිකත්වයෙන්) වෙන් වූ සිත් ඇති ඒ භික්‍ෂූවට එයම (චිත්ත) සාමග්‍රිය වෙතැ'යි කීහු."

---

a. මහානිද්දේස, මිත්තෙය්‍ය සුත්ත.

මෙසේ මේ සංඛාරුපෙක්ඛා ඤාණය යෝගියාගේ 'පතිලීනචර' භාවය නියම කොට තව දුරටත් ආර්යමාර්ගයට අයත් බොජ්ඣඞ්ග, මග්ගඞ්ග, ඣානඞ්ග, පටිපදා, විමොක්ඛ යන මේ විශේෂයන් නියම කරයි. ඇතැම් ස්ථවිර කෙනෙක්, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග, ඣානඞ්ගයනට විශේෂ වූ පාදක ධ්‍යානය නියම කෙරෙති'යි කියති; ඇතැමෙක් විදර්ශනාවට අරමුණු වූ ස්කන්ධයන් එම විශේෂය නියම කෙරෙති'යි පවසති; තවද කෙනෙක්, පෞද්ගලික අධ්‍යාශයය එය නියම කෙරෙති'යි කියති. ඔවුන්ගේ වාදයනට අනුව වුවද, මේ පූර්වභාගයට අයත් වුට්ඨානගාමිනී විපස්සනාව (එකී විශේෂයන්) නියම කෙරෙත්මයැ'යි දතයුතුය.

මේ එහි (බොජ්ඣංගාදී විශේෂය නියම කිරීමෙහි) පිළිවෙළ කථාව මෙසේය:- විදර්ශනා නියමයට අනුව වනාහි, සුක්ඛවිපස්සකයා (පිළිසිඹියා නැතිව මාර්ග-ඵල ලබන්නා)හට උපන් මාර්ගයද, සමාපත්ති ලාභියාහට වුවද, ධ්‍යානය පාදක කොට නොගෙන උපන් මාර්ගයද, ප්‍රථම ධ්‍යානය පාදක කොටගෙන ප්‍රකීර්ණක සංස්කාරයන් සම්මර්ශන කිරීමෙන් උපදවන ලද මාර්ගයද ප්‍රථමධ්‍යානිකම වේ. සියලු තන්හි බොජ්ඣඞ්ග සතද, මාර්ගාඞ්ග අටද, ධ්‍යානාංග පසද වේ. ඔවුන් පිළිබඳ වූ පූර්වභාග විදර්ශනාව සෝමනස්ස සහගත හා උපෙක්ඛා සහගත වී වුට්ඨාන කාලයෙහි (මාර්ගාසන්න කාලයෙහි) සංඛාරුපෙක්ඛා භාවයට පත්ව සෝමනස්ස සහගතම වේ.

(ධ්‍යානයන් පිළිබඳ) පංචක නයෙහිදී, දෙවන, තෙවන, සිවුවන ධ්‍යානයන් පාදක කොට උපදවන ලද මාර්ගයන්හිදී ධ්‍යානය පිළිවෙළින් චතුරඞ්ගික, තිවඞ්ගික හා දුවඞ්ගික වේ. සියලු ධ්‍යානයන්හි මාර්ගාංග සතෙක් වේ. චතුර්ත්ථධ්‍යානයෙහි (පීති හැර) බොජ්ඣඞ්ග සයෙක් වේ. මේ විශේෂය පාදක ධ්‍යාන-නියමයෙන් මෙන්ම විදර්ශනා නියමයෙන්ද සිදුවේ. ඔවුන්ගේද පූර්වභාග විදර්ශනාව සෝමනස්ස සහගතවද, උපෙක්ඛා සහගතවද වේ; වුට්ඨාන ගාමිනී විදර්ශනාව සෝමනස්ස සහගත වේ.

පංචමධ්‍යානය පාදක කොට උපදවන ලද මාර්ගඥානයෙහි වනාහි උපේක්ෂා, චිත්තෙකාග්‍රතා වශයෙන් ධ්‍යානාංග දෙකෙකි. බෝධ්‍යංග හා මාර්ගාංගද (පිළිවෙළින්) සයෙක් හා සතෙක් (පීති, හා සම්මා සඞ්කප්ප හැර) වේ. මේ විශේෂයද (පාදක ධ්‍යාන හා විදර්ශනා යන) මේ උභයනියමයන් අනුව සිදු වේ. මෙම නයෙහි පූර්වභාග විදර්ශනාව සෝමනස්ස සහගත හෝ උපෙක්ඛා සහගත වේ. ව්‍යුත්ථාන ගාමිනී විදර්ශනාව හුදෙක් උපෙක්ඛා සහගතම වේ. අරූප ධ්‍යානයන් පාදක කොට උපදවන ලද මාර්ගඥානයෙහිද මෙම නයයි. මෙසේ පාදකධ්‍යානයෙකින් නැඟී යම් කිසි සංස්කාරයක් සම්මර්ශනය කොට නිපදවන ලද මාර්ගයට ආසන්න තැනෙක නැඟුණ සමාපත්තියෙහි

සමාන බව ඇති වේ; ගොයාගේ වර්ණය භූමි වර්ණයට සමාන වන සේය.

දෙවන ස්ථවිරවාදයට අනුව, යම් යම් සමාපත්තියෙකින් නැඟී, යම් යම් සමාපත්ති ධර්මයන් සම්මර්ශනය කොට මාර්ගය නිපදවන ලද්දේ වේද, ඒ මාර්ගය ඒ ඒ සමාපත්තියට සමාන වේ; එහිද විදර්ශනා නියමය කී නයින්ම දතයුතුය.

තෙවන ස්ථවිර වාදයට අනුව, තම තමාගේ අධ්‍යාශයයට අනුරූපව, යම් යම් ධ්‍යානයක් පාදක කොට, යම් යම් ධ්‍යාන ස්වභාවයක් සම්මර්ශනය කොට මාර්ගඥානය නිපදවන ලද්දේ වේද, එම මාර්ග ඥානය ඒ ඒ ධ්‍යානයටම සමාන වේ. පාදක ධ්‍යානයෙකින් තොරව, හුදෙක් අධ්‍යාශය වශයෙන්ම, එය සිදු නොවේ. මෙම අර්ථය නන්දකොවාද සූත්‍රයෙන් පැහැදිලි කළ යුතුය; මෙහිද විදර්ශනා නියමය කී නයින්ම දතයුතුය. මෙසේ සඞ්ඛාරුපෙක්ඛා - බොජ්ඣඞ්ගඣානඞ්ග - මග්ගඞ්ගයන් නියම කෙරෙති'යි දතයුතුය.

ඉදින් මේ සඞ්ඛාරුපෙක්ඛාව කෙලෙස් මැඩලීමේදී, මුලපටන්, දුකසේ, උත්සාහයෙන්, මෙහෙයවීම් සහිතව, මැඩලනු හැකි වේ නම්, එය 'දුක්ඛා පටිපදා' නම් වේ; එයට විපරිත වූයේ 'සුඛා පටිපදා' නම්; (වික්ඛම්භන වශයෙන්) කෙලෙස් මැඩලා, විදර්ශනා පරිවාස සහිත මාර්ග ප්‍රාදුර්භවය සෙමෙන් (ලැසිව) කෙරේනම් එය (සංඛාරුපෙක්ඛාව) 'දන්ධාභිඤ්ඤා' නම් වේ; එයට විපරීත වූයේ 'ඛිප්පාභිඤ්ඤා' යි; මෙසේ මේ සංඛාරුපෙක්ඛාව ආයුතු තන්හි සිට තම තමාගේ මාර්ගයට නම් සපයයි; එහෙයින් මාර්ගඥානය නම් සතරක් ලබයි.

ඒ මේ ප්‍රතිපදාව ඇතැම් භික්ෂු කෙනෙකුට විවිධාකාර වේ; ඇතැමකුට මාර්ග සතරෙහිම ඒකාකාර වේ; බුදුවරයනට වනාහි මාර්ග සතරම සුඛාපටිපදා ද, ඛිප්පාභිඤ්ඤා ද වේ; ධම්ම සේනාපති සැරියුත් තෙරුන් හට ද එසේ විය; මුගලන් තෙරුන්හට වනාහි ප්‍රථම මාර්ගය සුඛාපටිපදාද ඛිප්පාභිඤ්ඤාද විය; එහෙත් මතු මාර්ග තුන දුක්ඛා පටිපදා ද, දන්ධා භිඤ්ඤා ද විය.

ප්‍රතිපදාවන් මෙන්ම අධිපති ධර්මයන් ද ඇතැම් භික්ෂු කෙනෙකුට මාර්ග සතරෙහි විවිධාකාර වන අතර තවද කෙනකුට සතරෙහි ඒකාකාර වේ; මෙසේ සංඛාරුපෙක්ඛාව ප්‍රතිපදාවන් පිළිබඳ විශේෂය නියම කෙරේ. විමෝක්ෂ විශේෂය නියම කරන ආකාරය පෙර කියන ලද්දේමය.

තවද මාර්ගය කරුණු පසක් මුල් කොට ගෙන නම් ලබයිඃ ස්ව-කෘත්‍යයෙන්ද ප්‍රතිපක්ෂයෙන්ද ස්ව-ගුණයෙන්ද, අරමුණෙන්ද, ආගමානයෙන්දැ'යි යනුවෙනි.

ඉදින් සංඛාරුපෙක්ඛා ඤාණය අනිත්‍ය වශයෙන් සම්මර්ශනය කොට නැගේ නම් අනිමිත්ත විමෝක්ෂයෙන් මිදේ නම් වේ; ඉදින් දුඃඛ වශයෙන් සම්මර්ශනය කිරීමෙන් නැගේ නම් අප්‍රණිහිත විමෝක්ෂයෙන් මිදේ නම් වේ; ඉදින් අනාත්ම වශයෙන් සම්මර්ශනය කිරීමෙන් මිදේ නම්, සුඤ්ඤත විමෝක්ෂයෙන් මිදේ නම් වේ. මේ කෘත්‍ය හෙයින් ලද නාමයි.

යම් හෙයකින් වනාහි මේ මාර්ගය අනිච්චානුපස්සනාවෙන් සංස්කාරයන්ගේ ඝන විනිර්භෝගය (විශ්ලේෂණය) කෙරෙමින් නිත්‍ය - නිමිත්ත - ධ්‍රැව නිමිත්ත - ශාස්වත නිමිත්තයන් බැහැර කෙරෙමින් ආයේද, එහෙයින් 'අනිමිත්ත' නම් වේ; දුඃඛානුපස්සනාවෙන් සුඛ සංඥාව හැර, ප්‍රණිධිය හෙවත් ප්‍රාර්ථනය වියලවමින් ආ හෙයින් අප්පණිහිත' නම් වේ; අනත්තානු පස්සනාවෙන් ආත්ම-සත්‍වපුද්ගල සංඥාවන් හැර සංස්කාරයන් ශූන්‍ය වශයෙන් දක්නා ලද හෙයින් 'සුඤ්ඤත' නම් වේ; මේ ප්‍රත්‍යනීක වශයෙන් ලද නාමයි.

රාගාදියෙන් ශූන්‍ය වූ හෙයින් මේ මාර්ග 'සුඤ්ඤත' නම් වේ; රූප නිමිත්තාදිය හෝ රාග නිමිත්තාදිය නැති හෙයින් 'අනිමිත්ත' නම් වේ; රාග ප්‍රණිධි ආදිය නැති හෙයින් 'අප්පණිහිත' නම් වේ; මේ ස්ව-ගුණ වශයෙන් ලද නාමයි.

ඒ මේ මාර්ගය ශූන්‍යවූ, අනිමිත්ත වූ, අප්‍රණිහිත වූ, නිර්වාණය අරමුණු කෙරෙති'යි 'සුඤ්ඤත' නම්ද. 'අනිමිත්ත' නම්ද, 'අප්පණිහිත' නම් ද වේ; මේ අරමුණ වශයෙන් ලද නාමයි.

ආගමනය වනාහි විදර්ශනාගමනය, මාර්ගාගමනය'යි ද්විවිධ වේ; එහි මාර්ගයෙහි විදර්ශනාගමනයද, ඵලයෙහි මාර්ගාගමනයද ලබයි. අනත්තානුපස්සනාව වනාහි 'සුඤ්ඤතා' නම් වේ; සුඤ්ඤත විදර්ශනාවෙන් ආ මාර්ගය සුඤ්ඤත නම්වේ. අනිච්චානුපස්සනාව අනිමිත්ත නම්වේ, අනිමිත්ත විදර්ශනාවෙන් ආ මාර්ගය 'අනිමිත්ත' නම්වේ.

මේ (අනිමිත්ත යන) නාමය අභිධර්ම පර්යායට අනුව නොලැබේ; සූත්‍රාන්ත පර්යායයෙන්ම ලැබේ. එහි (අභිධර්ම පර්යායයෙහි) ගෝත්‍රභූ ඤාණය අනිමිත්ත වූ නිර්වාණය අරමුණු කොට 'අනිමිත්ත' නම් වී, තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට මාර්ගයට නම් දෙති'යි කියති. එහෙයින් මාර්ගය 'අනිමිත්තය'යි කියන ලදි. මාර්ගාගමනයෙන් වනාහි ඵලය 'අනිමිත්ත' නම් වනු යුතුම වේ.

දුක්ඛානුපස්සනාව සංස්කාරයන් කෙරෙහිවූ ප්‍රණිධිය (ප්‍රාර්ථනය) වියලවමින් ආහෙයින් 'අප්‍රණිහිත' නම් වේ; අප්‍රණිහිත විදර්ශනාවෙන් ආ මාර්ගය 'අප්ප්‍රණිහිත' නම්වේ, අප්පණිහිත මාර්ගයෙහි ඵලයද

'අප්පණිහිත' නම් වේ, මෙසේ විදර්ශනාව තමාගේ නාමය මාර්ගයටද, මාර්ගය ඵලයටද දෙයි. මේ ආගමන වශයෙන් ලද නාමයි. මෙසේ මේ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය විමෝක්ෂය පිළිබඳ විශේෂය නියම කරයි.

සඞ්ඛාරුපෙක්ඛා ඤාණය නිමි.

—//—

ඒ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය ඇසුරු කරන, වඩන, ප්‍රගුණ කරන ඒ යෝගාවචරයාහට අධිමෝක්ෂ ශ්‍රද්ධාව බලවත්ව උපදියි. මැනවින් ගන්නා ලද වීර්යයද, මැනවින් එළඹ සිටි සිහියද, මැනවින් සන්සුන් වූ සිතද වේ; අතිශයින් තියුණු වූ සඞ්ඛාරුපෙක්ඛා ඤාණය උපදියි.

ඉක්බිති ඒ යෝගාවචරයාහට 'මාර්ගය' උපදිති'යි සඞ්ඛාරුපෙක්ඛා ඤාණය අනිත්‍ය වශයෙන් හෝ දුඃඛ වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ සංස්කාරයන් සම්මර්ශනය කොට භවාංගයට බසියි. භවාංගයට අනතුරුව, සඞ්ඛාරුපෙක්ඛායෙහිදී කළ නයින්ම සංස්කාරයන් අනිත්‍යයහයි හෝ දුඃඛයහයි හෝ, අනාත්මයහයි' හෝ අරමුණු කෙරෙමින් මනෝද්වාරාවර්ජනය උපදියි. ඉක්බිති භවංගය නැවත උපන් ඒ කිරිය චිත්තයට අනතුරුව, අතරක් නැතිව චිත්ත සන්තතිය පවත්වමින්, එසේම සංස්කාරයන් අරමුණු කොට 'පරිකර්ම'යයි කියනු ලබන පළමුවන ජවන චිත්තය උපදියි; ඉනික්බිතිව එසේම සංස්කාරයන් අරමුණු කොට 'උපචාර'යයි කියනු ලබන දෙවන ජවන චිත්තය උපදියි; අනතුරුව එසේම සංස්කාරයන් අරමුණු කොට 'අනුලෝම' යයි කියනු ලබන තෙවන ජවන චිත්තය උපදියි.

ජවනයන් අතුරෙන් එක් එක් ජවනයට වෙන වෙනම මේ නම් තුන වෙතත්, අවිශේෂයෙන් මේ ත්‍රිවිධ වූ ම ජවන් සිත් 'ආසේවන' යයිද, 'පරිකර්ම'යයිද, 'උපචාර'යයිද, 'අනුලෝම'යයිද කිවයුතු වේ. කවරකට අනුලෝම වනුයේද යත්:- පූර්වභාග (පෙර) හා පශ්චිම භාග (පසු) යන්හි වූ ධර්මයනටය; එම ජවන චිත්තය ප්‍රථමයෙන් වූ උදයව්‍යය ආදී විදර්ශනාඥාන අටට අනුරූප කෘත්‍ය ඇති හෙයින් අනුලෝම වේ; මත්තෙහිද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයනට එසේම අනුලෝම වේ.

එම ජවන චිත්තය වනාහි අනිත්‍ය ලක්ෂණාදී වශයෙන් සංස්කාරයන් ඇරබ පැවැති හෙයින්, i. උදයබ්බය ඤාණය ඒකාන්තයෙන් උදය-ව්‍යය සහිත වූම ධර්මයන්ගේ ඉපැදීම හා වැයවීම දුටුයේය'යිද ii. භඞ්ගානුපස්සනා ඤාණය ඒකාන්තයෙන් බිඳෙන සුලු වූම ධර්මයන්ගේ බිඳීම දුටුයේය'යිද. iii. භයතුපට්ඨාන ඤාණයට ඒකාන්තයෙන් භයසහිත වූම ධර්මය භය වශයෙන් වැටහිණැ'යිද, iv. ආදීනවානුපස්සනා ඤාණය ඒකාන්තයෙන් ආදීනව සහිත වූම ධර්මය ආදීනව වශයෙන් දුටුයේය'යිද,

v. නිබ්බිදානුපස්සනා ඤාණය ඒකාන්තයෙන් කලකිරෙනු යුතු වූම ධර්මයෙහි කලකිරීම ඇති කළේයයිද, vi. මුඤ්චිතුකම්‍යතා ඤාණය ඒකාන්තයෙන් මිදිය යුතු වූම ධර්මයෙහි මිදෙනු කැමැති බව ඇති කළේය'යිද, vii. පටිසඞ්ඛානුපස්සනා ඤාණයෙන් ඒකාන්තයෙන් නිරතුරු මෙනෙහි කළ යුතු වූම ධර්මය මෙනෙහි කරන ලදැ'යිද, viii. සඞ්ඛාරුපෙක්ඛාඤාණයෙන් ඒකාන්තයෙන් උපේක්ෂා කළ යුතු වූම ධර්මයෙහි උපේක්ෂා කරන ලදැ'යිද යනුවෙන් අරුත් වශයෙන් කියන ලෙසින්ම මේ විදර්ශනා ඤාණ අටට තථකිච්චතා (අනුරූපවූ කාර්ය) ඇති හෙයින් අනුලෝම වේ. මතුවටද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් එම ප්‍රතිපත්තියට පැමිණිය යුතු වන හෙයින් එසේම අනුලෝම වේ.

යම්සේ වනාහි දැහැමි රජෙක් තෙමේ විනිශ්චයාසනයෙහි හිඳ, ව්‍යවහාරික (අධිකරණ) මහාමාත්‍යවරයන්ගේ විනිශ්චයය අසා අගති ගමනින් තොරව, මැදහත්ව, ''එසේ වේව''යි අනුමත කරනුයේ ඔවුන්ගේ විනිශ්චයයට මතු නොව රාජධර්මයටද (පෙර සිරිතටද) අනුලෝම වේද, මේ කාරණයද එසේම ය'යි දතයුතුය.

මෙහි අනුලෝම ඤාණය රජු වැනිය, විදර්ශනාඥාන අට ව්‍යවහාරික මහාමාත්‍යවරුන් අට දෙනකු වැනිය, සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ පෞරාණික රාජධර්මය වැනියහ. එහි අනිත්‍යාදී වශයෙන් සංස්කාරයන් අරබයා උපදනා ඥාන අටම 'තථකිච්චතා' වශයෙන් අනුලෝම වීම හා මතුවටද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයනට අනුලෝම වීම, රජු ''එසේ වේව''යි පවසමින් අධිකරණ අමාත්‍යවරුන්ගේ විනිශ්චයයටද, පෙර රජසිරිතටද අනුලෝම වීම වැනිය. එහෙයින් 'සච්චානුලෝමික ඤාණ' යයිද කියනු ලැබේ.

අනුලෝම ඤාණය නිමි.

—//—

මේ අනුලෝම ඤාණය වූකලී සංස්කාරයන් අරමුණු කොට ඇති වුට්ඨානගාමිනී විපස්සනාවෙහි අවසාන අවස්ථාවයි. එහෙත් සියලු කරුණු සියලු අතින් ගෙන බලන විට, ගෝත්‍රභූ ඤාණය වුට්ඨාන ගාමිනී විපස්සනාවෙහි අවසාන අවස්ථාව වෙයි.

දැන්, එම වුට්ඨාන ගාමිනී විපස්සනාව පිළිබඳව මුළා නොවීම පිණිස මේ සූත්‍ර සංසන්දනය දතයුතුය; ඒ මෙසේයි:- මේ වුට්ඨානගාමිනී විපස්සනාව සළායතන විභඞ්ග සූත්‍රයෙහි, ''මහණෙනි. අතම්මයතාව (තෘෂ්ණා-දෘෂ්ටි-මාන විරහිත බව) ඇසුරු කොට, අතම්මයතාවට පැමිණ, යම් මේ උපේක්ෂාවක්, ඒකාග්‍රතාවක්, එක් අරමුණක් ඇසුරු කොට පවත්නා බවක් වේද, එය හරිවූ. එය ඉක්මවවූ'' යන මෙහි, අතම්මයතා'යි කියන

ලදි. අලගද්ද සූත්‍රාන්තයෙහි, ''නිර්වේදයට පත් වනුයේ, (සංස්කාරයන් කෙරෙහි) නිබ්බිදා වශයෙන් නො-ඇලෙයි, විරාග වශයෙන් මිදෙයි'' යනුවෙන් මෙසේ 'නිබ්බිදා' යයි කියනලදි. සුසීම සූත්‍රාන්තයෙහි ''සුසීමය, මුලදී පැවැති ධම්මට්ඨිති ඤාණය පසුව නිර්වාණය පිළිබඳ (මාර්ග) ඥානය වේ'' යනුවෙන් 'ධම්මට්ඨිතිඤාණය'යි කියන ලදි. පොට්ඨපාද සූත්‍රාන්තයෙහි, ''පොට්ඨපාදය, සඤ්ඤාව (වුට්ඨාන ගාමිනී විපස්සනාව) පළමුව උපදියි; පසුව (මාර්ග) ඤාණය උපදියි'' යනුවෙන් මෙසේ 'සඤ්ඤග්ග' (සඤ්ඤාවෙහි අග) යයි කියනලදි. දසුත්තර සූත්‍රාන්තයෙහි, ''පටිපදාඤාණදස්සන විසුද්ධි' යනු පාරිශුද්ධියෙහි ප්‍රධානාංගයයි'' යනුවෙන් 'පාරිසුද්ධි පධානියඞ්ග' යයි කියනලදි. පටිසම්භිදා මග්ගයෙහි. ''යම් මුඤ්චිතුකම්‍යතාවක් වේද, යම් පටිසඞ්ඛානුපස්සනාවක් වේද, තවද යම් සඞ්ඛාරුපෙක්ඛාවක් වේද, මේ ධර්මයෝ අර්ථයෙන් සමාන වෙති, හුදෙක් ව්‍යංජන (අක්‍ෂර) වශයෙන්ම නානාවිධ වෙති'' යනුවෙන් නම් තුනෙකින් වහරන ලදි. පට්ඨානයෙහි, ''ගෝත්‍රභූචිත්තයට, වෝදානයට (පිරිසුදුබවට) අනුලෝම වේ'' යනුවෙන් (ගෝත්‍රභූ, වෝදාන යන) නම් දෙකකින් වහරන ලදි. රථවිනීත සූත්‍රාන්තයෙහි, ''ඇවැත්නි, කිමෙක්ද? පටිපදාඤාණවිසුද්ධිය පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වසනු ලැබේද?'' යනුවෙන් 'පටිපදා ඤාණදස්සන විසුද්ධි'යයි කියන ලදි.

ඉති නෙකෙහි නාමෙහි කිත්තිතා යා මහෙසිනා,
වුට්ඨානගාමිනී සන්තා පරිසුද්ධා විපස්සනා
වුට්ඨාතුකාමො සංසාර දුක්ඛ පඞ්කා මහබ්භයා,
කරෙය්‍ය සතතං තත්ථ යොගං පණ්ඩිත ජාතිකො'ති.

මහර්ෂීන් වහන්සේ විසින් මෙසේ නොයෙක් අභිධානයන්ගෙන් පසසන ලද, පිරිසුදුවූ, ශාන්ත වූ යම් වුට්ඨානගාමිනීවිපස්සනාවක් වේද, එය කෙරෙහි, සසර දුක් නමැති මහ වගුරෙන් ගොඩ වනු කැමැති, පණ්ඩිත ස්වභාව ඇත්තේ නිරන්තරයෙන් යෝග කරන්නේය.

සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධිමාර්ගයෙහි,
පඤ්ඤාභාවනාධිකාරයෙහි 'පටිපදාඤාණදස්සන විසුද්ධිනිද්දේස' නම්වූ
එක්විසිවන පරිච්ඡේදය නිමියේයි.

—//—

# ඤාණදස්සන විසුද්ධි නිද්දේසය

මෙයින් (පටිපදා ඤාණදස්සනවිසුද්ධියෙන්) අනතුරුව ගෝත්‍රභූ ඤාණය වේ. එය ආර්ය මාර්ගය ආවර්ජනය කරන ස්ථානයෙහි සිටි හෙයින් පටිපදා ඤාණදස්සන විසුද්ධිය හෝ ඤාණ දස්සන විසුද්ධිය භජනය නොකෙරේ; (එම විසුද්ධීන් දෙකට) අතරින් සිටියේ අව්‍යවහාරික (නිර්වචන කළ නොහැකි)ම වේ. විදර්ශනා ප්‍රවාහයට වැටුණ හෙයින් විදර්ශනා සංඛ්‍යාවට යෙයි.

සෝවාන් මාර්ගය. සකෘදාගාමී මාර්ගය, අනාගාමී මාර්ගය, අර්හත් මාර්ගයයි යන මේ මාර්ග සතර පිළිබඳ වූ ඥානය 'ඤාණදස්සන විසුද්ධි' නම්වේ.

මෙකී මාර්ගයන් අතුරෙන් පළමු කොට ප්‍රථම මාර්ගඥානය සපයනු කැමැත්තහු විසින් කළ යුතු අන් කිසිවක් නැති; ඔහු විසින් කළයුතු දෙයක් වීනම් එය අනුලෝමාවසානයෙහි වූ විදර්ශනාව උපදවමින් කරන ලද්දේම වේ.

මෙසේ උපන් අනුලෝම ඤාණ ඇති ඔහුගේ (ඒ යෝගාවචරයාගේ), එම ත්‍රිවිධ වූම අනුලෝම ඤාණයෙන්, සත්‍යයන් වසා ගෙන සිටි අතිමහත් මෝහාන්ධකාරය, ස්ව-ශක්ති ප්‍රමාණයෙන් අතුරුදහන් කළ කල්හි සකල විධ සංස්කාර ධර්ම විෂයයෙහි සිත නොවදියි, නොසිටියි, නො-ඇලෙයි, නොරැඳෙයි, නොලැගෙයි, නොබැඳෙයි; නෙළුම් කොලයෙහි දිය මෙන් හැකිලෙයි, පැකිලෙයි, ලිහිසයි; සියලු නිමිත්තාරම්මණයද, සියලු පවත්තාරම්මණයද පළිබෝධ වශයෙන් වැටහෙයි.

ඉක්බිති ඔහුට සියලු නිමිත්ත ආරම්මණය හා පවත්ත ආරම්මණය පළිබෝධ සෙයින් වැටහුණු කල්හි, අනුලෝම ඤාණය ආසේවන ප්‍රත්‍යය වශයෙන් පිහිටි පසු, නිමිති රහිත, පැවතුම් රහිත, සංස්කාර විරහිත නිරෝධ සංඛ්‍යාත නිර්වාණය අරමුණු කෙරෙමින්, පෘථග්ජන ගෝත්‍රය, පෘථග්ජන සංඛ්‍යාව (ව්‍යවහාරය), පෘථග්ජන භූමිය ඉක්මවමින්, ආර්යගෝත්‍රයට ආර්ය සංඛ්‍යාවට, ආර්යභූමියට අවතීර්ණ වෙමින්. නිර්වාණාලම්බනය වෙතට ප්‍රථම ආවර්තනය (නැඹුරු වීම) වූ ප්‍රථමාවර්ජනය වූ, ප්‍රථම සමන්නාහාර (යොමු වීම) වූ, මාර්ගයට අනන්තර, සමනන්තර. ආසේවන, උපනිස්සය, නත්‍ථි, විගත යන ෂඩ් - ආකාරයෙන් ප්‍රත්‍යය භාවය සිද්ධ කරන. මුදුන් පත්වූ විදර්ශනාවෙහි අග්‍රඵලයවූ, පෙරළා නොයන ගෝත්‍රභූඤාණය උපදියි. එම ගෝත්‍රභූ ඤාණය සඳහා කියන ලදිඃ-

(අසංඛත ධාතුවෙන් හෙවත් නිර්වාණයෙන්) බාහිරවූ (සංස්කාරයන් කෙරෙන්) නැගී සිටීමේ හා ඉවත්ව සිටීමේ ප්‍රඥාව ගෝත්‍රභූ ඤාණය

වනුයේ කෙසේද? උත්පාදය මැඩලතී'යි ගෝත්‍රභූ නම්, පැවැත්ම -පෙ- උපායාසය මැඩලතී'යි ගෝත්‍රභූ නම්, බාගිර සංස්කාර නිමිත්ත මැඩලතී'යි ගෝත්‍රභූ නම්. අනුත්පාදයට පිවිසෙතී'යි ගෝත්‍රභූ නම්, නොපැවැත්ම -පෙ- උපායාස නොවන බවට, නිරෝධයට, නිර්වාණයට පිවිසෙතී'යි ගෝත්‍රභූ නම්. උත්පාදය මැඩලා අනුත්පාදයට පිවිසෙතී'යි ගෝත්‍රභූ නම්.''[a] යනුවෙන් සියල්ල විස්තර කළ යුතුය.

එහිලා එක් ආවර්ජනයෙකින් එක් වීථියෙක්හි පවත්නා වූද අනුලෝම, ගෝත්‍රභූ යන ඥානද්වයය විවිධ අරමුණෙහි පවත්නා ආකාරය දැක්වෙන උපමාවෙකි මේ:- යම්සේ වනාහි, මහ ඇළෙකින් පැන එතෙර වනු කැමැති පුරුෂයෙක් තෙමේ, වේගයෙන් දුවවිත් ඇළෙහි මෙතෙර ඇති ගසෙක අත්තෙක බඳින ලදුව එල්බෙන රැහැනක් හෝ රිටක් අල්වාගෙන ඇළට උඩින් පැන එතෙරට නැඹුරු වූ, ප්‍රවණ වූ, බරවූ සිරුරු ඇතිව පරතෙර මතට පැමිණියේ, රැහැන හෝ රිට හැර වෙවුලමින් එතෙරට බැස සෙමින් සිටියිද, එසේම මේ යෝගාවචරයාද භව, යෝනි, ගති, ස්ථිති. සත්ත්වාවාස යන මේවායෙන් එතෙර ඇති නිර්වාණයෙහි පිහිටනු කැමැතිව, උදයබ්බයානුපස්සනා ආදිය කරණ කොට වේගයෙන් අවුත්, ආත්මභාව නමැති රුකෙහි, අත්තෙක එල්බෙන රූපස්කන්ධ නමැති රැහැන හෝ වේදනාදිය නමැති එක්තරා රිටක් හෝ ''අනිත්‍යය''යි හෝ, දුඃඛය''යි හෝ, ''අනාත්මය''යි හෝ අනුලෝම ආවර්ජනවශයෙන් අල්වාගෙන, එය නොහරිමින්ම, පළමුවන අනුලෝම චිත්තය කරණ කොට එතොරට පැන. දෙවැන්න කරණ කොට එතෙරට නැඹුරුවූ, ප්‍රවණ වූ, බරවූ සිරුරු ඇතිව මෙන් නිර්වාණය වෙතට නැඹුරුවූ. ප්‍රවණ වූ, බරවූ සිත් ඇතිව, තුන්වැන්න කරණ කොට, එගොඩ මත්තට පැමිණ මෙන්, ඉක්බිතිව පැමිණිය යුතු නිර්වාණය වෙත ළංව, එම (තුන්වන අනුලෝම) චිත්තය නිරුද්ධ වීමත් සමග එම සඞ්ඛාරාරම්මණය හැර පියා ගෝත්‍රභූ චිත්තය කරණ කොට පරතෙර වැනි විසඞ්ඛාර සංඛ්‍යාත නිර්වාණ භූමියෙහි පිහිටයි; එක්ම අරමුණෙක ආසේවනය නොලද බැවින්, වෙවුලමින් සිටින ඒ පුරුෂයා මෙන්, තවමත් මැනවින් නොපිහිටියේ වේ; අනතුරුව මාර්ගඥානයෙන් මැනවින් පිහිටයි.

එහි, අනුලෝම චිත්තය සත්‍යයන් වසන් කොට සිටි ක්ලෙශාන්ධකාරය විදහා ලන්නට සමත් වන මුත්, නිවණ අරමුණු කරන්නට පොහොසත් නොවේ; ගෝත්‍රභූ චිත්තය නිවණ අරමුණු කරන්නටම මුත් සත්‍යයන් මුවහ කොට සිටින ක්ලේශාන්ධකාරය දුරලන්නට නොහැක්කේ වේ.

එහිලා මේ උපමායි:- එක්තරා ඇස් ඇති පුරුෂයෙක් තෙමේ නක්ෂත්‍ර යෝගයක් දන්නෙමී'යි රාත්‍රි කාලයෙහි නික්ම සඳ දකිනු පිණිස

a. පටිසම්භිදාමග්ගපාළි ඤාණකථා

උඩ බැලී, එය වළාකුළින් වැසී තිබුණ හෙයින් ඔහුට නොපෙනිණි, අනතුරුව සුළඟක් නැඟී මහත් මහත් වළාකුළු විදහාලීය, තවත් සුළඟක් නැඟී මධ්‍යම ප්‍රමාණයේ වළාකුළුද තෙවන සුළඟක් නැඟී සියුම් වළාකුළුද පැලවීය. ඉක්බිති ඒ පුරුෂයා පහවූ වළාකුල් සහිත අහසෙහි සඳ දැක නක්ෂත්‍රයෝගය දත්තේය.

එහි, සත්‍යයන් වසා සිටි ස්ථූල, මධ්‍යම, සූක්ෂ්ම ක්ලේශාන්ධකාරය තුන් ආකාර වළාකුළු වැනිය; අනුලෝම සිත් තුන තුන් ආකාර සුළඟ වැනිය, ගෝත්‍රභූ ඤාණය ඇස් ඇති පුරුෂයා වැනිය; නිර්වාණය චන්ද්‍රයා වැනිය. එක් එක් අනුලෝම චිත්තය, සත්‍යයන් වසන් කරන ක්ලේශාන්ධකාරය පහකිරීම. එක් එක් සුළඟක් නැඟී පිළිවෙළින් වළාකුල් පහකිරීම වැනිය. සත්‍යයන් වසන් කරන ක්ලේශාන්ධකාරය පහව ගිය කල ගෝත්‍රභූඤාණය විශුද්ධ වූ නිර්වාණය දැකීම වළාකුල් පහවී ගිය කල ඒ පුරුෂයාහට අහසෙහි යම් සේ වනාහි තුන් සුළඟෙක් නැඟී හුදෙක් සඳ වසා සිටි වලාකුළු විදහා ලන්නට මිස සඳ දකින්නට නොහැකි වේද, එසේම අනුලෝම සිත් හුදෙක් සත්‍යයන් වසා සිටි ක්ලේශාන්ධකාරයම දුරලන්නට මිස නිවණ දකින්නට සමත් නොවේ. යම්සේ ඒ පුරුෂයා හුදෙක් සඳ දක්නට මිස වලා පහකර ලන්නට නොහැකි වන්නේද, එසේම ගෝත්‍රභූ ඤාණය හුදෙක් දක්නටම මිස ක්ලේශාන්ධකාරය දුරලන්නට නොහැකි වේ.

එහෙයින්ම මේ ගෝත්‍රභූඤාණය මාර්ගයට ආවර්ජනය'යි කියනු ලැබේ; එය වනාහි, තෙමේ 'ආවර්ජන' නොවූයේම ආවර්ජනස්ථානයෙහි සිට ''මෙසේ උපදිනුයැ''යි මාර්ගයට සංඥා දෙමින් මෙන් නිරුද්ධ වේ. මාර්ගයද එය දුන් සංඥාව නොහැරම අවිච්ඡින්න පරම්පරා වශයෙන් එම ඥානය අනුව යමින් පෙර නොවිදිවිරූ නොපැළූ විරූ ලෝභස්කන්ධයද. ද්වේෂස්කන්ධයද, මෝහස්කන්ධයද විදිමින්ම, පළමින්ම උපදියි.

එහිලා මේ උපමා යි:- එක්තරා දුනුවායෙක් අටඉස්බක් පමණ දුරින් පුවරු සියයක් තබවා වස්ත්‍රයෙකින් මුහුණ වසා බැඳගෙන, (දුන්නෙහි) හීය රූවා ගෙන, කැරකෙන යන්ත්‍රයෙක සිටියේය; අනෙක් පුරුෂයෙක් යන්ත්‍රය බමවා, පුවරුව දුනුවායා වෙතට එල්ල වන විට එහි ඇති දඬුවෙකින් සංඥා දෙයි; දුනුවායා දඬුවෙන් දුන් සංඥාව වරද්දා නොගෙන හී යවමින් පුවරු සියය විදලයි.

ගෝත්‍රභූ ඤාණය එහි දණ්ඩක සංඥාව වැනිය, මාර්ගඥානය දුනුවායා වැනිය; මාර්ගඥානය ගෝත්‍රභූඥානය විසින් දෙන ලද සංඥාව නොහැරම නිවන් අරමුණු කොට පෙර නොවිදි විරූ, නොපැළු විරූ ලෝභ-ද්වේෂ-මෝහ ස්කන්ධයන් විදීම, පැළීම දුනුවායා දණ්ඩක සංඥාව නොහැර පුවරු සියය විදීම වැනිය.

මේ මාර්ගඥානය කරනුයේ හුදෙක් ලෝභස්කන්ධාදිය විදලීම මතු නොවේ; අග්-මුල් නැති සසර වට දුක් මුහුද වියලවයි; සියලු අපාය දොරටු වසාලයි, සප්ත ආර්ය ධනය හමු කරවයි; අෂ්ටාංගික මිථ්‍යා මාර්ගය හරවයි; සියලු (කෙලෙස්) සතුරු බිය දුරු කරයි; සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ඖරස පුත්‍රභාවයට පමුණුවයි; අනෙකුදු නොයෙක් සියගණන් ආනිසංස ප්‍රතිලාභය පිණිස පවතී. මෙසේ නොයෙක් ආනිසංස ගෙන දෙන සෝවාන් මාර්ගය හා සමග යෙදුන ඥානය සෝතාපත්ති මග්ග ඤාණයයි.

ප්‍රථම මාර්ගඥානය නිමි

—//—

මේ ඥානයට අනතුරුව එහිම විපාක වූ ඵල-සිත් දෙකක් හෝ තුනක් උපදියි. ලෝකෝත්තර කුශලයන් අනතුරු (අතරක් නැතිව වහා පල දෙන) විපාක ඇති හෙයින්ම, ''සමාධිමානන්තරිකඤ්ඤමාහු'' (අනතුරු විපාක සහිත සමාධිය''යි කීහු), ''දන්ධං ආනන්තරිකං පාපුණාති ආසවානං ඛයාය'' (ආශ්‍රවක්ෂයය පිණිස ලැසිව පලදීම අතරක් නැති පලදීමක් බවට පත්වේ) යන ආදිය කියන ලදි.

ඇතැමෙක් වනාහි, පලසිත් එකක්, දෙකක්, තුනක් හෝ සතරක් උපදිති'යි කියත්; එය නොගතයුතුය. අනුලෝමාසේවනය කෙළවර ගෝත්‍රභූ ඤාණය උපදියි; එහෙයින් යටත් පිරිසෙයින් අනුලෝම සිත් දෙකක් විය යුතුය; එකක් වුවහොත් ආසේවනප්‍රත්‍යය නොලබයි; එක් ජවන වීථියක් උපරිම වශයෙන් සිත් සතෙකි; එහෙයින් යම් ජවන වීථියෙක අනුලෝම සිත් දෙකක් වුවහොත්, එහි තුන්වැන්න ගෝත්‍රභූ සිතයි, සිවුවැන්න මාර්ග සිතයි, පලසිත් තුනෙකි; යම් ජවන වීථියෙක අනුලෝම සිත් තුනක් වුවහොත්, එහි සිවුවැන්න ගෝත්‍රභූ වේ, පස්වැන්න මාර්ග සිතයි, පල සිත් දෙකක් වේ; එහෙයින් පල සිත් දෙකක් හෝ තුනක් උපදිති'යි කියනලදි

ඇතැමෙක් වනාහි, ''යම් ජවන වීථියෙක අනුලෝම සිත් සතරක් වුවහොත් එහි පස්වැන්න 'ගෝත්‍රභූ'ද, සවැන්න 'මාර්ගද, ඉතිරි එක 'පල' ද වෙති'යි කියති. එය ''සිවුවැන්න හෝ පස්වැන්න අර්පණාය, භවාංගය ආසන්න වූ හෙයින්, එයින් ඔබ්බට නොවේ'' යයි ප්‍රතික්ෂේප කරන ලද හෙයින් සාර වශයෙන් නොගතයුතුය.

මෙතෙකින් වනාහි මේ යෝගාවචර තෙමේ සෝතාපන්න නම් දෙවන ආර්ය පුද්ගලයා බවට පත්වේ. හේ තෙමේ බොහෝ සෙයින් පමා වූයේ වුවද, (උපරිම වශයෙන්) සත් වරක් දේව-මනුෂ්‍ය ලෝකවල ඉපිද, සැරිසරා සසරදුක් කෙළවර කරනු සමත් වේ.

ඵලාවසානයෙහිදී මොහුගේ සිත භවංගයට අවතීර්ණ වේ; ඉක්බිති, භවංගය සිඳී මාර්ගප්‍රත්‍යවේක්ෂණය පිණිස මනෝද්වාරාවර්ජන චිත්තය උපදී, එය නිරුද්ධ වූ කල පිළිවෙළින් මාර්ගප්‍රත්‍යවේක්ෂණ ජවන් සිත් සතෙක් උපදී; යලිදු භවංගයට බැස එනයින්ම ඵලාදිය ප්‍රත්‍යවේක්ෂණය පිණිස ආවර්ජනාදිය උපදී. එම ආවර්ජනාදිය ඉපැදීමෙන් මේ තෙමේ මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරයි; ඵලය ප්‍රත්‍යවේක්ෂා කරයි, ප්‍රහීණ වූ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරයි, ඉක්බිති ''මාගේ මෙනම් කෙලෙස් ඉතිරිව ඇතැ''යි, මතුවට ඇති මාර්ග තුනෙන් හැරලිය යුතු කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කරයි, අවසන්හි, ''මවිසින් මේ ධර්මය අරමුණු වශයෙන් අවබෝධ කරන ලදැ''යි අමෘත නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරයි. මෙසේ සෝවාන් බවට පත් ආර්යශ්‍රාවකයාහට මේ පංචප්‍රත්‍යවේක්ෂණය වේ.

සෝවාන් වූවහුට යම් සේද, සකෘදාගාමී අනාගාමීන් හටද, එසේම (ප්‍රත්‍යවේක්ෂණ පසක් බැගින්) වේ. රහතුන්හට වනාහි ඉතිරිව ඇති කෙලෙසුන් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙක් නැති; මෙසේ සියල්ල එක් වී ප්‍රත්‍යවේක්ෂණයන් එකුන් විස්සක් වේ. මේ උපරිම පරිච්ඡේද වශයෙනි. ප්‍රහීණ වූ හා ශේෂව ඇති කෙලෙස් ප්‍රත්‍යවේක්ෂණය ශෛක්ෂ්‍යයන් (රහත් නොවූවන්) හටද වියහැකි හෝ නොවියහැකි වේ; එම ප්‍රත්‍යවේක්ෂණය නොමැති වූ හෙයින්ම, මහානාම තෙමේ භාග්‍යවතුන් වහන්සේගෙන්, ''කවර නම් ස්වභාවයක් මා සිත තුළ ප්‍රහීණ නොවූයේ දෝ! ඇතැම් විටෙක ලෝභස්වභාවයන්ද මාසිත මුළුමනින් වැළඳ සිටින හෙයිනි''යි යනුවෙන් (සං. නි. සෝතාපත්ති සංයුත්ත සූත්‍රයෙහි එන පරිදි) සියල්ල විස්තර වශයෙන් දතයුතුය.

සෝවාන් පෙලෙහි සිටි ඒ ආර්ය ශ්‍රාවක තෙමේ මේ ආකාරයෙන් ප්‍රත්‍යවේක්ෂා කොට හුනස්නෙහිමදී හෝ අන් කලෙක දී හෝ කාමරාග-ව්‍යාපාද යන දෙක තුනී වන දෙවන (සකෘදාගාමී) භූමියට පැමිණීම පිණිස යෝග කෙරෙයි; හේ තෙමේ ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ගයන් ගලපමින්, රූප, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර, විඤ්ඤාණ යන එම සංස්කාරයන්ම අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි නුවණින් පිරිමදියි, ඒ මේ අත පෙරළයි, විදර්ශනා වීථියට බසියි.

මෙසේ පිළිපන් ඔහුට යට කී නයින්ම සංඛාරුපෙක්ඛා ඤාණය අවසන්හි, එක් ආවර්ජනයෙන්ම අනුලෝම හා ගෝත්‍රභූ ඤාණයන් උපන් කල ගෝත්‍රභූ ඤාණයට අනතුරුව සකෘදාගාමී මාර්ගය උපදී. එම මාර්ගය හා සම්ප්‍රයුක්ත වූ ඤාණය සකෘදාගාමී මාර්ගඥානයයි.

දෙවන ඥානයයි

—//—

මේ (දෙවන) ඥානයටද අනතුරුව, කියන ලද නයින්ම, පලසිත් දතයුතුය. මෙතෙකින් වනාහි මේ යෝගී තෙමේ, එක් වරක් පමණක් මෙලොවට අවුත් සසර දුක් කෙළවර කරනු සමත් සකෘදාගාමී නම් මේ සිවුවන ආර්යපුද්ගලයා බවට පත්වේ. ඉක්බිති ප්‍රත්‍යවේක්ෂණය කී නයින්ම වේ.

මෙසේ ප්‍රත්‍යවේක්ෂා කෙරෙමින් ඒ සකෘදාගාමී ආර්යශ්‍රාවක තෙමේ, එම අස්නෙහි හුන් වනම හෝ පසු කලෙක හෝ කාමරාග-ව්‍යාපාදයන්ගේ නිරවශේෂ ප්‍රහාණය වූ තෙවන (අනාගාමී) භූමියට පත්වනු පිණිස යෝග කරයි; හේතෙමේ ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ගයන් ගලපමින් එම සංස්කාරයන්ම ''අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ඥානයෙන් පිරිමදියි, ඒ මේ අත පෙරළයි, විදර්ශනා වීථියට බසියි.

මේ ආකාරයෙන් පිළිපන් ඔහුට යට කී නයින්ම සඞ්ඛාරුපෙක්ඛා ඤාණය අවසන්හි, එක් ආවර්ජනයෙන්ම අනුලෝම හා ගෝත්‍රභූ ඥානයන් උපන් කල ගෝත්‍රභූ ඥානයට අනතුරුව අනාගාමී මාර්ගය උපදී. එම මාර්ගය හා සම්ප්‍රයුක්ත වූ ඥානය අනාගාමී මාර්ගඥානයයි.

තුන්වන ඥානයයි.

—//—

මේ ඥානයටද අනතුරුව, කී නයින්ම පලසිත් දතයුතුය. මෙතෙකින් වනාහි ඒ යෝගී තෙමේ අනාගාමී නම් සවන ආර්ය පුද්ගලයකු බවට පත් වේ; හේ තෙමේ ඕපපාතිකව එහිම (ශුද්ධාවාසයන්හි) ඉපිද එහිම පිරිනිවෙන සුලුද පෙරළා නො-එන සුලුද වූයේ, එම ලෝකයෙන් ප්‍රතිසන්ධි වශයෙන් මෙලොවට ආපසු නො-එන්නෙක් වේ, ඉක්බිති කී නයින්ම ප්‍රත්‍යවේක්ෂණය වේ.

මේ ආකාරයෙන් ප්‍රත්‍යවේක්ෂා කරමින් ඒ අනාගාමී ආර්යශ්‍රාවක තෙමේ එම අසුනෙහි හුන්වනම හෝ පසු කලෙක හෝ රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන සංයෝජනයන්ගේ නිරවශේෂ ප්‍රහාණය වූ සිවුවන භූමියට පැමිණීම පිණිස යෝගකරයි; හේ තෙමේ ඉන්ද්‍රිය-බල-බොජ්ඣඞ්ගයන් ගලපමින් එම සංස්කාරයන්ම ''අනිත්‍යය, දුඃඛය, අනාත්මය'යි ඥානයෙන් පිරිමදියි, ඒ මේ අත පෙරළයි, විදර්ශනා වීථියට බසියි.

මෙසේ පිළිපන් ඔහුට යට කී නයින්ම සංඛාරුපෙක්ඛාවසානයෙහි එක් ආවර්ජනයෙන්ම අනුලෝම ගෝත්‍රභූ ඥානයන් උපන් කල්හි. ගෝත්‍රභූ ඥානයට අනතුරුව අර්හත් මාර්ගය උපදී. එය හා සම්ප්‍රයුක්ත වූ ඥානය අර්හත්ත්ව මාර්ග ඥානයයි.

සිවුවන ඥානයයි.

—//—

මේ ඥානයටද අනතුරුව, කී ෆයින්ම පලසිත් වෙති'යි දතයුතුය. මෙතෙකින් වනාහි මේ තෙමේ (අර්හත් නම්) අටවන ආර්ය පුද්ගලයා බවට පත්වේ. හේතෙමේ අවසන් වරට (සාංසාරික) දේහයක් දරන, (ස්කන්ධාදී) සියලු බර බහා තුබූ, ස්වාර්ථාසිද්ධියට පිළිවෙළින් පැමිණි, භව සංයෝජනයන් ක්ෂය කළ, මොනවට දැන විමුක්තියට පැමිණි, දෙවියන් සහිත ලෝකයට අග්‍රදක්ෂිණෙය්‍ය වූ මහාක්ෂීණාශ්‍රව කෙනෙක් වේ.

මෙසේ ''සෝවාන් මාර්ගය, සකෘදාගාමී මාර්ගය, අනාගාමි මාර්ගය, අර්හත් මාර්ගය'යි යන මේ සතර මගෙහි වූ ඥානය 'ඤාණදස්සන විසුද්ධි' නමැයි යමක් (යට) කියන ලද්දේද එය, මෙකී අනුපිළිවෙළින් පැමිණිය යුතු මේ චතුර්විධ ඥානයන් සඳහා කියනලදී.

ඉක්බිත්තෙන් ඥාන සතරක් ඇති මෙම ඤාණදස්සන විසුද්ධිය පිළිබඳ ආනුභාවයන් දැන ගැනීම පිණිසඃ-

පරිපුණ්ණ බොධිපක්ඛිය - භාවො වුට්ඨාන බලසමායොගො,
යෙ යෙන පහාතබ්බා - ධම්මා තෙසං පහානඤ්ච
කිච්චානි පරිඤ්ඤාදීනි - යානි වුත්තානි අභිසමය කාලෙ,
තානි ච යථාසභාවෙන ජානිතබ්බානි සබ්බානීති

පරිපූර්ණ බෝධිපාක්ෂික භාවයද, වුට්ඨාන, බල යන මෙදෙකින් යුක්ත වීමද, එදෙකින් ප්‍රහීණ කළයුතු යම් ක්ලේශ ස්වභාවයක් ඇතොත් එය ප්‍රහීණ කිරීමද

අභිසමය අවස්ථාවෙහි 'පරිඤ්ඤා' ආදී යම් කෘත්‍යයක් කියන ලද්දේ නම්, ඒ සියල්ලද තත්වූ ස්වභාවයෙන් දතයුතුය.

එහි, 'පරිපුණ්ණ බෝධිපක්ඛිය භාවෝ' යනු, බෝධිපාක්ෂික ධර්මයන්ගේ පරිපූර්ණ භාවයයි; සතිපට්ඨාන සතරය, ඉද්ධිපාද සතරය, සම්‍යක් ප්‍රධාන සතරය, බල පසය, බොජ්ඣංග සතය, ආර්ය මාර්ගාංග අටය' යන මේ සත්තිස් ධර්මයෝ බෝධන අර්ථයෙන් 'බෝධි' යයි නම් ලත් ආර්ය මාර්ග පක්ෂයෙහි වූ හෙයින් 'බෝධිපක්ඛිය' නම් වෙති; 'පක්ඛේ භවත්තා' (පක්ෂයෙහි වූ හෙයින්) යනු, ''උපකාරී බවිහි සිටි හෙයිනි'' (යන අර්ථයි.)

ඒ ඒ අරමුණට වැද, පිවිස එළඹ සිටින හෙයින් 'පට්ඨාන' නම්; 'සති ඒව පට්ඨානං' (සිහියද එම පට්ඨානද), 'සතිපට්ඨාන' නම්; කාය, වේදනා, චිත්ත, ධම්ම යන අනුපස්සනාවන්හිදී අශුභ-දුඃඛ-අනිත්‍ය-අනාත්ම ආකාරයන් ගැනීම් වශයෙන් මෙකී සිහිය ශුභ-සුඛ-නිත්‍ය-ආත්ම සංඥාවන්ගේ ප්‍රහාණ වශයෙන් පවත්නා හෙයින් චතුර්විධ භේදය වේ. එහෙයින් 'සතර සතිපට්ඨාන'යයි කියනු ලැබේ.

මෙය කරණ කොට වීර්ය කෙරෙති'යි 'පධාන' නම්, ශෝභන වූ වීර්යය 'සම්මප්පධාන' නම්වේ, මෙය කරණ කොට මනාසේ, සෙමෙන් වීර්ය කෙරෙති'යි හෝ 'සම්මප්පධාන' නම්වේ. ක්ලේශයන් කරණකොට විරූපීවීමෙන් තොරවූ හෙයින් හෝ ශෝභන වේ; හිතසුව නිපදවන හෙයින්ද, ශ්‍රේෂ්ඨභාවය ගෙන එන හෙයින්ද, ප්‍රමුඛභාවය ඇති කරන හෙයින්ද ප්‍රධාන වෙති'යි හෝ 'සම්මප්පධාන' නම් වේ; මේ වීර්යයට අධිවචනයි; ඒ මේ සම්‍යක් ප්‍රධානය උපන් හා නූපන් අකුසල් (පිළිවෙළින්) ප්‍රහීණ කිරීමේ හා නො-ඉපදවීමේ කෘත්‍යයද, නූපන් හා උපන් කුසල් (පිළිවෙළින්) ඉපිද වීමේ හා තිර කර ගැනීමේ කෘත්‍යයද සිද්ධ කෙරෙති'යි මෙසේ චතුර්විධ වේ; එහෙයින් 'සතර සම්‍යක් ප්‍රධාන'යයි කියනු ලැබේ.

යට (ඉද්ධිවිධ නිර්දේශයෙහි) කී නයින්, ඉටු වීමේ අර්ත්‍ථයෙන් 'ඉද්ධි' නම් වේ; සම්ප්‍රයුක්ත වූ එම ඍද්ධියට පූර්වාංගම (මුල්) වෙති'යි යන අර්ත්‍ථයෙන් හා ඵලභාවයට පත් ධර්මයට (ඍද්ධියට) පෙරාතුව කරනු ලැබීමේ අර්ත්‍ථයෙන් එම ඍද්ධියට පදනම් වෙති'යි 'ඉද්ධිපාද' නම්වේ. එය 'ඡන්‍ද' ආදී වශයෙන් චතුර්විධ වේ, එහෙයින් 'චතුරිද්ධිපාද' යයි කියනුලැබේ. එහෙයින් කීහුඃ- ''ඡන්දිද්ධිපාදය, විරියිද්ධිපාදය, චිත්තිද්ධිපාදය, වීමංසිද්ධි පාදය'යි ඍද්ධිපාද සතරෙකි''[a] මේ (ඍද්ධිපාද) ලෝකෝත්තරම වේ. ''ඉදින් ඡන්‍දය අධිපති කොට ගෙන භික්‍ෂු තෙමේ යම් සමාධියක් ලබාද, චිත්තෛකාග්‍රතාවක් ලබාද, මෙය ඡන්‍දසමාධියයි කියනු ලැබේ''[a] යන ආදිය කී හෙයින් ඡන්‍දාදිය අධිපති කොට ලත් ලෞකික සමාධියක්ද වේ.

ශ්‍රද්ධා විරහිත බව, කුසීත බව, ප්‍රමාද බව, වික්‍ෂිප්ත බව හා මුළා බව මැඩලන හෙයින් 'අභිභවන' යයි කියනු ලබන, ආධිපත්‍යාර්ත්‍ථයෙන් 'ඉන්‍ද්‍රිය' (ඉන්‍ද්‍රභාවය) නම්වේ. එකී ශ්‍රද්ධාවිරහිත භාවය විසින් මැඩලිය නොහැකි බැවින්, නොසෙල්විය හැකි බැවින් 'බල' නම්වේ. එම ඉන්‍ද්‍රිය, බල (යන දෙකද) සද්ධා ආදී වශයෙන් පස් වැදෑරුම් වේ; එහෙයින් 'පංච ඉන්‍ද්‍රියය,' 'පංච බලය'යි වහරනු ලැබේ.

අවබෝධ කරන සත්‍වයාහට 'අංග' වන හෙයින් 'සති' ආදී සත 'බොජ්ඣඞ්ග' නම් වේ. (සසරින්) නික්මවති'යි යන අර්ත්‍ථයෙන් සම්මාදිට්ඨි ආදිය 'මග්ගඞ්ග' නම් වේ. එහෙයින් (පිළිවෙළින්) 'සත්ත බොජ්ඣඞ්ග යයිද, 'අරිය අට්ඨඞ්ගික මග්ග'යයිද කියනු ලැබේ.

මෙසේ මේ තිස්හත 'බෝධිපාක්‍ෂික ධර්ම' නම්වේ. ලෞකික විදර්ශනාව පවත්නා මුල් අවස්ථාවෙහිදී තුදුස් ආකාරයෙකින් කය පරිග්‍රහ කරන්නහුට කායානුපස්සනා සතිපට්ඨානයද, නව ආකාරයෙකින් වේදනාව පරිග්‍රහ කරන්නහුට වේදනානුපස්සනා සතිපට්ඨානයද,

---

a. විභඞ්ග පාළි, ඉද්ධිපාද විභඞ්ග

සොළොස් ආකාරයෙකින් සිත පරිග්‍රහ කරන්නහුට චිත්තානුපස්සනා සතිපට්ඨානයද, පස් ආකාරයෙකින් (චෛතසික) ධර්මයන් පරිග්‍රහ කරන්නහුට ධම්මානුපස්සනා සතිපට්ඨානයද සිද්ධ වේ.

මේ ආත්මභාවය තුළ තමා කෙරෙහි නො-උපන්, එහෙත් මෙරමාහට උපන් අකුශලයක් දැක, ''යම් ආකාරයෙකින් පිළිපන් මොහුට මේ අකුශලය උපන්නේද, මම ඒ ආකාරයෙන් නොපිළිපදිමි, මෙසේ වූ කල මට මේ අකුශලය නො-උපදිති'යි එම අකුශලය නො-ඉපැදවීම පිණිස යත්න කරන විට පළමුවන සම්‍යක් ප්‍රධානය වේ; තමා කෙරෙහි පැළඹීමට වන් අකුශලයක් දැක, එය පහ කරනු පිණිස උත්සාහ කරන විට දෙවැන්න වේ; තමා කෙරෙහි පෙර නොවූ විරූ ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ උපදවනු පිණිස යත්න කරන්නහුට තුන්වැන්න වේ; උපන් කුශලයක් නොපිරිහෙන සේ යළියළිත් උපදවන්නහුට සිවුවන සම්‍යක් ප්‍රධානය සිද්ධ වේ.

ඡන්දය ප්‍රමුඛ කොට කුසල් කරන විට ඡන්දිද්ධිපාදය වේ, -පෙ- වීමංසිද්ධිපාදය වේ; මිථ්‍යා වචනයෙන් වෙන් වන විට සම්‍යග්වචනය වෙතැ'යි, මෙසේ (ලෞකික අවස්ථාවෙහිදී) නොයෙක් සිත් තුළ ලැබේ. මේ සතර මාර්ගයන් උපදින කල එක්ම සිතක් තුළ ලැබේ. ඵලක්ෂණයෙහිදී සතර සම්‍යක්ප්‍රධාන හැර ඉතිරි තෙතිස ලැබේ. මෙසේ එක් චිත්තයක් තුළ මේ ධර්මයන් ලැබෙන කල්හි නිර්වාණය අරමුණු කොට ඇති එක්ම 'සති'ය කායාදිය කෙරෙහි වූ ශුභසංඥා ආදිය ප්‍රහීණ කිරීමේ කාර්යය සිද්ධ කිරීම් වශයෙන් සතර 'සම්‍යක්ප්‍රධාන'යයි කියනු ලැබේ. එක්ම වීර්යය නූපන් (අකුසල්) නො-ඉපදවීම් ආදී කාර්යය සිද්ධ කිරීම් වශයෙන් සතර සම්‍යක් ප්‍රධාන යයි කියනු ලැබේ. සෙසු (බෝධිපාක්ෂික) ධර්මයන් පිළිබඳව අඩු වැඩි වීමෙක් නැති, තවද එම ධර්මයන් පිළිබඳව,

නව එකවිධා එකො ද්වෙධාථ චතු පඤ්චධා
අට්ඨධා නවධා චෙව ඉති ඡද්ධා භවන්තු තෙ

(බෝධිපාක්ෂික ධර්මයන් අතුරෙන්) නවයක් ඒකවිධ වේ; තවද එකක් එකක් බැගින් ද්විවිධද, චතුර්විධද, පංචවිධද, අෂ්ටවිධද, නවවිධද, වෙති'යි මෙසේ ඒ (බෝධිපාක්ෂික ධර්මයෝ) සය අයුරෙකින් වෙති.

''නව එකවිධා'' යනු, ඡන්ද, චිත්ත යන දෙකද, පීති, පස්සද්ධි, උපෙක්ඛා යන තුනද, සඞ්කප්ප, වාචා, කම්මන්ත, ආජීව යන සතරදැ'යි යන මේ නවය (පිළිවෙළින්) ඡන්දිද්ධිපාදාදී වශයෙන් (ඉද්ධිපාද,) බොජ්ඣඞ්ග හෝ මග්ගඞ්ග වශයෙන් ඒකවිධම වේ; අන් කොටසක් නොබෙජේ. ''එකො ද්වේධා'' යනු, ශ්‍රද්ධාව ඉන්ද්‍රියයක් සෙයින්ද, බලයක් සෙයින්දැ'යි දෙයයුරෙකින් සිටියි. ''අථ චතු- පඤ්චධා'' යනු, අනෙකක් සිවු අයුරෙකින්ද, තවද අනෙකක් පස් අයුරෙකින්ද සිටිති'යි යන අර්ථයි.

එහි එකක් වන සමාධිය ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, හා මග්ගඞ්ග (සම්මා සමාධි) වශයෙන් සිවු'අයුරෙකින් සිටියි; ප්‍රඥාවද එම සතර අයුරෙන් හා ඉද්ධිපාද (වීමංස) වශයෙන්ද්'යි පස් ආකාර වේ; ''අට්ඨධා නවධා චෙව'' යනු, තවද එකක් අට අයුරෙකින්ද, අනෙකක් නව අයුරෙකින්ද වෙති'යි යන අර්ථයි. සතිය (සිහිය) චතු සතිපට්ඨාන, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග (සම්මාසති) වශයෙන් අටඅයුරෙකින් සිටියි; වීර්යය චතුසම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග (සම්මා වායාම) වශයෙන් නව අයුරෙකින් සිටියි. මෙසේ,

> චුද්දසෙව අසම්භින්නා හොන්ති තෙ බොධි පක්ඛියා,
> කොට්ඨාසතො සත්තවිධා සත්තතිංසප්පභෙදතො
> සකිච්ච නිප්පාදනතො සරූපෙන ච වුත්තිතො,
> සබ්බෙව අරිය මග්ගස්ස සම්භවෙ සම්භවන්ති තෙ'ති.

මේ බෝධිපාක්ෂික ධර්මයෝ බෙදීම් නොමැතිව ගත්කල තුදුසක්ම වෙති; (සති, විරිය, ඡන්ද, චිත්ත, පඤ්ඤා, සද්ධා, සමාධි, පීති, පස්සද්ධි, උපෙක්ඛා, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යනුවෙනි). කොටස් වශයෙන් සතෙකි; (සතිපට්ඨාන, සම්මප්පධාන, ඉද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග යනුවෙනි); ප්‍රභේද වශයෙන් තිස් හතෙකි.

ස්ව-කෘත්‍ය නිෂ්පාදන වශයෙන්ද, ස්ව-රූප වශයෙන්ද, ස්ව-වෘත්ති වශයෙන්ද මේ (බෝධිපාක්ෂික ධර්ම) සියල්ලම ආර්යමාර්ග ඉපිදවීමෙහි සාධක වේ.

මෙසේ පළමු කොට මෙහි පරිපූර්ණ බෝධිපාක්ෂික භාවය දතයුතුය.

ඉහත සඳහන් ''පරිපුණ්ණ...'' ආදි ගාථා යුගලයෙහි, ''වුට්ඨානබල සමායොගො'' යනු, ව්‍යුත්ථානයෙන් (නැගීමෙන් හා (සමථ-විදර්ශනා) බලයෙන් යුක්ත වීමයි; ලෞකික විපස්සනාව වූකලී, (සංස්කාර) නිමිත්ත අරමුණු කොට ඇති හෙයින්ද, (ප්‍රවෘත්ති කාරණ (පැවැත්මට හේතු) වූ සමුදයය නොසිඳින ලද හෙයින්ද, නිමිත්තෙන් හෝ (විපාක) ප්‍රවෘත්තියෙන් නොනැඟේ. ගෝත්‍රභූ ඤාණය සමුදයය නොසිඳීමේ හේතුවෙන් (විපාක) ප්‍රවෘත්තියෙන් නොනැඟේ, එහෙත් නිර්වාණය අරමුණු කොට ඇති හෙයින් නිමිත්තෙන් නැඟෙති'යි ''ඒකතො වුට්ඨානය'' (එකෙකින් නැගීම) වේ. එහෙයින් කීහු:- බාහිරවූ (සංස්කාරයන්ගෙන්) නැඟීමයයි කියනු ලබන විවර්තනය (පෙරළීම) පිළිබඳ ප්‍රඥාව ගෝත්‍රභූ ඤාණයයි''[2] එසේම ''උත්පාදයෙන් පෙරළී අනුත්පාදයට (නිවණට) වදිති''යිද, පැවැත්මෙන් පෙරලී (නොපැවැත්මට වදිති'යිද) ගෝත්‍රභූ නම් වෙති'යි යනුවෙන් (පෙරකී නයින්) සියල්ල දතයුතුය.

මේ මාර්ගඥාන සතර වනාහි අනිමිත්ත (නිවණ) අරමුණු කොට ඇති හෙයින් නිමිත්තෙපාද සමුදය සමුච්ඡේද කරන හෙයින් පැවැත්මෙන්ද නැඟෙති'යි 'දුභතො වුට්ඨාන' (නිමිත්ත, පවත්ත යන දෙකින්ම නැඟීම) නම් වේ. එහෙයින් කියන ලදිः- ''දුභතෝවුට්ඨාන වශයෙන් විවට්ටන (පෙරලීම්) විෂයයෙහි ප්‍රඥාව මාර්ගඥානය වනුයේ කෙසේද? සෝවාන් මාර්ගක්ෂණයෙහි (චතුරාර්යසත්‍යය) දකිති'යි යන අර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැඟෙයි; එම මිථ්‍යාදෘෂ්ටියට අනුගත ක්ලේශයන්ගෙන්ද, ස්කන්ධයන්ගෙන්ද නැඟෙයි; බාහිර නිමිති සියල්ලෙන්ද නැඟෙයි; එහෙයින් 'දුභතෝවුට්ඨාන විවට්ටනයෙහි (නිමිත්ත, පවත්ත යන දෙකින්ම නැඟීමයයි කියනු ලබන විවර්තනයෙහි (හෙවත් පෙරළීමෙහි) ප්‍රඥාව මාර්ග විෂයයෙහි ඥානයයි කියනු ලැබේ.''[a] යනුවෙනි.

(අභිනිරෝපනට්ඨෙන) (නිවණකරා) යොමු කරති'යි යන අර්ථයෙන් සම්මා සංකප්පය මිච්ඡා සංකප්පයෙන්ද -පෙ-, (පරිග්ගහට්ඨෙන) මනා කොට ගනිති'යි යන අර්ථයෙන් සම්මාවාචා - මිච්ඡා වාචාවෙන්ද -පෙ-, (සමුට්ඨානට්ඨෙන) මනාකොට නැඟටුවති'යි යන අර්ථයෙන් සම්මා කම්මන්තය -පෙ-, (වොදානට්ඨෙන) පිරිසුදු කරති'යි යන අර්ථයෙන් සම්මා ආජීවය -පෙ-, (පග්ගහට්ඨෙන) වීර්ය කෙරෙති'යි යන අර්ථයෙන් සම්මා වායාමය -පෙ-, (උපට්ඨානට්ඨෙන) එළඹ සිටිති'යි යන අර්ථයෙන් සම්මාසතිය -පෙ-, (අවික්ඛේපනට්ඨෙන) ඒ මේ අත නොවිසිරෙති'යි යන අර්ථයෙන් සම්මා සමාධිය මිථ්‍යා සමාධියෙන්ද නැඟී සිටියි; එයට අනුගතව පවත්නා ක්ලේශයන් කෙරෙන්ද, ස්කන්ධයන් කෙරෙන්ද, නැඟී සිටියි, බාහිර වූ සියලු නිමිත්තයන් කෙරෙන්ද නැඟී සිටියි; එහෙයින් දුභතො වුට්ඨාන වශයෙන් විවර්තන (පෙරළීමේ) ප්‍රඥාව මාර්ගය පිළිබඳ ඥානයයි කියනු ලැබේ.

සකෘදාගාමී මාර්ගක්ෂණයෙහිදීද දර්ශනාර්ථයෙන් සම්මාදිට්ඨිය -පෙ-, අවික්ෂේපාර්ථයෙන් සම්මා සමාධිය ඕළාරික වූ කාමරාග සංයෝජනයෙන්ද, පටිඝ සංයෝජනයෙන්ද, ඕළාරික වූ කාමරාග අනුසයයෙන්ද, පටිඝානුසයයෙන්ද නැඟෙයි -පෙ-, අනාගාමිමාර්ගක්ෂණයෙහිදීද, දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය -පෙ-, අවික්ෂේපාර්ථයෙන් සම්මා සමාධිය, අනුසහගත (ශේෂ) වූ කාමරාග සංයෝජනයෙන්ද, පටිඝ සංයෝජනයෙන්ද, අනුසහගත වූ කාමරාග අනුසයයෙන්ද, පටිඝ අනුසයයෙන්ද නැඟෙයි -පෙ-, අර්හත් මාර්ගක්ෂණයෙහිදීද, දර්ශනාර්ථයෙන් සම්මා දිට්ඨිය -පෙ-, අවික්ෂේපාර්ථයෙන් සම්මාසමාධිය රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන මෙයින්ද, නැඟෙයි; එම අනුසයයන් අනුව පවත්නා ක්ලේශයන්ගෙන්ද, ස්කන්ධයන් කෙරෙන්ද

---

a. පටිසම්භිදා පාළි. ඥාණ කථා

නැගෙයි; බාහිරවූ සියලු නිමිත්තයන් කෙරෙන්ද නැගෙයි; එහෙයින් දූහතෝ වුට්ඨාන වශයෙන් නිවර්තනයේ (පෙරළීමේ) ප්‍රඥාව මාර්ග විෂයයෙහි ඥාන''යයි කියනු ලැබේ.

ලෞකික වූ අෂ්ට සමාපත්තීන් වඩන කල සමථ බලය අධික වේ; අනිච්චානුපස්සනා ආදිය වඩන කල විදර්ශනා බලය අධික වේ. ආර්ය මාර්ග ක්‍ෂණයෙහි වනාහි එම සමථ-විපස්සනා දෙක එකිනෙක නොඉක්මවති'යි යන අර්ථයෙන් යුගනද්ධ (වියගසෙහි බැඳි ගොනුන් සෙයින් සමසේ බැඳී) පවතී. එහෙයින් මේ ඥාන සතරෙහිදීම උභය බල සමායෝගය (සමථ-විපස්සනා යන දෙක සම්බලව යෙදීම) වේ. එහෙයින් කියනලදි:- ''උද්ධච්චය සහිත ක්ලේශයන් කෙරෙන්ද, ස්කන්ධයන් කෙරෙන්ද නැගෙන්නහුගේ සිතෙහි, ඒකාග්‍රතාව, අවික්ෂේපය (නොවිසරුණු බව), සමාධිය නිරෝධය (නිවණ) වෙතට යොමුව පවතී; අවිද්‍යා සහගත ක්ලේශයන් කෙරෙන්ද ස්කන්ධයන් කෙරෙන්ද නැගෙන්නහුගේ විදර්ශනාව අනුදර්ශන (අනුව බලන) අර්ථයෙන් නිරෝධය වෙතට යොමුව පවතී; මෙසේ වුට්ඨාන (නැඟී සිටීමේ) අර්ථයෙන් සමථ-විපස්සනා යන දෙක සමාන කෘත්‍ය සහිත වේ, යුගනද්ධ (වියගසෙහි බැඳි ගොනුන් සේ) වේ, එකිනෙක නො-ඉක්මවයි; එහෙයින් ව්‍යුත්ථානාර්ථයෙන් සමථ විපස්සනා යන දෙක යුගනද්ධයන් සෙයින් වඩති'යි[a] කියනු ලැබේ. මෙසේ මෙහි වුට්ඨාන බල සමායෝගය (නැඟීමේදී බලය සම සේ යෙදීම) දතයුතුය.

(ඉහත සඳහන් ගාථාවෙහි) ''යෙ යෙන පහාතබ්බා ධම්මා තෙසං පහානඤ්ච'' යනු, මෙකී ඥානයන් අතුරෙන් යම් ඥානයෙකින් යම් ක්ලේශ ස්වභාවයක් පහ කළ යුතු වේ නම්, එහි ප්‍රහාණයද දතයුතුය. මේ ඥාන සතර සුදුසු පරිදි සංයෝජන, ක්ලේශ, මිථ්‍යාදෘෂ්ටි ආදිය ලෞකික ස්වභාවය, මාත්සර්ය, විපර්යාස, ග්‍රන්ථ, අගති, ආශ්‍රව, ඕඝ, යෝග, නීවරණ, පරාමාස, උපාදාන, අනුසය, මල, අකුසල-කම්මපථ, චිත්තුප්පාද යයි (නොයෙක් නම්වලින්) වහරනු ලබන ස්වභාවයන්ගේ ප්‍රහාණය සිදු කරයි.

එහි, 'සංයෝජනානි' යනු, (මේ භවයෙහි වූ) ස්කන්ධයන් (මතුභවයෙහි වන) ස්කන්ධයන් සමග, නොහොත් කර්මය ඵලය හා සමග, නැතහොත්, සත්ත්වයන් සසර දුකින් බැඳලන හෙයින් රූපරාගාදී දශ ස්වභාවයෝ සංයෝජන යන නමින් වහරනු ලබත්. යම් තාක් මේ රූපරාගාදිය පවත්නේද, ඒතාක් මේ ස්කන්ධ - ඵල - දුඃඛයන්ගේ නැවැත්මක් නැත. එහිද, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච අවිජ්ජා යන මේ පස උසස් භවයන්හි උපදවන ස්කන්ධාදිය සංයෝජනය කරන හෙයින් ''උද්ධම්භාගිය සංයෝජන'' නම් වේ; සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත

a. පට්ඨාන පාළි, යුගනද්ධකථා

පරාමාස, කාමරාග, පටිඝ යන මේ පස රූප-අරූප භවයන්ගෙන් පහළ භවයන්හි ඉපැදවීම සිදු කරන ස්කන්ධාදිය සංයෝජනය කරන හෙයින් ඕරම්භාගිය සංයෝජන නම් වේ.

මෙහි, කිලේස යනු, තමාම කිලිටි හෙයින්ද, සම්ප්‍රයුක්ත ධර්මයන් කිලිටි කරන හෙයින්ද, ලෝභ, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි, විචිකිත්සා, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප, යන මේ දස (අකුශල) ධර්මයි.

'මිච්ඡත්ත' (මිථ්‍යාභාව) යනු, මිථ්‍යාව පවත්වන හෙයින් මිච්ඡාදිට්ඨි, මිච්ඡා සඞ්කප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡා සති, මිච්ඡාසමාධි යන මේ අටයි, නොහොත්, මිච්ඡා විමුත්ති, මිච්ඡා ඤාණ යන දෙක හා සමග දසයක් වේ.

'ලෝකධම්ම' යනු, ලෝකය පවත්නා තාක් නොනවත්න ස්වභාව ඇති හෙයින් ලාභ, අලාභ, අයස, යස, සුඛ, දුඃඛ, නින්දා, පසංසා යන මේ අටයි. මෙහි වනාහි කාරණා-උපචාරයෙන් (කාරණය හෙවත් හේතුව සඳහන් කිරීමෙන් කාර්යය හෙවත් ඵලය හැඟවීම මගින්) ලාභ ආදිය වස්තු කොට ඇති අනුනය තෘෂ්ණාවද, අලාභ ආදිය වස්තු කොට ඇති පටිඝයද, මෙසේ ලෝක ධර්ම ග්‍රහණයෙන් ගන්නා ලද'යි දතයුතුය.

'මච්ඡරිය' යනු, ආවාස මච්ඡරිය, කුල මච්ඡරිය, ලාභමච්ඡරිය, ධම්ම මච්ඡරිය, වණ්ණ මච්ඡරියයි යන ආවාස ආදිය අනුන්හට පොදු බව නො-ඉවසන ස්වභාවයෙන් පවත්නා මසුරු බවයි.

'විපල්ලාස' යනු, අනිත්‍ය. දුඃඛ, අනාත්ම අසුභ වූම වස්තූන් කෙරෙහි නිත්‍යය, සුඛය, ආත්මය, ශුභයයි මෙසේ පවත්නා සංඥා විපර්යාසය, චිත්ත විපර්යාසය, දෘෂ්ටි විපර්යාසය යන මේ තුනයි.

'ගන්ථ' යනු, නාමකාය යන දෙක එක් කොට ගැට ගසන හෙයින් අභිධ්‍යා ආදී සතරයි; ඒ එසේ මැයි, අභිධ්‍යා කාය ග්‍රන්ථය, ව්‍යාපාද කාය ග්‍රන්ථය, සීලබ්බතපරාමාස කායග්‍රන්ථය, ඉදං සච්චාභිනිවේස කාය ග්‍රන්ථය යන මේ සතර කියන ලදි.

'අගති' යනු, ඡන්ද, දෝස, මෝහ, භය යන මේ හේතූන් නිසා නොකළ යුත්තක් කිරීම හා කළයුත්තක් නොකිරීම යන මෙයට අධිවචනයි. ආර්යයන් විසින් එයට නොයායුතු හෙයින් 'අගති' යයි කියනු ලැබේ.

'ආසව' යනු, අරමුණු වශයෙන් ගෝත්‍රභූ චිත්තය දක්වාද, භවාග්‍රය දක්වාද, වැගිරෙන හෙයින් හා සංවර නොකරන ලද ද්වරයන්ගෙන්, කළයෙක සිදුරුවලින් ජලය මෙන් වැගිරෙන හෙයින් නිරන්තරයෙන් වහනය වෙති'යි යන අර්ථයෙන්ද, නොහොත්, සසර දුක් වහනය වන හෙයින්ද, කාමරාග, භවරාග, මිච්ඡාදිට්ඨි, අවිජ්ජා යන මොවුනට අධිවචනයි.

'ඕඝ' යනු, සසර සයුර වෙතට ඇදලන අරුතින් හා තරණය කිරීම දුෂ්කරය යන අරුතින් 'ඕඝ' යයි,

'යෝග' යනු, ආලම්බන වියෝගයටද දුඃඛ වියෝගයටද ඉඩ නොදෙන හෙයින් යෝග යයිද එම ආශ්‍රවයනටම අධිවචනයි.

'නීවරණ' යනු, (කුශල නොහොත් ධ්‍යාන) චිත්තය අවුරන, වසන් කරන, මුවහ කරන අරුතින් කාමච්ඡන්ද ආදී පසයි.

'පරාමාස' යනු, ඒ ඒ ධර්මයන් පිළිබඳ යථා ස්වභාවය ඉක්මවා, විපරීත ලෙසින්, නැති ස්වභාවයක් දැඩිව අල්වාගැනීමේ ආකාරයෙන් පවත්නා හෙයින් මිථ්‍යාදෘෂ්ටියට මේ අධිවචනයි.

'උපාදාන' යනු, යට පටිච්චසමුප්පාද (පඤ්ඤාභූමි) නිද්දේසයෙහි සියලු ආකාරයෙන් විස්තර කරන ලද කාමූපාදානාදී (උපාදාන) සතරයි.

'අනුසය' යනු, බලවත් බවට පත්වූයේ යන අර්ථයෙන් කාමරාග, පටිඝ. මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා යන අනුසය සතයි. ඔහු වනාහි බලවත් බවට ගිය හෙයින් නැවත නැවතත් කාමරාග ආදිය ඉපැදීමට හේතුවන බැවින් 'අනුව හොවිත'යි යන අරුතින් 'අනුසය' නම් වෙති.

'මල' යනු, තෙල් අඳුන් කලල් සෙයින් තමා ද අපිරිසුදුව මෙරමාද අපිරිසුදු කරවන බැවින් ලෝභ, ද්වේෂ, මෝහ යන තුනයි.

'අකුසල කම්මපථ' යනු, අකුශල කර්ම වන බැවින්ද, දුර්ගතියට මාර්ග වන බැවින්ද, පාණාතිපාතය, අදින්නාදානය, කාමේසුමිච්ඡාචාරය, මුසාවාදය, පිසුණා වාචාය, ඵරුසා වාචාය, සම්ඵප්පලාපය, අභිජ්ඣාය, ව්‍යාපාදය, මිච්ඡාදිට්ඨිය යන මේ දශයයි.

'අකුසල චිත්තුප්පාද' යනු, ලෝභ මූලික අටය, දෝස මූලික දෙකය, මෝහ මූලික දෙකය යන මේ දොළොසයි.

මෙසේ මේ මාර්ගඥාන සතර, මෙකී සංයෝජනාදී වූ අකුශල ධර්මයන් යෙදෙන පරිදි ප්‍රහීණ කරයි; කෙසේද යත්:- පළමුකොට සංයෝජනයන් අතුරෙන් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන තුනද, අපායට පැමිණවිය හැකි කාමරාග, පටිඝ යන දෙකද'යි යන මේ සංයෝජන පස ප්‍රථම මාර්ගඥානයෙන් නැසිය යුතුවේ. ඕළාරිකවූ සෙසු (අපායගමනීය නොවන) කාමරාගය හා පටිඝය ද්විතීය මාර්ගඥානයෙන් නැසිය යුතුවේ. සියුම් වූ කාමරාගය හා පටිඝය තෘතීය මාර්ගඥානයෙන් නැසිය යුතුවේ. රූපරාග ආදී ඉතිරි සංයෝජන පස චතුර්ථ මාර්ගඥානයෙන්ම නැසිය යුතුවේ.

මතුවටද යම් යම් තැනෙක්හි 'ඒව' යනුවෙන් අවධාරණය නොකරන්නමෝද, ඒ ඒ තන්හි යම් යම් (ක්ලේශාදියක්) උසස් වූ (දෙවන, තුන්වන, සිවුවන) මාර්ගඥානයන් මගින් නැසියයුතුයයි කියන්නමෝද, ඒ ඒ (ක්ලේශ ස්වභාවය) පූර්ව මාර්ගඥානයන් මගින් නසන ලද අපාය ගාමනීයාදිභාවය ඇතිවම 'උපරිඤාණවජ්ඣ' (උසස් මාර්ග ඥානයන් මගින් නැසිය යුතු) වෙතැ'යි දතයුතුය.

ක්ලේශයන් අතුරෙන්, දිට්ඨි, විචිකිච්ඡා යන දෙක ප්‍රථම ඥානයෙන් නැසිය යුතුවේ, ද්වේෂය තෘතීය මාර්ගඥානයෙන් නැසිය යුතුවේ, ලෝභ, මෝහ, මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන සත චතුර්ථ මාර්ග ඥානයෙන් නැසියයුතු වේ.

මිච්ඡත්ත (මිථ්‍යාභාව) යන් අතුරෙන්, මිච්ඡාදිට්ඨි, මුසාවාද, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව යන සතර ප්‍රථම ඥානයෙන් නැසිය යුතුවේ, මිච්ඡා සඞ්කප්ප, පිසුණා වාචා, ඵරුෂා වාචා යන මේ තුන තෘතිය ඥානයෙන් නැසියයුතු වේ. මෙහි 'වාචා' යනුවෙන් අදහස් වනුයේ චේතනාවම බව දත යුතුය. සම්ඵප්පලාප, මිච්ඡාවායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධි, මිච්ඡා විමුත්ති, මිච්ඡා ඤාණ යන සය චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ.

ලෝකධර්මයන් අතුරෙන් (අලාභාදිය නිසා ඇතිවන) පටිඝය තෘතීය ඥානයෙන් නැසිය යුතුවේ, (ලාභාදියෙන් ඇතිවන) අනුනය තෘෂ්ණාව චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ, යසසෙහි හා ප්‍රශංසාවෙහිදී ඇති වන අනුනය තෘෂ්ණාව පමණක් චතුර්ථඥානයෙන් නැසිය යුතුයයි ඇතැමෙක් යෙති. මච්ඡරිය (මසුරුකම) ප්‍රථමඥානයෙන්ම නැසිය යුතුය.

විපල්ලාස (විපර්යාස) යන් අතුරෙන්, අනිත්‍ය වස්තු විෂයයෙහි නිත්‍යයයිද, අනාත්ම වස්තු විෂයයෙහි ආත්මයයිද යනුවෙන් වන සංඥා, චිත්ත, දෘෂ්ටි-විපර්යාස හා දුඃඛයෙහි සුඛයයිද, අශුභයෙහි ශුභයයිද යනුවෙන් වන දෘෂ්ටි-විපර්යාසද'යි යන මොහු ප්‍රථම ඥානයෙන් නැසිය යුතු වෙති, අශුභයෙහි ශුභයයි යනුවෙන් වන සංඥා - චිත්ත - විපර්යාසයෝ තෘතීයඥානයෙන් නැසියයුතු වෙති. දුඃඛයෙහි සුඛයයි යනුවෙන් වන සංඥා-චිත්ත-විපර්යාසයෝ චතුර්ථඥානයෙන් නැසිය යුතු වෙති.

ග්‍රන්ථ (ගැට)යන් අතුරෙන්, සීලබ්බතපරාමාස, ඉදං සච්චාභිනිවේස යන කායග්‍රන්ථ දෙක ප්‍රථමඥානයෙන් නැසියයුතු වේ, ව්‍යාපාද කායග්‍රන්ථය තෘතීය ඥානයෙන් නැසියයුතු වේ; ඉතිරි (ව්‍යාපාද) කාය ග්‍රන්ථය චතුර්ථඥානයෙන් නැසියයුතු වේ.

අගති සතර ප්‍රථමඥානයෙන්ම නැසිය යුතුවේ. ආශ්‍රවයන් අතුරෙන්, දිට්ඨාසවය ප්‍රථම ඥානයෙන් නැසිය යුතුවේ; කාමාසවය තෘතීය

ඥානයෙන් නැසිය යුතුවේ; ඉතිරි (භවාසව, අවිජ්ජාසව යන) දෙක චතුර්ථ ඥානයෙන් නැසියයුතු වේ.

ඕඝ හා යෝග විෂයයෙහිද මෙම නයයි.

නීවරණයන් අතුරෙන් විචිකිච්ඡා නීවරණය ප්‍රථමඥානයෙන් නැසිය යුතුවේ; කාමච්ඡන්ද, ව්‍යාපාද, කුක්කුච්ච යන තුන තෘතීයඥානයෙන් නැසිය යුතුවේ; ථීන මිද්ධ, උද්ධච්ච යන දෙක චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ.

පරාමාසය ප්‍රථමඥානයෙන්ම නැසියයුතු වේ.

උපාදානයන් අතුරෙන්, සියලුම ලෞකික ස්වභාවයන් වස්තුකාම වශයෙන් කාමයන්ම වෙති'යි (පෙළෙහි) ආ හෙයින් රූප හා අරූප රාගයද කාමූපාදාන සංඛ්‍යාවට වැටේ, එහෙයින් එය චතුර්ථඥානයෙන් නැසිය යුතු වේ; සෙසු (දිට්ඨි, සීලබ්බත, අත්තවාද යන) තුන ප්‍රථමඥානයෙන් නැසිය යුතු වේ.

අනුසයයන් අතුරෙන් දිට්ඨි හා විචිකිච්ඡා යන අනුසය දෙක ප්‍රථමඥානයෙන් නැසිය යුතුය, මාන, භවරාග, අවිජ්ජා යන තුන චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ.

මල අතුරෙන් ද්වේෂ මලය තෘතීය ඥානයෙන් නැසිය යුතු වේ; ඉතිරි දෙක චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ.

අකුසල කම්මපථයන් අතුරෙන්, පාණාතිපාත, අදින්නාදාන, මිච්ඡාචාර, මුසාවාද, මිච්ඡාදිට්ඨි යන මේ පස ප්‍රථමඥානයෙන් නැසිය යුතුවේ; පිසුණාවාචා, ඵරුසා වාචා, ව්‍යාපාද යන තුන තෘතීය ඥානයෙන් නැසිය යුතුවේ; සම්ඵප්පලාප, අභිජ්ඣා යන දෙක චතුර්ථඥානයෙන් නැසිය යුතුවේ.

අකුසල චිත්තුප්පාදයන් අතුරෙන්, දිට්ඨිගත සම්පයුත්ත සතර හා විචිකිච්ඡා සම්පයුත්තයයි යන පස ප්‍රථමඥානයෙන් නැසිය යුතුවේ; පටිඝ සම්පයුත්ත දෙක තෘතීය ඥානයෙන් නැසිය යුතුවේ. ඉතිරි පස චතුර්ථඥානයෙන් නැසියයුතු වේ.

තවද (සංයෝජනාදී වූ) යම් ස්වභාවයක් යම් (මාර්ගඥානයෙකින්) නැසිය යුතු වන්නේ ද, එම (සංයෝජනාදිය) එම මාර්ගඥානයෙන් ප්‍රහීණ කළ යුතු වන්නේ නම් ද වේ. එහෙයින්, ''මෙසේ මේ මාර්ගඥානයන් මේ සංයෝජනාදී ස්වභාවයන්ගේ ප්‍රහාණය නිසි පරිදි සිදු කෙරෙති''යි කියන ලදී.

මේ මාර්ගඥානයෝ අතීත හා අනාගත වූ (සංයෝජනාදී) ධර්මයන් පහ කෙරෙත්ද? නැතහොත් වර්තමාන ධර්මයන් පහ කෙරෙත්ද? යත්:- ඉදින්, පළමුකොට, මෙහි පහ කෙරෙනුයේ අතීත-අනාගත ධර්මයන්

නම්, එය ඵලරහිත ව්‍යායාමයක් වන්නේය; කවර හෙයින්ද? (අතීත - අනාගත දෙකෙහිම) පහකළ යුතු දෙයක් නැති හෙයිනි. එසේ නම් (පහ කැරෙනුයේ) වර්තමාන ධර්මයන්ද? එසේ වුවද, (ව්‍යායාමය) ඵල රහිත වේ; ව්‍යායාමය හා සමග පහ කළ යුතු සංයෝජන ආදියද ඇති හෙයිනි; එසේ වුව හොත් මාර්ග භාවනාවද කිලිටි බවට පත් වෙති'යි යනු ගම්‍ය වේ; එසේ වුවහොත්, ක්ලේශයන් (සිතින්) වෙන්ව පවත්නා බවත් ගම්‍ය වේ. (එහෙත්) සිතින් පවත්නා ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) ක්ලේශ නමැ'යි දෙයක් නැත්තේය.

මෙය ආවේණික (අපූර්ව) චෝදනාවක් (ප්‍රශ්නයක්) නොවේ; පාළියෙහිම වනාහි:- ''යම් මේ මාර්ගඥානයක් කෙලෙසුන් පහ කෙරේ නම්, එය පහකරනුයේ අතීත වූ, නැත හොත් අනාගත වූ, එසේද නැතහොත් වර්තමාන වූ කෙලෙස්ද''[a]යි චෝදනා (ප්‍රශ්න) කොට, යලිදු, ''ඉදින්, පහ කෙරෙනුයේ අතීත වූ කෙලෙස් නම්, එවිට ක්‍ෂය වූවක් ක්‍ෂය කරන්නේ වේ; නිරුද්ධ වූවක් නිරුද්ධ කරන්නේ වේ; පහ වූවක් පහ කරන්නේ වේ, ඉකුත්ව ගිය දෙයක් ඉකුත් කරන්නේ වේ; අතීත වූ දෙයක් නොපවත්නේ වේද, (නොපවත්නා) එවන් දෙයක් පහ කරනුයේ වේ''යයි පරිහාර (පිළිතුරු) වශයෙන් කියා, ''අතීත වූ කෙලෙස් පහ කරන්නේ නොවේය''යි ප්‍රතික්‍ෂේප කරන ලදි.

එසේම ''ඉදින් පහ කැරෙනුයේ අනාගත වූ කෙලෙස් නම්, එවිට නොහටගත් දෙයක් පහ කරන්නේ වේ, නොනිපන් දෙයක් පහ කරන්නේ වේ, නූපන් දෙයක් පහ කරන්නේ වේ, පහළ නොවූ දෙයක් පහ කරන්නේ වේ; අනාගත වූ දෙයක් නොපවත්නේ වේද, එවන් දෙයක් පහ කරන්නේ වේ'' යයි කියා, ''අනාගත කෙලෙස් පහ කරන්නේ නොවේ''යයි (එයද) ප්‍රතික්‍ෂේප කරන ලදි.

එසේම, ''ඉදින් පහ කැරෙනුයේ ප්‍රත්‍යුත්පන්න වූ කෙලෙස් නම්, එවිට රාග සහිත වූයේම රාගය පහ කරන්නේ වේ, ද්වේෂ සහිත වූයේම ද්වේෂය පහ කරන්නේ වේ, මුළා වූයේම මෝහය පහ කරන්නේ වේ, මානයෙන් දැඩිවම මානය පහ කරන්නේ වේ, පරාමර්ශ සහිත වූයේම මිථ්‍යාදෘෂ්ටිය පහ කරන්නේ වේ, වික්‍ෂේප සහිත වූයේම ඖද්ධත්‍යය පහ කරන්නේ වේ, නිශ්චයයට නොපැමිණියේම විචිකිච්ඡාව පහ කරන්නේ වේ, අනුශයයන් බලවත්ව තිබියදීම අනුශයයන් පහ කරන්නේ වේ. මෙසේ කුසල් හා අකුසල් යුගනද්ධව (යුගල වශයෙන් බැඳී)ම පවත්නේ වේ; මාර්ග භාවනාවද කිලිටි වන්නේ වේ''[a] යයි කියා. ''අතීත වූ කෙලෙස් හෝ, අනාගත වූ කෙලෙස් හෝ, ප්‍රත්‍යුත්පන්න වූ කෙලෙස් හෝ පහ කරන්නේ නොවේ'' යයි සියල්ල ප්‍රතික්‍ෂේප කොට, - ''එසේ නම්,

a. පටිසම්භිදා පාළි, අභිසමය කථා

මාර්ගභාවනාවක් නැත්ද? ඵලසාක්ෂාත් කරණයක් නැත්ද? ක්ලේශ ප්‍රහාණයක් නැත්ද? ධර්මාභිසමයයක් නැත්දැ?යි යනුවෙන් ප්‍රශ්න කොට අවසන්හි, ''එසේ (නැත්තේ) නොවේ, මාර්ග භාවනාවක් ඇත. -පෙ- ධර්මාභිසමයයක් ඇත'' යනුවෙන් ප්‍රතිඥා කොට, නැවත ''කුමක් මෙන්දැ''යි පවසා මෙසේද කියන ලදිඃ-

''යම්සේ නොපීදුණු නහඹු රැකෙක් වේද, මිනිසෙක් එය මුලින්ම සිඳ ලන්නේද, එවිට ඒ රැකෙහි නොහටගත් යම් පලයක් වේද, එය හටගැනීමක් නැති නිසාම නොහටගන්නේ වේ, නොනිපන් නිසාම නොනිපදනේ වේ, නො-උපන් නිසාම නො-උපදනේ වේ, නොපහළ වූ නිසාම නොපහළ වනුයේ වේ; එසේම ක්ලේශයන්ගේ හට ගැනීමට උත්පාදය (ඉපැදීම) හේතු වේ, ඉපැදීම ප්‍රත්‍යය වේ. උත්පාදයෙහි ආදීනව දැක අනුත්පාදය වෙතට සිත වඩී, අනුත්පාදය වෙතට සිත වන් හෙයින්, උත්පාද හේතුවෙන් යම් ක්ලේශයක් උපදනේද, එම ක්ලේශය නො-උපන් හෙයින්ම නො-උපදනේ වේ; -පෙ- පහළ නොවූ හෙයින්ම පහළ නොවන්නේ වේ; මෙසේ හේතු නිරෝධයෙන් (හේතුව නැති කිරීමෙන්) දුඃඛනිරෝධය වේ. කෙලෙස් ඉපැදීමට ස්කන්ධයන්ගේ පැවැත්ම හේතු වේ, (සංස්කාර) නිමිත්තද හේතු වේ. ආයූහනයද (කර්මයන් රැස් කිරීමද) හේතු වේ. අනායූහය වෙත සිත වන් හෙයින් ආයූහන හේතුවෙන් උපදනා -පෙ- කෙලෙස් නො-උපන් හෙයින්ම -පෙ- පහළ නොවූ හෙයින්ම පහළ නොවේ. මෙසේ හේතු නිරෝධයෙන් ඵල නිරෝධය වේ.

මෙසේ මාර්ගභාවනාවක් ඇත, ඵලසාක්ෂාත්කරණයක් ඇත, ක්ලේශප්‍රහාණයක් ඇත. ධර්මාභිසමයයක් ඇත.

මෙයින් (මේ චෝදනා - පරිහාරයෙන්) කුමක් පැහැදිලි කරන ලද්දේද? 'භූමිලද්ධ' නම් ක්ලේශයන්ගේ ප්‍රහාණය පැහැදිලි කරන ලද්දේය. කිමෙක්ද? එම භූමිලද්ධයෝ අතීත හෝ අනාගත වෙත්ද? නැතහොත් ප්‍රත්‍යුත්පන්න වෙත්ද? ඔහු හුදෙක් 'භූමිලද්ධුප්පන්න (භූමියක් ලැබ උපන්නාහු) නම් වෙති.

'උප්පන්න' යනු, වත්තමානය, භූතාපගතය, ඕකාසකතය, භූමිලද්ධය ආදී වශයෙන් අනේකවිධ වේ; එහි උත්පාද ජරා-භංග සහිත වූ සියල්ල වත්තමානුප්පන්න නම් වේ; අරමුණු රස අනුභව කොට ඉකුත්ව ගිය, එහෙයින්, අනුභූතාපගත නම්වූ, කුශලාකුශල වූ, උත්පාදාදී ත්‍රිකයට පිළිවෙළින් පැමිණ නිරුද්ධ වූද, භූතාපගත සංඛ්‍යාවට වැටෙන සෙසු සංස්කාරද 'භූතාපගතුප්පන්න නම් වේ; ''යානිස්ස තානි පුබ්බෙ කතානි කම්මානි'' (ඔහු විසින් පෙර කරන ලද යම් කර්මයක් වේද, එය) යන ආදී වශයෙන් කියන ලද කර්මයක් අතීත වූම අනෙක් කර්ම විපාකයක් වලක්වා තම විපාකයට ඉඩ සලසාගෙන සිටි හෙයින්, එසේ ඉඩ සලසාගත්

විපාකය නො-උපන්නේ වූනමුදු, එසේ කළ කල ඒකාන්තයෙන් උපදනා හෙයින් ''ඕකාසකතුප්පන්න'' නම් වේ; ඒ ඒ ස්කන්ධ සංඛ්‍යාත භූමියෙහි මුළුමනින්ම ක්‍ෂය නොකරන ලද අකුශල කර්මය භූමිලද්ධුප්පන්න' නම් වේ.

මෙහිද, 'භූමි' හා 'භූමි ලද්ධ' යන දෙකෙහි නානත්‍වය (වෙනස) දතයුතුය. 'භූමි' යනු විදර්ශනාවට අරමුණු වූ පංචස්කන්ධයයි; 'භූමිලද්ධ' යනු, එම ස්කන්ධයන් කෙරෙහි ඉපැදීමට සුදුසු ක්ලේශ සමූහයයි. එය (ක්ලේශසමූහය) විසින් එම භූමිය ලබාගන්නා ලද්දේ නම් වෙති'යි 'භූමිලද්ධ' යයි කියනු ලැබේ.

එය ද අරමුණු වශයෙන් නොවේ; අරමුණු වශයෙන් වනාහි සියලු අතීත, අනාගත ස්කන්ධයන්ද, රහතුන්ගේ පරිඥාත (පිරිසිඳ දන්නා ලද) ස්කන්ධයන්ද අරබයා කෙලෙස් උපදී; මහා කච්චාන තෙරණු, උප්පලවණ්ණා තෙරණි ආදීන්ගේ ස්කන්ධයන් අරබයා සොරෙය්‍ය සිටු, නන්‍දමානවක ආදීනට සෙයිනි.

ඉදින් එය (ඒ ක්ලේශ සමූහය) භූමිලද්ධ නම් වෙතොත්, එය පහ කළ නොහැකි වන හෙයින් කිසිවකුත් භවමූලය නොහරිනු ඇතः (එසේ නොවේද?)

(නො-එසේය) 'භූමිලද්ධ' යනු, වස්තු වශයෙන් දතයුතුය; යම් යම් තැනෙක විදර්ශනාවට හසු නොවූ ස්කන්ධයන් උපදිතොත්, ඒ ඒ තැන උපතෙහි පටන් සසර වටට මුල් වන ක්ලේශ සමූහය 'අනුසය' බවට පත් වෙයි, එය 'ප්‍රහීණ නොවූ' යන අර්ත්‍ථයෙන් 'භූමිලද්ධ' යයි දතයුතුය.

එහිද, යමකුට යම් ස්කන්ධයක් විෂයයෙහි අප්‍රහීණාර්ත්‍ථයෙන් අනුසය බවට පත් ක්ලේශයන් වෙතොත්, ඔහුට එම ස්කන්ධය එම ක්ලේශයනට වස්තු වේ. අන්‍යයන් සතු ස්කන්ධයෝ එසේ නොවෙති. අතීත ස්කන්ධයන් විෂයයෙහිද, ප්‍රහීණ නොකළ හෙයින් අනුසය බවට ක්ලේශයනට අතීත ස්කන්ධයෝම වස්තු වෙති, අන්‍ය ස්කන්ධයෝ වස්තු නොවෙති. අතීත ස්කන්ධයන් විෂයයෙහිද, ප්‍රහීණ නොකළ හෙයින් අනුසය බවට ක්ලේශයනට අතීත ස්කන්ධයෝම වස්තු වෙති, අන්‍ය ස්කන්ධයෝ වස්තු නොවෙති. අනාගතාදී ස්කන්ධයන් විෂයයෙහිද මෙම නයයි. එසේම කාමාවචර ස්කන්ධයන් විෂයයෙහිද ප්‍රහීණ නොකළ හෙයින් අනුසය බවට ක්ලේශයනට අතීත ස්කන්ධයෝම වස්තු වෙති, අන්‍ය ස්කන්ධයෝ වස්තු නොවෙති. අනාගතාදී ස්කන්ධයන් විෂයයෙහිද මෙම නයයි. එසේම කාමාවචර ස්කන්ධයන් විෂයයෙහිද ප්‍රහීණ නොකළ හෙයින් අනුසය බවට පත් ක්ලේශයනට කාමාවචර ස්කන්ධයෝම වස්තු වෙති, සෙසු ස්කන්ධයෝ වස්තු නොවෙති, රූපාරූපාවචරයන් විෂයයෙහිද මෙම නයයි.

සෝතාපන්න ආදීන් විෂයයෙහි වනාහි, යම් යම් ආර්යපුද්ගලයකුගේ ස්කන්ධ විෂයයෙහි, සසර වටට මුල්වූ ඒ ඒ ක්ලේශ සමූහය ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ වූයේද, ඒ ඒ ආර්යපුද්ගලයාගේ ඒ ඒ ස්කන්ධයන්, ප්‍රහීණ වූ ඒ ඒ වට්ටමූල ක්ලේශයන්හට වස්තු වූ හෙයින්, 'භූමි' යන ව්‍යවහාරය නොලැබේ. පෘථග්ජනයාගේ වට්ටමූල ක්ලේශයන් සර්වප්‍රකාරයෙන්ම අප්‍රහීණ වූ බැවින් කරනු ලබන කවර හෝ කර්මයක් කුසල් හෝ අකුසල් වේ; මෙසේ කර්ම ක්ලේශයන් ප්‍රත්‍යය කොට ගෙන මොහුගේ සසරවට පවතී.

ඔහුගේ මේ වට්ටමූලය රූපස්කන්ධයෙහිම මිස වේදනාස්කන්ධාදියෙහි නොවෙති'යි හෝ -පෙ- විඥ්ඥාණස්කන්ධයෙහිම මිස රූපස්කන්ධාදියෙහි නොවෙති'යි හෝ නොකිවයුතු වේ; කවර හෙයින්දයත්? අවිශේෂයෙන් ස්කන්ධ පංචකයෙහිම 'අනුසය' බවට පත් වූ හෙයිනි.

කෙසේද යත්, ගසෙක පෘථිවි රසාදිය මෙනි, යම්සේ වනාහි මහාවෘක්ෂයක් පොළෝ තෙලෙහි පිහිටා සිට පෘථිවිරසය ද, ආපෝ රසය ද නිසා, එය හේතු කොට ගෙන, මුල-කඳ-අතුපතර-දළු-කොළ-මල්-පලයෙන් වැඩී අහස වසා සිට කප් කෙළවර තෙක් බීජපරම්පරායෙන් රුක් සනුහරය පවත්වමින් සිටි කල්හි, එම පෘථිවි රසාදිය මූලෙහිම වනු මිස කඳ ආදී කොටස් තුළ නොවෙති'යි හෝ -පෙ- ගෙඩිවලම වනු මිස, මුල් ආදියෙහි නොවෙති'යි හෝ කිවහැකි නොවේ; කවර හෙයින්ද යත්, අවිශේෂයෙන් මුල් ආදී සියලු කොටස් තුළ අනුගතව සිටි හෙයිනි.

යම් සේ වනාහි එම රුකෙහිම මල්පල ආදියෙහි කලකිරුණ කිසියම් පුරුෂයෙක් එම රුකෙහි සිවු දෙසින් මණ්ඩුකටු නම් විස කටු විශේෂය ගසාද, එවිට එම රුක එම විස වැදීමෙන් පෘථිවිරසාදිය මඩනා ලද හෙයින් ඵල නොදරන ස්වභාවයට පත්ව යළි පරපුර ඉපැදවිය නොහැකි වන්නේද, එසේම කඳ පිළිවෙළ පැවැත්මෙහි කලකිරුණ කුලපුත් තෙමේ, ඒ පුරුෂයා ගසෙහි සිවු දෙසින් විසකටු ගසන්නා සේ තමාගේ සන්තානයෙහි චතුමග්ග භාවනාව අරඹයි. ඉක්බිති ඔහුගේ ස්කන්ධ පරම්පරාව එම සතර මග නමැති විසකටු පහසින් සසර වටට මුල්වූ කෙලෙස් සර්වප්‍රකාරයෙන් මඩනාලද හෙයින් හුදෙක් කිරියාභාවයට පත් කාය කර්මාදී සියලු කර්ම ප්‍රභේද සහිත වූයේ මතු පුනර්භවයක් නොනිපදවන ස්වභාවයට පත්ව භවාන්තර සන්තතිය නිපදවනු නොසමත් වේ; හුදෙක් අවසාන විඥ්ඥාණය නිරුද්ධ වීමෙන්, දර නැතිව ගිය ගින්නක් සෙයින් උපාදාන විරහිත වූයේ පිරිනිවෙයි. මෙසේ 'භූමි' හා 'භූමි ලද්ධ' යන දෙකෙහි නානත්වය දත යුතුය.

තවද, සමුදාචාරය, ආරම්මණාධිග්ගහිතය, අවික්ඛම්භිතය, අසමූහතයි (ක්ලේශයන්ගේ) චතුර්විධ උප්පන්නයක් (ඉපැදීමක්) ඇත.

ආලෝකය පතුරුවාද, තෙල් දවා ද,
...නය පෙරපසු නොව එක්විටම සත්‍යයන් සතර අවබෝධ
...ඥ්ඥාභිසමය (පිරිසිඳ දැනීම්) වශයෙන් දුඃඛ සත්‍යය අවබෝධ
...ණාභිසමය වශයෙන් සමුදය සත්‍යය අවබෝධ කරයි.
...ක්ෂාත් කරණ) වශයෙන් නිරෝධ සත්‍යය අවබෝධ කරයි,
...යෙන් මාර්ග සත්‍යය අවබෝධ කරයි. කුමක් කී නියාද?
...කොට සත්‍යයන් සතරටම පැමිණෙයි, සතරම දකියි,
... යන මෙයයි.
"මහණෙනි, යමෙක් දුක දකීද, හේ තෙමේ
...කිරීමද දකී, දුක් නැති කිරීමේ මාර්ගයද
...අනෙකක් ද කියනලදි. "මාර්ගයෙන්
...එය දුක පිළිබඳ ඥානය ද වේ, දුක්
...වර කිරීමේ ඥානය ද, වේ. දුක්
...ය ද වේ.[1]
... මාර්ගඥානය
... පහ

එහි වර්තමානයෙහි උපන් ක්ලේශය 'සමුදාචාරුප්පන්න' නම්, චක්ෂුරාදීන්ගේ විෂයපථයට අරමුණ පැමිණි කල්හි මුලදී නූපන්නාවූද ක්ලේශ සමූහය අරමුණ දැඩිව ගන්නා ලද හෙයින්ම, ඒකාන්තයෙන් පසුව උපදනා හෙයින් 'ආරම්මණාධිග්ගහිතුප්පන්න' යයි කියනු ලැබේ. කල්‍යාණි ග්‍රාමයෙහි පිඬු පිණිස හැසිරෙන විට මහාතිස්ස තෙරුන්හට විසභාග (විරුද්ධ ලිංගික) රූපයක් දර්ශනය වීමෙන් (පසු ව) උපන් ක්ලේශසමූහය සෙයිනි. සමථ-විපස්සනාවන් අතුරෙන් එක් ක්‍රමයෙකින් නොවියලවන ලද ක්ලේශ සමූහය සිත් සතන්හි (එතෙක්) නොවැඩුණේ නමුදු, ඉපැදීම වලක්වන හේතුවක් නොමැති හෙයින් 'අවික්ඛම්භිතුප්පන්න නම් වේ. සමථවිපස්සනාවන් මගින් වියලවන ලද නමුදු, ආර්ය මාර්ගයෙන් නොනසනු ලැබීමේ හේතුවෙන්, උත්පත්ති ධර්මතාව නො-ඉක්මවන ලද හෙයින්, 'අසමූහතුප්පන්න'යයි කියනු ලැබේ. අෂ්ටසමාපත්ති ලාභී තෙරණු කෙනකුට සුපිපි කුසුමින් යුත් රුක් ඇති උයනෙක මිහිරි හඬින් ගයමින් කුසුම් නෙලන ස්ත්‍රියකගේ ගායනය ඇසීමෙන් උපන් ක්ලේශ සමූහය සෙයිනි.

'ආරම්මණාධිග්ගහිත'ය, 'අවික්ඛම්භිතය', 'අසමූහත'ය යන මේ ත්‍රිවිධ වූම උප්පන්නයන් 'භූමිලද්ධ' යන්නෙහිම සංග්‍රහයට යෙති'යි දතයුතුය.

මෙසේ මෙකී ප්‍රභේද සහිත මේ උප්පන්න විෂයයෙහි, 'වත්තමාන'ය, 'භුතාපගත'ය, 'ඔකාසකත'ය, 'සමුදාචාර'ය යන මේ චතුර්විධ උප්පන්නයක් (ඉපැදීමක්) වේද, එය මාර්ග වධ්‍ය නොවන හෙයින් කිසි යම් මාර්ගඥානයකින් ප්‍රහීණ කළහැකි නොවේ. 'භූමිලද්ධ'ය, ආරම්මණාධිග්ගහිත'ය, 'අවික්ඛම්භිත'ය, 'අසමූහත' යයි කියනු ලබන යම් මේ උප්පන්නයක් වේද, යම් හෙයකින් එහි ඒ උප්පන්න භාවය විනාශ කරවමින් ලෞකික හෝ ලෝකෝත්තර වූ ඒ ඒ ඥානයක් උපදීද, එහෙයින් ඒ සියල්ලම (එකී ඥානයෙකින්) ප්‍රහීණ කළයුතු වේ. මෙසේ මෙහිලා යම් ක්ලේශයක් යම් ඥානයෙකින් ප්‍රහීණ කළයුතු වේද, එම ක්ලේශයන්ගේ ප්‍රහාණයද දතයුතුය.

> කිච්චානි පරිඤ්ඤාදීනි යානි වුත්තානි අභිසමයකාලෙ
> තානි ච යථා සභාවෙන ජානිතබ්බානි සබ්බානී'ති.

සත්‍යාවබෝධන කාලයෙහිදී කළයුතු 'පරිඤ්ඤා' ආදී වූ යම් කෘත්‍යයක් කියන ලද්දේද, ඒ සියල්ල තත් වූ ස්වභාවයෙන් දතයුතුය.

සත්‍යාභිසමය කාලයෙහිදී සතර මාර්ගඥානයන්ගෙන් එක් එක් ඥානයට එකවිටම කළයුතු පරිඤ්ඤාය, පහානය, සච්ඡිකිරියාය, භාව... යන මේ කෘත්‍යයන් සතරක් සතරක් ... යථා ස්වභාව...



... පිරිසිඳ දනියි, යම්සේ මෙතෙර හරීද, එසේම මාර්ගඥානය දුක මැනවින් පිරිසිඳ දනියි, යම් සේ භාණ්ඩ ප්‍රවාහනය සැඬ පහර සිඳීද, එසේම සමුදයය හරියි, යම්සේ කෙරේද, එසේම සහජාත ආදී ප්‍රත්‍යය භාවයෙන් මාර්ගය වඩවයි. යම්සේ පරතෙරට පමුණුවාද, එසේම සසරින් එතර නිර්වාණය සාක්ෂාත් කරවයි, යනුවෙන් උපමා සංසන්දනය දතයුතුය.

මෙසේ සත්‍යාවබෝධ කාලයෙහිදී එකවිට කෘත්‍යයන් සතරක් වශයෙන් පැවති මේ ඥානයට චතුඃසත්‍යය තථ්‍යාර්ත්‍ථයෙන් (ඇති සැටියෙන්) සොළොස් ආකාරයෙකින් ඒක පටිවේධ (එකවිට අවබෝධ කිරීම) වේ. යම් සේ කීහුද :- තථ්‍යාර්ත්‍ථයෙන් චතුඃසත්‍යය ඒකපටිවේධ වනුයේ කෙසේද? තථ්‍යාර්ත්‍ථයෙන් චතුඃසත්‍යය සොළොස් ආකාරයෙකින් ඒකපටිවේධ වේ; දුඃඛය පිළිබඳ පෙළීමේ අර්ත්‍ථය, සඞ්ඛත (ස්කන්‍ධයන්ගේ සංස්කාරභාවය) අර්ත්‍ථය, සන්තාප (තැවීමේ) අර්ත්‍ථය, විපරිණාම (වෙනස් වීමේ) අර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; සමුදයය පිළිබඳ ආයූහන (රැස් කිරීම) අර්ත්‍ථය, නිදාන (හේතුව) අර්ත්‍ථය, සංයෝග (දුඃඛය හා සමග බැඳී සිටීම) අර්ත්‍ථය, පළිබෝධාර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; නිරෝධය පිළිබඳ නිස්සරණ (සසරින් නික්මීම) අර්ත්‍ථය, විවේක (ලෞකිකත්‍වයෙන් වෙන්වීම) අර්ත්‍ථය, අසඞ්ඛත (සංස්කාර නොවීම) අර්ත්‍ථය, අමෘත (නොනැසීම) අර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; මාර්ගය පිළිබඳ නිර්යාන (සසරින් ...ක්මවීම) අර්ත්‍ථය, හේතු (සසරින් එතරවීමට හේතුවීමේ) අර්ත්‍ථය, දර්ශන (...තතු දැකීම) අර්ත්‍ථය, ආධිපත්‍ය (මුඛ්‍ය වීම) අර්ත්‍ථය යන මේ ...ර්ත්‍ථයි. මෙම සොළොස් ආකාර...

සෝතාපන්න ආදීන් විෂයයෙහි වනාහි, යම් යම් ආර්යපුද්ගලයකුගේ ස්කන්ධ විෂයයෙහි, සසර වටට මුල්වූ ඒ ඒ ක්ලේශ සමූහය ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ වූයේද, ඒ ඒ ආර්යපුද්ගලයාගේ ඒ ඒ ස්කන්ධයන්, ප්‍රහීණ වූ ඒ ඒ වට්ටමූල ක්ලේශයන්හට වස්තු වූ හෙයින්, 'භූමි' යන ව්‍යවහාරය නොලැබේ. පෘථග්ජනයාගේ වට්ටමූල ක්ලේශයන් සර්වප්‍රකාරයෙන්ම අප්‍රහීණ වූ බැවින් කරනු ලබන කවර හෝ කර්මයක් කුසල් හෝ අකුසල් වේ; මෙසේ කර්ම ක්ලේශයන් ප්‍රත්‍යය කොට ගෙන මොහුගේ සසරවට පවතී.

ඔහුගේ මේ වට්ටමූලය රූපස්කන්ධයෙහිම මිස වේදනාස්කන්ධාදියෙහි නොවෙති'යි හෝ -පෙ- විඤ්ඤාණස්කන්ධයෙහිම මිස රූපස්කන්ධාදියෙහි නොවෙති'යි හෝ නොකිවයුතු වේ; කවර හෙයින්දයත්? අවිශේෂයෙන් ස්කන්ධ පංචකයෙහිම 'අනුසය' බවට පත් වූ හෙයිනි.

කෙසේද යත්, ගසෙක පෘථිවි රසාදිය මෙනි, යම්සේ වනාහි මහාවෘක්ෂයක් පොළෝ තෙලෙහි පිහිටා සිට පෘථිවිරසය ද, ආපෝ රසය ද නිසා, එය හේතු කොට ගෙන, මුල-කඳ-අතුපතර-දළු-කොළ-මල්-පලයෙන් වැඩී අහස වසා සිට කප් කෙළවර තෙක් බීජපරම්පරායෙන් රුක් සනුහරය පවත්වමින් සිටි කල්හි, එම පෘථිවි රසාදිය මූලෙහිම වනු මිස කඳ ආදී කොටස් තුළ නොවෙති'යි හෝ -පෙ- ගෙඩිවලම වනු මිස, මුල් ආදියෙහි නොවෙති'යි හෝ කිවහැකි නොවේ; කවර හෙයින්ද යත්, අවිශේෂයෙන් මුල් ආදී සියලු කොටස් තුළ අනුගතව සිටි හෙයිනි.

යම් සේ වනාහි එම රුකෙහිම මල්පල ආදියෙහි කළකිරුණ කිසියම් පුරුෂයෙක් එම රුකෙහි සිවු දෙසින් මඬුකටු නම් විස කටු විශේෂය ගසාද, එවිට එම රුක එම විස වැදීමෙන් පෘථිවිරසාදිය මඩනා ලද හෙයින් එල නොදරන ස්වභාවයට පත්ව යලි පරපුර ඉපැදවිය නොහැකි වන්නේද, එසේම කඳ පිළිවෙළ පැවැත්මෙහි කලකිරුණ කුලපුත් තෙමේ, ඒ පුරුෂයා ගසෙහි සිවු දෙසින් විසකටු ගසන්නා සේ තමාගේ සන්තානයෙහි චතුමග්ග භාවනාව අරඹයි. ඉක්බිති ඔහුගේ ස්කන්ධ පරම්පරාව එම සතර මග නමැති විසකටු පහසින් සසර වටට මුල්වූ කෙලෙස් සර්වප්‍රකාරයෙන් මඩනාලද හෙයින් හුදෙක් කිරියාභාවයට පත් කාය කර්මාදී සියලු කර්ම ප්‍රභේද සහිත වූයේ මතු පුනර්භවයක් නොනිපදවන ස්වභාවයට පත්ව භවාන්තර සන්තතිය නිපදවනු නොසමත් වේ; හුදෙක් අවසාන විඤ්ඤාණය නිරුද්ධ වීමෙන්, දර නැතිව ගිය ගින්නක් සෙයින් උපාදාන විරහිත වූයේ පිරිනිවෙයි. මෙසේ 'භූමි' හා 'භූමි ලද්ධ' යන දෙකෙහි නානත්වය දත යුතුය.

තවද, සමුදාචාරය, ආරම්මණාධිග්ගහිතය, අවික්ඛම්භිතය, අසමූහතයි (ක්ලේශයන්ගේ) චතුර්විධ උප්පන්නයක් (ඉපැදීමක්) ඇත.

එහි වර්තමානයෙහි උපන් ක්ලේශය 'සමුදාචාරුප්පන්න' නම්, චක්‍ෂුරාදීන්ගේ විෂයපථයට අරමුණ පැමිණි කල්හි මුලදී නූපන්නාවූද ක්ලේශ සමූහය අරමුණ දැඩිව ගන්නා ලද හෙයින්ම, ඒකාන්තයෙන් පසුව උපදනා හෙයින් 'ආරම්මණාධිග්ගහිතුප්පන්න' යයි කියනු ලැබේ. කල්‍යාණි ග්‍රාමයෙහි පිඬු පිණිස හැසිරෙන විට මහාතිස්ස තෙරුන්හට විසභාග (විරුද්ධ ලිංගික) රූපයක් දර්ශනය වීමෙන් (පසු ව) උපන් ක්ලේශසමූහය සෙයිනි. සමථ-විපස්සනාවන් අතුරෙන් එක් ක්‍රමයෙකින් නොවියලවන ලද ක්ලේශ සමූහය සිත් සතන්හි (එතෙක්) නොවැඩුණේ නමුදු, ඉපැදීම වලක්වන හේතුවක් නොමැති හෙයින් 'අවික්ඛම්භිතුප්පන්න නම් වේ. සමථවිපස්සනාවන් මගින් වියලවන ලද නමුදු, ආර්ය මාර්ගයෙන් නොනසනු ලැබීමේ හේතුවෙන්, උත්පත්ති ධර්මතාව නො-ඉක්මවන ලද හෙයින්, 'අසමූහතුප්පන්න'යයි කියනු ලැබේ. අෂ්ටසමාපත්ති ලාභී තෙරණු කෙනකුට සුපිපි කුසුමින් යුත් රුක් ඇති උයනෙක මිහිරි හඬින් ගයමින් කුසුම් නෙලන ස්ත්‍රියකගේ ගායනය ඇසීමෙන් උපන් ක්ලේශ සමූහය සෙයිනි.

'ආරම්මණාධිග්ගහිත'ය, 'අවික්ඛම්භිතය', 'අසමූහත'ය යන මේ ත්‍රිවිධ වූම උප්පන්නයන් 'භූමිලද්ධ' යන්නෙහිම සංග්‍රහයට යෙති'යි දතයුතුය.

මෙසේ මෙකී ප්‍රභේද සහිත මේ උප්පන්න විෂයයෙහි, 'වත්තමාන'ය, 'භූතාපගත'ය, 'ඔකාසකත'ය, 'සමුදාචාර'ය යන මේ චතුර්විධ උප්පන්නයක් (ඉපැදීමක්) වේද, එය මාර්ග වධ්‍ය නොවන හෙයින් කිසි යම් මාර්ගඥානයකින් ප්‍රහීණ කළහැකි නොවේ. 'භූමිලද්ධ'ය, ආරම්මණාධිග්ගහිත'ය, 'අවික්ඛම්භිත'ය, 'අසමූහත' යයි කියනු ලබන යම් මේ උප්පන්නයක් වේද, යම් හෙයකින් එහි ඒ උප්පන්න භාවය විනාශ කරවමින් ලෞකික හෝ ලෝකෝත්තර වූ ඒ ඒ ඥානයක් උපදීද, එහෙයින් ඒ සියල්ලම (එකී ඥානයෙකින්) ප්‍රහීණ කළයුතු වේ. මෙසේ මෙහිලා යම් ක්ලේශයක් යම් ඥානයෙකින් ප්‍රහීණ කළයුතු වේද, එම ක්ලේශයන්ගේ ප්‍රහාණයද දතයුතුය.

> කිච්චානි පරිඤ්ඤාදීනි යානි වුත්තානි අභිසමයකාලෙ
> තානි ච යථා සභාවෙන ජානිතබ්බානි සබ්බානී'ති.

සත්‍යාවබෝධන කාලයෙහිදී කළයුතු 'පරිඤ්ඤා' ආදී වූ යම් කෘත්‍යයක් කියන ලද්දේද, ඒ සියල්ල තත් වූ ස්වභාවයෙන් දතයුතුය.

සත්‍යාභිසමය කාලයෙහිදී සතර මාර්ගඥානයන්ගෙන් එක් එක් ඥානයට එකවිටම කළයුතු පරිඤ්ඤාය, පහානය, සච්ඡිකිරියාය, භාවනාය යන මේ කෘත්‍යයන් සතරක් සතරක් බැගින් කියන ලද්දේද, ඒ සතර යථා ස්වභාවයෙන් දතයුතුය. කියන ලද මැයි පුරාණාචාර්යයන් විසින් :-

''යම්සේ පහනක් පෙර-පසු නොව එක්විටම කෘත්‍යයන් සතරක් කරයි ද, එනම්: වැටිය දවා ද අඳුර නසා ද, ආලෝකය පතුරුවාද, තෙල් දවා ද, එසේම මාර්ගඥානය පෙරපසු නොව එක්විටම සත්‍යයන් සතර අවබෝධ කරයි, පරිඥ්ඥාභිසමය (පිරිසිඳ දැනීම්) වශයෙන් දුඃඛ සත්‍යය අවබෝධ කරයි, ප්‍රහාණාභිසමය වශයෙන් සමුදය සත්‍යය අවබෝධ කරයි. සච්ඡිකිරියා (සාක්‍ෂාත් කරණ) වශයෙන් නිරෝධ සත්‍යය අවබෝධ කරයි, භාවනාභිසමය වශයෙන් මාර්ග සත්‍යය අවබෝධ කරයි. කුමක් කී නියාද? නිර්වාණය අරමුණු කොට සත්‍යයන් සතරටම පැමිණෙයි, සතරම දකියි, සතරම ප්‍රතිවේධ කරයි යන මෙයයි.

මෙසේ කියන ලදිː- ''මහණෙනි, යමෙක් දුක දකීද, හේ තෙමේ දුකට හේතුවද දකී, දුක නැති කිරීමද දකී, දුක් නැති කිරීමේ මාර්ගයද දකී''[a] යන මේ සියල්ල දතයුතුය. අනෙකක් ද කියනලදි. ''මාර්ගයෙන් යුක්ත වූවහුට යම් ඥානයක් වේ නම්, එය දුක පිළිබඳ ඥානය ද වේ, දුක් හේතුව පිළිබඳ ඥානය ද වේ, දුක් කෙළවර කිරීමේ ඥානය ද, වේ. දුක් නැති කිරීමේ මාර්ගප්‍රතිපදාව පිළිබඳ ඥානය ද වේ.[a]

එහි, යම් සේ පහන වැටිය දවාද, එසේම මාර්ගඥානය දුක පිරිසිඳ දනියි; යම් සේ අඳුර දුරු කරයිද, එසේම සමුදයය පහ කරයි, යම් සේ ආලෝකය පතුරුවාද, එසේම සහජාත ආදී වශයෙන් ප්‍රත්‍යය වන හෙයින් සම්මා සඞ්කප්පාදී ධර්ම සංඛ්‍යාත මාර්ගය වඩයි; යම් සේ තෙල් දවාලයිද, එසේම කෙලෙසුන් ක්‍ෂය කරන නිරෝධය සාක්‍ෂාත් කරයි. මෙසේ මෙහි උපමා-උපමේය සංසන්‍දනය දතයුතුය.

තවද ක්‍රමයෙකිː- ''යම්සේ සූර්යයා උදා වෙමින්ම පෙරපසු නොව කෘත්‍යයන් සතරක් කෙරේද, එනම්, රූපගතවූ සියල්ල ප්‍රකට කරවාද, අඳුර නසාද, ආලෝකය පතුරුවාද, ශීතය මැඩලාද, එසේම මාර්ග ඥානය -පෙ- සච්ඡිකිරියාභිසමය වශයෙන් නිර්වාණය අවබෝධ කරයි. මෙහිදීද යම් සේ සූර්යයා රූපගත වස්තූන් ප්‍රකට කෙරේද, එසේම මාර්ගඥානය දුක පිරිසිඳ දනියි; යම් සේ අඳුර දුරලාද, එසේම සමුදයය පහ කරයි; යම් සේ ආලෝකය පතුරුවාද, එසේම සහජාතාදී ප්‍රත්‍යය වශයෙන් මාර්ගය වඩවයි; යම් සේ ශීතය වැඩලාද. එසේම කෙලෙසුන් දුරු කරන නිරෝධය සාක්‍ෂාත් කරයි- යනුවෙන් උපමා සංසන්‍දනය දතයුතුය.

තවද ක්‍රමයෙකිː- යම් සේ නැවක් පෙර-පසු නොව එක් විට කාර්යයන් සතරක් කරයිද, එනම්ː මෙතෙර හරිද, සැඩ පහර සිඳීද, භාණ්ඩ ප්‍රවාහනය කරාද, එතෙරට පමුණුවාද, එසේම මාර්ගඥානය -පෙ- සච්ඡිකිරියාභිසමයයෙන් නිවන් අවබෝධ කරවයි; මෙහිදිද, යම්සේ නැව

a. සං. නි. කෝටිගාම වග්ග
b. පටිසම්භිදා පාළි. ඥාණකථා

මෙතෙර හරීද, එසේම මාර්ගඥානය දුක මැනවින් පිරිසිඳ දනියි, යම්සේ සැඩ පහර සිඳීද, එසේම සමුදයය හරියි, යම් සේ භාණ්ඩ ප්‍රවාහනය කෙරේද, එසේම සහජාත ආදී ප්‍රත්‍යය භාවයෙන් මාර්ගය වඩවයි. යම්සේ පරතෙරට පමුණුවාද, එසේම සසරින් එතර නිර්වාණය සාක්‍ෂාත් කරවයි, යනුවෙන් උපමා සංසන්‍දනය දතයුතුය.

මෙසේ සත්‍යාවබෝධ කාලයෙහිදී එකවිට කෘත්‍යයන් සතරක් වශයෙන් පැවති මේ ඥානයට චතුඃසත්‍යය තථ්‍යාර්ත්‍ථයෙන් (ඇති සැටියෙන්) සොළොස් ආකාරයෙකින් ඒක පටිවේධ (එකවිට අවබෝධ කිරීම) වේ. යම් සේ කීහුද :- තථ්‍යාර්ත්‍ථයෙන් චතුඃසත්‍යය ඒකපටිවේධ වනුයේ කෙසේද? තථ්‍යාර්ත්‍ථයෙන් චතුඃසත්‍යය සොළොස් ආකාරයෙකින් ඒකපටිවේධ වේ; දුඃඛය පිළිබඳ පෙළීමේ අර්ත්‍ථය, සඞ්ඛත (ස්කන්‍ධයන්ගේ සංස්කාරභාවය) අර්ත්‍ථය, සන්තාප (තැවීමේ) අර්ත්‍ථය, විපරිණාම (වෙනස් වීමේ) අර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; සමුදයය පිළිබඳ ආයූහන (රැස් කිරීම) අර්ත්‍ථය, නිදාන (හේතුව) අර්ත්‍ථය, සංයෝග (දුඃඛය හා සමග බැඳී සිටීම) අර්ත්‍ථය, පළිබෝධාර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; නිරෝධය පිළිබඳ නිස්සරණ (සසරින් නික්මීම) අර්ත්‍ථය, විවේක (ලෞකිකත්‍වයෙන් වෙන්වීම) අර්ත්‍ථය, අසඞ්ඛත (සංස්කාර නොවීම) අර්ත්‍ථය, අමෘත (නොනැසීම) අර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි; මාර්ගය පිළිබඳ නිර්යාන (සසරින් නික්මවීම) අර්ත්‍ථය, හේතු (සසරින් එතරවීමට හේතුවීමේ) අර්ත්‍ථය, දර්ශන (ඇතිතතු දැකීම) අර්ත්‍ථය, ආධිපත්‍ය (මුඛ්‍ය වීම) අර්ත්‍ථය යන මේ තථ්‍යාර්ත්‍ථයි. මෙම සොළොස් ආකාරයෙන් චතුඃසත්‍යය ඒක සංගෘහිත (එකක් ලෙස සංග්‍රහ වීම) වේ. යමක් ඒක සංගෘහීත වේද, එය ඒකත්‍වයද වේ.[a] එක් ඥානයෙකින් ප්‍රතිවේධ කෙරෙති'යි චතුඃසත්‍යය 'ඒක පටිවේධ' නම් වේ.

එහිලා චෝදනාවක් (ප්‍රශ්නයක්) පැන නැඟිය හැකියඃ- දුඃඛ ආදිය පිළිබඳ රෝග, ගණ්ඩ ආදී අන් අරුත් ද ඇත. එසේ නම්, කවර හෙයින් සතරක්ම කියන ලද්දේද? මෙහි (පරිහාරය) කියමුඃ සමුදය ආදී සෙසු සත්‍යයන් දැකීම් වශයෙන් ප්‍රකට වන හෙයිනි. එහි 'දුක්ඛෙ ඤාණං' (දුක පිළිබඳ ඥානය) යනු කිමෙක්ද? ''දුක අරබයා යම් ප්‍රඥාවක්, මනා දැනුමක් උපදීද''[b] යන ආදී වශයෙන් හා එක් එක් සත්‍යයට අරමුණු වීමේ වශයෙන් ද සත්‍යයන් පිළිබඳ ඥානය කියන ලදි. ''මහණෙනි, යමෙක් දුක දකීද, හේ සමුදයය (දුකට හේතුව) ද දකියි''[c] යන ආදී නයින් එක් එක් සත්‍යයක් අරමුණු කොට සෙසු සත්‍යයන් කෙරෙහිද කෘත්‍ය නිෂ්පත්ති (කාර්ය සාධන) වශයෙන් කියන ලදි.

a. පටිසම්භිදාපාළි, මග්ග කථා
b. පටිසම්භිදා පාළි. ඤාණකථා
c. සං. නි. කෝටිගාම වග්ග

එහි, එක් එක් සත්‍යය අරමුණු කරන කල්හි, පළමු කොට, සමුදය සත්‍යය දැකීමෙන් ස්වභාව වශයෙන් පීඩණ ලක්‍ෂණ ඇති දුක ආයුහන ලක්‍ෂණ ඇති සමුදයය විසින් එක් කරන ලද්‍ද'යි, සකස් කරන ලද්‍ද'යි, රැස් කරන ලද්‍ද'යි, එසේ හෙයින් එය (දුක) පිළිබඳ සංඛතාර්ත්‍ථය ප්‍රකට වේ. යම් හෙයකින් වනාහි මාර්ගය කෙලෙස් සන්තාපය දුරු කරනුයේ සිහිල් ගුණ ඇත්තේ වේද, එහෙයින් මාර්ග දර්ශනයෙන් එම දුක පිළිබඳ සන්තාප අර්ත්‍ථය ප්‍රකට වේ. ආයුෂ්මත් නන්‍ද තෙරුන්හට දිව්‍යජ්සරාවන් දැකීමෙන් සුන්දරිය (ජනපද කල්‍යාණිය) ගේ අනභිරූපභාවය වැටහීම මෙනි. අවිපරිණාම ස්වභාවය ඇති නිරෝධය එම දුක පිළිබඳ විපරිණාමාර්ත්‍ථය ප්‍රකට වෙති'යි යනු කිවයුතු නොවේ.

එසේම දුක දැකීමෙන් ස්වභාව වශයෙන් ආයූහනය (රැස්කිරීම) ලක්‍ෂණ ඇති සමුදයය පිළිබඳ නිදානාර්ත්‍ථය ප්‍රකට වේ. අපථ්‍ය ආහාරයක් ගැනීමෙන් උපන් ව්‍යාධියක් දැකීමෙන් එම ආහාරය ව්‍යාධියට නිදාන වූ බව දැකීම මෙනි. විසංයෝග ලක්‍ෂණ ඇති නිරෝධය දැකීමෙන් දුක පිළිබඳ සංයෝගාර්ත්‍ථය ප්‍රකට වේ, නිර්යාන ලක්‍ෂණ ඇති මාර්ගය දැකීමෙන් දුක පිළිබඳ පළිබෝධාර්ත්‍ථය ප්‍රකට වේ.

එසේම අවිවේක ස්වභාව ඇති සමුදයය දැකීමෙන් නිස්සරණ ලක්‍ෂණ ඇති නිරෝධය පිළිබඳ විවේකාර්ත්‍ථය ප්‍රකට වේ; මාර්ගය දැකීමෙන් (නිරෝධය පිළිබඳ) අසංඛතාර්ත්‍ථය වැටහේ; මේ යෝගියා විසින් අනවරාග්‍ර වූ සංසාරයෙහිදී මාර්ගය නොදුටු විරූය, එම මාර්ගයද ප්‍රත්‍යය සහිත බැවින් සංඛත වේමැයි, යනුවෙන් අප්‍රත්‍යය ස්වභාව ඇති (නිරෝධය) පිළිබඳ අසංඛත භාවය ඉතාමත් ප්‍රකට වේ. දුඃඛය දැකීමෙන් වනාහි, 'දුක විසෙකි, නිවණ අමාවෙකි'යි මේ නිරෝධය පිළිබඳ අමෘතාර්ත්‍ථය ප්‍රකට වේ.

එසේම සමුදයය දැකීමෙන්, "මේ සමුදයය නිර්වාණයට හේතු නොවේ, මේ (මාර්ගයම) හේතු වේ" යනුවෙන් නිර්යාණ ලක්‍ෂණ ඇති මාර්ගය පිළිබඳ හේත්වර්ත්‍ථය ප්‍රකට වේ. නිරෝධය දැකීමෙන් (එම මාර්ගය පිළිබඳ) දර්ශනාර්ත්‍ථය ප්‍රකට වේ, ඉතා සියුම් රූපයන් දක්නහුට, 'මාගේ ඇස් ඉතා පැහැදිලිය"යි ඇස්හි පැහැදිලි බව වැටහෙන්නා සේය. දුක දැකීමෙන් (එම මාර්ගයම පිළිබඳ) ආධිපත්‍යාර්ත්‍ථය ප්‍රකට වේ. නොයෙක් රෝගයන්ගෙන් පෙළෙන දුගී ජනයා දැකීමෙන් ඉසුරුමත් ජනයාගේ උදාරභාවය ප්‍රකට වන්නා සේය. මෙසේ ස්ව-ලක්‍ෂණයනට අනුව එක් එක් සත්‍යය ඉතිරි සත්‍ය තුන දැකීම් වශයෙන් (සංසන්‍දනයෙන්) ඉතිරි සත්‍ය තුනක් තුනක් ප්‍රකට වීමෙන්, එක් එක් සත්‍යය පිළිබඳ අර්ත්‍ථයන් සතරක් සතරක් කියන ලදි.

මාර්ගක්‍ෂණයෙහි වනාහි මෙකී අර්ත්‍ථයන් සියල්ලම දුඃඛාදිය කෙරෙහි වූ එක්ම චතුකෘත්‍ය ඥානයෙන් ප්‍රතිවේධයට යෙති.

යමෙක් වනාහි, නානාභිසමය (චතුඃ සත්‍යය නානා ක්ෂණයෙහි නානා (මාර්ග) ඥානයෙන් අවබෝධකරතැ'යි යන මතය) කැමැති වෙත්ද, ඔවුනට (දිය යුතු) පිළිතුරු අභිධර්මයෙහි, කථාවත්ථුප්පකරණයෙහි කියන ලද්දේමැයි.

ඉක්බිති, පරිඤ්ඤා ආදීවූ යම් ඒ කෘත්‍යයන් සතරක් යට කියන ලද්දේද, එහි:-

තිවිධා හොති පරිඤ්ඤා තථා පහානම්පි සච්ඡිකිරියාපි,
ද්වෙ භාවනා අභිමතා විනිච්ඡයො තත්‍ථ ඤාතබ්බො

පරිඤ්ඤාව ත්‍රිවිධ වේ, පහාන, සච්ඡිකිරියා යන දෙක එසේය. (ත්‍රිවිධ වේ); භාවනාව ද්විවිධ වේ; එහි විනිශ්චයය දතයුතුය.

'තිවිධා හොති පරිඤ්ඤා' යනු, පරිඤ්ඤාව (පිරිසිඳ දැනීම) ඤාත පරිඤ්ඤාය, තීරණ පරිඤ්ඤාය, පහාන පරිඤ්ඤාය යි ත්‍රිවිධ වේ. එහි "අභිඤ්ඤාපඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං"[a] අභිඤ්ඤා පඤ්ඤා' යනු, දන්නා ලදැ'යි යන අර්ත්‍ථයෙහි වූ ඥානයයි යනුවෙන් මෙසේ උද්දේස කොට, "යෙ යෙ ධම්මා අභිඤ්ඤාතා හොන්ති, තෙ තෙ ධම්මා ඤාතා හොන්ති"[a] යම් යම් ධර්මයක් අවබෝධ කරන ලද්දේද, ඒ ඒ ධර්මය දන්නා ලද්දේය"යි මෙසේ සංක්ෂේපයෙන්ද, "සබ්බං භික්ඛවෙ අභිඤ්ඤෙය්‍යං, කිඤ්ච භික්ඛවෙ සබ්බං? චක්ඛුං භික්ඛවෙ සබ්බං අභිඤ්ඤෙය්‍යං"[a] මහණෙනි, සියල්ල මනාකොට දතයුතු වේ; මහණෙනි, කවරවූ සියල්ල මනා කොට දතයුතු වේද? මහණෙනි. චක්ඛුප්පසාදය පිළිබඳව සියල්ල මනාකොට දතයුතු වේ ආදී නයින් විස්තර වශයෙන්ද, කියන ලදුයේ ඥාතපරිඤ්ඤා' නම්.

එම ඤාතපරිඤ්ඤාව විසින් ප්‍රත්‍යය සහිත වූ නාමරූපයන් විශේෂයෙන් දැනගැනීම. "ආවෙණිකා භූමි පරිඤ්ඤා පඤ්ඤා තීරණට්ඨෙ ඤාණං", එයටම (එම ඤාත පරඤ්ඤාවටම) ආවේණික භූමිය වූ පරිඤ්ඤාප්‍රඥාව තීරණාර්ත්‍ථයෙහි ඤාණය වේ," යනුවෙන් මෙසේ උද්දේස කොට, "යෙ යෙ ධම්මා පරිඤ්ඤාතා හොන්ති, තෙ තෙ ධම්මා තීරිතා හොන්ති" යම් යම් ධර්මයක් පිරිසිඳ දන්නා ලද්දේද, ඒ ඒ ධර්මය තීරණය කරන ලද්දේය"යි මෙසේ සංක්ෂේපයෙන්ද, "සබ්බං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං, කිඤ්චභික්ඛවෙ සබ්බං පරිඤ්ඤෙය්‍යං? චක්ඛුං භික්ඛවෙ පරිඤ්ඤෙය්‍යං" මහණෙනි, සියල්ල පිරිසිඳ දතයුතුවේ, මහණෙනි කවරවූ සියල්ල පිරිසිඳ දතයුතුවේද? මහණෙනි, චක්ඛුප්පසාදය පිරිසිඳ දතයුතු වේ, යන ආදී නයින් විස්තර වශයෙන්ද කියන ලදුයේ තීරණ පරිඤ්ඤා නම්.

එම තීරණ පරිඤ්ඤාව විසින්, කලාප සම්මර්ශනයෙහි පටන් අනිත්‍යය, දුඃඛය, අනාත්මය යන තීරණ වශයෙන් පවත්වනු ලබන,

a. සං.නි. සච්චසංයුත්ත.

අනුලෝම ඥාණය තෙක්, ආවේණික භූමිය වූ පහාන පරිඥ්ඥා පරිත්‍යාග (කෙලෙස් හැර දැමීමේ) ඥාණයයි, මෙසේ උද්දේස කොට, ''යෙ යෙ ධම්මා පහීනා හොන්ති, තෙ තෙ ධම්මා පරිච්චත්තා හොන්ති''[a] යම් යම් (ක්ලේශ) ධර්මයක් ප්‍රහීණ වූයේද, ඒ ඒ ධර්මය පරිත්‍යක්ත වූයේය'යි මෙසේ විස්තර වශයෙන් කියන ලද, ''අනිච්චානුපස්සනාවෙන් නිත්‍යසංඥාව හරියි'' යන ආදී නයින් පැවති පහාන පරිඥ්ඥාවයි, භංගානුපස්සනාවෙහි පටන් මාර්ගඥානය තෙක් එයට අයත් භූමියයි; මෙහි අභිප්‍රේත වනුයේ මෙයයි.

යම් හෙයකින් ඥාතපරිඥ්ඥා, තීරණ පරිඥ්ඥා යන දෙකද එම ප්‍රහාණය සඳහාම වන හෙයින්ද, යම් (ක්ලේශ) ධර්මයක් හරී නම්, එය නියත වශයෙන්ම 'ඥාත' (දන්නා ලද)ද, 'තීරිත' (තීරණය කරනලද)ද වන හෙයින්, පරිඥ්ඥා තුනම මෙකී පර්යායයෙන් මාර්ගඥානයටම අයත් කෘත්‍යයන් වෙති'යි දතයුතුය.

(ගාථායෙහි) ''තථා පහානම්පි''යනු, ප්‍රහාණයද වික්ඛම්භන ප්පහානය, තදඞ්ගප්පහානය, සමුච්ඡේදප්පහානය'යි, පරිඥ්ඥාව මෙන්ම ත්‍රිවිධ වේ. එහි, සෙවෙල් සහිත දියෙහි බහන ලද කළයෙකින් (තාවකාලිකව) සෙවෙල් ඉවත් වන්නා සෙයින් ඒ ඒ ලෞකික සමාධීන් මගින් නීවරණ ආදී වූ ප්‍රතිපක්ෂ ධර්මයන් (තාවකාලිකව) යටපත් කිරීම 'වික්ඛම්භනප්පහාන' නම්; පෙළෙහි වනාහි, ''වික්ඛම්භනප්පහානං ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො'' යනුවෙන්, ප්‍රථමධ්‍යානය වඩන්නහුගේ නීවරණයන් යටපත් කිරීම වික්ඛම්භනය'යි; නීවරණයන්ගේම වික්ඛම්භනය කියන ලදි. එය (නීවරණ වික්ඛම්භනය) ප්‍රකට වූ හෙයින් එසේ කියන ලද'යි දතයුතුය. නීවරණයෝ වනාහි ධ්‍යානයට පෙරාතුව මෙන්ම පසුවද ක්ෂණිකව සිතතුළ නොපැතිරෙති; එහෙයින් විතක්ක ආදිය (ධ්‍යානාංග) යෙදූ කෙණෙහිම සිතතුළ පැතිර සිටී; එහෙයින් නීවරණයන්ගේ විෂ්කම්භනය ප්‍රකට වේ.

රාත්‍රිභාගයෙහි දල්වන ලද පහනෙකින් අඳුර (පහ කරන්නා) සේ විදර්ශනාවට අවයව වූ ඒ ඒ ඥානාංගයෙන් (එයට) ප්‍රතිපක්ෂ වශයෙන් පහ කළයුතු ඒ ඒ (ක්ලේශ) ධර්මයන්ගේ යම් ප්‍රහාණයක් වේද. එය තදඞ්ගප්පහාන නම්. මේ කෙසේද යත්, පළමු කොට, නාමරූපයන් පිරිසිඳීමෙන් අහේතුදෘෂ්ටි, විෂම හේතු දෘෂ්ටීන්ගේ හා ශංකා මලයන්ගේ (මල වැනි සැකය) ද, කලාප සම්මර්ශනයෙන් 'මමය, මාගේය' යන සමූහග්‍රාහයෙහි (මූළාවෙහි)ද, මාර්ග අමාර්ග විනිශ්චයයෙන් අමාර්ග විෂයයෙහි වූ මාර්ග සංඥාවෙහිද, උත්පාදය දැකීමෙන් උච්ඡේද දෘෂ්ටියෙහිද, ව්‍යයය (නැතිවීම) දැකීමෙන් ශාස්වත දෘෂ්ටියෙහිද,

a. පට්ඨාන පාළි. ඥාණකථා

භයතුපට්ඨාන ඥානයෙන් එය සහිත පංචස්කන්ධ විෂයයෙහි වූ අභය සංඥාවෙහිද, ආදීනවයන් දැකීමෙන් (ස්කන්ධ විෂයයෙහි) ආස්වාද සංඥාවෙහිද, නිබ්බිදානුපස්සනාවෙන් අභිරති (ඇලීම) සංඥාවෙහිද, මුඤ්චිතුකම්‍යතා ඥානයෙන් නොමිදෙනු කැමැති බවෙහිද, පටිසඞ්ඛා ඥානයෙන් අප්පටිසංඛානයෙහි (නුවණින් නොවිමසීමෙහි)ද, සඞ්ඛාරුපෙක්ඛා ඥානයෙන් උපේක්ෂා විරහිත භාවයෙහිද, අනුලොම ඥානයෙන් සත්‍යයනට ප්‍රතිපක්ෂ (මිථ්‍යා) ග්‍රහණයෙහිද -තදඞ්ග- ප්‍රහාණය වේ.

තවද අටළොස් මහා විදර්ශනාවන් අතුරෙන්, අනිච්චානුපස්සනාවෙන් නිත්‍ය සංඥාවෙහිද, දුක්ඛානුපස්සනාවෙන් සුඛ සංඥාවෙහිද, අනත්තානුපස්සනාවෙන් ආත්ම සංඥාවෙහිද, නිබ්බිදානුපස්සනාවෙන් නන්දිරාගයෙහිද, විරාගානුපස්සනාවෙන් රාගයෙහිද, නිරෝධානුපස්සනාවෙන් සමුදය (තෘෂ්ණා) යෙහිද, පටිනිස්සග්ගානුපස්සනාවෙන් ආදාන (දැඩිව ගැනීම)යෙහිද, ඛයානුපස්සනාවෙන් ඝන (එක්ව බැඳී ඇතැ'යි යන) සංඥාවෙහිද, වයානුපස්සනාවෙන් ආයූහන (කර්මයන් රැස් කිරීම)යෙහිද, විපරිණාමානුපස්සනාවෙන් ධ්‍රැව (තිරය යන හැඟීම) සංඥාවෙහිද, අනිමිත්තානුපස්සනාවෙන් නිමිත්ත ග්‍රහණයෙහි (රූපාදී නිමිති ගැනීම)ද, අප්පණිහිතානුපස්සනාවෙන් ප්‍රණිධියෙහි (සැප පැතීම)ද, සුඤ්ඤතානු පස්සනාවෙන් අභිනිවේස (ආත්මය පිළිබඳ දෘෂ්ටිය) යෙහිද, අධිපඤ්ඤා ධම්ම විපස්සනාවෙන් සාරාදානාභිනිවේසයෙහි (සාරවශයෙන් දැඩි සේ ගැනීම)ද, යථාභූත ඤාණ දස්සනයෙන් සම්මෝහාභිනිවේසයෙහි (මුළාවෙන් දැඩිව ගැනීම)ද, ආදීනවානුපස්සනාවෙන් ආලයාභිනිවේසයෙහි (ඇලීම් වශයෙන් දැඩිව ගැනීම)ද, පටිසඞ්ඛානුපස්සනාවෙන් අප්පටිසඞ්ඛානයෙහි (නුවණින් නොවිමසීමද) විවට්ටානුපස්සනාවෙන් සංයෝගාභිනිවේසයෙහි (සංයෝජන ලෙසින් දැඩිසේ ගැනීම්) ද ප්‍රහාණය වේ. මේද තදංගප්‍රහාණමැයි.

එහි, අනිච්චානුපස්සනාදී වූ විදර්ශනා සතෙන් නිත්‍ය සංඥා ආදියෙහි ප්‍රහාණය වන ආකාරය (පටිපදා ඤාණදස්සන විසුද්ධි නිද්දේසයෙහි) භඞ්ගානුපස්සනයෙහි කියන ලද්දේමය. ඛයානුපස්සනා ඝනසංඥාව බිඳහැර, ක්ෂයාර්ථයෙන්, අනිත්‍ය වෙතැ'යි මෙසේ (ස්කන්ධයන්ගේ ක්ෂය වීම දක්නහුගේ ඥානයයි; එයින් (එම ඥානයෙන්) ඝන සංඥාවෙහි ප්‍රහාණය වේ;

'වයානුපස්සනා' යනු,

ආරම්මණ අන්වයෙන උභො එකවවත්ථනා
නිරොධෙ අධිමුත්තතා වය ලක්ඛණ විපස්සනා'ති

රූපාදී අරමුණු මගින් (ප්‍රත්‍යක්ෂ වශයෙන්)ද, අරමුණු අනුව මෙනෙහි කිරීමෙන් (අනුමාන වශයෙන්ද'යි මෙසේ දෙ-ආකාරයෙන්ම සංස්කාරයන්ගේ ව්‍යය ලක්ෂණය ව්‍යවස්ථාන කිරීමද, නිරෝධය කෙරෙහි අධිමුත්තතාව (ශ්‍රද්ධා ඇති බව)ද, වයලක්ඛණ විපස්සනායි.

මෙසේ කියන ලද, ප්‍රත්‍යක්ෂ වශයෙන්ද, අනුමාන වශයෙන්ද සංස්කාරයන්ගේ භංගය දැක, එම භංග සංඛ්‍යාත නිරෝධය කෙරෙහි අධිමුත්තතාව (විශ්වාසය) ඇතිවේ; එයින් (අධිමුත්තතාවෙන්) ආයූහන ප්‍රහාණය වේ; යමක් සඳහා ආයූහනය (රැස් කිරීම) කෙරේද, එම සංස්කාරයන් වැයවනසුලු වෙති'යි දක්නහුගේ සිත ආයූහනය වෙත නොනැමේ.

විපරිණාමානුපස්සනා යනු, රූප සප්තකාදී වශයෙන් (යටකී ආදාන නික්ඛේප ආදී වූ) ඒ ඒ පරිච්ඡේදයන් (පිරිසිඳීම්) ඉක්මවා අන්‍යථා ප්‍රවෘත්තිය (වෙනස් වන ස්වභාවය) දැකීමයි; නොහොත් ජරාවෙන් හා මරණයෙන්දැ'යි යන දෙ-ආකාරයෙන්ම උපන් සත්වයාගේ විපරිණාමය (වෙනස් වීම දැකීමයි; එයින් ධ්‍රැව සංඥාව (තිරය'යි යන හැඟීම) ප්‍රහීණ වේ.

'අනිමිත්තානුපස්සනා' යනු, අනිත්‍යානුපස්සනාවමැයි; එයින් නිත්‍යය'යි ගත් නිමිත්තෙහි ප්‍රහාණය වේ. 'අප්පණිහිතානුපස්සනා' යනු, දුඃඛානු පස්සනාවමැයි; එයින් සුඛ ප්‍රණිධි හෙවත් සැප පැතීමෙහි ප්‍රහාණය වේ. 'සුඤ්ඤතානුපස්සනා' යනු, අනත්තානුපස්සනාව මැයි; එයින් ''ආත්මයක් ඇතැ''යි යන අධිවිශ්වාසයෙහි ප්‍රහාණය වේ.

'අධිපඤ්ඤාධම්ම විපස්සනා' යනු,

ආරම්මණඤ්ච පටිසඞ්ඛා භඞ්ගඤ්ච අනුපස්සති
සුඤ්ඤතො ච උපට්ඨානං අධිපඤ්ඤාවිපස්සනා'ති

අරමුණු ගැනීමද, ඒ අනුව නුවණ මෙහෙයවීමද, (සංස්කාරයන්ගේ) භංගය දැකීමද, ශූන්‍ය වශයෙන් වැටහීමද, 'අධිපඤ්ඤාවිපස්සනා' නම්වේ.

මෙසේ කියන ලද, රූපාදී අරමුණු දැන, එම අරමුණෙහි මෙන්ම තදාරම්මණික චිත්තයෙහි (එම අරමුණුගත්සිතෙහි) ද භංගය දැක, ''සංස්කාරයෝම බිඳෙති, සංස්කාරයන්ගේම මරණය වේ, අන් කිසිවක් නැතැ'යි භංග වශයෙන් ශූන්‍යතාව ගෙන පැවැති විදර්ශනාවයි, එය 'අධිපඤ්ඤා' නමැ'යිද, (සංස්කාර) ධර්මයන් පිළිබඳ විදර්ශනා නමැ''යිද එක් කොට ගෙන 'අධිපඤ්ඤාධම්ම විපස්සනා'යයි කියනු ලැබේ. එයින් නිත්‍ය වශයෙන් ගත හැකි සාරයක් නැති බවද, 'ආත්ම' යන්නෙහි හරයක් නැති බවද මැනවින් දුටු හෙයින් සාරාදානාභිනිවේසයෙහි (සාරයයි දැඩිව ගැනීමෙහි) ප්‍රහාණය වේ.

'යථාභූත ඤාණදස්සන' යනු, ප්‍රත්‍යය සහිතව නාම-රූපයන්ගේ විග්‍රහයයි; එයින් ''මම අතීතයෙහි වූයෙම්ද?'' යන ආදී වශයෙන්ද, ''ඊශ්වරයකුගෙන් ලෝකය හටගනී'' ආදී වශයෙන්ද පැවැති සම්මෝහාභිවේසයෙහි ප්‍රහාණය වේ.

'ආදීනවානුපස්සනා' යනු, භයතුපට්ඨාන වශයෙන් උපන් භව ආදී සියල්ලෙහි ආදීනව දැකීමේ ඥානයයි; එයින් ඇලුම් කළයුතු කිසිවක් නැතැ'යි යනුවෙන් ආලයාභිනිවෙසයෙහි ප්‍රහාණය වේ. 'පටිසඞ්ඛානුපස්සනා' යනු, සසරින් මිදීම පිණිස කැරෙන උපාය වන පටිසසඞ්ඛා ඥානයයි; එයින් අප්පටිසඞ්ඛායෙහි (නුවණින් මෙනෙහි නොකිරීම) ප්‍රහාණය වේ.

'විවට්ටානුපස්සනා' යනු, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය මෙන්ම අනුලෝම ඤාණය ද වේ. එවිට ඒ යෝගාවචරයාගේ සිත මඳක් නැඹුරු නෙළුම් කොළයෙක දිය බිඳු සෙයින් සියලු සංස්කාර ධර්මයන් කෙරෙන් හැකිලෙති'යි, පැකිලෙති'යි, පෙරළා වැටෙති'යි කියන ලදි. එහෙයින් එයින් (විවට්ටානුපස්සනාවෙන්) සංයෝගාභිනිවේසයෙහි ප්‍රහාණය වේ. කාමච්ඡන්ද ආදී සංයෝජන ක්ලේශයන් දැඩිව ගැනීම, ක්ලේශයන්ගේ පැවැත්ම, ප්‍රහීණ වෙති'යි යන අර්ථයි. තදඞ්ග ප්‍රහාණය විස්තර වශයෙන් මෙසේ දත යුතුයි. පෙළෙහි වනාහි, ''තදඞ්ගප්පහානඤ්ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො''[a] මිථ්‍යා දෘෂ්ටීන් කෙරෙහි නිර්වේදය (කලකිරීම) දනවන විදර්ශනා සමාධිය වඩන්නහුට තදංගප්‍රහාණය වේ යනුවෙන් සංක්ෂේපයෙන් කියන ලදි.

අකුණු පහරට ලක්වූ රුකක් සෙයින්, ආර්යමාර්ග ඥානයෙන්, සංයෝජනාදී ක්ලේශ ධර්මයන්ගේ පැවැත්ම යළි ඇති නොවන සේ සිදුවන යම් ප්‍රහාණයක් වේද, මෙවන් ප්‍රහාණය 'සමුච්ඡේදපහාන' නම්වේ. එය සඳහා කියනලදි:- ''සමුච්ඡෙදප්පහානඤ්ච ලොකුත්තරං ඛයගාමි මග්ගං භාවයතො'' (ලෝකෝත්තර වූ කෙලෙසුන් ක්‍ෂය කිරීමේ මාර්ගය වඩන්නහුට සමුච්ඡේද ප්‍රහාණය වේ) යනුයි.

මෙසේ මේ ත්‍රිවිධ වූ ප්‍රහාණයන් අතුරෙන් සමුච්ඡේද ප්‍රහාණයම මෙහිලා අභිප්‍රේත වේ; නොහොත්, යම් හෙයකින් මේ යෝගාවචරයා විසින් මුල් කාලයෙහිදී පුරුදු කරන ලද වික්ඛම්භන, තදංග ප්‍රහාණයන්ද එය (සමුච්ඡේදප්‍රහාණය) සඳහාම වූයේද, එහෙයින් ප්‍රහාණත්‍රයයම මේ නියායෙන් මාර්ගඥානයට අයත් කෘත්‍යයන් වෙති'යි දතයුතුය. සතුරු රජකු නසා රාජ්‍යයට පත්වූ විට එයට පෙරාතුව කරන ලද කෘත්‍යයන් පවා 'මේ මේ සියල්ල (අපගේ) රජු විසින්ම කරන ලදැ'යි කියනු ලැබේ.

a. පට්ඨාන පාළි. ඤාණකථා

(යට සඳහන් 'තිවිධා හොති පරිඤ්ඤා...' ආදී ගයෙහි) 'සච්ඡිකිරියා' යනුද, ලෞකික සාක්ෂාත් කරණය, ලෝකෝත්තර සාක්ෂාත් කරණය'යි දෙකක් ලෙස බෙදන ලද නමුදු, ලෝකෝත්තර සාක්ෂාත් කරණය (නැවත) දර්ශන - භාවනා වශයෙන් (දෙකක්ම) බෙදෙන හෙයින් ත්‍රිවිධ වේ.

එහි, ''ප්‍රථමධ්‍යානය ලැබූවෙක්මි, අත්දුටුවෙක්මි, මවිසින් ප්‍රථම ධ්‍යානය සාක්ෂාත් කරන ලදී'' යන ආදී නයින් (පෙළෙහි) ආ ප්‍රථම ධ්‍යාන ආදිය ස්පර්ශ කිරීම 'ලෝකිය සච්ඡිකිරියා' (ලෞකික සාක්ෂාත් කරණ) නම් වේ. 'ඵුස්සනා' යනු, මැනවින් අවබෝධ කොට, ''මෙය මවිසින් අවබෝධ කරන ලදැ''යි ප්‍රත්‍යක්ෂ වශයෙන් ඥානස්පර්ශයෙන් ස්පර්ශ කිරීමයි, අත්දැකීමයි. මෙම අර්ථයම සඳහා. ''සච්ඡිකිරියා පඤ්ඤා ඵස්සනට්ඨෙ ඤාණං'' (සාක්ෂාත් කිරීමේ ප්‍රඥාව ස්ඵර්ශන කාර්යයෙහි ඥානය'යි යනුවෙන් උද්දේස (මාතෘකා) කොට, ''යම් යම් ධර්මයක් සාක්ෂාත් කරන ලද්දේද, ඒ ඒ ධර්මය ස්පර්ශ කරන ලද්දේය''යි සච්ඡිකිරිය නිද්දේසය කියන ලදි.

තවද, ස්ව-සන්තානයෙහි ඉපැදවීමක් නැතිව වුවද, යම් ධර්මයක්, හුදෙක්, අපරප්‍රත්‍යය (අනෙකකුගෙන් ලද) ඥානයෙන් දන්නා ලද්දේ නම්, එයද සාක්ෂාත් කෘත නම් වේ; එහෙයින්ම, ''මහණෙනි, සියල්ල සාක්ෂාත් කළ යුතුය; මහණෙනි. සාක්ෂාත් කළයුතු සියල්ල කවරේද? මහණෙනි, ඇස (චක්ඛු) සාක්ෂාත් කළ යුතුය,'' යන ආදිය කියන ලදි. අනෙකක්ද කියන ලදිඃ- ''රූපය දකිනුයේ සාක්ෂාත් කරයි, වේදනාව දකිනුයේ පෙ- විඤ්ඤාණය දකිනුයේ සාක්ෂාත් කරයි; ඇස-පෙ-ජරාමරණ යන දෙක, අමෘතයෙහි ගැලුණ නිර්වාණය දකිනුයේ සාක්ෂාත් කරයි, යම් යම් ධර්මයක් සාක්ෂාත්කෘත වේද, ඒ ඒ ධර්මය ස්පර්ශ කරන ලද්දේද වේ'' යනුයි.

ප්‍රථම මාර්ග ක්ෂණයෙහිදී නිර්වාණදර්ශනය 'දස්සන සච්ඡිකිරියා'යි; සෙසු මාර්ගක්ෂණයන්හිදී නිර්වාණ දර්ශනය 'භාවනා සච්ඡිකිරියා'යි; එම දෙ-ආකාර වූම සච්ඡිකිරියාව මෙහිලා අභිප්‍රේතයි; එහෙයින් දස්සන හා භාවනා වශයෙන් නිර්වාණය සාක්ෂාත් කිරීම මෙම (ආර්ය මාර්ග) ඥානයට අයත් කෘත්‍යයන් වෙති'යි දතයුතුය.

(යට කී ''තිවිධා හොති පරිඤ්ඤා....'' යන ආදී ගයෙහි) ''ද්වෙ භාවනා අභිමතා'' යනු, භාවනාව වනාහි ලෞකික භාවනා, ලෝකෝත්තර භාවනා යනුවෙන් දෙකක්ම අභිමත වේ; එහි, ලෞකික වූ සීල-සමාධි-පඤ්ඤාවන් ඉපැදවීම හා එයින් ස්ව-සන්තානය පිරිසුදු කිරීම ලෞකික භාවනායි. ලෝකෝත්තර වූ සීල-සමාධි-පඤ්ඤාවන් ඉපැදවීම හා එයින් සන්තානය පිරිසුදු කිරීම ලෝකෝත්තර භාවනායි. එදෙකින් මෙහිලා ලෝකෝත්තර භාවනාව අභිප්‍රේතයි. ලෝකෝත්තරවූ ශීලාදිය මේ චතුර්විධ

වූම (ආර්ය මාර්ග) ඥානය උපදවයි; එම ශීලාදිය පිළිබඳ සහජාත ප්‍රත්‍යයතාදී හේතුවෙන්ද, එම ශීලාදියෙන්ද සන්තානය පරිභාවිත (මනාසේ පුරුදු පුහුණු කළ) වෙති'යි මේ ලෝකෝත්තර භාවනාවම මෙම මාර්ගඥානයට අයත් කෘත්‍යය වේ. මෙසේ,

කිච්චානි පරිඤ්ඤාදීනි යානි වුත්තානි අභිසමය කාලෙ,
තානි ච යථා සභාවෙන ජානිතබ්බානි සබ්බානී'ති

සත්‍යාවබෝධන කාලයෙහිදී කළයුතු 'පරිඤ්ඤා' ආදී වූ යම් කෘත්‍යයක් කියන ලද්දේද, ඒ සියල්ල තත් වූ ස්වභාවයෙන් දතයුතුය'යි (මෙම පරිච්ඡේදයෙහි යට කියන ලදී).

මෙතෙකින්, "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤං ච භාවයං" යනුවෙන් නියමිත පිළිවෙළින්ම දක්වන ලද පඤ්ඤාභාවනාව පිළිබඳ විධානය දක්වනු පිණිස, "මූලභූතා දෙව විසුද්ධියො සම්පාදෙත්වා සරීරභූතා පඤ්ච විසුද්ධියො සම්පාදෙන්තෙන භාවෙතබ්බා" (ගසෙක මුල් වැනි සීල, චිත්ත යන විශුද්ධීන් දෙක සම්පාදනය කොට, ඉක්බිති ශරීරය එනම්, කඳ ආදී සෙසු කොටස් වැනි දිට්ඨි, කංඛාවිතරණ, මග්ගාමග්ග ඤාණ දස්සන, පටිපදාඤාණදස්සන, ඤාණදස්සන යන පංච විශුද්ධීන් සම්පාදනය කරන්නහු විසින් වැඩිය යුතුයයි යමක් (යට බන්ධ නිද්දේසාරම්භයෙහි 'කථං භාවෙතබ්බා?' යන්නට පරිහාර වශයෙන්) කියන ලද්දේද, එය විස්තර කොට දක්වන ලදි. 'කථං භාවෙතබ්බා' (කෙසේ වැඩිය යුතුද?) යන ප්‍රශ්නයද විසඳන ලදි.

සාධුජන ප්‍රමෝදය පිණිස කළ විශුද්ධි මාර්ගයෙහි
පඤ්ඤා භාවනාධිකාරයෙහි ඤාණදස්සන විසුද්ධි නිද්දේස නම්
දෙවිසිවන පරිච්ඡේදය සමාප්තයි.

——//——

# පඤ්ඤාභාවනානිසංස නිද්දේසය

''පඤ්ඤාභාවනාය කො ආනිසංසො'' යනුවෙන් යමක් යට (බන්ධ නිද්දේසාරම්භයෙහි) කියන ලද්දේද, ඒ පිළිබඳව කථා කරමු:- මේ පඤ්ඤා භාවනාව වූකලී නොයෙක් සියගණන් අනුසස් ඇත්තෙකි. එහි අනුසස් දීර්ඝකාලයෙකින් පවා විස්තර වශයෙන් ප්‍රකාශ කිරීම සුකර නොවේ. සංක්ෂේපයෙන් වනාහි, නොයෙක් ක්ලේශයන්ගේ විධ්වංසනය, ආර්යඵල රසානුභාවය, නිරෝධ සමාපත්තියට සමවැදීමේ සමත්බව, ආහුණෙය්‍ය (පූජාර්හ) භාවාදිය සමෘද්ධ වීමය යන මේ අනුසස් දතයුතුය.

එහි, නාමරූප පරිච්ඡේදයෙහි (පිරිසිඳීමෙහි) පටන් සක්කායදිට්ඨි ආදී වශයෙන් නොයෙක් කෙලෙසුන් පිළිබඳ යම් විධ්වංසනයක් කියන ලද්දේද, මේ ලෞකික පඤ්ඤාභාවනාවෙහි අනුසස් වේ. ආර්ය මාර්ගක්‍ෂණයෙහිදී සංයෝජනාදී නොයෙක් ක්ලේශයන්ගේ විධ්වංසනයක් කියන ලද්දේද, මේ ලෝකෝත්තර වූ පඤ්ඤා භාවනාවෙහි අනුසස් යයි දතයුතුය.

භීම වෙගානුපතිතා අසනීව සිලුච්චයෙ,  
වායුවෙග සමුට්ඨිතො අරඤ්ඤම්ව පාවකො  
අන්‍ධකාරං විය රවිසතෙජුජ්ජල මණ්ඩලො,  
දීඝරත්තානුපතිතං සබ්බානත්‍ථ විධායකං  
කිලෙසජාලං පඤ්ඤාහි විද්ධංසයති භාවිතා,  
සන්‍දිට්ඨික මතො ජඤ්ඤා ආනිසංසම්මං ඉධ

බිහිසුණු වේගයෙකින් පතිත වූ අකුණක් පවුමුදුනෙක වූ වන ලැහැබක් සෙයින්ද, වාත වේගයෙන් නැඟී ගිය ලැව් ගින්නක් වන ලැහැබක් සෙයින්ද,

තෙද රැස් මඬුලු සහිත සූර්යයා අන්‍ධකාරය සෙයින්ද, වඩනා ලද පඤ්ඤාභාවනාව (විදර්ශනාව) දීර්ඝ කාලයක් පැවත ආ සියලු අවැඩ සිදු කරන ක්ලේශජාලය වනසාලයි. එහෙයින් මෙහි (පඤ්ඤාභාවනාවෙහි) වූ මේ සාංදෘෂ්ටික (අත්දුටු) ආනිසංසය දතයුතුය.

'අරියඵලරසානුභව' යනු, හුදෙක් කෙලෙසුන් නැසීම මතු නොවේ, ආර්ය ඵල රසානුභවයද පඤ්ඤා භාවනාවෙහි අනුසස් වේ. සෝතාපත්ති ඵලාදිවූ ශ්‍රාමණ්‍ය ඵලය ආර්යඵලයයි කියනු ලැබේ. එහි රසානුභවය මාර්ගවීථියෙහිදීද, ඵල සමාපත්ති වශයෙන් පැවැත්මෙහිදීදැ'යි දෙ-ආකාරයෙකින් වේ; එහි මාර්ග වීථියෙහි පැවැත්ම දක්වන ලද්දේම වේ.

තවද, යමෙක්, ''ඵලය නම් හුදෙක් සංයෝජනයන්ගේ ප්‍රහාණ මාත්‍රයයි, අන්කිසිවක් නැතැ'යි කියත්ද, ඒ (ආන්‍ධ්‍ර) ආචාර්යවරයන් දැනුවත්

කරනු පිණිස මේ සූත්‍රයද දක්විය යුතුය:- ''ආර්යමාර්ගයෙහි යෙදීමෙන් ලද කෙලෙස් බර මුදාහැරීමේ ප්‍රඥාව, ඵලය පිළිබඳ ඥානය වනුයේ කෙසේද? සෝවාන් මාර්ගක්ෂණයෙහිදී නිවන් දකිති'යි යන අර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් නැගී සිටියි, එම මිථ්‍යාදෘෂ්ටියට අනුගතව පවත්නා ක්ලේශයන් හා ස්කන්ධයන් කෙරෙන්ද නැඟී සිටියි, බාහිර වූ සියලු නිමිති කෙරෙන්ද නැගී සිටියි, සෝවාන් මාර්ගයෙහි යෙදීමෙන් කෙලෙස් බර මුදාහළ හෙයින් සම්‍යග්දෘෂ්ටිය උපදියි, මේ මාර්ගයෙහි ඵලයයි''[a] යනුවෙන් විස්තර කළයුතුය. තවද. ''ආර්ය මාර්ග සතරද, ශ්‍රාමණ්‍ය ඵල සතරද'යි යන මේ ධර්මයෝ පමණ කළ නොහැකි අරමුණු ඇත්තාහුය; මහද්ගත ධර්මය (නේවසඤ්ඤානාසඤ්ඤා සමාධිය) පමණ කළ නොහැකි (නිර්වාණ) ධර්මයට අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ'' යන මේ ආදියද මෙහිලා සාධක වේ.

ඵල සමාපත්තියෙහි පැවැත්ම දක්වනු වස් එය පිළිබඳව කරනු ලබන ප්‍රශ්න කිරීම මෙසේයි:- 'ඵලසමාපත්ති' යනු කිම? කවුරු එයට සමවදිත්ද? කවුරු නොසමවදිත්ද? කවර හෙයින් සමවදිත්ද? කෙසේ සමවැදීම වේද? සිටීම කෙසේ වේද? නැඟිටීම කෙසේ වේද? ඵලයට අනන්තර ප්‍රත්‍යය වනුයේ කිමෙක්ද? ඵලය අනන්තර ප්‍රත්‍යය වනුයේ කුමකටද?

එහි (කා ඵල සමාපත්ති) ඵල සමාපත්ති' යනු කිමෙක්ද යත්:- ආර්ය ඵල නිරෝධය පිළිබඳ යම් 'අර්පණාවක්' (පිහිටීමක්) වේද, එයයි; (කෙ තං සමාපජ්ජන්ති) කවුරු එයට සමවදිත්ද? කවුරු නොසමවදිත්ද යත්:- සියලු පෘථග්ජනයෝ නොසමවදිති; කවර හෙයින්ද යත්:- අවබෝධ නොකළ හෙයිනි; සියලුම ආර්යයෝ සමවදිති; කවර හෙයින්ද යත්:- අවබෝධ කළ හෙයිනි; ඉහළ ඵලයන්හි සිටියෝ පහළ ඵලයනට නොසමවදිති, කෙලෙස් බර බහා තැබීම එක් එක් පුද්ගලයා විසින් එක් එක් ප්‍රමාණයට කරන ලද හෙයිනි; පහළ ඵලයන්හි සිටියාහු ඉහළ ඵලයනට නොසමවදිති; අවබෝධ නොකළ හෙයිනි; තමතමාගේ ඵලයටම සමවදිති. මේ මෙහි සනිටුහනයි (නිශ්චයයි)

ඇතැමෙක් වනාහි ශ්‍රෝතාපන්නයන් හා සකෘදාගාමීන් නොසමවදිතැයිද, උපරිම පල දෙකට පත්වූවන්ම සමවදිතැ'යිද යෙති; (අනාගාමී, අර්හත් යන) මේ දෙදෙනාම පමණක් සමාධි විෂයයෙහි පරිපූරකාරීන් (සම්පූර්ණ කරන්නන්) වෙති'යි යනු එයට (හේතු වශයෙන්) ඔවුන් දක්වන කරුණයි. එහෙත් පෘථග්ජනයා පවා තමා ලැබූ ලෞකික සමාධියට සමවදින හෙයින් එම (ඔවුන් දක්වන) කාරණය අකාරණයක්ම වෙයි.

---

a. පට්ඨාන පාළි. ඤාණකථා

මෙහිලා කාරණා කාරණ සිතීමෙන් ඇති පලය කිම? පෙළෙහිම මෙසේ කියන ලදුයේ නොවේද? ''කවර නම් ගෝත්‍රභූ ධර්ම දශයක් විදර්ශනා වශයෙන් උපදීද? ශ්‍රෝතාපත්ති - මාර්ග ප්‍රතිලාභය පිණිස උත්පාදනය (ඉපැදීම) ප්‍රවෘත්තිය (පැවැත්ම) -පෙ- උපායාසය -පෙ- බාහිර සංස්කාර නිමිත්ත මැඩලති'යි ගෝත්‍රභූ නම්, ශ්‍රෝතාපත්ති ඵල සමාපත්තිය පිණිස, සකෘදාගාමි -පෙ- අර්හත් ඵලසමාපත්තිය පිණිස -පෙ- සුඤ්ඤත විහාර සමාපත්තිය පිණිස, අනිමිත්ත විහාර සමාපත්තිය පිණිස, උත්පාදය -පෙ-, බාහිර සංස්කාර නිමිත්ත මැඩලති'යි ගෝත්‍රභූ නම්.''[a] එහෙයින් සියලුම ආර්යයන් තමතමන්ගේ ඵලයට සමවදිති'යි මෙහිලා නිගමනයට යායුතු වේ.

කවර හෙයින් සමවදිත්ද (කස්මා සමාපජ්ජන්ති?) යත්:- දෘෂ්ටධර්ම - සුඛ විහාර (ඉහාත්මයෙහිම කෙලෙස් පීඩා සන්සිඳුවා සුවසේ වසනු) පිණිසයි. යම් සේ වනාහි, රජෙක් රජ සැපද, දෙවියෝ දිව සැපද අනුභව කෙරෙත්ද, එසේම ආර්යයෝ ''ආර්ය වූ ලොවුතුරා සුවය විඳින්නමෝය''යි කාල සීමා පිරිසිඳ (නියම කොට) රිසි රිසි කෙණෙහි පලසමවතට සමවදිත්'.

මෙයට (පල සමවතට) සමවැදීම කෙසේ සිදු වේද? එහි පිහිටීම හා එයින් නැඟීම කෙසේ සිදුවේද යත්:- පළමු කොට, දෙ-ආකාරයෙකින් මෙයට සමවැදීම වේ; නිවණ හැර අන් අරමුණක් මෙනෙහි නොකිරීමෙන් හා නිවණම මෙනෙහි කිරීමෙනි. යම්සේ කීහුද:- ''ඇවැත්නි, නිමිති රහිත චේතෝවිමුක්තියට සමවැදීම පිණිස ප්‍රත්‍යය වන කරුණු දෙකෙකි; සියලු (සංස්කාර) නිමිති මෙනෙහි නොකිරීම හා නිමිති රහිත (නිර්වාණ) ධාතුව මෙනෙහි කිරීමයි''[b]

මේ වනාහි, එහි සමවැදීමේ ක්‍රමයයි:- පල සමවතට සමවදිනු කැමැති ආර්යශ්‍රාවකයා විසින් හුදෙකලාව, විවේකීව. උදයව්‍යයාදී වශයෙන් සංස්කාරයන් බැලිය යුතුය. එවිට පිළිවෙළින් පවත්වන ලද විදර්ශනා ඇති ඔහුගේ සිත, සංස්කාරයන් අරමුණු කොට ඇති (වෝදාන) ගෝත්‍රභූ ඥානයට අනතුරුව ඵල සමාපත්ති වශයෙන්, නිරෝධය කෙරෙහි පිහිටයි. ඵල සමාපත්තිය වෙත නැඹුරු වූ හෙයින් මෙහිදී ශෛක්‍ෂ්‍යයාහටද මාර්ගය නොව ඵලයම උපදියි.

යමෙක් වනාහි, ශ්‍රෝතාපන්න පුද්ගලයා ''ඵල සමාපත්තියට සමවදිමි''යි විදර්ශනා පිහිටුවා සකෘදාගාමී වෙතැ'යි සකෘදාගාමී පුද්ගලයාද අනාගාමී වෙතැ'යි කියත්ද, ඔවුනට (ඒ අභයගිරිකයනට), ''එසේ වෙතොත්, අනාගාමී පුද්ගලයා රහතකු වියයුතුය, රහත් පුද්ගලයා පසේ බුදු වියයුතුය, පසේබුදුවරයාද සම්මා සම්බුදු වියයුතුය''යි කිවයුතුය. එහෙයින් පාළිනයානු

a. පටිසම්භිදා පාළි. ඤාණකථා
b. ම. නි. මහාවේදල්ල

කුලවම (පෙළටම අනුව) ප්‍රතික්ෂිප්ත වූ මේ කිසිවක් නොගත යුතුය. මෙයම (මෙහි කියන ලද්දම්) ගතයුතුය. ශෛක්‍ෂයාහට වුවද ඵලයම මිස මාර්ගය නො-උපදියි. ඉදින් ඔහු විසින් ප්‍රථමධ්‍යානික මාර්ගය අවබෝධ කරන ලද්දේ නම්, ඔහුට ප්‍රථමධ්‍යානික ඵලයම උපදියි; ඉදින්, ද්විතීයාදී අන්කිසි ධ්‍යානයක් අධිගත නම්, ඒ ඒ ධ්‍යානික ඵලයම වේ. ඵල සමාපත්තියට සමවැදීම මෙසේ වෙයි.

''ඇවැත්නි, නිමිති රහිත වූ චේතෝ විමුක්තියෙහි ස්ථිතිය (පිහිටීම) පිණිස කරුණු තුනක් ප්‍රත්‍යය වේ; සියලු (සංස්කාර) නිමිති මෙනෙහි නොකිරීමය, නිමිති රහිත වූ (නිර්වාණ) ධාතුව මෙනෙහි කිරීමය, මුලදීම කාල සීමා නියම කොට ගැනීමය යන තුනයි''[a] යනු කී හෙයින් මේ තුන් ආකාරයෙන් ඵල සමාපත්තිය නොසිඳී සිටීම වේ. එහි, ''පුබ්බෙච අභිසඞ්ඛාරො'' (මුලදීම කාලය පිරිසිඳීම) යනු, සමාපත්තියට ප්‍රථමයෙන්ම කාල සීමා ඉටා ගැනීමයි. ''අසුවල් වේලාවට නැඟිටිමි''යි පිරිසිඳි හෙයින් එම කාලසීමාව නොඑළඹෙන තෙක් සමාපත්තිය නොසිඳී සිටීම වෙති'යි මෙසේ එහි ස්ථිතිය වේ.

''ඇවැත්නි, නිමිති රහිත වූ චේතෝවිමුක්තියෙන් නැඟීම පිණිස කරුණු දෙකක් ප්‍රත්‍යය වේ:- සියලු (සංස්කාර) නිමිති මෙනෙහි කිරීම හා අනිමිත්ත (නිමිති රහිත) නිර්වාණ ධාතුව මෙනෙහි නොකිරීමය යන දෙකයි''[a] යනු කී හෙයින් ඵල-සමාපත්තියෙන් නැඟීම දෙ-ආකාරයෙකින් වේ. එහි, 'සියලු නිමිති' (සබ්බ නිමිත්තානං) යනු, රූප නිමිති, වේදනා-සඤ්ඤා-සංඛාරා-විඤ්ඤාණ-නිමිති යන මේය. එකැතින්ම, මේ සියල්ල එකවිට මෙනෙහි කරනුයේ නොවේ, සියල්ල සංග්‍රහ කිරීමේ වශයෙන් මෙසේ එක් කොට කියන ලදි. එහෙයින් යම් නිමිත්තක් භවංගයට අරමුණු වේද, එය මෙනෙහි කරන්නහුට එයින් (ඵල සමාපත්තියෙන්) නැඟීම වෙති'යි මෙසේ මෙහි නැඟීම (වුට්ඨාන) දතයුතුය.

ඵල චිත්තයට අනන්තර ප්‍රත්‍යය වනුයේ කිමෙක්ද? ඵල චිත්තය අනන්තර ප්‍රත්‍යය වනුයේ කුමකටද? පළමු කොට, ඵලයට ඵලයම හෝ භවාංග චිත්තය හෝ අනන්තර ප්‍රත්‍යය වේ; මාර්ග චිත්තය අනන්තර ප්‍රත්‍යය වූ ඵල චිත්තයෙක් ඇත, ඵල චිත්තය අනන්තරප්‍රත්‍යය වූ ඵල චිත්තයෙක්ද ඇත, ගෝත්‍රභූ චිත්තය අනන්තර ප්‍රත්‍යය වූ ඵලචිත්තයෙක්ද ඇත; නේවසඤ්ඤා නාසඤ්ඤායතන චිත්තය අනන්තර ප්‍රත්‍යය වූ ඵලචිත්තයෙක්ද ඇත; එහි මාර්ග වීථියෙහිදී ඵල චිත්තයට මාර්ග චිත්තය අනන්තර ප්‍රත්‍යය වේ; පළමු පළමු ඵල චිත්තයට පසු පසු ඵල චිත්තය අනන්තර ප්‍රත්‍යය වේ; ඵල සමාපත්ති විෂයයෙහි, පළමු පළමු ඵලචිත්තයට ගෝත්‍රභූ චිත්තය අනන්තර ප්‍රත්‍යය වේ. මෙහි 'ගෝත්‍රභූ' යනු

a. ම. නි., මහාවේදල්ල

අනුලෝමඥානයයිද දතයුතුය; කියන ලද මැයි පට්ඨානයෙහි:- "රහත්හුගේ අනුලෝමඥානය ඵල සමාපත්තියට අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ. ශෛක්ෂ්‍යයන්ගේ අනුලෝම ඥානය ඵලසමාපත්තියට අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ."[a] යම් ඵලයෙකින් නිරෝධයෙන් නැඟීම වේද, එය නේවසඤ්ඤානාසඤ්ඤායතනයට අනන්තර වේ. එහි, මාර්ගවීථියෙහි උපන් ඵලය හැර සෙසු සියල්ල ඵල සමාපත්ති වශයෙන් පැවතියේ නම්වේ. මෙසේ මේ ඵලය මාර්ගවීථියෙහි හෝ ඵලසමාපත්තියෙහි ඉපැදීම් වශයෙන්,

පටිප්පස්සද්ධ දරථං අමතාරම්මණං සුභං
වන්තලොකාමිසං සන්තං සාමඤ්ඤ ඵල මුත්තමං,
ඔජවන්තෙන සුඛිතා සුඛෙන අභිසන්දිතං,
යෙන සාතාතිසාතෙන අමතෙන මධුං විය
තං සුඛං තස්ස අරියස්ස රසභූත මනුත්තරං
ඵලස්ස පඤ්ඤං භාවෙත්වා යස්මා වින්දති පණ්ඩිතො.
තස්මාරියඵලස්සෙතං රසානුභවනං ඉධ,
විපස්සනාභාවනාය ආනිසංසොති වුච්චති.

කෙලෙස් විඩා සන්සිඳවූ, නිවන් අරමුණු කොටගත්, කල්‍යාණ වූ, ලෞකිකත්වය දුරු කළ, ශාන්තවූ යම් ශ්‍රාමණ්‍යඵලයක් වේද, සාරවත්වූ, පිරිසුදු වූ, අග්‍රරසය වූ, අමෘත වූ ඒ පලසුවයෙන් මුසු කරන ලද මිහිරක් වැනි වූ,

අනුත්තර රසය වූ ඒ සුවය, යම් හෙයකින්, පණ්ඩිත තෙමේ ආර්ය ඵල ප්‍රඥාව (විදර්ශනාව) වැඩීමෙන් විඳීද,

එහෙයින් මෙහි (මේ ශාසනයෙහි) මේ ආර්යඵලරසානුභවනය විදර්ශනාවෙහි ආනිසංසයයි කියනු ලැබේ.

"නිරෝධ සමාපත්තියට සමවැදීමේ කුශලතාව" (නිරෝධ සමාපත්ති සමාපජ්ජන සමත්ථතා) යනු, හුදෙක් ආර්යඵල රසානුභවනය මතු නොවේ; නිරෝධ සමාපත්තියට සමවැදීමේ සමත් බවද මේ ප්‍රඥා භාවනාවෙහි අනුසස් වශයෙන් දතයුතුය.

එහිලා, නිරෝධසමාපත්තිය විස්තර කරනු සඳහා මේ ප්‍රශ්න කිරීමයි:- 'නිරෝධ සමාපත්ති' යනු කිමෙක්ද? කවරෙක් එයට සමවදිත්ද? කවරෙක් නොසම වදිත්ද? කොතැනෙක සමවදිත්ද? කවර හෙයින් සමවදිත්ද? එයට සමවැදීම කෙසේ වේද? එහි සිටීම කෙසේ වේද? එයින් නැඟීම කෙසේ වේද? නැඟුණහුගේ සිත කුමක් වෙත නැඹුරු වේද? මළහුගේ හා සමවන්නහුගේ විශේෂය (වෙනස) කිමෙක්ද? නිරෝධ

a. පට්ඨාන පාළි. පඤ්හවාර

සමාපත්තිය සංඛතද? අසංඛතද? ලෞකිකද? ලෝකෝත්තරද? නිෂ්පන්නද? අනිෂ්පන්නද?

එහි, 'නිරෝධ සමාපත්ති' යනු කවරේද යත්:- ප්‍රතිපක්‍ෂ ධර්මයන් පිළිවෙළින් නිරුද්ධ කිරීම් වශයෙන් චිත්ත-චෛතසික-ධර්මයන්ගේ නොපැවැත්ම (නිෂ්ක්‍රිය වීම)යි. කවරෙක් එයට සමවදිත්ද? කවරෙක් නොසමවදිත්ද යත්:- පෘථග්ජනයෝද, ශ්‍රෝතාපන්නයෝද සකෘදාගාමීහුද, ශුෂ්ක විදර්ශක වූ අනාගාමීහු හා අර්හත්හුද යන සියල්ලෝම නොසමවදිත්, අෂ්ටසමාපත්ති ලාභී වූ අනාගාමීහු හා ක්‍ෂීණාශ්‍රවයෝ සමවදිත්. ''සමථබල-විදර්ශනාබල යන දෙකින්ම සමන්විතවූ හෙයින් (කාය, වචී, චිත්ත යන) ත්‍රිවිධ සංස්කාරයන් සන්සිඳුවීමෙන් (මෙහි මතු දැක්වෙන අනිච්චානුපස්සනාදී) ඤාණ චරියා සොළොසකින්ද, (ප්‍රථම ධ්‍යානාදී) සමාධිචරියා නවයෙකින්ද වශීභාවයට පත් 'ප්‍රඥාව' නිරෝධ සමාපත්තිය පිළිබඳ ඥානයයි''[a] කියන ලදි. මේ සම්පදාව අෂ්ටසමාපත්ති ලාභී අනාගාමී, ක්‍ෂීණාශ්‍රව යන මොවුනට මිස අන්‍යයනට නැත. එහෙයින් ඔවුන්ම මිස අන්‍යයෝ එයට නොසමවදිති.

මෙහි (සඳහන් කළ) බල දෙක කවරේද? -පෙ- (සංස්කාර තුන, ඤාණ චරියා සොළොස, සමාධි චරියා නවය) -පෙ- වසීභාවතා පඤ්ඤා යනු කිමෙක්ද යත්- මෙහිලා අප විසින් කිවයුතු කිසිවක් නොමත; මේ සියල්ල මෙහි ඉහත කී (ද්වීහි බලෙහි සමන්නාගතතත්තා යන ආදී) උද්දේසය විස්තර කිරීමෙහිදී කියන ලද්දේමය. යම් සේ කීහුදඃ-

බල දෙකින් (ද්වීහි බලෙහි) යනු, සමථ බලය, විපස්සනා බලයයි බල දෙකෙකි; එහි සමථබලය යනු කිමෙක්ද යත් නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිතෙහි ඒකාග්‍රතාව, නොවිසිරුණ ස්වභාවය සමථබලයයි, අව්‍යාපාද වශයෙන් -පෙ-, ආලෝක සංඥා වශයෙන් -පෙ-, මිථ්‍යා විතර්ක දුරලීම් අනුව දක්නා ආශ්වාස වශයෙන් -පෙ- මිථ්‍යාවිතර්ක දුරලීම් දක්නා ප්‍රශ්වාස වශයෙන් සිතෙහි ඒකාග්‍රතාව, අවික්‍ෂේපය සමථ බලයයි.

සමථය බලයක් වනුයේ කවර අරුතෙන්ද යත්:- ප්‍රථමධ්‍යාන හේතුවෙන් නීවරණ විෂයයෙහි නොසැලෙති'යි යන අරුතින් සමථය බලයක් වේ, ද්විතීයධ්‍යාන හේතුවෙන් විතක්ක - විචාර විෂයයෙහි -පෙ- නේවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්ති හේතුවෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥා විෂයයෙහි නොසැලෙති'යි යන අරුතින් සමථය බලයක් වේ, උද්ධච්ච විෂයයෙහිද, උද්ධච්ච සහගත කෙලෙසුන් විෂයයෙහිද, ස්කන්ධ විෂයයෙහිද, කම්පා නොවෙති'යි, නොසැලෙති'යි, නොවෙවුලති'යි යන අරුතින් සමථය බලයක් වේ. මේ සමථ බලයයි.

---

a. පට්ඨාන පාළි. ඤාණකථා

විපස්සනා බලය යනු කිමෙක්ද යත්:- අනිච්චානුපස්සනාව විපස්සනා බලයයි, දුක්ඛානුපස්සනාව - පෙ- අනත්තානුපස්සනාව -පෙ-, නිබ්බිදානුපස්සනාව -පෙ- විරාගානුපස්සනාව -පෙ- නිරෝධානුපස්සනාව -පෙ-, පටිනිස්සග්ගානු පස්සනාව විපස්සනා බලයයි. රූපස්කන්ධ විෂයයෙහි අනිච්චානුපස්සනාව -පෙ- රූපස්කන්ධ විෂයයෙහි පටිනිස්සග්ගානු පස්සනාව විපස්සනා බලයයි. වේදනා විෂයයෙහි -පෙ- සඤ්ඤා විෂයයෙහි -පෙ- සංඛාර විෂයයෙහි -පෙ- විඤ්ඤාණ විෂයයෙහි -පෙ- චක්ඛු විෂයයෙහි -පෙ- ජරාමරණ විෂයයෙහි අනිච්චානු පස්සනාව -පෙ- ජරාමරණවිෂයයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විපස්සනා බලයයි.

විපස්සනාව බලයක් වනුයේ කවර අරුතෙකින්ද යත්:- අනිච්චානුපස්සනා හේතුවෙන් නිච්ච සඤ්ඤා විෂයයෙහි නො-සැලෙති'යි යන අරුතින් විපස්සනාව බලයක් වේ, දුක්ඛානුපස්සනා හේතුවෙන් සුඛ සඤ්ඤා විෂයයෙහි නොසැලෙති'යි -පෙ, අනත්තානුපස්සනා හේතුවෙන් අත්ත සඤ්ඤා විෂයයෙහි නොසැලෙති'යි -පෙ- නිබ්බිදානුපස්සනා හේතුවෙන් නන්දිරාග විෂයයෙහි නොසැලෙති'යි -පෙ- විරාගානුපස්සනා හේතුවෙන් රාග විෂයයෙහි නොසැලෙති'යි -පෙ- නිරෝධානුපස්සනා හේතුවෙන් සමුදය විෂයයෙහි නොසැලෙති'යි -පෙ-, පටිනිස්සග්ගානුපස්සනා හේතුවෙන් ආදාන විෂයයෙහි නො-සැලෙති'යි යන අරුතින් විපස්සනාව බලයක් වේ; අවිද්‍යා විෂයයෙහිද අවිද්‍යා සහගත ක්ලේශ විෂයයෙහිද, ස්කන්ධ විෂයයෙහිද සසල නොවෙති'යි නොසැලෙති'යි, නොවෙවුලති'යි යන අරුතින් විපස්සනාව බලයක් වේ. මේ විපස්සනා බලයයි.

ත්‍රිවිධ සංස්කාරයන් සන්සිඳුවීමෙන් (තිණ්ණං සංඛාරානං පටිප්පස්සද්ධියා) යන මෙහි, කවර නම් සංස්කාරත්‍රයයක් සන්සිඳුවීමද යත්:- ද්විතීයධ්‍යානයට සමවන්නහුගේ විතක්ක-විචාරයනට අයත් වචී සංඛාරයෝ සන්සිඳුවන ලද්දාහු වෙති; චතුර්ථධ්‍යානයට සමවන්නහුගේ ආශ්වාස-ප්‍රශ්වාසයනට අයත් කායසංඛාරයෝ සන්සිඳුවන ලද්දාහු වෙති; සඤ්ඤාවේදයිත නිරෝධයට සමවන්නහුගේ සඤ්ඤා, වේදනා යන චිත්ත සංඛාරයෝ සංසිඳුවන ලද්දාහු වෙති. මේ ත්‍රිවිධ සංස්කාරයන් සන්සිඳුවීමෙනි.

ඤාණචරියා සොළොසෙකින්ද (සොළසහි ඤාණ චරියාහි) යන මෙහි කවර නම් ඤාණචරියා සොළොසෙකින්ද යත්:- අනිච්චානුපස්සනා ඤාණචරියා, දුක්ඛ-පෙ-, අනත්ත -පෙ-, නිබ්බිදා -පෙ-, විරාග -පෙ-, නිරෝධ -පෙ-, පටිනිස්සග්ග -පෙ-, විවට්ටානුපස්සනා ඤාණචරියා, සෝතාපත්ති මග්ග ඤාණචරියා, සෝතාපත්තිඵල සමාපත්ති -පෙ-, සකදාගාමී මග්ග -පෙ-, සකදාගාමී මග්ග -පෙ- අරහත් ඵල සමාපත්ති ඤාණචරියා යන මේ ඤාණචරියා සොළොසෙනි.

සමාධිචරියා නවයෙකින්ද (නවහි සමාධි චරියාහි) යන මෙහි, කවර නම් සමාධිචරියා නවයෙකින්ද යත්:- ප්‍රථම ධ්‍යානසමාධි චරියා, ද්විතීයධ්‍යාන -පෙ-, නේවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති සමාධිචරියා හා ප්‍රථම ධ්‍යාන ප්‍රතිලාභය සඳහා විතක්ක - විචාර - පීති - සුඛ - ඒකග්ගතා යන මොහුද - පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති ප්‍රතිලාභය සඳහා විතක්ක - විචාර - පීති - සුඛ - ඒකග්ගතා යන මොහුද'යි* යන මේ සමාධිචරියා නවයෙනි.

'වසී' යනු, ආවජ්ජන වසී, සමාපජ්ජන වසී, අධිට්ඨානවසී, වුට්ඨානවසී, පච්චවෙක්ඛන වසී යන පඤ්ච වසීයයි. ප්‍රථමධ්‍යානය කැමැති තැනෙක, කැමැති කලෙක, කැමැති තාක් කල් ආවර්ජනය කෙරෙති'යි ආවර්ජනයෙහි නුහුරු-නුබුහුටි බවක් නැතැ'යි යනු ආවජ්ජන වසියයි; ප්‍රථමධ්‍යානය කැමැති තැනෙක, කැමැති කලෙක, කැමැති තාක්කල් සමවදිති'යි සමවැදීමෙහි නුහුරු-නුබුහුටි බවක් නැතැ'යි යනු සමාපජ්ජන වසීයයි; -පෙ- අධිෂ්ඨාන කෙරෙතියි, අධිෂ්ඨානයෙහි -පෙ- නැඟෙති'යි, නැඟීමෙහි -පෙ- මෙනෙහි කෙරෙති'යි, මෙනෙහි කිරීමෙහි නුහුරු-නුබුහුටි බවක් නැතැ'යි යනු පච්චවෙක්ඛන වසියයි. ද්විතීයධ්‍යානය -පෙ- නේවසඤ්ඤායතන සමාපත්තිය කැමැති තැනෙක, කැමැති කලෙක, කැමැති තාක් කල් ආවර්ජනය කෙරෙති'යි -පෙ- මෙනෙහි කෙරෙති'යි, මෙනෙහි කිරීමෙහි නුහුරු-නුබුහුටි බවක් නැතැ'යි යනු පච්චවෙක්ඛන වසීයයි. මේ පංචවසියයි.

මෙහි, 'සොළසහි ඤාණ චරියාහි' (සොළොස් ඤාණ චරියාවෙන්) යන මෙය උඩත් පිරිසෙයින් දැක්වීමයි; අනාගාමීනට වනාහි (අර්හත් මාර්ග, අර්හත් ඵලසමාප්ති යන දෙක හැර) ඤාණචරියා තුදුසෙකින් වසීභාවය වේ. එසේ නම් සකෘදාගාමීනට දොළොසෙකින්ද ශෝතාපන්නයනට දසයෙකින්ද (වසීභාවය) නොවන්නේද? නොවේ, සමාධියට හානිකර වූ පංචකාම ගුණික රාගය ප්‍රහීණ නොකළ හෙයිනි; ඔවුන්ගේ වනාහි ඒ කාමරාගය ප්‍රහීණ වූයේ නොවේ, එහෙයින් සමථබලය අපරිපූර්ණ වේ, එය අපරිපූර්ණ වූ කල බල දෙකින් සමවැදිය යුතු නිරෝධසමාපත්තිය එම බල විකලත්‍වය හේතු කොට ගෙන සමවදිනු නොහැකි වේ; අනාගාමීන්ගේ වනාහි එම කාමරාගය ප්‍රහීණ වූ හෙයින් එම සමථබලය පරිපූර්ණය, පරිපූර්ණ බල ඇති හෙයින් (සමවදිනු) හැකි වේ. එහෙයින් කීහ භාග්‍යවතුන් වහන්සේ:- "නිරෝධ සමාපත්තියෙන් නැඟෙන්නහුට නේවසඤ්ඤානාසඤ්ඤායතන කුශල චිත්තය ඵලසමාපත්තියට අනන්තර ප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වේ" යනුවෙනි.

---

* සමාපත්ති අටෙහිම උපචාර සමාධිය නවවන සමාධිචරියාවය'යි කී නියායි. එහෙත් චතුර්ථ (පංචම) ධ්‍යානයෙහි පටන් ඒකග්ගතාව හැර මුල් ධ්‍යානාංග සතර පවතීද? ගැටලුවෙකි. විමසිය යුතුය.

''නිරෝධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං ඵලසමාපත්තියා අනන්තරපච්චයෙන පච්චයො''[a] යන මේ පට්ඨාන මහාප්‍රකරණයෙහි අනාගාමීහුගේම නිරෝධ සමාපත්තියෙන් නැගීම අරබයා කියන ලදී.

කොතැනෙක්හි සමවදිත්ද (කත්ථ සමාපජ්ජන්ති?) පඤ්ච වෝකාර භාවයෙහිය; කවර හෙයින්ද? සමාපත්ති සම්භවය අනුපිළිවෙළින් වන හෙයිනි. චතුවෝකාර භවයෙහි (අරූපභවයෙහි) වනාහි ප්‍රථමධ්‍යානාදීන්ගේ උපතක් නැත, එහෙයින් එහි සමවදිනු නොහැකිය. ඇතැමෙක් වනාහි වස්තුරූපයක් නොමැති හෙයිනැ'යි කියති.

කවර හෙයින් සමවදිත්ද? (කස්මා සමාපජ්ජන්ති?) සංස්කාරයන්ගේ (උදය-ව්‍යය ආදී වශයෙන්) විකාර ප්‍රවෘත්තීන් (වෙනස් පැවතුම්) කෙරෙහි කලකිරීමෙන් ආත්මභාවය පැවතියදීම, ''අචිත්තක (සිත නැති) ව නිරෝධ සංඛ්‍යාත නිර්වාණයට පැමිණ සුඛ විහරණ කරන්නමෝය''යි සමවදිති.

එයට සමවැදීම කෙසේ සිදු වේද? (කථඤ්චස්සා සමාපජ්ජනං හොති?) සමථ විපස්සනා වශයෙන් උත්සාහ කිරීමෙන් පූර්වකෘත්‍යයන් සම්පූර්ණ කොට නේවසඤ්ඤානාසඤ්ඤායතනය ඉකුත් කරන යෝගාවචරයාහට මෙසේ මේ නිරෝධසමාපත්ති සමාපජ්ජනය සිදුවේ. යමෙක් වනාහි හුදෙක් සමථ වශයෙන්ම උත්සාහ කෙරෙත්ද, ඔහු නේවසඤ්ඤා නාසඤ්ඤා සමාපත්තියට පැමිණ සිටිත්; යමෙක් හුදෙක් විදර්ශනා වශයෙන්ම උත්සාහ කෙරෙත්ද, ඔහු ඵල සමාපත්තියට පැමිණ සිටිත්; යමෙක් වනාහි උභය වශයෙන් උත්සාහ කිරීමෙන් පූර්ව කෘත්‍යයන් සම්පූර්ණ කොට නේවසඤ්ඤානාසඤ්ඤායතනය නිරුද්ධ කෙරත්ද, ඔහු එයට (නිරෝධ සමාපත්තියට) සමවදිති''යි යනු මෙහි සංක්ෂේපයයි.

විස්තරය මෙසේයි:- මේ ශාසනයෙහි, නිරෝධයට සමවදිනු කැමැති භික්ෂු තෙමේ බත්කිස නිම කොට, අතපය මැනවින් සෝදාගෙන විවේක ස්ථානයෙක මොනවට පැනවූ අස්නෙක පලඟ බැඳ, කය ඍජුව පිහිටුවාගෙන, කර්මස්ථානයට අභිමුඛව සිහිය එළවාගෙන හිඳියි; ඒ භික්ෂු තෙමේ ප්‍රථම ධ්‍යානයට සමවැද, එයින් නැඟී එහි ඇති සංස්කාරයන් අනිත්‍ය වශයෙන්, දුඃඛ වශයෙන් හා අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.

මේ විදර්ශනාව වනාහි සංඛාර පරිග්ගණ්හනක විපස්සනාය, ඵලසමාපත්ති විපස්සනාය, නිරෝධසමාපත්ති විපස්සනායයි ත්‍රිවිධ වේ. එහි සංඛාර පරිග්ගණ්හනක විදර්ශනාව මන්ද (මොට) හෝ වේවා, තියුණු හෝ වේවා, මාර්ගයට පදනම් වේමය; ඵලසමාපත්ති විදර්ශනාව- තියුණු වූයේම වටී- මාර්ග භාවනාව හා සමාන වේ; නිරෝධ සමාපත්ති විදර්ශනාව වූකලී ඉතා මන්ද නොවූයේ හෝ ඉතා තියුණු නොවූයේ වටී,

a. පට්ඨාන පඤ්හවාර විභඞ්ග

එහෙයින් මේ යෝගී තෙමේ ඉතා මන්ද නොවූ හෝ ඉතා තියුණු නොවූ විදර්ශනාවෙන් ඒ සංස්කාරයන් දකියි.

ඉක්බිති ද්විතීයධ්‍යානයට සමවැද එයින් නැඟී එහි වූ සංස්කාරයන් එසේම විදර්ශනාවට නඟයි; ඉක්බිති තෘතීය ධ්‍යානයටද -පෙ-, ඉක්බිති විඤ්ඤාණඤ්චායතනයට සමවැද, එයින් නැඟී එහි වූ සංස්කාරයන් එසේම විදර්ශනාවට නඟයි; එසේම ආකිඤ්චඤ්ඤායතනයට සමවැද, එයින් නැඟී, - නානාබද්ධ - අවිකෝපනය, සඞ්ඝපතිමානනය, සත්‍ථු පක්කෝසනය, අද්ධාන පරිච්ඡේදය යන චතුර්විධ පූර්වකෘත්‍යයන් කරයි.

එහි 'නානාබද්ධ-අවිකෝපන' යනු, යම් (පිරිකර ආදියක්) මේ භික්‍ෂුව හා සමග එක්ව බැඳී නොපවතී නම්, එනම් (හඳනා, පොරෝනා ආදී වශයෙන් පරිභෝග නොකැරෙමින්) වෙන්ව පවතින යම් පා-සිවුරු, ඇඳපුටු හෝ නිවාස ගෘහ හෝ අන්කිසි පිරිකර ආදියක් හෝ වේ නම්, එයට හානි නොවන සේ - එනම්, ගිනි, දිය, සුළං, ආදියෙන් හෝ, සොරුන්, මීයන් ආදීන්ගෙන් විනාශ නොවන සේ - අධිෂ්ඨාන කළයුතුය. එහිලා අධිෂ්ඨාන කළ යුතු ආකාරය මෙසේයః- ''මේ මේ දූය මෙම සතිය තුළ ගින්නෙන් නොදැවේවා, ජලයෙන් පාවී නොයේවා, සුළඟින් නොවිසිරේවා, සොරුන් විසින් පැහැරගනු නොලැබේවා, මීයන් විසින් කා-දමනු නො-ලැබේවා'' ආදී වශයෙනි. මෙසේ අධිෂ්ඨාන කළ කල එම සතිය තුළ එයට කිසි හානියක් නොවන්නේය.

එසේ අධිෂ්ඨාන නොකළහොත්, ගිනි ආදියෙන් හානි සිදුවිය හැකිය, මහානාග ස්ථවියන්හට සෙයිනි; උන්වහන්සේ මව් උවැසියගේ ගමට පිඬු පිණිස පිවියහ; උවැසි තොමෝ උන්වහන්සේට කැඳ පිළිගන්වා ආසනශාලායෙහි හිඳවූය; උන්වහන්සේ නිරෝධයට සමවැද වැඩහුන්හ; උන්වහන්සේ වැඩහිඳියදී ආසනශාලාවට ගිනි ඇවිලිණි; සෙසු භික්‍ෂූහු තමතමන් හුන් අසුන් ගෙන ඉවත ගියහ. ගම්වැසියෝ රැස්වී තෙරුන් දැක, 'අලස මහණෙක, අලස මහණෙකැ'යි කීහ; ගින්න තණ, හුණ, දැව දවාගෙන තෙරුන් වට කොට සිටියේය; මිනිස්හු කළවලින් දිය ගෙනවුත්, ගිනි නිවා, අලු ඉවත් කොට, පිරිසිදු කොට, මල් විසුරුවා වඳිමින් සිටියහ. තෙරුන් වහන්සේ පිරිසිඳින ලද කාලය අවසන් වූ කල ඔවුන් දැක, ''ප්‍රකට වීමි''යි (නිරෝධ සමාපත්තියට සමවැද හුන් රහතකු බව හෙළි වීය'යි) අහසට නැඟ පුවඟු දිවයිනට වැඩියහ. 'නානාබද්ධ - අවිකෝපන' යනු මේය.

යමක් (පිරිකර ආදියක්) එක්ව බැඳී පවතීද, (දරා සිටි) එවන් හඳනාපොරෝනා හෝ හුන'සුන හෝ පිළිබඳව වෙන් කොට අධිෂ්ඨාන කිරීමක් අවශ්‍ය නොවේ. සමවත මගින්ම එය රැකේ; ආයුෂ්මත් සංජීව තෙරුන්හට සෙයිනි. කියන ලද මැයි, ''ආයස්මතො සඤ්ජීවසස

සමාධිවිප්ඵාරා. ඉද්ධි, ආයස්මතො සාරිපුත්තස්ස සමාධිවිප්ඵාර ඉද්ධි'' (ආයුෂ්මත් සංජීව තෙරුන්ගේ සමාධිබලයෙන් පතළ ඍද්ධියයි, ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන්ගේ සමාධිබලයෙන් පතළ ඍද්ධියයි)[a] යනුවෙනි.

'සඞ්ඝස්ස පතිමානනං' යනු, එම භික්ෂුව කෙරෙහි සංඝයාගේ බහුමානයයි, එම හේතුවෙන්ම සංඝකර්මයෙකදී එම භික්ෂුවගේ පැමිණ සිටීම අපේක්ෂා කරන බවයි. එම භික්ෂුව පැමිණෙන තුරු සංඝකර්මය ආරම්භ නොකොට (පොරොත්තුව) සිටීමය යන අර්ථයි. මෙහිලා මේ භික්ෂුවගේ පූර්වකෘත්‍යය වනුයේ පතිමානනය නොව පතිමානනය ගැන සැලකිලිමත් වීමයි. එහෙයින් මෙසේ ආවර්ජනය කළයුතුයː- ''ඉදින් මා සතියක් නිරෝධ සමාපත්තියට සමවැද හුන් කල 'ඤත්ති' ආදී වූ කිසියම් (විනය) කර්මයක් කළයුතු වේද, එකල යම් තාක් කිසි භික්ෂුවක් පැමිණ මා කැඳවත්ද ඒ තාක් නොනැගිටින්නෙමැ'යි (කැඳවූ කෙණෙහි නැඟිටින්නෙමැ'යි) මෙසේ ඉටා ගෙන සමවැදුණහොත් එකල (තමාගේ පැමිණීම අවශ්‍ය වූ කල) නැඟිටිනුයේමය.

යමෙක් එසේ නොකෙරෙත්ද, සංඝයාද රැස් වී ඒ භික්ෂුව නොදැක, ''අසුවල් භික්ෂුව කොහිදැ''යි විමසා, ''නිරෝධසමාපත්තියට සමවන්හ''යි කී කල, ''සංඝයාගේ වචනයෙන් එම භික්ෂුව කැඳවනුයැ'යි කිසි භික්ෂුවක් යවත්ද, එවිට එම භික්ෂුව විසින් (සමවතට සමවන්නහුට) ඇසෙන තෙක් මානයේ සිට, ''ඇවැත්නි, සංඝයා ඔබගේ පැමිණීම හරසරින් අපේක්ෂා කෙරෙති''යි කී කෙණෙහිම නැඟිටීම සිදුවේ. මෙසේ සංඝාඥාව වූකලී ඉතා ගරු (සුලු පටු නොවූ) දෙයකි; එහෙයින් එය ගැන සැලකිලි මත්ව, යම්සේ තමාම නැඟිටිත්ද, එසේ අදිටන් කොට සමවැදීම මැනවි.

'සත්ථුපක්කොසන' යන මෙහිද සමවදින්නාගේ පූර්ව කෘත්‍යය වනුයේ ශාස්තෘන් වහන්සේ විසින් කැඳවනු ලැබීමේ භව්‍යතාව ආවර්ජනය කිරීමයි; එහෙයින් එයද මෙසේ ආවර්ජන කළයුතුයː- ''ඉදින් මා සතියක් නිරෝධයට සමවැද හුන් කල, යම් කිසි සිද්ධියක් පැනනැඟී, ශාස්තෘන් වහන්සේ ශික්ෂාපදයක් පණවත්ද, එවැනි කරුණක් සිදුවී ධර්මයක් හෝ දෙසත්ද, කිසිවක පැමිණ මා නැඟිටුවන්නට පෙර නැඟිටිම්'යි මෙසේ අදිටන් කොට හුන්නේ එකල නැඟිටිනුයේමය.

යමෙක් වනාහි එසේ අදිටන් නොකෙරෙත්ද, ශාස්තෘන් වහන්සේද සංඝයා රැස්වූ කල ඒ භික්ෂුව නොදැක, ''අසුවල් භික්ෂුව කොයිදැ'යි විමසා නිරෝධයට සමවැදුනහ'යි කී කල, ''ගොස් මාගේ වචනයෙන් ඒ භික්ෂුව කැඳවන්නැ''යි කිසියම් භික්ෂුවක් යවත්ද, එවිට ඒ භික්ෂුව විසින් (සමවැද හුන්) භික්ෂුවට ඇසෙන තෙක් මානයේ සිට ''ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවන සේක'යි කී කෙණෙහිම නැඟිටීම සිදුවේ. මෙසේ

---

a. පටිසම්භිදාමග්ග පාළි, ඉද්ධි කථා

ශාස්තෘන් වහන්සේ විසින් කැඳවනු ලැබීම ගරුක වූ (සුලුපටු නොවූ) දෙයකි. එහෙයින් එය ආවර්ජනය කොට, යම්සේ තමාම නැගිටිත්ද, එසේ අදිටන් කොට සමවැදීම මැනවි.

'අද්ධාන පරිච්ඡේද' යනු තමාගේ ජීවිත කාලය පිරිසිඳීමයි. මේ භික්ෂුව කාලය පිරිසිඳීමෙහි ඉතා දක්ෂ විය යුතුය. තමාගේ ආයුසංස්කාරය සත්දවසක් පවතීද නොපවතීද'යි ආවර්ජන කොටම සමවැදිය යුතුය. ඉදින් සත් දිනක් ඇතුළත ඉකුත් වීමට ඇති ආයුසංස්කාරය ඇති කල, ආවර්ජන නොකොටම සමවැදුණහොත්, එම භික්ෂුවගේ නිරෝධ සමාපත්තිය මරණය වලකනු නොසමත්වන හෙයින්ද, නිරෝධ සමාපත්ති කාලය තුළ මරණය නොවියහැකි හෙයින්ද සත්දවස අතරතුරදීම සමවතින් නවතින්නට සිදු වේ. එහෙයින් මෙය ආවර්ජන කොටම සමවැදිය යුතුය. සෙසු පූර්වකෘත්‍යයන් ආවර්ජන නොකළද මෙය ආවර්ජන කළයුතුමය'යි කියන ලදී.

මෙසේ ඒ භික්ෂු තෙමේ ආකිඤ්චඤ්ඤායතනයට සමවැද එයින් නැඟී මෙකී පූර්වකෘත්‍යයන් කොට නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදියි; ඉක්බිති චිත්තවාර එකක් හෝ දෙකක් ඉක්මගිය පසු අචිත්ත (සිත් නැත්තකු) බවට පත් වේ, නිරෝධය ස්පර්ශ කරයි. කවර හෙයින් චිත්තවාර දෙකෙකින් මතු සිත් නොපවත්නේද යත්, නිරෝධය පිණිස යෙදුණ හෙයිනි; මේ වනාහි මේ භික්ෂුවගේ සමථ විපස්සනා යන දෙක එකිනෙක සම කොට අෂ්ටසමාපත්ති වශයෙන් නැඟීම අනුපූර්ව (අනු පිළිවෙළින්) නිරෝධය පිණිස යෙදීම මිස නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය පිණිස යෙදීම නොවේ. නිරෝධය පිණිස යෙදුණ හෙයින් සිත් දෙකෙකින් මතු සිත් (සිත් දෙකකට වඩා) නොපවතියි.

යම් භික්ෂු කෙනකු වනාහි, ආකිඤ්චඤ්ඤායතනයෙන් නැඟී මෙකී පූර්වකෘත්‍යයන් නොකොට නේවසඤ්ඤායතනයට සමවදිතොත්, ඒ භික්ෂු තෙමේ එයින් මතු 'අචිත්තක' බවට පත්වනු හැකි නොවන්නේය, පෙරළා යළිත් අකිඤ්චඤ්ඤායතනයෙහිම පිහිටන්නේය.

මෙහිලා, පෙර නොගිය විරූ මඟෙක ගිය පුරුෂයාගේ උපමාව කිවයුතුයඃ- එක්තරා පුරුෂයෙක් තෙමේ පෙර නුපුරුදු මඟෙක ගොස් අතරමඟ කඳුරක් හෝ වගුරක් ඉක්මවා (පසු කොට) ඇති සැඩ හිරු රැසින් රත්වූ ගල්තලාවක් වෙත පැමිණ, හඳනා පොරෝනා නිසි ලෙස තබා නොගෙනම කඳුරට බටුයේ ඇඟලුම් තෙමෙති'යි යන බියෙන්, පෙරළා යලි ඉවුරටම එයි. ගලමත පා තබා හෝ දැවෙන පා ඇතිව පෙරළ පහළට බැස සිටියි.

එහි, යම්සේ ඒ පුරුෂයා හඳනා පොරෝනා නිසි ලෙස තබා (හකුලුවා) නොගත් හෙයින් කඳුරට බට සැණින්ම, නැතහොත්, රත් වූ

ගල මත පා තැබූ සැණින්ම බැස පෙරළා ඉවුරෙහිම සිටීද, එසේම ඒ භික්ෂු තෙමේද, පූර්වකෘත්‍යයන් නොකළ හෙයින්, නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුන සැණින් පෙරළා ආකිඤ්චඤ්ඤායතනයෙහි පිහිටයි.

යම් සේ, පෙර එමඟ ගොස් පුරුදු පුරුෂයෙක් එතැනට පැමිණ එක් වස්ත්‍රයක් තරයේ හැඳ, අනෙක අතින් ගෙන, කඳුරෙන් එතෙරට යයිද, නැතිහොත් රත්වූ ගල මත යුහුව පා තබා එතරට යයිද, එසේම පූර්වකෘත්‍යයෙන් නිම කළ භික්ෂු තෙමේ නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදම එයින් ඔබ අචිත්තක බවට පත්ව නිරෝධය ස්පර්ශ කෙරෙමින් විහරණය කරයි.

'කථං ඨානං' (සමාපත්තියෙහි සිටීම කෙසේද) යනු අතරතුර (ඉහතකී) ආයුක්ෂය වීම, සංඝපතිමානනය හෝ සත්ථුපක්කෝසනය නොවූව හොත්, මෙසේ සමවත් මේ නිරෝධසමාපත්තිය කාලසීමා පිරිසිඳීම් වශයෙන්ම තිරව පවතියි. (කඩ නොවී සිටියි).

'කථං වුට්ඨානං' (සමාපත්තියෙන් නැඟීම කෙසේද?) යනු, අනාගාමීහුගේ අනාගාමී ඵලය ඉපැදීමෙන්ද, රහත්හුගේ රහත්ඵලය ඉපැදීමෙන්ද'යි මෙසේ දෙපරිද්දෙකින් නැඟිටීම සිදුවේ.

'වුට්ඨිතස්ස කිංනින්නං චිත්තං හොති?' (සමවතින් නැඟුණහුගේ සිත කවරක් වෙත නැඹුරු වේද?); නිර්වාණය වෙතට නැඹුරු වෙයි; කියන ලදමැයි:- ''ඇවැත්නි, විසාඛයෙනි, සඤ්ඤා වේදයිත නිරෝධසමාපත්තියෙන් නැඟුණ භික්ෂූහුගේ සිත විවේකය (නිර්වාණය) වෙතට නැඹුරු වේ, විවේකය වෙතට ප්‍රවණ වේ, විවේකය වෙතට බර වේ''[a]

'මතස්ස ච සමාපන්නස්ස ච කො විසෙසො? (මළහුගේ හා සමවතට සමවන්නහුගේ වෙනස කිම?) යන මෙයද සූත්‍රයෙහි කියන ලදුයේමය. යම් සේ කීහුද, ''ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් මළේද, කලුරිය කළේ වේද, ඔහුගේ කාය සංඛාරයෝ නිරුද්ධ වූවාහුය, හරින ලද්දාහුය; වචී සංඛාරයෝ -පෙ- චිත්ත සංඛාරයෝ නිරුද්ධ වූවාහුය, හරින ලද්දාහුය; ආයුෂක්ෂය වූයේය; උණුසුම සන්සිඳියේය; ඉන්ද්‍රියයෝ බිඳීගියාහුය. යම් මේ භික්ෂු කෙනෙක් සඤ්ඤාවේදයිත නිරෝධයට සමවන්නාහුද, ඔවුන්ගේ කාය සංඛාරයෝද නිරුද්ධ වූවාහුය, හරින ලද්දාහුය; වචී සංඛාරයෝ -පෙ- චිත්ත - සංඛාරයෝ නිරුද්ධ වූවාහුය, හරින ලද්දාහුය; ආයුෂ ක්ෂය නොවූයේය; උණුසුම නොසන්සිඳියේය; ඉන්ද්‍රියයෝ නොබිඳුණාහුය''[b]

---

a. ම. නි., චූල වේදල්ල

b. ම. නි., මහා වේදල්ල

'නිරොධසමාපත්ති සඞ්ඛතා? අසඞ්ඛතා?' (නිරෝධ සමාපත්තිය සඞ්ඛත (කෘත්‍රිම)ද, නැතහොත් අසඞ්ඛතද?) යන ආදිය පිළිබඳ ප්‍රශ්නයෙහිදී, ''සඞ්ඛතය'', හෝ 'අසඞ්ඛතය'යිද, 'ලෞකිකය' හෝ 'ලෝකෝත්තරය'යිද කිවහැකි නොවේ; කවර හෙයින්ද? ස්වභාව වශයෙන් අවිද්‍යමාන වූ හෙයිනි. යම් හෙයකින් එය සමවදින්නකු ඇති හෙයින් සමවදින ලද්දේ නම් වේද, එහෙයින් එය 'නිෂ්පන්න' යයිද, 'අනිෂ්පන්න නොවේ' යයිද කීම යෝග්‍ය වේ.

ඉති සන්තං සමාපත්තිං ඉමං අරියසෙවිතං
දිට්ඨෙව ධම්මෙ නිබ්බාණමිති සංඛං උපාගතං
භාවෙත්වා අරියං පඤ්ඤං සමාපජ්ජන්ති පණ්ඩිතා
යස්මා තස්මා ඉමිස්සාපි සමාපත්ති සමත්ථතා,
අරියමග්ගෙසු පඤ්ඤාය ආනිසංසො'ති වුච්චතී'ති.

මෙසේ, පණ්ඩිතයෝ ආර්යමාර්ගප්‍රඥාව වඩා, ආර්යයන් විසින් සෙවුනා ලද ශාන්ත වූ, 'දෘෂ්ට ධර්ම (ආත්මභාවය පවතිද්දීම විඳිය හැකි) නිර්වාණය' යන ව්‍යවහාරයට පත් මේ (නිරෝධ) සමාපත්තියට සමවදිති.

යම් හෙයකින් මෙම සමාපත්තියටද සමවදිනු සමත් බවක් වේද, එහෙයින් එයද ආර්ය මාර්ගප්‍රඥාවෙහි ආනිසංසය'යි කියනු ලැබේ.

'ආහුණෙය්‍යභාවාදි සිද්ධි' (උසස් පූජෝපහාරයනට සුදුසුබව සමෘද්ධ වීම) යනු, හුදෙක් නිරෝධසමාපත්තියට සමවදිනු සමත් බව මතු නොවේ, මේ ආහුණෙය්‍යභාවාදිය ලැබීමද මෙම ලෝකෝත්තර ප්‍රඥා භාවනාවෙහි ආනිසංසය'යි දතයුතුය.

අවිශේෂයෙන් (සෝවාන් ආදී) චතුර්විධ වුම මේ ලෝකෝත්තර ප්‍රඥාව වඩනා ලද හෙයින් 'භාවිත පඤ්ඤ' නම් වූ ආර්යපුද්ගල තෙමේ දෙවියන් සහිත ලෝකයාහට ආහුණෙය්‍ය (දුර සිට ගෙනෙනු ලබන පූජාවනට යෝග්‍ය) වේ, පාහුණෙය්‍ය (ආගන්තුක දානයට යෝග්‍ය) වේ, දක්ඛිණෙය්‍ය (පැන් වඩා දෙන දානයට යෝග්‍ය) වේ, අඤ්ජලිකරණීය (දොහොත් මුදුන් දී වඳිනු ලැබීමට යෝග්‍ය) වේ. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස (ලෝකයාහට අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර) වේ.

විශේෂයෙන් වනාහි, පළමුකොට ප්‍රථම (සෝවාන්) මාර්ග ප්‍රඥාව වඩා මන්ද වූ විදර්ශනායෙන් ආ, මෘදු වූ (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් ඇති ආර්ය පුද්ගල තෙමේ 'සත්තක්ඛත්තු පරම' නම් වේ; සුගතිභව සතෙක්හි සැරිසරා (සසර) දුක් කෙළවර කරයි. මධ්‍යම ප්‍රමාණයේ විදර්ශනායෙන් ආ, මධ්‍යම ප්‍රමාණ ඉන්ද්‍රිය සහිත පුද්ගල තෙමේ 'කෝලංකෝල' (කුලයෙන් කුලයට යන) නම් වේ; (මහාසාර) කුල දෙකක් හෝ තුනක් සැරිසරා (සසර) දුක් කෙළවර කරයි. තියුණු වූ විදර්ශනා සහිතව ආ, තියුණු ඉන්ද්‍රියයන් ඇති

පුද්ගල තෙමේ 'ඒක බීජී' නම් වේ; එක්ම වරක් මිනිස් ලොව ඉපිද (සසර) දුක් කෙළවර කරයි.

ද්විතීය මාර්ග ප්‍රඥාව වැඩීමෙන් 'සකෘදාගාමී' නම් වේ, එක්ම වරක් මිනිස් ලොවට අවුත් සසර කෙළවර කරයි. තෘතීය මාර්ග ප්‍රඥාව වඩා 'අනාගාමී' නම් වේ; එම ආර්යපුද්ගල තෙමේ ඉන්ද්‍රියයන්ගේ විෂම ප්‍රමාණ වීම් (අඩු-වැඩිවීම්) වශයෙන් 'අන්තරා පරිනිබ්බායි', උපහච්ච පරිනිබ්බායී, අසඞ්ඛාර පරිනිබ්බායී, සසඞ්ඛාර පරිනිබ්බායී, උද්ධංසෝත අකණිට්ඨගාමීය'යි පස් ආකාරයෙකින් මේ සසර හැරපියා අවසන් වෙයි.

එහි, 'අන්තරාපරිනිබ්බායී' නම් පුද්ගල තෙමේ කිසියම් ශුද්ධාවාස භවයෙක්හි ඉපිද, එහි ආයුප්‍රමාණයෙන් අඩකට නොපැමිණම පිරිනිවන් පායි; 'උපහච්ච පරිනිබ්බායී' පුද්ගල තෙමේ ආයු ප්‍රමාණයෙන් අඩක් ඉක්මවා පිරිනිවෙයි; 'අසඞ්ඛාර පරිනිබ්බායි' යනු, අනෙකකුගේ මෙහෙයවීමක් නැතිව නිරුත්සාහයෙන්ම මතු (අර්හත්) මාර්ගය උපදවයි; සසඞ්ඛාර පරිනිබ්බායී' යනු, මෙහෙයවීමක් ඇතිව උත්සාහයෙන් මතු (අර්හත්) මාර්ගය උපදවයි; 'උද්ධංසෝත අකණිට්ඨගාමී'' යනු, කිසියම් ශුද්ධාවාස භවයෙක්හි ඉපිද, එතැන් සිට අකණිෂ්ට භවය තෙක් ඉහළට නැග එහිදී පිරිනිවන්පායි, යන අර්ථයි.

සිවුවන (අර්හත්) මාර්ග ප්‍රඥාව වඩා කිසිවෙක් 'සද්ධා විමුත්ත' වෙති, කිසිවෙක් 'පඤ්ඤාවිමුත්ත'ද, කිසිවෙක් 'උභතොභාග විමුත්ත'ද වෙති. කිසිවෙක් 'තේවිජ්ජ' (ත්‍රිවිද්‍යාවෙන් සමන්විත)ද, කිසිවෙක් ඡළභිඤ්ඤා (ෂඩ් අභිඥාවෙන් සමන්විත)ද වෙති; කිසිවෙක් පටිසම්භිදා විශේෂයනට පත් මහා ක්ෂීණාශ්‍රව වෙති. එම ක්ෂීණාශ්‍රවයන් සඳහා, ''හේ තෙමේ වනාහි මාර්ගක්ෂණයෙහිදී ඒ තෘෂ්ණා ජටාව ලිහාලයි; ඵලක්ෂණයෙහිදී ලිහාලූ ජටා ඇත්තේ දෙවියන් සහිත ලෝකයාට අග්‍රදක්ෂිණාර්හ බවට පත් වන්නේය''යි (මෙහි නිදාන කථාවෙහි) කියන ලදි.*

එවං අනෙකානිසංසා අරියපඤ්ඤාය භාවනා
යස්මා තස්මා කරෙය්‍යාථ රතිං තත්‍ථ විචක්ඛණො

මෙසේ, යම් හෙයකින් ආර්ය මාර්ග ප්‍රඥා භාවනාව අනේක වූ ආනිසංස ඇත්තේ වේද. එහෙයින් නුවණැත්තේ එහි ඇලුම් කරන්නේය.

මෙතෙකින් ;

''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං''

---

* විසුද්ධිමග්ග (හේවාවිතාරණ මුද්‍රණය, 3 වන පිටුව).

යන මේ ගාථායෙහි ශීල, සමාධි, ප්‍රඥා වශයෙන් දේශනා කරන ලද විශුද්ධි මාර්ගයෙහි, ආනිසංස සහිත වූ ප්‍රඥා (විදර්ශනා) භාවනාව විස්තර කරන ලද්දේ වේ.

සාධුජන ප්‍රමෝදය සඳහා කරන ලද විශුද්ධිමාර්ගයෙහි, පඤ්ඤාභාවනාධිකාරයෙහි, පඤ්ඤාභාවනානිසංස නිද්දේස නම්වූ තෙවිසිවන පරිච්ඡේදය මෙතෙකින් නිමියේයි.

නිගමනය

මෙතෙකින්:-

''සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො චිත්තං පඤ්ඤඤ්ච භාවයං

ආතාපී නිපකො භික්ඛු සො ඉමං විජටයෙ ජටං''

යන මේ ගාථාව මාතෘකා වශයෙන් තබා,

''ඉමිස්සාදානි ගාථාය කථිතාය මහෙසිනා
වණ්ණයන්තො යථාභූතං අත්ථං සීලාදිභෙදනං
සුදුල්ලභං ලභිත්වාන පබ්බජ්ජං ජිනසාසනෙ
සීලාදි සඞ්ගහං ඛෙමං උජුං මග්ගං විසුද්ධියා
යථාභූතං අජානන්තා සුද්ධිකාමාපි යෙ ඉධ
විසුද්ධිං නාධිගච්ඡන්ති වායමන්තාපි යොගිනො
තෙසං පාමොජ්ජකරණං සුවිසුද්ධ විනිච්ඡයං
මහාවිහාරවාසීනං දෙසනානයනිස්සිතං
විසුද්ධිමග්ගං භාසිස්සං තං මෙ සක්කච්ච භාසතො
විසුද්ධිකාමා සබ්බෙපි නිසාමයථ සාධවො''

යනුවෙන් යමක් කීවමෝද, එය ප්‍රකාශ කරන ලද්දේ වේ,

තෙසං සීලාදිභෙදානං අත්ථානං යො විනිච්ඡයො
පඤ්චන්නම්පි නිකායානං වුත්තො අට්ඨකථානයෙ
සමාහරිත්වා තං සබ්බං යෙභුය්‍යෙන සනිච්ඡයො
සබ්බසංකර දොසෙහි මුත්තො යස්මා පකාසිතො
තස්මා විසුද්ධිකාමෙහි සුද්ධපඤ්ඤෙහි යොගිහි
විසුද්ධිමග්ගෙ එතස්මිං කරණීයොව ආදරො

ශීලාදී භේද ඇති එම අර්ථයන් පිළිබඳ යම් විනිශ්චයයක්, (අඞ්ගුත්තර ආදී) නිකාය පසටම අයත් අටුවානයෙහි කියන ලද්දේද,

ඒ සියල්ල පිඩු කොට, සියලු සංකර දොෂයන්ගෙන් මුදවා, බොහෝ සෙයින් නිශ්චය සහිතව, යම් හෙයකින් මෙහි ප්‍රකාශ කරන ලද්දේද,

* පරිවර්තනය, නිදාන කථා, 2 වැනි පිටුව බලන්න.

එහෙයින්, විශුද්ධිකාමී, ශුද්ධ ප්‍රඥා ඇති යෝගීන් විසින් මේ 'විසුද්ධිමග්ග' නම් කෘතිය කෙරෙහි ආදර කළ යුතුය.

විභජ්ජවාදි සෙට්ඨානං ථෙරියානං යසස්සිනං
මහාවිහාර වාසීනං වංසජස්ස විභාවනො
භදන්ත සඞ්ඝපාලස්ස සුචි සල්ලෙඛ වුත්තිනො
විනයාචාර යුත්තස්ස යුත්තස්ස පටිපත්ති යං
ඛන්ති සොරච්ච මෙත්තාදි ගුණ භූසිත චෙතසො
අජ්ඣෙසනං ගහෙත්වාව කරොන්තෙන ඉමං මයා
සද්ධම්මට්ඨිතිකාමෙන යො පත්තො පුඤ්ඤසඤ්චයො
තස්ස තෙජෙන සබ්බෙපි සුඛ මෙධෙන්තු පාණිනො

ශ්‍රේෂ්ඨ විභජ්ජවාදී, ථේරවාදී, කීර්තිමත් මහාවිහාරවාසීන්ගේ වංශයෙහි පහළවූ, මහාප්‍රාඥා වූ,

පිවිතුරු සැහැල්ලු පැවතුම් ඇති, විනයානුකූල ආචාරසමාචාරයෙන් යුත්, (ශාසනික) ප්‍රතිපත්තියෙහි යෙදුණු, ක්ෂාන්ති (ඉවසීම) සෞරත්‍ය (සුරත බව), මෛත්‍රී ආදී ගුණයෙන් සැරසුණ සිත් ඇති භදන්ත සංඝපාල ස්ථවිරයන්ගේ

ආරාධනය පිළිගෙන සද්ධර්මස්ථිතිය කැමැතිව, මෙම ග්‍රන්ථය රචනා කිරීමෙන් මා විසින් යම් පුණ්‍යසම්භාරයක් ලබා ගන්නා ලද්දේද, එහි තේජසින් සියලු සත්වයෝ සුවපත් වෙත්වා!

විසුද්ධිමග්ගො එසො ච, අන්තරායං විනා ඉධ
නිට්ඨිතො අට්ඨපඤ්ඤාස භාණවාරාය පාලියා
යථා තථෙව ලොකස්ස සබ්බෙ කල්‍යාණනිස්සිතා
අනන්තරායා සිජ්ඣන්තු සීඝසීඝං මනොරථා

තවද, මෙහි මේ 'විසුද්ධිමග්ග' නම් කෘතිය අන්තරායයෙන් තොරව, අටපණස් බණවරෙකින් යුක්ත කොට, පාලිභාෂාවෙන් ලියා නිම කරන ලදුයේ

යම්සේද, එසේම ලෝකයාගේ හිත සුව ඇසුරු කොට ඇති සියලු අපේක්ෂාවෝ අන්තරායෙකින් තොරව සමෘද්ධ වෙත්වා!

——//——

අතිපරිශුද්ධ ශ්‍රද්ධා-බුද්ධි-වීර්ය ගුණයෙන් ප්‍රතිමණ්ඩිතවූ, ශීල-ආචාර-ආර්ජව (ඍජු බව) මාර්දව (මෘදු බව) යන ගුණ සමුදායයෙන් වැඩී ගිය, ස්වසමය - සමයාන්තර ගහනය ඇලළීමෙහි සමත් වූ, ප්‍රඥාවෙන් හා ව්‍යක්තතාවෙන් සමන්විත වූ, අර්ථකථා සහිත ත්‍රිපිටක පර්යාප්ති භේද ඇති ශාස්තෘ ශාසන විෂයයෙහි අප්‍රතිහත ඥාන ප්‍රභාව ඇති, මහා

ව්‍යාකරණාචාර්ය වූ, ඉන්ද්‍රිය සම්පතින් හටගෙන සුවසේ නිකුත්වන මධුරෝදාර-වාග් ලාලිත්‍යයෙන් යුක්ත වූ, යථාර්ථයෙන්ම ශ්‍රේෂ්ට වාගීශ්වරයෙකැ'යි කිව හැකි, මහාකවි වූ ෂඩභිඥා ප්‍රතිසම්භිදාදී අනේක ගුණයෙන් යුත් උත්තරීය මනුෂ්‍ය ධර්ම විෂයයෙහි අප්‍රතිහත බුද්ධි ඇති, ථේරවාද වංශයට ප්‍රදීපායමාන මහාවිහාරවාසී මහා ස්ථවිරයන්ගේ වංශයට අලංකාර වූ, විපුල විශුද්ධ බුද්ධි ඇති 'බුද්ධඝෝෂ' යන ගුරුන්ගෙන් ලත් නාමධේය ඇති, මෝරණ්ඩඛේටක නම් ගමෙහි විසියුතු (එනම් ගමෙහි උපන්) තෙරුන් විසින් රචනා කරන ලද 'විසුද්ධි මග්ග' නම් කෘතිය,

තාවතිට්ඨතු ලොකස්මිං ලොකනිත්ථරණෙසිනං
දසෙසන්තො කුලපුත්තානං නයං සීල විසුද්ධියා
යාව බුද්ධො'ති නාමම්පි සුද්ධචිත්තස්ස තාදිනො
ලොකම්හි ලොකජෙට්ඨස්ස පවත්තති මහෙසිනො

පිරිසුදු සිත් ඇති, තාදීගුණයෙන් යුත්, ලෝකජ්‍යෙෂ්ඨ වූ මහර්ෂීන් වහන්සේගේ 'බුද්ධ' යන නාමය හෝ යම්තාක් ලොව පවතීද, ඒ තාක් ලෝකය (සසර) තරණය කරනු කැමැති කුල-පුත්‍රයනට ශීලාදි-විශුද්ධනය දක්වමින් ලොව පවතීවා!

යං සිද්ධං ඉමිනා පුඤ්ඤං යං චඤ්ඤං පසුතං මයා
එතෙන පුඤ්ඤකම්මෙන දුතියෙ අත්තසම්භවෙ
තාවතිංසෙ පමොදෙන්තො සීලාචාරගුණෙ රතො
අලග්ගො පඤ්චකාමෙසු පත්වාන පඨමං ඵලං
අන්තිමෙ අත්තභාවම්හි මෙත්තෙය්‍යං මුනිපුඞ්ගවං
ලොකග්ගපුග්ගලං නාථං සබ්බසත්තහිතෙ රතං
දිස්වාන තස්ස ධීරස්ස සුත්වා සද්ධම්මදෙසනං
අධිගන්ත්වා ඵලං අග්ගං සොභෙය්‍යං ජිනසාසන'න්ති.

මෙම ග්‍රන්ථකරණයෙන් මවිසින් යම් පිනක් සිද්ධ කරන ලද්දේද, තවද අනෙක් යම් පිනක් රැස් කරන ලද්දේද, ඒ පින් බලයෙන් දෙවන ආත්මභාවයෙහි තව්තිසා බවනෙහි ප්‍රමුදිත වනුයේ, ශීලාචාර ගුණයෙහි ඇලුණේ, පස්කම් සැපෙහි නො-ඇලුණේ, ප්‍රථම ඵලයට පත්ව,

අන්තිම ආත්මභාවයෙහි ලෝකයට අග්‍රපුද්ගලවූද, නාථ වූද, සියලු සත්වයන් වෙත හිත වැඩෙහි නිරත වූ, මෛත්‍රෙය මුනිශ්‍රේෂ්ඨයන් වහන්සේ-

දැක, ධීරගුණ සම්පන්න වූ උන්වහන්සේගේ සදහම් දෙසුම් අසා, අග්‍රඵලයට පැමිණ බුදුසසුන හොබවම්වා!

විශුද්ධි මාර්ගය නිමියේයි.

—//—